SENIOR HOUSEKEEPING SUPERVISORS - Mr. M.D.E.M.N. Karunarathna

HOUSEKEEPING SUPERVISORS – Mr. P.P.N.S. Pushpakumara, Mr. K.N. Basnayake, Mr. S.D. Rathnasiri, Mr. K.H. Yasapala

F & B SUPERVISORS—Mr. L.G.Jayawardena, Mr. J.A.N.S. Perera, Mr. K.A.D.A. Wijesiri, Mr. K.A.A. Jayantha, Mr. K.A.J.I. Tillekeratne, Mr. L.P. Perera, Mr. K.G.P.K. Gamlath, Mr. K.D.M.S. Fernando, Mr. N.D. Wijeyasundara, Mr. M.P.N. Chandrasiri, Mrs.S.C.Renuka.

KITCHEN STEWARDING SUPERVISOR -

CHEF-DE-PARTIE - Mr.S.E. Jinadasa, Mr. K.D.S. Patroneous, Mr. W.D.J.D. Wickremasinghe, Mr. K.W.G. Nissanka.

ASSISTANT PRINCIPAL OFFICER - Mr. K.K.D. Gamini

SENIOR LEADING COOKS - Mr. H.A. Pathmakumara, Mr. R.G.K. Kadanarachchi, Mr. K.D.U. Gunarathna

LEADING COOKS - Mr. D.S. Somaweera, Mr. J.M.R. Premalal, Mr. H.T. Ranasinghe,, Mr.K.D.Piyasiri, Mr.A.A.D.T.S.K.Abeynayake, Mr.P.Lionel

DEPARTMENT OF LEGISLATIVE SERVICES

DIRECTOR (LEGISLATIVE SERVICES) - Mr. J.R. Gajaweera Arachchige

TABLE OFFICE - Mr. H.E. Janakantha Silva, Mr. M.J. Perera (Assistant Directors - Administration); Miss N.R.W. Abayawardena, Mr. P.H. Kumarasinghe, (Principal Officers); Mr. K.R. Herath, Mrs. C.M. Subasinghe (Deputy Principal Officers); Mr. J. Naseerdeen, Mrs. K.C.K. Peiris , Mrs. A.C.F. Nusrath (Assistant Principal Officers); Mr.S.L.Wickrama (Parliamentary Officer)

BILLS OFFICE - Miss G. Thatchanarany (Assistant Director - Administration), Mr. W.A.K.C. Udapola (Principal Officer); Mrs. G.N.D. Thilakarathna (Deputy Principal Officer); Mr. S.A.M. Shaheed, Mrs. W.L.S.D. de Alwis (Assistant Principal Officers)

COMMITTEE OFFICE - Mrs. C.I. Dissanayake (Assistant Director- Administration); Mr. A.M. Nilamudeen , Mrs. C.M. Bulathsinhala, (Principal Officers); Mrs. S.P. Gamage (Deputy Principal Officer); Mrs. H.R.de Zoysa, Mrs. V.P.G.S. Vidanapathirana, Mrs. R.A.N.D. Alwis, Mrs. G.R.U. Gamage,(Assistant Principal Officers)

COMMITTEE OFFICE II - Mr. C. Kalansooriya (Assistant Director- Administration); Mr. M.M.M. Mabrook (Principal Officer)

PUBLIC ACCOUNTS AND PUBLIC ENTERPRISES COMMITTEE OFFICE - Mrs. N.S. Wickramarathne, Mrs. A.C.P. Sooriyapperuma (Assistant Directors - Administration); Mr. E.D.J. Wickremasinghe, Mr. D.R.S. Fernando, Mrs. M.K.S.D. Alwis (Deputy Principal Officers); Mrs.B.J.Abeysinghe, Mr. R.C. Wijetilleke (Assistant Principal Officers); Mr. W.G. Sunil Shantha, Mr. K.T.L.A. Chandrasiri, Mr. M.R.B. Senaratne (Parliamentary Officers)

PUBLIC PETITIONS COMMITTEE OFFICE - Mr. S.B. Kulugammana (Assistant Director - Administration); Mrs.K.T.C.K.Peiris (Principal Officer); Mr.W.W.N.S.C. Fernando, Mr. H.R.C. Silva (Deputy Principal Officers); Mr. R.A.R.L.Ranawake, Mr. M.R.D.T. Thilakasiri (Assistant Principal Officers); Mr.W.K.D.S. Kumarasiri, Miss.R.M.D.K..Priyadarshani (Parliamentary Officers)

LIBRARIAN - Mr. P.H.N. Premasiri

DEPUTY LIBRARIAN - Miss K.A.D.R. Sepalika

ASSISTANT LIBRARIAN - Mr. S.L. Siyath Ahemed, Miss. K.D.S.Wijenayake, Mr. G. Ratnayake

JUNIOR ASSISTANT LIBRARIAN GRADE I - Mrs. H.S. Rathnayake

JUNIOR ASSISTANT LIBRARIANS - Mr. W.A. Gunarathna

CHIEF RESEARCH OFFICER - Mr. G. Kumanayake

SENIOR RESEARCH OFFICER - Mr. M. Ajiwadeen

RESEARCH OFFICERS - Miss G.R. Ayesha Godagama, Mrs. P.L.T. Erandathi, Mrs. R.N.H. Wijayathilaka, Mrs. H.P.A.S. Abeykoon, Mrs. J.S. Amugoda Arachchi, Mr. V. Muralithas

CHIEF PARLIAMENTARY INTERPRETER - Mr. W.M.U. Bandara

DEPUTY CHIEF PARLIAMENTARY INTERPRETERS - Mr. M.Z.M. Marzook, Mr. I.L. Abdul Jabbar, Mr. J.A.S.P. Perera

SENIOR PARLIAMENTARY INTERPRETERS - Mr. K.M. Christopher, Mr. M.S. Zain Fazil, Mrs. I.D.L. Ratnaseeli, Mr. K.D.R. Padmasiri, Mr. A. Saravanabavanandan, Mr. C.J. Karunaratne, Mr. A.G. Mohamed Fiqrhi, Mr. S.R.M. Nisam, Mr. G.F.B. Sureshwaran, Mrs. N.B.C.J. Nissanga, Mrs. H.V.S. Heendeniya, Mr. G.V.S. Wijesinghe

PARLIAMENTARY INTERPRETERS - Mr. D.D.V.N. Dhammage, , Mr. W.M. Rajapaksa, Mr. P.L.P.L.Kumarasiri, Mr. P. Shanthakumar, Mr. S. Rameshkumar, Mrs. R. Vasanthi Perera, Mr. M. Ajithkumar, Mr. G. Jeyachandra, Mr. M.H.M. Ramis, Mr. E.A. Amarasena, Mr. E.M.N.S.M. Ekanayake, Mrs.A.L.A.D.Thiumini, Mrs. K.M.P.G.K. Senarathne, Mr.M.Z.M.Azka

DEPARTMENT OF INFORMATION SYSTEMS AND MANAGEMENT

DIRECTOR (Information Systems and Management) - Mr. H.M.C. Perera

SYSTEMS ENGINEER - Mr. N.B.U. Nawagamuwa

SYSTEMS ANALYST - Mr. C.J. Willoraarachchi

COMMUNICATION / SECURITY ENGINEER - Mr. G.N. Lakmahal

SYSTEMS DESIGNER -

SYSTEMS ADMINISTRATOR - Mr. A.S.D.M. Wickramaratne

WEB AND NETWORK ADMINISTRATOR - Mr. N.G.L.S. Karunathilaka

SENIOR COMPUTER PROGRAMMER- Mr. D. Panditha,

COMPUTER PROGRAMMER - Miss P.M.M. Chandima

WEB EDITOR (SINHALA / ENGLISH) - Mr. U.L. Geeganage

WEB EDITOR (ENGLISH/TAMIL) - Mr. M.N.M. Shifaq

ASSISTANT COMPUTER PROGRAMMER - Mrs. P.L.I.G. Cooray

HELP DESK CO-ORDINATOR - Mrs. B.N.H. Thissera

PARLIAMENTARY OFFICER - Mrs. I.C.K. Ranasinghe

SENIOR COMPUTER OPERATORS - Mrs. P. Jehanya, Mr. J.S. Colombage, Mrs. K.G.S. Sewwandhi, Mrs. N.N. Hettige, Mr. W.H.U.D. Piyatunga, Mr. A.G.R.K. Abeyrathne, Mr. N.D.D.P. Premasiri

COMPUTER OPERATORS - Mr. K.P.P.S. Romawardene, Mr. K.D.G.M. Chrishantha, Mrs. W.D.A. Jayarukshi, Mr. L.G. Ashik Ali, Mr. A.R.M. Rikaz Ali, Mr. A.M. Fouzul Ameen

SENIOR COMPUTER TECHNICIANS - Mr. G.M.T. Perera, Mr. H.S. Sathyajith

SENIOR TECHNICAL ASSISTANTS- Mr.V.R.S.J.Somaratne, Mr.W.S.Suranga

පාර්ලිමේන්තු විවාද

නිල වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

අට වන පාර්ලිමේන්තුව - පළමුවන සභා වාරය

பாராளுமன்ற விவாதங்கள்

அதிகார அறிக்கை

இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின்

எட்டாவது பாராளுமன்றம் - முதலாவது கூட்டத் தொடர்

PARLIAMENTARY DEBATES

OFFICIAL REPORT

THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

EIGHTH PARLIAMENT - FIRST SESSION

253 වන කාණ්ඩය | **தொகுதி 253** | **VOLUME 253**

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 ජූලි 04වන අඟහරුවාදා

2017 யூலை 04, செவ்வாய்க்கிழமை

Tuesday, 04th July, 2017

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.

කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා]

මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.

சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய]

தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,

MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

කථානායකතුමාගේසහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)

(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 ජූලි 03වැනි දින ම'විසින්, "අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF FINANCE COMMISSION

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர்அவர்கள்)

(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017.01.01 දින සිට 2017.03.31 දින දක්වා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපිලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்டபத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக்கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය සහ සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினாவிடுக்கப்பட்டுஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් සහ

2016 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය සහ මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

I

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

2015 අංක 5 දරන, ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග;

2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

2013 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

2013 වර්ෂය සඳහා ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව;

2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව;

2013 වර්ෂය සඳහා සීදුව විජය කුමාරණතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව;

2014 වර්ෂය සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ වාර්ෂික වාර්තාව; සහ

2011 සහ 2012 වර්ෂ සඳහා හෝමියෝපති වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

II

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත්

කෙටුම්පත" සහ "1978 අංක 2 දරන, අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

III

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම නිෂ්පාදන සහ සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "2012 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වාර්ෂික වාර්තාව" සහ "2013 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලංකා ලේලන්ඩ් ලිමිටඩ්හි වාර්ෂික වාර්තාව" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජෝන් අමරතුංග මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜோன் அமரதுங்க - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. John Amaratunga - Minister of Tourism Development and Christian Religious Affairs)

Hon. Speaker, I present a petition received from Mr. M.A.D.F. Joseph of No. 92, Balagalawatta, Hendala, Wattala.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මංගල සමරවීර මහතා - පැමිණ නැත.

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, මාකොල, මාකොල දකුණ, බටුගේවත්ත, ශ්‍රී පැරකුම් මාවත, අංක 462 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජී.එස්.ආර්. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, පානදුර, මහවිල, හොරණ පාර, අංක 151 දරන ස්ථානයෙහි පදිංචි අයි.ඩී. ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) ජාඇල, ඒකල, ජොසිටාවත්ත, අංක 165 දරන ස්ථානයෙහි පදිංචි එම්.ඒ. ක්ලැරන්ස් පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) යක්කල, ඉසුරු මාවත, අංක 68/28 දරන ස්ථානයෙහි පදිංචි මනෝහාරි කළුතන්ත්‍රී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Hon. Speaker, I present a petition from Mr. K.D. Nimal Jayantha of No. 116/4, Kurunduwaththa, Meegoda.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මහනුවර, අරුප්පල ධර්මාශෝක මාවත, පිටිය දේවාල පාර, අංක 29 - ඩී දරන ස්ථානයෙහි පදිංචි ටී.එච්. කරුණාදාස මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. පසුගිය දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණය සම්බන්ධව ගරු සභාවේ අවධානය මා නැවතත් යොමු කරවන්න කැමැතියි. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන්කරන කාල සීමාව පැයක් දක්වා පමණක් සීමා කිරීමට එම රැස්වීමේදී තීරණයක් ගනු ලැබුවා. ඒ නිසා මන්ත්‍රීවරු ප්‍රශ්න ඇසීමේදීත්, ඒවාට පිළිතුරු දීමේදීත් වේලාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. එහෙම නැති වුණොත්, නියමිත කාලය අවසන් වුණාට පසුව අපට ඒ ප්‍රශ්නවලට අදාළ පිළිතුරු සභාගත කරන්න සිද්ධ වනවා.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සිදුව ඇති වංචා හා දූෂණ : පරීක්ෂණවල ප්‍රගතිය

வீடமைப்பு, நிர்மாணத்துறை அமைச்சில் இடம்பெற்ற ஊழல், மோசடி: விசாரணைகளிலான முன்னேற்றம்

FRAUD AND CORRUPTION AT MINISTRY OF HOUSING AND CONSTRUCTION: PROGRESS OF INVESTIGATIONS

921/'16

1. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2011 ජනවාරි සිට 2015 ජනවාරි දක්වා කාලය තුළ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සිදුවී ඇති වංචා, දූෂණ සහ රාජ්‍ය දේපළ අවභාවිතය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමෙන් පරීක්ෂණ පවත්වනු ලබන්නේද;

(ii) එසේ නම්, එම එක් එක් පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම වංචා හා දූෂණවලට අමාත්‍යාංශ නිලධාරීන් සම්බන්ධ බවට හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ විනය ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2011 சனவரி முதல் 2015 சனவரி வரையிலான காலப்பகுதியில் வீடமைப்பு, நிர்மாணத்துறை அமைச்சில் இடம்பெற்றுள்ள ஊழல், மோசடி மற்றும் அரச சொத்துக்களை தவறாக பயன்படுத்துதல் சம்பந்தமாக அமைச்சு மட்டத்தில் விசாரணைகள் மேற்கொள்ளப் படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி ஒவ்வொரு விசாரணையினதும் முன்னேற்றம் யாதென் பதையும்;

(iii) மேற்படி ஊழல் மற்றும் மோசடிகளுடன் அமைச்சின் உத்தியோகத்தர்கள் தொடர்புபட் டுள்ளார்களென இனங்காணப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், இவர்கள் சம்பந்தமாக மேற்கொள் ளப்பட்ட ஒழுக்காற்று நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he inform this House -

(i) whether Ministry-level investigations are conducted on frauds, corruption and misuses of public property that had taken place in the Ministry of Housing and Construction during the period from January, 2011 to January, 2015;

(ii) if so, the progress of each aforesaid investigation;

(iii) whether the Ministry officials who were alleged to have had connections with aforesaid frauds and corruption have been identified; and

(iv) if so, the disciplinary actions that have been taken against them?

(b) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

ඊට අමතරව අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල සිදු වී ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන මට්ටමෙන් මූලික විමර්ශන හා විධිමත් විනය පරීක්ෂණ පවත්වනු ලබයි. තවද, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින්ද පරීක්ෂණ පවත්වනු ලබයි.

(ii) ඇමුණුම I හි "ඇ" තීරය මඟින් හා ඇමුණුම II හි "ඇ" තීරය මඟින් දක්වා ඇත.

(iii) ඔව්.

(iv) ඇමුණුම I හි "ඉ" තීරය මඟින් හා ඇමුණුම II හි "ඇ" තීරය මඟින් මෙම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ඇතැම් නිලධාරීන් සම්බන්ධයෙන් ගෙන ඇති විනය ක්‍රියා මාර්ග දක්වා ඇත. එසේම දැනට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව හා මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මඟින් කරගෙන යනු ලබන ඉහත සඳහන් පරීක්ෂණ අවසානයේ ලබා දෙන තීරණ අනුව අමාත්‍යාංශය මඟින් ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, (අ) (ii) යටතේ අසා ඇති "එක් එක් පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද?" යන්න ඔබතුමා සඳහන් නොකළාට, අඩු ගණනේ කරන පරීක්ෂණ නම් වශයෙන් සඳහන් කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය සඳහා ඉතා දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එම පිළිතුර සභාගත කර තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
කොච්චර විතර තිබෙනවාද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු මන්ත්‍රීතුමනි, එම කොටසට පිළිතුර දෙන්න විනාඩි 10ක් පමණ ගත වෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි 10ක් දෙන්න අමාරුයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා විනාඩි දෙකක් අරගෙන ප්‍රධාන පරීක්ෂණ ටික කියන්න කෝ.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ඔබතුමා ප්‍රධාන පරීක්ෂණ කියන්නේ, සාමාන්‍යයෙන් මොන විධියේ වෛද්‍යතා සම්බන්ධයෙන්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමාට විනාඩි දෙකක් ඇතුළත කියවන්න පුළුවන් ප්‍රමාණය කියවන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විනාඩි ගණන හදලා එහෙම කරන්න අමාරුයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට පරීක්ෂණවල ප්‍රගතිය ඇතුළත් වාර්තාව දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම වාර්තාව බලලා කථා කරන්න. සහයෝගය දෙන්න-

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, එහෙම නම් මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ලෙස අහන්නේ මේකයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියන්න හිටපු අමාත්‍යාවරයා සම්බන්ධ මත්තේගොඩ හා කහතුඩුව නිවාස ව්‍යාපෘතිවල නිවාස ඉදිකිරීම සහ පැවරීම සම්බන්ධයෙන් වූ පරීක්ෂණයට මොකද වෙලා තිබෙන්නේ කියලා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)
ගරු කථානායකතුමනි, මත්තේගොඩ නිවාස ව්‍යාපෘතියේ සහ කහතුඩුව නිවාස ව්‍යාපෘතියේ අර්බුදකාරී නිවාස 6ක් තිබෙනවා. ඒ නිවාස 6 සම්බන්ධයෙන් විස්තර මා ඔබතුමාට කියන්නම්.

1. හේවා ගීගනගේ වත්සලා කුමාරසිංහ, කහතුඩුව නිවාස ව්‍යාපෘතිය, ගෙවා තිබූ මුදල රුපියල් 11,00,000යි, ගෙවීමට ඇති මුදල රුපියල් 74,00,000යි.

2. ඉසුරු තරංග මාලා මුතු රණවීර, කහතුඩුව නිවාස ව්‍යාපෘතිය, ගෙවා තිබූ මුදල රුපියල් 7,00,000යි, ගෙවීමට ඇති මුදල රුපියල් 78,00,000යි.

3. පලාතේ ගෙදර වසන්තා රූපසිංහ, කහතුඩුව නිවාස ව්‍යාපෘතිය, ගෙවා තිබූ මුදල රුපියල් 20,00,000යි, ගෙවීමට ඇති මුදල රුපියල් 78,00,000යි.

4. ප්‍රියන්ත මිලින්ද රත්නායක, කහතුඩුව නිවාස ව්‍යාපෘතිය, ගෙවා තිබූ මුදල රුපියල් 5,00,000යි, ගෙවීමට ඇති මුදල රුපියල් 97,00,000යි.

5. වාදවිචාරිගේ හේමසිරි, මත්තේගොඩ නිවාස ව්‍යාපෘතිය, ගෙවා තිබූ මුදල රුපියල් ලක්ෂ 10,50,000යි, ගෙවීමට ඇති මුදල රුපියල් 89,50,000යි.

6. පල්ලලේපේරුව ගමගේ ආනන්ද ප්‍රියදර්ශන, මත්තේගොඩ නිවාස ව්‍යාපෘතිය, ගෙවා තිබූ මුදල රුපියල් 10,50,000යි, ගෙවීමට ඇති මුදල රුපියල් 91,50,000යි.

ගරු කථානායකතුමනි, නෛතික ගිවිසුමක් අත්සන් නොකොට, අත්තිකාරම් මුදලක් ලබාගෙන මෙම නිවාස ලබා දී තිබුණු අතර ඥාතීන්ට ලබාදුන් නිවාස තුනක් ඕෂන් වීව් සමාගම වෙත ආපසු ලබාගෙන තිබෙනවා.

මිලින්ද රත්නායක යන අයට ලබා දී ඇති නිවස ආපසු ලබා දී නොමැති බැවින්, ඒ සම්බන්ධව කැස්බෑව දිසා අධිකරණයේ අංක 46 නෙරපීම් යටතේ දේපළ සන්තකය පවරා ගැනීමට නඩු පවරා තිබෙනවා. මේ පිළිබඳව විමර්ශන කටයුතු කෙරෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයෙන් මා අහලා තිබෙන්නේ 2011 ජනවාරි සිට 2015 ජනවාරි දක්වා කාලය තුළ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ සිදුවී ඇති වංචා, දූෂණ සහ රාජ්‍ය දේපළ අවභාවිතාව පිළිබඳවයි. ඒ සිදුවීම මේ පාර්ලිමේන්තුවට වාර්තා කරලත් දැන් වසර දෙකකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. ඔය ලැයිස්තුවේ එක නිවසක් තිබෙනවා, ලක්ෂ 74ක් අය විය යුතු. නමුත් එයට ලක්ෂ 11යි ගෙවලා තිබෙන්නේ. ඒ වාගේම, ඔබතුමා කියපු ලැයිස්තුවේ ඉන්නේ හිටපු අමාත්‍ය විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ ඥාතීන්. අක්කා, මස්සිනා, ඒ අක්කාගේ දුව වැනි අය. ඒ අයගෙන් මේ මුදල් අය කර ගන්න තවමත් කටයුතු කර නැත්තේ ඇයි? මේක ඇස් පනාපිට පෙනෙන හොරකමක් නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, මේ නිවාස හයෙන් අපට ගැටලුවක් තිබෙන්නේ අවසාන නිවාසය ගැන විතරයි. අනික් නිවාස පහම නැවත අපේ යටතට අරගෙන තිබෙනවා. මේ කරුණු පිළිබඳව අධිකරණයේ නඩු විභාග වන නිසා අධිකරණයෙන් තීන්දුවක් ලැබෙන තුරු අපට බලා සිටින්න සිදු වෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඒ නිවාස පවරා ගත්තාට වරද නිවැරදි වන්නේ නැහැ. ඔය චෝදනා ලැබූ අයගෙන් ඒ මුදල් අයකර ගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ වාගේම තිබෙනවා, අමාත්‍යාංශය විසින් කැලැන්ඩර් සහ දින පොත් මුද්‍රණය කරලා කළ වංචාව පිළිබඳව. ඒ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියා මාර්ගය මොකක්ද?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க)
(The Hon. Indika Bandaranayake)

ගරු කථානායකතුමනි, ඕෂන්විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම විසින් 2015 වර්ෂය සඳහා දින පොත් හා දින දර්ශන මුද්‍රණය කිරීම වෙනුවෙන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන් ලබාදෙන ලද ඇණවුම් අනුව - අමාත්‍යාංශය විසින් ඕෂන්විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම වෙත සිදුකර ඇති ඉල්ලීම පරිදි- ආයතනවලින් අදාළ මුදල් අය කරගෙන ඉමාෂි පබ්ලිකේෂන් ආයතනය වෙත ගෙවීම් සිදුකර ඇත. ඒ මුදල රුපියල් එක්කෝටි හතලිස්අට ලක්ෂයයි. ඒ සඳහා ගත් ක්‍රියා මාර්ග මේකයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය හා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මේ පිළිබඳව විමර්ශන ආරම්භ කර තිබෙනවා. අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන්ද මේ පිළිබඳව දැනටමත් ප්‍රකාශ ලබාගෙන ඇත. අදාළ විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී.

පළාත් පාලන කොට්ඨාස මායිම් නිර්ණය : අභියාචනා කමිටුව
உள்ளூராட்சித் தொகுதி எல்லைகள் மீள்வரையறை: மேன்முறையீட்டுக் குழு
DEMARCATION OF BOUNDARIES IN LOCAL GOVERNMENT WARDS: APPEAL COMMITTEE

1045/'16

2. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2012 අංක 21 දරන පළාත් පාලන මැතිවරණ පනත ප්‍රකාරව, පළාත් පාලන කොට්ඨාස මායිම් පිළිබඳ අභියාචනා සලකා බැලීමට අභියාචනා කමිටුවක් පත්කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුව විසින් 2016 ඔක්තෝබර් 31 දිනට අභියාචනා සලකා බලා අවසන් කර ඇති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(iv) එම පළාත් පාලන ආයතන සඳහා මෙතෙක් මැතිවරණ නොපැවැත්වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2012ஆம் ஆண்டின் 21ஆம் இலக்க உள்ளூராட்சித் தேர்தல்கள் சட்டத்தின்படி, உள்ளூராட்சித் தொகுதி எல்லைகள் தொடர்பான மேன்முறையீடுகளை ஆராய்வதற்காக மேன்முறையீட்டுக் குழுவொன்று நியமிக்கப்பட்டுள்ளதா;

(ii) ஆமெனில், இக்குழுவினால் 2016 ஒக்டோபர் 31ஆம் திகதியில் உள்ளவாறு மேன்முறையீடுகள் ஆராய்ந்து முடிவுறுத்தப்பட்டுள்ள உள்ளூராட்சி நிறுவனங்களின் எண்ணிக்கை எவ்வளவு;

(iii) மேலே (ii) இல் குறிப்பிடப்பட்டுள்ள உள்ளூராட்சி நிறுவனங்களின் பெயர்கள் யாவை;

(iv) மேற்படி உள்ளூராட்சி நிறுவனங்களுக்கு இதுவரை தேர்தல் நடத்தப்படாதிருப்பது ஏன்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils and Local Government:

(a) Will he inform this House -
(i) whether an appeal committee has been appointed to take into consideration the appeals regarding demarcation of

boundaries in Local Government wards as per the Local Authorities Elections Act, No. 21 of 2012;

(ii) if so, the number of Local Authorities related to which the committee has completed the consideration of appeals as at 31 October 2016:

(iii) the names of the Local Authorities mentioned in (ii) above;

(iv) as to why elections have not yet been held in the aforementioned Local Authorities?

(b) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) පැන නොනඟී.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අන්න උත්තර!

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, පළාත් පාලන මැතිවරණ කොට්ඨාස මායිම් පිළිබඳ අභියාචනා සලකා බැලීමට අභියාචනා කමිටුවකුත් පත්කර නොතිබුණා නම්, මැතිවරණය මෙතරම් කල්යෑමට හේතුව කුමක්දැයි මෙම ගරු සභාවට දැනුම්දෙන්න පුළුවන්ද?

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහලා තිබෙන්නේ යම් පනතක් සම්බන්ධ කරගෙන. පළාත් පාලන ඡන්දය සම්බන්ධයෙන් 2012 අංක 21 දරන පළාත් පාලන මැතිවරණ පනත අදාළ වෙන්නේ නැහැ. එම නිසා ඔබතුමාගේ ප්‍රශ්නය හරියට, "කොහේද යන්නේ මල්ලේ පොල්" වාගෙයි. නීතිඥවරයකු විධියට ඔබතුමා දැනගත යුතුයි, 2012 අංක 21 දරන පනතේ පළාත් පාලන ඡන්දය පිළිබඳව සඳහන් වෙන්නේ නැහැ කියලා. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නත් මෙම මූලික ප්‍රශ්නය තුළින් මතුවිය යුතු නිසා, ඔබතුමා අහන සෑම ප්‍රශ්නයකටම "අදාළ නොවේ" කියලා තමයි මට උත්තර දෙන්න වෙන්නේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු ඇමතිතුමනි, මට ප්‍රශ්නයකට තිබෙන්නේ ඔබතුමාගේ නීති දැනුමයි. අභියාචනා කමිටුව පත් කිරීම ගැන ඒ පනතේ ඉතා පැහැදිලිව සඳහන් වී තිබෙනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා 2012 අංක 21 දරන පළාත් පාලන මැතිවරණ පනත කියවලා තමයි මෙම ප්‍රශ්නය අහන්න ඕනෑ. ඒ පනත පළාත් පාලන මැතිවරණයකට අයිති නැති පනතක්. ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළ පනත මෙය නොවන නිසා, මට ඔබතුමාගේ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, එහෙම නම් ගරු ඇමතිතුමාට උත්තර දෙන්න පුළුවන් ප්‍රශ්නයක් අහන්නම් කෝ. [බාධා කිරීම්] ඒ,මේ කාරණයට අදාළව. ගරු කථානායකතුමනි, එතුමා මෙම පනතේ අංකයක් ගැන-[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාරණයට අදාළ නම් අතුරු ප්‍රශ්නය අහන්න පුළුවන්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
Hon. Speaker, the Act in relation to the Local Government Elections is Act, No. 22 of 2012. The Question which the Hon. Member has asked deals with Act, No. 21 of 2012. So, any අතුරු ප්‍රශ්නයක් අහපු මූලික ප්‍රශ්නයෙන්ම මතු විය යුතුයි. So, when a Question has been asked based on an Act which is not with regard to elections, you cannot ask any questions with regard to that. If I cannot answer the primary question, how can I answer a secondary question?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, 2012 අංක 22 දරන පළාත් පාලන මැතිවරණ පනත යටතේ ප්‍රශ්නය අහන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ ගරු අවධානයට මේ කාරණය යොමු කරනවා. ගරු ඇමතිතුමාට ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, පළාත් පාලන මැතිවරණ පනත නොවෙයි. පනතේ අංකය 22 වෙනුවට 21 යනුවෙන් සඳහන් වුණා කියලායි එතුමාට ප්‍රශ්නය තිබෙන්නේ. මෙවැනි මුද්‍රණ දෝෂයක් මත රැඳිලා ගරු ඇමතිතුමා මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම මහහරිනවා නම්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා නැවත ප්‍රශ්නය ඉදිරිපත් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරයකුගේ අයිතිවාසිකම් රැකීම පිළිබඳව බැඳී සිටින ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරන්න කැමැතියි. මෙතැන අංක 22 වෙනුවට අංක 21 සඳහන් වෙලා. අංකය වැරදිලා. ඒක මුද්‍රණ දෝෂයක්. පළාත් පාලන මැතිවරණ පනතට අදාළව ප්‍රශ්නයක් ඇතිවෙලා නැහැ. පළාත් පාලන මැතිවරණ පනතේ ප්‍රශ්නයක් වෙලා නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒක නැවත raise කරන්න.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
අංක 21 වෙනුවට අංක 22 යනුවෙන් මුද්‍රණය වීමේ ප්‍රශ්නයකුයි තිබෙන්නේ.

මගේ අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
But, he is legally correct.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
අපි අංකය අමතක කරමු. පළාත් පාලන මැතිවරණය පිළිබඳව කථා කරමු. පළාත් පාලන මැතිවරණය පිළිබඳ,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථාව මෙතැනින් නවත්වා වෙනම අවස්ථාවක මේ ගැන නැවත කථා කරමු. [බාධා කිරීම්]

හක්වටුනාව සහ කහල්ල රක්ෂිත: යෝජිත අලිමංකඩ සැලැස්ම

හක්වට්ටුනාව මற்றும் கஹல்ல ஒதுக்கங்கள்: உத்தேச யானைக்கடவைத் திட்டம்

HAKWATUNAWA AND KAHALLA RESERVES: PROPOSED PLAN FOR ELEPHANT PASS

1162/'16

3. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හක්වටුනාව සහ කහල්ල රක්ෂිත යෝජිත අලිමංකඩ සැලැස්ම සකස් කර ඇත්තේ වනජීවී කළමනාකරණ කමිටුවක් මඟින් නම්, එහි සාමාජිකයන්ගේ නම්, ලිපින හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) ඒ පිළිබඳව ක්ෂේත්‍ර අධ්‍යයනයක් කර තිබේ නම්, ඒ කවර කාලයේද; අදාළ වනජීවී කළමනාකරණ කමිටුව හමු වූ ආගමික සහ ප්‍රජා සංවිධාන කවරේද;

(iii) මේ සම්බන්ධයෙන් පරිසර අධ්‍යයනයක් කර තිබේ නම්, ඊට සහභාගී වූපරිසර සංවිධාන/පරිසරවේදීන් කවුරුන්ද;

(iv) එම වාර්තාව ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි සැලැස්මක් සකස් කළ යුතු විද්‍යාත්මක ක්‍රමවේදය කවරේද; යෝජිත සැලැස්ම සකස්කර ඇත්තේ එම ක්‍රමවේදයට අනුවද;

(ii) යෝජිත අලිමංකඩ සැලැස්ම ගජ-මිතුරු සංවිධානය අනුමත කරන ලද්දේ නම්, ඒ කවර කාලයේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සැලැස්ම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් තාවකාලිකව අත්හිටුවා තිබියදී එය නොතකා ප්‍රාදේශීය ලේකම්වරයා ඒ පිළිබඳව මැදිහත්වීම් කරන බවත්;

(ii) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව අභිබවා යෑමට ප්‍රාදේශීය ලේකම්වරයාට බලය පවරා තිබේ නම්, ඒ කවුරුන් විසින්ද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஹக்வட்டுனாவ மற்றும் கஹல்ல ஒதுக்கங்களின் உத்தேச யானைக்கடவைத் திட்டமானது வனசீவராசிகள் முகாமைத்துவக் குழுவொன்று மூலமாக தயாரிக்கப்பட்டிருப்பின் அதன் அங்கத்தவர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் தொழில்வாண்மைத் தகைமைகள் யாவை;

(ii) அது சம்பந்தமாக வெளிக்கள ஆய்வொன்று மேற்கொள்ளப்பட்டிருப்பின் அது எப்போது; சம்பந்தப்பட்ட வனசீவராசிகள் முகாமைத்துவக் குழு சந்தித்த சமய மற்றும் சமுதாய அமைப்புக்கள் யாவை;

(iii) இது சம்பந்தமாக சுற்றாடல் ஆய்வொன்று மேற்கொள்ளப்பட்டிருப்பின் அதில் பங்கேற்ற சுற்றாடல் அமைப்புகள்/ சுற்றாடலியலாளர்கள் யாவர்;

(iv) அவ்வறிக்கையை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இத்தகைய திட்டமொன்று தயாரிக்கப்படவேண்டிய விஞ்ஞானரீதியான முறையியல் யாது; உத்தேச திட்டம் அந்த முறையியலுக்கு அமைவாகவா தயாரிக்கப்பட்டுள்ளதா;

(ii) உத்தேச யானைக்கடவைத் திட்டத்தை கஜ-மித்துறு அமைப்பு அங்கீகரித்திருப்பின் அது எக்காலத்தில் எவரால்;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மேற்படி திட்டம் மாவட்ட இணைப்புக் குழுவினால் தற்காலிகமாக இடைநிறுத்தப்பட்டுள்ள வேளையில் அதனைப் பொருட்படுத்தாமல் பிரதேச செயலாளர் அது சம்பந்தமாக இடையீடு செய்கிறார் என்பதையும்;

(ii) மாவட்ட இணைப்புக் குழுவினை மீறிச்செல்ல பிரதேச செயலாளருக்கு அதிகாரம் கையளிக் கப்பட்டிருப்பின் அது எவரால்;

என்பதை மேலும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

askëd the Minister of Sustainable Development and Wildlife:

(a) Will he inform this House-

(i) the names, addresses and professional qualifications of the members of the Wildlife Management Committee, if the proposed plan for the elephant pass at Hakwatunawa and Kahalla Reserves has been formulated by such a committee;

(ii) the religious and community organizations that have been met with the wildlife management committee; if field study has been conducted in this regard; of the time when; and

(iii) the environmental organizations/ environmentalists who participated in the environment study, if such a study has been conducted in this regard; and

(iv) whether that report would be submitted?

(b) Will he also inform this House-

(i) the scientific method that should be used to formulate a plan like this; whether the proposed plan has been formulated following that method;

(ii) the time when and the persons by whom this plan was approved, if Gaja Mithuru Organization approved it?

(c) Will he further inform this House-

(i) whether further intervention by the Divisional Secretary takes place in this regard despite the temporary suspension of the plan by the District Coordinating Committee; and

(ii) if the Divisional Secretary has been authorized to override the District Coordinating Committee, who granted him such authority?

(d) If not, why?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) කමිටු සාමාජිකයින්ගේ නම්:

* කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ (කුරුණෑගල) - සභාපති

අධ්‍යක්ෂ, පළාත් වාරිමාර්ග කාර්යාලය, කුරුණෑගල.

* වනජීවී සහකාර අධ්‍යක්ෂ (වයඹ පළාත)

වනජීවී සහකාර අධ්‍යක්ෂ, වනජීවී කාර්යාලය, වයඹ පළාත.

* ප්‍රාදේශීය ලේකම් (පොල්පිතිගම)

ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොල්පිතිගම.

* ගරු සභාපති (පොල්පිතිගම ප්‍රාදේශීය සභාව)

සභාපති, පොල්පිතිගම ප්‍රාදේශීය සභාව.

* දිසා වන නිලධාරි (කුරුණෑගල)

දිසා වන නිලධාරි, දිසා වන නිලධාරි කාර්යාලය, කුරුණෑගල.

* පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ (වයඹ පළාත)

කෘෂිකර්ම අධ්‍යක්ෂ, පළාත් කෘෂිකර්ම කාර්යාලය, වයඹ පළාත.

* පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ පළාත)

ඉඩම් කොමසාරිස්, පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, වයඹ පළාත.

* පළාත් පරිසර අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (වයඹ පළාත)

නියෝජ්‍ය අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය, වයඹ පළාත.

* දිස්ත්‍රික් ඉඩම් පරිහරණ හා සැලසුම් නිලධාරි (කුරුණෑගල)

ඉඩම් පරිහරණ හා සැලසුම් නිලධාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල.

(ii) කමිටු සාමාජිකයන් විසින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් 2009.04.29 දින සිදු කර ඇති අතර, හමුවූ ආගමික හා ප්‍රජා සංවිධාන පිළිබඳ සඳහන් කර නොමැත.

(iii) පරිසර අධ්‍යයනයක් සිදු කර නොමැත.

(iv) අදාළ නොවේ.

(ආ) (i) වන අලින්ට ප්‍රවේශ විය හැකි පරිදි විදුලි වැට මාර්ගය වෙනස් කිරීම සිදු කළ යුතුව ඇති අතර, යෝජිත සැලැස්ම ඒ අනුව සකස් කර ඇත.

(ii) නොදනී.

(ඇ) (i) යෝජිත වයඹ ඇළ ව්‍යාපෘතිය මඟින් කහල්ල පල්ලේකැලේ අභය භූමිය තුළ සිදු කරන ඉදි කිරීම් නිසා වන අලින්ට අහිමි වන භූමිය වෙනුවට හක්වටුනාඔය ජලාශය රක්ෂිතය වන අලින් සඳහා වෙන් කළ යුතු බැවින්ද, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම ජාතික අවශ්‍යතාවක් බැවින්ද, ප්‍රාදේශීය ලේකම්වරයා මැදිහත්ව ඇත.

(ii) නොදනී.

(ඈ) අදාළ නොවේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාගේ පිළිතුරෙන්ම පැහැදිලි වෙනවා, මේ ප්‍රශ්නය මිනිසුන් දසදහසකට පමණ අදාළ, ගම්මාන හැට ගණනකට බලපාන, දිගුකාලීනව තිබෙන ප්‍රශ්නයක් බව. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ නිලධාරීන් ක්ෂේත්‍ර පරීක්ෂණය කරලා තිබෙන්නේ 2009 දී බවත්, පරිසර අධ්‍යයන වාර්තාවක් සකස් කර නැති බව ඔබතුමා පිළිගන්නා බවත් මේ පිළිතුර අනුව පෙනෙනවා. ඔබතුමා නැවත ක්ෂේත්‍ර පරීක්ෂණයක් නොකරන්නේ ඇයි, පරිසර අධ්‍යයන වාර්තාවක් සකස් නොකරන්නේ ඇයි කියලා මගේ පළමුවන අතුරු ප්‍රශ්නය විධියට මම අහන්න කැමැතියි. පරිසර අධ්‍යයන වාර්තාව හරියාකාරව සකස් නොකර කටයුතු කිරීම නිසා තමයි බණ්ඩාරවෙල ගිලා බැහැලා තිබෙන්නේ. එසේ නොකර මේ කටයුත්ත කරන්න ඔබතුමාට බලයක් නැහැ නේද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, පවුල් 13ක ප්‍රශ්නයක් මෙතැන තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ ප්‍රශ්නය ගැන මීට ඉස්සෙල්ලාත් කථා කළා නේද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ඔව්, ගරු කථානායකතුමනි. මෙතුමන්ලා මේ ප්‍රශ්නය කරකවමින් අඹරනවා. මිරිස් ගලේ දාලා අඹරනවා, කොච්චි අඹරනවා වාගේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා අතුරු ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුත්තට අදාළ සම්පූර්ණ පරිසර වාර්තාවක් ඉදිරිපත් කිරීමට මා අදාළ නිලධාරීන්ට නියම කරනවා.

මෙතැන තිබෙන්නේ පවුල් 13ක ප්‍රශ්නයක්. වාරිමාර්ග ක්ෂේත්‍රයේ මහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනවා. මේ ව්‍යාපෘතිය සඳහා ජලය ගෙනෙන්නේ කළු ගඟෙන්. මම මීට ඉස්සෙල්ලාත් කිව්වා, යාපහුවේ මිනිසුන්ට වතුර බින්දුවක්වත් නැහැ කියලා. දැඳුරු ඔය ජලාශය තිබෙනවා. දැඳුරු ඔය ජලාශය තිබෙන්නේ යාපහුව මායිමේ. නමුත් දැඳුරු ඔය ජලාශයෙන් යාපහුවට වතුර බින්දුවක්වත් ලැබෙන්නේ නැහැ. යාපහුවේ වැව් හයසිය ගණනක් තිබෙනවා. යාපහුව කියන්නේ ශුෂ්ක ප්‍රදේශයක්. සමෘද්ධි දීමනාව ලබාගෙන තමයි යාපහුවේ බහුතරයක් ජනතාව ජීවත් වෙන්නේ. මේ යෝජනා ක්‍රමය යටතේ වැව් හයසිය ගණනකට ජලය ලබා දීලා මේ වියළි භූමිය තෙත් භූමියක් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ආකාරයට මෙතැන පරිසර ප්‍රශ්නයක් ඇත්තේම නැහැ. හක්වටුනාව ඔය ඉස්මත්තේ ගොවියෝ අවුරුදු 40ක ඉඳලා වගා කරනවා. දැන් ඒක ගොඩ වෙලා. ගලේවෙල ඉඳලා කලාවැවට එනකම් අක්කර හැටදහසක් තිබෙනවා. [බාධා කිරීමක්] එවකට වයඹ පළාත් සභාවේ ප්‍රධාන ඇමති මම, මහාචාර්ය සරත් තොටගම Director of the Department of Wildlife Conservation. [බාධා කිරීමක්] ඒක තහනම් කරලා reserve එකක් කළා. [බාධා කිරීමක්] ඔබතුමාට අවශ්‍ය නම් පරිසර වාර්තාවක් ලබා දෙන්නම්. ගරු මන්ත්‍රීතුමා, මෙතැන තිබෙන්නේ පවුල් 13ක ප්‍රශ්නයක්. මේ ව්‍යාපෘතිය නිසා කාටවත් අසාධාරණයක් වෙන්නේ නැහැ. කිසිම පාරිසරික ප්‍රශ්නයක් නැහැ, Hakwatuna Oya Reserve එකේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු මන්ත්‍රීතුමා, දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පවුල් 13ක කථාව සම්පූර්ණයෙන්ම බොරුවක්. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, ඇහුම් කන් දෙන්න කෝ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මට කාලය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, දැඳුරු ඔය ව්‍යාපෘතියත් සමඟ හෝ වයඹ ඇළ ව්‍යාපෘතියත් සමඟ මෙහි කිසිම සම්බන්ධයක් නැහැ. ගරු ඇමතිතුමා, යන්නේ කොහේද අහපුවාම මල්ලේ පොල් කියනවා වාගේ උත්තරයක් දෙන්නේ. වයඹ ඇළ ව්‍යාපෘතිය කරන්නට වයඹ ඇළ අවශ්‍යයි. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, පොඩ්ඩක් ඇහුම් කන් දෙන්න කෝ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්නය අහන්න දෙන්න. [බාධා කිරීමක්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ප්‍රශ්නය අහන්නේ නැතිව උත්තර දෙන්නේ කොහොමද? [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා, ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න කෝ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ගම් 64ක මරණාධාර සමිති 64ක් - උදාහරණයට මරණාධාර සමිතිය ගන්නේ ඕනෑම ගමක තිබෙන ලොකුම සමිතිය මරණාධාර සමිතිය වන නිසා.- මේ පෙත්සමට

අත්සන් කර තිබෙනවා, එම සැලැස්ම ක්‍රියාත්මක කරන්න එපා කියා. ඒ, එක් පාර්ශ්වයක්. දෙවනුව, පාසල් 14ක විදුහල්පතිවරු ඇතුළු ආචාර්ය මණ්ඩලය අත්සන් කර තිබෙනවා, එම සැලැස්ම ක්‍රියාත්මක කරන්න එපා කියා. ඒ වාගේම, පක්ෂ තුනේම මන්ත්‍රීවරු අත්සන් කර තිබෙනවා, එය ක්‍රියාත්මක කරන්න එපා කියා. ගරු කථානායකතුමනි, ඒකයි කතාව. නමුත්, පවුල් 13ක් ගැන තමයි කවුරුන් හෝ ගරු ඇමතිතුමාට කියා තිබෙන්නේ. මිනිස්සු යෝජනා කරන්නේ මොකක්ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න, මේ ගැන පැහැදිලි කරන්න ඕනෑ නිසා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහන්න. එතකොට ගරු අමාත්‍යතුමා පිළිතුර දේවි.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු අමාත්‍යතුමනි, මිනිසුන් යෝජනා කරන දේ මා කියන්නම්. අක්කර 50,000ක් වන එම කැලේ අලි 563ක් ඉන්නවා. අලි 22ක් ගම් වැදිලා ඉන්නවා. මිනිස්සු යෝජනා කරන්නේ මොකක්ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, දැන් ඔබතුමා ප්‍රශ්නය දන්නවා නේ. ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
පවුල් 13ක ප්‍රශ්නයක් නොවෙයි මෙය. ගරු අමාත්‍යතුමා හඳුන්නේ, තවත්- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පිළිතුර දෙන්න, ගරු අමාත්‍යතුමා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, කාට කාටත් ගිහින් -අමුඩ ගහගෙන ගිහින්- අත්සන් ගන්න පුළුවන්. කිසිම ගමකට, මේ ජලාශයෙන් බාධාවක් නැහැ. පවුල් 13කටයි ඉවත් වන්න සිදු වන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඔය කියන කාරණය ගැන නොවෙයි මා අසා තිබෙන්නේ අලි මංකඩක් ගැනයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ඕනෑ තරම් අත්සන් ගන්න කියන්න. "සයිටම්" එක සම්බන්ධයෙන් කරනවා වාගේ උද්ඝෝෂණ කරන්න. ගරු කථානායකතුමනි, මා පැහැදිලිව, වගකීමෙන් මේ ගරු සභාවේ කියනවා, කිසිදු ගම්මානයක් ඉවත් වන්නේ නැහැ කියා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දන්නවා, ප්‍රධාන ඇමති විධියට හිටපු කාලයේ මමයි ඔය කියන ස්ථානය දියුණු කළේ කියා. ඔබතුමා එය දන්නවා. ඉවත් වන්න සිදු වන පවුල් 13ටත් මා කියා තිබෙනවා- [බාධා කිරීමක්] මේ ගරු සභාවේ කිව්වා, තේක්ක ගහට, කොස් ගහට, දෙල් ගහට, පොල් ගහට පවා වන්දි ගෙවනවා කියා. මා නොවෙයි, මහවැලි හා වාරිමාර්ග- [බාධා කිරීමක්] මා මෙයට උත්තර දුන්නාට, මා නොවෙයි- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ කාරණය සම්බන්ධයෙන් මත දෙකක් තිබෙනවා. ඔබතුමන්ලා කතා කරගෙන මේ ගැටලුව විසඳාගන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔය කියන පෙත්සම අත්සන් කරගෙන ගිහින්- [බාධා කිරීමක්] ඒ ප්‍රාදේශීය ලේකම් හරිම එඩිතර කෙනෙක්.

කෙළින් සිටි නිලධාරියෙක්. මම එතුමාට ගරු කරනවා. අද පොළොන්නරුව අතිරේක ලේකම් වෙලා ගිහිල්ලා ඉන්නවා. එතුමාට මරණ තර්ජන ආවා. භය වුණේ නැහැ. ඒ වාගේ නිලධාරින් තමයි අපට ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම මේ සම්බන්ධයෙන් රටේ අග්‍රාමාත්‍යවරයාගෙන්, නැත්නම් ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ඇමතිතුමා පිළිගත්තා 2009න් පස්සේ අඩු ගණනේ මෙතැන ක්ෂේත්‍ර පරීක්ෂණයක්වත් කරලා නැහැයි කියා. ලොකු ව්‍යාපෘතියක් කරනවා, අඩු ගණනේ පරිසර අධ්‍යයන වාර්තාවක් ලබා ගෙන නැහැ. තමුන්නාන්සේට නීති කඩලා වැඩ කරන්න බලයක් නැහැ. ඒ නිසා අඩු ගණනේ තමුන්නාන්සේ මේ ව්‍යාපෘතිය කරන්න කලින් පරිසර අධ්‍යයන වාර්තාවක් ගන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(මාණ්පුමිකු කාමිණි ජූයවික්‍රම පෙරේරා)
(The Hon. Gamini Jayawickrama Perera)
මේවාට උත්තර දෙන්න ඕනෑ මම නොවෙයි. හක්වටුනාව අයිති මට නොවෙයි, වාරිමාර්ග අමාත්‍යාංශයටයි. මේ කියන ව්‍යාපෘති සම්බන්ධයෙනුත් ඉදිරියේදී වාර්තා ලබා දෙන්න කටයුතු කරනවා. වාරිමාර්ග අමාත්‍යාංශයට අයිති ජලාශ සම්බන්ධයෙන් වාර්තා ලබා දීම මහවැලි සංවර්ධන අධිකාරිය භාර ගන්නවා ඇති. ඒ ජලාශ ටිකත්, කළු ගහෙන් එන වතුර- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනවා.

වව්නියා දිස්ත්‍රික්කයේ ගොවි බිම් : විස්තර
வவுனியா மாவட்ட விவசாய நிலங்கள்: விபரம்
AGRICULTURAL LANDS IN VAVUNIYA DISTRICT: DETAILS

1181/'16

4. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) වව්නියාව දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්මය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) வவுனியா மாவட்டத்தில்,

(i) 1983 ஆம் ஆண்டளவில் செய்கைபண்ணப்பட்ட மொத்த விவசாய நிலங்களின் அளவு யாது;

(ii) 1982 மற்றும் 1983ஆம் ஆண்டுகளில் செய்கைபண்ணப்பட்ட விவசாய நிலங்களின் அளவு ஒவ்வொரு பயிருக்கிணங்கவும் வெவ் வேறாக எவ்வளவு;

(iii) 1983 ஆம் ஆண்டின் பின்னர் 2009 ஆம் ஆண்டில் யுத்தநிலைமை முற்றுப்பெறும்வரை செய்கை பண்ணப்பட்ட மொத்த நிலங்களின் அளவு ஒவ்வோராண்டுக்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(iv) யுத்த நிலைமை முற்றுப்பெற்ற பின்னர் இற்றைவரை செய்கைபண்ணப்பட்ட விவசாய நிலங்களின் அளவு ஒவ்வோராண்டுக் கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முழுமையான அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House, in respect of the Vavuniya District -

(i) the extent of agricultural land that was under cultivation by the year 1983;

(ii) the extents of agricultural land cultivated in the 1982 and 1983, separately in respect of each crop in each year;

(iii) the total extent of cultivated land in each year after 1983 up until the end of the war situation in 2009, separately;

(iv) the total extent of cultivated land after the end of the war situation up until now in each year, separately; and

(v) whether he will table a full report on all above?

(b) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i)

1983 වර්ෂය	
වගාව	වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්.)
වී වගාව	14,731
අතිරේක භෝග වගාව	2,930
එළවළු වගාව	442
පළතුරු වගාව	544
එකතුව	18,647

(ii)

1982 වර්ෂය		1983 වර්ෂය	
බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
වී	13,942	වී	14,731
අතිරේක බෝග		අතිරේක බෝග	
i කුරක්කන්	168	i කුරක්කන්	276
ii. බඩඉරිඟු	167	ii. බඩඉරිඟු	166
iii. මෙනේරි	392	iii. මෙනේරි	3
Iv. මුං	174	Iv. මුං	198
v. කවුපි	608	v. කවුපි	573
vi. තල	2,189	vi. තල	387
vii. රටකජු	305	vii. රටකජු	222
viii. මඤ්ඤොක්කා	336	viii. මඤ්ඤොක්කා	258
ix. බතල	45	ix. බතල	12
x. අර්තාපල්	1	x. අර්තාපල්	2
xi. රතුළඟු	228	xi. රතුළඟු	232
xii. අමුමිරිස්	742	xii. අමුමිරිස්	601
xiii. ඉදුල් ඉරිහු	2	xiii.ඉදුල් ඉරිහු	0
උප එකතුව	5,357	උප එකතුව	2,930

1982 වර්ෂය		1983 වර්ෂය	
බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
ඵලවළු		ඵලවළු	
i. අළුකෙසෙල්	86	i අළු කෙසෙල්	73
ii. වම්බටු	121	ii. වම්බටු	106
iii. වට්ටක්කා	90	iii. වට්ටක්කා	56
iv. බණ්ඩක්කා	76	iv. බණ්ඩක්කා	80
v. පුහුල්	28	v. පුහුල්	19
vi. කරවිල	36	vi. කරවිල	35
vii. පතෝල	16	vii. පතෝල	18
viii. පිපිඤ්ඤා	23	viii. පිපිඤ්ඤා	11
ix. තක්කාලි	37	ix. තක්කාලි	28
x ගෝවා	10	x. ගෝවා	10
xi. බෝංචි	10	xi. බෝංචි	3
xii. බීට්රූට්	5	xii. බීට්රූට්	3
උප එකතුව	538	උප එකතුව	442
පළතුරු		පළතුරු	
i කෙසෙල්	වාර්තා වී නැත	i කෙසෙල්	170
ii ගස්කජු	වාර්තා වී නැත	ii ගස්කජු	103
iii දෙහි	වාර්තා වී නැත	iii දෙහි	49
iv අඹ	වාර්තා වී නැත	iv අඹ	144
v දොඩම්	වාර්තා වී නැත	v දොඩම්	37
vi පැපොල්	වාර්තා වී නැත	vi පැපොල්	41
උප එකතුව	වාර්තා වී නැත	උප එකතුව	544
වර්ෂය තුළ මුළු වගාබිම් එකතුව	19,837	වර්ෂය තුළ මුළු වගාබිම් එකතුව	18,647

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

(iii)

වර්ෂය	බෝගයන් අනුව වගා කළ භූමි ප්‍රමාණයන්(හෙක්.)				වර්ෂය තුළ වගා කළ මුළු බිම් ප්‍රමාණය(හෙක්.)
	වී	අතිරේක බෝග	ඵලවළු	පළතුරු	
1984	19,502	919	249	561	21,231
1985	11,901	4,570	333	550	17,354
1986	9,934	2,859	232	479	13,504
1987	4,973	6,090	335	261	11,659
1988	7,462	6,147	326	202	14,137
1989	3,119	4,696	462	338	8,615
1990	3,274	4,191	209	0	7,674
1991	465	0	0	0	465
1992	4,801	3,520	104	6	8,431
1993	6,094	4,976	275	255	11,600
1994	8,241	4,501	250	260	13,253
1995	8,889	4,965	290	190	14,334
1996	6,308	2,168	300	198	8,974
1997	3,176	4,055	295	190	7,716
1998	5,158	3,886	231	160	9,435
1999	7,017	2,936	250	160	10,363
2000	7,035	1,990	321	162	9,508
2001	7,340	2,235	262	160	9,997
2002	6,783	2,285	334	188	9,590
2003	9,526	2,642	441	179	12,788
2004	8,234	2,174	326	176	10,910
2005	9,772	3,897	1,034	729	15,432
2006	10,051	4,114	960	526	15,651
2007	4,650	3,065	1,035	346	9,096
2008	11,390	3,668	1,109	353	16,520
2009	6,962	5,363	988	650	13,964
එකතුව	192,057	91,912	10,952	7,279	302,200

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

(iv)

වර්ෂය	බෝගයන් අනුව වගා කළ භූමි ප්‍රමාණයන් (හෙක්ටයාර්)				වර්ෂය තුළ වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්.)
	වී	අතිරේක බෝග	ඵලවළු	පළතුරු	
2010	5,664	4,359	481	88	10,592
2011	17,960	3,582	742	465	22,750
2012	17,150	3,383	880	725	22,138
2013	23,300	5,410	898	904	30,512
2014	9,934	4,069	1,000	650	15,654
2015	22,563	5,621	940	1,205	30,329
2016	20,849	5,745	1,333	1,038	28,965
එකතුව	117,420	32,170	6,275	5,074	160,939

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This reply is also placed in the Library.]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, පසු ගිය පාර්ලිමේන්තු වාරයේදීත් මා ඔබතුමාගේ අවධානයට මෙම කරුණ යොමු කළා. මේ පාර්ලිමේන්තුවේදී අපි කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අසන ප්‍රශ්නවලට උත්තර දෙන්න කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයා බැඳී සිටිනවා. නමුත්, ඒ සඳහා එතුමා පාර්ලිමේන්තුවට එන්නේ නැහැයි කියන කාරණය අපි ඔබතුමාගේ අවධානයට යොමු කළා. මට ගරු වසන්ත අලුවිහාරේ කෘෂිකර්ම රාජ්‍ය ඇමතිතුමා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. එතුමා රාජ්‍ය ඇමතිවරයා හැටියට පාර්ලිමේන්තුවට ආවා. කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අපි අසන ප්‍රශ්නවලට එතුමා කොහොමටත් උත්තර දෙනවා. ගරු කථානායකතුමනි, ඒ අනුව මා ඉහතින් සඳහන් කළ කාරණය නැවතත් මා ඔබතුමාට අවධාරණය කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, මා නැවතත් ගරු සභානායකතුමාගේ අවධානයට එම කරුණ යොමු කරනවා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

කෘෂිකර්ම ඇමතිතුමා විදේශගත වෙලා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කෘෂිකර්ම රාජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කරපු වාර්තාව අනුව පෙනෙනවා, යුද්ධය නිම වීමෙන් පසුව වව්නියාව දිස්ත්‍රික්කය තුළ සියලුම බෝග වගාවන්හි වර්ධනයක් සිදු වී තිබෙන බව. වියළි කලාපීය ප්‍රදේශවල ගොවිතැන් බත් කරපු, සුළු අපනයන බෝග වගාවන්හි යෙදුණු ජනතාව 2014 අවුරුද්දේ පැවති නියඟය හේතුවෙන් පීඩා වින්දා. ඒ

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

නිසා එම කාලය තුළ වගා කරපු ඉඩම් ප්‍රමාණය අඩු වී තිබෙනවා. මෙම ප්‍රදේශවල ගොවි ජනතාව පසු ගිය මාස කීපය තුළ පැවති දැඩි නියඟය නිසාත් පීඩා විඳිනවා. ඒ දිස්ත්‍රික්කයට බලපෑ නියඟය හේතුවෙන් ගොවීන් වෙනුවෙන් ගෙවන ලද වගා වන්දි ප්‍රමාණය කොපමණද කියා ඔබතුමාට දැන් මේ ගරු සභාවට ඉදිරිපත් කළ හැකිද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ අතුරු ප්‍රශ්නය මුල් ප්‍රශ්නය යටතේ අහලා නැහැ. වගා කරපු ඉඩම් ප්‍රමාණය වෙනුවෙන් අපි කොච්චර වන්දි ප්‍රමාණයක් ගෙවා තිබෙනවාද කියලා මට ඔබතුමාට ඉදිරිපත් කරන්න පුළුවන්. මේ කාරණය ගැන මුල් ප්‍රශ්නයෙන් අහලා තිබුණා නම් අපි ඒ සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. බොහෝ දිස්ත්‍රික්කවල ගොවීන්ට නියමිත කාලයේදී - කන්න දෙකේදී - පොහොර සහනාධාරය නොලැබීමේ ගැටලුව පිළිබඳව අපට පසුගිය දිනවලත් වාර්තා වුණා. ගොවිජන කේන්ද්‍ර හරහා වාගේම ගොවිජන සංවර්ධන නිලධාරීන් හා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරුන් එක්ක තමුන්නාන්සේලා මේ කටයුත්තට මැදිහත් වී සිටිනවා. ඒ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, බොහෝ දිස්ත්‍රික්කවල තවම මේ ගැටලුව විසඳිලා නැහැ. ඒ කන්නයට අවශ්‍ය පොහොර ටික ගන්න ගොවීන්ට බැරිවෙලා තිබෙනවා. පසු ගිය ආණ්ඩුව විසින් ලබා දෙන ලද පොහොර සහනාධාරය වෙනුවට තමුන්නාන්සේලා දැන් මුදල් ලබා දෙනවා. නමුත් ඒ මුදල නියමිත කලට ගොවීන්ට ලැබෙන්නේ නැහැ. මේ වෙනුවෙන් ඔබතුමන්ලා අරගෙන තිබෙන පියවර කුමක්ද? මේ දිස්ත්‍රික්කය තුළ සිටින සමස්ත ගොවීන්ට ගෙවන ලද පොහොර සහනාධාරයේ ප්‍රමාණය කොපමණද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයේ ඒ අතුරු ප්‍රශ්නය සඳහන් වෙලා නැහැ. නමුත් ඒ ගොවීන්ට පොහොර සහනාධාරය ලැබී නැත්නම්, අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධව මොකක් හරි ගැටලුවක් ඇති. සමහර විට ඉල්ලුම්පත්‍රවල අඩුපාඩු ඇති. ඒ හැරුණු විට අනෙක් සියලු දෙනාටම ගෙවා තිබෙනවා. අපට ඒ නම් ලැයිස්තුව දෙන්න. අපි ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මාගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු කාරණා අනුව මට මේ වෙලාවේ ගැටලුවක් මතු වුණා. මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තඹාන කියන අති දුෂ්කර ගම්මානය තුළ පොහොර සහනාධාරය නොලැබුණු පවුල් සංඛ්‍යාවක් සිටින බව පසුගිය සතියේ මට වාර්තා වුණා. ඒකට හේතුව ඔබතුමා ඔය කියපු කාරණා නොවෙයි. ඔවුන් නිසි පරිදි forms පුරවලා, ඒ forms ගොවිජන සේවා නිලධාරීන්ට භාර දීලා, ගොවිජන සේවා කොමසාරිස්ට යවලා තිබෙනවා. ඒ අය ඔබතුමන්ලා අත්සන් කරන්න දීපු සමස්ත ලේඛනයක් අත්සන් කරලා යවපු අය. ඔබතුමන්ලාගේ කාර්ය පටිපාටියෙන් මේ වතාවේ ගොවියා විශාල වශයෙන් අර්බුදයකට ලක් කරලා තිබෙනවා. විශාල අත්සන් ප්‍රමාණයක් යොදන්න තිබෙනවා. ඒවාට කටයුතු කරලා, photos ගහලා, identity cards හදලා, ඒ ඔක්කෝම කරලා තමයි එවලා තිබෙන්නේ. එහෙම කරලාත් නිසි වෙලාවට කන්නයට පොහොර සහනාධාරය නොලැබුණු ගොවීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ඔබතුමන්ලා රටේම වාර්තා අරගෙන බලන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ඒ අයට පොහොර සහනාධාරය දෙන්න ලැහැස්තියි නේද, ගරු රාජ්‍ය ඇමතිතුමනි? ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ නම් ලැයිස්තුව ඇමතිතුමාට ඉදිරිපත් කරන්න. එතකොට ගෙවයි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු කථානායකතුමනි, දෙන්න ලැහැස්තියි. පොහොර සහනාධාරය හම්බ වුණේ නැති අයගේ නම් ලැයිස්තුව එවන්න. එතකොට අවශ්‍ය පියවර ගන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ජාතික හා පළාත් පාසල් විදුහල්පතිවරු: මාතර දිස්ත්‍රික්කය

தேசிய மற்றும் மாகாணப் பாடசாலை அதிபர்கள்: மாத்தறை மாவட்டம்
PRINCIPALS IN NATIONAL AND PROVINCIAL SCHOOLS: MATARA DISTRICT

1297/'16

5. ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයට අයත් ශ්‍රේණිධාරී විදුහල්පතිවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ශ්‍රේණිය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික හෝ පළාත් පාසල්වල ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරීන් නොවන පුද්ගලයන් විදුහල්පති ධුරයන් දරන්නේද;

(iv) එසේ නම්, එම පාසල් කවරේද;

(v) විදුහල්පති ශ්‍රේණියක් ලබා ඇති මුත්, විදුහල්පති ධුරයක් නොලබා මාතර දිස්ත්‍රික්කයේ ජාතික හා පළාත් පාසල්වල සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(vi) ඉහත (v) සඳහා හඳුනාගත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் தேசிய மற்றும் மாகாணப் பாடசாலைகளில் பணியாற்றும் இலங்கை அதிபர் சேவையில் தரநிலைப் படுத்தப்பட்ட அதிபர்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி எண்ணிக்கை ஒவ்வொரு தரத்துக்கும் அமைவாக வெவ்வேறாக யாது;

(iii) மாத்தறை மாவட்டத்தின் தேசிய அல்லது மாகாண பாடசாலைகளில் இலங்கை அதிபர் சேவையில் தரநிலைப்படுத்தப்படாத ஆட்கள் அதிபர் பதவிகளை வகிக்கின்றார்களா;

(iv) ஆமெனில், அப்பாடசாலைகள் யாவை;

(v) அதிபர் தரத்தைப் பெற்றுள்ளபோதிலும், அதிபர் பதவியைப் பெறாது மாத்தறை மாவட்டத்தின் தேசிய மற்றும் மாகாண பாடசாலைகளில் பணியாற்றும் ஆட்களின் எண்ணிக்கை யாது;

(vi) மேலே (v) இன் பொருட்டு இனங்காணப் பட்டுள்ள காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of principals in the Sri Lanka Principals' Service with principal grades, serving in National and Provincial Schools of the Matara District;

(ii) separately on per grade basis, of the number mentioned above;

(iii) whether any person without principal grades in the Sri Lanka Principals' Service are serving as principals in any national or provincial school in the Matara District;

(iv) if so, the names of such schools;

(v) the number of persons serving in national and provincial schools in the Matara District in positions other than the post of Principal with Sri Lanka Principals' Service grade; and

(vi) the reasons identified as causes of (v) above?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)

(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජාතික පාසල්වල 80 දෙනෙකුත්, පළාත් පාසල්වල 376 දෙනෙකුත් සමඟ මුළු ශ්‍රේණිධාරී විදුහල්පතිවරු සංඛ්‍යාව 456 දෙනෙකි.

(ii) විදුහල්පතිවරුන් අධ්‍යාපන පරිපාලන සේවයෙන් හා විදුහල්පති සේවයේ I, II, III ශ්‍රේණිවලින් පත් කරනු ලබයි.

අධ්‍යාපන පරිපාලන සේවය - ජාතික පාසල් - 15
පළාත් පාසල් - 00

විදුහල්පති I ශ්‍රේණිය - ජාතික පාසල් - 14
පළාත් පාසල් - 46

විදුහල්පති II ශ්‍රේණිය - ජාතික පාසල් - 52
පළාත් පාසල් - 100

විදුහල්පති III ශ්‍රේණිය - ජාතික පාසල් - 02
පළාත් පාසල් - 230

ඒ අනුව මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල අධ්‍යාපන පරිපාලන සේවයේ 15දෙනෙක්ද, විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ 14දෙනෙක්ද, II ශ්‍රේණියේ 52දෙනෙක්ද, III ශ්‍රේණියේ දෙදෙනෙක්ද විදුහල්පති තනතුරු දරයි.

පළාත් පාසල්වල අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් විදුහල්පති තනතුරු නොදරන අතර විදුහල්පති සේවයේ I ශ්‍රේණියේ 46දෙනෙක්ද, II ශ්‍රේණියේ 100දෙනෙක්ද, III ශ්‍රේණියේ 230දෙනෙක්ද විදුහල්පති තනතුරු දරයි.

(iii) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල ශ්‍රේණිධාරීන් නොවන පුද්ගලයන් විදුහල්පති ධුර දරන්නේ නැත.

පළාත් සභා පාසල්වල ශ්‍රේණිධාරී නොවන අය විදුහල්පති ධුර දරයි.

(iv) මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාසල්වල මාතර කලාපයේ පළාත් පාසල් 12කද, මුලටියන කලාපයේ පාසල් 35කද, දෙනියාය කලාපයේ පාසල් 21කද, අකුරැස්ස කලාපයේ පාසල් 24කද ශ්‍රේණිධාරී නොවන පුද්ගලයන් 92දෙනෙක් විදුහල්පති ධුර දරයි.

එම පාසල් ලැයිස්තුව ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම **සභාගත *** කරමි.

(v) මාතර දිස්ත්‍රික්කයේ ජාතික පාසල්වල විදුහල්පති ශ්‍රේණියක් ලබා ඇති නමුත්, 67දෙනෙකු විදුහල්පති ධුර ලබා නැත. මෙම අය විදුහල්පති පත්වීම් භාර නොගෙන ගුරු සේවයේම තවදුරටත් සිටීමින් අදාළ ජාතික පාසල්වල සේවය කරනු ලබයි.

පළාත් සභා පාසල්වල 179දෙනෙකු විදුහල්පති ශ්‍රේණිධාරීන් වුවද, විදුහල්පති ධුර ලබා නොමැත.

ගරු මන්ත්‍රීතුමනි, පළාත් ලේකම් එවලා තිබෙන පිළිතුරයි මම මේ කියන්නේ.

(vi) ඉහත ප්‍රශ්නය සඳහා හඳුනා ගත් හේතු,

2016 මැයි මාසයේදී බඳවා ගන්නා ලද විදුහල්පති සේවයේ III පන්තියේ නිලධාරීන් 4356දෙනා අතරින් දකුණු පළාත වෙත 527දෙනෙකු පළාත් සභා පාසල් වෙත ස්ථානගත කිරීම සඳහා ලබා දෙන ලදි.

මෙම නිලධාරීන්ද ඇතුළුව මාතර දිස්ත්‍රික්කයේ සමහර ශ්‍රේණිධාරීන් වෙත විදුහල්පති ධුර

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

> නොලැබීමට හේතු දකුණු පළාත් ලේකම් විසින් මා වෙත වාර්තා කර ඇත.
>
> පාසල්වල විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති, සහකාර විදුහල්පති යන තනතුරු තුන සඳහාම පත් කළ යුතු වන්නේ විදුහල්පති ශ්‍රේණිධාරීන්ය. එමෙන්ම මෙම තනතුරු සඳහා විදුහල්පති සේවයේ I, II, III යන ශ්‍රේණිධාරීන් පත් කළ යුතු වේ.
>
> බොහෝ විට විදුහල්පති සේවයේ III ශ්‍රේණිධාරියකු සඳහා පත්වීම් ලබා දෙනු ලබන්නේ සහකාර හෝ නියෝජ්‍ය විදුහල්පති තනතුර වන අතර, කුඩා පාසල්වල ප්‍රධාන විදුහල්පති තනතුර විදුහල්පති සේවයේ III ශ්‍රේණිධාරීන් සඳහා ලබා දීමට හැකියාව ඇත.
>
> මේ නිසා සියලුම ශ්‍රේණිධාරීන් වෙත ප්‍රධාන විදුහල්පති තනතුර ලබා දීමේ හැකියාවක් නොමැත. පහසුකම් අඩු කුඩා පාසලක ප්‍රධාන විදුහල්පති තනතුර ලබා දුන්නද සමහර නිලධාරීන් එම තනතුර භාර ගන්නවාට වඩා, පහසුකම් සහිත පාසල්වල නියෝජ්‍ය හෝ සහකාර විදුහල්පති තනතුරු භාර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත.
>
> එමෙන්ම නගරාසන්න විදුහල්වල විදුහල්පති තනතුර ලබා දෙන ලෙස ලැබී ඇති ඉල්ලීම් ප්‍රමාණය විශාල නිසාද, ඒ සෑම දෙනා වෙතට නගරාසන්න පාසල් ලබා දීමට නොහැකිවීම නිසාද, විදුහල්පති තනතුර ලබා දීමට නොහැකි වී ඇත. එමෙන්ම තමන් ඉල්ලා සිටින කලාපයෙන් බැහැරව පත්වීම් ලද නිලධාරීන්ද එම කලාපයෙන් ඉවත් නොවී විදුහල්පති තනතුරු භාර නොගෙන සිටී.

(ආ) අදාළ නොවේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු ඇමැතිතුමනි, ඔබතුමා එම ප්‍රශ්නයට අංග සම්පූර්ණ පිළිතුරක් ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමැතිතුමනි, එම පිළිතුර අනුව ඔබතුමාම ඉඟියක් කළා, මේ පළාත් ලේකම්වරයාගේ පිළිතුර, අමාත්‍යාංශයේ පිළිතුර කියලා. ඔබතුමාට මතක ඇති, මීට පෙර අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් පිළිබඳ මීට සමාන්තර ප්‍රශ්නයක් ඇහුවාම, ඔවුන් ඔබතුමාට ඉදිරිපත් කරපු පිළිතුර වුණේ "කොන්ත්‍රාත් පදනමින් පරිපාලන සේවයේ රැඳී සිටීම සඳහා කැබිනට් මණ්ඩලය ගනු ලැබූ තීරණය ප්‍රකාරව නිලධාරීන් හතරදෙනයි ඉල්ලීම් කරලා තිබෙන්නේ" කියන එක. නමුත්, ඒක සත්‍ය නොවෙයි. එම නිසා මේ පිළිතුර මත ගොනු වුණු කරුණු, කොයි තරම් දුරට සත්‍ය කරුණුද කියලා ඔබතුමාගේ ප්‍රායෝගික මනසටත් තේරෙනවා ඇති. කෙසේ වෙතත්, මෙතැනදී මතුවන බරපතළ කාරණය ජාතික පාසල් නොවෙයි, ඔබතුමා පළාත් පාසල් 92ක් නම් කළා. එනම්, මුලටියන, දෙනියාය, මොරවක, අකුරැස්ස කියන ප්‍රදේශවල පාසල්.

ඒ කියන්නේ, මාතර දිස්ත්‍රික්කයේ තිබෙන දුෂ්කරම අධ්‍යාපන කොට්ඨාස හතරේ, සුදුසුකම් රහිත විදුහල්පතිවරුන් අනූදෙදෙනා ඉන්නා බව තමයි ඔබතුමා මේ සභාවට වාර්තා කරන්නේ. සමස්ත දිස්ත්‍රික්කය විධියට ගත්තාම අධ්‍යාපන දර්ශකවලින් ඉතා ඉහළ තැනක් මාතර දිස්ත්‍රික්කයට තිබෙනවා. මම මේ කියන කාරණය එක්ක එකඟ වෙනවා ඇති, මාතර දිස්ත්‍රික්කයේ අනෙක් දේශපාලන පක්ෂ නියෝජනය කරන මගේ මිත්‍රයනුත්. මේ ගරු සභාවේ මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා ඉන්නවා; සාගල රත්නායක ඇමතිතුමා ඉන්නවා; කංචන විජේසේකර මන්ත්‍රීතුමා මේ විපක්ෂය පැත්තේ ඉන්නවා; නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමා ඉන්නවා. ගරු කථානායකතුමනි, අපි හැම දෙනාම පොදුවේ එකඟ වෙනවා, හොඳ අධ්‍යාපන දර්ශක ඇතුළේ මේ දිස්ත්‍රික්කය තිබුණත්, ඒ දිස්ත්‍රික්කය ඇතුළේ ගැටලු තිබෙන කොට්ඨාස හතරේ තමයි මේ අර්බුදය මතු වෙලා තිබෙන්නේ කියලා. කැබිනට් ඇමතිවරයා විධියට මෙය තුලනය කිරීම සඳහා කිසිදු ආකාරයක මැදිහත්වීමක් කිරීමේ හැකියාවක් නැද්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
විදුහල්පතිවරුන් සම්බන්ධයෙන්ද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔව්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම අපි නව රජය බලයට පත් වෙන කොට විදුහල්පති සේවයේ III ශ්‍රේණිය සඳහා හාරදහසකට ආසන්න සංඛ්‍යාවක ගුරු හිඟයක් තිබුණා. උපගුරුවරුන් තමයි වැඩ බලමින් හිටියේ. අපි විධිමත් විභාගයක් තියලා හාරදහසක් පමණ බඳවාගෙන තිබෙනවා, දේශපාලනය පොඩ්ඩක්වත් ගාවන්නේ නැතුව. එතකොට අධ්‍යාපන පරිපාලන සේවයේ 852ක හිඟයක් තිබුණා. අපි ඒ 852කම බඳවා ගෙන, ඒ විවෘත විභාගයෙන් ගත්තු දෙසීය ගණනක් මේ වන විට වසරක නේවාසික පුහුණුවීම් ලබමින් ඉන්නවා. ඒ වාගේම ඒ බඳවා ගත්තු විදුහල්පතිවරුන්ගෙන් හොඳම කාර්යසාධනයක් තිබෙන අය විදේශ පුහුණුවකට යවන්නත් සූදානම් කරලා තිබෙනවා. අපි පළාත් සභාවලට මුදා හැරලා තිබෙනවා, ඒ විදුහල්පතිවරුන් "විදුහල්පතිවරු" ලෙසම පත් කරන්න කියලා. විශේෂයෙන්ම වැඩ බලන අයත් ඉන්නවා. ඒ අයත් විදුහල්පතිවරු ලෙසම පත් කරන්න කියලා පළාත් සභාවලට අපි කියලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවකුත් දාලා තිබෙනවා. සමහර වෙලාවට පළාත් සභාවලින් මෙක කරන්නේ නැහැ. මේ ගැන අපි කැබිනට් මණ්ඩල රැස්වීමේදීත් කියලා තිබෙනවා; පාර්ලිමේන්තුවේදීත් කියලා තිබෙනවා. මෙතුමා කියන කාරණයේ යම් සත්‍යයක් තිබෙනවා. ඒක ඒ අදාළ පළාත් සභාව විසින් කළ යුතු දෙයක්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මෙතැන තමයි ගැටලුව මතු වන්නේ. ඔබතුමාගේ පිළිතුරට අනුව පෙනී යනවා, රටේ උත්තරීතරම ආයතනය වන මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපටත් ඊට මැදිහත් වීමක් හෝ ඊට උදව් කිරීමක් කළ නොහැකි මට්ටමකට පත් වෙලා තිබෙන බව.

කෙසේ වෙතත් මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මා මේ කාරණය ඉදිරිපත් කරන්න කැමැතියි. මේක විදුහල්පතිවරුන් සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. ගරු ඇමතිතුමනි, මේක වැදගත් ප්‍රශ්නයක් නිසා ඔබතුමා කැමති නම් උත්තරයක් දෙන්න.

මාතර නගරයේ තිබෙන ඉතාම ජනප්‍රිය පාසල් දෙකක් තමයි මාතර රාහුල විද්‍යාලය; -රාහුලේ ආදී ශිෂ්‍යයෝ කිහිප දෙනෙක් මේ පාර්ලිමේන්තුව තුළත් ඉන්නවා.- සහ මහින්ද රාජපක්ෂ විද්‍යාලය. මේ විද්‍යාල දෙකේම ප්‍රධානම ගොඩනැඟිලි ඉදිකිරීම් දෙකක වැඩ දැන් නැවතිලා තිබෙනවා. රාහුල විද්‍යාලයේ දැනට අවුරුදු හතරකට පමණ පෙර පටන් ගත්තු ප්‍රධාන ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු මුළුමනින්ම නතර වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, අවුරුදු එකහමාරක් තිස්සේ කිසිම ඉදිකිරීමක් වෙන්නේ නැහැ. ඊටත් වඩා බරපතළ තත්ත්වයක් තිබෙනවා, මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ. ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණු නිසා අලුතෙන් ළමයින් බඳවා ගැනීමටත් නොහැකි වෙලා තිබෙනවා.

ඒ වාගේම ගොඩනැඟිලි දෙකක ඉදිකිරීම් කටයුතු නතර වෙලා තිබෙනවා. මාතර දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, සමහර වෙලාවට මොණරාගල දිස්ත්‍රික්කයේ, රත්නපුර දිස්ත්‍රික්කයේ දරුවෝ මේ පාසල්වලට ඇවිල්ලා ඉගෙන ගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් අසන පාසල් ගොඩනැඟිලි සම්බන්ධ ප්‍රශ්නය අසා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නැහැ. අපට වෙලාවේ ප්‍රශ්නයකුත් තිබෙන නිසා ඒ ගැනත් ටිකක් අවධානය යොමු කරන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, පාසල් ගොඩනැඟිලි සම්බන්ධයෙන් මා දැන් මතු කරන ප්‍රශ්නය අසා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ නැති බව මම ගරු ඇමතිතුමාට කියලායි පටන් ගත්තේ. ගරු ඇමතිතුමා අසා තිබෙන ප්‍රශ්නයෙන් එළියට ගිහින් වෙනදාටත් උත්තර දෙනවා. අසන ප්‍රශ්නවලට හැමදාම උත්තර දෙන ගරු ඇමතිවරයෙක් නිසායි මම මේ ප්‍රශ්නය ඉතා ගෞරවයෙන් එතුමාට ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට වෙන් වෙලා තිබෙන්නේ තවත් විනාඩි 13ක කාලයක් පමණයි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට අපි රාහුල විද්‍යාලයට මුදල් ප්‍රමාණයක් අනුමත කරලා යැව්වා. ඒ මුදල් යැවීවේ ඔබතුමා කියන මේ ගොඩනැඟිල්ලටද කියලා පරීක්ෂා කළ යුතුව තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, මම මේ කියන ගොඩනැඟිල්ලට මුදල් ලැබිලා නැහැ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මුදල් යවා තිබෙනවා. තවත් මුදල් මදි පාඩුවක් ඇති. අපි ඒ මුදලත් ලබා දෙන්න බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, මාතර නගරයට තිබුණු එකම ශ්‍රවණාගාරය තිබුණේ රාහුල විද්‍යාලයටයි. දැන් ඒ ශ්‍රවණාගාරය නැතිව අවුරුදු 4ක් වෙනවා. ඒක බරපතළ ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, "ළඟම පාසල-හොඳම පාසල" ව්‍යාපෘතියට අදාළ නිශ්චිත කාර්යන් සඳහා තමයි අපි මුදල් ප්‍රතිපාදන වෙන් කර ගත්තේ. ගරු මන්ත්‍රීතුමා කියන මේ ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් ඊට කලින් නැවතිලා තිබුණු එකක්. ඇත්තටම අපි ඒ ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් සඳහා මුදල් යවා තිබෙනවා. මම හිතන විධියට මුදල් මදි පාඩුවක් තිබෙන්නේ. මම ඒ ගැන සොයා බලන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නය ගංවතුරත් එක්ක සම්බන්ධ වන ප්‍රශ්නයක්. සෘජුවම අසා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නයක් නොවෙයි. මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමාත්, ගරු නිරෝෂන් ජේමරත්න මන්ත්‍රීතුමාත්, මමත් මේ ගරු සභාවේ ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපනයට සම්බන්ධ ප්‍රශ්නයක් ද අහන්නේ?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අධ්‍යාපනයට සම්බන්ධ වැදගත් ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. අධ්‍යාපන අමාත්‍යාංශය පැත්තෙන් විපතට පත් වුණු පවුල්වල දරුවන්ට ලොකු සහනයක් ලබා දෙන බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කරලා තිබුණා. හැබැයි, ගංවතුරට යට වූ පාසල් රාශියක පරිගණක කාමරය, සංගීත කාමරය මුළුමනින්ම වතුරෙන් යට වෙලා දරුවන්ට ඒ කිසිම උපකරණයක්, භාණ්ඩයක් පාවිච්චි කරන්න බැරි තත්ත්වයකයි දැන් තිබෙන්නේ. උදාහරණයක් විධියට මාතර නගරයේ තිබෙන තුඩාව ආදර්ශ විද්‍යාලය සහ ගොඩගම අනගාරික ධර්මපාල විද්‍යාලය පෙන්වා දෙන්න පුළුවන්. ඒ පාසල් අයිති පළාත් සභාවටයි කියලා එක පැත්තකින් අපට නිදහස් වෙන්න පුළුවන්. නමුත්, ජාතික මට්ටමේ තීන්දුවක් ඒ සම්බන්ධයෙන් ගන්න බැරිද, ගරු ඇමතිතුමනි?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අපි ඒ සම්බන්ධයෙන් ජාතික මට්ටමේ තීන්දු අරගෙන තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ ඉංජිනේරුවන් ආපදාවට පත් වුණු පාසල් සියල්ලටම ගිහින් ඒ පාසල්වල කැඩී බිඳුණු දේවල් වාගේම අලුත්වැඩියා කළ යුතු සියලු දේ පිළිබඳවත්

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

මේ වන විට තොරතුරු ලබා ගෙන ඉවරයි. එයට අදාළ කැබිනට් පත්‍රිකාවත් දැන් යවලා තිබෙනවා. ආපදාවට ලක් වෙලා තිබෙන්නේ ජාතික පාසල් ද, පළාත් සභා පාසල් ද කියලා භේදයකින් තොරව ඒ පාසල් සියල්ල හදන්න අවශ්‍ය මුදල් ප්‍රතිපාදන අපි ඉල්ලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ආපදාවට පත් වුණු පාසල් ළමුන් 58,000ක් ඉන්නවා. ඒ සියලු ළමුන් සඳහා අපි නිල ඇඳුම් කට්ටල තුනක් සඳහා රෙදි, සපත්තු කුට්ටමක් සඳහා මුදල් වවුචරයක්, අච්චු පොත් ටික ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, අභ්‍යාස පොත් ලබාදීම වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේ අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් රුපියල් මිලියන 5ක් ලබා දුන්නා.

ඒ මුදල්වලින් දරුවන්ට අභ්‍යාස පොත්, ඒ වාගේම බෑග් ලබා දුන්නා. ඒ වාගේ උපකරණ එකතු කිරීමේ මධ්‍යස්ථාන ලෙස අපි ජාතික පාසල් යොදවා ගත්තා. ඒ අනුව ඒ දරුවන් 58,000ටම අපි මේ වනකොට ඒ pack එක යවලා තිබෙනවා.

කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : විස්තර
கல்முனை பிரதேச செயலாளர் பிரிவு: விபரம்
KALMUNAI DIVISIONAL SECRETARY'S DIVISION: DETAILS

1311/'16

6. ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතරින් කිසියම් වසමක/ වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම්වල නම්, අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

(iii) කල්මුනේ ද්‍රවිඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් හෝ උප ලේකම් කොට්ඨාසයක් පිහිටුවා තිබේද;

(iv) එසේ නම්, එයට අදාළ ගැසට් පත්‍රය සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தின் கல்முனை பிரதேச செயலாளர் பிரிவு தாபிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) அது தொடர்பில் வெளியிடப்பட்ட வர்த்தனி அறிவித்தலின் பிரதி ஒன்றைச் சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) கல்முனை பிரதேச செயலாளர் பிரிவில் உள்ளடங்குகின்ற மொத்த நிலப்பரப்பு யாது என்பதையும்;

(iv) அதிலுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மேற்படி கிராம அலுவலர் பிரிவுகளின் இலக்கங்கள் மற்றும் பெயர்கள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) கல்முனை பிரதேச செயலாளர் பிரிவு தாபிக்கப்படுகின்றபோது உத்தியோகபூர்வமாக எல்லை நிர்ணயம் செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) (i) கல்முனை பிரதேச செயலாளர் பிரிவுக்குரிய கிராம அலுவலர் பிரிவுகளில் எதேனும் பிரிவின்/ பிரிவுகளின் நிருவாக நடவடிக்கைகள் அல்லது தொழிற்படுத்தல்கள் வேறொரு பிரதேச செயலகத்தினால் மேற்கொள்ளப் படுகின்றனவா என்பதையும்;

(ii) ஆமெனில், அத்தகைய கிராம அலுவலர் பிரிவுகளின் பெயர்கள், இலக்கங்கள் உட்பட்ட விபரங்களைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) கல்முனை தமிழ் பிரதேச செயலாளர் பிரிவொன்று அல்லது உப செயலாளர் பிரிவொன்று தாபிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அதற்குரிய வர்த்தமானப் பத்திரிகையை சபையில் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Home Affairs:

(a) Will he inform this House -

(i) the date on which the Kalmunai Divisional Secretary's Division of the Ampara District was established;

(ii) whether he will table a copy of the Gazette Notification which was issued in this regard;

(iii) the total area that comes under the Kalmunai Divisional Secretary's Division;

(iv) the number of Grama Niladhari Divisions that come under the Kalmunai Divisional Secretary's Division; and

(v) the numbers and names of the aforesaid Grama Niladhari Divisions?

(b) Will he also inform this House -

(i) whether the Kalmunai Divisional Secretary's Division was officially delimitated when it was established; and

(ii) if so, of the details of such delimitation?

(c) Will he state -

(i) whether administration or operation of any Grama Niladhari Division/Divisions that come under the Kalmunai Divisional Secretariat is being handled by any other Divisional Secretariats;

(ii) if so, the names, numbers and other details of such Grama Niladhari Divisions;

(iii) whether a Tamil Divisional Secretary's Division or a sub-division has been established in Kalmunai; and

(iv) if so, whether he will table the respective Gazette Notification?

(d) If not, why?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) 1978

(ii) ඔව්.

(iii) වර්ග කිලෝමීටර 19.65

(iv) ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව 58

(v) ගරු කථානායකතුමනි, එකී ග්‍රාම නිලධාරී වසම් 58හි නම් මා දැන් කියවන්න යන්නේ නැහැ. ඒ ග්‍රාම නිලධාරී වසම් 58 නම් ලැයිස්තුව මම **සභාගත*** කරනවා.

(ආ) (i) සීමා නිර්ණයක් සිදු කර ඇත.

(ii) හඳුනාගත් ග්‍රාම නිලධාරී වසම් 58ට අදාළ සීමාව වේ.

(ඇ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) ඔව්.

කල්මුණේ දෙමළ උප ලේකම් කාර්යාලයක් පිහිටුවා තිබේ.

(iv) නැත.

(ඈ) මෙතෙක් ගැසට් වී නොමැත.

**** සභාමේසය මත තබන ලද ලැයිස්තුව :***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** List tabled:*

අනු අංකය	ග්‍රාම නිලධාරී වසම	නිල අංකය
01	කල්මුණේ - 03 එමඩි	කේපි /59
02	කල්මුණ කුඩි - 01	කේපි /58
03	කල්මුණ කුඩි - 02	කේපි /58සී
04	කල්මුණ කුඩි - 03	කේපි /58 ඒ
05	කල්මුණ කුඩි - 04	කේපි /58බී
06	කල්මුණ කුඩි - 05	කේපි /56
07	කල්මුණ කුඩි - 06	කේපි /56එෆ්
08	කල්මුණ කුඩි - 07	කේපි /56ඊ
09	කල්මුණ කුඩි - 08	කේපි /56ඩී
10	කල්මුණ කුඩි - 09	කේපි /56බී
11	කල්මුණ කුඩි - 10	කේපි /56සී
12	කල්මුණ කුඩි - 11	කේපි /56ඒ
13	කල්මුණ කුඩි - 12	කේපි /55
14	කල්මුණ කුඩි - 13	කේපි /54ඒ
15	කල්මුණ කුඩි - 14	කේපි /54
16	මරදමුනේ - 01	කේපි /67බී
17	මරදමුනේ - 02	කේපි /67
18	මරදමුනේ - 03	කේපි /67ඒ
19	මරදමුනේ - 04	කේපි /67සී
20	මරදමුනේ - 05	කේපි /67ඩී
21	මරදමුනේ - 06	කේපි /68
22	නවපිඩඩිමුනේ - 01	කේපි /64ඒ
23	නවපිඩඩිමුනේ - 02	කේපි /64බී
24	නවපිඩඩිමුනේ - 03	කේපි /64
25	නවපිඩඩිමුනේ - 04	කේපි /64සී
26	නවපිඩඩිමුනේ - 05	කේපි /64ඩී
27	පෙරියනීලවනායි -I	කේපි /72
28	පෙරියනීලවනායි -II	කේපි /72 ඒ
29	කල්මුණේ - 1 එමඩි	කේපි /59 ඒ
30	කල්මුණේ - 01	61 / 01
31	කල්මුණේ - 01ඒ	61 / 02
32	කල්මුණේ - 01බී	61 / 03
33	කල්මුණේ - 01සී	61 / 04
34	කල්මුණේ - 01ඩී	61 / 05
35	කල්මුණේ - 01ඊ	61 / 06
36	කල්මුණේ - 02	61 / 07
37	කල්මුණේ - 02 ඒ	61/ 08
38	කල්මුණේ - 02 බී	61 / 09
39	කල්මුණේ - 03	59 / 02
40	කල්මුණේ - 03 ඒ	59 / 01
41	පාන්ඩිරුප්පු- 01	66 / 01
42	පාන්ඩිරුප්පු - 01ඒ	66 / 02
43	පාන්ඩිරුප්පු - 01බී	66 / 03
44	පාන්ඩිරුප්පු - 01සී	66 / 04
45	පාන්ඩිරුප්පු - 02	66/ඒ/01
46	පාන්ඩිරුප්පු - 02 ඒ	66/ඒ/02
47	පාන්ඩිරුප්පු - 02බී	66/ඒ/03
48	පාන්ඩිරුප්පු - 02සී	66/ඒ/04
49	නවපිඩඩිමුනේ - 01	62/01
50	නවපිඩඩිමුනේ - 02	62/02
51	කල්මුනායි - 03	62/03
52	චේනෙයි - 01	69/01
53	චේනෙයි - 01 ඒ	69/02
54	චේනෙයි - 01 බී	69/03
55	පෙරියනීලාවනේ - 01	71/01
56	පෙරියනීලාවනේ - 01ඒ	71/02
57	පෙරියනීලාවනේ - 01 බී	71/03
58	පෙරියනීලාවනේ - 02	71/04

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් මා දැන ගන්න කැමතියි, දැන් කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ කල්මුණේ දෙමළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කියන දෙකම නිල වශයෙන් සම තත්ත්වයේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක්ද එහෙම නැත්නම් එක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් යටතේ පවතිනවාද කියලා.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)

ගරු කථානායකතුමනි, අවශ්‍යතාව මත දැනට එවැනි උප කාර්යාල ලංකාවේ විවිධ ස්ථානවල අපි ස්ථානගත කරලා තිබෙනවා. හැබැයි, අපි ඒවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හැටියට සම්පූර්ණ වශයෙන් භාර ගන්නේ නැහැ. නමුත් අර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින උප කාර්යාලයක් හැටියට පවත්වාගෙන යනවා. මෙවැනි උප කාර්යාල ලංකාවේ දැනට 20ක් පමණ තිබෙනවා. 2012 සීමා නිර්ණය අනුව අලුතෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 33ක් ඇති කිරීමට නිර්දේශ කර තිබෙනවා. නමුත් තවම ඒවා ගැසට් කරලා නැති නිසා මේවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් හැටියට පිළිගන්නේ නැහැ; උප කාර්යාලයක් හැටියට පිළිගන්නවා. ඒ වාගේම අදාළ සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා යටතේ ඒ කටයුතු සිද්ධ වනවා.

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා
(மாண்புமிகு எம்.எச்.எம். சல்மான்)
(The Hon. M.H.M. Salman)
බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -1330/'16 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය: නියාමන අධිකාරියක්

சிறிய மற்றும் நடுத்தர அளவுத் தொழில்முயற்சித் துறை: ஒழுங்குமுறைப்படுத்தல் அதிகாரசபை
SMALL AND MEDIUM-SCALE ENTERPRISE SECTOR: REGULATORY AUTHORITY

1370/'16

10.ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) 2016 අය වැය යෝජනාවන්ට අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය විධිමත් කිරීමට අවශ්‍ය "නියාමන අධිකාරියක්" පිහිටුවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලියා පදිංචි කිරීමේදී රු. 25,000/-ක ගාස්තුවක් ගෙවිය යුතුද;

(iv) සුළු හා මධ්‍ය පරිමාණ අංශය මුහුණ දෙන ගැටලු අධ්‍යයන කිරීම සඳහා උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබුවේද;

(v) එසේ නම්, එම කමිටුවෙහි සාමාජිකයන් කවුරුන්ද;

(vi) සුළු හා මධ්‍ය පරිමාණ ණය ආරක්ෂණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා 2016 වර්ෂයේදී, රුපියල් මිලියන 500ක මූලික අරමුදලක් රජය මගින් ලබා දුන්නේද;

(vii) සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයට සහනදායී පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් සැපයීමට ආධාරයක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් මිලියන 100ක ණය පහසුකමක් ලැබුණේද;

(viii) ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ, ණය ලබා දුන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ නම් හා ලිපින ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2016 வரவு செலவுத் திட்ட முன்மொழிவுகளின் படி, சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சித் துறையை ஒழுங்குமுறையாக்குவதற்குத் தேவையான "ஒழுங்குமுறையாக்கல் அதிகாரசபை" ஒன்று தாபிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அவ்வாறாயின், அத்திகதி யாதென்பதையும்;

(iii) இலங்கையில் நுண் நிதி நிறுவனங்களை பதிவு செய்யும்போது ரூபா 25,000/- கட்டண மொன்றைச் செலுத்தவேண்டுமா என்பதையும்;

(iv) சிறிய மற்றும் நடுத்தர அளவிலான துறை எதிர்நோக்குகின்ற பிரச்சினைகளை ஆய்வு செய்வதற்கு ஆலோசனைக் குழுவொன்று அமைக்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அக்குழுவின் உறுப்பினர்கள் யாவர் என்பதையும்;

(vi) சிறிய மற்றும் நடுத்தர அளவிலான கடன் பாதுகாப்பு வேலைத்திட்டமொன்றை நடைமுறைப் படுத்துவதற்காக 2016ஆம் ஆண்டில், அரசாங்கம் ரூபா 500 மில்லியன் தொகை ஆரம்ப நிதியத்தை வழங்கியதா என்பதையும்;

(vii) சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சித் துறைக்கு சலுகை வட்டி வீதத்தின் கீழ் நிதி வசதிகளை வழங்குவதற்கான உதவியாக ஆசிய அபிவிருத்தி வங்கியிலிருந்து ரூபா 100 மில்லியன் கடன் வசதி கிடைத்துள்ளதா என்பதையும்;

(viii) ஆசிய அபிவிருத்தி வங்கியின் கடன் வசதியின் கீழ், கடன் வழங்கப்பட்ட சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சியாளர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் அடங்கிய பட்டியலைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House -

(i) whether a "regulatory authority" required for regulating the small and medium-scale enterprise sector was established as per the Budget Proposals for year 2016;

(ii) if so, the date on which such authority was established;

(iii) whether a fee of Rs.25,000 should be paid when registering a microfinance company in Sri Lanka;

(iv) whether an advisory committee was established for the purpose of studying the difficulties experienced by the small and medium-scale enterprise sector;

(v) if so, the names of the members of the aforesaid committee;

(vi) whether an initial fund of Rs. 500 million was provided by the Government for the implementation of a credit guarantee scheme for small and medium-scale enterprises in the year 2016;

(vii) whether a credit facility of Rs.100 million was received from the Asian Development Bank to assist the programme for providing financial facilities to the small and medium-scale enterprise sector under concessionary interest rates; and

(viii) whether a list containing the names and addresses of the small and medium-scale entrepreneurs who were provided with loans that were granted under the credit facility of the Asian Development Bank would be presented to this House?

(b) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)

The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2016 අය වැය යෝජනාවන්ට අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය නියාමනය කිරීමට යෝජනා වුවද, එම කාර්යය ශ්‍රී ලංකා මහ බැංකුව හරහා ඉටු කිරීමට හැකි බැවින් කඩිනමින් එවැනි අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාවක් පැන නැහුණේ නැත.

(ii) අදාළ නොවේ.

(iii) නැත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කලින් කලට නිශ්චය කරනු ලබන ලියා පදිංචි ගාස්තු හා වාර්ෂික බලපත්‍ර ගාස්තු අය කිරීමට 2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතේ විධිවිධාන මඟින් කටයුතු සලසා ඇත.

(iv) නැත.

(v) අදාළ නොවේ.

(vi) නැත.

(vii) නැත.

(viii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා

(மாண்புமிகு பந்துல குணவர்தன)

(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කළේ පසු ගිය වර්ෂයේ -2016- ඉදිරිපත් කර සම්මත කරගත් අය වැය යෝජනාවක් සම්බන්ධයි. එහි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කරන ආකාරය ගැන පිටුවක පමණ දීර්ඝ විස්තරයක් කරමින්, 122 හා 123 වැනි අනු අංක යටතේ යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. නමුත්, දැන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කරනවා, "අය වැයේ යෝජනා කරලා මේ පාර්ලිමේන්තුවේ සම්මත වුණාට එවැනි නියාමන අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාවක් පැන නැහුණේ නැහැ" කියලා. එහෙම නම්, අවශ්‍යතාවක් නැති යෝජනාවක් අය වැය ලේඛනයට ඉදිරිපත් කරලා සම්මත කර ගත්තේ මොකටද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)

(The Hon. (Dr.) Harsha De Silva)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේ, "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය විධිමත් කිරීමට අවශ්‍ය 'නියාමන අධිකාරියක්' පිහිටුවනු ලැබුවේද?" කියලායි. අපි ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා නියාමන රාමුවක් සකස් කළා. ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කිරීම, සම්පූර්ණයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට අයිති නැහැ. සුළු හා මධ්‍ය පරිමාණ අංශය ඇතුළේ තමයි ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය තිබෙන්නේ. ක්ෂුද්‍ර මූල්‍ය සඳහා කරපු නියාමනය හැම එකටම ආදේශ කරන්න බැහැ. එම නිසා තමයි මම මෙතුමාට කිව්වේ, "නියාමන අධිකාරියක් පිහිටුවීමේ අවශ්‍යතාවක් පැන නැහුණේ නැහැ" කියලා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධානම ගැටලුව තමයි, seed capital එක සහ අනෙකුත් පවත්වාගෙන යෑම් සඳහා අවශ්‍ය කරන ප්‍රාග්ධනය නොමැතිකම. ඒ සඳහා පසු ගිය අය වැය යෝජනාවේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට සහනදායී පදනම යටතේ මූල්‍ය පහසුකම් සපයා දීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් සහනාධාර මුදලක් ලැබුණා" කියලා.

දැන් එතුමා සඳහන් කරනවා, එවැනි මුදලක් ලැබුණේ නැහැයි කියලා. නමුත් ගරු කථානායකතුමනි, මෙහි ඉතා පැහැදිලිව තිබෙනවා, මෙම ක්ෂේත්‍රයට සහනදායී පොලී අනුපාතය යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීමට උපකාර කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක ණය පහසුකමක් ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබා ගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවාය කියලා. මුදල් ඇමතිතුමා කියනවා, credit line එකකින් ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් ලබා ගන්න හැකියාව තිබෙනවාය කියලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතුමා උපකල්පනය කරන්න ඇති, අවශ්‍ය මුදල් ලබා ගෙන මේ සඳහා යොදවන්න. නමුත් ඊට පස්සේ රජය තීරණය කරලා ඇති, ඒ ලැබුණු මුදල් සුළු හා මධ්‍ය පරිමාණයේ වෙනත් වැඩ කටයුතු සඳහා යොදවන්න. සුළු හා මධ්‍ය පරිමාණ ණය ආරක්ෂණ වැඩ පිළිවෙළක් සඳහා පොලී අනුපාතය යටතේ මූල්‍ය පහසුකම් සැපයීමට ණය පහසුකමක් ලැබුණාද කියලා නේ ඔබතුමා අහන්නේ. මෙවැනි දේවල් රාශියක් කෙරෙනවා. ආසියානු සංවර්ධන බැංකුව හරහා ගන්න මූල්‍ය පහසුකම්, ලෝක බැංකුව හරහා ලැබෙන මූල්‍ය පහසුකම්, FMO එක හා ජර්මනියේ DEG එක හරහා ගන්න මූල්‍ය පහසුකම් නොයෙකුත් බැංකු හරහා ක්‍රියාත්මක වනවා. මේ ඩොලර් මිලියන 100 විතරක් නොවෙයි, එදා සිටම ඉදිරියටත් මෙය ක්‍රියාත්මක වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේ ගැන මමත් සොයා බැලුවා. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අහලා තිබෙන්නේ, සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයට සහනදායී පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් සැපයීමට ආධාරයක් වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් මිලියන 100ක ණය පහසුකමක් ලැබුණේද කියලායි. අපි බැලුවේ, රුපියල් මිලියන 100ක් ගැනයි. ඒ කියන්නේ, ඩොලර් මිලියනයකට අඩු මුදලක් ගැනයි. අවශ්‍ය නම් ඒ ගැන නැවත සොයා බලා කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයේ තිබෙන්නේ රුපියල් මිලියන 100ක් කියලායි. රුපියල් මිලියන 100ක් කියන්නේ, ඩොලර් මිලියනයකට අඩු මුදලක්. ආසියානු සංවර්ධන බැංකුව කිසි දවසක ඩොලර් මිලියනයක් අපට දීලා නැහැ. ඔබතුමා කියන්නේ ඩොලර් මිලියන 100ක් ගැන නම්, මා ඇමතිතුමාට කියන්නම් ඒ ගැන සොයා බලා ප්‍රකාශ කරන්නය කියලා. රුපියල් මිලියන 100ක් ගැන ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවාම, අපි බැලුවේ රුපියල් මිලියන 100ක් ගැනයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අවසාන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කර තිබෙන්නේ, 2016 අය වැය යෝජනා 122 හා 123 අනුවයි. එහි ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් කියා සඳහන් කර තිබෙනවා. මේ ප්‍රශ්නයේ රුපියල් මිලියන 100ක් කියා සඳහන් කර තිබෙනවාය කියන එක නොවෙයි ප්‍රශ්නය. එතකොට රුපියල් මිලියන 100ක්වත් සොයාගන්න බැරි වෙලා තිබෙනවා. රුපියල් මිලියන 100ක්වත් සොයාගන්න බැරිවෙලා තිබෙනවාය කියන එක පිළිගන්න ඕනෑ. අද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තිබෙන ප්‍රශ්නය තමයි, කොසු, ඉදල් වැනි නිෂ්පාදන වක්කඩ කැඩුවා වාගේ ගෙන ඒමයි. අද මේ කර්මාන්ත ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් වැටිලායි තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු අගමැතිතුමනි, කියන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එහෙම නම් මම සමාව ඉල්ලනවා. මම හිතුවේ මේ රුපියල් මිලියන 100ක් ගැන කියන්නේ රුපියල් 2,500කින් ජීවත් වෙන්න පුළුවන් කියපු පුද්ගලයා කියලා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දීලා අවසානද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙවැනි මූල්‍ය පහසුකම් දිගටම ලබාගෙන, ඒ හරහා අප සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන්ට සහනදායී ණය ලබා දෙනවා. අප ඒ කටයුතු දිගටම කර ගෙන යනවා, ගරු කථානායකතුමනි.

ස්තුතියි.

දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන පවුල්: බදුල්ල දිස්ත්‍රික්කය

වරුමෙක් කෝට්ඩින්කීழ් වාழුම් කුටුම්පංකළ්:
පදුළෙ මාවට්ටම්
FAMILIES LIVING BELOW POVERTY LINE: BADULLA DISTRICT

1472/'16

11.ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) උඹව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ,

(i) සමෘද්ධි සහනාධාර ලබා ගන්නා පවුල් සංඛ්‍යාව;

(ii) දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන පවුල් සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත්වන සහ සමෘද්ධි සහනාධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරා ඇතත්, සහනාධාර නොලැබෙන ජනතාවට සමෘද්ධි සහනාධාර ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සමූහ වලුවූට්ටල්, නලන්පුරි මට්රුම් කණ්ඩි මරපුරිමෛකළ් අමෛච්චරෛක් කේට්ට වින්නා:

(அ) ஊவா மாகாணத்தின், பதுளை மாவட்டத்தில்,

(i) சமுர்த்தி நிவாரணம் பெறும் குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) வறுமைக் கோட்டிற்கு கீழ் வாழும் குடும்பங் களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) வறுமைக் கோட்டிற்கு கீழ் வாழ்ந்து வருகின்ற மற்றும் சமுர்த்தி நிவாரணத்தை பெற்றுக்கொள்வதற்கான தகுதியை பூர்த்தி செய்துள்ளபோதிலும், நிவாரணம் கிடைக்கப்பெறாத மக்களுக்கு சமுர்த்தி நிவாரணத்தை பெற்றுக்கொடுப்பதற்கு தேவையான நடவடிக் கைகளை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[

asked the Minister of Social Empowerment, Welfare and Kandyan Heritage:

(a) Will he inform this House separately in terms of each Divisional Secretary's division of Badulla District in Uva Province-

(i) the number of families that receive Samurdhi subsidies; and

(ii) the number of families who are living below the poverty line?

(b) Will he also inform this House whether he will take measures to provide Sumurdhi subsidies to the people who are living below the poverty line and do not receive them even though they are qualified?

(c) If not, why?

ගරු එස්.බී. දිසානායක මහතා (සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க - சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சர்)
(The Hon. S.B. Dissanayake - Minister of Social Empowerment and Welfare and Kandyan Heritage)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	සමෘද්ධි ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව
01	මහියංගනය	5,479
02	රිදීමාලියද්ද	5,252
03	මීගහකිවුල	2,006
04	කන්දකැටිය	3,178
05	සොරනාතොට	2,463
06	පස්සර	3,136
07	ලුණුගල	2,259
08	බදුල්ල	2,640
09	හාලිඇල	5,634
10	උඹව පරණගම	6,249
11	වැලිමඩ	4,633
12	බණ්ඩාරවෙල	3,697
13	ඇල්ල	4,201
14	හපුතලේ	1,773
15	හල්දුම්මුල්ල	2,377
	එකතුව	54,977

(ii)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන පවුල් සංඛ්‍යාව
01	මහියංගනය	7,765
02	රිදීමාලියද්ද	7,361
03	මීගහකිවුල	2,826
04	කන්දකැටිය	2,955
05	සොරනාතොට	2,355
06	පස්සර	5,087
07	ලුණුගල	4,519
08	බදුල්ල	3,507
09	හාලිඇල	7,915
10	උඹව පරණගම	6,868
11	වැලිමඩ	7,598
12	බණ්ඩාරවෙල	3,810
13	ඇල්ල	4,401
14	හපුතලේ	4,121
15	හල්දුම්මුල්ල	4,276
	එකතුව	75,364

[ගරු එස්.බී. දිසානායක මහතා]

(ආ) සමෘද්ධිලාභීන් සහ දැනට සහනාධාර නොලබන අඩු ආදායම්ලාභී පවුල් දීප ව්‍යාප්ත සමීක්ෂණයකට භාජන කර විධිමත් ක්‍රමවේදයක් යටතේ, ප්‍රධාන නිර්ණායක 06ක් සහ අනු නිර්ණායක 28ක් පාදක කරගනිමින් සුදුසුකම් සපුරාලන අඩු ආදායම්ලාභී පවුල් තෝරා ගැනීම ලකුණු පදනම මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මේ වන විට සිදු කරමින් පවතී.

(ඇ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබාදුන්නාට බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම දිළිඳුකම පිටුදැකීම උදෙසා ඔබතුමාගේ අමාත්‍යාංශය මඟින් රට පුරා විශාල කාර්යභාරයක් ඉටු කරනවා. ගරු ඇමතිතුමනි, අපේ බදුල්ල දිස්ත්‍රික්කයේ යම් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඉන්න සමෘද්ධිලාභීන් පිළිබඳව ඔබතුමා කිව්වා. ඒ වාගේම, හාලිඇල, වැලිමඩ, උඟ පරණගම, බණ්ඩාරවෙල කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව ගැනත් ඔබතුමා සඳහන් කළා. ගරු ඇමතිතුමනි, ඒ ප්‍රදේශවල සිටින ඉතාම දුප්පත් පිරිසගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා තමයි මේ දායකත්වය, ශක්තිය ඔබතුමාගේ අමාත්‍යාංශය මඟින් ලබා දෙන්නේ. අප දන්නවා, උමා ඔය ව්‍යාපෘතිය නිසා අද ඒ ජනතාවට මහා ව්‍යසනයකට මුහුණ දෙන්න සිදුවී තිබෙන බව. එම ව්‍යාපෘතියට මා කලින් සඳහන් කළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතර ඇතුළත් වෙලා තිබෙනවා. සමෘද්ධි සහනාධාරය ලබන, එදිනෙදා ජීවිතය අමාරුවෙන් ගත කරන ඒ විශාල පිරිසම තමයි මේ ව්‍යසනයටත් අසු වෙලා ඉන්නේ, ගරු අමාත්‍යතුමනි.

මට තිබෙන ප්‍රශ්න මෙයයි. මේ අය කබලෙන් ලිපට වැටුණු නිසා ඔබතුමාගේ අමාත්‍යාංශය මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු බවයි මගේ අදහස. කලින් සඳහන් කළා, ඒ අය විවිධ ණය පහසුකම් අරගෙන තමයි කුකුළු ගොවිපළ කළේ, හතු වගාව කළේ කියලා. දැන් ඒවා සියල්ල අඩපණ වෙලායි තිබෙන්නේ. එක පැත්තකින් ඒ අයගේ ණය ගෙවීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම සමෘද්ධි දීමනාව නොලබන, වැඩි ආදායම් තිබෙනවාය කියන පුද්ගලයනුත් උමා ඔය ව්‍යාපෘතිය නිසා අද මේ ගණයට වැටී තිබෙනවා. එම නිසා මේ රට සමෘද්ධිමත් කරන්නට හදන උත්සාහයේදී, විශේෂයෙන්ම උමා ඔය ව්‍යාපෘතිය නිසා බණ්ඩාරවෙල ප්‍රදේශයේ ව්‍යසනයට ලක්වුණු පුද්ගලයන් වෙනුවෙන් මේ වන විට ඔබතුමා කුමක් හෝ වැඩ පිළිවෙළක් යෝජනා කර තිබෙනවාද?

ගරු එස්.බී. දිසානායක මහතා
(*மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க*)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, මේ පිළිබඳව අපේ අවධානය යොමුවෙලා තිබෙනවා. තව සති දෙකක් යනකොට ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් මේ තේරීම් කටයුතු අවසන් කරයි. ඊට පස්සේ විශේෂ සැලකිල්ලක් දක්වන්න ඕනෑ පවුල් ගැන සලකා බලන්න පුළුවන්. මොකද, තොරතුරු ලබාදෙන කොට තිබුණු තත්ත්වය අද සමහර පවුල්වල නැතුව ඇති. ඒ තොරතුරු ලබාදී තිබෙන්නේ මීට මාස 6කට කලින්. ඒ නිසා තේරීම් කටයුතුවලින් පසු අභියාචනා පිළිබඳවත් සලකා බලා ඒ අයට සහනයක් දෙන්න සලකා බලමු. ඒක කරන්න පුළුවන්. ඔබතුමා කිව්වා වාගේ අපි වැඩිපුර මුදල් ප්‍රමාණයක් යොදවමු, ඒ පවුල්වලට ජීවනෝපාය සඳහා අවශ්‍ය ආධාර ලබාදෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ඒ අය ලබාගත් ණය කපා හැරීමක් කරන්න පුළුවන්ද ගරු ඇමතිතුමනි?

ගරු එස්.බී. දිසානායක මහතා
(*மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க*)
(The Hon. S.B. Dissanayake)

ගරු කථානායකතුමනි, ඒ මුදල් සම්පූර්ණයෙන්ම ඒ අයගේමයි. ඒවා ආණ්ඩුවේ සල්ලි නොවෙයි. ඒ නිසා ඒ ණය කපා හරිනවා නම්, ඒ තීන්දුව ගන්නත් ඕනෑ ඒ අයම තමයි. ඒ අයත් එක්ක සාකච්ඡා කරලා එහෙම තීන්දුවක් ගන්න පුළුවන්ද කියලා අපි බලමු. මොකද, ඒ සියල්ලම ඒ මිනිස්සුන්ගේ මුදල්. ඒ සත පහක්වත් ආණ්ඩුවේ මුදල් නොවෙයි. ඒ ණය කපා හරිනවා නම්, ආණ්ඩුවෙන් ඒ සල්ලි දමන්න වෙයි. නමුත් එහෙම දමන්න සල්ලි නැහැ. ඒ නිසා ඒ අයට මොකක් හෝ සහනයක් දෙන්න පුළුවන්ද කියලා අපි බලමු.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම ඔබතුමා ඒ පිළිබඳව කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කිරීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ගරු අමාත්‍යතුමනි, විශේෂයෙන්ම මෙම ව්‍යසනය වෙන්නේ අද ඊයේ ඉඳලා නොවෙයි. මේක දීර්ඝ කාලයක් තිස්සේ සිදුවෙනවා. ඒ නිසා අප සතුව මේ පිළිබඳ වූ යම් කිසි සංඛ්‍යා ලේඛන තිබෙන්නට ඕනෑ. මම නම් කියන්නේ, අපි ගිහිල්ලා බොරුවට කමිටු පවත්වලා, ඒ ජනතාව මුණගැහෙනවා කියන්නේ මහා කාලකණ්ණි වැඩක් කියලායි ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මේ කාරණය ටිකක් බරපතළ නිසායි විස්තර සහිතව ප්‍රශ්නය අහන්නේ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

අපට කාලය සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. දැනටමත් පස්වරු 2.00 පහුවෙලා තිබෙන්නේ.

ගරු චමින්ද විජේසිරි මහතා
(*மாண்புமிகு சமிந்த விஜேசிறி*)
(The Hon. Chaminda Wijesiri)

හොඳයි ගරු කථානායකතුමනි, සමාවෙන්න.

ගරු අමාත්‍යතුමනි, මේ ව්‍යාපෘතිය නිසා ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් පවා නැතිවෙලා තිබෙනවා. එම නිසා මම මේ ඉල්ලීම කරන්න කැමැතියි. විශේෂයෙන්ම උමා ඔය ව්‍යාපෘතිය නිසා පීඩාවට පත්වී සිටින අසරණ පවුල් සඳහා, "අඩු ආදායම්ලාභී" කියන කාරණයෙන් එහාට ගිහිල්ලා, ඒ අයගේ යටිතල පහසුකම් යථා තත්ත්වයට පත්කිරීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයට යම් කිසි විශේෂ මුදලක් යොදවන්න හැකියාව තිබෙනවාද?

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, ඒක කරන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඒ යෝජනා එවන්න. එතකොට ප්‍රාදේශීය ලේකම්තුමා හා මූලස්ථාන කළමනාකරුවන්, සහකාර අධ්‍යක්ෂවරුන් හරහා ඒ පිළිබඳ තොරතුරු එක්රැස් කරලා අපි ඒ යෝජනාව ක්‍රියාත්මක කරමු. ඔබතුමාගේ යෝජනාව අපට දෙන්න. ඒක කරන්න පුළුවන්.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා අහනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කැමැති නම් විතරක් ඉතාම කෙටියෙන් මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මෙය ඌව පළාතට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. සමස්ත රටේම-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මම කෙටියෙන් කියන්නම්. පහු ගිය දවස්වල සමෘද්ධි සංවර්ධන නිලධාරි තනතුර සඳහා වූ තරග විභාගයට අපේක්ෂකයන් ඉදිරිපත් වුණා. අපි මහජන දිනය පවත්වද්දී ඒ අය සමත්ද, අසමත්ද කියලා දැන ගන්න ක්‍රමයක් අපෙන් අහනවා. ඒ හැම කෙනෙක්ම ඇවිල්ලා ඒ විභාගයේ results අහනවා. මහජන නියෝජිතයන් වශයෙන් අපටත් ඒ ප්‍රතිඵල දැනගන්න විධියක් නැහැ. ඒක දැන ගන්න පුළුවන් ක්‍රමවේදයක් හෝ නැත්නම් මේ විභාගයට මොකද වුණේ කියලා ගරු සභාව දැනුවත් කරන්න පුළුවන්නම් හොඳයි.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ගරු කථානායකතුමනි, අපිත් උත්සාහ කළා මේ අයගේ ප්‍රතිඵල website එකට දාන්න; තැපෑලෙන් යවන්න. හැබැයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අපට උපදෙස් දීලා තිබෙන්නේ, ඒ තනතුරට තෝරා ගන්නා ප්‍රමාණයෙන් දෙගුණයක පිරිසකට ලියුම් යවලා, කැඳවලා, සම්මුඛ පරීක්ෂණ තියලා තෝරා ගන්න කියලායි. ඒක තමයි රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අපට ලැබිලා තිබෙන උපදේශය. මෙම ප්‍රතිඵල ගැන ඔබතුමාට දැන ගන්න පුළුවන් විධියේ ක්‍රමයක් තිබෙනවාද කියලා අපේ අමාත්‍යාංශ නිලධාරීන්ගෙන් මම සොයා බලන්නම්. මේ සියලු ප්‍රතිඵල website එකට දාලා මේ අයට දැනුම් දෙන්නයි මාත් හිතාගෙන හිටියේ. හැබැයි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව අපට කියලා තිබෙනවා, ඒ තනතුරට බඳවා ගන්නා වූ ප්‍රමාණයෙන් දෙගුණයක පිරිසක් කැඳවලා සම්මුඛ පරීක්ෂණ තියලා අවශ්‍ය පිරිස තෝරා ගන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේදී යම් කාරණයක් ගැන ගරු සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. අවස්ථා කිහිපයකදීම පක්ෂ නායක රැස්වීමේදී අපි තීරණයක් ගත්තා මේ ප්‍රශ්න ඇසීම පැයකට සීමා කරන්න කියලා. දැනටම පස්වරු දෙක පහුවෙලා තිබෙනවා. අදට මතු කරන්න නියමිත 23(2) යටතේ ප්‍රශ්න දෙකක් තිබෙනවා. අමාත්‍යාංශ නිවේදන තුනක් තිබෙනවා. එම නිසා අපි එදා පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී ගත් තීරණය පරිදි කටයුතු කළ යුතු වනවා. අද න්‍යාය පත්‍රයේ ඇති ප්‍රශ්න හතරක් පිළිතුරු දෙන්න ඉතිරිව තිබෙනවා. එම ප්‍රශ්නවල පිළිතුරු සභාගත කරන ලෙස මම යෝජනා කරනවා.

இந்த நிலையில், மேற்படி புகையிலைச் செய்கை தடை செய்யப்படுகின்ற நிலையில், புகையிலைச் செய்கையில் தற்போது ஈடுபட்டு வருகின்ற மக்களுக்கு மாற்றுப் பயிர்ச் செய்கைகள் என்ற வகையில் என்னென்ன பயிர்ச்செய்கைகள் அறிமுகப்படுத்தப் படவுள்ளன? இல்லையேல், அறிமுகப்படுத்தப்பட்டுள்ளன என்பதை அறியத்தர முடியுமா?

தற்போது யாழ்ப்பாணத்தில் மேற்கொள்ளப்பட்டு வருகின்ற மிளகாய் மற்றும் வெங்காயச் செய்கைகள் ஒப்பீட்டளவில் புகையிலைச் செய்கைக்கு அடுத்தபடியாகப் பொருளாதார ரீதியில் சாதகமான நிலையினைத் தருவதாகக் கூறப்படுகின்ற நிலையில்,

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

තව්පොතු පුකෙයිලෙච් චෙය්කෙයිල් ඊටුපට්ටු වරුකින්ර විවසායිකළුක්කාන මාට්රුප් පයිර්ච්චෙය්කෙ එන්ර වකෙයිල්, වෙඋකායම් මට්රුම් මිළකාය්ප් පයිර්ච් චෙය්කෙකළිල් ඊටුපටුවතට්කාක මානියඋංකළ්, ඌක්කුවිප්පුක්කළ් මට්රුම් ඒනෙය වසතිකළ් චෙය්තු කොටුක්කප්පටුමා?

ඉතේපෝන්රු නවීන සන්තෛක් කේළ්වික්කේට්ප ඒනෙය පයිර්ච්චෙය්කෙකළෙ අට්රිමුකඤ්චෙය්කින්ර ඒට්පාටුකළ් ඉරුප්පින්, අවට්රිල් ඊටුපටුකින්ර විවසායිකළුක්කු මානියඋංකළ් වළඋංකප්පටුමා? අප්පටි වළඋංකප්පටුමායින් එන්න වකෙයිලොන මානියඋංකළ් වළඋංකප්පටුම්?

තව්පොතු යාෆ්. කුටානාට්ටිල් මේට්කොළ්ළප්පටුකින්ර උරුළෙක්කිළඋංකු, වෙඋකායම්, මිළකාය් පෝන්ර පයිර්ච්චෙය්කෙකළිල් අරුවටෛකළෛච් චන්තෛප්පටුත්තුවතිල් තේචිය මට්රුම් චර්වතේච මට්ටත්තිල් ඉරුක්කක්කූටිය තටෛකළෛ අකට්රුවතට්කු එටුක්කප්පටවුළ්ළ නටවටික්කෛකළ් එන්න?

කුට්රිප්පාක, එමතු උට්පත්තිකළ් චන්තෛක්කු වරුම් කාලත්තිල් අතේ පොරුට්කළ් ඉරක්කුමති චෙය්යප්පට්ටුක් කුට්රෙන්ත විලෛකළිල් විට්කප්පටුවතාල්, එමතු විවචාය උට්පත්තියාලර්කළ් පෙරුම් පාතිප්පුක්කු මුකඋංකොටුක්කින්ර නිලෛ තොටර්කින්රතු.

එනවේ, ඉරක්කුමති වරිකළෛ අතිකරිප්පතෝටු මට්රුම් නින්රුවිටාමල්, අප්පොරුට්කළින් ඉරක්කුමතියෛ මට්රුප්පටුත්තුවතට්කු අල්ලතු අක්කාලඋංකළිල් ඉරක්කුමතියෛ නිරුත්තුවතට්කු උරිය තරප්පුකළුටන් ඉණෛන්තු නටවටික්කෛ එටුක්ක මුටියාතා?

මේට්පටි කේළ්විකළුක්කු චම්පන්තප්පට්ට කෞරව අමෛච්චර් අවර්කළ් පතිල් වළඋංකුවාරෙන එතිර්පාර්ක්කින්රේන්.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු වචන්ත අළුවිහාර)
(The Hon. Wasantha Aluvihare)

ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමාගේ පළමු වන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. මිරිස්, ලූනු, එළවලු යන බෝග වර්ග හා අපනයන වෙළෙඳ පොළ ඉලක්ක කර ගනිමින් කෙසෙල් බෝගය විකල්ප බෝගය ලෙස හඳුන්වා දිය හැක.

දෙවන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

මිරිස්, ලූනු, කෙසෙල් නව වගාවන් ලෙස ආරම්භ කරන ගොවීන් වෙත සහනාධාර ලබා දීමේ හැකියාව පවතී. ඒ යටතේ සියයට 50 රජයේ දායකත්වය යටතේ රෝපණ ද්‍රව්‍ය, ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති හා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම සිදු කළ හැකි වේ.

එසේම කෘෂි රසායන ද්‍රව්‍ය අවම ලෙස භාවිතයට ගනිමින් පරිසර හිතකාමී ලෙස වගාවන්හි නිරත ගොවීන් වෙත දිරි දීමනා ලබා දීම සිදු කළ හැකිවේ.

තුන්වන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

අර්තාපල්, ලූනු, මිරිස් යන බෝගයන්හි අස්වනු නෙළා වෙළෙඳ පොළට ගෙන එන අවස්ථාවේදී පමණක් නොව වසර පුරා අඛණ්ඩව ආනයනය කෙරෙන නිෂ්පාදනයන් සඳහා බදු පැනවීම මඟින් මෙම බෝගයන්හි මිල උච්චාවචනය යම් තරමක් දුරට තුලනය කර ඇත.

රතු ලූනු අස්වනු ගබඩා කිරීම සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් සැලසීම තුළින් අස්වනු එකවර වෙළෙඳපොළට පැමිණීම වැළැක්වීම මඟින් ගොවීන්ගට ඔවුන්ගේ නිෂ්පාදනයන් සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට අවස්ථාව සැලසී ඇත.

හතරවන ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ආනයන බදු ඉහළ නැංවීමේදී හා ආනයන ද්‍රව්‍ය පාලනය සඳහා මේ වන විටත් අදාළ පාර්ශ්ව සමඟ එක්ව කටයුතු කරන අතර ඉදිරියේදීත් එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

එසේම ශ්‍රී ලංකාවේ ගොවීන් වෙළඳ පොළට නිකුත් කෙරෙනුයේ ප්‍රාථමික නිෂ්පාදන වන අතර, එමඟින් නිෂ්පාදකයාට ප්‍රශස්ත මිලක් ලබා ගැනීමට හැකියාවක් නොලැබී ගොස් ඇත. එබැවින් ගොවියාට වැඩි ආදායමක් හිමි කර දෙමින් අගය එකතු කළ නිෂ්පාදනයන් සිදු කිරීමට ගොවීන් නැඹුරු කිරීමට පියවර ගැනේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

Now, Ministerial Statements. ගරු අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා

වෙහෙර විහාරස්ථාන පාලනයට රජය මැදිහත් වන බවට ජනමාධ්‍ය තුළින් ප්‍රසිද්ධ කිරීම: අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

விகாரைகளின் நிர்வாகத்தில் அரசாங்கம் தலையிடுவதாக வெளியான ஊடகச் செய்திகள்: நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சருமானவரின் கூற்று

MEDIA REPORTS IMPLYING GOVERNMENT INTERVENTION IN ADMINISTRATION OF BUDDHIST TEMPLES: STATEMENT BY MINISTER OF JUSTICE AND MINISTER OF BUDDHASASANA

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ - නීති අමෛච්චරුම් පුත්තචාචන අමෛච්චරුම්)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, වර්තමාන ආණ්ඩුව වෙහෙර විහාරස්ථානවල පාලනයට මැදිහත්වීමේ, වෙහෙර විහාරස්ථානවල ආදායම් පාලනය කිරීමේ කටයුත්තක් ආරම්භ කර තිබෙනවාය කියලා පසු ගිය සති කිහිපය තුළ ජනමාධ්‍ය මඟින් ඉතා විශාල ප්‍රසිද්ධියක් ලබා දෙමින් පැවතුණ බව අපි දැක්කා. ආණ්ඩුවක් විධියට අපි ඒ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කළා, "අපේ රටේ වෙහෙර විහාරස්ථාන සම්බන්ධව අදාළ වන්නේ බ්‍රිතාන්‍ය පාලන සමයේ සම්මත කරන්නට යෙදුණ 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතයි, ඒ හැරෙන්නට ආණ්ඩුව විධියට; රජය විධියට අපි කිසිදු ආකාරයකින් වෙහෙර විහාරස්ථානවල ස්වාධීනතාවට මැදිහත් වන්නේ නැහැ"යි කියලා. ඒ අතර අපි දැක්කා, මාධ්‍ය යම් යම් අවස්ථාවල විවේචනාත්මකව සඳහන් කර තිබුණා, ආණ්ඩුව වෙහෙර විහාරස්ථානවල පින් කැටවලටත් අත කියන්න සුදානම් වෙලායි සිටින්නේ කියලා. අපි ඒ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කර තිබේද්දී, ගරු කථානායකතුමනි, 2017.07.03 වන ඊයේ දින මේ රටේ සංඝරත්නය, මහජනතාව නොමඟ යවන ආකාරයේ බරපතළ ප්‍රකාශයක් විශාල ප්‍රසිද්ධියක් ලබා දෙමින් "ලංකාදීප" පුවත් පතේ මුල් පිටුවේම මෙසේ සඳහන් කර තිබෙනවා:

"කන්දෙ විහාරයේ පින් කැට 37කට සීල්. "
විහාරාධිපති හිමියෝ කියති.

"පින් කැට සීල් කළේ පඩුරු ආදායම ගණන් බලන්න."
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් කියයි.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ඒ ඓතිහාසික කන්දෙ විහාරස්ථානය බෙන්තර වලල්ලාවිට කෝරළයේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය බටුවන්හේනේ ශ්‍රී බුද්ධරක්ඛිත නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අධිපතිත්වය යටතේ පවතින පන්සලක් බව. උන්වහන්සේගේ කාල සීමාව තුළ මෙම විහාරස්ථානය ඉතාමත්ම ශීඝ්‍ර ලෙස දියුණුවට පත්වෙලා තිබෙන බවත්, විහාරස්ථානය වෙනුවෙන් විශාල සේවාවක් කළ ස්වාමීන්ද්‍රයන් වහන්සේ නමක් බවත් රටේ අපි සියලු දෙනාම පිළිගන්නා කාරණයක්.

දැන් තිබෙන ප්‍රශ්නය ගරු කථානායකතුමනි, කන්දෙ විහාරයේ පින් කැට 37කට seal කළාද කියන කාරණයයි. බෞද්ධ විහාර දේවාලගම් පනතේ පන්සල් වර්ග දෙකක් තිබෙනවා. එකක් තමයි, එම පනතේ 4 (1) වගන්තිය යටතේ පාලනය වන විහාරස්ථාන. අනෙක තමයි 4 (1) වගන්තියෙන් බැහැර කරන ලද විහාරස්ථාන.

එම පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන විහාරස්ථානයක් සම්බන්ධව භාරකරුවෙකු සිටින්න ඕනෑ; පත් කිරීමක් කරන්න ඕනෑ. ඒ පිළිබඳව ආදායම් ගණනය කිරීමේ ක්‍රමවේදයක් බෞද්ධ විහාර දේවාලගම් පනතේ iv වන කොටසේ සඳහන් කරලා තිබෙනවා. ඒ අනුව මෙවැනි වෙහෙර විහාරස්ථානවලට ලැබෙන ආදායම් පිළිබඳව මුල් කාලයේ බලතල පැවරිලා තිබුණේ මහා භාරකරුට. පසු කාලීනව - එක්දහස්නවසියඅසූ ගණන්වල- පනත සංශෝධනය වීමෙන් අනතුරුව ඒ බලතල මහා භාරකරුගෙන් ඉවත් වෙලා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබෙනවා. ඒ අනුව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කරනවා. පනතේ 4(1) වගන්තිය යටතේ ගැනෙන වෙහෙර විහාරස්ථානවලට ලැබෙන ආදායම පිළිබඳව ඒ භාරකාර භික්ෂූන් වහන්සේ හෝ භාරකරු ගිණුම් පවත්වා ගෙන යා යුතුයි. ඒ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහායි. ඒ වෙහෙර විහාරස්ථානවලින් ලැබෙන ආදායම පාරදෘශ්‍යභාවයක් සහිතව ගණනය කරලා එම මුදල් බැංකුගත කිරීම බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී තිබෙන වග කීමක්.

ගරු කථානායකතුමනි, මේ කටයුත්ත කෙරෙන්නේ කන්දෙ විහාරයේ පමණක් නොවෙයි. මේ ගණය යටතේ ගැනෙන වෙහෙර විහාරස්ථාන 258ක් අපේ රටේ තිබෙනවා. ඒ අනුව මහනුවර ශ්‍රී දළ දා මාළිගාව, ශ්‍රීපාදස්ථානය, රුහුණු මහා කතරගම දේවාලය, රත්නපුර මහ සමන් දේවාලය, දෙවුන්දර ශ්‍රී විෂ්ණු දේවාලය, දෙවුන්දර පරම විචිත්‍රාරාම විහාරස්ථානය, සීනිගම දේවාලය යනාදී ප්‍රධාන ගණයේ වෙහෙර විහාරස්ථාන ඇතුළුව බෞද්ධ විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සියලු විහාරස්ථානවල ආදායම සම්බන්ධව බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා අනුගමනය කරන්නේ මේ නීතියයි. මෙහි කිසිදු දේශපාලනයක් නැහැ; දේශපාලනඥයින්ගේ මැදිහත් වීමක් නැහැ. ඒ අනුව කන්දේ විහාරයේ පින් කැටවලින් ලැබෙන ආදායම අධීක්ෂණය කිරීමේ කටයුත්තද බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා සිදු කරනවා. එය සිදු කරන්න ගරු කථානායකතුමනි, ස්ථාපිත වුණු ක්‍රමවේදයක් තිබෙනවා. අදාළ විහාරස්ථානයේ භාරකාර භික්ෂූන් වහන්සේ හෝ භාරකරු ඒ පින් පෙට්ටිය පිරී තිබෙනවාය කියලා දැනුම් දුන්නාම, ඒ භාරකාර භික්ෂූන් වහන්සේ හෝ භාරකරු ඉල්ලා සිටින දිනයේදී බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් ගිහිල්ලා ඒ මුදල් ගණන් කරලා, බැංකු නිලධාරීන් ගෙනැල්ලා ඒ මුදල් බැංකුගත කරලා ඊට පස්සේ බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා ඒ පින් පෙට්ටිවලට සීල් තබා එන ක්‍රමය. මෙය තමයි දළ දා මාළිගාවේත් අද අනුගමනය කරන ක්‍රමය. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයා මෙම කාර්යයට මැදිහත් වන්නේ ඒ විහාරාධිපති භික්ෂූන් වහන්සේලා 'පින් පෙට්ටිය පිරී තිබෙනවා'ය කියලා දැනුම් දුන්නාට පසුවයි. අවසන් වතාවට කන්දෙ විහාරස්ථානයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත එවපු ලිපිය ගරු සභාවේ දැනගැනීම පිණිස මම කියවනවා. එහි මෙසේ සඳහන් වෙනවා:

"භාරකාර හිමි,
බෙත්තාරාම කන්දෙ විහාරය,
අලුත්ගම.

2015 මැයි 28.

ගරු නියෝජ්‍ය කොමසාරිස්තුමිය,
විහාර දේවාලගම් බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.
පින් පෙට්ටි හිස් කර නැවත තැබීම සඳහා

නියෝජ්‍ය කොමසාරිස්තුමිය,

අප විහාරස්ථානයේ තබන ලද පින් පෙට්ටි පිරී ඇති බැවින් ඒවා හිස් කොට නැවත තැබීම සඳහා මෙම මස 27, 28, 29 යන දින තුන තුළ අධීක්ෂණ කටයුතු සඳහා ඔබ දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන් සම්බන්ධ කරවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

මෙයට,
භාරකාර
(පූජ්‍ය) පී. පියරතන හිමි."

ගරු කථානායකතුමනි, අවසන් වතාවට කන්දෙ විහාරස්ථානයෙන් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත එවපු ලිපිය තමයි මම ඒ කියෙව්වේ. ඒ අනුව වෙහෙර විහාරස්ථානවල පින් පෙට්ටි පිරුණාම බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාට ඉල්ලීමක් කරනවා, "මේ මුදල් ගණන් කරලා, ගිණුම්ගත කරන්න එන්න" කියලා. ඒ ආරාධනාව මත තමයි ඔවුන් ගිහිල්ලා මේ කටයුත්ත කරන්නේ. මේ මාතෘකාව විවාදයට තුඩු දීලා තිබෙන මොහොතක, කිසිදු වග කීමකින් තොරව "ලංකාදීප" පුවත් පත මඟින් ප්‍රසිද්ධියක් ලබා දෙනවා, "කන්දෙ විහාරයේ පින්කැට 37 කට සීල්" යනුවෙන්. බලහත්කාරයෙන්, නීති විරෝධීව පන්සලේ මුදල් ලබා ගන්න ආණ්ඩුවෙන් ගිහිල්ලා සීල් තැබුවාය කියන අදහස තමයි මේ පුවතෙන් දෙන්නේ. නමුත් සත්‍ය කතන්දරය තමයි, රටේ පවතින නීතිය අනුව, වෙහෙර විහාරස්ථාන 258ක මේ කටයුත්ත සිදු කෙරෙනවාය කියන කාරණයයි. ජනමාධ්‍යවේදී මහත්වරුන්ට, විශේෂයෙන්ම මේ ලිපි ලියපු මහත්වරුන්ට, පුවත් පත්වල කර්තෘවරුන්ට වගකීමක් පැවරී තිබෙනවා, තමන්ගේ පුවත් පත රුපියල් 30ක් දීලා මිලදී ගන්න පාඨකයාට සාධාරණයක් ඉටු කරන්න. ඒ නිසා මේ වාගේ කාරණයක් වාර්තා වුණත්, අඩු ගණනේ ඒ මාධ්‍යවේදීන්ට යුතුකමක් තිබෙනවා, පන්සල් පාලනය වෙන්නේ කුමක් යටතේද, බෞද්ධ විහාර දේවාලගම් පනතේ මොනවාද තිබෙන්නේ කියලා හොයන්න. ඒ කරුණු හොයා ගන්නත් අපහසුතාවක් තිබෙනවා නම් "මේ කටයුතු සිද්ධ වන්නේ කොහොමද?" කියලා වැඩිහිටි ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමකගෙන් අහලා කරුණු දැනගන්න ඉඩ තිබුණා. ජාතික මට්ටමේ මාධ්‍යයක් විධියට සලකන "ලංකාදීප" වාගේ පුවත් පතක ජනතාව නොමඟ යවන මෙවැනි ප්‍රකාශ පළ කිරීම පිළිබඳව අපි කනගාටු වනවා. අන් සියලු දෙනාගේම අඩු පාඩුකම් හොයන, අඩු පාඩුකම් ගැන කථා කරන, දේශපාලනඥයන්ගේ මදි පුංචිකම් පිළිබඳව විවේචනය කරන, මාධ්‍යවේදීනුත්, මාධ්‍ය ආයතනවල කර්තෘවරුන් ඇතුළු ප්‍රවෘත්ති

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

සම්පාදකයනුත් මින් මතුවට ජනතාව වෙනුවෙන් තොරතුරු ලබා දීමේදී තමන්ගේ අඩු පාඩුකම් හදා ගත්තා නම් ඉන් ජනතාවට විශාල සේවයක් ඉටු වනවාය කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, මට මයික් එක දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාට මයික් එක දෙන්න.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු ඇමතිතුමනි, මට පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔබතුමා දැන් ප්‍රකාශ කළ විධියට ලංකාවේ තිබෙන ආගමික ස්ථාන 258ක තමයි මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන්නේ. ගරු ඇමතිතුමනි, ඒ ආගමික ස්ථාන 258ටම එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වුණේ එක කාල සීමාවකදී විතරක්ද, එහෙම නැත්නම් එක්තරා කාලසීමාවකදී එය වෙනස් වුණාද කියලා දැන ගන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, විහාර දේවාලගම් පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සහ 4(1) වගන්තියෙන් බැහැර කරනු ලබන වෙහෙර විහාරස්ථාන පිළිබඳව වරින් වර ගැසට් නිවේදන නිකුත් කරලා තිබෙනවා. සමහර අවස්ථාවලදී සමහර ස්ථාන 4(1) වගන්තියෙන් බැහැර කරලා තිබෙනවා; සමහර අවස්ථාවලදී 4(1) වගන්තිය යටතට පත් කරලා තිබෙනවා. ඒක එක අවස්ථාවකදී සිදු වුණු දෙයක් නොවෙයි. 1931 වසරේ ඉඳලා අද දක්වා කාලයෙන් කාලයට වෙනස් වෙමින් පවතින දෙයක්. වර්තමානය වන විට පවතින ස්ථාන සංඛ්‍යාව තමයි මම 2,058ක් වශයෙන් සඳහන් කළේ. ගැසට් නිවේදන මගින් ඒවා ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු ඇමතිතුමනි, ඒවා ඉදිරිපත් කරන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ලබා දෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විදේශ කටයුතු ඇමතිතුමා.

ජාතික ලොතරැයි මණ්ඩලයට එරෙහිව නැඟූ චෝදනා : විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

தேசிய லொத்தர் சபைக்கு எதிரான குற்றச்சாட்டுகள் : வெளிநாட்டலுவல்கள் அமைச்சரினது கூற்று

ALLEGATIONS LEVELLED AGAINST THE NATIONAL LOTTERIES BOARD: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS

ගරු රවි කරුණානායක මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Foreign Affairs)

Hon. Speaker, I rise to make this Statement in reply to the charges made by the Hon. Bandula Gunawardane, Member of Parliament, regarding the National Lotteries Board. The Hon. Member at a media conference held by the Joint Opposition on the 25th of June, 2017 displayed a piece of paper implying it to be lottery tickets. He stated that these alleged lottery tickets did not contain a draw date, draw number or winning numbers. He also stated that the said lottery was due to be drawn on the 17th of June and had been issued to the market. He alleged that they were faulty tickets. This is a serious allegation.

I made inquiries from the National Lotteries Board and they have denied the allegations made by the Hon. Member. According to their report, what was shown by the Hon. Member at the press conference was an impression of the artwork of the Govi Setha Lottery ticket. Govi Setha Lottery is drawn on five days of the week and printed in five different colours. Any lottery ticket sold in the market must have the variable data such as wining numbers, date, draw number, bar code, QR code, et cetera to be a valid lottery. Finally, special security overlay is printed on the surface.

It is strange that the Hon. Member, while displaying the alleged lottery ticket, told the media that there was no draw date or draw number printed and at the same time stated that it was to be drawn on the 17th. I think it is pertinent to ask the Hon. Member as to how he presumed that it was to be drawn on the 17th. The NLB informs me that no complaints were received from their sales network or customers in this regard. The matter has now been handed over to the CID for further investigation and the NLB will seek legal advice on the future course of action.

වගකිව යුතු මහජන නියෝජිතයෙකු නම් ගරු මන්ත්‍රීවරයා විසින් කළ යුතුව තිබුණේ එම ලොතරැයි පත සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානය යොමු කිරීම විනා, මාධ්‍ය සංදර්ශන පැවැත්වීම නොවේ. ඔහුගේ මෙම ක්‍රියාව හරහා සාමාන්‍ය ලොතරැයි පත් අළෙවිකරුවන්ගේ හා නියෝජිතවරුන්ගේ ව්‍යාපාර කටයුතු මෙන්ම ඔවුන්ගේ එදිනෙදා ජීවිකාව අවදානමකට ලක් කිරීමට උත්සාහ දරා ඇත.

ලොතරැයි පත් මුද්‍රණය කරනු ලබන්නේ විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලියක් හරහා තෝරා ගනු ලබන පෞද්ගලික මුද්‍රණකරුවන් විසිනි. ජාතික ලොතරැයි මණ්ඩලය සතු ලොතරැයි නවයක් වෙළෙඳ පොළේ පවතින අතර, දෛනිකව ලොතරැයි පත් මිලියන තුනක් අලෙවිය සඳහා නිකුත් කරනු ලැබේ. 2013 වසර තෙක්ම ටෙන්ඩර් පටිපාටියක් නොතිබුණු අතර -රාජ්‍ය මුද්‍රණ සංස්ථාව හැර - තනි මුද්‍රණ ආයතනයක් විසින් ලොතරැයි පත් පහක් මුද්‍රණය කරනු ලැබිණ. 2002 වසරේ සිට 2013 වසර දක්වා පමණක් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ඉහත කී ආයතනය වෙත ලොතරැයි පත් මුද්‍රණය වෙනුවෙන් රුපියල් බිලියන 2.2කට ආසන්න මුදලක් -ලොතරැයි පතක් සඳහා ශත 50ක් වශයෙන්- මුද්‍රණ ගාස්තු ගෙවනු ලැබීය. 2013 වසරේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කෙරුණු අතර, එකල ජාතික ලොතරැයි මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ඒකාධිකාරී කොන්දේසි හේතුවෙන් ඉහත සඳහන් කළ සමාගමටම ලොතරැයි පතක් සඳහා ශත 47ක් වන පරිදි කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. 2016 වසරේදී මෙම කොන්ත්‍රාත්තුව අවලංගුවීමත් සමඟම තරගකාරී බවට අවස්ථාව හිමිකර දෙමින් නව මිල ගණන් සඳහා ලංසු කැඳවීම සිදුවූ අතර, විශිෂ්ට ප්‍රමිතියක් සහ වැඩිදියුණු කළ ආරක්ෂිත මුහුණුවර සමඟින් ලොතරැයි පතක් සඳහා ශත 35ක පිරිවැයක් අත්කර ගැනීමට ජාතික ලොතරැයි මණ්ඩලය සමත් වූයේ, ශත 12ක ලාභයක් ද රඳවා ගනිමිනි. මේ හේතුවෙන් ජාතික ලොතරැයි මණ්ඩලයට ලොතරැයි පත් වර්ග හතරකින් පමණක් වාර්ෂිකව රුපියල් මිලියන 57ක මුදලක් ඉතිරි කර ගැනීමට හැකි වී තිබෙන අතර, වසර විස්සක් පුරා එකම බලවත් මුද්‍රණ ආයතනයකට හිමිව තිබුණු ඒකාධිකාරය බිඳ දමමින් අවශ්‍ය අවස්ථාවක සේවය ලබා ගැනීමට මුද්‍රණ ආයතන එකතුවක් නිර්මාණය කිරීමේ හැකියාව **ද** ලැබී තිබේ. නිසි තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් එවක අනුගමනය කළේ නම්, ජාතික ලොතරැයි මණ්ඩලයට රුපියල් මිලියන 850ක ලොතරැයි පත් මුද්‍රණ ගාස්තුවක් ඉතිරි කර ගැනීමට හැකිව තිබිණ.

ටෙන්ඩර් පටිපාටියේ අක්‍රමිකතාවන් පිළිබඳව ද ගරු මන්ත්‍රීවරයා සඳහන් කර ඇත. ටෙන්ඩර් පටිපාටියේ අක්‍රමිකතා යනුවෙන් ඔහු අදහස් කරන්නේ කුමක්දැයි මම දැන ගැනීමට කැමැත්තෙමි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වාඩිවෙන්න. ඔබතුමාට කථා කරන්න අවස්ථාව දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අක්‍රමිකතා යනුවෙන් ඔහු අදහස් කළේ අතීතයේ මෙන් තනි ආයතනයකට පමණක් බඩ වඩා ගැනීමට අවකාශ සැලසීමද, එසේ නැත්නම් පුළුල් අවස්ථා විවර කිරීම හරහා ජාතික ලොතරැයි මණ්ඩලයට මුද්‍රණ ගාස්තු වශයෙන් වැය වූ විශාල මුදලක් ඉතිරි කර ගැනීමද යන්න පැහැදිලි නැත.

අමාත්‍යවරුන් වෙත පවරන වගකීම් හා කාර්යභාරය පිළිබඳ විධායක ජනාධිපතිතුමා සතු පරමාධිකාරිය ද ගරු මන්ත්‍රීවරයා විසින් ප්‍රශ්න කර තිබේ. රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව හා ජාතික චිත්‍රපට සංස්ථාව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් විෂයයන් වීම, රාජ්‍ය වැවිලි හා ජනවසම රාජ්‍ය ව්‍යවසාය සංවර්ධනය යටතට පත්වීම යනාදී වශයෙන් වෙනත් අමාත්‍යාංශ වෙත අනුයුක්ත කරන ලද විෂයයන් ඔහු ඉතා පහසුවෙන් මහ හැර ඇති බවද පෙනේ. එකමත් එක කාලයක, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජනාධිපති යටතට අනුයුක්ත කර තිබූ බව ඒකාබද්ධ විපක්ෂයේ ආර්ථික පර්යේෂණ අංශයට අමතක වී ඇත්දැයි මම අසමි. ඇති විය හැකි ප්‍රතිවිපාක පිළිබඳව හොඳින් දන්නා නිසාම ගරු මන්ත්‍රීවරයා ඒ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි බව අපි දනිමු.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරයා විසින් ජූලි මාසයේ 02වැනි දින පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී යළිත් වරක් ඔහුගේ සුපුරුදු චෝදනාව ඉදිරිපත් කළේය. ලොතරැයි මණ්ඩලය සම්බන්ධව දිගින් දිගටම එල්ල කරන චෝදනා සහ මහජනතාව නොමඟ යවන එවැනි ප්‍රකාශවල පදනම් විරහිත බව සනාථ කිරීම සඳහා මේ ගරු සභාව හමුවේ සත්‍යය අනාවරණය කිරීමට මම කැමැත්තෙමි. ස්තූතියි.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
I will give you time to speak, Hon. Member.

Order, please! I wish to inform the House that the Hon. Alwaleed Bin Talal Abdulaziz Al Sahid from Saudi Arabia is present in the Speaker's Gallery now. We warmly welcome you.

මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, ගරු විදේශ කටයුතු ඇමැතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්නයි තිබෙන්නේ. ලොතරැයි මණ්ඩලය ගැනයි එතුමා ප්‍රකාශය කළේ. විදේශ කටයුතු අමාත්‍යාංශයයි, ලොතරැයි මණ්ඩලයයි අතර තිබෙන සම්බන්ධය මොකක්ද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක එතුමාට පවරලා තිබෙන්නේ.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ඒ වාගේම, ලොතරැයි මණ්ඩලය මුදල් අමාත්‍යාංශය යටතේ තමයි විගණනය කෙරෙන්නේ. [බාධා කිරීම්] විගණනය කරන්නේ මුදල් අමාත්‍යාංශය යටතේ.විදේශ කටයුතු අමාත්‍යාංශය විගණනය කරන්නේ නැහැ. ලොතරැයි මණ්ඩලය ජාත්‍යන්තරයට ගෙනියන්නද හදන්නේ? ලොතරැයි මණ්ඩලය ජාත්‍යන්තරයට ගෙනියන්නද හදන්නේ කියන එකයි මගේ ප්‍රශ්නය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
It is understood; it has been gazetted under him.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද ගරු මන්ත්‍රීතුමා? හැබැයි, එම ආයතනය එතුමා යටතේ ගැසට් කරලා තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මේ සිද්ධිය සම්බන්ධයෙන් කොමිසමක් පත් කරලා, පරීක්ෂණයක් කරන බවට ලොතරැයි මණ්ඩලයේ සභාපතිනිය මාධ්‍ය හමුවේ ප්‍රකාශයක් කළා. එහෙම කොමිසමක් පත් කළාද, එහෙම කොමිසමක් පත් කළා නම්, ඒ කොමිසමේ සාමාජිකයින් කවුද, මේ වන විට ඒ සම්බන්ධයෙන් අවසන් නිගමනයක් ලැබිලා තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා ප්‍රකාශය කළේ මීට දවස් හතරකට කලින්. ඒ ප්‍රකාශය කරපු දවසට පසු දවසේ ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිනිය ඒ සම්බන්ධයෙන් මාධ්‍යය ඉදිරියේ පිළිතුරක් ඉදිරිපත් කළා. මම හිතුවා මේ කඩාකප්පල්කාරී ස්වරූපයේ ප්‍රකාශ ගැන පාර්ලිමේන්තුව දැනුවත් කිරීම මගේ කාර්ය භාරයක් කියලා. ඒ අය මේ කරන්නේ බාධා කිරීමක් මිස වෙන දෙයක් නොවෙයි. අපි අනිවාර්යයෙන්ම මේ පිළිබඳ කොමිසමක් පත් කරලා පුළුවන් තරම් ඉක්මනට මේ පිළිබඳ හෙළිදරව් කරනවා. අපට වහන්න දෙයක් නැහැ. හැම මොහොතේම CID එකට යන බන්දුල ගුණවර්ධන මන්ත්‍රීවරයා ඇයි මේ ගැන පැමිණිලි කළේ නැත්තේ? එතුමා මාධ්‍ය ඉදිරියේ සංදර්ශන පවත්වනවා. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, එතුමාට CID එකට යන්න කියන්න. අපි මේ කාලයේ දූෂණය නැත්තටම නැති කරනවා මිසක් වෙන දෙයක් නොවෙයි කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු ඇමැතිතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ විදේශ කටයුතු ඇමැතිතුමාත් සිටින නිසා මම ප්‍රශ්නයක් මතු කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මම වාචික පිළිතුරු අපේක්ෂාවෙන් විදේශ කටයුතු අමාත්‍යතුමාට ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. ඒකට 2016 නොවැම්බර් 11වැනි දා විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරක් ලබා දුන්නා. මම ඇහුවේ, රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංගට ලබා දීපු රාජතාන්ත්‍රික ගමන් බලපත්‍රය පිළිබඳවයි. හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමා උත්තරයක් දීලා තිබෙනවා, උදයංග වීරතුංග මැතිතුමාගේ රාජතාන්ත්‍රික ගමන් බලපත්‍රය අවලංගු කරලායි තිබෙන්නේ කියලා. [ඝෝෂා කිරීම්] කොටුව අධිකරණය ගිය සතියේ,- [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා. [ඝෝෂා කිරීම්] මේකට උත්තරයක් දෙන්න පුළුවන්ද, ගරු ඇමතිතුමා?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එතුමා උත්තරයක් දෙනවා. [ඝෝෂා කිරීම්] මම අහන්නම්. [ඝෝෂා කිරීම්] කොටුව අධිකරණය ගිය සතියේ දැනුම් දීලා තිබෙනවා, එය අවලංගු කරන්න කියලා. [ඝෝෂා කිරීම්] මම අහන්නේ, එතකොට විදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට බොරුවක්ද කියලා තිබෙන්නේ කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාඩි වෙන්න, ගරු මන්ත්‍රීවරුනි. [ඝෝෂා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අපි කැබිනට් ඇමතිවරු වශයෙන් මේ ගරු සභාවේදී අහන ඕනෑම ප්‍රශ්නයකට පිළිතුරු දෙන්න සූදානමින් සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කාල වේලාව සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. තව ප්‍රශ්නයකුත් අහන්න තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම පුළුවන් තරම් ඉක්මනින් අවසන් කරන්නම්. උදයංග වීරතුංගට Diplomatic Passport එකක් දීලා තිබුණා. අපේ ආණ්ඩුව ආපු විගස ඒක වෙනස් කරලා තිබුණා. නමුත් ඒක භාර දීලා තිබුණේ නැහැ. [ඝෝෂා කිරීම්] ඒක භාර දීලා නැති වුණාට හිටපු ජනාධිපති ජපානයට, පාකිස්ථානයට, ඩුබායිවලට යන හැම අවස්ථාවේදීම එතුමාත් ගිහිල්ලා තිබෙනවා. INTERPOL එකේ "B" ලකුණ යටතේ නම් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට අංග සම්පූර්ණ උත්තරයක් ලබා දෙන්නම්. ඔබතුමා ඒ ප්‍රශ්නය අහපු එක ගැන ස්තුතියි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු ඇමතිතුමනි, මගේ පැහැදිලි කර ගැනීම මේ ලොතරැයියට අදාළවයි. එහෙම නැතුව වෙන කාරණයක් ගැන නොවෙයි. ඔබතුමා ප්‍රකාශයක් කළා, ඒකට අදාළවයි මට පැහැදිලි කර ගන්න ඕනෑ. මේ ලොතරැයිය පිළිබඳව කරුණු ඉදිරිපත් වුණු අවස්ථාවේ, සභාපතිනිය මාධ්‍ය හමුවේ ඒ ප්‍රකාශය කළේ, ඔබතුමාගේ අමාත්‍යාංශයේ දැනුවත්කම ඇතිවද? දැන්, ඔබතුමා පාර්ලිමේන්තුවට මේ කරුණු ඉදිරිපත් කරන එක හරි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මමයි සභාපතිනියට නිර්දේශ කළේ, උත්තර දෙන්න කියලා. මේ වාගේ මාධ්‍ය ඉස්සරහට ගිහිල්ලා සංදර්ශනයක් ඇති කරන අවස්ථාවේදී අපි උත්තර දිය යුතුව තිබෙනවා. ඒ සත්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමට එතුමියට මම කිව්වා, උත්තර දෙන්න කියලා. මේ මස පාර්ලිමේන්තුව පවත්වන පළමුවන දවස අද නිසා මම පාර්ලිමේන්තුවේදී අද දින එතුමාට උත්තර දෙනවා. හැබැයි, ඒ බව දැනගෙන එතුමා එළියට ගිහිල්ලා තිබෙනවා. කරුණාකරලා මේ ප්‍රශ්නය CID එකට ගෙන යන්න. ඇයි, හැංගි, හැංගි ඉන්නේ? එතැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, හැම වෙලාවේම ප්‍රශ්නයක් තිබෙනවා කියලා පෙන්වනවා නම් මම අභියෝග කරනවා, මේ වාගේ බොරු කරන්නේ නැතුව CID එකට යන්න කියලා. හැබැයි, ගියේ නැත්නම් එතුමා එතැනට ගෙන්වා ගන්නවා. එච්චරයි. [බාධා කිරීම්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒක අපි අවශ්‍ය වෙලාවට ඉදිරිපත් කරන්නම්. ගරු ඇමතිතුමනි, රටේ සම්ප්‍රදායක් කියන එකක් තිබෙන්න ඕනෑ. මේ වාගේ කාරණාවක් මතු වුණාම, ඔබතුමා මේ වාගේ වැදගත් ප්‍රකාශයක් මේ සභාවේ කරන්න මත්තෙන් නිලධාරීන් තැන තැන ප්‍රකාශ කරන්න ගියාම ඔබතුමාගේ ප්‍රකාශයේත් වටිනාකමක් නැති වෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඒක කළේ මෙහෙමයි. ගරු මන්ත්‍රීතුමා ඒ ගැන ප්‍රකාශ කළේ සෙනසුරාදා. සෙනසුරාදා ඒ ප්‍රකාශය කරලා බැලුවේ ඉරිදායි, සඳුදායි ඒ ප්‍රකාශය සඳහා මාධ්‍ය පාවිච්චි කරන්න. නිකම් හිටියා නම්, අපි වැරැදිකරුවන් බවට පත් වෙනවා. ඒක නිසා තමයි මම කියන්නේ, මේ වාගේ බොරු කරන්නේ නැතුව කරුණාකරලා CID එකට ගෙන යන්න කියලා. දැන් අපි CID එකේ case එකක් දාලා තිබෙනවා. අපි IGPට දීලා තිබෙනවා, ඒක ඉස්සරහට ගෙන යන්න කියලා. ඔබතුමාගේ ඉල්ලීමත් පරිදි මම ඒකේ වාර්තාවත් වැඩි කල් යන්න ඉස්සෙල්ලා ඉදිරිපත් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

බන්දුල ලාල් බණ්ඩාරිගොඩ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
பந்துல லால் பண்டாரிகொட மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
BANDULA LAL BANDARIGODA FOUNDATION (INCORPORATION) BILL

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"බන්දුල ලාල් බණ්ඩාරිගොඩ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல் மற்றும் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment, Welfare and Kandyan Heritage for report.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්ද නිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත. දෙවන වර කියවීම. ගරු අධිකරණ ඇමතිතුමා. යෝජනා අංක 1 සහ 2.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
යෝජනා අංක 1 විතරක් අද ඉදිරිපත් කරනවා. යෝජනා අංක 2 අද ඉදිරිපත් කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

தேருநர்களைப் பதிவுசெய்தல் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்

REGISTRATION OF ELECTORS (SPECIAL PROVISIONS) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 2.53]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - நீதி அமைச்சரும் புத்தசாசன அமைச்சரும்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - Minister of Justice and Minister of Buddhasasana)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට හේතු වුණු කාරණය මම පළමුවෙන්ම කියන්නම්. අපේ රටේ පසු ගිය කාලයේ -වසර 30කට ආසන්න කාලයක් තිස්සේ- උතුරු-නැඟෙනහිර ප්‍රදේශ ඇතුළු රට පුරාම තිබුණු ඒ ප්‍රචණ්ඩ ගැටුම්කාරී වාතාවරණය තුළ සමහර පුරවැසියන්ට ඡන්දය සඳහා ලියාපදිංචි ස්ථානයෙන් බැහැරව වෙනත් තැන්වල ජීවත් වීමට සිදු වුණා. ඒ කියන්නේ අවතැන් වෙලා සිටිනවා. එවැනි පුරවැසියන්ට තමන්ගේ ඡන්දය පාවිච්චි කිරීමට තිබෙන අයිතිය යම් යම් අවස්ථාවලදී වැළකී ගිහින් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතුන්පිටකු, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී රටක ජීවත්වන ජනතාවට තිබෙන මූලිකම අයිතිවාසිකමක් තමයි, ඒ රටේ පැවැත්වෙන නොයෙකුත් මැතිවරණවලදී ඡන්දය පාවිච්චි කිරීමට තිබෙන අයිතිය. අපේ රටේ තිබුණු ගැටුම්කාරී වාතාවරණය තුළ එසේ ඡන්දය භාවිත කිරීම අහිමි වුණු ජන කොටස්වලට සාධාරණයක් ඉටු කිරීම සඳහා තමයි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ දේශපාලන පක්ෂ කිහිපයක්ම මෙවැනි නීතියක තිබෙන අවශ්‍යතාව පිළිබඳව අප දැනුවත් කොට, මෙවැනි නීතියක් ඉල්ලා සිටියා. මීට පෙරත් එම ජන කොටස්වල අයිතිය තහවුරු කරදීම පිණිස 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත බලාත්මකව තිබුණා. නමුත්, එහි ක්‍රියාකාරිත්වය 2015 ජූනි 19වැනි දිනෙන් අවසන් වුණා. ඡන්ද බලය පාවිච්චි කිරීමට අවස්ථාව නොලැබුණු පුරවැසියන් ඡන්දය දිය හැකි ආකාරයට ලියාපදිංචි කිරීම සඳහා, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් නියමවලින් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් නිදහස් කිරීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීමට තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම ඡන්දය සඳහා ලියාපදිංචිවීමට තිබෙන සුදුසුකම් පිළිබඳව මේ පනත් කෙටුම්පතේ දෙවැනි වගන්තියේ මෙසේ සඳහන් කර තිබෙනවා:

> "2. (1) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවට යටත්ව-
>
> (අ) අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ හෝ අවතැන් වී සිටි තැනැත්තකුව සිටියා වූ ද;
>
> (ආ) 2009 වර්ෂය අවසන් වන තෙක් වූ යම් වර්ෂයක් සඳහා උතුරු පළාතේ හෝ නැඟෙනහිර පළාතේ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත් වන්නා වූ ද; සහ
>
> (ඇ) 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාමලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූ ද,"

ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ඡන්දය ලබාදීම සඳහා ලියාපදිංචි වීමට මින් අවස්ථාව ලබා දෙනවා.

මේ පනත් කෙටුම්පත පිළිබඳව පෙත්සම් දෙකක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් වුණා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහිදී මෙම පනත් කෙටුම්පතේ තිබෙන නීත්‍යානුකූලභාව පිළිබඳව දීර්ඝ වශයෙන් වාද විවාද පැවැත්වීමෙන් අනතුරුව, මෙම පනතේ නීත්‍යානුකූලභාවය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවක් ලබා දීලා තිබෙනවා. එම නඩු විභාගය අවස්ථාවේදී අපි දැනුම් දුන්නා, මේ ඉදිරිපත් කරපු පනත් කෙටුම්පතට යම්කිසි සංශෝධන කිහිපයක් එකතු කරනවා කියලා. ඒ බවත් ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ සඳහන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ 2. (ආ) වගන්තිය යටතේ අපි කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ මෙසේයි:

> "2009 වර්ෂය අවසන් වන තෙක් යම් වර්ෂයක් සඳහා උතුරු පළාතේ හෝ නැඟෙනහිර පළාතේ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ඡන්ද හිමි නාමලේඛනයක නම ඇතුළත් වන්නා වූ ද; සහ"

මේ හා සමාන වගන්ති පැවති පනත් කෙටුම්පත් කිහිපයක් මීට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයේදී විවාදයට ලක් වුණා. ඒ අවස්ථාවලදී මෙවැනි ආකාරයට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට තිබෙන සුදුසු, නුසුදුසුභාවය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජන වුණා. ඒ අනුව, උතුරු-නැඟෙනහිර දෙපළාතට සීමා කිරීමකින් තොරව, මෙම පනත් කෙටුම්පත පොදුවේ සමස්ත ශ්‍රී ලංකාවටම

අදාළ වන විධියට අපි පාර්ලිමේන්තුවේ කාරක සභා අවස්ථාවේදී සංශෝධනය කරනවා කියලා ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දුන්නා. ඒ අනුව අද දිනයේදී ඊට යටත්ව, "අභ්‍යන්තරික වශයෙන් අවතැන් වූ තැනැත්තා" කියන අර්ථ නිරූපණයේ යම් සංශෝධනයක් කරලා අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙනවා. ඒ වෙනස්කම් සහිතව මෙම පනත් කෙටුම්පත ගරු සභාවේදී සම්මත කර ගැනීමට සියලු ගෞරවනීය මැතිඇමැතිවරුන්ගේ සහාය අපි බලාපොරොත්තු වෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එදුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු අධිකරණ අමාත්‍යතුමාට මා මේ කාරණය ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම මේ නඩු තීන්දුව දීපු අවස්ථාවේදී ඔබතුමා මේ කරුණු දකින්නට ඇති. The position of the Attorney General is that the Bill is consistent with the provisions of the Constitution. ඒ ගැන අපට ප්‍රශ්නයක් තිබුණේම නැහැ. "However, in view of the matters raised by the learned President Counsel, the learned Deputy Solicitor-General informed Court that at the Committee Stage, the following Amendments will be made to "definitions" of internally displaced persons". Committee Stage එකේදී කරන්න තිබෙන සංශෝධන අපට දැන් තමයි ලැබුණේ. මේ Amendments ටික දැනට මිනිත්තු 10කට පෙර තමයි අපට ලැබුණේ. ඉතින් ඒ නිසා,- [බාධා කිරීමක්] Correct, that is what I am saying. We just got it. We are going through it one by one. I am not disputing the timing of it.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
I will clarify it.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Yes, we need a clarification. One thing is, you have mentioned the date as 18th May, 2009. Is it open-ended or what is it? Where is the limit?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Can I just explain it very briefly?

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Yes

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Deputy Chairman of Committees, in Clause 8 of the Bill, "internally displaced person" has been interpreted. It states, I quote:

> " "internally displaced person" means a citizen of Sri Lanka who was permanently resident in the Northern Province or Eastern Province and who was forced or obliged to leave from his residence at any time prior to May 18, 2009, as a result of any action of terrorist militant or other group, and currently resides in Sri Lanka outside his original place of residence in the Northern Province or Eastern Province or had re-settled in his original place of residence subsequent to the date on which the revision of the register of electors for the year 2012 commenced."

Hon. Rambukwella, I would like to mention that there are no significant changes to that, except that the definition has been more precisely clarified. There are two changes. One is, in Clause 8, under "Interpretation", two Provinces are referred to: Northern Province and the Eastern Province. We are removing that barrier, so that it would apply to the entire country.

There is another limitation. Last three lines of the second paragraph of Clause 8 states:

> "…in his original place of residence subsequent to the date on which the revision of the register of electors for the year 2012 commenced;"

We have removed that part. If any citizen who had registered previously, but due to the activities of the militants he had been displaced and not registered after the conclusion of the war in May 2009, now he will get the opportunity to have the registration irrespective of the fact that his name had been entered in the 2012 electors' register or not. Those are the two changes. I think with those changes, the right has been made crystal clear; the legal position is clear.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
There are some other Amendments.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Yes. That is because in two, three places in the Bill, the Northern and the Eastern Province are repeated. Except for that, there are no significant changes. One thing is, the seven days' period in Clause 3 has been extended to 14 days.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Then, what about the amendment proposed for Clause 8 of the Bill in page 5?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

It states:

"Sri Lanka and who was forced or obliged to leave from his permanent residence at any time prior to May 18, 2009, as a result of any action of terrorist militant or other group, and continues to permanently reside in Sri Lanka outside his original place of residence;."

That is a further qualification for him to get registered as a voter.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

That means, within Sri Lanka?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Yes, within Sri Lanka; living in Sri Lanka.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

Suppose a person is now living in Chilaw. How do we know whether he is registered now in Chilaw and then also getting registered under this?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

If he had been registered prior to 2009, the previous register of electors reflects that he had been living there.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

So, you need to raise objections if that happens?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Yes, this is really an internal displacement; within the country.

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Applying for vote for two places is a criminal offence. He is liable to be punished.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Yes, he is liable to be punished.

Thank you very much.

[අ.භා. 3.04]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මීට පෙරාතුව ගෙනෙන්න තිබුණු පනත් කෙටුම්පතක්. ඇත්තටම ප්‍රමාද වෙලා තමයි මෙම පනත් කෙටුම්පත ගෙනෙන්නේ. මොකද, යුද්ධය අවසන් වෙලා දැන් අවුරුදු ගණනක් වෙනවා. යුද්ධය නිසා අවතැන් වූ ජනතාවගේ ඡන්ද අයිතිය පැහැදිලිව, නිරවුල්ව ලබාදීම මේ පනත් කෙටුම්පතේ අරමුණක් වනවා. නමුත් දැන් ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පත ගෙනෙද්දී, මෙහි වලංගු කාලය මෙතැන් සිට අවුරුදු 4ක කාල සීමාවක් බව සඳහන් කරලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පතේ භය වන වගන්තියේ සඳහන් වනවා, "මේ පනතේ විධිවිධාන මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුදු හතරක කාල සීමාවක් සඳහා බලාත්මකව පවතින්නේ ය" කියලා. එහි අදහස වන්නේ, මේ අවතැන් වූ ජනතාව යළි පදිංචි කරවීම තව අවුරුදු හතරකට කල් යනවා කියන එක ඔබතුමන්ලා වක්‍රව පිළිගෙන තිබීමයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මේකෙන් කියන්නේ අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීමේ කාරණය නොවෙයි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඒක හරි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

යම්කිසි හේතුවක් නිසා තමන් පදිංචි වෙලා හිටපු තැන ලියාපදිංචිය නැතුව ගිහිල්ලා තිබෙන, බොහෝවිට තමන්ගේ සිය කැමැත්තෙන්ම වෙනත් ස්ථානවල ජීවත්වන පුද්ගලයන්ටත් මේ අයිතිය ලබා දීමයි. අවතැන් වෙලා ඉඳලා නැවත පදිංචි කරවනු ලැබූ පුද්ගලයන්ට පවා මේ පනතෙන් ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ලැබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ඒක මට පැහැදිලියි. ඔබතුමන්ලා මේ අවුරුදු හතර කියලා සීමාවක් යොදා ගත්තේ ඇයි කියන කාරණය ගැනයි මම සඳහන් කළේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අවුරුදු හතර ඇතුළත කරන්න බැරි වුණොත් අපි බලමු.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

2016 අවුරුද්දේ ගෙනාවේ 2020 ගැන හිතලාද? අවුරුදු හතරක කාලසීමාව තීරණය කළේ 2020 ගැන හිතලාද කියන එකයි දැන ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පත පිළිබඳව අපට ගැටලුවක් නැහැ. අපි මෙය කාලෝචිත අවශ්‍යතාවක් විධියට දකිනවා. විශේෂයෙන්ම යුදමය තත්ත්වයන් නිසා උතුරු නැඟෙනහිර පළාත්වල පමණක් නොවෙයි, ලංකාවේ හැම තැනම මේ අවතැන් වූ ජනතාවගේ ප්‍රශ්නය මතු වුණා. ඒ නිසා නිවැරදිව ඡන්දය ලබාදීමේ ඔවුන්ගේ අයිතිය අපි ආරක්ෂා කළ යුතුයි. ඒ අර්ථයෙන් ඔබතුමා මේ පනත් කෙටුම්පතෙහි යම් වෙනසක් කරලා තිබෙනවා. උතුරු සහ නැඟෙනහිර පළාත් කියලා වෙන් කරලා තිබුණු එක, මුළු රටේම -ශ්‍රී ලංකාවේම- කියලා සඳහන් කරලා තිබෙනවා. ඒක හොඳයි. ඒ අර්ථයෙන් ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත සම්බන්ධව අපේ එකඟතාව පළ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම නීතිය පිළිබඳ සාකච්ඡාවට ලක්වෙන නිසාම තවත් කරුණු දෙකක් කෙරෙහි මගේ අවධානය යොමු කරන්න කැමැතියි. ප්‍රධාන කාරණය තමයි මේ දවස්වල සිදුවෙමින් තිබෙන පොලිස් පහරදීම් පිළිබඳ කාරණය. මේ අවුරුදු දෙකහමාරක කාලය තුළ -ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ- විශේෂයෙන්ම විශ්වවිද්‍යාල සිසුන් 420කට පහරදීම් කරලා අත් අඩංගුවට ගැනීම් සිද්ධ වෙලා තිබෙන බව වාර්තා වුණා. මෑතකදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇති වුණු සිදුවීම දෙස බැලුවොත්, එතැනදී පොලීසිය විසින් කරන ලද අමානුෂික පහරදීම් මුළු රටම දැක්කා. අපි දන්නා විධියට පොලිස් දෙපාර්තමේන්තු නියෝගවල ඉතා පැහැදිලිව තිබෙනවා, එවැනි කලබලකාරී තත්ත්වයක් විසුරුවා හරින්නේ කොහොමද කියලා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. නීතිය ගැනයි මා මේ කියන්නේ. නීතිය පැත්තෙන් ඔබතුමන්ලා මැදිහත් වෙන්න ඕනෑ කියලා.

ගරු ඇමතිතුමනි, අද විවාදයට ගන්නා ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගැන ප්‍රශ්නයක් නැහැ. ඒ ගැන කථා කරන්න ගොඩක් දේවල් නැහැ. මොකද, මෙම පනත් කෙටුම්පත සම්මත විය යුතුයි. හැබැයි, කලහකාරී තත්ත්වයන්වලදී පහරදීමේ ක්‍රියාවලිය නම් නීතිය ඉක්මවා සිදු වනවා. අන්න ඒකට නීතිය භාර ඇමතිවරයා විධියට ඔබතුමා මැදිහත් විය යුතුව තිබෙනවා. මොකද, පොලිස් දෙපාර්තමේන්තු නියෝගවල -Police Ordinance- ඉතා පැහැදිලිව තිබෙනවා, කලහකාරී තත්ත්වයක් පාලනය කරන්නේ කොහොමද, duties disperse කරන්නේ කොහොමද කියලා. එවැනි අවස්ථාවකදී කණ්ඩායම් තුනක් පැහැදිලිව යොදවා ගන්න පුළුවන්.

පළමුවැනි කණ්ඩායම -ඉදිරියෙන්ම යන පොලිස් කණ්ඩායම- තමයි, කඳුළු ගෑස් ප්‍රහාර දෙන කණ්ඩායම. ඒ අය බලන්නේ, කඳුළු ගෑස් පාවිච්චි කරලා විසුරුවා හරින්නයි. දෙවැනි කණ්ඩායම තමයි, baton ප්‍රහාර දෙන කණ්ඩායම. ඒ කියන්නේ, කඳුළු ගෑස් ප්‍රහාරයෙන් විසුරුවා හරින්න බැරි නම්, baton ප්‍රහාර එල්ල කරන එක. තුන්වැනි කණ්ඩායම තමයි, අත් අඩංගුවට ගන්න කණ්ඩායම. සාමාන්‍යයෙන් මේක තමයි නීතිය. පොලිස් දෙපාර්තමේන්තු නියෝගවල ඉතා පැහැදිලිව සඳහන් වෙලා තිබෙන නීතිය ඒකයි. එතකොට තුන්වැනි කණ්ඩායමට හැර පළමුවැනි හෝ දෙවැනි කණ්ඩායමට කිසිදු කෙනෙක්ව අත් අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූල බලයක් නැහැ. එය පොලිස් දෙපාර්තමේන්තු නියෝගවල ඉතා පැහැදිලිව තිබෙනවා. හැම පොලීසියකම පොලිස් නියෝග සඳහන් බයිබලය වාගේ ලොකු පොතක් තිබෙනවා. සෑම පොලිස් නිලධාරියෙකුටම එම නියෝග පිළිබඳව අවබෝධයක් තිබිය යුතුයි.

විශේෂයෙන්ම උසස් පොලිස් නිලධාරීන්ට මේ පිළිබඳව නීතිමය අවබෝධයක් තිබිය යුතුයි. නමුත්, පසු ගිය සිදුවීම්වලදී ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් -SSPලා, SPලා මට්ටමේ අය- හැසිරුණු ආකාරය අපි දැක්කා. මේ මැතකදී සිදුවූ කලහකාරී අවස්ථාවේදී SP කෙනෙක් තමයි baton පොල්ලක් අරගෙන විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක් පසු පස පැන්නුවේ. Baton පොලු ප්‍රහාරයක් දෙන්න ශිෂ්‍යයෙක් පසු පස යන්න SP කෙනෙකුට කිසිදු අයිතියක් නැහැ. මොකද, පොලිස් නියෝගවල ඉතා පැහැදිලිව තිබෙනවා, එය සීමා වෙන්නේ මොන කණ්ඩායමටද කියලා. එවැනි උසස් නිලධාරියෙකුට තිබෙන්නේ එතැන අණ ක්‍රියාත්මක කිරීම මිසක්, baton පොල්ලක් අරගෙන ශිෂ්‍යයෝ පස්සේ පන්නන්න නොවෙයි. ඒ සඳහා ඔහුට නීත්‍යානුකූල බලයක් නැහැ. ඇත්තටම එවැනි සිදුවීම් ඇති වුණේ, පොලිස් දෙපාර්තමේන්තු නියෝග පිළිපදින්නේ නැතිකම නිසායි.

කලහකාරී අවස්ථාවකදී විසුරුවා හරින ආකාරය පොලිස් නියෝගවල ඉතා පැහැදිලිවම තිබෙනවා. සාමාන්‍යයෙන් කාමරයක් ඇතුළේ කලහකාරී සිද්ධියක් වනවා නම්, කාමරයේ දොරවල් වහලා, ගේට්ටු වහලා එතැනින් යන්න බැරි විධියට කොටු කරලා පහරදීම් කරන්නේ නැහැ. කාමරය වහලා කඳුළු ගෑස් ගහන්නේ නැහැ. යන්න බැරි විධියට කාමරය වහලා baton පොලු ප්‍රහාර දෙන්නේ නැහැ. ප්‍රහාර දෙන විධිය ඉතා පැහැදිලිව තිබෙනවා. යන්න පාරක් හදලා, එක්කෝ දොරවල් විවෘත කරලා, නැත්නම් ගේට්ටුව විවෘත කරලා තමයි එක පැත්තකින් කඳුළු ගෑස් ප්‍රහාර දෙන්න ඕනෑ. ඒක ඉතාම පැහැදිලිව නියෝගවල තිබෙනවා. හැබැයි, එහෙම නොවෙයි සිදු වුණේ. කාමර වහලා, ගේට්ටු වහලා පහරදීම් කරන කොට එම ශිෂ්‍යයන්ට යන්න තැනක් නැති වනවා. එතකොට තමයි එතැන කලහකාරී තත්ත්වයක් ඇති වෙන්නේ. එතකොට තමයි පොදු දේපළ හානියට පත් වෙන්නේ.

ගරු ඇමතිතුමනි, SAITM එකේ ප්‍රශ්නය නිසා පසු ගිය දවස්වල ඇති වුණු සිද්ධියට අදාළ ශිෂ්‍යයෝ හොයාගෙන දැන් පොලීසිය රට වටේම ගෙවල්වලට යමින් අත් අඩංගුවට ගන්න මෙහෙයුමක් ක්‍රියාත්මක කරනවා. එය ඉතාම නීති විරෝධී වැඩක්. එතැන එම ප්‍රශ්නය මතු වුණේ, පොලීසිය විසින් පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝග හරියට පිළිපදින්නේ නැතුව කටයුතු කරපු නිසායි. පොලීසිය, පොලිස් දෙපාර්තමේන්තුවේ නියෝගවලට අනුව කටයුතු කළා නම් එතැන පොදු දේපළ හානියක් සිද්ධ වෙන්නේ නැහැ. එතැන තිබෙනවා, නීති විරෝධී විධියට පොලීසියේ මැදිහත් වීමක්. එම නිසා නීතිය ක්‍රියාත්මක කිරීමේදී පොලීසිය පැත්තෙන් නීතිය අභිභවා -නීතිය ඉක්මවා- යමකිසි මැදිහත් වීමක් කළා නම්, එය නිවැරදි කිරීමට මැදිහත් වීම නීතිය භාර අමාත්‍යවරයාගේ වග කීමක් විධියට මම දකිනවා. මොකද අත් අඩංගුවට ගන්න බලය තිබෙන්නේ, තුන්වන කණ්ඩායමට. ඔවුන්ටත් නිකම්ම අත් අඩංගුවට ගන්න බැහැ. ඔවුන් නියමිත පරිදි නිල ඇඳුම සහිතව තමයි යන්න ඕනෑ. පොලීසියට නියමිත නිල ඇඳුම සහිතව ගිහින් තමයි අත් අඩංගුවට ගැනීම් කරන්න ඕනෑ. නමුත් මෑත කාලීනව සිද්ධ වුණු පහරදීම්, අත් අඩංගුවට ගැනීම් යනාදී සියලු දේවල්වලදී අපි දැක්කා, පොලිස් දෙපාර්තමේන්තු නියෝග අනුව පොලීසිය ක්‍රියා කළේ නැති බව. එම නිසා ඉතා පැහැදිලිව මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් එතැන සිදු වී තිබෙනවා. මෙය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කළ හැකි කාරණාවක්.

අද රටේ සිදු වන නොයෙකුත් සිදුවීම්වලදී පොලිස් දෙපාර්තමේන්තු නියෝග ඉක්මවා යමින් පොලීසිය හැසිරෙනවා. ඒක ඉතාම බරපතළ වැරැද්දක්. නීතිය තමන්ගේ අතට අරගෙන, නීතියට පිටින් ක්‍රියා කිරීමක්. එම නිසා අධිකරණ විෂය භාර ඇමතිවරයා විධියට ඔබතුමා ඒ වෙනුවෙන් මැදිහත් විය යුතුයි. මේ රටේ ශිෂ්‍යයෝ වෙන්න පුළුවන්; ගොවියෝ වෙන්න පුළුවන්; කම්කරුවෝ වෙන්න පුළුවන්; තමන්ගේ සාධාරණ ප්‍රශ්න

[ගරු විජිත හේරත් මහතා]

වෙනුවෙන්, මේ රටේ ජනතාවගේ පොදු ප්‍රශ්න වෙනුවෙන් මැදිහත් වෙද්දී ඊට ක්‍රියාත්මක වීමේ නීත්‍යානුකූල ක්‍රමවේදයක් තිබෙනවා.

පොලීසියට හෝ වෙනත් ආයතනයකට ඒ නීත්‍යානුකූල ක්‍රමවේදයෙන් පිට ගිහින් හැසිරෙන්න හැකියාවක් නැහැ; අයිතියක් නැහැ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිදුවීම මෙවැනි බරපතළ තත්ත්වයකට වර්ධනය වෙන්න පැහැදිලිව බලපෑවේ වෙන මොකක්වත් නොවෙයි, පොලිස් දෙපාර්තමේන්තු නියෝග අභිභවා පොලීසිය ක්‍රියාත්මක වීමයි. ඒ නිසා වහාම එයට මැදිහත්වෙලා, නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීම නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන ඇමතිවරයාගේ වග කීමක් කියලා මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙවන කරුණ මෙයයි. දැනට රටේ මතු වී තිබෙන කුණු ප්‍රශ්නය පිළිබඳව අද මේ සභාවේදී සාකච්ඡා වුණා. කුණු ප්‍රශ්නය සම්බන්ධයෙන් අද නීති විරෝධී විධියට හැසිරෙන්නේ, නීති විරෝධී විධියට කටයුතු කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, ආණ්ඩුවයි. එහිදී අමු-අමුවේ නීතිය උල්ලංඝනය කරනවා. වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එදා පරිසර ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ නිකුත් කරපු ගැසට් නිවේදන තිබෙනවා. ඒ ගැසට් නිවේදන පවා අද උල්ලංඝනය කර තිබෙනවා. මේ දවස්වල තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, කොළඹ නගර සභාවෙන් කුණු ගෙන ගොස් මුතුරාජවෙල අභය භූමියට දමන එක. අභය භූමිය කියන්නේ, පරිසර අමාත්‍යාංශය විසින්ම, ඒ වාගේම වනජීවී අමාත්‍යාංශය විසින්ම විවිධ නියෝග, චක්‍රලේඛ, ගැසට් නිවේදන නිකුත් කරලා වෙන් කරපු භූමි ප්‍රදේශයක්ය කියලා කවුරුත් දන්නවා. 2006 ඔක්තෝබර් මාසයේ 13වන සිකුරාදා නිකුත් කරපු ගැසට් නිවේදනය මා ළඟ තිබෙනවා. මේ ගැසට් නිවේදනය නිකුත් කරන්නේ වෙන කවුරුවත් නොවෙයි, වර්තමාන ජනාධිපති, එදා පරිසර ඇමති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි. එතුමා නිකුත් කරපු ඒ ගැසට් නිවේදනයේ ඉතා පැහැදිලිව තිබෙනවා, "මෙහි 1වන උපලේඛනයේ විස්තර කර ඇති සීමාවන් තුළ පිහිටා ඇති ප්‍රදේශය ඉහත කී පනතේ කාර්යය සඳහා පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් විය යුතු බවත්, එම නියෝගය මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවත් ...." කියලා.

එදා පරිසර ඇමතිවරයා, වර්තමානයේ රටේ ජනාධිපතිවරයා ගැසට් නිවේදනය නිකුත් කර තිබෙන්නේ 2006 ඔක්තෝබර් මාසයේ 13වන දායි. ඒ ගැසට් නිවේදනයෙන් තමයි වර්තමාන ජනාධිපතිවරයා විසින් මුතුරාජවෙල අභය භූමිය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් වශයෙන් නම් කරනු ලබන්නේ. මේ විධියට සීමාව වෙන් කළාට පස්සේ කිසි කෙනකුට මේ භූමියට, මේ ප්‍රදේශයට කැළි කසළ වැනි දේවල් දමන්න බැහැ. එය නීති විරෝධීයි. එය රක්ෂිත අභය භූමියක් විධියට නම් කර තිබෙනවා. ඒ අභය භූමියට කවුරුන් හෝ බලහත්කාරයෙන් කුණු දමනවා නම් එය වළක්වන්න උසාවි නියෝගයක් ගන්න, පොලීසිය මැදිහත් කරවා ගන්න තිරසර සංවර්ධන හා වනජීවී ඇමතිවරයාට -ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිවරයාට- වග කීමක් තිබෙනවා; බලයක් තිබෙනවා. නමුත් අවාසනාවක තරම! ප්‍රදේශයේ ජනතාව අවස්ථා කිහිපයකදීම කඳාන පොලීසියට, ජා-ඇල පොලීසියට පැමිණිලි කිහිපයක් ඉදිරිපත් කර තිබෙනවා, අභය භූමියට කුණු දමන එක නීති විරෝධීයි කියලා. නමුත් පොලීසියට ඉදිරිපත් කරපු පැමිණිලි සම්බන්ධයෙන් විභාග වන්නේ නැහැ; විභාග කරන්නේ නැහැ. මේ ගැසට් නිවේදනයට අනුව මේ අභය භූමියට කුණු බැහැර කරන්න කිසිදු කෙනකුට අයිතියක් නැහැ. ඒ ප්‍රදේශයට කුණු ගෙන ගිහින් දමන්න කොළඹ නගර සභාවට තිබෙන නීත්‍යානුකූල බලය; අයිතිය මොකක්ද?

ඇත්තටම ගත්තොත් මේ කුණු ගිහින් දමන්නේ එතැන තිබෙන ජලයටයි. ජලයට කුණු බැහැර කරන්න කිසිසේත්ම අයිතියක් නැහැ. එය මූලික පාරිසරික නීතින් පවා උල්ලංඝනය කිරීමක්. මේ ජලය අපිරිසිදුවීම නිසා මීගමුව කළපුව විතරක් නොවෙයි, ඒ ප්‍රදේශයේ තිබෙන ඇළවල් සියල්ලම අපිරිසිදු වනවා, ඊට එහා පැත්තේ ජීවත්වන ජනතාවට පානීය ජලය ටිකවත් හරියාකාරව පිරිසිදුව ලබාගන්න බැරි තත්ත්වයක් ඇති වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ෆයිසර් මුස්තාපා ඇමතිතුමා කිව්වා, රෝහල්වලින් ඉවත් කරන මිනිස් අවයව එතැනට දමන්නේ නැහැයි කියලා. මිනිස් අවයව එතැනට දමන්නේ නැතිවෙන්න පුළුවන්. හැබැයි එතැනට ගෙන ගොස් දමන්නේ දිරාපත් නොවන කසළයි. ප්ලාස්ටික් බෝතල්, සිරින්ජර් කටු, වීදුරු වැනි සියලු දේවල් එතැනට දමා තිබෙනවා. ඒ වාගේම කුණුවන, දිරාපත්වන, ගඳ ගහන සියල්ලම ගෙන ගිහින් අභය භූමියට දමනවා. මේ සම්බන්ධයෙන් ඉතා පැහැදිලි නීති කිහිපයක් තිබෙනවා. වර්තමාන ජනාධිපතිවරයා එදා පරිසර ඇමතිවරයා වශයෙන් නිකුත් කරපු ගැසට් නිවේදනය පමණක් නොවෙයි, වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත තිබෙනවා. ඒ ආඥා පනතට අනුවත් ඒ භූමිය අභය භූමියක් වශයෙන් ඉතා පැහැදිලිව නම් කරලා තිබෙනවා. ඒ භූමියට කැළි කසළ බැහැර කරන්න කිසි කෙනකුට නීත්‍යානුකූල අයිතියක් නැහැයි කියන එක ඒ ආඥා පනතේ තිබෙනවා.

තුන්වන කාරණාව මෙයයි. අධිවේගී මාර්ගවලින් කුණු ගෙන යන්න පුළුවන් වන්නේ කොහොමද කියන එක පිළිබඳව ජාතික පාරිසරික පනතේ 3 වන වගන්තියේ ඉතා පැහැදිලිව සඳහන් වනවා.

I quote:

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන)පනත් කෙටුම්පත දෙවන වර කියවීම සඳහා වූ විවාදය අද පැවැත්වෙනවා. ඒ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම සඳහා නව නීතියක් සම්පාදනය කිරීම සඳහායි. උතුරේ කොටි ත්‍රස්තවාදය නිසා අවතැන් වෙච්ච සියලු දෙනාට ඒ අයිතිය ලබා දෙන්නට ඕනෑ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිබෙන සාමාන්‍ය නීතිය යටතේ ඒ අයට තමන්ගේ ඡන්ද අයිතිය ලබා දෙන්නට බැරිද? ලබා දෙන්නට පුළුවන්. ඇයි මේ විශේෂ නීතියක් ගේන්නේ? විශේෂ නීතියක් ඕනෑ වෙන්නට පුළුවන්. ඒ විශේෂ නීතිය ඕනෑ වෙන්නේ මොකද, සාමාන්‍ය නීතිය තිබියදී? සාමාන්‍ය නීතියක් නැත්නම් විශේෂ නීතියක් ගෙනාවාට තමක් නැහැ. ඇයි මේ විශේෂ නීතියක් ගේන්නේ? අපිට සැකයක් මතු වෙනවා. යහපාලන ආණ්ඩුව එක පැත්තකින් ඡන්ද හිමියන්ට ඡන්ද අයිතිය ලබා දෙන්නට කටයුතු කරන අතරම අනෙක් පැත්තෙන් රටේම ජනයාගේ ඡන්ද අයිතියට වැට බඳින්නට කටයුතු කළ ආණ්ඩුවක් බවට ඉතිහාස ගත වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුව තිබෙනවා. පළාත් පාලන ආයතන විසුරුවා හැර දැන් අවුරුදු දෙකකට වැඩි කාලයක් ගත වී තිබෙනවා. පළාත් පාලන ආයතන අක්‍රීය වී තිබීම නිසා ඩෙංගු රෝගය උවදුරක් බවට පත් වී දවස ගණනේ ජනයා බිළි ගන්නා තත්ත්වයට, මේ රටේ අහිංසක ජනයා දවස ගණනේ මරා දමන තත්ත්වයට පත් වී තිබෙනවා.මෙයට ප්‍රධාන හේතුව අන් කවරක්වත් නොවෙයි. පළාත් පාලන ආයතනවලින් සිද්ධ වෙච්ච මදුරු මර්දන ක්‍රියාවලිය දුර්වල වීම පමණක් නොවෙයි, කසළ කළමනාකරණ ක්‍රියාවලියත් දුර්වල වීමයි. එම නිසා පළාත් පාලන මැතිවරණය තියන්න භයයි. ආණ්ඩුව පළාත් පාලන මැතිවරණය හරියට බාලගිරි දෝෂය වාගේ "අද නොවෙයි හෙට" කියන තත්ත්වයට පත් වී තිබෙනවා. පළාත් පාලන මැතිවරණය තියන්න "කෝදුරුතෙල් හත් පට්ටයකුත් තවත් ටිකක් ඕනෑ" ය කියා ආණ්ඩුව කියනවා. ඒ "ටික" හොයා ගන්න බැහැ ගරු ෆයිසර් මුස්තාෆා ඇමතිතුමාට. මේ "ටික" කවදා ද හම්බ වෙන්නේ? කෝදුරුතෙල් හත් පට්ටයකුයි තවත් ටිකකුයි ඕනෑ, පළාත් පාලන මැතිවරණය තියන්න. මේ විධියට පළාත් පාලන මැතිවරණය දිගින් දිගටම කල්දමන යහපාලන ආණ්ඩුව අනෙත් පැත්තෙන් ඡන්ද හිමි අයිතිය ලබා දෙන්නට කල්පනා කරනවා. මේක තමයි ආණ්ඩුවේ තිබෙන පරස්පරය. අපට සැකයි, මේ ලැහැස්ති වෙන්නේ මොකටද කියා. එක පැත්තකින් පළාත් පාලන ඡන්ද විමසීම දින නියමයක් නැතිව කල්දමා තිබෙනවා. හරියට දිනයක් කියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු තුන්දහසක් තිබෙනවා. මේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා සුදුස්සන් තෝරා ගැනීමට 2016 පෙබරවාරි මාසයේ තරග විභාගයක් පැවැත්වුවා. ඒ තරග විභාගයෙන් ඉහළ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳෙව්වා. ඒ සම්මුඛ පරීක්ෂණයෙන් ඉහළ සුදුසුකම් ලැබූ අය තෝරා ගත්තා. නමුත් ඒ තෝරා ගත් අයට තවම පත්වීම් දුන්නේ නැහැ. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය තවම පත්වීම් දුන්නේ නැහැ. එසේ පත් වීම් නොදී දැන් මොකද කරන්න හදන්නේ? එදා 1977-1994 සමයේ එක්සත් ජාතික පක්ෂයේ ගමේ දේශපාලනය කළ, යූඇන්පියේ ශාඛා සමිතිවල සභාපති, ලේකම්ලාට තමුන්නාන්සේලාගේ යුඇන්පි ආණ්ඩුව වගා නිලධාරි පත්වීම් දුන්නා. පසුව ඒ වගා නිලධාරීන්ට ග්‍රාම නිලධාරීන් හැටියට පත් වීම් ලබා දුන්නා. ඒ පසුව ග්‍රාම නිලධාරීන් වුණු වගා නිලධාරීන් දැන් විශ්‍රාම ගිහින් තිබෙනවා. ඒ විශ්‍රාම ගිය අය දැන් ග්‍රාම නිලධාරී පුරප්පාඩුවලට ගන්න හදනවා. අපට ආරංචිය තිබෙන විධියට 1800කට දැන් ඒ තනතුරු දෙන්න ලැහැස්ති කර තිබෙනවා. මේ අය ඔක්කොම එදා පත් කර ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගෙන්, රාජ්‍ය අමාත්‍යවරුන්ගෙන්, කැබිනට් ඇමතිවරුන්ගෙන්. මොකටද මේ එන්න ලැහැස්ති වෙන්නේ?

ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා පවත්වපු තරග විභාගයේ ප්‍රතිඵල අනුව වැඩිම සුදුසුකම් ඇතිව ලකුණු ලබා ගත් අය සම්මුඛ පරීක්ෂණවලට කැඳෙව්වා නම්, ඒ සම්මුඛ පරීක්ෂණවලට කැඳවපු අයගේ වැඩිම ලකුණු අනුව ඒ අයට ග්‍රාම නිලධාරි පත්වීම් නොදී, තමන්ගේ ගෝල බාලයන් වුණු වගා නිලධාරීන් ග්‍රාම නිලධාරීන් බවට පත් කර එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතියේ සභාපතිලාට, ලේකම්ලාට මෙම ග්‍රාම නිලධාරි පත්වීම් ටික දෙන්න යන්නේ මොකටද? එකෙන් තේරෙනවා, කරන්න හදන සෙල්ලම

[ගරු ජයන්ත සමරවීර මහතා]

එච්චර හොඳ නැහැ කියලා. නිදහස් චතුරස්‍රයේ පිහිටි රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වෙනම තිබුණු ග්‍රාම නිලධාරී අංශය අද වන විට අතිරේක ලේකම්වරයෙක් යටතේ වෙනම ගොඩනැඟිල්ලකට ගෙනිහිල්ලා, රුපියල් ලක්ෂ අටක මාසික කුලියකට පවත්වාගෙන යනවා. ඒ නිසා පැහැදිලියි, එක පැත්තකින් ඡන්ද අයිතියත් දීගෙන තමයි එන්න හදන්නේ කියා. අනෙක් පැත්තෙන් ග්‍රාම නිලධාරී පුරප්පාඩුවලට එක්සත් ජාතික පක්ෂයේ තමන්ගේ ඡන්ද හදපු ශාඛා සමිතිවල ලේකම්ලා, සභාපතිලා, වගා නිලධාරීන් ග්‍රාම නිලධාරීන් බවට පත් කර ඒ උදව්ය ගෙනෙන්නයි හදන්නේ.

අනෙක් පැත්තෙන් දින නියමයක් නැතිව තමන්ගේ ඡන්ද මගඩියට ඕනෑ කරන යටිතල පහසුකම් ටික හොඳට හදා ගන්නතුරු මේක කල් දම දමා තෙපරබබා ඉන්නේ වෙන මොකටවත් නොව, ඊළඟ ඡන්ද මගඩියක් කරලා බලය අත් පත් කර ගන්න කියන එක පැහැදිලියි. ඒක තමයි මේ ගමන. ඒකට තමයි මේ ලක ලැහැස්ති වෙන්නේ. ඒකට තමයි මේ සූදානම් වෙන්නේ. ඒකට නොවෙයි නම්, ඒක නොවෙයි කියලා අපට කියන්න. ඒ නිසා මේ එන්න හදන්නේ වෙන මොනවාටවත් නොවෙයි, ඒක තමයි මේ සැලැස්ම. උතුරේ කොටි ත්‍රස්තවාදීන්ගේ මෘග යුද්ධය නිසා අවතැන් වුණු දෙමළ ජනතාවට, සිංහල ජනතාවට, මුස්ලිම් ජනතාවට ඡන්ද අයිතිය ලබා දෙනවා නම් එය ලබා දෙන්න ඕනෑ. ඒකට අපි පක්ෂයි. ඒ ඡන්ද අයිතිය විතරක් නොවෙයි, ඒ ජනතාවට නැති වුණු හැම අයිතියක්ම ලබා දිය යුතුයි. ඒ අයිතිය ලබා දෙන ගමන් මේ එන්න හදන්නේ වෙන මොනවාටවත් නොවෙයි. ඒ ඡන්දදායක අයිතිය පෙන්න පෙන්න මේ ලක ලැහැස්ති වෙන්නේ, මේ රටේ එළැඹෙන හැම මොහොතකම තියන්න තිබෙන මැතිවරණ නැවත වතාවක් කොල්ල කෑමටයි. ඒක තමයි මේ අයගේ උපාය මාර්ගය බවට පත් වෙලා තිබෙන්නේ කියන එක අපට බොහොම පැහැදිලියි. ඒක එහෙම නොවෙයි නම්, ආණ්ඩු පක්ෂයේ කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් මේ සඳහා උත්තර දෙන්න. ග්‍රාම නිලධාරී විභාගය පවත්වා තිබියදී, එහි සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබියදී, ග්‍රාම නිලධාරී තනතුරට සුදුසුකම් අනුව එම පුරප්පාඩු පිරවීමට තෝරා තිබියදී ඒ පත්වීම් ටික නොදී, ග්‍රාම නිලධාරීන් බවට පත් වුණු වගා නිලධාරීන්, එක්සත් ජාතික පක්ෂයේ ශාඛා සමිතිවල හැට පිරුණු අය; විශ්‍රාම ගිය ලේකම්ලා, සභාපතිලා යූඑන්පී එකේ මන්ත්‍රීවරුන්ගේ, ඇමතිවරුන්ගේ, නියෝජ්‍ය ඇමතිවරුන්ගේ, රාජ්‍ය ඇමතිවරුන්ගේ ලැයිස්තුවලින් නැවතත් රාජ්‍ය සේවයට ගෙනැල්ලා දාන්න හදන්නේ මොකටද කියලා අපි අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ දෙමළ ජනතාවගේ ඡන්ද අයිතිය වෙනුවෙන් අපි පෙනී ඉන්නා අතරතුර, මේ වෙලාවේ අපි ඒ අයිතිය ලබා දෙන්න ඕනෑ. අනෙක් නැති වුණු හැම අයිතියක්ම දෙන්න ඕනෑ. මේ රට දාලා ගිය අයට නැවත මේ රටේ ඇවිල්ලා පදිංචි වෙන්න; නැවතත් මේ රටේ ජීවත් වෙන්න; නැවත මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා සමඟ සතුටින් සමඟියෙන් වාසය කරන්න අයිතිය දෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න. අද, දෙමළ ජනතාවට දකුණේ සහ සෙසු පළාත්වල ජීවත්වීමට අයිතිය තිබෙනවා. අද, මුස්ලිම් ජනතාවට දකුණේ සහ සෙසු පළාත්වල ඕනෑ තැනක ජීවත්වීමට අයිතිය තිබෙනවා. හැබැයි, උතුරේ සිංහල ජනතාවට ජීවත්වීමට අද අයිතියක් නැහැ. උතුරේ නාග විහාරයේ ඉදිවෙන බුදු පිළිම වහන්සේ ඉදි කරන්න අයිතිය දෙන්නේ නැහැ. ඒක නවත්වන්න කියලා තර්ජන පිට තර්ජන එනවා. අද මුලතිව් පන්සලේ බුදු පිළිම වහන්සේ ඉදිවෙන එක නවත්වන්න කියලා තර්ජන පිට තර්ජන එනවා. ඒ පන්සල එකැනින් අයින් කරගෙන යන්න කියලා එහි වෙසෙන හාමුදුරුවන් වහන්සේලාට බලපෑම් පිට බලපෑම් එනවා. මෙහෙන් අයිතිය ඉල්ලනවා. එහෙන් අයිතිය නැති කරනවා. මේකද, ප්‍රජාතන්ත්‍රවාදය? මේකද, සාධාරණය? අපි කියන්නේ එහෙම බැහැ. උතුරේ දෙමළ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය නිසා-

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද, ඔබතුමියගේ point of Order එක?

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ පල්ලිය අයින් කරන්න කියලා. අවුරුදු 10ක,15ක පමණ කාලයක සිට අපේ temple ඔක්කෝම අයින් කරනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමිය පැහැදිලි කිරීම කළේ මම මතු කළ කාරණය ගැන නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාග විහාරයේ බුදු පිළිම වහන්සේ ඉදි වෙන්න දෙන්නේ නැහැ. ඒක නවත්වනවා. මුලතිව් පන්සල ගොඩනඟන්න දෙන්නේ නැහැ, ඒක නවත්වනවා. පන්සල දාලා යන්න කියලා හාමුදුරුවන්ට බලපෑම් පිට බලපෑම් කරනවා. ඒක එහෙම වෙන්න බැහැ. දකුණේ එහෙම නැහැ. දෙමළ ජනතාව, මුස්ලිම් ජනතාව දකුණේ හැම තැනම සිංහල ජනතාවත් එක්ක සමඟියෙන් ඉන්නවා නම්, උතුරෙත් මුස්ලිම් ජනතාව, දෙමළ ජනතාව, සිංහල ජනතාව කවුරුත් එකට වාසය කරන්න ඕනෑ.

අපි අවධාරණය කරන්නේ බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය නිසා වේළුපිල්ලේ පිරබාහරන්ගේ යකඩ සපත්තුවට පෑගිලා හිටපු ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය දෙනවාට අපි පක්ෂයි කියන එකයි. හැබැයි, ඒක ජාති භේද නැතුව, ජාතිවාදය නැතුව සිදු විය යුතුයි. එක ජාතියකට විතරක්, එක ජාතිකත්වයකට විතරක් වරදාන, වරප්‍රසාද ලබා දෙන විධියට නොව, හැමෝටම සමානව ඒ අයිතිය ලබා දෙන්න ඕනෑය කියන එක අවධාරණය කරමින්, එසේ කරන ලෙස අප ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යහපාලන ආණ්ඩුව, ඡන්දයට භය ආණ්ඩුව, දිනෙන් දින ජනතා අප්‍රසාදයට පත් වන ආණ්ඩුව මේ සැරසෙන්නේ බරපතළ ඡන්ද මංකොල්ලයකටය කියන එකත් අවධාරණය කරමින් මා නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, මොකක්ද point of Order එක.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍ර ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා ඉතා වේගවත් කථාවක් කළා. මා එතුමාට බොහොම මිත්‍රශීලිව කියන්න කැමැතියි, එතුමන්ලා මිනිස්සුන්ගේ හැඳුනුම් පත් එකතු කළේ නැත්නම්, ගොවියාගේ තුවක්කු අරගත්තේ නැත්නම් - [බාධා කිරීමක්] කොහෙද එදා ප්‍රජාතන්ත්‍රවාදය තිබුණේ? ඔබතුමා අද කථා කරනවා, ප්‍රජාතන්ත්‍රවාදය ගැන. ඔබතුමන්ලානේ මිනිස්සුන්ගේ හැඳුනුම් පත් එකතු කළේ. පළමුවෙන් ඡන්දය දාපු මිනිස්සුන්ව අත් කපලා, නාස් කපලා, කන් කපලා, ඇඟිල් කපලා ගෙදර යැව්වේ කවුද? පළමුවෙන්ම ඡන්දය දාපු මනුෂ්‍යයාගේ අත කැපුවේ කවුද? [බාධා කිරීමක්]

[අ.භා. 4.31]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන වර කියැවීම සඳහා අද දින ඉදිරිපත් කර තිබෙන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත යටතේ වවන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ලබා දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා.

ඡන්ද කල් දැමීම පිළිබඳවත්, දේශපාලන පත්වීම් ලබා දීම පිළිබඳවත් කියමින් ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා අපේ රජයට විශාල චෝදනා රාශියක් නැඟුවා. අපි විශේෂයෙන් මතක් කරන්න ඕනෑ, එතුමන්ලාගේ කාලයේ දිවි නැගුම සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විධියට ලබා දීපු දේශපාලන පත්වීම් ගැන. අපි සියලු දෙනාම දන්නවා, සමෘද්ධි සංවර්ධන නිලධාරීන් එළිපිටම දේශපාලනය කරමින් පසු ගිය ආණ්ඩුවේ දේශපාලන නියෝජිතයින් හැටියටයි අද වන තුරුත් වැඩ කරන්නේ කියන එක. එතකොට එතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ ඒවා ලබා දුන්නේ කොහොමද කියන එක ගැනත් එතුමා කියන්න ඕනෑ.

ඊළඟට, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරි මහත්වරු පත් කළේ කොහොමද කියලත් එතුමන්ලා කියන්න ඕනෑ. එදා හිටපු ආසන සංවිධායකවරු යවපු ලැයිස්තුවලට අනුවයි ඒ අයව පත් කළේ.

එතුමා අපට චෝදනා කරනවා වාගේම එතුමන්ලා පත් කළ නිලධාරීන් ගැනත්- ඒවා අපි කියන කොට දැන් මෙතැනින් නැඟිටලා යනවා. හැම දාම එහෙම තමයි. අපට චෝදනා කරනවා, ඊළඟට අපි කථා කරන විට අහගෙන ඉන්න බැරුව නැඟිටලා යන එක තමයි එතුමන්ලා කරන්නේ.

එතුමා පළාත් පාලන මැතිවරණය ගැනත් කිව්වා. මම මතක් කරන්නට ඕනෑ, ගරු මහින්ද රජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ කොළඹ මහ නගර සභාව විසුරුවා හැරලා අවුරුදු තුනහමාරක පමණ කාලයක් විශේෂ කොමසාරිස්වරයෙක් යටතේ එය පාලනය කළා; මැතිවරණය පැවැත්වුවේ නැහැයි කියන එක. ඒ කාලයේත් මේ වාගේ දේවල් වුණා. අද මේ පළාත් පාලන මැතිවරණය කල් දැමීම සිදු වෙලා තිබෙන්නේ අපේ-

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
මෙතුමා මේ කථා කරන්නේ කොළඹ මහ නගර සභාවේ- [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. [බාධා කිරීමක්] ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න. [බාධා කිරීමක්]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කොහොම හෝ මැතිවරණයක් පැවැත්වූයේ නැහැ. මැතිවරණය තියන්නේ නැතිව අවුරුදු ගණනාවක්- [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, වාඩි වෙන්න, මේ මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මැතිවරණය පවත්වන්නේ නැතිව විශේෂ කොමසාරිස්වරයෙක් යටතේ කොළඹ මහ නගර සභාව අවුරුදු තුනක් විතර පාලනය කළා. මොකද, එදා මහින්ද රාජපක්ෂ මහත්මයා භය වුණා, මැතිවරණය පැවැත්වුවාම එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරයි කියලා. එම නිසා ඒ විධියට කටයුතු කරගෙන ගියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් පාලන මැතිවරණය කල් දැමීමේ අපි නොවෙයි. පළාත් පාලන මැතිවරණය කල් දමන්නට හේතුව මෙයයි. එදා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ හිටපු බැසිල් රාජපක්ෂ මහත්මයාගේ අමාත්‍යාංශයෙන් තමයි මේ කොටියාස සීමා නිර්ණය කළේ. විරුද්ධ පක්ෂයේ කිසිම දේශපාලන පක්ෂයකින් අදහස් විමසුවේ නැහැ; ඒ සාකච්ඡාවලට අප කැඳෙව්වේ නැහැ. අපට කිව්වේ නැහැ, මේ කොටියාස සීමා නිර්ණය කරන්නේ කොහොමද කියලා. ඒ කිසි දෙයක් කරන්නේ නැතිව, සුද්දෝ දකුණු අප්‍රිකාව බෙදුවා වාගේ, සම්පූර්ණ සිතියම ගෙනැල්ලා එතුමාගේ මේසය උඩ දාලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායකවරුන්ට ඕනෑ විධියට කොටියාස සීමා නිර්ණය කළා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

එහෙම කරපු නිසා තමයි නැවත මේ සීමා නිර්ණය කරන්නට සිදු වුණේ. ඒ නිසා තමයි මේ මැතිවරණය කල් ගියේ. මැතිවරණය කල් යාමේ වරදට වගඋත්තරකාරයෝ තමුන්නාන්සේලා. අද වගඋත්තරකාරයෝ ඇවිල්ලා අපට චෝදනා කරනවා, අපි මැතිවරණය කල් දානවා කියලා. මැතිවරණය කල් දාන්න අපට අවශ්‍යතාවක් නැහැ. ඕනෑම වේලාවක මැතිවරණයකට යන්න අපි ලැහැස්තියි. ඒක ගැන අපට ගැටලුවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන්ගේ නාම ලේඛන ලියා පදිංචි කිරීම සම්බන්ධයෙනුත් එකතු කරන්නට ඕනෑ අදහස් කිහිපයක් තිබෙනවා. විශේෂයෙන් අද කොළඹ නගරය ඇතුළු නගරවල කුලී නිවාසවල ජීවත් වන ජනතාව විශාල පිරිසක් සිටිනවා. මම හිතන විධියට කොළඹ නගරය තුළ පමණක් කුලී නිවාසවල ජීවත් වන පවුල් 15,000කට වැඩි සංඛ්‍යාවක් සිටිනවා. කුලී නිවාසවල ජීවත්වීම මතම ඔවුන්ට ඡන්ද හිමි නාම ලේඛනයට තම නම ඇතුළත් කිරීමේ අවස්ථාව අහිමි වෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, කුලී නිවැසියන්ට ඡන්ද හිමි නාම ලේඛනයට තමන්ගේ නම ඇතුළත් කරන්නට ඒ ගෙවල්වල හිමිකරුවන් ඉඩ නොදීම. කොළඹ නගරය ඇතුළු නගරවල ජීවත් වන ජනතාව අද මුහුණ දෙන විශාල ප්‍රශ්නයක් තමයි, කුලී නිවාසවල ජීවත්වීම මතම මේ රටේ ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය නොලැබීම. මම හිතනවා, අපි මේ ප්‍රශ්නය ගැනත් සාකච්ඡා කර නීති රීති සකස් කරන්නට ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම වීථිවල ජීවත් වන ජනතාවටත් මේ ප්‍රශ්නය තිබෙනවා. විශාල ප්‍රමාණයක ජනතාවක් වීථිවල ජීවත් වෙනවා. ඒ වීථිවල ඉන්න ජනතාවටත් ඡන්ද බලය නැහැ. අපි දන්නවා, පසු ගිය කාලයේ කොළඹ නගරයේ වීථිවල හිටපු සමහර අය අරගෙන ගිහින් පරිවාස නිවාසවලට දාලා තිබෙන බව. ඒ පරිවාස නිවාසවල ඉන්න අයටත් ඡන්දය දැමීමේ වරම ලැබෙන්නේ නැහැ; එම අයිතිය ලැබෙන්නේ නැහැ. එම නිසා මම හිතනවා, අපි මේ කරුණු ගැන අවධානය යොමු කළ යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමන්ගේ ලෙඩේ සුව වෙලා නමුත් නිවාසවලින් ඇවිදින් එක්කගෙන යන්නේ නැති විශාල පිරිසක් අංගොඩ මානසික රෝහලේ ඉන්නවා. ඔවුන්ට ඒ ඡන්ද අයිතිය ලැබෙන්නෙත් නැහැ. මානසික රෝගය සුව වුණාට පසුව ඔවුන්ට ඡන්දය දීමේ වරම නැවත ලැබෙන්නේ නැහැ. මොකද, ගෙවල්වල සිටින අය ඔවුන් පදිංචිව සිටි නිවාසවලට නැවත ඔවුන් එක්ක ගිහින් නැති නිසා, තවමත් ඔවුන් ඒ රෝහල්වලම සිටින නිසා ඔවුන්ටත් ඡන්ද අයිතිය ලැබිලා නැහැ. මේකත් අපි දකින විශාල අඩු පාඩුවක්.

දේශපාලනඥයන්ට මේ සියලු දේවල් ගැන විශාල වගකීමක් තිබෙනවා. අපි දන්නවා, සමහර තැන්වල ග්‍රාම නිලධාරි මහත්වරුන් ඡන්දහිමියන් ලියා පදිංචි කිරීම නිසියාකාරයෙන් නොකරන බව. සමහර නගරවල ඒ වෙනුවෙන් නිලධාරීන් පත් කරලා ඉන්නවා. නමුත් ඒ නිලධාරි මහත්වරු සමහර වෙලාවට ගෙවල්වලට ගිහින් නිසි විධියට, නිසි ක්‍රමවේදයකට මේ ඡන්ද forms ලබා දෙන්නේ නැහැ. සමහර තැන්වල ඡන්ද forms ලබා දෙනවා, නමුත් ඒවා එකතු කරන්නට නැවත එන්නේ නැහැ.

මේ අතර ඡන්ද පෝරම ලබා දීලා නැති නිවාසත් විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ සඳහා තමයි දේශපාලන පක්ෂවල නියෝජිතයන් පත් කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට දැනගන්න ලැබී තිබෙන කරුණු අනුව දැනට මේ නියෝජිතයන් පත් කරලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් පමණයි. තවම අනෙක් පක්ෂවලින් මේ නියෝජිතයන් පත් කරලා නැහැ. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂයේ සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අයින් වුණු; අයින් කළ මන්ත්‍රීවරුන්ට පුළුවන්, පොහොට්ටුව හරහා දැන් ඒ නියෝජිතයන් පත් කරන්න. ඒ නිසා තමුන්නාන්සේලා වහාම තමුන්නාන්සේලාගේ නායක බැසිල් රාජපක්ෂ මහත්තයාට කියලා ඒ තනතුරු සඳහා නියෝජිතයන් පත් කර ගත්තොත් හොඳයි. මොකද, එතකොට ග්‍රාම නිලධාරි මහත්වරුන්, ඒ ප්‍රදේශවල සිටින මැතිවරණ නිලධාරි මහත්වරුන් කියන සියලු දෙනාම එකතු කර ගෙන අපට ක්‍රමවත්ව මේ කාර්යය කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලය පුරාම යුද්ධය හරහා අභ්‍යන්තරව ඡන්ද අයිතිය අහිමි වෙලා සිටි, යුද්ධය හරහා අනාථ වෙලා සිටි විශාල පිරිසකට අද මේ පනත් කෙටුම්පත හරහා ඒ වරම නැවත අපි ලබා දෙනවාය කියලා මා හිතනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබුණු කාලය අවසානයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව එක් විනාඩියක් ලබා දෙන්න.

ලංකාවට එන්න බැරිව ශ්‍රී ලාංකික පුරවැසියන් විශාල සංඛ්‍යාවක් දකුණු ඉන්දියාවේ ජීවත් වනවා. ඔවුන්ටත් ඡන්ද අයිතිය ලැබී නැහැ. මීට අමතරව විදේශගත වෙලා සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් සිටිනවා, මැද පෙරදිග හා ඒ අවට රටවල. ඒ වෙනුවෙන් නම් පාර්ලිමේන්තුව හරහා යම් කමිටුවක් පත් කරලා ඒ වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වී ගෙන යනවා. ඉදිරියේදී, විදේශගත වෙලා සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ටත් තමන් ජීවත් වන ඒ රටවල් තුළදීම තම ඡන්දය පාවිච්චි කිරීමේ හැකියාව අපි ලබා දිය යුතුයි. ලෝකයේ දියුණු වන රටවල් කරන වෙනස්කම් පිළිබඳව අධ්‍යයනය කර, අපිත් ඒ වෙනස්කම් කර ගෙන ඉදිරියට යා යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වෙනුවෙන් අපි ක්‍රියාත්මක විය යුතුයි කියලා කියමින්, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 4.41]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று தமிழர்கள் தங்களுடைய வாக்குகளைப் பதிவது தொடர்பிலே சிந்தித்துக்கொண்டிருக்கின்ற வேளையில், இன்றைய தினம் இச்சபையிலே அதனுடன் தொடர்புடைய ஒரு சட்டமூலம் கொண்டுவரப்படுவதானது மிக முக்கியமான விடயமாகப் பார்க்கப்படுகின்றது. இலங்கையிலே யுத்தத்தினால் அதிகமாகப் பாதிக்கப்பட்டவர்கள் வடக்கிலும் கிழக்கிலும் வாழ்கின்ற தமிழ் மக்களாவர். அத்துடன், வாக்காளர் இடாப்பிலே தங்களுடைய பெயர்களைப் பதிவதிலே ஏற்படுகின்ற இடைஞ்சல்களைச் சந்திப்பவர்களும் இந்தத் தமிழ் பேசும் மக்களே! இங்கு எனக்கு முன்பு பேசிய கௌரவ உறுப்பினர் ஜயந்த சமரவீர அவர்கள், "வட மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் வாழ்ந்த சிங்கள, முஸ்லிம் மக்களுடைய இடப்பெயர்வுகள், அவர்களுடைய பதிவுகள் சரியாக மேற்கொள்ளப்படவில்லை" என்று குறிப்பிட்டார். இது சம்பந்தமாக நான் சில விடயங்களை இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

மிக முக்கியமாக, இலங்கையில் சுதந்திரத்துக்கு முன்னர் அநுராதபுரத்தில் பெரும்பாலான தமிழர்கள் வாழ்ந்தார்கள். அவர்கள் அங்கேயிருந்து 1956ஆம் ஆண்டிலும் 1958ஆம் ஆண்டிலும் சிங்கள மொழி பேசுகின்ற வன்முறையாளர்களால் பலாத்காரமாக வெளியேற்றப்பட்டார்கள். அவ்வாறு காடையர்களால் வெளியேற்றப்பட்ட அந்த மக்கள் தங்களுடைய இருப்பிடங்களையும் உடுபுடவைகளையும் இழந்த நிலையில், வடக்கிலும் கிழக்கிலும் குடியேறி வாழ்ந்தார்கள். அவ்வாறானவர்களுடைய பெயர்களிலும் அவர்களின் பரம்பரைப் பெயர்களிலும் இன்றும் அநுராதபுரத்திலே பல காணிகள் காணப்படுகின்றன. அவற்றைச் சிங்கள மக்கள் சுவீகரித்து வைத்திருக்கிறார்கள். இன்றும் அநுராதபுத்திலே ஒரு சிவாலயம் இருக்கின்றது. அதேபோல், இன்றைக்கும் அநுராதபுரத்திலே தமிழர்களுடைய பெயர்களில் திரையரங்கு உட்படப் பல கடைகளும் காணப்படுகின்றது. இவற்றைச் சகோதர உறுப்பினராகிய நீங்கள் ஏன்தான் புரிந்துகொள்ளத் தவறுகின்றீர்கள்? என்றுதான் நான் எண்ணுகின்றேன்.

1983ஆம் ஆண்டு திருநெல்வேலியில் நடந்த ஒரு கண்ணிவெடித் தாக்குதலில் 13 இராணுவத்தினர் கொல்லப் பட்டதை மையமாகவைத்து, தென்னிலங்கையிலே பல்லாயிரக் கணக்கான தமிழ் மக்கள் தங்களுடைய சொத்துக்களை இழந்தார்கள். குறிப்பாக, மலையகத்திலே இருந்த ஏதுமறியாத அப்பாவி மக்கள் சிங்களக் காடையர்களால் வெட்டிக் கொலை செய்யப்பட்டார்கள். அவர்களுடைய சொத்துக்கள் அழிக்கப்பட்டன. அங்கிருந்து அவர்கள் உடுத்த உடுப்புகளோடு கலைக்கப்பட்டார்கள். அதேபோல, கொழும்பிலே இருந்த தமிழ் மக்கள் “லங்கா ராணி” கப்பலிலும் “லங்கா முதித” கப்பலிலும் வடக்கு நோக்கி அனுப்பப்பட்டார்கள். இதெல்லாம் வரலாற்றில் நடந்த சம்பவங்கள்! வரலாறுகள் அவ்வாறு இருக்கின்றன. நீங்கள் செய்த தவறுகளும் அநியாயங்களும் இனப்படுகொலைகளும் இந்த மண்ணிலே மேலோங்கியிருக்கின்றபொழுது, மக்களை வேறு வழிகளில் திசை திருப்புவதுபோல இந்த விடயங்களை மாற்றிக் கதைப்பது என்பது ஒரு நல்லிணக்கத்துக்கானதாக அமையாது. நீங்கள் செய்த பாவங்களைக் கழுவத் தயாராகுங்கள்! நீங்கள் செய்த விடயங்களினால் இந்த நாட்டில் என்னென்ன நடந்திருக்கின்றது? யார் இதற்குக் காரணமாக இருந்தார்கள்? என்ற விடயங்களை முதலில் சொல்லுங்கள்!

இன்றுகூட நான் பத்திரிகையைப் புரட்டுகின்றபொழுது பார்த்தேன், தேர்தல் ஆணைக்குழுவின் தலைவர் மகிந்த தேசப்பிரிய அவர்கள் குறிப்பிட்டிருக்கிறார். “இந்த நாட்டிலே 1983ஆம் ஆண்டு இனக்கலவரம் ஏற்படாமல் இருந்தால், சிங்கள மக்கள் தமிழர்களைத் தாக்காமல் இருந்திருந்தால், நான் இன்று பூரணமாகத் தமிழ் பேசுகின்ற ஒருவனாக இருந்திருப்பேன்” என்று. அவ்வளவுதூரம் அவரே குறிப்பிடுகின்ற அளவுக்கு இந்த நாட்டிலே எவ்வாறு ஒரு பிரச்சினை தமிழர்கள் மீது திணிக்கப்பட்டது? என்பதைத்தான் நாங்கள் இந்த இடத்திலே பார்க்கவேண்டும்.

இவ்வாறு தமிழர்கள்மீது தொடர்ந்து மேற்கொள்ளப்பட்ட இன வன்முறைகள், இன அழிப்புகள் காரணமாக அவர்கள் இந்த நாட்டிலே இருக்க முடியாது புலம்பெயர்ந்தார்கள். அவ்வாறு புலம்பெயர்ந்த மக்களில் இரண்டு இலட்சத்துக்கும் மேற்பட்டவர்கள் இந்தியாவிலே வாழ்கின்றார்கள். அதேபோல, புலம்பெயர்ந்த எமது மக்களில் பன்னிரண்டு இலட்சத்துக்கும் மேற்பட்டவர்கள் இன்று பல்வேறு நாடுகளில் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். ஆனால், இவர்களுடைய பெயர்கள் வாக்காளர் இடாப்புகளிலே பதியப்படுவதில்லை. அதனால்தான் இன்று வடக்கு, கிழக்கிலே வாழுகின்ற மக்களின் பிரதிநிதித்துவம் என்பது - அவர்களுடைய மக்கள் பிரதிநிதிகளுடைய தொகை என்பதுகூட கேள்விக்குறியாக்கப் பட்டிருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அம்பாறை மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு ஒரு காலத்தில் இரண்டு தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்கள் இருந்திருக்கிறார்கள். அங்கு 1941ஆம் ஆண்டிலே எவ்வளவு தமிழர்கள் வாழ்ந்தார்கள், எவ்வளவு சிங்களவர்கள் வாழ்ந்தார்கள், எவ்வளவு முஸ்லிம்கள் வாழ்ந்தார்கள் என்ற வரலாற்றைத் திருப்பிப் பாருங்கள்! இந்த விபரங்களை 1970களில் பாருங்கள்! 1990களில் பாருங்கள்! 2000 இலிருந்து 2017 வரையும் பாருங்கள்! இன்று அந்த அம்பாறை மாவட்டத்திலே ஒரு தமிழ்ப் பிரதிநிதித்துவத்தைப் பெறுவதற்குக்கூடப் பகீரதப் பிரயத்தனம் செய்யவேண்டிய நிலை ஏற்பட்டுள்ளது. இதனால் அந்த மண்ணுக்குச் சொந்தமான பூர்வீகக் குடிகள் இன்று அங்கலாய்த்திருக்கின்ற ஒரு சூழலை நாங்கள் காண முடிகின்றது.

இதேபோல, திருகோணமலை மாவட்டத்தை எடுத்துக்கொண்டால், 1941ஆம் ஆண்டில் அங்கு வாழ்ந்த சிங்கள மக்களுடைய விகிதாசாரம் என்ன? தமிழ் மக்களுடைய விகிதாசாரம் என்ன? முஸ்லிம் மக்களுடைய விகிதாசாரம் என்ன? என்பவற்றைப் பாருங்கள்! இன்று இருக்கின்ற நிலை என்ன? இது எவ்வாறு நடந்தது? யார் இதற்குக் காரணம்?

இன்னுமொரு விடயத்தை இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன். கன்னியா வெந்நீரூற்று என்பது இராவணன் என்கின்ற ஒரு தமிழ் மன்னன் இலங்கையை ஆண்டபொழுது தன்னுடைய தாயாரின் அந்திமக் கிரிகைகளைச் செய்வதற்காக அவன் வெட்டிய கிணறுகள் என்று வரலாறு சொல்லுகின்றது. ஆனால், இப்பொழுது அது சிங்களவர்களுக்குச் சொந்தமானதென்று வரலாற்றை மாற்றியெழுதி, அங்கு இருந்த சிவன் ஆலயத்தை இல்லாமல் செய்து, பிள்ளையார் ஆலயத்தை அகற்றிவிட்டு, இப்பொழுது அங்கு பௌத்த விகாரை அமைக்கப்பட்டிருக்கின்றது. இதுதான் இந்த நாட்டினுடைய வரலாறு! இதைத்தான் இந்த நாட்டினுடைய ஒற்றுமையாகக் கொள்ள முடியுமா?

நாங்கள் மௌனம் காக்கின்றோம்; இந்த நாட்டிலே நல்லிணக்கம் பற்றிப் பேசுகின்றோம்; விட்டுக்கொடுக்கக்கூடிய அளவுக்கு விட்டுக்கொடுக்கின்றோம்; உங்களோடு சேர்ந்து வருவதற்குத் தயாராக இருக்கின்றோம். ஆனால், எங்களுடைய இந்த மௌனங்களையும் இந்தக் காலத்திலே நாங்கள் தருகின்ற ஆதரவுகளையும் நீங்கள் எங்களுடைய ஒரு பலவீனமாகக் கருதுகிறீர்களா என்ற சந்தேகம் இப்பொழுது தமிழர்களிடம் எழுந்திருக்கின்றது. இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற இனப்பிரச்சினைக்கு ஒரு தீர்வைக் காணவேண்டும் என்பதற்காக இந்த அரசாங்கத்திற்கு எவ்வளவுதூரம் எமது ஆதரவைக் கொடுத்துத் தீர்வைக் காண முயற்சிக்கின்றோமோ அவ்வளவுதூரம் தமிழர்கள் புறக்கணிக்கப்படுகின்ற சூழல்தான் இங்கு காணப்படுகின்றது. இந்த நாட்டிலிருக்கின்ற அநேகமான சிங்களத் தலைவர்கள் இப்பொழுதும் தங்களுடைய ஓர் அரசியல் மூலதனமாக இனவாதங்களைப் பேசுவதனையும் இனரீதியான குரோதங்களை வளர்ப்பதிலும் இனரீதியாகத் தங்களுடைய செல்வாக்கை அதிகரிப்பதிலும்தான் கவனத்தைச் செலுத்துகின்றார்களோ என்கின்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் ஜயந்த சமரவீர அவர்கள்கூட "முல்லைத்தீவு மாவட்டத்திலே சிங்கள மக்கள் இருந்தார்கள், இப்பொழுது அவர்கள் அங்கு இல்லை" என்று இந்த இடத்தில் குறிப்பிட்டிருந்தார். இதனை நான் இந்த அடிப்படையில்தான் பார்க்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முல்லைத்தீவு மாவட்டத்திலே, மிக முக்கியமாக கருநாட்டுக்கேணியில் இருந்த ஒரு விநாயகர் ஆலயத்தை 2001ஆம் ஆண்டுக்குப் பின்னர் ஒரு பௌத்த துறவி வலுக்கட்டாயமாகப் பிடித்து, இப்பொழுது அந்த ஆலயத்தை அகற்றி எறிந்துவிட்டு, அந்த இடத்திலே ஒரு பௌத்த விகாரையை அமைத்துக்கொண்டிருக்கின்றார். நீதிமன்றம் அந்தப் பிள்ளையார் ஆலயத்திற்குரிய இடத்தைவிட்டு அந்தத் துறவியை வெளியேறுமாறு தீர்ப்பு வழங்கியிருந்தது. அதனையும் மீறி அந்தப்

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பௌத்த பிக்குவால் செயற்பட முடிகின்றதென்றால், இந்த நாட்டினுடைய சட்டம், நீதியைப்பற்றி யாரிடம் சொல்வது? இவைதான் இந்த நாட்டிலே நடந்துகொண்டிருக்கின்றன.

முல்லைத்தீவு மாவட்டத்தில் கொக்கிளாய், கொக்குத்தொடுவாய்ப் பிரதேசங்களில் ஆமையன்குளம், பட்டிக்குடியிருப்பு, டொலர்பாம், கென்பாம், புளியமுனை, கந்தசாமி மலை, ஒதியமலை போன்ற பிரதேசங்கள் இன்று எவ்வாறு பெயர் மாற்றப்பட்டிருக்கின்றன! 2010ஆம் ஆண்டு இந்த நாட்டின் ஜனாதிபதியாக இருந்த மஹிந்த ராஜபக்ஷ அவர்கள் தன்னுடைய படை பட்டாளங்களோடு சென்று, கந்தசாமி மலை, ஒதியமலை போன்ற கிராமங்களிலிருந்த தமிழர்களது நிலங்களை, அவர்களுடைய அறுதி உறுதி கொண்ட பூர்வீகக் காணிகளைச் சிங்கள மக்களுக்குப் பகிர்ந்தளித்து, 'மஹிந்தோதய' உறுதியும் வழங்கியிருந்தார். இது இந்த நாட்டிலே நியாயமானாதா? அப்பாவித் தமிழ் மக்களினது காணிகளை அவர்களது கண்முன்னே பறிப்பதும் அதில் சிங்கள மக்களைக் குடியேற்றுவதும் ஒரு நியாயமான காரியமாக அமையுமா?

தமிழர்கள் பூர்வீகமாக வாழுகின்ற நாவற்குழி மண்ணிலே எந்த ஒரு சிங்கள மகன்கூட ஒருகாலத்திலும் வாழ்ந்ததில்லை. இன்று அங்கு சிங்கள மக்களைக் குடியேற்றி, இப்பொழுது நூற்றுக்கும் மேற்பட்ட பௌத்த துறவிகள் அங்கு சென்று அந்த இடத்திலே ஒரு பௌத்த தேவாலயத்தை அமைப்பதற்கு அத்திவாரம் இடுகிறார்கள். அவர்களிலே இருபத்தைந்து பேரளவில் யாழ்ப்பாண வைத்தியசாலைக்குச் சென்று இரத்த தானம் செய்தார்கள். அங்கேயிருக்கின்ற இராணுவத்தினரிலும் ஒரு பத்துப் பேர் சென்று இரத்த தானம் செய்தார்கள். இதனைப்பற்றி வடக்கு மாகாணத்தினுடைய ஆளுநர் சொல்கிறார், இப்பொழுது வடக்கிலே, யாழ்ப்பாணத்தில் வாழ்கின்ற மக்களை வெட்டிப் பார்த்தால், அவர்களிடம் பௌத்த பிக்குகளுடைய இரத்தமும் இராணுவத்தினருடைய இரத்தமும்தான் ஓடிக்கொண்டிருப்பதாக.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

40-50 பிக்குகளுடைய, அல்லது ஒருசில இராணுவத்தினருடைய இரத்தம் அவருடைய கண்ணுக்கு எவ்வாறு தெரிகின்றது! என்றுதான் நான் நினைக்கின்றேன். இப்பொழுதும்கூட நேர்மையாக, உளச்சுத்தியோடு அந்த மக்களுடைய பிரச்சினையை அணுகமுடியாமல், இரத்தம் பற்றிய கதைகளையே சொல்லி மக்களைத் திசைதிருப்ப முற்படுகின்ற ஆளுநர்தான் இப்பொழுது வடக்கில், யாழ்ப்பாணத்தில் இருக்கின்றாரென்பதை நாங்கள் இந்த இடத்திலே பார்க்க வேண்டும்.

இந்த நாட்டிலே பெருமளவில் இடம்பெயர்ந்தவர்கள் தமிழர்கள் என்பதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும். கிழக்கு மாகாணத்திலே 1941ஆம் ஆண்டிலிருந்த தமிழர்களுடைய விகிதாசாரம் 82 சதவீதமாகும். 1948ஆம் ஆண்டு இலங்கை சுதந்திரம் அடைகின்றபொழுது கிழக்கு மாகாணத்தில் அவர்கள் 80 சதவீதமாக இருந்தார்கள். இன்று 42 சதவீதமாக அங்கு தமிழர்களுடைய விகிதாசாரம் குறைந்திருக்கின்றதென்றால் இதற்கு யார் காரணம்? அங்கிருந்த தமிழர்களை யார் விரட்டினார்கள்? அங்கிருந்த தமிழர்களுடைய நிலங்களை யார் பறித்தார்கள்? ஏன், ஏனைய இனங்கள் அங்கு இவ்வாறு பெருகியிருக்கின்றன? இந்த நிலையில்தானா நாட்டிலே நாங்கள் சமாதானம் பற்றிப் பேசுவது?

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றும் இந்த நாட்டிலே உள்ள பிரச்சினைக்குத் தீர்வுகாண யாரும் தயாராக இல்லை. அந்த வகையிலான செய்திகளையே தினமும் காலை பத்திரிகையை விரித்துப்பார்த்தால் பார்க்க முடிகின்றது. "அனைத்துப் பிக்குமார்களையும் திரட்டி, வரப்போகின்ற அரசியலமைப்புக்கு எதிராகப் போராடுவோம்" என்று அஸ்கிரிய பீடம் சொல்கின்றது! உள்ளூராட்சிச் சபைத் தேர்தல்களை நடாத்தும்வரை அரசியல் வழிகாட்டல் குழுவிலிருந்து தங்களுடைய தரப்பினர் வெளியேறப் போவதாக மஹிந்த ராஜபக்ஷ சொல்கிறார்! இப்படியாக multi-barrel பீரங்கிகளைப் போல இவர்கள் தங்களுடைய வசனங்களால் தாக்கிக்கொண்டிருக்கின்றார்கள். Multi-barrel பீரங்கிகளை முதன்முதல் இந்த நாட்டிலே அறிமுகம் செய்தவர்கள் விடுதலைப் புலிகள்! இலங்கை இராணுவப் படையினர் பாவிப்பதற்கு முன்னரே பல்குழல் பீரங்கிகளைப் பயன்படுத்தியவர்கள் தளபதி பால்ராஜ் தலைமையிலான விடுதலைப் புலிகள்! இந்த நிலையில் நாட்டிலே சமாதானம் பற்றி யார் பேச முடியும்? நாட்டிலே நல்லிணக்கம் பற்றி யார் பேச முடியும்? இவை இந்த நாட்டிலே மிக முக்கியமான கருத்துக்களாக அமையுமா?

வெளிநாடுகளில் இடம்பெயர்ந்திருக்கின்ற தமிழர்களை வாக்காளர்களாகப் பதிவதற்கு பல்வேறுபட்ட முயற்சிகள் மேற்கொள்ளப்பட்டன. இந்தியாவில் இருக்கின்றவர்கள் தமிழ் நாட்டிலோ அல்லது டில்லியிலோ இருக்கின்ற துணைத் தூதரங்களில் தங்களை வாக்காளர்களாகப் பதிவுசெய்வதற்கான ஏற்பாடுகளைச் செய்ய வேண்டும். தேர்தல் நடக்கின்றபொழுது அந்த தூதரகங்களுக்குச் சென்று வாக்களிக்கக்கூடிய உரித்து அவர்களுக்கு வழங்கப்பட வேண்டும். அவ்வாறான ஒரு சூழல் உருவாக்கப்படுகின்றபொழுதுதான் தமிழர்களுடைய உண்மையான வாக்குப் பலத்தைச் சரியாக எடைபோட முடியும். சாதாரணமாகச் சிந்தியுங்கள்!

இன்று வடக்கிலும், கிழக்கிலும் இருக்கின்ற 8 மாவட்டங்களிலும் பல்கலைக்கழகங்களுக்குச் செல்கின்ற, ஆசிரிய பயிற்சிக் கல்லூரிகளுக்குச் செல்கின்ற, கல்வியியற் கல்லூரிகளுக்குச் செல்கின்ற மாணவர்களுடைய தொகையை எடுத்துப் பாருங்கள்! அவற்றுக்குத் தெரிவுசெய்யப்படுகின்ற மாணவர்களுடைய மற்றும் பாராளுமன்ற உறுப்பினர்களுடைய எண்ணிக்கையைத் தீர்மானித்தல் எல்லாமே இந்த வாக்காளர் இடாப்பின் அடிப்படையிலேயே மேற்கொள்ளப்படுகின்றன. அவ்வாறான ஒரு சூழலில், வாக்காளர் இடாப்பினூடாகச் சரியான முறையில் விடயங்கள் மேற்கொள்ளப்படுகின்றனவா? தமிழர்களுடைய உண்மையான பிரதிநிதித்துவம் அவர்களுடைய வாக்குப் பலத்தினூடாகச் சரியாக மேற்கொள்ளப்படுகின்றதா? என்ற விடயங்களை முதலில் நாங்கள் சிந்திக்க வேண்டும். இந்த நாட்டிலே தொடர்ந்தும் பல்வேறுபட்ட விடயங்கள் மேற்கொள்ளப்படுகின்றன; பல்வேறுபட்ட விடயங்கள் பேசப்படுகின்றன. ஆனால், நல்லெண்ணத்துக்கான கருத்துக்கள் முன்வைக்கப்படுவதில்லை. பாதிக்கப்பட்ட எமது மக்களுடைய தரமான வாழ்க்கை முறைக்கான அமைப்புக்கள் உருவாக்கப்படவில்லை. ஆகவே, முதலிலே உங்களுடைய மாயைகளிலிருந்து நீங்கள் வெளியிலே வரவேண்டும்; இதயசுத்தியோடு பேசுகின்ற நிலைமை உருவாக வேண்டும்!

நான் இந்த இடத்திலே இன்னொரு விடயத்தையும் குறிப்பிட விரும்புகின்றேன். அண்மையிலே கிளிநொச்சி மாவட்டத்தினுடைய கண்டாவளை பிரதேச செயலாளர் பிரிவிலே இருக்கின்ற உழவனூர் தம்பிராசபுரம் என்ற பகுதியில் மகேந்திரன் ரவீந்திரன் என்ற 32 வயதுடைய ஒருவர் கொல்லப்பட்டார். ஒன்பது வயதிலே ஓர் ஆண் பிள்ளை, இரண்டரை வயதிலே ஒரு பெண் பிள்ளையுமாக அவருக்கு இரண்டு பிள்ளைகள் இருக்கின்றனர். 2017.05.31ஆம் திகதி இவர் மண் அள்ளச் சென்றாரென்று ஒரு பொய்க் காரணம் சொல்லப்பட்டு பொலிசாரால் கைதுசெய்யப்பட்ட அவர், 2017.06.02ஆம் திகதி பொலிசாரால் அடித்துக் கொலை செய்யப்பட்டிருக்கிறார். பொலிஸார் மட்டுமல்ல, அங்கிருந்த கைதிகளும்கூட இவருக்கு அடித்திருக்கின்றார்கள். அவர்கள் அவரின் நெஞ்சிலே சவள்களால் அடித்திருக்கின்றார்கள். அவர்மீது அடிக்கப்பட்ட காயங்கள்

காணப்பட்டன. அவருடைய உதடுகள், நெற்றிகள் எல்லாம் வெடித்திருந்தன. அவருடைய மனைவி சசிகலா ரவீந்திரன்கூட அழுது அழுது இந்த விடயங்களைச் சொன்னார். நான் அந்த மரணச் சடங்கில் கலந்துகொள்ளச் சென்றிருந்தேன். ரவீந்திரன் மிக மோசமான முறையிலே, மிகக் கோரமாகத் தர்மபுரம் பொலிஸாரால் தாக்கப்பட்டிருக்கின்றார். இதனைவிட இவர், வவுனியா பொலிஸ் கைதிகள் காவல் நிலையத்திற்கு அனுப்பப்பட்டபொழுது அங்கே வைத்தும் தாக்கப் பட்டிருக்கின்றார். இது ஒரு விடயம்.

இரண்டாவது விடயம், முழங்காவில் தேசியப் பாடசாலையிலே கற்றுக் கொண்டிருந்த அல்றீன் ஜோன்சன் அவினாஸ் என்ற 13 வயது மாணவன் பற்றியது. இவர் 2017.06.17ஆந் திகதி சனிக்கிழமை மாலை 7 மணியளவில் முழங்காவில் புனித அந்தோனியார் தேவாலயத்தில் பூசை முடிந்து, தேவாலயத்திற்கு முன்னால் இருந்தபொழுது, 7.45 மணி அளவில் அந்த வழியாலே வந்த SG CAJ - 1171 என்ற ஒரு மகிழுந்து - 'கார்' அவரை மோதித் தூக்கி எறிந்துவிட்டுச் சென்றிருக்கின்றது. ஆனால், சம்பந்தப்பட்டவர்கள் யாரும் 2017.06.22ஆந் திகதி, வியாழக் கிழமை வரை - 5 நாட்கள் வரை - கைதுசெய்யப்படவில்லை. அவ்வாறு அந்த மாணவன் இறந்த பின்னர் அவருடைய உடலோடு மக்கள் போராட்டம் நடத்திய பின்புதான் பொலிஸார் சம்பந்தப்பட்டவர்களைக் கைது செய்திருக்கின்றார்கள். இவ்வாறு கிளிநொச்சியிலே, தர்மபுரம், முழங்காவில் பகுதிகளிலே இருக்கின்ற பொலிஸார் சட்டத்தை மீறி நடந்துகொள்கின்றார்கள். ஆகவே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த விடயங்களையும் இந்த இடத்திலே நீதியின்பால் ஈர்த்து, என்னுடைய உரையை நிறைவுசெய்கின்றேன்.

[අ.භා. 4.56]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදය තමයි අද දවසේ පැවැත්වෙන්නේ.

2009 සටනින් ලද ජයග්‍රහණයෙන් පස්සේ මේ රටේ ජනතාවට යළිත් වරක් තමන්ගේ පදිංචි ස්ථාන වෙත ගොස් ඡන්දය ලියාපදිංචි කර ගැනීමේ අවස්ථාව සැලසුණා. කාලයකට පස්සේ -2017දී- මේ පනත් කෙටුම්පත ගෙනෙන්න ක්‍රියා කිරීම තුළින් එක් පැත්තකින් පෙන්නුම් කරනවා, මේ රට, මේ රටේ ජනතාවට උන් හිටි තැන් කරා ගමන් කරන්න පුළුවන් විධියේ ක්‍රියා මාර්ගයක් නැති රටක් බව. කනගාටුවෙන් වුණත් මා ඒ කාරණය සඳහන් කරන්න කැමතියි. ඡන්ද නාම ලේඛනය හදා ගැනීම දේශීය වශයෙන් වාසිදායක තත්ත්වයක් වුණාට, මේ අවුරුදු ගණනාව තුළ ජාත්‍යන්තර වශයෙන් අපි ලබා තිබෙන ප්‍රගතියට එය විශාල කැළලක් බව කියන්න ඕනෑ.

ඡන්දයක් ලියාපදිංචි කිරීමක මූලික ඕනෑකම වන්නේ ඡන්දය පාවිච්චි කිරීමයි. ඡන්දයක් පවත්වන්නේ නැති අවස්ථාවක අද අපි කථා කරන්නේ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම ගැනයි. අද මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරු හැටියට වාගේම ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි අවුරුදු දෙකක් තිස්සේ ඉල්ලන්නේ පළාත් පාලන ඡන්දය පවත්වන්න කියලායි. පළාත් පාලන ඡන්දය සඳහා ලියාපදිංචි ඡන්දදායකයන් මිලියන 15ක් පමණ අපේ රටේ ඉන්නවා. අද මේ ඡන්දදායකයන්ගේ ඡන්ද අයිතිය අහෝසි කරලා තිබෙනවා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන අවස්ථාවේ පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ වුණා, "මීට පස්සේ ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීමෙන් ඒ කොමිෂන් සභා පූර්ණ බලධාරීන් වනවා"ය කියලා. ඒ සම්බන්ධයෙන් මා කනගාටු වනවා. මොකද, මැතිවරණ කොමිසම තවම ඡන්දයක් තියා ගන්න බැරි වුණු කොමිසමක් බවට පත්වෙලා තිබෙන නිසා. ඒ කොමසාරිස්තුමා ඉතාම ජ්‍යෙෂ්ඨ, අපි කවුරුත් ගරු කරන කෙනෙක්. නමුත් යථාර්ථය තමයි, මේ මැතිවරණ කොමිසම ඡන්දය තියා ගන්න බැරි කොමිසමක් බවට පත්වෙලා තිබෙන එක.

එදා ජාතික පොලිස් කොමිෂන් සභාවක් පත් කළා. ඒ වාගේම, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවක් පත් කළා. නමුත් ජාතික විගණන පනත් කෙටුම්පත තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. තමුන්ගේ කටයුතු ඉෂ්ට කර ගන්න බැරි කොමිෂන් සභාවක් බවට මේ කොමිෂන් සභාව පත් වුණොත් සර්වජන ඡන්දය කෙරෙහි ජනතාව තුළ තිබෙන විශ්වාසය කැඩී යනවා.

ලංකාවේ පළාත් පාලන ආයතන 330ක් අද බලධාරීන් යටතේ ආණ්ඩු කරනවා. ඒවා බලධාරීන් යටතේ ආණ්ඩු කිරීම ප්‍රජාතන්ත්‍රවාදීද? නැහැ, එය ප්‍රජාතන්ත්‍ර විරෝධියි. ලියාපදිංචි ඡන්දදායකයන්ට ඡන්දය පාවිච්චි කරන්න අවස්ථාව ලබා දෙන්නේ නැත්නම් එය මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී මූලික අයිතිවාසිකමට කරන බරපතළ වරදක්. අද අපේ රටට අත් වී තිබෙන එම කනගාටුදායක තත්ත්වය පිළිබඳව අපි ප්‍රශ්න කරන්න ඕනෑ. "ඡන්දය තියන්න පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයාට බලයක් නැත. බලය තිබෙන්නේ මැතිවරණ කොමිසමට" කියලා සංශෝධනයක් ගෙනෙන්න පුළුවන් නම් ඊට වඩා ප්‍රජාතන්ත්‍රවාදී තවත් ක්‍රියාවක් නැති බව මා මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ. අද මැතිවරණ කොමිසම කියනවා, "අපට බලය ලැබිලා නැහැ" කියලා. ඇමතිතුමා කියනවා, "බලය දුන්නා, ජූලි 01 වැනි දාට පළාත් පාලන ඡන්දය පවත්වන්න නියම කළා" කියලා. නමුත් මීට දවස් දෙක තුනකට ඉස්සෙල්ලා ඒ ගැසට් නිවේදනය අවලංගු කරලා ඔක්තෝබර් මාසය දක්වා ඡන්දය කල් දමන විධියේ අලුත් ගැසට් එකක් සකස් කරලා තිබෙනවා. ඡන්දය පාවිච්චි කරන්න ඡන්දදායකයන්ට තිබෙන අයිතිය ගැසට් එකෙන් අහෝසි වනවා නම්, මෙවැනි ලියාපදිංචි කිරීම්වල තිබෙන වටිනාකම මොකක්ද කියන කාරණය පිළිබඳව අපි ඉතාම ඕනෑකමින් සොයා බලන්න ඕනෑ.

ඡන්ද හිමි නාම ලේඛනයට නම ඇතුළත් කරන්න පුළුවන්; ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වෙන්න පුළුවන්. නමුත් ඡන්ද පාවිච්චි කරන්න බැරි තත්ත්වයකට අපේ රටේ ඡන්දදායකයන් පත් කිරීම ගැන පිළිතුරක් නැති අවස්ථාවක තමයි අපි මේ වනකොට පසු වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්, උතුරෙන් පැමිණි ජනතාව ලංකාවේ විවිධ පළාත්වල ඡන්ද හිමි නාම ලේඛන යටතේ ලියාපදිංචි වීම -ද්විත්ව ලියාපදිංචිය- වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතුයි කියලා අපි කියනවා.

උතුරේ විතරක් නොවෙයි, නැහෙනහිර වේවා, ලංකාවේ අනෙක් පළාත්වල වේවා, ද්විත්ව ලියාපදිංචිය වැළැක්වීමට අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. ග්‍රාම නිලධාරී කෙනෙකුගේ ලිපියක් මත ලියාපදිංචිය සනාථ කරන්නට කටයුතු කිරීමෙන් ඡන්දදායකයෙක් විය හැකි බවට ඉදිරිපත් කරන අලුත් වගන්ති මෙයට එකතු වී තිබෙනවා. මේවායේ බරපතළකම ගැන අපේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත සමරවීර මහතා කිව්වා. ග්‍රාම නිලධාරී කියන්නේ රජයේ නිලධාරියෙක්. දිසාපති කියන්නේ ස්වාධීන නිලධාරියෙක්. මැතිවරණ කොමිෂන් සභාව කියන්නේ ස්වාධීන කොමිෂන් සභාවක්. ප්‍රාදේශීය ලේකම් කියන්නේ ස්වාධීන නිලධාරියෙක්. ප්‍රාදේශීය ලේකම් නියෝජනය කරමින් ගමේ ඉන්න තැනැත්තා තමයි ග්‍රාම නිලධාරිවරයා. ග්‍රාම නිලධාරිවරයාගේ පත්වීම්වලට ඇඟිලි ගසමින්, තමන්ට රිසි ලෙස අලුතින් පුද්ගලයන් පත් කිරීමේදී ඡන්ද හිමි නාම ලේඛනය ශුද්ධ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

පවිත්‍ර ලේඛනයක් කියලා සහතික කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය තමයි අපි මැතිවරණ කොමිසමෙන් අහන්න ඕනෑ. මැතිවරණ කොමිසම කොහොමද සහතික වෙන්නේ, මෙයින් සිද්ධ වන්නේ ශුද්ධ පවිත්‍ර ලියාපදිංචියක් කියලා? ඒ නිසා මේ කනගාටුදායක තත්ත්වය වළක්වන්න අවශ්‍ය පියවරත් මෙයට ඇතුළත් කිරීම ඉතාම වැදගත් කියලා අපි කල්පනා කරනවා. මම මේ ගැන දීර්ඝව කථා කරන්නේ නැහැ.

පළාත් පාලනය ගැන අපි කලින් කථා කළා. අද හැම නගර සභාවකම කුණු එකතු වෙමින්, ලංකාව පුරා කුණු ප්‍රශ්නය උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මීතොටමුල්ල ඛේදවාචකයෙන් පසු මාස දෙකක් ගත වෙලා, තුන්වන මාසයට අපි අවතීර්ණ වන විටත් තවම ප්‍රශ්නයට විසඳුමක් සොයා ගන්න බැරි වෙලා තිබෙනවා. මේ තත්ත්වයේ තිබෙන බරපතළකම ගැන අපේ කාදිනල්තුමාගේ ප්‍රකාශයේ සඳහන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ අද රට පුරාම ඩෙංගු රෝගය වේගයෙන් පැතිරී යනවා. ඒ ගැන සෞඛ්‍ය ඇමතිතුමාගේ ප්‍රකාශ පමණයි තිබෙන්නේ. එයට විසඳුමක් නැති රටක් බවට අද මේ රට පරිවර්තනය වෙමින් තිබෙනවා. එයට හේතුව, ග්‍රාමීය -ප්‍රාදේශීය-නගරවල අවම සේවාව කඩා වැටීමයි. අවම සේවාව කඩා වැටීමට හේතුව, මන්ත්‍රීවරු නොමැති වීමයි. මන්ත්‍රීවරු නොමැති වීමට හේතුව, ඡන්දය පවත්වන්නේ නැති වීමයි. ඡන්දය පවත්වන්නේ නැති නිසා මහජන සේවාව, ආරක්ෂාව හා පරිසරය අද අවුල් වියවුල් තත්ත්වයකට පරිවර්තනය වෙලා තිබෙනවා.

මම තව එක කාරණාවක් සඳහන් කරන්න කැමැතියි. මම ස්තුතිවන්ත වෙනවා, මැතිවරණ කොමිසමේ තීන්දුවක් ගැන. ලංකාවේ ඉහළම අධිකරණය බවට සැලකෙන්නේ ශ්‍රේෂ්ඨාධිකරණයයි. අභියාචනාධිකරණයේ පෙත්සමක් විභාග කළා, ගීතා කුමාරසිංහ මන්ත්‍රීතුමියගේ මන්ත්‍රී ධුරය අහෝසි කරනවාද නැද්ද කියලා. අභියාචනාධිකරණය තීරණයක් දුන්නා, මන්ත්‍රීකම අහෝසි කරනවා කියලා. ලංකාවේ ඕනෑම පුරවැසියෙකුට සම්ප්‍රදායානුකූලව අවස්ථාව තිබෙනවා, අභියාචනාධිකරණයේ නඩු තීන්දුව ප්‍රකාශ කළාට පසුව දින 42ක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට යෑමට. මෙතැනදී මොකක්ද සිද්ධ වුණේ? මේ පාර්ලිමේන්තුව දවස් දෙකක් ඇතුළතදී මේ රටේ ජනතාව පත් කරලා එවපු මන්ත්‍රීතුමියකගේ මන්ත්‍රීකම අහෝසි කරන ලිපිය මැතිවරණ කොමිසමට යැවුවා. ඒක මොන තරම් කනගාටුදායක තත්ත්වයක්ද? ඒ මන්ත්‍රීතුමිය ඒකාබද්ධ විපක්ෂයේ වෙන්න පුළුවන්. ඒ වාගේම වෙනත් පක්ෂයක වෙන්නත් ඉඩ තිබුණා. අපි ඒ සම්බන්ධව ගරු කථානායකතුමා හමු වුණා. අපි මහජන නියෝජිතයන් හැටියට ගරු කථානායකතුමාට ඒ ගැන කිව්වා. අපි ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන බව කිව්වා. අපි ඒ මන්ත්‍රීතුමියගේ නීතිඥයන්ගේ ලිපිය ඉදිරිපත් කළා. නමුත් මේ පාර්ලිමේන්තුවෙන් මැතිවරණ කොමිසමට ලියුමක් ගියා, වහාම ඒ බව ගැසට් කරන්න කියලා. හොඳ වෙලාවට ගැසට් කර ගන්න බැරුව ගියා. මැතිවරණ කොමිසම රැස් වන අතරතුර මන්ත්‍රීතුමියට අධිකරණයට යන්න ඉඩ ප්‍රස්ථාව ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිකම් කල්පනා කරලා බැලුවොත්, පසුව දා මැතිවරණ කොමිසම රැස් වෙන්න පුළුවන්කම තිබුණා නම් මොකක්ද සිද්ධ වෙන්නේ? ඒ මන්ත්‍රීතුමියගේ මන්ත්‍රීකම අහෝසි කරනවා.

ශ්‍රේෂ්ඨාධිකරණයට යෑමට තිබෙන නීතිමය හා මූලික අයිතිවාසිකම ඒ විධියට උල්ලංඝනය කරන්න උපදෙස් දුන්නේ කවුද කියන ප්‍රශ්නය තමයි මේ පාර්ලිමේන්තුවට වැදගත් වන්නේ. පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා නම්, ප්‍රජාතන්ත්‍රවාදයේ අයිතිවාසිකම් නියෝජනය කරන ජනතාවට එකට රැස් වෙන්න බැරි නිසා මන්ත්‍රීවරු පත් කරලා පාර්ලිමේන්තුවට එවනවා නම්, පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයට, පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වයට එලෙස ඇඟිලි ගහන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මා මේ අවස්ථාවේදී ඉතාම ඕනෑකමින් අහන්න කැමැතියි. මොකද, ඒ බරපතළ ක්‍රියාව සිද්ධ වුණේ අභියාචනයක් ඉදිරිපත් කරන්න තිබුණු කාල සීමාව තුළදීයි.

ඊළඟට මා කියන්න කැමැතියි, මැතිවරණ කොමිසමේ ක්‍රියාකාරී සාමාජිකයකු වන මහාචාර්ය හූල් මහතා පුවත් පත්වලට ප්‍රසිද්ධියේ කරන ප්‍රකාශ ගැන. මහාචාර්ය හූල් මහතාගේ ප්‍රකාශන ඉතාම වැදගත්. මහාචාර්ය හූල් මහතාගේ ප්‍රකාශන කියවන්නට ගරු මන්ත්‍රීතුමන්ලා යොමු වෙනවා නම්, ඉතාම වැදගත්. එක පැත්තකින් එතුමා වෙනත් අදහස් දරනවා. නමුත්, ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකමක් වන ඡන්ද බලය ගැන හා ඡන්දය පැවැත්වීමේ අවශ්‍යතාව පිළිබඳව එතුමා පැහැදිලිව අදහස් ප්‍රකාශ කර තිබෙනවා. එම කොමිසමේ සාමාජික හූල් මහතා පුවත් පත්වල පළ කර තිබෙන එම ලිපි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මා අගය කරනවා.

විශේෂයෙන් පාර්ලිමේන්තුව හා ඡන්දය පිළිබඳව අයිතිවාසිකම ගැන එතුමා දරන අදහස් අපි අගය කරනවා. අපි එසේ අගය කළාට, කොමිසමට ඡන්දය තියා ගන්න බැරි වෙලා තිබෙනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. පළාත් පාලන මැතිවරණය පවත්වා ගන්න බැරිව අද අවුල් ජාලාවක් බවට පත් වෙලා තිබෙනවා. කනගාටුව එයයි. අපි පාර්ලිමේන්තුවෙන් මොන අණපනත් සම්මත කළත්, ආණ්ඩුවට ඡන්දය පවත්වන්න ඕනෑ නැත්නම්, ආණ්ඩුවට ඡන්දය නොපවත්වා ඉන්න පුළුවන් නම් කොමිෂන් සභාවකින් වැඩක් නැහැ. කොමිෂන් සභාව ස්වාධීන කළේ, ස්වාධීන තීරණ ගැනීමටයි. ස්වාධීන තීරණ ගන්න පුළුවන් කොමිසමක් වුණොත් තමයි මුළු මහත් රටවැසියාගේ ගෞරවය හිමි වෙන්නේ.

අද දින ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීමෙන් පසුව ඡන්ද ලැයිස්තු ප්‍රමාණය වැඩි වෙන්න පුළුවන්; ඡන්ද ලැයිස්තු ශුද්ධ වෙන්න පුළුවන්; යම් යම් පළාත්වල ඡන්ද නාම ලේඛන වැඩි කර ගන්න පුළුවන්. නමුත් ඡන්ද ලැයිස්තුවල **නම්** තිබුණාට ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය නැත්නම්, අපි ප්‍රජාතන්ත්‍රවාදයේ මළ ගමට ගමන් කරන බරපතළ අනතුරකට පත් වෙන්න පුළුවන්. මෙම පනත් කෙටුම්පත දෙවන වන කියවීමේ විවාදය සිදු වන මේ අවස්ථාවේ දී අප යළිත් වරක් ඉල්ලා සිටින්නේ, ජනතාවගේ මූලික අයිතිවාසිකමක් වූ, ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් වූ ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව ලබා දෙමින්, පළාත් පාලන මැතිවරණය ඉක්මනින් පැවැත්වීමට කටයුතු කරන ලෙසයි.

ග්‍රාමීය පළාත් පාලනය ලංකාවේ පාලන තන්ත්‍රයේ ඉතාම වැදගත් අංගයක් වෙනවා. පාලන තන්ත්‍රයේ "පළාත් පාලනය" තමයි ඉතාම වැදගත් වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉහළින් ගන්නා තීරණ පහළට යන පහළම ආයතනය එයයි. ආදායමක් එකතු කරලා වියදම් කරන්න අයිතිය තිබෙන්නේ, මහජන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත සභාවක අනුමැතිය ලැබුණොත් විතරයි. ඒක තමයි නීතියේ කියැවෙන්නේ. මහජන මන්ත්‍රීවරුන් පත් වෙලා සිටින සභාවකට විතරයි වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්කම තිබෙන්නේ කියලා නීතියේ කියැවෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී ඇති කාලය අවසානයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කථාව අවසන් කරන්නම්.

වැය ශීර්ෂයක් සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්කම තිබෙන්නේ මහජන නියෝජිතයන් පත් වුණු සභාවකින් විතරයි කියලා මහනගර සභා ආඥාපනතේ ඉතා පැහැදිලිව තිබෙනවා. එහෙම නම් අද මේ හිතුවක්කාර වියදම් කරන්නේ කොහොමද? මේ හිතුවක්කාර වියදම් කරන්නේ මොන නීතියක් යටතේද? සම්පූර්ණයෙන්ම ඉතාම හිතුවක්කාර පාලන තන්ත්‍රයකට පරිවර්තනය වෙලා මහජන මුදල් මේ විධියට වියදම් කරනවා. අපි උදාහරණයකට කොළඹ නගර සභාව ගනිමු. ලංකා ආණ්ඩුවේ ආදායම් මාර්ගවලට සමාන විශාලතම ආදායම් මාර්ගයක් තිබෙන සභාවක් තමයි කොළඹ නගර සභාව කියන්නේ. එහි බිලියන ගණනක ආදායමක් පාලනය කරනවා. මහජන නියෝජිතයෝ නැහැ. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදයේ කනගාටුදායක තත්ත්වය.

සමහර අය ඡන්දය එපාය කියලාත් ඡන්දය දෙන්න කැමැති වෙනවා. එහෙම ඡන්දය එපාය කියලා ඡන්දය දීපු අයට පසුව හඬන්නට සිද්ධ වෙන බව ප්‍රජාතන්ත්‍රවාදයට පහර දෙන හැම දෙනාටම අපි ඉතාම අනතුරුදායක තත්ත්වයක සිටිමින් මතක් කරනවා. ඡන්දය පවත්වන්න ආණ්ඩුව බය වෙන්න එපා. ඡන්දය තිබ්බාම, යූඇන්පී එකත් පත් වෙනවා; ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් පත් වෙනවා; ඒකාබද්ධ විපක්ෂයත් පත් වෙනවා; ද්‍රවිඩ සන්ධානයත් පත් වෙනවා. එහෙම නම් ඡන්දය පවත්වන්න බය ඇයි? මේ අහෝසි කරන්නේ කාගේ මූලික උරුමයද කියලා ප්‍රශ්න කරමින් මම නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.12]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවන මේ අවස්ථාවේ දී මන්ත්‍රීවරයකු හැටියට ඒ ගැන අදහස් ප්‍රකාශ කිරීමට මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මුලින්ම ස්තුතිවන්ත වෙනවා. අද දින මෙම විවාදයේ දී ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් සියලු පක්ෂවල මන්ත්‍රීවරුන් දිගින් දිගටම කරන ලද කථාවලට ඇහුම් කන් දීමේ දී මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයකු හැටියට මට තේරුම් ගියේ, අපි කර ගත්ත දේවල් අපිටම විඳින්නට සිදු වී තිබෙන බවයි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩු කරපු කාලයේ කළ වැරැදි, එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරපු කාලයේ කළ වැරැදි, මේ යහ පාලන ආණ්ඩුව පිහිටුවීමෙන් පසුව නිවැරැදි කර ගන්න යනකොට, එයට මේ සියලු දෙනාගේ සහයෝගය ලබා දීම තමයි යුතුකම වන්නේ. මෙම පනත් කෙටුම්පත පිළිබඳව දෙවැනි වර කියවීමේ විවාදය සිදු කරන මේ වේලාවේ දී ඒ පිළිබඳව ඉතා කෙටියෙන් කරුණු කිහිපයක් මතක් කරන්න කැමැතියි. මෙම පනත් කෙටුම්පත සම්මත කර ගැනීම තුළින් රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික අංගයක් වන ඡන්ද අයිතිය වඩාත් පිරිසිදු කෙරෙනවා. යුද්ධය නිම වූ වහාම කළ යුතුව තිබුණු දෙයක් ප්‍රමාද වී හෝ කිරීමට හැකි වීම ගැන අපි සතුටු විය යුතුයි. ඒ වාගේම මේ අවස්ථාව යුද්ධය සහ විවිධ හේතු නිසා අවතැන් වූ ජනතාවගේ හඬට, ඔවුන්ගේ ඡන්ද බලයට වටිනාකමක් ලැබෙන අවස්ථාවක්. මේ කාරණය ප්‍රජාතන්ත්‍රවාදය අහිමි වීම නිසා තුවාල වූ ජනතා සිත් සතන් සුවපත් කිරීමට ගත් වැදගත් පියවරක් වෙනවා. මේ නිසා උතුරේ ජනතාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව තිබෙන විශ්වාසය තව තවත් වැඩිදියුණු වෙනවා. අනෙක් පැත්තෙන් මේ පනත් කෙටුම්පත සම්මත වීම නිසා ඡන්ද අයිතිය හිමි වන්නේ උතුරේ අවතැන් වුණු ජනතාවට පමණක් නොවෙයි. යුද්ධය නිසා අවතැන් වී දකුණට සංක්‍රමණය වුණු සිංහල සහ මුස්ලිම් ජනතාවටත් මේ අයිතිය ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් සිටි, නොයෙකුත් අත්දැකීම් තිබෙන, ප්‍රජාතන්ත්‍රවාදය ගැන ඉතා ගැඹුරින් කථා කරන මන්ත්‍රීවරුන් ඒ අය බලයේ සිටි කාලයේ කරපු දේවල් ගැන සිහිපත් වෙනකොට, කොයි පක්ෂයේ හිටියත් විශාල කනගාටුවක් තමයි ඇති වන්නේ. මොකද, නොයෙකුත් මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ අදහස් තුළින් අපි දැක්කේ පළාත් පාලන මැතිවරණය පවත්වන්නය කියන එකයි. පළාත් පාලන මැතිවරණය කල් දමලා තිබෙන්නේ මේ යහ පාලන ආණ්ඩුව විතරක් නොවෙයි. කවුරු කළත් ඒක වැරැදියි. හැබැයි, මේ වැරැදි කරපු මිනිසුන්ම තමයි ආපහු මේ ගරු සභාවේ ඒ පිළිබඳව කථා කරන්නේ.

පසු ගිය කාලයේ SAITM එක ගැන මේ ගරු සභාව තුළ කථා කළා. එදා SAITM එක ගෙනෙන්න අත උස්සපු, එයට විරුද්ධව නැඟිටින්නේ නැතිව පාර්ලිමේන්තුවේ කට වහගෙන සිටි අය දැන් SAITM එකට විරුද්ධව කථා කරනවා. ඒ තුළින් බොහොම පැහැදිලිව පෙනී යනවා, අපි 2015 වසරේ ජනවාරි 08වැනි දින ගෙනාපු ආණ්ඩුව තුළින් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත වූ බව. අද ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත සංශෝධනය කිරීම තුළින් එම ප්‍රජාතන්ත්‍රවාදය තව තීව්‍ර වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අප කළ යුත්තේ ඒකයි. අපේ යුතුකම විය යුත්තේ ඒකයි.

2013 වසරේ පැවැති පළාත් සභා මැතිවරණය මට මතකයි. මහනුවර දිස්ත්‍රික්කයේ හිටපු අගමැතිතුමාගේ පුතා වන අනුරාධ ජයරත්න මැතිතුමා මනාපවලින් පළමුවැනි ස්ථානයට ආවා. මේ අය අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. එදා රාජපක්ෂ කෙනෙකුට මහ ඇමැතිකම ලැබුණා. නමුත් අපි මහනුවර දිස්ත්‍රික්කයෙන් ගෙනාපු අනුරාධ ජයරත්නට මහ ඇමැතිකම ලැබුණේ නැහැ. ඒකයි අද අනුරාධ ජයරත්න මැතිතුමා මේ යහ පාලන ආණ්ඩුව පිළිගෙන අද අපේ පැත්තේ වාඩි වෙලා ඉන්නේ. අද එතුමන්ලා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කතා කරනවා. මමත් ඔය දෝරේ ගලන ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ හිටියා. අපි දන්නවා එදා කටයුතු කළේ කොහොමද කියලා. නාවලපිටියේ මැතිවරණ දෙකක් පවත්වන්න වුණා. මැතිවරණ කොමසාරිස්ට උණ හැදෙන්න ඇති, ආයෙත් ඡන්දයක් පවත්වන්න වුණාම. ඇයි? මැතිවරණ කොමසාරිස්තුමාට දවස් දෙක-තුනක් නිදි වරාගෙන මහන්සි වෙන්න වෙනවා, ඡන්ද ප්‍රතිඵල නිකුත් කරන්න. හැබැයි, මොකක්ද වුණේ? ආපහු ඡන්දයක් තියලා සිද්ධ වුණු දේවල් මම දන්නවා, මමත් එහි ඡන්දය පාවිච්චි කරපු කෙනෙක් නිසා. මැතිවරණ කොමසාරිස්තුමා කෙළින් හිටියත් මේක ඇතුළේ ඉන්න මිනිසුන් මැතිවරණ කොමසාරිස්තුමාට ඒ ඡන්ද ප්‍රතිඵලය හරියට ගෙනෙන්න ඉඩ නොදුන් අවස්ථා අපි දැකලා තිබෙනවා. අපි කුරුණෑගල ඡන්දය දමන්න ගියා. පෙරවරු 10.00, 10.30 වෙනකොට හැමෝම ඡන්දය දමලා ඉවරයි. මමත් ඒ මැතිවරණයේ ඡන්දය පාවිච්චි කළා. මේකයි ඇත්ත කථාව.

අද ජයන්ත සමරවීර මගේ මිත්‍රයා බොහොම වේගවත් කථාවක් කළා. හැබැයි, එතුමන්ලාට මතක නැතිව ඇති පළමුවැනියට ඡන්දය දමපු මිනිහාගේ අත් කපාපු වේලාව;

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

පළමුවැනියට ඡන්දය දමන්න ආපු කෙනාගේ කකුල කපාපු වේලාව; පළමුවැනියට ඡන්දය දමන්න ආපු මිනිහාගේ බෙල්ල කපලා කෝටුවල ගහපු වේලාව. ඒ අය දැන් ඡන්ද අයිතිය තහවුරු කරන්න කථා කරනවා; ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. හැඳුනුම්පත් ටික එකතු කර ගත්තාම කොහේද ඒ අයට ඡන්දය දමන්න අයිතිය තිබෙන්නේ? පාලම් ටික පිපිරෙව්වාම ඡන්දය දමන්න එන්න පුළුවන්ද? කොහේද ඒ අයට ඡන්ද අයිතිය තිබෙන්නේ? අභිංසක ගොවීන්ගේ තුවක්කු ටික එකතු කළා. අද ගොවීන්ට තුවක්කු නැහැ. තවම ඒ තුවක්කු ලැබිලා නැහැ. ගොවීන් ගැන කථා කරනවා; ගොවීන් ගැන කියලා පාර්ලිමේන්තුවේ අඬනවා. මේ අය අමුඩේ ගහගෙන ඉන්න ගොවියාට හූ කියනවා, හෙලුවෙන් ඉඳගෙන. ඒකයි ඇත්ත කථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එකතු වෙලා යන මේ ගමනට නොයෙකුත් අය අකුල් හෙළනවා. මේ පනත් කෙටුම්පත ගෙන ඒම ඉතා අවශ්‍යයි.

විදේශගත වෙච්ච මේ රටේ පුරවැසියන්ට ඡන්දය දාන්න තිබෙන අයිතිය මේ සංශෝධන තුළින් තහවුරු වෙනවා. ඒ වාගේම මම නියෝජනය කරන නාවලපිටිය ආසනයේ ඡන්දය නැති වතුකරයේ ජනතාව විශාල පිරිසක් ඉන්නවා. ඒ වතුකරයේ ජනතාව සමහර විට උතුරෙන් ආපු අය වෙන්න ඇති. සමහර අය වතුකරයේ හිටියත් ඡන්ද අයිතිය අහිමි වූ පුද්ගලයන් වෙන්න ඇති. කොහොම වුණත් මේ ගොල්ලන්ට ඒ ඡන්ද අයිතිය අහිමි වෙලා තිබෙනවා. ඒක නිසා ඉතා වැදගත් වූ පනත් කෙටුම්පතක් තමයි මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ඒ වැරදි නිවැරදි කරන්න කෙළින් කථා කරන්න කොන්දක් තිබුණේ නැති මිනිසුන්ට ජනවාරි 8වැනි දා හදපු මේ ආණ්ඩුව විසින් කෙළින් කථා කිරීමේ අයිතිය අපි තහවුරු කරලා තිබෙනවා. ඒක තමයි ප්‍රජාතන්ත්‍රවාදය. අපි දිගින් දිගටම මේ මැතිවරණ කල් දමනවා නොවෙයි. මේ මැතිවරණ කල් දමන යෝජනාව ගෙනාවේ ඒ පැත්තෙනුයි. අයුතු ලෙස මැතිවරණයට අදාළ පනත් කෙටුම්පත් සම්මත කරන්න ගිහිල්ලා තමයි මේ මැතිවරණය කල් දාන්න සිදු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළාත් පාලන ආයතනයක හිටපු නියෝජිතයෙක් හැටියට -මම 1997 ගඟ ඉහළ ප්‍රාදේශීය සභාවේ හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් හැටියට- මේ යහපාලන ආණ්ඩුවෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් ඉක්මනට පළාත් පාලන මැතිවරණය තියන්න කියලා. අපි දන්නවා, දිනන විධිය. අපට මැතිවරණයක් තියන එකෙන් කිසි හානියක් ඇත්තේ නැහැ. පළාත් පාලන ආයතනවල බහුතරය මේ යහපාලන ආණ්ඩුව ගන්නවා කියන එකත් මේ අවස්ථාවේ මා ප්‍රකාශ කරනවා. ඒක නිසා මේ මැතිවරණය තිබිය යුතුයි. පළාත් පාලන ආයතනයක හිටපු ප්‍රධානියෙකු හැටියට කටයුතු කරලා, පළාත් සභාවක දීර්ඝ කාලයක් හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට, පාර්ලිමේන්තුවත් නියෝජනය කිරීමේ ඒ වරම ලබපු මන්ත්‍රීවරයෙක් හැටියට මම දකින්නේ පළාත් පාලන මැතිවරණය කල් දැමීමෙන් විපක්ෂයට නොවෙයි පාඩුව තිබෙන්නේ. පළාත් පාලන මැතිවරණය කල් දැමීමේ පාඩුව තිබෙන්නේ යහපාලන ආණ්ඩුවට කියන එක මම බොහොම ගෞරවයෙන් මේ අවස්ථාවේදී අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට කලින් ඉදිරිපත් කරන්න තිබුණු දෙයක්. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන ආධුනික මන්ත්‍රීවරයෙක් හැටියට මට මේ කාරණය කියන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුව තුළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත කිසිම දවසක සම්මත කර ගන්න හම්බ වෙන්නේ නැහැ, මේ යහපාලන ආණ්ඩුව නොතිබෙන්න. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අපි සම්මත කර තිබෙනවා. අද ඉතා වැදගත් පනත් කෙටුම්පතක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කරලා අපි බලාපොරොත්තු වෙන්නේ, ඒ බිවිඩිව ප්‍රජාතන්ත්‍රවාදය නැවත නිවැරැදි කරලා ඒ වාගේම මැතිවරණ කොමසාරිස්තුමා ඇතුළු ඒ කාර්යයන් සිදු කරන සියලුදෙනාට විනිවිදභාවයෙන් ඒ කටයුතු සිදු කර මේ රටේ ජනතාවට පුරවැසි අයිතිවාසිකම් හරියට භුක්ති විඳීම සඳහා අවස්ථාව ලබා දීමේ මූලික සිද්ධාන්තයන් තහවුරු කිරීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. සියලුදෙනාටම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.20]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පෙර පැවති ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් දිවයිනේ උතුරු පළාතේ පිහිටි සිය ගම්-බිම් සහ දේපළ අතහැර දිවයිනේ සෙසු පළාත්වලට තාවකාලික වාසස්ථාන වශයෙන් නවාතැන් ගන්නට සිද්ධ වූ අවතැන් වූ පුද්ගලයන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට ඡන්ද ප්‍රකාශ කිරීමේ අයිතිය සුරක්ෂිත කිරීම සඳහා 2013 අංක 27 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම 2015 ජූනි මාසයෙන් අවසන් වුණා. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද අමාත්‍ය අනුකමිටුවේ නිර්දේශ අනුව, එම පනතේ පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් අවශ්‍ය බැවින් එම පනතේ විධිවිධාන බලපැවැත්වෙන කාල සීමාව තවත් අවුරුදු හතරකට දීර්ඝ කරනු ලැබුවා. මෙතැනදී රජයක් වශයෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, අවුරුදු හතරක් ඇතුළත මේ කටයුත්ත සිදු කර අවසන් කරන්නයි; එහෙම නැතුව, යම් යම් කට්ටිය ආණ්ඩුවට මඩ ගහන්න උත්සාහ ගන්න විධියට මේ මැතිවරණ කල් දමන එක නොවෙයි. ඒ වාගේම මෙය රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පස්සේ අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නත් කටයුතු කරලා තිබෙනවා. ඒක නිසා අද මේ ඉදිරිපත් වුණු පනත් කෙටුම්පතට පාලක පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මගේ සහාය පළ කරන බව විශේෂයෙන් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

අභ්‍යන්තර අවතැන්වූවන් ගැන කථා කරද්දී මේ පනත් කෙටුම්පතට අනුව එම පුද්ගලයන් කොටස් තුනකට වර්ගීකරණය කරන්න අපට පුළුවන්. අවතැන් වන අවස්ථාවේදී අවුරුදු 18 සම්පූර්ණ නොවූ එහෙත් මේ වන විට අවුරුදු 18 සම්පූර්ණ වූ පුද්ගලයන්, අවතැන් වූ පසු එම පුද්ගලයන්ට දාව ඉපදී දැනට අවුරුදු 18 සම්පූර්ණ වූ පුද්ගලයන්, ඒ වාගේම 2009 නාම ලේඛනවල නම් සඳහන් නොවූ පුද්ගලයන් වශයෙන් වර්ගීකරණය කරන්න හැකියාව තිබෙනවා.

මේ සියලුම දෙනාට ඡන්ද බලය ලබාදීමේ හැකියාව මේ පනත් කෙටුම්පත තුළින් ලැබෙනවා. ඒ වාගේම මේ ඡන්ද ලියාපදිංචි

කිරීමට වැඩි අපහසුතාවක් නැහැ. ග්‍රාම නිලධාරින්ගේ සහතික මඟින් මේ කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම, තමන්ට අසාධාරණයක් වුණා නම් ගැසට් පත්‍රයේ පළ වුණාට පස්සේ දින 7ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් අභියාචන ඉදිරිපත් කිරීමේ හැකියාවත් තිබෙනවා. මෙතැනදී කියන්න ඕනෑ විශේෂ දෙයක් තිබෙනවා. ඒ තමයි පසු ගිය කාලයේ විවිධ ක්‍රමවේද හරහා හොර ඡන්ද දැමීමේ ව්‍යාපාර ක්‍රියාත්මක වුණා. යහ පාලන ආණ්ඩුවෙන් ගෙනාපු මේ පනත් කෙටුම්පතේ පැහැදිලිව සඳහන් වනවා, එක් ඡන්ද ලියා පදිංචියකට අමතරව තවත් ඡන්ද ලියා පදිංචියක් සිදු කළොත් අවුරුදු දෙකක සිර දඬුවම් ලැබෙනවා; ලක්ෂයක දඩ ගෙවීමක් සිද්ධ වනවා කියන කාරණය. ඒ වාගේම මේ පනතේ සඳහන් යම් කාර්යයක් සඳහා අසත්‍ය තොරතුරු ඉදිරිපත් කළොත් අවුරුද්දක සිර දඬුවම් ලැබෙනවා, රුපියල් 50,000ක දඩයක් නියම වනවා කියන කාරණයත් සඳහන් වනවා.

නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් හරහා තමයි මේ පනත් කෙටුම්පත අද ඉදිරිපත් වෙන්නේ. ඡන්දය කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්. මැතිවරණ දෙපාර්තමේන්තුව මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දීලා, රාජ්‍ය නිලධාරින්, දේශපාලන නියෝජිතයන් දැනුවත් කරලා ඔවුන්ට යම් දිරිගැන්වීමක් ලබා දීලා ඡන්ද ලියාපදිංචි කටයුතු කළොත් මේ ක්‍රමය සාර්ථක වෙනවා. මොකද, ඡන්දයක් පවත්වන විටදී, "තමන්ට ඡන්දය නැහැ; ඡන්දය ප්‍රකාශ කිරීමට අවශ්‍ය කරන අනන්‍යතාව ඔප්පු කිරීමේ හැකියාව තමන්ට නැහැ." කියන චෝදනා දේශපාලනඥයන් විධියට අපට හැමදාම ලැබෙනවා. ඡන්ද නාමලේඛනයට නම ඇතුළත් කිරීම අවශ්‍ය කරුණක් වන නිසා ස්ථිර ස්ථානයක් තිබීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙනවා.

පසු ගිය කාලයේ අපි දැක්කා, මැතිවරණ කොමසාරිස්තුමා වෙනදාට වඩා ඡන්ද අයිතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩ සටහන්වල යෙදී සිටින ආකාරය. කුලියට හිටියත්, බද්දට හිටියත් ඡන්දය ලියාපදිංචි කරන්න පුළුවන් කියලා මැතිවරණ කොමසාරිස්තුමා ප්‍රකාශ කළා. මැතිවරණ කොමසාරිස්තුමා ගෙන යන වැඩ පිළිවෙළ අපි අගය කරන්න ඕනෑ. නමුත්, ග්‍රාමීය මට්ටමට යන විට බොහෝ දෙනෙකුට මේ ඡන්ද හිමිකම පිළිබඳ තිබෙන අවබෝධය හුහාක් අඩුයි. ග්‍රාම නිලධාරි මඟින් ජනතාව දැනුවත් කිරීම් සිදු වන්නේ නැහැ. සමහර ඡන්දදායකයන්ට අදාළ බීසී ආකෘති පත්‍ර පුරවන්න තේරෙන්නේ නැහැ. සමහර අයට ඒක පුරවන්න අවශ්‍යතාවක් නැහැ. සමහර අයට ජාතික හැඳුනුම්පත් නැහැ. එම නිසා මේ ඡන්ද නාමලේඛන සකස් කිරීමේදී ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව දැනුවත් කිරීම වාගේ කටයුතුවලට රාජ්‍ය නිලධාරින්ගේ සහයෝගයත්, ඔවුන්ගේ අවධානයත් යොමු විය යුතුයි කියලා මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණ පිළිබඳව "අලි බබා කල්ලිය" මේ දිනවල හරි සද්දෙන් කෑ ගහනවා. ඒ අය කියනවා, "අපි ඡන්ද තියන්න බයයි; පරදියි කියලා බයේ ඉන්නවා." කියලා. ඡන්දවලට බය වෙන්න අපට කිසිම හේතුවක් නැහැ. මට කලින් කථා කරපු ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් ඒ ගැන කිව්වා. ඡන්ද දිනන හැටි අපි දන්නවා. [බාධා කිරීමක්] ඔව්, දිනන්න දන්න නිසා තමයි කියන්නේ. අපි ඡන්ද දිනන හැටි දන්නවා. ඒ ක්‍රමයට තමයි අපි 2015 තිබුණු ඡන්දත් දිනලා පෙන්නුවේ. ඒ නිසා කවුරු මොනවා කිව්වත් ප්‍රාදේශීය සභා, පළාත් සභා ඡන්ද ගැන අපට කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ඡන්දවලට බොහෝම කැමැතියි. ඡන්ද පවත්වන්න ඕනෑ නම් ඒක කරන්න අපි දෙපාරක් ඇඹරෙන්නෙත් නැහැ. ඒ වාගේම අපේ පාක්ෂිකයන් බලාගෙන ඉන්නෙත් තමන්ගේ ගමේ සංවර්ධනය වෙනුවෙන් එක්සත් ජාතික පක්ෂයෙන් නායකයන් පත් කර ගන්නයි.

ජනතාව අපෙන් නිතරම අහනවා, පළාත් පාලන මැතිවරණය තියෙන්නේ කවදාද කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පිරිස තමයි නියමිත කාලයට, නියමිත ක්‍රමවලට මැතිවරණ තියන්න බය වුණේ. ඒ කාලයේ පළාත් පාලන මැතිවරණය තිබ්බේ කොටස් කීයකට බෙදලා ද? මහ නගර සභා ඡන්දය වෙනම පැවැත්වුවා; නගර සභා ඡන්දය වෙනම පැවැත්වුවා; නාගරික ප්‍රදේශවල ප්‍රාදේශීය සභා ඡන්දය වෙනම පැවැත්වුවා; ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාදේශීය සභා ඡන්දය වෙනම පැවැත්වුවා. ලජ්ජයි. ඒ මදිවට මැතිවරණ කාලයට ලොරි ගණන් සිල් රෙදි, උදළු තල, දැකැති, කුකුළු පැටව්, චීත්ත, උළු කැට වැනි දේවල් බෙදලා තමයි ඡන්දය තියන්න කටයුතු කළේ. ඒ වාගේම නියෝජ්‍ය ඇමතිවරු, ඇමතිවරු, සංස්ථා සභාපතිවරු, නිලමේවරු ඇවිල්ලා ඡන්දයට වැඩ කළා. ඒ කාලයේ හතර වටේටම දන්සැල් දාලයි තිබුණේ.

ඒ කාලයේ තිබුණේ මැතිවරණ නොවෙයි, දන්සැල්. පසුගිය මැතිවරණ කාලයේ උතුරේ ජනතාවට බෙදුවේ බඩු නොවෙයි, රත්තරන්. කෝච්චිවලින් කොළඹට ගෙනැල්ලා, අරලිය ගහ මන්දිරයේ තියාගෙන රත්තරන් බෙදුවා. නමුත් ඡන්දය දිනුවා ද, කියලා මම අහන්න කැමැතියි. එහෙම උදව්ය තමයි ඡන්දය ඉල්ලන්නේ. ඡන්දය ඉල්ලන්න නොවෙයි, ඡන්දෙන් ඉල්ලාගෙන කන්න තමයි හදන්නේ. ජනතාවට අල්ලස් දීලා, මාධ්‍ය මඟින් සංවර්ධනය ගැන හීන පෙන්වලා, දේශප්‍රේමීන්ට වශී කරලා, විදුලි පුටු ගැන මතක් කරලා ජනතාව නොමඟ යවලා තමයි ඡන්දය ගන්නේ. එසේ පිහිටවපු පළාත් පාලන ආයතන සහ පළාත් සභා තමයි පසුගිය කාලයේ තිබුණේ. ඒවායේ නියම ජනමතය තිබුණේ නැහැ. ඒ නිසා හෙට වුණත් මැතිවරණය පවත්වනවා නම් අපි කැමැතියි. මැතිවරණය ප්‍රමාද වෙන තරමට අපටම තමයි අවාසි වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජපක්ෂලා මැතිවරණ පැවැත්වූ විධියට මැතිවරණ තියලා රටේ බලය ගන්න ඕනෑ නම්, අපි 2015 ජනවාරි 08 වෙනිදා අතිගරු ජනාධිපතිතුමා පත් කළාට පස්සේ, මහ මැතිවරණය පැවැත්වුවාට පස්සේ සියලුම ආසනවල පළාත් පාලන මැතිවරණය තියන්න අපට හැකියාව තිබුණා. නමුත් අපි ජනතාවගේ මතයට ගරු කරලා කටයුතු කරන ආණ්ඩුවක් හැටියට එහෙම කළේ නැහැ. අපිව බලයට පත් කළ කණ්ඩායම්වල මතයට ඇහුම්කන් දීලා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කිරීම පිළිබඳ විශ්වාසය ඇති කළා. ඒ වාගේම දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අහෝසි කරන්න අවශ්‍ය කටයුතු කරලා තමයි ඊළඟ මැතිවරණයට ආවේ. පළාත් පාලන මැතිවරණ කටයුතු කරන්නේත් එහෙමයි. සියලු දෙනාට ඇහුම්කන් දීලා වෙනස්කම් කරන්න ඕනෑ නිසා තමයි මැතිවරණය කල් යන්නේ. මැතිවරණය කල් දමනවාට පෞද්ගලිකව මම එකඟ නැහැ. නමුත් අදාළ සංශෝධන විය යුතුයි. මැතිවරණ කල් යනවා නම්, එයට වගකිව යුත්තේ රාජපක්ෂ රෙජීමයයි. ඔවුන් තමයි මේ ගැටලු නිර්මාණය කළේ.

අද අපි මුහුණ දීලා තිබෙන ගැටලුව තමයි SAITM ප්‍රශ්නය. මේවා නිර්මාණය කළේ කවුද? උමා ඔය ප්‍රශ්නය නිර්මාණය කළේ කවුද? අහස උසට කුණු කඳු ගොඩ ගැසුණු ප්‍රශ්නය නිර්මාණය කළේ කවුද? රට වැටී ඇති ණය උගුල නිර්මාණය කළේ කවුද? අක්‍රමවත් ලෙස පළාත් පාලන කොට්ඨාස නිර්ණය කළේ කවුද? ඒ වාගේම ජාතිවාදී, ආගම්වාදී විරෝධය මතු කිරීම නිර්මාණය කළේ කවුද? ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, අපරාධකරුවන් ඒ වාගේම ස්ත්‍රී දූෂකයන්, හොරුන් කියන මේ සියලු දෙනාට නායකත්වය දුන්නේ කවුද? අද ඒ අලි බබා කල්ලියට එල්ල වෙලා තිබෙන වංචා දූෂණ සම්බන්ධයෙන් ඒ උදව්ය පසුගිය කාලයේ විවිධ උපක්‍රම භාවිත කළා. ඉස්සෙල්ලාම ඔවුන් රැස්වීම් පැවැත්වුවා; ඊට පස්සේ පාගමන් ගියා; ඊට පස්සේ ගෝල් ෆේස් පිටිටනිය පිරෙව්වා; ඊළඟට පන්සල් ගියා; පොල් ගැහුවා; මිරිස් ඇඹරුවා. නමුත් ඒ එකක්වත් හරි ගියේ නැහැ.

දැන් හිතෙෂි වෛද්‍ය කණ්ඩායමක් අල්ලා ගෙන වැඩ වර්ජන කරලා ආණ්ඩුව පෙරළන්න උත්සාහ කරනවා. මේ හිතෙෂි

[ගරු වන්දිම ගමගේ මහතා]

වෛද්‍ය කණ්ඩායම දුවන්නෙත් SAITM එක පස්සේ. අද ඒකාබද්ධ කල්ලියට තිබෙන ලොකුම මාතෘකාව SAITM එක. SAITM එකෙන් එහාට ඒ ගොල්ලන්ට අරමුණක් නැහැ. ඒ වුණාට SAITM එක හැදුවේ මොකටද කියන එක හැමෝම දන්නවා. SAITM එකට ණය දුන්නේ කොහොමද කියලා හැමෝම දන්නවා. ඒ වාගේ පසු බිමක් තුළ තමයි අද මේ රටේ දේශපාලනය ක්‍රියාත්මක වෙන්නේ. අපි ඒ තත්ත්වය පැහැදිලි කරන්න මේ වෙනතුරු බිම් මට්ටමට ගිහිල්ලා නැහැ. අපි මෙවා බිම් මට්ටමට ගෙනියන්නේ නැති නිසා, අපි රජය මාධ්‍ය භාවිත කරන්නේ නැති නිසා සමහරු හිතනවා මේ ආණ්ඩුවට මතයක් නැහැ කියලා. නමුත් මේ ආණ්ඩුවට මතයක් තිබෙනවා. අපි ඒ මතය තියාගෙන ඉන්නේ තැන් තැන්වල මාධ්‍ය සාකච්ඡා පවත්වා කෑ ගහන්න නොවෙයි. අපි හරි වෙලාවට මැතිවරණයට දින නියම කරලා, මැතිවරණ ප්‍රචාරක කටයුතුවලදී බිම් මට්ටමට ගිහිල්ලා මිනිසුන්ට මේ කාරණා පැහැදිලි කරලා දීලා මිනිසුන්ගේ මතය අරගෙන ඊළඟට මැතිවරණය ජයග්‍රහණය කරනවා. ඒ නිසා තමයි මම කිව්වේ අපි මැතිවරණයට බය නැහැ කියලා. අපි මැතිවරණයට බයයි නම් 2015 ජනවාරි 08 වෙනිදා තිබුණු හීෂණයත් එක්ක අපි මැතිවරණ කරන්න ඉදිරිපත් වෙන්නෙත් නැහැ. නමුත් අපි මැතිවරණයට ඉදිරිපත් වුණා. අවුරුදු 23කට පස්සේ කැකිරාව ආසනය ජයග්‍රහණය කරන්න මට හැකියාව ලැබුණා. ඒ වාගේම අවුරුදු 15කට විතර පස්සේ අපට අනුරාධපුර දිස්ත්‍රික්කය සම මට්ටමට ගෙනෙන්නත් හැකියාව ලැබුණා. ඒ නිසා කවුරු මොනවා කිව්වත්, මොන බයිලා ගැහුවත් මේ ආණ්ඩුවේ බලය අපි තවම හරියට පෙන්නුවේ නැහැ. අපි තවමත් බලන්නේ යහ පාලනය හරහා මේ රටේ ජනතාවට සාධාරණයක් කරන්නයි. අපි සාධාරණයි කියලා ජාත්‍යන්තරයට පෙන්වන්න ඕනෑ. මැතිවරණයක් ආවාම අපි කරන්න ඕනෑ මොකක්ද කියලා දන්නවා. ඒ ටික අපි කරලා පෙන්වනවා කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[ප.ප. 5.32]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேருநர்களைப் பதிவு செய்தல் சம்பந்தமாகக் கொண்டுவரப் பட்டிருக்கின்ற இந்தச் சட்டமூலமானது மிகவும் வரவேற்கத் தக்கது. மலையக மக்களுடைய பிரதிநிதியென்ற வகையிலே அந்த மக்கள் சார்பாக இது சம்பந்தமாக ஒருசில வார்த்தைகள் பேசக் கிடைத்ததையிட்டு, முதலில் நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விசேடமாக வாக்காளர் இடாப்பிலே பதிவுகள் இடம்பெறுவது சம்பந்தமான இந்தப் பிரேரணையின் உள்ளடக்கத்தில் முக்கிய பங்கினை வகிப்பவர்கள் மலையக மக்கள். இவர்களுக்கு ஐக்கிய தேசியக் கட்சியின் அன்றைய தலைவர் ஜே.ஆர். ஜயவர்தன அவர்கள் ஜனாதிபதியாக இருந்தபோது, ஐக்கிய தேசியக் கட்சியின் அரசாங்கத்திலேயே வாக்குரிமை அங்கீகாரம் கிடைக்கப்பெற்றது. படிப்படியாக அந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தின் மூலமாக இன்று மலையகப் பெருந்தோட்ட மக்களுக்கு முழுமையான வாக்குச் சுதந்திரம் கிடைக்கப் பெற்றிருக்கின்றது. இந்த வாக்குச் சுதந்திரம் கிடைக்கப் பெற்றுள்ளபோதிலும்கூட, அதிகாரிகள் சிலரின் அசமந்தப் போக்குக் காரணமாகவும் பிரதேச செயலாளர் சிலரின் அசமந்தப் போக்குக் காரணமாகவும் கிராம உத்தியோகத்தர் சிலரின் அசமந்தப் போக்குக் காரணமாகவும் எங்களுடைய மலையக மக்களுடைய வாக்குப் பதிவு அங்கு குறைவாகவே காணப்படுகின்றது. விசேடமாக, தேசிய அடையாள அட்டை இல்லாத காரணத்தால் மலையக மக்களின் வாக்குகள் உரிய முறையிலே பயன்படுத்தப்பட முடியாமல் இருக்கின்றன. அத்துடன், வாக்காளர் இடாப்பிலே அவர்களின் பெயர்கள் சரியாகப் பதியப்படாத காரணத்தினால், அதாவது, தமிழ் தெரிந்த உத்தியோகத்தர்கள் அங்கு குறைவாகக் காணப்படுவதன் காரணமாக சிங்கள உத்தியோகத்தர்கள் அந்தப் பெயர்களைப் பதியும்போது அவர்கள் எழுத்துப் பிழைவிடுவதன் காரணமாக எமது மக்கள் வாக்குச் சாவடியிலே சென்று முகங்கொடுக்கின்ற இன்னோரன்ன பிரச்சினைகள் ஏராளம். ஆகவே, இந்தச் சட்டமூலத்தைக் கொண்டுவந்தால் மட்டும் போதாது. மலையகத்திலே உடனடியாகத் தமிழ் மொழிமூல உத்தியோகத் தர்களை நியமித்து, தமிழ்மொழிமூல கிராம உத்தியோகத்தர்களை நியமித்து, தமிழ்மொழி அமுலாக்கத்தை நடைமுறைப்படுத்துவதற் குரிய சரியான வழிமுறைகள் மேற்கொள்ளப்பட வேண்டும்.

இங்கு பேசிய சகோதரர்கள் சிலர் மலையக மக்கள் சார்பாக முதலைக்கண்ணீர் வடித்தார்கள். அங்கு அன்று எங்களுடைய மக்களின் தேசிய அடையாள அட்டைகளைப் பறித்துச் சென்று வாக்களிப்பதற்கு வாக்குச் சாவடிக்குச் செல்லவிடாது தடுத்தவர்கள் இன்று வரலாறு பேசுகிறார்கள். மலையக மக்களுடைய கசப்பான அனுபவங்களை நேரடியாக அனுபவித்தவன் என்ற வகையிலே எங்களுக்கு உரிமையிருந்தும் கூட வாக்களிக்க முடியாமல் சில பிரச்சினைகளுக்கு முகங்கொடுத்ததை நாம் இன்றும் மறந்துவிட முடியாது. ஆகவே, ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தின்மூலம் கிடைக்கப்பெற்ற இந்த வாக்குரிமையை இந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தின் மூலமாகவே முழுமையாக, சுதந்திரமாக அவர்கள் பயன்படுத்தக்கூடியதாகச் சகல தஸ்தாவேஜுகளையும் வழங்கக்கூடிய நடவடிக்கைகளை இந்த அரசாங்கமும் கௌரவ அமைச்சர் அவர்களும் அதிகாரிகளும் ஏற்படுத்த வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

அத்தோடு, தேர்தல் ஆணைக்குழுவின் தலைவர் மஹிந்த தேசப்பிரிய அவர்கள் இனவாதமற்ற ஓர் அதிகாரி. அவர் மிகவும் நேர்மையான முறையிலே கடமையாற்றுபவர். எனவே, அவருடைய காலகட்டத்திலே இந்தப் பெருந்தோட்ட மக்களுடைய இந்த வாக்குரிமை சம்பந்தப்பட்ட நடவடிக்கைகளில் அவர் நேரடியாக ஈடுபட வேண்டுமென்று நான் இங்கு வேண்டுகோள் விடுக்கின்றேன்.

மலையக மக்கள் அடையாள அட்டையை இழந்திருக் கிறார்கள். அவர்கள் தற்காலிக வீடுகளில் வசிக்கிறார்கள். அந்த மக்களுடைய வேலைப்பளு அனைவருக்கும் தெரியும். பகல் நேரத்திலே அவர்கள் தோட்டத்திலே வேலைசெய்யும் நேரத்தில் கிராம உத்தியோகத்தர்கள் வந்து அந்தப் பதிவுக்குரிய பத்திரத்தை வெறுமனே ஆங்காங்கே பட்டுவாடா செய்துவிட்டுச் செல்கின்றார்கள். அதனால் அந்தப் பத்திரங்கள் அவர்களுக்குக் கிடைப்பதில்லை. இதன் காரணத்தினாலும் மாலை நேரங்களிலே கிராம உத்தியோகத்தர்கள் தோட்டங்களுக்கு விஜயஞ்செய்து அந்தப் பத்திரங்களைச் சேகரிக்காத காரணத்தினாலும் அந்த மக்கள் பல இன்னல்களுக்கு முகங்கொடுக்கிறார்கள். அவர்கள் அரசாங்க உத்தியோகத்திற்கு விண்ணப்பிக்கும்போது தேர்தல் இடாப்பிலே அவர்களின் பெயர் இடம்பெற்றிருக்கின்றதா என்று ஆராய்ந்து பார்க்கப்படுகின்றது. ஆனால், அதில் அவர்களின் பெயர்கள் இடம்பெற்றிருப்பதில்லை. ஆகவே, அரசாங்கம் உடனடியாகத் தமிழ் பேசுகின்ற கிராம உத்தியோகத்தர்களைத் தோட்டவாரியாக நியமிக்க வேண்டும்; பெருந்தோட்டப் பகுதிகளிலே இருக்கின்ற பிரதேசச் செயலகங்களிலே தமிழ் பேசக்கூடிய உத்தியோகத்தர்களை நியமிக்க வேண்டும். எமது மக்கள் இந்த அனைத்து விடயங்கள் காரணமாகவும் இன்னோரன்ன பிரச்சினைகளுக்கு முகம்கொடுத்துக்கொண்டிருக் கின்றார்கள்.

வடக்கு, கிழக்கிலே யுத்தம் நடந்த காலத்திலும் எமது மக்கள் பாதிக்கப்பட்டார்கள். எமது மக்கள் இந்த நாட்டிலே ஆங்காங்கே சிதறி வாழ்கின்றார்கள். இந்த நாட்டு மக்கள் தொகையில் 7.5

වීතමානවර්களாக இருக்கின்றார்கள். அப்படியானால் இந்தப் பாராளுமன்றத்திலே எமது பிரதிநிதிகள் 16 பேர் இருக்க வேண்டும். ஆனால், 9 பேரே இருக்கின்றார்கள். தேர்தல் வாக்குப் பதிவு செய்யப்படும்போது சம்பந்தப்பட்ட அதிகாரிகள் ஆங்காங்கே பலவந்தத்துக்கு உள்ளாவதன் காரணமாகவும் காடையர்களுடைய பிரச்சினை களுக்கு முகம்கொடுப்பதன் காரணமாகவும் அந்த மக்களின் தேசிய அடையாள அட்டைகள் திட்டமிட்டுப் பறிக்கப் படுவதன் காரணமாகவும்தான் அவர்களுக்கு இந்த நிலைமை ஏற்பட்டிருக்கின்றது. இவ்வாறான நிலைமைகளுக்குத் தொடர்ந்தும் இடமளிக்க முடியாது. ஆகவே, பொறுப்புவாய்ந்த அரசாங்க அதிகாரிகள் இந்த விடயத்தில் பொறுப்புடன் செயற்பட வேண்டும். இந்தச் சட்டமூலத்தின்மூலம் அரசாங்கமும் அமைச்சரும் மலையக மக்களுடைய வாக்குகள் முழுமையாகச் சுதந்திரமாகப் பிரயோகப்படுத்தப்படுவதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டும் என்று நான் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

முழுமையாக மலையகத்திலுள்ள பிரதேசக் காரியாலயங்கள், சம்பந்தப்பட்ட தேர்தல் காரியாலயங்கள், மற்றும் பொலிஸ் நிலையங்களிலே தமிழ் பேசக்கூடிய அதிகாரிகளை நியமிக்க வேண்டும். அதேநேரம் தேர்தல் காலங்களிலே அங்கு சேவையாற்றும் கிராம உத்தியோகத்தர்களின் மொழிப் பிரச்சினை காரணமாக இன்னோரன்ன பிரச்சினைகளுக்கு எமது மக்கள் முகம் கொடுக்கின்றார்கள். ஆகவே, அதனையும் சரியான முறையிலே செயற்படுத்தக்கூடிய ஏற்பாடுகளை இந்த அரசாங்கம் மேற்கொள்ள வேண்டும். அறிக்கைகள் மூலமாகவும் அதுபோன்ற செயற்பாட்டின் மூலமாகவும் மட்டும் இதுபற்றித் தொடர்ந்து பேசுவதுடன் நின்றுவிடாது, நடைமுறைச்சாத்தியமான நடவடிக்கைகளை அரசாங்கம் செயற்படுத்த வேண்டும். மலையக இளைஞர்கள் பற்றிய பதிவுகள் தேர்தல் இடாப்பிலே சரியான முறையிலே இடம்பெறாததன் காரணத்தினால்தான் அவர்கள் பல வகையான கல்வித் தகுதிகள் இருந்தும் அரசாங்கத் தொழிலில் ஈடுபட முடியாத வகையில் பிரச்சினைகளுக்கு முகம்கொடுக் கின்றார்கள்.

1983ஆம் ஆண்டுக் காலகட்டத்திலும் அதற்கு முன்னரும் பின்னரும் நடந்த பல யுத்தங்களின் காரணமாக இடம்பெயர்ந்த பல்லாயிரக்கணக்கான மலையக மக்கள் இங்கிருந்து இந்திய நாட்டிற்கும் வெளிநாடுகளுக்கும் இடம்பெயர்ந்து சென்று விட்டார்கள். ஆகவே, இந்தச் சட்டமூலத்தின்மூலம் அவர்களு டைய வாக்குரிமையும் உறுதி செய்யப்பட வேண்டும். அப்படிச் செய்யப்படும்போது மலையக மக்களின் பிரதிநிதிகளை அதிகரிக்கக்கூடியதாக இருக்கும். ஆகவே, இந்த அரசாங்கம் அந்தச் செயற்பாட்டை முன்னெடுக்க வேண்டும். இந்த விடயத்தில் அமைச்சர் அவர்கள் முழுமையான ஈடுபாட்டுடன் செயற்பட வேண்டும் என்று மலையக மக்கள் சார்பாக இந்த உயரிய சபையிலே கேட்டுக் கொள்கின்றேன்.

அது மட்டுமல்லாமல், தேசிய அடையாள அட்டையில், அதேபோல் பிறப்புச் சான்றிதழில், தமிழரா? சிங்களவரா? அல்லது எந்த மதத்தைச் சார்ந்தவர்? என்ற கேள்விகள் பற்றிய விடயங்கள் எல்லாம் அகற்றப்படல் வேண்டும். எமது மக்கள் இலங்கை மக்கள் என்ற வகையில், இலங்கை நாட்டின் பொருளாதாரத்தின் முதுகெலும்பாகச் செயற்படுகின்ற பெருந்தோட்ட மக்களுடைய வாக்குகளின் மூலமாக நாட்டின் ஜனாதிபதியைத் தேர்ந்தெடுக்க முடியுமானால், அந்த மக்களுடைய வாக்குகளின் மூலமாகப் பாராளுமன்ற உறுப்பினர்களைத் தேர்ந்தெடுக்க முடியுமானால், எதற்காக இனியும் இந்த நாட்டில் அவ்வாறான கேள்விகள் எழுப்பப் படுகின்றன? வைத்தியசாலை விடுதிகளிலே ஒருவரைச் சேர்க்கும்போது, அவர் எந்த இனத்தைச் சார்ந்தவர் என்று கேட்கின்றார்கள். ஆகவே, அரசாங்கத்தின் மூலமாக இவ்வாறான கேள்விகள் அகற்றப்பட்டு, அந்தத் தஸ்தாவேஜுகளினூடாக அவர் இலங்கைப் பிரஜை எனத் தெரியவந்தால், அவருக்குரிய சகல அங்கீகாரங்களும், சகல வசதிகளும், சகல வாய்ப்புக்களும் வழங்கப்படவேண்டும். ஏனெனில், பிறப்புச் சான்றிதழில் ஆரம்பிக்கின்ற அந்தப் பிரச்சினைக்கு இறப்புச் சான்றிதழ் வரை மலையக மக்கள் முகங்கொடுத்துக் கொண்டிருக்கின்றார்கள்.

இப்பொழுது இந்த அரசாங்கத்தின் மூலமாக, கௌரவ பிரதம மந்திரி ரணில் விக்கிரமசிங்க அவர்கள் மூலமாக இன்று தனி வீட்டுத் திட்டத்தினூடாக ஓரளவேனும் மலையக மக்கள் கட்டங்கட்டமாக அங்கீகரிக்கப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். எனவே, அதைத் துரிதப்படுத்துவது மட்டுமல்லாது, அரசாங்கத்தினால் மேற்கொள்ளப்படுகின்ற ஏனைய பதிவுகளிலும் இந்த மலையக மக்கள் புறக்கணிக்கப்படாமல் முழுமையாக உள்வாங்கப்பட வேண்டும். அத்தோடு, நான் இங்கு குறிப்பிட்டவாறு அங்கு உரிய தமிழ் உத்தியோகத்தர்கள் நியமிக்கப்படாததினால்தான் மலையக மக்களது ஆவணங்களில் எழுத்துப் பிழைகள் ஏற்படுகின்றன. ஆகவே, மலையகத்திலே நிலவுகின்ற கிராம சேவகர் வெற்றிடங்கள் எல்லாம் உடனடியாக அந்தந்தப் பிரதேசத்தைச் சேர்ந்த தமிழ் இளைஞர்களைக் கொண்டு நிரப்பப்படவேண்டும். தமிழ் பேசக்கூடிய பிரதேச செயலாளர்கள் மலையகத்திலே நியமிக்கப்படவேண்டும். அப்போதுதான் இவ்வாறான பிரச்சினைகளுக்கு நாம் தீர்வுகாணக் கூடியதாக இருக்கும். ஆகவே, அதனைச் செயற்படுத்துவதற்கு இந்த அரசாங்கம் முழுமையாகச் செயற்படவேண்டும் என நான் கேட்டுக் கொள்கின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ගැන ගරු ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා. අද දින මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් කථා කළා; කිඹුල් කඳුළු හෙළමින් කථා කළා.

එදා වතුකරයේ ජනතාවගේ identity cards උදුරාගෙන ගිහිල්ලා ඔවුන්ට ඡන්ද අයිතිය නැති කළා. මේ රටේ ජීවත් වන ජනතාවගෙන් සියයට 7.5ක් වතුකරයේ ජනතාව. එම සියයට 7.5ක්වූ ජනතාවගේ ඡන්දයත් හරියට ලැබුණා නම්, අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ නියෝජිතයන් 16දෙනෙක්. එසේ නියෝජිතයන් 16දෙනෙක් නැතිව, අද 9දෙනෙක් ඉන්නේ මොකද?

යාපනයේ බෝම්බ ගැහුවත් "බයිට්" එකට ගන්නේ, වතුකරයේ ජනතාවයි. මඩකළපුවේ ප්‍රශ්නයක් වුණොත් "බයිට්" එකට ගන්නේ, වතුකරයේ ජනතාවයි. Identity cards උදුරා ගන්නෙත් වතුකරයේ ජනතාවගේයි. ඒ නිසා අපි mobile service එකක් introduce කරලා ඔවුන්ගේ birth certificates ලබා දෙන්න ඕනෑ. වතුකරයේ ජනතාවගේ identity cardsවල අකුරු වෙනස්. එසේ අකුරු වෙනස් වෙන්නේ ඇයි? දෙමළ නම ලියනවා, සිංහල නිලධාරියෙක්. සිංහල නිලධාරියෙක් දෙමළ නමක් ලියන කොට, අකුරු වෙනස්. එතකොට ඡන්ද කාඩ් එක එන කොට, එහි තිබෙන නම වෙනස්. ඡන්ද කාඩ් එකේ වෙන නමක්, ඡන්ද පොතේ වෙන නමක්, identity card එකේ වෙන නමක්. එම නිසා වතුකරයේ අදාළ තනතුරුවලට සුදුසු දෙමළ නිලධාරීන් පත් කරන්න. වතුකර ප්‍රදේශවලට දෙමළ ග්‍රාම නිලධාරිවරුන් පත් කරන්න. සිංහල නිලධාරීන් පත් කරනවා නම්, ඒ අය දෙමළ භාෂාව දන්නා අය වෙන්න ඕනෑ. සිංහල නිලධාරීන් දෙමළ ඉගෙන ගෙන එන්න ඕනෑ. එහෙම නැත්නම් භාෂා ප්‍රශ්නයක් එනවා.

ගරු ඇමතිතුමනි, ඊළඟට තිබෙන ප්‍රශ්නය මෙයයි. ග්‍රාම නිලධාරිතුමා කාර්යාලයට එන්නේ දවල්ට. දවල්ට වතුකරයේ ජනතාව වැඩට ගිහිල්ලා. ග්‍රාම නිලධාරි forms ටික deliver කරලා එනවා. වතුකරයේ ජනතාව ගෙදරට එන්නේ, හවස පහහමාරට හෝ හයට. එතකොට ග්‍රාම නිලධාරි මහතා off වෙලා ගිහිල්ලා. මේ නිසා වතුකරයේ ජනතාවට ඡන්ද ලියා පදිංචි අයිතිය

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

ලැබෙන්නේ නැහැ. එම නිසා මේ පවතින system එක වෙනස් කරන්න. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ලෙස හොඳ නිලධාරිතුමෙක් අද පත්වෙලා ඉන්නවා. ඒ තමයි මහින්ද දේශප්‍රිය මහතා. එතුමා වතුකර ජනතාව ගැන හොඳට දන්නවා. එතුමා එම නිලයේ ඉන්න කාලයේදී, මේ ආණ්ඩුව මේ වැඩ පිළිවෙළ වෙනස් කරන්නෙ; මේ system එක වෙනස් කරන්න. වෙන ප්‍රදේශවලත් එහෙම කරනවා නම්, වතුකරයේ ජනතාව වෙනුවෙනුත් එවැනි වැඩ පිළිවෙළක් සකස් කරන්න. වතුකරයේ ජනතාවගේ වැඩ රාජකාරි කරන වේලාව අනුව මේ කටයුතු ටික වෙනස් කරන්න ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කරන්න. දැනුවත් කරලා, ඒ system එක හරියාකාරව ක්‍රියාත්මක කළොත් තමයි, සම්පූර්ණයෙන්ම එම ඡන්ද අයිතිය භුක්ති විඳින තත්ත්වයට වතුකරයේ ජනතාව පත් වෙන්නේ. එම නිසා අද මේ ගෙනෙන පනත් කෙටුම්පත ක්‍රියාත්මක වීමේදී, මේ ක්‍රමය වෙනස් කරලා, වතුකරයේ ජනතාව වෙනුවෙන් විශේෂ සැලකිල්ලක් ගරු ඇමතිතුමා සහ නිලධාරීන් පෙන්වයි කියලා මම බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි;

නන්‍රි. வணக்கம்!

[අ.භා. 5.43]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමාට පෙර කථා කළ, රනිල් බබාගේ Party එකේ අලි බබා ගැන කථා කරපු තොත්ත බබාට පස්සේ කථා කරන්න ලැබීම පිළිබඳව මම බෙහෙවින්ම සන්තෝෂයට පත් වනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව හුහක් කථා කරනවා. හැබැයි, ඒ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව උතුරු හා උතුරු මැද ප්‍රදේශයේ ජනතාව හොඳින් දන්නවා. ඔවුන් අමු අමුවේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කළ ආකාරය පිළිබඳව අපි දන්නවා. එතුමා සහ එතුමාගේ පියාගේ ක්‍රියා කලාප අපි දන්නවා.

උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ජනතාවට සහ පිට රට ජීවත් වන ජනතාවට ඡන්ද අයිතිය ලබා දීම සඳහා අද මෙම පනත් කෙටුම්පත යටතේ යෝජනා කර තිබෙනවා. අපි කියන්නේ, උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ජීවත් වන සහ රටින් බැහැරව ජීවත් වන ජනතාවට ඡන්ද අයිතිය දෙනවා වාගේම, 1988-1989 කාලයේ මේ රටින් බැහැර වූ සිංහල ජනතාවටත් එම අයිතිය ලබා දිය යුතු බවයි. එදා එක්සත් ජාතික පක්ෂ භිෂණ සමයේ 60,000කට ආසන්න සංඛ්‍යාවක් ඝාතනය වුණා. ඒ වාගේම ඒ කාලයේ මේ රටින් බැහැරවී පිට රටවල ජීවත් වන සිංහල ජනතාව විශාල පිරිසක් ඉන්නවා. ඒ ජනතාවටත් ඡන්ද හිමි වරම -ඡන්ද අයිතිය- ලබා දීමට වහාම කටයුතු කරන්න ඕනෑ. රටේ එක් කොටසකට අයිතියක් ලබා දෙනවා වාගේම, අනෙක් අය පිළිබඳවත්-

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
Sir, I rise to a point of Order.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, point of Order එක දිය යුතුද කියලා හරියට බලලා දෙන්න. මොකද, මේ මගේ වෙලාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කරමින් ප්‍රකාශයක් කළා. එම නිසා point of Order එකක් ඉදිරිපත් කිරීමේ අයිතිය මට තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, තොත්ත බබාද මොන බබාද කියන එක ඔබතුමාට අදාළ නැහැ. මම කාගේවත් නම් සඳහන් කරමින් කථා කළේ නැහැ.

භීෂණ කාලයේ මොනවාද කළේ කියන එක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. 2015 ජනවාරි මාසයේ මැතිවරණය කරපු හැටිත් අපි දන්නවා. [බාධා කිරීමක්] එක් එක් කෙනාගේ නම් කිය-කියා කථා කරන්න එපා. මා කාගේවත් නම කියලා කථා කළේ නැහැ. මා මොකක් හෝ භීෂණයක් කර තිබෙනවා නම් ඒ ගැන කියන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරමු.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
නැහැ, නැහැ. ඒ ප්‍රකාශය ඉවත් කර ගන්න කියන්න. මොකක්ද, මා කරපු - [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

තොත්ත බබා, තොත්ත බබා. සමා වෙන්න. තොත්ත බබා ඉන්න.

අද මෙතුමන්ලා සුපුරුදු ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. ඒ කාලයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට තිබුණු චෝදනාව තමයි, මැතිවරණ පැවැත්විය යුතු දිනයට කලින් මැතිවරණ පවත්වනවාය කියන එක. මැතිවරණ පැවැත්විය යුතු දිනයට කලින් මැතිවරණ පවත්වා මේ රටේ ජනතා පරමාධිපත්‍යය, තමන්ගේ නියෝජිතයා තෝරා ගැනීමේ අයිතිය එතුමා ලබා දුන්නා. අද මා කථා කරන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට නොවෙයි, පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයකු විධියටයි. අද වනකොට පළාත් පාලන ආයතනවල මැතිවරණ පැවැත්විය යුතු දිනය පහුවෙලා

මාස 25කුත්, දවස් 5ක් ගතවෙලා තිබෙනවා. අද මේ රටේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය අමු-අමුවේ උල්ලංඝනය කරනවා. මේ රටින් බැහැරව සිටින ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන මේ ආණ්ඩුව මේ රටේ සිටින ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරමින් මැතිවරණ නොපැවැත්වීම නිසා අද මේ රටේ ජනතාව විශාල අර්බුදයකට පත්වෙලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන මැතිවරණය නොපැවැත්වීම නිසා අද කසළ කළමනාකරණය කරන්න විධියක් නැහැ; ඩෙංගු මර්දනය කරන්න විධියක් නැහැ. අද මේ රටේ ඩෙංගු උවදුර නිසා අහිමිවන හැම ජීවිතයකටම වග කියන්න ඕනෑ, මේ යහ පාලන ආණ්ඩුවයි. පළාත් පාලන ආයතනවලට මහජන නියෝජිතයන් පත් නොකර මේ රටේ නිලධාරිවාදයට ඉඩ දීමෙන් මෙතුමන්ලා කරන්නේ ගමේ ප්‍රශ්නයට විසඳුම් සොයන ගමේ නියෝජිතවරයා පත් නොකිරීමයි. අද උදේ අපි ප්‍රශ්නයක් ඇසුවා, පළාත් සභා හා පළාත් පාලන ඇමතිවරයාගෙන්. අද පළාත් පාලන ආයතනවලට තිබෙන බරපතළම ප්‍රශ්නය තමයි ඩෙංගු උවදුර.

අපේ ගම්පහ ප්‍රදේශයේ විශාල සංඛ්‍යාවක් ඩෙංගු උවදුරට ගොදුරුවෙලා ඉන්නවා. ගම්පහ ප්‍රදේශයේ විතරක් නොවෙයි, මුළු රටේම කොළඹ, ගම්පහ ඇතුළු දිස්ත්‍රික්ක නවයක ජනතාව අද මේ ඩෙංගු උවදුරින් පීඩාවට පත්වෙලා ඉන්නවා. අද පත්‍රවල පළවෙලා තිබෙන සංඛ්‍යා ලේඛන අනුව කියන්නේ, ඩෙංගු රෝගීන් සංඛ්‍යාව 60,000යි, 68,000යි, 70,000යි කියලායි. ඩෙංගු රෝගීන් සංඛ්‍යාව අද වසන් කරනවා. ඒ පිළිබඳව රෝහල්වලින් සත්‍ය වාර්තා ලබාගන්නේ නැහැ. අද ඩෙංගු රෝගීන් සංඛ්‍යාව ලක්ෂ 5කට හෝ ලක්ෂ 6කට වඩා වැඩියි. ඒ අතර පාසල් දරුවන් ඉන්නවා. අද ධූමනය හරියාකාරව කරන්නේ නැහැ; හරියාකාරව කුණු ගෙන යන්නේ නැහැ. කුණු ගෙන ගොස් දමන්නේ කොහේටද? ශක්‍යතා වාර්තා, පරිසර වාර්තා පිළිබඳව මහ ලොකුවට කථා කරනවා. නමුත් පසු ගිය කාලයේ ආවාට ගියාට ඉඩම්වලට කසළ බැහැර කළා. මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ අනුදැනුම ඇතිව ගාල්ල ප්‍රදේශයේ අක්කර 25ක පෞද්ගලික ඉඩම් ගොඩ කරනවා. මේවාට කොමිස් ගියේ කාටද? අද පළාත් පාලන ආයතනවල කුණු දමලා, ඊට පස්සේ පස් දමලා ගොඩ කරනවා. පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා මේ ගරු සභාවේ ඉන්නවා. අපේ හිතවත් අනුරාධ ජයරත්න නියෝජ්‍ය ඇමතිතුමා මේ පිළිබඳව අවධානය යොමු කරයි කියලා මා හිතනවා. ඒ වාගේම කැලණිය ප්‍රදේශයේ තේ ෆැක්ටරියක් අයිති කොම්පැනිකාරයකුගේ අක්කර 3ක ඉඩමක් ගොඩ කරනවා. හැබැයි අපි ඒ කාලයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් අදාළ අනුමැතිය අරගෙන, සල්ලි දීලා ගත්ත ඉඩමට කුණු නොදමා කසළ කළමනාකරණය පිළිබඳව ව්‍යාපෘතියක් පටන් ගත්තා. කිහිපදෙනකුගේ චුවමනාවට අද ඒ ඉඩමට කුණු දැමීම නවත්වා තිබෙනවා. ඊට එහා පැත්තේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයිති අක්කර 22ක ඉඩමක් තිබෙනවා. ඒකෙන් අක්කරයක් හෝ අක්කර දෙකක් ලබාගෙන, නිසි ක්‍රමවේදයකට කැලණිය ප්‍රදේශයේ කසළ එයට බැහැර කිරීමේ කටයුත්ත කරන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක් දෙන්න.

මැතිවරණ නොපවත්වා, මේ රටේ පළාත් පාලන ආයතන විනාශ කරන, මේ රටේ ජනතාව අපහසුතාවට පත්කරන, මේ රටට වසංගත බෝ කරන ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත්වෙලා තිබෙනවා. මා කලින් කිව්වා වාගේ ඩෙංගු රෝගය හැදිලා අහිමිවන සෑම ජීවිතයකටමත්, සෑම රෝගියකුටමත් වග කියන්න ඕනෑ, මේ යහ පාලන ආණ්ඩුව බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[5.50 p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)

Thank you, Hon. Presiding Member, for giving me this opportunity. This is a very important Bill, I should say.

During the war, from the Districts of Mannar, Vavuniya and Mullaitivu, over 150,000 people were chased out. They had to leave their respective districts within two hours and they all came to Puttalam. After the war, about 60,000 people have returned to their respective districts; started living there and registered as voters of that area. Another 20,000 people have been registered in Puttalam and now they are living in Puttalam as people of Puttalam. Very unfortunately, there are about 40,000 to 50,000 people, who want to go back to their respective districts, still living in Puttalam with all the difficulties. But unfortunately, due to certain problems, their lands have not been handed over to them. The lands which were owned by them were not given back and because of that they cannot go back to their respective districts and resettle. Anticipating that they would be able to go and live in their respective districts in the future, they are still living in Puttalam with all the difficulties. There are about 40,000 of them and they want to go back. They want to register themselves as voters of their respective districts; but unfortunately they have been deprived of that. You would not believe it, but they are unable even to get a letter from the *Grama Sevaka* because the first question they are asked is, "What is the district you vote from?" So, those are some of the difficulties they are facing.

I know, the present Chairman of the Election Commission knew that we had this problem during the Presidential Election also. Some arrangements were made for those people living in Puttalam to go back to their respective districts and cast their vote. Unfortunately, the then Government - I know that personally - blocked all those people. About 20,000 to 25,000 people were unable to cast their vote because of that. So, my request to the Chairman of the Election Commission is to look into this matter and see that some arrangement is made by the Government and the Commission for those 30,000 to 40,000 voters living in Puttalam to go back and vote. They must not be deprived of their voting rights. This is a very important issue which has been going on for years. In the future, we are going to face the Local Government

[ගරු මොහොමඩ් නවවි මහතා]

Elections, the Provincial Council Elections and we should not deprive those people of their voting rights. Therefore, I request the Government to humbly look into their problem and see that they are registered in their respective districts as voters and are allowed to cast their vote. The second issue, Sir, is this. I especially would like to speak about my District, Puttalam. Out of the total number of voters, over 10,000 people are working in Europe, America and all over and another 20,000 people are working in the Middle East.

So, 30,000 people are working abroad and we are not fair by them. The amount of foreign exchange that they send to this country is vast. As you know, the foreign exchange sent by the migrant workers, I think, is the third largest income of the country. Unfortunately, these people are unable to cast their vote. When you compare this situation with other countries like America, wherever their people are, they are able to cast their vote in the embassies of the respective countries. Their votes are counted along with the other votes. But here, over lakhs and lakhs of people who are working abroad, sending their income and helping us are being deprived of casting their vote. Therefore, wherever the Sri Lankans are living in large numbers, wherever they are working, arrangements must be made for them to cast their vote. Otherwise, it is unfair. They cannot come back just because of the elections. They cannot get visas. They are helping us by sending valuable foreign exchange. Some arrangements must be made in this regard so that at the next election they would be able to cast their vote. This is a very important matter, because in the future elections more than two hundred thousand people would be deprived of their right to vote.

There is another important point I want to make. If we change the present PR system - it is okay if we do not - but still there are some doubts that the system would be changed. Therefore, I would like to make a valid point. Because of this PR system certain electorates are unable to elect a Member. What happens is, the leaders of both parties in the district who get more preferential votes come to power. In some instances, there are two or three MPs in one electorate and in another electorate there is nobody. Take my electorate as an example. I represent Puttalam Electorate in the Puttalam District. From 1989 up to the year last election was held, we were unable to elect a single Member for our electorate. Even I lost by 500 votes and I have come through the National List. Both sides have been losing by a few thousand votes in every election. Because we were unable to elect an MP, unfortunately my electorate is suffering. This is the position in certain electorates of the country. Therefore, if, - there is a big "if " there - if the PR system is not changed, some arrangements must be made for electorates which do not have elected members. Therefore, these are the problems that we face. Political rights which we require must be given. There are difficulties, but I am sure with this Bill these things would be addressed. Lakhs and lakhs of people who are living abroad must be allowed to cast their vote. Internally displaced people also must be given that right. My request is, if the PR system is not changed some arrangements must be made for electorates which do not elect MPs.

Thank you.

[අ.භා. 5.58]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවන මේ මොහොතේ බොහෝ මන්ත්‍රීතුමන්ලා මෙහි වැදගත්කම ප්‍රකාශ කළා. ඇත්තෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන රටක්, ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලන ජනතාවක් ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි දක්වන සැලකිල්ල අපි දකිනවා, මැතිවරණයකදී ඒ පුද්ගලයන්ට ලැබෙන ඡන්ද අවස්ථාව සහ ඡන්ද බලය දිහා බැලීමේදී. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි යම් කිසි පක්ෂයක් ඒ පක්ෂයේ අරමුණ කරා යද්දී ප්‍රජාතන්ත්‍රවාදයට පිටින් ගිහිල්ලා පුද්ගලයන් ලියා පදිංචි කරලා රට තුළ නැති පුද්ගලයන්ට, රට තුළ අනන්‍යතාව ඔප්පු කර ගන්න බැරිව ගිය පුද්ගලයන්ට ඡන්දය හදා දෙන ක්‍රමවේදය අපි අසූ ගණන්වලදී දැක්කා. මා හිතන විධියට මේ ක්‍රමවේදයට විරුද්ධව එදා සටන් කරපු බොහෝ දෙනෙකු නැවතුනේ සූරියකන්ද, එහෙම නැත්නම් බටලන්ද වාගේ වධකාගාරවල. මේ රට එහෙම තත්ත්වයක තිබුණු රටක්. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදයකට යනවා කියලා බලය ගත්ත ආණ්ඩුවක් තමයි 2015 වර්ෂයේදී පත් වුණේ. හැබැයි, අද අපට තිබෙන කනගාටුව, දුක මෙයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔය මූලාසනයේ ඔබතුමා අද ඉන්නවා. නමුත්, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන මැතිවරණය කවදාද පවත්වන්නේ කියලා කියන්න ඔබතුමාට හැකියාවක් නැහැ. පාර්ලිමේන්තුවේ රාජ්‍ය නිලධාරීන්ගේ කුටියේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ඉන්නවා. නමුත්, එතුමාට කියන්න හැකියාවක් නැහැ, පළාත් පාලන මැතිවරණය කවදාද, මොන විධියටද පවත්වන්නේ කියලා. ඉතින් මේක මහ කරුමක්කාර කාලකණ්ණි රටක්.

මේ රටේ බලය ගත්ත උදවියට, නීති ක්‍රියාත්මක කරන උදවියට මේ මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා නිශ්චිත දිනයක් කියා ගන්න බැරි වෙලා තිබෙනවා. මේක මහා ලොකු දෙයක් නොවෙයි. මේ තැන්වල මේ නිලධාරීන් ඉන්නවා නම් කථා කරලා නිශ්චිත දිනයක් දෙන්න පුළුවන්කම තිබෙනවා. ඇයි, මේක "රබර්" කරන්නේ? ඇයි මේක අදින්නේ? මැතිවරණ කොමසාරිස්තුමා හමු වුණාම එක වෙලාවක කියනවා, "දැන් පුළුවන්, මැව් එක ගහන්න ලෑස්තියි, පිටටනිය ලෑස්තියි, දැන් අපට තිබෙන්නේ මැව් එක පටන් ගන්නයි" කියලා. ඉතින්, අපි යනවා මැව් එක ගහන්න. නමුත්, මොන මැව් ගැහිල්ලක්ද? මොකද, තව කට්ටියක් කියනවා, අද වහිනවා, නැත්නම් වෙන ගැටලුවක් තිබෙනවා, ඒ නිසා මැව් එක ගහන්න බැහැ කියලා. එහෙම නැත්නම්, "පන්දු ඉවරයි" කියනවා. දැන් කොහොමත් මේ ආණ්ඩුවේ පන්දු ඉවර වේගෙන තමයි යන්නේ. ඉතින් ඒ නිසා අද පැන නැඟී තිබෙන ගැටලු බොහොම වැඩියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ප්‍රජාතන්ත්‍රවාදය උතුරට දෙන්න, නැඟෙනහිරට දෙන්න, ඒ සඳහා පනත් ගෙනැත් ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න හැදුවත්, අද ජනාධිපතිවරයාට පුළුවන්කමක් නැහැ මේ මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා කියාගන්න. අග්‍රාමාත්‍යවරයාට පුළුවන්කමක් නැහැ මේ මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා කියාගන්න. විෂයය භාර ඇමතිවරයාට පුළුවන්කමක් නැහැ මේ මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා කියාගන්න. මැතිවරණ කොමසාරිස්තුමාට පුළුවන්කමක් නැහැ මේ මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා කියාගන්න. ඉතින්, මේ කෙටුම්පත් සියල්ල හැදුවත්, මැතිවරණයට දින නියම කර ගන්න බැරි නම් ඇති වැඩේ මොකක්ද? දැන් මේ පිළිබඳ සංශෝධන 57ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මේ සංශෝධන 57 පාර්ලිමේන්තුවට ගෙනැත් සම්මත කර ගන්නේ කවදාද කියලා කියා ගන්න අඩුම තරමින් මේ ආණ්ඩුව නියෝජනය කරන ජනාධිපතිවරයා, අගමැතිවරයා, විෂයය භාර ඇමතිවරයා දන්නේ නැහැ. මේ නිසා තමයි ගැටලු පැන නැඟී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ කිසි දවසක නොවූ අන්දමට මේ මාස හයට විතරක් ඩෙංගු රෝගීන් ලක්ෂ ගණනක් හමු වෙලා තිබෙන්නේ මේ මැතිවරණය පවත්වා පළාත් පාලන ආයතන පිහිටුවා ගන්න බැරිවීම නිසායි. කසළ කළමනාකරණය හරියාකාරව කරන්න බැරිව ගිහින් තිබෙන්නේත් ඒ නිසායි. හැබැයි, ආණ්ඩුව හොරණෑව ගහනවා වාගේ හැම දාම කියන්නේ මොකක්ද? "මේ ප්‍රශ්න ගැටලු ගිය ආණ්ඩුව ඉතුරු කරලා ගිය ඒවා" කියනවා. ඉතින්, පසු ගිය ආණ්ඩුවෙන් වැරැද්දක් වුණා නම් ඒකට දොස් කියන එක නොවෙයි මේ ආණ්ඩුවේ වගකීම. මේ ආණ්ඩුවේ වගකීම ඒ ගැටලු අවසන් කරන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පසු ගිය දිනයකත් මේ කාරණය කිව්වා. අවුරුදු 30ක යුද්ධයක් ඇති කළේ කවුද කියන එක බලන්නේ නැතිව තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒ වෙලාවේ යුද්ධය ඉවර කළේ. ඒ නිසා, කුණු කන්ද ගෙනැත් දැම්මේ කවුද කියලා කථා කරන්න අවශ්‍ය නැහැ. උමා ඔය ව්‍යාපෘතිය පටන් ගත්තේ කවුද කියලා කථා කරන්න අවශ්‍ය නැහැ. එහෙම නැත්නම් ඩෙංගු රෝගය වැඩි වුණේ කවදා සිටද කියලා කථා කරන්න අවශ්‍ය නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුව ගත්ත උදවියට වගකීමක් තියෙන්න ඕනෑ, හැකියාවක් තියෙන්න ඕනෑ, චුවමනාවක් තියෙන්න ඕනෑ මේ ප්‍රශ්නවලදී කැප වෙලා, බැහැලා වැඩ කරන්න. එහෙම නැතිව, "අහවලා ගෙනාපු ප්‍රශ්නය ඉතිරි වුණා, අහවලා ගෙනාපු ප්‍රශ්නය තමයි තිබෙන්නේ" කිය කියා ඉන්න එක නොවෙයි කළ යුත්තේ. අද තමුන්නාන්සේලා මේ බෝලය හැමෝගේම අතට දමනවා.

අද මැතිවරණ ක්‍රමය ගැන නිශ්චිත විසඳුමක් නැහැ. "සමානුපාතික ක්‍රමයට යන්න බැරි නම්, කොට්ඨාස ක්‍රමයට යන්න බැරි නම්, නැවත පරණ තිබුණු ක්‍රමයට යමු" කියලා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සහ ඒ අය සමඟ එකතු වුණු පක්ෂ නායකයෝ සාකච්ඡා කර තිබෙන පුවත් පත් දැන්වීමක් මම ඊයේ පෙරේදා දැක්කා. මේක අභාග්‍යයක්. දැන් අපි පළාත් සභා මැතිවරණයට කොහොමද මුහුණ දෙන්නේ? කොහේද පළාත් සභාවල සීමා හදලා තිබෙන්නේ? කොහේද පළාත් සභාවලට අදාළ ඒ ක්‍රමවේදය හදලා තිබෙන්නේ? කොහේද මහ මැතිවරණයකදී කොට්ඨාස ක්‍රමයට යන විධියක් නිර්මාණය කරලා තිබෙන්නේ? ඒ කිසිම දෙයකට තවම අත තියලාවත් නැහැ. ඒ කිසිම දෙයකට අත තියලාවත් නැතිව, පළාත් පාලන ආයතන මැතිවරණය තියන්නේ කොහොමද කියලා ආණ්ඩුව තවම කල් මරමින් සිටිනවා. "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හොඳ වෙයිද, යූඑන්පී එකට හොඳ වෙයිද, මේ ස්වාභාවික විපත් ඉවර වෙයිද, රටට සල්ලි එයිද, රටේ වැඩ කරන්න පුළුවන් වෙයිද?" කියා හිත හිතා මේ මැතිවරණය කල් අරිනවා නම් ජනතාව කාගෙන්ද සහනයක් බලාපොරොත්තු වෙන්නේ?

ගරු අධිකරණ ඇමතිතුමනි, ජනතාවට අවශ්‍ය කරන කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙන ඒම හොඳ කටයුත්තක්. හැබැයි, මැතිවරණ කොමසාරිස්තුමා, ජනාධිපතිවරයා ඇතුළු සියලු දෙනා මේ මැතිවරණය පවත්වන්නේ කවදාද කියන වචනය පාර්ලිමේන්තුවට දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමන්ලාට දෙන්න බැහැ; අනිකුත් පුද්ගලයන්ට දෙන්න බැහැ. නමුත්, මූලාසනයේ සිටින ඔබතුමා සහ ජනාධිපතිවරයා, මැතිවරණ කොමසාරිස්වරයා, අගමැතිවරයා, විෂයය භාර ඇමතිවරයා කියන සියලු දෙනාම එකතු වෙලා, මේ සංශෝධන ටික සම්මත කරලා, මේ ඡන්දය පවත්වන්නේ කවදාද කියලා පැහැදිලිවම කිව්වේ නැත්නම්, මේ රටත්, පාර්ලිමේන්තුවත් විශාල බෙදවාචකයකට යයි කියන අවිශ්වාසය අප තුළ තිබෙනවා. එය නැති කරලා, කඩිනමින් මැතිවරණය පවත්වන්නය කියන ඉල්ලීම කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 6.05]

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி பிரதி அமைச்சரும் புத்தசாசன பிரதி அமைச்சரும்)

(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ, පක්ෂ විපක්ෂ මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම මේ පිළිබඳව ප්‍රශංසාව තමයි පළ කළේ.

විශේෂයෙන්ම උතුරු නැඟෙනහිර පැවති ත්‍රස්තවාදී ක්‍රියා හේතුකොට ගෙන ඒ ජනතාව නොයෙකුත් ක්ෂේත්‍රවලදී දීර්ඝ කාලයක් තිස්සේ විශාල වශයෙන් පසුබෑමකට ලක් වුණා. ඒ ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සහ අපේ රටේ සංහිඳියාව ගැන කථා කරන මොහොතක, අප සියලු දෙනාම ශ්‍රී ලාංකිකයන් හැටියට ඉදිරියට යන්නට නම් ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ශක්තිමත් විය යුතුය කියන කාරණය අප විශ්වාස කරනවා.

අද මේ ආණ්ඩුවට විශේෂයෙන්ම මුහුණ දෙන්නට සිදු වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්න දෙක තමයි, ආර්ථිකය සහ ප්‍රජාතන්ත්‍රවාදය. මේ කරුණු දෙකම ජයග්‍රහණය කරන්නට අවශ්‍ය කරන පරිසරය නිර්මාණය කර ගෙන අපි ඉදිරියට යා යුතුයි.

ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන විට, එදා යුද්ධයෙන් බැට කාපු ජනතාව තුළ නැවත වතාවක් ඒ විශ්වාසනීයත්වය ඇති කිරීම ආණ්ඩුවක් හැටියට, ආමාත්‍යාංශය හැටියට අපේ වගකීමක් වෙනවා. ඒ වග කීම තමයි අපි මේ දක්වා ඉෂ්ට සිද්ධ කර ගෙන යන්නේ. පසු ගිය කාල සීමාව ඇතුළත පනත් කෙටුම්පත් රාශියක් ගෙනැවිත් සම්මත කර ගන්නට අපට පුළුවන් වුණා. උදාහරණයක් වශයෙන් කියනවා නම්, ඉඩම් පිළිබඳව උතුරු නැඟෙනහිර පළාත්වල විශාල වශයෙන් ගැටලු තිබුණා. යුද්ධයෙන් තම වාසස්ථාන අහිමි වුණු බොහෝ පිරිසක් ඉන්නවා. එම නිසා අපට සිදු වුණා, කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙන එන්නට. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නට පුළුවන්, නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරන්නට පුළුවන් හැම අවස්ථාවකදීම ඒ සඳහා අවශ්‍ය අණ පනත් ගෙන එන්නට අපි කටයුතු කළා.

[ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා]

ත්‍රස්තවාදය නිසා තමන්ට ඡන්ද අයිතිය අහිමි වුණු විශාල පිරිසක් අපේ රටේ ඉන්නවා. ඒක උතුරේද, නැහෙනහිරේද, දකුණේද කියලා නැහැ. නොයෙකුත් ආකාරයට තමන්ගේ ජීවිතවලට මෙය බලපෑවා. එම ජනතාවගේ මූලික අයිතිවාසිකමක් ලබා දීම තමයි අප මේ පනත් කෙටුම්පත හරහා ඉෂ්ට සිද්ධ කරන්නේ. ඒ නිසා තමයි අද මේ විවාදයේ දී අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා මේ පනත් කෙටුම්පතට පක්ෂව අදහස් පළ කළේ. ඒ ඇතුළේ විවිධාකාර වූ වෙනත් මාතෘකා ගැනත් කථාබහ වුණා. නමුත් මේ පනත් කෙටුම්පතේ තිබෙන වැදගත්කම එයින් බිඳකුදු හෝ අඩු වෙනවාට අපි කැමැති නැහැ.

මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන ඒම සඳහා අපි අවුරුදු එකහමාරක් පමණ කාලයක් දීර්ඝ වශයෙන් කටයුතු කළා. මෙම පනත් කෙටුම්පත කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා ඊට පස්සේ නීතිපතිවරයාගේ සහතිකය මත පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙනකොට, මෙම පනත් කෙටුම්පතට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ නඩු දෙකකුත් අවසන් වුණා. ඒ සියලු දේවලින් පසුව තමයි ඡන්ද අයිතිය නොමැතිව සිටින ජනතාවට නැවත ඡන්ද අයිතිය ලබා දීමේ වැඩ කටයුත්ත මේ දක්වා කෙරී ගෙන ඇවිත් තිබෙන්නේ. මෙම පනත් කෙටුම්පතට අවශ්‍ය සංශෝධන කාරක සභා මට්ටමේදී අපි සිදු කරනවා. ඒ තුළ පනත් කෙටුම්පතට ලැබෙන බලතල තවත් පුළුල් වෙනවා ඇති. මෙම පනත් කෙටුම්පතෙන් , "අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තා " කියන කොටස තවත් නිර්වචනය කිරීම, තවත් පුළුල් වීම තුළ මේ පනත් කෙටුම්පත මගින් ඡන්ද අයිතිය නොමැතිව සිටින ජනතාවගේ ඡන්දය අයිතිය ආරක්ෂා වීම තව දුරටත් තහවුරු වුණාය කියන කාරණාව අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතේ 2 (1) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "2. (1) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවට යටත්ව-
>
> (අ) අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ හෝ අවතැන් වී සිටි තැනැත්තකුව සිටියා වූ ද;"

උතුරු පළාත සහ නැහෙනහිර පළාත යනුවෙන් මේ පළාත් සීමා නොකර මුළු රටටම බලපාන පරිදි මෙම පනත් කෙටුම්පත ගෙන ඒමෙන් ප්‍රජාතන්ත්‍රවාදය තවදුරටත් ආරක්ෂා කරන්නට අපට පුළුවන්කම ලැබුණාය කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම මෙම පනත කෙටුම්පතේ, "2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාමලේඛනයක තමාගේ නම අතුළත් කරනු ලැබ නොමැති වූ ද,..." යනුවෙන් සඳහන් කර ඇති 2. (1) (ඇ) යටතේ ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියෙකුට ඡන්ද අයිතිය ලැබෙන බව තහවුරු වනවා. අපේ සමාජයේ මේ පිළිබඳව තිබෙන "අවිශ්වාසය" කියන කාරණාව අපි බිඳ දමන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ සමහර මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ විවිධ අදහස් මම අහගෙන සිටියා. උතුරේ පන්සල් හදන එක ගැන කථා කළා; නැහෙනහිර පන්සල් හදන එක ගැන කථා කළා. ඒ වාගේම දකුණේ කෝවිල් හදන එක අපි නවත්වා නැති බවත් කියන්නට ඕනෑ. දකුණේ පල්ලි හදන එක අපි නවත්වා නැහැ. එසේ නම්, එම අයිතිය උතුරේ පන්සල්වලටත් ඒ ආකාරයෙන්ම තිබිය යුතුයි. ඒ වාගේම උතුරේ ආණ්ඩුකාරවරයා කළ යම් යම් ප්‍රකාශ ගැනත් සඳහන් කළා. අප සියලු දෙනාගේම බලාපොරොත්තුව වන්නේ එකම රටක් හැටියට අපේ රට ඉදිරියට යනවා දකින්නයි. එම නිසා යම් යම් අන්තවාදී අදහස් වලට නැඹුරුතාවක් දක්වන්නේ නැතිව, තමන්ගේ අන්තවාදී දේශපාලන මතිමතාන්තර ඉදිරියට ගෙන යන්නේ නැතිව රට හැටියට සිතා මේ ගමන අපට ඉදිරියට යන්නට පුළුවන් නම් අප විශ්වාස කරන සමාජය බොහොම ඉක්මනට ළඟා කර ගැනීමේ හැකියාව පවතිනවා.

එම නිසා අධිකරණ ඇමතිතුමා, මැතිවරණ කොමසාරිස්වරයා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා ප්‍රධාන සියලුම නිලධාරීන් පසු ගිය වසර එකහමාරක, දෙකක වාගේ කාලය ඇතුළත විවිධ දේශපාලන පක්ෂවලින් ලැබුණු අදහස් හා යෝජනා සියල්ල සැලකිල්ලට අරගෙන කටයුතු කළ නිසා තමයි අද මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම දක්වා වූ ගමන යන්නට පුළුවන්කම ලැබුණේ. එම නිසා ඒ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ස්ථාපිත කළ ආයතනවල තව දුරටත් යම් යම් දුර්වලතා තිබෙනවා නම්, එම දුර්වලතා මකා දමා ඉදිරියට යෑම තමයි අප සියලු දෙනාගේම වගකීම වෙන්නේ කියා අපි විශ්වාස කරනවා. ඒ වගකීම ඉෂ්ට සිද්ධ කරන්නට මහජන නියෝජිතයින් සියලු දෙනාගේම සහයෝගය අවශ්‍ය කරනවා. විවේචන තිබෙන්නට පුළුවන්. හැබැයි, මේ සියලු දෙනා ඒක රාශි වෙලා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන ආයතන ගොඩනැඟිය යුතුයි. අපි සියලු දෙනාම නිදහසේ ජීවත් වෙන්නට කැමැති මිනිස්සු. එම නිසා ඒ අයිතිය අපෙන් බිඳ දමන්නට යම් කිසි කෙනෙක් උත්සාහ දරනවා නම්, ඒ සියලු දේවල්වලට විරුද්ධ වෙලා පසු ගිය වසර දෙකක කාලය තුළ ගත්තා වූ ක්‍රියාමාර්ග ශක්තිමත් කරන එක තමයි අප සියලු දෙනාගේම වගකීම හැටියට මා දකින්නේ. මම මේ පිළිබඳව දීර්ඝ වශයෙන් අදහස් දක්වන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මෙම පනත් කෙටුම්පත ගෙන එන්නට ලැබීම අප ලැබූ ජයග්‍රහණයක්.

අද දින මෙම විවාදයේ දී SAITM එක ගැනත් කථා වුණා. පළාත් පාලන මැතිවරණය ගැන කථා වුණා. හැබැයි, අද දින දෙවැනි වර කියවීම සඳහා ඉදිරිපත් කළ මෙම පනත් කෙටුම්පතට තිබෙන වටිනාකම ගැන බැලුවොත්, අපි රටක් හැටියට ජයග්‍රහණයක් ලැබූ දවසක්. මෙම පනත් කෙටුම්පතේ වටිනාකම අඩු කරන්නට සමහරු විවිධාකාරයෙන් අර්ථ කථන ලබාදෙමින් කථා කළත්, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පුළුවන්කම ලැබීම පිළිබඳව රටේ සමස්ත ජනතාව අද සතුටු වෙනවා. මේ තුළින් ප්‍රජාතන්ත්‍රවාදය තවත් ශක්තිමත් වේවි. එම නිසා ඉදිරි කාලය තුළ අපට මොන බාධක ආවත් ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා ගන්නා වූ තීන්දු ඒ ආකාරයෙන්ම ගන්නවාය කියන කාරණය මතක් කරමින් මා නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවුක්කප්පට්ටු, ඒற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

தீர்மானிக்கப்பட்டது.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. PRESIDING MEMBER in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1 ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ඇති අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්.)
வாசகம் 2.- (உள்நாட்டில் இடம்பெயர்ந்த ஆட்கள் பதிவுசெய்வதற்குத் தகவுடையோராதல்.)
CLAUSE 2.- (*Internally displaced persons eligible to be registered.*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 22වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'යම් මැතිවරණ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (හිමිකම් පෑම් ලැයිස්තුව.)
வாசகம் 3.- (உரிமைக் கோரிக்கைகள் பற்றிய நிரல்.)
CLAUSE 3.- (*List of Claims.*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "3 වන පිටුවේ, 15 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(2) (අ) යම් මැතිවරණ'

(2) "3 වන පිටුවේ, 19 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'විසින් ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීමේ දින සිට දින දහ හතරක් ඇතුළත'

(3) "3 වන පිටුවේ, 24 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තියේ (7) වන'

(4) "3 වන පිටුවේ, 35 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(1) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය දක්වා වූ විධිවිධාන,' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
3 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 සිට 7 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
4 ஆம் வாசகத்திலிருந்து 7 ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 4 to 7 ordered to stand part of the Bill.

8 වන වගන්තිය.- (අර්ථ නිරූපණය.)
வாசகம் 8.- (பொருள்கோடல்.)
CLAUSE 8.- (*Interpretation.*)

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5වන පිටුවේ, 20 වන පේළියේ සිට 31 දක්වා වූ පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'ශ්‍රී ලංකාවේ ස්ථිර වශයෙන් පදිංචි වී සිටියා වූ ද, 2009 මැයි මස 18 වන දිනයට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී ත්‍රස්තවාදී සටන්කාමී හෝ වෙනත් කණ්ඩායමක යම් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ ස්ථිර පදිංචි ස්ථානය හැරයාමට සිදු වූ හෝ හේතු වූ ද, දැනට තම මුල් පදිංචි ස්ථානයෙන් පිටත ශ්‍රී ලංකාව තුළ පදිංචි වී සිටින්නා' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

8 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
8 ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 8, as amended, ordered to stand part of the Bill.

පූර්විකාව පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
முன்னுரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Preamble, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කල් තැබීමේ යෝජනාව, ගරු බිමල් රත්නායක මහතා.

සර්වජන ඡන්ද අයිතිය සුරැකීම
சர்வசன வாக்குரிமையைப் பாதுகாத்தல்
SAFEGUARDING UNIVERSAL ADULT FRANCHISE

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා ඉදිරිපත් වන මෙම යෝජනාව සඳහා පිළිතුරු දීමට ආණ්ඩුව පැත්තෙන් ඉන්නේ කවුද කියලා මා දැන ගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
The Hon. (Dr.) Harsha De Silva)
ගරු අගමැතිතුමා වෙනුවෙන් මා ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හේෂාන් විතානගේ මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂාන් විතානගේ මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු එච්.ආර්. සාරතී දුෂ්මන්ත මහතා (අධිකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා හා බුද්ධ ශාසන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச்.ஆர். சாரதீ துஷ்மந்த - நீதி பிரதி அமைச்சரும் புத்தசாசன பிரதி அமைச்சரும்)
(The Hon. H.R. Sarathie Dushmantha - Deputy Minister of Justice and Deputy Minister of Buddha Sasana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. HESHAN WITHANAGE *took the Chair.*

[අ.භා. 6.18]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු(ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ඉදිරිපත් වීම ගෞරවනීය ලෙස පිළිගන්නවා. ඒ වාගේම ගරු අධිකරණ ඇමතිතුමාට මෙම ගරු සභාව තුළ තවත් විනාඩි 10ක, 15ක කාලයක් රැඳී සිටීමට හැකි නම් එය වටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ විවාදය සඳහා ඉදිරිපත් කරනු ලබන යෝජනාව මෙයයි.

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති වයස අවුරුදු 18ට වැඩි පුරවැසියන්ට හිමි විය යුතු සර්ව ජන ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැක්කේ වයස අවුරුදු 18 මාස 06ක්වත් ඉක්ම වූ හෝ බොහෝ විට වයස අවුරුදු 19 ඉක්මවූ තරුණයන්ට පමණක්වීමේ ගැටලුව විසඳීමට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටීම සඳහා ශ්‍රී ලංකාවේ යොවුන් පරපුර වෙනුවෙන් කාරුණිකව ඉදිරිපත් කරනු ලැබේ. '

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී මම දෙයක් කියන්න ඕනෑ. මේක ශ්‍රී ලංකා යෞවන සමාජය විසින් අභිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, මැතිවරණ කොමසාරිස්තුමාට ඉදිරිපත් කරන ලද යෝජනාවක්. ඒ පදනම මත තමයි මම මෙම කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්නේ.

'1. අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන 4 වන ව්‍යවස්ථාව අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සර්ව ජන ඡන්ද බලය වයස අවුරුදු 18ට වැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ට හිමි වේ.

2. එසේ වුවත්, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව සෑම වර්ෂයකම ජූනි 01 දින වාර්ෂික ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ කරන දිනය ලෙස සැලකෙන අතර, එදිනට වයස අවුරුදු 18 සම්පූර්ණ පුරවැසියන්ට පමණක් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි විය හැකිය. උදාහරණ වශයෙන් දැනට වලංගුව පවතින 2015 ඡන්ද හිමි නාමලේඛනයට අදාළ ප්‍රතිශෝධනය ආරම්භ කළ නියමිත දිනය 2015 ජූනි 01 දින වූ බැවින් -සමහර විට මෙය අද වන විට 2016 වෙලා ද කියා මම දැනට දන්නේ නැහැ. නමුත්, මෙහි මූලධර්මය එකයි.- 2015 ඡන්ද හිමි නාමලේඛනයට නම් ඇතුළත්ව ඇත්තේ, 1997 මැයි මස 31 හෝ එදිනට පෙර උපත ලැබූ ශ්‍රී ලාංකිකයන්ට පමණකි.

3. එබැවින්, 1997 ජූනි 01 දින හා ඉන්පසුව උපත ලැබූ මේ වන විට වයස අවුරුදු 19 ද ඉක්මවා ඇති කිසිවකුගේ නම් වලංගු නාමලේඛනයේ ඇතුළත් නොවේ.'

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් වශයෙන් මම යෝජනාව ඉදිරිපත් කරන මෙම අවස්ථාවේදීම කියන්නම්, මෙම ඔක්තෝම්බර් මාසයේ මේ කියන විධියට පළාත් සභා මැතිවරණ හෝ වෙනත් මැතිවරණයක් පැවැත්වුවහොත් ඒ සඳහා ඡන්දය ලබා දීමට හැකි වන්නේ, 2015 ජූනි 01 වනදාට අවුරුදු 18 සම්පූර්ණ වෙලා තිබෙන අයට පමණයි. ඕනෑම අවුරුද්දක ඡන්ද හිමි නාමලේඛනයක් සංශෝධනය කරන්න මාස 06ක් යනවා. එම නිසා මෙහි මූලික කාරණය වන්නේ මෙයයි.

4. එබැවින්, 2016 නාමලේඛනය සහතික කිරීමට නියමිත දිනට පෙර ඡන්ද විමසීමක් කැඳවුවහොත් ඡන්දය භාවිතා කිරීමට හැකි වන්නේ, වයස අවුරුදු 19ක් හා මාස 06ක්වත් ඉක්ම වූ තරුණ-තරුණියන්ට පමණක් වනු ඇත. එමඟින් ඡන්ද බලය අහිමිවන වයස අවුරුදු 18ට වැඩි යෞවනයින්ගේ සංඛ්‍යාව හාරලක්ෂයක් (400,000)ඉක්මවයි.

5. 2016 ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීමට යෝජිතව ඇත්තේ, 2016 ඔක්තෝම්බර් 31 දින -දැන් මෙය සිදු වෙලා ඇති- හෝ එදිනට පසු බව මාධ්‍ය වාර්තා අනුව පෙනී යන හෙයින් 2016 ඔක්තෝම්බර් 31 දිනෙන් පසුව ඡන්ද විමසීමක් කැඳවුවහොත් 2016 ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය ආරම්භක දිනය වූ 2016 ජූනි 01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කළ තැනැත්තන්ගේ නම් පමණක් එනම්, 1998 මැයි 31 හෝ එදිනට පෙර උපත ලැබූ අයගේ නම් පමණක් එකී 2016 නාමලේඛනයට ඇතුළත් වන හෙයින් 1998 ජූනි 01 දින හා ඉන්පසු උපත ලැබූ, ඡන්ද විමසීම කැඳවන දිනය වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ වන තරුණ-තරුණියන්ට මහජන නියෝජිත ආයතන සඳහා තමන්ගේ කැමැත්ත අනුව නියෝජිතයන් පත් කර ගැනීමේ අයිතිය අහිමි වේ.'

එබැවින්, මගේ ඉල්ලීම මෙයයි.

(අ) මෙය එම තරුණ තරුණියන්ගේ ඡන්ද අයිතිය අහිමි කිරීමක් බව ඔබතුමාට කාරුණිකව පෙන්වා දීමට කැමැත්තෙමු.

(ආ) එම තරුණ තරුණියන්ගේ අයිතිය ලබාදීම සඳහා 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

(ඇ) එබැවින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සර්ව ජන ඡන්ද අයිතිය සැබෑ ලෙසම ක්‍රියාත්මක කිරීමට තරුණ තරුණියන්ට අවස්ථාව ලබා දෙන ලෙසද වැඩිදුරටත් ඉල්ලා සිටිමු.

මෙහි අර්ථය සැමටම එකඟ වෙන්න පුළුවන්, පැහැදිලි කාරණයක් කියා මම හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සරලව ගත්තාම මේ වසරේ ඔක්තෝබර් මාසයේ ඡන්දයක් පැවැත්වුවොත්, 2016 ඡන්ද හිමි නාම ලේඛනය අනුව තමයි එසේ ඡන්දය පවත්වන්නට වෙන්නේ. 2016 ඡන්ද හිමි නාම ලේඛනය අනුමත වෙන්න නියමිතව තිබෙන්නේ 2016 නොවැම්බර් මාසයේ 30වැනිදායින් පසුවයි. 2017 ඡන්ද හිමි නාම ලේඛනය ගන්න වෙලාවක් නැහැ. 2017 ඡන්ද හිමි නාම ලේඛනය අනුමත වෙන්න නියමිතව තිබෙන්නේ 2017 නොවැම්බර් මාසයේ 30වැනිදායි. එම නිසා සිද්ධ වෙන දේ තමයි, 2017 ඔක්තෝබර් මාසයේ හෝ නොවැම්බර් මාසයේ ඡන්දයක් පවත්වනවා නම්, එහිදී අවුරුදු 19යි මාස 6කට වැඩි අයට තමයි ඇත්තටම ඡන්දය පාවිච්චි කරන්න වෙන්නේ; ඡන්ද අයිතිය තිබෙන්නේ. සරලව ගත්තොත් ගරු ඇමතිතුමනි, අවුරුදු 18යි මාස 6යි, එක දවසක් ඉකුත් වූ අයට තමයි අපේ රටේ ඡන්දය පාවිච්චි කරන්න හැකි වෙන්නේ. අපේ රටේ ඡන්දය පාවිච්චි කළ හැකි අඩුම වයස එයයි. මේ සම්බන්ධයෙන් ලොකු විවාදයකට මා යන්නේ නැහැ. මගේ දැනීමේ හැටියට, මැතිවරණ කොමසාරිස්තුමා සහ ඒ ප්‍රධානීන් විවිධ අවස්ථාවලදී මේ කරුණ මතු කරලා තිබෙනවා. නමුත්, ඒ ආයතන මේ සම්බන්ධව යම් කිසි සූදානමක් තිබෙනවාද දන්නේ නැහැ. ඔවුන්ගේ ප්‍රායෝගික පැත්ත ගැන අපට වැඩි අවබෝධයක් නැහැ. ඒ සියල්ල සලකා බලා, ප්‍රධාන වශයෙන් ඉතා ඉක්මනින් මෙය සංශෝධනයක් වශයෙන් ඉදිරිපත් කර අනුමත කර, ඒ අයට හිමි අවස්ථාව ලබා දෙන්නය කියන ඉල්ලීම තමයි මට කරන්නට තිබෙන්නේ. මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

[අ.භා. 6.23]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිසි කලට හා නිසි වේලාවට ශ්‍රී ලාංකීය යෞවන යෞවනියන්ගේ ඡන්ද අයිතිය ලබාදීම සඳහා බිමල් රත්නායක මන්ත්‍රීතුමා ගෙනෙන ලද ඉතා විශිෂ්ට යෝජනාව කැමැත්තෙන්ම ස්ථිර කරන බව මා ප්‍රකාශ කර සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 6.24]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති, වයස අවුරුදු 18ට වැඩි පුරවැසියන්ට හිමි විය යුතු සර්ව ජන ඡන්ද බලය ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව බොහෝවිට වයස අවුරුදු 19 හෝ ඊට වැඩි වූ තරුණ තරුණියන්ට පමණක් හිමිවීමේ ගැටලුව විසඳීමට ක්‍රියා කරන ලෙස ඉල්ලා ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු බිමල් රත්නායක මහතා විසින් මෙම සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. මෙම යෝජනාව 2017 ජූනි මස 22වැනි දිනයි ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණේ. නමුත්, එම යෝජනාව අද තමයි විවාදයට ගන්නේ. එතුමා ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව කාලෝචිත හා ප්‍රායෝගික යෝජනාවක් කියා මේ සභාවේ සිටින අපි සියලුම දෙනාම පිළිගන්නවා. එවැනි ආකාරයේ සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම එතුමාට ස්තුති වන්ත වන අතර, දේශපාලන පක්ෂ භේදයකින් තොරව එම ප්‍රශ්නය විසඳිය යුතුයි කියා රජය පිළිගන්නවා.

ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදී ප්‍රවර්තන ඡන්ද හිමි නාම ලේඛනය අදාළ ඡන්ද විමසීම සඳහා වලංගු ඡන්ද හිමි නාම ලේඛනය ලෙස භාවිත වන අතර, ඡන්ද හිමි නාම ලේඛනය සකස් කර සහතික කිරීම සඳහා එම කාර්යය 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව ආරම්භ කරන දින සිට වර්ෂයක පමණ කාලයක් මෙයට පෙර ගතවූ අතර, දැන් එම කාල සීමාව මාස හය දක්වා අඩු කර තිබෙනවා. එනම්, අදාළ වර්ෂයේ නොවැම්බර් 30වැනි දින නාම ලේඛනය සහතික කළ හැකිව තිබෙනවා. ඒ සඳහා වර්ෂයේ ජූනි

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

මස පළමුවැනි දින සිට අවම වශයෙන් මාස හයක් ගත වෙනවා. එවැනි විටෙකදී එම වර්ෂයේ දෙසැම්බර් මාසයේ ඡන්ද විමසීමක් කැඳවීමේ දැන්වීමක් නිකුත් කළහොත් ඒ සඳහා වලංගු ඡන්ද හිමි නාම ලේඛනය භාවිත කරන හෙයින්, ඡන්ද බලය හිමිවන්නේ වලංගු ඡන්ද හිමි නාම ලේඛනයේ නම් සඳහන් කැනැත්තන්ට පමණක් හෙයින්, එසේ ඡන්ද බලය හිමි වන්නේ වයස අවුරුදු 18ක් හා මාස හයකට වැඩි කාලයක් ඉකුත් වූ අයට පමණයි.

දැන් 2017 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය ප්‍රතිශෝධනය ආරම්භ කර ඇති නමුත්, එකී නාමලේඛනය සහතික කළ හැක්කේ නොවැම්බර් 30වන දිනදී බවට අපේක්ෂා කෙරෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිවූ පරිදි එතෙක් වලංගු නාමලේඛනය වන්නේ 2016 ජුනි මස 01 දින ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කර 2016 දෙසැම්බර් 30වන දින සහතික කරන ලද නාමලේඛනය බැවින්, 2017 අගෝස්තු 01වන දින ඡන්ද විමසීමක් කැඳවීමේ නිවේදනයක් නිකුත් කළහොත්, ඡන්ද බලය හිමි වන්නේ 2016 ජුනි 01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කළ තැනැත්තන්ටයි. එනම්, 1998 මැයි 31 හෝ එයට පෙර උපත ලැබූ අයට පමණයි. ඒ කියන්නේ, වයස අවුරුදු 19ක් හා - ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා මාස 6ක් කියලා- මාස තුනකට වැඩි කාලයක් ඉක්ම වූ අයට පමණයි.

මෙම ගැටලුව පිළිබඳව දේශපාලන පක්ෂ ලේකම්වරුන් ඇතුළු දේශපාලන පක්ෂවල ප්‍රමුඛ ක්‍රියාකාරීන්ද දැනුවත් කිරීමට මැතිවරණ දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමිෂන් සභාව විසින් මීට පෙර අවස්ථා කිහිපයකදීම ක්‍රියා කරන ලද බව අපට දන්වා තිබෙනවා. ඡන්ද හිමි නාමලේඛනය සකස් කර සහතික කිරීමෙන් පසුව, සෑම මාස 4කට වරක්ම සුදුසුකම් ලත් තැනැත්තන්ගේ නම් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීමට අවස්ථාව ලැබෙන සේ, සෑම වර්ෂයකම ජුනි මස 01වැනි දිනට, ඔක්තෝබර් මස 01වැනි දිනට හා අනුගාමී වර්ෂයේ පෙබරවාරි මස 01වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කෙරෙනවා. එයට අමතරව, ඡන්ද විමසීමේ දිනයන් පිළිබඳ නියමයක් නිකුත් කරන දිනය වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයක් සකස් කිරීම මඟින් සහ එකී පරිපූරක නාමලේඛනය ඒ වන විට වලංගු නාමලේඛනයට ඒකාබද්ධ කිරීම නැතහොත් ඇතුළත් කිරීම මඟින් ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමේ දිනය වන විට වයස අවුරුදු 18 සම්පූර්ණ වන සුදුසුකම් ලත් සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ට ඡන්ද පොළට ගොස් ඡන්දය භාවිත කිරීමේ හැකියාව ලබා දිය හැක. මේ පිළිබඳව දේශපාලන පක්ෂ ලේකම්වරුන්, පක්ෂ නියෝජිතයන් සමඟ මැතිවරණ කොමිෂන් සභාව පැවැත්වූ සාකච්ඡාවලදී එකී දේශපාලන පක්ෂ නියෝජිතයන්ගේ පොදු එකඟතාව මේ සඳහා ලැබී ඇති බව අපට මැතිවරණ කොමිෂන් සභාව මඟින් දන්වා තිබෙනවා.

මෙම කරුණු සාක්ෂාත් කර ගැනීම පිණිස 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියා පදිංචි කිරීමේ පනත සංශෝධනය කළ යුතුව ඇති අතර, ඒ පිළිබඳ මූලික කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව පියවර ගනිමින් සිටින බවට අපව දැනුවත් කර තිබෙනවා. මේ සඳහා ඔවුන් සියලු දේශපාලන පක්ෂවල සහය කාරුණිකව අපේක්ෂා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ ලැබී තිබෙන පැහැදිලි කිරීම අනුව මැතිවරණ කොමිෂන් සභාව මේ ගැටලුවට පිළිතුරක් යෝජනා කර තිබෙනවා; ක්‍රමවේදයක් යෝජනා කර තිබෙනවා. මා හිතනවා, කවුරුත් ඒ ක්‍රමවේදය පිළිබඳව ගැටලුවක් තියා ගන්න අවශ්‍ය නැහැ කියලා. මේක දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා අපි ඔක්කෝම එකතු වෙලා මේ පනත සංශෝධනය කරන්න ලැහැස්ති නම් අපට මේ ප්‍රශ්නයට පිළිතුරක් තිබෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 6.31]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුලින්ම මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමාට ස්තුතිය පුද කරනවා. මොකද, මෙම කාරණය කාලයක් තිස්සේ සාකච්ඡා වුණත් දැඩි අවධානයකට යොමු නොවී පැත්තකට තල්ලු වුණු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබුණා.

ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණය පිළිබඳව අපේ ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමා දුන් පිළිතුර හොඳටම ප්‍රමාණවත්. නමුත් එතුමා මගේ අදහස බලාපොරොත්තු වුණු නිසා මම යමක් සඳහන් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වයස් පූර්ණත්වයට පත්වීමේ වයස -age of majority එක- කාලයක් තිස්සේම තිබුණේ අවුරුදු 21 ලෙසයි. අපි 1980 ගණන්වලදී දැනට ජාත්‍යන්තර මට්ටමෙන් පිළිගෙන තිබෙන ආකාරයට වයෝපූර්ණත්ව වයස අවුරුදු 18 වන විධියට අපේ නීතිය සංශෝධනය කළා. ඒ අනුව දැන් අවුරුදු 18දී ඡන්දය පාවිච්චි කරන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. වයෝපූර්ණත්ව පනත අනුව කෙනෙකුට වයස අවුරුදු 18 වූ දිනයේම ඔහු වැඩිහිටියෙකු ලෙස සලකනවා. ඒ අනුව ඔහුට ගිවිසුමකට ඇතුළත් වීමට, පූර්ණ ස්වාධීනත්වයෙන් බැංකු ගිණුමක් ආරම්භ කිරීමට සහ ඕනෑ නම් අවුරුදු 18 සම්පූර්ණ වූ දිනයේම විවාහයකට එළැඹීමට වුණත් පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම අපේ රටේ මැතිවරණ නීතිය අනුව ඡන්දය පාවිච්චි කිරීමේ අයිතියත් නීතියෙන්ම ලැබිලා තිබෙනවා. නමුත් මැතිවරණ පනත තුළ ක්‍රියාත්මක කරන්නට තිබෙන ක්‍රමවේදය නිසා ඒ තරුණයන්ට ලැබුණු අයිතිය ක්‍රියාත්මක වීම අහිමි වීම ගැන තමයි ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා පෙන්නුම් කරලා තිබෙන්නේ.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමාත් මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ නිලධාරීන්ගේ මැදිරියේ රැඳී සිටිනවා. එතුමා මේ පිළිබඳව පක්ෂ නායකවරුන් සමඟ අවස්ථා කිහිපයකම සාකච්ඡා කරලා තිබෙනවා. ඒ වාගේම අපිත් මේ පිළිබඳව වරින් වර සාකච්ඡා කරලා තිබෙනවා. මේ ක්‍රමවේදය පිළිබඳව ඇත්තටම අපට ගැටලුවක් තිබුණා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුරේ සඳහන් වුණු ආකාරයට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා ක්‍රමවේදයක් යෝජනා කරලා තිබෙනවා. අපි මේ ක්‍රමවේදයට අනුගත වීම සඳහා අවශ්‍ය නීතිය සංශෝධනය කරන්නට ප්‍රථම කැබිනට් අනුමැතිය ලබාගැනීම සඳහා කල් මැරීමකින් තොරව ඉතා ඉක්මනට කටයුතු කරන්නට බලාපොරොත්තු වෙනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.34ට, 2017 ජූලි 05 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 6.34 மணிக்கு பாராளுமன்றம், 2017 யூலை 05, புதன்கிழமை மு. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.34 p.m. until 1.00 p.m. on Wednesday, 05th July, 2017.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

253 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 253 - இல. 2
Volume 253 - No. 2

2017 ජූලි 05වන බදාදා
2017 யூலை 05, புதன்கிழமை
Wednesday, 05th July, 2017

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
උතුරු පළාතේ ගොඩබිමට මුහුදු ජලය ඇතුළුවීම වැළැක්වීම

දේශීය ආදායම් පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම

කල්තැබීමේ යෝජනාව:
උමා ඔය වැනි ව්‍යාපෘතීන් නිසා ඇති වී තිබෙන පාරිසරික අර්බුද තුළින් දේශපාලන වාසි ලබා ගැනීම

பிரதான உள்ளடக்கம்

பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
வட மாகாண நிலங்களில் உவர் நீர் உட்புகுவதைத் தடுத்தல்

உண்ணாட்டரசிறைச் சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

இலங்கை ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவகம் சட்டமூலம் :
முதன்முறை மதிப்பிடப்பட்டது

இலஞ்சம் மற்றும் ஊழல்கள் பற்றிய விசாரணை ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் படிகளில் திருத்தம் மேற்கொள்ளல்

ஒத்திவைப்புப் பிரேரணை :
உமாஓயா போன்ற கருத்திட்டங்களினால் ஏற்பட்டுள்ள சுற்றாடல் பிரச்சினைகளினூடாக அரசியல் இலாபமீட்டல்

PRINCIPAL CONTENTS

QUESTIONS POSED TO PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Prevention of Seawater Intrusion into Northern Province

INLAND REVENUE BILL:
Read the First time

CEYLON GERMAN TECHNICAL TRAINING INSTITUTE BILL:
Read the First time

REVISION OF SALARY AND ALLOWANCES OF THE DIRECTOR GENERAL OF THE COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

ADJOURNMENT MOTION:
Gaining Political Advantage through Environmental Hazards caused by Projects such as Uma Oya

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 ජූලි 05වන බදාදා
2017 யூலை 05, புதன்கிழமை
Wednesday, 05th July, 2017

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி .ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මුද්‍රල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 පළමු කාර්තුවේ මූල්‍ය කාර්ය සාධනය (සාරාංශය) පිළිබඳ වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා රජයේ මුද්‍රල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා මිනිස්බල හා රැකී රක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;

(ii) 2016 වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්; සහ

(iii) 2016 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 වර්ෂය සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රංජිත් සියඹලාපිටිය මහතා - පැමිණ නැත.
ගරු ඒ.ඒ. විජේතුංග මහතා - පැමිණ නැත.
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO PRIME MINISTER

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙසේයි.

(අ) (i) පසු ගිය රජය කාලයේ මෙන්ම නැවතත් රටේ විවිධ ප්‍රදේශවල සංවිධානාත්මකව අන්තවාදී හා ජාතිවාදී ක්‍රියාකාරකම් ආරම්භ වී ඇති අතර, එය මැඩපැවැත්වීම සඳහා රජය ගෙන ඇති ක්‍රියා මාර්ගය කුමක්ද?

(ii) ඔවුන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්නේද?

(iii) සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට සාමයෙන් හා සංහිඳියාවෙන් ජීවත් වීම සඳහා රජය රැගෙන තිබෙන පියවර කුමක්ද?

(ආ) (i) අන්තවාදී ක්‍රියාකාරකම් නිසා හානියට පත්ව ඇති බෞද්ධ හා ඉස්ලාම් ආගමික ස්ථාන සඳහා වන්දි ලබා දීමට කටයුතු කරන්නේද?

(ii) එම අන්තවාදී ක්‍රියාකාරකම් නිසා හානි වූ සහ පීඩාවට පත් වූ ජනතාවට වන්දි ලබා දීමටත් ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් ගෙන ඇති පියවර කුමක්ද?

(iii) එසේම 2014 වසරේදී අලුත්ගම ප්‍රදේශයේ සිදු වූ සිදු වීමෙන් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ගෙන ඇති පියවර කුමක්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාව තුළ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට සමගියෙන් ජීවත්වීම සඳහා ගත හැකි සියලු ක්‍රියා මාර්ග ගැනීමට අප රජය කටයුතු කර තිබෙනවා. පසු ගිය රජය සමයේ පැවැති සංවිධානාත්මක, අන්තවාදී හා ජාතිවාදී ක්‍රියාකාරකම් -ඒවා සිදු වුණේ අනුග්‍රහය ඇතුව; නැතුව නොවෙයි- නවතා දැමීමටත්, සංහිඳියාව ඇති කර සාමකාමී පරිසරයක් ගොඩ නැඟීමටත් අප රජය බලයට පත් වූ වහාම පියවර ගත්තා.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත් කෙටුම්පත සම්මත කර ගැනීම, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ප්‍රධානත්වයෙන් ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශය පිහිටුවීම, සංහිඳියා යන්ත්‍රණයන් සම්බන්ධීකරණය සඳහා වන ලේකම් කාර්යාලය පිහිටුවීම වැනි ක්‍රියාමාර්ග රැසක් ද අප රජය විසින් ගනු ලැබුවා. මෙම සියලු ක්‍රියාමාර්ගවල අරමුණ වූයේ සංහිඳියාව ඇති කර ආගමික සහජීවනය සපිරි සමාජයක් ඇති කිරීමයි.

පසු ගිය දිනවල ප්‍රදේශ කිහිපයකින් යම් යම් ගැටුම්කාරී සිද්ධීන් කීපයක් වාර්තා වී තිබුණා. සමහර ඒවා ඇත්ත වශයෙන්ම අන්තවාදී හා ජාතිවාදී ක්‍රියාකාරකම් හැටියට හඳුන්වන අතර, අනික් ඒවා ඒ ගණයට වැටෙන්නේ නැහැ.

මෙතැනදී ඒ ගැටුම්වලට කිසිම අනුග්‍රහයක් ලැබුණේ නැහැ. පසු ගිය වතාවේ සහ මේ වතාවේ වෙනස තිබුණේ ඒකයි. පසු ගිය වතාවේ අනුග්‍රහය ලැබිලා මේ ගැටුම් සංඛ්‍යාව වැඩි වුණා.

ජනතාවගෙන් ප්‍රතික්ෂේප වූ නමුත්, කෙසේ හෝ බලයට පැමිණීමට අපේක්ෂා කරන පටු දේශපාලන අරමුණු සහිත පුද්ගලයන් සෑම කුඩා සිදුවීමක්ම අන්තවාදී හා ජාතිවාදී ක්‍රියාකාරකම් ලෙස අර්ථ දැක්වීමට කටයුතු කරන බව අපට පෙනී ගොස් තිබෙනවා. ඔවුන්ගේ අරමුණ වෙන කිසිවක් නොව, ජාතිවාදය අවුස්සා හෝ බලය ලබා ගැනීමයි. අපි මේ පිළිබඳව ක්‍රියා කළා. මේ පිළිබඳව කිහිප දෙනෙකු පොලිසියෙන් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ වාගේම නඩු විභාග අවසන් කරන තෙක් තවත් කිහිප දෙනෙකුට උසාවියෙන් ඇප දීලා තිබෙනවා.

කනගාටුවෙන් වුවත් කියන්න සිදුවන්නේ සමහර ජනමාධ්‍ය ආයතන ද මෙම ජාතිවාදී හා ආගම්වාදී විෂබීජ පැතිරවීමේ පහත් ක්‍රියාවන්හි නිරත වන බව පැහැදිලිව පෙනෙන බවයි.

ජාතිවාදය ගැන සාමාන්‍ය පත්තරවල පළ වන පුවත් දැකලා සමහර දවස්වලට මම පුදුම වනවා. ස්වල්ප දෙනෙක් විතරක් මේවාට පක්ෂව කථා කරලා තිබෙනවා. නමුත් රටේ බහුතරයක් ඒවාට විරුද්ධයි. කෙසේ වුවත් ජාතිවාදය අවුස්සමින්, අන්තවාදී ක්‍රියාකාරකම්වල නිරතවන්නන්ට එරෙහිව දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කරන ලෙස පොලීසිය වෙත අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙනවා. ඒ අනුව හැම පොලිස් වසමකම දිවා - රාත්‍රී ජංගම සංචාර, පාමුර සංචාර, මාර්ග බාධක සංඛ්‍යාව වැඩි කිරීමටත්, විශේෂයෙන් පසු ගිය සිද්ධීන් ඇති වූ ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීමටත්, සෑම පොලිස් වසමකම ප්‍රජා පොලිස් කමිටු රැස්වීම් පවත්වා කමිටු සාමාජිකයන් මඟින් ප්‍රජාව දැනුවත් කිරීමටත්, ජාතීන් අතර අසමගිය ඇති කිරීමට කටයුතු කරන පිරිස් සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන ඔවුන්ට විරුද්ධව අප්‍රමාදව නීතිය ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කර තිබෙන බව පොලිස්පතිතුමා විසින් මා වෙත වාර්තා කර තිබෙනවා.

2014 වසරේ අලුත්ගම ප්‍රදේශයේ ඇති වුණු සිද්ධිය හේතුවෙන් හානි වූ හේන මුස්ලිම් පල්ලිය හා දර්ගා නගරයේ මස්ජිද් නූර් පල්ලිය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර තිබෙනවා. එසේම එම සිද්ධියේදී මිය ගිය පුද්ගලයින් දෙදෙනා වෙනුවෙන්ද, තුවාල සිදු වී රෝහල්ගත කළ පුද්ගලයින් හත් දෙනා සඳහාද වන්දි මුදල් ලබා දී තිබෙනවා. එසේම හානියට පත් වූ නිවාස හා කඩ සාප්පු යථා තත්ත්වයට පත් කර -තිබූ පරිදිම- ඔවුන් වෙත බාර දී තිබෙනවා. මෙම ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වූවන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කර තිබෙන අතර වැලිපැන්න මූනමලේවත්ත පාලම අසල හා දර්ගා නගරයේ වැලිපිටිය ප්‍රදේශවල විශේෂ කාර්ය බලකා ස්ථිර කඳවුරු ස්ථාපිත කර තිබෙනවා. මුස්ලිම් පල්ලිවලටත්, බෞද්ධ පන්සල්වලටත් හානියක් වුණා නම් ඒ අයට සහන ලබා දීමයි අපේ ප්‍රතිපත්තිය.

ගරු කථානායකතුමනි, ජාතිවාදය උලුප්පමින් දේශපාලන වාසි ලබා ගැනීමට කටයුතු කරන පුද්ගලයින් සියලු දෙනාගෙන් අපි ප්‍රවේශම් විය යුතුයි.

දේශපාලන වශයෙන් අනාථ වී සිටින මොවුන් ජාතිවාදය මත්තේ එල්ලී හෝ තමන්ගේ අරමුණු ඉටු කර ගැනීමට මාන බලමින් සිටිනවා. ඒ වාගේම ඒ අපරාධවල යෙදුණු අය ආරක්ෂා කරන්න කිසි කෙනෙක් ඉදිරිපත් නොවිය යුතුයි. ඒක නීතියේ වැඩ කටයුතුවලට හරස් වීමක්. ඒ නිසා අප සියලු දෙනා එක්වී එම පහත් ක්‍රියා පරාජය කළ යුතු බව මා කියන්න කැමැතියි. සාමය හා සහජීවනය අගයන වැඩි පිරිසක් ජීවත් වන මේ ශ්‍රී ලංකාවේ ජාතිවාදයට හා ආගම්වාදයට ඉඩක් නැහැ. ඒ වාගේ අසත්පුරුෂ වැඩ කරන අයට හිමි ස්ථානය කුණු බක්කිය බව ඉතිහාසය දෙස බලන විට අපට ඕනෑ තරම් දක්නට තිබෙන බව මා අවසන් වශයෙන් අවධාරණය කර සිටිනවා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගෙන් මා පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. යුද්ධය ජයග්‍රහණය කිරීමෙන් පස්සේ මේ රටේ ජනතාව සමඟියෙන්, සාමයෙන් ජීවත් වෙන්න පුළුවන් සංවර්ධිත ශ්‍රී ලංකාවක් බලාපොරොත්තු වුණා. නමුත් අපි දන්නවා, අලුත්ගම ප්‍රදේශයේ ඇති වුණු සිද්ධිය ප්‍රසිද්ධියේ සහ අප්‍රසිද්ධියේ රාජ්‍ය ත්‍රස්තවාදයේ උසි ගැන්වීමත්, අනුග්‍රහයත් මත සිදු වුණු බව. දැන් දින දහසක් ගත වෙලා තිබෙනවා. ඒ අයට ලැබුණු වන්දි මුදල සම්බන්ධව, ව්‍යාපාරික ස්ථානවලට සිදු වුණු හානිවලට ලැබුණු වන්දි මුදල පිළිබඳව ඒ අය සෑහීමකට පත් වන්නේ නැහැ.

විශේෂයෙන්ම එම සිද්ධියෙන් පසුව එක් ව්‍යාපාරික ස්ථානයකට විදුලි කාන්දුවක් නිසා සිදු වූ අනතුරක් යයි හඳුන්වනු ලබන අනතුරකට දෙවතාවක් මුහුණ දෙන්න සිදු වුණා. ඒ වාගේම පසු ගිය අප්‍රේල් මාසයේ ඉඳලා මේ දක්වා සිදුවීම් 27ක් වෙලා තිබෙනවා, ආගමික සිද්ධස්ථාන සහ ව්‍යාපාරික ස්ථානවලට අදාළව. එතකොට ඒවාටත් -අලුත්ගම ප්‍රදේශයේ වන්දි ලබා දීමට ඉතුරු වෙලා තිබෙන ඒවාට වාගේම- වන්දි මුදලක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනවාද කියලා මා අහන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඇත්ත වශයෙන්ම ඔය සිදුවීම් 27 තුළම අන්තවාදී හා ජාතිවාදී කියලා තිබුණේ නැහැ. නමුත් අන්තවාදයට හා ජාතිවාදයට යට වුණු එම ප්‍රදේශවල හානියක් වෙලා තිබෙනවා නම් අපි ඒ හානිය පිළිබඳව බලා වන්දි ලබා දෙන්නම්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමනි, මේ බොහෝ සිදුවීම් සිදු වුණු ස්ථාන සම්බන්ධව, එම සිද්ධි සිදු වුණු වහාම පොලීසිය කිව්වේ, එක්කෝ insurance එක ගන්න කරපු දෙයක්, එහෙම නැත්නම් පිටින් ඇවිල්ලා ගහලා, එහෙම නැත්නම් එම පුද්ගලයාම ගිනි තියලා, එහෙමත් නැත්නම් විදුලි කාන්දුවක් වෙලා කියලායි. මේ සිදු වෙලා තිබෙන සිද්ධි 27න් එක සිද්ධියකට අදාළව තමයි පුද්ගලයෙකුව අල්ලා ගත්තේ. ඉතුරු සිදුවීම් සම්බන්ධව පරීක්ෂණ කඩිනම් කරලා යම් කිසි කාල වකවානුවක් තුළ ඔවුන් අත් අඩංගුවට ගන්නත්, අන්තවාදී හැඟීම් පතුරුවන අයට -මොන ජාතියක වුණත්, බෞද්ධ හෝ මුස්ලිම් හෝ මොන ආගමක වුණත්- දඬුවම් ලබා දෙන්නත්, සමාජ මාධ්‍ය ජාල හරහා විවිධ fake profiles හදාගෙන අන්තවාදය වපුරන දේවල් පාලනය කරන්නත්, එම කණ්ඩායම්වලට දඬුවම් ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවාද කියලා මම අහන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

දැනට එක්කෙනෙක් නොවෙයි, ඊට වඩා අත් අඩංගුවට අරගෙන තිබෙනවා. සමහර අය සිද්ධි තුන-හතරකට වග කිව යුතුයි. සමහර තැන්වල ඇත්තවශයෙන්ම ගිනි ගැනීමක් තමයි සිදු වෙලා තිබෙන්නේ. ඒ හැම එකක් ගැනම පොලීසියෙන් විභාග කර බැලුවා. මොකද, අපි ඒ හැම එකක් ගැනම ඇසුවා. ඒවා ගැන වාර්තා තිබෙනවා. මම ඉස්සෙල්ලා කියපු විධියට මේවාට සම්බන්ධ අයට විරුද්ධව අපි නීතිය අනුව ක්‍රියා කරන්නයි ඉන්නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාගේ අවසර ඇතිව මම තුන්වෙනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු අගමැතිතුමනි, පසු ගිය දා ඉරිදා පුවත් පතක පළ වෙලා තිබුණා ලංකාවේ ඇමෙරිකානු තානාපති කාර්යාලයට ISIS සංවිධානයක් පහර දෙන්න සූදානමින් ඉන්නවා කියලා. ඇමෙරිකානු තානාපති කාර්යාලය ඒ ප්‍රවෘත්තිය ප්‍රතික්ෂේප කළා, එහෙම එකක් නැහැ කියලා. ඇත්තටම මේ ප්‍රවෘත්තිය plant කරපු ප්‍රවෘත්තියක් ලෙස තමයි හැඳින්වෙන්නේ. ඒ පිළිබඳව පරීක්ෂණයක් පවත්වන්න කියලා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධ ප්‍රවෘත්තියක් තිබුණා. ඇමෙරිකානු තානාපති කාර්යාලය කියනවා ඒ අයට එහෙම ප්‍රවෘත්තියක් ලැබිලා නැහැ කියලා. අපි දන්නේ නැහැ, මේ පුවත් පතට විශේෂ තොරතුරු තිබෙනවාද කියලා. එම නිසා අපි පොලීසියෙන් ඉල්ලා තිබෙනවා ඒ අයගෙන් ඒ විශේෂ තොරතුරු ලබාගෙන, එහෙම අනතුරක් තිබෙනවා නම් අදාළ පියවර ගන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මෙම ප්‍රශ්නය අහනවා.

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

2017.01.20 දිනැතිව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා ලෙස කටයුතු කරනු ලබන ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් අ.ම.ප. අංක 09/1819/329/011 අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් මුදල් අමාත්‍යතුමාගේ, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ සහ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගේ නිර්ක්ෂණද සමඟින් ඔබ රජය ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාව දී තිබෙන බිබිල සීනි කර්මාන්ත ව්‍යාපෘතිය සම්බන්ධ පහත සඳහන් කරුණු පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

ආරම්භ කිරීමට නියමිත මෙම බිබිල සීනි කර්මාන්ත ආයතනයට යෝජනා වී තිබෙන ප්‍රදේශය මාදුරු ඔය, රඹකැන් ඔය, නිල්ගල, ගල ඔය, ඇකිරියන්කුඹුර ආදී ප්‍රදේශ අයිති, පාරිසරික සංවේදී කලාපයක පිහිටා ඇති බව ගරු අගමැතිතුමාගේ අවධානයට යොමු කරමි. මෙම කලාපය ආවේණික පාරිසරික පද්ධති ගණනාවක් තිබෙන වාරි, වැව්, අමුණු, ගංගා, ඇළ දොළ ජල මූලාශ්‍ර සහිත ශ්‍රී ලංකාවේ වටිනාකම වාරි ශිෂ්ටාචාරයකට නෑකම් කියන ප්‍රදේශයක් වෙයි. උක් කර්මාන්තය සඳහා යෝජනා කරන ප්‍රදේශවල වී ගොවිතැන ඇතුළු කුරක්කන්, දෙහි, දොඩම්, රබර්, බඩ ඉරිහු, තල, මෙනේරි අහස් දියෙන් වගා කරනු ලබන අතර, විශාල ගොවි ජනතාවක් සිටින ප්‍රදේශයකි. එමෙන්ම මෙම උක් කර්මාන්තය ආරම්භ කිරීමට යෝජනා කරන ප්‍රදේශය විශාල අලි ගහනයක් සිටින ප්‍රදේශයක් වන අතර, පුරා අතීතයේ පටන් සුවිශේෂී අලිමංකඩක් වන නිල්ගල හා මාතර යා කෙරෙන ඇකිරියන්කුඹුරද එයට අයත් වේ. දැනට ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම උග්‍ර වීමට එක් හේතුවක් ලෙස මේ කර්මාන්තය සඳහන් කළ හැකිය. උක් කර්මාන්තය ආරම්භ කළ සෙවණගල, පැල්වත්ත, හිඟුරාන, කන්තලේ වැනි ප්‍රදේශවල ජනතාවට අදටත් මේ ප්‍රශ්නයට ස්ථිර පිළිතුරක් නොමැති බව මා ඔබතුමාගේ අවධානයට යොමු කරමි.

මෙම ප්‍රදේශය දුර්ලභ ගණයේ කටු උණ, අරළු, බුළු, නෙල්ලි, රසකිඳ, ගම්මාලු ආදී ඖෂධ වර්ගද, ජල මූලාශ්‍ර පිරිසිදු කරන රක්ෂිතයද ඇති බැවින් මෙම උක් කර්මාන්තය ආරම්භ කළහොත් ඒවා සම්පූර්ණයෙන් විනාශ වන බව දැනටමත් අපේ රටේ පරිසරවේදීන් ගණනාවක් ප්‍රකාශ කර ඇති බවට සඳහන් කරමි. එබැවින් මෙම ව්‍යාපෘතිය සම්බන්ධව පුළුල් පරිසර විද්‍යාත්මක අධ්‍යයනයක් සැබෑ ලෙසටම සිදුවී තිබෙනවාද යන්න බරපතළ ගැටලුවක් බව මම ඔබතුමාට අවධාරණය කරමි. එබැවින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරක් මෙම පාර්ලිමේන්තුවට ලබා දෙන මෙන් ඔබතුමාගෙන් ඉල්ලමි.

(i) දැනට ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය සඳහා වෙන් කර තිබෙන ඉඩම් ප්‍රමාණය (සෙවණගල, පැල්වත්ත, හිඟුරාන, කන්තලේ ඇතුළු) මුළුමනින්ම කොපමණද?

(ii) දැනට මෙම සීනි කර්මාන්තශාලාවල වාර්ෂික නිෂ්පාදනය කොපමණද?

විශේෂයෙන්ම මෙය -සෙවණගල සහ පැල්වත්ත- රාජ්‍ය සමාගමක් බවට පත් වූවාට පසුව වාර්ෂික නිෂ්පාදනය කොපමණද කියන්න පුළුවන් නම් ඉතා වැදගත් යැයි මා සලකනවා.

(iii) එම සීනි කර්මාන්තශාලා වෙනුවෙන් වෙන් කර දී තිබෙන ඉඩම් ප්‍රමාණය පිළිබඳව වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

(iv) එම සීනි කර්මාන්තශාලා දියුණු කිරීම වෙනුවෙන් ඔබ රජය විසින් ගෙන ඇති පියවර පිළිබඳව පුළුල් වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද?

(v) ශ්‍රී ලංකාවේ උක් කර්මාන්තය වෙනුවෙන් උක් පර්යේෂණ ආයතනය විසින් -විශේෂයෙන් සෙවණගල පිහිටි- කරන ලද පර්යේෂණ පිළිබඳවත්, එම පර්යේෂණවලට අනුව හඳුනාගෙන ඇති, දියුණු කළ උක් ප්‍රභේද හරහා පසු ගිය වසර කිහිපය තුළ උක් කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් ඔබ රජය ගත් පියවර පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කළ හැකිද?

(vi) මෙම කර්මාන්තය ආරම්භ කරන ප්‍රදේශයේ -බිබිල සීනි කර්මාන්ත ආයතනය ආරම්භ කරන ප්‍රදේශයේ- උක් වගා කිරීමට යෝජනා කරන ප්‍රදේශය පිළිබඳව පුළුල් පාරිසරික ඇගයීමක් කර තිබෙන්නේද යන්න පිළිබඳව මේ පාර්ලිමේන්තුවට තොරතුරු ඉදිරිපත් කළ හැකිද?

(vii) මෙම ප්‍රදේශය සම්බන්ධව පුරාවිද්‍යාත්මක සමීක්ෂණයක් - archaeological assessment- කර තිබේද යන්නත්, ඊට අදාළ තොරතුරු පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්නේද?

(viii) මෙම කර්මාන්ත ව්‍යාපෘතිය පිළිබඳ පුළුල් වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි ද?

යන්න පිළිබඳවත් ගරු අගමැතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න අහනවා නොවෙයි. කථාවක් නේ කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා අවසන්ද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අවසන්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා. දීර්ඝ ප්‍රශ්නයක් එතුමා ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මහා වංශය කියවලා එන්න වෙයි මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි. දැනට සෙවනගල සීනි කර්මාන්තශාලාව සතුව වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් හයදහස් අසූතුනක්, පැල්වත්ත සීනි කර්මාන්තශාලාව සතුව වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් නවදහස් එකසිය තිස්පහක්, හිඟුරාන සීනි කර්මාන්තශාලාව සතුව වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් හත්දහස් හාරසිය හැටහයක් සහ කන්තලේ සීනි කර්මාන්තශාලාව සතුව වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් පන්දහස් අටසිය අසූහතරක් පවතිනවා. එකතුවක් වශයෙන් සැලකුවොත් මේ කර්මාන්තශාලා 04 සතුව සීනි කර්මාන්තය සඳහා යොදා ගත හැකි ඉඩම් හෙක්ටයාර් විසිඅටදහස් පන්සිය හැටඅටක් තිබෙනවා. සෙවනගල කර්මාන්තශාලාවෙන් වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් දාහත්දහස් දෙසීය තිස්හතරක් සහ

පැල්වත්ත කර්මාන්තශාලාවෙන් වාර්ෂිකව සීනි මෙට්‍රික් ටොන් තිස්හතරදහස් එකසිය අසූඅටක් නිෂ්පාදනය කරනු ලබනවා.

2008 වසරේ දී එළඹී ගිවිසුමක් මගින් සී/ස හිඟුරාන සීනි කර්මාන්තශාලාව ඇතුළු හෙක්ටයාර් දෙසීය හැත්තෑ හතක ඉඩම් ප්‍රමාණය ගල්ඔය වැව්ලි සමාගම වෙත ලබා දී තිබෙනවා. හිඟුරාන සීනි කර්මාන්තායතනය යටතේ පවතින වගා කළ හැකි ඉඩම් හෙක්ටයාර් හාරදහස් හාරසිය අනුවක උක් වගා කටයුතු සිදු වන අතර, ගිවිසුමට අනුව උක් වගාකරුවන් විසින් උක් අස්වැන්න ගල්ඔය වැව්ලි සමාගමට සපයනු ලබනවා. මේ වන විට හිඟුරාන සීනි කර්මාන්තායතනයේ වත්කම්/වගකීම් නිරවුල් කර ආයතනය ඈවර කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබෙනවා. සීනි කර්මාන්තය දියුණු කිරීම වෙනුවෙන් අප රජය විසින් පියවර රාශියක් ගෙන තිබෙනවා.

ඒ අතුරින් කිහිපයක් මා මේ සභාවට ඉදිරිපත් කරන්න කැමැතියි.

1. 2017 අය වැය යෝජනා අනුව උක් මිලදී ගැනීම සඳහා ටොන් එකක ගැණුම් මිල රුපියල් 5,000ක් ලෙස ප්‍රකාශයට පත් කළා.
2. දේශීය සීනි වෙළඳ පොළ පවත්වාගෙන යාම සඳහා ආනයනික රතු සීනි සහ සුදු සීනි කිලෝ එකක් සඳහා පිළිවෙළින් රුපියල් 25 සහ රුපියල් 23 ලෙස විශේෂ භාණ්ඩ බදු වැඩි කරනු ලැබුවා.

ගරු කථානායකතුමනි, මොණරාගල, බදුල්ල, අම්පාර, මඩකළපුව, ත්‍රිකුණාමලය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල නව සීනි කර්මාන්ත ව්‍යාපෘති ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙනවා. ඒ අතුරින් පහත ව්‍යාපෘති සඳහා පුළුල් පාරිසරික ඇගයීම් වාර්තාවන් සකස් කර තිබෙනවා.

මොණරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ ඇතිමලේ වැව්ලි සමාගම විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත සීනි කර්මාන්ත ව්‍යාපෘතිය.

බිබිල, මහියංගණය, රිදීමාලියැද්ද, මැදගම, මඩුල්ල හා මහඔය යන ප්‍රදේශ ආවරණය වන සේ ක්‍රියාත්මක කිරීමට යෝජිත බිබිලේ සීනි ව්‍යාපෘතිය.

එසේම කන්තලේ සීනි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ පාරිසරික ඇගයීමක් ද සිදු කෙරෙමින් පවතිනවා.

ඌව වෙල්ලස්ස සීනි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද පුරා විද්‍යා හානි ඇගයුම් සමීක්ෂණයන්ට අනුව අදාළ ප්‍රදේශය තුළ පුරා විද්‍යාත්මක තොරතුරු පවතින බව වාර්තා කර තිබෙනවා. එම පුරා විද්‍යා හානි ඇගයුම් සමීක්ෂණයෙන් අනතුරුව බිබිල සීනි කර්මාන්තශාලාව සඳහා කොන්දේසි සහිතව අනුමැතිය ලබා දී තිබෙනවා.

මෙම සීනි කර්මාන්ත ව්‍යාපෘතිය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරියේ දී පාර්ලිමේන්තුවට සභාගත කිරීමට කටයුතු කරනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු අගමැතිතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම මට ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්නට තිබෙනවා. මා අසන ලද ප්‍රශ්නයෙන්ම තමයි මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මතු වන්නේ.

ගරු අගමැතිතුමනි, දැනට භාවිත වන ඉඩම් ප්‍රමාණය තමයි ඔබතුමා වාර්තාවේ ඉදිරිපත් කළේ. හැබැයි, සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලා බිහි වුණේ 1986දී. කන්තලේ සීනි කර්මාන්තශාලාව බිහි වුණේ, 1957දී. හිඟුරාන සීනි කර්මාන්තශාලාව බිහි වුණේ, 1991. මම අහන අතුරු ප්‍රශ්නය තමයි, ඒ කාලයේ ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවට අනුව සෙවනගලටත්, පැල්වත්තටත්, කන්තලේටත්, හිඟුරානටත් සමස්ත ලෙස වෙන් කර තිබෙන ඉඩම් ප්‍රමාණය හඳුනාගත හැකිද? එම ඉඩම්වල සංඛ්‍යාත්මක අගයක් තිබෙනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මට දැන් ඒ ගැන කියන්න බැහැ. මම වාර්තාවක් ලබා ගන්නම්. එදා ඉඩම් වෙන් කළා වාගේම, පත් වූ විවිධ ආණ්ඩු විසින් වෙන වෙන හේතූන්වලට ඉඩම් දීලා තිබෙනවා. ඒවා ලේඛනගත වෙලා තිබෙනවා නම්, අපි ඔබතුමාට දැනුම් දෙන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමාගේ විශේෂ අවධානයට මේ කාරණය මා යොමු කරවනවා.

ඒ කාලයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් උඩවලවේ ජලාශයේ වතුර තමයි සෙවනගල කර්මාන්තශාලාව බිහි කිරීමට පාදක කරගෙන තිබෙන්නේ. කළු ගහ හරස් කරලා වේල්ලක් බැඳලා, කළු ගඟේ වතුර තමයි කන්තලේ කර්මාන්තශාලාවට යෝජනා වෙන්නේ. ඒ වාගේම සේනානායක සමුද්‍රය මුල් කරගෙන තමයි ගල්ඔය ව්‍යාපාරය සහ හිඟුරාන කර්මාන්තශාලාව යෝජනා වෙන්නේ. මම ඔබතුමාගෙන් අහන ප්‍රශ්නය තමයි, ඔබතුමන්ලා නව සීනි කර්මාන්තශාලා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට එකඟ වෙලා තිබෙනවා. ගල්ඔය ආරක්ෂිත භූමියේ තමයි එම සීනි කර්මාන්තශාලාව බිහි වෙන්නේ. ගල්ඔය ව්‍යාපාරයේ පෝෂක ප්‍රදේශයේ; ඒ වාගේම මාදුරු ඔය පෝෂක ප්‍රදේශයේ; ඒ වාගේම මහවැලි ගඟේ අතු ශාඛාවන්වල පෝෂක ප්‍රදේශයේ.

ප්‍රතිපත්තිමය වශයෙන් අක්කර 62,500ක උක් වගා කරන ව්‍යාපෘතියක් බිහි වුණොත් සේනානායක සමුද්‍රයත්, ඒ වාගේම මහවැලි ගඟේ අතු ශාඛාවලට විහිදී යන අරිය ජල වහන රටාව ඇතුළේ තිබෙන වාරි පද්ධතියත් අර්බුදයකට ලක්වන බව බොහෝ පරිසරවේදීහු ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධව ඔබතුමන්ගේ රජය හඳුනාගෙන තිබෙනවාද, මේ පිළිබඳව පුළුල් අධ්‍යයනයක් කර තිබෙනවාද, අධ්‍යයනයක් කර තිබෙනවා නම් එය මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ව්‍යාපෘතිය ආරම්භ කරද්දී එවැනි අනතුරක් තිබුණේ නැහැ. ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්න මා සටහන් කර ගෙනයි තිබෙන්නේ. ඒ පිළිබඳව වාර්තාවක් මේ සභාවට ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අසනු ලබන ප්‍රශ්නය මෙසේයි.

1. ප්‍රධාන රාජ්‍ය බැංකු තුන අතුරෙන් ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව යමින් විශ්‍රාමික වයස අවුරුදු 55 ලෙසත්, ඉන් පසුව අවුරුදු 60 දක්වා සේවය කිරීමට අදහස් කරන සේවකයින්ගෙන් විශේෂ අයදුම් කිරීමකින් තොරව නිර්බාධිතව සේවය කිරීමට අවස්ථාව දී තිබුණද, මහජන බැංකුව තුළ පමණක් ඊට පටහැනිව අවුරුදු 60 දක්වා සේවය කිරීමට අපේක්ෂා කරන සේවකයින්ගෙන් වසරක් පාසා සේවා දිගු අයදුම් කිරීමට සිදුව තිබේ. එසේ කිරීමේදී පවා මාස තුන, හය වැනි කෙටි කාල සීමා සඳහා සේවා දිගු ලබා දී අධෛර්යවත් කර එම සේවකයින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන්නේ ඇයි?
2. මහජන බැංකුව තම සේවකයින්ගෙන් සේවා දිගු ලබාදීමේදී විනය විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ සමස්ත ලංකා බැංකු සේවක සංගමයේ සභාපතිවරයාටත්, මහජන බැංකු නිලධාරීන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයාටත්, මහජන බැංකු විශ්‍රාමික භාර අරමුදලේ භාරකරු නිලධාරියාටත් සේවා දිගු ලබා නොදී ඔවුන් බැංකු සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇද්ද?
3. මහජන බැංකුවේ සේවා දිගු කිරීමේ ප්‍රතිපත්තිය වරප්‍රසාද දීමේ, පළිගැනීමේ හා සේවකයින් හිය වැද්දීමේ මෙවලමක් ලෙස උපයෝගී වෙමින් ඇති බව පිළිගන්නේද?
4. මෙම තත්ත්වය නතර කිරීම සඳහා ආණ්ඩුව විසින් ගනු ලබන පියවර කවරේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මහජන බැංකුව තුළ ක්‍රියාත්මක වන්නේ බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවා දිගු ප්‍රතිපත්තියක්. අපේ රජයේ ප්‍රතිපත්තියක් නොවෙයි ඒ අයට භාර දීලා තිබෙන්නේ. මහා භාණ්ඩාගාර චක්‍රලේඛයක් මඟින් මහජන බැංකුව රාජ්‍ය පරිපාලන හා භාණ්ඩාගාර චක්‍රලේඛවලින් නිදහස් කර තිබෙනවා. රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ 1/2013 මඟින්ද මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු පැහැදිලි කර තිබෙනවා.

මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබෙන සේවා දිගු ප්‍රතිපත්තිය අනුව සේවකයකුගේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 වෙනවා. එම බැංකුවේ සේවා අවශ්‍යතා, සේවකයාගේ ඵලදායීතාව, කාර්යක්ෂමතාව සහ යහපත් කාර්ය සාධනය පිළිබඳව කළමනාකාරිත්වය සෑහීමට පත් වීම වැනි අත්‍යවශ්‍ය සාධක පදනම් කරගෙන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ අභිමතය පරිදි වයස අවුරුදු 55 සිට 60 දක්වා උපරිම වශයෙන් වසරක කාලය බැගින් සේවා දීර්ඝ කිරීම් ලබාදීමට කටයුතු කරනවා.

සේවා දීර්ඝ කිරීම් ලබාදීමේ අරමුණ වන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ වුවද තවදුරටත් කාර්යක්ෂමව හා ඵලදායීව සේවය කළ හැකි දක්ෂ නිලධාරීන්ගේ සේවය තවදුරටත් බැංකුවට ලබාගැනීමයි. මෙහිදී සේවකයන් අධෛර්ය කර ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කිරීමක් සිදු වන්නේ නැහැ.

සමස්ත ලංකා බැංකු සේවක සංගමයේ සභාපති කේ. සුබසිංහ මහතා සඳහා 2017.05.05 දින සිට 2018.05.04 දින දක්වා සිදුවන සේවා දිගුවත්, මහජන බැංකුවේ නිලධාරීන්ගේ සංගමයේ හිටපු සභාපති ආර්.ඩී. ලීලාරත්න මහතා සඳහා 2016.12.08 දින සිට 2017.12.07 දින දක්වා දෙවන සේවා දිගුවත් ලබාදී තිබෙනවා. මෙම නිලධාරීන් බැංකු සේවයෙන් ඉවත් කර නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු අගමැතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ බැංකු සේවකයන්ට අදාළව නොවෙයි. බැංකුව සමඟ කටයුතු කරන ජනතාවට සම්බන්ධ ප්‍රශ්නයක් මම අහන්නේ. බැංකු ණය ලබාගෙන කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, කෘෂි කර්මාන්ත, ඒ වාගේම වෙනත් වෙළෙඳ ව්‍යාපාර කරපු ජනතාව පසු ගිය ගංවතුර ආපදාව නිසා හානියට පත් දිස්ත්‍රික්කවල ඉන්නවා. එම ආපදාවට ලක්වූ ජනතාව ලබාගත් බැංකු ණය සම්බන්ධයෙන් යම් කිසි සහනදායී ක්‍රමයක් අනුගමනය කරන්නට ආණ්ඩුව කටයුතු කරනවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඔව්, ඒ අයට යම් කිසි කාල සීමාවක් දෙන්න කියලා අපි කියලා තිබෙනවා. මම රට යන්න ඉස්සෙල්ලා, සෙනසුරාදාම ඒ තීරණය ගත්තා. අවශ්‍ය නම් සම්පූර්ණ තීරණය ඔබතුමාට දැනුම් දෙන්න පුළුවන්. එය බැංකුවටත් දැනුම් දී තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, ඊළඟ අතුරු ප්‍රශ්නය ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු අගමැතිතුමනි, මහජන බැංකුවටම අදාළවයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ. ඔබතුමා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙනුත් කටයුතු කරන නිසා මේ පිළිබඳව අවබෝධයක් ඇති කියා විශ්වාස කරමිනුයි මම මේ ප්‍රශ්නය අහන්නේ. ගරු අගමැතිතුමනි, රජයට අයත් ප්‍රධාන බැංකුවල සිටින සේවක සේවිකාවන් විශ්‍රාම ගියාම ඔවුන්ගේ විශ්‍රාම වැටුපට ජීවන වියදම් දීමනාව එකතු කරන බව ඔබතුමා දන්නවා. නමුත්, මහජන බැංකුවෙන් විශ්‍රාම යන සේවක සේවිකාවන්ට ඔවුන්ගේ ජීවන වියදම් දීමනාව අදාළ පරිදි එකතු වෙන්නේ නැහැ. අවුරුදු ගණනාවක් තිස්සේ මේ ගැටලුව සාකච්ඡා වෙමින්, කල් යමින් තිබෙනවා. මෙම තත්වයට සේවක සේවිකාවන් විශාල පිරිසක් මුහුණ දී සිටිනවා.

ගරු කථානායකතුමනි උදාහරණයක් විධියට, 1990 වර්ෂයේදී පමණ විශ්‍රාම ගිය කෙනෙකුට අද තිබෙන ජීවන තත්ත්වයත් එක්ක ඔවුන්ගේ වැටුපෙන් ජීවත් වෙන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එම නිසා මම අගමැතිතුමාගෙන් මේ සම්බන්ධයෙන් පිළිතුරක් වාගේම, මේ ගැන සොයා බලා මේ ගැටලුව නිරාකරණය කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ ගැන සොයා බලා ක්‍රියා කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු බිමල් රත්නායක මැතිතුමනි, ඔබතුමාගේ අවසාන ප්‍රශ්නය අසන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගෙන් අසන ප්‍රධාන ප්‍රශ්නය මෙයයි.

මීතොටමුල්ල කසළ කන්ද නාය යාම සහ ජීවිත විශාල වශයෙන් විනාශවීමත් සමඟ කසළ කළමනාකරණය පිළිබඳ විශාල සාකච්ඡාවක් ඇති විය. ඒ අවස්ථාවේදී ආණ්ඩුව විසින් කසළ කළමනාකරණය සඳහා කඩිනම් හා දිගු කාලීන විසඳුම් ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

එසේ වුවත්, මේ වන තෙක් එවන් වැඩ පිළිවෙළක් දක්නට නොලැබෙන අතර කොළඹ දෙහිවල ගල්කිස්ස ඇතුළු රටේ බොහෝ පළාත්වල නාගරික අපද්‍රව්‍ය බැහැර කිරීම අදාළ ආයතන මඟින් නිසියාකාරව නොකෙරේ.

එබැවින්,

1. නාගරික ප්‍රදේශවල කසළ බැහැර කිරීම අඩපණ වී ඇති බැවින් ඒවා කාර්යක්ෂම කිරීමට එතුමා ගන්නා පියවර මොනවාද?
2. කොළඹ, දෙහිවල, ගල්කිස්ස, කෝට්ටේ, මොරටුව, මහරගම, කැස්බෑව, කොලොන්නාව, නුවර, යාපනය, කුරුණෑගල, ගාල්ල, ගම්පහ, පානදුර යන නගරවල කැළි කසළ කළමනාකරණය සඳහා ගෙන ඇති,කෙටි කාලීන ක්‍රියා මාර්ග දිගු කාලීන ක්‍රියා මාර්ග වෙන් වෙන්ව එතුමා ඉදිරිපත් කරන්නේද?
3. මහා පරිමාණ කසළ කළමනාකරණ ව්‍යාපෘති සඳහා දැනට රජය එළැඹ ඇති ගිවිසුම් කවරේද?
4. ගිවිසුම්වලට වෙන් කර ඇති මුදල කොපමණද?
5. ඒවා ආරම්භ කරන සහ අවසන් කරන වර්ෂ මොනවාද?
6. නොඑසේනම්, ඒ මන්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
කසළ නිසියාකාරව කළමනාකරණය කිරීමේ වගකීමෙන් කිසි විටෙක අප රජය බැහැර වන්නේ නැහැ. නාගරික ප්‍රදේශවල කසළ බැහැර කිරීම සඳහා නිසි ස්ථානයක් නොමැති වීම නිසා මේ වන විට කොළඹ ඇතුළු ප්‍රදේශ කිහිපයකට ගැටලු මතු වී තිබෙනවා.

ඊට ස්ථිර විසඳුමක් සොයා ගැනීම සඳහා අපි මේ වන විට සැලසුම් සකස් කරමින් සිටිනවා.

එසේම, කෙටි කාලීනව එම ගැටලුවලට කඩිනම් පිළියම් යෙදීමටත්, කසළ බැහැර කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීමටත්, අදාළ පළාත් පාලන ආයතනවල නිලධාරීන්, පොලිසිය, හමුදාව හා මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙකුගෙන් සමන්විත නිලධාරී කමිටුවක් පත් කරනු ලැබුවා.

දිවයිනේ සෑම පළාතකම පළාත් පාලන කොමසාරිස් ඇතුළු රාජ්‍ය නිලධාරීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් හා කසළ කළමනාකරණය සඳහා උනන්දුවක් දක්වන ආයතන සම්බන්ධ කරගනිමින්, ඒ ඒ පළාතට සුදුසු අයුරින් කසළ කළමනාකරණ සැලැස්ම සකස් කිරීමට උපදෙස් ලබා දී තිබෙනවා. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත්, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ මඟින් සැපයීමට නියමිතයි. දැනටමත් දිවයිනේ සෑම පළාතකම මේ වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා, යන්ත්‍රානුසාරයෙන් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් කොම්පෝස්ට් යන්ත්‍ර 09ක් දිවයිනේ පළාත් 09ක ස්ථාපිත කරන්න කටයුතු යොදා තිබෙනවා. තවද, නොදිරන කසළ සඳහා ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති 25ක් ආරම්භ කිරීමට කටයුතු යොදා තිබෙනවා. ඒ වාගේම, කසළ ප්‍රවාහනය විධිමත් කිරීම සඳහා දේශීය අරමුදල් මඟින් කසළ ප්‍රවාහන යන්ත්‍ර (කම්පැක්ටර්) 100ක් සහ කොරියානු සහනාධාර මඟින් යන්ත්‍ර 150ක් මිලදී ගැනීමට කටයුතු යොදා තිබෙනවා.

මීට අමතරව ඒ නගරවල කසළ කළමනාකරණය සඳහා කෙටි කාලීන සහ දිගු කාලීන ක්‍රියා මාර්ග රැසක් ගෙන තිබෙනවා. විශේෂයෙන්ම, කොළඹ හා කොලොන්නාව නගර සභාවල දිරන කසළ කොම්පෝස්ට්කරණය කිරීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මුතුරාජවෙල කොම්පෝස්ට් අංගනයක් ස්ථාපිත කර, දිනකට ටොන් සියයක ප්‍රමාණයක් කොම්පෝස්ට්කරණය කරනු ලබනවා.

මිශ්‍ර කසළ වෙනුවෙන් සනීපාරක්ෂක බිම් පිරවුමක් ඉදි කිරීම සඳහා ව්‍යූහාත්මක සැලසුම් සකස් කිරීම පේරාදෙනිය විශ්වවිද්‍යාලය මඟින් මේ දිනවල සිදු කරනු ලබනවා. තවද, දොම්පේ පිහිටි කසළ රඳවනයට නොදිරන එහෙත් ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි කසළ ටොන් 50ක් දිනකට යෙදවීමට කටයුතු කර ඇති අතර, ඉදිරියේදී මෙම ප්‍රමාණය දිනකට ටොන් 90ක් දක්වා වැඩි කිරීමට බලාපොරොත්තු වෙනවා.

දෙහිවල - ගල්කිස්ස, කෝට්ටේ, මොරටුව, මහරගම, කැස්බෑව නගර සභාවල කසළ බැහැර කිරීම සම්බන්ධව ගැටලුවක් නොමැති අතර, බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් කරදියාන කසළ අංගනයට කසළ බැහැර කරනු ලබනවා. එසේම මහනුවර නගර සභාවේ කසළ බැහැර කරන ගොහාගොඩ කසළ අංගණය උපරිම සීමාවට ළඟා වී ඇති බැවින්, ඒ සඳහා නව සනීපාරක්ෂක කසළ අපහරණ භූමියක් ඉදි කිරීමට කටයුතු යොදා තිබෙනවා.

තවද, මධ්‍යම පරිසර අධිකාරිය විසින් උතුරු පළාතේ සනීපාරක්ෂක බිම් පිරවුමක් සැකසීමට කටයුතු කරන ලද අතර, යන්ත්‍රානුසාරයෙන් කොම්පෝස්ට් අංගනයක් ඉදි කිරීමට සැලසුම් කර තිබෙනවා. එසේම පෞද්ගලික අංශයේද සහභාගිත්වය ඇතිව නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා කටයුතු යොදා තිබෙනවා. කුරුණෑගල සහ ගාල්ල ප්‍රදේශවල ද යන්ත්‍රානුසාරයෙන් කොම්පෝස්ට් නිපදවීමේ අංගණ ඉදි කිරීමට කටයුතු යොදා තිබෙනවා.

ගරු කථානායකතුමනි, එසේම දිගුකාලීන ව්‍යාපෘති සැලැසුමක් වශයෙන් කොළඹ මහ නගර සභාව, දෙහිවල - ගල්කිස්ස මහනගර සභාව, කොලොන්නාව නගර සභාව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව, මොරටුව මහනගර සභාව යන පළාත් පාලන ආයතන සහ අවශ්‍යතාවය අනුව පුත්තලම, වනාතවිල්ලුව ඇතුළුව පුත්තලම් දිස්ත්‍රික්කයේ හා අනෙකුත් ප්‍රදේශවල දෛනිකව ජනනය වන නාගරික කසළවලින් උපරිමය දිනකට ටොන් 1,200ක් බැහැර කිරීමට පහසුකම් සැලසීමට පුත්තලම අරුවක්කාලු ප්‍රදේශයේ සනීපාරක්ෂක කසළ රඳවුමක් ඉදි කිරීමට කටයුතු සැලසුම් කර තිබෙනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

වසර 20ක පමණ කාලයක් මෙම භූමිය භාවිත කළ හැකි වේ යැයි අපේක්ෂා කරනවා. මෙම වැඩ බිමේ යෝජිත සනීපාරක්ෂක කසළ රඳවනය සහ කැලණිය ප්‍රදේශයේ ඉදි කිරීමට යෝජිත කසළ භූවමාරු ස්ථානය ද ඇතුළත්ව සකසන ලද මූලික පාරිසරික ඇගයීම් වාර්තාව මේ වන විට මධ්‍යම පරිසර අධිකාරිය සහ වයඹ මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර තිබෙනවා. මෙම ව්‍යාපෘතියට රජය විසින් 2017 වර්ෂය සඳහා රුපියල් බිලියන දෙකක් වෙන් කර ඇති අතර, 2018 වර්ෂය සඳහා රුපියල් බිලියන හතරක් වෙන් කිරීමට අපේක්ෂා කරනවා. එසේම ඉදිරියේදී අවශ්‍ය මූල්‍යමය හා තාක්ෂණික ආධාර ලබා දීමට ලෝක බැංකුව ද කැමැත්ත පළ කොට තිබෙනවා.

දීර්ඝ කාලීන වශයෙන් බස්නාහිර පළාතේ මොරටුව, කරදියාන හා මුතුරාජවෙල යන ප්‍රදේශවල කසළ මඟින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘති 3ක් ඇති කිරීමට යෝජනා වී තිබෙනවා.

මේ වන විට අප රජය ෆෙයාර්වේ හෝල්ඩිංස් පුද්ගලික සමාගම, වෙස්ටන් පවර් පුද්ගලික සමාගම සහ කේ.සී.එච්.ටී. ලංකා ජෑන්ග් පුද්ගලික සමාගම සමඟ මහා පරිමාණ කසළ කළමනාකරණ ව්‍යාපෘති සඳහා ගිවිසුම් ඇති කරගෙන තිබෙනවා. එම ගිවිසුම් සඳහා රජය මඟින් මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැති අතර, ආයෝජන හරහා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතයි. දැනට මේ ව්‍යාපෘතිවල මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, පාරිසරික අනුමැතින් ලබා ගැනීමේ කටයුතු කරමින් පවතිනවා. වර්ෂ දෙකක් තුළ මේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබෙනවා.

පසු ගිය වසර 10ක රාජපක්ෂ පාලනයෙන් යහ පාලනයට උරුම වුණේ ණය කන්දක් හා කුණු කන්දක්. රාජපක්ෂලා භයේ පැන ගියා වාගේ අපි පැන යන්නේ නැහැ. අපි මේ ණය ප්‍රශ්නයට වාගේම කුණු ප්‍රශ්නයටත් කෙටි කාලීන, මැදි කාලීන හා දිගු කාලීන විසඳුම් ලබා දෙනවා. අපේ අනාගත පරපුරට අප උරුම කර දෙන්නේ, ණය බර නැති, කුණු නැති ශ්‍රී ලංකාවක් කියා මම අවසාන වශයෙන් කියන්න කැමැතියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ඉස්සර අපේ රටේ ගෙවල් ඉස්සරහා තිබුණේ පුන් කලසයි. අද එය "ෆුල් කසළ" වෙලායි තිබෙන්නේ. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා මේ ගැන දන්නවා. අද ලංකාවේ landmark එක වාගේ වෙලා තිබෙන්නේ මොකක්ද? ඒ, දැන් හැම ගෙයක් ඉස්සරහාම තිබෙන කුණු බෑග් එකයි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ වාර්තාවට ස්තුතිවන්ත වන ගමන් මම අහනවා, පළාත් පාලන මැතිවරණය පවත්වා, පළාත් පාලන ආයතන සක්‍රිය වන තාක් හෝ ගෙවල්වලින් බැහැර කරන කසළ අඩුම ගණනේ දින දෙකතුනකට සැරයක් හෝ ගෙන යන්න නියෝග කරන්න, නියෝග කරලා මිනිසුන් විඳින පීඩාව අවම කරන්න ඔබතුමා ක්‍රියා මාර්ග ගන්නවාද කියා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අපි දැනටමත් ක්‍රියා මාර්ග ගෙන තිබෙනවා. ප්‍රධාන වශයෙන්, ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් එක් කමිටුවක් තිබෙනවා. එය සති දෙකකට සැරයක් රැස් වෙනවා. මම විටින් විට අදාළ පර්ශ්වයන් මුණ ගැසෙනවා, කොළඹ දිස්ත්‍රික්කය ගැන සාකච්ඡා කරන්න.

සියලුම කසළ ඉවත් කිරීම සම්බන්ධයෙන් වගකීම ඊයේ අපේ මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමාට භාර දුන්නා. ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමාට භාර දුන්නා, පළාත් පාලන ආයතන මඟින් කසළ ඉවත් කිරීම සම්බන්ධයෙන් වගකීම. දැනට කොළඹ නම් පොලීසියත්, යුද හමුදාවත්, මහ නගර සභාවත් ඒ කටයුතු ක්‍රියාත්මක කර ගෙන යනවා. අපි බැලුවේ මේ ප්‍රශ්නයට අවසාන විසඳුමක් සොයන්නයි. නැත්නම් තවත් කුණු කන්දක්, තවත් මීතොටමුල්ලක් තමයි ඇති වන්නේ.

එදා කුණු ඉවත් කළා. ඒ කුණු මීතොටමුල්ලට ගෙනැවිත් දැම්මා. කුණු වැඩි වෙන්න වැඩි වෙන්න, අපි වෙනත් ස්ථාන සොයා ගෙන ක්‍රියා කරන්න යද්දී නඩු දැම්මා. දැන් අපි පළමුවෙන්ම බලන්නේ ස්ථිර වශයෙන් ගන්න පුළුවන් විසඳුම මොකක්ද කියන එකයි. දැනට පුත්තලම ප්‍රදේශයේ කසළ දැමීමට ක්‍රියා කරගෙන යනවා. මාස හයකින් විතර පසුව කුණු දමන්න තවත් ස්ථාන දෙකක් සොයා ගෙන ඒවා සකස් කරන්න තිබෙනවා.

දැනට තිබෙන ප්‍රශ්නය, අද සිට ඊළඟ මාස කිහිපයට කසළ බැහැර කිරීම ගැනයි. දැනට කුණු දොම්පේ ප්‍රදේශයට යවනවා; මුතුරාජවෙලට යවනවා. මුතුරාජවෙලට කුණු දැමීමේදී තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මුතුරාජවෙල සමහර තැන්වලට දැම්මොත් ඒ තැන්වලට හානියක් වෙන්න පුළුවන්. ඒ ගැනත් සොයන්න තිබෙනවා. තුන්වැනි ස්ථානය හැටියට තිබෙන්නේ කරදියානයි. කරදියානට කොළඹ කුණු දමන්න එපා කියලා බස්නාහිර පළාත් සභ අපද්‍රව්‍ය අධිකාරිය තීන්දුවක් අරගෙන තිබුණා. ඊට පස්සේ ඒ ගැන අපේ ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා, බස්නාහිර පළාතේ මහ ඇමතිතුමා එක්ක කථා කළාම එතුමා ඒකට එකඟ වුණා. ඒක උසාවියට ඉදිරිපත් කළාම මහෙස්ත්‍රාත්තුමා කිව්වා, ඒකට එකඟ වෙන්න බැහැයි කියලා. දැන් දවස් තුන හතරක් නඩුව අහගෙන යනවා. නඩුව අහලා ඉක්මනින් තීන්දුවක් දෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒ තීරණය අවාසි නම් අපට මහාධිකරණයට යන්න වෙනවා. නමුත් ඒ තීන්දුව තවම දීලා නැහැ. ඒ නඩුව දැන් සුමාන තුනක් තිස්සේ ඇද ගෙන යනවා. ඇත්ත වශයෙන්ම අපට කරදියාන මේ කටයුත්ත සඳහා ලබා ගන්න පුළුවන් නම් මුතුරාජවෙලටත් හානියක් නොවී කෙටි කාලීනව මේ ප්‍රශ්නය විසඳන්න තිබුණා. දැන් මාස හයකින් තව ස්ථාන දෙක තුනක් ලබා ගෙන ඊළඟ අවුරුදු දෙක දක්වා ඒ තැන්වලට කසළ දමන්න පුළුවන්. දැන් අපට තිබෙන ලොකුම ප්‍රශ්නය කුණු එකතු කිරීම නොවෙයි. කුණු එකතු කරන්න පුළුවන්. කුණු දමන ප්‍රදේශ පිළිබඳ ප්‍රශ්නය පළමුවෙන් විසඳා ගන්න ඕනෑ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමනි, අපි ඉතාම ප්‍රායෝගික ප්‍රශ්නයකට ගියොත් කොළඹ නගරයේත්, දෙහිවල, ගල්කිස්ස ප්‍රදේශයේත් කුණු එකතු කිරීම් සිද්ධ වන්නේ ඉතාම අඩුවෙන්. මට වග කීමෙන්ම කියන්න පුළුවන්, පසු ගිය දවස් 10 තුළ අපේ ගෙදර ඇතුළුව ඒ ප්‍රදේශයේ කුණු ගෙනියන්න ඇවිල්ලා නැහැයි කියන එක. මේක රටටම බලපාන පොදු ප්‍රශ්නයක් බව මම පිළිගන්නවා. මම ඔබතුමාගෙන් අහන්නේ මේකයි. ඔබතුමා ඇමතිවරු දෙදෙනකුගේ නම් සඳහන් කළා. එයින් චම්පික රණවක ඇමතිවරයා පුවත්පතකට කියා තිබෙනවා මම දැක්කා, කුණු ගෙන යාම පිළිබඳව එතුමාට කිසිම වගකීමක් නැහැයි කියලා.

පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමාගේ හැකියාව අපි මේ සභාවේදී දැකලා තිබෙනවා. පළාත් පාලන ආයතන සක්‍රිය වෙලා,

ඒ ආයතන ශක්තිමත් වන තාක් කල් හෝ එක්කෝ ජනාධිපතිවරයා යටතේ නැත්නම් අගමැතිතුමා යටතේ යම් කිසි අධිකාරියක් පිහිටුවා මේ ප්‍රශ්නයට ප්‍රායෝගික විධායක කාර්ය භාරයක් ඉටු කිරීම සඳහා කටයුතු කරනවාද කියන එකයි මා අහන්නේ. නැත්නම් පාඨලී චම්පික රණවක අමාත්‍යවරයාට හා ෆයිසර් මුස්තාපා අමාත්‍යවරයාට මේ කාර්යය පැවරුවාට මොකුත් වෙන්නේ නැහැ. මේක දෛනිකව මිනිසුන් මුහුණ දෙන ප්‍රශ්නයක්. හරියට හුස්ම වාගේ මේක මිනිසුන්ට නිතරම බලපානවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම ඊයේ අපේ පාඨලී චම්පික රණවක ඇමතිතුමා සමඟ කථා කළා. කොළඹ නගරය තුළ කසළ බැහැර කිරීම සම්බන්ධ ප්‍රශ්නය තිබුණා. අපි සැලසුම් කර තිබෙන ක්‍රියාවලිය සිකුරාදා වනකොට ක්‍රියාත්මක කරන්න පුළුවන් කියලා බලාපොරොත්තුවක් තිබෙනවා. අපත් ඒ ගැන බලාගෙන ඉන්නේ. විශේෂයෙන් මමත් මේ සම්බන්ධයෙන් බලනවා. ඩෙංගු ප්‍රශ්නය වැනි කොළඹ තිබෙන එක එක ප්‍රශ්න නිසා විශේෂයෙන්ම අපේ අවධානය යොමු වෙලා තිබෙන්නේ කොහොම හෝ කොළඹ සුද්ද කර ගන්නයි. කසළ බැහැර කිරීම සම්බන්ධ ප්‍රශ්නයක් දෙහිවල ප්‍රදේශයේ තිබෙන්න විධියක් නැහැ. මොකද, දෙහිවල ප්‍රදේශයේ කුණු කරදියානට යවන්න පුළුවන්. එහෙම නම්, මම ඒ පිළිබඳව අහලා බලන්නම්, මන්ත්‍රීතුමනි. කසළ ගෙන යන එකේ ප්‍රශ්නය තිබෙන්නේ කොළඹ, කොළොන්නාව, කඩුවෙල, බියගම සහ කැලණිය ප්‍රදේශවල. අනික් ප්‍රදේශවල කසළ ගෙන යන්න පුළුවන්. අනික් ප්‍රදේශවල කසළ ගෙන යන්නේ නැත්නම් මම ඒ පිළිබඳව සොයා බලන්නම්. ඔබතුමා කියන විධියට දෙහිවල ප්‍රදේශය සම්බන්ධයෙන් මම සොයා බලන්නම්. විශේෂයෙන්ම අපි මෙහිදී අවධානය යොමු කළේ මේ ප්‍රශ්න තිබෙන ප්‍රදේශ සම්බන්ධයෙන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ අවසාන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අගමැතිතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, මුතුරාජවෙලට කුණු දැමීම නතර කරන්න කියලා අද ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් දීලා තිබෙන බව. කරදියාන සම්බන්ධයෙන් නඩුවක් තිබෙනවා. බස්නාහිර පළාත් සභ අපද්‍රව්‍ය අධිකාරියෙන්ම ප්‍රකාශ කරලා තිබෙනවා, උපරිම වශයෙන් දැම්මත්, කරදියානට කුණු දමන්න පුළුවන් වන්නේ තව අවුරුදු දෙකයි කියලා. මොකද, ඒ තුළින් පරිසරයට සුවිශාල හානියක් වන නිසා. ගරු අගමැතිතුමනි, පසු අවස්ථාවක හෝ කමක් නැහැ, නිවැරදි සැලැසුම් සමඟ, ඊළඟ අවුරුදු දෙකේ මොකක්ද වෙන්නේ කියලා නිවැරදිව මේ සභාවට කරුණු ඉදිරිපත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු අගමැතිතුමනි, මිනිසුන් උද්ඝෝෂණය කරන්නේ කසළ කළමනාකරණ ව්‍යාපෘතිවලට එරෙහිව නොවෙයි. කරදියාන ඇතුළුව මිනිසුන් උද්ඝෝෂණය කරන හැම තැනකම තිබෙන ගැටලුව වන්නේ, එම ස්ථානවලට නිකම්ම කසළ ගෙනැල්ලා දැමීමයි. දැන් ඔබතුමා කියපු උදාහරණවලත් වැඩි වශයෙන් තිබෙන්නේ කොම්පෝස්ට් පොහොර හදන එක සම්බන්ධවයි. දැනටත් මහා පරිමාණයෙන් එකතු වන නොදිරන කුණු කළමනාකරණය සඳහා -බලශක්තිය හැදීම හෝ, මොනවා හෝ- ඉතාම සුළු උදාහරණ සංඛ්‍යාවක් තමයි ඔබතුමා කිව්වේ. නොදිරන කුණු කළමනාකරණය කිරීමේදී මහා පරිමාණ හෝ, සුළු පරිමාණ හෝ ක්‍රියාදාමයකට නොගියොත් මේ ප්‍රශ්නය බරපතළ ගැටලුවක් බවට පත්වනවා. එම නිසා නොදිරන කුණු කළමනාකරණය කිරීම පිළිබඳව සවිස්තර වාර්තාවක් පුළුවන් නම්, තව සති දෙකක් ඇතුළත මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. එතකොට අපට දැනගන්න පුළුවන්, ආණ්ඩුව මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කරන්න හිතලා තිබෙන්නේ මොනවාද කියලා හෝ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ඊළඟ වාර්තාවේදී මම ඒ කරුණු ඉදිරිපත් කරන්නම්. මෙතැන වෙලා තිබෙන්නේ මේකයි. එහෙම නම්, කරදියානට කොළඹ කසළ ගෙන ගොස් දැමීමට ඉඩ දෙනවාද, නැද්ද කියන එක පිළිබඳව කැස්බෑව උසාවියෙන් ඉක්මනින් තීන්දුවක් දෙන්න ඕනෑ. කරදියානට කොළඹ කසළ ගෙන ගොස් දැමීමට විරුද්ධව කැස්බෑව උසාවියෙන් තීන්දුවක් දුන්නොත්, මහාධිකරණයට ගිහිල්ලා නඩුවක් දමන්න අපට පුළුවන්.

මේ කාරණය ඇදගෙන ගියාම විශාල ප්‍රශ්නයක් ඇති වනවා. ඒ කියන්නේ, කුණු කොහේ හෝ ගොඩ ගැහෙනවා. මුතුරාජවෙල ප්‍රදේශයේත් මේ ප්‍රශ්නය තිබෙනවා. අදාළ ආයතනය කෑඳවලා කරුණු අහන්න උසාවියටත් යුතුකමක් තිබෙනවා. හැම තැනකටම උසාවි නියෝග ලබා දෙනවා නම් විශේෂයෙන්ම කොළඹ තිබෙන කුණු ප්‍රමාණය වැඩි වෙන්න ඕනෑ; කුණු අඩු වෙන්නේ නැහැ. මේ සේවාව, අත්‍යවශ්‍ය සේවාවක්. අත්‍යවශ්‍ය සේවා තිබෙන කොට උසාවිය නියෝග ලබා දෙන්නේ කොහොමද කියලා කියන්න මම දන්නේ නැහැ. මෙයට පක්ෂව නියෝග ලබා දෙන්න කියලා මම කියන්නේ නැහැ. අඩු ගණනේ මෙහෙම විශාල අර්බුදයක් තිබෙන කාලයකදීවත් ඊට අදාළ නිලධාරීන් කැඳවලා කරුණු අහන්න ඕනෑ. මේ කටයුත්තට කැමති පරිසරවේදීන් ඇති. සමහර පරිසරවේදීන් යනවා මේ කටයුත්ත නවත්වන්න කියලා. කරුණු හොයලා තීරණයක් ලබා දෙන්න උසාවිවලට වගකීමක් තිබෙන බව මම කෙළින්ම කියන්න කැමතියි. මේ කටයුත්ත කාලයක් තිස්සේ කරගෙන ගියානේ. [බාධා කිරීමක්] එහෙම නම් 20වැනි දා වන තුරු කාලය ලබා දෙන්න ඇති. [බාධා කිරීමක්] ඊළඟ දවසේ දෙන්න ඕනෑ. අපට ගිහිල්ලා ඒ ගැන කියන්න වේවි. අධිකරණයටත් මේ කටයුත්ත විශාල ප්‍රශ්නයක් බව මා මේ ගරු සභාවේදී කියන්න කැමැතියි. ඩෙංගු රෝගය පැතිරෙනවා; මිනිස්සු මැරෙනවා. එහෙනම් ඒ අදාළ කණ්ඩායම් කැඳවලා, ඒ කණ්ඩායම් එක්ක සාකච්ඡා කරලා, ඊට පස්සේ ඕනෑම තීන්දුවක් ලබා දෙන්න. මොකද, මෙතැන කරුණු ගණනාවක් තිබෙනවා. 20වැනි දා වන තුරු කල් ලබා දීලා තිබෙනවා නම් මේ නගරවල කුණු ගෙනියන්න බැහැ. කුණු එකතු කිරීම නොවෙයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. එතැන සිට කුණු ගෙනි යන එක තමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. මේ ගරු සභාවත් ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑය කියා මා හිතනවා. උසාවි මෙහෙම තහනම් නියෝග ලබා දෙන ගියොත් රටේ ලෙඩ පැතිරෙනවා; මේ ප්‍රශ්න තවත් වැඩි වෙනවා. සියලුම කුණු ඉවත් කරන්න හමුදාව ලැහැස්තියි; පොලීසිය ලැහැස්තියි; කොළඹ නගර සභාව ලැහැස්තියි. උසාවිත් ඒ වාගේම මේ කටයුත්ත වෙනුවෙන් ක්‍රියා කරන්න අවශ්‍යයි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව : දුම්රිය එංජින් මිලදී ගැනීම
இலங்கைப் புகையிரத திணைக்களம் : புகையிரத இயந்திரங்கள் கொள்வனவு
DEPARTMENT OF SRI LANKA RAILWAYS: PURCHASE OF TRAIN ENGINES

1066/'16

1. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

[ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා]

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සකසන ලද 2015 - 2020 ක්‍රියාකාරී සැලැස්මෙහි දුම්රිය එංජින් මිලදී ගැනීමට විධිවිධාන සලසා නොමැති වීමට හේතුව කවරේද;

(ii) එකී සැලැස්ම ක්‍රියාත්මක නොකරන්නේ නම්, විකල්ප සැලැස්මක් සකසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ජාත්‍යන්තර තරඟකාරී මිල කැඳවීමකින් තොරව ඉන්දියාවෙන් දුම්රිය එංජින් මිලදී ගැනීමට සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ඉන්දියාවේ දුම්රිය එංජින් නිෂ්පාදනය කරන සමාගම්වල නම් කවරේද;

(iv) ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් නොකැඳවීම යහ පාලන මූලධර්මයට එකඟද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු මත්‍රුම් සිවිල් විමාන සේවෛකළ් අමෛච්චරෙක් කේට්ට වින්නා:

(அ) (i) இலங்கைப் புகையிரதத் திணைக்களத்தினால் தயாரிக்கப்பட்ட 2015 - 2020 செயற்பாட்டுத் திட்டத்தில் புகையிரத இயந்திரங்களைக் கொள்வனவு செய்வதற்கான ஏற்பாடுகள் மேற்கொள்ளப்படாமைக்கான காரணம் யாதென்பதையும்;

(ii) மேற்படி திட்டம் செயற்படுத்தப்படாதெனில், மாற்றுத் திட்டமொன்று தயாரிக்கப்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) சர்வதேச போட்டி ரீதியிலான விலைமனுக் கோரலின்றி இந்தியாவிலிருந்து புகையிரத இயந்திரங்களைக் கொள்வனவு செய்வதற்கான திட்டமொன்று உள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கான காரணங்கள் யாவை யென்பதையும்;

(iii) இந்தியாவில் புகையிரத இயந்திரங்களை உற்பத்தி செய்கின்ற கம்பனிகளின் பெயர்கள் யாவையென்பதையும்;

(iv) சர்வதேச போட்டி ரீதியிலான விலைமனுக் கோரல் மேற்கொள்ளப்படாமை நல்லாட்சிக் கோட்பாட்டுக்கு அமைவானதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House-

(i) the reason for non-availability of provisions for the purchase of train engines in the 2015 -2020 Action Plan prepared by the Department of Sri Lanka Railways; and

(ii) whether an optional plan has been prepared, if the said plan would not be implemented;

(b) Will he also inform this House-

(i) whether there is a plan to purchase train engines from India without calling for international competitive bids;

(ii) if so, the reason for that;

(iii) the names of the companies that produce train engines in India; and

(iv) whether not calling for international competitive bids is in line with the principles of good governance?

(c) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) වර්ෂ 1965 පමණ වනවිට දුම්රිය එංජින් 300ක් පමණ පැවති අතර දැනට ධාවන තත්ත්වයේ පවතින්නේ එංජින් 180ක් පමණය. ඒ අනුව 2015 - 2020 ක්‍රියාකාරී සැලැස්මෙහි දුම්රිය එංජින් මිලදී ගැනීම සම්බන්ධව සඳහන් කර නොමැති වුවත් දුම්රිය මැදිරි හා ගැල් මිලදී ගැනීම අවශ්‍යතාවක් ලෙස සඳහන් කර ඇති අතර දුම්රිය මැදිරි හා ගැල් ධාවනය වැඩි කිරීම සඳහා එංජින් මිලදී ගැනීමේ අවශ්‍යතාවද පවතී.

(ii) 2015 - 2020 සැලැස්ම අනුව කටයුතු කරමින් පවතී.

(ආ) (i) ඔව්.

(ii) ඉන්දීය ණය ආධාර යටතේ ලබා දී ඇති ප්‍රතිපාදනවල ඉතිරි මුදල් භාවිතා කිරීමක් බැවින් ඉන්දියාව තුළ ඇති ආයතනවලින් පමණක් මිල කැඳවීම් කර ඇත.

(iii) දුම්රිය එංජින් නිෂ්පාදනය කරනු ලබන්නේ ඉන්දීය රජයේ ආයතනයන් වන Diesel Locomotive Works (DLW), Varanasi සහ Chittaranjan Locomotive Works (CLW) යන ආයතනයි.

(iv) ලැබී ඇති ප්‍රතිපාදන ඉන්දීය ණය ආධාර යටතේ බැවින් එම ණය කොන්දේසිය අනුව කටයුතු කළ යුතුව ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
බොහොම පින්, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු : සභාපති/සම සභාපති ධුර

மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக்கள்: தவிசாளர்/இணைத் தவிசாளர் பதவி

DISTRICT AND DIVISIONAL COORDINATING COMMITTEES: POSITIONS OF CHAIRMAN/ CO-CHAIRMAN

1137/'16

2. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) රට පුරා ක්‍රියාත්මක දිස්ත්‍රික් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සභාපති හෝ සම සභාපති ධුර දරන පුද්ගලයන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයන් අතරින් පාර්ලිමේන්තු හෝ පළාත් සභා මන්ත්‍රීවරයන් නොවන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) நாடு முழுவதிலும் இயங்கிவருகின்ற மாவட்ட மற்றும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவற்றின் தவிசாளர் அல்லது இணைத்தவிசாளர் பதவிகளை வகிக்கின்ற ஆட்களின் பெயர்கள் மற்றும் பதவிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஆட்களில் பாராளுமன்ற அல்லது மாகாண சபை உறுப்பினர்கள் அல்லாத ஆட்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and the Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the number of District and Divisional Coordinating Committees that are functioning throughout the country;

(ii) the names and the designations of the persons who are holding the positions of Chairman or Co-chairman of those Committees;

(iii) out of the aforesaid persons, the number of persons who do not come under the category of Members of Parliament or Provincial Councilors?

(b) If not, why?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සංඛ්‍යාව - 25
ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සංඛ්‍යාව - 331

(ii) පිළිතුර ඇමුණුම 01, 02, 03 සහ 04හි දක්වා ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
එයින් කිහිපයක් කියන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම ඉන් කිහිපයක් කියන්නම්.

ගම්පහ දිස්ත්‍රික්කය - ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය, ගරු අජිත් මාන්නප්පෙරුම මහතා.

කළුතර දිස්ත්‍රික්කය - ගරු මහින්ද සමරසිංහ මහතා, ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා.

මාතලේ දිස්ත්‍රික්කය - ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා, ගරු රංජිත් අලුවිහාරේ මහතා. ඒ ආදී වශයෙන් නම් ඔක්කෝම තිබෙනවා.

(iii) 82යි.

(ආ) අදාළ නොවේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, (අ)(ii) ප්‍රශ්නය යටතේ මා මේ සඳහන් කරන දිස්ත්‍රික්කවලට අදාළව පිළිතුරු ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ සම සභාපති ධුර දරන්නේ කවුද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මහින්ද සමරසිංහ මහතා සහ හේමන්ත වික්‍රමආරච්චි මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ සම සභාපති ධුර දරන්නේ කවුද?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මහින්ද සමරසිංහ මහතා, අනික් පැත්තෙන් නන්දන ගුණතිලක මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ සම සභාපති ධුර දරන්නේ කවුද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
චන්දන කත්‍රිආරච්චි මහතා, මේ පැත්තෙන් අජන්ත නිරෝෂන් පාදුක්ක මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති සහ සම සභාපති ධුර දරන්නේ කවුද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
නිරූපමා රාජපක්ෂ මහත්මිය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්. ඊළඟට, අපේ පැත්තෙන්-

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
අපේ පැත්තෙන්, ඒ පැත්තෙන් කියන්නේ -[බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
කටුවන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ඉන්නේ ආනන්ද කුලරත්න මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ඉන්නේ කවුද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපට කාලය ගැනත් අවධානය යොමු කරන්න වෙයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
දෙවිනුවරට එක පැත්තකින් ඉන්නේ එච්.ආර්. විමලසිරි මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
අනෙක් පැත්තෙන් ඉන්නේ කවුද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
අනෙක් පැත්තෙන් දෙවිනුවර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ ඉන්නේ කවුද කියලා මට මෙම ලේඛනයෙන් සොයා ගන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නම් අපි අනෙක් ප්‍රශ්නවලට යමු.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය කලානිති) නළින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු පානදුරේ නන්දන ගුණතිලක, යූඇන්පී සංවිධායක; මන්ත්‍රීකමක් නැහැ. හොරණ හේමන්ත වික්‍රමආරච්චි, යූඇන්පී සංවිධායක; මන්ත්‍රීකමක් නැහැ. කැස්බෑවේ චන්දන කත්‍රිආරච්චි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධායක; මන්ත්‍රීකමක් නැහැ. කටුවන, නිරූපමා රාජපක්ෂ මහත්මිය; මන්ත්‍රීකමක් නැහැ. කටුවන, ආනන්ද කුලරත්න, මන්ත්‍රීකමක් නැහැ. එච්.ආර්. විමලසිරි, දෙවිනුවර යූඇන්පී සංවිධායක; මන්ත්‍රීකමක් නැහැ. මේ, කිහිපයක් විතරයි. මේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, රජයේ නිලධාරීන් ගෙනැල්ලා ජනතාවගේ ඕනෑ එපාකම්, අවශ්‍යතා පිළිබඳව සාකච්ඡා කරන තැන්. එම කමිටුවලට පළාත් සභා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවෙන -ඔබතුමා දැන් කියපු- ඔබතුමන්ලාගේ පැත්තේ සංවිධායකයන් සහ අනෙක් පැත්තේ සංවිධායකයන් පත් කරගෙන ඉන්නවා. මොකක්ද, මේ යහ පාලනය? තව මේ වාගේ ගොඩක් තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මන්ත්‍රීකම නැති සමහර අය ඉන්නවා. නමුත් රජය වෙනුවෙන් ක්‍රියාත්මක වීමට ඒජන්තවරුන් හැටියට ඔවුන් පත් කරලා තිබෙනවා.

ගරු වජීර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු වජිර අපේවර්තන - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
එහෙම පත් කරන්න බැහැ කියා නීතියක් -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ද සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
එහෙම පත් කරන්න බැහැ කියලා කොහේවත් -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
පොඩ්ඩක් ඉන්න. එම අතුරු ප්‍රශ්නයට උත්තරය දීලා ඉවර කරන්න ඉඩ දෙන්න, ගරු කථානායකතුමනි. එහෙම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් කරන්න ඕනෑය කියලා කොහේවත් නීතියක් නැහැ. රජය වෙනුවෙන් පත් කළ -

ගරු වජිර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අබේවර්තන)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, -

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
සමාවෙන්න, ගරු ඇමතිතුමනි. ඔබතුමා උත්තර දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ගරු අනුර දිසානායක මැතිතුමාට මුලින් අවස්ථාව දෙමු. ඊට පසුව ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ ගොඩනඟන්නේ එක්සත් ජාතික පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත් ඒ ඒ ආසනවල ඒකාබද්ධ කමිටු නම්, පක්ෂ කමිටු නම් අපට ප්‍රශ්නයක් නැහැ. මේ ගොඩනඟා තිබෙන්නේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු. ඒ කියන්නේ රාජ්‍ය මූල්‍ය පරිපාලනය පිළිබඳව ඒ පළාත්වලට එන සංවර්ධන වැඩ කටයුතු අධීක්ෂණය කිරීම, මෙහෙයවීම තීන්දු කිරීමේ කාර්ය භාරය ඉටු කරන කමිටු. එම තීන්දු-තීරණ ගැනීමේ කාර්ය භාරයට "අපේ පැත්තෙන්, ඒ පැත්තෙන්" කිය කියා මොකක්ද, මේ කරන්නේ? මන්ත්‍රී ධුරයක්වත් නැති, ජනතාවට වග කියන්නේ නැති තමන්ගේ පක්ෂවල හෙංචයියන් ඒකට දමා ගන්න අයිතියක් තිබෙනවාද? වන්දන කන්‍රිආරච්චි කැස්බෑවට දමන්න, තව කොහේට හරි තව කෙනෙක් දමන්න අයිතියක් තිබෙනවාද? මේ මොකක්ද කරන්නේ, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමනි, මේ කමිටු ගොඩ නැඟුණු හැම වෙලාවේම ඒ පළාත් නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වය ලබා ගන්නවා, සංවර්ධන වැඩ කටයුතු සඳහා. තමුන්නාන්සේලා ඒ වෙනුවට කරමින් තිබෙන දේ තමයි තමුන්නාන්සේලාගේ පක්ෂ සංවිධායකවරුන් මේ කමිටුවල සභාපතිවරුන් ලෙස පත් කර ගැනීම. ගරු කථානායකතුමනි, එතකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ඒ කමිටුවේ පැත්තක වාඩි වෙලා ඉන්නවා. සමහර පළාත්වල මන්ත්‍රීවරයෙක් සිටියදී තමුන්නාන්සේලා වෙනත් කෙනෙකු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති ලෙස පත් කරනවා. තමුන්නාන්සේලා ඒ අයට නමක් දෙනවා, 'ආසන සංවිධායක' කියලා, තමුන්නාන්සේලා ඒ අයට නමක් දෙනවා, 'ප්‍රාදේශීය සම්බන්ධීකාරක' කියලා. ගරු කථානායකතුමනි, මේ මුළුමනින්ම රාජ්‍ය මුදල් අවභාවිතාවේ යෙදවීම සඳහා, තමන්ගේ පක්ෂ ශක්තිමත් කිරීම සඳහා යන වැඩ පිළිවෙළක්. පක්ෂ ශක්තිමත් කර ගැනීමේ යාන්ත්‍රණයකටයි මේ යන්නේ. [බාධා කිරීමක්]

ගරු වජිර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අබේවර්තන)
(The Hon. Wajira Abeywardana)
ජේවීපී අයටත් දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ස්වදේශ කටයුතු අමාත්‍යතුමා පිළිතුරු දෙන්න.

ගරු වජිර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අබේවර්තන)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, මම පිළිතුර දුන්නාට පසුව විපක්ෂයේ සංවිධායකතුමා පැහැදිලි කිරීමක් කළාට කමක් නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, ඇමතිතුමා පැහැදිලි කරන්න.

ගරු වජිර අබේවර්ධන මහතා
(මාණ්පුමිකු වජිර අබේවර්තන)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, වෙන දා මේ චක්‍රලේඛනයේ සඳහන් වුණේ "මහජන නියෝජිතයන්" කියන වචනය. අපි මේ චක්‍රලේඛනය සංශෝධනය කරලා "අතිගරු ජනාධිපතිතුමාගේ සහ අග්‍රාමාත්‍යතුමාගේ නියෝජිත" කියන වචන දෙක ඇතුළත් කළා. අපි එහෙම කළේ කාරණා කීපයක් උඩ. ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයකට ලක් කරන්නට තීරණය කළේ, ඒ ඒ දිස්ත්‍රික්කවල සහ ඒ ඒ මැතිවරණ කොට්ඨාසවල මහජන නියෝජිතත්ත්වය හරියාකාරව දැනට පවතින මැතිවරණ ක්‍රමය තුළ සිදු වන්නේ නැහැයි කියන කාරණය මුල් කරගෙනයි. [බාධා කිරීමක්] මම කිව්වාට පසුව ඔබතුමා පැහැදිලි කරන්න. සමහර කමිටුවලට පත් කරලා සිටින නියෝජිතයන් සමහර වෙලාවට තමන්ගේ මැතිවරණ කොට්ඨාසය ජයග්‍රහණය කරපු අය; සමහර වෙලාවට ඡන්ද කිහිපයක් අඩුවීම නිසා පාර්ලිමේන්තුව හෝ පළාත් සභාව නියෝජනය කිරීමේ අවස්ථාව අහිමි වූ අය. මොවුන් මහජන නියෝජිතයන් ලෙස සැලකීම සුදුසු යැයි කියන පදනමේ ඉඳගෙන, -ඒ කියන්නේ දැනට තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධනයත් මුල් කරගෙන- තමයි මේ නියෝජනය සඳහා චක්‍රලේඛනය සංශෝධනය කර තිබෙන්නේ. විවිධ මත දරන අය මේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු නියෝජනය කරනවා. ඒ සඳහා බාධාවක් නැහැ.

ඇත්ත වශයෙන්ම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ලිඛිතව දැන්වුවහොත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සඳහා ජනතා විමුක්ති පෙරමුණේ හෝ වෙනත් දේශපාලන පක්ෂවල නියෝජිතත්වයක් අවශ්‍යයි කියලා, අපට පුළුවන් සම සභාපතිවරු හැටියට ඒ අයත් පත් කරලා ක්‍රියා කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙතුමා සඳහන් කළ පළමුවෙනි කාරණය වැරදියි. මේ පිළිබඳව කිසිදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා

[ගරු අනුර දිසානායක මහතා]

සංශෝධනයක් සිදු වී නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. ඔබතුමා දැන් කිව්වා නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගැන. ඒ හරහා මේ රටට චිත්‍රයක් මවන්න හදනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් මේ දේ ඇතුළත් කරලා තිබෙන බැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කරන්න පුළුවන් කියලා. නමුත් එවැනි සංශෝධන කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් වී නැහැ. මේ ස්වදේශ කටයුතු අමාත්‍යාවරයාද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි, ගැසට් එකයි දන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමැතිතුමාට පිළිතුරු දෙන්න අවස්ථාව දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමා මොකක්ද කිව්වේ කියලා හැන්සාඩ් දෙපාර්තමේන්තුවට ගිහින් recordings rewind කරලා බලන්න. ගරු කථානායකතුමනි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සභාපති ධුරය පිළිබඳව හෝ ප්‍රාදේශීය සංවර්ධන කමිටුවල සභාපති ධුරය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කිසිදු සංශෝධනයක් ඇති වී නැහැ. එම නිසා මෙතුමා කියන කරුණ සම්පූර්ණයෙන් වැරැදියි.

ගරු කථානායකතුමනි, දෙවනුව, මෙතුමා කියන පරිදි ඡන්දය ඉල්ලා පැරදුණ නිසා ඒ අය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට දමනවා. හැබැයි, එහෙම දමන්න ඒ අය මොකක්ද කරලා තිබෙන්නේ? මෙතෙක් තිබුණු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට පත් කිරීමේ ක්‍රමවේදය තමුන්නාන්සේලා මාරු කළා. තමුන්නාන්සේලා එම ක්‍රමවේදය මාරු කළේ මොකටද? මෙතෙක් තිබුණ ක්‍රමවේදය තමයි, ඒ පළාත නියෝජනය කරන මන්ත්‍රීවරු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ වාඩිවීම. අද තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ එතැන පක්ෂ නියෝජිතයන් වාඩි කරවීමයි. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන්නේ පක්ෂ කාර්ය භාරයක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂයට සාමාජිකයින් බඳවා ගන්නේ කොහොමද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රීපාල පාර්ශ්වයත් එක්ක ගැටුම් ඇති කර නොගෙන ඉන්නේ කොහොමද කියන ඒවා කථා කරන්න තමුන්නාන්සේලා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ස්වදේශ කටයුතු ඇමැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ ප්‍රශ්නය අවසන් නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කෙටියෙන් ප්‍රශ්නය අහන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ, එක්සත් ජාතික පක්ෂ hybrid ආණ්ඩුවේ ගෙදර ප්‍රශ්න විසඳා ගන්න වෙනත් ක්‍රමයක් හදා ගන්න කියන්න. ඒකට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු උපයෝගි කර ගන්න එපා. ගරු කථානායකතුමනි, දැන් පැහැදිලි ලෙස ඡන්දය ඉල්ලපු නැති සමහර අය - මහ ඡන්දයකට, පළාත් සභා ඡන්දයකට ඉල්ලපු නැති අය- ඇවිත් මේ කමිටුවල වාඩි වෙනවා කියලා මම වගකීමෙන් කියනවා. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු? පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එහි සාමාජිකයන් හැටියට වාඩි වෙනවා. මොකක්ද ඒ? මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු සාමාජිකයන් වෙද්දී, මේ අයගේ නියෝජිතයන් ඒ කමිටුවල සභාපතිවරු බවට පත් කරනවා. මේක කිසිසේත්ම සාධාරණ නැහැ. එය මුළුමනින්ම දේශපාලන යටත් කිරීමක්.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, අපේ මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ කථා කළා. මම හිතන හැටියට එතුමා ඒක වැරැදි විධියටයි අවබෝධ කර ගත්තේ. ඇත්ත වශයෙන්ම අපි ඒ ගැන සඳහන් කළේ සියලු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තුව තුළ සංශෝධන කිහිපයක් සිදු වෙමින් තිබෙන අවස්ථාවකයි. එම නිසා තමයි අපි බැලුවේ මේ කමිටුවලට ග්‍රාමීය මට්ටමේ සියලු පක්ෂවල සහ සියලු අයගේ නියෝජිතත්වය සිදු විය යුතුයි කියලා. ඔබතුමන්ලාගේ පක්ෂයේ අයත් දැනට ඒ කමිටුවලට සභාභාගි වෙනවා. ඔබතුමන්ලාට අවශ්‍ය නම් අග්‍රාමාත්‍ය කාර්යාලයට ලේඛනයක් එවන්න. එතකොට අපට පුළුවන් ඒ අයත් පත් කරන්න.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அநுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அநுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළවයි මම කියන්නේ. මම ජනතා විමුක්ති පෙරමුණෙන් මේ කාරණය අහනවා. ඡන්දයකට ඉදිරිපත් වෙලා මනාප ලැයිස්තුවේ ඉදිරියෙන්ම හිටපු අය අයින් කරලා, කිසිම ඡන්දයකට ඉදිරිපත් නොවුණ කොහේවත් හිටපු මිනිස්සුත් මෙච්චර කාලයක් ජනතා විමුක්ති පෙරමුණෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. ඒ නිසා ඒ ගොල්ලන්ට මේවා අහන්න අයිතියක් නැහැ. [බාධා කිරීම්] මනාප ගත්තු අය අයින් කරලා කොහේවත් හිටපු මිනිස්සු තමයි මෙතැන වාඩි වෙලා ඉන්නේ. [බාධා කිරීම්] ඡන්දය ඉල්ලා මනාප ගත්ත අය පැත්තකට දමලා තමයි මේ ගොල්ලන් වාඩිවෙලා ඉන්නේ. [බාධා කිරීම්] මේ ගොල්ලන්ට ඒ ප්‍රශ්නය අහන්න සාධාරණ අයිතියක් නැහැ. [බාධා කිරීම්] වාඩි වෙන්න. ඡන්දය ඉල්ලපු මිනිස්සු අයින් කරලා, ඒ අය පැත්තකට දමලා තමයි මේ ගොල්ලන් වාඩි වෙලා ඉන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාට දුන්නු අවස්ථාව ඉවරයි. ඔබතුමාට මීට වඩා අවස්ථාව දෙන්න බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අදාළ අමාත්‍යවරයා වෙනුවට උත්තර දෙන්න නියෝජ්‍ය ඇමතිතුමාට අවස්ථාව දුන්නා. [බාධා කිරීම්] මොන point of Order එකක් අනුවද ඒ මන්ත්‍රීතුමා උත්තර දුන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා මතු කළේ point of Order එකක් නොවෙයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. අපේ ප්‍රශ්නය අහලා තිබුණේ අදාළ අමාත්‍යවරයාගෙන්. අදාළ අමාත්‍යවරයාගේ නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිවරයා පිළිතුරු ලබා දුන්නා. ඒ පිළිතුරට සම්බන්ධ නිසා ස්වදේශ කටයුතු අමාත්‍යවරයාත් පිළිතුරු ලබා දුන්නා. මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. කැබි එකේ ගිහිල්ලා හැප්පෙන කොට කාන්තාවන්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හිටියේ කොහොමද කියන්න අපි දන්නවා. [බාධා කිරීම්] ඒ අය උත්තර දුන්නේ කොහොමද? ඒ අය මෙතැනදී උත්තර දුන්නේ කොහොමද? [බාධා කිරීම්] අපි මන්ත්‍රීවරයෙකුගෙන් ප්‍රශ්නය ඇහුවාද? [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, අපි මන්ත්‍රීවරයෙකුගෙන් ඒ ප්‍රශ්නය ඇහුවාද? මන්ත්‍රීවරයෙක් උත්තර දෙන්නේ කොහොමද? [බාධා කිරීම්] මම අහන්නේ එක කාරණයයි. ඔබතුමා උත්තර දෙන්න ඇයි මන්ත්‍රීවරයෙකුට අවස්ථාව දුන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4. ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා, කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොන ප්‍රශ්නයටද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ මන්ත්‍රීතුමා උත්තර දුන්නේ කොහොමද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් ඉල්ලුවාම අවසර දෙනවා. ඒ ප්‍රකාශය කරන අතරතුර මම ඒක නැවැත්වුවා. එතුමා point of Order එකක් ඉල්ලුවා. ඒක point of Order එකක් නොවන නිසා ඒ කථාව නැවැත්වුවා. [බාධා කිරීම්] වෙන අයිතියක් නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද point of Order එක? [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම ඔබතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. එතුමා ගෙනාවේ point of Order එකක් නොවෙයි. [බාධා කිරීම්] කිසිසේත්ම එතුමා ගෙනාවේ point of Order එකක් නොවෙයි. එතුමා පිළිතුරු දෙන්නයි අවස්ථාව ඉල්ලුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මම ඒක නැවැත්වුවේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මන්ත්‍රීවරයෙකුට කොහොමද පිළිතුරු දෙන්න අවස්ථාවක් දෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුරු දෙන්න නොවෙයි. Point of Order එකක් දුන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පිළිතුරු දෙන්න ඕනෑ අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්. හැබැයි, ඔබතුමා පිළිතුරු දෙන්න අවස්ථාව දුන්නා, මන්ත්‍රීවරයෙකුට. කොහොමද මන්ත්‍රීවරයෙකුට උත්තර දෙන්න අවස්ථාව දුන්නේ? [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, දැනට ප්‍රශ්නවලට පැයක කාලයක් ගත වෙලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න ඕනෑ ඇමතිවරයෙක්. මන්ත්‍රීවරයෙකුට බැහැ ඒකට උත්තර දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] Order, please! කරුණාකරලා වාඩි වෙන්න. [බාධා කිරීම්] Order, please!

කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොවි බිම්: විස්තර
கிளிநொச்சி மாவட்ட விவசாய நிலங்கள்: விபரம்
AGRICULTURAL LANDS IN KILINOCHCHI DISTRICT: DETAILS

1185/'16

3. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්මය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කමත්තොழිල් අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) கிளிநொச்சி மாவட்டத்தில்,

(i) 1983ஆம் ஆண்டளவில் செய்கைபண்ணப்பட்ட மொத்த விவசாய நிலங்களின் அளவு யாது;

(ii) 1982 மற்றும் 1983ஆம் ஆண்டுகளில் செய்கை பண்ணப்பட்ட விவசாய நிலங்களின் அளவு ஒவ்வொரு பயிருக்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் 2009ஆம் ஆண்டில் யுத்தநிலைமை முற்றுப்பெறும்வரை செய்கை பண்ணப்பட்ட மொத்த நிலங்களின் அளவு ஒவ்வோராண்டுக்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(iv) யுத்தநிலைமை முற்றுப்பெற்ற பின்னர் இற்றைவரை செய்கைபண்ணப்பட்ட விவசாய நிலங்களின் அளவு ஒவ்வோராண்டுக் கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முழுமையான அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House, in respect of the Kilinochchi District -

(i) the extent of agricultural land that was under cultivation by the year 1983;

(ii) the extents of land cultivated in the years 1982 and 1983, separately in respect of each crop in each year;

(iii) the total extent of cultivated land in each year after 1983 up until the end of the war situation in 2009, separately;

(iv) the total extent of cultivated agricultural land after the end of the war situation up until now in each year, separately; and

(v) whether he will table a full report on all above?

(b) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1983 වර්ෂයේ කිලිනොච්චිය, දිස්ත්‍රික්කයක් ලෙස වෙන් වී නොතිබූ අතර එය යාපනය දිස්ත්‍රික්කය යටතේ පැවතිනි. එබැවින් 1983 වර්ෂයේ කිලිනොච්චි දිස්ත්‍රික්කයට අදාළ දත්ත වාර්තා වී නොමැත.

(ii) ඉහත (i) පිළිතුරම අදාළ වේ.

(iii)

වර්ෂය	වර්ෂය තුළ වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)
1984	9,168
1985	27,077
1986	28,512
1987	20,485
1988	23,483
1989	23,606
1990	20,674
1991	5,912
1992	17,593
1993	20,147
1994	25,459
1995	22,020
1996	15,531
1997	4,452
1998	3,305
1999	4,400
2000	2,333
2001	12,150
2002	16,867
2003	16,791
2004	27,377
2005	28,495
2006	25,481
2007	23,832
2008	21,876
2009	-
එකතුව	447,026

(iv)

වර්ෂය	වර්ෂය තුළ වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)
2010	2,004
2011	33,417
2012	35,555
2013	32,734
2014	26,547
2015	34,119
2016	29,665
එකතුව	194,042

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනුවෙන් අපි දැනටමත් පැයකට වඩා වැඩි කාලයක් අරගෙන තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මම මේ පිළිබඳව ඊයේත් පාර්ලිමේන්තුවේ අවධානය යොමු කළා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට අද හරි මේ ප්‍රශ්නයට පිළිතුරක් දිය හැකි ද කියලායි මම අහන්නේ. ඊයේ අහපු ප්‍රශ්නයට සමාන්තර ප්‍රශ්නයක් තමයි මේ අසා තිබෙන්නේ. ගොවීන්ට ගෙවන වගා වන්දි ප්‍රමාදය පිළිබඳව මම ඊයේ පාර්ලිමේන්තුවේදී ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් විමසුවා. ගොවීන්ට ගෙවන වගා වන්දි ප්‍රමාදය පිළිබඳව කිලිනොච්චිය දිස්ත්‍රික්කයේත් වාර්තා වෙනවා ද? මොනරාගල දිස්ත්‍රික්කයේ ගොවීන්ට වගා වන්දි ගෙවීමේ ප්‍රමාදය සහ පොහොර සහනාධාර නිසි කලට නොලැබීමේ ප්‍රමාදය පිළිබඳව මම ඔබතුමාට ඊයේ පෙන්වා දුන්නා. මේ පිළිබඳව ඉතා කඩිනමින් පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතුයි. මේ පිළිබඳව ඔබතුමාට දැන්වත් මේ පාර්ලිමේන්තුව දැනුවත් කළ හැකිද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය වෙනම ප්‍රශ්නයක් විධියට ඇහුවොත් ඒ සංඛ්‍යාලේඛන අරගෙන මට පිළිතුරු සපයන්න පුළුවන්. දැනට මේ ප්‍රශ්නයට පිළිතුර ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ, ඒ සංඛ්‍යාලේඛන මේ පිළිතුරට ඇතුළත් කරලා නැති නිසා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, එහෙම නම් හෙට හරි ඒ පිළිතුර ඉදිරිපත් කරන්න පුළුවන්ද? හෙටත් මෙවැනිම ප්‍රශ්නයක් අහන්න තිබෙනවා නේ.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ඔබතුමා හෙට ඒ ප්‍රශ්නය අහන්න. මම ඒ සංඛ්‍යාලේඛන ලබාගෙන වගා වන්දි පිළිබඳ උත්තරයක් දෙන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමාට පුළුවන්ද මොනරාගල ඇතුළු ඒ අදාළ දිස්ත්‍රික්කවල වගා වන්දි,- [බාධා කිරීමක්]

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
අමාත්‍යාංශයෙන් ඒ අවශ්‍ය විස්තර මම ගන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පොහොර සහනාධාරය නිසි කලට නොලැබීම පිළිබඳ ගැටලු තිබෙනවා. මම අහන්නේ, නිසි කලට වගා වන්දි දුන්නා ද, දුන්නා නම්, කොයි තරම් ප්‍රමාණයකට දීලා තිබෙනවාද කියලායි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ඒ ප්‍රශ්නයට පසුව උත්තරයක් දෙන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මේ ප්‍රශ්නයට අදාළ නොවුණත්, දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් මේ ගැන අහන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේදී අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ඔබතුමන්ලාගේ කෘෂිකර්ම අමාත්‍යතුමා පසු ගිය කාලයේ පාර්ලිමේන්තුවට ආවේ නැහැ.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්පුමිකු வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
කෘෂිකර්ම ඇමතිතුමා මේ වන විට විදේශගත වෙලා ඉන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒක හරි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුන්ළතු]
[Expunged on the order of the Chair.]

අතර ලොකු ඓතිහාසික සම්බන්ධයක් තිබෙනවා නේ. මේ වන විට කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලියට ගෙන තිබෙන ගොඩනැඟිල්ලට කෝටි ගණනක් ගෙවමින් තිබෙනවා. ඔබතුමන්ලා ඇයි ඒ ගොඩනැඟිල්ලට යන්නේ නැත්තේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අදාළ නොවන කොටස් අපි හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහලා අවසන්ද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මම අහන්නේ කෝටි ගණනක් ගෙවන ඒ ගොඩනැඟිල්ලට තවම යන්නේ නැත්තේ ඇයි කියලායි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු කථානායකතුමනි, එතුමා අහලා තියෙන ප්‍රශ්නයට මේ අතුරු ප්‍රශ්නය අදාළ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන් කර තිබෙන කාලය දැනටමත් අවසන් වෙලා තිබෙනවා. පැයකටත් වඩා වැඩි කාලයක් දැන් ඒ වෙනුවෙන් අරගෙන තිබෙනවා. අපි පක්ෂ නායක රැස්වීමේදී ඒ සම්බන්ධයෙන් තීන්දුවක් අරගෙන තිබෙනවා, "වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා පැයකට වඩා කාලය ගන්නේ නැහැ." කියලා. අනවශ්‍ය ලෙස අපි කාලය නාස්ති කළොත්, වැදගත් ප්‍රශ්න ඉදිරිපත් කරන්න තිබෙන වේලාවයි නැති වෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ ඉතා වගකීම් සහගත ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අසන ලද අතුරු ප්‍රශ්නය, මෙම ප්‍රශ්නයට අදාළ වන කරුණක් නොවෙයි. එම නිසා එම කාරණා පිළිතුරේ ඇතුළත් වෙලා නැහැ ගරු මන්ත්‍රීතුමා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මම අතුරු ප්‍රශ්නයක් අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. අතුරු ප්‍රශ්න අහන්නට ඕනෑ මේ ප්‍රශ්නයට අදාළව නේ. එතුමා පිළිතුරු දෙන්නෙ නැත්නම් මට බල කරන්න බැහැ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා එය පිළිගන්නවා. නමුත් මම ඇහුවේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා එයට පිළිතුරු දෙන්න බැහැ කියනවා නම් මම මොනවා කරන්නද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මම පොහොර සහනාධාරය ගැන ඇහුවා. වගා වන්දි ගැන ඇහුවා. ඒ වාගේම දිගටම මේ කාරණය අහනවා, නමුත් ඒ සම්බන්ධව උත්තරයක් නැහැ. උත්තර නැති නිසාත්, ඒ ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවට එන්නෙත් නැති නිසා තමයි මම මේ අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අවසානයි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
එතුමා අහන්නේ සබීතාගේ building එක ගැන.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මෙතැනට අවශ්‍ය නැහැ. [බාධා කිරීම්] Order, please! වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න සඳහා වෙන් වූ පැයක කාලය අවසන් වී තිබෙන නිසා ඉතිරි ප්‍රශ්න හතර සභාගත කරන්නට සභාව එකඟද? විපක්ෂයෙනුත් එයට එකඟත්වය ලැබෙනවාද? ගරු සභානායකතුමා.

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව ප්‍රශ්න හයක් අසන්නට තිබෙනවා. එයට සභාවේ එකඟත්වය දෙන්න. එච්චරයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණයක් ගත්තා. අපි ඒ තීරණය අනුව කටයුතු කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය සභාව තීරණය කරන්න ඕනෑ. එච්චරයි. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)
ගරු කථානායකතුමනි, ප්‍රශ්න තුනකටම කල් ඉල්ලා තිබෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න තුනකට කල් ඉල්ලනවා?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ප්‍රශ්න අංක 6ට පිළිතුර සභාගත කළ හැකියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4, 5, 6, 7, 8 තිබෙනවා. [බාධා කිරීම්] මට මේ කාරණය පහදා දෙන්න අවස්ථාව දෙන්න. අපි පසුගිය දින පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී අවස්ථා දෙකකදීම තීරණය කළා වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීම පැයක් ඇතුළත කරන්න ඕනෑ එහෙම නැත්නම් ඒ ප්‍රශ්න සහ පිළිතුරු සභාගත කරන්න ඕනෑ කියලා. එහි යම් වෙනසක් කරනවා නම් ඒක සභාව තීරණය කරන්න ඕනෑ. ඒ පිළිබඳ මට තීරණය කරන්න බැහැ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුමා මන්ත්‍රීතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ඒ තීරණය සභාවේ නිරෝගීභාවයට ඉතාම අහිතකර විධියට බලපානවා. ඊයේ දිනයේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 15ක් තිබුණා. එතකොට පළමුවන කාරණය, පැයකදී ප්‍රශ්න 15ක් සඳහා උත්තර ලබා දුන්නොත්, එක ප්‍රශ්නයකට විනාඩි 5කටත් වඩා අඩු කාලයක් ලැබෙන්නේ. දෙවන කාරණය තමයි, ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්න ඇසීම ඇතුළත් වුණු අද වාගේ දවසක,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ගණන අඩු කරලායි තිබෙන්නේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අද වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 8ක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වෙනදාට ප්‍රශ්න 14ක් හෝ 15 තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
නමුත් ගරු අගමැතිතුමාගෙන් අසන ප්‍රශ්න පිළිබඳව දීර්ඝව සාකච්ඡාවට භාජනය වනවා. ඒ නිසා ඒක සාධාරණ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, අපි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම පවත්වා තීරණයක් ගන්න ඕනෑ. ඒක ඔබතුමන්ලා තීරණය කරන්න ඕනෑ. එච්චරයි. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රශ්න අහන්නේ නැහැ, කථා පවත්වනවා. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද? [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ගරු අමාත්‍යවරයෙකුගෙන් ප්‍රශ්නයක් අසන්නට තිබෙන අයිතිය, මන්ත්‍රීවරුන්ගේ අයිතියක්.

දැන් ඔබතුමන්ලා තීරණය කර තිබෙන විධියට, පැයක කාලය තුළ අසා නිම කරන්න බැරි වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ටිකට අදාළ පිළිතුරු සභාගත කරනවා. එහෙම කරන්න බැහැ. එහෙම නම්, අඩු ගණනේ ඊළඟ දිනයේදීවත් එම ප්‍රශ්න ටික අහන්න අයිතිය දෙන්න ඕනෑ. නැත්නම් අපට අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක පක්ෂ නායක රැස්වීමේදී ගත් තීරණයක්. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් එදා සිටියා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එම තීරණය නිසා අපට අතුරු ප්‍රශ්න අහන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ.

ගරු ටී. රංජීත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු මන්ත්‍රීවරුන් 225ක් පාර්ලිමේන්තුවේ ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරමින්, එදා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාත් හිටියා. එතුමාත්, විපක්ෂ නායකතුමාත් ඇතුළු සියලුම පක්ෂ නායකයෝ එක්ව තමයි එම තීරණය ගත්තේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පක්ෂ නායක රැස්වීමට ගරු මන්ත්‍රීවරු- [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ ගරු සභාව විශේෂයෙන්ම රැස් වෙන්නේ නීති සම්මත කරන්න, මුදල් වෙන් කර ගැනීම් සම්මත

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

කරන්න. ඊට අමතරව, අපට ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්, ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න පුළුවන්. හැම රටකම පාර්ලිමේන්තුවල ප්‍රශ්න ඇසීම සඳහා යම් කාල සීමාවක් වෙන් කරලා තිබෙනවා. ප්‍රශ්න සියල්ලම ඉදිරිපත් කරන්නේ නැහැ. අපේ පාර්ලිමේන්තුවේ සමහර වෙලාවට පැය තුනක් පමණ ගත කරනවා, ප්‍රශ්න අහන්න. වැදගත් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම ඒ පිළිබඳව සාකච්ඡා කරන්න වෙලාව නැහැ. එංගලන්ත පාර්ලිමේන්තුවේ නම් ප්‍රශ්න ඉදිරිපත් කළාම පිළිතුරු දෙන්න පුළුවන් ප්‍රශ්න ලොතරැයි ක්‍රමයකින් තෝරා ගන්නවා. [බාධා කිරීම්] අනෙක් ප්‍රශ්න,- [බාධා කිරීම්] මෙතැන ඇවිල්ලා කෑ ගහලා හරියන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා ඉගෙන ගන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරන අය ඒවා ගැන දන්නේ නැහැ. ඒ නිසා කෑ ගහනවා. මම කිව්වේ, එංගලන්තය වාගේම හුහක් රටවල පාර්ලිමේන්තුවේ කටයුතු කෙරෙන ක්‍රමයයි. ප්‍රශ්න ඉදිරිපත් කළාම ලොතරැයි ක්‍රමයකින් තමයි පිළිතුරු දෙන ප්‍රශ්න තීරණය කරන්නේ. අනෙක් ප්‍රශ්නවලට වෙනම පිළිතුරු දෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමා ගත්ත තීරණය නිවැරදියි. අපි ඒ අනුව ක්‍රියා කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද අනවශ්‍ය විධියට වෙලාව නාස්ති කළා. ආදර්ශවත් විය යුතු තැනක අනවශ්‍ය විධියට වෙලාව නාස්ති කරලා, කථා කරන්න තිබුණු අවස්ථාව නැති වුණා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වීකට උත්තර දෙන්න පැයක් ඇතුළත බැරි නම්, ඊළඟ දවසේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අපි හෙට කථා කරන්නම්.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම නැති කරන්න එපා. ඉතිරි ප්‍රශ්න ඊළඟ දවසේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මෙතුමාට අවස්ථාව දීලා මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එක කාරණයක් පමණයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, මොකක්ද කාරණය සභානායකතුමා?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා ගරු අගමැතිතුමාගෙන් අහපු ප්‍රශ්නය, පිටු හතරක්. [බාධා කිරීම්] පිටු හතරක්. ඒක විහිළුවක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වැරැදියි. මම ඒක දන්නවා. අපි ඒක හදන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අගමැතිතුමාගෙන් අහපු ප්‍රශ්නය, පිටු හතරක්. එහෙම ප්‍රශ්න අහන්න පුළුවන්ද?

இன்றைய காலகட்டத்தில் எங்களுடைய மக்கள் பல்வேறு இழப்புகளைச் சந்தித்து அதிலிருந்து தப்பிக்கொள்ள முடியாத ஒரு நிலையில், மீள்எழுச்சி பெற முடியாத ஒரு நிலையில் வாடிக்கொண்டிருக்கிறார்கள். அப்படிப்பட்ட மக்களுக்குச் சிறந்த நிர்வாகிகள் கிடைக்கின்றபோதுதான் சிறந்த பலாபலன்கள் கிடைக்கும். ஆனால், பணத்தின் பக்கமாகச் சாய்ந்துகொள்கின்ற நிர்வாகிகள் - பணத்திற்கு அடிமையாகின்ற நிர்வாகிகளைப் பொறுத்தமட்டில் அவர்கள் மூலமாக எந்தவொரு மக்கள் மீட்பு செயற்பாடுகளையோ, மக்கள் எழுச்சி செயற்பாடுகளையோ, மக்களுக்கு நிவாரணமளிக்கின்ற செயற்பாடுகளையோ செய்யமுடியாது. உங்களைப் போன்ற நல்லதோர் அமைச்சரிடம் இந்த நிர்வாகக் கட்டமைப்புகளை மறுசீரமைக்கின்ற அல்லது புனருத்தாரணம் செய்கின்ற செயற்பாடு ஒப்படைக்கப் பட்டிருக்கின்றது. எனவே, உங்களுடைய காலத்திலே சிறந்த நிர்வாகிகள் நாடெங்கிலும் செயற்படுவதற்கு ஏற்ற விதத்தில் உங்களுடைய நல்லாட்சி முறையின்கீழ் நல்ல செயற்பாடுகளை முன்கொண்டு செல்லவேண்டுமென்று இந்த வேளையிலே நான் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

அதேவேளை, உங்களிடம் நான் இன்னுமொரு விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். நீண்டகாலமாகச் சில பிரதேச செயலகங்கள் குறிப்பாக சிறிய பிரதேச செயலகங்கள் பரப்பளவு கூடிய நிலையில் காணப்படுகின்றன. அதேவேளையில் 3 பிரதேச பகுதிகளை உள்ளடக்கக்கூடிய பெரிய பிரதேச செயலகங்களும் காணப்படுகின்றன. குறிப்பாக மட்டக்களப்பை எடுத்துக்கொண்டால், ஏறாவூர்ப்பற்று என்ற பிரதேச செயலகமானது மிகவும் விஸ்தீரணமான ஒரு பிரதேச செயலகப் பிரிவாகக் காணப்படுகின்றது. அந்தப் பிரதேசத்தில் யுத்தத்தால் பாதிக்கப்பட்ட கரடியனாறுப் பகுதிக்கு உட்பட்ட பிரதேசங்களுக்கு வினைத்திறன்மிக்க நிர்வாகத்தை ஏற்படுத்தி, யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களை மீட்டுக்கொள்வதற்கு ஏற்ற விதத்தில் அந்த இடத்தில் புதியதொரு நிர்வாக அலகை - பிரதேச செயலகத்தை அமைக்க வேண்டிய ஒரு தேவையிருக்கின்றது.

அதேபோன்று, களுவாஞ்சிக்குடி, வெல்லாவெளி, கிரான் போன்ற பிரதேசங்களும் இவ்வாறு பாரிய நிலப்பரப்பையும் அதிகளவு மக்கள் எண்ணிக்கையையும் கொண்ட பிரதேசங்களாகக் காணப்படுகின்றன. அதேவேளையில் குறைந்த நிலப்பரப்பையுடைய பிரதேசங்களும் குறைந்த எண்ணிக்கையான மக்களைக் கொண்ட பிரதேச செயலகப் பிரிவுகளும் காணப்படுகின்றன. ஆனால், மக்களின் அபிவிருத்தி விடயத்தில் சிறிய பிரதேச செயலகப் பிரிவுகளுக்கும் பாரிய பிரதேச செயலகப் பிரிவுகளுக்கும் வழங்கப்படுகின்ற நிதி மூலங்கள் ஒரேயளவாகவே இருக்கின்றன. குறிப்பாக 24 கிராம உத்தியோகத்தர் பிரிவுகளைக் கொண்ட பிரதேச செயலகப் பிரிவுகளும் காணப்படுகின்றன; 43 கிராம உத்தியோகத்தர் பிரிவுகளைக் கொண்ட பிரதேச செயலகப் பிரிவுகளும் காணப்படுகின்றன. இந்த இரண்டு பிரதேச செயலகப் பிரிவுகளுக்கும் சம அளவான நிதிகளை ஒருக்குகின்றபோது சில பிரதேசங்கள் வளர்ச்சியடைந்துகொண்டு போகும், சில பிரதேசங்கள் வளர்ச்சியில் மந்தமான தன்மையை எதிர்கொள்ளும். எனவே, இந்தக் காலத்தில் மாற்றங்களை எதிர்பார்த்துக் கொண்டிருக்கின்ற மக்களுக்கு மாற்றங்களை ஏற்படுத்திக் கொடுக்கக்கூடிய விதத்தில் உங்களுடைய வினைத்திறன் மிக்க சேவையானது மிகவும் துரிதமாக முன்னெடுக்கப்பட வேண்டும். அதன்மூலமாக எங்களுடைய மக்களுக்கு மீட்சியை ஏற்படுத்திய சிறந்த அமைச்சராக, மக்கள் மனங்களைக் கவர்ந்த ஓர் அமைச்சராக நீங்கள் மிளிரவேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Okay.

அதேபோன்று, சில கிராம சேவையாளர் பிரிவுகள் பெரிய நிலப்பரப்பைக் கொண்டதாகக் காணப்படுகின்றன. உதாரணமாக காஞ்சிரங்குடா கிராம சேவகர் பிரிவைக் குறிப்பிடலாம். எனவே, இந்தப் பிரதேச செயலகப் பிரிவுகளை அளவோடு வகுத்து, அந்தப் பிரதேசத்திலுள்ள மக்களுக்கு ஒரு சிறந்த சேவை கிடைப்பதற்கு ஆவன செய்யவேண்டுமென்று கூறி, எனது உரையினை நிறைவுசெய்கின்றேன். நன்றி.

[අ.භා. 2.51]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ අල්ලස් හෝ දූෂණ විරෝධී හඬ ලෝකයේ ප්‍රධාන රැල්ලක් විධියට විසිර යමින් පවතිනවා. වර්තමානයේ බොහෝ රටවල ජනතාව රාජ්‍ය බලය වෙනස් කළේ, බඩු මිල අඩු කරන්න කියලාවත්, රැකියා ලබා දෙන්න කියලාවත් නොවෙයි. මිනිසුන්ගේ එවැනි පෞද්ගලික අභිමතාර්ථ ඉටු කර ගැනීමට නොවෙයි, දූෂණය සහ අල්ලස රටින් තුරන් කරන්න කියලා තමයි ආණ්ඩු වෙනස් කළේ. මේ නිසාම දේශපාලන බල තුලනයේදී අල්ලස් හෝ දූෂණ විරෝධී හඬ ප්‍රධාන බලවේගයක් විධියටයි පැන නැඟුණේ.

2015 ජනවාරි 08වැනි දා වුණත් මේ රටේ ජනතා විප්ලවය ඇති වුණේ අල්ලස සහ දූෂණය පිළිබඳ විරෝධතා මතයි. පසු ගිය රජයේ ජනාධිපතිවරයා බොහොම ප්‍රබල ජනාධිපතිවරයකු වුණා; ජනතාවගේ ජාතිවාදය අවුස්සාගෙන විශේෂයෙන්ම ජිනීවාවල විදුලි පුටුව ගැන වාගේම එල්ලුම්ගහ ගැන කථා කළා; ජනතාවගේ ජාත්‍යාලය ඇවිස්සුවා. අනෙක් පැත්තෙන් නොපෙනෙන සංවර්ධනයක් ගැන කථා කරලා හුඹස් සංවර්ධනයක් මවා පාලා පෙන්නුවා. නමුත්, ජනතාව ඒ කිසිම දෙයකට රැවටෙන්නේ නැතිව ඒ ජනාධිපතිවරයා ඉවත් කළේ විශේෂයෙන්ම අල්ලස සහ දූෂණය රජ කරපු නිසායි. වර්තමාන රජය මෙය තේරුම් අරගෙන කටයුතු කළා. අල්ලස් හා දූෂණ මැඩලීමේ යන්ත්‍රණය වර්තමාන රජය ශක්තිමත් කළා. අකර්මන්‍ය වී තිබූ ලංකාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සක්‍රීය කළා. ඒ සඳහා නව පණක් ලබා දුන්නා. එය දේශපාලන අතකොළුවක් නොවී ස්වාධීනව කටයුතු කරන ආයතනයක් බවට පත් කළා. උත්තරීතර පාර්ලිමේන්තුවේ අද දින සාකච්ඡාවට බඳුන් වන්නේත් වර්තමාන රජය ශක්තිමත් කළ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතාගට රජයේ ඒකාබද්ධ අරමුදලින් මාසික වැටුප් දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගැනීමටයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ අංක 16.(2) වගන්තිය අනුව කටයුතු කිරීමක් තමයි අද මේ පාර්ලිමේන්තුවේ සිදු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස හෝ දූෂණය මේ රටේ සමස්ත ජනතාවගේ ආර්ථිකයට වක්‍රව හෝ සෘජුව බලපාන කාරණයක්. විශේෂයෙන්ම අපි දන්නවා පසු ගිය රාජ්‍ය පාලන කාලයේදී ලබා ගත් මුදල්, ණය ගෙවීමටත් මදි වුණා කියලා. ඒ කියන්නේ රාජ්‍ය පාලනය කිරීම සඳහා අය කර ගත් මුදල විදේශ ණය ගෙවීමටවත් ප්‍රමාණවත් වුණේ නැහැ. ණය අරගෙන තමයි විදේශ ණයත් ගෙවිවේ. මේවාට මූලික වුණේ විශේෂයෙන්ම අල්ලස සහ දූෂණය එදා රජ කිරීමයි.

ඒ වාගේම අපි දන්නවා, එදා රට කරවපු ආදායමෙන් සියයට 90ක් ම බදු මුදල් බව. සියයට 90ක් වූ බදු මුදල්වලින් තමයි රට කළේ. එදා රාජ්‍ය ආයතන අකාර්යක්ෂම වෙලායි තිබුණේ. රට කරවන ආදායමෙන් සියයට 90ක් වූ බදු මුදල්වලින් සියයට 80ක් අය කරගත්තේ දුප්පත් ජනතාවගෙන්. දුප්පත් ජනතාවට නොදන්වා පික්පොකැට් ගහපු බදුවලින් තමයි -වක්‍ර බද්ද මඟින් තමයි- එම ප්‍රමාණය අය කරගත්තේ. ධනවත් අය -බොහෝ මුදල් උපයන්නන්- බදු හැටියට ගෙව්වේ සියයට 20යි. අල්ලස හා දූෂණයේ බර, අනිවාර්යයෙන්ම නොදැනුවත්වම රටේ සාමාන්‍ය ජනතාවගේ කර පිටට වැටෙන දෙයක්.

ඒ විතරක් නොවෙයි, පසු ගිය කාලයේ ඇරඹූ උමා ඔය ව්‍යාපෘතිය දිහා බැලුවත් එහෙමයි. ඒ සම්බන්ධයෙන් විශාල ජන විරෝධතාවක් තිබෙනවා. "සයිටම්" එක දිහා බැලුවත් එහෙමයි. ඒ සම්බන්ධයෙනුත් ජන විරෝධතාවක්, වෛද්‍යවරුන්ගේ විරෝධතාවක් පැන නැඟී තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මීතොටමුල්ල කුණු කන්ද දිහා බැලුවත් එහෙමයි. ඒ සම්බන්ධයෙනුත් ජනතාවගේ විශාල විරෝධතාවක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. ඩෙංගු වසංගතය ගෙන බැලුවත් එහෙමයි. අද කුණු අදින කටයුත්ත කරන්නේ නැහැ. ඒ ආදි නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. පසු ගිය රජය කාලයේ පැවැති අල්ලස සහ දූෂණය නිසා, විවිධ වැරැදි තීන්දු ගැනීම නිසා ඇති වූ ඒ ඔක්කෝම ප්‍රශ්න වර්තමානයේ මේ රජයේ සහ විශේෂයෙන් රටේ ජනතාවගේ කර පිට පැටවුණු බරක්, ශාපයක් ලෙස අපි දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පසු ගිය කාලය ගෙන බැලුවොත්, ලංකා විදුලිබල මණ්ඩලයේ වර්ෂයක පාඩුව රුපියල් කෝටි 1,330යි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩුව වර්ෂයකට රුපියල් කෝටි 777යි. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ පාඩුව වර්ෂයකට රුපියල් කෝටි 1,064යි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ වසරක පාඩුව රුපියල් කෝටි 3,235යි. මිහින් ලංකා ගුවන් සමාගමේ වසරක පාඩුව රුපියල් කෝටි 256යි. රාජ්‍ය වැවිලි සංස්ථාවේ වසරක පාඩුව රුපියල් කෝටි 22යි. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වසරක පාඩුව රුපියල් කෝටි 13යි. සීනි සමාගමේ වසරක පාඩුව රුපියල් කෝටි 3යි. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වසරක පාඩුව රුපියල් කෝටි 18යි. ලංකා ධීවර සංස්ථාවේ වසරක පාඩුව රුපියල් කෝටි 8යි. ශ්‍රී ලංකා ධීවර නිෂ්පාදන ආයතනයේ වසරක පාඩුව රුපියල් කෝටි 4යි. කෘෂිකාර්මික හා ගොවි ජන රක්ෂණ මණ්ඩලයේ වසරක පාඩුව රුපියල් කෝටි 194යි. ඒ සම්පූර්ණ පාඩුව විඳින්න සිද්ධ වුණේ මේ රටේ අහිංසක ජනතාවටයි. මේ සියල්ල -ලාභ ලබන්න පුළුවන් ආයතන සියල්ල- පාඩු ලැබීම නිසා ජනතාව පිට බර පැටවුණේ විශේෂයෙන් අල්ලස සහ දූෂණය නිසාය කියන කාරණය ජනතාවට අලුතින් කියන්න දෙයක් නොවෙයි කියා මම හිතනවා. ඒ නිසාම තමයි පැවැති රජය වෙනස් වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ඇවිත් තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත සම්මත කළා. අපි දන්නවා, ඒ සම්බන්ධයෙන් යන්ත්‍රණයක් නිර්මාණය කරන්න ඕනෑ බව. අල්ලස හා දූෂණය නැති කරන්න නම්, අල්ලස සහ දූෂණය කරන අයට නඩු දමලා, ඒ වැරැදිකරුවන්ට දඬුවම් දීම විතරක් නොවෙයි, එතැනින් ඔබ්බට ගිය යන්ත්‍රණයක් මේ රට තුළ ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ හින්දාම තමයි තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුව සම්මත කළේ. විශේෂයෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිය ලබා දුන්නාම, මේ රටේ සියලු මුදල් පරිහරණය පිළිබඳව, මූල්‍ය භාවිතය පිළිබඳව, රාජ්‍ය මුදල්වලට මොකද වෙන්නේ කියන එක පිළිබඳව දැන ගන්න පුළුවන්. ඒ නීතිමය අයිතිය ජනතාවට ලබා දෙන්න පාර්ලිමේන්තුව කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. අල්ලස් දීමක් හෝ දූෂණයක් ගැන දැනගත්තාම එය වැරැදියි කියලා එයට විරුද්ධව හඬ නැඟීමේ නිදහස අපි මිනිසුන්ට ලබා දුන්නා. ඇති තරම් හඬ නහන්න, විරෝධතා ඉදිරිපත් කරන්න, නඩු දමන්න, උද්ඝෝෂණය කරන්න අවශ්‍ය නිදහස අපි ලබා දුන්නා. නමුත් අපි දැක්කා එදා මේ විධියට හඬ නැඟුවා නම් මොකද වුණේ කියලා. එදා තොරතුරු දැනගැනීමේ අයිතියක් ජනතාවට තිබුණේ නැහැ. කොහෙන් හෝ තොරතුරු දැනගෙන ජනතාව හඬ නැඟුවා නම්, ඔවුන් මරා දැමුවා. මාධ්‍ය වාර්තාකරුවන් 44 දෙනෙකු පසු ගිය ආණ්ඩුව කාලයේ මරලා දැම්මා.

ඒ විතරක් නොවෙයි. එදා අතුරුදහන් වූ ගණන කියා නිම කරන්න බැහැ; පහර කෑ ගණන කියා නිම කරන්න බැහැ. ඒ වාගේ තත්ත්වයක් තුළ තමයි පසු ගිය කාලයේ කටයුතු කළේ. නමුත් අපි ජනතාවට අවශ්‍ය නිදහස ලබා දී තිබෙනවා. අල්ලස් ගන්නන්ට සහ දූෂණ කරන්නන්ට දඬුවම් දීම විතරක් නොව එවැනි වාතාවරණයක් ඇති නොවීමට කටයුතු කරන්න අවශ්‍ය නිදහස, යන්ත්‍රණය පවා නිර්මාණය කර තිබෙනවා. මෙහිදී අප දකින විශේෂ දෙයක් තිබෙනවා. ඒ හදපු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙහි සාමාජිකයන් පත් කරන්න ජනාධිපතිවරයාට බැහැ. එහි සාමාජිකයන් පත් කරන්න අග්‍රාමාත්‍යවරයාට බැහැ. එහි සාමාජිකයන් පත් කරන්න විෂයය භාර අමාත්‍යවරයාට බැහැ. එයත් කරන්න ඕනෑ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්. ඒක ස්වාධීන සභාවක්; ස්වාධීන කමිටුවක්. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයන් පවා එම සභාව මඟින් පත් කරන යන්ත්‍රණය නිර්මාණය කරලායි තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අධිකරණ සේවා කොමිෂන් සභාව නිර්මාණය කළා. මොකද, එදා ජනතාවට විශ්වාසයක් තිබුණේ නැහැ, අධිකරණය ගැන.

ඒ විතරක් නොවෙයි, අපි ජාතික පොලිස් කොමිෂන් සභාව නිර්මාණය කළා. මොකද, එදා පොලීසි දේශපාලන කාර්යාල බවට පත්වෙලායි තිබුණේ. පොලීසිය කරන දේ හරියි කියලා එදා රටේ ජනතාවට විශ්වාසයක් තිබුණේ නැහැ. නමුත් අද එම නිලධාරින්ට ස්වාධීනව, තමන්ගේ හෘද සාක්ෂිය අනුව කටයුතු කරන්න පුළුවන් වාතාවරණය අපි ලබා දුන්නා. ඒ වාගේම, විගණන සේවා කොමිෂන් සභාව අපි ඇති කළා. ඒ අනුව නිදහසේ රාජ්‍ය මූල්‍ය වියදම් සියල්ලම අධීක්ෂණය කිරීමට, නියාමනය කිරීමට අවස්ථාව ලබා දුන්නා. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඇති කළා. ඒ තුළින් ජනතාවට නිදහසේ තමන්ගේ ආගම් ඇදහීමට, ජනතාවට නිදහසේ කථා කිරීමට, ජනතාවට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට අවකාශය ලබා දුන්නා. ඒ වාගේම ප්‍රසම්පාදන කොමිෂන් සභාව අපි ඇති කළා. ඒ අනුව මේ රටේ විවිධ කොන්ත්‍රාත් කටයුතු කිරීමේදී ටෙන්ඩර් ක්‍රමය අනුගමනය කරමින් දේශපාලන අතකොළු නොවී කටයුතු කරන්න අවස්ථාව ජනතාවට හිමි කර දුන්නා. අපි මෙවැනි යන්ත්‍රණයක් නිර්මාණය කර දුන්නා.

පසු ගිය කාලයේ අපි ජනතාවට කිව්වා රුපියල් 10,000කින් පඩි වැඩි කරනවාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වසර 2020 වන විට රාජ්‍ය සේවකයාගේ පඩිය රුපියල් 10,000කින් නොවෙයි, දැන් ලබන පඩිය වාගේ දෙගුණයකින් වැඩි වන විධියට ඒ යන්ත්‍රණය නිර්මාණය කර තිබෙනවා. එතකොට ඒ අයගේ විශ්‍රාම පාරිතෝෂිකය තිබුණා වාගේ දෙගුණයක් වෙනවා; විශ්‍රාම වැටුප තිබුණා වාගේ දෙගුණයක් වෙනවා. ඒ විතරක් නොවෙයි, අපි සමෘද්ධිලාභියාගේ සහනාධාරය දෙගුණ කළා.

විශේෂයෙන්ම පසු ගිය කාලයේ වුණු දූෂණය, වංචාව, අල්ලස නිසා මේ රටේ යන්ත්‍රණය කඩාගෙන වැටීම තුළින් අහිංසක දුප්පත් ජනතාව මත බර පැටවුණ නිසා තමයි අපි ඒවා කරන්න හේතු වුණේ. ඒ නිසාම තමයි මේ ආණ්ඩුව ආවාට පසුව මෙවැනි ක්‍රියා මාර්ග ගත්තේ. ඩීසල්, පෙට්‍රල්, භූමිතෙල්, ගෑස් වාගේ දේවල්වල, කිරිපිටි වාගේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල අඩු කළා. සමෘද්ධිලාභියාට දෙන දීමනාව දෙගුණ කළා. ඒ කාලයේ ලංගම සේවකයාට පඩි ගෙව්වේ නැහැ. අපි ඒ අයගේ පඩි ගෙව්වා; පාරිතෝෂික දීමනා ගෙව්වා. අපි මේ සියලු කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස, දණ්ඩ නීති සංග්‍රහය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් ලෙස නීතිගත කළේ බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේයි. 1833දී තමයි අල්ලස් ගැනීම, දඬුවම් ලැබිය යුතු වරදක් විධියට මේ රටේ නීතිගත කළේ. 1954දී අල්ලස් පනත ශ්‍රී ලංකාවේ නීතිගත වීම මඟින් 1958 අංක 40 දරන පනත යටතේ අල්ලස් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමට හැකියාව ලැබුණා. 1974 අංක 19 දරන පනතේ විධිවිධාන අනුව අල්ලස් වැරැදි සම්බන්ධයෙන් නඩු පවරන ලෙස විධානය කිරීම සඳහා මෙම කොමිෂන් සභාව පිහිටෙව්වා. මෙම කොමිෂන් සභාව පිහිටෙව්වාට පසු ගිය කාලය තුළ එය අකර්මණ්‍ය වෙලා තිබුණු නිසා, එයට හරිහැටි සාමාජිකයන් පත් කර ගන්න බැරිවීම නිසා රටේ දූෂණය, වංචාව ඉහවහා ගිහිල්ලා තිබුණා. ඒ නිසා තමයි අද අපට ඒ පව් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ. සමහර අයගේ සල්ලි තිබෙන්නේ පිටරටවල. ණය ගත්තාය කිව්වාට, ඒ ණය ලංකාවට ඇවිල්ලා නැහැ. ඒවා පිටරටවල බැංකුවල තැන්පත්වෙලා තිබෙනවා. මේවා සොයන්න ගියාම පිටරටවලට ඇඟිලි ගැසීමේ හැකියාව මොකක්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ඒ නිසා මේවා ගැන කටයුතු කරන්න විශේෂ පොලිස් ඒකක පිහිටුවන්න අපට සිද්ධ වුණා. මෙවැනි ප්‍රශ්න විසඳා ගන්නවා වාගේම වර්තමානයේ එවැනි ප්‍රශ්න නැවත ඇතිවීම වැළැක්වීම සඳහා ඒවා ගැන සොයන්න බලන්න, ප්‍රශ්න කරන්න "කෝප්" කමිටුව වාගේ කමිටුවල බලය අපි විපක්ෂයට භාර දුන්නා. පසු ගිය කාලයේ ඒවා තිබුණේ රජයේ හිතෛෂී ඇමතිවරයකු යටතේයි. නමුත් ඒවායේ සභාපතිකම විපක්ෂයට භාර දීලා රජයෙන් ප්‍රශ්න කිරීමේ හැකියාව ඇති කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ගරු අගමැතිතුමාගෙන් ඍජුව ප්‍රශ්න කිරීමේ හැකියාව අපි ලබා දුන්නා. ඒ වාගේම 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව ඇති වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට වෙන් කළ කාලය නම් අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියනවා, අල්ලසින් හා දූෂණයෙන් තොර රටක් නිර්මාණය කිරීම සඳහා නීතියෙන් දඬුවම් පමුණුවනවා වාගේම, ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රණය මේ රට තුළ ස්ථාපිත කිරීම මඟින්, අනාගතයේ යහපත් රටක් බිහිවීමට අවකාශය නිර්මාණය කිරීම නූපන් පරම්පරාවට පවා සැනසිල්ලක් වනු ඇතැයි විශ්වාස කරමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අනුර දිසානායක මැතිතුමා.

[අ.භා. 3.03]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. මම දැන් ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරන්නට ලෑස්තියි. අපේ රටේ ඛනිජ තෙල් විකුණන ආයතන දෙකක් තිබෙනවා. ඒ Lanka IOC සහ තෙල් සංස්ථාව. එයින් Lanka IOC එක ලාභ ලබනවා; තෙල් සංස්ථාවත් ලාභ ලබනවා. අපේ රටේ ප්‍රවාහනයට පෞද්ගලික අංශය සම්බන්ධ වෙනවා. පෞද්ගලික බස් රථ හිමියන් ලාභ ලබනවා. නමුත් SLTB එක පාඩු ලබනවා. අපේ රටේ

[ගරු අනුර දිසානායක මහතා]

වෙළෙඳපොළට පෞද්ගලික අංශයේ supermarkets සම්බන්ධ වෙනවා. ඔවුන් ලාභ ලබනවා; සතොස පාඩු ලබනවා. අපේ රටේ මාධ්‍ය ක්ෂේත්‍රයේ රූපවාහිනී නාලිකා තිබෙනවා. ඒ රූපවාහිනී නාලිකාවලින් පෞද්ගලික රූපවාහිනී නාලිකා ලාභ ලබනවා. නමුත්, ආණ්ඩුවේ රූපවාහිනී නාලිකා පාඩු ලබනවා. අපේ රටේ වරාය කටයුතුවල පෞද්ගලික ජැටි තිබෙනවා. ඒ පෞද්ගලික ජැටිය ලාභ ලබනවා. නමුත්, සමස්ත ලෙස ගත්තොත් ආණ්ඩුවේ වරාය පාඩු ලබනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මෙතැන සිදු වෙලා තිබෙන ප්‍රධානම දේ තමයි, අකාර්යක්ෂමතාව, තීන්දු ගැනීමේ දුබලතාව, අල්ලස සහ දූෂණය. මේ අල්ලස සහ දූෂණය මැඩ පැවැත්වීම වෙනුවෙන් ප්‍රධානම ආයතනයක් ලෙස තමයි 'අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව' පිහිටුවා තිබෙන්නේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධයෙන් ඉතා වැදගත් සංශෝධනයක් ඇතුළු කළා.

ඒ අනුව දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධයේ "VIIඅ පරිච්ඡේදයේ 41ආ.(6) යටතේ මෙසේ සඳහන් වනවා:

"මැතිවරණ කොමිෂන් සභාව හැර මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය."

ඒ කියන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවත් පාර්ලිමේන්තුවට වගකිව යුතුයි, ඒ වාගේම එම කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට පිළිතුරු දීමට බැඳී සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය 2016 අවුරුද්දේ නොවැම්බර් මාසයේ 24වෙනි දා තමයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ එතෙක් සිටි අධ්‍යක්ෂ ජනරාල්තුමිය වූ දිල්රුක්ෂි ඩයස් මහත්මිය ඉවත් කොට මේ නව අධ්‍යක්ෂ ජනරාල්තුමා පත් කරනු ලැබුවේය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමිය යටතේ ආණ්ඩුව වර්තමානයේ නියෝජනය කරන අමාත්‍යවරයෙකුට විරුද්ධව නඩුවක් පැවරූ බව මා ඉතා වග කීමෙන් කියනවා. ෆවුසි රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා ඇති, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් එක් අමාත්‍යවරයෙකුට විරුද්ධව නඩුවක් පැවරුවා, තව අමාත්‍යවරු තිදෙනෙකු පිළිබඳව පරීක්ෂණ කටයුතු සිදු කරමින් තිබුණු බව. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් අපේ රටේ බලගතු නිලධාරීන් ගණනාවක් පිළිබඳවත් පරීක්ෂණ සිදු කරමින් තිබුණා. ඒ වාගේම යම් මන්ත්‍රීවරු ගණනාවක් පිළිබඳවත් පරීක්ෂණ සිදු කරමින් තිබුණා. ලංකාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පළමු වතාවට අමාත්‍යවරු, මන්ත්‍රීවරු සහ නිලධාරීන් ගණනාවකට එරෙහිව පරීක්ෂණ සිදු කරමින් තිබුණා. ඒ සමහර පරීක්ෂණ අවසන් අදියරට ඇවිල්ලා තිබුණා. නමුත්, ජනාධිපතිවරයා සෘජුව මැදිහත් වී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමිය මාරු කළා. දැන් නව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කරලා මාස හතකට ආසන්න කාලයක් ගත වෙමින් තිබෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුවම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ පාර්ලිමේන්තුවට පිළිතුරු ලබා දීමට බැඳී සිටිනවා. දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් මේ පාර්ලිමේන්තුවට කියන්න ඕනෑ, 2016 නොවැම්බර් මස 24වන දා සිට අද දක්වා නඩු කීයක් ගොනු කරලා තිබෙනවාද, සිදු කරමින් තිබුණු පරීක්ෂණවල තත්ත්වය කුමක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි ලෙසම මෙතැන සිදු වී තිබෙන දේ තමයි, හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමිය ඉවත් කොට නව අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු පත් කිරීම නිසා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කාර්යක්ෂමතාව මුළුමනින්ම බිඳ වැටීමට තමුන්නාන්සේලා කටයුතු කිරීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කළා යැයි කියා අද පුවත් පත්වල වාර්තා වෙලා තිබෙන ලිපියක් මා දැක්කා. එතුමා එසේ ප්‍රකාශ කළාද කියා මා දන්නේ නැහැ. නමුත්, පුවත් පත එසේ වාර්තා කර තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවත්, පොලිස් දෙපාර්තමේන්තුවත් මාස තුනකට එතුමා යටතට පත් කරන්නේ නම්, මේ වංචනිකයන්ට සහ දූෂිතයන්ට දඬුවම් දෙන්න මාස තුනක් ප්‍රමාණවත් කියලා ජනාධිපතිවරයා කිව්වා කියලා එහි සඳහන් වනවා. ජනාධිපතිවරයා මේ කියන්නේ කුමක්ද? ජනාධිපතිවරයා මේ කියන්නේ, වර්තමානයේ නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම දරන අමාත්‍යවරයාත්, වර්තමානයේ පොලිස් දෙපාර්තමේන්තුවේ වගකීම දරන අමාත්‍යවරයාත් මේ කටයුතුවලට බාධා කරන බව නොවෙයිද? එහෙම නම්, පළමුකොටම ජනාධිපතිවරයාට නිසි ගෞරවය සහ වගකීම තිබෙනවා නම්, ඒ අමාත්‍යවරු කරුණාකරලා ඒ ආයතන ජනාධිපතිවරයාට පැවරිය යුතුව තිබෙනවා.

මා දන්නේ නැහැ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජනාධිපතිවරයාට ඒ ඔක්කෝම භාර ගන්න පුළුවන්ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙසේ වුවත් මේ ආයතන භාරව සිටින ඇමතිවරු වග කීමක් සහිත, යම් ගෞරවයක් සහිත ඇමතිවරු නම් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුයි. ජනාධිපතිවරයා විසින් මේ කියා තිබෙන්නේ කුමක්ද? ජනාධිපතිවරයා පොලීසිය භාර අමාත්‍යවරයාට දී තිබෙන පණිවුඩය වන්නේ, "මේ වංචනිකයන්ට සහ දූෂිතයන්ට එරෙහිව ඔබ පොලිස් දෙපාර්තමේන්තුව මෙහෙය වන්නේ නැහැ" කියන එකයි. නීතිපති දෙපාර්තමේන්තුව නියෝජනය කරන අමාත්‍යවරයාට ලබා දී තිබෙන පණිවුඩය වන්නේ "ඔබ වංචනිකයන්ට සහ දූෂිතයන්ට දඬුවම් ලබා දීම වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව නිසි පරිදි මෙහෙය වන්නේ නැහැ " කියන එකයි. එම පණිවුඩය අද ජනාධිපතිවරයා විසින් ලබා දීලා තිබෙනවා. එම නිසා ජනාධිපතිවරයාම පෙන්නුම් කොට තිබෙනවා, මේ ආයතන අද දුර්වල කරලා තිබෙනවා කියලා. ඒ ආයතන පමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙම වංචා දූෂණ පිළිබඳව කටයුතු කරන්න දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයකුත් පිහිටෙව්වා. එම ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු කාලය මේ ජූනි මාසයේ 30වෙනි දායින් අවසන් වුණා. ජූනි මාසයේ 30වෙනි දායින් පසුව ඒ අය කරන්න ඕනෑ මොකක්ද? අග්‍රාමාත්‍ය ලේකම්වරයා යටතේ තමයි මේ ආයතනය තිබුණේ.

"ජූනි මාසයේ 30 වැනිදායින් මේ කාලය අවසන් වූවාට පසුව කරන්නේ කුමක්ද?" කියලා අවස්ථා ගණනාවකදී අග්‍රාමාත්‍ය ලේකම්වරයාගෙන් ලිඛිතව විමසා සිටියත් එතුමා මොකක්වත් කියන්නේ නැහැ. නමුත් ජූනි මාසයේ 30 වැනිදායින් පස්සේ එම ආයතනයට වැඩ කටයුතු කිරීමට බලයක් නැහැ. එම ආයතනයේ සියලුම නිලධාරීන්, එම ආයතනය සතු දේපළ, ලිපි ගොනු සහ එම ආයතනයේ තිබුණු කාර්ය භාරය මුළුමනින්ම ඉවත් කරලා දොරවල්වලට යතුරු දමා තිබෙනවා. දැන් ඒ යතුරු බාර දෙන්නේ කාටද? මේ ආයතනයට වෙන්නේ මොකක්ද කියලා දන්නේ නැහැ. ආයතනයේ යතුරු පොලීසියට ගිහිල්ලා බාර දීලා, එළියට බැහැලා එනවා. වංචා, දූෂණ පිළිබඳව සොයන්න තමුන්නාන්සේලාට තිබෙන වුවමනාවද මෙයින් පෙන්නුම් කරන්නේ? අඩු තරමින් එම දූෂණ මර්දන කමිටු ලේකම්

කාර්යාලයේ නිලධාරින්ට කියන්න ඕනෑ, "ජූනි මාසයේ 30 වැනිදායින් ඔබතුමන්ලාගේ කාලය අවසන්. නියමිත පරිදි ලිපි ගොනු බාර දෙන්න. ඔබතුමන්ලා සතුව තිබෙන දේපළ බාර දෙන්න. ඔබතුමන්ලා කලින් වැඩ කරපු ආයතනවලට යන්න" කියලා. අඩු තරමින් ඒ ටික කියන්නේත් නැහැනේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ වෙනුවට කරමින් සිටින්නේ මොකක්ද? ඒ කටයුතු අඩාල වෙන්න, ඔහේ කඩා වැටෙන්න ඉඩ හැරලා තිබෙනවා. ජූනි මාසයේ 30 වැනිදායින් පස්සේ ඒ නිලධාරින් කරන්නේ මොකක්ද කියලා ඇහුවාට කියන්නේත් නැහැ. පොලීසියට යතුරු බාර දීලා එන්න ඔවුන්ට අද සිදුවෙලා තිබෙනවා. ජනාධිපතිවරයා විසින් පෙන්නුම් කරලා තිබෙන්නේත්, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට මේ අත් කරලා තිබෙන ඉරණම විසින් පෙන්නුම් කරලා තිබෙන්නේත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අකර්මණ්‍ය කිරීම හරහා පෙන්නුම් කරලා තිබෙන්නේත් මොකක්ද? තමුන්නාන්සේලාට තිබෙන්නේ වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් ලබා දීමේ වුවමනාවක් නොවෙයි, වංචනිකයන් සහ දූෂිතයන් ආරක්ෂා කිරීමේ වුවමනාවක් බවයි. ඒක තමයි මේ ආණ්ඩුව විසින් සිදු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව පොලිස් දෙපාර්තමේන්තුව මෙහෙය වන්නේත්, නීතිපති දෙපාර්තමේන්තුව මෙහෙය වන්නේත්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරින් මාරු කරන්නේත්, දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය වසා දමන්නේත් මොකක් වෙනුවෙන්ද? දූෂිතයන්ට දඬුවම් ලබා දීම වෙනුවෙන්ද? නැහැ. තමුන්නාන්සේලා දූෂිතයන් ආරක්ෂා කරනවා පමණක් නොවෙයි, දූෂිත පාලනයක් බවට පත්වෙලා තිබෙනවා. වංචාවන්ට හවුල් වෙච්ච මේ ඉදිරි පෙළ අසුන්වල සිටින ඇමතිවරුන්ගේ නම් ගම් සහිතව මට කියන්න පුළුවන්. [බාධා කිරීමක්] රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිවරයා මගෙන් අහනවා, "ඒ කවුද?" කියලා. මම ඔබතුමාට මේ කාරණා ගැන කියන්නම්. මහාමාර්ග අමාත්‍යවරයාගේ ව්‍යාපෘති දිහා බලන්න. ඒවා පෙනෙන්නේ නැද්ද? මගෙන් රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිවරයා අහනවා, "කවුද?" කියලා. රවි කරුණානායකගේ ප්‍රාඩෝ ගනු-දෙනුව පිළිබඳව අහන්න කියා මා කියනවා. මගෙන් රන්ජන් රාමනායක අහනවා, "ඒ කවුද?" කියලා. ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යවරයා විසින් සිදු කළ හරක් බෙදීම ගැන අහන්න. තමුන්නාන්සේ ඔතැන වාඩි වෙලා ඉන්නේ කොහොමද කියලා කියන්න මම දන්නේ නැහැ, රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමනි. හොරුන් එක්ක වාඩි වීමත් හොරුන් ආරක්ෂා කිරීමක් බව ඔබතුමා මතක තබා ගන්න. රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යවරයා මේ ගැන මගෙන් අහපු නිසායි මම මේවා කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැදුම්කර ගනු-දෙනුව ආරක්ෂා කළ කෙනා කවුද? අග්‍රාමාත්‍යවරයා. වෙන කවුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව දූෂිතයන්ට දඬුවම් දීම නොව, දූෂිතයන්ගෙන් ගහන වෙච්ච පාලනයක් බවට පත් වී තිබෙනවා. දූෂිතයන්ගෙන් ගහන වෙච්ච පාලනයක් විසින් තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව අකර්මණ්‍ය කරන්නේ; දූෂිතයන්ගෙන් ගහන වෙච්ච පාලනයක් විසින් තමයි පොලිස් දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය කරන්නේ; දූෂිතයන්ගෙන් ගහන වෙච්ච පාලනයක් විසින් තමයි නීතිපති දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය කරන්නේ; දූෂිතයන්ගෙන් ගහන වෙච්ච පාලනයක් විසින් තමයි දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය අහෝසි කර දමන්නේ. ඒ නිසා තවදුරටත් මේ රටේ වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් ලබා දීමේ සදාචාරාත්මක අයිතිය තමුන්නාන්සේලාට නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොරෙකුට දඬුවම් ලබා දෙන්න පුළුවන්කම තිබෙන්නේ හොරෙක් නොවෙන කෙනෙකුටයි. හොරෙක් කොහොමද තවත් හොරෙකුට දඬුවම් ලබා දෙන්නේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හොරෙකුට දඬුවම් දීමට නම් වැදගත්ම සාධකය තමයි හොරකම් නොකර සිටීම. තමන් හොරකම් කරමින් තව හොරෙකුට දඬුවම් ලබා දීම සඳහා මේ ආණ්ඩුවෙන් අපි පාලනයක් බලාපොරොත්තු විය යුතුද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුළුමනින්ම වංචනිකයන්ගෙන්, හොරුන්ගෙන් ගහන වෙච්ච පාලනයක් මේ රටේ ගොඩ නැඟිලා තිබෙනවා. ඊට අදාළව තිබෙන ආයතන මුළුමනින්ම අකර්මණ්‍ය කරමින් තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මේ කාරණා වෙනුවෙන් වග කියන්න, පිළිතුරු ලබා දෙන්න පාර්ලිමේන්තුවට බැඳී සිටිනවා. 2016 නොවැම්බර් මාසයේ 24 වැනිදා වනකොට අවසන් වී තිබුණු පැමිණිලි ප්‍රමාණය කොච්චරද? පරීක්ෂණ කවර ආකාරයකින් තිබුණාද, ඉන් පසුව නඩු කීයක් ගොනු කළාද කියලා මම දැනගන්න කැමැතියි. මේ සියල්ල අත් හරිමින්, මේ සියලු ආයතන දුර්වල කරමින් තිබෙන පාලනයක් තිබෙනවා. එවැනි පාලනයක් තබාගෙන අපට ඇවිල්ලා කියනවා, "අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් වැඩි කරලා දෙන්න" කියලා. වැටුප් වැඩි කරන්න අවශ්‍ය නම් ඒ වැටුපට අනුව වැඩ කරන්න. එසේ නැතිව මේ පාර්ලිමේන්තුව විසින් වැටුප් වැඩි කිරීමෙන් ඇති ඵලය කුමක්ද කියලා විමසමින් මම මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඊළඟට, (ආචාර්ය) හර්ෂ ද සිල්වා නියෝජ්‍ය ඇමතිතුමාට තමයි කථා කරන්න අවස්ථාව තිබෙන්නේ. නමුත් වාසුදේව නානායක්කාර මැතිතුමා එතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ අනුව වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාට කථා කිරීම සඳහා අවස්ථාව ලබා දීමට එතුමා එකඟ වෙලා තිබෙනවා.

[අ.භා. 3.13]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් වැඩි කිරීමට අපගේ එකඟතාව පළ කිරීමට අපි කැමැතියි. එයට හේතුව, ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ බලවත් වර්ණනාවට පාත්‍ර වූ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මියගේ දඩයක්කාර යුගයෙන් පසු වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමා නැවතත් එම කොමිසමේ ගෞරවය ඇති කර තිබීමයි.

"දඩයක්කාර යුගය" කියන එකේ තේරුම තමන්ගේ දේශපාලන විරුද්ධවාදීන් දඩයම් කිරීමයි. වැරදිකාරයාද, නිවැරදිකාරයාද, සැකකරුවාද, නැද්ද කියන ඔක්කෝම පැත්තකින් තියලා "දේශපාලන විරුද්ධවාදියා" කියන එක මුල් කරගෙනයි - ඒක තමයි ප්‍රධාන කාරණය - කටයුතු ආරම්භ කළේ. අන්න ඒකට තමයි දේශපාලන විරුද්ධවාදීන් දඩයම - witch-hunt - කියා කියන්නේ. ඒ දඩයම පිළිබඳව එතුමිය ඉතා ලොකු දක්ෂතාවක් දැරුවා. ඒ නිසා එතුමියට විරුද්ධව හැම පැත්තෙන්ම විරෝධතා ආවා. ඒ විරෝධතා නිසා එතුමිය එම ධුරයෙන් ඉවත් කරන්නට යෙදුණා. ඒක සිදු වුණු හොඳ දෙයක්.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දේශපාලන විරුද්ධවාදීන් දඩයම් කරනවාය කියලා චෝදනාවක් නැහැ. කාටහරි විරුද්ධව යම් කිසි චෝදනාවක් තිබෙනවා නම්, නැත්නම් යම් කිසි සැකයක්, තොරතුරක් තිබෙනවා නම්, ඒ මත ඒ පුද්ගලයාට විරුද්ධව ක්‍රියා කරගෙන යාම ගැන කවුරුවත් විරුද්ධ වන්නේ නැහැ. නමුත් දේශපාලන විරුද්ධවාදීකමක් මුල් කරගෙන එය කළාම, ඒක දඩයමක් බවට පත් වෙනවා. වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමා එම ආයතනයට නැවතත් ගෞරවනීය නාමයක් ලබා දීම නිසා එතුමාගේ වැටුප් වැඩි කිරීම සඳහා අපි අපේ සහයෝගය ලබා දෙනවා.

දෙවන කාරණය මෙකයි. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා දිගින් දිගටම කියා ගෙන ගියා, දඬුවම් ලබා දීම ගැන. දඬුවම් ලබා දීම උසාවියේ කටයුත්තක්. අධ්‍යක්ෂවරුන්ට, එහෙම නැත්නම් නිලධාරීන්ට, පොලිස්පතිට බැහැ, දඬුවම් ලබා දෙන්න. දඬුවම් ලබා දෙන්න පුළුවන් උසාවියට විතරයි. දූෂණ මර්දන කමිටුව හැදුවේම දඬුවම් ලබා දෙන්නලු. ඒකෙන්ම තේරෙනවා, අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාත් එකතු වෙලා හදපු දූෂණ මර්දන කමිටුවේ අභ්‍යන්තර පරමාර්ථය, අභ්‍යන්තර අභිමතාර්ථය මොකක්ද කියලා. වරදකරුවන් යයි සැක කරන පුද්ගලයන් අධිකරණයට පැමිණවීම කියා කිව්වා නම් හරි. එහෙම නැතුව දූෂණ මර්දන කමිටුව තිබෙන්නේ දඬුවම් ලබා දීමට නම්, ඒකට උසාවිය බවටත් පත් වෙන්න පුළුවන්. මේ වාගේ කට පටලවා ගැනීම්වලින් වැළකෙන්න තරම් ජ්‍යෝෂ්ඨත්වයක් එතුමාට දැනට මේ පාර්ලිමේන්තුවේ තිබෙන බව මා කියන්න කැමැතියි.

ඊළඟට, මම අගමැතිතුමාට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් කළා, දැනට භය මාසයකට නුදුරු කාලයකදී. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා බොහොම බලවත් ප්‍රකාශයක් කළා, අගමැතිතුමා මේ බැඳුම්කර වංචාවේ හවුල්කරුවෙක්ය කියලා. අගමැතිතුමා ඒ බැඳුම්කර වංචාවේ හවුල්කාරයෙක්ය කියලා එතුමා දන්නවා නම්, එතුමා පැමිණිල්ලක් කරන්න ඕනෑ. මම පැමිණිල්ලක් කළා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට. ඒ පැමිණිල්ල කළේ, දැනට භය මාසයකට පමණ පෙර. ඒ පැමිණිල්ල කරලා දිගු කාලයකට පසුව -දැනට දෙමාසයකට පමණ පෙර- මගෙන් ප්‍රකාශයක් ලබා ගත්තා. ඒ ප්‍රකාශය ලබා ගන්නා අවස්ථාවේදී මගෙන් ඇහුවේ, මම මගේ පැමිණිල්ලේ සටහන් කර තිබුණු කරුණු ගැනමයි. මම ඒ ප්‍රකාශය ලබා දුන්නා. මගෙන් අලුත් ප්‍රශ්නයක් ඇහුවේ නැහැ. දැන් මම අහන ප්‍රශ්නය තමයි ඒ පැමිණිල්ලට ලැබිය යුතු ප්‍රමුඛත්වය කුමක්ද කියන එක. ඒ පැමිණිල්ල, මේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා ඉතිහාසයේ ප්‍රබලම පැමිණිල්ල බව මා එක හඬින් කියනවා. ඇයි? ලංකාවේ ආණ්ඩුවට වංචනික ලෙස මෙතරම් විශාල අලාභයක් සිදු කරපු වෙනත් අල්ලස් ගනු දෙනුවක් නැහැ. වංචනික ලෙස මේ තරම් අලාභයක් සිදු කරපු වෙනත් ගනු දෙනුවක් නැහැ. බැඳුම්කර - Bonds - දෙකයි, අලාභය රුපියල් බිලියන හතරකුත් ගණනක්; ක්ෂණික අලාභයක්. එය, දිගට ගණන් හැදුවාම පෙනෙන අලාභය නොවෙයි. මේක පොලී මං කොල්ලයක්. මේ පොලී මං කොල්ලයේ හවුල්කරුවෙක් හැටියට මම අගමැතිතුමාව නම් කළා. නිකම්ම නිකම් මෙතැන කියපු වචනයක් හැටියට, ප්‍රකාශයක් හැටියට නොවෙයි, මා එය සිදු කළේ. මම එතුමා නම් කළේ පැහැදිලි සාක්ෂි ඇතුවයි. පැහැදිලි සාක්ෂි ඇතුව ලේඛන දොළහකට වැඩි සංඛ්‍යාවක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මම භාර දුන්නා. දැන් එහි සිටින අධ්‍යක්ෂ ජනරාල්තුමාට මම ස්තුතිවන්ත වෙනවා. මම පමණක් නොවෙයි, මේ වාගේ අල්ලස් හෝ දූෂණ පැමිණිලි ගණනාවක් අපේ ඒකාබද්ධ විපක්ෂයෙන් සිදු කළා. ඒ හැමෝගෙන්ම මූලික ප්‍රකාශන ලබා ගෙන තිබෙනවා. වහාම පරීක්ෂණ සිදු කිරීම සඳහා මෙම පැමිණිල්ලට අද ප්‍රමුඛත්වයක් ලැබෙන්නට ඕනෑ. ඇයි? මේක තමයි ආණ්ඩුවට ලොකුම වංචනික අලාභයක් කරපු මහා පොලී මං කොල්ලය; මහ බැංකුව තුළ සිද්ධ කරපු මං කොල්ලය. එහෙම නම් මේකට තවම ප්‍රමුඛත්වයක් ලැබෙන්නේ නැත්තේ ඇයි? මෙම පරීක්ෂණයේ අනෙක් කටයුතු ගැන අපි දන්නේ නැහැ. මගෙන් ප්‍රකාශයක් ගත් බව මම දන්නවා. අගමැතිතුමාගෙන් ප්‍රකාශයක් ගත්තාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. [බාධා කිරීමක්] මම දන්නේ නැහැනේ. මට ඒ ගැන දැන ගැනීමට තිබෙන තොරතුරු දැන ගැනීමේ අයිතිය අනුවයි මම මේ අහන්නේ. අගමැතිතුමාගෙන් ප්‍රකාශයක් ගත්තාද? අගමැතිතුමාගෙන් ප්‍රකාශයක් ගත්තාට පසුව ගන්නා ඊළඟ පියවර කුමක්ද?

මේ තොරතුරු දැන ගන්න අපට අයිතියක් තිබෙනවා; පාර්ලිමේන්තුවට අයිතියක් තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ නොවෙයි, අණපනත් යටතේ මේ පාර්ලිමේන්තුව දැන ගත යුතුයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මොකද කරන්නේ කියලා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරන ස්වාධීන කොමිෂන් සභා මොකද කරන්නේ කියලා මේ පාර්ලිමේන්තුව දැනගත යුතුයි. එය දැන ගැනීමට අයිතියක් තිබෙනවා. මම මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ යම් පත් කිරීමක් අනුව පවතින්නා වූ එක්තරා කොමිසමක් ගැන ගරු කථානායකතුමා හරහා විමසීමක් කර ගත්තා. එම කොමිසම විසින් යම් ස්ථාන මාරුවක් කළා. මම ඇහුවා, "මේ ස්ථාන මාරුව කළේ ඇයි?" කියලා. මම මන්ත්‍රීවරයෙක් හැටියට එය දැන ගන්න ඕනෑ. මට කියලා එවා තිබුණා, "එම කොමිසමේ ස්වාධීනත්වයට ගරු කිරීමක් හැටියට මෙබඳු කරුණුවලට හේතු විමසන්නට බැහැ" කියලා. එතකොට කොහොමද, පාර්ලිමේන්තුවේ අයිතිය රැකෙන්නේ? පාර්ලිමේන්තුව කොහොමද දැන ගන්නේ ඇයි, යම් ස්ථාන මාරුවක් කළේ කියලා? එම ස්ථාන මාරුව දැනුවත්වම, පෙනුමටම යම් කිසි පළි ගැනීමක් නම්, යම් කිසි දේශපාලන හේතුවක් උඩ කරපු පළි ගැනීමක් නම්, ඒ ගැන මා තුළ චෝදනාවක් තිබෙනවා නම්, "මේ ස්ථාන මාරුව කළේ මෙන්න මේ සාධාරණ හේතු උඩයි" කියලා මට පෙන්නුම් කරන්නට එම කොමිසමට වගකීමක් තිබෙනවා. ඒක මගේ දැක්ම අනුව සාධාරණද, නැද්ද කියන එක වැඩක් නැහැ. එම කොමිසම මට කියන්නට ඕනෑ, "අපි මේක කළේ මෙන්න මේ හේතු නිසායි" කියලා. කොමිසමට කියන්න බැහැ, "ඒක අපෙන් අහන්න ඔබට අයිතියක් නැහැ" කියලා. මට ලැබුණු උත්තරය ඒකයි. කොමිසමෙන් මට කියලා එවා තිබුණා, "ඔබට මේක දැන ගන්න අයිතියක් ඇත්තේත් නැහැ; අපට මේක කියන්න යුතුකමක් ඇත්තේත් නැහැ" කියලා. මම ඒ සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට පැමිණිලි කළා. මම එම කොමිසමේ නම්, ගම් ගැන මේ වේලාවේ කියන්න යන්නේ නැහැ. ඉදිරි කාලයේදී මම ඒ තොරතුරු ඉදිරිපත් කරනවා. මට එවා තිබුණු උත්තරයේ "ඔබට මේක දැන ගන්න අයිතියක් නැහැ; ඒක අපේ අභිමතය" කියලා සඳහන් වී තිබුණා. ඒකද, අපට ලැබෙන්න ඕනෑ පිළිතුර? අපිට ඒ ගැන දැන ගන්න අයිතියක් නැද්ද? කිසියම් වූ සාධාරණ හේතු උඩ -කාලීන ස්ථාන මාරු අනුව, තිබෙන්නා වූ සාමාන්‍ය වැඩ පිළිවෙළ අනුව- මේ මාරුව කළා; එහෙම නැත්නම් මෙන්න මේ විශේෂ හේතු උඩ එය කළා කියලා අපට කියන්න බැරිද? ඒක මම පිළිගන්නවාද, නැද්ද කියන එක වෙනම කාරණයක්. නමුත් එය කීමට එම කොමිසමට යුතුකමක් නැද්ද?

මම මේ කියන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන නොවෙයි. අපේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නිලධාරී මහත්වරුන්ට නොවෙයි, මම මේ චෝදනාව කරන්නේ. එහි සභාපතිතුමා ඇතුළු අනෙක් අයට නොවෙයි, මේ චෝදනාව කරන්නේ. වෙනත් කොමිසමක් ගැනයි මම මේ කියන්නේ. නමුත් මේ පාර්ලිමේන්තුවට තිබෙන

අයිතිය, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට තිබෙන අයිතිය ගැනයි මම මේ කථා කරන්නේ.

මේ පාර්ලිමේන්තුවේ ආංශික අධීක්ෂණ කමිටු තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ කටයුතු ගැන විපරම් කරන්න අපිට ආංශික අධීක්ෂණ කමිටුවක් අවශ්‍ය නැද්ද?

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රගතිය ගැන දැනගන්නට පාර්ලිමේන්තුවට, අපට ආංශික අධීක්ෂණ කාරක සභාවක් අවශ්‍ය නැද්ද? එහෙම ආංශික අධීක්ෂණ කාරක සභාවක් නැහැ කියලායි මම තේරුම් ගෙන තිබෙන්නේ. අදාළ අමාත්‍යාංශයේ ආංශික අධීක්ෂණ කාරක සභා තිබෙනවා. ඒ වාගේම විවිධ කොමිෂන් සභා තිබෙනවා. ඒ කොමිෂන් සභා ස්වාධීන කොමිෂන් සභා. එම නිසා මේ ස්වාධීන කොමිෂන් සභා ගැන අපට විපරම් කරන්නට-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැනට තිබෙන්නේ මාස හයකට සැරයක් පාර්ලිමේන්තුවට වාර්තාවක් දීම පමණයි නේද, ගරු මන්ත්‍රීතුමා?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එච්චරයි තිබෙන්නේ. ඒ කොමිෂන් සභා වාර්තාවක් දෙනවා. ඒ වාර්තාව අපි සාකච්ඡා කරනවා; එච්චරයි. එහෙම නැතිව අපට විපරම් කිරීම සඳහා ආංශික අධීක්ෂණ කාරක සභාවක් නැහැ. එහෙම තිබිය යුතුයි කියලායි මම කියන්නේ. එතකොට අපි කවුරුත් මේ සභාවට ආවාම නොදන්නා තත්ත්වයට පත් වෙන්නේ නැහැ. ඒ කමිටුවලට සම්බන්ධ මන්ත්‍රීවරුන් අපේ පක්ෂයේත් ඉන්නවා. ඒ අය ඒ කමිටුවලට ගිහිල්ලා ඒ ගැන විපරම් කරලා දැනගෙන අපට කියනවා. එම නිසා මම හිතනවා එවැනි පියවරක් ගැනීම හොඳයි කියලා.

විශේෂයෙන්ම ස්වාධීන කොමිෂන් සභා මේ වන විට දක්වා තිබෙන ආකල්පය මේ පාර්ලිමේන්තුවේ ස්වෛරීභාවයට සහ උත්තරීතරභාවයට එතරම් ගැළපෙන්නේ නැහැ. ඒ අනුව පාර්ලිමේන්තුවට වඩා ඒ කොමිෂන් සභා උත්තරීතරයි කියලා මතයක් සමහර විට ඒ අය අතරේ තිබෙන්නට පුළුවන්. මම මේ සම්බන්ධයෙන් නිශ්චිත කරුණු දැක්වීමක් පසුව කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සහ මූල්‍ය අපරාධ විමර්ශන අංශයට පැමිණිල්ලක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා පාර්ලිමේන්තුවටද පැමිණිල්ල කරන්න යන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඇහුණේ නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ දවස්වල මම මහලු වයසේ, නැත මගේ-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, කථාව කරගෙන යන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වරායේ ඉඩම් ලංකා මැරයින් සර්විස් සමාගමට නොමිලයේ ලබා දීම ගැනත්, ඉතාම අඩු මුදලකට තෙල් ටැංකි විකිණීමේ ජාවාරම ගැනත් මම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මියට විරුද්ධව සුප්‍රීම් උසාවියේ නඩුවක් දැම්මා. ඒ නඩුවේදී සුප්‍රීම් උසාවිය කෙළින්ම තීන්දු කළා ඒක වංචනික ගනු - දෙනුවක් කියලා. ඒකේ වගඋත්තරකාරියක වුණේ, චිත්තිකාරියක වුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය. ඉන් පසුව ඒ ගනු - දෙනුව අවලංගු කළා. අවලංගු කරලා සුප්‍රීම් උසාවිය කිව්වා, "මේ වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ කළ යුතුයි. අල්ලස් හෝ දූෂණ කටයුතු සිදු වී තිබේ දැයි කියා සොයා බලන්න." කියලා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කිව්වා, "මේ පසු පස වංචනික ක්‍රියාකාරීත්වයක් තිබේ දැයි කියා සොයා බැලීමට පරීක්ෂා කරන්න." කියලා. මොකද, අපේ පැමිණිල්ල වුණේ මේක වංචනික ගනු - දෙනුවක් කියන එකයි. සුප්‍රීම් උසාවියට මූලික අයිතිවාසිකම් නඩුවක් යටතේ පුළුවන් වන්නේ මේක වංචනික ගනු - දෙනුවක්, මේ නිසා ආණ්ඩුවට ලොකු අලාභයක් සිදුවෙලා තිබෙනවා, එම නිසා ඒ ගනු - දෙනුව අවලංගුයි කියන්නට පමණයි. ඉන් පසුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවටත් ඒ නියෝගයම කළා. නඩු තීන්දුවෙන් පසුව ඊළඟ දිනයක ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව කැඳවන දිනයක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් ශ්‍රේෂ්ඨාධිකරණයට වාර්තා කළා දැන් අපි පරීක්ෂණ කරගෙන යනවා කියලා. ඉන් පසුව අවුරුදු පහක් ගතවෙලාත් ඒ ගැන මොකුත් වුණේ නැති තැන තමයි මම මේ පැමිණිල්ල අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් දෙන්නේ. ඉන් පසුව සුප්‍රීම් උසාවියට වැඩිදුර වාර්තාවක් දුන්නෙත් නැහැ. මම මේ පැමිණිල්ල ගිහින් දුන්නාට පසුව මට පිළිතුරක් එනවා මේක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විෂයක් නොවෙයි කියලා. දැන් මට මේක තේරෙන්නේ නැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට එන්න කියලා සුප්‍රීම් උසාවිය නියම කරනවා, මේ ගැන වැඩිදුර විභාගයක් පවත්වන්න.

"මේක වංචනික ගනු-දෙනුවක්. ආණ්ඩුවට අලාභයක් සිදු වෙලා තිබෙනවා. එම නිසා මම මේ ගනුදෙනුව අවලංගු කරනවා." කියලා මේ නඩුවේ තීන්දුවක් ලබා දීලා තිබෙනවා. මේ ගනුදෙනුව පසුපස තිබුණු අල්ලස, දූෂණය හෝ වංචාව පිළිබඳව විභාග කරන්නය කියලා තමයි නියෝග කළේ. එම නියෝගය අනුව ඒ විනිශ්චයකාරතුමා ඉන්නතුරු වාර්තා කිරීම් කරලා, ඉන් පසුව ඒක මහ හැරියා. මේ ගැන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගන්නා පියවර මොකක්ද කියලා අද මම අහනවා. මෑතදීත් මම ලිපියක් යැව්වා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට නැවත මතක් කිරීමක් කළා . ඒක කළේ වැඩි හොඳට. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමටත් එම ලිපියේ පිටපතක් යැව්වා කියලා මට මතකයි. මෙපමණ දීර්ඝ කාලයක් -අවුරුදු 6ක්, 7ක්- ගත වෙලා තිබෙනවා. හිටපු ජනාධිපතිවරිය වගඋත්තරකාරිය වූ නඩුවක වංචනික ගනු-දෙනුවක් තිබුණා කියලා මේ වන විට සුප්‍රීම් උසාවිය තීන්දුවක් ලබා දීලා තිබෙනවා. එතුමියට චෝටර්ස් එජ් නඩුවේදී ගෙවීමක් කරන්නත් නියම වුණා. මේක තවත් නඩුවක්. මට එතුමිය සමඟ පෞද්ගලික විරුද්ධත්වයක් නැහැ. මම අහන්නේ ඉහළ තැන්වලට යනකොට අල්ලස් හෝ දූෂණ විමර්ශන චෝදනා කොමිසම එන්න එන්න කුඩා වෙනවාද කියලායි. තනතුර, පුද්ගලයා ඉහළ යනකොට අල්ලස් හෝ දූෂණ විමර්ශන චෝදනා කොමිසමේ බලය එන්න එන්න අඩු වෙනවාද? මෙන්න මේක ප්‍රධාන ප්‍රශ්නයක් හැටියට අපි අද මතු කළ යුතුව තිබෙනවා. මෙවැනි පැමිණිලි ගණනාවක් අද මා සතුව තිබෙනවා. එක්කෝ මේ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

පැමිණිලි ගැන වැඩ කරන්නේ නැහැ. එහෙම නැත්නම් මේ පැමිණිලි වැරැදියි, බොරුයි කියලා පැමිණිලිකරුවන්ට විරුද්ධවයි වැඩ කරන්නේ. මේ දෙකෙන් ඕනෑ එකක් කරන්න පුළුවන්. වේලාව නැති නිසා පැමිණිලි ලැයිස්තුව දිගටම කියවන්න මම කැමැති නැහැ. නමුත්, මම දළ වශයෙන් කියාගෙන යන්නම්. මේ හැම එකකම මූලික ප්‍රකාශය ගත්තා. මූලික ප්‍රකාශය ගැනීම ගැන අලුත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට ස්තුතියි. නමුත්, ඊට පසුව මේ නඩුවලට මොකද වුණේ කියලා අපි දැන ගන්න කැමැතියි. මේක අල්ලස් හෝ දූෂණ විමර්ශන චෝදනා කොමිෂන් සභාවට අයිති රාජකාරියක්. ඒ වාගේම පැමිණිලිකරුට උනන්දුවක් තිබෙනවා. තමන්ගේ පැමිණිල්ලට මොනවාද වුණේ කියලා දැන ගන්න පැමිණිලිකරු උනන්දුයි. එම නිසා එහි ප්‍රගතිය පිළිබඳ දැනුවත් වීමට මේ පාර්ලිමේන්තුවට, ඒ වාගේම පැමිණිලිකරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් ඔහුට අයිතියක් තිබිය යුතුයි කියලා මම විශ්වාස කරනවා. බැඳුම්කරය හරහා සිදු වුණු මහ බැංකු පොලි මංකොල්ලය මම මතක් කරනවා. ප්‍රාඩෝ සහ බෙන්ස් රථ ගණනාවක් නියමිත බදු මුදල් අවලංගු කරලා, අඩු බදු මුදලකට රේගුවෙන් පිට කළා. එයට හේතු වූ පසු බිම අනුව කෙරුණු පැමිණිල්ල.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කාලය අවසන් වේගෙන එනවා.

Hon. Member, you are running out of time.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
I will finish quickly.

ඊළඟට, මහපොළ අරමුදල පිළිබඳ පැමිණිල්ල; විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ රක්ෂණයකට ගෙවූ මුදල ගැන කරපු පැමිණිල්ල; අගමැති, චරිත, කබීර් හාෂීම් ආදීන් සම්බන්ධ කර ගෙන ගුවන් යානා පිළිබඳව අපේ මන්ත්‍රීවරු කරපු පැමිණිල්ල, පී. හැරිසන් ඇමැතිතුමාගේ වී මගඩිය පිළිබඳ පැමිණිල්ල, රජයට රුපියල් මිලියන 6,500ක් පාඩු කරමින් වාහන කැබලි කර ගෙන්වා නැවත එකලස් කිරීමේ ජාවාරම පිළිබඳ පැමිණිල්ල, රාජිත සෞඛ්‍ය ඇමැතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්ගේ නාමයෙන් නැව් අටක් මිලදී ගැනීම පිළිබඳ පැමිණිල්ල, රාජිත ඇමැතිතුමා ඖෂධ සංස්ථාවට පත් කරපු ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාගේ මස්සිනා විසින් ඇති කරපු ඖෂධ සමාගමක් මහින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවට පිළිකා රෝග නාශක ඖෂධ ගෙන්වා ඒවායේ දුබලතාව පිළිබඳ වෛද්‍යවරුන්ගෙන් පැමිණිලි ලැබීම.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ගෙන්වන ලද ගල් අඟුරු තොගය පිළිබඳව උසාවියට කරන ලද පැමිණිල්ලත් සමඟ හෙළි වූ කරුණු රාශියක් තිබෙනවා. මේ කාරණයත් ප්‍රකාශ කරමින් මගේ කථාව දැන් මා අවසන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට නියමිත කාලය දැන් අවසන්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණය කිව්වා, "මේක දැක්කාම අධිකරණයේ හෘදය සාක්ෂිය කම්පනය වෙනවා, අපට තීන්දුවක් දෙන්න බැහැ. නමුත් මේක බරපතළ කාරණයක්. අඩු ලංසුවකට නොදී වැඩි ලංසුවකට මේ ගල් අඟුරු මිලදී ගැනීමෙන් වෙච්ච අලාභය බිලියන ගණනක් වෙනවා" කියලා. නමුත් ඒ ගැන අවසානය දක්වා කිසිම සොයා බැලීමක් සිදු වෙලා නැහැ. මේ ගැනත් කරුණු දක්වමින්, අද දින මේ වැටුප් වැඩි කිරීමේ යෝජනාවට අපි පක්ෂ වන අතර, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ ප්‍රගතිය දැන ගැනීමට පැමිණිලිකරුවන්ට හා මන්ත්‍රීවරුන්ට ඉඩක් ලබා දෙන්නය කියලා ඉල්ලමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමා.

[අ.භා. 3.35]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා බොහෝ වෙලාවක් චෝදනා ඉදිරිපත් කළා. එතුමා නොරොච්චෝලෙන් තමයි කථාව නැවැත්වූවේ. ඕනෑ නම් මටත් නොරොච්චෝලෙන්ම කථාව පටන් ගන්න පුළුවන්. නොරොච්චෝලය පිළිබඳව පැමිණිලි එකක් නොවෙයි, බර ගණනක් ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් අවුරුදු ගණනක් තිස්සේ සිදු වුණු ඒ දේ ගැන අපට සන්තෝෂ වෙන්න බැහැ. මම ඒ පිළිබඳව මෙතැනදී කථා කරන්න දැන් බලාපොරොත්තු වෙන්නේ නැහැ.

මේ ගෙනවිත් තිබෙන යෝජනාව කාලීනයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු එම නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීම සිදු කළ යුතුයි. ඒ සඳහා මන්ත්‍රීවරුන්ගේ කිසි විරුද්ධත්වයක් නැති බව අපට පෙනී යනවා.

අපේ රට දුප්පත් රටක් හැටියට තවම තිබෙන්නේ අපේ රට දූෂිත රටක් නිසායි. We are poor because we are corrupt. ඒක තමයි ඇත්ත. දූෂණය හැම තැනම තිබෙනවා. මම එක කාරණයක් ගැන කියන්න කැමැතියි. එය මම මේ දැන් මුහුණ දෙන ප්‍රශ්නයක්. කුණු ප්‍රශ්නයක් ගැන කථා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පක්ෂ භේදයක් පටලවා ගන්න නරකයි, මේ දූෂණය ගැන කථා කරන කොට. හොරු හැම පාටෙන්ම ඉන්නවා. හැම පාටෙන්ම -rainbow colours වලින්ම - හොරු ඉන්නවා. ඒක නිසා-

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ඔබතුමන්ලා ආණ්ඩුව ගත්තේ හොරකම නවත්වනවා කියලා නේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමනි, ඒ ගැන තමයි මම මේ කථා කරන්නේ. ඒකයි මම කියන්නේ පක්ෂ භේදයකින් තොරව

අපි හොරු අල්ලන්න ඕනෑය කියලා. මම මේ කියන්නේ දැන් සිදුවෙන දෙයක් ගැන කථාවක්.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
දැන් හොරු වැඩි වෙලා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ දවස්වල කුණු ප්‍රශ්නයක් තිබෙනවා. කුණු ප්‍රශ්නය ගැන බොහෝ විවේචන එල්ල වෙනවා. කුණු ගෙන යන්නේ නැහැ, කුණු දාන්න තැන් නැහැ. මම නියෝජනය කරන්නේ මේ පාර්ලිමේන්තුව පිහිටලා තිබෙන කෝට්ටේ ප්‍රදේශය. ඒක තමයි මම නියෝජනය කරන ඡන්ද කොට්ඨාසය. කෝට්ටේ පැත්තේ කුණු ප්‍රශ්නය ගැන කථා කරන කොට 2015 විගණකාධිපතිවරයාගේ වාර්තාව ගැන සඳහන් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කැමැතියි, එම වාර්තාවේ, කම්පැක්ටර් 06ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් සඳහන් වන මෙම පිටුව **සභාගත*** කරන්න.

මේ කුණු ගෙන යන්නේ කම්පැක්ටර් යන්ත්‍රවලින්. කම්පැක්ටර් යන්ත්‍ර කියන්නේ කුණු ලොරිවලට. මේ කුණු ලොරි ගන්න 2014 දෙසැම්බර් මාසයේ 20වැනි දා රුපියල් 52,920ක් වියදම් කරලා පත්තරවල දැන්වීමක් පළ කරලා තිබෙනවා. එහි මෙන්න මෙහෙම කියා තිබෙන බව මෙම විගණන වාර්තාවේ සඳහන් වනවා:

"පිළිගත් සැපයුම්කරුවන්ගෙන් හෝ නියෝජිත සමාගම් මඟින් (Brand New) වාහන/යන්ත්‍ර මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ."

නමුත් විගණකාධිපතිවරයා මෙතැන කියනවා, " 'කම්පැක්ටර් රථ මිලදී ගැනීම' යන්න කොහේවත් සඳහන් කරලා නැහැ" කියලා. ඒ කියන්නේ, කම්පැක්ටර් රථ ගන්නයි advertisement එක දැම්මේ; හැබැයි, ඒකේ තිබෙන්නේ, වාහන හා යන්ත්‍රෝපකරණ ගන්න කියලායි.

2015 අප්‍රේල් පළමුවැනි දා රුපියල් මිලියන 63ක් වියදම් කරලා එක ආයතනයකින් මේ යන්ත්‍ර හය අරගෙන තිබෙනවා. 2015 ජනාධිපතිවරණයේදී හිටපු ජනාධිපතිවරයා මාරු වෙලා සියලු දේ සිද්ධ වුණා. ගරු ලොහාන් රත්වත්තේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ආණ්ඩුවත් මාරු වුණා. මම මේ කථාව කියන්නේ මෙන්න මේ නිසායි. 2015 ආණ්ඩුව මාරු වෙන්න කලින් තමයි මේ advertisement එක දාන්නේ. නමුත්, මේ යන්ත්‍ර මිලදී ගන්නේ මේ ආණ්ඩුව කාලයේදීයි. මේ කථාවේදී මම පෙන්වන්න උත්සාහ කරන්නේ ඒකයි. මොකද වුණේ? සැපයුම්කරුවන් තිදෙනෙකු විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණා. අශෝක් ලේලන්ඩ්, ඉසුසු සහ හීනෝ වර්ගයේ කම්පැක්ටර් යෝජනා වෙලා තිබුණා. නමුත්, මෙම වාහන ලංකාවට ගෙන එන දේශීය නියෝජිතයන් වෙන්නේ, ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම, ටොයෝටා ලංකා සමාගම හා සතොස මෝටර්ස් ආයතනයයි. නමුත්, මොවුන්ගෙන් මෙම යන්ත්‍ර මිලදී ගැනීමට කිසි විධියකට මිල ගණන් කැඳවලා නැහැ. මොකද, ඔවුන් දන්නේ නැහැ, මේ මිල ගණන් කැඳවලා තිබෙන්නේ "කම්පැක්ටර්වලට" කියලා. අන්තිමට මොදක කළේ? Third party එකකින් මේ කම්පැක්ටර් යන්ත්‍ර ගත්තා. කීයදට ගත්තේ? එක කම්පැක්ටර් යන්ත්‍රයක් රුපියල් මිලියන 10.5 ගණනේයි අරගෙන තිබෙන්නේ. නමුත්, විගණකාධිපතිවරයා මේ වාර්තාවෙන් කියනවා, "අවුරුදු එකහමාරකට පස්සේ එතුමා quotation call කළා; එතකොට එක කම්පැක්ටරයක මිල රුපියල් මිලියන 6.7යි." කියලා. එක කම්පැක්ටර් යන්ත්‍රයක් රුපියල් මිලියන 6.7යි, නමුත්, ගත්තේ රුපියල් මිලියන 10.5කටයි. එතකොට මේ කම්පැක්ටර් 6 හරහා පමණක් රුපියල් මිලියන 23.25ක පාඩුවක් කෝට්ටේ මිනිසුන්ට වෙලා තිබෙනවා කියලා විගණකාධිපතිවරයා කියනවා. ආණ්ඩුව මාරු වෙන්න කලින් advertisement දාන්නේ. ආණ්ඩුව මාරු වුණාට පස්සේ තමයි මේවා ගන්නේ. ඒ විධියට බලන කොට මෙතැන තිබෙන්නේ ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවෙයි. මෙතැන තිබෙන්නේ ක්‍රමවේදයේ ප්‍රශ්නයක්. කවුද මේක පිටුපස ඉන්නේ? මේ වාගේ ප්‍රශ්නයකදී දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කරන්න හරි ලේසියි. ගොඩාක් වෙලාවට හැමෝම කියන්නේ, "අර දේශපාලනඥයා හොරා, මේ දේශපාලනඥයා හොරා" කියලායි. සමහර දේශපාලනඥයන් හොරු තමයි. නමුත්, ඇත්තටම බලනවා නම් සමහර නිලධාරිනුත් හොරු. දේශපාලනඥයාට විතරක් කියන්න බැහැ, "මෙන්න මේක කරන්න" කියලා. සමහර නිලධාරිනුත් දේශපාලනඥයන් එක්ක එකතු වෙලා තමයි මේක කරන්නේ. ඒ නිසා අපි දේශපාලනඥයන් ගැන වාගේම සමහර නිලධාරීන් පිළිබඳවත් සොයා බැලීමක් සිද්ධ කරන්න වෙනවා. මගේ ළඟ තව කරුණු රාශියක් තිබෙනවා කියන්න. ඒවා කියන්න දැන් වෙලාවක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
විගණකාධිපතිවරයා ඔය පෙන්වාදීම කළාට පස්සේ මොකද වුණේ?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මේ කාරණය ගැන මම දැනගෙන හිටියේ නැහැ. මේක කොළඹ කුණු ප්‍රශ්නයත් එක්ක ඇදිලා ආපු දෙයක්. මොකද, කුණු එකතු කරන කම්පැක්ටර් ගන්න තිබෙන සල්ලි කවුරු හරි මේ විධියට එක කම්පැක්ටර් එකකින් මිලියන 4 ගණනේ සාක්කුවේ දාගෙන තිබෙනවා නම්, -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
විගණකාධිපතිතුමාගේ වාර්තාව අනුව මේ ගනු-දෙනුව කර තිබෙන්නේ දේශපාලනඥයන් ද, නිලධාරීන් ද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමනි, මේ චෝදනාව එල්ල කරන්නේ කාටද කියලා විගණකාධිපති වාර්තාවේ නැහැ. එතුමා කියලා තිබෙන්නේ, "මෙන්න මේ වාගේ වංචාවක් සිද්ධ වෙලා තිබෙනවා" කියලායි. මේ විගණකාධිපති වාර්තාව පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට එනවා. මෙතැනින් ඒක අරගෙන ඉදිරියට විමර්ශනය කරගෙන යන්න ඕනෑ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම නම්, මේ කාරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගෙනියන්න පුළුවන් නේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මේ කාරණය මම ගෙනියනවා. ඒක තමයි මම මේ කියන්නේ. මම මේ සියල්ලම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සඳුදා දිනයේදී ඉදිරිපත් කරනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සමඟර විට අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඇති. එතුමාගේ දැන ගැනීමටයි මම මේ කියන්නේ. මම සඳුදාට මේ සියලු වාර්තා අරගෙන එනවා. මොකද, කුණු ප්‍රශ්න නිසා මිනිස්සු අපට බණිනවා නම්, කුණු හරහා මිනිස්සු දේශපාලනය කරනවා නම්, කුණු ගෙනියන වාහන මීලදී ගැනීමේදී වැඩිපුර ගෙවලා ඒ මුදල් සාක්කුවල දා ගන්නවා නම්, ඒ මිනිස්සුයි මේවාට වග කියන්න ඕනෑ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිතුමනි, අධ්‍යක්ෂ ජනරාල්තුමනි, ඔබතුමන්ලා මේක ගැන සොයා බලන්න. මේ ගැන හොයලා බලලා විතරක් මදි. මම මුළු රටටම කියන්නේ මෙවැනි දේවල් කරුණාකරලා අපට පෙන්වන්න කියලායි. මම මේ රජයේ ඉන්න නියෝජ්‍ය ඇමතිවරයෙක්.

මෙය, මේ අවස්ථාවේ සිද්ධ වන දෙයක්. එහෙම නම් ඔබතුමන්ලා පක්ෂ භේදයකින් තොරව, පක්ෂග්‍රාහී නොවී අපට පෙන්වන්න මේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියලා. ඒකයි අපි බය නැතුව කියන්නේ. අනික් කාරණය ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, COPE එක ගැන බලන්න. COPE එකේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. එතුමා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක්. ඔබතුමා බැඳුම්කර ගනු - දෙනුව සම්බන්ධයෙන් නොයෙකුත් චෝදනා කළා. නමුත් පසුගිය අවුරුදු දහය තුළ කිසි දවසක මෙහෙම සොයා බැලීමක් සිද්ධ වුණේ නැහැ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා එය පිළිගන්න. මම එදා පෞද්ගලිකව PAC එකට කොච්චර තොරතුරු ගෙනාවාද? මම එදා COPE එකේ හිටියේ නැහැ. "මෙතැන හොරකම වෙනවා; අතැන හොරකම වෙනවා." කිව්වා. නමුත් එදා හොයලා බැලුවාද? නැහැ. හොයලා බැලුවේ නැහැ. නමුත් ඔබතුමා පැමිණිල්ලක් ඉදිරිපත් කළා. ඒ පැමිණිල්ල පිළිබඳව ඔබතුමාට කථා කරලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කට උත්තර ගත්තා. ඒක හොඳයි. ඒක තමයි යහ පාලනය කියන්නේ. Presidential Commission එකට මටත් එන්න කිව්වා, බැඳුම්කර ගනු දෙනුව සම්බන්ධයෙන් ප්‍රශ්න කරන්න. මම ගියා. අපෙනුත් ප්‍රශ්න ඇසුවා. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාටත් කථා කළා. COPE එකේ මන්ත්‍රීවරු හැටියට සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාටත් මටත් කථා කළා. ඒක තමයි වෙන්න ඕනෑ. එතකොට තමයි ඇත්ත හොයා ගන්න පුළුවන් වෙන්නේ. හරිදේට හරි කියන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා COPE එක, PAC එක තිබුණේ රජයේ ඇමතිවරු යටතේ. අද එහෙම නැහැ. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට මට කියන්න බැහැ, "සුනිල්, මේක මෙහෙම කරන්න එපා; අරහෙම කරන්න එපා." කියලා. එහෙම නැහැ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, PAC එකේ ඔබතුමාත් ඉන්නවා. ඔබතුමායි, මමයි පිටරටකටත් ගිහින් බැලුවා, ඒ රටවල කාර්යක්ෂමව මේ කටයුතු වෙන්නේ කොහොමද කියලා. මෙහෙම තමයි වෙන්න ඕනෑ. මේක තමයි යහ පාලනය. මිනිස්සු කියනවා තමයි "ඔන්න අතන හොරකම් කළා; මෙන්න මෙතැන හොරකම් කළා; අන්න අතන හොයනවා." කියලා. හොයන්න ඕනෑ. නමුත් හොයන්න මෙච්චර කල් අවස්ථාවක් ලබා දුන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අවස්ථාව තමයි යහ පාලන ආණ්ඩුවෙන් ලබා දීලා තිබෙන්නේ. මම මීට වඩා මේ සම්බන්ධයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු රන්ජන් රාමනායක මැතිතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබල ගැන්වීම්, සුබසාධන සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் பற்றிய பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment, Welfare and Kandyan Heritage)
විපක්ෂය පැත්තට අවස්ථාව දෙනවා කිව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
වාසුදේව නානායක්කාර මැතිතුමාට දුන්නේ ආණ්ඩු පක්ෂයේ අවස්ථාව.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට මගේ වේලාව දුන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු රන්ජන් රාමනායක මැතිතුමා.

[අ.භා. 3.45]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මහතාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම පිළිබඳ පැවැත්වෙන විවාදයේදී සියලු දෙනාම ඒකට පක්ෂව කථා කළා. වාසුදේව නානායක්කාර මැතිතුමාත් එතුමාට බොහොම පක්ෂව කථා කළා. ඉස්සර හිටියේ දඩයක්කාරියක් කියලා එතුමා කිව්වා. දැන් ඉන්නේ හොඳ මහත්මයෙක් කියලා එතුමා ගැන හොඳ recommendation එකක් දුන්නා. ඒ ගැන සන්තෝෂ වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම අනුර කුමාර දිසානායක මැතිතුමා කරන ලද චෝදනාවට පිළිතුරක් ලබා දෙන්න මම කැමැතියි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මඟින් මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද මුළු නඩු සංඛ්‍යාව 39යි. වැටලීම් නඩු 14යි. විවෘත විමර්ශන නඩු 06යි. වත්කම් විමර්ශන නඩු 02යි.

නඩු පවරන ලද වූදිත රාජ්‍ය නිලධාරීන් - හිටපු ඇමතිවරුන් දෙදෙනායි. ඒ තමයි, ප්‍රවාහන හා ගුවන් සේවා හිටපු අමාත්‍යවරයා සහ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති හිටපු අමාත්‍යවරයා. ඊළඟට ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිතුමා, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා, ගුවන් සේවා අමාත්‍යවරයාගේ හිටපු සම්බන්ධීකරණ ලේකම්. ඒ වාගේම මහාධිකරණයේ නඩු පවරන ලද වූදිත රාජ්‍ය නිලධාරීන් වශයෙන් දිසා විනිසුරුවරු, සුරාබදු

කොමසාරිස්, කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, කෘෂි පරීක්ෂණ නිලධාරීන්, ප්‍රාදේශීය ගොවි ජන නිලධාරීන්, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ කළමනාකරු, තාක්ෂණ නිලධාරීන්, යටියන්තොට ප්‍රාදේශීය සභාවේ භිටපු සභාපති, ජාතික යොවුන් සේනාංකයේ මධ්‍යස්ථාන සභාපති, ධීවර පරීක්ෂක ඇතුළු බොහෝ දෙනෙක් ඉන්නවා.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ඔබතුමාටත් නඩුවක් තිබෙනවා නේද?

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
නඩුවක් තිබෙනවාද? මොකක්ද? ඔබතුමාට මිනී මැරුම් නඩුවක් තිබෙනවා නේද? නීතිඥ රියන්සි අර්සකුලරත්න මහත්මයා දාලා ඒකෙන් බේරුණා නේ.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
ඔබතුමාට ගැහැනු නඩුවක් තිබෙනවා නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔව්. ඔප්පු කර ගන්න බැරි වුණ නඩුවක් තිබෙනවා. ඒ නඩුව අවුරුදු හයක් තිස්සේ ඇදෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අල්ලස් හා දූෂණ ගැන කථා කරද්දී 2015 ජනවාරි 08වැනි දා මැතිවරණය වෙනුවෙන් වේදිකාවේදී අපි දුන් පොරොන්දුව මතකයට එනවා. එත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා අගමැතිතුමා ඇතුළු සියලුදෙනා කිව්වා, "ජනවාරි 08වැනි දා ර 12ට airport එක වහලා හොරුන්ව අල්ලනවා" කියලා. එවැනි පොරොන්දුවක් දුන්නා. ඒ පොරොන්දුව ඉෂ්ට වුණාද? ලංකාවේ ජනතාවගෙන් බහුතරයක් අහනවා, "එම පොරොන්දුව හරියට ඉෂ්ට කළාද?" කියලා. මැතිවරණ පොරොන්දු ඉෂ්ට කිරීම ගැන කථා කරද්දී, ලෝකයේ අනෙකුත් රටවල් ගැන අපි බලමු.

මැතිවරණ වේදිකාවේදී දුන් පොරොන්දු සියයට සියයක්ම ඉෂ්ට කළේ, පිලිපීනයේ ජනාධිපති රොඩ්‍රිගෝ ඩුටර්ටේ. එම ජන නායකයා කිව්වා, "දූෂිත ඇමතිවරු හමු වුණොත්, මම ඔවුන්ව හෙලිකොප්ටර් එකෙන් උඩට ගෙනියලා පහළට තල්ලු කරනවා" කියලා. තම අතින්ම 36දෙනෙක් වෙඩි තබා මැරුවා කියලා, එතුමාම පිළිගත්තා. UN එකෙන් ප්‍රශ්න ඇනි වුණත්, එතුමාම එය පිළිගත්තා. ඒ වාගේම පිලිපීනයේ කුඩු විකුණපු, අල්ලස් ගත්ත 7,000ක් මරා දැමුවාය කියලාත් එතුමා පිළිගත්තා. ඒ විධියට තමයි වෙනත් රටවල ජන නායකයන් මැතිවරණ වේදිකාවේ දුන්නු පොරොන්දු ඉෂ්ට කළේ. හරියටම -ටක්කෙටම- පොරොන්දු ඉෂ්ට කළා. කවුරු කොච්චර ප්‍රශ්න ඇනි කළත්, United Nations එකෙන් මොනවා කිව්වත්, මානව හිමිකම් කඩ කිරීම් ගැන මොනවා කිව්වත්, එතුමා තම duty එක කළා. මැතිවරණ පොරොන්දු ඉෂ්ට කරපු අපේ මතකයේ ඉන්න ඊළඟ ජන නායකයන් කවුද? ෆිදෙල් කැස්ත්‍රෝ, රාවුල් කැස්ත්‍රෝ හා වේ ගුවේරා. මම හිතනවා, වාසුදේව නානායක්කාර ගරු මන්ත්‍රීතුමා මේක දන්නවා කියලා. ඒ තුන්දෙනා එක්ක එම නිදහස් සටනේ වීරෝදාර හමුදා නිලධාරිවරයෙක් හිටියා, General Arnaldo Ochoa කියලා. ඒ පුද්ගලයා මර්ජුවානා වැවීම සහ පැහැර ගැනීම්වලට - human smugglingවලට - හසු වුණා. ෆිදෙල් කැස්ත්‍රෝ, රාවුල් කැස්ත්‍රෝ හා වේ ගුවේරා සමඟ රට බේරා ගත්ත ඒ රණ විරුවාට අන්තිමට මොකද වුණේ? ඒ ගොල්ලෝ බැලුවේ නැහැ, මොහු රණ විරුවෙක්ය; අපේ රට බේරා ගත්ත පුද්ගලයෙක්ය කියලා. ඔහුට වෙඩි තබා මරා දැමුවා. ඒ order එක දුන්නේ, ෆිදෙල් කැස්ත්‍රෝ, රාවුල් කැස්ත්‍රෝ හා වේ ගුවේරා. එම ජන නායකයන් එහෙමයි කටයුතු කළේ. රණ විරුවාගේ බිරිඳ සහ දරුවාව බලා ගන්නට-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අධිකරණ නියෝගයකින් මරා දැමුවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඔබතුමා නිවැරදියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

අධිකරණ නියෝගයකින් එම රණ විරුවාව වෙඩි තබා මැරුවා. එම රණ විරුවාත් එසේ - මෙසේ කෙනෙක් නොවෙයි. ඔහු වෙඩි තැබීමට පෙර තමුන්ගේ මුහුණට දාපු වැස්ම ගලවා, "මම කෙළින්ම මරණයට මුහුණ දෙනවා" කිව්වා. එහෙමයි ඒ රටවල නායකයන් වැඩ කළේ.

ඊළඟට, කවුද? ලී ක්වාන් යූ. තමුන්ගේ නිවාස ඇමතිට විරුද්ධව චෝදනාවක් ආවාම, ඔහුට දඬුවම් දුන්නා. ඊළඟට, කවුද? ඉන්දියාවේ අන්නා හසාරේ, කෙජ්රිවාල්. මේ සියලුදෙනා දූෂණ විරෝධී සටනේදී යාළුකම්, මිත්‍රකම් නැතුව වැරදිකරුවන්ට දඬුවම් දුන්නා. නමුත්, අපේ කෙනෙකුට එහෙම දඬුවම් දුන්නොත් මොකද වෙන්නේ? කෙළින්ම පෙළපාළි යයි. රණ විරුවන්ට දඬුවම් දුන්නා, නැත්නම් වීවරධාරීන්ට දඬුවම් දුන්නා, නැත්නම් ආර්යාවකට දඬුවම් දුන්නා, ප්‍රශ්න අහන්න ආර්යාවක් FCID එකට ගෙන්නුවා කියලා කෑ ගහයි. නමුත්, ඒ රටවල එවැනි දේවල් කළේ නැහැ. ඒ රටවල පන්ති භේදයක් තිබුණේ නැහැ.

1958දී අපේ රටේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා තමයි දඬුවම් දීම හරියටම කළේ. ගරු වාසුදේව මැතිතුමනි, මම වැරදි නම් නිවැරදි කරන්න. බණ්ඩාරනායක මැතිතුමා බලයට ආවාට පස්සේ කැබිනට් ඇමතිවරු පස්දෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට කැබිනට් ඇමතිවරු පස්දෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. සී.ඒ.එස්. මරික්කාර්, ඇම්.පී. ද සොයිසා, විමලා විජේවර්ධන ඇතුළු පස්දෙනෙකුගේ ප්‍රජා අයිතිය අහෝසි කළා. අහෝසි කළේ කවුද? එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා. [බාධා කිරීමක්] අපේ මරික්කාර් ගරු මන්ත්‍රීතුමා නොවෙයි. ප්‍රජා අයිතිය අහෝසි කරන්න ගිහිල්ලා මොකක්ද වුණේ, ගරු වාසුදේව නානායක්කාර මහත්තයෝ? ඒක කරන්න ගිහින් එතුමාට වෙඩි කන්න සිද්ධ වුණා. මේ හොරු ඇල්ලීම එසේ - මෙසේ කාර්යයක් නොවෙයි. හොරු ඇල්ලීමට යෑමේදී, හොරුන් බොහොම වේදනාවට, දුකට, ආතතියට හා කෝපයට පත්වනවා. ඒ නිසා හොරු අනිවාර්යයෙන්ම චෝදනාවට ලක් කරන පුද්ගලයාව මරා දමනවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාත් මරණයට ගොදුරු වුණා. එම සිද්ධියට අදාළව සෝමාරාම සහ බුද්ධරක්ඛිත හික්ෂූන් වහන්සේලාගේ නම් කියවුණා; විමලා විජේවර්ධනලාගේ නැව් ගනු -දෙනුවක් ගැන කියවුණා. වැරදි කළ පුද්ගලයන්ට දඬුවම් කරන්න ගිහින් තමයි එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාට ඒ දේ වුණේ. ඒ තමයි ඉතිහාසය.

දඬුවම් ලබා දීම සම්බන්ධව කථා කරද්දී මගේ මාමා වන විජය කුමාරණතුංග මහත්තයා හැම දාම කිව්වේ, "රදලයෝ විසින් රදලයන්ව රකිනවා. වලව් විසින් වලව් රකිනවා" කියලායි.

[ගරු රන්ජන් රාමනායක මහතා]

එතුමාගේ බිරිඳ වේදිකාවේ තබාගෙන එතුමා කිව්වා, රදලයන් විසින් රදලයන් රකිනවාය කියලා. "අර වලව්වෙන් මේ වලව්ව රකිනවා. මේ වලව්වෙන් අර වලව්ව රකිනවා. මැදමුලන වලව්වෙන් අර වලව්ව රකිනවා. අර වලව්වෙන් මේ වලව්ව රකිනවා. අපි කට්ටිය එකට ඉගෙන ගත්තේ. අපි classmatesලා. අපි කට්ටිය රෑට "සෙට්" වෙනවා කියලා පසු ගිය කාලයේ කතිකාවක් පැතිරුණා. මේ නීතිය තිබෙන්නේ පීඩිත පන්තියේ අයට විතරයි. නමුත් අද ග්‍රාම නිලධාරි කෙනෙක් බලයට පත්වෙලා ඉන්නවා. එතුමාට රෝයල් ගිය ඉතිහාසයකුත් නැහැ; වලව්වකුත් නැහැ. ඒ නිසා මේ දූෂණ සම්බන්ධයෙන් නිසි පියවර ගන්නට එතුමාට පුළුවන්. අලුත් ආණ්ඩුවක් පත් වුණාට පස්සේත් සුදුවැල්ල branch එකේ තිබුණු මුදල් ගැන ක්‍රියාත්මක වුණේ නැහැ. මොකද, එහාට call එකක් දෙනවා. එකට නටපු කට්ටිය එතැන හිටියේ. එකට dance කරපු යාළුවෝ "සෙට්"වෙලා සිටියේ. ඒ සියලුදෙනාම තමුන්ගේ වරිගය, තමුන්ගේ පන්තිය රැක්කා.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(මාණ්පුමිකු லொහාන් රත්වත්තේ)
(The Hon. Lohan Ratwatte)
ආණ්ඩු පක්ෂයේ ඉස්සරහ පේළියේ හිටියේ කවුද?

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රඤ්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
සෙලාන් බැංකුවේ රුපියල් හාරකෝටිය සම්බන්ධයෙන් ඔබතුමාගේ පියාට විරුද්ධව චෝදනාවක් එල්ල වුණා. අර්සකුලරත්න නීතිඥ මහත්මයා තමයි ඒ නඩුව වෙනුවෙන් පෙනී සිටියේ. ඒ නඩුව ගැන මා දන්නවා. ඒ නීතිඥ මහත්මයා මගේ යාළුවෙක්. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔබතුමාගේ පියාට විරුද්ධව නඩුවක් තිබුණා. අවශ්‍ය නම් ඒ නඩු වාර්තාව මා පෙන්වන්නම්. ඔබතුමාගේ පියාට විරුද්ධව නඩුවක් තිබුණා.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(මාණ්පුමිකු லොහාන් රත්වත්තේ)
(The Hon. Lohan Ratwatte)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා. මට විනාඩියක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ නම කිව්වේ නැහැ නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රඤ්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
අනේ! කරුණාකර මගේ කථාව කරන්න ඉඩ දෙන්න.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(මාණ්පුමිකු லොහාන් රත්වත්තේ)
(The Hon. Lohan Ratwatte)
මහනුවර ගැහැනු කෙනකුගෙන් රුපියල් ලක්ෂ 20ක් අරගෙන, ඒ මුදල දුන්නේ නැහැයි කියලා ඔබතුමාට නඩුවක් තිබුණා නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රඤ්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
නැහැ, නැහැ. එහෙම නඩුවක් තිබෙනවා නම් ඔබතුමන්ලා ඒක විමර්ශනය කරන්න. මා නඩුවක් ගැන කියනකොට එතුමා වෙන එකක් කියනවා. ඒක නොවෙයි ප්‍රශ්නය. උඩතලවින්නේ 10දෙනකු මැරුවාය කියලා ඔබතුමාට විරුද්ධව නඩුවක් තිබුණා.

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(මාණ්පුමිකු லොහාන් රත්වත්තේ)
(The Hon. Lohan Ratwatte)
බඳිනවාය කියලා මහනුවර ගැහැනු කෙනකුගෙන් රුපියල් ලක්ෂ 20ක් අරගෙන, ඒ මුදල දුන්නේ නැහැයි කියලා නඩුවක් තිබුණා නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රඤ්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
නැහැ, නැහැ. ඒක අසත්‍යයක්. ඒක අසත්‍යයක් නොවෙයි නම් අවුරුදු ගණනක් තිස්සේ ඔප්පු කරන්න බැරිව ඉන්නේ මොකද? ඇය මානසික රෝගී කාන්තාවක්. [බාධා කිරීමක්] තමුන්නාන්සේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තිබුණු කාලයේ 10දෙනකු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කෙනෙක්නේ. ඒවා සේරම යට ගියා. අපි ඒ ගැන වෙනම කථා කරමු. විජය කුමාරණතුංග මහත්මයා -මගේ මාමා- කියපු විධියට, ඒ කට්ටිය ඒ විධියට රැක්කා. ඒක තමයි තිත්ත ඇත්ත.

දැන් මේ පරීක්ෂණ හිරවෙන්නේ කොහේද? මේ පරීක්ෂණ ගිහිල්ලා හිරවෙන්නේ කොහේද?

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(මාණ්පුමිකු லොහාන් රත්වත්තේ)
(The Hon. Lohan Ratwatte)
ලජ්ජා නැද්ද, බඳිනවාය කියලා ගැහැනුන්ගෙන් සල්ලි ගන්න?

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රඤ්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
මේ පරීක්ෂණ හිරවෙන තැනක් තිබෙනවා. ලොකු ආර්යාවන්ට කියනවා, කථානායක නිල නිවසට ගිහිල්ලා FCID එකට උත්තර දෙන්න කියලා. උසස් පන්තියේ අයට වෙනම ක්‍රමයක් අනුගමනය කරනවා. හැබැයි, පීඩිත පන්තියේ අභිංසක මිනිසුන් FCID එකට ගෙන ගිහින් හිර කරගෙන ප්‍රශ්න අහනවා. ඒ ක්‍රම දෙක නැති වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව ගැන කථා කරද්දී, ඉතිහාසයේ ඉඳලා බලනකොට උපතේ සිට මරණය දක්වා - උප්පැන්න සහතිකයේ සිට මරණ සහතිකය දක්වා- හොරකමින් පිරුණු රටක් තමයි ලංකාව. ඒක තමයි තිත්ත ඇත්ත. අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් තමන්ගේ දුව, පුතා ජනප්‍රිය පාසලකට ඇතුළත් කරන්නට අසත්‍ය ප්‍රකාශ කරනවා. පුතාට කියනවා, "රෝයල් විද්‍යාලය ළඟ ඉන්නේ, ආනන්ද විද්‍යාලයට කිලෝමීටරයක් ළඟ ඉන්නේ" කියලා කියන්න කියලා. පාසල්වලට ළමයින් ඇතුළත් කර ගන්න ලිංගික අල්ලස් පවා දෙනවා. මෙවැනි බොරුව, වංචාව පිරුණු රටක, විමානයක රජ වෙන්න ඕනෑ කවුද? අන්න ඒක තමයි ප්‍රශ්නය. ලංකාවේ, බොරු කියන රටේ, බහුතරයක් හොරුන් පිරුණු රටේ රජ වෙන්න ඕනෑ හොරෙක්ම තමයි. ජනප්‍රිය, හිතහොඳ හොරකම් කරන්නේ නැති නායකයකුට කවදාවත් ලංකාවේ රජ වෙන්නට බැහැ. ඒකට ගැළපෙන නායකයෙක් රජ වෙන්න ඕනෑ. ඒක තමයි තිත්ත ඇත්ත.

ඒ විතරක් නොවෙයි. හොරුන් ආරක්ෂා කරන නායකයෙක් පසු ගිය කාලයේ කිව්ව කථාවක් අපි ඇහුවා. හොරු ආරක්ෂා කරන නායකයා කිව්වේ මොකක්ද? "අනේ හාමුදුරුවනේ! අපේ කාලයේ වැරදි කරපු, දූෂණ වංචා කරපු හොරුන් ආරක්ෂා කළා. මා ඒ ගොල්ලන් රැක්කා. ඒ ගොල්ලන්ගේ files හැංගුවා. මා එහෙම කළා. ඒක මගේ වරදක්" කියලා ඒ නායකයා කිව්වා. ඒ නායකයා හරි ජනප්‍රියයි. මොකද, ලංකාවේ බහුතරයක් හොරුන් නිසා. තිත්ත ඇත්ත ඒකයි. අපේ ජනතාව shortcutsවලට කැමැතියි. Shortcuts කියන්නේ, helmet එකක් නොදමා ගිහින් පොලීසියට අහුවුණාම උසාවි යන්නේ නැතුව ඒ පොලිස් නිලධාරියාට කීයක් හෝ දීලා බේරෙන්න කැමැතියි. කාර් එකක් ධාවනය කරද්දී telephone call එකක් ගන්නකොට, ඒක පොලීසියට අහුවුණාම, එහෙම නැත්නම් driving licence එක නැතුව යනකොට පොලීසියට අහුවුණාම පොඩි දෙයක් දීලා, අල්ලසක් දීලා බේරෙන්නට කැමැතියි. ඒකට පුරුදු වුණු බහුතර ජනතාවක් ඉන්න රටක අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කොපමණ වැඩි කළත්, ඒ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප වැඩි කළත්, දීමනා වැඩි කළත් ඒ ප්‍රශ්නය කවදාවත් විසඳෙන්නේ නැහැයි කියන එකයි මගේ මතය.

අනික් කාරණය තමයි මා කියන මේ ප්‍රකාශය. මේක හොඳට අහගන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මගේ මතය. අපේ ලංකාවේ ඉන්නවා, "අපි කැපුවත් කොළ පාටයි, අපි කැපුවත් නිල් පාටයි" කියා කියන අන්ධ ජනතාවක්.

මේ ජනතාව ඉන්න තුරු මේ රට හදන්න බැහැ. ලක්ෂ පනස්අටකට කිට්ටු ජනතාවක් කිව්වා, මහින්ද රාජපක්ෂ මහත්තයා හොඳයි කියලා. ලක්ෂ හැටදෙකහමාරක් ජනතාව කිව්වා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා හොඳයි කියලා. නමුත් මේ දෙගොල්ලෝම නොවෙයි රටේ අනාගතය තීරණය කරන්නේ. අපි කිව්වොත්, මහින්ද රාජපක්ෂ මහත්තයා සුනාමි ආධාර හොරකම් කළා, ඩේසි ආච්චිගේ මැණික් මල්ල හරහා යෝෂිත හොරකම් කළා, ක්‍රිෂ් ගනු-දෙනුව හරහා හෙලිකෝප් හරහා නාමල් රාජපක්ෂ මහත්තයා හොරකම් කළා කියලා, - facts and figures වලින් හෝ B Reportsවලින් ඔප්පු කරලා කිව්වත්- ඒ ලක්ෂ පනස්අටක ජනතාව කවදාවත් ඒක පිළිගන්නේ නැහැ. ඒක තමයි තිත්ත ඇත්ත. ඒ වාගේම, බැදුම්කර වංචාවක් අහු වුණත්, වාහන වංචාවක් අහු වුණත්, හරක් හොරකමක් අහු වුණත්, නැත්නම් වෙනත් කුමන හෝ හොරකමක් අහු වුණත් යූඑන්පී එකේ ඒ ලක්ෂ හැටදෙකහමාරක ජනතාව ඒවා ජීවිතේට පිළිගන්නේ නැහැ. මොකද, තමුන්ගේ එකා රකිනවා. ඒක තමයි ඇත්ත. ඒක තමයි තිත්ත ඇත්ත.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමන්ලා තමයි රකින්නේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
නැහැ. නැහැ. ඒක කියන්නේ ඔබතුමා නේ. මේ අන්ධ භක්තිකයෝ දෙගොල්ලන්ම කවදාවත් තීරණය කරන්නේ නැහැ, මේ රටේ දූෂණ, වංචා, හොරකම් නවතින්න ඕනෑ කියලා. හොරකම් කරපු, දූෂණයේ යෙදුණු, මිනීමැරුම් කරපු තමුන්ගේ ඒ නායකයා ඒ අය රකිනවා. "බී" වාර්තාවලින් කොපමණ ඔප්පු වුණත් ලංකාවේ ජනතාව අන්ධ භක්තිකයෝ හැටියට පුරුදු වෙලා තිබෙන්නේ තමුන්ගේ නායකයා ආරක්ෂා කරන්නයි. ඒ නිසා මෙවැනි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කොතරම් පිහිටෙවුවත් ඒවා නවත්වා ගන්න පුළුවන් කියලා මම කවදාවත් හිතන්නේ නැහැ. මම හිතන්නේ කවුරු කෙසේ කීවත්-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
"B" වාර්තාවෙන් ඔප්පු වෙන්නේ නැහැ, උසාවියෙන් ඔප්පු වෙන්න ඕනෑ. උසාවියෙන් වැරදිකාරයෙක් වෙන්න ඕනෑ. උසාවියෙන් වැරදිකාරයෝ වෙච්ච කවුරුවත් නැවත පත්වෙලා නැහැ නේ, ලංකාවේ.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඉදිරියේදී වැරදිකාරයෝ වෙයි. දැන් ස්වාධීන කොමිසමක් පිහිටුවා තිබෙනවා ගරු මන්ත්‍රීතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මම හිතන්නේ මෙවැනි රටකට, මෙවැනි දූෂණයෙන් බොරුවෙන්, වංචාවෙන් පිරුණු රටකට ගැළපෙනම නායකයා තමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැනිතුමා. ඒක තමයි තිත්ත ඇත්ත. එතුමා හරි ජනප්‍රියයි. එතුමා හොරු ආරක්ෂා කරනවා. එතුමා කියනවා," මම files හංගනවා. මම නුඹලාව ආරක්ෂා කරනවා" කියලා. ඒ නිසා මේ රටේ හොඳ මිනිහෙකුට, හොරකම් අල්ලන මිනිහෙකුට කවදාවත් හරි නායකයෙක් වෙලා හරි ගමනක් යන්න බැහැ. ඒ නිසා තමයි අද උද්ඝෝෂණ වැඩි වෙලා තිබෙන්නේ. ඒ නිසා තමයි හොරු ටික අද කෑ ගහන්නේ. ඒ නිසා තමයි හොරු ටික කියන්නේ,"පොලිස් කට්ටාගේ ඉඳලා DIG දක්වා ගල් ගසා මරනවා"කියලා. එහෙම කියන්නේ ඇයි? ඒ අයගේ ආදායම එහෙම පිටින්ම නැවතුණ නිසා. ඒ අයට මේක දරාගෙන ඉන්න බැහැ. ඒ නිසා මම හිතන විධියට මේ ලංකාවට බිහිවුණු, මේ ලංකාවට ගැළපෙන හොඳම නායකයා තමයි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මැනිතුමා. මොකද, එතුමා ප්‍රසිද්ධියේ කිව්වා, "මම හොරු ආරක්ෂා කරනවා, මම හොරුන්ගේ files හැංගුවා. අපේ හාමුදුරුවනේ මට සමාවෙන්න මගෙන් මේ වැරදි සිද්ධ වුණා" කියලා. එතුමා ආයෙත් ඇවිත් ඒක නොකරයි කියලා කියන්නේ කොහොමද? ජන්මයට වඩා පුරුද්ද ලොකුයි. ඒ නිසා කවදාවත් ඒක නවත්වන්නේ නැහැ. ඒ නිසා මේ කථාව අහගෙන ඉන්න ලංකාවේ ජනතාවට මම කියනවා, මෙහෙම තමයි හොරු ආරක්ෂා කළේ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඉන්න අය මොනවාද කරන්නේ? බැදුම්කර පිළිබඳ පැමිණිල්ලක් ආවාම ඒක සොයන්න ජනාධිපති කොමිසමක් පත් කළා. ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමා කථාවේදී- [බාධා කිරීම්] කෝප් කමිටුවට එක දිගට ආවා. [බාධා කිරීම්] මොකක්ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ අයගේ නම් එළියට දාන්න. [බාධා කිරීම්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ඇත්ත වශයෙන්ම Greek Bonds, හෙජින් ගිවිසුම යනාදියෙන් බිලියන ගණනක් ගැහුවා. COPE කමිටුවේදී කවදාවත් ඒවා විමර්ශනයට ලක් වුණේ නැහැ. එහෙම දේවල් එදා වුණේ නැහැ. අපේ ආණ්ඩුව ආවාට පස්සේ ස්වාධීන කොමිෂන් පිහිටෙව්වා. විපක්ෂයේ -JVP එකේ- මන්ත්‍රීවරයෙකුට COPE කමිටුවේ සභාපතිකම දුන්නා. කොච්චර සාධාරණද කියලා බලන්න. කොච්චර සාධාරණද? පසු ගිය ටිකේ දිගු ගමනක් ගියා, බරපතළ මුදල් වංචා පිළිබඳ ජනාධිපති විමර්ශන කමිටුවේ හිටපු ලැසිල් ද සිල්වා මහත්මයා. ඔහුට අයින් වෙන්න සිද්ධ වුණා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම දාම මම මේ ජාතික ආණ්ඩුව වර්ණනා කළා. මම ජාතික ආණ්ඩුව වර්ණනා කළ හේතුව මොකක්ද? රක්ෂා දහයක් ආවොත්, එයින් පහක් හම්බ වෙනවා එක්සත් ජාතික පක්ෂයට; පහක් හම්බ වෙනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට. මේ විධියට ඒවා බෙදිලා ගියා. නමුත් හොරුත් ඒ විධියට බෙදුණා. හොරුන්ටත් ඒ පහසුකම හම්බ වුණා. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පක්ෂයේ සභාපති වුණාට පස්සේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හොරු ටික ආරක්ෂා වුණා. එක්සත් ජාතික පක්ෂයේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අගමැති ධුරය හම්බ වුණාට පස්සේ, එක්සත් ජාතික පක්ෂයේ හොරු ටික ආරක්ෂා වුණා. ජනතාවට? ජනතාවට මොකද වුණේ? [බාධා කිරීමක්]

ගරු ලොහාන් රත්වත්තේ මහතා
(மாண்புமிகு லொஹான் ரத்வத்தே)
(The Hon. Lohan Ratwatte)
කෙළ වුණා!

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ජනතාවට කෙළ වුණා! ඔබතුමාගේ ඒ ප්‍රකාශයට මම එකඟයි. මේ අන්ධ භක්තික ලක්ෂ හැටදෙකහමාරයි, මේ අන්ධ භක්තික ලක්ෂ පණස්හතයි තමන්ගේ අය රකිනවා, රටට මොනවා වුණත් කමක් නැහැ කියලා. ඒක තමයි අද වෙලා තිබෙන්නේ. මේ කාරණයේදී අපේ නායකයෝ මා සමඟ එරෙහි වෙන්න පුළුවන්. නමුත් මේක තමයි ජනතා මතය. ජනතා මතය තමයි, නායකයන් තමන්ගේ අය රකිනවාය කියන එක. ඒක තමයි ජනතාවගේ මතය; ජනතාවගේ පිළිගැනීම. අද මේ තිබෙන ප්‍රශ්න ඇදෙනවා. ඇදෙනවා, ඇදෙනවා. - drag වෙනවා, delay වෙනවා. මම හිතනවා, [බාධා කිරීම්] ඔව්. කියන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අපේ හොරා අපට හොඳයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ මතයට මම ගරු කරනවා. අපට අවශ්‍ය වෙන්නේ ඇත්තටම රොබ්‍රිගෝ ගුතාර්තේ වාගේ පුද්ගලයෙක්; පිලිපීනයේ ජනාධිපති, රොබ්‍රිගෝ ගුතාර්තේ වාගේ පුද්ගලයෙක්. නැත්නම් ලී ක්වාන් යූ වාගේ නායකයෙක්. නැත්නම් අන්න හසාරේ වාගේ නායකයෙක්. ඇමෙරිකාව වාගේ රටවල ජනාධිපතිවරු කවදාවත් තමන්ගේ ඇමතිවරු ආරක්ෂා කළේ නැහැ. ඒ වාගේම පිදෙල් ක්‍රස්තෝ, රාහුල් ක්‍රස්තෝ, චේ ගුවේරා - [බාධා කිරීමක්] ඒ කාලයේ හිටපු නායිකාව ඔබතුමාගේ පියා ආරක්ෂා කළා. ඒ කාලයේ ඒ වාගේ දේවල් වුණා. හාරකෝට් හැටපන් ලක්ෂයක් සෙලාන් බැංකුවෙ දමා ගෙන ඉන්දැද්දී ඒක ආරක්ෂා කළා; ඒ නඩුවලින් බේරුණා. ඒක තමයි ඇත්ත. තිත්ත ඇත්ත ඒකයි. ඒ වාගේ දේවල් පහු ගිය කාලයේ පුදුම විධියට සිද්ධ වුණා. හැම දාම කළේ ඒ නායකයෝ ටික, නායිකාවෝ ටික තමන්ගේ තමන්ගේ වරිගය රැකපු එකයි. තමන්ගේ වරිගය රැක්කා. "නුඹලා ආවොත් අපේ ඒවා අල්ලන්න එපා. අපි ආවොත් නුඹලාගේ ඒවා අල්ලන්නේ නැහැ."

"උඹලා අපේ පිට කසපල්ලා, අපි උඹලාගේ පිට කසන්නම්" කියලා තමයි කියන්නේ. මේ නිසා තමයි අද ලංකාවට මේ දේ සිදුවෙලා තිබෙන්නේ. ශ්‍රී ලංකාවේ පසු ගිය කාලයේ විගණනයන් නැති දේවල් කොච්චර තිබුණාද? අපි අද කියනවා, ලෝකයේ ධනවත්ම පුද්ගලයා බිල්ගේට්ස් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් මම දන්නා විධියට නම් ලෝකයේ ධනවත්ම පුද්ගලයා ආගමික නායකයෙක්. කියන්න දුකයි, මම දන්නා විධියට ඒ තමයි පාප් වහන්සේ. මට තිබෙන තොරතුරු අනුව සිසිලියේ තිබෙන සල්ලි මේ ලෝකයේ කොහේවත් නැහැ කියන එක තමයි මගේ මතය.

එතකොට ලංකාවේ වැඩිපුරම මුදල් තිබෙන්නේ කොහේද? ආගමික නායකයන් ළඟ. මම තව හොඳ කථාවක් කියන්නම්. පසු ගිය ටිකේ The Finance ආයතනය bankrupt වුණා. ඒ bankrupt වුණු අවස්ථාවේ එහි එකේ සිට දාහතර දක්වා ස්ථාවර තැන්පතු - fixed deposits - තිබුණේ කාටද? ගරුතර මහා සංඝරත්නයේ ස්වාමීන් වහන්සේලාට. ඊළඟට, දාහතරේ සිට දාහත දක්වා ස්ථාවර තැන්පතු තිබුණේ කාටද? දේශපාලන නායකයන්ට. එතැන සිට විසි අට දක්වා ස්ථාවර තැන්පතු තිබුණේ කාටද? නොයෙකුත් රජයේ නිලධාරීන්ට.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හොරකම් කරලා තමයි මේ රට විනාශ කළේ. අද මම අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මහත්මයාට කථා කළා. එතුමා කිව්වා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කොච්චර ප්‍රබල වුණත්, කොච්චර නීති තිබුණත් මේ Act එකේ හැටියට රාජ්‍ය නිලධාරීන්ට පමණයි නඩු දමන්න පුළුවන් වන්නේ කියලා. ඒ නිසා අපි එම තත්ත්වය වෙනස් කරන්න නම් පනත් කෙටුම්පතක් ගෙනැවිත් සම්මත කරගත යුතුමයි. ඇත්ත වශයෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ loopholes ගොඩාක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ හොරු අල්ලන්නට හදන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ඉදිරි ක්‍රියා මාර්ග නවත්වන්නේ කවුද? රටේ ඉන්න ප්‍රබල ජනාධිපති නීතිඥවරු; රටේ ඉන්න විනිසුරුවරු. අද පාර්ලිමේන්තුවේ මට ඒක කියන්න බලය තිබෙනවා. ඒක තමයි තිත්ත ඇත්ත. විජයදාස රාජපක්ෂ මහත්මයාගේ පුතාගේ වෙඩින් එකේදී මේ රටේ ඉන්න ජනප්‍රියම highest paid lawyer කෙනෙක් මට හමු වුණා. මම ඇහුවා, "ඇයි සර් මේක කරන්නේ. සර් හොඳටම දන්නවා, සර් පෙනී ඉන්න මේ මිනිහා ලෝක හොරෙක් බව. මේ මනුස්සයා ඒ මනුස්සයාගේ නෝනාත් එක්ක එකතු වෙලා ගහපු ගැහිලි, තිබෙන ඉඩම් ගැන ඔබතුමා දන්නවා. මම වැඳලා කියන්නම්, මේ දූෂිතයාව ආරක්ෂා කරන්න එපා" කියලා මම කිව්වා. එතකොට එතුමා මගේ අත අල්ලා ගෙන මට කිව්වා,

"Ranjan, how can I refuse him? He is my client. I have to protect him. I know he is a thief. I know he is a rogue, but my profession is to protect him." මෙන්න මේක තමයි තිත්ත ඇත්ත. අද අග්‍ර ගණයේ බුද්ධිමත් නීතිඥයෝ ඉන්නවා. කවුද? ඒ අය තමයි රියෙන්සි අර්සකුලරත්න මහත්මයා, රොමේෂ් ද සිල්වා මහත්මයා, කාලිංග ඉන්ද්‍රතිස්ස මහත්මයා, අනිල් ද සිල්වා මහත්මයා. මේ මහත්වරුන්ට මම වැඳලා කියන්නම්, තමුන්නාන්සේලා මේ ආරක්ෂා කරන සේවා දායකයන් මේ රටේ අහිංසක මිනිසුන්ගේ මුදල් කොල්ල කාපු දැවැන්ත ගණයේ හොරු කියලා තමුන්නාන්සේලා හොඳටම දන්නවා. දැන් මේ හොරු මොකද කරන්නේ? හොරු TV programmesවලට ගිහිල්ලා අපට හිනා වෙනවා. මම මේ ළඟදී දැක්කා, ක්‍රිෂ් ගනුදෙනුවෙන් රුපියල් කෝටි 7ක් හොරකම් කරපු හොරෙක් ආවේ කොහොමද කියලා. වාහනයේ sunroof එක ඇරලා "ජයවේවා!" කියාගෙනයි ආවේ. හොරා ආවේ "ජයවේවා!" කියාගෙන. මිනිස්සුත් "ජයවේවා!" කිව්වා. මොකක්ද, ඔහුට තිබෙන චෝදනාව? රුපියල් කෝටි 7ක් හොරකම් කරලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතින් මෙවැනි සමාජයක් හදන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න. මැතිවරණය දිනලා මේ ආණ්ඩුව පත්වුණාට පසුව, ජනවාරි 10වෙනිදා නැත්නම් 11වෙනිදා වනකොට බැසිල් රාජපක්ෂ මහත්මයා මේ රටින් පැනලා ගියා. මුළු ලංකාවේම ජනතාව කිව්වා; පොදු විපක්ෂයත් කිව්වා, "හොරා පැනලා ගියා" කියලා. බැසිල් මහත්මයා "හොරා" කියලා විමල් වීරවංශ මහත්මයාත් කිව්වා. මල්වානේ ඉඩම දැක්කත්, මාතර බ්‍රවුන්ස්හිල් හී ඉඩම දැක්කත් මේ සියලුම දේවල්වලට බැසිල් රාජපක්ෂ මහත්තයා සම්බන්ධයි කියලා මුළු ලංකාවේ බහුතර ජනතාව දන්නවා. හැබැයි, බැසිල් රාජපක්ෂ මහත්මයා කටුනායකින් එද්දී අපේ ලංකාවේ ජනතාව ගිහිල්ලා "ජයවේවා! ජයවේවා!" කියලා එතුමාව පිළිගත්තා. ඒ කියන්නේ, ලංකාවේ ජනතාව බහුතරයක් හොරුන්ට කැමැතියි. ලංකාවේ ජනතාව බහුතරයක් හොරුන්ට ඡන්දය දෙනවා. ලංකාවේ ජනතාව බහුතරයක් හොරුන්ට ප්‍රේම කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති වනතෙක් කවදාවත් අපේ නායක-නායිකාවන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිලා, කමිෂනර්ස්ලා, අධ්‍යක්ෂ ජනරාල්වරු මේ අය මොන තරම් උත්සාහ කළත් කවදාවත් මේ රට හදන්න බැහැ.

මේ රට හදන්න නම්, මම ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ එකම දෙයයි. මේ හොරකම් කරලා තිබෙන තමන්ගේ ගමේ අපේක්ෂකයා එදා push bicycle එකෙන් පාර්ලිමේන්තුවට ආපු හැටි; push bicycle එකෙන් නගර සභාවට ආපු හැටි; push bicycle එකෙන් ප්‍රාදේශීය සභාවට ආපු හැටි ගමේ ජනතාව දන්නවා. මේ අයගේ වත්කම් බැරකම් සහ ඉතිහාසය එම ප්‍රදේශවාසීන් දන්නවා. එතකොට ඒ අයට පුළුවන්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ගිහින් කියන්න, "මේ මිනිහා මෙහෙම ඉඳලා තමයි අද කෝටිපතියෙක් වෙලා තිබෙන්නේ" කියා. අද සමහර අයට ගුවන් යානා පුහුණු පාසල් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර අයට හෙලිකොප්ටර් තිබෙනවා; සමහර අයට නැව් තිබෙනවා. ළඟදී අහු වුණා, සමහර අයට එංගලන්තයේ ගෙවල් තිබෙනවා කියලා. ළඟදී ගෙවල් 16ක් තිබෙන එක්කෙනෙක් අහු වුණා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් මේ අය අල්ලන්න ගියාම, "මට නයෙක් ගැහුවා" කියලා එක්කෙනෙක් කිව්වා. පක්ෂ භේදයෙන් තොරව අපි මේවාට විරුද්ධ වෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ මම පැහැදිලිව කියනවා, මගේ පක්ෂය - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මම කියන දේ අහගන්න. අපේ පක්ෂයේ ඇමතිවරුන්ගේ files පවා මම ගිහින් දෙනවා. අම්මාපල්ල! මම ගිහින් දීලා තිබෙනවා. ඒක තමයි මගේ ක්‍රමය. [බාධා කිරීමක්] ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන චෝදනා ගැන මම කථා කරන්නේ නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා ගැන මම කථා කරන්නේ නැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! දැන් කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
එතුමා කැලණියේ පටන් ගත්ත සේරම දේවල් ගැන අපි දන්නවා. ඒ ගැන මම කථා කරන්නේ නැහැ.

මම කියන්නේ මෙපමණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේ රටට ආදරෙයි නම් මේ පාට කණ්ණාඩි අයින් කරලා, පක්ෂ, පාට භේදයෙන් තොරව අපි සියලුදෙනාම එකතු වෙලා කටයුතු කරමු. අපේ පක්ෂයේ, අප ඡන්දය දුන්න නායකයා වුණත් හොරෙක් නම් හොරෙන් හෝ ගිහින් ඒ file එක දෙන්න, ඒ complaint එක දමන්න. ඒ ඉල්ලීමයි මම කරන්නේ. ආදරණීය ජනතාවගෙනුත් මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා දේශපාලනයෙන් අන්ධ වන්නේ නැතිව, පක්ෂ, පාට භේදයෙන් තොරව තමන්ගේ ප්‍රදේශයේ, තමන්ගේ පක්ෂයේ -තමන්ගේ අම්මා තාත්තා වුණත් කමක් නැහැ - මේ ඉන්නේ හොරෙක් නම් අල්ලලා දෙන්න කියා. ඒක එළාර රජ්ජුරුවෝ කළා. ඒ කාලයේ රජවරු ඒ දේවල් කළා. මේ සංවිධාන, දෙපාර්තමේන්තු, කොමිසම් මොනවා පිහිටෙව්වත් වැඩක් නැහැ, මේ රට දියුණු වෙන්න නම්, දූෂණය නවත්වන්න නම් අපේ ජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති විය යුතුයි කියන කාරණය සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is Hon. Charles Nirmalanathan. You have ten minutes. ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

[பி.ப. 4.13]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் படிகளில் திருத்தம் மேற்கொள்ளல் தொடர்பான இன்றைய விவாதத்தில் பேச அனுமதித்தமைக்காக நன்றி. இன்று இந்த நாட்டிலே எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும், அந்த அரசாங்கத்திலிருக்கின்ற அமைச்சர்களினால் இலஞ்சம் மற்றும் ஊழல் செயற்பாடுகள் மேற்கொள்ளப்படுவது தொடர்ந்தும் நடைபெற்று வருகின்றது என்பதையும் தங்களுடைய கட்சி சார்ந்த உறுப்பினர்களை அந்தந்தக் கட்சியின் தலைவர்கள் காப்பாற்றுவதாகவும், அதாவது ஸ்ரீலங்கா சுதந்திரக் கட்சியிலிருக்கின்ற உறுப்பினர்களை ஜனாதிபதி அவர்களும் ஐக்கிய தேசியக் கட்சியிலிருக்கின்ற உறுப்பினர்களைப் பிரதமர் அவர்களும் இலஞ்சம் மற்றும் ஊழல் விசாரணைகளிலிருந்து காப்பாற்றி வருவதாகவும் கௌரவ உறுப்பினர் ரஞ்சன் ராமநாயக்க அவர்கள் சுட்டிக்காட்டியிருந்தார். அது உண்மையான விடயம்.

இன்று இந்த நாட்டில் இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழு ஒன்று இயங்கிவருகின்றது. அதன் பணிப்பாளர் நாயகத்தின் தகுதிக்கேற்ப அவருக்குச் சம்பளம் அதிகரிக்கப்பட வேண்டும். ஆனால், அந்தப் பணிப்பாளர் நாயகம் அரசியல் ரீதியான அணுகுமுறையில்லாது, குற்றம் இழைத்தவருக்கு எதிராக முறைப்பாடு முன்வைக்கப்பட்டால் அதைச் சரியான முறையில் விசாரிப்பதற்கு நடவடிக்கை எடுக்கவேண்டும். ஏனென்றால், இந்த அரசாங்கத்திலிருக்கின்ற சில அமைச்சர்களுக்கெதிராக முறைப்பாடுகள் செய்யப் பட்டிருக்கின்றன. அந்த முறைப்பாடுகளின் அடிப்படையில் ஒரு சில விசாரணைகளும் இடம்பெற்றிருக்கின்றன. ஆனால், விசாரணைகள் முடிவுறுத்தப்படாமல், நீதிமன்றத்திற்குச் சமர்ப்பிக்கப்படாமல், காலதாமதம் செய்யப்பட்டு வருகின்றது. அத்துடன், ஆறு மாதங்களுக்கு முன்னர் இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தினை மாற்றியமையானது இந்த ஆணைக்குழுவில் அரசியல் ரீதியான தலையீடு இருக்கின்றது என்பதை இந்த நாட்டின் மக்களுக்கும் புரியவைத்தது. எனவே, இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவிற்கு அரசியல் ரீதியான அழுத்தம் இருக்கின்றது. அதனப்படையில்தான் ஆறு மாத காலத்திற்கு முன்னர் இருந்த பணிப்பாளர் நாயகம் செயற்படுவதைத் தடுத்து நிறுத்துவதற்காக அல்லது ஒரு சில அமைச்சர்கள் சம்பந்தமாக மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளை நிறுத்துவதற்காக அவரின் மாற்றம் நடைபெற்றது. அந்தவகையில், ஒரு சில அமைச்சர்கள் தப்பித்துக்கொள்கின்றார்கள். உண்மையில், இந்தப் பாராளுமன்றத்திற்கு வாடகைக் காரில் வந்த பாராளுமன்ற உறுப்பினர் ஒருவர், தற்போது அபிவிருத்திக்குழுக் கூட்டத்திற்கு ஹெலிகொப்டரில் வருகின்ற ஒரு சூழ்நிலை இருக்கின்றது. இலஞ்சம், ஊழல் என்பன இடம்பெறாவிட்டால் இத்தகைய அமைச்சர்களுடைய நடவடிக்கைகள் இப்படி இருக்காது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நிலையில் நாட்டை எப்படிக் கட்டியெழுப்ப முடியுமென்பதை நீங்கள் அறிந்துகொள்ள வேண்டும்.

வலுக்கட்டாயமாகக் காணாமலாக்கப்படுவதிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேசச் சமவாய சட்டமூலம் பாராளுமன்றத்தினுடைய ஒழுங்குப் பத்திரத்தில் இருக்கின்றது. பௌத்த மகாநாயக்க தேரர்களின் நான்கு 'நிக்காயா'க்கள் இன்றைய இந்தச் சட்டமூலத்தைப் பாராளுமன்றத்தில் நிறைவேற்ற வேண்டாமென்று எதிர்ப்புத் தெரிவித்தவுடன் உடனடியாக அமுலுக்கு வரும்வகையில் காணாமலாக்கப்பட்டவர்கள் சம்பந்தமான இந்தச் சட்டமூல நிறைவேற்றத்தை அரசாங்கம் பிற்போட்டிருக்கிறது. மேலும், அரசியல் யாப்பு மாற்றம் இந்த நாட்டுக்கு அவசியமில்லையென்ற கருத்தையும் அவர்கள் தெரிவித்திருக்கின்றனர். 2009ஆம் ஆண்டில் நேரடியாக இராணுவத்திடம் கையளிக்கப்பட்ட உறவுகள் எங்கே என்று கிட்டத்தட்ட 4,000 பெற்றோர் தொடர்ச்சியாகத் தங்களுடைய உறவுகளைத் தேடிக்கொண்டிருக்கிறார்கள். குறிப்பாக கிளிநொச்சியில் 125 நாட்களுக்கும் மேலாக அவர்கள் அதற்காகப் போராட்டம் நடத்திக்கொண்டிருக்கிறார்கள். அதுபோல், முல்லைத்தீவில், வவுனியாவில் மற்றும் வடக்கு, கிழக்கின் பல மாவட்டங்களில் தங்களுடைய உறவுகளைத் தேடித் தரும்படி அப்பெற்றோர் போராட்டம் நடத்திக்கொண்டிருக்கிறார்கள். காணாமலாக்கப்பட்டவர்கள் தொடர்பான சட்டமூலம் நிறைவேற்றப்பட்டு, அதனூடாக எடுக்கப்படக்கூடிய நடவடிக்கைகளை அவர்கள் எதிர்பார்த்திருக்கிறார்கள்.

கடந்த மாதம் யாழ்ப்பாணம் சென்ற ஜனாதிபதி அவர்கள், இராணுவத்தினரிடம் சரணடைந்த போராளிகளுடைய பெயர் விபரங்களை வெளியிடுவதாக ஆளுநருடைய அலுவலகத்தில் வைத்து காணாமலாக்கப்பட்டவர்களுடைய உறவுகளுக்கு உறுதியளித்திருந்தார். ஆனால், இன்றுவரை அவருடைய வாக்கு பொய்யாகியிருக்கிறது. இதை நினைக்கும்போது உண்மையில் மனவேதனையாக இருக்கின்றது. எங்களுடைய மக்கள் தங்களுடைய உறவுகளைக் கண்டறிவதற்காக எடுக்கின்ற ஒவ்வொரு முயற்சியின்போதும் அரசாங்கம் கொடுக்கின்ற வாக்குறுதிகள் நிறைவேற்றப்படுவதில்லை. விசாரணைகள் நடைபெறாவிட்டாலும் தண்டனைகள் வழங்க முடியாவிட்டாலும் காணாமலாக்கப்பட்டவர்கள் தொடர்பான அலுவலகமாவது திறக்கப்படுமென்று நம்பி தங்களுடைய பதிவுகளை மேற்கொள்வதற்காக உறவினர்கள் காத்திருந்தபோது, அதைக்கூட இன்று இந்த அரசாங்கம் பிற்போட்டிருக்கிறது. உண்மையில் இந்த மக்கள் 4,000 பேரும் இலங்கையின் பிரஜைகள் அல்லவா? ஏன், அவர்களுடைய இந்தக் கோரிக்கையை அரசாங்கம் நிராகரிக்கிறது? காணாமல் ஆக்கப்பட்டவர்கள் தொடர்பில் உண்மையைக் கண்டறிய விசாரணை நடத்தவேண்டும் என்ற கோரிக்கையானது, வெறுமனே இந்த 4,000 பேருடையது மட்டுமல்ல. மாறாக அது வடக்கு, கிழக்கில் வாழ்கின்ற எங்களுடைய ஒட்டுமொத்தத் தமிழ் இனத்தினதும் கோரிக்கையாகும். அவர்களுக்கு என்ன நடந்தது என்பதைத் தெளிவுபடுத்துவதற்கு ஏன், இந்த அரசாங்கம் பின்னிற்கின்றது? 225 பாராளுமன்ற உறுப்பினர்கள் அங்கம் வகிக்கின்ற இந்தப் பாராளுமன்றத்தில், ஒழுங்குப் பத்திரத்தில் இடம்பெற்ற ஒரு விடயம் தொடர்பில் உடனடியாக அமுலுக்கு வரும்வகையில் மாற்றம் செய்வதாக இருந்தால், அனைத்துக் கட்சித் தலைவர்களையும் அழைத்து அவ்விடயம் தொடர்பில் கலந்தாலோசித்ததன் பின்னரே குறித்த மாற்றம் இடம்பெற வேண்டும் என்று நான் நினைக்கின்றேன். ஆனால், இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்படவிருந்த வலுக் கட்டாயமாகக் காணாமற்போக்கப்படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேசச் சமவாய சட்டமூலத்தைப் பிற்போடுமாறு நான்கு பௌத்த தேரர்கள் கோரிக்கை விடுத்திருக்கிறார்கள். பௌத்த மதகுருமாரின் கோரிக்கைக்கு இந்த நாட்டின் ஜனாதிபதியும் பிரதமரும் என்ன பதில் சொல்லப்போகின்றார்கள்? என்பதை நான் இந்த அரசாங்கத்திடம் கேட்க விரும்புகின்றேன்.

நாங்கள் அந்தப் பௌத்த மத குருமாரையும் மதிக்கின்றோம். நான் இந்த மதகுருமாரிடத்தில் அன்பாகக் கேட்டுக்கொள்வது என்னவெனில், அவர்களுடைய இந்தக் கோரிக்கையை அவர்கள் மீள்பரிசீலனை செய்யவேண்டும் என்று. இந்த நாட்டில் இருக்கின்ற ஒன்பது மாகாணங்களுக்கும் சம அளவில் அதிகாரங்கள் பகிரப்பட வேண்டுமென்பதற்காக கடந்த ஒன்றரை வருடங்களுக்கும் மேலாகப் பாராளுமன்றத்தில் ஒரு வழிநடத்தல் குழுவின்மூலம் எல்லாக் கட்சிகளின் பிரதிநிதிகளினதும் இணக்கப்பாட்டுடன் நடவடிக்கைகள் முன்னெடுத்துச் செல்லப்படுகின்றன. இந்த நடவடிக்கையை மதித்து, பௌத்த மதகுருமார் தங்களுடைய கோரிக்கையை மீள்பரிசீலனை செய்யவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன். கடந்த காலத்தில் இந்த நாட்டில் நடைபெற்ற யுத்தத்தினால் இரண்டு தரப்பிலும் மக்கள் அழிவுகளைச் சந்தித்தார்கள். எனவே, இனிவரும் காலத்திலும் யுத்தம் ஏற்படாதவண்ணம், இந்த நாட்டிலுள்ள மக்கள் அனைவரும் அரசியல் ரீதியாக சம உரிமையுடனும் அதிகாரங்களுடனும் மத உரிமையுடனும் மொழி உரிமையுடனும் வாழ்வதற்கு ஏற்றவகையில், ஓர் அரசியல் ரீதியான மாற்றமொன்று - அரசியல் யாப்பு மாற்றமொன்று இடம்பெறவேண்டும். இந்த நாட்டில் அரசியல் யாப்பு மாற்றமொன்று இடம்பெறாவிட்டால் மீண்டும் மிகப்பெரிய குழப்பங்கள் ஏற்படுவதற்கு வாய்ப்புக்கள் இருக்கின்றன.

ஆரம்ப காலத்தில் எங்களுடைய பிரதேசங்களில் இருந்த இளைஞர்கள் ஆயுத ரீதியாகப் போராட முற்பட்டதற்குக் காரணம், அவர்களுடைய உரிமைகள் மறுக்கப்பட்டமை யாகும். தமிழ் இனம் என்ற வகையில், அவர்களுக்கு கல்வி மற்றும் வேலைவாய்ப்புக்கள் மறுக்கப்பட்டன. இவ்வாறு ஒவ்வொரு விடயத்திலும் எங்களுடைய மக்கள் புறந்தள்ளப்பட்டதன் காரணத்தினால்தான் அன்று எங்களுடைய இளைஞர்கள் ஆயுதமேந்திப் போராடினார்கள். அப்படியான ஒரு சூழ்நிலை இந்த நாட்டில் மீண்டும் ஏற்படக்கூடாது. இந்த நாடு பொருளாதாரத்தில் முன்னேறவேண்டுமாக இருந்தால், இந்த நாட்டில் ஒரு நிரந்தர சமாதானம் ஏற்படவேண்டுமாக இருந்தால், அரசியல் யாப்பு மாற்றம் என்பது மிகவும் அவசியமானது. அது இந்த நாட்டிலுள்ள அனைத்து மக்களும் ஏற்றுக்கொள்ளக்கூடிய வகையில் அமையவேண்டும். அப்படி அமைந்தால்தான், எங்களுடைய நாட்டைப் பொருளாதார ரீதியில் முன்னேற்றுவதற்குரிய முயற்சிகளை நாங்கள் முன்னெடுக்கலாம்.

காணாமல் ஆக்கப்பட்டவர்களுடைய உறவுகள் கடந்த 09 வருடங்களுக்கு மேலாக நடத்திவந்த போராட்டத்தின் விளைவாக - அவர்களுடைய முயற்சியினால் கொண்டு வரப்பட்ட சட்டமூலத்தை அரசாங்கமானது இன்று விவாதத்துக்கு எடுக்காமல் பிற்போட்டிருக்கிறது. இந்த நாட்டின் ஜனாதிபதி அவர்கள் யாழ்ப்பாணத்தில் வாக்குறுதி அளித்ததுபோன்று, இறுதி யுத்தத்தின்போது இராணுவத்தினரிடம் சரணடைந்தவர்களுடைய பெயர்ப் பட்டியலை மிக விரைவில் வெளியிடவேண்டும். எனவே, இந்தச் சட்டமூலம் மிக விரைவில் பாராளுமன்றத்துக்குக் கொண்டுவரப்பட்டு, நிறைவேற்றப்பட வேண்டும். அதற்கு எங்களுடைய ஜனாதிபதி அவர்களும் பிரதமர் அவர்களும் ஒருமித்துச் செயற்பட்டு, எமது மக்களின் வலியைப் போக்குகின்ற வகையில் உரிய நடவடிக்கைகளை மிக விரைவில் எடுக்கவேண்டும். ஏனென்றால் காணாமல் போன உறவுகளுடைய - நேரடியாக ஒப்படைக்கப்பட்ட இளைஞர்களுடைய பெற்றோர் வயது முதிர்ச்சியடைந்து செல்கின்றார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
මට විනාඩියක කාලයක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இந்த விடயம் சம்பந்தமாக அவர்கள் நேரடியாகச் சாட்சியமளிக்கின்றபோது வயது முதிர்ச்சி காரணமாக அவர்களுக்குப் பல குழப்பங்கள் ஏற்படலாம். அதேநேரம் காணாமல் ஆக்கப்பட்டவர்களுடைய விடயம் சம்பந்தமாகப் பல அமைச்சர்களும் தங்களுடைய கருத்துக்களைச் சொல்லிக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, காணாமல் ஆக்கப்பட்டோர் சம்பந்தமான சட்டம் மிக விரைவில் நடைமுறைக்கு வரவேண்டும்; அவர்களுக்கு என்ன நடந்தது என்பது பற்றிய உண்மையை இந்த அரசாங்கம் எங்களுடைய மக்களுக்கும் இந்த உலகத்திற்கும் தெரியப்படுத்த வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you.

මීළඟට, ගරු පාලිත රංගෙ බණ්ඩාර රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.25]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன இராஜாங்க அமைச்சர்)
The Hon. Palitha Range Bandara - State Minister of Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණුත් සලකා බලා, ඒවාට පිළිතුරකුත් ලබා දෙමින් මගේ කථාව ආරම්භ කරන්න මම බලාපොරොත්තු වෙනවා.

අද ඉදිරිපත් කරන්න තිබුණු පනත් කෙටුම්පත පිළිබඳවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳවත්, ඒ වාගේම ගරුතර මහා සංඝරත්නයට රජය ඇහුම් කන් දීම පිළිබඳවත් ගරු මන්ත්‍රීතුමා කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව හැමෝටම ඇහුම් කන් දෙන ආණ්ඩුවක්. රට තුළ විවිධ ප්‍රශ්න ඇති කරලා තිබෙනවා. විවිධ ප්‍රශ්න නිසා අද රටේ ජනතාව වීථි බැහැලා තිබෙනවා. ඒ ප්‍රශ්නවල නිර්මාතෘවරු, ඒ ප්‍රශ්න ඇති කරන උදවියත් එක්ක එක්කාසු වෙලා, ඒ අයට උඩ ගෙඩි දෙමින් පිටුපසින් ඉඳලා අවුස්සමින් ඉන්නවා. අපි ඒ හැම කෙනෙකුගේම ප්‍රශ්නවලට ඇහුම් කන් දීලා තිබෙනවා. ඒ හැමෝටම ඇහුම් කන් දීලා තමයි ප්‍රශ්නවලට විසඳුම් සොයන්නේ. මේ රටේ මූලික ආගම වුණු බෞද්ධාගමේ නායක ස්වාමීන්වහන්සේලා -ගරුතර මහා සංඝරත්නය- යම් කාරණයක් කිව්වා නම්, ඉල්ලීමක් කළා නම්, ඒකට ඇහුම් කන් දීම මේ රජයේ වග කීමක් වෙනවා; යුතුකමක් වෙනවා. ඒ අනුව රජය, ගරුතර මහා සංඝරත්නයට ඇහුම් කන්

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

දීලා, උන්වහන්සේලාගේ අදහස් පිළිබඳවත් සලකා බලා අවශ්‍ය විධියට ක්‍රියා කරයි. හැබැයි, එසේ කටයුතු කරනකොට "ඒක හේතු කරගෙන නැවත යුද්ධයක් ඇති වෙනවා. නැවත අරගළයක් ඇති කරනවා." කියන කථා කීම ඒ තරම් සුදුසු දෙයක් නොවෙයි. මොකද, අපි හැම දෙනාම ඉවසිලිවන්තව සහ සංහිඳියාවෙන් කටයුතු කරන්න ඕනෑ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order? පොඩ්ඩක් ඉන්න ගරු රාජ්‍ය අමාත්‍යතුමනි.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම කිව්වේ මේකයි. මහානායක ස්වාමීන්වහන්සේලාගේ කථාව ආණ්ඩුව අහපු එක හරි. අපේ මිනිස්සු අවුරුදු 9ක් තිස්සේ කියන එකත් අහන්න කියන එක තමයි අපි කියන්නේ. මහානායක ස්වාමීන්වහන්සේලා කියන දේවල් අහන්න එපා කියලා මම කිව්වේ නැහැ.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු මන්ත්‍රීතුමනි, මම කිව්වෙත් ඒක තමයි. ගරුතර මහා සංඝරත්නයටත් ඇහුම් කන් දෙනවා,- [බාධා කිරීමක්] දැන් ඇති ගරු මන්ත්‍රීතුමා. මට තව විනාඩි 8ක් විතරයි ඉතුරුවෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] හොඳයි, දැන් මට මගේ කථාව කරන්න දෙන්න. ඔබතුමා බාධා කරද්දි මගේ මානෘකාව ගැන කථා කර ගන්න විධියක් නැහැ නේ, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
හොඳයි.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
බොහොම ස්තුතියි. අපි කිව්වෙත් ඒකම තමයි. අපි සියලුම දෙනාට ඇහුම් කන් දෙනවා. ඇහුම් කන් දීලා තමයි සම්මුතියෙන් මේ ප්‍රශ්න බේරුම් කරගන්න තිබෙන්නේ. මේවා අවුරුදු ගණනක් තිස්සේ ඇති වුණු ආරවුල්. අපි ඇහුම් කන් දෙනවා. [බාධා කිරීමක්] ඔව්, කථා බහ කරනවා; සම්මුතියක් ඇතුව යනවා. ඒකයි ගරු මන්ත්‍රීතුමනි මම කිව්වේ, සම්මුතියෙන් කටයුතු කරන නිසා පසුව බේරුම් කරගන්න පුළුවන් කියා.

සරත් ජයමාන්න මැතිතුමා තමයි අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන්නේ. අපට මතකයි මීට ප්‍රථම දිල්රුක්ෂි ඩයස් මැතිනිය එම තනතුරේ සිටියදී පොඩි ආන්දෝලනාත්මක තත්ත්වයකුත් ඇති කළා. දිල්රුක්ෂි ඩයස් මැතිනිය පුද්ගලයාගේ පාට බැලුවේ නැහැ, පක්ෂ බැලුවේ නැහැ, කවුද කියලා බැලුවේ නැහැ, තරාතිරම බැලුවේ නැහැ. ඇය වෙත ලැබුණු පැමිණිලි අනුව ඇය රාජකාරි කළා. ඇය රාජකාරි කරනකොට යම් යම් උදව්ය අත් අඩංගුවට ගන්න වුණා, යම් යම් උදව්ය අධිකරණයට ඉදිරිපත් කරන්න වුණා, නඩු පවරන්න සිද්ධ වුණා. ඒක ඇගේ රාජකාරිය. ඇය කාන්තාවක් වශයෙනුත්, ඒ වාගේම අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වගකීම අනුවත් ඇය නිවැරදිව හා ශක්තිමත්ව වැඩ කළා. ලිහිල් විධියට නොව, ශක්තිමත්ව වැඩ කළා. නිලධාරියෙක් වුණාම, මෙවැනි ආයතනයක ප්‍රධානියෙක් වුණාම ඒ විධියට ශක්තිමත්ව වැඩ කටයුතු කරන්න ඕනෑ. එහෙම කටයුතු කරනකොට විවිධ උදව්ය විවිධ බලපෑම් ඇති කළා. අවසානයේදී එතුමියට තනතුරින් ඉවත් වෙන්නට සිදුවුණා. කොහොම හරි අතිගරු ජනාධිපතිතුමා විසින් සරත් ජයමාන්න මැතිතුමාව නැවත එම තනතුරට පත්කර තිබෙනවා. සරත් ජයමාන්න මැතිතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්. අත් දැකීම් බහුල, දැනුමෙන් අනූන දක්ෂ නිලධාරියෙක්. අධිකරණය තුළදී දක්ෂකම් පෙන්නපු, ඒ වාගේම නීතිපති දෙපාර්තමේන්තුව තුළ දක්ෂකම් පෙන්නපු, අධිකරණය තුළත්, නීතිපති දෙපාර්තමේන්තුව තුළත්, ඒ වාගේම රට තුළත් හොඳ නමක්, නොකැලැල් නමක් පවත්වාගත් නිලධාරියෙක් කියන එක මම පෞද්ගලිකවම සඳහන් කරන්නට කැමැතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එම නිසා දිල්රුක්ෂි ඩයස් මැතිනියටත් වඩා තව තවත් ශක්තිමත්ව එතුමාට මෙම කාර්ය භාරය කරගෙන යෑමට ශක්තිය, ධෛර්ය ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

නිලධාරීන් වැඩ කරද්දී ඔවුන්ට වැටුප් දිය යුතුයි, දීමනා දිය යුතුයි, නිල නිවාස දිය යුතුයි, වාහන ලබාදිය යුතුයි, ඒ වාගේම අනෙකුත් පහසුකම් ලබාදිය යුතුයි. එවැනි පහසුකම් ලබා නොදෙනකොට තමයි එක පැත්තකින් අල්ලසට හා දූෂණයට යොමුවෙන්නේ. ඒ වාගේම දුෂ්කර තැන ඉඳගෙන, දුෂ්කර ක්‍රියාවේ සිටිමින් තමන්ගේ කාර්ය භාරය කරන්න පුළුවන් වෙන්නේ නැහැ. එම නිසා සිත්ගන්නාසුළු වැටුපක්, එයට අවශ්‍ය දීමනා සහ පහසුකම් සලසා දීම රජයක වග කීමක්. ඒ අනුව කැබිනට් මණ්ඩලය ඒ තීන්දුව අරගෙන, ඒ පිළිබඳ යෝජනාව තමයි අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. එය සිදු කළ යුතු කාරණයක් විධියට අප දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ පවතින අල්ලසට, දූෂණයට විරුද්ධව අප හැම තිස්සේම කථා කරනවා. හැබැයි, බහුතරයක් තැන්වල සිද්ධ වන්නේ අල්ලස, දූෂණයමයි. ගිය තැන; අවස්ථාවක් ලැබුණු තැන අනෙකා පැත්තකට දමලා කෙසේ හෝ හම්බ කර ගැනීමට උපක්‍රමයක් තමයි බොහෝ විට බලන්නේ. අපේ රටේ මහා පරිමාණ ව්‍යාපෘති සිදු වෙනකොට ඒ ව්‍යාපෘතිවලදී බොහෝ විට සිද්ධ වන දෙයක් තමයි වංචාව හා දූෂණය.

මෑත භාගයේ රටේම ආන්දෝලනයට ලක් වෙලා තිබෙන කාරණයක් තමයි බණ්ඩාරවෙල සිද්ධිය. විවේකයක් ගන්න, ටිකක් නිදහසේ ජීවත් වෙන්න, සතුටින් ගත කරන්න, සැපක් ගන්න කෙනෙකුට අප යන්න කියන්නේ බණ්ඩාරවෙලට, තුවරළියටයි. හැබැයි, එහෙම සැපක් ගන්න බණ්ඩාරවෙල යන්න කිව්වත් අද එහි ජීවත් වන මිනිසුන් දුකක් විඳින ප්‍රදේශයක් බවට පත් වෙලා තිබෙනවා. ඇයි, ඒ ප්‍රදේශය මේ තත්ත්වයට පත් වුණේ? මම ඒ පිළිබඳව කෙටියෙන් සඳහන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

උමා ඔය ව්‍යාපෘතිය 1989 අවුරුද්දේ සිට සැලසුම් කළ කාර්යයක්. එදා කිරිදි ඔය ව්‍යාපෘතිය කරද්දි, -මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ පැත්තේ- එය සිදුකිරීමට ඇවිත් හිටියේ ජපන් ජාතිකයන්. මිල ගණන් නොතකා මේ ව්‍යාපෘතිය සිද්ධ කරන්න, උමා ඔය ව්‍යාපෘතිය අවසන් කරලා මොනරාගලට,

හම්බන්තොටට ජලය අරගෙන යන්න, ඒකේ මිල ගණන්වලට වඩා ජනතාවට ලැබෙන්නා වූ ප්‍රතිලාභය වටිනවා කියන උපදේශය මේ ජපන් විශේෂඥයන් එදා අපේ රජයට; ලංකා ආණ්ඩුවට දීලා තිබුණා. ඒ අනුව මේ ව්‍යාපෘතිය පිළිබඳව කටයුතු කරන්න පියවර ගත්තා.

2001 වර්ෂය වන විට එහි ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් වුණා. මේ ව්‍යාපෘතිය පිළිබඳව අධ්‍යයනයක් කරන්න භාර දුන්නේ කැනේඩියානු රජයට අයත් Canadian International Development Agency එකටයි. එම ආයතනය මේ පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළා. එම අධ්‍යයනය සිදු කරලා 2001 ජනවාරි මාසයේ 28 වැනි දා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත එම වාර්තාව පිළිගැන්වුවා. එවකට වාරිමාර්ග කටයුත්ත භාරව තිබුණේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයටයි. ඒ නිසා තමයි විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මේ වාර්තාව ඉදිරිපත් කළේ. මේ වාර්තාවට අත්සන් කළේ ව්‍යාපෘති කළමනාකාරතුමායි. සී.ජේ. හැන්සන් මහත්මයා. එතුමා ඉංජිනේරු මහත්මයෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාර්තාව අනුව, සමස්ත ව්‍යාපෘතිය සඳහා වියදම ඩොලර් මිලියන 160යි; මෙය බහු කාර්ය ව්‍යාපෘතියක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ජීවත් වන මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවායට ජලය ගෙන යාම, ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයට ජලය ගෙන යාම, විදුලිය උත්පාදනය ආදී මේ සියලු කාරණා සිදු කිරීම සඳහායි මේ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ වාර්තාව අනුව, එම ව්‍යාපෘතිය නිම කිරීම සඳහා ඩොලර් මිලියන 160ක් ඇස්තමේන්තු කර ඇති බව මම කිව්වා. එම මිල ගණන් දැක්වෙන වගුවක් ඇතුළත් මෙම ලේඛනය අනෙක් අයගේත් දැනගැනීම සඳහා මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් මිලියන 160කට සකස් කරන්න සූදානම් කළ උමා ඔය ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කළ මුදල, පසුකාලීනව -2008 විතර වෙන කොට- ඩොලර් මිලියන 300 දක්වා ඉහළට නැග්ගුවා. එවකට රුපියලේ අගයත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ආණ්ඩුව සම්බන්ධ වෙලා මේ ව්‍යාපෘතිය කිරීම සඳහා අවසාන යුගයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඩොලර් මිලියන 300කට එකඟතාවකට ඇවිල්ලා තිබුණා. හැබැයි, තව ටිකක් ඉදිරියට යන කොට මේ සඳහා පසු ගිය රජයත්, ඒ වාගේම ඉරාන රජයත් ඒකට එක්කාසු වෙනවා. ඉරානයේ හිටපු ජනාධිපති අහමදිනෙජාද් මහත්මයාත්, ශ්‍රී ලංකා ජනාධිපති හැටියට ඒ අවස්ථාවේ හිටපු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් දෙන්නා එක්කාසු වෙලා මේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගිවිසුමකට ඇතුළත් වුණා. එවැනි ආකාරයට ගිවිසුමකට ඇතුළත් වෙන කොට උමා ඔය ව්‍යාපෘතිය වෙනුවෙන් සකස් කළ ඇස්තමේන්තු මුදල ඩොලර් මිලියන 160 ඉඳලා, ඩොලර් මිලියන 548 දක්වා ඉහළ ගියා. ඒ විධියට ඩොලර් මිලියන 548 දක්වා ඉහළ නංවන කොට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඒකට එකඟ වුණේ නැහැ; විරුද්ධ වුණා. ඒ වෙලාවේ අමාත්‍යාංශයේ ලේකම් හැටියට හිටියේ ඒ.ඩී.එස්. ගුණවර්ධන කියලා මහත්මයෙක්. ඔබතුමන්ලාගේ ප්‍රදේශයේ තිබෙන මව් ආර, ඒ වාගේම කිරිඳි ඔය ව්‍යාපෘතියේ කටයුතු සිදු කළේ මේ ඒ.ඩී.එස්. ගුණවර්ධන කියන ඉංජිනේරු මහත්මයා; එහෙම නැත්නම්, අමාත්‍යාංශයේ ලේකම්තුමා. එතුමා දක්ෂ කෙනෙක්. පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය කඩා ගෙන යන වෙලාවේ, දැවැන්ත විනාශයක් සිදු වෙන්න ගිය වෙලාවේ, ඉදිරියට ගිහිල්ලා ඒ විනාශයෙන් පොළොන්නරුව බේරා ගන්න; ප්‍රදේශය බේරා ගන්න; පරාක්‍රම සමුද්‍රය බේරා ගන්න වැඩ කටයුතු කළේ මේ ඒ.ඩී.එස්. ගුණවර්ධන කියන අමාත්‍යාංශ ලේකම්තුමායි, එහෙම නැත්නම් ඉංජිනේරු මහත්මයායි. [බාධා කිරීමක්] ඒක තමයි. ඒ.ඩී.එස්. ගුණවර්ධන මහත්මයා දක්ෂ නිලධාරියෙක්; දැනුම තිබෙන නිලධාරියෙක්; කාර්යක්ෂම නිලධාරියෙක්; තමන් කරන කාර්ය සඳහා කැප වෙලා වැඩ කළා. මම සඳහන් කළ මව් ආර ව්‍යාපෘතිය, කිරිඳි ඔය ව්‍යාපෘති කරද්දී, ඒ ව්‍යාපෘති සඳහා රජයේ ඇස්තමේන්තු මුදලින් තුනෙන් එකයි වියදම් කරලා තිබුණේ, අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඇස්තමේන්තුගත මුදලින් තුනෙන් දෙකක මුදලක් ඉතිරි කරලා තිබුණා. ඒ අනුව එදා උමා ඔය ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුදල ඩොලර් මිලියන 548 දක්වා වැඩි කරන කොට ඒ.ඩී.එස්. ගුණවර්ධන මහත්මයලා ඒකට එකඟ වුණේ නැහැ; විරුද්ධ වුණා. එහෙම විරුද්ධ වෙලා අවසානයේ අමාත්‍යාංශයත්, ආණ්ඩුවත් අතර මත ගැටුමක් ඇති වුණා. නමුත්, අහමදිනෙජාද් හිටපු ඉරාන ජනාධිපතිවරයා එන කොට එතුමා එක්ක ගිවිසුම අත්සන් කරන්න යොදා ගෙන තිබුණා. ඒ අනුව, ඇස්තමේන්තු රහිත හිස් ගිවිසුමක් අත්සන් කළේ. හැබැයි, ඒ වෙලාවේ මේ අමාත්‍යාංශ ලේකම්වරයා සටහනක් තැබුවා, "ඇස්තමේන්තුව සාධාරණ ඇස්තමේන්තුවක් නම් තමයි ඒකට එකඟ වෙන්නේ" කියා. මේ තත්ත්වය මත අවසානයේදී ගුණවර්ධන මහත්මයා අමාත්‍යාංශ ලේකම් ධුරයෙන් ඉල්ලා අස් වෙලා ගියා. ඊට පස්සේ අයිවන් කියලා මහත්මයෙක් වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විධියට පත් කර ගත්තා. එතකොට වාරිමාර්ග ඇමතිවරයා විධියට හිටියේ චමල් රාජපක්ෂ මහත්මයා, රටේ ජනාධිපතිවරයා විධියට මහින්ද රාජපක්ෂ මහත්මයා හිටියා. අයියයි, මල්ලියි දෙන්නාම හිටියා, අහමදිනෙජාද් අයියත් එක්ක එකතු වෙලා උමා ඔය ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියන 548කට ගිවිසුම අත්සන් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
මේ කාරණය ගැන කථා කරන්න වැඩිපුර වෙලාව දුන්නත් කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ආකාරයට කටයුතු කරලා තමයි මේ ගිවිසුම අත්සන් කළේ. මේ ව්‍යාපෘතිය සඳහා ඩොලර් මිලියන 248ක් වැඩිපුර තමයි ඒ ගිවිසුම අත්සන් කළේ.

ඒ අනුව දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය බලන්න? එහෙම ගිවිසුම් ගහලා අද මුළු බණ්ඩාරවෙලටම විනාශයක් කරලා තිබෙනවා. මේ වෙන කොට බණ්ඩාරවෙලට නිවාස 1,900ක්, වගා වන්දි වශයෙන් රුපියල් මිලියන 367ක්, ජල ව්‍යාපෘති තුනකට රුපියල් මිලියන 351ක්, තවත් පවුල් 2,400කට ජල සම්බන්ධතා නොමිලේ ලබාදීමටත්, ඒ වාගේම වියළි සලාක ආදී විවිධ දේවල් ජනතාවට ලබා දෙන්නත් සිද්ධ වලා තිබෙනවා, මේ ව්‍යාපෘතියේ තිබෙන අක්‍රමිකතා නිසා.

මේ ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිසරික ඇගයීම් වාර්තාව -පිටු හාරසිය ගණනකින් සමන්විත වාර්තාව- මා සතුව තිබෙනවා. එවකට මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති ලෙස සිටි චරිත හේරත් මහතා මේ වාර්තාවට අත්සන් කළේ, 2012 අප්‍රේල් මාසයේ 12වන

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

දායි. එනම්, සිංහල අවුරුද්දට පෙර දවසේයි; රජයේ නිවාඩු දවසේයි. මෙම වාර්තාව සකස් කරන්න කලින් මධ්‍යම පරිසර අධිකාරියේ උදවිය ගියා, උමාඔය ප්‍රදේශයට; බණ්ඩාරවෙල ප්‍රදේශයට. ගිහින් පරීක්ෂණ පැවැත්වුවා. කරුණු 24ක් අනුව එම ව්‍යාපෘතියේ තිබෙන නුසුදුසුකම් පිළිබඳව ඔවුන් හෙළිදරවු කළා; ඒ වෙනුවෙන් ඇති විකල්ප ගැන කිව්වා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එම ව්‍යාපෘතියට අදාළ පරිසර අධ්‍යයන වාර්තාව සකස් කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට බාර දෙනු ලැබුවේ කවුරුන් විසින් ද? මා දන්නා විධියට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිසරය පිළිබඳ විෂයයක් ඉගැන්වෙන්නේ නැහැ. භූ ගර්භ විද්‍යාව පිළිබඳ subject එකක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විෂයයන්වලට ඇතුළත් වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර නම් පේරාදෙණිය විශ්වවිද්‍යාලය, මොරටුව විශ්වවිද්‍යාලය ආදිය තමයි එකී කටයුතුවලට වැඩිපුර සම්බන්ධ වෙලා තිබුණේ. නමුත් මෙම ව්‍යාපෘතියෙහි ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකස් කළේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයි. එසේ නම්, එය පදනම් කරගත්තේ ඇයි- [බාධා කිරීමක්]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)

එම කටයුත්ත බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයට භාර දුන්නා වාගේ වැඩක් තමයි කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ මොරටුව විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආදියයි මෙවැනි ශක්‍යතා අධ්‍යයන සිදු කරන්නේ. නමුත් මෙකී ශක්‍යතා අධ්‍යයනය සිදු කළේ මහාචාර්ය ස්වර්ණා පියසිරි, මහාචාර්ය නන්දලාල්, උමං විශේෂඥ අතුකෝරල කියන උදවියයි. දිය යුතු තැනට නොවෙයි, ඒ සම්බන්ධව දැනුමක් තිබෙන උදවියට නොවෙයි, නිපුණතාවක් තිබෙන උදවියට නොවෙයි ඒ වැඩේ කරන්න බාර දී තිබුණේ. ඇත්ත වශයෙන්ම මොරටුව විශ්වවිද්‍යාලය කළ යුතු කාර්යයක් කරන්න දී තිබෙන්නේ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයටයි. මේ අන්දමට තමයි මෙකී ශක්‍යතා අධ්‍යයනය සිදු කළේ. එවැනි ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් තමයි චරිත හේරත් මහත්මයා සිංහල හා හින්දු අලුත් අවුරුද්දට ඉස්සෙල්ලා දවසේ -නිවාඩු දවසේ- උදේ ගිහින් කාර්යාලය ඇරලා මේ වාර්තාව දුන්නේ. බලපෑම් මතයි, තර්ජන මතයි, එය කළේ. ඩොලර් මිලියන 248ක් ගසා කෑම සඳහා, හොරා කෑම සඳහා කළ උපක්‍රමයක් තමයි, මේ උමාඔය ව්‍යාපෘතිය. ඒ නිසා බණ්ඩාරවෙල මිනිස්සු අපා දුක් විඳින මිනිසුන් බවට, මර බියෙන් ජීවත් වන මිනිසුන් බවට අද පත් වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියා මම කථාව අවසන් කරන්නම්. ශ්‍රී පාද ස්ථානයේ දිවාගුහාවේ තිබෙනවා, සෙල් ලිපියක්. එය නිශ්ශංකමල්ල රජ දවසේ සකස් කරන ලද සෙල් ලිපියක්. එම සෙල් ලිපියෙන් කියැවෙන්නේ, "රජයේ දේපළ, ජනතා දේපළ ගසා කන උන් ඊළඟ ආත්මයේ බල්ලන්, බළලුන් වශයෙන් උපදිනවා" කියන එකයි. එහෙම නම්, බණ්ඩාරවෙල මිනිසුන්ට දැන් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ, ඒ ඩොලර් මිලියන 248 ගසා කෑපු උන් බල්ලන්, බළලුන් වී ඊළඟ ආත්මයේ ඉපදෙන එක දිහා බලාගෙන සිටීමයි කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට, ගරු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය විනාඩි 10යි.

[අ.භා. 4.42]

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)

මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ විවාදයට සම්බන්ධ වන්න ලැබීම පිළිබඳව සතුටු වෙනවා වාගේම මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නව අධ්‍යක්ෂ ජනරාල් සරත් ජයමාන්න මැතිතුමාගේ වැටුප සහ අනෙකුත් සියලු දීමනා වැඩි කිරීම සම්බන්ධව අද කෙරෙන සාකච්ඡාවේදී අපි කියනවා, එතුමාට අවශ්‍ය කරන එවැනි සම්පත් ලබා දීම පිළිබඳව ඒකාබද්ධ විපක්ෂය හැටියට අප විරුද්ධ වන්නේ නැති බව. එයට හේතුව, මෙවැනි ආයතනයක නිලධාරියෙකුට කශේරුකාව තියාගෙන, පාට පක්ෂ භේදයකින් තොරව වැඩ කරන්න නම් එතුමාට අවශ්‍ය කරන ශක්තිය රජය විසින් පැහැදිලිව ලබා දිය යුතු වීමයි. ඒ නිසා එතුමාට මේ දේවල් ලබා දීම පිළිබඳව අපි විරුද්ධ වන්නේ නැහැ. අපි ඒ ගැන සතුටු වෙනවා.

ඒ වාගේම මම එතුමාට කියන්න කැමැතියි, මීට පෙර හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමියට ගෙදර යන්න වුණේ රාජිත සේනාරත්න අමාත්‍යතුමාට විරුද්ධව පැමිණිලි කරලා එතුමා සම්බන්ධයෙන් ඇති වුණු සිද්ධීනුත් එක්කයි කියන එක. ඒ සිද්ධීන් විතරක් නොවෙයි, විශේෂයෙන්ම එතුමිය තුළ තිබුණු පක්ෂපාතීභාවයත් එක්ක තමයි එවැනි තත්ත්වයක් ඇති වුණේ. ඒ නිසා අපේ නව අධ්‍යක්ෂ ජනරාල්තුමාට එවැනි සිද්ධියක් සිදු නොවේවා කියා මා මුලින්ම ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිවම දන්නවා, 2015 ජනවාරි 08වැනි දා මේ යහ පාලන ආණ්ඩුව ආවේ අල්ලස, දූෂණය නැති කරනවාය කියලායි කියන එක. ඒ විධියට මේ රටේ ජනතාවට නැවුම් බලාපොරොත්තු දීලා ආපු රජයකට අද වන විට අත්වෙලා තිබෙන ඉරණම පිළිබඳව සලකා බැලීමේදී ඉතාමත්ම කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ. 2015 ජනවාරි 08 මේ රජය බලයට පත් වෙලා මාසයක් යන්න ඉස්සරවෙලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

පටන් ගත්තා, මේ රටේ අහිංසක ජනතාවගේ මුදල්වලට විදින්න. අග්‍රාමාත්‍ය කාර්යාලය භරහා සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වුණු ඒ මුදල පොඩි නැහැ. ඒ මුදල රුපියල් බිලියන 26යි -රුපියල් මිලියන 26,000යි-. මාසයක් ඇතුළත අන්න එවැනි තත්ත්වයක් ඇතිවීම නිසා, මේ රට තුළ බොහොම බේදනීය තත්ත්වයක් ඇති වුණා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කම්බා හොරෙක් වෙන කොට ඊට පිටිපස්සේ ඉන්න අනෙක් හොර රැන කුමන ආකාරයෙන් හොරකම් කරයිද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අද ඇති වෙලා තිබෙන්නේ එවැනි තත්ත්වයක්. හොරකම, දූෂණය, වංචාව පිටුදකින්න ආපු ආණ්ඩුව අද හොරුත් එක්ක නිදැල්ලේ නිදියන මට්ටමක් උදා වෙලා තිබෙනවා. මේ රට තුළ හොරුත් එක්ක නිදියන නායකයන් බිහිවෙලා තිබෙනවා. ඒ නිසා තමයි අද මේ රටේ ජනතාවට "කා" කියා ගන්න බැරි තත්ත්වයක් උදාවෙලා තිබෙන්නේ. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි පැහැදිලිවම කියනවා, අපේ ආණ්ඩුව යටතේ යම් කිසි කෙනෙක් හොරකම් කර තිබෙනවා නම් මහින්ද රාජපක්ෂට නොවෙයි, ඕනෑම කෙනෙකුට දඬුවම් දුන්නාට කිසිදු ගැටලුවක් නැහැ; ප්‍රශ්නයක් නැහැ කියලා. "හොරා", "හොරා", "හොරා", "හොරා", "රාජපක්ෂවරු හොරු" කිය කියා ගිහිල්ලා අවසානයේ අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද මේ ආණ්ඩුවේ හොරු ටික නිදැල්ලේ ඉන්නවා. අපි පැහැදිලිවම කියනවා, මේ ආණ්ඩුවේ හොරු ටික පිළිබඳව මේ රටේ සමස්ත ජනතාවම දන්නවාය කියලා. අපේ අධ්‍යක්ෂ ජනරාල්තුමනි, අපේ "Top Ten" වැඩසටහන යටතේ ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි 10ක් ඉදිරිපත් කළා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට, හිටපු මුදල් ඇමති රවි කරුණානායකට, මලික් සමරවික්‍රමට, තලතා අතුකෝරලට, කබීර් හෂීම්ට, පී. හැරිසන් මහත්තයාට, ඒ වාගේම අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන රාජිත සේනාරත්න කියන මේ සියලු දෙනාටම විරුද්ධව අපි පැමිණිලි ඉදිරිපත් කළා. අවසානයේ සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ පැමිණිලි පිළිබඳව හරි පරීක්ෂණයක් කිරීම සඳහා තවම වැඩ කටයුත්තක් ආරම්භ කර නැහැ. ඒකපාර්ශ්විකව යන වැඩ පිළිවෙළක් විතරයි තිබෙන්නේ. විරුද්ධ පක්ෂයේ අය දඩයම් කරන වැඩ පිළිවෙළක් විතරයි මේ යහ පාලන ආණ්ඩුව තුළ ක්‍රියාත්මක වන්නේ. ඒ ගැන අපි දන්නවා නේ. මේ කම්බ හොරු රැන දිහා බැලුවාම, අපි උදාහරණයක් හැටියට රාජිත සේනාරත්න මැතිතුමා පිළිබඳව ගත්තොත්, අපේ මහින්ද අමරවීර ඇමතිතුමා එතුමාට විරුද්ධව නැවි සම්බන්ධව චෝදනා කරලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කළා. ඒ පැමිණිල්ලට මොකද වුණේ? ඒ පැමිණිල්ල එහෙමමයි. අවසානයේ නිකම් files ගොඩ ගැහෙන මට්ටමක් පමණයි ඇති වන්නේ.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ පැමිණිල්ල දැම්මේ කොයි කාලයේද?

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
පැමිණිල්ල කොයි කාලයේ දැම්මත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒක නිසා අපට කාලය ප්‍රශ්නයක් නැහැ. හොරු අල්ලන්න ආවා නම්, අල්ලන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සිටින පිළිකා රෝගීන්ට තිබෙන බෙහෙත් පිළිබඳව බලන්න. ශ්‍රී ලංකා පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ සභාපතිතුමිය ප්‍රමුඛ විශේෂඥ වෛද්‍යවරු 25දෙනෙකු එකතු වෙලා "Hycet" කියන බෙහෙත මේ රටට ගෙන්වන්න එපා කියලා කිව්වා. ඒකට විරෝධතාව දැක්වූවා. අවසානයේ රාජිත සේනාරත්න ඇමතිතුමාගේ බොහොම සුවව කීකරු ගෝල බාලයෙකු අධ්‍යක්ෂ ධුරය දරන කොම්පැනියක සම්බන්ධතාවෙන් ඒ බෙහෙත -පිළිකා රෝගීන්ට සුදුසු නැති, ප්‍රමිතියෙන් තොර බෙහෙත- ගෙනාවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
ඒ සිද්ධීන්වලට විරුද්ධව අපි පැමිණිලි කළා. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා මේ පිළිබඳව පැමිණිලි කළා. කෝ, ඒ පැමිණිලිවලට මොකද වුණේ? අවසානයේ රාජිත ඉන්නවා; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය ගෙදර. මෙන්න තත්ත්වය. එම නිසා මෙන්න මෙවැනි තත්ත්වයක තමයි මේ කටයුතු මේ රජය තුළින් සිදු වෙන්නේ කියන කාරණය අපි විශේෂයෙන්ම කියනවා. එම නිසා මේ ආණ්ඩුව කවදාවත් දූෂණයට, වංචාවට වැට බඳින්නේ නැහැයි කියලා අපි පැහැදිලිවම කියනවා. මොකද, දූෂණ හා වංචා කරන අය තමයි මේ ආණ්ඩුව තුළ ඉන්නේ. බොහොම ගරු රහපෑමක් කරන අපේ 'වන්ෂොට්' සහෝදරයා එක එක්කෙනාට චෝදනා කරනවා කියලා අපි දන්නවා. ඇයි, දෙවියනේ! එතුමා පිළිබඳව තිබෙන චෝදනා පොඩි නැහැ. දැන් එතුමාට තිබෙන එක චෝදනාවක් තමයි, මහනුවර, තෙල්දෙනියේ ඉන්ද්‍රා හෝටලයේ දවස් 10ක කෑම බිල ගෙවන්නේ නැතිව කොමර්ෂල් බැංකුවේ cheque එකක් දීලා ඇති වුණු ප්‍රශ්නය. ඒ, එක සිද්ධියක්. ඊ ළඟට, ලිංගික අල්ලස් සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ චෝදනා වැඩි වශයෙන්ම තිබෙන මන්ත්‍රීවරයා කවුද? ඔය 'වන්ෂොට්' කියන ගරු මන්ත්‍රීතුමා. ඒක නිසා එතුමා මේ පාර්ලිමේන්තුවේ ගරු රහපෑමක් කරලා වැඩක් නැහැ. එතුමා සැබෑ ලෙසම ඇඟිල්ල දිගු කරනවා නම්, දිගු කරන්න ඕනෑ තමන්ගේ යහ පාලන කණ්ඩායමේ සිටින කම්බ හොරු රැනටයි. මේ හොරු ටික කාගේ වුණත් කමක් නැහැ; කොයි පක්ෂයේ වුණත් කමක් නැහැ; මොන පාට වුණත් කමක් නැහැ; ජනතාවගේ මුදල් කොල්ල කාලා තිබෙනවා නම්, ඒ අයට දඬුවම් දිය යුතුයි කියලා මේ ආණ්ඩුවට අපි කියනවා. ඒ අයට විරුද්ධව කටයුතු කළ යුතුයි කියන චෝදනාව අපි කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය තුළ අහිංසක ජනතාව එන්න එන්න කබලෙන් ළිපට වැටෙනවාය කියන කාරණය අපි පැහැදිලිවම කියනවා. එහෙන් මේ ආණ්ඩුව මං කොල්ල කනවා.

කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ආසනයේ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වීරකන්ද නාය ගියා. ඒ කන්ද අසල පවුල් 26ක සාමාජිකයින් 106ක් ඉන්නවා. ඔවුන්ට වියළි සලාක මල්ලක් දෙන්න අද වන තෙක් මේ රජයට බැරි වුණා. මම මේ කරුණ වග කීමෙන් කියන්නේ. අහිංසක ජනතාව විපතට පත් වුණු වෙලාවට ඒ විපතට මුහුණ දුන් ජනතාව බේරා ගන්න කිසිදු වැඩ පිළිවෙළක් නැති, මුදල් කොල්ල කන ආණ්ඩුවක් හැටියටයි අපි මේ යහ පාලන ආණ්ඩුව දකින්නේ. මේ තත්ත්වය වෙනස් කරන්න අපේ රටේ ජනතාව දැන් පෙළ ගැසෙමින් ඉන්නවාය

[ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා]

කියලා මා හිතනවා. එසේ පෙළ ගැසෙමින් සිටින අවස්ථාවේදී මේ කම්බ හොරු ටිකට දෙන්න තිබෙන පාඩම ජනතාවත් එක්ක එකතු වෙලා ලබා දෙන්න අපි කිසිදු බයක් නැහැයි කියන පණිවුඩය ලබා දෙමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Douglas Devananda. You have 15 minutes.

[பி.ப. 4.54]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி! இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் படிகளில் திருத்தம் மேற்கொள்ளல் தொடர்பாக என்னுடைய சில கருத்துக் களையும் இங்கு பதிவுசெய்ய விரும்புகின்றேன். உலகளாவிய ரீதியில் ஆண்டுதோறும் சுமார் 1,000 பில்லியன் டொலர் இலஞ்சமாகக் கொடுக்கப்படுவதாக உலக வங்கி அறிவித்துள்ள நிலையில், இலஞ்சமானது ஒரு நாட்டினது மொத்த உற்பத்தியில் 17 சதவீதத்தை அபகரித்து விடுவதாக ஆசிய அபிவிருத்தி வங்கி தெரிவித்துள்ள நிலையில், ஏழை மக்களும் பெண்களும் சிறுபான்மை இன மக்களும் சம உரிமைகளையும் வேலைவாய்ப்புக்களையும் பெறுவதை இலஞ்சமும் ஊழலும் தடுத்து வருவதாக ஐக்கிய நாடுகள் அமைப்புக் கூறுகின்ற நிலையில், நாம் இன்றைய தினம் அது குறித்த வாத விவாதங்களை நடத்திக்கொண்டிருக்கின்றோம்.

அண்மையில் சர்வதேச அரச சார்பற்ற நிறுவனமொன்று உலகின் 107 நாடுகளில் சுமார் 1,14,000 பேரிடம் நடத்தியுள்ள ஆய்வொன்றின் பிரகாரம், உலகில் நான்கு பேரில் ஒருவர் இலஞ்சம் கொடுக்க வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டுள்ள தாகவும் செல்வந்த நாடுகளில் ஒருவர் இலஞ்சம் கொடுக்க வேண்டி ஏற்படுகின்ற சூழ்நிலையைப் போன்று, வறிய நாடுகளில் ஒருவர் அதைவிட இரண்டு மடங்கு அதிகமான சூழ்நிலைகளில் இலஞ்சம் கொடுக்க வேண்டிய அவசியம் ஏற்படுவதாகவும் அந்த ஆய்வு தெரிவிக்கின்றது. அந்த வகையில் 2008ஆம் ஆண்டில் உலகப் பொருளாதார நெருக்கடி ஏற்பட்டதன் பின்னர் உலக அளவில் இலஞ்சம் மற்றும் ஊழல் அதிகரித்துள்ளதாகவே தெரியவருகின்றது. ஆனால், இதற்கெதிராக உரிய அதிகாரிகளால் மேற்கொள்ளப்பட்டு வருகின்ற நடவடிக்கைகள் அதிகரிக்கப்பட்டுள்ளதான ஒரு தோற்றப்பாடு மக்கள் மத்தியில் காட்டப்படுகின்றபோதிலும் உண்மையிலே அவ்வாறான நடவடிக்கைகள் மேற்கொள்ளப் படுகின்றனவா என்ற சந்தேகம் எமது மக்கள் மத்தியில் இல்லாமல் இல்லை.

மேற்படி ஆய்வினைப் பொறுத்தவரையில் அதிகளவில் இலஞ்சம் மற்றும் ஊழலில் ஈடுபடுகின்றவர்கள் பட்டியலில் முதலாமிடத்தில் அரசியல்துறை சார்ந்தவர்களும் இரண்டா மிடத்தில் பொலிஸாரும் மூன்றாவதாக நீதித்துறை சார்ந்தவர்களும் இருப்பதாகக் கூறப்பட்டுள்ளது. எமது நாட்டைப் பொறுத்தவரையில் கல்வித்துறையே இலஞ்சம் அதிகரித்துள்ள துறையாக இருப்பதாக ஊழல் மற்றும் இலஞ்ச ஆணைக்குழு வெளியிட்டுள்ள ஒரு தகவல் குறிப்பிடுகின்றது. எனவே, இலஞ்சம் மற்றும் ஊழல் தொடர்பிலான பாடத்திட்டமொன்றைப் பாடசாலைப் பாட நூல்களில் உள்ளடக்குவதற்கும் திட்டமிடப்பட்டுள்ளதாகத் தெரிய வருகின்றது.

முறைப்பாடுகள் செய்யப்பட்டால் மாத்திரமே இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவால் விசாரணைகளை மேற்கொள்ள முடியும் என்ற வகையிலேயே தற்போதைய சட்ட ஏற்பாடுகள் எமது நாட்டிலே நடைமுறையில் இருக்கின்றன. இது இலஞ்சம் மற்றும் ஊழலை இந்த நாட்டிலிருந்து முற்றாக ஒழிப்பதற்குப் போதுமான சட்ட ஏற்பாடாக இல்லை. ஏனெனில், எமது நாட்டில் 3,000 க்கும் அதிகமானோர் திடீர் செல்வந்தர் களாகியுள்ளனர் என்ற தகவலையும் இதே இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவே தெரிவிக்கின்றது. இந்த நிலையில் முறைப்பாடுகள் செய்யப்பட்டால் மாத்திர மன்றி, சந்தேகத்திற்குரிய விடயங்கள் குறித்து நேரடியாக ஆராய்ந்து, அவை தொடர்பில் விசாரணைகளை மேற்கொள்ளக்கூடிய வகையிலான அதிகாரங்கள் மேற்படி ஆணைக்குழுவுக்கு வழங்கப்பட வேண்டும் என்பதையே இது எடுத்துக் காட்டுவதாக அமைகின்றது என்பதையும் நான் இந்தச் சந்தர்ப்பத்திலே வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

எமது நாட்டில் கல்வித்துறை சார்ந்தே அதிகளவில் இலஞ்சம் மற்றும் ஊழல் குற்றச்சாட்டுகள் நிலவுவதாக மேற்படி ஆணைக்குழு தெரிவித்திருக்கும் நிலையில், பெற்றோர்களிடமிருந்து நன்கொடைகளைக் கோருகின்ற பாடசாலைகள் குறித்து கல்வி அமைச்சுக்குத் தெரியாது எனக் கூறுவதற்கு இடமில்லை. பல பாடசாலைகளில் மேற்படி செயற்பாடுகள் இடம்பெற்று வருவதாகத் தமக்கு அறியக் கிடைத்துள்ளது என கல்வி அமைச்சர்கள் அடிக்கடிக் கூறுகின்ற நிலைமைகளும் இல்லாமல் இல்லை. இத்தகைய நிலையில், கல்வி அமைச்சு மேற்படி பாடசாலைகள் குறித்து மக்களுக்கு அறிவுறுத்தல்களை மேற்கொள்ளாததும் சட்ட நடவடிக்கைகளை மேற்கொள்ளாததும் ஏன்? என்ற கேள்வி எமது மக்கள் மத்தியில் எழுவது நியாயமானதாகும்.

வடக்கிலே பல்வேறு பகுதிகளில் இயற்கை வளங்கள் சட்டவிரோதமான முறையில் சூறையாடப்பட்டு, பல மில்லியன் ரூபாய் நிதியீட்டல்கள் தொடர்கின்றன. குறிப்பாக, யாழ்ப்பாணம் மருதங்கேணி, குடாரப்பு வடக்கு பிரதேசங் களிலே அரசியல்வாதிகள் சிலரின் பின்னணியில் அரச அதிகாரிகளே மணல் கொள்ளைகளில் ஈடுபட்டு இலஞ்சம் மற்றும் ஊழல் மோசடிகளுக்கான வழிகளைத் திறந்து விட்டிருக்கின்றனர். எனவேதான் இவ்வாறான சந்தேகத்திற் கிடமான செயற்பாடுகள் தொடர்பில் நேரடி ஆய்வுகளை மேற்கொண்டு அவற்றை விசாரிக்கின்ற அதிகாரங்கள் மேற்படி ஆணைக்குழுவுக்கு வழங்கப்பட வேண்டுமென்ற கோரிக்கையை இங்கு முன்வைக்க விரும்புகின்றேன். அந்த வகையில், தற்போது எமது நாட்டில் நடைமுறையிலுள்ள இலஞ்ச ஊழல் ஒழிப்புச் சட்டத்தில் திருத்தங்கள் மேற்கொள்ளப்பட வேண்டும். இலஞ்சம் மற்றும் ஊழல் அற்ற சமூகத்தை உருவாக்குவது தொடர்பிலான ஐக்கிய நாடுகள் அமைப்பின் ஒப்பந்தத்தில் 2004ஆம் ஆண்டு மார்ச் மாதம் இலங்கை கைச்சாத்திட்டுள்ளது. அந்த ஒப்பந்தத்தில் கைச்சாத்திட்ட இரண்டாவது நாடாக எமது நாடு இருக்கின்ற நிலையில் அந்த ஒப்பந்தத்தை நடைமுறைப்படுத்த அரசு முன்வர வேண்டும்.

இலஞ்சம் மற்றும் ஊழலால் ஏற்படுகின்ற பொருளாதாரச் சிதைவுகளால் குறிப்பாக வறிய மக்களே மிக அதிகமாகப் பாதிக்கப்படுகின்றனர். வறிய மக்களை ஒடுக்குவதற்கான ஒரு வழிமுறையாக இலஞ்சம் இருந்து வருகின்றது. தொழில் வாய்ப்புகளைப் பெறவோ அன்றி தங்களுக்கான வாழ்வாதாரங் களைப் பெற்றுக்கொள்வதற்கோ, தமது பிள்ளைகளுக்கான கல்வி வசதிகளைப் பெறவோ இலஞ்சம் முதன்மைப் படுத்தப்படுமானால், வறியவர்களால் இலஞ்சம் கொடுக்க முடியாத நிலையில் அவர்கள் பாரியளவில் பாதிக்கப் படுவதுடன், அவர்களுக்கான வாய்ப்புகளும் திசை மாறிப் போய்விடுகின்றன. இந்த நிலையில் கடந்தகால யுத்தம் காரணமாக அனைத்தையும் இழந்துநிற்கின்ற எமது மக்களின் நிலை எந்தளவுக்குப் பரிதாபகரமானது என்பதைச் சிந்தித்துப் பார்க்க வேண்டும்.

எமது மக்கள்மீது வறுமை என்பது யுத்தம் காரணமாகவும் இயற்கைப் பேரழிவுகள் காரணமாகவும் திணிக்கப்பட்டது. யுத்தத்தின் பின்னரான காலப்பகுதியிலே எமது மக்களில் பலருக்கு வறுமை நிலையிலிருந்து மீளக்கூடிய வாய்ப்புகள் இருந்தும் அவை சிலரால் தடுக்கப்பட்டும் புறக்கணிக்கப்பட்டும் அவர்களது அத்துமீறிய செயற்பாடுகள் காரணமாகப் பறிக்கப்பட்டும் வந்திருக்கின்றன. இதன் காரணமாக வறுமை யானது எமது மக்கள்மீது பலவந்தமாகத் திணிக்கப்பட்டுள்ள நிலைமையே காணப்படுகின்றது. இவ்வாறான நிலையில் வாழ்ந்து வருகின்ற எமது மக்களிடையே இலஞ்சம் மற்றும் ஊழல்கள் தலைவிரித்திருக்கும் நிலையில், எமது மக்கள் தங்களது வாழ்க்கையில் தலைநிமிர முடியாத நிலைமையே தொடர்ந்திருக்கும் என்பதில் சந்தேகமில்லை.

இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழு தொடர்பில் அவதானத்தைச் செலுத்துகின்றபோது, பிரதான மாகக் கூறப்படுகின்ற ஒரு விடயம் ஆளணிப் பற்றாக் குறையாகும். தொடர்ந்தும் இந்த விடயம் முன்வைக்கப்பட்டு வருகின்றது. எனினும், இதற்கு இதுவரையில் தீர்வுகள் எட்டப்படாமல் இருப்பது ஏன்? என்ற கேள்வி எழுகின்றது. குறிப்பாக, மேற்படி ஆணைக்குழுவில் கணக்காய்வு மற்றும் வங்கி நடைமுறைகள் தொடர்பிலான பட்டதாரிகள் 100 பேருக்கான வெற்றிடங்கள் நிலவுவதாகத் தெரியவருகின்றது. மேலும், கொள்வனவுகள், பணத்தை வெளிநாட்டு வங்கிக் கணக்குகளில் வைப்பீடு செய்தல் போன்ற விடயங்களை விசாரிப்பதற்கான அனுபவம் வாய்ந்த அதிகாரிகளுக்கான தேவை இருப்பதாகவும் தெரியவருகின்றது. எனவே, இத்தகைய வெற்றிடங்களை நிரப்புவதற்கு மேலும் தாமதிக்காது உடனடி நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன்.

கடந்த 2012ஆம் ஆண்டிலிருந்து 2016ஆம் ஆண்டு வரையிலான காலப்பகுதிக்குள் 392 வழக்குகள் மேற்படி ஆணைக்குழுவால் நீதவான் நீதிமன்றங்களிலும் மேல் நீதிமன்றங்களிலும் தாக்கல் செய்யப்பட்டுள்ளதாகவும் 106 பேர் குற்றவாளிகளாக அடையாளங் காணப்பட்டுள்ளனர் என்றும் தெரியவருகின்றது. எனினும், கடந்த காலங்களில் பலராலும் கூறப்பட்ட நிலையில் ஊடகங்களில் வெளி வந்திருந்த தகவல்களை வைத்துப் பார்க்கின்றபொழுது இந்த எண்ணிக்கையானது பல மடங்காக அதிகரித்திருக்க வேண்டு மென்ற கருத்தே மக்கள் மத்தியில் நிலவுகின்றது. அதே போன்று, மேற்படி ஆணைக்குழுவுக்குக் கிடைத்ததாகக் கூறப்பட்ட முறைப்பாடுகளின் எண்ணிக்கைகளும் ஏராளம் என்றே ஊடகங்கள் தெரிவித்திருந்தன. இந்த நிலையை அவதானிக்கின்றபோது, பொய்யான முறைப்பாடுகளை முன்வைத்திருக்கக்கூடிய சந்தர்ப்பங்களும் அநேகம் என்பது புலனாகின்றது. தற்போது எமது நாட்டில் நடைமுறையிலுள்ள சட்டத்தின் பிரகாரம், உண்மைக்கு மாறான முறைப்பாட்டினை ஒருவர் செய்கின்றாரெனில், அவருக்கு 10 வருடகால தண்டனை விதிக்கப்பட முடியும். ஆனால், அத்தகைய தண்டனைகள் வழங்கப்படக்கூடிய நிலைமைகள் ஏற்பட்டுள்ளனவா? என்ற கேள்வியும் எமது மக்கள் மத்தியில் எழாமல் இல்லை. ஏனெனில், உண்மைக்கு மாறான குற்றச் சாட்டுகள் பலவும் கடந்த காலங்களில் முன்வைக்கப் பட்டுள்ளதாகவும் இதே ஊடகங்கள் தெரிவித்திருந்தமை குறிப்பிடத்தக்கது. எனவே, அத்தகைய செயற்பாடுகள் குறித்தும் ஆராய்ந்து நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். அத்துடன், நான் இங்கே சுட்டிக்காட்டியதற்கிணங்க மேற்படி ஆணைக்குழுவுக்கு மேலதிக அதிகாரங்களுடன் போதிய ஆளணிகள் இணைக்கப்பட்டு, அதன் பணியை மேலும் செயற்திறன் மிக்கதாக முன்னெடுப்பதற்கு நடவடிக்கை எடுக்குமாறு மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன்.

அதேநேரம், வலுக்கட்டாயமாகக் காணாமலாக்கப் படுதலிலிருந்து எல்லா ஆட்களையும் பாதுகாத்தல் பற்றிய சர்வதேசச் சமவாயச் சட்டமூலத்தின் இரண்டாம் மதிப்பீடு இன்று விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்படவிருந்த நிலையில், பௌத்த மதகுருமாரின் வேண்டுகோளுக்கிணங்க அது ஒத்திவைக்கப்பட்டிருக்கின்றது. என்றாலும், அது தொடர்பாகச் சில கருத்துக்கள் இங்கு சொல்லப்பட்டபடியினால் எனது கருத்துக்களையும் நான் இங்கு பதிய விரும்புகின்றேன். கடந்த காலங்களிலே ஆட்கள் காணாமற்போதல் தொடர்பில் ஏற்கெனவே இந்தச் சபையிலே கருத்துக்களைத் தெரிவித்துள்ள இரண்டொரு தமிழ் நாடாளுமன்ற உறுப்பினர்கள், காணாமற் போனோர் தொடர்பில் எமது கட்சி மீதும் குற்றஞ் சாட்டியிருந்தனர். இது உண்மைக்குப் புறம்பான குற்றச்சாட்டு என்பதை நான் தொடர்ந்தும் வலியுறுத்தி வருகின்றேன். இவ்வாறான குற்றச்சாட்டுக்களை முன்வைக்கின்ற சில அரசியல்வாதிகளால் தூண்டப்பட்ட நிலையில், காணாமற் போனோர் தொடர்பில் ஓரிருவர் எம்மைப்பற்றிய உண்மைக்குப் புறம்பான தகவல்களை முன்வைத்திருந்தமை தொடர்பில் நடவடிக்கைகளை எடுக்குமாறு உரிய அரச தரப்பினருக்கு நாம் ஏற்கெனவே அறிவித்துள்ளோம். எமது கட்சிமீது சேறு பூசுகின்ற நடவடிக்கைகளாகவே இவ்வாறான குற்றச்சாட்டுகள் முன்வைக்கப்பட்டு வருகின்றனவேயன்றி, இவற்றில் எவ்விதமான உண்மையும் இல்லை. எனவே, எம்மீது இது தொடர்பில் முன்வைக்கப்படுகின்ற குற்றச்சாட்டுக்கள் உடனடி விசாரணைகளுக்கு உட்படுத்தப்பட்டு, உண்மைகள் வெளிக்கொண்டுவரப்பட வேண்டுமென்பதை நான் இங்கு தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

எம்மீது இத்தகைய குற்றச்சாட்டினை கடந்த நாடாளுமன்றக் கூட்டத்தொடரின்போது முன்வைத்திருந்த தமிழ் நாடாளுமன்ற உறுப்பினர் ஒருவர், புலிகளின் பலவந்தமான ஆட்சேர்ப்புக்கள் குறித்தும் விசாரணை செய்யப்பட வேண்டுமெனத் தெரிவித்திருந்தார். அத்தகைய விசாரணைகளும் மேற்கொள்ளப்பட வேண்டும். தற்போது புலிகள் இயக்கத் தலைமைகள் இல்லாத நிலையில், புலிகளால் அவர்களது கொள்கைகளின் பிரகாரம் உருவாக்கப்பட்ட கட்சியினர் இருக்கின்றனர். புலிகள் இயக்கத்தின் வழித் தோன்றல் என்றே இவர்கள் தம்மை எமது மக்களிடையே இனங்காட்டி வருகின்றனர். கடந்தகால யுத்த அழிவுகளுக்கும் எமது மக்களது அழிவுகளுக்கும் ஆட்கள் காணாமற்போன பல சம்பவங்களுக்கும் இவர்கள் மௌனமாக இருந்தும் புலிகளது செயற்பாடுகளை ஊக்குவித்தும் தூண்டியும் அதற்கு

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

முழுமையான ஆதரவு தெரிவித்துப் பங்காற்றியவர்கள் என்பதால், அது தொடர்பில் இவர்களையும் விசாரணைகளுக்கு உட்படுத்த வேண்டுமென்றும் கேட்டுக்கொள்கின்றேன். அந்த வகையில், மேற்படி சட்டமூலம் செயற்பாட்டுக்கு கொண்டு வரப்படுமானால், மாற்றுக் கருத்துக்களைக் கொண்டோரைத் துரோகிகளெனக் கூறி, பல்வேறு பலவந்தமான காணாமற்போதல்களுக்கு உறுதுணையாக இருந்துள்ளவர் களையும், இந்த நாடாளுமன்றத்திலுள்ளவர் களையும் விசாரணைகளுக்கு உட்படுத்தப்பட வேண்டுமெனக் கோரி, எனக்கு இந்தச் சந்தர்ப்பத்தைக் கொடுத்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කරුණාරත්න පරණවිතාන මහතා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.07]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් වැඩි කිරීම සම්බන්ධයෙන් අද දින ඉදිරිපත් කරන ලද යෝජනාව ඉතාම කාලීන යෝජනාවක්. ඒ වාගේම ඒකෙන් පෙන්නුම් කරන්නේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන ක්‍රියාවලිය - යන්ත්‍රණය- ශක්තිමත් කිරීම සඳහා රජය දරන කැපවීමයි. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඇතුළුව අක්‍රිය වෙලා තිබුණු ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාත්මක කළේ මේ රජයයි. ඒකෙනුත් පෙනෙන්නේ, යුක්තිය, සාධාරණය සහ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය ඉදිරියට ගෙන යාමට රජය දක්වන කැපවීමයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගැන කථා කරනවාට වඩා මේ රටේ අල්ලස, දූෂණය පිටු දැකීම සඳහා සමස්තයක් හැටියට අප ගන්නා වැයම ශක්තිමත් වෙලා තිබෙනවාද, නැද්ද කියන කාරණය සම්බන්ධයෙන් අවධානය යොමු කරවන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08 වනදා මේ රටේ වෙනසක් සිදු වුණා. ඒ වෙනසට හේතු වූ ප්‍රධාන ධාරණාව වුණේ; මූලික කාරණාව වුණේ, අන්ත දුෂිතභාවයට පත් වෙලා තිබුණු අපේ රාජ්‍යය, මහා ධන මංකොල්ලයකට ලක් වෙලා තිබුණු අපේ රාජ්‍යය එයින් ගලවා ගැනීමයි. ඒක තමයි න්‍යාය පත්‍රයේ අංක 01 බවට පත් වුණේ. නමුත් අවුරුදු දෙකහමාරක් විතර ගත වුණාට පසුව අද වන විට සමහර අය කල්පනා කරමින් සිටිනවා, 2015 ජනවාරි 08 විප්ලවයට මුල් වූ ප්‍රධාන අංගය අද අපේ සමාජ දේශපාලන න්‍යාය පත්‍රයේ අංගයක් නොවෙයිද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවුරු එම විප්ලවය පාවා දුන්නත්, එම විප්ලවයට මූලාරම්භය දීපු අපි ඒ කොඩිය අරගෙන ඉදිරියට යනවාය කියන කාරණය මා මේ වෙලාවේ සඳහන් කරන්න කැමැතියි. මේ රටේ දේශපාලන තලයේ, නිලධාරි තලයේ මහා හොරු රැළක් ඉතුරු වෙලා සිටියා. මොන ආණ්ඩුවට, මොන පක්ෂයට, මොන කල්ලියට සම්බන්ධ වුණත්, රාජ්‍යයක් හැටියට අපි ඒ හොරුන්ට එරෙහිව සටන් කළේ නැත්නම්, අපි සමාජයක් හැටියට අන්ත පසුගාමී තත්ත්වයට පත් වෙනවා, අපේ ශ්‍රී ලංකා රාජ්‍යය වැදගැම්මකට නැති රාජ්‍යයක් බවට පත් වෙනවා.

විශේෂයෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ සහ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමාගේ ආණ්ඩුවේ අංක 01 වගකීම තමයි එදා ජන වරමෙන් ජනතාව අපට කරන්න කියලා භාර දීපු වැඩේ ඉෂ්ට සිද්ධ කරන එක. මා කියන්න කැමැතියි, අපි ඒ සඳහා යම් යම් පියවර අරගෙන තිබෙන බව; යම් යම් පැමිණිලි විභාග කරලා තිබෙන බව; යම් යම් අයට එරෙහිව නඩු පවරා තිබෙන බව. නමුත් සමාජයක් හැටියට මේ ජන වරම ඉදිරියට ගෙන ආපු ජනතාව ඒ කාරණය සම්බන්ධයෙන් සතුටෙන් නොවෙයි සිටින්නේ. ඒ සම්බන්ධයෙන් විශාල ප්‍රමාදවීම් තිබෙනවා. සමහර අය වැඩේ අත් හැරලා දමලා තිබෙනවා; නොසලකා හැරලා තිබෙනවා කියන එක රහසක් නොවෙයි. ඒ නිසා නැවත වතාවක් ඒ දූෂණ විරෝධී ධජය මේ සමාජයේ දේශපාලන න්‍යාය පත්‍රයේ අංක 01 වශයෙන් සලකා කටයුතු කරනවාය කියන කාරණය අවධාරණය කරන්නට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් වැඩි කිරීම පිළිබඳ අද පැවැත්වෙන මෙම විවාදය අපි ප්‍රයෝජනයට ගන්නවා. ඒ සඳහා අපි මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේදීත් මේ කාරණය අවධාරණය කරලා තිබෙන බව අපි මාධ්‍යවලින් දැක්කා. ණය බරින්, බදු බරින්, ජීවන බරින් හෙම්බත් වුණු සමාජයක් තමයි එදා තිබුණේ. අපි මතක් කර ගන්න ඕනෑ, එදා සමාජය තිබුණේ කොහොමද කියලා. ණය බරින්, බදු බරින්, ජීවන බරින් හෙම්බත් වෙලායි මේ සමාජය තිබුණේ. ජාතිවාදය, ආගම්වාදය, පවුල්වාදය කියන දේශපාලන බර ඒ සමාජයට දරන්න සිදු වුණා. ජනාධිපති ධුරයේ ඉඳලා ගමේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා දක්වා දේශපාලන තන්ත්‍රය දූෂණය නමැති පිළිකාව වැලඳ ගත්තා. ජනාධිපති ලේකම්වරයාගේ ඉඳලා ග්‍රාම නිලධාරිවරයා දක්වා රාජ්‍ය නිලධාරි තන්ත්‍රයට දූෂණය, අල්ලස බෝ වුණා. ආධ්‍යාත්මික වශයෙන් කුණු වූ සමාජයක් බවට අපේ සමාජය පත් වුණා. අන්න ඒකෙන් මේ සමාජය ගලවා ගැනීමට තමයි 2015 ජනවාරි 08 වනදා විප්ලවය සිදු වුණේ. අද මේ චෝදනාව හැමෝටම එල්ල වෙලා තිබෙනවා. ඒක බොරුවක් නොවෙයි. මේ ආණ්ඩුවට ඒ චෝදනාව එල්ල වෙලා තිබෙනවා.

අද මේ රජයට කිසියම් චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා නම් පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ අපි හින්දු කර තිබෙනවා, "ඉස්සෙල්ලා රජයේ චෝදනාව අපි නිවැරැදි කර ගන්න ඕනෑ"ය කියලා. ඒක තමයි එදා මෙදා තුර පැවති ආණ්ඩු සහ අද පවතින ආණ්ඩුව අතර තිබෙන වෙනස. ඒ නිසා තමයි ඔය බැඳුම්කර චෝදනාව සම්බන්ධයෙන් විමර්ශනය කරන්න දැන් කොමිසමක් පත් කරලා තිබෙන්නේ. අපි ඒ එක්කම කියනවා, "ග්‍රීක බැඳුම්කරය ගැන හොයන්න. හෙජින් ගිවිසුම ගැන හොයන්න. එතැන ඉඳලාම වැඩේ පටන් ගන්න" කියලා.

අද සමහර අය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට සමහර වෙලාවට ව්‍යාජ ප්‍රශංසා ඉදිරිපත් කරනවා. සමහර ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන් මෙතැන ඉඳලා ව්‍යාජ ප්‍රශංසා ඉදිරිපත් කළා, "දේශපාලන දඩයමක් කරන්නේ නැහැ. බොහොම හොඳයි. මුකුත් ප්‍රශ්නයක් නැහැ. දැන් තත්ත්වය ඉතාම හොඳයි" කියලා. අපි කොමසාරිස්තුමන්ලාට මුකුත් කියන්නේ නැහැ. එතුමන්ලා හොඳ වැදගත් මහත්වරු. නමුත් මේ සමාජය විසින් ප්‍රශ්න කරන කාරණයක් පිළිබඳව අපට මතු කරලා කියන්න සිදුවෙලා තිබෙනවා. ඒ කාරණය තමයි, "වැඩ ප්‍රමාදයි" කියන එක. ඒ චෝදනාව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පමණක් එල්ල වී තිබෙන චෝදනාවක්

නොවෙයි. ඒ චෝදනාව පොලීසියට, මූල්‍ය අපරාධ විමර්ශන අංශයට -FCID එකට-, පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට සහ පොදුවේ අධිකරණයට එල්ල වී තිබෙන චෝදනාවක්. යුක්තිය ඉෂ්ට වුණාට වැඩක් නැහැ, යුක්තිය ප්‍රමාද වෙලා ඉෂ්ට වුණොත්. එතකොට යුක්තිය ඉෂ්ට වුණේ නැහැ වාගේ තමයි. හැබැයි, මේ දේශපාලන පිළිකාවෙන්, ආධ්‍යාත්මිකව සමාජය කුණු කරන මේ රෝගයෙන් සමාජය ගලවා ගැනීමට අපි රාජ්‍යයක් හැටියට අපොහොසත් වෙලා තිබෙනවාය කියන කාරණය යහ පාලන ආණ්ඩුවේ අවුරුදු දෙකක කාලය සහ ජනාධිපතිතුමාගේ අවුරුදු දෙක හමාරක පාලන කාලය ගත වෙන මොහොතේ අපි ස්වයං විවේචනාත්මකව පිළිගත යුතුව තිබෙනවා. ඒ නිසා මම නම් රන්ජන් රාමනායක මැතිතුමාගේ කථාවේ සහ මට කලින් කථා කරපු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවේ ලොකු වෙනසක් දකින්නේ නැහැ. එතුමන්ලා දෙදෙනා එකම කාරණයක් පිළිබඳව තමයි අවධාරණය කළේ. ඒ තමයි, ඕනෑම දූෂිතයෙකුට, ඕනෑම මංකොල්ලකාරයෙකුට තරාතිරම නොබලා, කොයි කාටද, කොයි පැත්තටද අයිති කියන එක නොබලා -නොසොයා- දඬුවම් ලබා දෙන යන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්න කියන එක. එහෙම නැතිව මේ සමාජය මේ විධියට යන්න ගියොත් එහෙම කෙමෙන්-කෙමෙන් රටේ අරාජිකත්වයක් ඇති වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දූෂණය කරපු අයට, ජාතික ධනය මංකොල්ල කාපු අයට, අමු-අමුවේ මහ දවල් ජනතා දේපළ හොරකම් කරපු අයට ඡන්ද දිනාගෙන පාර්ලිමේන්තුවට එන්න පුළුවන් වෙලා තිබෙනවා නම්; පන්සලට ගිහිල්ලා "අනේ! භාමුදුරුවනේ" කියලා කථා කරන්න; මහජන ගෞරවයක් දිනා ගන්න පුළුවන් නම් එතකොට රටේ ආණ්ඩුවක් ඇති වෙන්නේ නැහැ. එතකොට රටේ ඇති වන්නේ අරාජිකත්වයයි. ඒ දූෂිතයන් නම් රටේ ජය කෙහෙලි නංවන්නේ, ඒ ජනතා කොල්ලකරුවන් නම් රටේ දේවල් තීරණය කරන්නේ, ඔවුන් නම් රටේ පූජිත භාවයට පත් වන්නේ එතකොට රටේ අරාජික තත්ත්වයක් ඇති වනවා. ඒ අරාජික තත්ත්වයට රට ගමන් ගන්නා වෙලාවේ අපි නිවේදනය කරනවා, "අපි ජනවාරි 08 න්‍යාය පත්‍රය අලුත් කරනවා"ය කියලා. ඒ වෙනුවෙන් අපට පාර්ලිමේන්තුවේ සටනක් තිබෙනවා. එදා වාගේම අපට මහ පාරේ ආපසු සටනක් තිබෙනවා කියන කාරණයත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. යළිත් රාජාණ්ඩුව ගෙනෙන්න කවුරු හෝ හිතාගෙන ඉන්නවා නම්, යළිත් ඒ පවුල් පාලනය ගෙනෙන්න කවුරු හෝ හිතාගෙන ඉන්නවා නම්, ඒ ප්‍රභූ පැළැන්තියටම එකතුවෙලා තවත් අය ඒකම ගහන්න හදනවා නම් අපි ඒ අයට කියනවා, "මහත්වරුනි, වැඩේ වැරැදිලා. ඉතිහාසයේ ආපස්සට ගමනක් නැහැ. මේ ගමන ඉස්සරහටයි යන්නේ" කියලා.

මේ රට වැදගත් රටක් කරන්න එදා මේ රටට ආදරය කරන පිරිසක් අධිෂ්ඨාන කර ගත්තේ ආපසු හැරෙන්න නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදී නිදහස සහ ජනමාධ්‍ය නිදහස නිසා හැමෝටම කථා කරන්න අයිතිය ලැබීම හේතුවෙන් අද හැමෝම කියනවා, "ඔව්, අපටත් කාරණයක් කියන්න තිබෙනවා"ය කියලා. ඕනෑම බොරුවකට අද පැවැත්මක් තිබෙනවාය කියා අපි කියනවා. "මිනිස්සු එකතු කර ගන්න පුළුවන්. පාරේ picket කරන්න පුළුවන්" කියලා අද දූෂිත බලවේගවල හඬ ජනමාධ්‍යයෙන් හා සමාජ මාධ්‍යයෙන් ඇහෙනවා. නමුත් එදාත් ඔහොම හඬක් ඇහුණා. එදා බැලූ-බැලූ අත හැම ලයිට් කණුවකම, හැම ගලක් ගහක් ගණනේම ලොකුවට පෙනෙන්න දේවල් තිබුණා. නමුත් ඒ සියල්ලට එරෙහිව යටින් ජන රැල්ලක් ආවා.

අද සමාජය කෙමෙන්-කෙමෙන් අවබෝධ කර ගනිමින් ඉන්නවා, මේ ජනවරමට යුක්තිය ඉෂ්ට කළ යුතුයි කියලා. එම යුක්තිය ඉෂ්ට කරන දේශපාලන බලවේගය ශක්තිමත් කළ යුතුයි කියන අවබෝධයකට සමාජය පැමිණෙමින් තිබෙනවා. ඒක පෙනෙන්නේ නැහැ; ඒක ප්‍රවෘත්තිවලට හසු වෙන්නේ නැහැ; ඒක සමාජවාදයට පෙනෙන්නේ නැහැ. නමුත් ඒ දේශපාලන සංවිධානය, ඒ බලවේගය තමයි මේ රටේ ජයග්‍රහණය කරන්නේ; ප්‍රගතිය කරා යන්නේ. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ, 2015 ජනවාරි අට වැනි දා සිදු වුණු විප්ලවය ආපසු හැරෙන එකක් නොවෙයි කියලා. එම නිසා අද කවුරු හරි දූෂණයට විරුද්ධව, මංකොල්ලයට විරුද්ධව, ජනතා දේපළ ගසා කෑමට විරුද්ධව පෙනී සිටිනවා නම්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා සමඟ අත්වැල් බැඳ ගන්න ඕනෑය කියලා අපි කියනවා. එතුමා තමයි එම ධජය පළමුවැනි වතාවට ලංකාවේ ප්‍රධාන දේශපාලන සටන් පාඨය බවට පත් කළේ. එතුමාටත් ඒක අත හරින්න බැහැ. මේ පාර්ලිමේන්තුවේ මේ ආණ්ඩුවට ඒක අත හරින්න බැහැ. අත හරිනවා කියලා කියන්නේ ආණ්ඩුව සියතින් බෙල්ල කපා ගන්නවා කියන එකයි.

අපි අද කථා කරන මාතෘකාව මහා බරපතළ මාතෘකාවක්. එම නිසා අපේ ආයතන පද්ධතියේ හැම අංශයක්ම අපි උපරිම ආකාරයට ශක්තිමත් කරන්න ඕනෑ. එසේ ශක්තිමත් කරන්නේ වෙන ස්වායත්ත දූපත් හදා ගෙන ඒවායේ රස විඳින්න නොවෙයි, මේ කටයුත්ත ඉෂ්ට සිද්ධ කරන්නයි. මහා දූෂණ ගොඩාක් ගැන කථා වුණා; මහා මං කොල්ල රාශියක් ගැන කථා වුණා. ඒවා එකක්වත් අද ප්‍රධාන මාතෘකා නොකරන්න සමහර අය උත්සාහ කරනවා. ඒවා ප්‍රධාන දේවල් නොවෙයි කියලා හිතන්න සමහර අය උත්සාහ ගන්නවා. "දූෂණය ඕනෑ තරම් තිබෙනවා; කොල්ලකෑම් ඕනෑ තරම් තිබෙනවා, මේක මේ රටවල තත්ත්වයක්, ඔහොම තමයි තුන්වන ලෝකයේ ස්වභාවය" යනාදී වශයෙන් හිතෙන ගතියක් පෙනෙන්න තිබෙනවා.

රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කරමින් කිව්වේ, "මේක මේ ජනතාවගේ හැටි; ජනතාව වැරදියි" කියලායි. ඔව්, සාමාන්‍යයෙන් අපට ඉන්නේ ඡන්ද දායකයෝ මිසක්, පුරවැසියෝ නොවෙයි. එම නිසා සමහර වේලාවට "අපේ පක්ෂය, අපේ කණ්ඩායම" කියලා හිතන පිරිසක් එහෙම ඉන්නවා වෙන්න පුළුවන්. නමුත් දේශපාලනය තිබෙන්නේ එතැන නොවෙයි. එතැන තිබෙන්නේ අදේශපාලනය. දේශපාලනය තුළ මෙය සංවිධානය කරන කොට, අපි යළිත් කියන්නේ යහපත් රාජ්‍යයක්, ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක්, කොල්ලකන්නේ නැති රාජ්‍යයක්, නියම පුරවැසි ජනරජයක් හැදීමේ සටන පටන් ගත්තා විතරයි කියන එකයි. එම සටනට අනාගතයක් තිබෙනවා; එම සටන ජයග්‍රහණය කරනවා. එම නිසා විවිධ උද්ඝෝෂණ මැද්දේ හැංගෙන්න හදන, පන්සල් ඇතුළේ හැංගෙන්න හදන, ජනමාධ්‍ය ඇතුළේ හැංගෙන්න හදන, ව්‍යාජ pickets ඇතුළේ හැංගෙන්න හදන ඕනෑම තරාතිරමක දූෂිතයෙකුට, මං කොල්ලකාරයෙකුට, "අපි සටනට සූදානම්" කියලා අනතුරු අඟවන්න අපි සූදානම්. එහෙම නැතුව මේක කරන්න බැහැ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සිටින නිලධාරීන්ගේ වැටුප් වැඩි කළාය කියලා, ඔවුන්ට යාන-වාහන දුන්නාය කියලා -ඒවාත් කෙරෙන්න ඕනෑ;- එතැනින් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

ඊළඟට, තවත් කාරණයක් ගැන අවධාරණය කරන්න කැමැතියි. නඩු ගොඩක් තිබෙනවා; පැමිණිලි ගොඩක් විභාග කරන්න තිබෙනවා; තව නඩු එන්න තිබෙනවා; අලුතින් පවා එයි. මේ ජන සම්මතවාදී ක්‍රමයට මේක විරුද්ධයි කියලා සමහර විට කාට හරි පෙනේවි. නමුත් අපිට මේ ගැන කියන්න වෙනවා. මේ අධිකරණ පද්ධතිය ප්‍රමාණවත් මදි නම්, වේලාව මදි නම්, පහසුකම් මදි නම් මේ සම්බන්ධයෙන් විශේෂ අධිකරණයක් පිහිටුවන්න කියලා අපි කියන්න කැමැතියි. විශේෂ අධිකරණයක් පිහිටුවන්න. මේ සියලුම පැමිණිලි, -ලැයිස්තු ගොඩාක් කිව්වා. වාසුදේව නානායාක්කාර මන්ත්‍රීතුමා ලැයිස්තුවක් කිව්වා; රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ලැයිස්තුවක් කිව්වා; තව මන්ත්‍රීවරුන් ලැයිස්තු කිව්වා.- ඔක්කෝම ටික අරගෙන එම ක්‍රියාදාමය වේගවත් කරන්න. කිසිම කෙනෙක් ඒක කියන්නේ නැහැ. කිසිම කෙනෙක් කියන්නේ නැහැ, මේක ප්‍රජාතන්ත්‍රවාදයට

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

විරුද්ධයි; විධිමත් ක්‍රියාදාමයට -due process එකට- විරුද්ධයි කියලා. මොකද, සමාජයේ ලොකු ඉල්ලීමක් තිබෙනවා, "හොරා හෙළිදරව් කරන්න" කියලා

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික නායකතුමා)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(මාණ්ඩලික නායකතුමා)
(The Hon. Karunarathna Paranawithana)
"කොල්ලකාපු මනුස්සයා හෙළිදරව් කරන්න" කියලා සමාජයේ ලොකු ඉල්ලීමක් තිබෙනවා. ඒ ගැනත් ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික නායකතුමා)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

The next speaker is the Hon. S. Viyalanderan. You have 11 minutes. Before that, will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(මාණ්ඩලික නායකතුමා)
(The Hon. Karunarathna Paranawithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(මාණ්ඩලික නායකතුමා)
(The Hon. S. Viyalanderan)

වීසින් ස්ථිර කරන ලදී.
ආමෝදිත්තාර්.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විධුක්කප්පට්ටු ඒත්‍රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
අතන්පිරකු, මාණ්ඩලික නායකතුමා ජේ.එම්. ආනන්ද කුමාරසිරි අවර්කළ් ආසනත්තිලිරුන්දු අකලවේ, මාණ්ඩලික නායකතුමා එට්වට් කුණසේකර අවර්කළ් තලైමై වකිත්තාර්කළ්.
Whereupon THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

[ප.ව. 5.22]

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(මාණ්ඩලික නායකතුමා)
(The Hon. S. Viyalanderan)
කෞරව තලைමைතாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய விசாரணை ஆணைக்குழுவின் பணிப்பாளர் நாயகத்தின் சம்பளம் மற்றும் படிகளில் திருத்தம் மேற்கொள்ளல் தொடர்பான விவாதத்திலே பேச வாய்ப்புக் கொடுத்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

இந்த நாட்டிலே இனவாதத்தை, மதவாதத்தை விரும்பாத நல்லாட்சியை விரும்புகின்ற சிங்கள மக்களும் அதுபோன்று தமிழ், முஸ்லிம் மக்களும் இணைந்து 2015 ஜனவரி 08ஆம் திகதி ஊழலற்ற, நேர்மையான, நீதியான ஒரு நல்லாட்சியை எதிர்பார்த்து ஓர் ஆட்சி மாற்றத்தை ஏற்படுத்தினார்கள். ஆனால், இந்த நல்லாட்சி ஏற்பட்டு இரண்டு வருடங்கள் கடந்து மூன்றாவது வருடத்தை நோக்கிச் செல்கின்ற இந்தச் சூழலில் ஆட்சியாளர்கள் எதைச் சொல்லிக்கொண்டு ஆட்சிக்கு வந்தார்களோ அதை அவர்கள் நடைமுறைப்படுத்தினார்களா? என்பது இங்கே சந்தேகத்திற்கிடமான மிகப்பெரியதொரு கேள்வியாகவே இருக்கின்றது.

ஊழலற்ற ஆட்சியை ஏற்படுத்துவதில் அல்லது ஊழல் புரிந்தவர்களைச் சட்டத்தின் முன் நிறுத்துகின்ற நடவடிக்கையிலே இந்த அரசு எந்தளவுக்கு வெற்றி கண்டிருக்கின்றதென்று பார்த்தால், நிச்சயமாக அதிலே அவர்கள் முழுமையான வெற்றியைப் பெறவில்லையென்றுதான் கூறவேண்டும். ஏனென்றால், கடந்த அரசு ஊழல் செய்தவர்களை எவ்வாறு பாதுகாத்ததோ, அதேபோன்று இந்த அரசும் ஊழல் செய்தவர்களைப் பாதுகாக்கின்ற ஒரு செயற்பாட்டைத்தான் நாங்கள் பார்க்கின்றோம். உண்மையிலே கடந்த காலத்திலே 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' என்ற அபிவிருத்தித் திட்டங்களைக் கடந்த அரசு முன்னெடுத்தது. ஆனால், அவற்றின்மூலம் அங்கு நடந்தது என்ன? என்பதை நாம் சிந்திக்க வேண்டும். அரசியல்வாதிகளும் அவர்களுக்கு எடுபிடிகளாக இருந்து செயற்பட்ட அரச உயரதிகாரிகள் சிலரும் சேர்ந்து மக்களுக்குரிய நிதியிலே செய்த பாரிய மோசடிதான் இவற்றின்மூலமாக நடந்த விடயம். மூன்று தசாப்தகால யுத்தத்திலே மிகவும் மோசமாகப் பாதிக்கப்பட்ட, அழிக்கப்பட்ட, காணாமற்போகச் செய்யப்பட்ட எங்களுடைய வடக்கு, கிழக்கு உறவுகள் 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' என்பவற்றின்மூலம் எந்தவொரு நன்மையையுமே பெறவில்லை.

இச்சந்தர்ப்பத்திலே தமிழ் சினிமாப் படமொன்றின் நகைச்சுவைப் பகுதியொன்று எனது ஞாபகத்திற்கு வருகின்றது. அதாவது, நகைச்சுவை நடிகர் ஒருவர் கிணறு கட்டுவதற்கென ஒரு நிதி நிறுவனத்திலே கடன் எடுப்பார். ஆனால், கிணறு கட்டமாட்டார். அந்த நிதி நிறுவனத்தினர் கடனைக் கேட்டு வரும்போது அவர் பொலிஸ் நிலையத்துக்குச் சென்று கிணற்றைக் காணவில்லையென்று முறைப்பாடு செய்வார். அதுபோன்றுதான் கடந்த அரசின் ஆட்சிக் காலத்திலே 'வடக்கின் வசந்தம்', 'கிழக்கின் உதயம்' என்பன இருந்தன. ஏனென்றால், அங்கே பல இடங்களிலே பாலங்கள் கட்டப்பட்டதாக, வீதிகள் போடப்பட்டதாகக் காட்சிப் படுத்தப்பட்ட அந்த வேலைத்திட்டத்திற்குரிய விளம்பரப் பலகைகள் இருக்கின்றன. ஆனால், அங்கே பாலங்களும் இல்லை, வீதிகளும் இல்லை. இதன்மூலமாக எத்தனை கோடி ரூபாய் நிதி களவாடப்பட்டிருக்கின்றது! அவ்வாறான ஊழல் புரிந்தவர்கள் இதுவரை கைது செய்யப்படவுமில்லை; அவர்கள் தொடர்பான எந்தவொரு விசாரணையும் முன்னெடுக்கப் படவுமில்லை. இவ்வாறான விடயங்களை முன்னெடுப்பதாகவும், ஊழல் புரிந்தவர்களைச் சட்டத்தின் முன் நிறுத்துவதாகவும் கூறிக்கொண்டுவந்த இந்த அரசுகூட இதுசம்பந்தமாக எந்தவிதமான நடவடிக்கைகளையும் எடுத்ததாகத் தெரியவில்லை.

இன்று இந்த நாட்டிலே எந்த அரசாங்கம் மாறிமாறி ஆட்சிக்கு வந்தாலும், சாதாரணமாக, பாலர் வகுப்பிலிருந்து பல்கலைக்கழகம் வரை - ஏன், ஒருவர் பிறப்புச் சான்றிதழ் பெறுவதிலிருந்து அவரது இறப்புச் சான்றிதழ் பெறுவதுவரை

ஊழல் நிறைந்து காணப்படுகின்றது என்று கூறினால் அது மிகையல்ல. இதனால் அதிகம் பாதிக்கப்படுபவர்கள் இந்த நாட்டில் பெரும்பான்மையாக வாழ்கின்ற சாதாரண மக்களே! இதற்கு உதாரணங்களாக "வாழ்வின் எழுச்சி", "சமுர்த்தி" போன்றவற்றைக் குறிப்பிட முடியும். அன்று மட்டக்களப்பு மாவட்டத்திலே வறுமை வீதமானது 10ஆக இருந்தது. எமது பகுதிக்கு வாழ்வின் எழுச்சித் திட்டம் வந்தபொழுது, இந்த மாவட்டத்தினுடைய வறுமை வீதம் குறையும் என்று நாம் எதிர்பார்த்தோம். ஆனால், இன்று இந்த மாவட்டத்தினுடைய வறுமை வீதமானது 19.2ஐயும் தாண்டிச் சென்றிருக்கின்றது. கிட்டத்தட்ட 2,100 பில்லியன் ரூபாய் தனியார் வங்கிகளிலே fixed deposit - நிலையான வைப்பிலிடப்பட்டு அதிலிருந்து வட்டி பெறப்படுகின்றது. சாதாரண மக்களுக்குப் பகிர்ந்தளிக்கப்பட வேண்டிய நிதியைத் தனியார் வங்கிகளிலே வைப்புச்செய்து, அதன்மூலம் வட்டியைப் பெறுகின்ற நிலைமை இன்னும் தொடர்வதைப் பார்க்கின்றோம். இதனால் சாதாரண அடிமட்ட ஏழை மக்கள் microcredit - நுண்கடன் நிதி நிறுவனங்களிலே கூடுதலான வட்டிக்கு குறிப்பாக 25 - 30வீத வட்டிக்குக் கடனை எடுத்து, அந்தக் கடனைத் திருப்பிச் செலுத்தமுடியாமல் தற்கொலை செய்துகொள்ளுகின்ற நிலைமை மட்டக்களப்பு மாவட்டத்திலே நாளுக்குநாள் அதிகரித்துச் செல்கின்றது. இதற்குக் காரணம், இன்று சமுர்த்தி வங்கிகளிலே தேங்கிக் கிடக்கின்ற பணம் மக்களுக்கு உரிய முறையிலே பகிர்ந்தளிக்கப்படாமையாகும்.

அவ்வாறே, வைத்தியசாலைகள், பாடசாலைகள் உட்பட எல்லாத் துறைகளிலும் இன்று ஊழல் மலிந்து கிடக்கின்றது. இதனால், உண்மையிலே பாதிக்கப்படுவது வறுமைக் கோட்டிற்குக்கீழ் வாழுகின்ற சாதாரண அடிமட்ட ஏழைகள்தான். தனவந்தர்களும் வசதிபடைத்தவர்களும் உயர் அதிகாரிகளும் ஏன், அரசியல்வாதிகளும் ஏதோ ஒரு விதத்திலே தப்பிப் பிழைத்துக்கொள்கின்றார்கள். அதுமாத்திரமல்ல, என்னுடைய பார்வையிலே அரசியல்வாதிகளைவிட மிகப் பெரிய மகா திருடர்கள் யார் என்றால், எந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தாலும், அந்த அரசாங்கத்துக்கு ஏற்பத் தங்களை மாற்றிக்கொண்டு நாடகமாடுகின்ற ஒரு சில அரச உயர் அதிகாரிகளே! எவ்வாறு அரசியல்வாதிகளுடைய சொத்துக்கள் தொடர்பான விடயங்கள் சேகரிக்கப்படுகின்றதோ, அதுபோன்று இந்த அரச உயர் அதிகாரிகளுடைய சொத்துக்கள் தொடர்பான விடயங்களும் திரட்டப்பட வேண்டும். ஏனெனில், எந்த அரசாங்கம் வந்தாலும் அந்த அரசாங்கத்துக்கு ஏற்றவாறு சில அரச உயர் அதிகாரிகள் தங்களை மாற்றிக்கொண்டு, ஊழல் மோசடிகளிலே ஈடுபடுவதைப் பார்க்கின்றோம்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மட்டக்களப்பு மாவட்டத்திலே எத்தனையோ பேர் காணிகளின்றி, வாழ்வதற்கு 20 பேர்ச்சஸ் காணி இல்லாமல் அல்லலுறுகின்ற நிலையிலே, 2009இலிருந்து இன்றுவரை அந்த மாவட்டத்தில் இருக்கின்ற அரச காணிகளைத் தனவந்தர்களுக்கும் மிகவும் வசதிபடைத்தவர்களுக்கும் தென்னிலங்கையிலுள்ள பணக்காரர்களுக்கும் பகிர்ந்தளிக்கின்ற நிலைமை காணப்படுகின்றது. 10 ஏக்கர், 20 ஏக்கர் என்று பகிர்ந்தளித்து அதன்மூலம் பல இலட்சம் ரூபாய் இலஞ்சம் வாங்குகின்ற நிலைமை இன்றும் தொடர்கின்றது. அந்த மாவட்டத்திலுள்ள இயற்கை வளமான மண் வளத்தைச் சூறையாடி, மணல் அகழ்கின்றவர்களோடு கூட்டுச்சேர்ந்துகொண்டு, பல இலட்சம் ரூபாய் உழைக்கின்ற உயர் அரச அதிகாரிகள் சிலர் அங்கே இருக்கின்றார்கள். இனிவரும் காலங்களிலே அவர்கள் தங்களுடைய நடவடிக்கைகளைத் திருத்திக்கொள்ளாவிட்டால், நாங்கள் அவர்களுடைய பெயர்களைச் சொல்வதற்கும் தயங்கமாட்டோம். அவர்களுக்கெதிரான நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். பொதுவாக ஓர் அரச அதிகாரி 5 வருடங்கள் ஒரு சேவை நிலையத்தில் பணிபுரிந்தால், அவர் வேறு இடத்திற்கு மாற்றப்பட வேண்டும், அல்லது 6 வருடங்களுக்குப் பின்னராவது மாற்றப்படவேண்டும். ஆனால், சில அரச உயரதிகாரிகள் 10 -12 வருடங்களாக ஒரே இடத்திலிருந்துகொண்டு பல்வேறுவிதமான ஊழல்களில் ஈடுபடுகின்றனர்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
Sir, please give me one more minute.

இன்று மட்டக்களப்பிலுள்ள வைத்தியசாலைதான் கிழக்கு மாகாணத்திலிருக்கின்ற ஒரேயொரு போதனா வைத்தியசாலையாகும். அந்தப் போதனா வைத்தியசாலையிலே ஊழல்கள் இடம்பெறுவதாகப் பல்வேறு செய்திகள் வெளிவருகின்றன. ஆகவே, இந்த நல்லாட்சியிலே அது தொடர்பான விசாரணைகள் மேற்கொள்ளப்பட வேண்டும். மட்டக்களப்புப் போதனா வைத்தியசாலை 2,000க்கு மேற்பட்ட ஆளணியினரையும் பல்வேறு பிரிவுகளையும் பல விடுதிகளையும் கொண்ட மிகப்பெரிய போதனா வைத்தியசாலையாகும். 2006ஆம் ஆண்டு நவம்பர் மாதம் இந்த வைத்தியசாலை போதனா வைத்தியசாலையாகத் தரமுயர்த்தப்பட்டது. அங்கே 2016ஆம் ஆண்டு இரண்டு கணக்காளர்கள் நியமிக்கப்பட்டார்கள். அதிலே ஒருவர் Class-I accountant ஆவார். அவர் நியமிக்கப்பட்டு ஒரு வருடம் பூர்த்தியாகின்ற நிலையிலே, இன்று அவரை இடமாற்றுவதற்கான நடவடிக்கைகள் வைத்தியசாலைக்கு வெளியிலும் அமைச்சு மட்டத்திலும் நடைபெறுவதாக நாங்கள் அறிகின்றோம். நாங்கள் எந்தவிதத்திலும் அதற்கு அனுமதிக்கமாட்டோம். அது ஒரு போதனா வைத்தியசாலை. ஆகவே, அதற்குத் தரம் 1 இல் உள்ள கணக்காளர் ஒருவரே நியமிக்கப்பட வேண்டும். அதற்குரிய நடவடிக்கையைச் சுகாதார அமைச்சு மேற்கொள்ள வேண்டும். எக்காரணத்தைக் கொண்டும் அங்கிருக்கின்ற இரண்டு கணக்காளர்களையும் இடம் மாற்ற முயற்சிக்காமல், அங்கிருக்கின்ற தரம் 1 கணக்காளருக்குரிய cadre creation உருவாக்கப்பட்டு, அவர் அங்கு தொடர்ந்து சேவையாற்ற அனுமதிக்கப்பட வேண்டும். தரம் 1இல் உள்ள கணக்காளரை இடமாற்றம் செய்வதற்குரிய நடவடிக்கைகளை மேற்கொண்டால், நிச்சயமாக இந்த அரசு ஊழலுக்குத் துணைபோவதாகத்தான் நாங்கள் பார்ப்போம். அவ்வாறு மாற்றம் செய்வதற்கு நாங்கள் ஒருபோதும் அனுமதிக்கமாட்டோம். அதற்காக நாங்கள் எந்த மட்டத்திலும் இறங்கிப் போராடத் தயாராக இருக்கின்றோம் என்பதனை இந்த உயரிய சபையிலே நான் பதிவுசெய்துகொள்கின்றேன். வாய்ப்புக்கு மீண்டும் நன்றி கூறி விடைபெறுகின்றேன்.

[අ.භා. 5.33]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම පිළිබඳ විවාදයේදී කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

[ගරු ඡේෂාන් විතානගේ මහතා]

විශේෂයෙන්ම මේ විවාදය තුළ මතු වුණු අදහස් අපි අහගෙන හිටියා. 2015 ජනවාරි 08වෙනි දා ලබා ගත්ත ජනතා ජයග්‍රහණය හෑල්ලුවට ලක් කරමින්, ඒ ලබා ගත් ජනතා ජයග්‍රහණය ජයග්‍රාහී මාවතට යන එක බලාගෙන ඉන්න බැරිව විවිධ වූ පුරසාරම් දොඩන යම් කණ්ඩායමක් මේ විවාදයට සම්බන්ධ වුණා. ඒ අතරම, මේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර තුළින් මේ රටේ අනාගතය ශුභදායී විධියට නිර්මාණය වෙන යහපත් දේශපාලන වාතාවරණයක් අපේක්ෂා කරන ආකාරයේ අදහසුත් මේ විවාදය තුළ ඉදිරිපත් වුණා.

පළාත් පාලන ආයතනයක සිටි සභාපතිවරයෙක් විධියට මම මේ වෙලාවේ විශේෂයෙන් කියන්නට කැමැතියි, අපේ රටේ දේශපාලනඥයන් බොහෝ විට තම දේශපාලන ගමන ආරම්භ කරන්නේ පළාත් පාලන ආයතනයකින් බව. අද අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා, පාර්ලිමේන්තුවේ ඇමතිවරුන්ගේ දූෂණ ගැන, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ දූෂණ ගැන, ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ දූෂණ ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මම විශ්වාස කරනවා, ජනතාවත් සමඟ ළඟින්ම ඉන්නේ පළාත් පාලන ආයතනයක නියෝජිතයන් බව. ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් ඉස්සෙල්ලාම, ඉක්මනින්ම ඉදිරිපත් වෙන දේශපාලනඥයා තමයි පළාත් පාලන ආයතනවල ඉන්නේ. පළාත් පාලන ආයතනවල දේශපාලනඥයන්ට නීත්‍යානුකූල අල්ලස් දීලා, "උඹලා මේ මුදල සාක්කුවේ දාගෙන දේශපාලන ව්‍යාපාරය සාර්ථක කර ගනිල්ලා" කියලා පසු ගිය කාලයේ පැවති ආණ්ඩුවෙන් පූර්වාදර්ශයක් දුන්නා. ඒ තුළින් මේ රටේ අල්ලස හා දූෂණය පටන් අරගෙන ඉහළට එනකම් ඇවිල්ලා, ප්‍රාදේශීය සභාව, පළාත් සභාව තුළින් විත් අද ඒ ගැන පාර්ලිමේන්තුවේ කථා කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

අපට මතකයි, පසු ගිය කාලයේ බැසිල් රාජපක්ෂ මහත්මයා "එක ගමකට - එක වැඩක්" කියලා ව්‍යාපෘතියක් ගෙනාව බව. මේ ව්‍යාපෘතිය ගෙනැල්ලා සල්ලි ටික එව්වා, ප්‍රාදේශීය සභාවලට. අපි හිටපු ප්‍රාදේශීය සභාපතිවරුන් විධියට දන්නවා, එදා ඒ සල්ලි ටික දුන්නේ ගමේ මිනිසුන්ට වැඩ කරන්න; ගමේ ව්‍යාපෘති ටික ක්‍රියාත්මක කරන්නට බව. සභාපතිවරුන්ට ඒ නිදහස දීලා ඒ ව්‍යාපෘති ටික ක්‍රියාත්මක වුණා නම් අපිත් සතුටු වෙනවා. එහෙම වුණා නම් ඒ ප්‍රදේශයේ යම් වගකීමක් දරන මන්ත්‍රීවරුන් සමඟ ඒ වැඩේ කරගෙන යන්න තිබුණා. නමුත් එහෙම නොවෙයි සිදු වුණේ, සභාපතිවරුන්ට නම් කරලාම එව්වා, "මෙන්න ව්‍යාපෘතිය මේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාට" කියලා. ඒ තුළින් සිදු වුණේ ගමේ වැඩේ සාර්ථකව ක්‍රියාත්මක කිරීමක් නොවෙයි, ඒ ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා පාරට බොරලු ටිකක් අඩු මුදලකට දාලා ඉතිරි සල්ලි ටික සාක්කුවේ දා ගත්තා. එවැනි චෝදනා එල්ල වුණු හිටපු සභාපතිවරුන් පිළිබඳව අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කරලා තිබෙනවා. ඒ වාගේම මේ අතර වැඩ කරන, කාර්යශූර, දක්ෂ, රටට ආදරය කරන සභාපතිවරුන් සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුනුත් හිටියා. මම මේ කියන්නේ බහුතරයක් ගැන. තංගල්ලේ, අකුරැස්සේ නිර්මාණය වුණු සිද්ධි ගැන සොයලා බැලුවාම අපට ඒ සභාපතිවරුන් ගැන දැනගන්නට පුළුවන්. රුපියල් ලක්ෂ දෙකක බොරලු දාලා රුපියල් ලක්ෂ 8ක් සාක්කුවේ දාගන්නවා. අනේ ඉතින්, රජයේ නිලධාරීන්ටත් මේවාට අත්සන් කරන්නට වෙනවා. එදා තිබුණු දේශපාලන වාතාවරණයේ අදට වඩා මහා වෙනස්කමක් තිබුණා. එදා රජයේ නිලධාරීන්ට කථා කරන්නට පුළුවන් නිදහසක් තිබුණේ නැහැ. අපි විශ්වාස කරනවා, අද නිර්මාණය වෙලා තිබෙන්නේ හොරකම, වංචාව, දූෂණය පිටු දැකලා, දේශපාලනඥයාට නියම වටිනාකමක් දෙන යුගයක් කියලා.

මම එක උදාහරණයක් දෙන්නට කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වන විට විගණකාධිපතිවරයා පසු ගිය අවුරුද්දේ සබරගමු පළාත් සභාවේ, -මමත් ඒ පළාත් සභාව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක්- විගණන වාර්තාව නිකුත් කරලා දින කිහිපයක් වෙනවා. එහි සබරගමු පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය ගැන සටහනක් තිබෙනවා.

එහි තිබෙනවා, "සබරගමුව පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හිටපු සභාපතිවරයා තමන්ට අයිති බස් රථ 5ක් ප්‍රවාහන බලපත්‍ර, මාසික ලොග් සටහන් කිසිවක් නැතිව, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අවසරය මත, 2015 වසරේ සිට 2016 වසර දක්වා රුපියල් දසලක්ෂ 1,600ක මුදලක් අහිමි කරමින් ධාවනය කරගෙන යනවා" කියලා. ඒ වාගේම එතුමා, -ඔය කියන සභාපතිවරයාම,- බස් රථ 19ක් කිසිම බලපත්‍රයක් නැතිව ධාවනය කරනවා. මේ, අපි කියන කථාවක්වත්, දේශපාලන වශයෙන් කාගේවත් චරිතය ඝාතනය කිරීමක්වත් නොවෙයි; පසු ගිය වසරේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කරුණුයි.

දැන් යහ පාලන ආණ්ඩුවකුයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයාත් ආණ්ඩු පක්ෂයේ කෙනෙක්. දැන් විගණකාධිපති වාර්තාව ඇවිත් තිබෙනවා. එයින් පිරිසිදුව, පැහැදිලිව ඔප්පු වෙලා තිබෙනවා, මේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා, එහි ප්‍රවාහන අමාත්‍යවරයා විධියට කටයුතු කරද්දී, සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ විශාල වංචාවක් සිදු වෙලා තිබෙනවා කියලා. මේක පිටු තුන්සිය ගණනක් වන විශාල විගණන වාර්තාවක්. සබරගමුව පළාත් සභාවේ හැම අංශයක්ම හොර ගුලක් කියන එක මේ වාර්තාවෙන් එළියට ඇවිත් තිබෙනවා. එදා මෙහෙම එළියට ආවේ නැහැ. එදා විගණකාධිපති වාර්තාවත් එහෙමම හමස් පෙට්ටියට යනවා. කවුද කළේ, මොකක්ද වුණේ කියලා හොයලා බලන්නේ නැහැ.

අද අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා තමන්ගේ අදහස් දැක්වීමේදී සඳහන් කළා, මේ රටේ දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයේ කාර්ය භාරය ඉදිරියට කරගෙන යෑමේ අඩු පාඩුවක් පිළිබඳව. මම එතුමාටත්, අපේ වාසුදේව නානායක්කාර මැතිතුමාටත් මතක් කරලා දෙන්න කැමැතියි, 2015.02.11වැනි දින අපි ආණ්ඩුව අරගෙන මාසයක් ගිය තැන කැබිනට් මණ්ඩලය විසින් යෝජනාවක් ගෙනැත් තමයි මේ දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය ආරම්භ කළේ කියලා. මේක නිකම් ආරම්භ කරලා නමට පවත්වා ගෙන යන ආයතනයක් නොවෙයි. මේ ආයතනය ස්ථාපිත කරලා කාර්ය මණ්ඩලය විධියට උපදේශකවරු පස්දෙනෙක්, අධ්‍යක්ෂවරයෙක්, සහකාර අධ්‍යක්ෂවරු හයදෙනෙක් ඇතුළු 42ක සාමාජික සංඛ්‍යාවක් සමඟ සාර්ථකව කරගෙන ගියා. අද මෙම ආයතනය විසින් මේ රටේ පසු ගිය කාල සීමාව තුළ සිදුවූ දූෂණ, වංචාවලට සම්බන්ධ වුණු දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළු විශාල පිරිසකට ගොනු කළ යුතු නඩු සඳහා නිර්දේශ ලබා දීලා තිබෙනවා. එම නිසා කලබල වෙන්න එපා. මේ ආයතන එදා වාගේ එක් එක් අයට අවශ්‍ය විධියට ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ අයට අවශ්‍ය තීන්දුව ගන්න පුළුවන් විධියට මේ ආයතන මෙහෙය වන්නේ නැහැ. මේ ආයතන අද මෙහෙය වන්නේ ස්වාධීනවයි. මේ ආයතනය අදාළ තීන්දුව දෙන්න පොඩ්ඩක් ප්‍රමාද වුණාම, මේවාට සම්බන්ධ වුණු හොරු කණ්ඩායමක්, ඉස්සරහට ඇවිත් කියනවා "කෝ අපි ඇල්ලුවාද? පුළුවන් නම් අල්ලපල්ලා. උඹලා ජනවාරි 08වැනි දින කිව්වේ අප අල්ලන්න එනවා කියල නේද? කෝ, දැන් ඇල්ලුවාද?" කියලා. මේ රටේ මිනිසුන්ට මේ විගඩම පෙනෙනවා. මේ රටේ මිනිසුන් දන්නවා, මේ කෑ ගහන්නේ හොරු කියලා. "Top 10" කියලා වාර්තාවක්, එහෙම නැත්නම් බොරු ඊනියා ලියවිල්ල අරගෙන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගියේ, ඒ අය 'හොරු' කියා මේ රටේ මිනිසුන් 2015

ජනවාරි 8වැනි දින මේ තීන්දුව දෙන්න හේතුව වුණු කණ්ඩායමයි. එම නිසා අපි කියනවා, ආණ්ඩුවේ කවුරු හෝ හොරකම් කරලා තිබෙනවා නම්, වංචා කරලා තිබෙනවා නම් ඒ වෙනුවෙන් ඉක්මනින්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමැතිතුමා කිව්වා වාගේ, අපි බැලුම්කර සිද්ධිය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ඕනෑවටත් වැඩිය ඉක්මනින් අරගෙන තිබෙනවා. එම නිසා එදා ඒ අය කළා වාගේ, අපේ නායකතුමා file එක ළඟ තියාගෙන කියන්නේ නැහැ, "උඹ මේ කරලා තිබෙන හොරකම් ටිකට උඹට දෙන්න ඕනෑ දඩුවම මා ගාව තිබෙන්නේ. උඹ කරුණාකරලා නිශ්ශබ්දවෙලා හිටපන්. උඹ නිශ්ශබ්දවෙලා නොහිටියොත් උඹට වෙන්නේ මෙන්න මේකයි" කියලා. ඒ විධියට අගමැතිතුමා හෝ, ජනාධිපතිතුමා හෝ නඩුව තීන්දු කරන්නේ නැහැ. එහෙම තිබුණු පරිසරයක්, එහෙම තිබුණු සංස්කෘතියක් තමයි අද වෙනස් වෙලා යහ පාලනය බවට පරිවර්තනය වෙලා තිබෙන්නේ. එම නිසා මේ රටේ මිනිසුන්ට, ඇරලා බලපු මල්ල ඔබලා බලන්න අවශ්‍ය වන්නේ නැහැ. මේ රටේ මිනිසුන් අවශ්‍ය දේශපාලන තීන්දුව අරගෙන නිවැරදි ගමනක් යන්න කියලා අපට රට භාර දීලා තිබෙනවා. මාධ්‍ය ඉදිරියට ගිහින් තමන් සුදු චරිත බව පෙන්නුවාට, ඇතුළත ගැබ වෙලා තිබෙන කළු චරිත ඉදිරි අනාගතය තුළ එළියට එනවා. එතකොට තමන් ලබපු තාවකාලික විඳීනය අවසන් වෙනවා කියන එක විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට අපි ශක්තියක්, භයියක් ලබා දීලා බලාපොරොත්තු වෙන්නේ මේ රටේ දේශපාලනඥයන් විතරක් නොවෙයි, දූෂිත රාජ්‍ය නිලධාරීන්වත් නීතියේ රැහැනට හසු කර මංකොල්ල කන, හොරකම් කරන දේශපාලනඥයන් මේ උත්තරීතර ආයතනයට -මේ පාර්ලිමේන්තුවට- පැමිණීමට තිබෙන ඉඩ ඇහිරීමයි. ඒ තුළින් රජයේ නිලධාරීන් අභිංසක මිනිසුන්ගේ මුදල් සාක්කුවට දමා ගැනීමට තිබෙන ඉඩ අහුරලා මේ රට ඉදිරියට ගෙන යන වැඩසටහනට එතුමාගේ ශක්තිය, සවිය ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අන්න ඒකයි මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ. ඒක තමයි මේ උත්තරීතර ආයතනය නියෝජනය කරන බහුතරයක් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුත් බලාපොරොත්තු වෙන්නේ කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.44]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොමත්ම ස්තුතියි, මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමනි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට වැටුප් හා දීමනා වැඩි කිරීම සම්බන්ධයෙන් අදහස් හා යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේදී අපගේ පෞද්ගලික අදහස ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා පළාත් පාලන ආයතන ගැන කථා කළා. අපි පළාත් පාලන ආයතන නියෝජනය කරපු සගයෝ. අපි පළාත් පාලන ආයතන නියෝජනය කරපු සභාපතිවරු; මන්ත්‍රීවරු. හැබැයි, මන්ත්‍රීතුමනි, ඔය එක එක්කෙනාගේ ලැයිස්තුවලට වැඩ කරපු කාලයක් තිබුණා කියන ඔය චෝදනාව හැම දාම කරනවා. නමුත් එහෙම වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. ඒක අපි පැහැදිලිව කියන්න ඕනෑ. ඔබතුමා තව ටික වෙලාවකින් මෙතැනින් පිටත් වෙනවා. ඊට කලින් මේ ගැන කියන්න ඕනෑ. අපි අපේ අභිමතයටයි වැඩ කළේ.

ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා -මෙතුමා- කැලණිය ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා. මම දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිතුමා. ඔබතුමා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා. අපි අපේ අභිමතයටයි වැඩ කළේ. ඒ වෙලාවේ ටෙන්ඩර් එක හැදුවා. නිලධාරීන් ඇස්තමේන්තු කළා. ඇස්තමේන්තු කරලා අවශ්‍ය කරන විධියට අපට අවශ්‍ය මුදල ලැබුණා. අපි ඒ වැඩ කටයුතු කළා. හැබැයි, අපි ඒ වැඩ කටයුත්ත කරපු ක්‍රියාවලිය කොච්චර කාර්යක්ෂමද, කොච්චර නිර්මලද කියලා කියනවා නම් අපි සියලු දෙනාම පාර්ලිමේන්තුවට එන්න තරම් ජනතාව අපව පිළිගත්තා. පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ගෙන් ඒ කාලයේ ආණ්ඩුව එහෙමයි වැඩ ගත්තේ කියලා කවුරු හරි කියනවා නම්, ඒ ජනතාව අපව යවන්නේ පාර්ලිමේන්තුවට නොවෙයි, හිරගෙවල්වලටයි; පොලීසිවලටයි. ඒක නිසා එහෙම තත්ත්වයක් රටේ ඒ කාලයේ තිබුණේ නැහැ. මේ මවන චිත්‍රයේ තවමත් පාට ගානවා. තවමත් මේ චිත්‍රය අඳිනවා. තවමත් ඒ චිත්‍රය එක්ක ජීවත් වෙන්න උත්සාහ කරනවා.

එක්තරා නියෝජ්‍ය අමාත්‍යවරයෙක් එතුමාගේ හොරණෑ සද්දෙන් මහා ඉහළින් කථා කරලා කිව්වා, "දූෂණය, වංචාව, අල්ලස ගැන වෙන රටවල ක්‍රියා කරන්නේ මෙහෙම නොවෙයි. හෙලිකොප්ටරයෙන් උඩට ගෙනහින් බිමට තල්ලු කරනවා. වෙන රටවල 38දෙනෙකුගේ ඔළුවට වෙඩි තියලා තිබෙනවා. වෙන රටවල නායකයන් එහෙමයි." කියලා. එතුමාගේ නායකයා මුතුරාජවෙල සිද්ධිය වෙලාවේ කථා කරලා, "මුතුරාජවෙලට යන්න එපා. මුතුරාජවෙලට ගියොත් තමුන්නාන්සේ ඒ ආගමික නායකයන්ගෙන් නාම යෝජනා අරගන්නවා" කියද්දී නැට්ට පස්සේ ගහගෙන ආපස්සට හැරෙනවා. මෙහෙම දේශපාලනඥයන්ද මේ රඟපෑම කරන්නේ? මේ දේශපාලන චරිතද? එතුමා, මහනුවර ප්‍රදේශයේ ගුරුවරියක් සම්බන්ධයෙන් අල්ලස් නඩුවක් තිබෙන කෙනෙක්. ඒ ගුරුවරියගෙන් රුපියල් ලක්ෂ 10ක් ලබා ගත්තා කියලා එතුමාට චෝදනාවක් තිබෙනවා. අල්ලස් නඩු තිබෙන උදවිය මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිර්මලව කථා කරන එක ගැන අපට මහ පිළිකුලක් තිබෙනවා. අපි කාගෙන් හරි අල්ලස් අරගෙන තිබෙනවා කියලා පුළුවන් නම් අපට චෝදනා කරන්න කියලා අපි භය නැතුව කියනවා. අපි දෙදෙනා එකම මැතිවරණ කොට්ඨාසයේ ගනු - දෙනු කරන්නේ. රන්ජන් රාමනායක මැතිතුමාත්, මමත් -අපි දෙන්නාම- එකම මැතිවරණ කොට්ඨාසයේ. මම නොබියව කියනවා, ඉන්දික අනුරුද්ධට අල්ලස් චෝදනා තිබෙනවා නම් කථා කරන්න කියලා. එතුමාට තිබෙනවා, ලිංගික අල්ලස් චෝදනාව. එතුමාට තිබෙනවා, මූල්‍යමය අල්ලස් චෝදනාවක්. එතුමාට තිබෙනවා, වාහන අවභාවිත කරපු චෝදනාවක්. මේ චෝදනා සියල්ල එතුමාට තිබෙනවා. එතුමාට එහෙම චෝදනා තිබෙද්දී එතුමා ඇවිල්ලා අනික් අයට චෝදනා කරනවා. ඒක හරියට ජනතා විමුක්ති පෙරමුණ නිර්මල විධියට කථා කරනවා වාගෙයි. ජනතා විමුක්ති පෙරමුණත් එහෙමයි නේ. ජනතා විමුක්ති පෙරමුණ බොහොම නිර්මලයි. අද රටේ ප්‍රශ්න ගැන කථා කරන්න වෙනත් පක්ෂයක් නැති විධියටයි ඔවුන් කථා කරන්නේ. හරිම නිර්මලයි. අපි පරණ දේවල් ගැන කථා කරන්න යන්නේ නැහැ. ඇයි, දෙයිහාමුදුරුවනේ! ඊයේ-පෙරේදා වැසිකිළියක ඉඳන් සල්ලි ගත්තු එකක් ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කළා නේ. වැසිකිළියකට ගිහිල්ලා සල්ලි ගත්තු සිද්ධියක් ගැන ජනතා විමුක්ති පෙරමුණට

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

විරුද්ධව මේ පාර්ලිමේන්තුවේදී කථා කළා. කවුද උත්තර දුන්නේ? ඉස්සරහ පේළියේ ඉඳගෙන ඉන්න හයදෙනාම "මීයාට පිම්බා" වාගේ ඔළුව බිමට හරවාගෙන හිටියා මිසක් කිසිම දවසක, "නැහැ, අපි ගත්තේ නැහැ." කියලා කිව්වේ නැහැ. ප්‍රසිද්ධ මාධ්‍ය ඉස්සරහට ඇවිල්ලා කථා කරලා කිව්වේ නැහැ, "අපි ගත්තේ නැහැ" කියලා. ප්‍රසිද්ධ මාධ්‍යයෙනුත් ඒ පුද්ගලයා මේ බව ප්‍රකාශ කළා. එහෙම කිව්වේ, ඒ පුද්ගලයාගේ නොදැනුවත්කම හින්දාද කියලා කියන්න මා දන්නේත් නැහැ. එහෙම නැත්නම් තක්කෙටම හරි වෙන්න ඇති. ප්‍රසිද්ධ මාධ්‍යයට ඇවිල්ලා ඒ පුද්ගලයා කිව්වා, "ඔව්, ජනතා විමුක්ති පෙරමුණට තැන් තැන්වලදී මිලියන ගණන් අපි සල්ලි දුන්නා." කියලා. කවුද කථා කළේ? කවුද නඩු දැම්මේ? කොහේද නඩුවක් ගොනු කරලා තිබෙන්නේ? ජනතා විමුක්ති පෙරමුණේ කිසිම පුද්ගලයෙකු නඩුවක් ගොනු කරලා නැහැ.

රන්ජන් රාමනායක මැතිතුමා කථා කරලා කියනවා, ලෝකයේ ඉන්න බහුතරයක් ජනතාව අදහන කතෝලික ආගමේ ගෞරවයට පාත්‍ර වෙච්ච පාප් වහන්සේ ළඟ තමයි වැඩිම මුදල් තිබෙන්නේ කියලා. එහෙම කියන එක ආගමික නායකයන්ට කරන ලොකු අපහාසයක්. ඒ වාගේම ලංකාවේ මහා සංඝරත්නයේ නායක ස්වාමීන් වහන්සේලා ළඟ තමයිලු වැඩිම සල්ලි තිබෙන්නේ. ඒක නිසා වෙන්න ඇති, මේ ආණ්ඩුව පිං පෙට්ටිවලටත් කෙළින්නේ.

වැඩිම මුදලක් තිබෙන්නේ මහා සංඝරත්නය ළඟයි කියලා එතුමා කියනවා. එතුමාට ආගමක් නැහැ. රන්ජන් රාමනායක මැතිතුමනි, ඔබතුමා රත්නපුරයට යද්දී බෞද්ධයා. ගම්පහට එද්දී ඔබතුමා කතෝලිකයා. ඔබතුමා උප්පත්තියෙන් බෞද්ධයා; ගම්පහට එද්දී කතෝලිකයා. ඔබතුමා උත්පත්තියෙන් කතෝලිකයාද, බෞද්ධයාද කියලා දැන් සොයා ගන්න බැහැ. එතුමා කියනවා, පාසල්වලට දරුවන් ඇතුළත් කරද්දී නම් වෙනස් කරනවාලු. දරුවාට බොරු කියන්න කියලා කියනවාලු. එතුමාගේ අම්මා, තාත්තා දුන්නු නම එතුමා වෙනස් කරගත්තා. එතුමාගේ නම තමයි, සද්ද විද්ද පළග පතිර අඹ කුමාර දොන් අල්පොන්සු සිල්වෙස්ටර් රන්ජන් සිල්වෙස්ටර් රාමනායක. මොකක්ද දැන් නම? රන්ජන් රාමනායක. මේ වාගේ බොළඳ දේවල් අපි නොදන්නවා කියලා හිතාගෙන රහපාන්න ගත්තාම අපිට මේ වෙස් මුහුණු ගලවන්න වෙනවා. අපි එතුමාගේ වෙස් මුහුණ දිවුලපිටියේදී ගැලෙව්වා. ඒ වාගේම, ජනතා විමුක්ති පෙරමුණේ වෙස් මුහුණත් ඒකාබද්ධ විපක්ෂය හෙට-අනිද්දා වෙද්දී ගලවනවා කියන එකත් අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හොයා ගත්තු තොරතුරු අනුව ජනතා විමුක්ති පෙරමුණ තමයි පක්ෂයක් විධියට මූල්‍යමය වශයෙන් වැඩිම වත්කම් තිබෙන පක්ෂය බවට අද පත් වෙලා තිබෙන්නේ. කොහොමද එහෙම පත් වුණේ? ඒ අල්ලස ගත්තේ කවද්ද? 2015 ජනවාරි 08වැනි දා ආණ්ඩුව වෙනස් කරන කොන්ත්‍රාත් එකේ ලොකුම අල්ලස ගත්තේ ජනතා විමුක්ති පෙරමුණයි. ඔවුන් අද එක එක හොරකම් ගැන කථා කරනවා; එක එක වංචාවන් ගැන කථා කරනවා; ගම්වල තිබෙන පරිසර ගැටලු ගැන කථා කරනවා. මොනවා කථා කළත් යටින් කුට්ටිය ආවාට පස්සේ පක්ෂයක් විධියට ඒවා ඔක්කෝම අරගෙන තිබෙනවා. ඒක පසු ගිය දවස්වල අපි පාර්ලිමේන්තුවේ දැක්කා. අපි කියන්නේ මේකයි. තමුන් නිර්මල නම් ඒ චෝදනාවලින් මිදෙන්න. අපි කථා කරනවා අපි නිර්මලයි කියලා. අපට චෝදනා කරන්න. බය නැතිව අපි කථා කරනවා. ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු විධියට චෝදනා කරන සියලුදෙනා කෑගහලා කියනවා. අපි "ටොප් ටෙන්" එක ගෙනැල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ඉදිරිපත් කළා. අධ්‍යක්ෂ ජනරාල්තුමනි, ඔබතුමාට පිට කොන්දක් තිබෙනවා නම් අපි ඔබතුමාට මේ සඳහා සියලු අනුග්‍රහය ලබා දෙනවා. මේකේ පළමුවැනි චිත්තිකාරයා අගමැතිතුමායි. පුළුවන් නම් අගමැතිතුමා හෙටම අල්ලස් කොමිසම හමුවට කැඳවන්න. ඔබතුමාට වැටුප් හා දීමනා දෙගුණයක් වැඩි කරලා දුන්නත් අපි කවදාවත් කිසිම දවසක හෙළා දකින්නේ නැහැ. මේ පළමුවැනි බැදුම්කරයෙන් ගහපු ගැහිල්ලට පුළුවන් නම් අග්‍රාමාත්‍යවරයා අල්ලස් කොමිසම ඉදිරියට ගෙන එන්න. ඔබතුමාට එහෙම හැකියාවක් නැහැ. පුළුවන් නම්, රවි කරුණානායක මැතිතුමාව අල්ලස් කොමිසමට ගෙන්වන්න. ඔබතුමාට හැකියාවක් නැහැ. මලික් සමරවික්‍රම මැතිතුමාව ගෙන්වන්න ඔබතුමාට හැකියාව නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දුන්න ෆයිල් දහයේ සඳහන් කරුණුවලින් විතරක්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කොල්ලකා තිබෙන මුදලේ වටිනාකම රුපියල් මිලියන 131,500ක් වෙනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේ මාස ගණනට කොල්ල කාලා තිබෙන මුදල රුපියල් මිලියන 131,500ක් වෙනවා. මහ බැංකු බැදුම්කරයෙන් කාපු කොල්ලකෑම කොයි පක්ෂවලට බෙදුණාද කියලා අපි දන්නේ නැහැ. අද වෙද්දී රටේ ආදායමක් නැහැ හොරකම් කරන්න; රටේ වත්කමක් නැහැ හොරකම් කරන්න. රටේ වත්කම් නැති නිසා අපට දැන් පේනවා, ඇමතිවරයෙක් හරකෙක්, දෙන්නෙක් හරි උස්සලා යම්කිසි ගතමනාවක් ගන්න තත්ත්වයකට ආණ්ඩුව පත් වෙලා ඉන්නවා කියලා. ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න මන්ත්‍රීතුමන්ලාටත් අපි කියනවා, "සුපිරිසිදු චරිත වෙන්න එපා." කියලා. කරුණාකරලා චතුර සේනාරත්න මන්ත්‍රීවරයා කියපු ඒ චෝදනාවෙන් ගැලවෙන්න. කරුණාකරලා ඔබතුමන්ලාගේ සද්භාවය රටට ලෝකයට පෙන්වන්න. එහෙම නැතිව වෙන වෙන ඒවාට ගිහිල්ලා මේ ජනතාව මුලාවේ දාන්න එපා. මේ ජනතාව මුලාවේ දැම්මේ පළමුවැනි වතාවට. ඔබ තමුන්නාන්සේලා එදා පක්ෂයක් විධියට ජනාධිපති අපේක්ෂකයෙක් ඉදිරිපත් කළා නම් අද රටට මේ සන්තෑසිය වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ අපේක්ෂකයා ඉදිරිපත් නොකර තියාගෙන ඉඳලා ඒ ඡන්ද ප්‍රමාණය අනෙක් අපේක්ෂකයාට ලබා දෙන්න කෝටි ගාණක්, බිලියන ගාණක් අල්ලස් අරගත්ත පක්ෂයක්. ඒක අපි කියනවා. ඒක ගත්තෙත් හොඳ තැනකදී නොවෙයි. වැසිකිළියක ඉඳගෙනයි ඒක ගත්තේ. ඒකයි තිබෙන ලජ්ජාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ඒ නිසා මෙවායින් මිදෙන්න. ඒ වාගේම මට කලින් කථා කරපු නියෝජ්‍ය ඇමතිවරයා පැහැදිලිවම කිව්වා, "සියලු දෙනා අල්ලස් ගන්නවා." කියලා. එතුමා ගරු අධිකරණයටත් අභියෝග කළා. නීතිය හරියට ඉෂ්ට වෙනවා කියලා අපි විශ්වාස කරන අධිකරණයටත් එතුමා අභියෝග කළා. මොකක්ද අභියෝගය? එතුමා මීට මාස ගණනාවකට කලින් කිව්වා, "රටේ ඉන්න

කුඩුකාරයෝ නීතිඥයන් හරහා අධිකරණ විනිසුරුවන්ට මුදල් ලබා දෙනවා; අල්ලස් ලබා දෙනවා." කියලා. ඒ නිසා අපි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිනවා මේවා විභාගයට ගන්න කියලා. මේ පැමිණිල්ල ශ්‍රේෂ්ඨාධිකරණයේ මේ වෙද්දී ගොනු කරලා තිබෙනවා. කරුණාකරලා අධිකරණය කිලිටි කරන්න ඉඩ දෙන්න එපා. ඒ නිසා අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට කියනවා,- [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න මට තව සුළු වේලාවක් දෙන්න.

මොන තරම් කොමිෂන් සභා පත් කළත් වැඩක් නැහැ. ආණ්ඩුව මේ වෙද්දී ස්වාධීන කොමිෂන් සභා ගණනාවක් පත් කර තිබෙනවා. නමුත් මේ මැතිවරණ කොමිසම මැතිවරණයක් පවත්වන්න බැරි කොමිසමක් බවට පත් වී තිබෙනවා. අපි සඳහන් කරපු 'Top 10' දැන් 'Top 25' වේගෙනයි එන්නේ. තව චෝදනා 15, 20ක් ඒකට එකතු වෙලා තිබෙනවා. ඒවාත් අරගෙන හෙට අනිද්දා අපි නැවතත් අල්ලස් කොමිසමට එනවා. ඊට කලින් අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කියනවා, පිට කොන්ද නියාගෙන මේ කියපු කරුණු ගැන හොයලා පරීක්ෂණ පවත්වන්න කියලා. අපි කිසිම දවසක තමුන්නාන්සේට වැඩි කරන දීමනා සහ වරප්‍රසාද වෙනුවෙන් වගකියන්නේ නැහැ. තමුන්නාන්සේ ආණ්ඩුවේ අල්ලස්වලට අසු වෙන්න එපා කියන ඒ ප්‍රකාශය කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 5.54]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට වචන කීපයක් කථා කරන්න ඉඩ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අද අපි මේ විවාදයේදී පක්ෂ විපක්ෂ මැති ඇමතිවරු ඒ අයගේ අදහස් උදහස් හුවමාරු කර ගත්ත හැටි අහගෙන හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක් මේ රටේ නීතියක් කියන එක තිබුණේ නැහැ. ඒ කාලයේ සෑම දෙයක්ම දේශපාලනීකරණය කරලා තිබුණේ. සෑම ආයතනයක්ම එනම්, ප්‍රාදේශීය සභාවක සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ආණ්ඩුවේ තිබෙන අනෙක් ආයතන යන සෑම තැනක්ම දේශපාලනීකරණය වෙලා තිබුණා. නිලධාරීන්ට කෙළින් වැඩ කරන්න බැරි තත්ත්වයක් තිබුණා. එදා 2015 ජනවාරි 08 වෙනි දා ඒ වෙනස වුණාට පසුව අද නිලධාරීන්ට වැඩ කරන්න පුළුවන්, ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් අවස්ථාවක් ඇති වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමාට ලබා දෙන වැටුප ඉතා වැදගත්. පසු ගිය වකවානුවේ, 2016 වෙනකොට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි 10,634ක් පමණ ලැබිලා තිබෙනවා. ඒ වාගේම 2015 වර්ෂයේ පැමිණිලි 3,021ක් සහ 2014 වර්ෂයේ පැමිණිලි 9,752ක් ලැබිලා තිබෙනවා. හැබැයි, 2014 අවුරුද්දේ ලැබුණු පැමිණිලි එකක්වත් හරියට විභාග කරලා නැහැ. ඒකට හේතු තිබෙනවා. එදා හිටපු දේශපාලනඥයන් ඇඟිලි ගහලා ඒ විභාග නතර කරලා තිබෙනවා. එහෙම නැත්නම් පැත්තකට දමා තිබෙනවා. හැබැයි, අපි දන්නවා, අද මේ නිලධාරීන් මේ පැමිණිලි විභාග කරගෙන යන්න වෙහෙස මහන්සි වී කටයුතු කරනවා කියලා. නමුත් පැමිණිලි විශාල ප්‍රමාණයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ආණ්ඩුව ලබා ගන්නකොට, ආණ්ඩුව භදනකොට, ඒ වෙනස ඇති කරනකොට ඒ වෙනුවෙන් විශාල කර්තව්‍යයක් කළා. අපි එදා ජයග්‍රහණය කළේ නැත්නම් අද අපි මෙතැන නැහැ. ඒක තමයි ඇත්ත කථාව. මොකද, එදා අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න කරපු සටනේදී අපට පහර දෙන්න විශාල බලවේග ආවා. අපට විරුද්ධව කරන්න තිබෙන හැමදේම කළා. හැබැයි, අපි ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා ගත්තාම අද විශේෂයෙන්ම සබරගමුව පළාත් සභාව විශාල වශයෙන් දූෂිත ආයතනයක් බවට පත්වෙලා තිබෙනවා. විගණන වාර්තාවල තිබෙනවා, එහි ප්‍රධාන අමාත්‍යවරයාට පාවිච්චි කරන්න පුළුවන් නිල වාහන දෙකක් සහ ආරක්ෂිත වාහනයක් පමණයි කියලා. නමුත්, 2015 වර්ෂය වෙනකොට වාහන 14ක් අවභාවිත කරලා තිබෙනවා. මිලියන 9කට වඩා මුදලක් ඒ වාහන සඳහා වැය වෙලා තිබෙනවා. මේ කරුණු 2016 විගණන වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. අපි ඉල්ලා සිටින්නේ මේවා ගැන විභාග කරලා කටයුතු කරන්න කියලායි.

ඊළඟට, අපි ගනිමු සමුපකාර. මේක තමයි අනෙක් දූෂිතම ක්ෂේත්‍රය. විශේෂයෙන්ම රඹුක්කන සමුපකාරයේ දූෂණ වැඩි වශයෙන් සිදු වනවා. ඊළඟට, ඉන්ධනහල් ගනිමු. ඉන්ධනහල්වලත් විශාල ලෙස මුදල් අක්‍රමිකතා සිදු වෙලා තිබෙනවා. එදා දේශපාලනඥයෝ ඡන්දය කරන්න මොකක්ද කළේ? තම අභිමතය පරිදි ඒ ඉන්ධනහල්වලින් වාහනවලට ඩීසල්, පෙට්‍රල් සපයා ගත්තා. එවැනි අක්‍රමිකතා විශාල වශයෙන් සිදු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම සියලු අක්‍රමිකතා පිළිබඳව පරීක්ෂණ පවත්වලා අවශ්‍ය කටයුතු කරන්න වනවා.

අද ඒකාබද්ධ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කථා කළා; ආණ්ඩුවට චෝදනා එල්ල කළා. නමුත්, දූෂණය කියන දේ දේශපාලන වශයෙන් මෙන්ම මේ රටේ සෑම තැනම තිබෙනවා. දූෂණය නැති කර මේ රට ඉදිරියට ගෙන යන්න අප සියලුදෙනාම එකතු වෙලා කටයුතු කරන්න ඕනෑ. ඒකට පක්ෂ, පාට භේදයක් බලන්න එපා. දේශපාලනඥයන් හැටියට අපි සියලුදෙනාම එකතු වෙලා මේ රටේ දූෂණය, භීෂණය නැති කරන එක තමයි කරන්න ඕනෑ.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා වැඩි කරන්න කටයුතු කිරීම ගැන අපි සන්තෝෂ වනවා. මේ යෝජනාවට අපේ සහාය ලබා දෙන බව ප්‍රකාශ කරමින්, මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 6.00]

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීමට අද ගෙනා යෝජනාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුති කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි කීයක් වෙන් වී තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 9යි.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීමට අදාළව විවාද කෙරෙන අවස්ථාව වුණත්, අද රටේ සිදු වන බරපතළ කාරණයක් පිළිබඳව මම පළමුවෙන්ම ගරු සභාවේ අවධානය යොමු කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට අයිති මුහුදු තීරය විදේශ රටවලින් ආක්‍රමණය කරන්න පටන්ගෙන තිබෙනවා. අද වෙද්දී ඒ ආක්‍රමණ එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. පිට රටවල නැව් අද අපේ මුහුදු සීමාව තුළට ඇතුළු වෙලා අපේ මුහුදු සීමාව තුළ ගමන් කරනවා. ඒ වාගේම අපේ මත්ස්‍ය සම්පත අල්ලා ගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු පළාතේ මගේ ගමේ, කුඩාවැල්ල ප්‍රදේශයේ ඩබ්ලිව්.එච්. මහින්ද මහතාගේ "ඩිලාන් පුතා" බෝට්ටුව හම්බන්තොට නගරයේ සිට මුහුදු සැතපුම් 13ක් එහා ධීවර කර්මාන්තයේ යෙදෙනවා. ඒ වාගේම හම්බන්තොට එල්.එච්. ලීලානන්ද මුදලාලිට අයිති "තුෂාන් පුතා" බෝට්ටුවත් හම්බන්තොට නගරයේ සිට මුහුදු සැතපුම් 13ක් එහා මුහුදු තීරයේ ධීවර කර්මාන්තයේ යෙදෙනවා. ඊයේ එක පාරටම අළු පාට නැවක් ඇවිල්ලා එම බෝට්ටු දෙකම යට කරගෙන ගිහින් තිබෙනවා. කුඩාවැල්ල ප්‍රදේශයට අයිති බෝට්ටුවේ හිටපු ධීවරයන් තුන්දෙනාගෙන් දෙදෙනෙක් අද වෙද්දි අතුරුදහන් වෙලා තිබෙනවා. එක ධීවරයෙක් මේ වෙද්දී ඉන්නවා, හම්බන්තොට ඉස්පිරිතාලේ. අද ඒ බෝට්ටු දෙකම මුහුදුබත් වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන ප්‍රශ්නය තමයි, තවමත් ඒ නැව අල්ලා ගෙන නැති එක. අපේ ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාත් මෙතැන ඉන්නවා. ගරු අමාත්‍යතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මේකයි. පිට රට නැව්වලට අපේ මුහුදු තීරයේ ගමන් කරන්න අවසර දුන්නේ කවුද? කාගේ අනුදැනුම ඇතිවද ඒ නැව් අපේ මුහුදු තීරයට ඇතුළු වුණේ? ඒවා සිදු වන්නේ කවුරුන් හෝ දැනුවත්වද? ලෝකයේ හොඳම නාවික හමුදාවක් තමයි අපේ ලංකාවේ ඉන්නේ. කවුරු හෝ ඒ අයට අනුබල දෙන නිසා තමයි, ඒ අය අද අපේ මුහුදු තීරයට ඇතුළු වෙලා ඒ වාගේ හානි සිදු කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළමුවැනි අවස්ථාව නෙවෙයි. අද අපේ ගමේ, කුඩාවැල්ලේ, ධීවරයෝ දෙදෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ වාගේම මීට මාස හයකට කලින් ගාල්ලේදීත් මෙවැනිම සිදු වීමක් වුණා. අපේ මුහුදු තීරයට බලහත්කාරයෙන් නැව් ඇතුළු වීම නිසා, ගාල්ලේත් ධීවරයෝ පස්දෙනෙක් ජීවිතක්ෂයට පත් වුණා. රටේ නායකයෝ දැනුවත්ව තමයි මේවා සිද්ධ වෙන්නේ.

එහෙම නැත්නම් මේ මුහුදු තීරයේ ඕනෑ ඕනෑ විධියට මෙහෙම හැසිරෙන්නේ කොහොමද? හැබැයි අද අපේ බෝට්ටුවක් වැරැදිලාවත් අපේ මුහුදු තීරයෙන් එළියට ගියොත් දඩ ගහනවා. අද කලුතර සචිත් මහතාගේ, සුරංග මහතාගේ, රංග මහතාගේ බෝට්ටු තුනට රුපියල් ලක්ෂ 5කට අධික බදු මුදලක් අය කරනවා. ඒකට හේතුව මොකක්ද? තමන්ගේ මුහුදු තීරයෙන් එළියට ගිහින් මාළු ඇල්ලුවා කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නීති ක්‍රියාත්මක වන්නේ අපේ රටට විතරයි. හැබැයි පිට රටවල නැව් ඇවිත්, ඔවුන්ට ඕනෑ විධියකට අපේ මුහුදු තීරයේ මාළු අල්ලන්න, ඒ වාගේම අපේ බෝට්ටු පෙරළාගෙන යන්න මේ රජය අවසර දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වෙද්දී -

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියයි අවශ්‍ය වන්නේ. අපේ මුහුදේ මාළු අල්ලන්න කිසිම යාත්‍රාවකට අවසර දීලා නැහැ. එහෙම යුගයන් තිබෙන්න ඇති. මා මෙම අමාත්‍යාංශයේ අමාත්‍ය ධුරය භාර ගත්තාට පස්සේ අපේ මුහුදු තීරයේ මේ ආකාරයෙන් මාළු අල්ලන්න අවසර දීලා නැහැයි කියලා මා ඉතාමත් වග කීමෙන් කියනවා.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
එහෙනම් අල්ලස් ගන්න ඇති.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මේ යාත්‍රා කෙහෙන්ද ගියේ කියන එක පිළිබඳවත් අපි දැනට සොයාගෙන යනවා. ඒ වාගේම අපේ මුහුදු තීරයේ වෙනත් නැව් යනවා; භාණ්ඩ ප්‍රවාහන නැව් යනවා.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
එතකොට ඒ බෝට්ටු දෙක හප්පාගෙන ගියේ කාර්ද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මොකක්ද?

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ඒ බෝට්ටු දෙක හප්පාගෙන ගියේ කාර් එකක්ද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ. ඔබතුමාගේ කාරණා පිළිබඳ මට වෙනම කියන්න තිබෙනවා. ඒකට අපි වෙනම විවාදයක් ගනිමු. [බාධා කිරීමක්] නැහැ. [බාධා කිරීමක්] සමා වෙන්න. නැහැ, නැහැ. දැනට අපට

වාර්තා වන්නේ භාණ්ඩ ප්‍රවාහන - [බාධා කිරීමක්] නැහැ. භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා ගමන් කරනවාය කියන එක තමයි අපට දැනට වාර්තා වන්නේ. මා ඉතාමත් වග කීමෙන් කියනවා, අපි කිසිදු යාත්‍රාවකට අවසර දීලා නැහැයි කියලා. ඕනෑ නම් අවසර දීපු ඒවා ගැන ඔබතුමාගේ පිටුපසින් ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් අහගන්න පුළුවන්. එහෙම අවසර දීපු කාලයක් තිබුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ කාලය ගැන කියන්න. [බාධා කිරීම්]

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මට තිබෙන ප්‍රශ්නය, ඇමතිතුමාගේ මේ බඩු ගෙන යන නැව් නාවික සැතපුම් 13ක් ඇතුළේද යන්නේ කියන එකයි. ඒ නැව් අපේ මුහුදු තීරයේද යන්නේ ඇමතිතුමනි? මුහුදු සැතපුම් 13 තුළ නැව් යන්නේ කොහොමද? මුහුදු සැතපුම් 60ක් ඇතුළත කිසිම නැවකට යන්න බැහැ. එම සීමාව තුළ නැව් යන්නේ කොහොමද කියන්න කෝ ඇමතිතුමනි. ඔබතුමන්ලාගේ අනුදැනුම ඇතිවද මේවා සිද්ධ වෙන්නේ? මේ ජීවිතවලට වග කියන්නේ ඔබතුමාද, ජනාධිපතිතුමාද, අගමැතිතුමාද? එහෙම නැත්නම් ඔබතුමන්ලා අල්ලස් අරගෙනද මේවා කරන්නේ?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක යාත්‍රාවකටවත් අවසර දීලා නැහැ. ඒ සීමාව තුළ නැව් යනවා නම් ඒකේ වගකීම භාර ගන්න ඕනෑ ශ්‍රී ලංකා නාවික හමුදාවයි. ඔවුන්ට සම්පූර්ණ අයිතිය ලබාදීලා තිබෙනවා, ඒ නැව් අත් අඩංගුවට ගන්න. අපේ කලාපය තුළට මොන රටකින් විදේශ යාත්‍රා ආවත්, ඒ කිසිදු යාත්‍රාවකට ධීවර අමාත්‍යාංශය විධියට අවසරයක් දීලාත් නැහැ, ඒ සම්බන්ධයෙන් අනුදැනුමකුත් නැහැ. එහෙම දෙයක් සිද්ධ වෙලා තිබෙනවා නම් ශ්‍රී ලංකා නාවික හමුදාව තමයි එහි වගකීම් භාර ගන්න ඕනෑ. මෙය භාණ්ඩ නෞකාවක්ද, අනවසරයෙන් ආපු නෞකාවක්ද කියන එක පිළිබඳව අපි සොයාගෙන යනවා.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ප්‍රශ්නය මේකයි. රටේ ජනාධිපතිතුමා මේවා දකිනවා, පත්‍රයෙන්. අගමැතිතුමාත් පත්‍රයෙන් දකිනවා. හැබැයි ධීවර ඇමතිතුමා බෝලය පාස් කරනවා, ශ්‍රී ලංකා නාවික හමුදාවට. ඇමතිවරු, ජනාධිපතිවරු, අගමැතිවරු හැම දාම බෝල පාස් කරනවා. හැබැයි අපේ ගමේ ජනතාවට වග කියන්නේ කවුද? අපේ ධීවරයාට වග කියන්නේ කවුද? එම ජීවිතවලට ඔබතුමන්ලා වග කියන්න ඕනෑ. බෝල පාස් කර-කර ඉන්න එපා. ඔබතුමා ධීවර ඇමතිවරයා විධියට වගකීම ගන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්නේ මේ විවාදයේ මතෘකාවට අදාළව නොවෙයි. දැන් මෙය වෙනත් විවාදයකට යනවා.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න ඉඩ දෙන්න. මෙතැන තිබෙන ප්‍රශ්නය තමයි, මේවා කරන්නේ අල්ලස් අරගෙන. මේ සිද්ධ වන්නේ හොරකම. ඒ ගැන තමයි සොයන්න ඕනෑ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යාත්‍රා මසුන් අල්ලන්න හෝ වෙනත් කටයුත්තකට ඇවිල්ලා තිබෙනවා නම්, අපි දැනටමත් ඒ ගැන තොරුතුරු සොයාගෙන යනවා. රජය විධියට අපි ඒ යාත්‍රාවලට එරෙහිව කටයුතු කිරීමට භාර ගන්නවාය කියන එක මා ඉතාමත් වග කීමෙන් කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව කරගෙන යන්න. ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මෙය පළමුවන එකත්, අන්තිම එකත් නොවන නිසායි. මාස 6කට කලින් ජීවිත 5ක් නැති වුණා. අද දෙදෙනෙක් අතුරුදහන් වෙලා තිබෙනවා. ඒ වාගේම ඉන්දියාවේ බෝට්ටු ඇවිත් කල්මුනේදී අපේ බෝට්ටුවලට ගහනවා. හැබැයි මේ ඇමතිවරු නිහඬයි, ජනාධිපතිතුමා නිහඬයි, අගමැතිතුමා නිහඬයි. මේක තමයි ඇත්ත තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ධීවරයාට එන්න-එන්නම නීති වැඩි වෙනවා. අපේ ධීවරයාට මාළු අල්ලන්න නැහැ. 2015 මේ ආණ්ඩුව භාරගත් දවසේ ඉඳලා මත්ස්‍ය නිෂ්පාදනය එන්න-එන්න අඩුවෙලා තිබෙනවා.

හැබැයි ලොකුවට කියනවා, දැන් සම්බාධක නැහැ කියලා. මත්ස්‍ය සම්පත පිට රටවලට, යුරෝපා සංගමයේ රටවලට දැන් ඕනෑ විධියට යවන්න පුළුවන් කියලා කියනවා. ගරු අමාත්‍යතුමනි, නමුත් 2015 සිට 2017 දක්වා අද වනකොට එන්න එන්නම මත්ස්‍ය අපනයනය අඩු වෙලා තිබෙනවා. මේ සම්බාධක නැත්නම් මත්ස්‍ය අපනයනය අඩු වෙන්නේකොහොමද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

මට කියන්න තියෙන්නේ මෙයයි. අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, ගරු ඇමතිතුමාට, නාවික හමුදාවට මේ සියලු දෙනාටම මම කියන්නේ, අපේ මුහුදු තීරය ආක්‍රමණය කරන එක නවත්වන්න කියලායි. අපේ මත්ස්‍ය සම්පත් රැගෙන යාම නවත්වන්න. අපේ ධීවරයන්ගේ ජීවිතවලට වග කියන්න කියා ආණ්ඩුවට බල කර සිටින්න කැමැතියි. ඔබතුමාට ස්තූතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තූතියි.

මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 6.10]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහා වැටුප් හා දීමනා ගෙවීම පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ වචන ස්වල්පයක් කථා කිරීමට ලැබීම ගැන සතුටු වෙනවා. සාමාන්‍යයෙන් අල්ලස් හෝ දූෂණය පිළිබඳ කථා කරද්දී හැම දාම භූමිතෙල් ගෑවුණු ගැරඩි වාගේ දහලන පිරිසක් ඉන්නවා. හොරුන්ට, වංචනිකයන්ට, දූෂිතයන්ට මේ මාතෘකාව කථා කිරීම තරම් අපුලක් තවත් නැහැ.

2015 ජනාධිපතිවරණයේ ජනවරම සුවිශේෂී එකක්. ඒ ජනවරම ලැබීමේ ප්‍රධාන කාරණාව තමයි සොරුන්ට, වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් පැමිණ වීම. ඒ සඳහා තමයි ලක්ෂ හැට දෙකක ජනතාවක් එකතුවෙලා මහින්ද රාජපක්ෂ මහත්මයා ජනාධිපති පුටුවෙන් බස්සලා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාව ඒ පුටුවේ වාඩි කරවූයේ. ඒ සඳහා ආයතන පද්ධතියක් පළමු දින සියය තුළ හැදුවා, ශක්තිමත් කළා. ඒ අනුව තමයි FCID එක හැදුවේ. ඒ අනුව තමයි FCID එකට පැමිණිලි ගොනු කිරීම සඳහා දූෂණ මර්ධන කම්ටු ලේකම් කාර්යාලය හැදුවේ. ඒ අනුව තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කළේ. ඒ අනුව තමයි වෙනදා පොලිස් නිලධාරියෙක්, ග්‍රාම නිලධාරි මහත්මයෙක්, විදුහල්පතිවරයෙක් අල්ලස් ගන්නකොට අල්ලනවා වෙනුවට සමහර දේශපාලනඥයන්, රජයේ නිලධාරීන් අල්ලස් කොමිසම හමුවට පැමිණෙව්වේ. ඒ දවස්වල රාජපක්ෂ කල්ලියේ අය වැඩිපුරම හිටියේ අල්ලස් කොමිසම ඉස්සරහ, FCID එක ඉස්සරහ. අල්ලස් කොමිසමට ඒ අයගෙන් කවුරු හෝ අරගෙන යනකොට, සමහර වෙලාවට ජාතික කොඩියත් විකෘති කර අරගෙන ගිහින් උද්ඝෝෂණ කරන තැන තමයි සිටියේ. එම නිසා හැම දාමත් මේ අල්ලස් හෝ දූෂණ ගැන කථා කරනකොට ඒ උදව්යට මේ ප්‍රශ්නය තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජනාධිපතිවරයා පත් වී අවුරුදු දෙකහමාරක් ගතවෙන කොට, මේ ආණ්ඩුව පත් වී අවුරුදු දෙකක් ගතවෙන කොට ඒ හොරුන්ට උඩ පැන පැන කෑ ගහන්න අවස්ථාවක් සලසා දී තිබෙන්නේත් මේ ආණ්ඩුවම තමයි. තිබුණු අල්ලස් කොමිසම අකර්මණ්‍ය කරලා, ඒ තිබුණු FCID එක අකර්මණ්‍ය කරලා, දූෂණ මර්දන කම්ටු ලේකම් කාර්යාලය ජූනි 30වෙනිදා ඉඳලා අහෝසි කරලා, ඒ තිබුණු files ටික පොලිස්පතිට භාර දෙන්න කියා නියෝග කරලා, ඒ හොරුන්ට නිදැල්ලේ සැරිසරන්න ඉඩ දීලා තිබෙන්නේ මේ ආණ්ඩුවයි. පසු ගිය වසර දෙකහමාරක කාලය තුළ දූෂණ මර්දන කම්ටු කාර්යාලයට පැමිණිලි දහසකට වඩා ලැබී තිබුණා. ඔවුන් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණ කරලා, පැමිණිලි ගොනු කර, FCID එකට පැමිණිලි 288කට ආසන්න ප්‍රමාණයක් ලබා දී තිබෙනවා. එයින් පැමිණිලි 82ක් පූර්ණ විමර්ශනයට ලක් කර, නීතිපති දෙපාර්තමේන්තුවට භාර දුන්නා. නමුත් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ගත වුණු අවුරුදු දෙකහමාරක කාලය තුළ නඩු පවරා තිබෙන්නේ, පැමිණිලි 15ක් සම්බන්ධයෙන් විතරයි. එයින් නඩු ඇසීම ආරම්භ කර තිබෙන්නේ එක පැමිණිල්ලක් සම්බන්ධයෙන් විතරයි. එම නිසා නඩු ඇසීමේ ප්‍රමාදයක් තිබෙනවා. ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා කියනවා මට ඇසුණා, "විශේෂ අධිකරණයක් හෝ ඇති කරලා හොරු ඉක්මනට අල්ලන්න ඕනෑ; දඬුවම් කරන්න ඕනෑ" කියලා. කාටද කියන්නේ? ඔබතුමා ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී කියන්න; ඔබතුමා අමාත්‍ය මණ්ඩලයට කියන්න; ජනාධිපතිතුමාට, අගමැතිතුමාට කියන්න. අපි කියන්නේත් ඒක තමයි. අධිකරණ පද්ධතියේ තිබෙන අධිකරණ දෙකක් හෝ තුනක් වෙන් කරලා මේ හොරුන්ට දඬුවම් දීමේ ක්‍රියාවලිය ඉක්මන් කරන්න ඕනෑ. මොකද, මේ හොරු පිනුම් ගහන්න පටන්ගෙනයි තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි අපි කියන්නේ, පසු ගිය කළු දශකයේ රාජපක්ෂලා හොරකම් කරපු දේවල් මේ රටට හෙළිදරවු කළාට විතරක් මදි කියලායි. ඒ අයව අල්ලා නීතිය හමුවට ගෙනෙන්න ඕනෑ. නිකම්ම නිකම් Montessori teacher කෙනෙක් වෙලා සිටි ශිරන්ති නෝනා තමන්ගේ නැන්දාත් එක්ක පැරිසියේ මහා හෝටල්වලට ගිහිල්ලා, ලෝකයේ මිල අධිකම විස්කි පානය කළේ කොහොමද කියලා මේ රට දැන ගන්න ඕනෑ. එහි බිල කොහොමද කියලා විදේශ අමාත්‍යතුමා කිව්වා. එතැනට යන්න පුළුවන් වුණේ කොහොමද කියලා මේ රට දැනගන්න ඕනෑ.

නිකම්ම නිකම් හොර පාරෙන් නාවික හමුදාවට ගිය යෝෂිත රාජපක්ෂ දෙහිවල ඉඩම් අක්කර ගණන් මිලදී ගත්තේ කොහොමද කියා රට දැනගන්න ඕනෑ විතරක් නොවෙයි, ඒවාට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙන්නත් ඕනෑ. ඒවා අහගෙන යන කොට ඔන්න කියනවා, "ඩෙසි ආච්චිගෙන් සල්ලි හම්බ වුණා" කියලා. ඩෙසි ආච්චිගෙන් ප්‍රශ්න කරන කොට කියනවා, ඩෙසි ආච්චි නිදාගෙන ඉන්න කොට කවුදෝ ඇවිත් මැණික් මල්ලක් දුන්නා ලු. මේගොල්ලෝ සල්ලි හම්බ කළ විධිය ගැන ඇහුවොත් කියන්න වන්නේ ඔය වාගේ උත්තර -ඩෙසි ආච්චිගේ මැණික් මල්ල වාගේ කථා- තමයි. එහෙම රාජපක්ෂලාට කඩේ යන අය ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරන්න පටන්ගෙන තිබෙනවා. මතක නියාගන්න, තමුන්නාන්සේලා ජනතා විමුක්ති පෙරමුණට වංචා, දූෂණ චෝදනා ඔහොම නොවෙයි මොන ආකාරයට එල්ල කළත්, මේ රටේ ජනතාව ඒවා පිළිගන්නේ නැහැ. අප අමාත්‍යාංශවල මාස 14ක් ඉඳලා එළියට බැස්සාට පස්සේ, තමුන්නාන්සේලා එක එක විමර්ශන කම්ටු පත් කරලා බැලුවා, අපේ අවභාවිතාවක්, වංචාවක් තිබෙනවාද කියා. නමුත්, අපේ එක සත පහක වංචාවක් සොයාගන්න බැරි වුණා. අප නිවැරදි ආකාරයට ඒ මුදල් පරිහරණය කර තිබෙනවා; භාවිත කර තිබෙනවා. අප නිස්සම්භාරාම ප්‍රාදේශීය සභාවේ අවුරුදු 8ක් හිටියා. අප එම ප්‍රාදේශීය සභාවෙන් ගියාට පසුව ඔය එක එක පරීක්ෂණ කම්ටු පත් කරලා හොයා බැලුවා. නමුත්, අල්ලා ගත්තාද? අපේ එක වංචා දූෂණයක් සොයා ගන්න බැහැ.

දැන් කියනවා, ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ අරමුදල ගැන. ඔව්, අප මැතිවරණ කොමසාරිස්වරයාට අපේ වත්කම් නිවැරදිව එළිදරවු කර තිබෙනවා. පසු ගිය 2015 අවුරුද්දේ අපේ ගිණුමේ කෝටි 8ක් තිබෙන බව අප කිව්වා. අපේ සියලු මන්ත්‍රීවරුන්ගේ -පාර්ලිමේන්තුවේ සිට ප්‍රාදේශීය සභාව දක්වා-

වැටුප් ඒ ගිණුමට බැර වෙනවා. අප පාවිච්චි කරන වාහන යම් කාලයක් පාවිච්චි කළාට පසුව විකුණුවාම ඒ මුදල අප ගිණුමට බැර කර තිබෙනවා. අප ඒ සියලු කටයුතු පාරදෘශ්‍යව කර තිබෙනවා. හැබැයි, ජනාධිපතිවරණයක්, මහ මැතිවරණයක් කළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඔය කල්ලිය මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ වත්කම් ලේඛනය කීයද? ලක්ෂ 190යි -එක්කෝටි අනූලක්ෂයයි-. අපටත් කියන්නකෝ, එච්චර මුදලකින් ඡන්ද දෙකක් කළේ කොහොමද කියලා. ඒගොල්ලන්ට තමන්ගේ ආදායම් පෙන්වන්න බැහැ. ඇයි? කළු සල්ලි. කළු සල්ලි කොහොමද පෙන්වන්නේ? කළු සල්ලිවලින් දේශපාලනය, ඡන්දය කළ අය; ඒ සල්ලිවලින් පාර්ලිමේන්තුවට ආපු අය දැන් ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරන්න පටන් ගෙන තිබෙනවා. ඒ විතරක් නම් මදෑ! ඒ කාලය ඇතුළතදී ප්‍රාදේශීය සභා සභාපතිකම් දරාගෙන අයියලා, මල්ලිලා එකතු වෙලා බොරළු කැපූ හැටි මේ පාර්ලිමේන්තුව විතරක් නොවෙයි, මේ රටේ මාධ්‍ය හරහා ප්‍රසිද්ධ වුණා නේ. කෝ, ඒවාට උත්තර? බොරළු කපලා පවුල් පොහොසත් කළ අය, රාජපක්ෂලාගේ වලිගයේ එල්ලිලා පාර්ලිමේන්තුවට ආපු අය, දැන් අර කවුද කෙනෙක් අල්ලාගෙන ඉන්නේ; ගම්පහින් ආපු මන්ත්‍රීවරයා. මොකක්ද වැසිකිළි කථාවක් කියනවා. කොහොමත් ඔහුගේ වැසිකිළි කට ගැන මේ පාර්ලිමේන්තුවෙන් එපිට කථාවිය දන්නවා. අල්ල ගන්න පුළුවන් වුණේ එයාගේ වචන ටිකයි. මේ රටේ කවුරුවත් පිළිගන්නවාද? එයා කියපු දේවල් පිළිගන්නවා නම් ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, - කෝටි 40,000ක් ගණන් කරනවා ඇස් දෙකෙන් දැක්කා කිව්වා නේ. රාජපක්ෂලා හම්බ කළ සල්ලි කෝටි ගණනක් ගණන් කරනවා ඇස් දෙකින් දැක්කා කියූ කෙනා ඒ කියපු කට කැඩිච්ච කථාවක් අල්ලාගෙන මෙන්න ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරන්න හදනවා; චෝදනා එල්ල කරන්න හදනවා. තමුන්නාන්සේලා මතක තියාගන්න, ඔහොම නොවෙයි, ඔය රාජපක්ෂ පවුලේ ලොක්කෝ ඇවිත් කිව්වත්, මේ රටේ ජනතාව ජනතා විමුක්ති පෙරමුණේ ඒ ගුණය පිළිබඳව සැක කරන්නේ නැති බව.

මේ රටට නොයෙක් ආපදාවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ගංවතුර ආවා; නාය යෑම් ආවා; සුනාමි ආවා. ඒවායේදී අප කවුරුත් වැඩ කළා. හැබැයි, සුනාමියට ආපු මුදල් හොරකම් කළා කියා චෝදනා එල්ල වුණේ කාටද? "සුනාමි හොරා" කිව්වේ කාටද? සුනාමි මුදල්වලින් තමන්ගේ ගිණුමට කෝටි ගණන් දමාගත්තේ කවුද? ඒවාට එරෙහිව අධිකරණයේ නඩු ගොනු වුණේ කාටද? අපිටද? තමුන්නාන්සේලා කරේ තියාගෙන ඉන්න අප්පච්චිට නේ. ඔය අප්පච්චි සුනාමි සල්ලි හොරකම් කළා වාගේ, අප්පච්චිගේ පුතාලා ගියෙත් ඒ පාරේම තමයි. එහෙම අය මේ අල්ලස්, දූෂණ, වංචා ගැන කථා කරන කොට භූමිතෙල් ගෑවුණු ගැරඬි වාගේ දහලන එක ගැන අපට හිතාගන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ ඒ ගැන කථා කරන කොට තමුන්නාන්සේලාට වහ කදුරු වාගේ තමයි. ඇයි? අප ඇඟිල්ල දිගු කරන්නේ අපට ඇඟිල්ල දිගු කරන්න හයියක් ශක්තියක් තිබෙන නිසායි. අපි දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය වෙනුවෙන් කථා කරන්නේ; FCID එක වෙනුවෙන් කථා කරන්නේ; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මැතිනිය වෙනුවෙන් කථා කරන්නේ අපට ඒ වෙනුවෙන් කථා කරන්න ශුද්ධ වූ අයිතියක් තිබෙන නිසායි; කාටවත් අපට ඇඟිල්ල දිගු කරන්න බැරි නිසායි; පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ, ප්‍රාදේශීය සභාවේ ඇමතිකම් දරපු කාලයේ අප මුදල් වංචා කළා කියා කිසිවෙකුට අපට චෝදනා කරන්න බැරි නිසායි. එහෙම කරන්න පුළුවන්කම තිබුණා නම් අපත් කොළය වහලා ඉන්නවා. හැබැයි, අප කෙළින් කථා කරන්නේ මේ රටේ ජනතාවගේ බදු මුදල් ගැනයි. මේ හොරකම් ගැන හොයන්න ඕනෑ කියායි කියන්නේ. ඒ අයට දඬුවම් කරන්න කියා අප කියන්නේ එවැනි චෝදනා ජනතා විමුක්ති පෙරමුණට එල්ල කරන්න බැරි නිසායි.

අර වාගේ කට කැඩුණු කථා කියලා ජනතා විමුක්ති පෙරමුණට චෝදනා කරන්න දරන අදබාල උත්සාහය ගැන අපි කනගාටු වෙනවා. ඊට කලින් තමන්ගේ දේශපාලනය පිරිසිදු කරගෙන එන්න. මේවාට වග කියන්න ඕනෑ මේ පැත්තේ ඉන්න මේ අය නොවෙයි, මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලායි. හොරුන්ට මේ වාගේ නිදැල්ලේ සැරිසරන්න ඉඩදීලා තිබෙන්නේ තමුන්නාන්සේලායි. නීතිය ක්‍රියාත්මක නොකරන නිසා සහ අධිකරණයට ඉදිරිපත් කරලා මේ හොරු හිරගෙට යවන්නේ නැති නිසයි එහෙම වෙලා තිබෙන්නේ. ඒ හොරකම් කරපු සල්ලි වියදම් කරලා දැන් රාජ්‍ය අංශයේ සමහර අය මිලදීගෙන, හොරකම් යටපත් කරගෙන "කෝ, හොරු ඇල්ලුවාද?" කියලා අහනවා. කාටද මේ "කෝවොක්" කරන්නේ? මතක තියාගන්න, කෝවොක් කරන්නේ මේ කැබිනට් මණ්ඩලයට නොවෙයි, මේ ඇමති මණ්ඩලයට නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ මේ කණ්ඩායමට නොවෙයි. තමන්ගේ රැකියාව, තමන්ගේ දූ දරුවන්, තමන්ගේ ජීවිතය අනතුරේ හෙළාගෙන, ඒ පිළිබඳව තකන්නේ නැතුව රාජපක්ෂ මහත්මයා පරාජය කරන්න ඡන්දය දීපු සහ ඡන්දය හදපු මේ රටේ ලක්ෂ 62ක් වන ජනතාවටයි මේ "කෝවොක්" කරන්නේ. අපේ වගකීම තමයි ඒ අය ආරක්ෂා කරන එක, ඒ ජනවරම ආරක්ෂා කරන එක. ඒ ජනතාව අතිවිශාල කැප කිරීමක් කළා. ජනතාවට කරන්න පුළුවන් ඒ දේ තමයි. අපි 2012, 2013, 2014 කාලයේ වේදිකාවක් ගානේ ගිහිල්ලා රාජපක්ෂලාගේ වංචා ගැන කිව්වා. ජනතාව ඒවා පිළිගත්තා. ජනතාවට කරන්න පුළුවන් දේ තමයි මැතිවරණයේදී තමන්ගේ කතිරයේ බලයෙන් ඒ අය ගෙදර යවන එක. ජනතාව ඒ වැඩේ කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඊට පස්සේ නව ආණ්ඩුවක් හැදුවා. ඒ ආණ්ඩුවෙන් ඒ වැඩේ කළේ නැහැ නේ. ඒක නිසා නේ ජනාධිපතිතුමාට කියන්න සිද්ධ වුණේ, පොලිස් දෙපාර්තමේන්තුවයි, නීතිපති දෙපාර්තමේන්තුවයි තමන් යටතට පවරාගන්න සූදානම් කියලා. ඒ, ඒ ආයතන දෙකේ වැඩ කෙරෙන්නේ නැති නිසා. මේ රාජපක්ෂලා ආරක්ෂා කරන්න තමුන්නාන්සේලාගේ පැත්තේ ඉන්න රාජපක්ෂ කෙනෙක් කටයුතු කරන නිසා, මේ රාජපක්ෂලා ආරක්ෂා කරන්න ඒ රාජපක්ෂ මහත්මයාගේ නෝනාගේ ඥාතියෙක් මේ පැත්තේ ඉඳලා කටයුතු කළ නිසා, පොලිසිය මෙහෙයවලා, නීතිපති දෙපාර්තමේන්තුව මෙහෙයවලා, එහෙමනේ මේ වගේ deals සිද්ධ වෙන්නේ. එහෙම deals දමාගත්තු අය, එහෙම deals දමාගෙන දේශපාලනය කරන අය අපට ඇඟිල්ල දිගු කරන්න එනවා. ඕවාට මහන්සි වෙන්න එන්න එපා මහත්තයෝ. තමුන්නාන්සේලාට වෙන වෙන දේශපාලන ප්‍රතිපත්ති මත ජනතා විමුක්ති පෙරමුණ එක්ක විවිධ ගැටුම් හදාගන්න පුළුවන්. හැබැයි, වංචා දූෂණ පිළිබඳව නම් ජනතා විමුක්ති පෙරමුණට ඇඟිල්ල දිගු කරලා දේශපාලනය කරන්න උත්සාහ කරන්න එපා කියමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු සන්දිත් සමරසිංහ මහතා.

උමා ඔය වැනි ව්‍යාපෘතීන් නිසා ඇති වී තිබෙන පාරිසරික අර්බුද තුළින් දේශපාලන වාසි ලබා ගැනීම
உமா ஓயா போன்ற கருத்திட்டங்களினால் ஏற்பட்டுள்ள சுற்றாடல் பிரச்சினைகளினூடாக அரசியல் இலாபமீட்டல்
GAINING POLITICAL ADVANTAGE THROUGH ENVIRONMENTAL HAZARDS CAUSED BY PROJECTS SUCH AS UMA OYA

[අ.භා. 6.21]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"විෂය කරුණු පිළිබඳ නිසි දැනුමකින් යුත් විශේෂඥයින්ගෙන් හා නිසි ආයතනවලින් උපදෙස් ලබා නොගෙන ඉංජිනේරුවන් විසින් දෙන ලද උපදෙස් නොතකා හරිමින් අත්තනෝමතික ලෙස ඉදිකිරීම් ආරම්භ කරන ලද උමා ඔය ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතීන්ගෙන් බලුල්ල දිස්ත්‍රික්කය ඇතුළු ප්‍රදේශ කිහිපයක ඇතිවී තිබෙන දැවැන්ත පාරිසරික ප්‍රශ්න හා උල්පත් සිඳීයෑම හේතුකොට ගෙන නිර්මාණය වී තිබෙන සමාජ අසහනයන් තව තවත් වර්ධනය කර එමඟින් දේශපාලන වාසි ලබා ගැනීමේ කුමන්ත්‍රණයක නිරතව සිටින බැවින් එකී කරුණු සම්බන්ධයෙන් මෙම පාර්ලිමේන්තුව මඟින් පරීක්ෂා කරබැලීමට කටයුතු කළ යුතුව ඇතැයි යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේ තවත් ඒවා තිබෙනවා. විශේෂයෙන්ම SAITM ආයතනය, ඒ වාගේම මීතොටමුල්ල කුණු කන්ද වගේ ස්ථාන. ඒවා පසු ගිය රජය කාලයේ සිදු කළ ඒවා. නමුත්, වර්තමාන ආණ්ඩුවට තමයි ඒ සෑම දේම බැරවෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම උමා ඔය ව්‍යාපෘතිය දිහා බැලුවාම, එදා නිවැරදි ක්‍රමවේදයන් භාවිත නොකළ නිසා පරිසරයට හානියක් සිදුවෙලා තිබෙන බව අපි දන්නවා. ඒවා අවම කරන්න කටයුතු කළේ නැහැ. හැබැයි, මුදල් හොයන්න තමයි එදා වැඩ කළේ. ඒ වාගේම SAITM ආයතනය ගත්තාම, එදා හිටපු නායකයින් මොනවාද කළේ? ඒ නායකයින් කළේ, ඒවාට අනුබල දීලා, අවශ්‍ය කටයුතු කරගෙන එම ආයතනය පටන් අරගෙන ඉදිරියට ගෙනයන්න රුපියල් මිලියන 600ක් පමණ ලබාදීමයි. අද මොනවාද වෙලා තිබෙන්නේ? ඒ සඳහා අද චෝදනා එල්ල වී තිබෙන්නේත් වර්තමාන ආණ්ඩුවටයි.

මීතොටමුල්ල කුණු කන්ද දිහා බලනකොටත් එහෙමයි. එදා පැවැති ආණ්ඩුවේ හිටපු ලේකම්වරයෙක් කරපු ක්‍රියාවලියන් නිසා මෙවැනි බෙදවාචකයන් ඇති වුණා. එම නිසායි අපි මේ යෝජනාව ගෙනාවේ. මොකද, පසු ගිය කාලයේත්, වර්තමානයේත් අපේ ආණ්ඩුවට සෑම විටම පහර දෙනවා අපි දැක්කා. මේ ආයතනය හරහා පන්න පන්නා පහර දෙනවා, එක එක්කෙනාගේ දේශපාලන ගමන් යන්න. එම නිසා මේ දේ මහජනතාව දැන ගත යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මෙම කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල්තැබීමේ යෝජනාව ස්ථිර කිරීම, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.24]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සභාව කල්තැබීම සඳහා ඉදිරිපත් කළ කාලෝචිත යෝජනාව ස්ථිර කරමින් කථා කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද මාතෘකාව වී තිබෙන්නේ, පසු ගිය අවුරුදු ගණනාවක් තුළ මේ රටේ ඉතිරි කරලා ගිය කුණු ගැන කථා කිරීමයි. 2015 ජනවාරි 08 වෙනිදා අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වෙනකොටත්, 2015 අගෝස්තු මාසයේදී අපේ මෙම අලුත් ආණ්ඩුව හදනකොටත් අපට තිබුණු ප්‍රධානම ප්‍රශ්නවලින් එකක් වුණේ ණය කන්දයි. මේ ණය කන්ද වාගේම, මේ රටේ විවිධ තැන්වල කුණු කඳු ඉතිරි කරලා තිබුණා. ඒ වාගේම නිසියාකාර ප්‍රමිතියකින් තොරව තිබුණු නොයෙකුත් දේවල් නිසා, අපට ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න වෙලා තිබුණා. අද SAITM ප්‍රශ්නය තවත් එක් පැතිකඩක්. මෙවැනි ප්‍රශ්න සියල්ලම පසු ගිය කාලයේ පැවැති රාජපක්ෂ ආණ්ඩුව විසින් අප වෙත පටවන ලද දේවල්. අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වෙලා දැනට අවුරුදු දෙකහමාරක් වෙනවා. ඒ වාගේම අගෝස්තු වෙනකොට අලුත් ආණ්ඩුව පිහිටුවලා අවුරුදු දෙකක් ගත වෙනවා. අවුරුදු දෙකක කාලයක් ගතවෙලාත් මේ තිබෙන ප්‍රශ්න කන්දරාව විසඳා ගෙන ඉදිරියට යාමේ වැඩ පිළිවෙළ දියත් කිරීමට තවමත් අපට සිදු වෙලා තිබෙනවා.

අද වන විට ප්‍රධානම ප්‍රශ්න තුනක් තිබෙනවා. එයින්, මීතොටමුල්ලේ කුණු කන්ද නිසා ඇතිවී තිබෙන ප්‍රශ්නය අපි පැහැදිලිවම දන්නා කාරණයක්. කුණු කන්ද හා ආශ්‍රිතව තිබෙන ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳන්න අවුරුදු දෙකක කාලයක් ගත වෙනවා. මොකද, ඒ යන්ත්‍රෝපකරණ අලුතෙන් නිෂ්පාදනය කරලායි විසඳුමකට යන්න ඕනෑ. පසු ගිය කාලයේ -අවුරුදු 5කට කලින්- මේ ප්‍රශ්නයට විසඳුම් හොයලා තිබුණා නම්, අද මෙවැනි ප්‍රශ්නයක් මේ රටේ ජනතාවට ඇති වෙන්නේ නැහැ. කුණු අර්බුදය නිසා තවත් ප්‍රශ්නයක් ඇති වුණා. ඒ තමයි ඩෙංගු ප්‍රශ්නය. මේ ප්‍රශ්නවලට නිසියාකාරව කළමනාකාරිත්වයක් තිබුණේ නැති නිසා තමයි මෙවැනි ප්‍රශ්න රාශියක් පැන නැඟුණේ. ආණ්ඩුවක් හැටියට අපට මේ ප්‍රශ්නවලින් පලා යන්න බැහැ. මේ ප්‍රශ්න පැත්තකින් තියලා අපේ අලුත් ගමන යන්න බැහැ. මේ ප්‍රශ්න විසඳලා ඒවා ජයග්‍රහණය කරගෙන ඉදිරියට යන්න ඕනෑ. එම නිසා යහ පාලන ආණ්ඩුවේ එක්සත් ජාතික පක්ෂයේ සියලුම මැති-ඇමතිවරු

වාගේම, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මැති-ඇමතිවරු ඉන්නවා. ගරු මහින්ද අමරවීර මැතිතුමා ඉන්නවා. අපි සියලු දෙනාම එකතු වෙලා ඉදිරියට යන මේ ගමන කිසිම කෙනෙකුට සොලවන්න බැහැ. 2020 වසර වනතෙක් අනිවාර්යයෙන්ම මෙම යහ පාලන ආණ්ඩුව තමයි ඉදිරියට යන්නේ. ඒ ගමන අපි දිගටම යනවා. පසු ගිය කාලයේ කුණු ඉතිරි කරලා ගිය කල්ලි තවමත් විවිධ දේවල් කියනවා; ජාතිවාදය පතුරුවනවා; වෙනත් විකල්ප, විවිධ වාද පතුරුවනවා. මෙවැනි සියලුම දේවල් කරමින් ඔවුන් සැරසෙන්නේ මේ රටේ දිනා ගත්ත ප්‍රජාතන්ත්‍රවාදය, මානව නිදහස පැත්තකට දාලා නැවත ඔවුන් බලයට ඒම සඳහායි. එක පැත්තකින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, ඊළඟට අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය එකතු කරගෙන කටයුතු කරන්නේ ඒකටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කථා කරන උමා ඔය ප්‍රශ්නයත් ඒ වාගේමයි. අතිගරු ජනාධිපතිතුමා උමා ඔය ප්‍රශ්නය විසඳීම සඳහා ගරු මහින්ද අමරවීර රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය කමිටුවක් පත් කර තිබෙනවා. අමාත්‍ය කමිටුවේදී මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට නිලධාරීන්ගේ පැත්තෙන් මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ඉංජිනේරු නිහාල් රූපසිංහ මහත්තයා නායකත්වය අරගෙන තිබෙනවා. අපි දන්නවා, නිහාල් රූපසිංහ මහත්තයා කීර්තිමත් ඉංජිනේරුවෙක් කියලා. එතුමා CECB ආයතයේ හිටපු සභාපතිවරයා. එතුමා මේ ගැන හොඳ දැනුම් තේරුම් තිබෙන කෙනෙක් බව අපි දන්නවා. එතුමාගේ දැනුමත් එක්ක මේක විසඳා ගන්න පුළුවන්. උමා ඔය ප්‍රශ්නය ගත්තොත්, සම්පූර්ණයෙන්ම ඒ කොන්ත්‍රාත්කරුවා විසින් consultancy, management එක වැනි මේ සියලුම දේවල් EPC Contract එකක් විධියට තමයි භාර දීලා තිබුණේ. සත්‍ය වශයෙන්ම, ඇමෙරිකානු ඩොලර් මිලියන 375ක විතර මුදලකටයි මෙය ඇස්තමේන්තු කරලා තිබුණේ. නමුත්, පසු ගිය කාලයේ මෙය ඇමෙරිකානු ඩොලර් මිලියන 525ක විතර මුදලකට අත දිගැරලා දුන්නා. උමඔක් හාරලා මේ ආකාරයට වතුර ගෙන යනකොට විවිධ පාරිසරික ප්‍රශ්න ඇති වෙනවා කියලා අපි දන්නවා. ඒ වාගේම risks තිබෙනවා. මේ risks ඔක්කෝම එකතු කරලා තමයි ඇමෙරිකානු ඩොලර් මිලියන 525ක් ඒ ආයතනයට දුන්නේ. නමුත්, ඒ ගොල්ලෝ ඒ risk එක ගත්තේ නැහැ. ඒ ගොල්ලෝ බොහොම පහසු දේවල් තමයි කළේ. උදාහරණයක් වශයෙන් ගත්තාම, බොහොම අඩුවෙන් තමයි investigations කළේ. මේ ආයතනය -ඉරානයේ EPC Contractor - ජර්මනියෙන් subcontractor කෙනෙක් ගෙනැල්ලා තිබුණා. නමුත්, ඒ ගොල්ලන්ට වැඩියෙන් ලාභ ලබා ගන්න අවශ්‍ය නිසා ඒ subcontractor ආපසු යැව්වා. ඒ වාගේම, Sri Jayewardenepura University එකෙන් තමයි පරිසර අධ්‍යයන වාර්තාව -EIA එක- අරගෙන තිබුණේ. මෙවැනි project එකකට ඉංජිනේරු වාර්තාවක් ගන්න ඕනෑ මොරටුව විශ්වවිද්‍යාලයෙන්, එහෙම නැත්නම් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන්. ඒක තමයි පිළිගත් සම්මතය වන්නේ. එහෙම නම්, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙන් හෝ සෞන්දර්ය විශ්වවිද්‍යාලයෙන් ගන්න තිබුණා. එවැනි වැඩසටහනක් තමයි පසු ගිය කාලයේ කරලා තිබුණේ. ඒ නිසා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් එම වාර්තාව ගත්තේ ඇයි කියා සොයා බලන ලෙස අපි ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දැනගත්ත ආකාරයට මේ සම්බන්ධයෙන් එවකට වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්, අයිවන් සිල්වා මහත්මයා මේ කාර්යයේ සම්පූර්ණ වගකීම දරන්න ඕනෑ. මොකද, මේ project එක implement කරන කොට, මේ project එකේ employer හැටියට ශ්‍රී ලංකා රජය පැත්තෙන් management එකට engineersලා කිසිවෙකු ඉදිරිපත් කරන්න එතුමා පැහැදිලිවම ඉඩ දුන්නේ නැහැ. අපට දැනගන්න තිබෙන විධියට, CECB එක ඒක දමන්න කියන යෝජනාවටවත් එතුමා ඉඩ දුන්නේ නැහැ. එහෙම ඉඩ නොදීම තුළ engineering consultancy part එක හරියට කරන්න බැරි වුණා. කෙසේ හෝ වේවා, මේ සිදු වුණු වැරැද්දට විසඳුම් සෙවිය යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තව කිලෝමීටර 05ක දුරක් පමණයි යන්නට තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, කිලෝමීටර 05 යනකොට පනන්ගල වැව හම්බ වෙනවා. පනන්ගල වැව ළඟදී තමයි ඉතාමත් බරපතළ ප්‍රශ්නය ඇති වෙන්නේ. ඒ ගැන ඔබතුමාත් දැනුවත් ඇති. නමුත්, මේ machine එක මීටර් 150ක් පමණ දිගවීමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. මේ ව්‍යාපෘතිය අපි පටන් අරගෙන දැන් සෑහෙන දුරකට ගිහිල්ලා තිබෙනවා. මේ ආණ්ඩුව එන කොට සියයට 50ක විතර කොටසක් ඉවර වෙලායි තිබුණේ. මේ project එක මෙතැනින් නවත්වා, මීටර් 150ක් දිග machine එක ආපහු ගත්තා කියලා මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මේ ව්‍යාපෘතියේ ඉදිරියටම ගිහිල්ලා, -මේකේ එළියට ගිහිල්ලා- තමයි මේ ප්‍රශ්නය විසඳා ගන්න වෙන්නේ.

මේ වන විට තත්පරයට ලීටර් 1,200ක විතර වතුර ප්‍රවාහයක් එනවා. කොහොමද එය නවත්වා ගන්නේ? මේවාට විශේෂ ක්‍රම තිබෙනවා; special grout machines තිබෙනවා. ඒ groutsවලට අදාළ materials තිබෙනවා. මේ දේවල් දැනට ජර්මනිය වැනි යුරෝපා රටවලින් අරගෙන මේ කාර්යය අපට කර ගන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට පත් කර තිබුණු Project Director සුනිල් සිල්වා මහත්මයාත් එක පැත්තකින් මේ ප්‍රශ්නයට වග කියන්න ඕනෑ. Project Director හැටියට එතුමා මේ කාරණය කළමනාකරණය කළේ නැහැ; මෙය වළක්වා ගන්න තිබුණු දේවල් කළේ නැහැ. සාමාන්‍ය සම්ප්‍රදාය අනුව මෙවැනි වැඩක් කරනකොට; උමඔක් හාරනකොට අංශක 360ක් වටේටම, ආරම්භ කරන තැන ඉඳලා මීටර් 20ක් හැම තැනම වතුර තිබෙනවාද කියලා check කරන්න ඕනෑ. නමුත් ගරු ඇමතිතුමනි, එහෙම වතුර තිබෙනවාද කියලා check කරන්න ක්‍රමවේදයක් මේ machine එකේ නැහැ. එවැනි දෙයක් ගැන පරීක්ෂණ කරන්න අවශ්‍ය විශේෂඥ දැනුම තිබෙන consultant කෙනෙක් මේ project එකේ ඉන්න තිබුණා. නමුත්, ඒ සියල්ලම කරන්න බැරි වුණා. Project Director හැටියට සුනිල් සිල්වා මහත්මයලා ඒ වගකීම පැහැර හැරියා. ඒ ආකාරයට වගකීම පැහැර හැරියාට පස්සේ එයින් ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ ජනතාවයි බලපෑමට ලක් වුණේ.

ඇමෙරිකානු ඩොලර් මිලියන 525ක් ඒ ව්‍යාපෘතිය කරන සමාගමට දුන්නේ, ඉහත කී ප්‍රශ්නවලට පිළියම් යොදන්නත් එක්කයි. උදාහරණයක් කියනවා නම්, යම් ගමකට වතුර නැති වනවා නම්, ඉක්මනින්ම වතුර බවුසර් ගෙනැල්ලා ඒ ගමට වතුර සැපයීමට මුදල් ඒ සමාගමට දුන් මුදල තුළ තිබෙනවා. නමුත් ඒ අය මොකක්ද කළේ? වැඩියෙන් ලාභ ගන්න ඕනෑ නිසා ඒ කිසිම දෙයක් සැලසුම් කළේ නැහැ. ඒ අය plan කර කර සිටියා; estimate එක කොච්චර වනවාද කියා ගණන් හදා හදා සිටියා. එහෙම දෙයක් කරන්න අවශ්‍ය නැහැ. EPC Contractor කෙනෙකු නම් කළ යුත්තේ, ඉක්මනින් ගණන බලා, "මෙන්න මේ ගණන වහාම ගෙවන්න" කියා, අර කියපු ඇමෙරිකානු ඩොලර් මිලියන 525න් අඩු කර ගන්නා ක්‍රමයක් හදන එක නේ. නමුත් එහෙම ක්‍රමවේදයකට ගියේ නැහැ. එතුමන්ලා කළේ, එතුමන්ලාගේ ගණන් බලමින් සිටීමයි; බොහොම හෙමින් ඒ වැඩේ කරගෙන යෑමයි. මේවා, මින් ඉදිරියටවත් විශේෂ ව්‍යාපෘති කරන කොට මේ රටේ සිදු නොවිය යුතු දේවල්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලාට පුළුවන් දැන් මේ ගැටලුකාරී තත්ත්වයන් නවත්වන්න. අපි දන්නවා, නිහාල් රූපසිංහ මහත්මයා ආදී අය ඉතිහාසයේ, මහවැලියේ සිටි කාලයේ ඉඳලාම, මේ වාගේ දේවල් කරපු අය

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

බව. එහෙම නම් එදා එතුමන්ලාගේ CECB ආදි ආයතනවල උපදෙස් ගන්න තිබුණා. නමුත් එසේ උපදේශ ලබා ගත්තේ නැති වැරැද්ද නිසා තමයි දැන් මේ රටට මෙවැනි ගැටලුවලට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ. ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන පන්සිය විසිපහෙන් කොමිස් ගියේ කාටද, ඒ කොච්චර ප්‍රමාණයකින්ද කියන ප්‍රශ්නවලට උත්තර අපි දන්නේ නැහැ. අපි දැක්කා, ඒ ගිවිසුම් අත්සන් කරන කොට පැවැති තත්ත්වය. ජනාධිපතිවරුන් දෙදෙනෙක් මේ project එක ගැන හරියාකාරව දන්නේවත් නැතිව තමයි, EIA ආදි කිසිවක් අවසාන වන්නේත් නැතිව තමයි ඒ project එකට sign කළේ. Blind project එකකට sign කරලා තමයි අද අප මේ තත්ත්වයට පත් වෙලා ඉන්නේ. ඒ නිසා මේ වැරැද්ද හදාගෙන එම ව්‍යාපෘතිය යටතේ අවසන් කළ යුතු ඉතිරි කිලෝමීටර් 5ක 6ක ප්‍රමාණයේ කටයුතු හරියාකාරව අවසන් කරන්න ඕනෑ. සිවිලිමේ වතුර leak වන තැන්වලට පිළියම් යොදන්න ඕනෑ. එක් පැත්තකින් සන අඩි 300ක විතර ප්‍රමාණයකින් ජල කාන්දුවක් වනවා නම්, සන අඩි 600ක විතර pressure එකක් අනෙක් පැත්තට දීලා, ඒ අවශ්‍ය leaks ටික හදාගන්නා ක්‍රමවේද මේ ලෝකයේ තිබෙන බව අපි consultantsලාගෙන් අසා තිබෙනවා. එවැනි ක්‍රමවේද හරියාකාරව අනුගමනය කරලා මේ ප්‍රශ්නය විසඳිය යුතුයි. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න අපේ අමාත්‍ය කමිටුවට හැකියාවක් ලැබේවි කියා මම හිතනවා. නිහාල් රූපසිංහ මහත්මයා ආදි ඉංජිනේරුවරුන්ගේත් උපදෙස් අරගෙන ඒ කටයුත්ත හරියාකාරව කළොත්, සෞන්දර්යය විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය ආදියෙන් උපදෙස් ගන්නේ නැතිව ඉංජිනේරු දැනුම හරියාකාරව තිබෙන විශ්වවිද්‍යාලවලින් උපදෙස් අරගෙන කටයුතු කළොත් මේ ප්‍රශ්නය විසඳාගන්න අපට පුළුවන්. එයට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 6.36]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා මේ වෙලාවේ රටේ මහත් ආන්දෝලනයකට තුඩු දී තිබෙන උමාඔය ව්‍යාපෘතිය ආශ්‍රය කරගෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඇත්තටම, උමාඔය ව්‍යාපෘතිය පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු වන්නත්, ජනාධිපතිවරයාගේ අවධානය යොමු වන්නත්, මේ පාර්ලිමේන්තුවේ සභ රටේම අවධානය යොමු වන්නත් බලපෑවේ මෑතකදී එම ප්‍රදේශවල ජනතාව දහදහස් ගණනක් බණ්ඩාරවෙල නගරයට එකතු වෙලා කරපු දැවැන්ත හර්තාලයයි. නමුත් උමාඔය විනාශය පිළිබඳව ඒ ප්‍රදේශයේ ජනතා නායකයන්, ආගමික නායකයන් කරුණු දක්වන්න පටන් ගත්තේ ගිය සතියේ නොවෙයි; ගිය මාසයේ නොවෙයි; මේ අවුරුද්දේ නොවෙයි. 2007 වර්ෂයේ මේ ව්‍යාපෘතිය යෝජනා වූ තැන් සිට විශේෂයෙන් එවකට පාර්ලිමේන්තු මන්ත්‍රීව සිටි සමන්ත විද්‍යාරත්න සහෝදරයා මූලික කරගෙන, ඒ ප්‍රදේශයේ පන්සල්වල නායක හාමුදුරුවන් වහන්සේලා ප්‍රමුඛස්ථානයේ තබාගෙන "උමා ඔය සුරැකීමේ ජනතා ව්‍යාපාරය" නමින් හදාගත් ව්‍යාපාරයක් තිබුණා. ඒ ව්‍යාපාරය මහින් ඒ අයගේ මතය නොවෙයි ඉදිරිපත් කළේ. ඒ අය පරිසරවේදීන් ගෙන්වා, භූ විද්‍යාඥයන් ගෙන්වා -විශේෂයෙන් මහාචාර්ය ජීනදාස කටුපොත මහතා ආදි විද්වතුන්, නැසී ගිය පරිසරවේදී පියල් පරාක්‍රම මහතා, පරිසරවේදී සජීව වාමීකර මහතා, පරිසරවේදී තිලක් කාරියවසම් මහතා ආදි අය ගෙන්වා- එදා ඉඳලාම මේ අනතුර පෙන්වා දුන්නා. ආණ්ඩුව ඒ කිසිවක් තඹ දොයිතුවකට හෝ මායිම් කරන්නේ නැතිව උමඟ හාරාගෙන ගියා. ජනතාවටත් මේ විනාශය තමන්ගේ දෙපතුල ළඟට එන කල් දැනුණේ නැහැ. සමන්ත විද්‍යාරත්න සහෝදරයා ඇතුළු ඒ කණ්ඩායම විටින් විට ජනතාව දැනුවත් කිරීම් කළත්, ජනතාවත් තමන්ගේ ගේ දොර ඉරි තළා යන කල්, තමන්ට බොන්න වතුර ටික නැති වන කල් මේ විනාශය පිළිබඳව එතරම් තැකීමක් කළේ නැහැ. නමුත් උමඟ මීටරයෙන් මීටරය හාරාගෙන යන කොට, එක් එක් ග්‍රාම නිලධාරී වසමෙන් වසමට ගෙවල් ඉරි තළා යන කොට, දිය උල්පත්, ඇළ දොළ, ළිං හිඳී යන කොට ජනතාවට මෙය දැනෙන්න පටන් ගත්තා.

ගෙවල් 7,000ක් ඉරිතලා තිබෙනවා, වෙහෙර විහාර නටබුන් වුණා, පාසල් ගොඩනැඟිලි දරුවන්ට ඉන්න බැරි තත්ත්වයට පත් වුණා, උල්පත් 3,000කට වඩා හිඳිලා ගියා. එහෙම වුණාට පස්සේ තමන්ගේ ජීවිත කාලය පුරා පිරිසිදු ජලය පානය කළ මධ්‍ය කඳුකරයේ නැහෙනහිර බෑවුමේ මිනිසුන්ට වතුර ටික නැති වෙන කොට තමන්ට ඇති වන පීඩනය නිසා ඒ ජනතාවගේ ආවේගය, කෝපය බුර බුරා නැහෙන එක සාධාරණයි.

මේ පිළිබඳව මේ ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡා කළේ අද ඊයේ නොවෙයි. වර්තමාන ජනාධිපතිවරයා පත් වුණාට පස්සේත් උමා ඔය බහු විනාශකාරී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උමා ඔය නිමිනය බේරා ගැනීමේ ජනතා ව්‍යාපාරය විසින් 2015 මාර්තු 20වැනිදා පරිසර අමාත්‍යාංශයේදී සාකච්ඡා කළා. එදාත් ඇමති අනු කමිටුවක් දැම්මා. රවි කරුණානායක ඇමතිවරයා එහි සභාපති ධුරය දැරුවා. ඒ කාලයේ ඌව පළාත නියෝජනය කළ මැති ඇමතිවරු එහි කොටස්කාරයෝ බවට පත් වුණා. විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා, රංජිත් මද්දුමබණ්ඩාර ඇමතිතුමා, ඒ කාලයේ ඌව පළාත් සභාවේ මහ ඇමති වෙලා හිටපු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා, චම්පික රණවක ඇමතිතුමා යන අය එහි කොටස්කාරයෝ බවට පත් වුණා. මාස 3ක් ව්‍යාපෘතිය නතර කළා. ඊට පසුව නැවතත් ඒ ව්‍යාපෘතිය ඉස්සරහට ගෙන ගියා. පරිසර අධ්‍යයන වාර්තා පදනම් කර ගෙන මෙවැනි විනාශකාරී ව්‍යාපෘති නතර කරනවාය කියලා තමුන්නාන්සේලා ජනාධිපතිවරණයේදී පොරොන්දු වුණාට, පසු ගිය ආණ්ඩුව කළ හැම ව්‍යාපෘතියක්ම ඉස්සරහට ගෙන ගියා. එහි ප්‍රතිඵල අද ජනතාව භුක්ති විඳිනවා. ඒ නිසා දැන් වුවමනා කරන්නේ මොකක්ද? දැන් වුවමනා කරන්නේ පෙර වැරැදි නොකර ඉන්නයි. ඇත්තටම දේශපාලනඥයන්ට, ආණ්ඩුවලට තීන්දු ගන්න පුළුවන්, "වැල්ලවාය, තණමල්විල, මොණරාගල ජනතාවට පානීය ජලය නැහැ, ඒ වෙනුවෙන් ජල ව්‍යාපෘතියක් හදමු" කියලා. හැබැයි, උමඟ කපන්න ඕනෑ කොහොමද, උමඟේ දිග කොයි තරම්ද, අපි උමඟ හදන කඳු වළල්ල ස්ථාවරයිද වැනි මේවා පිළිබඳව දේශපාලනඥයන්ට තීන්දු ගන්න බැහැ. ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, තමුන්නාන්සේත් ඇමති අනු කමිටුවට පත් කරලා ඉන්නවා නේ. තමුන්නාන්සේ ඒ ප්‍රදේශයට ගිය එක හොඳයි; නිරීක්ෂණය කරන්න පුළුවන්. නමුත් මේ සම්බන්ධයෙන් තීන්දුව ගත යුත්තේ තවත් ඇමති කණ්ඩායමක්, නැත්නම් දේශපාලනඥයන් කණ්ඩායමක් විසින් නොවෙයි. මෙය විද්වතුන්ගේ කාර්ය භාරයක්; පරිසරවේදීන්ගේ, භූ විද්‍යාඥයන්ගේ කාර්ය භාරයක්. ඒ ප්‍රදේශයේ උල්පත් හිඳිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නේ නැහැ, භූ අභ්‍යන්තරයට වෙලා තිබෙන හානිය මොකක්ද කියලා. මහින්ද අමරවීර ඇමතිතුමා ගියාට ඒක බලන්න බැහැ. එකක්, එතුමන්ලා ගිය එක හොඳයි, අඩු ගණනේ ඒ ජනතාවට ක්ෂණික පහසුකම්

ලබා දීම සඳහා යම් කිසි වෙගවත් වැඩ පිළිවෙළක් ඇති කරන්න. නමුත් එතැනින් එහාට යන, මේ පරිසරය, මේ බිම ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළක් ඕනෑ. රට මැද බෙනයක් හාරලා, නිකම් තියන්න බැහැ.

ඒ විතරක් නොවෙයි, මුල සිටම, මෙවැනි විනාශකාරී ව්‍යාපෘතියකින් අපේ පරිසරය, මේ භූමිය විනාශ කළ, ඒකට උඩගෙඩි දුන්න - ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒකට අදාළ වන්නේ ඒ අයද කියලා මම දන්නේ නැහැ. - තීන්දු ගත්ත දේශපාලනඥයන්ගේ ඉඳලා හැම දෙනාටම දඬුවම් පමුණුවන්න ඕනෑ, රටට මේ වාගේ විපත්තිදායක දේවලට අනාගතයේදී දායක වෙන්න හිතා ගෙන ඉන්න අයටත් උණ ගැනෙන ආකාරයට. එහෙම නැත්නම් මෙවැනි දේවලින් රට ආරක්ෂා කරන්න හම්බ වෙන්නේ නැහැ. දැන්වත් අපේ රටේ හෝ, ඕනෑ නම් ජාත්‍යන්තරයේ හෝ විද්වතුන්ගෙන් උපදෙස් ලබා ගෙන මේ හානිය අවම කරන්න - දැනටමත් හානිවෙලායි තිබෙන්නේ.- කටයුතු කරමුය කියන යෝජනාව මා කරනවා. ඒ වාගේම මේක ඇතුළට විවිධ දේශපාලන ගැටුම් දමලා ජනතාව භේද භින්න කරන්න එපාය කියන එකත් කියමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.43]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උමා ඔය බහුකාර්ය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. 1989දී ජර්මනියේ Lahmeyer International Company එකේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව, 1989 මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව, 1991 මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව, 2002 කැනේඩියානු SNC Lavalin Inc. ආයතනයේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව, 2004 වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව කියන මේ සියලුම වාර්තා දීලා නවත්වලා තිබුණු මේ ව්‍යාපෘතිය Mahab Ghodss Consulting Engineering Company එක විසින් ඉදිරිපත් කරන ලද ශක්‍යතා අධ්‍යයනය වාර්තාවට අනුව 2008 මැයි 24වැනි දා නැවත පටන් ගන්නවා.

මේකේ හාස්‍යජනකම දේ තමයි, මේ Mahab Ghodss කියන සමාගමේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව පෙර වාර්තා පදනම් කර ගෙන ඉදිරිපත් කිරීම. පෙර වාර්තා එපා කියලා කියනවා. නමුත්, මේ සමාගම කියනවා, මේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කරන්නේ පෙර වාර්තා පදනම් කර ගෙන කියලා. ආශු මාරසිංහ මන්ත්‍රීතුමාත් කිව්වා, ඇමෙරිකානු ඩොලර් මිලියන 350කට තිබුණු ඇස්තමේන්තුව එක පාරටම ඇමෙරිකානු ඩොලර් 550කට පමණ නඟිනවා කියලා. එතකොට මොකක්ද මේකෙන් වෙන ගනුදෙනුව කියන එක සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්නයක් මතුවනවා. ඒ අතර එක පාරටම ඉරානයේ ජනාධිපතිතුමා ලංකාවට එනවා. එතුමා ඇවිල්ලා මේ පිළිබඳව සාකච්ඡා කරනවා. ගිවිසුමට අත්සන් කරන්නේ බනිජ තෙල් නීතිගත සංස්ථාවයි, ඉරානයේ බලශක්ති අමාත්‍යාංශයයි. මේ ව්‍යාපෘතියේ නියෝජිතයා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය. ඉරානය වෙනුවෙන් ඉරාන රජයෙන් මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න නම් කරනවා, "ෆරාබ්" කියන සමාගම. මේ ගිවිසුම පරස්පර විරෝධී අමුතුම විධියේ ගිවිසුමක්. මේ "ෆරාබ්" කියන සමාගම පිළිබඳව සොයා බැලුවාම අපට දැනගන්න ලැබුණා, මේ සමාගම ලෝකයේ වෙන වෙන රටවලත් විනාශකාරී ව්‍යාපෘති ක්‍රියාත්මක කරපු සමාගමක්ය කියලා. මේ සමාගම ව්‍යාපෘතියක් කරද්දි ඒ සම්බන්ධයෙන් ඇතිවන අතුරු ආබාධ පිළිබඳව කිසිම සැලකිල්ලක් දක්වන්නේ නැහැ. මේ විධියට තමයි මේ කටයුතු සිද්ධ වුණේ. එම නිසා මේකේ ප්‍රතිඵල මේ විධියට එන එක පිළිබඳව දෙපාරක් හිතන්න ඕනෑ නැහැ. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා තිබෙන විධිය අනුව මේ ව්‍යාපෘතියේ ප්‍රතිඵල මේ විධියට එන එක සාමාන්‍යයි. දැන් මේ ව්‍යාපෘතියේ තිබෙන නරකම තත්ත්වය තමයි, මේ සම්බන්ධයෙන් සම්පූර්ණ දෝෂාරෝපණය වර්තමාන ආණ්ඩුවට එල්ල වීම.

දැන් මේ සභාවේදී කරුණු හෙළි වුණා වාගේ කිලෝමීටර් 15ක පමණ උමං මාර්ගය අවසන් කරන්න ඉතිරි වෙලා තිබෙන්නේ තව කිලෝමීටර් 5යි. මේ ව්‍යාපෘතියේ ඉතිරි ටික අවසන් කරන්නේ නැතිව මේ ව්‍යාපෘතියේ තිබෙන හානිය අවම කර ගන්නේ කොහොමද? එතකොට මේකෙන් ඉහළ සිට පහළට ජලය බහිනවා නම්, මේ tunnel එක හදා pressure එක වැඩි කරලා backpressure එකක් ඇති කරලා ජල මට්ටම උස්සනවා හැරෙන්න වෙනත් ක්‍රමවේදයක් නැහැ. මේකට පාවිච්චි කරන්නේ tunnel boring machine එක. Tunnel boring machine එක මෑත යුගයේ තමයි මෙරටට හඳුන්වා දුන්නේ. මේ යන්ත්‍රයෙන් උමඟ හාරන ගමන් කොන්ක්‍රීට් කර ගෙන යෑමේ හැකියාවත් තිබෙනවා. හැබැයි, මේ යන්ත්‍රය ක්‍රියාත්මක කරද්දි වටේට තිබෙන ජල මූලාශ්‍ර පිළිබඳව සොයා බලා ක්‍රියාත්මක කරන්න ඕනෑ. මේ සමාගම මේ යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේදී වටේට තිබෙන ජල උල්පත් සහ ජල ධාරා පිළිබඳව කිසිම තැකීමකින් තොරව තමයි ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ මේ යන්ත්‍රය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමේ ගැටලුව මතයි. එම නිසා මේ තත්ත්වය නිවැරදි කර ගැනීමට සිද්ධ වෙලා තිබෙන්නේ වර්තමාන ආණ්ඩුවටයි. නවීන තාක්ෂණය අනුව මේ කටයුත්ත කිරීමේ හැකියාව තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා.

මහින්ද රාජපක්ෂ මහත්තයා ජාතක කරපු SAITM එක අද යහපාලන ආණ්ඩුව පිටින් තැබුවා වාගේ මේ ව්‍යාපෘතියත්, මහින්ද රාජපක්ෂ මහත්තයායි, චමල් රාජපක්ෂ මහත්තයායි තමයි ආරම්භ කළේ. ගුණවර්ධන මහත්තයා නම් මේකට විරුද්ධ වෙලා අමාත්‍යාංශ ලේකම් ධුරයෙන් ඉවත් වුණා. මේ උදවිය මේ ව්‍යාපෘතිය ආරම්භ කරලා දැන් අපේ ආණ්ඩුව පිටින් තියන්නේ. රාජපක්ෂලා ජාතක කරපු දරුවන්ගේ වැරදි නිවැරදි කිරීම තමයි අද යහ පාලන ආණ්ඩුවට කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මෙහි තිබෙන අවාසනාවන්ත තත්ත්වය තමයි, මේ රටේ ජනතාවට මේ පණිවුඩය හරියට නොයෑම. අනුන් ජාතක කරපු විකෘති දරුවන්ට අපට උප්පැන්න දෙන්න සිද්ධ වනවාය කියන එක මේ රටේ ජනතාව තේරුම් නොගන්නා එක තමයි, දැන් තිබෙන අවාසනාවන්ත තත්ත්වය කියලා ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා. 6.48]

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

අපේ සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින් වර්තමානයේ ඇති වෙලා තිබෙන අර්බුද ගණනාවක් පිළිබඳව කථා කළා. එහිදී එතුමා කොළඹ නගරය හා ඒ අවට තිබෙන කසළ අර්බුදය පිළිබඳ කරුණුත් ඉදිරිපත් කළ නිසා ඒ සම්බන්ධයෙන් කරුණු කීපයක් ඉදිරිපත් කරන්න ඕනෑය කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනකොට කොළඹ නගරය තුළ හා ඒ අවට ප්‍රදේශවල ඉතාම බරපතළ ප්‍රශ්නයක් ලෙස කසළ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. මේ කසළ ප්‍රශ්නය අද මතු වන්න ප්‍රධානම හේතුවක් තමයි, කොළඹ නගරය හා ඒ අවට ප්‍රදේශවල තිබුණු කසළ කොළොන්නාවේ මීතොටමුල්ල ප්‍රදේශයට බැහැර කිරීම උඩ ඒ කුණු කන්ද කඩා වැටීම. එම හේතුව නිසා අද කොළඹ සහ ඒ අවට ප්‍රදේශවල කසළ බැහැර කරන්න ස්ථානයක් නැති වෙලා තිබෙනවා.

අද කොළඹ නගරයේ හැම ප්‍රදේශයකම පාරවල්වල නැවත කුණු කඳු ඇති වෙන්න පටන්ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ක්‍රියාවලියට මේ රටේ හිටපු හැම ආණ්ඩුවක්ම අඩු-වැඩි වශයෙන් වග කියන්න ඕනෑ; එහි වගකීම බාර ගන්න ඕනෑ. මොකද, රටක් හැටියට මේ කුණු කසළ ඉවත් කිරීම පිළිබඳව අපට වැඩසටහනක් තිබුණේ නැහැ; ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒ සඳහා ක්‍රමවේදයක් පටන් ගන්නා හැම මොහොතකම යම් යම් දේශපාලන නායකයන්ගේ විරෝධතාව මත ඒ කටයුතු නවත්වන්න සිදු වුණා. වර්තමාන කථානායකතුමා වන කරු ජයසූරිය මැතිතුමා කොළඹ නගර සභාවේ නගරාධිපති වෙලා හිටපු කාලයේදී -1998 අවුරුද්දේදී- ලෝක බැංකු ආධාර යටතේ අවිස්සාවේල්ල මීපේ ප්‍රදේශයේ කුණු කසළ බැහැර කිරීමේ අංගණයක් පටන් ගන්න මුල් වී කටයුතු කළා. නමුත් එතුමා 1998 අවුරුද්දේදී ඒ කටයුත්ත කරන්න හදනකොට අද මේ පාර්ලිමේන්තුවම නියෝජනය කරන ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න සමහර මන්ත්‍රීවරු අවිස්සාවේල්ලේ ඉඳලා කොළඹ නගරය දක්වා පා ගමන් ඇවිල්ලා, මීපේ කසළ බැහැර කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමට විරුද්ධව විශාල ජන මතයක් ගොඩ නඟලා, ඒ කටයුත්ත කරන්න දුන්නේ නැහැ.

අපේ වර්තමාන කථානායකතුමා තමයි, එදා කොළඹ නගරයේ නගරාධිපතිවරයා හැටියට ඒ කටයුත්ත ක්‍රියාත්මක කරන්න හැදුවේ. එදා මීපේ ප්‍රදේශයේ කුණු කසළ බැහැර කිරීමේ අංගණය ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණා නම් මීතොටමුල්ල වාගේ කුණු කඳු ඇති වන්නේ නැහැ. නමුත් අවාසනාවකට එදා ඒ අය ආණ්ඩු පක්ෂයේ ඉඳගෙනම, -චන්ද්‍රිකා කුමාරණතුංග ජනාධිපතිතුමිය බලයේ සිටි කාලයේ- ඊට විරුද්ධව විශාල හඬක් නඟලා, "මේක එක්සත් ජාතික පක්ෂයේ වැඩ පිළිවෙළක්" කියලා ඒ කටයුත්ත කරන්න දෙන්නේ නැතිව පරාජය කරලා දැම්මා. 2008 අවුරුද්දේ ඉඳලා තමයි කොළඹ, කොළොන්නාව, කෝට්ටේ, කඩුවෙල වාගේ නගර සභාවල කුණු කසළ කිසිම ප්‍රමිතියකින් සහ ප්‍රතිවක්‍රියාකරණයකින් තොරව කෙළින්ම මීතොටමුල්ලට ගෙනිහිල්ලා දැම්මේ. එදා මීතොටමුල්ලට ඒ කුණු ගෙනිහිල්ලා දමන වෙලාවේ ජනතාවගේ විශාල විරෝධයක් මතු වුණා. ඒ ප්‍රදේශයේ ජනතාව ඊට විරුද්ධව පාරට බැහැලා උද්ඝෝෂණය කළා. එවකට හිටපු ආරක්ෂක ලේකම්තුමා තමන්ගේ බලතල පාවිච්චි කරලා, ඒ කටයුත්ත මැඩ පවත්වලා, කොළඹ නගරයේ විතරක් නොවෙයි, කොළඹ නගරය අවට තිබෙන ප්‍රාදේශීය සභා බලප්‍රදේශවල සහ නගර සභා බලප්‍රදේශවල තිබුණු සියලුම කුණු කොළොන්නාව මීතොටමුල්ල ප්‍රදේශයට ගෙන ගොස් දැම්මා.

ඒ විතරක් නොවෙයි, නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුණු කසළ බැහැර කිරීම සඳහා අක්කර ගණනාවක් ඒ ප්‍රදේශයෙන්ම වෙන් කරගෙන, කුණු ප්‍රතිචක්‍රියාකරණය කරන්න අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර පවා ගෙනැල්ලා සවි කළා. නමුත් එවකට හිටපු ආරක්ෂක ලේකම්තුමා ඒ කිසිම දෙයක් ගණන් ගන්නේ නැතිව, ඒ යන්ත්‍ර සූත්‍රවලින් කිසිම ප්‍රයෝජනයක් ගන්නේ නැතිව, ඒ වෙන් කරපු අක්කර දෙකේත් කුණු ගෙනිහිල්ලා දැම්මා. ඒ යන්ත්‍ර ටිකත් එහෙමම අද වන තුරුම තිබෙනවා. ඒවා පාවිච්චි කළේ නැහැ. එහෙම ගොඩ ගහපු කුණු කන්ද තමයි මීට මාස දෙකකට කලින් කඩාගෙන වැටුණේ. ඒ කුණු කන්ද කඩාගෙන වැටුණාට පස්සේ කොළඹ නගරය හා අවට නගර සභාවලට විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා, "මේ කුණු ටික ගෙනි යන්නේ කොහේටද?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්‍යානුකූලව කුණු කසළ බැහැර කරන්න 2016 අවුරුද්දේ ජාඇල ඒකල ප්‍රදේශයෙන් අක්කර ගණනාවක ඉඩමක් හඳුනා ගත්තා. නමුත් ඒ ප්‍රදේශයට කුණු කසළ ගෙනියනකොට එම ප්‍රදේශයේ ආගමික නායකයන්, අපේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සමහර දේශපාලන නායකයන් ජනතාවත් එක්ක පාරට බැහැලා, ඒ කටයුත්තත් නවත්වලා දැම්මා. 2016 අවුරුද්දේදී තමයි ඒ කටයුත්තත් නැවැත්වුවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
2016 අවුරුද්දේදී ඒ කටයුත්තත් නැවැත්වුවාට පස්සේ වෙන විකල්පයක් නැති නිසා තමයි ආපසු අපට මීතොටමුල්ලට කුණු ගෙනි යන්න සිදු වුණේ. 2016 අවුරුද්දේ අපට ඒ කටයුත්ත කරගෙන යන්න ඉඩ ලැබුණා නම් සමහර විට මේ මීතොටමුල්ල කුණු කන්ද කඩාගෙන වැටෙන්නේත් නැහැ; ඒ ජීවිතවලට හානි සිදු වන්නේත් නැහැ. නමුත් යම් යම් දේශපාලනඥයන්ගේ වැරැදි ක්‍රියා කලාප මත සහ සමහර අයගේ උසි ගැන්වීම් මත ඒ කටයුතු කඩාකප්පල් වුණා. දවසකට කොළඹ නගරයේ ජීවත් වන ජනතාවගෙන් කුණු කසළ වශයෙන් එකතු වෙන්නේ ටොන් 250ක් බව මා මතක් කරන්න ඕනෑ. නමුත් කොළඹ නගරයට දවසකට මිලියනයකට ආසන්න ජනතාවක් එනවා. ඒ ජනතාවගේ කුණු කසළ දවසකට ටොන් 650ක, 700ක වාගේ ප්‍රමාණයක් එකතු වනවා. ඒ ප්‍රමාණයත් එක්ක තමයි කොළඹ නගරයේ දවසකට ටොන් 1,000ක වාගේ කසළ ප්‍රමාණයක් එකතු වෙන්නේ. මේ සියලු දෙනාගෙන්ම එකතු වන කුණු පිළිබඳ ප්‍රශ්නය අද මේ රට හමුවේ තිබෙනවා.

"මේවා කොළඹ නගරයේ කුණු, කොළඹ නගරයේ කුණු අපේ ප්‍රදේශයට ගෙනෙන්න එපා" කියලා නොයෙකුත් ප්‍රදේශවල ජනතාව උද්ඝෝෂණ කරන බව අපි දන්නවා. වත්තල ජනතාව උද්ඝෝෂණ කරනවා; ජා ඇල ජනතාව උද්ඝෝෂණ කරනවා; පිළියන්දල ජනතාව උද්ඝෝෂණ කරනවා; දොම්පේ ජනතාව උද්ඝෝෂණ කරනවා. ඒ සියලු දෙනාම කියනවා, "කොළඹ ජනතාවගේ කුණු අපේ ප්‍රදේශයට ගෙනෙන්න එපා" කියලා. "කොළඹ ජනතාවගේ කුණු" කියලා එකක් නැහැ කියලා අපි කියනවා. කොළඹ නගරයට දිනකට ලක්ෂ ගණනක ජනකායක් පැමිණෙනවා. ඒ සියලු දෙනාම බැහැර කරන කුණුත් එක්ක තමයි කොළඹ නගරයේ ටොන් දහසක පමණ කුණු එකතු වෙන්නේ. එතකොට ඒ එකතු වෙන්නේ, මේ රටේ ජනතාවගේ කුණු. එහෙම නැතුව "කොළඹ කුණු" කියලා දෙයක් නැහැ. කොළඹ නගරයේ

ජීවත් වන ජනතාවගෙන් දවසකට එකතු වෙන්නේ කුණු ටොන් 250යි. කොළඹ නගරයේ පුරවැසියෝ හෙට පාරට බැහැලා උද්ඝෝෂණය කරන්න පටන් ගත්තොත්, කවුරුවත් කොළඹට එන්න එපා කියලා කොළඹ නගරයට ඇතුළු වෙන පාරවල් ටික වහන්න කොළඹ නගරයේ ජනතාව හෙට පාරට බැස්සොත්, මොකක්ද වෙන්නේ? "එහෙම නම් තම තමන්ගේ ප්‍රදේශවලම ජීවත් වෙන්න, කවුරුවත් කොළඹට එන්න එපා" කියලා කොළඹ නගරයේ ජීවත් වන ලක්ෂ පහ-භයක ජනතාව හෙට පාරට බැහැලා, කොළඹ නගරයට ඇතුළු වෙන සියලු පාරවල් ටික වහන්න පටන් ගත්තොත් මොකක්ද වෙන්නේ? එහෙම වුණොත් මේ රටේ අගනුවර සිදු වන සියලු කටයුතු සම්පූර්ණයෙන්ම කඩා ගෙන වැටෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කියන කාරණය ඇත්ත. නමුත්, කාලය අවසන්.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

මේක වැදගත් ප්‍රශ්නයක්. මොකද, ඔබතුමාත් ගම්පහ ඉඳලා කොළඹට ඇවිල්ලා කුණු දමලා යනවා. ඊට පස්සේ දොම්පෙට ගිහිල්ලා කියනවා, "මෙහේට කුණු ගෙනෙන්න එපා" කියලා. ඒ නිසා කොළඹ නගරයේ පුරවැසියන්ට තිබෙනවා විශාල ප්‍රශ්නයක්. කොළඹ නගරයේ ජීවත් වන අපට තිබෙනවා විශාල ප්‍රශ්නයක්. අපේ ජනතාවගෙන් එකතු වෙන්නේ දවසකට කුණු ටොන් 250යි. අපේ කුණුවලට විසඳුමක් යොදා ගන්න අපට පුළුවන්. කොළඹ නගරයට එන ලක්ෂ සංඛ්‍යාත ජනතාව හවසට ආපසු යනකොට ඒ ගොල්ලන් පාවිච්චි කරපු දේවල් ඔක්කෝම අරගෙන යනවා නම්, අපේ කුණු ටොන් 250ට විසඳුමක් යොදා ගන්න අපට පුළුවන්. නමුත් එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය අද මේ නගරයේ ජීවත් වන ජනතාවට විශාල පීඩනයක්. අද ඒ ජනතාවගේ ගෙවල් ඉදිරිපිට කුණු කඳු ගොඩ නැඟිලායි තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පැහැදිලියි. දැන් කථාව අවසන් කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඉතා ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳුවේ නැත්නම්, මේ ගැන ආණ්ඩුවක් හැටියට තද දේශපාලන තීන්දු අරගෙන ඉදිරියට ගියේ නැත්නම්, කොළඹ නගරයේ ජීවත් වන ජනතාව හැටියට හෙට අනිද්දා වන විට අපටත් සිද්ධ වෙනවා, පාරට බැහැලා, කොළඹ නගරයට ඇතුළු වෙන පාරවල් ඔක්කෝම වහලා කටයුතු කරන්න.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට බොහොම කෙටි කාලයක් තමයි වෙන් වී තිබෙන්නේ.

[අ.භා. 6.56]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේදී ඉතාම හොඳ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, උමා ඔය ව්‍යාපෘතිය නිසා ඇති වී තිබෙන ප්‍රශ්නය සම්බන්ධව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපට තිබෙන්නේ උමා ඔය ව්‍යාපෘතිය නිසා ඇති වූ ප්‍රශ්න පමණක් නොවෙයි. සුන්දර බණ්ඩාරවෙල විනාශ කරපු උමා ඔය ව්‍යාපෘතිය වාගේම පසු ගිය රාජපක්ෂ ආණ්ඩුව තවත් කුණු කන්දල් ගොඩක් අපට පවරා තිබෙනවා. ඒ අතර සයිටම් ප්‍රශ්නය තිබෙනවා; මීතොටමුල්ලේ කුණු ප්‍රශ්නය තිබෙනවා; ඒ වාගේම පුත්තලම දිස්ත්‍රික්කයට දීපු නොරොච්චෝලේ බලාගාරයත් තිබෙනවා. අද ඒ බලාගාරයෙන් බැහැර කරන විශාල කුණු ප්‍රමාණයකින් ඒ ප්‍රදේශයේ ජීවත් වන ජනතාව පීඩා විඳිනවා. ඒ විතරක් නොවෙයි. මුහුද පාවිච්චි කරන්න බැරි විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා.

මීට ටික වෙලාවකට පෙර මේ පාර්ලිමේන්තුවේ තිබුණු තත්ත්වය, එහා පැත්තේ මන්ත්‍රීවරු කථා කරපු විධිය මම දැක්කා. හොරකම් කරලා, දූෂණ කරලා, වංචා කරලා විතරක් නොවෙයි, පරිසරයට හානි කරලා, මේ රටේ සම්පත්වලට හානි කරලා - [බාධා කිරීමක්] ඔය ප්‍රධාන ව්‍යාපෘති විතරක් නොවෙයි, ප්‍රධාන ව්‍යාපෘතිවලට අමතරව ගමක් ගමක් ගානේ තිබෙන ව්‍යාපෘති ටික අරගෙන බලන්න, ඒවා නිසා කොපමණ පරිසර හානියක් සිදු වෙලා තිබෙනවාද කියලා. ඒවායින් කොපමණ වංචා සිදු වෙලා තිබෙනවාද කියලා බලන්න. හැබැයි සුදු ඇඳ ගෙන මෙතැන කථා කළේ, නිකම් සුද්දෝ වාගෙයි. එහෙම කරනකොට සමහර විට ජනතාව හිතන්න පුළුවන්, "මේ අය නැවත ඇවිල්ලා කථා කරනවා, එතකොට අනෙක් මිනිසුන්ද හොරු?" කියලා. සමහර වෙලාවට බස් ඇතුළේත් ඒක සිද්ධ වෙනවා, පික්පොකට්කාරයන් අතින්. පික්පොකට්කාරයා පොකට් එකට ගහලා පාරට බැහැලා දුවනවා. අනෙක් අය ඔහු අල්ලන්න දුවගෙන යද්දී කියනවා, පික්පොකට්කාරයාත් කියනවා, "හොරෙක්-හොරෙක්, අල්ලන්න" කියලා. මේ අයත් හොරකම් කරලා, වංචා කරලා, ඒ කුණු ටික ඔක්කෝම අපේ ආණ්ඩුව පිට දමලා තිබෙනවා. අද ඒ පව් සියල්ලම කරට අරගෙන ඔවුන්ගේ පිටු පස්සෙන් යන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. එහෙම යනකොට ඔවුන් කෑ ගහගෙන යනවා, "ඉස්සරහින් හොරෙක්" යනවා කියලා. එහෙම තත්ත්වයකට අද මේ රට පත් කරලා තිබෙනවා. අද මේ උමා ඔය ව්‍යාපෘතිය නිසා ඇති වී තිබෙන ප්‍රශ්නය වාගේ තවත් ප්‍රශ්න රාශියක් ඉදිරියේදී මේ රටේ ඇති වෙන්න පුළුවන්.

ගමක්-ගමක් පාසා මේ ප්‍රශ්න එන්න පුළුවන් ඉස්සරහට. ජනතාව වෙනුවෙන් මේ සියලු පව් අපට තමයි කර තබා ගෙන යන්න වෙන්නේ. මොකද, අපි මේ ජනතාව වෙනුවෙන් පත් වුණු ආණ්ඩුවක් නිසා. එහෙම නැතුව මේ පාලකයෝ වෙනුවෙන් පත් කරපු ආණ්ඩුවක් නොවෙයි. ඒ නිසා ජනතාව වෙනුවෙන් පත් කරපු ආණ්ඩුවක් හැටියට අපි ඒ වගකීම් රාශිය කරට ගන්න කොට, වැඩි කල් යන්න පෙර මේ හොරු ටික දඬු කදේ ගහලා ඔවුන්ට දඬුවම් දිය යුතු වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපට සිද්ධ වෙනවා. අපි සියලු දෙනාටම ඒ සඳහා පෙළ ගැහෙන්න සිද්ධ වෙනවා. ඒක නොකළොත්, මේ ජනතාව වෙනුවෙන් අපිත් අපේ වගකීම ඉෂ්ට නොකළා වෙනවා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, උමා ඔය වාගේ සුන්දර තැන්, බණ්ඩාරවෙල වාගේ සුන්දර ප්‍රදේශ විනාශ කරමින් කිසිම පරිසර ඇගැයීමක් සිදු කරන්නේ නැතුව, තාක්ෂණික වශයෙන් ඉංජිනේරු මහත්වරුන්ගේ උපදෙස් නිවැරදි ක්‍රමයට

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ලබා ගන්නේ නැතුව කළ ඒ ව්‍යාපෘතිය නිසා ඒ ප්‍රදේශය විනාශ වෙනවා. ඒ විතරක් නොවෙයි. මේ අය අතින් තවත් එවැනි වැඩසටහන් ක්‍රියාත්මක වුණා නම්, සමස්ත රටම විනාශ වෙනවා. තමුන්නාන්සේලා දන්නවා, මත්තල ගුවන් තොටුපළ හැදුවේත් ඔය වාගේයි; හම්බන්තොට වරාය හැදුවේත් ඔය වාගේයි.

විශේෂයෙන්ම කොළඹ මුහුදේ ඉදිවන නගරය සැලසුම් කළේත් ඒ වාගේ තමයි. මේ කිසි දේකට තාක්ෂණ පැත්ත, පරිසර පැත්ත කියන කිසිම දෙයක් බැලුවේ නැහැ. මෝඩයෝ රැළක් වාගේ මේ අය මෙවැනි දේවල් කළේ සංදර්ශන පවත්වන්නයි, වෙන මොනම කාරණාවකටවත් නොවෙයි. ඒ සංදර්ශනවලට කෝටි-ප්‍රකෝටි ගණන් මුදල් වැය කරලා තිබෙනවා. ඔය මහ ලොකුවට කථා කරන

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හිටපු ඇමතිවරයා කරපු වංචා දූෂණ ප්‍රමාණයක් අද කෝප් කමිටුවෙන් මගේ අතට ලැබුණා. මම මෙතැනදී ඒ ගැන කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ ගැන කථා කරන්න විශේෂ අවස්ථාවක් ගන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මේ සියල්ලම සිද්ධ කරමින් මේ අය රටේ පරිසරය විනාශ කළා; රටේ තාක්ෂණ පැත්ත භාරව සිටි ඉංජිනේරු මහත්වරුන්ගේ මොළය විනාශ කළා; රටේ ජනතාවගේ අයිතිවාසිකම් ටික විනාශ කළා; රටේ තිබෙන සුන්දරත්වය විනාශ කළා. මේ සියල්ල විනාශ කළා පමණක් නොවෙයි, අද මේ හොරු සියලු දෙනා රාජපක්ෂ උන්නැහේත් වට කරගෙන කෑත නැතුව, ලජ්ජා නැතුව පන්සලක්-පන්සලක් ගණනේ ගිහිල්ලා අනෙක් අයට "හොරු" කියලා අත දිගු කරමින් රට විනාශ කරමින් යන වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ඒ නිසා අපිට වගකීමක් තිබෙනවා. මේ හොරු ටික ඉක්මනින් අල්ලා දඬු කඳේ ගහලා අවශ්‍ය කටයුතු කරන්න කියලා අපේ නායකයන්ටත් ඇහිල්ල දිගු කරලා කියන්න විශේෂයෙන්ම පසු පෙළ මන්ත්‍රීවරු හැටියට අපට විශාල වගකීමක් තිබෙනවා. එහෙම කරලා සත්‍ය මොකක්ද, කවුද හරියාකාරව රට පාලනය කරන්නේ කියන එක අපේ රටේ ජනතාවට පෙන්වන්න අපට සිද්ධ වෙනවා. ඒ නිසා උමා ඔය ව්‍යාපෘතිය හා සමානවම රටේ සිද්ධ වෙන අනෙක් සියලු කටයුතු ගැන හරියාකාරව සොයා බලා තීන්දු-තීරණ ගන්නා එක අපේ ආණ්ඩුවේ වගකීමක් හැටියට මා දකිනවා. ඒ ගැනත් ප්‍රකාශ කරමින් මේ සම්බන්ධව කථා කිරීමට මට අවස්ථාව දීම ගැනත් තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු කථාව, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වේලාවක් තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි විස්සක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.01]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විධියට ඉතාම වැදගත් යෝජනාවක් ඉදිරිපත් කළා. ඒ වාගේම ඒ සම්බන්ධව සියලු මන්ත්‍රීවරුන් විසින් ඉතාම ඉහළ මට්ටමේ අදහස් ඉදිරිපත් කිරීමක් සිදු කරනු ලැබුවා. ඒ පිළිබඳව ඒ හැමෝටම අපි අපේ ප්‍රශංසාව පුද කළ යුතුයි. ඔවුන් සියලු දෙනා අද කථා කළේ, මේ රටේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන උමා ඔය ව්‍යාපෘතිය ගැනයි. එහි ඇති වී තිබෙන අසාර්ථක තත්ත්වයත්, ඒ වාගේම එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ජනතාවට සිදු වුණු හිරිහැර පිළිබඳවත් තමයි එතුමන්ලා විශාල වශයෙන් කරුණු ඉදිරිපත් කළේ.

මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන ගමන්ම ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සඳහන් කළා, මේ සඳහා නිසි තාක්ෂණික ඇගැයීමක් සිදු වුණේ නැහැ, විශේෂඥ දැනුම ලබා ගත්තේ නැහැ කියලා. නමුත්, මේ ලියකියවිලිවල පෙනෙන හැටියට එහෙම අනුමැතිය අරගෙන තිබෙනවා. එසේ නමුත් ඒ වාගේ ප්‍රධාන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන කොට, මීට වඩා ගැඹුරින් ඒ පිළිබඳ පරිසර අධ්‍යයනයක් කළ යුතුව තිබුණා කියලා මේ රටේ පුරවැසියකු විධියට වාගේම, මහජන නියෝජිතයකු විධියට මා පෞද්ගලිකවම විශ්වාස කරනවා. මෙවැනි ව්‍යාපෘතියක් මේ රට තුළ ක්‍රියාත්මක කරන කොට, මීට වඩා විශේෂඥ දැනුම තිබෙන කණ්ඩායමකගේ සහයෝගය දේශීය සහ විදේශීය වශයෙන් අවශ්‍ය වෙනවා වාගේම, මෙම කොන්ත්‍රාත්කාර සමාගම පිළිබඳවත් මීට වඩා අවධානය යොමු කළ යුතු වෙනවා. FARAB සමාගම තමයි මේ කටයුතු සිදු කරන්නේ. ඉරාන රජයෙන් මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන එකඟතාව මත ඉරාන රජයත් එක්ක ශ්‍රී ලංකා රජය ඇති කර ගත් ගිවිසුමක්, එකඟතාවක් මත තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙන්නේ. නමුත්, ඉරාන රජයෙන් අපට ලැබී තිබෙන්නේ ඩොලර් මිලියන 50ක වාගේ මුදලක්. මොකද, ඒ රටේ ඇති වුණු ගැටලුව නිසා, ඒ වෙලාවේ ඇති වුණු තත්ත්වය නිසා එම මුදල් ලබා දීම සිද්ධ වුණේ නැහැ. ඉරානයෙන් ලැබුණු මුදල්වල අඩු පාඩුවක් තිබුණත් රජයේ මුදල් යොදවලා මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළා. මේ වන විට ගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය මේ පිළිබඳව යොමු වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මේ වන විට ස්විස්ටර්ලන්තයේ උපදේශක කණ්ඩායමක්, විශේෂඥ කණ්ඩායමක් මේ රටට ඇවිල්ලාත් තිබෙනවා. ඒ පිළිබඳ විශේෂඥයෙකු පරීක්ෂා කරලා මේ විදුම්කරණ යන්ත්‍රය නවීකරණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්න කියලා ලබා දුන් උපදෙස් අනුව, මේ මස 18වෙනි දාට ප්‍රථම මෙය නවීකරණය කිරීමට අවශ්‍ය උපාංග විශේෂ ගුවන් යානයක් මහින් මේ රටට ගෙන්වනවා. මේ මාසය අවසාන වීමට ප්‍රථම

නෝර්වේ රජයෙන් මේ පිළිබඳ විශේෂඥ කණ්ඩායමක් මේ රටට එනවා. මේ මාසයේ 31වෙනි දා කියලායි අපට දැනුම් දීලා තිබෙන්නේ. ඒ අය ඇවිල්ලා මේ පිළිබඳව පරීක්ෂා කළාට පසුව, මේ ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යනවා නම් කොහොමද කරගෙන යන්නේ, ඒ පිළිබඳව ගැටලු තිබෙනවා නම් මොන වාගේ ගැටලුද ඇති වෙලා තිබෙන්නේ කියන එක ගැනත්, ඒවා නිවැරදි කිරීමට ගන්නා පියවර පිළිබඳවත් ඔවුන්ගේ සහයෝගය ලබා ගන්නවා.

ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා කියපු කාරණය මම පිළිගන්නවා. මේ සම්බන්ධව පත් කරලා තිබෙන කමිටුව මේ විශේෂඥ වැඩේ කරන්නට යන්නේ නැහැ. උමා ඔය සම්බන්ධයෙන් එම කමිටුව පත් කලේ කැබිනට් මණ්ඩලයෙන්. මමත්, ගරු චම්පික රණවක ඇමතිතුමා, ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා ඇමතිතුමා සහ තවත් අය එම කමිටුවේ සාමාජිකයන් වුණා. ගරු ජනාධිපතිතුමාත්, කැබිනට් මණ්ඩලයත් අනුමත කිරීමෙන් පසුව තමයි ඒ කමිටුව පත් කළේ. අපි ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වෙන්නේ, ක්ෂණිකව ඇති වුණු තත්ත්වයෙන් එම ජනතාව මුදවා ගැනීමයි. ඒ සඳහා අවශ්‍ය සහන ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනම් කිරීමටත්, ජනතාවගේ ප්‍රශ්න ඉදිරිපත් කරලා ප්‍රායෝගික මට්ටමේ තිබෙන කාරණා පිළිබඳව රජය දැනුවත් කරන්නටත් බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව අවධානය යොමු කළ හැකි, දැනීම තිබෙන විශේෂඥයන් අපේ රටෙත් ඉන්නවා. අපි එම විශේෂඥයන්ගේ දැනුමත් මේ වන විට ලබා ගනිමින් සිටිනවා. ඒ වාගේම විදේශීය විශේෂඥයනුත් මේ රටට ගෙන්වා ගන්නට අපි කටයුතු කරනවා.

මේ ව්‍යාපෘතිය සම්බන්ධව කටයුතු කරන FARAB සමාගම සම්බන්ධව මම කිව්වා. මටත් තේරුණු දෙයක් තමයි මේ අයට උමං ඉදි කිරීම පිළිබඳව හරියාකාර පළපුරුද්දක් තිබුණේ නැහැ කියන එක. දැන් ලංකාවේ මේ කටයුත්ත කළාට පසුව ඒ අය පළපුරුද්ද ලබා ගනීවි. මෝටර් යාන්ත්‍රික කාර්යන් පිළිබඳව තමයි මේ ගොල්ලන්ට වැඩි දැනීමක් තිබෙන්නේ. ඒ වෙලාවේ ඒක කොහොම සිද්ධ වුණාද කියලා මම දන්නේ නැහැ. ඒ රටෙන් අපිට මේ කොන්ත්‍රාත් සමාගම දුන්නා කියලාත් කියනවා. මොන තත්ත්වයක් තුළ හෝ මීට වැඩිය මේ පිළිබඳව පළපුරුද්ද තිබෙන කණ්ඩායමක් යෙදවුවා නම් අපට මේ අනතුරෙන්, මේ ව්‍යසනයෙන් බේරෙන්නට තිබුණා. ඒ වාගේම මේ ව්‍යාපෘතිය ආරම්භ කරන මොහොතේත් යන්ත්‍රයෙන් විදගෙන යන අවස්ථාවේම කොන්ක්‍රීට් ආලේපනය සමඟ යන තාක්ෂණය ලෝකයේ තිබුණා. නමුත් එම තාක්ෂණය නොවෙයි යොදාගෙන තිබෙන්නේ. දැන් තමයි එම තාක්ෂණය යොදා ගන්න යන්නේ. එතැනත් ගැටලුවක් තිබෙනවා.

මේ මුදල් සම්බන්ධවත් ගැටලුවක් තිබෙන බවට ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා සඳහන් කළා. එතුමා බොහෝ කරුණු ඉදිරිපත් කළා. කෙසේ වෙතත් මේ සියලු කාරණා පිළිබඳව සොයා බැලීමට ගරු ජනාධිපතිතුමා මේ වන විට අදහස් කරගෙන සිටිනවා. නමුත්නානේසේලාගේ මේ අදහසුත් එක්කම එතුමාට එම යෝජනාව ඉදිරිපත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ විශේෂ තේරීම් කාරක සභාවක් පත් කර තිබෙනවා. එම තේරීම් කාරක සභාවට විශේෂඥ සහයෝගය ලබා ගන්නවා. එම කාරක සභාව තුළින් මෙම ව්‍යාපෘතියම ආරම්භ කළ විධිය පිළිබඳව සොයා බැලීමටත්, ඒ වාගේම ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට ගණන්හිලව්වල ගැටලුවක් තිබෙනවා නම් ඒ පිළිබඳව සොයා බැලීමටත්, දැනට ඇති වී තිබෙන තත්ත්වය සහ නිවැරදි කිරීම් පිළිබඳව අවශ්‍ය පියවර ගැනීමටත් බලාපොරොත්තු වෙනවා. මොකද, ඔබතුමන්ලාම සඳහන් කළ ආකාරයට ඒ වෙලාවේ එම්.කේ.ඒ.ඩී.එස්. ගුණවර්ධන මැතිතුමා මේ ව්‍යාපෘතියේ මූලික කටයුතුවලට සම්බන්ධ වෙලා, මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලිපියකුත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම ගණන්හිලව් පිළිබඳ කාරණා ගැනත් අපි සැලකිලිමත් වෙන්න ඕනෑ. මේ රටේ ජනතාවගේ මුදල් තමයි මේ ව්‍යාපෘතිවලට යොදවලා තිබෙන්නේ. ඒ නිසා මමත් පෞද්ගලිකව හිතනවා මේ සියලු කාරණා පිළිබඳව සොයා බැලීම වැදගත් වෙනවා කියලා.

දැනට ඇති වෙලා තිබෙන තත්ත්වයෙන් එම ජනතාව මුදවා ගැනීම සඳහා අපි වහාම කටයුතු කළ යුතු වෙනවා. ඒ සඳහා අපි දැනටමත් රුපියල් මිලියන 550කට ආසන්න ප්‍රමාණයක් සහනාධාර විධියට මේ අයට ලබාදීලා තිබෙනවා.

නිවාසවලට වන්දි සහ වගා හානිවලට වන්දි විධියට අපි මුදල් ලබා දීලා තිබෙනවා. ඊට අතිරේකව මේ අය ලබා ගත් වගා ණය කපා හැරීමට කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ලබා ගත් වෙනත් ණය මුදල් ආපසු ගෙවීමට යම් කාල වකවානුවක් ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ කාරණය කොහොම ආරම්භ කළත්, මොන විධියට පටන් ගත්තත්, මොන වැරැදි මත සිදු වුණත් මේ ජනතාවගේ වගකීම රජය විධියට අපි භාර ගත යුතු වෙනවා. මේ ජනතාවට සහන ලබා දීම අපි ප්‍රමුඛතම කාර්යක් බවට පත් කරගත යුතු වෙනවා. ජනාධිපතිතුමා දැනටමත් උපදෙස් ලබා දීලා තිබෙනවා, මේ ජනතාවට සහන ලබා දීමේ වැඩ පිළිවෙළ තවත් වේගවත් කරන්න කියලා. ඒ අනුව බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම්වරයාට රුපියල් මිලියන 300ක් වහාම නිදහස් කරන්න අපි කටයුතු කරනවා. එම රුපියල් මිලියන 300න් සහනාධාර ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරනවා. මම කියපු මුදලට අතිරේකව මේ මුදලත් එයට එකතු වෙනවා.

මේ වන විට ජල ටැංකි 5,000කට වැඩි ප්‍රමාණයක් මේ ජනතාව වෙත ලබා දීලා තිබෙනවා. පානීය ජල හිඟය මේ ජනතාවගේ ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. දැනට එම ජනතාවට බවුසර් 44ක් මඟින් පානීය ජලය සපයනු ලබනවා. රුපියල් මිලියන 325ක මුදලක් යොදවලා මේ කටයුත්ත සඳහා වෙනම ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කළා. දැන් ඒ ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා දෙනවා. මම පසු ගිය සතියේ ඒ ප්‍රදේශයට ගිය වේලාවේ වහාම ඒ කටයුත්ත ආරම්භ කරන්න කියලා කිව්වා. පළමුවැනි වතාවට නොමිලේ ජල සම්බන්ධතා ලබා දීමේ වැඩ පිළිවෙළ තුළ තමයි මේ අයට ජලය ලබා දෙන්නේ. සාමාන්‍යයෙන් ජල සැපයුමක් වෙනුවෙන් රුපියල් 17,500ක මුදලක් අය කරනවා. ඒ මුදල ජනතාවගෙන් අය කරන්නේ නැතිව අපි ගෙවලා, මේ පීඩාවට පත් වූ ජනතාවට ජලය ලබා දීමේ කටයුත්ත සිදු කරනවා. අපට තව මාස දෙකක් විතර මේ කරදරය විඳින්න සිදු වෙයි. ජූලි මාසයේ, අගොස්තු මාසයේ කොහොමටත් නියහය එනවා. දැනටමත් රට පුරාම නියහයක් ඇති වෙලා තිබෙනවා. දැනටත් මේ සෑම ප්‍රදේශයකම ජලය බෙදන්න බවුසර් යොදවලා තිබෙනවා. නමුත්, සැප්තැම්බර් මාසයේ සිට මේ ජනතාවගේ ජල ප්‍රශ්නයේ වගකීම භාර ගෙන කටයුතු කිරීමේ හැකියාව අපට තිබෙන බව මම කියන්න කැමැතියි. ඒ වගේම මොන ගැටලු ආවත්, මොන ප්‍රශ්න ආවත් කමිටුව විධියට අපි ඒ ප්‍රදේශයට යනවා. අපි ඒ ජනතාව මුණ ගැහෙනවා. අපි ලබන සතියේ මේ ජනතාව කොළඹදී මුණ ගැහෙන්න බලාපොරොත්තු වෙනවා. ඊට පසුව අපි ඒ ප්‍රදේශවලට ගිහින් එම කටයුතුවලට දායක වෙනවා.

මේ ජනතාවට සහන ලබා දෙන වැඩ පිළිවෙළ කඩිනම් කිරීමේදී තක්සේරු වාර්තා ලබා ගැනීමේ ප්‍රමාදයක් තිබෙනවා. තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා විශේෂ කණ්ඩායමක් යොදවලා තක්සේරු වාර්තා කඩිනමින් ලබා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ පිළිබඳ වාර්තා ලබා දීම සඳහා NBRO ආයතනයෙන් "උමා ඔය සහන කාර්යාලය" කියලා වෙනම ඒකකයක් දැනටමත් ස්ථාපිත කරලා තිබෙනවා. ඒකට වෙනම නිලධාරීන් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා. අපට දැනට වාර්තා වෙලා තිබෙන විධියට සම්පූර්ණයෙන් විනාශ වුණු නිවාස ප්‍රමාණය 52ක් වෙනවා. ඉරිතලා ගිය නිවාස ප්‍රමාණය 4,000කට ආසන්න ප්‍රමාණයක් කියලා අපට දැනට තොරතුරු ලැබිලා තිබෙනවා. හැබැයි, යම් මට්ටමකට මේ ප්‍රමාණය වැඩි වීමේ හැකියාවකුත් තිබෙනවා. හැබැයි, ඒ සියලු දෙනා වෙත

[ගරු මහින්ද අමරවීර මහතා]

නිසියාකාරයෙන් සහන ලබා දීමේ වැඩ පිළිවෙළක් රජය ක්‍රියාත්මක කරනවා. ඒ වගේම මේ ව්‍යාපෘතිය අතරමඟ නතර කළත්; හෙට මේ ව්‍යාපෘතිය නතර කරලා පැත්තකට දැම්මත් සැලකිය යුතු කාලයක් යනකම් අපට මේ පරිසර විනාශය වළක්වා ගන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. මේ රජය බලයට පත් වන විටත් මෙම ව්‍යාපෘතිය සියයට 44ක වාගේ ප්‍රගතියක් අත් කරගෙන තිබුණා. මේ වන විට මේ කටයුත්තේ මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය සියයට 77කට වැඩි ප්‍රමාණයක් වෙනවා. එම නිසා තාක්ෂණික සහයෝගය අරගෙන මේ කටයුත්ත අවසන් කරලා අවුරුදු තුනක් විතර යනකොට නැවත මේ ප්‍රදේශය යථාතත්ත්වයට පත් කිරීමේ හැකියාවක් තිබෙනවා කියලා මම විශ්වාස කරනවා. ඒ සඳහාත් අපි වැඩ පිළිවෙළක් හදනවා. මෙම කටයුත්ත අවසන් වීමෙන් පසුව විශේෂඥ සහයෝගය ලබාගෙන පරිසරය සකස් කිරීම සඳහා වන වගා ව්‍යාපෘති, පරිසර ව්‍යාපෘති ගෙන ඒමට බලාපොරොත්තු වෙනවා. ජල මට්ටම පෙර තිබූ තත්ත්වයට ඉහළ නංවමින් මේ ප්‍රදේශය පෙර තිබූ තත්ත්වයට ගෙන ඒම තමයි අපේ බලාපොරොත්තුව වන්නේ. අවුරුදු තුනකට ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළේ ප්‍රතිඵලය විධියට බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රදේශයේ ජනතාව අද විඳින පීඩාව සැලකිල්ලට අරගෙන, ඔවුන් මීට පෙර ගත කළ ජීවිතයට වඩා ඉහළ මට්ටමේ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන්න ඕනෑ කියන මතයේ ජනාධිපතිතුමා ඉන්නවා.

ඒ සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන රජය ලබා දෙන්න කටයුතු කරනවා. අග්‍රාමාත්‍යතුමා, කැබිනට් මණ්ඩලය ඇතුළු සියලුම දෙනා එක හඬින් මේ ව්‍යාපෘතියට සහන සැලසීමේ කටයුත්තට දායක වනවා කියන එකත් මා සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම මම මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. මේ ජනතාවට සහන ලබා දීමේ වැඩ පිළිවෙළේදී ඊළඟ කැබිනට් මණ්ඩලයට යොමු කරලා Super LARC මඟින් වැඩි වන්දියක් ලබා දීමේ ක්‍රමවේදය අනුගමනය කරන්න ජනාධිපතිතුමා අදහස් කරනවා. ඒක සාමාන්‍යයෙන් සිදු නොවන කාරණයක්. නමුත් මේකේ තිබෙන බරපතළකම වටහා ගෙන, ඒ වග කීම රජය භාරගෙන ඒ ජනතාවට වන්දි ලබා දීම කෙරෙහිත් ජනාධිපතිතුමාගේ අවධානය යොමු වෙලා තිබෙනවා වාගේම අපි අඛණ්ඩව මේ වැඩසටහනේදී ඒ පරිසරය යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය පියවර ගන්නවා. මම කියන්නේ නැහැ, මේ ව්‍යාපෘතිය නොකළ යුතු ව්‍යාපෘතියක් කියලා. මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන ජල ප්‍රශ්නයට විසඳුමක් වශයෙන් මේක කළ එක හොඳයි. හැබැයි, මේ ව්‍යාපෘතිය කරන ක්‍රමවේදයේ සිදු වෙච්ච අඩු පාඩුකම්, ගැටලු තමයි අපට පැහැදිලිව පෙනෙන්න තිබෙන්නේ. මේ ව්‍යාපෘතියේ සම්පූර්ණ නරක නාමය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාටයි, මේ ආණ්ඩුවටයි එන්න පටන් අරගෙන තිබෙනවා. ඒක හරි අවාසනාවන්ත තත්ත්වයක්. මාධ්‍යවල පළවන්නේත් ඒක මේ ආණ්ඩුව ආරම්භ කරලා, මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරලා වෙච්ච වැරැද්දක් වාගෙයි. ඒ වාගේම සමහර දේශපාලනඥයන්ගේ කථා ඇහුවාමත් තේරුම් යන්නේ මේක හරියට මේ ආණ්ඩුව කරපු වැරැද්දක් වාගෙයි. ඉතාමත් පැහැදිලිව මේ ආණ්ඩුව කළේ මේ ව්‍යාපෘතිය ඉස්සරහට ගෙන යන ආකාරයේ වැඩ පිළිවෙළක් විතරයි. සියලුම නරක නාම ටික, සියලුම චෝදනා ටික රජයට එල්ල වෙලා තිබෙනවා. ඔබතුමන්ලා සඳහන් කළ ආකාරයට SAITM ව්‍යාපෘතියේදීත් එහෙමයි. ඒ ගැටලුවත් අද මේ රජයේ කර පිටට ඇවිල්ලා තිබෙනවා. කුණු කන්දේ ප්‍රශ්නයත් ඇවිල්ලා තිබෙනවා. රජයට මේවා තමයි අභියෝග.

මේ රජයෙන් මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? මිනිස්සු බඩු මිලටත් වැඩිය අපෙන් අහන්නේ මේ ප්‍රශ්න ගැනයි. බඩු මිලේත් ප්‍රශ්න ඇති. ඒ සියල්ලටම වැඩිය අහන්නේ මේ ප්‍රශ්න දෙක, තුන විසඳන්න බැරිද කියලායි. රජය විධියට අපට වග කීමක් තිබෙනවා. අපට මෙයින් මහ හැර යන්න බැහැ. SAITM ගැටලුව වුණත්, කුණු ප්‍රශ්නය වුණත්, උමා ඔය ගැටලුව වුණත් මේ තුනම අපි භාර ගන්න ඕනෑ. මෙය කවුරු කළත්, ඒ වැරැද්ද කවුරු කළාද කියලා අපි බැණ-බැණ ඉඳලා වැඩක් නැහැ. වර්තමානයේ ඒ ප්‍රශ්න විසඳීමේ වග කීම අපට පැවරිලා තිබෙනවා. මේ ව්‍යාපෘතිය ආරම්භ වුණේ කොහොමද, මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණේ කොහොමද කියන එක රටේ ජනතාව දැනුවත් කිරීම වැදගත් වෙනවා. සමහර අය ඒවා අමතක වෙලා තිබෙනවා. හැබැයි, දැන් අපි මේ වග කීම භාරගෙන මේ ප්‍රශ්න තුනම විසඳන්න ඕනෑ. මම දන්නා විධියට ඒ සඳහා ප්‍රවේශ වෙලා තිබෙනවා. ඒ සඳහා යම් ක්‍රමවේදයක් සකස් වෙලා තිබෙනවා.

කුණු ප්‍රශ්නය තවත් කාටවත් භාර දෙන්නේ නැතුව විසඳන්න ඕනෑ. කුණු ප්‍රශ්නය කථා වුණේ අද-ඊයේ නොවෙයි. මමත් කැබිනට් මණ්ඩලයේ අවුරුදු ගණනාවක් හිටියා. අවුරුදු පහ, හයක ඉඳලා හැම දාම මේ කුණු ප්‍රශ්නය ගැන කථා කළා. හැම දාම කුණු ප්‍රශ්නය තිබුණා. නමුත් මේක තවත් ආණ්ඩුවකට භාරදෙන්නේ නැතුව, මේ ආණ්ඩුව ඉදිරි අවුරුදු දෙක-තුන ඇතුළත විසඳන්න වැඩ පිළිවෙළක් තිබෙනවාය කියන එක මට දැන් පෙනෙන්න තිබෙනවා. ඒ සඳහා රජය දැන් දැඩි ස්ථාවරයකට ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම SAITM ගැටලුවත් මීට වැඩිය සුභදශීලිව සාකච්ඡා කරලා බේරා ගන්න තිබුණා කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. සමහර කාරණා අපට ඉෂ්ට කරන්න බැරි වෙයි. නිදා ගෙන ඉන්න මිනිස්සු නැගිට්ටවා ගන්න පුළුවන්. හැබැයි, හොරට නිදා ගෙන හිටියොත් නැඟිට්ටවා ගන්න අමාරුයි. ඒක අපි වටහා ගෙන කටයුතු කරන්න ඕනෑ. හැබැයි, මේ ප්‍රශ්නයටත් අපි විසඳුම් ලබා දෙනවා වාගේම මට සහතික වශයෙන් මේ කාරණයත් කියන්න පුළුවන්. උමා ඔයේ මිනිසුන්ට කරදරයක් වුණා; හිරිහැරයක් වුණා. නමුත් අපි ගෙන යන වැඩ පිළිවෙළේ සාර්ථකත්වය මත මේ ව්‍යාපෘතිය අවසාන වෙන කොට බණ්ඩාරවෙල ප්‍රදේශයේ, බදුල්ල ප්‍රදේශයේ ජීවත් වන ජනතාව අද ඉන්න තත්ත්වයට වඩා වැඩිය හොඳ තත්ත්වයකට පත් කරන්න පුළුවන් වෙයි කියලා මට දැඩි විශ්වාසයක් තිබෙනවා. ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා; රජයේ අවධානය යොමු වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා ඒ වෙනුවෙන් කැප වෙලා කටයුතු කරනවා. ඒ නිසා අපට අනිවාර්යයෙන්ම මේ අභියෝගය ජය ගන්න ශක්තියක් තිබෙනවා කියන එක මම මේ අවස්ථාවේ සඳහන් කරමින් අද මේ ඉතාමත් වැදගත් යෝජනාව ඉදිරිපත් කළ සන්දීත් සමරසිංහ මන්ත්‍රීතුමාටත්, ඒ වාගේම වැදගත් ආකාරයේ අදහස් ඉදිරිපත් කළ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාටත් අපේ ප්‍රසාදය, ස්තුතිය පළ කරනවා. ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන ආකාරයෙන්ම මේ ගැටලුව විසඳනවා වාගේම මේ ප්‍රශ්නයේ අල ගිය තැන්, මුල් ගිය තැන් සියල්ල සොයන්න අපි වැඩ පිළිවෙළකුත් සකස් කරනවා කියන එකත් සඳහන් කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.18ට, 2016 මාර්තු 08වන දින සභා සම්මතිය අනුව, 2017 ජූලි 06 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.

அதன்படி பி.ப. 7.18க்கு பாராளுமன்றம், அதனது 2016 மார்ச் 08ஆந் திகதிய தீர்மானத்துக்கிணங்க, 2017 யூலை 06, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.18 p.m. until 10.30 a.m. on Thursday, 06th July, 2017 pursuant to the Resolution of Parliament of 08th March, 2016.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

253 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 253 - இல. 3
Volume 253 - No. 3

2017 ජූලි 06 වන බ්‍රහස්පතින්දා
2017 யூலை 06, வியாழக்கிழமை
Thursday, 06th July, 2017

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
ග්‍රාම නිලධාරී පුරප්පාඩු සඳහා තරග විභාගයකින් බඳවා ගැනීම

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
ලෙයිලා උම්මා දීන් පදනම (සංස්ථාගත කිරීමේ)- [ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා]- පළමුවන වර කියවන ලදී.
අබ්දුල් මජීද් ඇකඩමි (සංස්ථාගත කිරීමේ)- [ගරු කේ. කාදර් මස්තාන් මහතා] -පළමුවන වර කියවන ලදී.

වෙළඳ නැවි පනත:
නියෝග

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී.

කල් තැබීමේ යෝජනාව:
උතුරු-නැගෙනහිර ප්‍රදේශවලට නුසුදුසු පෙරසවි නිවාස

තුරෙසාර් මේර්පාර්වෙක්කුලු අරික්කෙකළ්

විනාක්කලුක්කු වාය්මූල විටෙකළ්

තනී අරිවිත්තල්මූල විනා:
පෝට්ටිප් පරීට්සෙමූලම් කිරාම සේවකර් වෙට්රිටඞ්කළෙ නිරප්පුතල්

තනී උරුප්පිනර් සට්ටමූලඞ්කළ්:
ලෙලා උම්මා දීන් මන්රම් (කූට්ටිණෙත්තල්) – [මාණ්පුමිකු සෙයිට් අලී සාහිර් මෞලානා] – මුතන්මුරෙ මතිප්පිටප්පට්ටතු
අප්දුල් මජීත් එක්කටමි (කූට්ටිණෙත්තල්) – [මාණ්පුමිකු කා. කාදර් මස්තාන්] – මුතන්මුරෙ මතිප්පිටප්පට්ටතු

වණිකක් කප්පර්රොළිල් සට්ටම්:
ඔළුඞ්කුවිතිකළ්

කටර්රොළිල් නීර්වාළ් උයිරිණ වළඞ්කළ් (තිරුත්තම්) සට්ටමූලම්:
ඉරණ්ටාම්, මූන්රාම් මුරෙකළ් මතිප්පිටප්පට්ටු, තිරුත්තප්පට්ටවාරු නිරෙවේර්රප්පට්ටතු

ඔත්තිවෙප්පුප් පිරේරණෙ:
වටක්කු, කිළක්කුප් පිරතේසඞ්කළුක්කු ඔව්වාත පොරුත්තුවීටුකළ්

பிரதான உள்ளடக்கம்

துறைசார் மேற்பார்வைக்குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
போட்டிப் பரீட்சைமூலம் கிராம சேவகர் வெற்றிடங்களை நிரப்புதல்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
லைலா உம்மா தீன் மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா] – முதன்முறை மதிப்பிடப்பட்டது
அப்துல் மஜீத் எக்கடமி (கூட்டிணைத்தல்) – [மாண்புமிகு கா. காதர் மஸ்தான்] – முதன்முறை மதிப்பிடப்பட்டது

வணிகக் கப்பற்றொழில் சட்டம்:
ஒழுங்குவிதிகள்

கடற்றொழில் நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
வடக்கு, கிழக்குப் பிரதேசங்களுக்கு ஒவ்வாத பொருத்துவீடுகள்

PRINCIPAL CONTENTS

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Filling of Vacancies of Grama Niladharis through Competitive Examination

PRIVATE MEMBERS' BILLS:
Laila Umma Deen Foundation (Incorporation)- [The Hon. Seyed Ali Zahir Moulana]- Read the First time
Abdul Majeed Academy (Incorporation) - [The Hon. K. Kader Masthan] -Read the First time

MERCHANT SHIPPING ACT:
Regulations

FISHERIES AND AQUATIC RESOURCES (AMENDMENT) BILL:
Read a Second and the Third Time, and passed as amended

ADJOURNMENT MOTION:
Prefabricated Houses Unsuitable for North and East

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 ජූලි 06 වන බ්‍රහස්පතින්දා
2017 யூலை 06, வியாழக்கிழமை
Thursday, 06th July, 2017

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2017 ජූලි මස 06 වැනි බ්‍රහස්පතින්දා එනම්, අද දින අපර භාග 3.45ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රී සියලුදෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව; සහ

(ii) 2016 වර්ෂය සඳහා මඩකළපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 2013 වර්ෂය සඳහා සී/ස සී-නෝර් පදනමේ වාර්ෂික වාර්තාව;

(iii) 2013 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්;

(iv) 2014 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2014 වර්ෂය සඳහා ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 වර්ෂය සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2013 වර්ෂය සඳහා පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තාව;

[ගරු ගාමිණී ලොකුගේ මහතා]

(iii) 2015 වර්ෂය සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;
(iv) 2015 වර්ෂය සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;
(v) 2015 වර්ෂය සඳහා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;
(vi) 2015 වර්ෂය සඳහා කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම්;
(vii) 2015 වර්ෂය සඳහා කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන හා වාර්ෂික ගිණුම් වාර්තාව;
(viii) 2015 වර්ෂය සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්;
(ix) 2015 වර්ෂය සඳහා මොණරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;
(x) 2015 වර්ෂය සඳහා මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;
(xi) 2015 වර්ෂය සඳහා මඩකළපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව;
(xii) 2015 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;
(xiii) 2015 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව;
(xiv) 2015 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්;
(xv) 2015 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන සහ ගිණුම් වාර්තාව;
(xvi) 2015 වර්ෂය සඳහා මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව; සහ
(xvii) 2015 වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මාතර, වල්ගම, විජේතිලකාරාම පාර, අංක 3/6 දරන ස්ථානයෙහි පදිංචි පී.එස්. සේනාරත්න මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම මම පිළිගන්වමි.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු කථානායකතුමනි, අම්පාර, සාමපුර, පී.එම්.බී. නිවාස, අංක 06 දරන ස්ථානයෙහි පදිංචි ජේ.අයි. නොයෙල් පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සම මම ගෞරවයෙන් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න. මම විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, වේලාව ගැන අවධානය යොමු කරන්න කියලා.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව : පණිවුඩකරුවන් බඳවා ගැනීම
இலங்கை புகையிரத திணைக்களம்: ஏவலாளர் ஆட்சேர்ப்பு
DEPARTMENT OF SRI LANKA RAILWAYS: RECRUITMENT OF MESSENGERS

1068/'16

1. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන පණිවුඩකරුවන් ඒකාබද්ධ සේවයට අයත් බවත්;

(ii) පණිවුඩකරුවන් සෘජුව බඳවා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවත්

එතුමා පිළිගන්නේද?

(ආ) (i) 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පණිවුඩකරුවන් බඳවා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලැබුණු දිනය කවරේද;

(iii) එකී අවසරය ලබා දුන් ලිපියේ පිටපතක් සභාගත කරන්නේද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) පණිවුඩකරුවන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරි (පරිපාලන) ගේ ප්‍රධානත්වයෙන්ද;

(ii) එසේ නම්, එකී සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව වනවිටත් එකී නිලධාරියා වැඩ තහනමට ලක්ව සිටි බව පිළිගන්නේද;

(iii) වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකු සේවයේ යෙදී සිටින්නේ කෙසේද

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු මත්‍රුම් සිවිල් විමාන සේවෛකළ් අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) இலங்கை புகையிரத திணைக்களத்தில் பணியாற்றும் ஏவலாளர்கள் ஒன்றிணைந்த சேவையை சேர்ந்தவர்களாவர் என்பதையும்;

(ii) ஏவலாளர்களை நேரடியாக ஆட்சேர்ப்புச் செய்வதற்கு இலங்கை புகையிரத திணைக்களத்திற்கு அதிகாரம் இல்லையென் பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) 2016ஆம் ஆண்டில் இலங்கை புகையிரத திணைக்களத்திற்கு ஏவலாளர்களை ஆட்சேர்ப்பு செய்வதற்கு ஒன்றிணைந்த சேவைகள் பணிப்பாளர் நாயகத்தின் அனுமதி பெறப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வனுமதி கிடைத்த திகதி யாதென்பதையும்;

(iii) மேற்படி அனுமதி வழங்கப்பட்ட கடிதத்தின் பிரதியொன்றைச் சபைக்குச் சமர்ப்பிப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) ஏவலாளர்களை ஆட்சேர்ப்புச் செய்யும் நேர்முகப் பரீட்சை மேலதிக புகையிரத பொது முகாமையாளரின் (நிருவாகம்) தலைமையில் நடாத்தப்பட்டதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நேர்முகப் பரீட்சை நடாத்தப்பட்ட சந்தர்ப்பத்தில் இந்த உத்தியோகத்தர் சேவை இடைநிறுத்தத்திற்கு உள்ளாகியிருந்தார் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) சேவை இடைநிறுத்தத்திற்கு உள்ளாகியுள்ள உத்தியோகத்தரொருவர் சேவையில் ஈடுபடுவது எவ்வாறு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he admit that -

(i) the messengers who work in the Department of Sri Lanka Railways belong to the Combined Service; and

(ii) the Department of Sri Lanka Railways has no power to recruit messengers directly?

(b) Will he inform this House-

(i) whether permission of the Director General of Combined Services was obtained to recruit messengers to the Department of Sri Lanka Railways in the year 2016;

(ii) if so, the date on which the aforesaid permission was obtained; and

(iii) whether a copy of the letter as per which the aforesaid permission was given will be tabled?

(c) Will he also inform this House-

(i) whether the interview for the recruitment of messengers was conducted under the patronage of the Additional General Manager of Railways (Administration);

(ii) if so, whether he admits the fact that the aforesaid officer had been under interdiction even on the occasion when the aforesaid interview was conducted; and

(iii) how an officer who has been interdicted is able to stay in service?

(d) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවේ, ඒකාබද්ධ සේවයට අයත් පණිවුඩකරුවෝ මෙන්ම ඒකාබද්ධ සේවයට අයත් නොවන දෙපාර්තමේන්තුගත පණිවුඩකරුවෝ ද සේවය කරති.

(ii) පණිවුඩකරුවන් බඳවා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන ඇත.

(ආ) (i) ඔව්.

(ii) 2016.08.10 සහ 2016.09.30

(iii) ඔව්.

(ඇ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

දෙපාර්තමේන්තුවක් වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට තමන්ට අනන්‍ය වූ පණිවුඩකරුවන් බඳවා ගැනීමට බලය තිබෙන බව ඔබතුමා පැවසුවා. ඒ බලය පැවරුණු ලිපිය සභාගත කරන්න ඔබතුමා කටයුතු කරනවාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඔව්. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්තුමාගෙන් ලැබුණු ලිපිය මම සභාගත කරන්නම්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා, ඒකාබද්ධ සේවයේ ඉන්න අය පණිවුඩකරුවන් වශයෙන් බඳවා ගන්න පුළුවන්; ඒ වාගේම ඊට අමතරව ඒකාබද්ධ සේවයෙන් පරිබාහිරවත් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පණිවුඩකරුවන් බඳවා ගන්න පුළුවන් කියලා.

මා දන්නා තරමින්, දෙපාර්තමේන්තුවලට ඒකාබද්ධ සේවයෙන් පරිබාහිරව බඳවා ගන්න බැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලාට එසේ බඳවා ගැනීමට අවසර ලැබුණු ලිපිය සභාගත කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩල විස්තර අනුව 2013 වර්ෂයේ පැවැති පුරප්පාඩු සඳහා විශේෂයෙන්ම ඒකාබද්ධ සේවයෙනුත්, ඒකාබද්ධ සේවයෙන් පරිබාහිරවත් බඳවා ගන්න අනුමැතිය ලැබී තිබෙනවා. එම අනුමැතිය ලබා දුන් ලිපිය මා **සභාගත*** කරනවා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 1153/'16 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, on behalf of the Minister of Megapolis and Western Development, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවි බිම්: විස්තර
புத்தளம் மாவட்ட விவசாய நிலங்கள்: விபரம்
AGRICULTURAL LANDS IN PUTTALAM DISTRICT: DETAILS

1186/'16

3. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) පුත්තලම දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය, එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983ත් පසුව 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්මය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) புத்தளம் மாவட்டத்தில்,

(i) 1983ஆம் ஆண்டளவில் செய்கைபண்ணப்பட்ட மொத்த விவசாய நிலங்களின் அளவு யாது;

(ii) 1982 மற்றும் 1983ஆம் ஆண்டுகளில் செய்கைபண்ணப்பட்ட விவசாய நிலங்களின் அளவு ஒவ்வொரு பயிருக்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் 2009ஆம் ஆண்டில் யுத்தநிலைமை முற்றுப்பெறும்வரை செய்கை பண்ணப்பட்ட மொத்த நிலங்களின் அளவு ஒவ்வோராண்டுக்கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(iv) யுத்தநிலைமை முற்றுப்பெற்ற பின்னர் இற்றைவரை செய்கைபண்ணப்பட்ட விவசாய நிலங்களின் அளவு ஒவ்வோராண்டுக் கிணங்கவும் வெவ்வேறாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முழுமையான அறிக்கையொன்றை சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House, in respect of the Puttalam District-

(i) the extent of agricultural land that was under cultivation by the year 1983;

(ii) the extents of land cultivated in the years 1982 and 1983, separately in respect of each crop in each year;

(iii) the total extent of cultivated land in each year after 1983 up until the end of the war situation in 2009, separately;

(iv) the total extent of cultivated agricultural land after the end of the war situation up until now in each year, separately; and

(v) whether he will table a full report on all above?

(b) If not, why?

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluwihare - State Minister of Agriculture)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(අ) (i)

1983 වර්ෂය	
වගාව	වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්ටෙයාර)
වී වගාව	12,302
අතිරේක බෝග වගාව	21,371
එළවලු වගාව	2,590
පලතුරු වගාව	4,716
එකතුව	40,979

(මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

ගරු මන්ත්‍රීතුමනි, (අ) (ii) ප්‍රශ්නයේ පිළිතුර සඳහා ලොකු ලැයිස්තුවක් තිබෙනවා. කියවන්නද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, එක් එක් බෝග වර්ග අවශ්‍ය නැහැ. 1982 සහ 1983 වර්ෂ දෙකේ සමස්ත වගා බිම් ප්‍රමාණය ඔබතුමාට සාරාංශ කර කියන්න පුළුවන්ද? මොකද, ඒ යුද්ධය ආරම්භ වූ මුල් කාලයයි.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

හෙක්ටයාර් ගණන මා කියන්නම්. 1982 වර්ෂයේ වී වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 14,576යි. 1983 වර්ෂයේ වී වගා කරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර් 12,302යි. ඒ සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. එම නිසා (අ) (ii) පිළිතුරේ සිට ඉතිරි කොටස මා සභාගත කරන්නද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
සභාගත කරන්න.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)

ගරු කථානායකතුමනි, පිළිතුරේ (අ) (ii), (iii) කොටස් මා **සභාගත*** කරනවා.

(iv)

වර්ෂය	වර්ෂය තුළ වගා කළ මුළු බිම් ප්‍රමාණය (හෙක්.)
2010	47,365
2011	59,904
2012	41,988
2013	54,767
2014	48,294
2015	57,532
2016	54,294

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව)

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද (අ) (ii) සහ (iii)හි පිළිතුර:
**சபாபீடத்தில் வைக்கப்பட்ட (அ)(ii) மற்றும் (iii) க்கான விடை :*
**Answer tabled for (a) (ii) and (iii):*

(ii)

1982 වර්ෂය		1983 වර්ෂය	
බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
වී	14,576	වී	12,302
අතිරේක බෝග		අතිරේක බෝග	
i කුරක්කන්	392	i කුරක්කන්	421
ii. බඩඉරිඟු	535	ii. බඩඉරිඟු	544
iii. මුං	1921	iii. මුං	2167
iv. කව්පි	7584	iv. කව්පි	7416
v. තල	2845	v. තල	2494
vi. රට්ටක්කු	2552	vi. රට්ටක්කු	2800
vii. මඤ්ඤොක්කා	4211	vii. මඤ්ඤොක්කා	3772
viii. බනල	575	viii. බනල	241
ix. රතුළුණු	207	ix. රතුළුණු	325
x. අමුමිරිස්	1225	x. අමුමිරිස්	1142
xi. ඉඳුල් ඉරිඟු	3	xi. ඉඳුල් ඉරිඟු	0
xii.අර්තාපල්	16	xii. අර්තාපල්	49
උප එකතුව	22,066	උප එකතුව	21,371

1982 වර්ෂය		1983 වර්ෂය	
බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)	බෝගය	වගා කළ බිම් ප්‍රමාණය (හෙක්.)
එලවළු	2,414	එලවළු	2,590
i. අළුකෙසෙල්	1289	i අළු කෙසෙල්	1284
ii. වම්බටු	241	ii. වම්බටු	260
iii. ගෝවා	0	iii.ගෝවා	2
iv. බණ්ඩක්කා	200	iv. බණ්ඩක්කා	204
v. පූහුල්	81	v. පූහුල්	133
vi. කරවිල	79	vi. කරවිල	75
vii. පතෝල	84	vii. පතෝල	72
viii. පිපිඤ්ඤා	59	viii. පිපිඤ්ඤා	59
ix. තක්කාලි	36	ix. තක්කාලි	24
x. රාබු	37	x. රාබු	22
xi. වට්ටක්කා	308	xi. වට්ටක්කා	505
උප එකතුව	2,414	උප එකතුව	2,590
පළතුරු		පළතුරු	4,716
i කෙසෙල්	වාර්තා වී නැත	i කෙසෙල්	1008
ii ගස්කජු	වාර්තා වී නැත	ii ගස්කජු	2541
iii දෙහි	වාර්තා වී නැත	iii දෙහි	101
iv අඹ	වාර්තා වී නැත	iv අඹ	673
v දොඩම්	වාර්තා වී නැත	v දොඩම්	127
vi පැපොල්	වාර්තා වී නැත	vi පැපොල්	79
vii අන්නාසි	වාර්තා වී නැත	vii අන්නාසි	187
උපඑකතුව		උප එකතුව	4,716
වර්ෂය තුළ මුළු වගාබිම් එකතුව	39,056	වර්ෂය තුළ මුළු වගාබිම් එකතුව	40,979

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

සැ යු: 1982 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පළතුරු පිලිබඳ දත්ත වර්තා කර නැත

(iii)

වර්ෂය	වර්ෂය තුළ වගා කළ මුළු බිම් ප්‍රමාණය(හෙක්.)
1984	46,661
1985	43,008
1986	45,623
1987	35,999
1988	40,040
1989	33,568
1990	36,213
1991	36,151
1992	39,328
1993	39,853
1994	44,171
1995	43,677
1996	32,854
1997	30,623
1998	37,510
1999	38,293
2000	34,684
2001	32,521
2002	37,868
2003	45,450
2004	27,084
2005	35,101
2006	37,095
2007	38,143
2008	48,937
2009	55,958

(මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව)

**** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා එක් එක් වර්ෂයට අදාළව පුත්තලම දිස්ත්‍රික්කය පිළිබඳව ඉදිරිපත් කළ වාර්තා අනුව එක වසරක් පමණක් වගා බිම් ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. ඔබතුමා කලිනුත් මේ ප්‍රශ්නවලට උත්තර දුන් නිසා, එයට බලපෑවේ නියඟය හේතුවෙන් ඇතිවුණු තත්ත්වයයි කියා මා විශ්වාස කරනවා. එහෙත් යුද්ධය නිමවීමෙන් පසුව, උතුරු නැඟෙනහිර ප්‍රදේශවලට ලැබුණු සාමය තුළ වගා බිම් ප්‍රමාණය වැඩි වෙලා, ගොවි පවුල් සංඛ්‍යාවටත් විශාල ප්‍රතිලාභයක් ලැබී තිබෙනවා.

මෙය, මම ඊයේත්, පෙරේදා දිනයේත් අහපු අතුරු ප්‍රශ්නයක්. මේ දිස්ත්‍රික්කය පසු ගිය නියං කාලයේදී විශාල වගා හානියකට ලක් වුණා. ඒ වාගේම, පොහොර සහනාධාරය සම්බන්ධ කාරණයකුත් මම විමසුවා. ඒක තමයි, ගොවීන්ට ඒ කන්න දෙකේදී නියමිත කලට පොහොර සහනාධාරය ලැබීම පිළිබඳව මේ පාර්ලිමේන්තුව දැනුවත් කරන්න කියන ඉල්ලීම. මේ වගා හානිවලට ගෙවීම් පිළිබඳ -පුත්තලම දිස්ත්‍රික්කයේ කොයිතරම් පවුල් සංඛ්‍යාවක් වාර්තා වුණාද, පසු ගිය කන්නය වෙනුවෙන් මේ වන විට කොයි තරම් වගා වන්දි ගෙවා තිබෙනවාද කියා- වාර්තාවක් ඉදිරිපත් කරන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු මන්ත්‍රීතුමනි, පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවීන් 4,654කට මේ වගා හානි සම්බන්ධයෙන් අප රුපියල් 10,000 ගණනේ ගෙවා තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගෙවා ඇති සම්පූර්ණ මුදල කීයද, ගරු රාජ්‍ය ඇමතිතුමනි?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
රුපියල් දහනවකෝටි හතළිස්ලක්ෂ තුන්දහස් දෙසියතිහයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒ කියන්නේ, පසු ගිය කන්නයේ?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ඔව්, පසු ගිය කන්නයේ ගෙවලා තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මට තේරුණේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඊළඟ ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගණන නිවැරදිව, නිශ්චිතව කියන්න. මොකක්ද ඔබතුමා කිව්වේ? එක්කෝටිද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
දහනමකෝටි හතළිස්ලක්ෂ තුන්දහස් දෙසියතිහයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
දහනම කෝටි?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ඔව්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා නිවැරදිවමද කිව්වේ?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ඔව්. පුත්තලම දිස්ත්‍රික්කයේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒ වාගේම පොහොර සහනාධාරය ලබන ගොවි පවුල් කොපමණ ප්‍රමාණයක් ඉන්නවාද කියලා දත්ත ඉදිරිපත් කරන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු මන්ත්‍රීතුමා, මම ඒ විස්තර ඉල්ලා තිබෙනවා. ඊළඟ සභා වාරයේදී මට ඒ තොරතුරු ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මම අහනවා. මේක මගේ මූලික ප්‍රශ්නයට අදාළ නොවුණත් අහන්න ඕනෑ. මම ඊයේත්, පෙරේදාත් ඇහුවා, කෘෂිකර්ම අමාත්‍යතුමා මේ පාර්ලිමේන්තුවට එන්නේ නැත්තේ ඇයිද කියන කාරණය.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊයේ පිළිතුරු දුන්නා, එතුමා විදේශගතවෙලා කියලා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒ වැරදි උත්තරයක් දුන්නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
එතුමා විදේශගතවෙලා නේද?

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්ඩලික වසන්ත අලුවිහාර)
(The Hon. Wasantha Aluvihare)
ඔව්, එතුමා විදේශගතවෙලා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
එතුමා විදේශගතවෙලා ඉන්නේ. ඒ නිසා ඒ ගැන argue කරන්න එපා. අද කරන්න තව වැඩ කටයුතු තිබෙනවා.

ඊළඟ ප්‍රශ්නය, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, එතුමා ලංකාවේ ඉන්නවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නයට ඊයේත්, පෙරේදාත් පිළිතුරු දුන්නා ගරු මන්ත්‍රීතුමා. අසාධාරණ වෙන්න එපා. ඇමතිතුමා නැති එක ගැන නේ ඔබතුමා අහන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න පුළුවන්. නමුත්, කලින් අහපු ප්‍රශ්නයට ඊයේ පිළිතුරු දුන්නා. ඊළඟ ප්‍රශ්නය අහන්න මම අවස්ථාව දෙන්නම්. ඒක මට කියන්න අවශ්‍ය නැහැ. තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්] ඔබතුමා ප්‍රශ්නයෙන් පිට යනවානේ. ඒක නේ වැඩේ. හොඳයි, දැන් ප්‍රශ්නය අහන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ කැමැත්ත අනුව මම ඇහුවේ, කෘෂිකර්ම ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට නොපැමිණීම පිළිබඳවයි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒකට ඊයේත් පිළිතුරු දුන්නා, පෙරේදාත් පිළිතුරු දුන්නා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නැහැ. එතුමා ඊයේත්, අදත් අනුරාධපුරයේ ඉන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
හැබැයි, මෙතුමා කියනවා පිට රට ගිහිල්ලා කියලා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
එතුමා විදේශගතවෙලා කියන කථාව බොරු. ඊයේ මේ රටේ මාධ්‍යවලට එතුමා voice cuts දීලා තිබෙනවා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(මාණ්ඩලික වසන්ත අලුවිහාර)
(The Hon. Wasantha Aluvihare)
ඒක බොරු. එතුමා මේ දිනවල විදේශගතවෙලායි ඉන්නේ. වැඩ බලන ඇමතිවරයා හැටියට මම කටයුතු කරනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා අනවශ්‍ය විධියට කටයුතු කරන්න එපා. ඔබතුමා සාධාරණ වෙන්න. ඊයේත් මේ ගරු සභාව තුළදී මම ආයාචනයක් කළා එහෙම කටයුතු කරන්න එපා කියලා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මාධ්‍යයෙන් කියනවා-

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඕනෑ නම්, පිට රට ඉඳලා telephone එකෙන් මාධ්‍යයට voice cuts දෙන්න පුළුවන් නේ.

ගරු ඩලස් අලහප්පෙරුම මහතාගේ 4වන ප්‍රශ්නය අහන්නේ නැද්ද?

ප්‍රශ්න අංක 5-1334/'16-(1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩලික පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගර කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ විෂයභාර අමාත්‍යවරයා ඊයේ මට දුරකථනයෙන් කිව්වා, අද එන්න වෙන්නේ නැති නිසා පිළිතුරු ලබා දීමට කල් ගන්නවා කියලා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරතුරු සමර්පිකක් කට්ටලයිටප්පට්ටු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6-1404/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්ඩලික පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Sustainable Development and Wildlife, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7-1477/'16-(1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of City Planning and Water Supply, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන්: විස්තර
போசாக்கின்மையால் பாதிக்கப்பட்டுள்ள சிறுவர்கள்: விபரம்
CHILDREN SUFFERING FROM MALNUTRITION: DETAILS

1503/'17

8. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ ළමා ජනගහනයෙන් මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව නිගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව ළමා ජනගහනයෙන් කවර ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් දරුවන් සංඛ්‍යාව, සමාජයේ එක් එක් ආදායම් මට්ටම් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පහසුවෙන් රෝගවලට භාජන වීම හේතුවෙන් මියයන බවට වාර්තා වී ඇති මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் சிறுவர் சனத்தொகையில் போசாக்கின்மையால் பாதிக்கப்பட்டுள்ள சிறுவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையை தீர்மானிக்கின்ற முறையியல் யாதென்பதையும்;

(iii) இலங்கையில் போசாக்கின்மையால் பாதிக்கப் பட்டுள்ள சிறுவர்களின் எண்ணிக்கை சிறுவர் சனத்தொகையில் எத்தனை சதவீதம் என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி அ (i) இல் குறிப்பிட்டுள்ள சிறுவர்களின் எண்ணிக்கை, சமூகத்தின் ஒவ்வொரு வருமான மட்டங்கள் வாரியாக தனித்தனியாக யாதென்பதையும்;

(ii) இலகுவாகவே நோய்களுக்கு உள்ளாவதால் மரணிப்பதாக அறியவந்துள்ள போசாக் கின்மையால் பாதிக்கப்பட்டுள்ள சிறுவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) out of the total child population in Sri Lanka, the number of children suffering from malnutrition;

(ii) the methodology used to determine that number; and

(iii) the number of malnourished children in Sri Lanka as a percentage of the child population?

(b) Will he also inform this House-

(i) the number of children mentioned in (a)(i) above according to the levels of income of the society separately; and

(ii) the number of malnourished children reportedly dying after being infected with diseases?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මන්ද පෝෂණයෙන් පෙළෙන දරුවන් කොටස් තුනකි. එම දොටස් තුනට අදාළව තොරතුරු පහත පරිදි වේ.

මන්දපෝෂණ තත්ත්වය	ළමුන් සංඛ්‍යාව
අඩු බර තත්ත්වය (වයසට නිසි බර නොමැති දරුවන්)	243066
මිටි තත්ත්වය (වයසට නිසි දිග/උස නොමැති දරුවන්)	143955
කෘෂ බව (දිග/උසට සරිලන බර නොමැති දරුවන්)	177267

(ii) සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය මඟින් හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය සේවා කාර්යාංශය විසින් සෑම වර්ෂයකදීම පවත්වනු ලබන පෝෂණ මාස සමීක්ෂණය මඟිනි.

(iii)

මන්ද පෝෂණ තත්ත්වය	ප්‍රතිශතය
අඩුබර තත්ත්වය (වයසට නිසි බර නොමැති දරුවන්)	15.6%
මිටි තත්ත්වය (වයසට නිසි දිග/උස නොමැති දරුවන්)	9.2%
කෘෂ බව (දිග/උසට සරිලන බර නොමැති දරුවන්)	11.3%

(ආ) (i) ආදායම් මට්ටම අනුව වෙන් වෙන් වශයෙන් තොරතුරු එක්රැස් කිරීමක් සිදු නොවේ.

(ii) වර්තමානයේ සෘජුව මන්ද පෝෂණය හේතුවෙන් ළමුන් මිය යෑමක් සිදු නොවේ. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් රැස් කරනු ලබන තොරතුරු තුළ මන්ද පෝෂණ තත්ත්වය වක්‍රාකාර ලෙස බලපෑම් හේතුවෙන් සිදුවන ළමා මරණ පිළිබඳ තොරතුරු ඇතුළත් නොවේ.

(ඇ) පැන නොනඟී.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අවසාන වශයෙන් මෙබඳු වාර්තාවක් සකස් කර ප්‍රසිද්ධියට පත් කරන ලද්දේ MRI සහ UNICEF එක්ව 2012 වර්ෂයේ හැටියට අපට ලබා ගත හැකි තොරතුරු අනුව සඳහන් වෙනවා. ඔබතුමා කියනවා, ඊට පසුව සකස් කළ වාර්තාවක් තිබෙනවා කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ වාර්තාව ලබා දීලා තිබෙන්නේ 2016 වර්ෂයේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ වාර්තාව අපේ පුස්තකාලයේවත් නැහැ නේ. අපේ පර්යේෂණ අංශවලත් නැහැ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
අවසාන වාර්තාව 2016 තමයි සකස් කරලා තිබෙන්නේ. ඒක මම ඔබතුමාට එවන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි අවසාන වාර්තාවක් හැටියට තිබෙන්නේ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, කෘෂ වීම, කුරු වීම සහ අඩු බර කියන මේ තුන් වර්ගයට අදාළ ප්‍රතිශතයන් ඔබතුමා වෙන් වෙන්ව කිව්වා. මේවායේ එකතුව වශයෙන් මන්දපෝෂණය ගණන් ගත් විට, ඔබතුමාගේ වාර්තාව අනුව 2016 වර්ෂයේ මන්දපෝෂණය සියයට කීයද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
සියයට 36.1යි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
සියයට 36.1 වන්නේ, ඒ සියල්ල එකට එකතු කළ විට ද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔව්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අමාත්‍යතුමනි, මේ ගණන් බැලීම්වලට මැදිහත් වන්නා වූ අංශ ගැන දැන් ඔබතුමා කිව්වා. එම අංශ සමඟ එකතු වෙලා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් එම කටයුත්ත කරනවා කියා කිව්වා. මගේ ප්‍රශ්නයෙන්, මා ඇහුවේ මේකයි. ඒ ගණන නිගමනය කරන්නේ, ජාතික වශයෙන්ම සාමාන්‍යයක් හැටියටයි. ඒ කියන්නේ, රටේ අවුරුදු 5ට අඩු ළමයින් මෙච්චර ඉන්නවා, ඒ අයගෙන් මෙච්චර සංඛ්‍යාවක් මන්දපෝෂණයට ගොදුරු වනවා කියන එකයි. ඒකට තමයි කියන්නේ, "ජාතික සාමාන්‍යය" කියා. ඒ ජාතික සාමාන්‍යය ගණනය කිරීම සිදු වන්නේ, හොඳින් පෝෂණය ලබන සියලු දරුවන්ද ඇතුළත්වයි. එවිට අඩු ආදායම්ලාභී ජන ගහනයේ මන්දපෝෂණ තත්ත්වය හරියාකාරව පිළිබිඹු වන්නේ නැති බව ඔබතුමා පිළිගන්නවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ ආකාරයට ගණනය කිරීමක් මෙහි කර නැහැ නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු අමාත්‍යතුමනි, එම නිසා ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. ආදායම් දශමක තිබෙනවා. ආදායම් දශමක වශයෙන් ගත්තාම, 10ක් තිබෙනවා. එසේ දශමක වශයෙන් තිබෙන ආදායම් මට්ටම් අනුව මන්දපෝෂණය පිළිබඳව සංඛ්‍යා ලේඛන ගණනය සිදු කිරීමට ඔබතුමා එකඟ වනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
එකඟ වනවා. මම කියන්නම්, මේ අවුරුද්දේදී ඒ අනුව ගණනය කරන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10-1187/'16-(1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

දකුණු පළාතේ වකුගඩු රෝගීන්: විස්තර
தென் மாகாணத்திலுள்ள சிறுநீரக நோயாளிகள்: விபரம்
KIDNEY PATIENTS IN SOUTHERN PROVINCE: DETAILS

1335/'16

11. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1)

(අ) (i) 2015 හා 2016 වර්ෂයන්හිදී දකුණු පළාතෙන් වාර්තා වූ වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අනුව, දකුණු පළාතේ වැඩිම වකුගඩු රෝගීන් පිරිසක් වාර්තාවන දිස්ත්‍රික්කය කවරේද;

(iii) දකුණු පළාතේ වකුගඩු රෝගයට බලපා ඇති ප්‍රධාන හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම වකුගඩු රෝගීන් වෙනුවෙන් රජය ආධාර ලබා දීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ලබා දී ඇති ආධාර කවරේද;

(iii) දකුණු පළාතේ වකුගඩු රෝග නිවාරණයට පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் தென் மாகாணத்தில் அறியக்கிடைத்த சிறு நீரக நோயாளிகளின் எண்ணிக்கை யாது;

(ii) அதன்படி, தென் மாகாணத்தில் ஆகக்கூடிய சிறுநீரக நோயாளிகள் அறியக்கிடைக்கும் மாவட்டம் யாது;

(iii) தென் மாகாணத்தில் சிறுநீரக நோய்க்கு ஏதுவாயுள்ள பிரதானமான காரணங்கள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி சிறுநீரக நோயாளிகளுக்கு அரசாங்கம் உதவி வழங்க நடவடிக்கை மேற்கொண்டுள்ளதா;

(ii) ஆமெனில், அவ்வாறு வழங்கப்பட்டுள்ள உதவிகள் யாவை;

(iii) தென் மாகாணத்தில் சிறுநீரக நோய் நிவாரணத்திற்காக நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா;

(iv) ஆமெனில், அந்நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Will he state that-

(i) the number of kidney patients reported from Southern Province in the years 2015 and 2016;

(ii) therefore, the district of the Southern Province where majority of kidney patients are being reported; and

(iii) main reasons behind the kidney disease reported from Southern Province?

(b) Will he inform this House-

(i) whether the Government has taken measures to provide aid for the kidney patients;

(ii) if so, the aid provided;

(iii) whether measures have been taken to prevent the kidney disease in Southern Province; and

(iv) if so, what such measures are?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2015 වර්ෂයේ - 271 (දෙසිය හැත්තෑඑකක්)
2016 වර්ෂයේ - 1101 (එක්දහස් එකසියඑකක්)
එකතුව - 1372 (එක්දහස් තුන්සියහැත්තෑදෙකක්)

(ii) මාතර දිස්ත්‍රික්කය

(iii) මෙම වකුගඩු රෝගීන්ගෙන් බොහෝ ප්‍රමාණයක් නිදන්ගත වකුගඩු රෝගීන් වන අතර, ඔවුන්ගෙන් වැඩි පිරිසක් දියවැඩියාව, අධි රුධිර පීඩනය, වකුගඩු ආශ්‍රිත ගල් සෑදීම, සහ පුරස්ථි ග්‍රන්ථියේ ඉදිමීම වැනි රෝගවලින් පෙළෙන පුද්ගලයින් බව වෛද්‍යවරුන්ගේ නිරීක්ෂණය වේ.

(ආ) (i) ඔව්.

(ii) වකුගඩු රෝගීන්ගේ විස්තර අඩාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කෙරෙන අතර, සමාජ සේවා හා සුභසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ එක් රෝගියෙක් සඳහා රු.3000යි ගෙවමින් තිබුණේ. ජනාධිපතිතුමාගේ අලුත් නියෝගය අනුව දැනට රුපියල් 5,000 බැගින් ආධාර ගෙවීම සිදු කරයි.

(iii) ඔව්.

(iv)

- 2015 වසරේ සිට රෝගීන් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ සිදුකිරීම ආරම්භ කර ඇත.
- රුධිර කාන්දු පෙරන ඒකක (Dialysis Units) දිස්ත්‍රික්ක තුනම ආවරණය වන පරිදි පිහිටුවීම.
- මෙසේ හඳුනා ගන්නා රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට 2016 වර්ෂයේ තිස්ස, කඹුරුපිටිය, බලපිටිය සහ තංගල්ල මූලික රෝහල්වල අධි උපස්ථාන ඒකක (HDU) සහ වකුගඩු රෝග සායන (Renal Clinic)සඳහා උපකරණ මිල දී ගැනීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සෞඛ්‍ය කාර්ය මණ්ඩල දැනුවත් කිරීම
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිදු කරන වැඩසටහන් සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. වෛද්‍ය විද්‍යාවේ සඳහන් වන "Prevention is better than cure" යන කියමනට මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. ඒ කියන්නේ රෝගයක් හැදුණාම ප්‍රතිකාර කිරීමට වඩා රෝග නිවාරණය තමයි වැදගත්.

හැබැයි, පානීය ජලයේ ඇති Cadmium, Mercury සහ Lead වෙන් කරලා ජලය පිරිපහදු කිරීමේ හැකියාව ලංකාවේ තවමත් සෑම දිස්ත්‍රික්කයකම ජල සම්පාදන යෝජනා ක්‍රමවල නැහැ. ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමවලත් නැහැ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට යටතේ හැම දිස්ත්‍රික්කයමත් ඒ හැකියාව නැහැ. මේ වෙලාවේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමතිතුමාට වම් පැත්තෙන් ජල සම්පාදන ඇමතිතුමාත් ඉන්නවා. එම නිසා මේ අමාත්‍යාංශ දෙක එකතු වෙලා පානීය ජලයේ තිබෙන Cadmium, Mercury සහ Lead ජලයෙන් වෙන් කරලා, ජලය පිරිපහදු කර බොන්න දෙන්න පුළුවන් වන විධියේ යම් කිසි ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යන්න ඔබතුමන්ලාට පුළුවන්කම තිබෙනවාද?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, අපි පරිභෝජනයට ගන්නා පානීය ජලයේ තිබෙන බැර ලෝහ පිළිබඳව අපේ පර්යේෂණාගාරවල දැඩි පරීක්ෂණ ක්‍රියාදාමයක් කර ගෙන යනවා. අපේ පවිත්‍රාගාරවලදී පවිත්‍ර කරලා ලබා දෙන ජලය කෙළින්ම ටැප් එකෙන් පානය සඳහා ගන්න පුළුවන් විධියේ සුදුසු තත්ත්වයක තිබෙන බව අපි සහතික කරනවා. නමුත්, සමහර විට මේ ප්‍රජා ජල සම්පාදන යෝජනා ක්‍රමවලින් කෙළින්ම ජලය භාවිත කිරීමේදී සමහර ප්‍රදේශවල ප්‍රශ්න මතුවනවා. ඒ පිළිබඳවත් අපි දැන් තීරණයක් ගෙන තිබෙනවා. ඒ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විශේෂඥයන් ලබා දීමේ ක්‍රමවේදයක් දැන් අපි හදා ගෙන යනවා. ඒ තුළින් ප්‍රශ්න කීපයකට පිළිතුරු සපයන්න අපට පුළුවන්. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරලා අපේ යම් කිසි සහයෝගයක් ලබා දෙන්න අවශ්‍ය නම්, ඒ අවශ්‍ය තැන්වලදී එය ලබා දෙන්න අපි කටයුතු කරනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය පැන නඟින්නේ පළමු අතුරු ප්‍රශ්නයට ලැබුණු පිළිතුරෙන්මයි.

මාතර දිස්ත්‍රික්කයේ පමණක් ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිවලින් - දැන් නම් ගංවතුරට සහ නාය යෑම්වලට හසු වීම නිසා ටිකක් සෙත්තපෝච්චි වෙලා තිබෙන්නේ. ඒක වෙනම කථාවක්. - සියයට 80කම ජල සාම්පල් පරීක්ෂා කරලා බැලුවාම එහි E. coli තිබෙනවා. වකුගඩු ප්‍රශ්න කියන ඒවා මැදි කාලීනව සහ දිගු කාලීනව ඇති වන ප්‍රශ්න. කෙටි කාලීනව E. coliවල බලපෑම කොහොමද කියලා කවුරුත් දන්නවා.

ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, පානීය ජල බෝතල් ගත්තොත් සමහර බෝතල්වලට ජලය පුරවන්නේ කඩවල් පිටු පස්සේ ක්ෂණිකවයි. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මා ඔබතුමාගෙන් දැනගන්න කැමතියි. ජල බෝතල් අහුළා ගන්නවා, ටැප් එකෙන් වතුර පුරවලා ආපසු ඒ ජල බෝතල් විකුණනවා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ සම්බන්ධයෙන් අපට පැමිණිලි ලැබුණාම අපේ විමර්ශන කණ්ඩායම් ගිහිල්ලා, පානීය ජලය බෝතල් කරන කර්මාන්තශාලා සම්පූර්ණයෙන් සෝදිසි කර බලනවා. ඒගොල්ලන්ගේ අඩු පාඩු තිබෙනවා නම් ඒවා සකසා ගන්න කියා අපි උපදෙස් ලබා දෙනවා. ඊට පසුව පසු විපරම් කිරීමේ කටයුතුත් කරනවා. නමුත් ඔබතුමා කියන විධියේ ප්‍රශ්නයක් යම්කිසි තැනක තිබෙනවාය කියා අපට දැන්වුවොත් අපට ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න පුළුවන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. වර්තමාන ජනාධිපතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයාව සිටියදී ආරම්භ කරපු වැඩ පිළිවෙළක් ඔබතුමාත් ඉදිරියට ගෙනි යනවා. ඒ තමයි, ශ්‍රී ලංකා

[ගරු බුද්ධික පතිරණ මහතා]

නාවික හමුදාවත් එක්ක එකතුවෙලා වකුගඩු රෝගවලින් ජනතාව වළක්වා ගන්න ජලය පවිත්‍ර කරන වැඩ පිළිවෙළ. තිබෙන සම්පත් අනුව හෝ වෙනත් හේතු නිසා මේ වැඩ පිළිවෙළ යම් යම් ප්‍රදේශවල පමණයි ක්‍රියාත්මක වෙන්නේ. මේ වනකොට යුද්ධයත් නැති නිසා මේ වැඩ පිළිවෙළ ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කරන්න. නාවික හමුදාව ඒ සඳහා තමුන්ට පුළුවන් උපරිම ශක්තිය සහ දායකත්වය ලබා දෙන නිසාත්, සෞඛ්‍ය අමාත්‍යාංශය සාධනීය සහයෝගය ලබා දෙන නිසාත් ඒ කටයුත්ත දීප ව්‍යාප්තව හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම - විශේෂයෙන් තර්ජිත වකුගඩු රෝග හඳුනා ගන්නා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සියල්ල ආවරණය වන පරිදි - ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඇත්තටම අපි නාවික හමුදාවේ ඉංජිනේරු අංශයට ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. ඔවුන් ඔවුන්ගේ තාක්ෂණික ඥානය යොදලා, අපට ඉතාම හොඳ තත්ත්වයේ RO Plants සකස් කරලා දුන්නා. ඉස්සර අපේ අමාත්‍යාංශය RO Plant එකක් ගෙන්වන්න රුපියල් ලක්ෂ තුනක් වියදම් කළා. අද අපි නාවික හමුදාවට කියලා රුපියල් 25,000කට ඒ ගුණාත්මකභාවයම තිබෙන RO Plants හදවා ගන්නවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා එදා අපි RO Plant එකක් මිලදී ගත්ත රුපියල් ලක්ෂ තුනක මුදලකට අද RO Plants 12ක් මිලදී ගන්නවා. ඒ නිසා RO Plants ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නවත්වලා, මුළු ඇණවුම නාවික හමුදාවට භාර දුන්නා. ඒ වාගේම අපි මහ රෝහලට Medical RO Plant එකක් හදවා ගත්තා. ඉස්සර අපි ඒ සඳහා රුපියල් මිලියන 13ක් වියදම් කළා. මේ වතාවේ ඒ සඳහා වියදම් කළේ, රුපියල් මිලියන 1.8යි. එදා වියදම් කළ මුදලෙන් 1/10ක පමණ මුදලකට ඒ ගුණාත්මකභාවයම තිබෙන Medical RO Plant එකක් හදවා ගත්තා. ඒ වාගේම තවත් දෙයක් වෙනුවෙන් අපි නාවික හමුදාවට ගරු කරන්න ඕනෑ. තැලසීමියා රෝගීන් සඳහා ලබා දීමට අපට නික්ෂේපණ උපකරණය අවශ්‍ය වෙනවා. දුප්පත් තැලසීමියා රෝගීන් ඉන්නවා. ඒ උපකරණය රුපියල් 75,000ක් වෙනවා. මම නාවික හමුදාවේ ඉංජිනේරු අංශයත් එක්ක ඒ ගැන කථා කළා. දැන් ඒ ගොල්ලන් රුපියල් 15,000කට ඒ උපකරණය හදලා දෙනවා. ඒ රුපියල් 15,000 මම ගෙවලා, තැලසීමියා රෝගීන්ට අද ඒවා නොමිලේ ලබා දෙනවා. ඒ උපකරණය දැන් නොමිලේ ලබා දෙන්න පුළුවන්. මොකද, එදා එක උපකරණයක් සඳහා වැය කළ මුදලට අද නාවික හමුදාවෙන් හදන උපකරණ පහක් මිලදී ගන්න පුළුවන් නිසා. රෝගීන් පවා ඒ ගැන කථා කරනවා. ඒ උපකරණය ඉතාම උසස් තලයක තිබෙනවා. ඒ කටයුත්ත ආරම්භ කරනකොට නම් ඒ කොම්පැනි මඟින් විශාල ප්‍රචාරයක් සිදු කරලා ඒ රෝගීන් නොමඟ යැව්වා. නමුත් දැන් ඒ රෝගීන් ඉතාම සතුටෙන් කථා කරනවා. ඒ වාගේම ඒ මඟින් අපි විශාල මුදලක් ඉතුරු කර ගත්තා. සාමාන්‍ය RO Plant එක වාගේ නොවෙයි, Medical RO Plant එක හදන්න අධි තාක්ෂණික දැනුමක් තිබෙන්න ඕනෑ. නමුත් ඒ ගොල්ලන් ඒක ඉතාම හොඳට කරලා තිබෙනවා. අපි ජාතික රෝහලට ඉතාම අඩු මුදලකට ඒ උපකරණය මිලදී ගත්තා. අපට වැය වුණේ රුපියල් මිලියන 1.8යි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 12-1406/'16-(1), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මූලධන සහ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ අරමුදල්: අමාත්‍යාංශ භාවිත කළ ප්‍රතිශතය
மூலதன மற்றும் மீண்டுவருஞ் செலவுக்காக ஒதுக்கிய நிதி: அமைச்சுகளின் பயன்பாட்டு வீதம்
FUNDS ALLOCATED FOR CAPITAL AND RECURRENT EXPENDITURE: PERCENTAGE USED BY MINISTRIES

1505/'17

13. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2016 වර්ෂයේදී,

(i) මූලධන වියදම් සඳහා වෙන් කළ අරමුදල් වැඩිම ප්‍රතිශතයකින් භාවිත කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(ii) මූලධන වියදම් සඳහා වෙන් කළ අරමුදල් අඩුම ප්‍රතිශතයකින් භාවිත කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(iii) පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ අරමුදල් වැඩිම ප්‍රතිශතයකින් භාවිත කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(iv) පුනරාවර්තන වියදම් සඳහා වෙන් කළ අරමුදල් අඩුම ප්‍රතිශතයකින් භාවිත කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(v) වෙන් කළ අරමුදල් වැඩිම ප්‍රතිශතයකින් භාවිත කර ඇති අමාත්‍යාංශ 05 කවරේද;

(vi) වෙන් කළ අරමුදල් අඩුම ප්‍රතිශතයකින් භාවිත කර ඇති අමාත්‍යාංශය 05 කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2016 ஆம் ஆண்டில்,

(i) மூலதனச் செலவிற்காக ஒதுக்கப்பட்ட நிதியில் ஆகக் கூடுதலான சதவீதத்தைப் பயன்படுத்தியுள்ள 05 அமைச்சுக்கள் யாவையென்பதையும்;

(ii) மூலதனச் செலவிற்காக ஒதுக்கப்பட்ட நிதியில் ஆகக் குறைந்த சதவீதத்தைப் பயன்படுத்தியுள்ள 05 அமைச்சுக்கள் யாவையென்பதையும்;

(iii) மீண்டுவரும் செலவிற்காக ஒதுக்கப்பட்ட நிதியில் ஆகக் கூடுதலான சதவீதத்தைப் பயன்படுத்தியுள்ள 05 அமைச்சுக்கள் யாவை யென்பதையும்;

(iv) மீண்டுவரும் செலவிற்காக ஒதுக்கப்பட்ட நிதியில் ஆகக் குறைந்த சதவீதத்தைப் பயன் படுத்தியுள்ள 05 அமைச்சுக்கள் யாவை யென்பதையும்;

(v) ஒதுக்கப்பட்ட நிதியில் ஆகக் கூடிய சதவீதத்தைப் பயன்படுத்தியுள்ள 0 5 அமைச்சுக்கள் யாவையென்பதையும்;

(vi) ஒதுக்கப்பட்ட நிதியில் ஆகக் குறைந்த சதவீதத்தைப் பயன்படுத்தியுள்ள 0 5 அமைச்சுக்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House -

(i) the five Ministries that have used the highest percentage of the funds allocated for Capital Expenditure;

(ii) the five Ministries that have used the lowest percentage of the funds allocated for Capital Expenditure;

(iii) the five Ministries that have used the highest percentage of the funds allocated for Recurrent Expenditure;

(iv) the five Ministries that have used the lowest percentage of the funds allocated for Recurrent Expenditure;

(v) the five Ministries that have used highest percentage of allocated funds; and

(vi) the five Ministries that have used lowest percentage of allocated funds? in the year of 2016?

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය	ප්‍රතිශතය (%)
123	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	99.40%
101	බුද්ධ ශාසන අමාත්‍යාංශය	97.21%
158	රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය	96.88%
119	විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය	95.33%
124	සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය	94.72%

(ii)

වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය	ප්‍රතිශතය (%)
167	විශේෂ කාර්යභාර අමාත්‍යාංශය	11.54%
122	පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	17.45%
195	සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය	37.65%
162	මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	42.49%
159	සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය	45.52%

(iii)

වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය	ප්‍රතිශතය (%)
150	ධනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය	99.45%
154	ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය	99.42%
108	තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය	99.37%
155	පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	99.25%
130	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය	99.24%

(iv)

වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය	ප්‍රතිශතය (%)
126	අධ්‍යාපන අමාත්‍යාංශය (අ)	28.81%
165	ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය	60.56%
167	විශේෂ කාර්යභාර අමාත්‍යාංශය	70.02%
162	මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	74.19%
120	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	79.34%

(v)

වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය	ප්‍රතිශතය (%)
130	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය	99.22%
123	නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය	98.89%
108	තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය	98.17%
158	රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය	95.77%
119	විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය	95.27%

(vi)

වැය ශීර්ෂ අංකය	අමාත්‍යාංශය	ප්‍රතිශතය (%)
126	අධ්‍යාපන අමාත්‍යාංශය	31.96%
167	විශේෂ කාර්යභාර අමාත්‍යාංශය	37.35%
162	මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	43.79%
159	සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය	59.64%
198	වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය	60.93%

(ආ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. බොහෝ අමාත්‍යවරුන් චෝදනා නඟනවා අරමුදල් අඩු ප්‍රතිශතයකින් භාවිත වීමට ප්‍රධානම හේතුව වී ඇත්තේ මුදල් අමාත්‍යාංශය නිසි කලට මුදල් නිදහස් නොකිරීමයි කියා. ඔබතුමා එම මතයට එකඟ වෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මම ඒ මතයට එකඟ වෙන්නේ නැහැ. එක් එක් අමාත්‍යාංශවලට මුදල් වියදම් කිරීමට හැකි වීමට හෝ නොහැකි වීමට හුඟාක් හේතු තිබෙනවා. මම හිතන්නේ ඒක සංකීර්ණ ප්‍රශ්නයක්.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

අමාත්‍යාංශ අරමුදලෙන් බොහෝ විට පුනරාවර්තන වියදම් සිදු වෙනවා. නමුත් මූලධන වියදම් සිදු වෙන්නේ නැහැ. ඒ හේතුව නිසා තමුන්නාන්සේලා පුනරාවර්තනයට වෙන් කරන මුදලත් නාස්තියක් වෙන්නට පුළුවන්. මුදල් වියදම් නොකිරීමට බලපා ඇති හේතු පිළිබඳව මුදල් අමාත්‍යාංශයෙන් අධ්‍යයනයක් කර තිබේද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මම හිතනවා මේක අමාත්‍යාංශයෙන් අමාත්‍යාංශයට වෙන වෙනම බැලිය යුතුයි කියලා. උදාහරණයක් හැටියට අධ්‍යාපන අමාත්‍යාංශයට රුපියල් බිලියන 171ක මුදලක් වෙන් කර තිබෙනවා. වියදම් කළ මුදල ලෙස තිබෙන්නේ රුපියල් බිලියන 49යි. ප්‍රතිශතයක් හැටියට ගත්තොත් ඒ ගණන බොහොම අඩුයි. නමුත් මෙතැන තිබෙන මූලික ප්‍රශ්නය තමයි, නාමික අගයන් ඇතුළු කරලා තිබීම. ජාතික පාසලක් කුලියට දෙනවා නම් ඒක ආදායමක් හැටියට ඇතුළු කරලා තිබෙනවා.

පළාත් සභා පාසල් කුලියට දෙනවා නම්, ඒක ආදායමක් හැටියට ඇතුළු කරලා තිබෙනවා. ඒකට වියදමක් නැහැ. එතකොට මේ ප්‍රතිශතය අඩු වෙනවා. නමුත්, මම ඒ ගැන සොයා බලා තිබෙන නිසා, ඒක සකස් කරගෙන යනවා. ලබන අවුරුද්දේ එහෙම වෙන්නේ නැහැ. ඒක ආදායමක් හැටියට පෙන්වන්නෙත් නැහැ. මම කිව්වා වාගේ මේ ප්‍රශ්නය ටිකක් සංකීර්ණයි. මේ සඳහා සුළු පිළිතුරක් නැහැ.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

මම අමාත්‍යතුමාගෙන් පුංචි ඉල්ලීමක් කරන්න කැමැතියි. මෙම පිළිතුරේ පිටපතක් ලබා දෙන්න පුළුවන් නම් ලොකු උදව්වක් වෙනවා. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. අමාත්‍යාංශයකට ඊළඟ වසරේ මුදල් වෙන් කිරීමේදී එම අමාත්‍යාංශය අරමුදල් භාවිත කිරීමේ කාර්යක්ෂමතාව නිර්ණායකයක් ලෙස භාවිත කරනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මම හිතන විධියට අපට ඒ වැඩ පිළිවෙළ තව දියුණු කළ හැකියි. ඉස්සර පාර්ලිමේන්තුවට වසරකට වතාවක් පමණයි මූල්‍ය පිළිබඳ වාර්තා ලබා දුන්නේ. ඊට පසුව මාස හයකට වතාවක් මුදල් අමාත්‍යාංශය වාර්තාවක් ලබා දෙනවා. දැන් අපි මාස තුනකට වතාවක් වාර්තාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාර්තාව ඉදිරිපත් කරනවා නම් ප්‍රගතිය බලන්න අපි අනිවාර්යයෙන්ම එම නිර්ණායක සකස් කළ යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. බොහොම ස්තුතියි.

මඩකළපුව කළපුවෙහි මඩ කැණීමේ ව්‍යාපෘතිය: යළි ඇරඹීම
மட்டக்களப்பு கடல் மணல் படுக்கைக்கு அண்மையிலான மண் அகழ்தல் கருத்திட்டம்: மீள ஆரம்பித்தல்
DREDGING PROJECT IN BATTICALOA LAGOON: RE-COMMENCEMENT

1731/'17

14. ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) 1980 වර්ෂයේදී මඩකළපුව කළපුවෙහි වැලිපරය ආසන්නයෙහි මඩ කැණීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ බවත්;

(ii) තුස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතරමැද දී නවතා දැමූ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මුහුදු සහ කලපුව සම්බන්ධ කෙරෙන මුවදොර වාර්ෂිකව වසා දැමීමට සිදු නොවීම;

(ii) කළපු ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන්ගට මුළු අවුරුද්ද පුරාම ප්‍රතිලාභ ලැබීමට හැකිවීම;

(iii) ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයේ යෙදෙන බෝට්ටුවලට සහ ට්‍රෝලර් යාත්‍රාවන්ට නැංගුරම් ලැම සඳහා කළපුව වෙත පහසු ප්‍රවේශය;

(iv) ගංවතුර ඉතා ඉක්මනින් මුහුද වෙත ඇදෙන බැවින් ගංවතුර කාලයේදී වී වගා කරන කුඹුරුවලට හානි සිදු නොවීම;

(v) ගංවතුර ඉතා පහසුවෙන් මුහුද වෙත ඇදී යාම නිසා රජය මඟින් සිදුකළ යුතු ගංවතුර සහන කටයුතු අවම වීම;

යන ප්‍රතිලාභයන් මෙම ව්‍යාපෘතියෙහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන බවත්, එතුමා දන්නේද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය නැවත ඇරඹීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1980ஆம் ஆண்டில் மட்டக்களப்பு கடல் மணல் படுக்கைக்கு அண்மையில் மண் அகழ்தல் கருத்திட்டமொன்று இடம்பெற்றது என்பதையும்;

(ii) பயங்கரவாதச் செயற்பாடுகளின் நிமித்தமாக அக்கருத்திட்டம் அரைவாசியில் நிறுத்தப்பட்டது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) கடலையும் வாவியையும் இணைக்கும் வாய் வருடாந்தம் மூடப்படாதிருத்தல்;

(ii) வருடம் பூராவும் வாவியில் மீன் பிடிக்கும் மீனவர்கள் மீன்பிடி நன்மையைப் பெற்றுக் கொள்ளல்;

(iii) ஆழ்கடல் மீன் பிடிக்கும் படகுகளும் இழுவைப் படகுகளும் நங்கூரமிடுவதற்கு இலகுவாக வாவிக்குள் வரக்கூடியதாக இருத்தல்;

(iv) வெள்ள நீர் விரைவாக கடலுக்குள் செல்வதால் வெள்ளத்தின்பொழுது நெல் வயல்கள் சேதமடையாதிருத்தல்;

(v) வெள்ள நீர் இலகுவாக கடலுக்குள் செல்வதால் அரசாங்கத்தால் மேற்கொள்ளப்பட வேண்டிய வெள்ள நிவாரண முயற்சிகள் குறைவடைதல்;

என்பன இக்கருத்திட்டத்தின் மூலம் கிடைக்கும் நன்மைகள் என்பதை அவர் அறிவாரா?

(இ) (i) இக்கருத்திட்டத்தை மீள ஆரம்பிக்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) அவ்வாறாயின், அது எப்போது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல் ஏன்?

asked the Minister of Fisheries and Aquatic Resources Development:

(a) Is he aware that-

(i) a project of dredging Batticaloa lagoon closer to the sand bar had taken place in 1980; and

(ii) this project was stopped half-way due to terrorist activities?

(b) Is he also aware that the outcome of this project will have the following benefits-

(i) there will not be annual closing of the mouth that connects the sea and lagoon;

(ii) lagoon fisherrmen will have the fishing benefits throughout the year;

(iii) deep sea fishing boats and trawlers will have easy access to lagoon for anchoring;

(iv) paddy fields will not be damaged during floods as flood water will be quickly drawn to the sea; and

(v) flood water will easily be drawn to the sea minimizing flood relief efforts to be undertaken by the Government?

(c) Will he inform this House-

(i) whether action will be taken to re-commence this project; and

(ii) if so, when?

(d) If not, why?

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i), (ii), (iii), (iv) හා (v) ඔව්. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ නම් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත හැකිව තිබුණි.

(ඇ) (i) නැත.

(ii) පැන නොනඟී.

(ඈ) දැනට මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කටයුතු කර නැත. කෙසේ වුවද, ධීවර ප්‍රජාවගේ අවශ්‍යතාවන් මත ශක්‍යතා අධ්‍යයනයකින් පසුව මේ පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බව සිතමි. එසේ නොමැතිව මෝයකට විවෘත කළහොත් පාරිසරික ගැටලු ඇති විය හැකි බැවින් ඒ පිළිබඳව පූර්ණ හා විද්‍යාත්මක අධ්‍යයනයක් කළ යුතු වේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවාද?

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Yes, Sir.

Thank you, Hon. State Minister for the reply given. Every year during the monsoon season, this area gets flooded and the farmers get affected. So, if this mouth can be opened and the lagoon can be dredged, it will be very helpful to the farmers and to the entire Batticaloa District. If you could kindly look into this matter and re-commence this project it will be very much appreciated by the people of Battlicaloa.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඇමතිතුමා ඒ අතුරු ප්‍රශ්නයට උත්තර දෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ උත්තරය දීලා ඉවරද, ගරු රාජ්‍ය ඇමතිතුමා.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ ගැන කියන්න මම විස්තරයක් අද රැගෙන ආවේ නැහැ. ඇමතිතුමා ඒ ප්‍රශ්නයට උත්තර දෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is that all right? The Hon. Minister will give you a reply later. Are you satisfied with that, Hon. Member?

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
It is okay. I will follow it up, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 15. ගරු බුද්ධික පතිරණ මැතිතුමා. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, සෞඛ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්නය අහන්න කලින් ධීවර රාජ්‍ය ඇමතිතුමාගෙන් එක අතුරු ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ කැමැත්ත ඇතිව අහන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, එක අතුරු ප්‍රශ්නයක් අහනවාට කැමැතියි නේද?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අහන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මාතර, ගාල්ල, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනේම ධීවර ජනතාවට අදාළ ප්‍රශ්නයක්. එකක් තමයි ගං මෝයවල් පිළිබඳ ප්‍රශ්නය. විශේෂයෙන්ම නිල්වලා ගඟ මෝය කටෙත් මේ ප්‍රශ්නය තිබෙනවා. ගිං ගඟේත් මේක අඩු වැඩි වශයෙන් තිබෙනවා. ඒක නිසා මේ පිළිබඳව යම් කිසි ඒකාබද්ධ වැඩ පිළිවෙළකට යන්න අමාත්‍යාංශයට මැදිහත් වෙන්න පුළුවන්ද?

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ ගැන ගරු ඇමතිතුමා එක්කත්, නිලධාරීන් එක්කත් සාකච්ඡා කර බලා අවශ්‍ය පරිදි කටයුතු කරනවා. මාතර විතරක් නොවෙයි, මේ ප්‍රශ්නය හම්බන්තොට දිස්ත්‍රික්කයේත් තිබෙනවා. ඒ නිසා අපි විවෘතව සාකච්ඡා කර බලා ඒ සඳහා වෙනම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

හෘද රෝගීන් සඳහා භාවිත කරන "ස්ටෙන්ට්ස්" : විස්තර
இருதய நோயாளிகளுக்கான 'ஸ்டென்ட்ஸ்' : விபரம்
STENTS USED FOR HEART PATIENTS: DETAILS

1336/'16

15. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) රජයේ රෝහල් සඳහා වර්ෂයකට අවශ්‍ය වන හෘදය වස්තුවෙහි නාළ අවහිරතා මහහැරවීම සඳහා භාවිත කරනු ලබන "ස්ටෙන්ට්ස්" සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන මුදල කොපමණද;

(iii) ඉදිරියේදී හිඟයකින් තොරව මෙම "ස්ටෙන්ට්ස්" රෝගීන් වෙත ලබා දීමට අවශ්‍ය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) හදවත් රෝගීන් සඳහා අවශ්‍ය වෙනත් ඖෂධ වර්ග හා උපකරණ රජයෙන් නොමිලේ ලබා දීමට බලාපොරොත්තු වන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க வைத்தியசாலைகளுக்கு ஆண்டொன்றுக்குத் தேவையான இருதய நாளங்களின் தடையை நீக்குவதற்குப் பயன்படுத்தப்படும் "ஸ்டென்ட்ஸ்" களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(ii) இதற்காக செலவிடப்படும் பணத்தொகை எவ்வளவென்பதையும்;

(iii) எதிர்காலத்தில் தட்டுப்பாடின்றி மேற்படி "ஸ்டென்ட்ஸ்" களை நோயாளிகளுக்கு பெற்றுக் கொடுப்பதற்குத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனின், அந்நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) இருதய நோயாளர்களுக்குத் தேவையான வேறு ஒளடத வகைகள் மற்றும் உபகரணங்களை அரசாங்கத்தினால் இலவசமாகப் பெற்றுக் கொடுப்பதற்கு எதிர்ப்பார்க்கப் படுகின்றதா என்பதையும்;

(ii) ஆமெனின், அவை யாவையென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House -

(i) the number of stents Government hospitals need annually for treating patients with narrow arteries in the heart;

(ii) the amount of money that is spent annually on that;

(iii) whether necessary steps have been taken to provide heart patients with these stents without any shortage in future; and

(iv) if so, of the nature of the steps that have been taken?

(b) Will he also inform this House -

(i) whether Government expects to provide free of charge other medicines and devices required by heart patients; and

(ii) if so, of the names of such medicines and devices?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 8,000කි.

(ii) රුපියල් මිලියන 640කි.

(iii) ඔව්.

(iv) * 2016 සැප්තැම්බර් සිට 2017 ජනවාරි දක්වා වෛද්‍ය සැපයීම් අංශය විසින් මෙම stents ප්‍රාදේශීයව මිලදී ගෙන රෝහල්වලට සපයා දීමට කටයුතු කර ඇත.

* සෑම වර්ෂයකම අවසානයේ ඉතිරි තොග සහ ලැබීමට නියමිත තොග සියල්ල සැලකිල්ලට ගනිමින් වාර්ෂික අවශ්‍යතාව, සුදුසු සැපයුම් කාල සටහනක් යටතේ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ඊළඟ වර්ෂයට ලබා ගැනීම තුළින් අලුතින් නිෂ්පාදිත stents තොග අඛණ්ඩව රෝගීන්ට ලබා දීමට කටයුතු කෙරේ.

* පරිභෝජනය වැඩි වීම හෝ වෙනත් හේතූන් මත රෝහල්වල ඇති වන සැපයුම් ඌනතාව මහ හරවා ගැනීම සඳහා රෝහල් මට්ටමින් රෝගී ප්‍රතිකාර අවශ්‍යතාවන් මත අවස්ථාවෝචිතව ප්‍රාදේශීයව මිලදී ගැනීමට වෛද්‍ය සැපයීම් අංශය මඟින් අනුමැතිය ලබා දීම සිදු වේ.

* ඉදිරියේදී වඩා කාර්යක්ෂමව කාර්ය සිදුවන අවස්ථාවේදීම අවශ්‍ය මිනුමෙන් යුත් අයිතම ලබා දීමටත්, අනවශ්‍ය මිනුම්වලින් යුත් තොග ඉතිරිවීම වළක්වා ගැනීමටත් මධ්‍යම රජයෙන් ටෙන්ඩර් කැඳවා මිල නියම කොට රෝහල් මඟින් ඒ අවස්ථාවේදී වඩා සුදුසු අයිතමය තෝරා මිලදී ගැනීමට ක්‍රමයක් හඳුන්වා දීමට නියමිතය.

(ආ) (i) ඔව්.

(ii) හදවත් රෝගීන් සඳහා අවශ්‍ය අනුමත ඖෂධ නාමාවලියෙහි ඇතුළත් -formulary එකේ තිබෙන - සියලුම ඖෂධ සහ උපකරණ නොමිලේ ලබා දෙනු ලබයි.

(ඇ) පැන නොනඟී.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වන ගමන් මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, දැන් එක පැත්තකින් හෘදය රෝගීන්ට stents ලබා දීම සිද්ධ කරනවා. ඒ විතරක් නොවෙයි, අක්ෂි කාව ලබා දීමේ වැඩ පිළිවෙළත් ආරම්භ කළා. හැබැයි, ඔබතුමා කොපමණ අවවාද කළත් ඇතැම් අක්ෂි සායනවලදී රජය අනුමත කර ලබා දෙන කාව රෝගීන්ට ලබා දීලා ඒ වෛද්‍ය කාර්ය මණ්ඩල පිරිස විසින්ම ඒ රෝගියා මානසිකව වැටෙන -depressed තත්ත්වයට පත්වන- විධියේ කථා කියනවා. "මේ අක්ෂි කාව අවුරුද්දයි, දෙකයි තිබෙන්නේ. මේවායේ ගැටලු ඇති වෙනවා" කියලා, අසවල් pharmacy එකෙන් අවශ්‍ය අක්ෂි කාව අරගෙන එන්නය කියනවා. මාතර දිස්ත්‍රික්කයේ තවමත් මේ තත්ත්වය ප්‍රායෝගිකව තිබෙනවා. යථාර්ථය ඒකයි. ඒ නිසා මෙම අක්ෂි කාව ලබා දීමට සාපේක්ෂව ඇති වන මෙවැනි තත්ත්වයන් වැළැක්වීම සම්බන්ධයෙන් අපට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගය මොකක්ද ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඔබතුමා ඒ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. අපි ලබා දෙන අක්ෂි කාව ඇමෙරිකාවෙන් ලංකාවට ගෙන්වන ඉතා ඉහළ මිලක් තිබෙන ඒවා. ඕනෑම අක්ෂි වෛද්‍යවරයකු ඒක දන්නවා, සමාගමේ නම කිව්වොත්. මා ඒ සමාගමේ නම කියන්නේ නැහැ. ඒවා ඉතාම අනර්ඝ තත්වයේ තිබෙන අක්ෂි කාව.

මොකද, ඒවා තෝරන්නේ Eye Surgeonsලා මිසක්, අපි නොවෙයි. Stents තෝරන්න මම Cardiologistsලාට බාර දුන්නා. මම ඒ අයට කිව්වා, හොඳම stent එක තෝරලා දෙන්න කියලා. මොකද, මේක ශරීරය තුළට දමන එකක් නිසා. අක්ෂි කාවවලින් හොඳම එක තෝරලා දෙන්න කියලා මම Eye Surgeonsලාට බාර දුන්නා. ඒක නිසා කාටවත් කියන්න බැහැ, මේ stents දෙවැනි පෙළේ ඒවා, තුන්වැනි පෙළේ ඒවා කියලා. ලංකාවේ තිබෙන අනර්ඝතම අක්ෂි කාව සහ stents වර්ගයි අපි පාවිච්චි කරන්නේ.

ගරු කථානායකතුමනි, අපි මතක තියාගන්න ඕනෑ අනෙක් කාරණය තමයි අපි stent එකක් වෙළෙඳ පොළෙන් ගන්න ගියොත් රුපියල් ලක්ෂ තුනක් හෝ තුනහමාරක් වියදම් කරන්න වෙනවාය කියන එක. වෙනදා කෙනෙකුට stents තුනක් දාන්න වුණා නම් වුණේ මොකක්ද? ඔහුට රුපියල් මිලියනයක් විතර ඕනෑ stents තුනක් දාන්න. සමහර විට ඔහු මිය යන්නත් පුළුවන්. මොකද, ඔහුට රුපියල් මිලියනයක් සොයා ගන්න බැරි නිසා. නමුත්, අද ඒ සියලුම දේවල් නිකම් දෙන්නේ. රුපියල් ලක්ෂ තුනක් වන ඒ stent එකක් අපි ආණ්ඩුවේ ටෙන්ඩර් පටිපාටිය හරහා අද රුපියල් 75,000කට ගන්නවා. මොකද, අපි එක වතාවකට stents 8,000ක් විතර ගන්න නිසා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි අපි සියලුම රෝහල්වලට tenecteplase 40 mg බෙහෙත ලබා දෙනවා. ගරු කථානායකතුමනි, heart attack -myocardial infarction- එකක් හැදුණු රෝගියෙකු රෝහලට ගෙනාවාම ඒ රෝගියාට නිසි ප්‍රතිකාරයක් මෙතෙක් තිබුණේ නැහැ. නමුත්, දැන් ලෝකයේ සොයා ගෙන තිබෙනවා, te

necteplase 40 mg කියලා බෙහෙතක්. පැය දෙකක් ඇතුළත රෝගියාට ඒ එන්නත දුන්නාම එම රෝගියා ක්ෂණිකව සම්පූර්ණයෙන්ම සනීප වෙලා ඒ තැනැත්තාට ඇවිදගෙන ගෙදර යන්න පුළුවන්. වාට්ටුවේ නැවතිලා ඉන්න අවශ්‍යත් නැහැ. ඒ වාගේම, reteplase කියලා බෙහෙතක් තිබෙනවා. ඒක දෙන්නේ අංශභාග රෝගීන්ටයි. ඒ කාලයේ නම් කෙනෙක් අංශභාග රෝගියෙක් වුණොත් ඒ තැනැත්තාට ජීවිත කාලය පුරාම අංශභාග රෝගියෙක් විධියටයි ඉන්න සිද්ධ වුණේ. නමුත් අද එවැනි රෝගියෙක් පැයක් ඇතුළත රෝහලට ඇතුළත් කරලා මේ reteplase බෙහෙත දුන්න හැටියේ ඔහුට ඇවිදගෙන ගෙදර යන්න පුළුවන් තරම් සුවයක් ලැබෙනවා; ඔහු කවදාවත් අංශභාග රෝගියෙක් විධියට සිටින්නේ නැහැ; සම්පූර්ණ සුවය ලබනවා. මේ කාරණය අපේ Cardiologistsලා ඉදිරිපත් කරපු වෙලාවේ මම වහාම රුපියල් මිලියන 552ක් වියදම් කරලා මේ බෙහෙත ආනයනය කළා. මේ tenecteplase 40 mgවලට විතරක් අපි රුපියල් මිලියන 552ක් වියදම් කරලා ගෙනැල්ලා අද වන විට සියලුම රෝහල්වලට ඒ බෙහෙත් ලබාදී තිබෙනවා. Reteplase බෙහෙත කලින් දුන්නේ ජාතික රෝහලේ විතරයි. අද වන විට හැම රෝහලකටම අපි ඒවාත් දීලා තිබෙනවා; කුඩා රෝහල්වලටත් දීලා තිබෙනවා. අංශභාග රෝගියෙක් රෝහලට ඇතුළත් කරපු ගමන් වෛද්‍යවරයාට පුළුවන් එම බෙහෙත රෝගියාට ලබා දෙන්න. ඒ බෙහෙත දුන්නාම එම ලෙඩාට ඇවිදගෙන ගෙදර යන්න පුළුවන් තත්ත්වයකට පත් වනවා.

අපි ලබා දෙන stents වර්ග ඇතුළු මේ සියලුම දේවල් ඉතාමත්ම හොඳ වර්ගයේ ඒවා කියලා අපි සහතික වෙනවා. මේ පිළිබඳව වාර්තාව ඊයේ මට ලබා දුන්නා. ඒ වාර්තාවට අනුව stent එකක් වෙළෙඳ පොළේ රුපියල් ලක්ෂ තුනක්, තුනහමාරක් වෙනවා. අපි එන සුමානයේ ගැසට් කරනවා, ඖෂධීය stent එක රුපියල් 105,000කට මිල නියම කර. එතකොට පෞද්ගලික වෙළෙන්දන්ට ඊට වඩා වැඩි මිලකට විකුණන්න බැහැ. එතකොට රෝගියෙකුට stent එකක් දමන කොට, කලින් වැය වුණු මුදලත් සමඟ සංසන්දනය කරනවා නම් රුපියල් ලක්ෂ දෙකක විතර ලාභයක් ඇති වනවා; stents තුනක් දානවා නම් රුපියල් ලක්ෂ හයක පමණ ලාභයක් ලැබෙනවා. ඒ වාගේම රුපියල් 75,000ට තිබුණු stent එක රුපියල් 24,000ට අපි මිල නියම කරනවා. ඊටපස්සේ ඊට වැඩි මිලකට එය විකුණන්න බැහැ. මේ සඳහා අපි ඊයේ සියලුම ආනයනකරුවන් සහ හෘදය රෝග විශේෂඥයන්ගේ සංගමයත් - Sri Lanka Heart Association - මුණගැසිලා සාකච්ඡා කළා. අපි තව දවසකින් දෙකකින් ඒවා ගැසට් කළාම පෞද්ගලික අංශයට ගිහින් මේ කටයුතු කරගන්න අයටත් විශාල සහනයක් ලැබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, 2015 ජනවාරි 08 වෙනිදායින් පසුව ගත් විප්ලවීය පියවරයන් පිළිබඳව ඔබතුමා සඳහන් කළා. කාව ලබා දීම, stents ලබා දීම සහ ඊළඟට පිළිකා රෝගීන් සඳහා ඖෂධ නොමිලයේ ලබාදීම ගැන සඳහන් කළා.

මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සියලු දේට පෙරට වඩා විශාල මුදලක් වියදම් වෙනවා. හැබැයි, 2015 වසරේදී අපි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශවල කිව්වා, මේ සහන දෙන ගමන් අපි සමස්ත ශ්‍රී ලාංකික ජනතාවම වෛද්‍ය රක්ෂණයකින් ආවරණය කරනවා කියලා. ඇත්තටම එහෙම කළොත් මේ වියදම රජයට ඉතිරි කර ගන්න පුළුවන්කම ලැබෙනවා. ඒ රක්ෂණ වැඩ පිළිවෙළට ගියොත් අපට මේ වියදම ඉතිරි කර ගන්න පුළුවන්. සමහරු මේවා ගැන සැක පහළ කළා, සෞඛ්‍ය සේවය පුද්ගලීකරණය කරනවා කියලා. රූපවාහිනී සංවාදවලදීත් ඒ වාගේ විවාද ඇති වුණා. නිදහස් සෞඛ්‍ය සේවය උපරිමයෙන් රකින ගමන් රක්ෂණය හරහා මීටත් වඩා ප්‍රතිලාභ දෙන ක්‍රමයක් ඇති කරන්න පුළුවන් නේද? අපි ඒකට ප්‍රමාද ඇයි?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍යිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

වෛද්‍ය රක්ෂණය කියන එක දියුණු රටවල් හැම එකකම අද භාවිත වන ක්‍රමයක්. වෛද්‍ය රක්ෂණයක් තිබිය යුතුයි. මොකද, එතකොට ඒකෙන් විශාල කොටසක් පුද්ගලික අංශයටත් යාවි. එතකොට ඉතුරු කොටසට මීටත් වඩා හොඳ සෞඛ්‍ය සේවයක් අපට ලබා දිය හැකියි. එතකොට රක්ෂණ සමාගම්වලින් තමයි මුදල් ආවරණය කරන්නේ. හොඳ නියාමනයකින් යුක්තව වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් තිබෙනවා නම් ඒක ඉතාමත් හොඳයි. ඉදිරියේදී අපි ඒ ගැන සියලු පාර්ශ්වයන් සමඟ කථා කර කරනවා. නැත්නම් කියයි, සෞඛ්‍යය පුද්ගලීකරණය කරන්න යනවා කියලා. එහෙම සරල විධියට තමයි ලංකාවේ සියලු සංයුක්ත ප්‍රශ්න දෙස බලන්නේ, සටන් පාඨ දේශපාලනය. ඒ සටන් පාඨ දේශපාලන කට්ටියත් එක්කත් කථා කරලා තමයි මේ කටයුතු කරන්න ඕනෑ.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු අමාත්‍යතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය පැන නඟින්නේ ඔබතුමා මාගේ දෙවන අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙමින් අවසානයේ සඳහන් කළ "සටන් පාඨ දේශපාලනය" තුළිනුයි. ඔබතුමා එසේ සඳහන් කරනකොට මගේ කල්පනාවට ආවේ සෞඛ්‍ය අමාත්‍යාංශය මෙච්චර වියදම් කරද්දී, ඊයේ පෙරේදා සෞඛ්‍ය අමාත්‍යාංශයට බරපතළ විධියට හානි සිද්ධ වුණා නේද කියන කාරණයයි. ගරු අමාත්‍යතුමනි, ඒ හානිය තක්සේරු කරලා තිබෙනවාද? දැන් ඒකට බෙහෙත් දීලා තිබෙනවාද? අනික් ඒවාට දෙනවා වාගේ ඒ වෙච්ච හානියට බෙහෙත් දීලා තිබෙනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍යිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ජනතාවගේ මුදල්වලින් -බදු මුදල්වලින්- ඒවා සෑදීමට අපි දැන් පටන් ගෙන තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

ගරු ඇමතිතුමනි, ඒ සඳහා කොපමණ මුදලක් වැය වනවාද?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(මාණ්පුමිකු (වෛද්‍යිය කලානිති) රාජිත සේනාරත්න)
(The Hon. (Dr.) Rajitha Senaratne)

පසු ගිය දා අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයට ගහපු කට්ටියගෙන් තුවාල වුණ අයව, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින්ම මහ රෝහලට යවා ප්‍රතිකාරත් කළා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

දෙවැනි වටය.

මාතර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම බස් ඩිපෝ : විස්තර
இபோச பஸ் டிப்போக்கள்: மாத்தறை மாவட்டம்
SLTB BUS DEPOTS IN MATARA DISTRICT: DETAILS

1286/'16

4. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - மாண்புமிகு டலஸ் அழஹப்பெரும சார்பாக)
(The Hon. Mahindananda Aluthgamage on behalf of the Hon. Dullas Alahapperuma)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) රාජ්‍ය ප්‍රවාහනයේ ප්‍රධාන සංරචකයක් වන ශ්‍රී ලංගම බස් සේවාව, පෞද්ගලික අංශයේ බස් සේවාවට තරගකාරී සේවාවක් වශයෙන් පවත්වාගෙන යාමේ ඇති වැදගත්කම එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2014.12.31 දිනට මාතර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම බස් ඩිපෝවලට අයත් බස් රථ සංඛ්‍යාව;

(ii) 2016.06.01 දින වනවිට එක් එක් වෘත්තිය අනුව ඉහත එක් එක් ඩිපෝවෙහි සේවක සංඛ්‍යාව;

(iii) 2015.01.01 දිනට පසු මාතර දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංගම ඩිපෝ සඳහා ලබා දී ඇති බස් රථ සංඛ්‍යාව;

එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 2014, 2015, 2016 යන වර්ෂයන්හි මාතර දිස්ත්‍රික්කයේ,

(i) ශ්‍රී ලංගම බස් ඩිපෝවල වාර්ෂික පිරිවැටුම;

(ii) ශ්‍රී ලංගමය විසින් ආවරණය කරනු ලබන මාර්ග කිලෝ මීටර් ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මගී අවශ්‍යතාව අනුව, මාතර දිස්ත්‍රික්කය තුළ තවත් කොපමණ බස් ඩිපෝ සංඛ්‍යාවක් ස්ථාපනය කිරීමට බලාපොරොත්තු වන්නේද;

(ii) ඒ සඳහා හඳුනාගෙන ඇති ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) அரச போக்குவரத்தின் பிரதான ஆக்கக்கூறொன்றாக விளங்கும் இபோச பேருந்துச் சேவையை, தனியார் துறை பேருந்து சேவைக்குப் போட்டியானதொரு சேவையாகப் பேணிவருவதன் முக்கியத்துவத்தை ஏற்றுக்கொள்கிறாரா?

(ஆ) (i) 2014.12.31ஆம் திகதி உள்ளவாறு மாத்தறை மாவட்டத்தின் இபோச பஸ் டிப்போக்களுக்கு சொந்தமான பேருந்துகளின் எண்ணிக்கை;

(ii) 2016.06.01ஆம் திகதி உள்ளவாறு ஒவ்வொரு தொழிலின் அடிப்படையில் மேற்படி ஒவ்வொரு டிப்போவிலும் உள்ள பணியாளர்களின் எண்ணிக்கை;

(iii) 2015.01.01ஆம் திகதிக்குப் பின்னர் மாத்தறை மாவட்டத்தின் இபோச பஸ் டிப்போக்களுக்கு வழங்கப்பட்டுள்ள பேருந்துகளின் எண்ணிக்கை;

ஒவ்வொரு டிப்போவிற்கு அமைவாக தனித் தனியாக யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) 2014, 2015 மற்றும் 2016 ஆகிய ஆண்டுகளில் மாத்தறை மாவட்டத்தின்,

(i) இபோச பஸ் டிப்போக்களின் வருடாந்த புரள்வு;

(ii) இ.போ.ச.வினால் சேவை வழங்கப்படுகின்ற வீதிகளின் கிலோமீற்றர் அளவு;

ஒவ்வொரு வருடத்திற்குமேற்ப தனித்தனியாக எவ்வளவு என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) பயணிகளின் தேவைக்கேற்ப மாத்தறை மாவட்டத்தினுள் மேலும் எத்தனை பஸ் டிப்போக்களை அமைப்பதற்கு எதிர்பார்க்கப்படுகின்றதென்பதையும்;

(ii) அதற்காக இனங்காணப்பட்டுள்ள பிரதேசங்கள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

ask the Minister of Transport and Civil Aviation:

(a) Will he admit the importance of maintaining the SLTB bus service, which is a major component of State transport, as a service to compete the bus service of the private sector?

(b) Will he inform this House separately as per each depot -

(i) the number of buses belong to the SLTB bus depots in the District of Matara as at 31.12.2014;

(ii) the number of staff of each of the above depots as per each occupation as at 01.06.2016; and

(iii) the number of buses provided to the SLTB bus depots of the District of Matara subsequent to 01.01.2015?

(c) Will he state in this House separately for each year of the District of Matara-

(i) the annual turnover of the SLTB bus depots; and

(ii) the extent of roads covered by the SLTB; in the years 2014, 2015 and 2016 in kilometres?

(d) Will he also inform this House-

(i) the number of bus depots expected to be further established in the District of Matara as per the requirement of the passangers; and

(ii) the locations identified for the same?

(e) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

[ගරු අශෝක් අබේසිංහ මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) පිළිගනී.

(ආ) (i)

ඩිපෝව	බස්රථ සංඛ්‍යාව (රථ ඇණිය)
මාතර	60
අකුරැස්ස	48
හක්මන	41
එකතුව	149

(ii) ඇමුණුමෙහි දක්වා ඇත. (*)

(iii) ඔව්.

ඩිපෝව	බස්රථ සංඛ්‍යාව
මාතර	25
අකුරැස්ස	27
හක්මන	21
එකතුව	73

(ඇ) (i)

ඩිපෝව	2014		2015		2016	
	මාර්ග ලේඛන ආදායම (රු.)	මුළු ආදායම (රු.)	මාර්ග ලේඛන ආදායම (රු.)	මුළු ආදායම (රු.)	මාර්ග ලේඛන ආදායම (රු.)	මුළු ආදායම (රු.)
මාතර	199,380,575	306,496,675	233,096,170	346,801,429	252,555,599	412,150,680
අකුරැස්ස	189,974,066	261,776,734	229,708,863	302,432,570	245,052,307	332,227,068
හක්මන	193,857,023	261,565,353	205,968,909	274,135,199	215,150,479	294,488,506
එකතුව	583,211,664	829,838.762	668,773,942	923,369,198	712,758,385	1,038,866,254

(ii)

ඩිපෝව	ධාවනය කරන ලද කි. මී. ප්‍රමාණය (දිනක සාමාන්‍ය)		
	2014	2015	2016
මාතර	10,091	12,103	12,479
අකුරැස්ස	8,204	9,713	10,698
හක්මන	8,033	9,136	9,122
එකතුව	26,328	30,952	32,299

(ඇ) (i) ඉදිරියේදී මාතර දිස්ත්‍රික්කය තුළ අලුතින් බස් ඩිපෝ ස්ථාපිත කිරීමට අපේක්ෂා නොකරමි.

(ii) අදාළ නොවේ.

(ඉ) අදාළ නොවේ.

මඩකලපුව ශික්ෂණ රෝහල : වාට්ටු හිඟය
மட்டக்களப்பு போதனா வைத்தியசாலை: வாட்டுகள் பற்றாக்குறை
BATTICALOA TEACHING HOSPITAL: SHORTAGE OF WARDS

1679/'17

9. ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அல ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) මඩකලපුව ශික්ෂණ රෝහලේ පවත්නා වාට්ටු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එක් එක් වාට්ටුවේ පවත්නා ඇඳන් සංඛ්‍යාව සහ දැනට ඇතුළත් කරගනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) සියලුම විශේෂඥ වෛද්‍යවරුන්ගේ නම් සහ ඔවුන්ගේ අදාළ වෛද්‍ය ක්ෂේත්‍ර කවරේද;

(iv) මෙම විශේෂඥ වෛද්‍යවරුන්ට වාට්ටු පවරා දීම පිළිබඳ තොරතුරු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශේෂඥ වෛද්‍යවරුන්හට පැවරීම සඳහා වාට්ටු හිඟයක් පවතින බවත්;

(ii) ඉඩකඩ සහ ඇඳන් නොමැතිවීම හේතුවෙන් සාමාන්‍ය රෝගීන් සහ කඩිනම් වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍යවන බරපතළ රෝගාබාධවලින් පෙළෙන රෝගීන් ඇතැම් වාට්ටුවල බිම සහ පිලේ දමා සිටින බවත්;

(iii) අමතර වාට්ටු ඉදිකිරීම සඳහා රෝහල් පරිශ්‍රය තුළ ඉඩකඩ පවතින බවත්;

(iv) මෙය නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය හදාරන සිසුන් සඳහා වෙන්කරන ලද ශික්ෂණ රෝහල බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉතා කඩිනම් අවශ්‍යතාවක්ව පවතින මෙම වාට්ටු ඉදිකිරීම සඳහා ඉහළ ප්‍රමුඛතාවය ලබා දී ඒ සඳහා වෙන් කළ ප්‍රතිපාදන නිකුත් කිරීමට නියෝග කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு போதனா வைத்தியசாலையில் உள்ள வாட்டுகளின் பெயர்கள் மற்றும் அவற்றின் எண்ணிக்கைகளையும்;

(ii) ஒவ்வொரு வாட்டிலும் உள்ள படுக்கைகளின் எண்ணிக்கை மற்றும் தற்போது அனுமதிக்கப் பட்டுள்ள நோயாளிகளின் எண்ணிக்கையையும்;

(iii) அனைத்து வைத்திய நிபுணர்களின் பெயர் களையும் அவர்களின் மருத்துவத் துறை களையும்;

(iv) இவ்வைத்திய நிபுணர்கள் பொறுப்பாக உள்ள வாட்டுகளின் விபரங்களையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) வைத்திய நிபுணர்களின் பொறுப்பில் வழங்குவதற்கு வாட்டுகள் தட்டுப்பாடாக உள்ளன என்பதையும்;

(ii) இடவசதி மற்றும் படுக்கை வசதி இல்லாத காரணத்தினால் சாதாரண நோயாளிகளும், தீவிர மருத்துவ சிகிச்சை தேவைப்படும் பாரதூரமான நோயுடன்கூடிய நோயாளிகளும் சில வாட்டுகளில் தரைகளிலும் வராந்தாக் களிலும் தங்கியுள்ளனரென்பதையும்;

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) மேலதிக வாட்டுகளின் நிர்மாணத்திற்காக வளாகத்தில் காணி கிடைக்கக்கூடியதாக உள்ளது என்பதையும்;

(iv) கிழக்கு பல்கலைக்கழக மருத்துவ மாணவர் களுக்கான ஒரு போதனா வைத்தியசாலையாக இது உள்ளது என்பதையும்

அவர் அறிவாரா?

(இ) (i) அவர் அதற்கு முன்னுரிமை அளித்து, அவசர மாகத் தேவைப்படும் வாட்டுகளின் நிர்மாணத் திற்கான நிதி ஒதுக்கீட்டை மேற்கொள்வரா என்பதையும்;

(ii) அவ்வாறாயின் எப்போது என்பதையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல் ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he state in this House-

(i) the number and names of wards available in the Batticaloa Teaching Hospital;

(ii) the number of beds available and the number of patients currently admitted in each ward;

(iii) names of all Consultants and their relevant medical fields; and

(iv) details of assignment of wards to these Consultants?

(b) Is he aware that-

(i) there is a shortage of wards to be assigned to the Consultants;

(ii) normal patients and patients with serious diseases needing intensive medical care are put on the floor and verandah in some wards due to lack of space and beds;

(iii) land is available in the premises for the construction of additional wards; and

(iv) this is the teaching hospital assigned for medical undergraduates of the Eastern University?

(c) Will he inform this House-

(i) whether he will give top priority and order for release of allocation for the construction of urgently required wards; and

(ii) if so, when?

(d) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම 01 හි දක්වා ඇත.
(ii) ඇමුණුම 02 හි දක්වා ඇත.

ඇමුණුම 01

වාට්ටු අංකය	වාට්ටුවේ නම
01	වෛද්‍ය - කාන්තා වාට්ටුව
02	උගුර, කණ, නාස පිළිබඳ – පිරිමි සහ කාන්තා වාට්ටුව
03	ප්‍රසව හා නිරීවේද වෛද්‍ය වාට්ටුව
04	විශ්වවිද්‍යාල වෛද්‍ය ඒකකය - පිරිමි
05	විශ්වවිද්‍යාල හා ප්‍රසව හා නාරීවේද වෛද්‍ය වාට්ටුව
06	සූතිකාගාරය
07	ප්‍රසව හා නාරී වෛද්‍ය වාට්ටුව
08	අක්ෂි -කාන්තා වාට්ටුව
09	ශල්‍යකර්ම - පිරිමි වාට්ටුව
10	ශල්‍යකර්ම - පිරිමි වාට්ටුව
11	ශල්‍යකර්ම - පිරිමි වාට්ටුව
12	ශල්‍යකර්ම - කාන්තා වාට්ටුව
14	විකලාංග- පිරිමි වාට්ටුව
15	විකලාංග- කාන්තා වාට්ටුව
16	වෛද්‍ය - පිරිමි වාට්ටුව
17	අක්ෂි - පිරිමි වාට්ටුව
18	වෛද්‍ය - කාන්තා වාට්ටුව
19	පිළිකා සැත්කම් - පිරිමි හා කාන්තා වාට්ටුව
20	පිළිකා - පිරිමි හා කාන්තා වාට්ටුව
21	වෛද්‍ය - කාන්තා වාට්ටුව
22	වෛද්‍ය - පිරිමි වාට්ටුව
23	මානසික රෝග - පිරිමි වාට්ටුව
24	මානසික රෝග - කාන්තා වාට්ටුව
25	ශල්‍යකර්ම - කාන්තා වාට්ටුව
26	ශල්‍යකර්ම - කාන්තා වාට්ටුව
27 – 28	ළමා වාට්ටුව
29 – 30	ළමා වාට්ටුව
31	පශ්චාත් මරණ පරීක්ෂණ වාට්ටුව
32	චර්ම රෝග- පිරිමි හා කාන්තා වාට්ටුව
33	විශ්වවිද්‍යාල ළමා ඒකකය - ළමා වාට්ටුව
34	වෛද්‍ය - පිරිමි වාට්ටුව
35	වෛද්‍ය - කාන්තා වාට්ටුව
36	විශ්වවිද්‍යාල ශල්‍යකර්ම ඒකකය - කාන්තා වාට්ටුව
37	විශ්වවිද්‍යාල ශල්‍යකර්ම ඒකකය - පිරිමි වාට්ටුව
40	ශ්වසන ඒකකය- කාන්තා හා පිරිමි වාට්ටුව

ඇමුණුම 02

වාට්ටු අංක	ඇඳන් සංඛ්‍යාව	මසකට ඇතුලත් කර ගනු ලබන රෝගීන් ප්‍රමාණය
01	34	407
02	34	318
03	34	290
04	32	301
05	22	340
06	12	600
07	34	327
08	20	204
09	36	303
10	34	319
11	35	156
12	38	705
14	27	61
15	29	59
16	21	424
17	20	256
18	35	345
19	36	251
20	35	130
21	25	289
22	42	287
23	14	27
24	13	45
25	28	336
26	27	274
27-28	48	231
29 -30	40	464
31	21	271
32	15	16
33	30	219
34	20	325
35	29	233
40	15	44
කායික දැඩි සත්කාර ඒකකය	05	37
නිරීක්ෂක ප්‍රතිකාර ඒකකය	05	38
ශල්‍ය දැඩි සත්කාර ඒකකය	05	16
රුධිර කාන්දු පෙරන ඒකකය	05	429
අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකය	17	658
නව ඒකක ඒකකය	25	89
මාතෘ හා ළදරු ඒකකය	09	66

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

(iii) ඇමුණුම 03* හි දක්වා ඇත.

(vi) ඇමුණුම 03 හි දක්වා ඇත.

(ආ) (i) ඔව්.

(ii) නැත.

(iii) නැත.

(iv) ඔව්.

(ඇ) (i) දැනටමත් අනතුරු හා හදිසි සත්කාර ඒකක ඉදිකිරීම් ආරම්භ කර ඇත.

(ii) පැන නොනඟී.

(ඈ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා තරග විභාගයෙන් බඳවා ගැනීම
போட்டிப் பரீட்சைமூலம் கிராம சேவகர் வெற்றிடங்களை நிரப்புதல்
FILLING OF VACANCIES OF GRAMA NILADHARIS THROUGH COMPETITIVE EXAMINATION

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23(2) යටතේ මා මේ ප්‍රශ්නය යොමු කරන්නේ, ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙතයි.

ගරු ඇමතිතුමනි, පුරප්පාඩු 2,000කට ආසන්න ප්‍රමාණයක් සඳහා ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමට තරග විභාගයක් පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට තිබියදී, එක්සත් ජාතික පක්ෂයේ මැති ඇමතිවරුන්ගේ ලැයිස්තුවකට විශ්‍රාමික ග්‍රාම නිලධාරීන් මේ වන විට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. එය නීති විරෝධී ක්‍රියාවක් බැවින්, එය වහාම නවත්වා තරග විභාගයෙන් බඳවා ගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, බොහොම ජ්‍යෙෂ්ඨ මහජන නියෝජිතයෙක් හැටියට ඔබතුමා මේ කාරණය පිළිගන්නවා ඇති. එය සනාථ කිරීමේ කරුණු හැටියට ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සංගමය ඔබතුමා අමතන ලද ලිපි හතරක් මම ඔබතුමා වෙත ඉදිරිපත් කරනවා. ගරු ඇමතිතුමනි, එම ක්‍රියාව නවත්වා විභාග ප්‍රතිඵල අනුව ග්‍රාම නිලධාරීන් පත් කරන ලෙස මා යළිත් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු වජිර අබේවර්ධන මහතා (ස්වදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு வஜிர அபேவர்தன - உள்நாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Wajira Abeywardana - Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, අපේ ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය සම්බන්ධයෙන් මම මීට පෙරත් පිළිතුරු දීමක් සිදු කළා. ඇත්ත වශයෙන්ම මම මතක් කරන්න කැමැතියි, ග්‍රාම නිලධාරීන් 14,022න් විභාගය පවත්වන අවස්ථාවේදී පුරප්පාඩු 1,700කට ආසන්න ප්‍රමාණයක් තිබුණ බව.

දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ලිපි වාගේ ලිපි කිහිපයක් ශ්‍රී ලංකා එක්සත් ග්‍රාම නිලධාරී සංගමය මටත් ඉදිරිපත් කර තිබෙනවා. අනික් සංගම් විසිනුත් ලිපි ඉදිරිපත් කරනු ලැබ තිබෙනවා. තරග විභාගයේ ප්‍රතිඵල එන්න ප්‍රථම මේ අවුරුද්දේ මුලදී ඒ ලිපි මඟින් ඔවුන් ඉල්ලීමක් කළා, මේ සේවාවට විභාග ප්‍රතිඵල අනුවම බඳවා ගන්නේ නැතුව, පුළුවන් නම් සියයට 50ක් කාන්තාවන් හා සියයට 50ක් පිරිමින් බඳවා ගන්නය කියලා. ඒ සංගම්වල ඉල්ලීම් අනුව අපි බැලුවා, එහෙම බඳවා ගන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවාද කියලා. හැබැයි ඒක කරන්න ගියොත් නැවතත් කාන්තා විරෝධයක් ඇති වීමේ හේතුව මුල් කරගෙන, - මොකද, දැනට ක්ෂේත්‍ර නිලධාරීන්ගෙන් බහුතරයක් ඉන්නේ කාන්තාවන්. මේ බඳවා ගන්නා අයගෙන් බහුතරයක් කාන්තාවන් වනවා- නැවත බඳවා ගැනීමේදී රාජ්‍ය සේවා කොමිසමට දැනුම් දෙන ක්‍රියාවලිය වෙනස් කරලා දැනුම් දෙන්න කටයුතු කළා. පසුව අපි ඒක ආපසස්ට හරවා දැන් නැවත දැනුම් දීලා තිබෙනවා, විභාග ප්‍රතිඵල අනුව බඳවා ගැනීමට කටයුතු කරනවාය කියලා.

ගරු කථානායකතුමනි, මා ගිය සතියේ මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටියා. අපේ TNA එකේ මන්ත්‍රීතුමන්ලාත් එතැන සිටියා. උදාහරණයක් හැටියට ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 27ක් තිබෙනවා. ඒ ග්‍රාම නිලධාරි වසම් 27ට ග්‍රාම නිලධාරීන් ඉන්නේ 9දෙනායි. එතකොට ඒ කොට්ඨාස පරිපාලනය කිරීමේ විශාල ප්‍රශ්නයක් අපට මතුවෙලා තිබෙනවා. ඒ වෙලාවේත්, ඊයේත් මා විපක්ෂ නායකතුමාට කිව්වා, retire වෙලා ඉන්න, අවුරුදු 67ට අඩු ග්‍රාම නිලධාරි මහත්වරුන් ඉන්නවා නම් වහාම සම්බන්ධ කරන්නය කියලා. ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ටත් කියා තිබෙනවා; දිසාපතිතුමාටත් කියා තිබෙනවා; අපේ මන්ත්‍රීතුමන්ලාටත් කිව්වා. ඒ එක්කම ඉරිදා මා මාන්තේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිටියා. ඒ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 15යි තිබෙන්නේ. නමුත් ග්‍රාම නිලධාරීන් 4දෙනායි ඉන්නේ. එතකොට එක් ග්‍රාම නිලධාරිවරයෙක් ග්‍රාම නිලධාරි වසම් තුනක විතර වැඩ බලනවා. එතකොට අපට පරිපාලන කටයුතු කරගෙන යන්න ඉතා අමාරුයි. ඒ අතර කලුතර, ගාල්ල, මාතර, රත්නපුරය, කෑගල්ල ආදී විවිධ ප්‍රදේශවල ඇති වූ තත්ත්වයන් එක්ක මා අලුත් දෙයක් කළේ නැහැ. ඇත්තටම දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, රාජපක්ෂ ආණ්ඩුව පාලනය කරන කාලයේ 2010.04.10වන දා නිකුත් කරපු චක්‍රලේඛයක් තිබෙනවා, මෙවැනි කටයුත්තකදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව. රාජ්‍ය සේවා කොමිසමට ඒ Circular එකම refer කරලා අනුමැතිය ලබාගෙන තමයි ඒ කටයුතු කරලා තිබෙන්නේ.

ඔබතුමාට ඕනෑ නම් මට ඒ චක්‍රලේඛයේ පිටපතක් දෙන්න පුළුවන්. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂමේ අනුමැතියට යටත්ව අප දැනට නිලධාරීන් සේවයේ පිහිටුවා තිබෙනවා. දැන් එම නිලධාරීන් කටයුතු කරගෙන යනවා. තරග විභාගයේ ප්‍රතිඵල නිකුත් කරනවා. ඒ එක්කම, ඒ අයගේ පැමිණීමෙන් මේ අයගේ තනතුර ඉබේම අහෝසි වෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මට පොඩි කාරණයක්, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඇහුවා. ගරු ඇමතිතුමා එයට පිළිතුරු දුන්නා. දැන් මේ වැඩ ටික කරගෙන යන්න කරුණාකර මට සහාය දෙන්න. මේ සභාවේ වැඩ කරන කොට අපට ස්ථාවර නියෝග තිබෙනවා නේ. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මෙහෙම කළාම මට හරි ප්‍රශ්නයක් වෙනවා. ඊයේ ඉඳලා මෙහෙමයි. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙනම අවස්ථාවක් දෙන්නම්. මට ස්ථාවර නියෝග වෙනස් කරන්න බැහැ. එහෙම නම් දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට ඒ කාරණය පැහැදිලි කරන්න පුළුවන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මට අවස්ථාවක් දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊළඟට, යෝජනා පිළිබඳ දැනුම්දීම. ගරු සෙයිය්ඩ් අලි සාහීර් මවුලානා මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මේක හරි අසාධාරණයක් නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, සාධාරණයි. මම ඊයේත් -[බාධා කිරීමක්]ස්ථාවර නියෝග අනුව ඔබතුමාට අවස්ථාව දෙන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. ඕනෑ නම් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
පැහැදිලි කරගන්න අවස්ථාවක්, -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්නය ඇහුවේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා නේ. ස්ථාවර නියෝග අනුව ඔබතුමාට එහෙම පැහැදිලි කිරීම් කරන්න බැහැ, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඔබතුමා මෙවා දන්නවා නේ. ඔබතුමා හිටපු ඇමතිවරයෙක්; පරණ මන්ත්‍රීවරයෙක්. එහෙම අවස්ථාවක් දෙන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඊයේ අප කථා කළාම එකඟ වුණා 23(2) ස්ථාවර නියෝගය යටතේ අපට අවස්ථාවක් දෙනවා කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
23(2) ස්ථාවර නියෝගය යටතේ මම අවස්ථාව දුන්නා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ආණ්ඩු පක්ෂයට අවස්ථාව දෙනවා. විපක්ෂයට දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයට දුන්නා නොවෙයි, ඇමතිවරයා ප්‍රශ්නයට පිළිතුරු දුන්නා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමා කියපු දෙය වැරැදියි. එය අසත්‍යයක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක ඔබතුමා පස්සේ කියන්න. වෙනම අවස්ථාවක් දෙන්නම්. දැන් මට අවස්ථාවක් දෙන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්තානන්ත අළුත්තමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ආණ්ඩු පක්ෂයට විතරයි වෙලාව දෙන්නේ. අපට දෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් වාඩි වෙන්න. [බාධා කිරීමක්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මම ඉතාම කෙටියෙන් ප්‍රශ්නය ඇහුවා. අප පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 50ක් නියෝජනය කරන කණ්ඩායමක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, ඒක ඇත්ත.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මම ඒ ප්‍රශ්නය අහන්න ගත්තේ ඉතාම කෙටි කාලයක්. විපක්ෂයේ මගේ සහෝදර වෙන මන්ත්‍රීතුමන්ලා මෙවැනි ප්‍රශ්න අහන කොට මේ වාගේ තුන් ගුණයක් කාලය දෙනවා. ගරු ඇමතිතුමා සුදානම්, මේ ප්‍රශ්නයට විසඳුමක් හා පිළිතුරු දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා දැන් පිළිතුරු දුන්නා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඒක වළක්වන්නේ නැතිව මන්ත්‍රීතුමා අහන අතුරු ප්‍රශ්නයට විනාඩියක් දෙන්න. මේක මුළු රටටම බලපානවා. ඡන්දයට දේශපාලන ග්‍රාම නිලධාරීන්ට ඉන්න බැරි බව අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා. මැතිවරණ කොමසාරිස්තුමා ඊයේත් එය කිව්වා. ගරු ඇමතිතුමනි, විශ්‍රාම ගිහින් සිටින කෙනෙක් යම් දේශපාලන පක්ෂයක නම්, ඇමතිතුමාට ඒ පත්වීම දෙන්න බැහැ. මෙය සරල දෙයක්, ගරු කථානායකතුමනි. මේකට අප තරහා වෙන්න ඕනෑ නැහැ. මේක අප කාටත් බලපාන බරපතළ ප්‍රශ්නයක් නිසායි ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා පැහැදිලි කර ගැනීමකට අවස්ථාව ඉල්ලන්නේ. එතුමාට පොඩ්ඩක් ඉඩ දෙන්න මේක විසඳාගන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා පැහැදිලි කරන්න කැමැති නම් ඉඩ දෙන්න පුළුවන්. ස්ථාවර නියෝග අනුව, ඇමතිතුමාගේ කැමැත්ත තිබෙනවා නම් මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] ඒකට ඇමතිතුමා එකඟ වෙන්න එපා යැ.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණය ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම මේ සංගම් විවිධ දේශපාලන පක්ෂවලට සම්බන්ධ විවිධ සංගම්. ඒ කාරණය අපි පැත්තකට දැම්මත්, ඇත්ත වශයෙන්ම දැනට පරිපාලන සේවයේ නිලධාරීන්ගේත් විශාල භීතියක් තිබෙනවා. අපි දැන් රාජ්‍ය සේවා කොමිසමෙන් අනුමතිය අරගෙන තිබෙනවා,- [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාට උත්තර දෙන්න පොඩ්ඩක් අවස්ථාව දෙන්න, ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] පිළිතුරු දෙන්න ඉඩ දෙන්න. ඊට පස්සේ ඔබතුමා කථා කරන්න.

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
අපි අවසර අර ගෙන තිබෙනවා, විශ්‍රාම ගිය අතිරේක දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්ලා, සහකාර ප්‍රාදෙශීය ලේකම්ලා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගන්න, අලුත් අය විභාගයෙන් පත් වෙනතුරු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඊට පස්සේ ඔබතුමා පත්වීම් දෙනවා? පත්වීම් දීලා අවසානයක් කරනවා?

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
ඒවා දීලා අවසානයි. පත් කරලා අවසානයි.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

I
ලෙයිලා උම්මා දීන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
லைலா உம்மா தீன் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
LAILA UMMA DEEN FOUNDATION (INCORPORATION) BILL

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Hon. Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate the Laila Umma Deen Foundation".

ගරු රංජිත් අලුවිහාරේ මහතා
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே)
(The Hon. Ranjith Aluvihare)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විවාදයට ගනු ලැබිණි.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி சமூக வலுவூட்டல், நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare and Kandyan Heritage for report.

II
අබ්දුල් මජීද් ඇකඩමි (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
அப்துல் மஜீத் எக்கடமி (கூட்டிணைத்தல்) சட்டமூலம்
ABDUL MAJEED ACADEMY (INCORPORATION) BILL

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
கௌரவ சபாநாயகர் அவர்களே, பின்வரும் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்:

"அப்துல் மஜீத் எக்கடமி (கூட்டிணைத்தல்) எனும் சட்டமூலம் கொண்டுவர அனுமதி வழங்கப்படுமாக."

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.
වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் நிலைக்கட்டளை இல. 47(5) இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Education for report.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, දිනට නියමිත කටයුතු ආරම්භ කිරීමට පෙර මම මේ කාරණයට ඔබතුමාගේ අවධානය යොමු කරවන්න සතුටුයි. අද දින "ලංකාදීප" පත්‍රයේ මුල් පිටුවේ මෙසේ පළ වී තිබෙනවා.

"අතුරුදන් පනත නවති. න්‍යාය පත්‍රයේ තිබුණත් විවාදයට නොගනී. බලහත්කාරයෙන් අතුරුදන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත විවාදය සඳහා ඉදිරිපත් නොකරන බව රජය පාර්ලිමේන්තුවට ඊයේ (5) දැනුම් දුන්නේය."

ගරු කථානායකතුමනි මම ඊයේ කිව්වේ, ඊයේ මේ පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීම සඳහා ඉදිරිපත් කරන්නේ නැහැ කියලායි. මේ පනත් කෙටුම්පත න්‍යාය පුස්තකයේ තිබෙනවා. ඉදිරි කාලයේදී අපි මෙම පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සඳහා ඉදිරිපත් කරනවා.

මේ පුවත් පතේ තිබෙන්නේ මේ පනත් කෙටුම්පත මම සම්පූර්ණයෙන්ම ඉල්ලා අස්කර ගත්තාය කියන අදහස එන ප්‍රවෘත්තියක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ ගැන අපි අවධානය යොමු කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එය නිවැරදි කරන මෙන් මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දිනට නියමිත ප්‍රධාන කටයුතු ආරම්භ කරමු.

න්‍යාය පත්‍රයේ සඳහන් විෂය අංක 1 හි සඳහන් වෙළඳ නැව් පනත යටතේ ඉදිරිපත් කරන නියෝග සහ විෂය අංක 2 හි සඳහන් ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව එකවර විවාද කොට, අවසානයේදී සම්මත කිරීමට බලාපොරොත්තු වෙනවා.

වෙළඳ නැව් පනත: නියෝග
வணிகக் கப்பற்றொழில் சட்டம்: ஒழுங்குவிதிகள்
MERCHANT SHIPPING ACT: REGULATIONS

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Ports and Shipping, I move,

"That the Regulations made by the Minister of Ports and Shipping under Section 321 read with Section 139 of the Merchant Shipping Act, No. 52 of 1971 relating to Verification of Container Gross Mass and published in the Gazette Extraordinary No. 1979/30 dated 11th August 2016 which were presented on 21.02.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[පූ.භා. 11.27]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)

ගරු කථානායකතුමනි, ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මා කරුණු දැක්වීමට බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, ඇදගෙන යනු ලබන දැල් භෙවත් ට්‍රෝලින් ධීවර මෙහෙයුම් ක්‍රමය ඉතා ඈත අතීතයේ සිටම ශ්‍රී ලංකා මුහුදු ජල තීරයේ ක්‍රියාත්මක වුණා. ඉස්සන් ඇල්ලීම සඳහා තමයි මේ ක්‍රමය යොදා ගත්තේ. 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලාත්මක වන අංක 948/25 සහ 1996.11.07 වන දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1996 ධීවර මෙහෙයුම් නියෝග මාලාවට අනුව ශ්‍රී ලංකා ජල තීරය තුළ මසුන් ඇල්ලීම සඳහා නියමිත පන්න ක්‍රම 17ක් හඳුන්වා දී තිබෙනවා. මෙම මෙහෙයුම් ක්‍රමයද එහි නියමිත මෙහෙයුම් ක්‍රමවලට ඇතුළත් වේ. මෙම නියමිත මෙහෙයුම් ක්‍රම ශ්‍රී ලංකා ජල තීරය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගෙන් බලපත්‍රයක් ලබා ගත යුතුය. 2011 වර්ෂයේ ජාතික ජලජ සම්පත් පර්යේෂණායතනය - NARA - මඟින් නිකුත් කරන ලද විද්‍යාත්මක වාර්තාව අනුව මුහුදු පතුලේ ඇදගෙන යනු ලබන දැල මඟින් මුහුදු පතුලේ සිටින මුහුදු ජීවී ප්‍රජාව සම්පූර්ණයෙන්ම විනාශ වන බව පෙන්වා දී ඇත. මෙම

[ගරු මහින්ද අමරවීර මහතා]

විද්‍යාත්මක දත්ත පදනම් කරගෙන 2011 වර්ෂයේ ඇදගෙන යනු ලබන දැල් සඳහා බලපත්‍ර ලබා දීම අත් හිටුවීමට ධීවර අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

ට්‍රෝලින් මෙහෙයුම් ක්‍රමය පොළොව මත ඇදගෙන යන පන්න ක්‍රමයකි. යටිමන්දේ යකඩ දම්වැල් හෝ වැඩි බරැති යකඩ බර යොදා ගෙන තිබීම නිසා එය මුහුදු පතුල සූරායමින් ඇදගෙන යයි. මෙහිදී මුහුදු පතුලේ තිබෙන කොරල් පර, මුහුදු ජීවීන් හා මාළු බෝවෙන ස්ථාන සියල්ලම විනාශ වෙන බව අප හඳුනාගෙන තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට පෙර ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා මේ කාරණය ගැන පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනාවක් ඉදිරිපත් කළා. අපි එතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. එතුමා ඒ පිළිබඳව බොහොම උනන්දුවෙන් කටයුතු කළා වාගේම, මේ දේශපාලන අධිකාරියේ සිටින මන්ත්‍රීවරුන්ද වරින්වර අපට ඒ ගැන කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම අපේ රටේ ධීවර ප්‍රජාව නිතරම අප මුණ ගැහිලා ඉල්ලීමක් කළා, මේ මුහුදු පතුල විනාශ වෙන මේ පන්න ක්‍රමය -bottom trawling- නතර කිරීම සඳහා විධිමත් ක්‍රියා මාර්ගවලට එළඹෙන්න කියලා. ඒ අනුව, අපි මේ පිළිබඳව විශේෂ දැනීමක් තිබෙන NARA ආයතනය ඇතුළු විවිධ අංශවල අදහස් අරගෙන තමයි මේ පනතට අදාළ සංශෝධනය ගෙනෙන්නේ.

මේ මඟින්, මේ පන්න ක්‍රමය භාවිත කරන අය සඳහා අය කරන දඩ මුදල වැඩි කිරීමක් කරනවා. අවම දඩය රුපියල් 50,000ක් වන ආකාරයටත්, ඒ වාගේම වසර 2ට නොවැඩි සිර දඬුවමකට යටත් කිරීමක් සහිතව අදාළ සංශෝධනය ගෙනෙනවා. ඒ වාගේම මේ කටයුතු නතර කිරීම සඳහා ගතහැකි, ගතයුතු ක්‍රියා මාර්ග සියල්ල ගනිමින් සිටින බව ඔබතුමාට සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම අපි අපේ මුහුදු තීරය ආරක්ෂා කරගන්න ඕනෑ. අපේ මුහුදු සම්පත අනාගතයට ඉතිරි කර ගැනීමේ වගකීම අපේ අමාත්‍යාංශයට වගේම රටක් විධියට අප සියලු දෙනාටම පැවරිලා තිබෙනවා. එම නිසා මම, ඒ වාගේම රාජ්‍ය ඇමතිතුමා පත්වුණාට පස්සේ ධීවර ජනතාවට විධිමත් ආකාරයේ පන්න ක්‍රම හඳුන්වා දෙමින්, නීත්‍යානුකූලව මසුන් මැරීමේ ක්‍රමවේදවලට උනන්දු කරවීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්න ඕනෑය කියලා තීන්දු කළා. ඒ අනුව තහනම් පන්න ක්‍රම අපි ක්‍රමානුකූලව වරින් වර, එකින් එක නතර කරමින් යන අවස්ථාවක් විධියට අපට මේ අවස්ථාව හඳුන්වන්න පුළුවන්. අපේ මුහුදු තීරයේ මසුන් ඇල්ලීමේදී ඩයනමයිට් යොදාගෙන මසුන් මැරීම ප්‍රබල ලෙස සිදු කළා. ඒකත් මහා විනාශකාරී පන්න ක්‍රමයක්. එම ක්‍රමය වහාම නතර කිරීම සඳහා සියලු ආකාරයේ කටයුතුවලට මැදිහත් වෙන්න ඕනෑ කියලා අපි තීන්දුවක් ගත්තා.

ගරු කථානායකතුමනි, ඩයිනමයිට් යොදා මසුන් මැරීම වෙනුවෙන් නීතියේ තිබෙන්නේ සුළු දඩයක්. ඒ ක්‍රියාමාර්ගවලට මිනිසුන් තුළ භයක් ඇති වෙලා නැහැ. ඒ නිසා අපි සාකච්ඡාවක් පවත්වලා, නාවික හමුදාවටත්, පොලිසියටත් උපදෙස් ලබා දුන්නා, ඩයිනමයිට් යොදාගෙන මසුන් මරණ අය අත් අඩංගුවට ගත්තාම පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ නඩු පැවරීමට කටයුතු කරන්න කියලා. ඒ තුළින් ඔවුන් දීර්ඝ කාලයක් රිමාන්ඩ් බන්ධනාගාරයේ තබා ගැනීමේ හැකියාව ලැබෙනවා. ඒ වාගේම, ඔවුන්ට දැඩි දඬුවම් ලබා දෙන නිසා අද එහි යම් මට්ටමක පාලනයක් සිද්ධවෙලා තිබෙනවා. ඩයිනමයිට් යොදා ගෙන මසුන් මරන අය අත් අඩංගුවට ගන්න වාගේම, ඒ මසුන් ප්‍රවාහනය කිරීමේදී සහ අළෙවි කිරීමේදී ඒ අය අත් අඩංගුවට ගැනීමේ වැඩ පිළිවෙළ අපි මේ වෙනකොට ක්‍රියාත්මක කරලා තිබෙනවා. පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සැලේ වැටලීම් කරලා මේ වන විට කිහිප දෙනෙක්ම අත් අඩංගුවට අරගෙන ඔවුන්ට විරුද්ධව නඩු පැවරීම සඳහා කටයුතු කර තිබෙනවා. තවත් මේ වාගේ තහනම් පන්න ක්‍රම රාශියක් තිබෙනවා. ලයිලා සුරුක්කු දැල්, light coarse, ඒ ආදී විවිධ පන්න ක්‍රම තහනම් කරමින් අපි කටයුතු කරන්නේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි, අනාගත පරම්පරාව සඳහාත් මේ ධීවර සම්පත ඉතිරි කිරීමේ අපේක්ෂාව සහිතවයි.

ගරු කථානායකතුමනි, මෙම පන්න ක්‍රම තහනම් කිරීම් තුළ මත්ස්‍ය අස්වැන්නේ යම් අඩුවීමක් නාවකාලිකව සිද්ධ වෙනවාය කියලා අපි දන්නවා. මන්ත්‍රීවරයෙකුත් ඊයේ කිව්වා, මේ කාලය ඇතුළත මත්ස්‍ය අස්වැන්නේ අඩුවීමක් තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, අවුරුද්දක් තුළ මෙම මත්ස්‍ය අස්වැන්න වැඩි කිරීමට අවශ්‍ය නම්, අපට ඒ සඳහා ක්‍රමවේද තිබෙනවා. මේ තහනම් පන්න ක්‍රම සියල්ලම උපයෝගි කරගෙන මසුන් මරන්න ඉඩ දුන්නොත් ඒ අයට විශාල මත්ස්‍ය ප්‍රමාණයක් ගොඩබිමට ගෙන ඒමට හැකියාව ලැබෙනවා. මෑත කාලයේදී "පෝඩු දැල්" කියන තවත් පන්න ක්‍රමයක් තහනම් කළා. ඒ අය දවසකට මේ ක්‍රමවලින් මාළු කිලෝ ලක්ෂයක් පමණ අල්ලා ගන්නවා. හැබැයි, අපි ඒ ක්‍රමය නැවැත්තුවා. ඒක නැවැත්තුවේ වෙන කිසිම දෙයක් නිසා නොවෙයි, ඒ මත්ස්‍යයන් අනාගතයටත් ඉතිරි කරගත යුතු නිසායි. මේ අනවසර පන්න ක්‍රම තහනම් කිරීම තුළ මත්ස්‍ය අස්වැන්න සමසේ බේදී යෑමේ වගකීම අපි දරනවා. අපි මෙවැනි කටයුතුවලට ප්‍රවේශ වන්නේ, සුළු ධීවරයන් ආරක්ෂා කර ගන්න ඕනෑ නිසායි. මෙහි ප්‍රතිඵලය විධියට "බොටම් ට්‍රෝලින්" ක්‍රමයත් තහනම් කරනවා.

විශේෂයෙන් ඉන්දියානු ධීවරයන් තමයි වැඩි ප්‍රමාණයක් මේ ක්‍රමය අනුගමනය කරන්නේ. ලංකාවේ අයත් මේ කටයුත්ත යම් ප්‍රමාණයකට කරනවා. මෙතැනින් පස්සේ ඒකත් නතර වෙනවා. එතකොට, මත්ස්‍ය අස්වැන්නේ තවත් යම් අඩුවීමක් තියෙයි. එතකොට සමහර මන්ත්‍රීවරුන්ට හෝ සමහර සංවිධානවලට චෝදනා කරන්න පුළුවන් මත්ස්‍ය අස්වැන්න අඩු වුණා කියලා. හැබැයි, අපට ඒක ගැටලුවක් නැහැ. අපි ඒ චෝදනාව භාර ගන්නම්. මාළු විධිමත් විධියට අල්ලා ගෙන අනාගතයටත් ඉතිරි කිරීමේ පරමාර්ථයෙන් තමයි අපි මේ කටයුත්ත කරන්නේ.

ගරු කථානායකතුමනි, "බොටම් ට්‍රෝලින්" පන්න ක්‍රමයෙන් අල්ලා ගන්නා මාළු පැය තුනහතරකින් ගොඩබිමට ගෙනෙනවා. සියලු කුඩා මාළු, ඒ වාගේම මාළු බෝ කරන ස්ථාන යන මේ සියල්ලම මේ මඩියට අරගෙන තමයි ගොඩබිමට ගෙනෙන්නේ; ගෙනැල්ලා එළියට ගන්නේ. ඒ නිසා මාළු විශාල ප්‍රමාණයක් අපතේ යනවා. ඒවා කිසිදු ආකාරයකින් ප්‍රයෝජනයට ගන්නේ නැහැ. එහි තිබෙන හොඳ මාළු ටික විතරයි ප්‍රයෝජනයට ගන්නේ. හැබැයි, මෙතැනදී මහා විනාශයක් සිද්ධ වෙනවා. ඒ නිසා තමයි අපි මේ පන්න ක්‍රමය නතර කළේ. කෙටි කාලීනව අපට මත්ස්‍ය අස්වැන්නේ අඩුවීමක් වුණත්, දීර්ඝ කාලීනව මේ රටේ මත්ස්‍ය සම්පත වැඩි කර ගන්න ඒ තහනම් කිරීම හේතුවක් බවට පත් වෙයි කියලා අපි හිතනවා.

ගරු කථානායකතුමනි, අපට යුරෝපයෙන් තිබුණු මත්ස්‍ය තහනම අපි ඉවත් කර ගත්තා. ඒක මේ රජය ජාත්‍යන්තර වශයෙන් ලබපු පළමුවෙනි ජයග්‍රහණය බව මට කියන්න පුළුවන්. පසු ගිය කාලයේ අපේ එක මාළු කැල්ලක් යුරෝපයට යවන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ නිසා අපේ කර්මාන්තශාලා නිස් දෙකක් අකර්මණ්‍ය වෙලා තිබුණා. ඒ නිසා විදේශ විනිමය ලැබීමෙන් ඉතා අඩුවීමක් තිබුණා. නමුත් ගරු කථානායකතුමනි, අපි ඒ යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගත්තා.

මේ රජය ජාත්‍යන්තරය සමඟ ඇති කර ගත් හොඳ හිත නිසා, ජාතික ආණ්ඩුව පිළිබඳව ලෝකයේ ඇති වුණු විශ්වාසය නිසා තමයි අපට ඒ කටයුත්ත කර ගන්න පුළුවන්කම ලැබුණේ. ඒ

වාගේම, ඒක පාදක කර ගෙන "GSP තහනම ඉවත් කර ගැනීම" කියන දෙවැනි ජයග්‍රහණය ලබා ගත්තා. රටක් විධියට දේශපාලන පක්ෂ, පාට භේදවලින් තොරව අපි ඒක අගය කරන්න ඕනෑ කාරණයක්. හැබැයි, මේ ආණ්ඩුවේ එක අඩු පාඩුවක් තිබෙනවා. මේ ජයග්‍රහණය වෙනුවෙන් board ගැහුවේ නැහැ; මේ වෙනුවෙන් cut-out ගැහුවේ නැහැ. මේ වෙනුවෙන් අවශ්‍ය ප්‍රචාරය දුන්නේ නැති බව මම දන්නවා. ඒ නිසා තමයි බොහෝ දෙනෙක් කියන්නේ, "මේ ආණ්ඩුව මොනවත් කළේ නැහැ" කියලා. හරි නම්, මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීම, GSP තහනම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් දෙන්න තිබුණා. මාධ්‍යවල ඒ ගැන ටික දවසක් පළ වුණා. ඉන් පසුව ඒ ගැන කිසිවක් පළ වෙනවා මම දැක්කේ නැහැ. ඒක එතැනින්ම නැවතිලා, ඊළඟට උද්ඝෝෂණ, විරෝධතා පිළිබඳව තමයි රට පුරාම ප්‍රචාරය වුණේ. මේ ලබා ගත් ජයග්‍රහණය තුළින් එක පැත්තකින් ආර්ථික වශයෙන් අපට විශාල වාසියක් ලැබෙනවා වාගේම, මේ තහනම ඉවත් කර ගැනීම හරහා අපේ රටට ජාත්‍යන්තරයේ තිබෙන පිළිගැනීම පිළිබඳව ශ්‍රී ලාංකීය ජාතියක් විධියට අපි සියලු දෙනාම ආඩම්බර වෙන්න ඕනෑ කියලා මම පැහැදිලිවම කියනවා. අපි මේ මත්ස්‍ය තහනම ඉවත් කර ගත් දවස්වල අපටත් තිබුණා, රතිඤ්ඤා පත්තු කරලා ඒ වෙනුවෙන් ලොකු සැමරුම් කරන්න. නමුත්, රජය ඒවාට මුදල් වියදම් කළේ නැහැ. Cut-out ගහන්න ගියේ නැහැ; banners ගහන්න සල්ලි වියදම් කළේ නැහැ. නමුත්, ඒ ලබා ගත් ජයග්‍රහණයේ ප්‍රතිඵලය අද ජනතාවට ලැබෙනවා.

ගරු කථානායකතුමනි, මත්ස්‍ය තහනම ඉවත් කර ගත්තාට පස්සේ අපිට ලැබුණු ඊළඟ වාසිය තමයි, GSP තහනම ඉවත් කර ගැනීමට ලැබීම. ඒ ආකාරයට GSP තහනම ඉවත් කර ගැනීම හරහා ධීවරයන්ට නැවත තවත් වාසියක් ලැබුණා. මත්ස්‍ය අපනයනකරුවන්ට සියයට 18ත්, 22ත් අතර වාසියක් ලැබෙන්නට පටන් ගත්තා. මේ කාරණයේදී කවුරු හෝ කියන්න පුළුවන්, "ඒක ලැබුණේ අපනයනයකරුවන්ට. ධීවරයාට එම වාසිය ලැබුණේ නැහැ" කියලා. දැන් ඒක ධීවරයාටත් වක්‍රව ලැබෙමින් පවතිනවා. මේ වන විට විදේශ අපනයනකරුවන් වෙනදාට වඩා වැඩි මිලකට අපේ මසුන් මිලදී ගන්නවා. වර්තමානයේ අපේ වෙළෙඳ පොළේ මත්ස්‍ය මිලේ වැඩිවීමකුත් තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි ඒක පිළිගන්නවා. අද කාගෙන් ඇහුවත් ඕනෑම කෙනෙක් කියයි, "මාළු මිල වැඩි වෙලා තිබෙනවා, ඒ නිසා අපට අමාරුයි" කියලා. නමුත්, යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීම හරහා පසු ගිය දවස්වල කෙළවල්ලන් මාළු කිලෝ එකක් රුපියල් 1,500ට කොම්පැනිවලින් මිලදී ගත්තා. අපි දන්නවා, මත්ස්‍ය අපනයනය සිදු කරන කොට විශාල රැකියා ප්‍රමාණයක් ලබා දෙන්නට පුළුවන් බව. කර්මාන්ත 32ම දැන් වැඩ ආරම්භ කර තිබෙනවා. අලුතින් සැකසුම් කර්මාන්ත බිහි වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ වන විටත් එය හරහා රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් එන්නට පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම, මේ අපනයනය කරන මසුන් කැබලිවලට කපලා, හොඳම කැබලි හදලා, සැකසුම් කරලායි යවන්නේ. ඒ විධියට යවන මාළු කිලෝ එකක් රුපියල් 8,000කට විතර විකිණෙනවා. ලංකාවෙන් පිට රටට මාළු යවන කොට ලංකාවට එවැනි මුදලක් ලැබෙනවා. ඒක අපි කවුරුවත් හිතන්නේ නැති දෙයක්. යම් කෙනෙකු කියන්න පුළුවන්, "කොම්පැනි 32කට තමයි මුදල් එන්නේ" කියලා. අපි දැන් එම ක්ෂේත්‍රය තවත් පුළුල් කරන්නට බලාපොරොත්තු වෙනවා.

ඒ විතරක් නොවෙයි, ඉදිරියේ දී රජය මැදිහත් වෙලා මසුන් අපනයනය කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වෙනවා. අවුරුදු 42ක් පාඩුවට තිබුණු ලංකා ධීවර සංස්ථාව දැන් ලාභ ලබන්න පටන් ගෙන තිබෙනවා. ඉතිහාසයේ පළමුවන වතාවට ධීවර සංස්ථාව ලාභ ලබන මේ වෙලාවේ අපි මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානයකුත් ආරම්භ කර තිබෙන බව කියන්නට ඕනෑ. ඒ වාගේම රජය මැදිහත් වෙලා මසුන් අපනයනය කිරීමේ වැඩ පිළිවෙළකුත් ක්‍රියාත්මක කරලා තවත් තරගකාරී බවක් ඇති කිරීමට ඉදිරියේ දී බලාපොරොත්තු වෙනවා. අපි ඒ සඳහා සැලසුම් කර තිබෙනවා කියන එකත් මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. ඒ වාගේම අපට තිබුණු තවත් අභියෝගයක් තමයි, ඉන්දියානු ධීවර ගැටලුව. මේ පිළිබඳව ගොඩක් අය කථා කළා. සමහර අය කතා කරන්නේ මේ ආණ්ඩුව ආවාට පසුව මේ ප්‍රශ්නය ඇති වුණා වාගෙයි. අවුරුදු 30ක් තිස්සේ ඉන්දියානු ධීවරයන් ඇවිල්ලා අපේ මුහුදු තීරය ආක්‍රමණය කළා. එය නවත්වා ගන්න බැරි වුණා. නමුත් අපට බය නැතිව කියන්න පුළුවන්, අප එම ගැටලුව විසඳන්න හොඳ ප්‍රවේශයක් ගත් බව. ඉන්දියාවේ මධ්‍යම රජයත් එක්ක සාකච්ඡා කරන අතරේ අපේ ධීවරයන්ගේ අදහසට අපි මුල් තැන දුන්නා. අපි උතුරේ ධීවරයන් වරින් වර මුණ ගැසුණා. උතුරේ ධීවරයන් ඉතාම අහිංසක මිනිස්සු. ඒ අය තවමත් හරියාකාර ආදායමක් ලබන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ මිනිසුන්ට අපි තවත් ගොඩක් දේවල් දිය යුතු බව රජයක් විධියට අපි පිළිගෙන තිබෙනවා. ඒ අයට නිසි සැලකිල්ලක් දක්වන්න අපට තවම බැරි වෙලා තිබෙනවා. අපේ ඉදිරි සැලැස්ම සකස් වෙලා තිබෙන්නේ, උතුරේ ධීවරයන් ශක්තිමත් කිරීම සහ නැහෙනහිර ඇතුළු යුද්ධය පැවැති ප්‍රදේශවල ධීවරයන් ශක්තිමත් කිරීම හරහා විශාල මත්ස්‍ය අස්වැන්නක් ලබා ගැනීමයි. අපේ අපේක්ෂාව වෙලා තිබෙන්නේ ඒකයි. ඒ අයගේ ප්‍රධාන ඉල්ලීම තමයි ඉන්දියාවේ ධීවරයන් කරන ආක්‍රමණය නවත්වා දෙන්න කියන එක. ඒ අනුව අප බලයට පත් වුණාට පසුව එකම ධීවර යාත්‍රාවක් හෝ අද වන කල් නිදහස් කළේ නැති බව මා කියන්න කැමැතියි. මේ වන කොට අපි ඉන්දියාවේ මධ්‍යම රජයත් එක්ක දෙවතාවක් සාකච්ඡා පවත්වා තිබෙනවා. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාත් එහි ගියා. අපේ දේශපාලන අධිකාරීන් එයට සම්බන්ධ වුණා. ඒ අය ඉතාම හොඳ දායකත්වයක් අපට ලබා දුන්නා. අපට කියන්න ආඩම්බරයි, ඒ සුහදතාව මත මේ වන කොට බෝට්ටු 200 ගණනක ධීවරයන් දැනටමත් එම කර්මාන්තයෙන් ඉවත් කර තිබෙනවා කියා අපට වාර්තා වෙලා තිබෙන බව. ඔවුන් ධීවර කර්මාන්තයෙන් ඉවත් කරලා වෙනත් රැකියාවලට යොමු කර තිබෙන බව අපට වාර්තා වෙනවා. ඒ වාගේම එම ධීවරයන් වෙනත් රැකියාවලට යොමු කරන්න ඉන්දියානු මධ්‍යම රජය අය වැය ලේඛනයෙන් වෙනම මුදලක් වෙන් කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, ඔබතුමාට තවත් විනාඩි පහක කාලයක් තිබෙනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, ඒ ආකාරයට දැනට පවතින සුහදතාව සහ ඒ අය එම ක්‍රමය තහනම් පන්න ක්‍රමයක් බවට පිළිගත් නිසාම අපි තීන්දුවක් ගෙන තිබෙනවා. අපට ධීවරයන් කැමැත්ත දුන්නා, එම බෝට්ටුවලින් යම් ප්‍රමාණයක් නිදහස් කරන්න. එහෙත් අපි කිව්වා, ඕනෑ නම් පැරණි ඒවායින් 42ක් නිදහස් කරන්නම් කියා. නමුත් තවම අපේ කොන්දේසිවලට එකඟතාව පළ කර නැහැ.

යම් ප්‍රමාණයක් නිදහස් කරන්න අපේ එකඟතාව තිබෙනවා. නිදහස් කළත්, කොන්දේසි සහිතව තමයි නිදහස් කරන්නේ. ධීවරයන්ගෙන් අනුමැතිය අපට ලැබුණත් තවම අපි ඒවා නිදහස් කරලා නැහැ. ඒ සියලු කටයුතු සම්පූර්ණ වුණාට පසුව තමයි නිදහස් කරන්නේ. මොකද, අපට අපේ වරායවල ඉඩ ගන්නත් ඕනෑ. හැබැයි, ගිය සතියේත් අත් අඩංගුවට ගැනීම් සිදු වුණා. හෙට

[ගරු මහින්ද අමරවීර මහතා]

ආවත් අපි අත් අඩංගුවට ගන්නවා. පසු ගිය කාලය ඇතුළත මේ ආක්‍රමණය සියයට 50කින් අඩු වෙලා තිබෙනවා කියා උතුරේ ධීවරයන් අපට ස්තුති කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම තවත් කරුණක් ගැන කියන්න කැමැතියි. ඊයේ දවසේ මේ පාර්ලිමේන්තුවේදීම අපට ලොකු චෝදනාවක් ආවා, "විදේශීය යාත්‍රාවලට අපේ මුහුදේ මාළු අල්ලන්න දීලා තිබෙනවා, අනවසරයෙන් ලංකාවට එන විදේශීය යාත්‍රා අත් අඩංගුවට ගන්නේ නැහැ"යි කියලා. මම මේ පිළිබඳව සොයා බැලීමක් කළා. ධීවර යාත්‍ර දෙකක් අනතුරට පත්වෙලා තිබෙනවා. "ෆායික් පුතා 2" සහ "හෂාන් 3" කියන ධීවර යාත්‍රා දෙක අනතුරට පත්වෙලා තිබෙනවා. අපට දැනට වාර්තා වෙලා තිබෙන තොරතුරු අනුව ඒක අනවසර මත්ස්‍ය නැවක් නොවෙයි. නැව් යන මාර්ගයේ දී භාණ්ඩ ප්‍රවාහන යාත්‍රාවක ගැටීමෙන් තමයි මේ අනතුර සිද්ධ වෙලා තිබෙන්නේ කියලායි අපට දැනට වාර්තා වෙලා තිබෙන්නේ. දැනටමත් අපේ රජය මේ පිළිබඳව මැදිහත් වෙලා තිබෙනවා. නාවික හමුදාව යොදවා මේ වැරැද්ද සිදුවෙලා තිබෙන්නේ කාගෙන්ද කියලා සොයනවා. ඒ වාගේම එම ධීවරයන්ට සහන ලබා දෙන්නත් අපි කටයුතු කරනවා. ඒ විධියට කිසිදු යාත්‍රාවකට අපේ මුහුදු තීරයට එන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ විධියට ඇවිල්ලා අනවසරයෙන් මත්ස්‍ය අස්වැන්න නෙලනවා නම් ඒ අය අත් අඩංගුවට ගන්න කියලා අපි නාවික හමුදාවට සම්පූර්ණ බලය දීලා තිබෙනවා. අපට ඕනෑ කරන්නේ අපේ ධීවරයා ශක්තිමත් කරන්න මිසක, වෙනත් කවුරුවත් ශක්තිමත් කරන්න නොවෙයි කියන එක මේ අවස්ථාවේ දී ඉතාමත් පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, අපට තව බොහෝ දේවල් කථා කරන්න තිබුණත්, වෙලාව මදිකමක් තිබෙන බව මම දන්නවා. විවාදය අතරවාරයේ යම් ප්‍රශ්නයක් මතු වුණොත් ඒ සඳහා අවස්ථාව ලබා ගන්න මම විනාඩි දෙක තුනක් ඉතිරි කර ගන්නවා. මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න සියලු දෙනාගේ සහයෝගය අපේක්ෂා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමා.

[පූ.භා. 11.44]

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, වෙළඳ නැව් පනත යටතේ ඉදිරිපත් කර තිබෙන නියෝගය ද සාකච්ඡා කරන මේ අවස්ථාවේ බොහොම කෙටියෙන් අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා. කාට හරි මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් මාගේ පිළිතුරු කථාවේදී එම පැහැදිලි කිරීම් කරන්න ඉඩකඩ තබා ගෙන, බොහොම කෙටියෙන් අදහස් ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ජාත්‍යන්තර සම්මුති සංවිධානයේ සම්මුතියක් වන SOLAS නමින් හැඳින්වෙන මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට මෑතකදී හඳුන්වා දුන් සංශෝධනයක් ප්‍රකාරව තමයි මේ නියෝග නිකුත් කර තිබෙන්නේ.

මේ නියෝග හරහා අපි බලාපොරොත්තු වන්නේ නැවකට පටවන කන්ටේනර්වල බර හරියාකාරව සහතික කිරීමෙන් අනතුරුව ඒ නැවට පටවන්න අවසර දීම. මොකද, මෙවැනි දේවල් කිරීමෙන් තොරව නැව්වලට කන්ටේනර් පැටවීමෙන් ඒ නැව් විශාල අනාරක්ෂිතභාවයකට ලක් වෙලා තිබෙන බව අපි අහලා තිබෙනවා. ඒ වාගේම බර වැඩිකම නිසා නැව් කීපයක් ගිලිලා තිබෙනවා. එතකොට ඒ නැවේ ගමන් කරන, ඒ නැවේ සේවය කරන අයගේ ජීවිතවලට හානි සිද්ධ වනවා. එවැනි හානි සිද්ධවෙලාත් තිබෙනවා; ඉදිරියේදීත් මෙවැනි හානි සිද්ධ වන්න ඉඩ කඩත් තිබෙනවා. මේ සියල්ලක්ම සැලකිල්ලට අරගෙන තමයි IMO එක මේ සම්මුතිය හඳුන්වා දීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව ඒ සම්මුතිය භාර ගැනීමත් සමඟ ඒ සම්මුතිය ක්‍රියාවට නංවන්න මේ නියෝග විෂයය භාර ඇමතිවරයා හැටියට අද මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කරන්න මා කටයුතු කරලා තිබෙන්නේ. එම නිසා මම කලින් කිව්වා වාගේ මීට වඩා මා මේ කෙටි හැඳින්වීම දිගු කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. කාට හරි ප්‍රශ්නයක් අහන්න හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් එයට පිළිතුරු දෙන්න මා සූදානම්. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා.

[11.46a.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Speaker, for giving me this opportunity to speak on the Fisheries and Aquatic Resources (Amendment) Bill that has been moved by the Hon. Minister of Fisheries and Aquatic Resources Development and on the Regulations under the Merchant Shipping Act.

I would really like to take time to speak on the first matter on the Amendments to the Fisheries and Aquatic Resources (Amendment) Bill. Let me right at the outset congratulate and thank the Hon. Minister for taking this step, which had been a long-standing request, primarily by the fishermen of the North. This particular method of fishing is universally accepted as one that is detrimental and very damaging to the marine resources. There is no two words about that. Yet, there was a long delay in making this Act an unlawful Act and prescribing punishments for it, because there were said to be international relations that have got entangled in this.

The Hon. Minister spoke about the fact that mostly it was Indian trawling boats that engaged in this exercise in the Sri Lankan waters. I do not even call them "Indian fishermen" because having studied the matter in detail, I have come to realize that it is not fishermen who are engaged in this particular method of fishing. Fishermen are used to various methods that they have been practising traditionally for ages. The trawlers that use "bottom nets" or "dragged nets" as they are called, are generally owned by various persons who have business

interest and they employ workmen on those boats and there is no fishing that happens on the bottom trawlers. They just sit in the trawler and drag the bottom of the sea. The seabed undergoes severe damage. All resources on the seabed gets scrapped up and we are told that whatever that is gathered by that method, less than 10 per cent is only taken as a catch. The rest is dumped back in the sea. There is no use thereafter. But by this particular method, the marine resources are totally depleted putting successive generations at peril. So, this is the kind of method that is universally accepted as I said as a very damaging practice, which can even not be described as a method of fishing.

The reason why it took so long, perhaps was because there were diplomatic issues when fishermen from India were arrested for straying into Sri Lankan waters. That always gave rise to tension; there were negotiations about their release and so on. But, this Bill seeks to do something very different and it is being done at a time when both countries have, as a matter of policy, jointly agreed that the practice of bottom trawling must be stopped. It is also with a sense of achievement that I speak today because, as the Hon. Minister acknowledged, I moved the Fisheries and Aquatic Resources Act (Amendment) Bill as a Private Members' Bill, not once but twice, in the last Parliament. But, when Parliament was dissolved, I had to move it again in this Parliament.

I must thank the Hon. Minister for including me in the two Ministerial-level delegations that had talks with the Government of India in November, last year in New Delhi and again in January, this year in Colombo. It was in November last year that the Indian Government agreed that bottom trawling must be banned and a Joint communique was issued after the talks in New Delhi, where the Hon. Mangala Samaraweera, the then Minister of Foreign Affairs and the Hon. Mahinda Amaraweera, Minister of Fisheries and Aquatic Resources Development, participated with two Central Government Ministers of India, including the Minister of External Affairs, Shrimati Sushma Swaraj. That Communique very specifically states that the practice of bottom trawling must be brought to an end. So, there is no dispute between the two countries. Both countries now agree on the policy that this is a damaging method and it must be brought to an end. Sir, I am glad that this Fisheries and Aquatic Resources (Amendment) Bill is being brought in such a context where this issue is no more in dispute. It is agreed by responsible persons from both countries that whoever it may be, the violators must be punished.

இந்தத் தருணத்திலே, மிகவும் விசேடமாக வடக்கு மீனவர்களை வெகு காலமாகப் பாதித்த ஒரு நடைமுறையை முடிவுக்குக் கொண்டுவருகின்ற விடயம் தொடர்பான சட்டமூலத்தின்மீது பேசுவதிலே நான் பெருமையடை கின்றேன். இந்த இழுவைமடித் தொழில் தடுக்கப்பட வேண்டுமென்று இந்திய மத்திய அரசாங்கமும் இலங்கை அரசாங்கமும் ஒன்றாக இணங்கியிருக்கின்றன. ஏனென்றால், இந்த முறையினாலே நீர் வளத்திற்கு, கடல் வளத்திற்கு, கடலின் அடித்தளத்திற்கு மாற்றீடு செய்ய முடியாத பாரிய சேதம் ஏற்படுகின்றது என்பது விஞ்ஞான பூர்வமாக அனைவரும் ஏற்றுக்கொண்ட ஓர் உண்மை நிலைப்பாடு. எங்களுடைய மீனவர்களுக்கு இந்திய மீனவர்களுடைய ஊடுருவல் பாரிய பிரச்சினையாக இருந்தது. ஆனால், ஒரு சிறிய நீரிணையினால் பிரிந்திருக்கின்ற இந்த இரண்டு நாடுகளிலும் இருக்கின்ற மீனவர்கள் கடல் எல்லையைத் தாண்டி ஒருவர் மற்றவருடைய பிரதேசத்திற்குப் போவது தவிர்க்க முடியாதது. வழமையாக அவர்கள் பாரம்பரியமாக மீன்பிடித் தொழிலில் ஈடுபட்டிருக்கின்றபோது அப்படியான எல்லைகளை இரு சாராரும் கடப்பது சாதாரணமான விடயம். ஆனால், இப்படியான ஓர் இழுவை மடித் தொழிலைச் செய்வதன் மூலமாக எங்களுடைய கடல் வளத்தை முற்றாக அழிக்கின்ற ஒரு செயற்பாடு நடைபெறுகின்றபோது அதைத் தடுக்கவேண்டிய அத்தியாவசிய தேவையேற்படுகிறது.

இந்த இழுவை மடி trawler மூலமாகத்தான் இப்படியான 99 வீதமான ஊடுருவல் நடக்கின்றது. அது தற்செயலாக அவர்கள் எல்லையைக் கடந்து வருகின்ற நிகழ்ச்சியல்ல. இது சம்பந்தமாக satellite மூலமாக எடுக்கப்பட்ட பல படங்களை நாங்கள் பார்த்திருக்கின்றோம். அவர்கள் எந்ததெந்த இடங்களிலே கூடுதலான வளங்களைச் சுரண்ட முடியுமென்று பார்த்து, அந்த இடங்களிலே ஊடுருவலை மேற்கொள்கின்றார் கள். சில வேளைகளிலே இலங்கையின் கடற்கரைக்கு அண்மித்த பகுதியில்கூட இந்த ஊடுருவல் நடைபெறுகின்றது. ஒரு தடவை நான் கௌரவ அமைச்சர் அவர்களுடன் சென்று இந்த இடங்களைப் பார்வையிட்டிருந்தேன். அப்படியாக வந்து எமது மீன் வளங்கள் முழுவதையும் இழுத்துச் செல்வதோடு, பாரம்பரியமாகத் தொழிலில் ஈடுபட்டிருக்கின்ற எமது மீனவர்களின் வலைகளும் உபகரணங்களும் சேதமாக்கப் படுவது மட்டுமல்லாமல், பல சமயங்களில் அவர்கள் நேரடியாகத் தாக்கப்படுகின்ற சம்பவங்களும் நிகழ்ந்திருக் கின்றன. ஆகையினால், இப்படியான ஒரு தொழில் முறை சுற்றாடலுக்கும் மீனவர்களுக்கும், விசேடமாக எதிர்வருகின்ற சந்ததியினருக்கும் பாரியதொரு பாதிப்பை ஏற்படுத்துகின்ற தென்ற காரணத்தினால், இதனைத் தடுக்கவேண்டும் என்ற இணக்கப்பாடு இரு நாடுகளுக்கிடையே ஏற்பட்ட பிறகு, இந்தச் சட்டமூலத்தை அரசாங்கச் சட்டமூலமாகக் கொண்டு வருவதையிட்டு நான் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களுக்கு இதுகுறித்துத் தனிப்பட்ட அனுபவம் உண்டு. தனி நபர் சட்டமூலமாக தகவல் அறியும் சட்டமூலத்தை அன்று அவர் எதிர்க்கட்சி வரிசையிலிருந்து முன்னிலைப்படுத்திய வேளையிலே, "அதை நீங்கள் கொண்டுவர முடியாது, நாங்களே அதைச் சமர்ப்பிப்போம்" என்று கடந்த அரசாங்கம் ஓர் உறுதிமொழி சொல்லி அதைத் தடுத்தது. அந்தப் பாராளுமன்றக் காலத்திலேயே ஓர் ஆட்சி மாற்றம் ஏற்பட்ட பிறகு தகவல் அறியும் சட்டமூலத்தை அரசாங்கச் சட்டமூலமாக தற்போதைய அரசாங்கத்தால் கொண்டுவரக்கூடியதாக இருந்தது. அதைவிட விசேடமான, சிறப்பான ஒரு நிகழ்வு இன்று நிகழ்கின்றது. எதிர்க்கட்சியிலே இருந்துகொண்டு தனிநபர் சட்டமூலமாக இதைக் கொண்டுவந்தபோது, அதை அரசாங்கம் தடுக்கவில்லை. அதைச் சமர்ப்பிப்பதற்கு சபையும் அனுமதி கொடுத்தது. அதுமட்டுமல்ல, அதுகுறித்த அமைச்சுக்கு அனுப்பப்பட்டபோது அதனோடு இணங்குவதாகச் சொல்லி அதை அனுமதிக்கும்படியான ஓர் அறிக்கையும் பாராளுமன்றத்திற்குக் கொடுக்கப்பட்டது. தனிநபர் சட்டமூலமாகக் கொண்டுவந்து அதற்கு ஒரு திருத்தத்தை ஏற்படுத்துவதைவிட, அரசாங்கச் சட்டமூலமாகக் கொண்டு வந்து அரசாங்கமே உரிய திருத்தத்தை மேற்கொண்டால்,

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

அதனுடைய வலுவிலே எந்தவிதமான கேள்வியும் எழமுடியாது என்பதனைக் கருத்திற்கொண்டு அப்படியான ஒரு விண்ணப்பத்தை நான் செய்தபோது, கௌரவ அமைச்சர் அவர்களும் அதற்கு இணங்கி, இதை அரசாங்கச் சட்டமூலமாகக் கொண்டுவந்திருக்கிறார். அதனையிட்டு நான் பெருமகிழ்சியடைகின்றேன். நீரியல் சம்பந்தமான என்னுடைய தனிநபர் சட்டமூலத்தை நான் பிறிதொரு நாளிலே மீளப்பெற்றுக்கொள்வேன்.

I will formally withdraw my Private Members' Bill that is still pending on another day. I am extremely happy and I thank the Hon. Minister for taking on the responsibility to bring this as a Government Bill so that there is no doubt or question as to the efficacy of this amendment, when it is brought into operation.

கௌரவ அமைச்சர் அவர்கள் சொன்னதைப்போல, இந்தத் தொழில் முறையைத் தடுப்பதன் காரணத்தினால் சில சமயங்களிலே பிடிக்கப்படுகின்ற மீன், அதுவும் விசேடமாக இறால் வகைகளுடைய தொகை குறையக்கூடும். என்றாலும், இது பொறுப்போடு செய்யப்படுகின்ற ஒரு விடயமாகும். எதிர்வரும் காலங்களிலே தொடர்ச்சியாக மீன் உற்பத்தி செய்யப்படுவதற்கும் அதற்கான அடிமட்ட வளங்கள் பாதுகாக்கப்படுவதற்கும் இப்படியான தொழில்முறை தடுக்கப்படுவது அத்தியாவசியமாக இருக்கிறது.

கௌரவ அமைச்சர் அவர்கள் பேசுகின்றபொழுது, "இந்தியாவிலிருந்து வருகின்ற 'ரோலர்'கள் மட்டும் இதிலே ஈடுபடவில்லை, எம்முடைய மீனவர்கள் சிலரும் இதிலே ஈடுபடுகிறார்கள்" என்று சொன்னார். வடக்கிலே சில இடங்களில் அப்படியாகச் சிலர் ஈடுபடுவது எங்களுக்குத் தெரியும். தனிநபர் சட்டமூலமாக இதைச் சமர்ப்பித்த பிறகு மீனவ சமூகங்களோடு நான் பல பேச்சுவார்த்தைகளை நடத்தினேன். இதனால் சுற்றாடலுக்கு ஏற்படுகின்ற தீமை சம்பந்தமாக அவர்களுக்கு விளக்கியிருக்கிறேன். அவர்கள் அதை மறுக்கவில்லை. ஆனால், சிற்சில இடங்களில் சேற்றுக் கடலில் மட்டும் அந்தத் தொழிலைச் செய்வதாக அவர்கள் கூறினார்கள். அங்கு நீருக்கடியிலே பாறைகள் எதுவும் கிடையாதெனவும் கடல் அடியை அது பாதிக்கவில்லையென்றும் அவர்களில் பலர் தங்களுடைய கருத்தை முன்வைத்தார்கள். அது மட்டுமல்ல, மிகச் சிறிய அளவிலான படகுகள்மூலம் தாங்கள் தொழில் செய்வதாகவும் அப்படகுகளுடைய விசை மிகவும் குறைந்ததென்றும் அவர்கள் சொல்லியிருக்கிறார்கள். படகினுடைய அளவு - அதனுடைய பிரமாணம் இதிலே முக்கியமான ஒரு விடயமல்ல. ஆனால், இப்படியாகச் சில இடங்களிலே மீன்பிடி நடவடிக்கைகளை மேற்கொள்வது நீரியல் வளத்தைப் பாதிக்காது என்று விஞ்ஞானபூர்வமாக நிரூபிக்கக்கூடுமாக இருந்தால், அதைத் தடுக்கவேண்டிய அவசியம் கிடையாது. ஆனால், தற்போது எங்களிடத்திலே இருக்கின்ற தரவுகளின்படி அப்படியாகப் பாதிப்பு இல்லாமல் இந்தத் தொழிலைச் செய்ய முடியுமா? என்பதிலே பாரிய சந்தேகம் இருக்கின்றது. ஆனாலும், அவர்கள் சொன்னதன்படி ஏதாவது குறித்த ஓர் இடத்தை விஞ்ஞானபூர்வமாக ஆராய்ச்சி செய்து, குறித்த இடம் முற்றுமுழுதாகச் சேற்றுக் கடல். இதிலே இழுவைமடித் தொழிலைச் செய்வதனாலே எந்தவிதமான பாதிப்பும் ஏற்படாது என்று உறுதிப்படுத்த முடியுமாக இருந்தால், அந்தப் பிரதேசத்தை அமைச்சர் அவர்கள் வெளிப்படுத்தி, உரிய நடவடிக்கை எடுக்கலாம்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ වීය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වන්නි දිස්ත්‍රික්කයේ ගරු මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමාත් දන්නවා, ඉන්දියානු ධීවරයන්ගේ පැමිණීම ලෙහෙසියෙන් පාලනය කරන්න බැරි බව. ඇමතිතුමාගේ ප්‍රකාශය හොඳ හිතින් කරන ලද ප්‍රකාශයක්. මසුන් මරන විශාල ඉන්දියානු යාත්‍රාවන්, ඒ වාගේම සමාගම්වල ශක්තිය සමඟ මේ ප්‍රශ්නය තවත් උග්‍ර වී තිබෙනවා. ඒ නිසා නිතර දෙවේලේ ඒ අය අත් අඩංගුවට ගන්න සිදු වෙනවා. ඉන්දියානු බලධාරීන් විසින් අපේ ධීවරයන්ද අත් අඩංගුවට ගැනීමේ ගැටලුව නිසා මේ ධීවර ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා එක හා සමානව දෙපාර්ශ්වයේ රෙගුලාසි ශක්තිමත් කිරීම වැදගත්. එක පාර්ශ්වයකට පමණක් නොව පාර්ශ්ව දෙකම එලෙස ශක්තිමත් කිරීමේ වැදගත්කම ගැන මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. ඉන්දියාවේ ධීවර කර්මාන්තය ප්‍රාන්ත ආණ්ඩුවලට හිමි බලයක් බවට පත්ව තිබෙනවා. අපේ රටේත් පළාත් සභාවලට ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් විශාල බලතල ප්‍රමාණයක් බාරදීලා තිබෙනවා. නමුත් ඉන්දියාවේ ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් සුවිශේෂ බලය තිබෙන්නේ ප්‍රාන්ත ආණ්ඩුවලට. ඒ නිසා ප්‍රාන්ත ආණ්ඩු මඟින් එල්ල කරන බලය -ශක්තිය- බලපෑම තමයි අද අපට විශාල ආදායමක් උපයාගත හැකි ධීවර කර්මාන්තයේ තෝතැන්න වන උතුරුකරයේ ධීවරයන්ට මතුවී තිබෙන ප්‍රශ්නය.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දෙවැනි කාරණය මෙයයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන වග කීමක් දරන ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාත් සම්බන්ධ නිසා මා මේ කාරණය කිව යුතුයි. Sir, I would like to quote from the front-page news report titled "Govt. to go ahead with new Constitution" appearing in "The Island" newspaper of today.

> "The government said yesterday that it would go ahead with the Constitution making process, but the final decision on enacting a new Constitution would be made by Parliament.
>
> 'There is no need for anyone to get unduly agitated over it', Health Minister Rajitha Senaratne told the weekly Cabinet press briefing at the Information Department.
>
> He said that the New Constitution Bill would contain proposals from a cross section of Sri Lankans and retain the unitary status of the country without doing away with the current status of Buddhism."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා මෙවැනි ප්‍රකාශයක් කිරීමෙන් රට නොමඟ යවා තිබෙනවා. මම එය වග කීමෙන් යුතුව ප්‍රකාශ කරනවා. මේ ඉල්ලීම ඉෂ්ට කිරීම සඳහා දැනට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව හමුවේ තිබෙන යෝජනා නිසායි මහා නායක ස්වාමීන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය මේ පිළිබඳව ප්‍රකාශයක් කළේ කියා අපි දන්නවා. Sir, I will quote from that document because it is a public document now; it is no more a confidential document of a few. The Hon. Minister has misled the country.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
He is the Cabinet Spokesman.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Yes, he is supposed to be the Cabinet Spokesman. He is a government by himself. That is what has happened.

Sir, I will quote the proposed Articles 1 and 2 - those Articles talk about the Unitary State in the current Constitution - for the new Constitution. There are three alternatives that have been proposed. Therefore, how can the Hon. Minister say that there has not been any such deviation? This document I have here with me gives one proposal, which states, I quote:

> "Sri Lanka (Ceylon) is one free, sovereign, independent, undivided and indivisible Republic consisting of the institutions of the Centre and of the Provinces which shall exercise power as laid down in the Constitution."

මෙන්න, "ඒකීය රාජ්‍ය" අහෝසි කරලා ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න හදන එක යෝජනාවක්! දෙවෙනි එක, I quote:

> "Sri Lanka (Ceylon) is one free, sovereign, independent, undivided and indivisible Republic."

Where is the word "Unitary"? I ask, will the Government be able to answer that question. Do not mislead the country. The *Maha Sangha* has been correct. On what is available before them, they have commented. So, we should not reject what the *Maha Sangha* has said unless the Government makes a statement to say that they are committed to the protection of the Unitary State.

Another proposal that you all are considering states, I quote:

> "Sri Lanka (Ceylon) is a free, sovereign and independent Republic which is an aekiya rajyaya/ orumiththa nadu".

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සිංහල භාෂාවෙන් කියනවා, "ඒකීය රාජ්‍ය" කියලා; දෙමළ භාෂාවෙන් කියනවා, "ඔරුමිත්ත නාඩු" කියලා. ඉංග්‍රීසි භාෂාවෙන් ඒක කියන්නේ නැහැ; ඉංග්‍රීසියෙන් "Unitary" කියන වචනය අත හැරියා. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාගෙන් මම අහනවා, ආණ්ඩුවේ සම කැබිනට් ප්‍රකාශක හැටියට ඔබතුමා මොකක්ද ඊයේ කියා තිබෙන්නේ? රටේ පුරවැසියන් හැටියටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියටත් ඒ ගැන අහන්න අයිතියක් අපට තිබෙනවා. මොකද, අවසානයේ අපියි පාර්ලිමේන්තුවේදී ව්‍යවස්ථාව හදන්නේ. ඇයි, "9. වන ව්‍යවස්ථාව අහෝසි කිරීමට කිසිම පියවරක් අරගෙන නැහැ" කියලා ප්‍රකාශ කළේ? මහා නායක ස්වාමීන් වහන්සේලා, මහා සංඝරත්නය ඉතා පැහැදිලිව කියා තිබෙනවා, "අලුත් ව්‍යවස්ථාවක් සකස් කිරීම සුදුසු නොවන බව". අපි 9. වන ව්‍යවස්ථාව අරගෙන බලමු. 9. වන ව්‍යවස්ථාවේ තමයි බුද්ධාගම ගැන සඳහන් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද 9. වන ව්‍යවස්ථාවෙන් කියන්නේ? 9. වන ව්‍යවස්ථාව අහෝසි කිරීමට කිසිම පියවරක් අරගෙන නැහැ කියලා ඇමතිතුමා කොහොමද කියන්නේ? 9. වන ව්‍යවස්ථාව අහෝසි කිරීමට විකල්ප 7ක් යෝජනා කර තිබෙනවා. එම විකල්ප 7 ගැන ඇමතිතුමා දන්නවාද? අද තිබෙන්නේ, ".....Sri Lanka shall give to Buddhism the foremost place and accordingly it shall be the duty of the State to protect and foster the Buddha *Sasana*,..." යනුවෙන්. Now, they are trying to deviate from that to say "Sri Lanka recognises the equality of all religions and beliefs and guarantees to all persons the fundamental rights guaranteed by the Constitution".

ඉතින් කොහොමද ගරු ඇමතිතුමා කියන්නේ, එහෙම පියවරක් අරගෙන නැහැ කියලා. කාවද රවටන්න හදන්නේ? මේ දැනට ප්‍රසිද්ධියට පත් කරලා තිබෙන Draft Interim Report එක. එම නිසා ආණ්ඩුව ඒ ගැන දන්නේ නැහැ කියන්න බැහැ. මොකද, ආණ්ඩුවත් හවුල් වෙලා තමයි මේ කටයුත්ත කරන්නේ. මේ කෙටුම්පත ගිය සුමානේ ප්‍රසිද්ධියට පත් කර තිබෙනවා. බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවට විවිධ අය ගෙන්වලා, සම්මන්ත්‍රණයක් තියලා, ආණ්ඩුව කථා කරපු දේවල් මහා නායක ස්වාමීන් වහන්සේලා දන්නේ නැහැ කියලා හිතන්න එපා. ඒවා දන්නේ නැත්තේ, ඊයේ ප්‍රකාශයක් කළ සම කැබිනට් ප්‍රකාශක රාජිත සේනාරත්න වෙන්න ඕනෑ.

මෙවැනි නොමඟ යවන ප්‍රකාශ කිරීමෙන් මහා සංඝ රත්නය හා මහා නායක ස්වාමීන් වහන්සේලා නොමඟ යැවීමට දරන උත්සාහය -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිනේෂ් ගුණවර්ධන නිටපු අමාත්‍යතුමා මතු කරන්නේ ඉතා වැදගත් කරුණක්. විශේෂයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා මෙහෙයුම් කමිටුව තුළ දැනට සාකච්ඡාවක් සිදුවෙමින් පවතිනවා.

ඒ සාකච්ඡාවට විවිධ යෝජනා, විවිධ අදහස් ඉදිරිපත් වෙමින් තිබෙනවා. එවැනි යෝජනා, විවිධ අදහස් ඉදිරිපත් කෙරෙමින් තිබියදී, කවුරුන් හෝ කෙනෙක් විසින් කොතැනක හෝ තැනකදී නිල වශයෙන් යම් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවාද? දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා පෙන්නුම් කරන පරිදි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති යම් සාකච්ඡාවකදී නිල වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. හැබැයි එවැනි නිල වාර්තාවක් ඉදිරිපත් කරන්න කිසිදු තැනකදී එකඟතාවකට පැමිණ නැහැ. පාර්ලිමේන්තුවේ මෙහෙයුම් කමිටුව තුළ යම් සාකච්ඡාවක් සිදුවෙමින් පවතිනවා. එම සාකච්ඡාවෙන් පසුව සකස් කරන වාර්තාව පවා ඉදිරිපත් කළ යුතු වන්නේ පාර්ලිමේන්තුවටයි. මොකද, ඒ මෙහෙයුම් කමිටුව, මේ පාර්ලිමේන්තුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් බවට පත්වෙලා ඒ සභාව විසින් පත් කරන ලද කමිටුවයි.

ඒ කමිටුවට පැවරී තිබෙන්නේ මේ සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්නයි. හැබැයි මේ සභාවට වාර්තාවක් ඉදිරිපත් නොකර, කොතැන හෝ තැනකදී වෙනත් වාර්තාවක් ඉදිරිපත් වෙනවා නම් එය බරපතළ තත්ත්වයක්. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරුණ විශේෂ සැලකිල්ලට ලක් කරන්න ඕනෑ. මොකද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා සාකච්ඡාවක් පවත්වාගෙන යන තත්ත්වයක් තුළ කවර හෝ කෙනෙකු විසින් වෙනත් වාර්තාවක් ඉදිරිපත් කරනවා නම් එය සැලකිල්ලට ලක් කළ යුතුයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Sir, I quoted what the Cabinet "*Prakashaka*" said on that, as reported in today's "The Island". - [*Interruption.*] Yes, I did quote him. Since the Hon. Prime Minister is here and if you want, I will quote again for the Hon. Prime Minister also to hear what the Hon. Minister Rajitha Senaratne, the Cabinet Spokesman, has said. The newspaper reports, I quote:

> "He said the New Constitution Bill, would contain proposals from a cross section of Sri Lankans and retain the unitary status of the country without doing away with the current status of Buddhism."

"The Island" also quotes him as having said that "There is no need for anyone to get unduly agitated over it...", referring to the Maha Sangha and the Mahanayakas.

Now, what I have here with me is the document which I quoted from. It is an open document today; it is no more a secret document. The Hon. Anura Dissanayake says it is a secret document. No, this was discussed openly at the seminar held at the BMICH, after the Hon. Prime Minister left. I know the Hon. Prime Minister was not there when this was discussed. Now, it is an open document. So, why is the Cabinet Spokesman saying that the Mahanayakas should not get agitated? Obviously, there are proposals regarding Article 9 - Buddhism - of the current Constitution and other proposals included in this. Those proposals made with regard to Buddhism are going to deviate from the existing Article 9. So, the Mahanayakas have every right to express their views. Therefore, the Hon. Minister is wrong. This is what I am trying to say. - [*Interruption.*] The Constitutional Assembly has not discussed this, yes.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මට වෙන් කර තිබෙන වෙලාව.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අපේ පක්ෂයට වෙන්කර තිබෙන කාලයෙන් ඔබතුමාට දෙන්නම්. මොකද, මේ කරුණ වැදගත් නිසා.

ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමාත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කරන මෙහෙයුම් කමිටුව නියෝජනය කරනවා. ඒ කමිටුව විසින් සකස් කරනු ලබන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමකින් තොරව වෙනත් කිසිදු තැනක ඉදිරිපත් කිරීම සඳහා අප අතර කිසිදු එකඟතාවක් වුණේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා පෙන්වා දෙන පරිදි වෙනත් තැනක ඒ වාර්තාව ඉදිරිපත් වෙමින් තිබෙනවා. එය කිසිසේත්ම සුදුසු කාර්යයක් නොවෙයි. ඒ වාර්තාව සකස් කිරීම තවම අවසන්වෙලාත් නැහැ, තවමත් සාකච්ඡාවට බඳුන් වෙමින් තිබෙනවා. අදත් සවස 2.30ට සාකච්ඡාවට බඳුන් වීමට නියමිතව තිබෙනවා. එසේ තිබියදී, මෙවැනි වාර්තාවක් ඉදිරිපත් කළේ කවුද, ඒක කවර වාර්තාවක්ද, මොකකින් අනුමත කරන ලද වාර්තාවක්ද කියලා මෙම පාර්ලිමේන්තුව දැනගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණා සියල්ලම අපි සාකච්ඡා කරලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කරනවා. ඒ සාකච්ඡාව දැන් පවත්වාගෙන යනවා. ඒ සාකච්ඡාව කරගෙන යන අවස්ථාවේදී විටින්විට විවිධ විකල්ප යෝජනා අපට ලැබී තිබෙනවා. ඒ යෝජනා ගැන අපි දැන් සාරාංශ සකස් කර තිබෙනවා. ඒත් අපි කිසි විටෙක ඒවා එක වාර්තාවක සඳහන් කරලාත් නැහැ; පිට කරලාත් නැහැ. මට එකක් කියන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂයත්, ජනාධිපතිතුමාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් -අපි සියලුදෙනාම- එකඟ වෙලා තිබෙනවා, බුද්ධාගමට තිබෙන ප්‍රමුඛස්ථානය ඉවත් කරන්නේ නැහැයි කියලා. මා හිතන්නේ නැහැ, කවුරුවත් ඒකට විරුද්ධ වනවාය කියලා. මහා නායක ස්වාමීන් වහන්සේලා හමුවෙලා මගේ වග කීමෙන් මහා නායක ස්වාමීන් වහන්සේලාට කිව්වේ, "ඒ සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටුවේ ප්‍රශ්නයක් නැහැ. එතැනට ආවාම අපි අදාළ තීරණ ගනිමු"යි කියලායි. මා හිතන්නේ නැහැ, කිසිම බාධාවක් තිබෙනවාය කියලා. සමඟර විට රාජිත සේනාරත්න ඇමතිතුමා සඳහන් කරන්න ඇත්තේ, ආණ්ඩුව තුළ ඉන්න ප්‍රධාන පක්ෂ අතර තිබෙන එකඟතාව ගැන වෙන්න ඇති. මට කොහොමවත් ඉල්ලීමක් ලැබිලා නැහැ, මේ පිළිබඳව විශාල සංශෝධනයක් කරන්න ඕනෑය කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එවැනි වාර්තාවක් නැහැ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

එවැනි වාර්තාවක් නැහැ. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි, මායි, ආණ්ඩුවේ පක්ෂයි එකඟ වෙලා තිබෙනවා, බුද්ධාගම ප්‍රමුඛස්ථානයේ තියනවා කියලා. [බාධා කිරීම්] වාර්තාව අපි තවම ලියාගෙන යනවා. තවම වාර්තාවක් නැහැ. අපි වාර්තාවක් සකස් කරන්න සාකච්ඡා කරමින් යන්නේ. අපි අතර එකඟත්වයක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Dinesh Gunawardena, your time is over.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඒක නේ වැඩේ. අපට කථා කරන්න දෙන්නේ නැහැනේ මේ පාර්ලිමේන්තුවේ. ගරු අගමැතිතුමනි, මගෙන් ගරු අනුර දිසානායක, විරුද්ධ පක්ෂයේ සංවිධායකතුමා ඇහුවා, මේ ලියැවිල්ල කොහොමද ඇවිල්ලා තියෙන්නේ කියලා. ගිය සතියේ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති උත්සවයට අගමැතිතුමාත් ගියා. දකුණු අප්‍රිකාවේ හිටපු විනිසුරුතුමාගේ දේශනයෙන් පස්සේ අගමැතිතුමා ගියා. ඊට පස්සේ තිබුණු සැසිවාරවලදී මේ කරුණු සාකච්ඡාවට ලක් කළා. එසේ සාකච්ඡාවට ලක් කරන්නේ මේ කරුණු නැතිවද? කවුද කියන්නේ, මේ කරුණු නැතිව සාකච්ඡා කළා කියලා? කවුද එහෙම කියන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
This is the Debate on the Regulations under the Merchant Shipping Act and the Fisheries and Aquatic Resources (Amendment) Bill that is going on now.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මහ ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශිත." මා ප්‍රශ්නයක් ඇති කරන්නේ නොවෙයි මේ කරුණ සඳහන් කළේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
අද වෙන subject එකක් ගැන නේ කථා කරන්නේ. Another Debate is going on now.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ප්‍රශ්නයක් ඇති කිරීම සඳහා නොවෙයි මා මේ ප්‍රශ්නය මතු කළේ. ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා වගකීමකින් තොරව,- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මේ අද කථා කරන subject එක නොවෙයි නේ. [බාධා කිරීමක්] Yes, Hon. Prime Minister? [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

කාලය පිළිබඳ ප්‍රශ්නය ඔබතුමන්ලා විසඳාගන්න. [බාධා කිරීම්] ඒත් බුද්ධාගමේ-

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමන්ලා විෂයයෙන් පිට කථා කරන්නේ. අද ධීවර විෂයය ගැනයි කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Next speaker is, the Hon. (Mrs.) Vijayakala Maheswaran.

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)
කෙළරව කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළේ, ඉන්‍රෙය විවාතත්තිල් කලන්තු කොළ්වතිල් නාන් මනමකිළ්ච්සියටෙකින්‍රේන්. වටක්කු, කිළක්කිලුළ්ළ මීනවක් කුටුම්පංකළ් - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, today we are debating some Regulations and the Fisheries and Aquatic Resources (Amendment) Bill.

ගරු මන්ත්‍රීතුමා ඔබතුමන්ලා කථා කරන්නේ වෙන subject එකක් නේ. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Sir, you asked the question whether what the Hon. Dinesh Gunawardena raises comes under this topic we are debating. I would say, yes, because he is fishing in troubled waters. -[*Interruption.*]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි මතු කරන කාරණය වැදගත්. පාර්ලිමේන්තුව ව්‍යවස්ථාදායක සභාවක් බවට පත් වෙලා, මෙහෙයුම් කමිටුවක් පත්කර තිබෙනවා. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්නකෝ. ඔබතුමාට මොකද වෙලා තිබෙන්නේ? [බාධා කිරීම්] ඒක එතුමාත් එක්ක බලා ගන්න. දැන් මෙහෙයුම් කමිටුවක් පත් කර තිබෙනවා. ඒ මෙහෙයුම් කමිටුවට පැවරී තිබෙන කාර්යභාරය තමයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා අවශ්‍ය මූලික ලියැවිල්ලක් සකස් කරලා ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කිරීම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
නමුත් ගරු මන්ත්‍රීතුමා, දැන් අපි කථා කරන්නේ subject එකක් ගැන නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එසේ නියමිත පරිදි ඉදිරිපත් නොකර, වෙන තැන්වලට ඉදිරිපත් කර තිබෙනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ගැන අපි බලන්න ඕනෑ. ඒ කොහේදීද ඉදිරිපත් කරලා තිබෙන්නේ? දැන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කරනවා, BMICH එකේදී ඉදිරිපත් කරපු ලියැවිල්ලක්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම එක කාරණයක් කියන්න කැමැතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එදා බෙදුවා. කොහොමද කියන්නේ බෙදුවේ නැහැ කියලා? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please!

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම වෙලා තිබෙනවා. මේ ගරු සභාවට අසත්‍යය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීවරුනි, කෑ ගහන්න එපා. නිශ්ශබ්ද වන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ස්ථාවර නියෝග අනුව මේ සභාවට එවන්න පුළුවන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුවෙන් විතරයි. එම මෙහෙයුම් කමිටුවෙන් කිසිම වාර්තාවක් යොදවලා නැහැ. අනුකමිටු වාර්තා හයක් මෙහෙයුම් කමිටුවට ලැබී තිබෙනවා. ඒක මෙහාට ගෙනැවිත් තිබෙනවා. ඊට අමතරව විවිධ සංවිධානවලින් විවිධ විධියට යෝජනා ලැබිලා තිබෙනවා. ඒ යෝජනා සාරාංශ කරලා තිබෙනවා. ඊට වඩා නම් අපි මොකුත් ඉදිරිපත් කරලා නැහැ. -[*Interruption.*] There was nothing by the Steering Committee.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, there was nothing by the Steering Committee.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව නවත්වන්න කිසිම හේතුවක් නැහැ. [බාධා කිරීමක්] මට වෙලාව දෙනවා කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා. -[*Interruption.*] Order, please!

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු අගමැතිතුමා ඒ කාරණයට උත්තර දුන්නා. Sir, the Hon. Prime Minister replied. We will proceed with the day's Business.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is the situation?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Deputy Speaker- [*Interruption.*]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
You cannot talk out of the point.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, the Hon. Prime Minister replied.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I was on my feet and I was just explaining.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. He is-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Please give me five minutes. You took my time. I asked about the Hon. Rajitha Senaratne's statement. I quoted it and asked why the *Mahanayake Theros* were agitated. He said that they were under false guidance. Then I showed him that Article 9 is proposed to be amended. That is why the *Mahanayake Theros*- [*Interruption.*]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප තවම ව්‍යවස්ථාව හදලත් නැහැ. ඒක ගැන කථා කරනවා විතරයි. [බාධා කිරීම්] BMICH එකේ සාකච්ඡාවක් තිබුණා. එහිදී දකුණු අප්‍රිකාවේ ව්‍යවස්ථාව හදපු විශාරදයෙක්; නඩුකාරයෙක් ඇවිත් අපේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන එක ගැන කථා කළා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ ඔහොම කිව්වාට, මහානායක හිමිවරු, -[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා ඔක්කොම අසත්‍යයි. මෙතුමා කියන්නේ අසත්‍යයක්. බෙදුවේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැත්නම් අහන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මහානායක හිමිවරුන්ගේ කථාව වෙනයි. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියන වාර්තාව බෙදුවේ නැහැ. මමත් එදා හිටියා. එහෙම එකක් බෙදුවේ නැහැ. ඒක පට්ටපල් බොරුවක්. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය.

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න දෙන්න කෝ. [බාධා කිරීම්] මම කථා කළාට පසුව කථා කරන්න. [බාධා කිරීම්]

ඔබතුමන්ලා Parliament එකට ඇවිල්ලා සෙල්ලම් කරනවා. වාඩිවෙන්න. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, මගේ වෙලාව දෙන්න. [බාධා කිරීම්] මේ කට්ටිය පාර්ලිමේන්තුවේ ඇවිල්ලා සෙල්ලම් කරනවා. අපි කොච්චර දුක් විඳලාද පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ. මට කථා කරන්න ඉඩ දෙන්න. ඔබතුමන්ලා සෙල්ලම් කරනවා. අද කථා කරන්නේ ඔය සම්බන්ධව නොවෙයි නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

හැම දාම ජාතිවාදය අවුස්සනවා. එළියෙත් අවුස්සනවා; ඇතුළෙත් අවුස්සනවා. පිස්සු කථා! [බාධා කිරීම්] ඔබතුමා ජාතිවාදය අවුස්සනවා නේ, නිකම් බොරුවට.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. [බාධා කිරීම්]

ගරු විජයකලා මහේශ්වරන් මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) විජයකලා මකේස්වරන්)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] අපට උතුරේ ධීවර ප්‍රශ්න වැඩියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! ඔබතුමන්ලා වාඩි වුණා නම් මට කථා කරන්න අවස්ථාව දෙන්න පුළුවන් නේ, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ඒ වාර්තාව පට්ටපල් අසත්‍යයක්. ඒක එතුමා මෙහෙයුම් කමිටුවේ සාමාජිකයකු හැටියට එතුමාට හම්බ වුණු එකක්. මමත් ඒ රැස්වීමේ හිටියා. කිසි දෙයක් බෙදුවේ නැහැ. මෙය අසත්‍යයක්. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා තමයි SAITM එක ලියා පදිංචි කරන්න ගැසට් එක ගෙනාවේ. අන්තිමට දැන් එතුමාත් ඒකට විරුද්ධව කථා කරනවා. [බාධා කිරීම්] එතුමා SAITM එක පිළිබඳ ගැසට් එක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, දැන් ඒකට විරුද්ධව පාර්ලිමේන්තුවේ කථා කරනවා. ලජ්ජයි! ඔය අසත්‍ය වාර්තා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා, -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා රැස්වීමේ න්‍යාය පත්‍රය මා ළඟ තිබෙනවා තිබෙනවා. එම රැස්වීමේ න්‍යාය පත්‍රය අගමැතිතුමා මට දුන්නා. ඒ රැස්වීමේදී මෙහෙයුම් වාර්තාව බෙදුවා කියා කොහේවත් සඳහන් වෙලා නැහැ. Can I read it? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු සභානායකතුමා එක වෙලාවකට නෙවිල් ප්‍රනාන්දු වෙනවා. එතුමා එක වෙලාවක සභානායකතුමා, තව වෙලාවකට නෙවිල් ප්‍රනාන්දු. මොකද, එතුමා පාර්ලිමේන්තුව ගැනත් කථා කරනවා, SAITM එක ගැනත් කථා කරනවා.

මම කියන්න හැදුවේ මේ කාරණයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක බරපතළයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුව තුළ යම් සාකච්ඡාවක් සිදු වෙමින් තිබෙනවා. තවම කිසිදු අවසන් එකඟතාවකට පැමිණ නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන හිටපු අමාත්‍යතුමා කියන පරිදි එවැනි එකඟතාවකට පැමිණ නැති අවස්ථාවක, යම් වාර්තාවක් එහි ලේකම් කාර්යාලය නමින් බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පසු ගිය 28වැනි දා පැවති සම්මන්ත්‍රණයකදි බෙදුවා නම් ඒක බරපතළ වැරැද්දක්. මොකද, එහෙම එකඟතාවකට පැමිණ නැහැ. [බාධා කිරීම්] මෙහෙයුම් කමිටුවට තිබෙන්නේ, -[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු අගමැතිතුමා. [බාධා කිරීම්] ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මේ ගැන ගරු අගමැතිතුමාට කරුණු ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා එම රැස්වීමට නිල වශයෙන් ඉදිරිපත් කළ වාර්තා දෙක මම **සභාගත*** කරනවා.

මම ඒක අතිරේක ලේකම්තුමියගෙන් ඉල්ලාගෙන ඇවිත් තිබෙනවා. අනු කමිටු වාර්තා ටික ඉංග්‍රීසියෙන්, සිංහලෙන් සහ දෙමළෙන් තිබෙනවා. අනිත් එක තමයි, මෙතැන කරපු යෝජනා. මම කැමැතියි, මේක මේ සභාවට භාරදෙන්න. ඊට අමතරව මොකක් හෝ බෙදුවා කියලා කියනවා නම්, ඒක මට භාරදෙන්න. මම කමිටුවෙන් හොයලා බලලා කියන්නම්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඒකට එකඟයි නේද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔය ලියවිල්ල ගැන මම අගමැතිතුමාට කිව්වා. අගමැතිතුමා කියන එක පිළිගන්න ඕනෑ නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මමත් වග කීමෙන් කියන්නේ. මම ලේකම් කාර්යාලයට ගිහින් එතැනින් මේක ඉල්ලා ගත්තා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා මේ කිසිවක් දැකලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට "මයික්‍රෆෝන්" එක දෙන්න. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා කලබල වෙලා මෙතැනට එන්න ඕනෑ නැහැ. මම කිව්වේ, රාජිත සේනාරත්න ඇමතිතුමා කැබිනට් ප්‍රකාශක හැටියට කිව්ව කාරණාව. මහානායක හාමුදුරුවෝ කියපු දේවල් "නිකම් කලබල වෙලා වග කීමක් නැති ප්‍රකාශ" කියලා එතුමා කිව්වා. ඒක වැරැදියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නමවැනි ව්‍යවස්ථාව වෙනස් කරනවා කිව්වොත් බෞද්ධ මහානායක ස්වාමීන්වහන්සේලාගේ වගකීම මොකක්ද? නිශ්ශබ්දව සිටීම නොවෙයි නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒකට උත්තරයක් දුන්නා නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඇමතිතුමා අසත්‍ය කියන්න අවශ්‍ය නැහැ නේ. මෙහෙම එකක් තිබෙනවා නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නමවැනි ව්‍යවස්ථාව වෙනස් කොට විකල්පයන් ඉදිරිපත් කර තිබෙනවා. අගමැතිතුමා කොහොමද නැහැයි කියන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අගමැතිතුමා ඒ පිළිබඳව ප්‍රකාශයක් කරයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සභාපතිවරයා වශයෙන් ඉන්නකල් ඒකට ඉඩ දෙන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම සියම් නිකායේ මල්වත්ත පාර්ශ්වය කඩනවා කියලා තර්ජනය කරද්දී කී දෙනෙක් කථා කළාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මතකද? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! අපි විවාදයට යන්න ඕනෑ. [බාධා කිරීම්] අපි දැන් විවාදයට යන්න ඕනෑ. ගරු අගමැතිතුමාත් කථා කළාට පස්සේ දැන් මේ ප්‍රශ්නය ඉදිරියට ගෙනයන එකේ තේරුමක් නැහැනේ සභානායකතුමනි. හොඳයි. Hon. (Mrs.) Vijayakala Maheswaran, you may continue. [බාධා කිරීම්]

[பி.ப. 2.43]

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இழுவை மடி போன்ற சட்ட விரோதமான மீன்பிடி முறைகளைத் தடுப்பதற்கான *[இடையீடு]* இன்றைய சட்டமூலம் மீதான விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு *[இடையீடு]* நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். வெளிநாடுகளிலிருந்து எங்களுடைய நாட்டுக்கு வருகின்ற இழுவைப் படகுகள் மூலமும் எங்களுடைய நாட்டில் பாவிக்கின்ற 'ரோலர்' படகுகள் மூலமும் சட்டவிரோதமான முறையில் மேற்கொள்ளப்படும் மீன்பிடி முறைகளைத் தடை செய்வதற்காகக் கொண்டுவரப்பட்ட இந்தச் சட்டமூலத்தை நாங்கள் வரவேற்கின்றோம்.

கடந்த காலங்களில் மட்டுமல்ல, இன்றைய காலத்திலும் இந்த இழுவைப் படகுகளின்மூலம் இலங்கையின் வடக்கு, கிழக்கு மற்றும் தெற்கில் வசிக்கின்ற மீனவக் குடும்பங்கள் பாதிக்கப்படுகின்றன. அதாவது, இந்த இழுவைப் படகுகளின் மீன்பிடி முறைகளினால் சிறிய சிறிய மீன்கள் எல்லாம் துடைத்தழிக்கப்படுகின்றன. இந்த முறை தொடர்ந்தால், எதிர்வரும் காலங்களில் - சுமார் பத்து வருடங்களுக்குப் பின்னர், இந்தக் கடல் வளங்கள் முற்றாகவே அழிக்கப்பட்டுவிடும் என்ற காரணத்தால் இந்த இழுவை மடி மூலமான மீன்பிடி முறை தடைசெய்யப்படவிருக்கின்றது; நாங்கள் இதை வரவேற்கின்றோம். அதேநேரம் வட மாகாணத்திலே குருநகர், பருத்தித்துறை போன்ற இடங்களிலும் இவ்வாறான இழுவைப் படகுகளை வைத்திருக் கின்றார்கள். அவர்களுடைய வாழ்வாதாரம் அழிக்கப்படக்

கூடாது; அவர்கள் அவர்களுக்கான மாற்றுத் தொழில்களை ஏற்படுத்திக்கொள்ளும் வரையாவது அரசாங்கம் அவர்களுக்கான கால அவகாசத்தை வழங்க வேண்டும் என்ற வேண்டுகோளையும் முன்வைக்கின்றேன்.

எங்களுடைய நாட்டிலுள்ள கடல் வளங்களைக் கொண்டு செல்கின்றவர்கள் அவற்றை ஐரோப்பா நாடுகளிலே விற்கின்றார்கள். அங்கு எங்களுடைய மக்கள்தான் அந்தக் கடலுணவுகளைப் பணம் கொடுத்து வாங்குகின்றார்கள். ஆகவே, எவ்வளவுதூரம் இதனால் நாங்கள் பாதிக்கப்பட்டிருக் கின்றோம் என்பது இன்று பார்க்கும்போது எமக்குத் தெரிகின்றது.

இன்று நாங்கள் எங்களுடைய நல்லாட்சி அரசாங்கத்தின் ஊடாக எத்தனையோ விடயங்களை மாற்றியமைத்திருக் கின்றோம். எங்களுடைய கிட்டத்தட்ட இரண்டரை வருட பதவிக் காலத்திற்குள் காணிகளை மீளப் பெற்றிருக்கின்றோம்; காணாமற்போன ஒருசில ஆட்களுக்குரிய முடிவு தெரியவந்திருக்கின்றது; கைதிகளாக இருக்கின்றவர்களில் சிலர் விடுதலை செய்யப்பட்டிருக்கின்றார்கள். நேற்றுக்கூட எங்களுடைய மயிலிட்டி harbour விடுவிக்கப்பட்டிருக்கின்றது. ஏனெனில் இது நல்லாட்சி அரசாங்கம்! கடந்தகால அரசாங்கத்தின் முன்னாள் ஜனாதிபதி அவர்கள் இந்தச் சபையிலே அமர்ந்திருக்கின்ற இவ்வேளையில் நான் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அதாவது, மயிலிட்டி harbourஐ விடுவிக்கும்படியும் வலிகாமம் வடக்கை விடுவிக்கும்படியும் நான் எதிர்க்கட்சியில் இருக்கும்போது அவரிடம் பலமுறை கூறியிருந்தேன். ஆனால், அந்த அரசாங்கமானது அந்தத் துறைமுகத்தை 25 வருட காலமாக விடுவிக்காமல் வைத்திருந்தது. இன்று நாங்கள் அந்த ஆட்சியை மாற்றி, வலிகாமம் வடக்கை விடுவித்திருக்கின்றோம்; மயிலிட்டி harbour ஐ விடுவித்திருக்கின்றோம். அத்துடன், அரசாங்கம் அந்த மக்களுக்கு நஷ்ட ஈடு வழங்க வேண்டும். ஏனெனில் அந்த மக்கள் கடற்றொழில்மூலம் உழைத்த எவ்வளவோ பணம் அழிந்துவிட்டது; அவர்களுக்கு வீடுவாசல்கள் இல்லை; தனிப்பட்ட தொழில் இல்லை. இன்று அவர்கள் வீதிகளிலே நிற்கின்றார்கள். கடற்றொழிலைச் செய்துவந்த வலி. வடக்குப் பிரதேச மக்கள் இன்றும்கூட முகாம்களில்தான் வாழ்ந்து வருகின்றார்கள். நாங்கள் மீண்டும் அவர்களை அந்த இடத்திற்குக் கொண்டுசென்று குடியமர்த்த வேண்டும்.

அதேபோல, இரணைதீவுப் பிரதேசத்தை எடுத்துக் கொண்டால், கடந்தகால அரசாங்கம் இந்த இரணைதீவுப் பிரதேசத்தைக்கூட விடுவிக்கவில்லை. இன்று எங்களுடைய நல்லாட்சி அரசாங்கமானது இரணைதீவுப் பிரதேசத்தை விடுவிப்பதாகக் கூறியிருக்கின்றது. இங்கே இப்பொழுது எங்களுடைய மீன்பிடித்துறை அமைச்சர் அவர்கள் இருக்கின்றார். நான் இதனை அவருடைய கவனத்திற்குக் கொண்டுவந்து கிட்டத்தட்ட ஒரு வருட காலமாகிவிட்ட போதிலும் அவர் எந்தவிதமான தீர்மானமும் எடுக்கவில்லை. இந்த மீனவக் குடும்பத்தினர் அன்றாடம் கடலுக்குச் சென்றுதான் தங்களது குடும்பத்தை நடத்துகின்றார்கள். அவருக்கு இது நன்றாகத் தெரியும். எங்களுடைய இரணைதீவைப் பொறுத்தமட்டில், நாலு கிலோ மீற்றருக்கு உட்பட்ட கடலோரத்தில் வாழ்ந்த 500 குடும்பங்கள் அங்கு இருந்திருக்கின்றனர். எனவே, அவர்கள் தங்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காகக் கட்டாயம் அந்தப் பிரதேசம் விடுவிக்கப்பட வேண்டும் என்று கூறிக் கொள்கின்றேன்.

அடுத்து, எங்களுடைய மீனவர்கள் சிலர் பெருமளவு முதலீடுகளை இட்டு 'ரோலர்' படகுகளைக் கொண்டு வந்திருக்கின்றார்கள். அதனால், இந்த இழுவை மடி மீன்பிடி முறையின் தடை காரணமாக அவர்களைப் பாதிப்படைய விடக்கூடாது. அவர்கள் மாற்றுத் தொழிலை ஏற்படுத்தும்வரை அவர்களுக்கான கால அவகாசத்தைக் கொடுக்க வேண்டும். ஏனென்றால் அவர்கள் கிட்டத்தட்ட 20 - 25 இலட்சத்திற்கு மேற்பட்ட நிதியை அதற்காக முதலிட்டுத்தான் இந்தத் தொழிலை ஆரம்பித்திருக்கிறார்கள். ஆனால், இந்தத் தொழில் முறையானது சிறிய அளவில் மீன் பிடிக்கின்றவர்களுக்குப் பாரிய நஷ்டத்தைக் கொண்டுவருகின்றது; அவர்கள் மீன்பிடிக்க முடியாத ஒரு நிலை காணப்படுகின்றது. எப்படியிருந்தாலும் இரண்டு தரப்பினரையும் - சிறு மீன்பிடித் தொழில் செய்கின்றவர்களையும் பாரியளவில் மீன்பிடித் தொழிலைச் செய்கின்றவர்களையும் பாதிக்காத வகையில் அந்தச் சட்டத்தைக் கொண்டுவர வேண்டும்.

தேசிய பாதுகாப்புக் காரணமாக எமது மக்களை இரணைதீவுக்கு மீண்டும் செல்ல விடமுடியாதென்று சொல்கிறார்கள். ஆனால் அயல்நாடுகளில் உள்ளவர்கள் 'ரோலர்' படகுகளில் நெடுந்தீவு, அனலைதீவு, எழுவைதீவு, காரைநகர் போன்ற பிரதேசங்களில் எங்களது கண்ணுக்கு எட்டிய தூரத்தில் வந்து மீன் பிடித்துச்செல்கிறார்கள். முதலில் அவர்களைத் தடைசெய்ய வேண்டும். அதற்குப் பின் எங்களுடைய இந்த மீனவக் குடும்பங்களின் தொழிலைப் பாதிக்காத வகையில் நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

இன்றைய இந்த விவாதத்தை நடத்தவிடாது தடையை ஏற்படுத்திக்கொண்டிருந்த கௌரவ உறுப்பினர் தினேஷ் குணவர்தன அவர்கள், இந்தப் பாராளுமன்றத்திற்குள்ளும் வெளியிலும் இனவாதத்தைத் தூண்டுகின்ற விதத்தில் நடந்து கொள்ளுகிறார். உண்மையாகவே பெரும்பான்மையினத்தைச் சேர்ந்தவர்களான இவர்கள் நல்ல மனம் படைத்தவர்களாக இருந்தால், எங்களுடைய சிறுபான்மையின மக்களையும் ஒன்றுசேர்த்து வாழவேண்டும். இது தமிழ், முஸ்லிம், சிங்கள மக்கள் ஒற்றுமையாக வாழ்கின்ற ஒரு நாடு. ஆனால், இவர்கள் எப்போது பார்த்தாலும் தமிழ், முஸ்லிம் மக்களை ஒதுக்குகின்றவர்களாகவே இருக்கிறார்கள். இவர்கள் ஞானசார தேரர் போன்ற தேரர்களை 'பன்சலை'களில் தரித்திருந்து, அங்கே பேச வைக்க வேண்டும். அவர்களது கருத்துக்களை இவர்கள் இங்கே பேசி எங்களுடைய சிறுபான்மையின் மக்களின் மனநிலையைப் பாதிப்படையச் செய்கிறார்கள். தற்பொழுது இந்தச் சபையிலே முன்னாள் ஜனாதிபதி அவர்களும் இருக்கின்றார். அவர் கடைசி யுத்தத்தில்

[ඉලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

என்பது அவருக்கு நன்றாகத் தெரியும்! இதுதொடர்பில் நாங்கள் யோசிக்கவேண்டும் - சிந்திக்கவேண்டும். சிறுபான்மை இன மக்கள் தாங்கள் நிம்மதியாக வாழவேண்டும் என்பதற்காகவே தேர்தலில் வாக்களித்து இந்த நல்லாட்சியைக் கொண்டுவந்தார்கள். அவர்களின் நிம்மதியைக் குழப்பிவிட்டு, டெங்கு, இயற்கை அனர்த்தம் போன்றவற்றைக் கூறி, அரசாங்கத்தின்மீது சேறு பூசுகின்றார்கள்; அவமரியாதை செய்கின்றார்கள். ஆகையால், நாங்கள் இந்த நல்லாட்சி அரசாங்கத்தினூடாக ஐக்கியத்தைக் கட்டியெழுப்ப வேண்டும். எங்களுடைய சிறுபான்மையின மக்களின் வாக்குகளினால் உருவாக்கப்பட்ட இந்த நல்லாட்சி அரசாங்கமானது எமது மக்களுக்குச் சரியான தீர்வுகளை வழங்குவதற்கு வழிகோல வேண்டும் என்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මොකක්ද ඔබතුමන්ගේ point of Order එක?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ කථාවේදී සඳහන් කළා, හිටපු ජනාධිපතිතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

එතුමා දන්නවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සියලු දේ හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියන ඉල්ලීම මම කරනවා.

අපි එතුමියගෙන් අහනවා, විශේෂයෙන්ම එතුමිය සහයෝගය ලබා දීපු කණ්ඩායම උතුරේත්, දකුණේත්, ලංකාවේ හැම තැනම මරපු ගණන එතුමිය දන්නවාද කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Vijayakala Maheswaran, you can respond to it? ගරු විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියට ඒකට උත්තරයක් දෙන්න පුළුවන්. [බාධා කිරීම්] ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න කියලායි ඔබතුමියට කියන්නේ. හිටපු ජනාධිපතිතුමා දන්නවා,- [බාධා කිරීමක්]

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran)
නැහැ, නැහැ. එයාට අපි උත්තර දෙන්න ඕනෑ. මෙරට, පිටරට ඔක්කෝම මිනිස්සු දන්නවා, මොකද වුණේ කියලා. [බාධා කිරීමක්] ඔයා වාඩිවෙන්න ඔයාගේ වැඩක් බලා ගන්න. අපි ඡන්දයෙන් පත් වෙලා ආවේ මේ ගැන කියන්න තමයි. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Keheliya Rambukwella, please go to your Seat.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
We want an answer from her or you give a Ruling, Mr. Deputy Speaker.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you go back to your Seat. -[*Interruption.*] මරණයට පත් වෙච්ච අය ගැන හිටපු ජනාධිපතිතුමාව සම්බන්ධ කරලා ඔබතුමිය සඳහනක් කළා. ඒ ගැන පැහැදිලිව ඔබතුමියට කියන්න පුළුවන්කමක් තිබෙනවා කියලා අපි හිතන්නේ නැහැ. එහෙම ප්‍රකාශයක් කළා නම්, ඒ මන්ත්‍රීතුමාගේ ඉල්ලීම මත හැන්සාඩ් වාර්තාවෙන් එම කොටස් ඉවත් කරන්න කියලා මම නියෝග කරනවා.

මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා. [බාධා කිරීම්]

[අ.භා. 2.51]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය සංඛ්‍යා ලේඛන ගැන කියනවා. හැබැයි, යාපනයේ කප්පම් ගත්ත ඒවා ගැන, යාපනයේ හිටපු පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ව මරපුවා ගැන කිව්වොත් අපට කියන්න ඊට වැඩිය ලොකු ලැයිස්තුවක් තිබෙනවා. මම එහෙම කියන්නේ නැහැ. ඒ නිසා නිකම් බොරුවට දන්නේ නැතිව කියන්න හදන්න එපා. ඒ කාලයේ කරපු දේවල් සියල්ල අපිටත් කියන්න පුළුවන්. ඒවා දන්නේ නැතිව ඔබතුමිය නිකම් කෑ ගහන්න එපා. ඒ ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළ නිසා මම ඒ ගැන කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින්ම මේ විවාදයට එක්කාසු වෙන්න කලින් කන්ද උඩරට නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මේ ගෞරවනීය සභාවෙන් ඉල්ලීමක් කරනවා. මේ ගෞරවනීය සභාවේදී මේ රටේ උත්තරීතර අස්ගිරි-මල්වතු පාර්ශ්වය ඇතුළු ත්‍රෛනිකායික මහා සංඝරත්නය හැල්ලුවට ලක් කරලා කථා කරන්න එපා කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් මේ කාරණය මම ඉල්ලා සිටින්න කැමැතියි. මාධ්‍ය ප්‍රකාශකතුමන්ලා ගෞරවනීය මහා සංඝරත්නයට, මහා නායකහිමිවරුන්ගේ ප්‍රකාශවලට කිව්ව දේවල් අපි දැක්කා. එවැනි පහත් තත්ත්වයකට මේ ආණ්ඩුව පත් වෙන්න එපා කියලා කියනවා. කාදිනල්තුමා ඇතුළු ඒ අයට ඒ විධියට කථා කරන්න එපා. මේක මේ ආණ්ඩුවේ ඉතා පහත් සිද්ධියක්. ඒක අපි පිළිකුලෙන් යුතුව හෙළා දකිනවා. තමුන්නාන්සේලා මේ වාගේ පහත් තත්ත්වයකට පත් වෙන්න එපාය කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව 'නංගි පෙන්නලා අක්කා දුන්නා' වාගේ ආණ්ඩුවක්. මේ ආණ්ඩුව 'වන්දානි' පෙන්නලා 'කලා' දුන්නා වාගේ ආණ්ඩුවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යවස්ථාදායක සභාව කිසිම ලිපි ගොනුවක් ඉදිරිපත් කළේ නැහැ කියලා අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා. අගමැතිතුමා රටටම කියනවා එහෙම එකක් ඉදිරිපත් කළේ නැහැ කියලා. හැබැයි, ඉදිරිපත් කරපු draft එකක් තමුන්නාන්සේලාගේ කාර්යාලයේ තිබෙනවා. ඉදිරිපත් කරපු draft එක ගැන රටේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මේක බරපතළ ප්‍රකාශයක්. මම නොවෙයි අනුර දිසානායක මන්ත්‍රීතුමායි කියන්නේ,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හදපු අනුර දිසානායක මන්ත්‍රීතුමායි මේක කියන්නේ. තමුන්නාන්සේලා ආණ්ඩුව බලයට පත් වුණෙත් අසත්‍ය ප්‍රකාශ කර තමයි. ආණ්ඩුව කර ගෙන යන්නේත් අසත්‍ය ප්‍රකාශ කර තමයි. තමුන්නාන්සේලා රටේ ජනතාවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. තමුන්නාන්සේලා මේ කෙටුම්පත හදලා ඉවරයි; තමුන්නාන්සේලා මේ draft හදලා ඉවරයි. නිල බලලා මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නයි තමුන්නාන්සේලා බලාගෙන ඉන්නේ. ඒ නිසා කරුණාකරලා මේ කටයුත්ත කරන්න එපාය කියන ඉල්ලීම අපි ඔබතුමන්ලාගෙන් කරනවා. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා. ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙක් හැටියට මම කියන්න කැමැතියි, මේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ එක වගන්තියක්වත් තවම හදලා නැහැ කියලා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කෙටුම්පතක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිරිඇල්ල ඇමතිතුමාට පාර්ලිමේන්තුවේත් නින්ද යනවා. ඒ කමිටුවේත් නින්ද යනවා. මෙතුමාට නින්ද ගිය වෙලාවක ඉදිරිපත් කරන්න ඇති. ඔබතුමා ගොඩක් දේවල් දන්නේ නැහැ. ඒ රැස්වීමේදී ඔබතුමාට නින්ද ගියාම මේ ලිපි ගොනුව ඉදිරිපත් කරලා. ඔය වයසේ වැරැද්ද. ඒක ගණන් ගන්න එපා. මම දැන් මාතෘකාවට එන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වරාය හා නාවික කටයුතු සම්බන්ධව සාකච්ඡා කරනවා. ඔබතුමා දන්නවා, පසු ගිය කාලයේ මේ රටේ කථා බහට ලක් වෙච්ච මාතෘකාව හම්බන්තොට වරාය බව. හම්බන්තොට වරාය විකිණීම පිළිබඳව දිගින් දිගටම ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි පෙනී සිටියා.

වරාය භාරව හිටපු ඇමතිවරයා -අර්ජුන රණතුංග අමාත්‍යතුමා- හම්බන්තොට වරාය සම්බන්ධයෙන් දිගින් දිගටම ආණ්ඩුවට කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරලා 'ඒ වරාය විකිණීම වහාම නවත්වන්න' කියන ඉල්ලීම කළා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේදී මොකක්ද වුණේ? අර්ජුන රණතුංග අමාත්‍යතුමාට වරාය බාර ඇමතිකම නැති වුණා; තමන්ගේ අමාත්‍යාංශය නැති වුණා. ඒ ඇයි? ඒ, එතුමා මේ රටේ සම්පත් වෙනුවෙන් පෙනී සිටි හින්දායි. වරාය විකුණන්න එපා, එය 20:80 පදනමට දෙන්න එපා, ණය කපනවා කියා සල්ලි ටික වෙනත් ඒවාට දමන්න එපා, මෙය කළොත් පාඩුයි කියා මෙයින් වන පාඩුව ගැන කැබිනට් පත්‍රිකා මඟින් අපේ අර්ජුන රණතුංග අමාත්‍යතුමා ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගැන විස්තර කරන්න මට වෙලාව නැති නිසා එම කැබිනට් පත්‍රිකා තුනම -එම්පීඑස්එච්ඒ 2016 දෙසැම්බර් 27 කැබිනට් පත්‍රිකාව, 2016 අංක 53 දරන කැබිනට් පත්‍රිකාව සහ එම්පීඑස්සී 2016 අංක 56 කියන කැබිනට් පත්‍රිකාව- මම **සභාගත*** කරනවා.

කැබිනට් පත්‍රිකා මඟින් ආණ්ඩුවේ ඇමතිවරයකු වන අර්ජුන රණතුංග අමාත්‍යතුමා කියනවා, "මේක මේ රටේ ආර්ථිකයට විශාල විනාශයක්. මේක කරන එක හොඳ නැහැ. මේකෙන් වරායට පාඩුයි. මේක කරන්න එපා." කියලා. එහෙම කියලා එතුමා කැබිනට් මණ්ඩලයට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. හැබැයි, මේ සියල්ල වෙද්දී තමයි පසු ගිය දා කැබිනට් සංශෝධනයක් සිද්ධ වන්නේ. කැබිනට් සංශෝධනයක් සිද්ධ වෙලා එම සංශෝධනය යටතේ නව ඇමතිවරයෙක් -මහින්ද සමරසිංහ අමාත්‍යතුමා- වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය භාර ගන්නවා. මහින්ද අමරවීර අමාත්‍යතුමනි, ඔබතුමා මේ ගරු සභාවේ සිටින නිසාත්, ඔබතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන අමාත්‍යවරයකු වන නිසාත් මම මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා.

තමුන්නාන්සේලා දැන් වරාය පිළිබඳව සද්දයක් නැහැ. නමුත් මොකක්ද වෙන්නේ? මෙච්චර කල් ප්‍රසිද්ධියේ වැඩේ කෙරෙමින් ගියා. දැන් එය ඇතුළෙන් -සීතල කටයුත්තක් ලෙස- කෙරෙමින් යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද සමරසිංහ අමාත්‍යතුමා වරාය භාර අමාත්‍යවරයා ලෙස පත් වුණාට පසුව වරාය අධිකාරියට අලුත් සභාපතිවරයකු පත් කරනවා. ඒ නව සභාපතිතුමා තමයි පරාක්‍රම දිසානායක මහත්මයා. ඔබතුමන්ලා දන්නවා, පරාක්‍රම දිසානායක මහත්මයා තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ -එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලයේ- වරාය අධිකාරියේ හිටපු සභාපතිතුමා බව. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, වරාය අමාත්‍යාංශය 2012 වර්ෂයේදී Colombo South Port එක විකුණන්න ඔබතුමන්ලා ටෙන්ඩර් කැඳවූ බව. ටෙන්ඩර් කැඳවුවාට පසුව, වරාය සියයට 15ක කොටසක් තියා ගත්තා; එයිටිකන් ස්පෙන්ස් සමාගම ගත්තා සියයට 30ක කොටසක්. ඒ වාගේම China Merchants Port Holdings Company Limited එක -CMPort නමින් හඳුන්වන, හම්බන්තොට වරාය ගන්න යන සමාගම- ගත්තා, සියයට 50ක කොටසක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ CMPort එක ලංකාවට ගෙනෙන්නේ කවුද? එය ලංකාවට ගෙන එන්නේ පරාක්‍රම දිසානායක මහත්මයායි. ඒ වාගේම එයිටිකන් ස්පෙන්ස් සමාගමේ වගකීම සම්පූර්ණයෙන් ගත් Managing Director කවුද? ඒ, පරාක්‍රම දිසානායක මහත්මයායි. පරාක්‍රම දිසානායක මහත්මයා එයිටිකන් ස්පෙන්ස් සමාගම මඟින් සියයට 30 කොටසක් අරගෙන කිසිදු වියදමක් කරන්නේ නැතිව ඒ සමාගම හරහා CMPort එකට එය නැවතත් විකුණනවා. මේ නිසා CMPort එකට කොළඹ දකුණු වරායේ සියයට 85ක ඒකාධිකාරයක් එනවා. මේ CMPort එකත් එක්ක ගනුදෙනු කරපු, ඉහත කී විකිණීම කළ, එයට සම්බන්ධ වූ කෙනා තමයි පරාක්‍රම දිසානායක මහත්මයා.

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමනි, ඔබතුමා මේ ගැන සිතා බලන්න. වරාය විකුණන්න CMPort එක එක් පැත්තකින් කටයුතු කරනවා. වරාය පැත්තෙන් කටයුතු කරන්නේ CMPort එකේම හිටපු, ඉහතින් කී විකිණීම සිදු කළ අධ්‍යක්ෂවරයායි. එහෙම නම්,

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

දැන් මොකක්ද බලාපොරොත්තු වන්නේ? දැන් මෙය private ගනුදෙනුවක් බවට පත් වෙලා. හෙක්ටෙයාර 800 ගණනක් දෙනවා කියලා තමයි කලින් කිව්වේ. දැන් අලුත් සභාපතිතුමා හෙක්ටෙයාර 1,200ක් දෙන්න එකඟ වෙලා. මේවා ගැන දැන් සද්ද නැහැ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ ගැන සිතා බලන්න. CMPort එකේ සිටි Director වරාය අධිකාරියේ සභාපති වෙලා එනවා. ඔහු වරාය අධිකාරියේ සභාපති වෙලා CMPort එකත් එක්ක ගනුදෙනුව කතා කරනවා. මේ මොන ලජ්ජා නැති වැඩක්ද? තමුන්නාන්සේලාට පුළුවන්ද එහෙම කරන්න? නවින් දිසානායක අමාත්‍යතුමා, එහෙම කරන්න පුළුවන්ද කියා ඔබතුමා සිතන්න. It is conflict of interest.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර්ජුන මහේන්ද්‍රන් මහත්මයා පත් කළා, ශ්‍රී ලංකා මහ බැංකුවේ සභාපති හැටියට. එතුමාගේ බෑනා primary dealer කෙනෙක්. එතුමා මහ බැංකුවේ අධිපති තනතුරට පත් කරන්න එපා කියලා රාජිත සේනාරත්න අමාත්‍යතුමාත්, චම්පික රණවක අමාත්‍යතුමාත් කිව්වා ලු. අගමැතිතුමා ඒක බාර ගත්තා ලු. අවසානයේදී මොකක්ද වුණේ? අවසානයේදී එහි ප්‍රතිඵලය මොකක්ද? දැන් කරපු දේ බලන්න. එයිටිකන් ස්පෙන්ස් සමාගමේ කොටස් හිමිව තිබූ ආයෝජකයා ගෙනා ඒ පුද්ගලයා වරාය අධිකාරියේ සභාපතිවරයා හැටියට පත් කරනවා. දැන් වරාය වෙනුවෙන් පෙනී සිටින්නේ පරාක්‍රම දිසානායක මහත්මයායි, මහින්ද අමරවීර අමාත්‍යතුමනි. ඊට වඩා හොඳයි China Harbour Engineering Company එකේ Chairman ගෙන්නලා වරායේ Chairman කළා නම්. ඒක ඊට වඩා හොඳයි. එහෙම නම් අපූරුවට මෙම ගනුදෙනුව කෙරීගෙන යාවි. මේවා කරන්නද, ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දුන්නේ? තමුන්නාන්සේලා මේ ගැන දන්නේ නැතිව ඇති. හම්බන්තොට වරාය විකිණීමේ විශාල ගනුදෙනු, වංචාසහගත කටයුතු අද ඇතුළතින් සිද්ධ වෙමින් යනවා. ඒ ගැන කවුරුවත් දන්නේ නැහැ. එතුමා සභාපති තනතුරට ගෙනාවේ මේ ගනුදෙනුව කරන්න තමයි. අර්ජුන රණතුංග අමාත්‍යතුමා වරාය භාර අමාත්‍ය ධුරයෙන් අයින් කළා. එතුමා අයින් කරලා අවශ්‍ය සභාපතිවරයා එනැනට ගෙනාවා. ගෙනැල්ලා කරපු ඒ කටයුත්ත ඉතාම වැරැදියි, ගරු අමාත්‍යතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට වරාය දැන් නැවත වරක් සියයට 20:80 පදනම මත දෙන්න යනවා. මහින්ද සමරසිංහ අමාත්‍යතුමා ගිහින් කියා තිබුණා, නව ආයෝජන සැලැස්මකුත් එක්ක එනවා කියා. ඊයේ පත්තරයක එහෙම තිබෙනවා මම දැක්කා.

ඒවා මේ මිනිසුන්ගේ හඬ වහන්න කියන දේවල්. දැන් අලුත් සභාපතිතුමා ඇවිල්ලා සේවකයන් අරගෙන, රස්සා නැති කරපු අයට නැවත රස්සා දීලා, ඉස්සෙල්ලාම එතුමා කාර්ය මණ්ඩලය සන්සුන් කරගන්නවා. අපි විරුද්ධ නැහැ. හම්බන්තොට විකුණලා ඒ ණය ටික ගෙවනවා නම් අපි විරුද්ධ නැහැ. ලබාගත් ණය ගෙවනවා නම් අපි විරුද්ධ නැහැ. හැබැයි, මේ ගොල්ලෝ ගත්ත ණය ගෙවන්නෙත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගත්ත ණය ගෙවන්නෙත් නැහැ, ඒකත් ආණ්ඩුවට අරගෙන තිබෙන සම්පත්, දේපළ සියල්ලත් දැන් විකුණන්න හදනවා. මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, ඔබතුමා දන්නවා, IMF එක දැන් පළවැනි වාරික ටික දෙන්න හදනවා කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, IMF එකේ වාරික ගන්න කලින් ආණ්ඩුවේ හිටපු මුදල් ඇමති රවි කරුණානායක මහත්මයාත්, අර්ජුන් මහේන්ද්‍රන් මහත්මයාත් IMF එකත් එක්ක ගිවිසුමක් අත්සන් කරනවා. මොකක්ද ගිවිසුම? මේ අවුරුද්දේ සැප්තැම්බර් වෙනකොට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට, ලංකා විදුලිබල මණ්ඩලයට මිල සූත්‍රයක් ගේනවා කියලා ඒ ගිවිසුමෙන් එකඟ වෙනවා. මිල සූත්‍රයක් ගේනවා කියන්නේ මොකක්ද? සියලු සේවාවන්වල මිල වැඩි කරනවා, සමාගම් බවට පත්වෙනවා, පාඩු ලබන්න බැහැ, ආණ්ඩුවට සල්ලි දෙන්න බැහැ.

මම ඊයේ පෙරේදා දැක්කා, ලංකා විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන පන්දහස් ගණනක් මහා භාණ්ඩාගාරයෙන් දෙනවා. ආයෙත් දෙන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් IMF එකෙන් සල්ලි ගත්තාට පස්සේ මොකද වෙන්නේ? සල්ලි ගත්තාට පස්සේ මිල සූත්‍රය හැදෙනවා. මිල සූත්‍රය හැදුණාම බනිජ තෙල්වල මිල නඟිනවා; විදුලි බිල නඟිනවා; වතුර බිල නඟිනවා. අපි දැක්කා, හකීම් ඇමතිතුමා කියලා තිබෙනවා, "වතුර බිල වැඩි කරන්න සිද්ධ වෙනවා, අනේ! කෑ ගහන්න එපා" කියලා. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා මේක පිළිගන්නවා. තමුන්නාන්සේලා IMF එකත් එක්ක අත්සන් කරපු ගිවිසුමේ කොන්දේසි අනුව තමයි තමුන්නාන්සේලාට වාරික මුදල දෙන්නේ. ඒ කොන්දේසිවලට එකඟ වුණේ නැත්නම් වාරික මුදල දෙන්නේ නැහැ. IMF එක හැරෙන්න මේ ආණ්ඩුවට වෙන කවුරුවත් ණය දෙන්නේ නැහැ. ණය දෙන්න, මේ ආණ්ඩුවට ණය ගෙවාගන්න බැහැ. ඒ නිසා කොන්දේසිවලට යටත්වෙලා තමුන්නාන්සේලාට මේ රටේ රාජ්‍ය සම්පත්, දේපළ විකුණන්න සිද්ධවෙලා තිබෙනවා. මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මොන ප්‍රශ්න තිබුණත්, මොන ගැටලු තිබුණත් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව යටතේ අපි කිසිම දේපළක් වික්කේ නැහැ කියන එක ඔබතුමන්ලා පිළිගන්න ඕනෑ. අපි ඒවා විකුණන්න හිතුවේ නැහැ. පාඩු ලබන දේවල් තිබුණා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Port City එක වික්කා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද? Port City එක?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Port City එක වික්කේ අපිද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, මම ඔබතුමාට කිව්වා, රාජ්‍ය දේපොළ- [බාධා කිරීම්] මෙහෙමයි, කිරිඇල්ල ඇමතිතුමනි, ඔබතුමා කියන ඒවා දැන් අපි වැඩිය ගණන් ගන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගෙන් එක කාරණයක් දැන ගන්න කැමැතියි. Port City එකේ නිර්මාතෘවරයා වන හිටපු ජනාධිපතිතුමා මේ ගරු සභාවේ මේ අවස්ථාවේ ඉන්නවා. එතුමාගෙන් අහන්න. Port City එක විකුණලායි තිබුණේ. අපි තමයි ඒක දීර්ඝකාලීන බදුවලට හැරෙව්වේ.[බාධා කිරීම්] අපි තමයි බදු දුන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා නැඟිටලා කියන්න කෝ.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට මයික් එක දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා.

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
නැහැ, නැහැ, නැහැ. ඔබතුමා ඉන්න. Port City එකක් තිබුණාද කියලා ඔබතුමා මට කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
විකුණන්න Port City එකක් තිබුණාද?

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
Port City එකක් තිබුණාද, විකුණන්න? මොනවාද මේ කියන අසත්‍ය. මම කැමැති නැහැ, කිරිඇල්ල ඇමතිතුමා එක්ක හැප්පෙන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කිරිඇල්ල ඇමතිතුමනි, හරි, හරි. දැන් ඔබතුමා ඉඳගන්න කෝ. දැන් ඔබතුමාට වයසයි. පොඩ්ඩක් ඉඳගන්න කෝ. කිරිඇල්ල ඇමතිතුමනි, තමුන්නාන්සේලා බලයට පත් වුණේ Port City එක නවත්වනවා කියලා නේ. තමුන්නාන්සේලාට හොංකොංවලින් ගනුදෙනුව හම්බ වුණාම ආයෙත් දුන්නේ නැද්ද? තමුන්නාන්සේලා, ඇයි දුන්නේ? එතකොට කාටද ගාන ගියේ. තමුන්නාන්සේලා බලයට ආවේ Port City එක නවත්වනවා කියලායි. ඒවා 'මෙගා ඩීල්' කියලා කිව්වා. අවුරුද්දක් ගිහිල්ලා, තමුන්නාන්සේලා Port City එක දුන්නේ ඇයි? තමුන්නාන්සේලාගේ ඇමතිවරයකුගේ හොංකොං කාර්යාලයේ යූඑස් ඩොලර් මිලියන 90ක ගනුදෙනුවක් සිද්ධ වුණා. තමුන්නාන්සේ විකුණපු දේවල් ගැන ඉස්සරවෙලා කථා කරන්න. හොඳයි, Port City එක මහින්ද රාජපක්ෂ මහත්තයා වික්කාය කියමු. තමුන්නාන්සේලා ඒක නැවැත්වුවේ නැත්තේ ඇයි? තමුන්නාන්සේලා අවුරුද්දක් ඇදලා ගනු-දෙනුව කථා කර ගත්තාට පස්සේ, ගාන ගත්තාට පස්සේ Port City එක වික්කා. ඒක වික්කා විතරක් නොවෙයි, තමුන්නාන්සේලා කොමිෂන් එක ප්‍රමාද කළ නිසා හෙක්ටෙයාර් 33ක් වැඩියෙනුත් දුන්නා. මහින්ද රාජපක්ෂ මහත්මයාට වඩා හෙක්ටෙයාර් 33ක් වැඩියෙනුත් දෙන්න තමුන්නාන්සේලාට සිද්ධ වුණා, කිරිඇල්ල ඇමතිතුමනි.

ඒ නිසා කිරිඇල්ල ඇමතිතුමනි, අපි ඔබතුමන්ලාට කියන්නේ පසු ගිය ආණ්ඩුව කාලයේ මේ රටේ මොනවා වුණත්, තමුන්නාන්සේලා රුපියල් බිලියන දෙදහස් හාරසිය ගණනක් ණය අරගෙන තිබෙනවා කියලායි. ඒකෙන් රුපියල් බිලියන හාරසිය ගණනයි ගෙවලා තිබෙන්නේ. රුපියල් බිලියන 2,000කට තමුන්නාන්සේලා කළේ මොනවාද? තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ මොනවාද කියලා අපට කියන්න. රුපියල් බිලියන 2,000ක් ණය අරගෙන තමුන්නාන්සේලා කළේ මොනවාද? තමුන්නාන්සේලා අපට චෝදනා කළා. චෝදනා කළාට අපි හදපු දක්ෂිණ අධිවේගී මාර්ගය තිබෙනවා; අපි හදපු ගුවන් තොටුපොළවල් තිබෙනවා; අපි හදපු පාරවල් තිබෙනවා. ඒ විධියට අපි හදපු දේවල් තිබෙනවා. හැබැයි තමුන්නාන්සේලා රුපියල් බිලියන 2,000ක් අරගෙන හොරා කෑවා හැරෙන්න, කළේ මොනවාද කියලා අපි අහනවා. [බාධා කිරීමක්] මොකක්ද? ඒ නිසා කිරිඇල්ල ඇමතිතුමනි,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
උමා ඔය -

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇමතිතුමනි, උමා ඔය ගැන ඕනෑ නම් අපි වෙනම විවාදයකට යමු. උමා ඔය ව්‍යාපෘතිය වැරැදි නම් ඇයි, ඔබතුමන්ලා බලා ගෙන හිටියේ? තමුන්නාන්සේලා කිව්වා නේ ඒක "highway robbery" කියලා. ඔබතුමා කිව්වා, ඒක "highway robbery" කියලා. දැන් තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් highways හදන්න දෙන්නේ, අපි දුන්නාටත් වැඩි ගණනට. ඕනෑ නම් මම ඒවා ගැන වෙනම කියන්නම්. තමුන්නාන්සේ මහනුවර අධිවේගී මාර්ගය හදන්න දෙනවා, අපි දෙන්න හදපු ගණනට වැඩියෙන්. ගරු ඇමතිතුමනි, එතැන ඉන්නවා, කොමිෂන් ගන්න ලේකම්වරියෝ. ඕනෑ නම් ලැයිස්තු පිටින් කියන්නම්. අපි ඒවා පැත්තකට දමමු. හැබැයි, මගේ අවධානය යොමු කළ කාරණය වුණේ වරාය විකිණීමේ ගනු -දෙනුවයි. වරාය විකිණීමේ ගනු-දෙනුව සම්බන්ධයෙන් පත් කළ සභාපතිවරයා සදාචාරාත්මක නැහැ. යහ පාලන ආණ්ඩුවකට මෙහෙම කෙනෙක් පත් කරන්න බැහැ. ඔබතුමන්ලාට ජනවරම දුන්නේ ඒකට නොවෙයි. ඔබතුමන්ලාට ඒ වාගේ කෙනෙක් පත් කරන්න බැහැ, ගරු ඇමතිතුමනි. පත් කරන්න බැරි වෙන්න හේතුව, ඔහු තමයි CMPort එක ලංකාවට ගෙනාවේ. ඔහු තමයි CMPort එකට කොටස් සියයට 35ක් වික්කේ. දැන් ඔහු ඒකේ ඉන්නවාය කියන්නේ CMPort එකේ කෙනෙක් වරායේ ඉන්නවාය කියන එකයි. එතකොට වරාය වෙනුවෙන් පෙනී සිටින්නේ කවුද? අපේ රටේ භූමිය වෙනුවෙන් කථා කරන්නේ කවුද? අපේ රටේ මිනිසුන්ට වන අසාධාරණය ගැන කථා කරන්න දෙයක් නැහැ.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය විතරක් නොවෙයි, දැන් තව තවත් දේවල් විකුණන්න කටයුතු කර ගෙන යනවා. ඒ නිසා මේ කටයුත්ත කරන්න එපා. මොනවා වුණත් හම්බන්තොට විතරක් නොවෙයි; තමුන්නාන්සේලා හම්බන්තොට දීලා නිකම් ඉන්නේ නැහැ. ත්‍රිකුණාමලයත් ඉන්දියාවට දෙන්න යනවා. තමුන්නාන්සේලා වෙන වෙන රටවලට මේවා දෙන්න හදනවා. හැබැයි, මේකේ අවසාන ප්‍රතිඵලය වන්නේ මොකක්ද? අපි තමුන්නාන්සේලාට මේවා පිළිබඳව පෙන්නුවාම, මේවා පිළිබඳව අපි කථා කළාම තමුන්නාන්සේලා අප හිරේ දමනවා; තමුන්නාන්සේලා අපට විරුද්ධව නඩු දමනවා.

ඊයේ අපි දැක්කා, අධිකරණය පිළිබඳව අගමැතිතුමා පාර්ලිමේන්තුවේ කළ කථාව. අද ඉහළ අධිකරණවල ඉන්න විනිසුරුවරුන්ට බලපෑම් කරනවා; භය කරනවා. මේක ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්. අද අධිකරණය ස්වාධීනව කටයුතු කරමින්, කුණු ප්‍රශ්නය පිළිබඳව අධිකරණයෙන් තීන්දුවක් දුන්නාම, ඒ තීන්දුව දුන්න විනිසුරුවරයාට එරෙහිව ආණ්ඩුව ප්‍රකාශයන් කරනවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්. දොම්පේ ප්‍රදේශයට කුණු දැමීම පිළිබඳව අධිකරණ තීන්දුව ගැන අගමැතිතුමා කථා කළා. ඔබතුමන්ලා අපට කිව්වා, අපි අධිකරණයට ඇඟිලි ගැහුවාය කියලා. අද මුතුරාජවෙල සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රශ්නය යන්නේ අග්‍ර විනිශ්චයකාරතුමාටයි.

මෙහෙම අධිකරණයට බලපෑම් කරන්න හදන කොට, මේ විධියට රටේ සම්පත් දේපළ විකුණන්න හදන කොට, මුදලාලිලා සභාපති විධියට පත් කරන්න හදන කොට, මේ රට දෙකඩ කරන්න ඇතුළේ හොරට ව්‍යවස්ථා හදලා ඒවා එළියට අහු වෙලා දැන් ඇඟේ ගාගන්න බැරිව දහලන වෙලාවක තමුන්නාන්සේලා මොනවාද මේ කරන්නේ? එම නිසා අපි මේ ආණ්ඩුවට කියනවා, මොනවා වුණත්, හම්බන්තොට වරාය තිබුණා නම්, ඒක රටට තිබෙනවා, ඒක අමතක කරන්න එපා කියලා. මොනවා වුණත්, අධිවේගී මාර්ග හදපු නිසා අද ඒවායේ ප්‍රතිලාභ ලැබී තිබෙනවා. කටුනායක අධිවේගී මාර්ගය, මත්තල ගුවන් තොටුපොළ හදපු නිසා අද අපි ඒවායේ ප්‍රතිඵල දකිනවා. පසු ගිය දවස්වල කටුනායක ගුවන් තොටුපොළේ repair එක කරපු වෙලාවේ මත්තල ගුවන් තොටුපොළේ වටිනාකම අපි දැක්කා. කටුනායක ගුවන් තොටුපොළේ ප්‍රශ්නයක් ඇතිවුණු වෙලාවට මත්තල ගුවන් තොටුපොළේ වටිනාකම අපි දැක්කා. මේවා සම්බන්ධයෙන් විවිධ චෝදනා එල්ල වනවා. ව්‍යාපෘතියක් හදපු ගමන් ලාභ ලබන්නේ නැහැ කිරිඇල්ල ඇමතිතුමනි. වරාය හදපු ගමන් ලාභ ලබන්නේ නැහැ. හැබැයි, හම්බන්තොට වරායේ ආදායම වැඩි වෙලා තිබෙනවා.

මත්තල ගුවන් තොටුපොළ හදපු ගමන් ලාභ ලැබෙන්නේ නැහැ. ඒවා සිදුවන්න පුළුවන්. අපේ අරමුණ වෙලා තිබුණා, කොළඹට පස්සේ දෙවෙනි අගනුවර විධියට, අපේ ප්‍රධාන දිස්ත්‍රික්කය විධියට හම්බන්තොට දියුණු කරන්න. හම්බන්තොට වරාය නිසා, මත්තල ගුවන් තොටුපොළ නිසා හම්බන්තොට දිස්ත්‍රික්කය දියුණු වුණොත් ඒක හම්බන්තොට මිනිසුන්ගේ ආර්ථිකයට හොඳයි. මේක තමයි වෙනස. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට ආවාම සංවර්ධනය යන්නේ නගරයට. තමුන්නාන්සේලා ඔක්කෝම කරන්නේ කොළඹට, තමුන්නාන්සේලා සියල්ලම කරන්නේ බස්නාහිරට. අපේ සංකල්පය වෙනත් එකක් ඇමතිතුමනි. අපි සංවර්ධනය ගෙන යන්නේ කොළඹින් ගමට. අපි හැම දාම සංවර්ධනය ගෙන ගියේ ගමට. ඒක තමයි අපි සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයක් හැදුවේ. එම නිසා තමයි අපි හම්බන්තොට වරාය හැදුවේ. එම නිසා තමයි අපි මත්තල ගුවන් තොටුපොළ හැදුවේ. ඒ විතරක් නොවෙයි. අපි ත්‍රිකුණාමලය වාගේම දකුණත් සංවර්ධනය කළා. ඒ හැම තැනම අපි ඒ සංවර්ධන කටයුතු කළා. [බාධා කිරීමක්]

අපි ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වනවා, වල් අලින්ගෙන් බේරාගෙන සූරියවැව ක්‍රීඩාංගණයට match එකක් ලබා දීම සම්බන්ධයෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඔබතුමාත් වල් අලින්ගෙන් බේරෙන්න ඕනෑ. ඒ සඳහාත් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අද වල් අලි තමයි මේ සියල්ලම කන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] මොකක්ද?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මෝඩ ඉංජිනේරුවෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, තව මොහොතකින් ඔබතුමාට නියමිත කාලය අවසන් වනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මන්ත්‍රීතුමා, මම ඒ ගැන කථා නොකර ඉන්නම්.

ඔබතුමා එදා රූපවාහිනී විවාදයට ගිහිල්ලා නාගෙන කෑවා නේ. සබන් විතරයි තිබුණේ නැත්තේ. රටම අහගත්තා, ඉංජිනේරු මහත්තයාගේ කථාව. ඒ හින්දා මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම එතුමාගේ නම කිව්වේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තව මොහොතකින් ඔබතුමාට නියමිත කාලය අවසන් වනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව මොහොතකින් අවසන් කරනවා. මා ඔබතුමාට කියාගෙන ආවේ මේ බරපතළ තත්ත්වය-

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is the point of Order, Hon. Member?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ඒ මන්ත්‍රීතුමාගේ නම මම කිව්වේ නැහැ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හිටපු ජනාධිපතිතුමාත් මේ අවස්ථාවේ ගරු සභා ගැබේ සිටින නිසා අපට දැනගන්නයි මේ දේ අහන්නේ. මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is the point of Order, Hon. Member?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ෂැන්ග්‍රි-ලා හෝටලය-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කථා කරන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ෂැන්ග්‍රි-ලා හෝටලය-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට මයික්‍රෆෝනය ලබා දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හිටපු ජනාධිපතිතුමා එක්ක කථා කරන්න දෙයක් නැහැ. හිටපු ජනාධිපතිතුමාගෙන් මට දමාගන්න තිබෙන ලකුණු ඔක්කෝම මා දමා ගෙන අවසන්. හැබැයි, එම මන්ත්‍රීතුමා දන්නවා, එම මන්ත්‍රීතුමා තමයි මහින්ද මහත්තයාගේ කාලයේ සභාපතිකම් කරලා එහා පැත්තට පැන්නේ කියලා. එම මන්ත්‍රීතුමා තමයි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් සභාපතිකම අරගෙන එහා පැත්තට පැන්නේ. අපි පැන්නේ නැහැ. දැන් ඔය ආපහු එතුමාගෙන් ෂේප් වෙන්න යන්නේ. ඕවාට අපි අහු වෙන්නේ නැහැ. එම නිසා ඉංජිනේරු මහත්තයා ගණන් ගන්න එපා; සැලෙන්න එපා; වැටෙන්න එපා. ඔහොම තමයි, බහින කලාවට ඕවා වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කියා ගෙන ආවේ මේ ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් කියලායි. තමුන්නාන්සේලා මේ පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන් මහින්ද අමරවීර ඇමතිතුමා හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, හම්බන්තොට වරාය සම්බන්ධයෙන් වූ මේ කාරණය පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා. මොකද, ඔබතුමන්ලාට තමයි අවසානයේ මේක ඉතිරි වන්නේ. එම නිසා මේ පත් කිරීම සම්බන්ධයෙන් කෙරෙන කටයුතු, අක්කර ප්‍රමාණය වැඩි කිරීම කියන මේ සියල්ල ඇතුළු ගනුදෙනුව පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක් තිබෙනවා.

[අ.භා. 3.11]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මිත්‍ර මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ කථාවෙන් පස්සේ මට කථා කරන්න ලැබීම ගැන සතුටු වනවා. එතුමා, එතුමාගේ කථාවේදී

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

යැයි ප්‍රකාශ කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා මේ සම්බන්ධයෙන් පොඩ්ඩක් පරීක්ෂා කර බලා එම කොටස හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න. මා හිතන්නේ ඒක ගරු අගමැතිතුමාට කරපු අගෞරවයක්. එතුමා බොරුකාරයෙකු නොවෙයි කියන එක මේ රටම දන්නවා.

විශේෂයෙන්ම මා මේ අවස්ථාවේදී තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. අද මේ සභාව නොමහ යවමින් ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කථා කළා. එදා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලාවේ පැවැති රැස්වීමේදී ඉදිරිපත් කරලා තිබුණේ මෙන්න මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අනුකමිටුවේ වාර්තාවේ සිංහල සහ ඉංග්‍රීසි පිටපත් සහ මේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සම්මන්ත්‍රණය" කියන file එක විතරයි. වෙන කිසිදු ලියවිල්ලක් එදා එතැනදි බෙදා හැරියේ නැහැ.

අපි දන්නවා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ලා හැම දාමත් බුද්ධ චීවරය, පාත්තරය, පින් කැටය ආදී මේ හැම දෙයක්ම විකුණා තමයි දේශපාලනය කෙරුවේ කියලා. එම නිසා සිංහල බෞද්ධයන් විධියට අපි කනගාටු වෙනවා, ස්වාමීන් වහන්සේලා යොදා ගෙන මේ විධියට සංඝ භේදය ඇති කර තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කරන්න කටයුතු කිරීම සම්බන්ධව. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන අපි ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා පිළිගත්තා මිසක්, කවදාවත් ස්වාමීන් වහන්සේලා දේශපාලන අතකොළුවක් බවට පත් කර ගත්තේ නැහැ. සියම් නිකාය, මල්වතු අස්ගිරි පාර්ශ්වවලට අමතරව රුහුණු පාර්ශ්වයක් හදන්න කටයුතු කරපු කාලයක් තිබුණු බව අපට මතකයි. ඒ විධියට මේ නිකායන් කඩලා බිඳලා සුනු විසුනු කරන්න කටයුතු කරපු කාලයක් තිබුණා. එහෙම නායකයෝ අද නැහැ. එම නිසා දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අද කටයුතු කරපු ආකාරය, හැසිරුණු ආකාරය සම්බන්ධව අපේ අප්‍රසාදය පළ කරන ගමන්, එතුමා ඒ විධියට කටයුතු කරලා හැම දාමත් දේශපාලන වාසි අරගෙන තමන් සිංහල බෞද්ධ යැයි කියා ගෙන, බෞද්ධයන්ගේ නායකයකු යැයි කියා ගෙන හැම දාම තමන්ගේ ජාතිවාදී ස්වරූපය පෙන්වූවා. දිනේෂ් ගුණවර්ධන මහත්තයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා සිංහල අයට, එහෙම නැත්නම් බෞද්ධයන්ට මොනවාද කෙරුවේ කියලා මම අහනවා.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අඩුම තරමේ දිනේෂ් ගුණවර්ධන මහත්තයාගේ පරම්පරාවෙන්වත් බෞද්ධයන්ට වෙහෙර විහාරයක්වත් හදා දුන්නා ද කියලා මම අහන්න කැමැතියි. හැබැයි, හැම දාම සිවුර අළෙවි කරලා, පාත්තරය අළෙවි කරලා, පන්සල අළෙවි කරලා තමන්ගේ දේශපාලනය කරපු එක තමයි මේ ගොල්ලන් කළේ. අදත් ඒ වාගේ නින්දිත වැඩක් තමයි කළේ. හැබැයි, හොඳට මතක තියා ගන්න තවම මේ කියන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කරලාවත් නැහැ; එහෙම කෙටුම්පතක් එන්නෙත් නැහැ; බෞද්ධාගමට තිබෙන තැන නැති වෙන්නෙත් නැහැ. ඒක අපේ නායකයනුත් පිළිගන්නා කාරණයක්; ගරු ජනාධිපතිතුමාත් පිළිගන්නා කාරණයක්; ද්‍රවිඩ සන්ධානයත් පිළිගන්නා කාරණයක්; ජනතා විමුක්ති පෙරමුණත් පිළිගන්නා කාරණයක්. අපි මේ රටේ හොඳ බෞද්ධ නායකයන් දෙන්නෙක් පත් කරලා තිබෙනවා. ඒ නායකයන් දෙන්නා ඉන්න මේ රටේ ඒ දේ වෙන්නේ නැහැ. එම නිසා මේ රට ගිනි තියන්න බලාපොරොත්තු වන ඔබතුමන්ලාට ඒ ආශාව ඉෂ්ට වෙන්නේ නැහැ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, අරක කළා, මේක කළා කියලා. හැබැයි, එතුමාගෙන් මම දැනගන්න කැමැතියි, ෂැංග්‍රිලා හෝටලයට අක්කර 7ක් සින්නක්කරව විකුණුවාද, නැද්ද කියලා. විකිණුවා. හිටපු ජනාධිපතිතුමා -අපේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා- මේ අවස්ථාවේ මේ සභාවේ ඉන්නවා. ඊළඟට Port City ව්‍යාපෘතියේ ඒ ගිවිසුම අනුව හෙක්ටෙයාර 20ක් සින්නක්කරව චීනයට පවරා දුන්නාද, නැද්ද? දුන්නා. ඒවා අපි වෙනස් කළා. ඒවා තමයි අපි යහ පාලනය තුළින් කළේ. 2015 ජනවාරි 08වෙනි දා ආණ්ඩු බලය ලබාගෙන කරපුවා ඒවා තමයි. දැන් ෂැංග්‍රිලා එක විකුණලා ඉවරයි. හැබැයි, අපි හම්බන්තොට වරාය විකිණීමක් නොවෙයි කරන්නේ. මේක සියයට 80ට හරි 20ට හරි ආයෝජනයක් විධියට - Public-Private Partnership එකක් විධියට- යනවා මිසක්, අවුරුදු 99ක බදු ගිවිසුමක් ඔස්සේ ආයෝජනයක් විධියට යනවා මිසක් විකිණීමක් නොවෙයි. විකිණීම කියන වචනයත් අද වෙනස් කරලා තිබෙන්නේ. විකිණීමයි, ආයෝජනයයි අතර තිබෙන වෙනස විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු දන්නේ නැහැ. මෙම ව්‍යාපෘති මේ විධියට ආරම්භ කරලා ඒවා ඉස්සරහට ගෙන යන්න බැරි තත්ත්වයක තිබුණු නිසා තමයි අපි අද විශාල ණය බරක හිරවෙලා තිබෙන්නේ.

මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කියනවා, ආදායම වැඩි වෙලා තිබෙනවා කියලා. ඒ වැඩි වන ආදායම ඒ වැඩි වෙන විධියට වැඩිවෙලා ගියාට, තව අවුරුදු සියයකින්වත් අඩුම තරමේ අපේ ණය වාරික ටිකවත් ඒ ව්‍යාපෘතියට ගිය වියදමවත් cover කර ගන්න බැහැ. එවැනි අසාර්ථක ව්‍යාපෘති කීයක් තිබෙනවාද? එතුමාම සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය ගැන කිව්වා. සූරියවැව ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය කියන්නේ, අසාර්ථක ව්‍යාපෘතියක්. මත්තල ගුවන් තොටු පොළ කියන්නේ, අසාර්ථක ව්‍යාපෘතියක්. හැබැයි, හම්බන්තොට වරාය ව්‍යාපෘතිය ආයෝජනය කරලා දියුණු කරන්න පුළුවන් ව්‍යාපෘතියක් කියලා අපි කියනවා. අපි හැම එකම නරකයි කියලා කියන්නේ නැහැ.

ඊළඟට, උමාඔය ව්‍යාපෘතිය බලන්න. උමාඔය ව්‍යාපෘතිය කරන්න ඕනෑ ව්‍යාපෘතියක්. හැබැයි, ඒකේ හරියට ශක්‍යතා අධ්‍යයනයක් කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් විද්වතුන්ගේ අදහස් ගත්තේ නැහැ. ඒ කොන්ත්‍රාත් සමාගම් පිළිබඳව හරියට විනිවිදභාවයකින් බැලුවේ නැහැ. මේ ආයෝජනවලට වියදම් වුණු මුදල් පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම ව්‍යාපෘති කරලා මේ රට සංවර්ධනය කරන්න පුළුවන්ද කියලා මම අහනවා. 2019 වන විට අද ගෙව්වා වාගේ දෙගුණයක් අපට ගෙවන්න තිබෙන ණය ප්‍රමාණය වැඩි වනවා. අපට මතකයි, අපේ නායකයා -වර්තමාන අගමැතිතුමා- 2004 වර්ෂයේ අගමැතිතුමා ලෙස හිටපු වෙලාවේ, එතුමා සියයට 45කින් ණය බර අඩු කළා. අපට පට් තද කර ගන්න කිව්වා. අපේ පාක්ෂිකයන්ට ඉවසන්න කිව්වා. ඒක නිසා අපට විපක්ෂයට යන්න වුණු එක වෙනම කතන්දරයක්. හැබැයි, ඉදිරියට අපට ගෙවන්න තිබෙන ප්‍රමාණය, එදා ඉඳන් අද දක්වා ගත්ත ණය ප්‍රමාණය මෙන් දෙගුණයක් බවට පත් වෙනවා. මෙතුමන්ලා මොන ව්‍යාපෘති කළා කිව්වත් අපේ තමයි හම ගියේ. මෙතුමන්ලාගේ නම ගියේ.

අපි ජනවාරි 08වෙනි දා ආණ්ඩුව භාර ගන්නා විට, මුදල් නැතිව කරපු ව්‍යාපෘතිවලට රුපියල් බිලියන 138ක් ගෙවන්න තිබුණා. කිසිදු මුදල් වෙන් කර ගැනීමකින් තොරව කරපු ව්‍යාපෘතිවලට රුපියල් බිලියන 138ක් ගෙවන්න වුණා. රවි කරුණානායක මැතිතුමා මුදල් ඇමති විධියට ඒ රුපියල් බිලියන 138 ගෙව්වා. හැබැයි, ඒවාට අපේ නම ගියේ නැහැ. අපේ හම ගිය එක විතරයි වුණේ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා රටට වග කියන ආණ්ඩුවක් විධියට අපි අනවශ්‍ය ව්‍යාපෘති කරන්නේ නැහැ කියලා. අපි කරන්නේ, රටට ප්‍රමුඛතාව තිබෙන ව්‍යාපෘති. හම්බන්තොට දියුණු කරන්නවත්, කුරුණෑගල දියුණු කරන්නවත්, එහෙම නැත්නම් අගමැතිතුමාගේ ගම දියුණු කරන්නවත් අපට අවශ්‍ය නැහැ. අපට ඕනෑ රටක් විධියට රටට අවශ්‍ය, ප්‍රමුඛතාව තිබෙන ව්‍යාපෘති මොනවාද කියලා හඳුනා ගෙන ඒ ව්‍යාපෘතිවලට මුදල් වෙන් කරන්නයි. එහෙම නැතිව තව අවුරුදු සියයකින්වත් අවශ්‍ය නොවන හම්බන්තොට මං තීරු හතරේ පාරවල් හදන්න, අපේ රටේ සමස්ත ආදායම උගස් තියන්න, එහෙම නැත්නම් අපේ රටේ ජනතාව ණයකාරයෝ කරන්න අපි කටයුතු කරන්නේ නැහැ. හම්බන්තොට පාරවල් හැදෙන්න ඕනෑ තමයි. හැබැයි, හැදෙන්න ඕනෑ අවශ්‍යතාව මතයි. තව අවුරුදු 10කට, 20කට, 30කට සැලසුම් කරලා හැදුවාට කමක් නැහැ. තව අවුරුදු 100කටවත් ඕනෑ නැති මං තීරු හතරේ පාරවල් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඕනෑ තරම් තිබෙනවා. අද ඒවායේ වැඩිපුර යන්නේ වාහන නොවෙයි. වාහනවලට වඩා රිලව්, තලගොයි, වඳුරෝ, මොනරු වැනි හැම සතෙක්ම ඔය පාරවල්වල යනවා. එවැනි ව්‍යාපෘති කරලා අපට මේ රට ණය කරන්න ඕනෑ නැහැ. ඒ නිසා අපි පැහැදිලිව මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට කියනවා, "ඔබතුමන්ලා කරපු ව්‍යාපෘතිවල තරම දැන් අපේ රටේ ජනතාව දන්නවා"ය කියලා.

තමුන්නාන්සේලා උමාඔය ගැන කථා කරන්නේ නැහැ; SAITM එක ගැන කථා කරන්නේ නැහැ. ඒවායේ පීතෘත්වය බාර ගන්නේ නැහැ. පීතෘත්වය බාර ගන්නවා නම් හොඳ දරුවාගේත් පීතෘත්වය බාර ගන්න ඕනෑ; අංග විකල දරුවගේත් බාර ගන්න ඕනෑ; නොසංඩාල දරුවගේත් බාර ගන්න ඕනෑ. ඒත් තමුන්නාන්සේලා හොඳ දරුවන් ගැන විතරක් කියනවා; අංග විකල දරුවන් ගැන කියන්නේ නැහැ. අංග විකල දරුවන් ගැන කියන්න අපට බාර දීලා තිබෙනවා. නොසංඩාල දරුවන් ගැන වාගේම අපේ රටේ විකුණුපු සම්පත් -දරුවන්- ගැන තමුන්නාන්සේලා කථා කරන්නේ නැහැ. ඒවා සියල්ලම අපට බාර දීලා. අපි ජනවාරි 08 වැනි දා වෙනස නොකළා නම් අද අපේ රට තිබෙන්නේ කොතැනද?

දැන් ලජ්ජා නැතිව අධිකරණය ගැන කථා කරනවා. ශිරාණි බණ්ඩාරනායක මහත්මිය කකුල් දෙකෙන් ඇදලා පුටුවෙන් විසි කරලා දැම්මා. පසු ගිය කාලයේ අධිකරණයේ ස්වාධීනත්වයක් තිබුණාද? ඒ දවස්වල අරලියගහ මන්දිරයේ ඉඳගෙන තමයි අධිකරණ විනිසුරුවන්ට කථා කරලා, තර්ජනය කරලා, අධිකරණයේ ස්වාධීනත්වය නැති කළේ. අවුරුදු දෙකකට පස්සේ

මේ රටේ ජනතාවට ඒවා අමතකයි කියා හිතලා කටයුතු කරන හිටපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නායකයන්ට 2020දී යළිත් බලය දෙන්න තරම් මේ රටේ ජනතාව මෝඩ නැහැ කියන කාරණය මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

ප්‍රශ්න තිබෙන්න පුළුවන්. අපේ ආණ්ඩුවේත් දුර්වලකම් තිබෙන්න පුළුවන්. හැබැයි, ඒ හැම දෙයක් ගැනම සාපේක්ෂව තමයි අපි බලන්න ඕනෑ. හැම දෙයක්ම තරාදියේ දෙපැත්තට දාලා බලන්න ඕනෑ. අපේ ආණ්ඩුව කාලයේ කරපු ටිකයි, ඔබතුමන්ලා ආණ්ඩු කළ අවුරුදු දහය තුළ කරපු ටිකයි තරාදියේ දෙපැත්තට දමලා බලන්න ඕනෑ කොහොමද තත්ත්වය කියලා.

තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා මත ගම්පොල ඉඩම් අත්පත් කරගෙන, නාවලපිටියේ ඉඩම් අත්පත් කරගෙන කරපුවා අපි දන්නවා. මේ බඩ ගෝස්තරවාදී දේශපාලනය නතර කළොත් අපේ රටට ඉස්සරහට යන්න පුළුවන්. මේ අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් ඉන්න තාක් කල් බුද්ධාගමට තිබෙන තැන නැති වෙන්නේ නැති බව මා පැහැදිලිවම කියනවා. ව්‍යාවස්ථා බිල්ලෙක් මවලා, ස්වාමීන් වහන්සේලා කලබල කරලා, නැවත ආගම්වාදී, ජාතිවාදී ස්වරූපයකට මේ රට තල්ලු කරන්න ඉඩ දෙන්නේ නැහැ කියලා අපි කියනවා. අපි ගෞරවනීය ස්වාමීන් වහන්සේලාටත් බොහොම ගෞරවයෙන් කියනවා, "මේ ව්‍යවස්ථාව තවම එළියට ඇවිල්ලා නැහැ. නොදැකපු ව්‍යවස්ථාවක් පෙන්වලා, උන් වහන්සේලා නොමඟ යවලා කටයුතු කරන මේ බඩ ගෝස්තරවාදී දේශපාලනඥයන් පන්සලකටවත් වැද්ද ගන්න එපා" කියලා. ඒක තමයි ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගෙන් අපි ඉල්ලන ගෞරවනීය ඉල්ලීම.

අද දවසේ විවාද කරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත කෙරෙහි මා ඊළඟට අවධානය යොමු කරනවා. ධීවර කර්මාන්තය අද මේ තැනට ගන්න පුළුවන් වුණේ කුමන හේතුවක් නිසාද? අපේ රටට තිබුණු යුරෝපා මත්ස්‍ය තහනම නැති වුණා, තමුන්නාන්සේලා කරපු මහා කෙරුවාවල් සහ වැඩ නිසා. ඒ නිසා රුපියල් කෝටි ගණනක් අපේ ධීවරයන්ට සහ අපේ රටට එන්න තිබුණු අවස්ථාව නැති වුණා. ඒ යුරෝපා මත්ස්‍ය තහනම නැති කරගෙන අද යුරෝපයට අපේ මත්ස්‍ය අපනයනය කරනවා. ඒ තුළින් විශාල මුදලක් අපේ රටට ලැබෙනවා. හැබැයි, අපේ රටේ තිබෙන මත්ස්‍ය සම්පත රැක ගන්න අපි කටයුතු කරන්න ඕනෑ. ඉන්දියානු ධීවරයන් ලංකාවට ඒම තමයි අපට දැන් තිබෙන බරපතළම ප්‍රශ්නය. ධීවර ප්‍රදේශයක් නියෝජනය කරන අපේ ශාන්ත සිසිර කුමාර අබේසේකර මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ ඉන්නවා. එක වතාවට ට්‍රෝලර් 60ක්, 70ක් ඉන්දියාවෙන් එද්දී මේ විධියට නීති පනවලා නතර කරන්න බැහැ කියලා තමයි එතුමා කිව්වේ. ඒ සඳහා යම්කිසි බාධකයක් -barrier- දාන්න ඕනෑ කියලා තමයි මේ විෂයය පිළිබඳව දන්නා අය කියන්නේ. Bottom trawling ක්‍රමය තුළින් ඩෙස්ටර් කරනවා වාගේ තමයි මාළු ටික අරගෙන යන්නේ. ඒ නිසා අපේ මුහුදු සීමාව තුළ තිබෙන මුහුදු පතුලට අඩු ගණනේ යම්කිසි බාධක ටිකක් දාන්න පුළුවන් නම් මේ ගැටලුව විසඳා ගන්න පුළුවන් වනවා. "පරණ කෝච්චි පෙට්ටි ටිකක් හෝ ගෙනිහිල්ලා ඒ මුහුදු පතුලට බස්සන්න පුළුවන් නම් මේ ක්‍රමය භාවිත කරන්න බැහැ. එහෙම නැතිව නීති පනවලා මේ වැඩේ නවත්වන්න බැහැ" කියලා පැහැදිලිවම මේ සම්බන්ධව දන්නා අය කියනවා. "වෙඩි තියලා මේ කටයුත්ත නවත්වන්න" කියලා පසු ගිය කාලයේ කිව්වා. කොයි විධියටවත් අපට ඉන්දියාවත් එක්ක ඒ කටයුත්ත කරන්න බැහැ.

අපේ මිත්‍ර රටක් විධියට වාගේම ලෝකයේ බලගතු රටක් විධියට සලකන ඉන්දියාවත් එක්ක වෙඩි තියාගෙන අපට මේ වැඩේ කරන්න බැහැ. ඒ නිසා පැහැදිලිවම යම්කිසි බාධකයක්, වැටක්, ආවරණයක් යොදලා, bottom trawling ක්‍රමයට මාළු අල්ලන එක නවත්වන විධියේ ක්‍රමයක් මුහුදු පතුලට යෙදුවොත් විතරයි මේ කටයුත්ත නතර කරන්න පුළුවන් වන්නේ. එහෙම වුණොත් අපට ධීවර කර්මාන්තය රැක ගන්න පුළුවන්. අපේ ධීවරයන් මේ ක්‍රමය භාවිතා කරන්නේ නැහැ. "ගොඩ trawling" ක්‍රමය තමයි අපේ ධීවරයන් භාවිත කරන්නේ. මේ යෝජනා තුළින් අපේ ධීවරයන්ට තමයි බරපතළ ප්‍රශ්නයක් ඇති වෙන්නේ. ඒ නිසා මේ ගැන හරියට සොයා බලා, සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරන්න කියලා අපි පැහැදිලිවම කියනවා. විද්‍යාත්මකව මේ විෂයය පිළිබඳව දන්නා තාක්ෂණික නිලධාරීන්, සමුද්‍රය පිළිබඳව අවබෝධයක් තිබෙන ඉංජිනේරුවන් යොදාගෙන, මේ සඳහා නිවැරදි ක්‍රමවේදයක් භාවිත කරන්න කියලා මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

පසු ගිය කාලයේ මේ ආණ්ඩුවට නොයෙක් ගැටලු මතු වුණා. හැබැයි මොන ගැටලු මතු වුණත්, අපි උද්ඝෝෂණවලට මුහුණ දුන්නා; උද්ඝෝෂණ විසුරුවා හැරියා; අවම බලය පාවිච්චි කළා. හැබැයි, මේ කණ්ඩායමට ඕනෑ වෙලා තිබෙන්නේ, එහෙම උද්ඝෝෂණ විසුරුවන්න නොවෙයි. මේ අයට ඉක්මනටම අවශ්‍ය වෙලා තිබෙනවා, බිල්ලක්. මේ ගොල්ලන් රතුපස්වලට ගිහිල්ලා වෙඩි තියලා මිනිසුන් මරලා තමයි පැය 48ක් ගත වෙන්න කලින් ඒ උද්ඝෝෂණය විසුරුවා හැරියේ. ඒ වාගේම හලාවත ධීවරයන් පෙට්‍රල් සහනය ඉල්ලද්දී පළමුවන දවසේම වෙඩි තියලා ධීවරයෙක් මැරුවා. EPF එක ගැන උද්ඝෝෂණය කරද්දී කටුනායක රොෂේන් චානක සහෝදරයාට වෙඩි තියලා මැරුවා. දැන් මේ අයට අවශ්‍යයි, අපේ ආණ්ඩුවත් ඒ ගොඩට දමා ගන්න. අපේ ආණ්ඩුව මිනියක් මරලා නැහැ කියන කාරණය, ජනතාව දන්නා ඒ කාරණය, අහෝසි කරන්නයි මේ අයට ඕනෑ. ඒ නිසා, මේ උද්ඝෝෂණයකදී බැරි වෙලාවත් වැටිලා හරි තරුණයෙක් - උද්ඝෝෂකයෙක්- මැරෙන එක තමයි මේ ගොල්ලන්ගේ බලාපොරොත්තුව; ඒක තමයි මේ අයගේ අවශ්‍යතාව. මිනියක් කර තබා ගෙන 2020 වසරේදී ආණ්ඩු පෙරළන්න බලාපොරොත්තු වෙන කණ්ඩායමක් තමයි අද ඉන්නේ.

වර්තමාන ජනාධිපතිතුමා බොහොම අහිංසක, ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙක්. අගමැතිතුමාත් ඒ වාගේ නායකයෙක්. ඒ නායකයෝ ඉන්නකල් කවදාවත් මිනී මරන්නේ නම් නැහැ. ඒක නම් බලාපොරොත්තු වෙන්න එපා. ඔබතුමන්ලා ඒ චේතනාවෙන් උද්ඝෝෂණ කරනවා නම්, අපි ඒ උද්ඝෝෂණය කරන හාදයන්ටත් කියනවා, අන්තරේ හාදයන්ටත් කියනවා, ඒ අය ඉස්සරහට දමාගෙන මිනියක් කර පින්නාගෙන 2020 වසරේදී බලයට පත් වෙන්න හදන අයටත් කියනවා, ඒකට නම් අපි ඉඩ නියන්නේ නැහැ කියලා. අපේ ආණ්ඩුව ඒ තත්ත්වයට පත් වෙන්න නම් කොහෙත්ම කටයුතු කරන්නේ නැහැ. හැබැයි, අවම බලය පාවිච්චි කරලා උද්ඝෝෂණයක් විසුරුවා හරින්න, බහුතර ජනතාවට උද්ඝෝෂණවලින් අවහිරයක් නොවෙන්න, නීතියේ ප්‍රතිපාදන ඇතුළත අපි කටයුතු කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කළ කථාව ගැන නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාගේ කථාවේදීත් සඳහන් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී සඳහන් කළා, විදුලිබල මණ්ඩලය පාඩු ලබන බව පෙන්වලා විදුලි බිල වැඩි කිරීමට ලැහැස්ති වෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා වගකීමෙන් මේ රටේ ජනතාවට කියනවා, අපි කිසිම ලෙසකින් විදුලි බිල වැඩි කරන්නේ නැහැ කියලා. මේ රටේ විදුලි බිල වැඩි කිරීමට කිසිම ආකාරයකින් කටයුතු කරන්නේ නැහැයි කියන කාරණය මා ඉතාම වගකීමෙන් කියනවා. මා එය නැවත නැවතත් කියනවා. විදුලිබල මණ්ඩලයේ තිබෙන ගැටලු විසඳා ගන්න අපට පුළුවන්. විකල්ප ක්‍රමවලින් අපි ඒ ප්‍රශ්න විසඳා ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන මතක් කළ එක හොඳයි. බොහොම ස්තුතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔව්. ඒ බොරු කියපු අය දැන් මෙතැන නැහැ. මෙතැන බොරු වපුරලා, පාර්ලිමේන්තුව ගඳ ගස්වලා, දැන් ගිහිල්ලා. ඒ සියල්ලම මාධ්‍ය සන්දර්ශන. මාධ්‍ය සන්දර්ශන තමයි අද මේ රටේ තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ගොල්ලන් මයික් එකක් ළඟට ගිහිල්ලා එක දෙයක් කියලා, එළියට ගිහිල්ලා වෙනත් දෙයක් තමයි කරන්නේ. මේ මාධ්‍ය සන්දර්ශන නතර කරන්න ඕනෑ. මේ මාධ්‍ය සන්දර්ශන බුද්ධියෙන් විමර්ශනය කරන, ඒවා දෙස විවක්ෂණශීලීව බලන කාලයක් අපි මේ රට තුළ ඇති කරන්න ඕනෑ. මොකද, මේ අයට ඕනෑ කරන්නේ රට ගිනි තියන්නයි.

1978 වසරේදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හඳපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි තවමත් තිබෙන්නේ. දැන් ඒකට අවුරුදු 40ක් වෙන්නත් ළඟයි. එතුමා එදා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදද්දී ඒකට විරුද්ධව ටයර් පුච්චපු අය, උද්ඝෝෂණ කරපු අය, පෙළපාළි ගිය අය, ඒවාට නායකත්වය දීපු අය තමයි අද ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කර පින්නාගෙන යන්නේ. නමුත් ඒක හඳපු එක්සත් ජාතික පක්ෂයේ අයට ඕනෑ වෙලා තිබෙනවා, මේ නවීන යුගයට - විසි එක්වන ශත වර්ෂයට- ගැළපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න. එදා මේ ව්‍යවස්ථාව හදනකොට උද්ඝෝෂණ කරපු අය දැන් ඒකට මල් තියලා වඳිනවා. මම කියනවා, මේ හෘදයන්ගේ ගෙවල්වල ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පිළිම හදන්න ඕනෑ කියලා. එතුමාගේ ඡායාරූප තියලා, මල් තියලා වඳින්න කියන්න ඕනෑ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඒ අය -එදා විරුද්ධ වුණු අය- එතරම්ම ආදරෙයි. මේ අයට ඕනෑ, මේ රට ගිනි තියන්නයි. අද බහුතරයක් තරුණයන්, විද්වතුන් පිළිගන්නවා, මේ රටට මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැළපෙන්නේ නැහැ කියලා. උතුරේ ද්‍රවිඩ ජනතාවට, දකුණේ සිංහල ජනතාවට, මුස්ලිම් ජනතාවට, බෞද්ධයන්ට, කතෝලිකයන්ට, -ඒ හැම කෙනෙකුටම- ගැළපෙන, තව අවුරුදු සියයකට ගැළපෙන, මේ රට තල්ලු කරගෙන ඉස්සරහට යන්න පුළුවන්, ලෝකයට ගැළපෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අපි හදන්න ඕනෑ.

මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා වෙන්න පුළුවන්, දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ඒකාබද්ධ කල්ලිය වෙන්න පුළුවන්, ඒ අය මේ කරන්නේ බුද්ධ චීවරයට අගෞරව කිරීමක්. තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය වෙනුවෙන් බුද්ධ චීවරය යොදා ගන්නවාද, ස්වාමීන් වහන්සේලාට වැරදි අවබෝධ දෙනවාද, නායක ස්වාමීන් වහන්සේලා නොමඟ යවනවාද, ඒක තමයි වර්තමානයේ සිදු වන ලොකුම ආනන්තරිය පාප කර්මය විධියට මම නම් දකින්නේ. ගෞතම බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටියා නම්, මේකත් ආනන්තරිය පාප කර්මයක් හැටියට එකතු කරාවි. ඒ වාගේ තුට්ටු දෙකක් දේශපාලනයක් කරන පිරිසක් තමයි මේ ඒකාබද්ධ කල්ලියේ අය.

මේ ආණ්ඩුව බලය අරගෙන තවම අවුරුදු දෙකයි. විශ්වකර්ම විධියට මාසයෙන් දෙකෙන්, අවුරුද්දෙන් මේ සේරම වෙනස් කරන්න බැහැ. ඒ වාගේම, මෙතුමන්ලා highway ගැන කථා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දී තිබූ කාලය අවසන්.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න.

මෙතුමන්ලා highway ගැන කථා කළා. මොනවාද මේ කියන්නේ, ඒ දවස්වල කිසිදු ක්‍රමවේදයකින් තොරව තමන්ගේ හිතවතුන්ට කොන්ත්‍රාත් දුන්නු කට්ටිය තමයි අද එහෙම කථා කරන්නේ. අද highway හැදීම ටෙන්ඩර් ක්‍රමවේදය තුළින් හරියට ක්‍රියාත්මක වෙනවා. [බාධා කිරීමක්] අද දේශීය කොන්ත්‍රාත්කරුවන් යොදාගෙන, දේශීය බැංකුවලින් ණය අරගෙන ඒවා ක්‍රියාත්මක වෙනවා. [බාධා කිරීමක්] ඒ දවස්වල highwayවලට වෙන්න පුළුවන්, අනෙක් පාරවල්වලට වෙන්න පුළුවන්, ඒවාට බොරලු දාපු අයට, බොරලු කපපු අයට මේවා කියද්දී ඇඬෙනවා; කෑ ගැහෙනවා; පුටුවෙන් නැඟිටෙනවා. [බාධා කිරීමක්] පුටුව රත්වෙනවා. බොරලු වැඩ කරපු අයට මේවා කියනකොට ඉන්න බැහැ. මේ ආණ්ඩුව කරන හැම ව්‍යාපෘතියක්ම කරන්නේ රටට වැදගත් වන විධියට, රටට බරක් නොවන සාධාරණ මිල ගණන්වලටය කියන කාරණය මතක් කරමින්, මේ රට ගිනි තියන දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමන්ලාට සවන් දෙන්න එපා කියන කාරණය නැවත වතාවක් රටේ ජනතාවටත්, ගෞරවනීය ස්වාමීන් වහන්සේලාටත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

[பி.ப. 3.29]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடற்றொழில் அமைச்சரினால் சமர்ப்பிக்கப்பட்ட 1996ஆம் ஆண்டின் 2ஆம் இலக்கக் கடற்றொழில் நீர்வாழ் உயிரின வளங்கள் சட்டத்தைத் திருத்துவதற்கான சட்டமூலம் இன்று விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டிருக்கின்றது. கடற்றொழில் அமைச்சு மீனவர்களின் நலன் கருதிச் சட்டங்களை இயற்றுவதை வரவேற்கின்றேன். இவ்வாறான சட்டங்களின்மூலம், எங்களுடைய மீனவர்களுடைய வாழ்வாதாரத்தைப் பாதிக்கும் வகையில் இந்திய இழுவைப் படகுகள் எமது கடற்பரப்புக்கு வந்து மீன்பிடித் தொழிலில்

ஈடுபடுவது முற்றுமுழுதாகத் தடுத்து நிறுத்தப்படவேண்டும். அப்படி நிறுத்தப்பட்டால்தான் இலங்கையிலுள்ள மீனவர்கள் தங்களுடைய சொந்தக் கடலில் சுயமாகத் மீன்பிடியில் ஈடுபட முடியும் என்பதைக் கௌரவ அமைச்சர் அவர்களுக்குத் தெரியப்படுத்த விரும்புகின்றேன். அதேநேரத்தில் உள்ளூர் இழுவைப் படகுகள் தொடர்பாக மாவட்டங்களில் இருக்கின்ற கடற்றொழில் சம்மேளன நிர்வாக உறுப்பினர்களும் சமாச நிர்வாக உறுப்பினர்களும் இணைந்து-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

-அனைத்து மீனவர்களையும் பாதிக்காத வகையில் ஒரு கலந்துரையாடலை மேற்கொண்டு, அதன் அடிப்படையில் அதற்குரிய தீர்மானங்களை அமைச்சு எடுக்கவேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன். அத்துடன், கடற்றொழில் சார்பாக என்னுடைய ஒரு கோரிக்கையையும் கௌரவ அமைச்சர் அவர்களிடம் முன்வைக்க விரும்புகின்றேன். ஆனால், கடற்றொழில் அமைச்சர் அவர்கள் தற்போது இந்தச் சபையில் இல்லை. இருந்தாலும், கடற்றொழில் அமைச்சினுடைய செயலாளர் மற்றும் பணிப்பாளர்கள் இங்கு இருப்பதால் அவர்களுடைய கவனத்தினை இந்த விடயத்தில் ஈர்க்க விரும்புகின்றேன்.

1983ஆம் ஆண்டு நாட்டில் ஏற்பட்ட கலவரம் காரணமாகக் கொக்கிளாய் பிரதேசத்திலிருந்து எங்களுடைய மக்கள் இடம்பெயர்ந்தார்கள். அந்த மக்கள் அங்கிருந்து இடம்பெயர முன்னர் அங்குள்ள கடற் பிரதேசத்தில் சுயமாக மீன்பிடித் தொழிலில் ஈடுபட்டவர்கள். அங்கு அந்த நேரத்தில் எந்தவிதமான கரைவலைத் தொழிலும் இருக்கவில்லை. அப்படியாக இடம்பெயர்ந்த அவர்கள், 27 வருடங்களின் பின்பு 2010ஆம் ஆண்டு அங்கு மீள்குடியேறினார்கள். அவர்கள் மீள்குடியேறியபோது தென்பகுதி மீனவர்களுக்கு அங்கு கரைவலைத் தொழிலில் ஈடுபடுவதற்குரிய அனுமதி மாவட்ட கடற்றொழில் பணிப்பாளரால் வழங்கப்பட்டிருந்தது. உண்மையில் கரைவலை இழுப்பதற்கான அனுமதி கொடுக்கும்போது அந்தப் பிரதேச செயலாளருடைய அனுமதியை அவர் பெற்றிருக்க வேண்டும். அந்தவகையில் கரைதுறைப்பற்று பிரதேச செயலாளருடைய அனுமதி இல்லாமல் அந்தப் பிரதேசத்தில் கரைவலை இழுப்பதற்கான அனுமதி தென்பகுதி மீனவர்களுக்கு வழங்கப்பட்டிருந்தது. இது முற்றுமுழுதும் பிழையாக வழங்கப்பட்ட அனுமதியாகும்.

அந்த மக்கள் 2010ஆம் ஆண்டு மீள்குடியேறிருந்தாலும் ஒரு வருடத்திற்கு முன்புதான் படகுகளைக் கொள்வனவு செய்யக்கூடிய அளவுக்குப் பொருளாதார நிலையை அடைந்திருக்கிறார்கள். ஒரு வருடத்திற்கு முன்பு கிட்டத்தட்ட 30 படகுகளை கொள்வனவு செய்தும் சொந்தப் பிரதேசமான கொக்கிளாயில் தங்களுடைய படகுகளை வைத்து கடற்றொழிலில் ஈடுபட முடியாத ஒரு பரிதாப நிலை அந்த மீனவர்களுக்கு ஏற்பட்டிருக்கின்றது. உண்மையில் அந்த கரைவலைத் தொழிலை நிறுத்தும்படி அவர்கள் கோரவில்லை. தாம் இயல்பாகத் தொழில் செய்யக்கூடிய வகையில் தங்களுடைய படகுகளை நிறுத்தி வைப்பதற்கு 250 மீற்றர் நிலப்பரப்பைத் தங்களுக்கு ஒதுக்கித் தரும்படிதான் அந்த மீனவர்கள் கேட்கிறார்கள். அந்த வகையில், கடற்றொழில் அமைச்சர் அவர்கள் அம்மீனவர்களுக்கு அதை வழங்க வேண்டும். ஏனென்றால், அவர்கள் அந்தப் பிரதேசத்தில் பூர்வீகமாக - பரம்பரை பரம்பரையாக வாழ்ந்தவர்கள். 1983ஆம் ஆண்டுக்கு முன்பு அங்கு இயல்பாக கடற்றொழிலில் ஈடுபட்டவர்கள். இருபத்தேழு வருடங்களுக்குப் பிறகு 2010ஆம் ஆண்டு அவர்கள் மீள்குடியேறினார்கள். யுத்தம் காரணமாக பல துன்பங்களை அனுபவித்து மீண்டும் தங்களுடைய பிரதேசத்திற்குச் சென்று வாழ்வாதாரத்தை மேம்படுத்தும் நோக்கில் அந்தப் படகுகளைக் கொள்வனவு செய்தும் சொந்தப் பிரதேசத்தில் அவர்களால் கடற்றொழிலில் ஈடுபட முடியாத நிலை இருக்கின்றது.

இந்தப் பிரச்சினை தொடர்பாக நீதிமன்றத்தில் வழக்கு இடம்பெற்று வருகின்றது. நீதிமன்றம் சட்ட மாஅதிபருடைய ஆலோசனையைக் கேட்டிருக்கிறது. கடற்றொழில் மற்றும் நீரக வளமூல அமைச்சின் பணிப்பாளருக்கும் பிரதேச செயலாளருக்கும் இடையே ஓர் இணக்கப்பாட்டை ஏற்படுத்தி, அவர்களுக்கு 250 மீற்றர் நிலப்பரப்பைக் கொடுக்கலாமென்று சட்ட மாஅதிபர் திணைக்களம் ஆலோசனை கூறியிருக்கிறது. ஆனால், அவர்களுக்கு கொடுப்பதற்கென அடையாளம் காட்டப்பட்டிருக்கின்ற அந்த 250 மீற்றர் நிலப்பரப்பு வெறும் கற்பாறைகள் கொண்ட பிரதேசமாகும். அந்தப் பிரதேசத்தில் யாரும் சென்று படகுகளைக் கட்டி தொழில் செய்ய முடியாத ஒரு சூழ்நிலை இருக்கின்றது. ஆகவே, கொக்கிளாய் பிரதேசத்து மீனவர்களுடைய விருப்பத்திற்கு அமைவாக, அவர்கள் ஏற்றுக்கொள்ளக்கூடிய ஓரிடத்தில் தங்களுடைய 30 படகுகளையும் கடற்கரையில் கட்டி சுயமாக கடற்றொழிலில் ஈடுபடுவதற்கு 250 மீற்றர் நிலப்பரப்பை வழங்க வேண்டுமென்று கௌரவ கடற்றொழில் அமைச்சர் அவர்களிடம் நான் விநயமாகக் கேட்டுக் கொள்கின்றேன்.

அவர்களுக்கு இடங்கொடுப்பதாகத் தீர்மானித்து பிரதேச செயலாளர் கடிதமும் கொடுத்திருக்கிறார். அந்தக் கடிதத்தின் பிரகாரம்தான் நீதிமன்றத்தில் வழக்கு இடம்பெற்று வருகின்றது. கடற்றொழில் மற்றும் நீரக வளமூல அமைச்சின் செயலாளர் இங்கிருக்கின்றார். நான் அவரை ஏற்கெனவே பாராளுமன்றத்தில் சந்தித்தேன். Director-General உம் இருக்கிறார். எனவே, நீங்கள் கொக்கிளாய் மீனவர்களுடைய

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

වාෂ්වාතාරත්තෙක් කරුත්තිලෙටුත්තු මනච්චාට්චියුටන් නටන්තුකොණ්ට වේණ්ටුම්. කරෙවලෙයිල් ඊටුපටුකින්ර මීනවර්කළෙ අංකිරුන්තු අනුප්පුවතු අවර්කළුටෙය නෝක්කමල්ල. අවර්කළුක්කු 250 මීට්රර් නිලප්පරප්පු කොටුප්පතාකත් තීර්මානිත්තිරුක්කින්රීර්කළ්. ආනාල්, නීංකළ් සොල්කින්ර ඉටම් පටකුකළෙ නිරුත්ති වෛත්තු කටර්ටොළිල් සෙය්ය මුටියාත කර්පාරෙකළ් නිරෙන්ත ඔරු පිරතේසමාකුම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු ඉ. චාර්ල්ස් නිර්මලනාතන්)
(The Hon. I. Charles Nirmalanathan)
මට විනාඩියක කාලයක් දෙන්න.

අන්ත පිරතේසත්තිල් plastic පටකුකළෛක් කොණ්ටුවන්තු කටර්ටොළිලිල් ඊටුපට මුටියාතු. අන්ත මීනවර්කළුටෙය විරුප්පත්තෛ අරින්තු අවර්කළ් ඉයල්පාක මීන්පිටියිල් ඊටුපටක්කූටියවාරු 250 මීට්රර් නිලප්පරප්පුල්ළ ඔරු පිරතේසත්තෛ අවර්කළුක්කුක් කොටුත්තු, පූර්වීකමාක වාෂ්න්ත අවර්කළුක්කු අන්තක් කටර්පිරතේසත්තිල් මීන් පිටිප්පතර්කාන අනුමතියෙයුම් තේවෛයාන ආලෝසනෛයෙයුම් වෘංකුමාරු නාන් කෞරව අමෛච්චර් අවර්කළිටම් පණිවාකක් කේට්ටුක්කොළ්කිරේන්. කටර්ටොළිල් අමෛච්චර් අවර්කළ් ඉතනෛ නිච්චයමාකච් සෙය්වාර් එන්රු නාන් නම්පුකින්රේන්. අතනෛ අවර් සෙය්යාවිට්ටාල් අතු උණ්මෛයිල් පාරාළුමන්ර උරුප්පිනර්කළාකිය එංකළින් මනංකළිල් අල්ලතු අන්තප් පිරතේසත්තු මක්කළින් මනංකළිල් මිකප් පෙරිය වේතනෛයුම් වටුවුමාක අමෛන්තුවිටුම්. ඉප්පටියාන සින්නඤ්සිරු පිරච්සිනෛකළ් මූලම්තාන් එංකළුටෙය නාට්ටිල් කුෘප්පංකළ් ඒර්පට්ටිරුක්කින්රන. අවර්ත්රෛත් තවිර්ප්පතර්කාකවේ ඉව්වාරාන විට්ටුක්කොටුප්පුක්කළෛච් සෙය්ය වේණ්ටුම්. ආනාල්, ඉන්ත විටයත්තෛප් පොරුත්තමට්ටිල් අතු විට්ටුක්කොටුප්පු එන්රු නාන් සොල්ලවිල්ලෛ; අතු අන්ත මක්කළුටෙය උරිමෛයාකුම්. එනවේ, අන්ත උරිමෛයෛක් කටර්ටොළිල් අමෛච්සේ අවර්කළුක්කු වෘංක වේණ්ටුම් එන්රු කේට්ටු, විටෛපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළහට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.37]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දූපත් රාජ්‍යයක් හැටියට මුහුදෙන් වට වෙලා ඉන්න අපි නාවික නීති-රීති පිළිබඳව කථා කරන්නට තීරණය කිරීම ඉතාම හොඳයි. ලෝකයේ ඉතාම හොඳ ආර්ථික කේන්ද්‍රස්ථානයක් හැටියට තිබෙන අපේ රට අනාගත සැලසුම් එක්ක, ඉදිරියේදී ආනයන සහ අපනයන ක්‍රියාවලිය පුළුල් වීමත් එක්ක ඇති වෙන ක්‍රියාදාමයන් තුළ අපේ නීති-රීති වඩ වඩාත් සංකීර්ණ වෙන්නට ඕනෑ. ඒවා පිළිබඳ වැඩි වැඩියෙන් සාකච්ඡා වෙන්නට ඕනෑ; අඩු පාඩු හැදෙන්න ඕනෑ.

විශේෂයෙන් 1977 වසරේ ආනයන - අපනයන ක්‍රියාවලිය තුළ දැවැන්ත පිබිදීමක් ඇති වුණා. ඒ හරහා නව යුගයේ අපි යෝජනා කරන නව ආර්ථික උත්පාදන වැඩසටහන් තුළ ඇති වන නව පිබිදීමත් එක්ක මේ කටයුතු වැඩි වැඩියෙන් සිදු වෙන්න ඕනෑ. හැබැයි, මොන මොන කාරණා ගැන කථා කළත්, හම්බන්තොට වරාය ගැන කථා වුණා. අපේ රට දිහා බල බලා නැව් යනවා කියලා කිව්වා. ඒ නැව් ටික ගෙන්වා ගන්න වරාය හදනවා කියලා කිව්වා. නමුත්, අපට ලැබුණේ නැව් නැති වරායක්. මේ වරාය කාර්ය බහුල කර ගන්න, වරාය වැඩ පිළිවෙළක් සහිත වරායක් බවට පත් කරන්න කර්මාන්තපුර යෝජනා කරද්දී, මේ වරාය හදන්න ආරම්භ කරපු බාසුන්නැහැලාම, නිර්මාතෘවරුම මේ කර්මාන්ත වැඩසටහන වෙනුවෙනුත් විරෝධතා දැක්වුවා. අපි ඒ සියලු නාටක දිහා බලාගෙන හිටියා.

අද මාතෘකාවට සම්පූර්ණයෙන් පටහැනිව යමින් අපේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා සුපුරුදු කටයුත්ත පටන් ගත්තා. ව්‍යවස්ථා අර්බුදයක් ඇදලා අරගෙන, ඒකට ත්‍රෛනිකායික මහා සංඝරත්නය සම්බන්ධ කරගෙන, මාතෘකාවට කිසිසේත් අදාළ නොවන වෙනත් මාතෘකාවක් ඔස්සේ නැවත මේ පාර්ලිමේන්තුව කෝලම් මඩුවක් බවට පත් කරන්න සුදානම් වුණා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයාත් ඒ ජවනිකාවම රඟදැක්වුවා. මේ ජවනිකාව තමයි පාර්ලිමේන්තුව ඇතුළේ නටන්නේත්; පාර්ලිමේන්තුවෙන් එළියේ නටන්නේත්. මේ දෙදෙනාම රඟදක්වන්නේ එකම ජවනිකාව. කොහේද යන්නේ, මල්ලේ පොල් වගේ තමයි. මාතෘකාව ගැන නොවෙයි කථා කරන්නේ. නිරන්තරයෙන් ආගම, ජාතිය, කම්කරු ප්‍රජාව, ශිෂ්‍ය ප්‍රජාව ආදී අවුස්සන්නට පුළුවන් හැම කසළ ගොඩක්ම අවුස්සමින් අද මේ රජයට මඩ ගහන ව්‍යාපාරයක තමයි මේ අය නිරත වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ තිබුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සම්මන්ත්‍රණයට අපේ ත්‍රෛනිකායික මහා සංඝරත්නයට ආරාධනා කළේ නැහැ කියන චෝදනාව මාධ්‍ය ගණනාවක ප්‍රචාරය වෙනවා අපි දැක්කා. ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම් නීල් ඉද්දවෙල මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ පුවත්පත් නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. එහි "2017 ජූනි මස 28වැනි දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ...." යනුවෙන් එම නිවේදනයේ කරුණු සඳහන් කර තිබෙනවා. මට එය දිගින් දිගටම කියවන්න බැහැ. අතිපූජ්‍ය ත්‍රෛනිකායික මහා නායක හිමිවරුන්ට -සියම්, අමරපුර, රාමඤ්ඤ නිකායික හිමිවරුන්ට සහ අනෙකුත් ආගමික නායකයන්ට- නියමිත පරිදි අදාළ ආරාධනා පත්‍ර යොමු කරන ලද බව මෙම කමිටුව විසින් පැහැදිලි කර තිබෙනවා. මල්වතු පාර්ශ්වයේ මහා නායක අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල මහා නායක හිමියන්ගේ කාර්යාලය විසින් ඒ වන විට අදාළ දිනට යොදා ගත් විශේෂ රාජකාරියක් නොමැති බවත්, උන්වහන්සේට මෙම සම්මන්ත්‍රණයට සහභාගිවීමට හැකියාවක් පවතින බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට දැනුම් දී තිබෙනවා. අස්ගිරි පාර්ශ්වයේ මහා නායක අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඤාණරතන හිමියන්ගේ කාර්යාලයට දැන්වූ විට උන් වහන්සේට මේ සම්මන්ත්‍රණයට වැඩම කිරීමට හැකියාවක් නොමැති බව දැනුම් දී තිබෙනවා. රාමඤ්ඤ නිකායේ මහා නායක අතිපූජ්‍ය නාපාන පේමසිරි ස්වාමීන් වහන්සේට එදිනට මියැන්මාරයට වැඩම කිරීමට නියමිතව ඇති බව දන්වා තිබෙනවා. අමරපුර

නිකායේ මහා නායක අතිපූජ්‍ය කොටුගොඩ ධම්මාවාස නාහිමියන් විසින් 2017.06.28 වැනි දින සම්මන්ත්‍රණයේ කුමන හෝ වේලාවකදී වැඩම කිරීමට උත්සාහ දරන බව දැනුම් දී තිබෙනවා. මේ විධියට අපේ අතිපූජ්‍ය මහා නායක හිමිවරුන්ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලය විසින් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ රැස්වීමට සහභාගී වෙන්නට දැනුම් දීලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අතිපූජ්‍ය මහා සංඝරත්නයට හොරෙන්, ආගමික නායකයින්ට හොරෙන් කරන හොර මගඩියක් නොවෙයි මේ ව්‍යවස්ථා සම්පාදනය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයක් බවට පත්වෙලා, අනු කමිටු හයක් රැස්වෙලා කෙටුම්පත් කරන තවමත් ප්‍රකාශයට පත් නොකළ ලියවිල්ලක් පිළිබඳව ගෝනිබිල්ලෙක් මවාගෙන ජාතිය, ආගම, මහා සංඝරත්නය ඇතුළු සියලු දෙනාවම අවුස්සන්නට දරන උත්සාහයක ප්‍රතිඵලයක් තමයි මේ. මහින්ද රාජපක්ෂ මැතිතුමාට ආපහු ජනාධිපති පුටුවේ ඉඳගන්නට බැරි වෙයි, ඒ පවුලේ, පරම්පරාවේ අයට ජනාධිපති පුටුවේ ඉඳගන්නට බැරිවෙයි කියන අමුතු භූඔස් බියක් තමයි මේ තිබෙන්නේ. මම ඒ පිළිබඳවත් විශේෂයෙන් කියන්නට ඕනෑ. එතුමන්ලා මේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට භයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ නියෝග ගැන කථා කරන නිසා බේරුවල පැත්තේ හිතවතුන් මට දැනුම් දුන්නා, එතුමන්ලාගේ මේ ප්‍රශ්න ටිකත් ඉදිරිපත් කරන්න කියලා. බේරුවල පැත්තේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. බේරුවල ධීවර වරාය තුළ වැලි සහ රොන් මඩ ගොඩ ගැසී ඇති නිසා ධීවර කටයුතු කරන්නට අපහසුවෙලා තිබෙනවා. ඒවා ඉවත් කරලා දෙන්න කියලා දැනුම් දෙන ලෙසයි මට ඒ අය කිව්වේ. වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සභාවේ ඉන්නවා නම් හොඳයි. මට පේන්නේ නැහැ එතුමා ඉන්නවා කියලා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇමතිවරු කවුරුත් නැහැ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
වරාය, ඇළ සහ මධ්‍යම යාන්ත්‍රික වැඩපොළ පාලම් තුනකින් එක් කිරීම සුදුසු බවට ධීවර ජනතාවගෙන් ඉල්ලීමක් තිබෙනවා. ඒ වාගේම, මෙම ධීවර වරායෙන් ට්‍රෝලර් යාත්‍රා සහ බහුදින යාත්‍රා 800ත් 1,000ත් අතර ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු සිදු වෙන නිසා මේ කටයුත්ත සිදුවීම අත්‍යවශ්‍ය බවයි ඒ අය දැනුම් දෙන්නේ.

අපේ ගරු පී. හැරිසන් ඇමතිතුමාට මම මේ කාරණය කියන්නම ඕනෑ. [බාධා කිරීමක්] ගරු පී. හැරිසන් ඇමතිතුමා මේ පාර්ලිමේන්තු පරිශ්‍රයේ කොහේ හරි ඇති. මේක අපේ රට තුළ ලොකු සංවාදයක් ඇති විය යුතු කාරණයක්. මම හිතන විධියට මේ කාරණය ගැන ඊයේ පෙරේදා ලොකු උද්ඝෝෂණ රාශියක් සිද්ධ වුණා. මේ ප්‍රශ්නයටත් වරාය සම්බන්ධයි. "Battery Cage" කියන කුකුළන් හැදීමේ වහල් ක්‍රමය පිළිබඳවයි අද මම මේ පාර්ලිමේන්තුවේදී හෙළිදරවු කරන්නට යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැවෙන් ගෙනැල්ලා, harbour එකෙන් ගොඩබාලා තමයි අපේ රටට මේ Battery Cage system එක ආවේ. මේ කාරණය මාතෘකාවෙන් පිට කාරණයක් නොවන නිසා මේ ගැනත් කථා කරන්නට අවශ්‍යයි. බෞද්ධ රටක් විධියට අපි පසුගිය කාලයේ බිත්තරයක් කෑවා. බොහොම බෞද්ධ බිත්තරයක් තමයි අපි ඒ කෑවේ. ඒක බෞද්ධ බිත්තරයක්. බෞද්ධාගමට ළං වෙන්නට පුළුවන්, අමානුෂික භාවයෙන් අඩු බිත්තරයක් තමයි අපේ කුකුළු නිෂ්පාදකයින් නිර්මාණය කළේ. ඒ හැම කිකිළියකුටම වර්ග අඩි තුනක හතරක ඉඩක් තිබුණා තමන්ගේ කොටුව තුළ සැරිසරන්නට. ඔවුන් ජීවත් වෙන කාලය අවුරුදු දෙක නම්, තුන නම් ඒ කාලය තුළ නිදහසේ කාලා-බීලා, නිදහසේ ඇවිදලා, නිදහසේ ඉගිල්ලිලා, නිදහසේ බිත්තරයක් දාලා, නිදහසේ වතුර ටිකක් බීලා ජීවත් වෙන්න ඉඩ දෙන්න ඕනෑ. අපි තිරිසනුන් නොවෙයි. මානුෂීය වශයෙන් අපි යම් කිසි නිදහසක් දුන්නු කුකුළු ව්‍යාපාරයක් පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපේ රටේ ක්‍රියාත්මක වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙන කොට මහා පරිමාණයේ ව්‍යාපාරිකයන් 20දෙනෙක් පමණ - මහා පිරිසක් නොවෙයි. - "Battery Cage" නමින් හඳුන්වන අති අමානුෂික කුකුළු ව්‍යාපාරයක නිරත වෙලා ඉන්නවා. මම එදා කණ්ඩායම් රැස්වීමේදී අපේ අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත් මේක ඉදිරිපත් කරන්න සූදානම් වෙලායි ආවේ. නමුත් එදා කණ්ඩායම් රැස්වීම හදිසියේ කල් ගිය නිසා මට ඒක ඉදිරිපත් කරන්න බැරුව ගියා. මම මේ පිළිබඳව පාර්ලිමේන්තුවේදී අහන්න ප්‍රශ්නයක් යොමු කරලා තිබෙනවා. ඒ ප්‍රශ්නය එන කොටත් තව මාස තුනක්, හතරක් යනවා. හැබැයි මේ කාරණය මතක තියා ගන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ වෙන කොට අපේ ලංකාවේ මේ Battery Cage ක්‍රමය තුළ අහල් හයක් වාගේ කූඩුවක හිර කරපු කුකුළන් -හිරකාර කුකුළන්- ලක්ෂ 10ක්, 15ක් වාගේ ප්‍රමාණයක් ඉන්නවා. ඒ කූඩුවේ ඉඩ තිබෙන්නේ එක සතෙකුට අහල් හයයි. අහල් හයක් වුණු කූඩුව ඇතුළට මේ බිත්තර දාන කිකිළියන් දැම්මාට පස්සේ බිත්තර දාලා ඉවර වෙලා අවුරුදු දෙකකින් පස්සේ තමයි ඒ සතුන් කූඩුවෙන් එළියට එන්නේ. එතකොට ඒ සතාගේ අඩු ටික වකුටු වෙලා, ඒවා කොර වෙලා ඉරවයි. ඒවා ගල් වෙලා ඉවරයි. පියාපත් හකුළන්නට හෝ කෙළින් කරන්න බැහැ. ඒවා ගල් වෙලා ඉවරයි. කෑම ටික එන්නේ belt එකෙන්. බිත්තරය වැටෙන්නේ belt එකට. කෑම වියදම අඩුයි කියනවා. ශ්‍රම වියදම අඩුයි කියනවා. නමුත් "මුදල්-මුදල්-මුදල්-මුදල්" කියන කාරණයත් එක්ක මිලේච්ඡත්වයේ යන්නට පුළුවන් ඉහළම තැනටම මේ Battery Cage ක්‍රමය හරහා මේ අලුත් ව්‍යාපාරිකයන් පිරිස ඇවිල්ලා තිබෙනවා.

ඇමෙරිකාව ඇතුළු බොහෝ රටවල් ඒ ක්‍රමයේ තිබෙන අමානුෂිකභාවය නිසා අද විශාල වශයෙන් ඒ ක්‍රමය තහනම් කරලා තිබෙනවා. ඉන්දියාව පවා තහනම් කරලා තිබෙනවා. මානව හිමිකම් සංවිධාන, සත්ව අවිහිංසා සංවිධාන, සියලු අය මේවාට මැදිහත් වෙලා මේ ක්‍රමය තහනම් කරලා තිබෙනවා. මට අවශ්‍ය වෙලා තිබුණා, අපේ ජනාධිපතිතුමාගේත්, අග්‍රාමාත්‍යතුමාගේත් අවධානය මේ සඳහා යොමු කරවන්න. මේ සම්බන්ධයෙන් හැරිසන් ඇමතිතුමාගේ නම් ඇස් ඇරියා. එතුමාට තවම මේක තේරෙන්නේ නැද්ද කියලා කියන්න මම දන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මට මේ පිළිබඳව විශාල වේදනාවක් තිබෙනවා. හැරිසන් ඇමතිතුමා මම දැක්කා, සභා ගර්භයට එනවා. ඒක නිසායි මම මේ කාරණය කියන්නේ. හැරිසන් ඇමතිතුමාට විශේෂයෙන් වග කීමක් තිබෙනවා. මේ ආණ්ඩුව වග කිව යුතු නැහැ. ආණ්ඩුව දැන් තමයි මේ ගැන දැනුවත් වෙන්නේ. මහා පරිමාණ කුකුළු ව්‍යාපාරිකයන් 20ක් වාගේ ප්‍රමාණයක් තමයි මේ කටයුත්තේ නිරත වෙන්නේ. තවම මේ සම්බන්ධයෙන් නීතියක්-රීතියක් පිළිබඳව අපේ රජයේ කිසිම කෙනෙක් දැනුවත් නැහැ. මෙහෙම දෙයක් අපේ රට තුළ පැන නැඟී තිබෙනවා. මේ පිළිබඳව සියලුදෙනාගේ අවධානය යොමු කිරීම අවශ්‍යයි. අද ලංකාව පුරා සාමාන්‍යයෙන් කුඩා පරිමාණ, මධ්‍ය පරිමාණ කුකුළු ගොවීන් භයදාහක, හත්දාහක ප්‍රමාණයක් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන්ම මා නියෝජනය කරන පඬුවස්නුවර ආසනය මෙන්ම නිකවැරටිය ආසනය, බිංගිරිය ආසනය, කුලියාපිටිය ආසනය මේ රටේ බිත්තර සපයන විශාල කේන්ද්‍රස්ථාන බවට පත් වෙලා තිබෙනවා. ඒ සුළු

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

පරිමාණ කුකුළු ගොවීන් භයදාහට අමතරව මේ කර්මාන්තය නිසා රට තුළ බිත්තර ප්‍රවාහනය කරන්නන්, කුඩා වෙළෙන්දන්, තොග වෙළෙන්දන්, සිල්ලර වෙළෙන්දන්, ඒ එක්කම ඒ හරහා බිහි වෙන රැකියා මේ සියල්ල ලක්ෂ එකහමාරක, දෙකක ආර්ථිකයක් නියෝජනය කරනවා. මහා පරිමාණ ව්‍යාපාරිකයන් අමානුෂික විධියට මෙවැනි දේවල්වලට අත ගහපුවාම බෞද්ධකමට සරිලන විධියට මානුෂික වශයෙන් අපි ගත්ත ඒ බෞද්ධ බිත්තරය යක්ෂයාගේ බිත්තරයක් බවට අද පත් වෙලා තිබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මොකක්ද බෞද්ධ බිත්තරය කියලා කියන්නේ?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒකේ ප්‍රජනනයක් නැහැ. ඒ බිත්තරයෙන් පැටියෙක් බිහි වෙන්නේ නැහැ. සංසේචනයක් නැහැ. අපේ රටට අවශ්‍ය වන ප්‍රෝටීන් ප්‍රමාණය ඒකේ තිබෙනවා. අපේ බෞද්ධකමට ගැළපෙන, යම් කිසි ආකාරයකට හරි සාරධර්ම ආරක්ෂා වෙන විධියට තිබෙන නිසා තමයි මම ඒ වචනය භාවිත කළේ.

මේ කරන්න හදන දෙයින් සම්පූර්ණයෙන්ම යක්ෂයාගේ බිත්තරයක් තමයි එන්නේ. මම හිතන විධියට මේ කටයුත්ත සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ සිටින අපේ නියෝජිතයින්ටත්, -මැති-ඇමතිවරුන්ටත්- විශේෂයෙන්ම ජනමාධ්‍යයටත් විශාල වගකීමක් තිබෙනවා. මේ කටයුත්ත කෙරෙහි සම්පූර්ණයෙන්ම ඇස් ඇරෙන්නටම අවශ්‍යයි. හැරිසන් ඇමතිතුමා මේ සභා ගර්භයේ නැහැ. නමුත් එතුමා මේ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ කොහේ හරි ඉන්නවා නම් ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට මම එතුමාට මේ කාරණය කියනවා. කැබිනට් අනුමැතියක් ඇතුව ඒ ගෙනා Battery Cagesවලින් එම කර්මාන්තය ආරම්භ කරපු අයට අවුරුදු පහක් කල් දුන්නාලු, ඒ තිබෙන ටික කරගෙන යන්න. අවුරුදු පහක කාල සීමාවට මම විරුද්ධ වෙනවා. මම නොවෙයි, මේ කථාව අහන සියලුම දෙනා ඒකට විරුද්ධ වෙයි කියලා මම හිතනවා. තමුන්නාන්සේලා හිර කරගෙන හිටියොත්, තමුන්නාන්සේලාට අත-පය වකුටු කරගෙන අවුරුදු දෙකක් ඉන්න පුළුවන්ද? මට එය මැවිලා පෙනෙනවා. අත-පය වකුටු කරගෙන අවුරුදු දෙකක් ඉන්න පුළුවන්ද? ඒ නිසා කරුණාකරලා ඒවාට දමපු සතුන් ටික පිළිබඳව කුමන හෝ තීරණයක් අරගෙන ඉතාම ඉක්මනින් අවිහිංසාවාදය ක්‍රියාත්මක කිරීම වෙනුවෙනුත්, අපේ රටේ දේශීයව කුඩා පරිමාණයෙන් කුකුළු ව්‍යාපාරයේ යෙදෙන නිෂ්පාදකයින් වෙනුවෙනුත්, ඒ හරහා රැකියාගත වෙලා ඉන්න අයගේ රැකියා ටික ආරක්ෂා කර ගැනීම වෙනුවෙනුත්, බෞද්ධ රටක් හැටියට අපේ රටේ තිබෙන සදාචාරය වෙනුවෙනුත් මේ සම්බන්ධව වගකීමකින් යුතුව කටයුතු කරන්න කියලා මම කියනවා. ඒ වාගේම නැවත වරායවලින් මෙවැනි Battery Cages ගෙනෙන්න දෙන්න එපා කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි.

මීළඟට, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වේලාවක් ලබා දී තිබෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දහතුනක කාලයක් ලබා දී තිබෙනවා.

[අ.භා. 3.52]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉදිරිපත් කර තිබෙන වෙළඳ නැව් පනත යටතේ නියෝග පිළිබඳවත්, ඒ වාගේම ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම යටතේ විශේෂයෙන්ම ධීවර කර්මාන්තයට බලපාන පසු ගිය කාලයේ දිගින් දිගටම කථා කරපු තහනම් දැල් ආම්පන්න භාවිත කිරීමෙන් සිදු වුණු විනාශය පිළිබඳව ඉදිරිපත් කර තිබෙන යෝජනා සම්බන්ධවත් පළමුවෙන්ම මගේ ස්තුතිය පළ කරනවා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි ධීවර අමාත්‍යාංශයට අදාළ මෙම විෂය ගැන කථා කරද්දී, ධීවර අමාත්‍යාංශය භාර අමාත්‍යතුමාත්, රාජ්‍ය අමාත්‍යතුමාත් කියන දෙදෙනාගෙන් එක්කෙනෙක් හෝ මේ වේලාවේ මේ සභා ගර්භයේ රැඳී නොසිටීම ගැන ඇත්තටම අප කනගාටු වෙනවා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් තුන් දෙනායි, මේ මුළු සභා ගර්භයටම ඉන්නේ. ඒ නිසා මේ පනත් කෙටුම්පත් ඉදිරිපත් කළාට වැඩක් වෙන්නේ නැහැ, මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි. විපක්ෂය වෙන්න පුළුවන්, ආණ්ඩු පක්ෂය වෙන්න පුළුවන් මේ වේලාවේ කරන කථාබහට ඇමතිතුමා ඇහුම්කන් දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමා මේ අවස්ථාවේ සභා ගර්භයට පැමිණෙනවා. ඇමතිතුමා නැතුව අපි මේ කතාව කරගෙන ගියා නම් මේකේ ප්‍රතිඵලයක් නැති වෙනවා කියලා මම හිතනවා.

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දවසේ සංශෝධන සිදු කර තහනම් කරන දැල්, විශේෂයෙන්ම bottom trawling කියන තහනම් පන්න ක්‍රමය අපේ ලංකාවේ ධීවරයින්ට වැඩිය භාවිත වෙන්නේ ඉන්දියානු ධීවරයන් අතරයි. පසු ගිය කාලයේ අපට තිබුණු විශාලම ගැටලුව තමයි ඉන්දියාවෙන් සිදු වුණු ආක්‍රමණ. අද දවසේත් එම ආක්‍රමණ ඒ ආකාරයෙන්ම සිද්ධ වෙනවා. අද ඉදිරිපත් කර තිබෙන තහනම් කිරීමේ යෝජනා, දඩ ගැසීම, සිර දඬුවම් කියන යෝජනා වාගේම විශේෂයෙන්ම මේ පන්න ක්‍රමය අද ජාත්‍යන්තර වශයෙනුත් තහනම් පන්න ක්‍රමයක් බවට පත් කරලා තිබෙනවා. ධීවර යාත්‍රා නාවික හමුදාවෙන් අත් අඩංගුවට ගන්නවා නම්, එසේ අත් අඩංගුවට ගැනීමේදී- ගරු ඇමතිතුමනි, ඔබතුමා අද උදේ කිව්වා, "යාත්‍රා 200කට ආසන්න සංඛ්‍යාවක් අත් අඩංගුවේ තිබෙනවා." කියලා. එය මම අහගෙන තමයි සිටියේ. නමුත් ඔබතුමාගෙන් මම මීට මාස තුනකට පමණ ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නයකට ඔබතුමාගෙන් පිළිතුර විධියට ලැබුණේ, අත් අඩංගුවේ තිබෙන්නේ යාත්‍රා 26යි කියලායි. ඔබතුමා ලබා දුන් එම උත්තරය මා ළඟ තිබෙනවා. මම ඔබතුමාගෙන් පෙබරවාරි මාසයේ අහපු ප්‍රශ්නයකට දීපු උත්තරය එයයි. යාත්‍රා 26යි කියලායි උත්තරය විධියට දීලා තිබුණේ. ඒ නිසා මේ මාස කිහිපය ඇතුළේ -

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
යාත්‍රා 26යි කියලා උත්තරයක් නැහැ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා එදා දීපු උත්තරයේ සඳහන් වී තිබෙන්නේ යාත්‍රා 26යි කියලායි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සභාගත කරපු උත්තරයේ තිබෙන්නේ එහෙමයි.

2017 පෙබරවාරි 21 දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 1282-1286 දක්වා කොටස මා **සභාගත*** කරනවා. අද වනකොට යාත්‍රා 200කට ආසන්න සංඛ්‍යාවක් තිබෙනවා නම් පසු ගිය මාස 6ක කාලය තුළ-

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, යාත්‍රා 150කට ආසන්න සංඛ්‍යාවක් තමයි තිබුණේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මේ තිබෙන තොරතුරුවලට අනුව යාත්‍රා 125කට ආසන්න සංඛ්‍යාවක් අද වන විට අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ අවස්ථාවේ මා යෝජනාවක් හැටියට ඉල්ලීමක් කරන්න කැමැතියි. එනම්, දීර්ඝ කාලයක් මේ තහනම් පන්න ක්‍රමය භාවිත කර අත්අඩංගුවට පත් වන ධීවර යාත්‍රා නැවත ඒ අයට ලබා දුන්නොත් නැවත වරක් ඒවා ලංකාවේ මුහුදට ඇතුළු වෙන්න තිබෙන අවස්ථාව වැඩියි. එහෙම ඇතුළු වන විදේශ ධීවරයින් නිදහස් කිරීම පිළිබඳව අපට ගැටලුවක් නැහැ. මොකද, මේ සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික ගිවිසුම් ඇති වෙනවා. සමහර වෙලාවට ලංකාවේ ඉඳලා ඉන්දියාවට යන ධීවරයන් එහෙන් නිදහස් කරලා එවනවා. නමුත්, අපි මේ ධීවර යාත්‍රා නිදහස් කරන්න ගියොත් අපට දිගින් දිගටම මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදු වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, "මෙවා රඳවා තබා ගන්න අපට ඉඩ පහසුකම් අඩුයි." කියලා. ඒ සියලු කරුණු කාරණා තිබුණත්, ඒ විධියට තහනම් දැල් ක්‍රමයක් භාවිත කරමින් ධීවර කර්මාන්තයේ යෙදෙන කිසියම් හෝ පිරිසක් ඉන්නවා නම් ඒ අය ඒ සඳහා යොදා ගන්නා සියලු උපකරණ රාජ සන්තක කර තබා ගන්නය කියන යෝජනාවත් මේ සඳහා ඇතුළත් කරන්නය කියන ඉල්ලීම කරනවා.

ගරු ඇමතිතුමනි, මා මේ වෙලාවේ තවත් විශේෂ කරුණු කිහිපයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. අද දවසේ අපි මේ නීති පැනවූවාට මේ නීතිවලින් බොහෝ වෙලාවට බැට කන්නේ ශ්‍රී ලාංකික ධීවර ජනතාවයි. අපි නීති දමන්නේ ඉන්දියාවට වෙන්න පුළුවන්. ඒ එන ආක්‍රමණ වැළැක්වීම සඳහා වෙන්න පුළුවන්. නමුත්, මේ ඇතුළත් වෙලා තිබෙන සියලු නීතිවලින් බොහෝ දුරට බැට කන්නේ ශ්‍රී ලංකා ධීවර ජනතාව පමණයි. පසු ගිය කාලයේ VMS යන්ත්‍රය ලබා දුන්නා. VMS යන්ත්‍රය ලබා දෙන්න අපේ රජය පැවැති කාලයේත් විශාල මුදලක් වෙන් කරලා ඒ වැඩ පිළිවෙළ ආරම්භ කළා. නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කියන්න කනගාටුයි, තවමත් යාත්‍රාවලින් සුළු ප්‍රමාණයකට පමණයි මේ VMS යන්ත්‍රය සවි කර තිබෙන්නේ. VMS යන්ත්‍රය සවි කර තිබෙන යාත්‍රා සංඛ්‍යාව සුළු ප්‍රමාණයක් වුණාට අද මේ සියලු යාත්‍රාවලින් විශාල වශයෙන් බදු මුදල්, අනෙකුත් ගාස්තු අය කරනවා. VMS යන්ත්‍රයට වෙන්න පුළුවන්, මාසික වශයෙන් අය කරන ගාස්තු වෙන්න පුළුවන්, එහෙම නැත්නම් TRC එකට අය කරන ගාස්තු වෙන්න පුළුවන්, අවුරුදු 05කට වතාවක් radio licence එකට අය කරන ගාස්තු වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් මුහුදු සීමාව සම්බන්ධයෙන් පනවා තිබෙන නීතිය උල්ලංඝනය වුණු සැණින් අය කරන දඩය වෙන්න පුළුවන්, මේ සියලු දේ ක්‍රියාත්මක වන්නේ අර නීත්‍යානුකූල රාමුවට ඇතුළත් වෙලා තිබෙන යාත්‍රාවලට පමණයි. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒ VMS යන්ත්‍රය සවි කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙනවා නම් සියලු යාත්‍රාවලට මේවා සවි කළ යුතුයි කියලා. නැත්නම් අනෙක් ඒවායේ මේවා සවි කර තිබෙන එකත් තේරුමක් නැහැ, ගරු ඇමතිතුමනි. මොකද, කණ්ඩායමක් පමණක් බදු මුදලත් ගෙවනවා, දඩ මුදලත් ගෙවනවා, මේ සියලු පීඩාවන්වලට ලක් වෙනවා. මෙවැනි ගැටලු රාශියක් තිබෙනවා. අද වන විට සෑම ධීවර වරායකින්ම එළියට යන ධීවර යාත්‍රාවලට විශාල වශයෙන් පීඩනයක් තිබෙනවා මේ තිබෙන නීති රීති එක්ක.

සමහර වෙලාවට නාවික හමුදාව ඉන්න තැනක් තිබෙනවා නම් නාවික හමුදාවේ අවසරය ගන්න ඕනෑ. සමහර වෙලාවට ධීවර කාර්යාලයට ගිහිල්ලා අවසරය ගන්න ඕනෑ. තවත් සමහර වෙලාවට ධීවර යාත්‍රාව පිටත් වෙන්න නියමිතව තිබෙන්නේ ඊළඟ දවසේ උදේ නම් කලින් දවසේ සවස 5.00ට ගිහිල්ලා ධීවර කාර්යාලයෙන් ඒ සඳහා අනුමැතිය ගන්න ඕනෑ. මේ සම්බන්ධ ලිපිලේඛන විශාල ප්‍රමාණයක් අද පුරවන්න තිබෙනවා. උදාහරණයක් ගත්තොත් ගන්දර ධීවර වරායේ අයිස් ලබා ගැනීමට පහසුකම් නැහැ. අයිස් ලබා ගන්න යන්න තිබෙන්නේ පුරාණ වැල්ල ධීවර වරායටයි. නැත්නම් නිල්වැල්ල ධීවර වරායටයි. ධීවර වරායෙන් නික්මෙන ඒ යාත්‍රාවලට ලිඛිත අවසරයක් ගන්න ඕනෑ. ගන්දර ධීවර වරායේ ඉඳලා පුරාණ වැල්ල ධීවර වරායට යන්නත් ලිඛිත අවසරයක් ගන්න ඕනෑ. නැවත ඒමේදීත් අවසර ගන්න ඕනෑ. නැවත පිටත් වීමේදීත් අවසර ගන්න ඕනෑ. මේ නීති - රීති යම් කිසි ආකාරයකින් තිබෙන්න ඕනෑ කියා අප පිළිගන්නවා. නමුත්, මේවා යම් ආකාරයකින් ලිහිල් කරන්න ඕනෑ. විශේෂයෙන්ම නාවික හමුදාව ඉන්න තැනකදී නාවික හමුදාව සහ ධීවර කාර්යාලය කියන මේ දෙකෙන්ම අවසර ගන්න අවශ්‍ය නැහැ. එක තැනකින් මේ කටයුත්ත සිද්ධ වෙනවා නම් මේ කටයුතු කර ගැනීම ධීවරයාට බොහෝ දුරට පහසු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට අපි ලංකාව වටේම මුහුදු තියාගෙන මත්ස්‍ය සම්පත ආනයනය කරන රටක් බවට පත් වෙලා තිබෙනවා. අපි ඇත්තටම ඒ ගැන කනගාටු වෙන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් සංඛ්‍යා දත්ත ඇතුළත් ලේඛනයක් මා ළඟ තිබෙනවා. මා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කංචන විජේසේකර මහතා]

මේ වාර්තාවට අනුව, 2014 වර්ෂයේ ලංකාවට ආනයනය කර තිබෙන මත්ස්‍ය ප්‍රමාණය මෙට්‍රික්ටොන් හැත්තෑඅටදහස් හත්සියදොළහක්. නමුත්, 2015 අවුරුද්ද වන විට එය මෙට්‍රික්ටොන් එක්ලක්ෂවිසිදහස දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ආනයනය කරන මත්ස්‍ය ප්‍රමාණය මෙට්‍රික්ටොන් පණස්දහසකින් වැඩි වෙලා තිබෙනවා. ඊළඟට, 2016 අවුරුද්දේ ආනයනය කර තිබෙන මත්ස්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් එක්ලක්ෂ පහළොස්දහසයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ වන විට රුපියල් 25කින් ආනයන බද්ද අඩු කර තිබෙනවා. ඒ අඩු කිරීම තුළ මේක තවත් වර්ධනය වෙලා තිබෙනවා. ලංකාවේ මත්ස්‍ය සම්පතේ production එකේ අඩුවක් වෙලා නැහැ, ගරු ඇමතිතුමනි.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, ටින් මාළු - canned fish - තමයි වැඩිම ප්‍රමාණයක් ආනයනය කරලා තිබෙන්නේ. ඒකට හේතුව තමයි, මේ රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා, රුපියල් 125ට, 130ට මාළු දෙන්න. ඒ වාගේම, ලංකාවේ කර්මාන්තශාලා 4ක නිෂ්පාදන සඳහාත් මාළු ගෙන්වන්න කටයුතු කර තිබෙනවා. එම සහනයත් එක්ක තමයි මාළු ආනයනය වැඩි වෙලා තිබෙන්නේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු ඇමතිතුමනි, රට වටේටම මුහුද තියාගෙනත් අපි මේ රටේ ජනතාවට සැමන් කවන්න නම් හදන්නේ ඒකේ ගැටලුවක් තිබෙනවා. ඒක ධීවර අමාත්‍යාංශයේ වැඩක් නොවෙයි. ඔබතුමා කියනවා, ටින් මාළු කර්මාන්තය නිසා තමයි මෙහෙම වෙලා තිබෙන්නේ කියලා. ඒ සඳහා බදු අඩු කරලා දෙනවා නම් එයින් මාළු ආනයනයේ අඩුවීමක් වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමා. මේ ටින් මාළු කර්මාන්තය වෙනුවෙන් රුපියල්,- [බාධා කිරීමක්]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

මම අමාත්‍යාංශය බාර ගන්න කොට මේ බද්ද තිබුණේ මාළු කිලෝග්‍රෑම් එකකට රුපියල් 25ක් ලෙසටයි. ඒක මම රුපියල් 75 දක්වා වැඩි කළා. මේ දවස්වල මාළු මිල වැඩියි කියන නිසා තමයි සීමිත කාලයකට තෝරා ගත්ත මාළු වර්ග කිහිපයකට මේ බද්ද අඩු කරලා තිබෙන්නේ. ඉදිරියේදී මාළු අස්වැන්න වැඩි වෙන කොට නැවතත් එම ආනයනික බද්ද වැඩි කරනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියනවා, සීමිත වර්ග කීපයකටයි එම බද්ද අඩු වෙලා තිබෙන්නේ කියලා. නමුත්, අද පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ පොළට හෝ වෙනත් ඕනෑම මත්ස්‍ය වෙළෙඳ පොළකට හෝ ගිහින් බැලුවොත් අපට දැකගන්න පුළුවන්, ආනයනය කරපු මාළු විකුණන හැටි. මේක තමයි අද යථාර්ථය. ගරු ඇමතිතුමනි, මේ කියන කාරණය පිළිබඳව ඔබතුමා පුළුල් අධ්‍යයනයක් කර තිබෙනවා කියා මා හිතනවා. ධීවර සංස්ථාවේ අලෙවි ස්ථාන සඳහා පසු ගිය කාලයේ මුදල් වෙන් කළේ වෙන මොනවත් නිසා නොවෙයි, මත්ස්‍ය සම්පතේ අතිරික්තයක් තිබෙන කාලයේදී ධීවර සංස්ථාව ඒවා මිලදී ගෙන අද වාගේ කාලවලදී, කාලගුණයේ වෙනස්වීම් එක්ක මත්ස්‍ය සම්පත නෙළා ගන්න බැරි කාලවලදී, -වාරකන් කාලවලදී,- ඒ කාර්ය භාරය කිරීමට තමයි ධීවර සංස්ථාවේ අලෙවි සැල් එදා ක්‍රියාත්මක වුණේ.

ගරු ඇමතිතුමනි, පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳ පොළේ ධීවර සංස්ථාවට තිබුණු කඩ දෙකත් අද ධීවර සංස්ථාවට අහිමි වෙලා තිබෙනවා. ඒ ගැන අපි කනගාටු වෙනවා. ධීවර සංස්ථාවට අයත් ලංකාව පුරා තිබෙන මත්ස්‍ය වෙළෙඳ සැල්වලින් අද වන විට වෙළෙඳ සැල් කීයක් ක්‍රියාත්මක වෙනවා ද කියලා කියන්න මම දන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, මා වැරැදියි නම් ඔබතුමා මා නිවැරැදි කරන්න. මම විශ්වාස කරන විධියට ධීවර සංස්ථාවේ කාර්ය භාරය වන්නේ, මත්ස්‍ය අතිරික්තයක් තිබෙන කාලයේදී ධීවරයා ළඟට ගිහින් ඒ මාළු මිලදී ගෙන ගබඩා කරලා, මාළු අඩු කාලයේදී මේ අලෙවි සැල් හරහා පාරිභෝගිකයන්ට සහනදායී මිලකට ලබාදීමයි. මොකද, ධීවර සංස්ථාවේ මාළු ගබඩා කරගන්න අවශ්‍ය පහසුකම් තිබෙනවා. ආනයනය සඳහා බද්ද අඩු කළාම අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ලංකාවේ ධීවරයෝ මත්ස්‍ය සම්පත නෙළා ගෙන එනවා. නමුත්, ඔවුන්ට ඒ මාළුවලින් මිලක් ලබා ගන්න බැහැ. අද බලයා කිලෝග්‍රෑම් එකක් රුපියල් 120යි; රුපියල් 130යි; රුපියල් 140යි. බලයා කිලෝග්‍රෑම් එකක් මේ මිලට විකුණලා ධීවර කර්මාන්තයේ ඉන්න පිරිසට තමන්ගේ ජීවිතය ඉදිරියට ගෙන යන්න බැහැ. ඔවුන් අද ඉන්ධන වෙනුවෙන් වෙන් කරන මුදල, VMS එක වෙනුවෙන් වෙන් කරන මුදල, ගෙවන බදු ආදී මේ සියලු දේ ගැන කල්පනා කළාම අද දවසේ ඔවුන්ට ජීවිතය ගත කරන්න මුදලක් සොයා ගන්න බැරි වෙනවා. අද දවස වන විට ධීවර යාත්‍රා විශාල සංඛ්‍යාවක් හිමියන් ඔවුන්ගේ ණය ගෙවා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

පසු ගිය කාලයේ ධීවර ණය ලබා දුන්නා. ඒ වෙලාවේදී රාජිත සේනාරත්න ඇමතිතුමා කිව්වා, "ධීවර ණය ලබා ගැනීමේදී කිසිම ආකාරයකට ඇපයක් ලෙස බෝට්ටුවක් තියා ගන්නේ නැහැ; මුදල් ලබා දෙන්නේ කිසිම දෙයක් ඇපයක් ලෙස තියාගන්නේ නැතිවයි" කියලා. නමුත්, අද බැංකුවලින් ඇවිල්ලා කියනවා, "අපට ඇපයක් විධියට බෝට්ටුව හැර වෙන යම්කිසි දෙයක් දෙන්න" කියලා. සමහර බැංකුවලින් ඇවිත් බලාගෙන ඉන්නවා, බෝට්ටුව ගොඩට ඇවිත් මාළු ටික විකුණලා කීයක් ගන්නවා ද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

අද දවසේ මෙවැනි ආකාරයේ විශාල ගැටලුවලට ධීවර ජනතාව මුහුණ දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ආනයනික බද්ද රුපියල් 25කින් අඩු කරන්න තීන්දුවක් ගත්තේ කොහොමද කියලා කියන්න මම දන්නේ නැහැ. ඒ බද්ද අඩු කිරීම තුළ විශාල වශයෙන් ආනයනික මත්ස්‍ය ප්‍රමාණයක් අද ලංකාව ඇතුළට එනවා. එම නිසා ලංකාවේ ඉන්න ධීවර කාර්මිකයන්ගේ ආර්ථිකය අද අඩපණ වෙලා තිබෙනවා. කිහිප දෙනෙක් පමණක් මේකෙන් යම්කිසි ලාභයක් ලබනවා. මට ආරංචි විධියට රුපියල් 25කින් බද්ද අඩු කළාම රුපියල් 15ක වාගේ මුදලක් විවිධ පුද්ගලයන් අතර බෙදිලා යනවා. ඒ නිසා ධීවර ඇමතිවරයා හැටියට ඔබතුමාට වගකීමක් තිබෙනවා, එහෙම යම්කිසි කාර්ය භාරයක් වෙනවා නම් ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා කටයුතු කරන්න.

විශේෂයෙන්ම ධීවර අමාත්‍යාංශයේ කාර්ය භාරය වන්නේ ධීවර කාර්මිකයා සහ ධීවර පවුල් ආරක්ෂා කරගෙන ලංකාවේ ධීවර කර්මාන්තය ආරක්ෂා කර ගැනීමයි. පාරිභෝගිකයන්ට

යම්කිසි ආකාරයකට සහන සලසන වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඒ කටයුත්ත කරන්න තිබෙන්නේ පාරිභෝගික කටයුතු ඇමතිතුමාටයි. මට මතකයි, සහනදායී ආකාරයට මාළු ලබා දෙන්න පසු ගිය අය වැයෙන් යම්කිසි මුදලක් සතොස ආයතනයට වෙන් කරනවා කිව්වා. නමුත් ඒක ක්‍රියාත්මක වුණේ නැහැ. පසු ගිය අය වැයේදී වෙන් කරපු මුදල්වලින් සියයට 20කටත් අඩු ප්‍රමාණයක් තමයි ධීවර අමාත්‍යාංශයෙන් මේ වෙන කොට වියදම් කර තිබෙන්නේ. ඒ බව මේ කාර්ය සාධනයෙන් පෙන්නුම් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න. මම අවසන් කරන්නම්.

ගරු ඇමතිතුමනි, මේ ධීවර කර්මාන්තයේ තිබෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කරන්න ඔබතුමාට තිබෙන හොඳම ස්ථානය, ධීවරයන්ට කථා කරන්න තිබෙන හොඳම ස්ථානය තමයි සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය. ධීවර වරායන්වල සිටින ගම්වල සාමාජිකයන්ගෙන් තමයි සමස්ත ලංකා ධීවර සම්මේලනය ගොඩනැඟෙන්නේ. නිල බලයෙන් ඔබතුමා එහි සභාපතිවරයා බවට පත් වෙනවා. නමුත් මම දන්නේ නැහැ, ඔබතුමා පත් වුණාට පස්සේ මේ වනතුරු නිලවරණයක් පවත්වා අවශ්‍ය සාමාජිකයන් සංඛ්‍යාව පත් කර ගත්තාද කියලා. මම ඒ පිළිබඳ ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. මා දන්නා විධියට තවමත් හිටපු අමාත්‍යවරයා තමයි මේක දුවවන්නේ; ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ හොල්මනක් වගේ තවමත් ඉන්නේ හිටපු ඇමතිවරයායි.

ඔබතුමා කියනවා, යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කරගෙන අපි ජයග්‍රහණයක් ලබා ගත්තා කියලා. නමුත් Yellow Card එක ලැබුණේ 2012 වර්ෂයේ. 2012 සිට 2014 වෙන තුරු අවුරුදු දෙකක කාලයක් තිබුණා, අපට ඒ කටයුතු නිවැරදි කර ගන්න. අපේ ආණ්ඩුවේ පරාජයට හේතුවක් වුණේ හිටපු ඇමතිවරයාගේ ඒ ක්‍රියාකලාපයයි. යුරෝපා මත්ස්‍ය තහනම ඇති වුණේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ වැරැද්දක් නිසා නොවෙයි. Yellow Card එක දුන්නාට පසුව අවුරුදු දෙකක කාලයක් තිබුණා, ඒක Green Card එකක් කර ගන්න. ඒ කටයුත්ත වෙනුවෙන් මුදල් වෙන් කළා. ඒ කාරණය අපි හොඳටම දන්නවා. මුදල් වෙන් කළා; VMS යන්ත්‍රවලට මුදල් දුන්නා. නමුත් හිටපු ඇමතිතුමා ඒ වෙනුවෙන් කිසිම ආකාරයක කටයුත්තක් කළේ නැහැ. එතුමා අද දවසෙත් වෛද්‍යවරුන් සමඟ සටනේ යෙදෙමින් ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් ඒ තැනට ගෙනියනවා. එක දවසෙන් යුරෝපා මත්ස්‍ය තහනම ඉවත් කර ගැනීම ජයග්‍රහණයක් වෙන්න පුළුවන්. නමුත් ඒ කාලයේ ඒකට හේතු වුණු පිරිස දැන් ඉන්නේ ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් එක්කයි. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේ වෙනුවෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

විශේෂයෙන්ම සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ අද දවසේ ඉන්නේ හිටපු ඇමතිතුමාගේ පුතා. එතුමාගේ ඡන්ද ටික හදා ගන්න, ගම්පහ දිස්ත්‍රික්ක ජයග්‍රහණය කරන්න තමයි සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය හදලා දුන්නේ. එතුමා සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනයේ සභාපති බවට නිතරගයෙන් පත් කළා. එහෙම පත් කරලා, සුගතදාස ක්‍රීඩාංගණයේ රැළි පවත්වන්න තමයි මේ ධීවර ජනතාව පාවිච්චි කළේ. අද ධීවර ජනතාව මේ පිළිබඳ දැනුවත් වෙලා ඉන්නවා.

පසු ගිය කාලයේ මම දැක්කා, ඔබතුමාට තව විශේෂ කාර්ය භාරයක් බාරදීලා තිබුණා. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ ඉතාම වැදගත් අමාත්‍යාංශයක්; මේ රටේ ජනතාව වෙනුවෙන් තිබෙන විශේෂ අමාත්‍යාංශයක්; මේ රටේ ආර්ථිකය හදන්න තිබෙන විශේෂ අමාත්‍යාංශයක්. ඒ නිසා ඔබතුමා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම මේ තහනම් දැල් ආම්පන්න වාගේ තවත් විශාල වශයෙන් ක්‍රියාත්මක වන තහනම් දැල් ක්‍රම ඕනෑ තරම් තිබෙනවා. ඒ වෙනුවෙනුත් නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ ප්‍රශ්නයක් පැන නැඟුනොත් පිළිතුරු දෙන්න මම කාලය ඉතුරු කළා. මම ඉතාමත් පැහැදිලිව කියන්න ඕනෑ, මත්ස්‍ය ආනයනයේදී බදු පනවන්නේ මුදල් අමාත්‍යාංශය බව. ඒ වෙලාවේ ආනයනික මත්ස්‍ය කිලෝවකට රුපියල් 25ක බද්දක් තිබුණේ. දැන් මාස කිහිපයකට පෙර අපට ජීවන වියදම් කමිටුවෙන්ම තමයි දැනුම් දුන්නේ මත්ස්‍ය මිලේ වැඩිවීමක් තිබෙනවා කියලා. මම පත්වුණාට පසුව ඒ ආනයනික බද්ද රුපියල් 75 දක්වා වැඩි කළා; එක වතාවක් රුපියල් 50 කළා; ඊට පසුව නැවතත් තව රුපියල් 25කින් වැඩි කළා. මොකද, අපේ නිර්දේශය මත මුදල් අමාත්‍යාංශය රුපියල් 75 දක්වා ඒ වැඩි කිරීම කළා. ඊට පසුව හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් දිගින් දිගටම මාළු මිල වැඩි බව ප්‍රකාශ කළා. ඔබතුමා හොඳටම දන්නවා, විශේෂයෙන්ම තලපත් සහ කොප්පරා මසුන් අපේ රටට ප්‍රමාණවත් තරමින් අහු වෙන්නේ නැති බව. ඒ නිසා තමයි බද්ද අඩු කරන්න කියන නිර්දේශය ලැබීම මත මුදල් අමාත්‍යාංශය විසින් බද්ද අඩු කළේ. නමුත් දැනුත් මාළු මිලේ ප්‍රශ්නයක් නැහැ කියලා ඔබතුමා කියනවා නම්, නැවත යෝජනාවක් යවලා, ඒ ආනයනික මත්ස්‍ය බදු මුදල රුපියල් 75 දක්වා නැවත වැඩි කරන්න කටයුතු කරන්නම්. ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. මොකද, මෙහි කාටවත් වෙනත් අවශ්‍යතාවක් නැහැ. හැබැයි, ධීවරයන් සමඟ සාකච්ඡා කරලා තමයි ඒ කටයුත්ත කළේ. ඒ මුදල මම එනකොට තිබුණු ගණනට වඩා වැඩි කිරීමක් මිසක් අඩු කිරීමක් නොවෙයි වෙලා තිබෙන්නේ.

ටින් මාළු සම්බන්ධයෙන් රජය ගත් ප්‍රතිපත්ති තීන්දුවක් මත තමයි ජනතාවට වැඩි මත්ස්‍ය ප්‍රමාණයක් ආහාරයට ගන්න වුවමනාය කියන කාරණය හේතුවෙන් ටින් මාළු මිල අඩු කළේ. ටින් මාළු කර්මාන්තශාලා හතරක් රජය ආරම්භ කලා. ඒ කර්මාන්තශාලා හතරට අවශ්‍ය මාළු සපයන්න තමයි බද්දකින් තොරව මාළු ආනයනය කරන්න අවසරය ලබා දුන්නේ. ගිය ආණ්ඩුව කාලයේ තමයි ඒ අවසරය ලබා දුන්නේ. ඒ මත තමයි මැකරල් මාළු ආනයනය කරන්නේ. ශත පහකවත් බද්දක් නැතුව මාළු ගෙනෙන්න අවස්ථාව ඒ සඳහා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවා වෙළඳපොළට යන නිසා අපි මැදිහත් වෙලා කර්මාන්තශාලා හතරට පමණක් එය සීමා කළා. එහෙම කළේ එලෙස ආනයනය කරන මාළු වෙළඳපොළට යෑම නවත්වන්නයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. මමත් ඉල්ලන්නේ ඒකයි. මොකද, ආනයනය කරන මාළු ප්‍රමාණය අඩු වුණොත් තමයි අපේ දේශීය මත්ස්‍ය කර්මාන්තය ආරක්ෂා වෙන්නේ. නමුත් ගරු ඇමතිතුමනි, ඒකෙන් අදහස් වෙන්නේ නැහැ, පාරිභෝගිකයන්ට අධික මිලකට මාළු ලබා දෙන්න කියන එක.

එම නිසා තමයි පසු ගිය රජය යටතේ ධීවර සංස්ථාව විසින් මත්ස්‍ය සම්පත මිලදී ගැනීමේ ක්‍රමවේදයක් ඇති කළේ. ධීවර සංස්ථාවෙන් ස්ථාවර මිලක් ලබා දුන්නොත්, ධීවර සංස්ථාවේ තිබෙන මත්ස්‍ය අළෙවි සැල් පාවිච්චි කරලා එම කටයුත්ත කරන්න පුළුවන්. නමුත් ගරු ඇමතිතුමනි, අද දවසේ ඒ ක්‍රමවේදය ඇත හිට තිබෙනවා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ධීවර සංස්ථාව මෙතෙක් කාලයක් ධීවරයාගෙන් මාළු කෙළින්ම ගත්තේ නැහැ. ධීවර සංස්ථාව අවුරුදු 42ක් පාඩු ලබමින් තමයි තිබුණේ. ඔබතුමාගේ තාත්තා ධීවර ඇමති හැටියට සිටි කාලය තුළත් දිගටම පාඩු තමයි ලැබුවේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. පොඩ්ඩක් ඉන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේක දැන් විවාදයක් වනවා. ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කටයුතු සඳහා කාලය අඩු වනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මෙතුමාට උත්තරයක් දෙන්න ඕනෑ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ වුණාට මෙය විවාදයක් කර ගන්න එපා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
එතුමා කිව්වාට පස්සේ -[බාධා කිරීමක්]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණයටයි මම උත්තර දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගත්තේ මගේ කාලය.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, විනාඩියෙන් අවසන් කරන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පසු ගිය දිනකදීත් කියා තිබුණා, "ධීවර සංස්ථාව පළමුවැනි වතාවටයි මේ ලාභ ලැබුවේ" කියලා. මම ඔබතුමාට අභියෝග කරනවා. මම ඔබතුමාත් එක්ක විවාදයකට එන්නම්. ධීවර සංස්ථාවේ ලාභ පිළිබඳව අපි කථා කරමු. මම ඕනෑම විවාදයකට එන්නම්. ධීවර සංස්ථාව 2002 අවුරුද්දේත් ලාභ ලැබුවා; 2003 අවුරුද්දේත් ලාභ ලැබුවා. ණය සියල්ල ගෙව්වා. ඒ අවුරුදුවල ණය ගෙව්වා විතරක් නොවෙයි, ධීවර සංස්ථාවේ සියලුම සේවකයන්ගේ හිඟ පඩිත් ගෙවලා, ඔවුන්ගේ දීමනාත් ලබා දුන්නා. එම නිසා ඔබතුමා ඔය කියන සංඛ්‍යා ලේඛන වැරදියි. "අද දවසේ ලාභ ලබනවා" කියන්නේ ඉතාම වැරදි ප්‍රකාශයක්.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කළ ප්‍රකාශය ඉතාමත් වැරදියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ධීවර සංස්ථාව විසින් ධීවරයාගෙන් කෙළින්ම මාළු ගන්න දැන් ලැහැස්ති කරලා තිබෙනවා. දිගින් දිගටම පාඩු ලැබූ ධීවර සංස්ථාව මම ධීවර ඇමතිවරයා හැටියට පත් වී ගත වූ මේ කාලය තුළදී ලාභ ලබන මට්ටමට ගෙනාවා. මෙතුමන්ලා මොනවා කිව්වත් මම පිළිගන්නේ නැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ මාළු අල්ලපු විධිය, නැව් ගිය විධිය පිළිබඳව මමත් කැමැතියි ඕනෑ වෙලාවක විවාද කරන්න. නැව් අයිතිකාරයෝ කවුද, petrol shedsවල අයිතිකාරයෝ කවුද, කොමිස් ගියේ කොහොමද කියන ඒවා පිළිබඳව අපි දන්නවා. ප්‍රශ්නයක් නැහැ. මේ පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනෙන්න. ඒකට ඔබතුමන්ලාට අයිතිය තිබෙනවා. මම ඒකට උත්තර දෙන්න ලැහැස්තියි. අපි විවාද කරමු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමා චෝදනා කළා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
චෝදනාවක් කළේ නැහැ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ඇයි, චෝදනාවක් නේ කළේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා නමක් සඳහන් කළේ නැහැ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ -[බාධා කිරීම්]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නැහැ, නැහැ. නමක් සඳහන් කළේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කලින් ඉදිරිපත් කළ point of Order එක -[බාධා කිරීම්]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මයික් එක දෙන්න කෝ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-[බාධා කිරීම්]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, විවාදයකට යන්න එපා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මට උත්තරයක් දෙන්න අවස්ථාව දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, එහෙම වෙලාව දෙන්න බැහැ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවස -[බාධා කිරීම්]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව දෙන්න කෝ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමනි, කරුණාකරලා කෙටියෙන් කියා අවසන් කරන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඕනෑම නාළිකාවක විවාදයකට එන්න. ධීවර -[බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් ඇති.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ඔබතුමා මට කථා කරන්න දෙන්නේ නැත්නම්, මොකක්ද -[බාධා කිරීම්] ඇමතිතුමා කථා කරලා යයි. මට උත්තරයක් දෙන්න ඔබතුමා අවස්ථාව දෙන්නේ නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මයික් එක නැහැ නේ. [බාධා කිරීම්] මයික් එක දෙන්නේ නැහැ නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමනි, කථාව කරගෙන යන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මයික් එක දාන්නේ නැහැ නේ. [බාධා කිරීම්] *බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.* [බාධා කිරීම්] එයා අහන්නේ නැහැ නේ. මයික් එක දෙන්න කියන්න කෝ. [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට මයික් එක දීලා තිබෙන්නේ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ධීවර සහ -[බාධා කිරීම්]

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා සම්බන්ධයෙන් මා -[බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, මොකක්ද -[බාධා කිරීම්] ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ -[බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. [බාධා කිරීම්]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්] එතුමා කථා කරනවා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථාව කරන්න.

[අ.භා. 4.16]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ඉදිරිපත් කර තිබෙන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත යටතේ කථා කරන්න ලැබීම ගැන මා සතුටට පත් වනවා. ඒකට හේතුව, -[බාධා කිරීම්]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මාස තුනයි.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
එයා ඉඩ දෙන්නේ නැහැ නේ. එයා කථා කරනවා නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීවරු කරුණාකරලා බාධා කරන එක නවත්වන්න. ඔබතුමා කථාව කරගෙන යන්න. කරුණාකර බාධා කරන එක නවත්වන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
කරුණාකරලා බාධා කරන එක නවත්වන්න. [බාධා කිරීම්]

අද දවසේ ධීවර අමාත්‍යාංශය ගැන කථා කරන්න ලැබීම ගැන විශාල සතුටක් ඇති වෙනවා. ගරු ඇමතිතුමනි, ඇහුම් කන් දෙන්න. මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සභාවේ සිටියදී කථා කරන්න අවස්ථාව ලැබීම ගැන විශාල සතුටක් ඇතිවන බව නැවත වතාවක් මා කියනවා.

ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කළා. මගේ දිස්ත්‍රික්කයේ කලාවැව මිරිදිය මාළු ව්‍යාපෘතියක් තිබෙනවා. ඒ වාගේම මගේ දිස්ත්‍රික්කයේ රාජාංගන, නාච්චදූව, පදවිය, හුරුලු, කනදරාව කියන වැව් තිබෙනවා. අද විතරක් නොවෙයි, රජතුමන්ගේ කාලයේ ඉඳලා ධීවර කටයුතු ඉතා ඉහළ අන්දමින් කරගෙන ගිය

දිස්ත්‍රික්කයක් තමයි අනුරාධපුර දිස්ත්‍රික්කය. මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ජනතාවගේ කාලය කෘෂි කර්මාන්තයට වාගේම ධීවර කර්මාන්තයටත් වෙන්කරලා තමන්ගේ ජීවිතයේ එදිනෙදා කටයුතු ලස්සනට කරගෙන ගියා. නමුත් ගරු ඇමතිතුමනි, මෑතකදී ඒකේ ලොකු වෙනසක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒකට හේතුව තමයි, අපේ වැව ඔබතුමාගේ නව අමාත්‍යාංශය යටතට පත්වෙලා තිබෙන එක.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමති සහ මහවැලි සංවර්ධන රාජ්‍ය ඇමති. ඒ ධුර දෙකම ඔබතුමාට පවරා තිබෙනවා. මගේම ගමේ තිබෙනවා කලාවැව. ඒ වැව අයිති වෙලා තිබෙන්නේ මහවැලි සංවර්ධන අමාත්‍යාංශයටයි. ඒ වාගේම රාජාංගන, නාච්චදූව, පදවිය, හුරුලු, කනදරාව යන වැව් අයිතිවෙලා තිබෙන්නේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයටයි. ගරු ඇමතිතුමනි, ධීවර කටයුතු කිරීමේදී අපේ ධීවරයාට විශාල ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා, අපේ ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන්. මාළු අල්ලන්න අයිනටවත් යන්න බැරි ප්‍රශ්නයක් ඇතිවෙලා තිනෙවා. මේ සම්බන්ධයෙන් නිලධාරින්ට දොස් කියලා වැඩක් නැහැ.

අනුරාධපුර දිස්ත්‍රික්කය තමයි මා නියෝජනය කරන දිස්ත්‍රික්කය. වනජීවී කලාපයක් වෙන් කරලා තිබෙනවා, කුරුණෑගල දිස්ත්‍රික්කයට. කුරුණෑගල දිස්ත්‍රික්කයේ වනජීවී කලාපයේ නිලධාරින්ට මා දොස් පවරන්නේ නැහැ. ඒ නිලධාරින්ගේ වැඩ කටයුතු ඒ අය කරනවා. මා ඊයේ පෙරේදා නිලධාරින් එක්ක කථා කරලා ධීවරයින්ට සහනයක් ලබා දුන්නා. ඒ නිලධාරින්ට මා ස්තුතිවන්ත වෙනවා. ධීවරයින්ට මාළු අල්ලන්න අයිනටවත් යන්න බැරි ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඒ අයට ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන්නේ වනජීවී නිලධාරින්ගෙන්. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මා කිව්වා, කලාවැව ඔබතුමාට -මහවැලි සවර්ධන අමාත්‍යාංශයට- අයිතියි කියලා. මා සඳහන් කළ අනික් වැව් අයිති වන්නේ වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයටයි. ඒ නිසා ඔබතුමා වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමාත් එක්ක කථා කරලා මාළු අල්ලන ධීවරයින්ට විශේෂ සැලකිල්ලක් කරන්න.

ගරු ඇමතිතුමනි, යහ පාලන ආණ්ඩුව පත් වුණු වෙලාවේදී මා ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක් කළා, මගේ දිස්ත්‍රික්කයට ඇවිල්ලා උදව් කරන්නය කියලා. ඒ වෙලාවේ ඔබතුමා අනුරාධපුර දිස්ත්‍රික්කයට ඇවිල්ලා, කලාවැවට ඇවිල්ලා ධීවරයින්ට අවශ්‍ය උපකරණ ලබා දුන්නා. ඒ සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මාළු අල්ලන අපේ ධීවරයින් එදා ගියේ push bicycle එකෙන්. අදත් ඒ අය push bicycle එකෙන් තමයි යන්නේ. ඒ අයට විශේෂ වැඩ පිළිවෙළක් නැහැ. කලා වැව ජාතික මිරිදිය ධීවර හා ජලජීවී වගා පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, මා සඳහන් කළ වැව්වල පහළ කොටසේ ඉන්න ධීවරයින් එක තැනකට ගෙන්වා, ලෝකයත් එක්ක ඉදිරියට ගමන් කරන ආකාරය පිළිබඳව අපේ ධීවරයින් දැනුවත් කරන වැඩ පිළිවෙළක් ඔබතුමාගේ නායකත්වය යටතේ ඔබතුමාගේ සංකල්පය අනුව සකස් කරන්න ඕනෑ. එහෙම නොවුණොත් ධීවරයින් හැම දාම හිහන්නන් බවට පත් වනවා. එදා සිට අද දක්වා ඒ අය ගමන් කරන්නේ push bicycle එකෙන් තමයි. ඒවා වෙනස් කරන්න කියලා ඔබතුමාගෙන් ගෞරවනීය ඉල්ලීමක් කරනවා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. අපේ ධීවරයින්ට තවත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අයට නිවාස නැති ප්‍රශ්නයක් තිබෙනවා. අපේ ඇමතිතුමා, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා ලස්සන නිවාස යෝජනා ක්‍රමයක් කර ගෙන යනවා. මා නියෝජනය කරන කොට්ඨාසයේ කලා වැව ඉස්මත්තේ ධීවර ගම්මානයක් තිබෙනවා. එහි ජනතාව දැනට පදිංචිවෙලත් ඉන්නවා. එදා ඒ ගෙවල් දුන්නේ කොහොමද දන්නවා ද? රජයේ සේවයකයන්ට තමයි ඒ ගෙවල්වලින් කොටසක් දුන්නේ. ඒ කලා වැව ධීවර ගම්මානයේ සියයට හැත්තෑවක් අසූවක් වාගේ ධීවරයෝත් ඉන්නවා. නමුත් එදා රජයේ සේවකයන්ට දීපු ගෙවල් තවම වහගෙන ඉන්නවා. එම නිසා මම ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ධීවරයන්ට නිවාස යෝජනා ක්‍රමයක් අපි ඇති කර දෙමු. ඔබතුමා යහපාලන ඇමති කෙනෙක්. එදා ධීවරයන්ට හදපු ගෙවල් රජයේ සේවකයන්ට දීපු විධියට ක්‍රියා කරන්නේ නැතිව, අපි හරි ආකාරයෙන් කටයුතු කරමු. සජිත් ප්‍රේමදාස ඇමතිතුමා දැන් වැඩ කරන්නේ කොහොමද? එතුමාගේ අමාත්‍යාංශයේ වැඩක් කියලා නිවාස බෙදා දීම එතුමාගේ අතට ගන්නේ නැහැ. එතුමා දිස්ත්‍රික්කයේ DM ට ඒ කටයුත්ත භාර දෙනවා, ජාති ආගම් කුල මල භේදයක් නැතිව, පක්ෂ, පාට භේදයක් නැතිව සුදුසු අය තෝරන්න කියලා.

ධීවර ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේත් ඒකයි. අපි පක්ෂ බලන්න ඕනෑ නැහැ; පාට බලන්න ඕනෑ නැහැ. කුල මල භේදයක් නැතිව දුප්පත් අයට කරන සැලකිල්ලක් විධියට ධීවරයන් ගැන සොයා බලා ඒ අයට අවශ්‍ය කටයුතු කරලා දෙමු. එහෙම කළොත් විතරයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ ධීවරයන්ටත් හොඳ නිවාසවල ලස්සනට ජීවත් වෙන්න අවස්ථාවක් ලැබෙන්නේ. කවුරු මොනවා කිව්වත් ගරු ඇමතිතුමනි, ඔබතුමා දක්ෂ ඇමති කෙනෙක්. ඒ නිසා තමයි, ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් ඔබතුමාට අමාත්‍යාංශ දෙකක් භාර දීලා තිබෙන්නේ. ධීවර අමාත්‍යාංශයත්, මහවැලි රාජ්‍ය අමාත්‍යාංශයත් ඔබතුමාට භාර දීලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මම දැන් කියපු වැව් කීපයකම ලොකු අඩු පාඩු තිබෙනවා. ඒ ධීවරයන්ට අවශ්‍ය උපකරණවල අඩු පාඩු තිබෙනවා. ඒ අයට නිවාස අඩුපාඩු තිබෙනවා. හැම දාම ඒ අය push cycleවල යන ගමන නැති කරලා, ඒ අයගේ සැප පහසුවත් සලසන්ට ඕනෑ.

මේ කථා කරන හැම දෙනාම මහ මුහුද ගැන කථා කරනවා. මගේ දිස්ත්‍රික්කයේ ඉන්න දුප්පත්ම ධීවරයෝ වෙනුවෙන් බොහොම ඕනෑකමින් ඔබතුමාගෙන් ඉල්ලන්නේ මෙයයි. ඔබතුමා ජනාධිපතිතුමා එක්ක බොහොම ළඟින් ඉන්න ඇමති කෙනෙක්. ඔබතුමාගේ අමාත්‍යාංශයට විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර දීලාත් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, අපි මේ අවුරුද්දේ සිටම ධීවර නිවාස යෝජනා ක්‍රමයක් පටන් ගනිමු. එදා නිවාස බෙදා දුන් විධියට නිවාස බෙදා දෙන්නේ නැතිව, අපි දුප්පත් ධීවරයෝ සොයා බලා ඒ අයට සතුටු වෙන්නට පුළුවන් විධියට ගෙවල් හදා දීලා ඒ කටයුතු කරමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉන්න ලෙඩුන්ගෙන් වැඩි දෙනෙක් ධීවර කර්මාන්තයේ යෙදෙන අය. එයට හේතුව තමයි, ඒ අය වැව් ඉස්මත්තේ ජීවත්වෙන එක. ඩෙංගු වැනි රෝග බෝ වෙනවා. ඒවාට මුහුණ දෙන්න බැරි ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. ඒවායින් ඒ අය නිදහස් කරන්න නම්, ඒ අය සඳහා හොඳ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. අපේ යහපාලන රජය යන ගමනට තව අවුරුදු තුනක් තිබෙනවා. මේ අවුරුදු තුනේදී ඔබතුමාගේ දිස්ත්‍රික්කයට වාගේම, අනුරාධපුර දිස්ත්‍රික්කයටත් විශේෂ සැලකිල්ලක් දක්වා මේ දිස්ත්‍රික්කයේ ධීවරයන්ගේ දියුණුවට උදව් උපකාර කරයි කියා මම හිතනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මහවැලි අමාත්‍යාංශයේ වැඩ කටයුතුත් අයිති නිසා ගරු ජයවික්‍රම පරේරා ඇමතිතුමා එක්ක

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

සාකච්ඡා කරන්න. ධීවරයන්ට කරදරයක් නොවෙන විධියට, ධීවරයන්ගේ කටයුතු කරගන්න පුළුවන් විධියට අපට වැඩ පිළිවෙළක් හදලා දෙන්න.

ගරු ඇමතිතුමනි, නවීන යුගයේ තමයි අපි දැන් ඉන්නේ. එදා සිටම "තුන්ඩිල්" දාලා තමයි අපේ ධීවරයෝ මාළු ඇල්ලුවේ. රජ කාලයේ සිට ඒ අය රැකියාව කරනවා. ඒ අය අදත් ඒ විධියටම කරන්න ඕනෑද කියලා මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහනවා. ඒ අයගේ තත්ත්වයත් වෙනස් වෙන්න ඕනෑ. වෙනස් වෙලා, ඒ අයත් හොඳ වාහනවල යන්න ඕනෑ. ඒ අයගේ ළමයි හොඳ ඉස්කෝලවලට යන්නට ඕනෑ. ඒ අයත් හොඳ අධ්‍යාපනයක් ලබා ගෙන, "තාත්තා ධීවරයා පුතාත් ධීවරයා" කියන තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. එහෙම පරිවර්තන වෙලා තියෙනවා.

තාත්තා ධීවරයෙක් නම් පුතා doctor කෙනෙක් වෙන්න ඕනෑ; ඉංජිනේරුවෙක් වෙන්න ඕනෑ. මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි වාගේ මන්ත්‍රීවරයෙක් දක්වා ඒ අයටත් එන්න අවශ්‍ය කටයුතු හදලා දෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉන්න අපි ඒකට විශේෂ වැඩ පිළිවෙළක් හදා දෙන්න ඕනෑ.

කලාවැවේ මිරිදිය මාළු ව්‍යාපෘතියක් තිබෙනවා. අපි ඒ ඔක්කොම අය ගෙන්වමු. ගෙන්වලා, ඒ අයට ඒ අවශ්‍ය කටයුතු හදලා දීලා, ඉදිරි ලෝකයත් එක්ක ගමන් කරන්න පුළුවන් මාර්ගය අපි හදා දෙමු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු ඉෂාක් රහ්මාන්)
(The Hon. Ishak Rahuman)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ඇමතිතුමනි, මම අන්තිමට කියන්නේ මේකයි. කවුරු චෝදනා කළත්, ඔබතුමා ඒවා ගණන් ගන්න එපා. ඔබතුමා ඉදිරියට යන ඇමති කෙනෙක්; මේ ආණ්ඩුවේ ඉන්න ප්‍රබල ඇමති කෙනෙක්. මේ අවුරුද්දේ වෙන් කළ මුදල්වලට වඩා වැඩි මුදලක් ලබන අවුරුද්දේ වෙන් කරලා, විශේෂයෙන්ම මම කියපු කලාවැව ඇතුළු මුළු අනුරාධපුර දිස්ත්‍රික්කයේම හොඳ වැඩ පිළිවෙළක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා.

ඔබතුමා පළමුවෙන්ම පත් වුණු වෙලාවේ අනුරාධපුරයට ආවා; අවශ්‍ය කටයුතු කරලා දුන්නා. මේ කට්ටිය කොච්චර කෑ ගැහුවත්, මේ අවුරුද්ද තුළදීත්, ඉදිරි අවුරුදු දෙක, තුන ඇතුළතදීත් හොඳ ලස්සන වැඩ පිළිවෙළක් කරලා මේ ගමන අපි අනිවාර්යයෙන්ම ලස්සනට යන්න ඕනෑ ගරු ඇමතිතුමනි. ගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් එක්ක එකතු වෙලා, ඉදිරි අවුරුදු තුන ඇතුළත මේ ප්‍රශ්නවලට සාර්ථකව උත්තර ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න වෙලාව ලබා දුන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු සන්දිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු සන්දිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසර තිබෙනවා නම් ගරු ඇමතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කාලය නම් බොහොම සීමිතයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු සන්දිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
ඇත්ත වශයෙන්ම මම මේක දීර්ඝ කාලයක් අපේක්ෂා කළ දෙයක්. මුහුදු පතුලේ ඇති සම්පත ආරක්ෂා කරගන්න ගෙනයන වැඩ පිළිවෙළට නෛතික බලයක් ලබාදීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් ධීවර සම්පත විනාශ වෙනවා. ඒ වාගේම අපේ සාගර සීමාවෙන් එහා පැත්තේ තිබෙන සමහර විශාල යාත්‍රා bottom trawling සඳහා පැමිණීම නිසා පරිසර සාධක විනාශ වීමත් සිදු වෙනවා. මේක විශාල මං කොල්ලයක්. අපි දැක්කා, මුහුදු ඌරෝ, ඒ වාගේම ඩොල්ෆින් මාළුවෝ, whalesලා, ඒ වාගේ සතුන් අපේ සාගරය අත හැරලා යනවා. සමහර සතුන් අනතුරට ලක්වුණු තත්ත්වයන් තිබුණා. මොකද, මේවා සංචාරක කර්මාන්තයත් එක්ක වෙලාගත් වැදගත් සාධක. ඒ වාගේම මම ඔබතුමාට කියන්න කැමැතියි, අපේ ධීවර සම්පත සංවර්ධනය කිරීමේදී මුහුදු දූෂණය වීමත් අහිතකර ලෙස බලපෑම් ඇති කරලා තිබෙන බව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව කෙටි කරන්න.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු සන්දිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ සියලු තත්ත්වයන් යටතේ මම ඔබතුමාට මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමා මෙම පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙන දණ්ඩනය වෙන්නේ රුපියල් 50,000යි. මීට කලින් මේ කාරණය කවරුන් හෝ මතු කළාද කියා මම දන්නේ නැහැ. එක මාළුවෙකුගෙන් ඒ මුදල හොයන්න පුළුවන්. ඒ දඩ මුදල ප්‍රමාණවත් නැහැ. ඇත්ත වශයෙන්ම අපි යම් කිසි බලපෑමක් කරන විධියට නීති සම්පාදනය කරනවා නම්, මේ වගේ සරල දේවල්වලින් ඒකට බලපෑමක් කරන්න බැහැ. මම ඒ පිළිබඳව ඔබතුමාගේ අදහස් දැනගන්න කැමැතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඇමතිතුමා, පැහැදිලියි නේද? මම හිතන්නේ ඇමතිතුමාට ඒක පැහැදිලි වුණා.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමනි, අවම දඩ මුදල තමයි ඒ සඳහන් කරලා තිබෙන්නේ. ඒත් එක්කම සිර දඬුවමක් තිබෙනවා. ඒ දඩ මුදල මීට වඩා බොහොම අඩු මට්ටමක තිබිලා තමයි ඔය මට්ටමට ගෙනාවේ. නමුත්, ඔබතුමා සඳහන් කළ කාරණය ගැන කිව්වොත්, අපි අත් අඩංගුවට ගන්නා ඉන්දීය බෝට්ටු තවම නිදහස් කරන්නේ නැහැ. ඒවා රජය භාරයේ තබාගන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සනත් නිශාන්ත මන්ත්‍රීතුමා.

[අ.භා. 4.30]

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවන අවස්ථාවේ දී මටත් අදහස් ඉදිරිපත් කිරීමට විනාඩි කිහිපයක් ලබාදීම පිළිබඳව ඔබතුමාට හදවතින්ම ස්තුතිය පුදකරනවා.

ගරු අමාත්‍යතුමනි, මේ අවස්ථාවේ දී මම ඔබතුමාට මෙන්න මේ කාරණය පිළිබඳව මතක් කරන්න කැමැතියි. මෙම වසර 5 ඇතුළත අපේ රට තුළ රැකියා දසලක්ෂයක් බිහිවෙයි කියා අපි බලාපොරොත්තු වුණා. ගරු අමාත්‍යතුමනි, මම පෞද්ගලිකව සඳහන් කරන කාරණයක් තමයි මේ පනත් කෙටුම්පත සංශෝධනය වීම හරහා, ඒ වාගේම මෙම වැඩ පිළිවෙළ හරහා පවුල් දසදහසකට වැඩි ප්‍රමාණයක් රැකියා විරහිත පවුල් බවට පත්වන එක නොඅනුමාන බව. වයඹ පළාතේ හිටපු පළාත් ධීවර ඇමතිවරයා වශයෙන් අත් දැකීම් තිබෙන මන්ත්‍රීවරයකු හැටියටයි මම මේ කාරණාව ඉදිරිපත් කරන්නේ. මෙම සංශෝධනය ඉදිරිපත් වෙද්දී "පතුලේ ඇදගෙන යනු ලබන දැල් භාවිතා කරමින් ධීවර මෙහෙයුම් තහනම් කිරීම" කියන එක අවස්ථා ගණනාවකදී දිගින් දිගටම කියැවුණා. ගරු ඇමතිතුමනි, මෙන්න මේ කාරණය නිසා යාපනය, මන්නාරම, කල්පිටියට ඉහළින් සහ පල්ලියවත්තට ඉහළින් පලුගහතුරෙයි, ඒ වාගේම කාරතිව් වැනි ප්‍රදේශවල ධීවරයින් විශාල පිරිසකගේ රැකියා අවස්ථා අහිමි වෙනවා. ඒ වාගේම මීගමුවේ සිට හැඳල, වත්තල දක්වාම මෙම පන්න ක්‍රමය භාවිත කරනවා ගරු ඇමතිතුමනි. මේ හරහා රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වෙනවා. අපි දළ වශයෙන් ගණනය කර බැලුවාම මේ හරහා 10,000කට ආසන්න පවුල් ප්‍රමාණයකට රැකියා අහිමි වෙනවා. මම වයඹ පළාත් සභාවේ ධීවර අමාත්‍යවරයා හැටියට කටයුතු කරන වෙලාවේ කල්පිටිය ධීවරයන්ගේ ගැටලුවක් විසඳන්න එම ස්ථානයට ගොස් පෞද්ගලිකවම එයට මැදිහත් වූ නිසයි මම මේ කාරණය ගැන කියන්නේ. සීමාසහිත කල්පිටිය එක්දින, බහුදින trawling යාත්‍රා හිමියන්ගේ ධීවර සමුපකාර සමිතියත් එක්ක අපි සාකච්ඡා කළා. ඒ සුළුපන්න ධීවරයින් සහ බහුදින යාත්‍රා හිමියන් සමඟ සාකච්ඡා කරලා අපි ඔවුන්ට GPS locaiton එකක් සීමා කරලා waypoint එකක් දුන්නා, මෙන්න මේ සීමාව තුළ තමයි ඔබට රැකියාව කරන්න පුළුවන්කම තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු දිශාවේ කාරතිව් ප්‍රදේශය පැත්තෙන් ගත්තාම 33900 කියන කොටස, උතුරු දිශාවේ දකුණු පැත්තෙන් ගත්තාම කුදිරමලේ තුඩුවේ 33120 කියන සීමාව, දකුණු සීමාවෙන් ගත්තාම පල්ලියවත්ත ප්‍රදේශයෙන් 29900 කියන සීමාව, එහිම දකුණු පැත්තේ දකුණු කොටස පලුගහතොරේ දක්වා 29900 කියන සීමාව, මෙම GPS location එක තුළ බහුදින යාත්‍රා 24කට මේ කියන පන්න ක්‍රමයෙන් රැකියාව කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දුන්නා. මේ සීමාව තුළ අපට ලැබෙනවා, කුරුටු ඉස්සා කියන ඉස්සා. මොනොඩෝන් කියන ඉස්සාට සමාන රෝස පැහැති ඉස්සෙක්. ග්‍රෑම් 15-30 දක්වා බරක් තිබෙන ඉස්සෙක්. මේ ඉස්සාගේ ආයු කාලය මාස එකහමාරේ සිට මාස තුනහමාරක් අතර කාලයක් වෙනවා. මේ කාල සීමාව තුළ ඉස්සාව ඇල්ලුවේ නැත්නම් ස්වභාවිකව මේ ඉස්සා මැරිලා යනවා. මේ ඉස්සාව අල්ලන්න "mud-trawling" system එක හැර වෙන කිසිම ක්‍රමවේදයක් අපේ රටේ හඳුනා ගෙන නැහැ. මේ සම්බන්ධව වසර ගණනාවක් නාරා ආයතනය හරහා පරීක්ෂණ කරලා තබෙනවා. නාරා ආයතනයෙන් ලබා දෙන ලද වාර්තාව වුණේ, මේ ඉස්සන් ඇල්ලීමට මෙම පන්න ක්‍රමය හැර වෙනත් කිසිදු පන්න ක්‍රමයක් භාවිත කළ නොහැකි බවයි.

මෙම පනත් කෙටුම්පත සංශෝධනය වෙලා එම සංශෝධනය හරහා දස දහසකට වැඩි ප්‍රමාණයකට රැකියා අහිමි වුණොත්, අද අපේ රටේ තිබෙන රැකියා අර්බුද ගොන්නට මේකත් එකතු වනවා. එක පැත්තකින් වෛද්‍යවරු පාරේ; එක පැත්තකින් ශිෂ්‍යයෝ පාරේ; තව පැත්තකින් කම්කරුවෝ පාරේ. එක එක ව්‍යාපෘතිකයින් තමන්ගේ අයිතිවාසිකම් ඉල්ලා ගෙන පාරට බහින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මේ තත්ත්වය හරහා රැකියා දස දහසක් අහිමි වුණොත් එම ජනතාවත් පාරට බහින එක නතර කරන්න අපට පුළුවන්කමක් නැහැ, ගරු ඇමතිතුමනි. එම නිසා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලන්නේ, ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත සංශෝධනය කරන ගමන් මේ ප්‍රදේශවල ඉන්න ධීවරයන් සමඟත් සාකච්ඡා කරලා, මහජන නියෝජිතයන් සමඟ සාකච්ඡා කරලා, මෙන්න මේ සීමාව තුළ සුළු පන්න භාවිත කරමින් මෙම කර්මාන්තය කිරීමේ තහනමක් නැහැයි කියලා ඒ location එක සීමා කරන්න කියලායි. අපේ යෝජනාව වෙන්නේ, ඉන්දියාවෙන් එන රේල් පීලි යොදා ගෙන මුහුදු පතුල විනාශ කරන කර්මාන්තය නොවෙයි. ඉන්දියාවෙන් මහා විශාල යාත්‍රා ඇවිල්ලා, මහා දම්වැල් දා ගෙන, කඩන, කුඩු කරන, විනාශ කරන කර්මාන්තය නොවෙයි. වසර 60කට ආසන්න කාලයක් තිස්සේ පවතින එම ධීවරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන්නය කියන කාරණය පමණයි ඉල්ලන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී පුංචි චෝදනාවක් තිබෙනවා. සෘජුවම මම කියන්නේ නැහැ, මේකමයි කාරණය කියලා. මෙහිදී, මෙම උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන එක්තරා ගෞරවනීය මන්ත්‍රීවරයකුගේත් නම කියැවෙනවා. ගරු ඇමතිතුමනි, ඒ මන්ත්‍රීවරයා ස්ටීව් කියන ඕස්ට්‍රේලියන් ජාතික සුදු මහත්තයෙක් එක්ක එකතු වෙලා රාජ්‍ය නොවන සංවිධානයක් හරහා නිල් කකුළුවා නිෂ්පාදනය කරන්න, මේ කියන භූමි ප්‍රදේශයෙන් අක්කර 3000ක්, 4000ක් පාවිච්චි කරන්න කල්පනා කරනවා. ඒ පාවිච්චි කරන්න තිබෙන බාධාව, මේ අහිංසක ධීවරයන් රැකියාව කරන එකයි. මේ ව්‍යාපෘතිය හරහා - [බාධා කිරීමක්] ගරු හර්ෂ ද සිල්වා නියෝජ්‍ය අමාත්‍යතුමනි, මේක කරන්න බැහැ. මොකද, මම ධීවර හා ජලජ සම්පත් ඇමතිතුමාට මේ දැවෙන ප්‍රශ්නයක් ගැනයි කිය කියා හිටියේ. පවුල් 10,000ක ප්‍රශ්නයක්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
සමාවෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සනත් නිශාන්ත මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනේ! මට සමාවෙලා තවත් විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මගේ වෙලාවෙන් දෙන්න. මගෙයි වැරැද්ද.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙලාව වෙන් කරලා නැහැ.

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා
(மாண்புமிகு சனத் நிசாந்த பெரேரா)
(The Hon. Sanath Nishantha Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්තරා සමාගමක් සම්බන්ධයෙන් මෙහිදී චෝදනාවක් නැඟෙනවා. මට ලැබුණු තොරතුරුවල හැටියට නම් Taprobane Seafoods Private Limited එක ගැනයි. එහි අයිතිකරුවන් කවුද, කළමනාකාර අධ්‍යක්ෂවරයා කවුද, සාමාන්‍යාධිකාරිතුමා කවුද, මුදල් පාලක කවුද, ගිණුම් කළමනාකාරතුමා කවුද යන්න මේ සියල්ලන්ගේම නාමලේඛනයත් එක්ක අපට තොරතුරු දුන්නා. මේ කණ්ඩායම ඒකරාශී වෙලා අභිංසක ධීවරයන්ගේ රැකියා අවස්ථාවන් නැති කරලා ඔවුන් මන්නාරම, යාපනය සහ කල්පිටිය අර්ධද්වීපය ආසන්නයේ නිල් කකුළුවා නිෂ්පාදනය කරන්න, නිල් කකුළු කූඩු ගහන්න හදනවා කියලා තමයි අපට දැන ගන්න ලැබුණේ.

අපේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන ගෞරවනීය මන්ත්‍රීවරයෙක් නිසා මම ඒ මන්ත්‍රීතුමාගේ නම කියන්නේ නැහැ; එහෙම කියන එක හොඳ නැති නිසා මම එහෙම කියන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා මේ වැඩේ කළත් අවසාන වශයෙන් තීන්දුවක් ගන්න පෙර, නැවත වතාවක් නාරා ආයතනයත් එක්ක සාකච්ඡා කරලා බලන්න. මේ හරහා පවුල් දසදහසකට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙනවාද, මේ කුරුටු ඉස්සා අල්ලන්න වෙනත් ක්‍රමයක් තිබෙනවාද, මේ කුරුටු ඉස්සාගේ ආයු කාලය කොපමණද, වසර හතළිහක්, පනහක් රැකියාව කරලාත් මේ හරහා ඒ භූමියට, ඒ ප්‍රදේශයට, මහ මුහුදට පරිසර හානියක් වුණේ නැහැ නේද, ගැඹුරේ වෙනසක් හෝ වෙනත් විනාශයක් සිදු වුණේ නැහැ නේද කියන වාර්තාව අරගෙන අවසාන තීන්දුවක් ගන්න කියන කාරුණික ඉල්ලීම කරමින්, ඔබතුමාට සහ අපේ රටේ අභිංසක ධීවර ජනතාවට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා. 4.39]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නිසා, ඔබතුමා මූලාසනයේ ඉන්න මේ මොහොතේදී ධීවරයන් පිළිබඳවත්, ධීවර කර්මාන්තය පිළිබඳවත් කථා කරන්නට ලැබීම පිළිබඳව සන්තෝෂ වනවා. යහ පාලන ආණ්ඩුව ජනවාරි 08වැනිදා පත් වුණාට පස්සේ, අපේ ධීවර ඇමතිතුමාට ප්‍රථම වතාවට මුහුණ දෙන්න වුණු ප්‍රශ්නය තමයි, එදා මීගමුවේ ධීවර ජනතාව මහ පාරට බැහැලා ලොකු උද්ඝෝෂණයක් කිරීම. ඒ උද්ඝෝෂණයේදී ඔවුන් ඉල්ලීමක් කළා, Port City එකට වැලි ගෙන යනවා, මෙයින් ඒ ප්‍රදේශයේ ඉන්න මත්ස්‍යයන් සහ ඒ මත්ස්‍යයන්ගේ බිත්තරවලට හානි වෙන්න පුළුවන්, මේක නතර කරන්න කියලා. ඒ අවස්ථාවේදී අපි ජනතා නියෝජිතයෝ හැටියට එදා ඒ ජනතාවත් එක්ක පාරට බැස්සා. ධීවර ජනතාවත් සමඟ අපේ ගරු ඇමතිතුමාත්, ඒ වාගේම ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු පාර්ලිමේන්තුවේ කණ්ඩායමක් එක්ක මහ මුහුදට ගිහිල්ලා, මේ ප්‍රදේශයේ වැලි ගන්නා ස්ථාන ටික නරඹලා මේකට අවශ්‍ය කරන ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්න ඒ අවස්ථාවේ අපට පුළුවන්කම ලැබුණා. ආණ්ඩුවක් හැටියට එදා මීගමුවේ ධීවර ජනතාව පාරට බැස්ස අවස්ථාවේදී ඔවුන්ව තනි කරලා, ඔවුන්ට බැටින් පොලුවලින් ගහලා මේ ප්‍රශ්නය විසඳන්න උත්සාහ ගත්තේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ජනතාවත් එක්ක එකතු වෙලා, සාකච්ඡා කරලා "මෙගාපොලිස්" අමාත්‍යාංශය හරහා, ධීවර අමාත්‍යාංශය හරහා මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ප්‍රථමයෙන් කථා කළ ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කථා කළ ආකාරය මට මතකයි. එදා ධීවර ජනතාව මාළු අල්ලා ගන්න මුහුදට ගිය අවස්ථාවේදී ජීවිත හානි වුණා. ඒ විතරක් නොවෙයි, ඔවුන් තමන්ගේ ඉන්ධන සහනාධාරය ඉල්ලා පාරට බැස්ස අවස්ථාවේදී ඔවුන්ට සැලකුවේ කොහොමද කියලා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අමතක වෙලා තිබෙනවා. හලාවත ඇන්ටනි මහත්මයා ඇතුළු පිරිසට බැටින් පොලුවලින් ගහලා වෙඩි තියලායි ඔවුන්ව පලවා හැරියේ, මර්දනය කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද මේ යහ පාලන ආණ්ඩුව ඇවිල්ලා වෙනසක් ඇති වෙලා තිබෙනවා. අද මේ යහ පාලන ආණ්ඩුවේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ඇමතිවරු මේ ප්‍රශ්නවලට ඇහුම් කන් දෙන පිරිසක් බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය තමයි, ධීවරයෝ - ධීවරයෝ අතර ගැටුමක් ඇතිවීම. තහනම් දැල් භාවිතා කරන ධීවරයෝ පිරිසකුත්, ඒකට විරෝධය පාන ධීවරයෝ පිරිසකුත් ස්ථාන දෙකකදී උද්ඝෝෂණ කරන්න පටන් ගත්තා. දින පහක් වැනි කාලයක් පාරවල් අවහිර කර ගෙන ඔවුන් උද්ඝෝෂණ කළා. ඒ වෙලාවේ එම ප්‍රශ්නයට අවශ්‍ය කරන උත්තරය සොයන්නට මේ ආණ්ඩුව ක්‍රියාත්මක වුණා. ඒ වාගේම, ධීවර ඇමතිතුමා මේ වෙනුවෙන් මැදිහත් වුණා. ධීවර ඇමතිතුමා ඒ ප්‍රශ්නයට මැදිහත්වීම ගැන අපි එතුමාට ස්තුති වන්න වෙන්න ඕනෑ. තහනම් දැල් භාවිත කරලා මත්ස්‍යයන් ඇල්ලීමෙන් මුහුදු පතුලට කරන හානියට විරුද්ධව ක්‍රියා මාර්ග ගන්න, නීති සම්පාදනය කරන්න මේ ජනතාව වෙනුවෙන් එතුමා මැදිහත් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා මේ ධීවර කර්මාන්තයේ යෙදෙන පිරිස් diversලා දමලා, චතුර යටින් දැල්

අරගෙන ගිහිල්ලා ඩයිනමයිට් ගහලා මාළු මරන බව. එහෙම කළාම මාළුන්ගේ බිත්තර, මාළු පැටව්, සිප්පි කටු ආදී මේ සියල්ලත් එක්ක තමයි ගොඩට ගන්නේ.

එයින් වන හානිය ගෙන බැලුවාම මම හිතනවා, කොරල් පරවලටත් ලොකු හානියක් සිද්ධ වනවා කියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙය අවුරුදු ගණනක් සිද්ධ වුණා. මෙයින් යම්තාක් දුරට ලාභයක් ලබන පිරිසක් ඇති. ඔවුන් මාළු මෙට්‍රික්ටොන් 25,000ක් විතර එක පාර අල්ලනවා කියා මම හිතනවා. නමුත් එමඟින් රටේ අනාගතයට සහ ධීවර කර්මාන්තයේ අනාගතයට වන හානිය ඉතාම බරපතළයි. මම විශ්වාස කරනවා ධීවර අමාත්‍යතුමාත්, ඒ නිලධාරිනුත් එකතු වෙලා මේ ප්‍රශ්නයටත් අවශ්‍ය කරන ස්ථිරසාර විසඳුම ලබා දේවි කියා. අපි දන්නවා, ඉන්දියාවේ ධීවරයන් ට්‍රෝලර් යාත්‍රාවලින් ඇවිත් ලංකාවේ මුහුදු සීමාවේ දැවැන්ත ලෙස මාළු ඇල්ලීමක් කරනවා කියා. මෙයින් රටට හානියක් වනවා විතරක් නොවෙයි, රටේ ආරක්ෂාවටත් හානියක් වනවා. ඒ නිසා අප ඒ කිසිවකට අවස්ථාවක් දෙන්න හොඳ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ යුගයේදී යුරෝපා සංගමය පැනවූ මත්ස්‍ය අපනයන තහනමට ලංකාව ලක් වුණා. ඒ හේතුවෙන් රුපියල් බිලියන 28කට වැඩි ප්‍රමාණයක ආදායමක් අපට වාර්ෂිකව අහිමි වුණා. නමුත් මේ යහ පාලන ආණ්ඩුව ඇවිත් අද මේ රටේ මත්ස්‍යයන් පිට රට යවන්න පුළුවන් අවකාශය ලබා දී තිබෙනවා; යුරෝපා සංගමය පැනවූ මත්ස්‍ය අපනයන තහනම ඉවත් කරවාගෙන තිබෙනවා; GSP Plus සහනය ලබා දී තිබෙනවා. මා හිතන විධියට ආණ්ඩු වෙනසත් එක්ක ධීවර කර්මාන්තයට ලැබුණු ශක්තිය තමයි මෙය. එදා කකුළුවන්, ඉස්සන් පිට රට යවාගන්න බැරිව හිටපු, එම ව්‍යාපාර කරපු අය අද නැවත වතාවක් තමන්ගේ ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. ඒත් එක්කම ගරු අමාත්‍යතුමාට මම තවත් කාරණයක් මතක් කර දෙනවා. විශේෂයෙන් මීගමුව ප්‍රදේශයේ සිටින අපේ ජනතාව අදටත් ජීවත් වන්නේ එදා ජීවත් වූ විධියටම තමයි. ඔවුන්ට හරිහමන් නිවසක් නැහැ. ඔවුන්ගේ දරුවන්ට හරිහමන් අධ්‍යාපනයක් ලබා ගන්න අවශ්‍ය පාසල් ටික නැහැ. සෞඛ්‍ය ගැටලුවක් වෙලා රෝහලට ගියාම ඔවුන්ට රැකවරණය සලසන රක්ෂණ ක්‍රමවේදයක් නැහැ. ඔවුන් දැවැන්ත ප්‍රශ්න ගොඩකයි ඉන්නේ. ගොවියන් මේ රටට බත සපයද්දී මේ රටට අවශ්‍ය කරන මාළු ටිකත්, පිට රටට යවන්න අවශ්‍ය කරන මාළු ටිකත් ගෙනැවිත් දෙන්නේ අපේ අභිංසක ධීවර ජනතාවයි. ඉතිහාසයේ ඉඳන් ගත්තාම පෙනෙනවා, ඔවුන් ඉතාම දුක් මහන්සියෙන් වැඩ කරන ජනතාවක් බවට පත් වෙලා තිබෙන බව.

ගරු අමාත්‍යතුමාගෙන් මා ඉල්ලනවා, විශේෂයෙන්ම මීගමුව ප්‍රදේශයේ, ජා-ඇල ප්‍රදේශයේ, වත්තල ප්‍රදේශයේ සිටින ධීවර ජනතාව වෙනුවෙන් මේ යහ පාලන ආණ්ඩුව හරහා නිවාස යෝජනා ක්‍රමයක්, රක්ෂණාවරණ ක්‍රමයක් -සෞඛ්‍ය රක්ෂණාවරණ ක්‍රමයක්- ක්‍රියාත්මක කරන්න කියා. එය කරන්න පුළුවන් නම් ඉතාම වැදගත්ය කියන කාරණය මා කියනවා. මොකද, ඒ ජනතාව ලොකු කැපවීමක් කරනවා. ඔවුන් තමන්ගේ ජීවිත පරදුවට තබා තමයි මහ මුහුදු තරණය කරලා මහ මුහුදත් එක්ක ගැටෙන්නේ කියන එක අපි මතක් කර දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ කතාවේදී එතුමා යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන අමුතු බිල්ලෙකු මැව්වා. ඒක ඔවුන්ගේ හැටියක් වී තිබෙනවා. එදා මැතිවරණයට යද්දී -ඌව මැතිවරණයට යද්දී- කියපු දේවල් අපට මතකයි. ජීනීවා මානව හිමිකම් කොමිසම හරහා මහින්ද රාජපක්ෂ මැතිතුමා දං ගෙඩියට -විදුලි පුටුවට- ගෙන යනවා කියා එදා ලොකු බිල්ලෙකු මැව්වා. ඒ අය අද යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව බිල්ලකු මවා, මේ රටට බොරුවක් පෙන්වා, මේ රටේ තිබෙන සාමය, මේ රටේ තිබෙන සංහිඳියාව නැති කරලා, ජාති ආගම් අතර අවබෝධය කඩා, මේ රට තුළ නැවත වතාවක් යුද ගිනි ඇවිළෙන්න අවශ්‍ය කරන වපසරිය සහ වටාපිටාව නිර්මාණය කරමින් යනවා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මෙවැනි මුසාවන් කියා, මේ රටට විරුද්ධව චෝදනා කරමින්, මේ රටේ ජනතාව නොමඟ යවමින් මේ ආණ්ඩුව අපකීර්තියට ලක් කරන්න උත්සාහ ගන්නවා නම් මේ ආණ්ඩුවත් මේ රටේ ජනතාවත් ඒකට ඉඩ දෙන්නේ නැහැ කියා. එසේ කියමින්, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බහුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[ප.ව. 4.47]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

இதனால், அவர்கள் தடைசெய்யப்படாத ஒன்றரை அங்குல அளவுள்ள வலைகளைப் போட்டு பெரிய மீன்களைத்தான் பிடித்தார்கள். என்ன நடந்தது? மீனவர்கள் தாக்கப்பட்டார்கள். அவர்கள் ஒருநாள்கூட மீன்பிடிக்க அனுமதிக்கப்படவில்லை. இதனால், இம்முறை கிட்டத்தட்ட 8,400 குடும்பங்களைச் சேர்ந்த மக்கள் பட்டினி நோன்பு நோற்றார்கள். புல்மோட்டை-கொக்கிளாய் பிரதேசத்திலே நூறு வருடங்களுக்கு மேல் இறாலையும் நண்டையும் பிடித்து வந்தவர்களுக்கு இப்பொழுது அதில் ஈடுபடுவதற்குத் தடைசெய்யப்பட்டிருக்கிறது.

அங்கு முஸ்லிம்களுக்கென 07 சம்மேளனங்கள் இருந்தன. இன்று முல்லைத்தீவிலே தமிழ் மக்களுக்கான ஒரு சம்மேளனமும் சிறிபுரவிலே சிங்கள மக்களுக்கான ஒரு சம்மேளனமும் இருக்கின்றது. இவற்றின் கூட்டங்கள் இடம்பெறுவதாயின், ஒரு மாதம் அது முல்லைத்தீவில் நடந்தால், அடுத்த மாதம் அது திருகோணமலையிலே நடத்தப்பட வேண்டும் என்று Gazette பண்ணப்பட்டது. ஆனால், இதுவரை ஒரு கூட்டம்கூட திருகோணமலையிலே நடத்தப்படவில்லை.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, you have to conclude your speech now.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්දුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
Please give me two more minutes, Sir. මට සුළු වේලාවක් දෙන්න ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මට වේලාව adjust කර ගන්නට අමාරුයි. I can give you one more minute. Please conclude.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්දුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
அந்த நிபந்தனையின் அடிப்படையில் ஒருநாள்கூட திருகோணமலை மாவட்டத்திலுள்ள மீனவர்களின் பிரச்சினை ஆராயப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்கள் வருகை தந்தபோது, அதற்குத் தீர்வு பெற்றுத்தருவதாகக் கூறியும் அதனைப் பெற்றுக்கொடுக்கவில்லை.

அதேநேரத்தில், நான் விரும்பும் கௌரவ அமைச்சர் மஹிந்த சமரசிங்க அவர்களது அமைச்சு சம்பந்தப்பட்ட சில விடயங்களைக் கூற ஆசைப்படுகின்றேன். அந்தப் பிரதேசத்திலே தார் வீதிகளைப் போட முடியவில்லை; கிரவல் வீதிகளைப் போட முடியவில்லை; சிப்பிகளைக்கூட அள்ள முடியவில்லை. காரணம், துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சுக்கு உரித்துடையதென அந்தப் பிரதேசத்தின் கரையோரக் காணிகள் எல்லாம் Gazette பண்ணப்பட்டிருக்கின்றது. கடந்த 2-3 மாதங்களுக்கு முன்னர் கௌரவ அமைச்சர் அர்ஜுன ரணதுங்க அவர்கள் அங்கு வந்தபோது 785 ஹெக்டயர் - 1,750 ஏக்கரை விடுவித்தார்; நாங்கள் சந்தோசமடைகின்றோம். இன்னும் 3,000 ஏக்கர் நிலம் விடுவிக்கப்பட வேண்டும்.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, you have to conclude now.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්දුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
எனவே, அந்தப் பிரதேசங்களில் எங்களுடைய மீனவர்கள் தொடர்பாகவும் எங்களுடைய பிரதேச மக்களுடைய வாழ்வாதாரம் தொடர்பாகவும் இந்த இரண்டு அமைச்சர்களும் கவனம் செலுத்த வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Thank you very much.

මීළඟට, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.59]

ගරු ඩී. වී. චානක මහතා
(මාණ්පුමිකු ඩි.වී. සානක)
(The Hon. D. V. Chanaka)
ගරු කථානායකතුමනි, රටේ ධීවර ජනතාවගේ අනාගතයට බලපාන, රටේ ධීවර කර්මාන්තයට බලපාන පනත් කෙටුම්පතක් පිළිබඳව ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවක අදහස් දැක්වීමට ලැබීම ගැන මම ස්තුතිය පළ කරන්නට කැමැතියි. ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත බලපාන්නේ ඉන්දියාවේ සිට ඇවිල්ලා අපේ රටේ ධීවර කර්මාන්තයේ යෙදෙන, එහෙමත් නැත්නම් වෙනත් රටවලින් ඇවිල්ලා අපේ මුහුදු සීමාව තුළ ධීවර කර්මාන්තයේ යෙදෙන කණ්ඩායමටද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. මේ නීති රෙගුලාසි බොහෝ වෙලාවට බලපාන්නේ අපේ රටේම අභිංසක ධීවරයන්ටයි. මේ නීති, රෙගුලාසි ගේන්නේ පිට රට ධීවරයාට කියලායි කියන්නේ; නමුත් ඇත්තටම බලපාන්නේ අපේ රටේ ධීවරයාටයි.

ගරු කථානායකතුමනි, මම මුලින්ම අවධානය යොමු කරන්නට කැමැතියි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමා අද "ලක්බිම" පුවත්පතට කරලා තිබෙන ප්‍රකාශයක් පිළිබඳව. ගරු කථානායකතුමනි, එහි මෙසේ සඳහන් වෙනවා:

"මෙම පනත අනුව මෙරට මුහුදු සීමාවට ඇතුළු වී නීති විරෝධී ලෙස ධීවර කර්මාන්තයේ යෙදෙන විදේශ ධීවර යාත්‍රා, ධීවර උපකරණ හා ධීවරයින් අත්අඩංගුවට ගන්නා අතර ඊට එරෙහිව පනවන දඩ මුදල දැනට තිබෙන මුදලට වඩා කිහිප ගුණයකින් වැඩි කිරීමට පියවර ගෙන තිබෙන බව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමැති මහින්ද අමරවීර මහතා ප්‍රකාශ කළේය.

ඒ අනුව මෙරට මුහුදු සීමාවට නීති විරෝධීව ඇතුළුවන ධීවර යාත්‍රා සඳහා මෙතෙක් පනවන ලද දඩ මුදල රුපියල් මිලියනයේ සිට මිලියන

100 දක්වා ඉහළ දැමෙනු ඇත. එමෙන්ම නීති විරෝධී පන්න ක්‍රමවල යෙදෙන දේශීය ධීවරයින් සඳහා වන දඩ මුදල රුපියල් 50000 සිට රුපියල් ලක්ෂ 05 දක්වා ඉහළ දමනු ලැබේ. "

හැබැයි ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්] ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවස්ථාවේ උත්තර දෙන්න. මට විනාඩි 10යි තිබෙන්නේ.

මේ පනත් කෙටුම්පත තුළ මේ කිසිම දෙයක් මම දකින්නේ නැහැ. මිලියන 100ක දඩයක් හෝ එවැනි කිසිම දෙයක් ගැන මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙන්නේ නැහැ. සමහරවිට පත්තරයේ වරදක් වෙන්න පුළුවන්, එහෙම නැත්නම් ඔබතුමා හඳුපු පනත් කෙටුම්පතේ වරදක් වෙන්න පුළුවන්. නමුත් ගරු කථානායකතුමනි, මේ මිලියන 100 දඩය පනත් කෙටුම්පතට ඇතුළු වෙනවා නම් අපි කැමැතියි. පිට රට ධීවරයන් අපේ මුහුදු සීමාවට ඇවිල්ලා අපේ මත්ස්‍ය සම්පත අරගෙන යන විට මෙහෙම දඩයක් එකතු වෙනවා නම් අපි කැමැතියි. හැබැයි ගරු කථානායකතුමනි, මම මේ පනත් කෙටුම්පත තුළ එවැනි කිසිම දෙයක් දකින්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මේ ආණ්ඩුව ආපු දවසේ ඉඳන් අපේ රටේ ධීවරයාට පනවන ලද අලුත් නීති - රීති නිසා දවසින් දවස මත්ස්‍ය නිෂ්පාදනය අඩු වෙමින් යනවා. ඒ වාගේම ආනයනය එන්න එන්නම වැඩි වෙනවා, අපනයනය එන්න එන්නම අඩු වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මේ නීතිත් සමඟ අද අපේ රටේ ධීවරයා විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දෙනවා. ධීවර ගමකින් ආපු කෙනෙක් වශයෙන් මම දන්නවා, ගරු කථානායකතුමනි, අද අපේ ගමේ ධීවරයාට විශාල ප්‍රශ්න තිබෙන බව. අද ඉංජිනේරුවාට තිබෙනවා වාගේ paper work ටිකක් ධීවරයාටත් කරන්න තිබෙනවා. ගරු කථානායකතුමනි, සමහර වෙලාවට එක බෝට්ටුවක ධීවරයන් පස්දෙනෙක් මුහුදු යනවා. හදිසියෙන්වත් කලින් දවසේ හවස එක්කෙනෙකුට එන්න බැහැ කිව්වොත් අලුත් ධීවරයෙක් පිළිබඳ විස්තර සඳහන් කරලා, ඔහුගේ Identity Card copies ගෙනැල්ලා දීලා ඒ ක්‍රියාවලිය අවසන් වෙලා රැකියාවට යන්න වෙන්නේ තව දවසක් විතර පහු වෙලායි.

ගරු කථානායකතුමනි, අලුතෙන් හඳුන්වා දුන් VMS එකත් සමඟ අද අලුත් නීතියක් ඇවිත් තිබෙනවා. බෝට්ටු මුහුදු ගිහින් දවස් කිහිපයක්, සමහර විට මාසයක් මුහුදේ ඉන්න අවස්ථා තිබෙනවා. මේ බෝට්ටු මුහුදු ගිහින් මහදී VMS එක කැඩුණොත්, පැය තුනක් ඇතුළත ගොඩ බිමට එන්න ඕනෑ. පැය තුනකින් ගොඩබිමට ආවේ නැත්නම් රුපියල් ලක්ෂ පහක දඩයක් නියම වෙනවා. හැබැයි, මේ නීති වැඩි වෙන්නේ අපේ රටේ ධීවරයාට. අපේ මත්ස්‍ය සම්පත නෙළා ගන්න ධීවරයාට නීති වැඩි වෙනවා. ඒ නිසා අපේ ධීවර කර්මාන්තය එන්න එන්නම කඩා වැටෙනවා; අපේ ධීවරයාට තිබුණු තැන නැති වෙලා යනවා.

ගරු කථානායකතුමනි, මම කලින් කිව්වා වාගේම පිට රටින් එන බෝට්ටුවලට තමයි නීති වැඩි වෙන්න ඕනෑ. ඊයේ අපේ ගමේ - කුඩාවැල්ල ප්‍රදේශයේ - බෝට්ටුවක් හා හම්බන්තොට වරායේ සිට ගිය බෝට්ටු දෙකක් නැවකින් යට කරගෙන ගිහින් තිබෙනවා. නැවකින් යට කරගෙන ගියා විතරක් නොවෙයි, ඒ බෝට්ටු දෙක සම්පූර්ණයෙන්ම මුහුදු බත් වෙලා. බෝට්ටුවල සිටි ධීවරයින් දෙදෙනෙක් තවමත් සොයා ගෙන නැහැ. එයින් එක් ධීවරයෙක් දික්වැල්ල, මාලියැද්ද ප්‍රදේශයේ පදිංචි සිව්දරු පියෙක්. ළමයි හතරදෙනෙක් සිටින පියෙක් නැහැ! ඒ වාගේම මගේ ගමේ - කුඩාවැල්ල, මෝදරවත්ත ප්‍රදේශයේ- සේකර සහෝදරයාට මොකක් වුණාද කියලා තවම දන්නේ නැහැ. එම නිසා මම ගරු ඇමැතිතුමාගෙන් අහන්න කැමැතියි, මේ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා. අද වන විට ඒ නැව සොයා ගත්තාද, ඒ නැවට දඩ නියම කරලා තිබෙනවාද, මොකක්ද ගත්ත ක්‍රියාමාර්ගය කියලා අපි දැන ගන්න කැමැතියි.

එදා යුද්ධයක් තිබුණ නිසා ධීවරයා මුහුදු යන්න භය වුණා. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා රටේ යුද්ධය නිම කරලා, ධීවරයාගේ බිය නැති කළා. හැබැයි, ධීවරයා නොවෙයි බිය වුණේ; ධීවරයාගේ පවුලේ අය. ධීවරයා මුහුදු යනකොට ධීවරයාගේ ආදරණීය භාර්යාව, අම්මා, තාත්තා, සහෝදරයා, පවුලේ අය තමයි භය වුණේ. හැබැයි, අද වෙද්දී රටේ යුද්ධයක් නොතිබුණත්, අපේ ධීවර පවුල්වල ජනතාවට තමන්ගේ ස්වාමිපුරුෂයා මුහුදු ගියාම, තමන්ගේ පුතා මුහුදු ගියාම භයෙන් ඉන්න සිදු වෙලා තිබෙනවා. නැවක් යට කරගෙන යයිද, එහෙම නැත්නම් ඉන්දියාවේ බෝට්ටුවකින් ඇවිත් පහර දෙයිද වාගේ ගැටලු රාශියකට අද අපේ ධීවරයාට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අද ධීවරයාගේ ආදරණීය භාර්යාවට, දරුවන්ට, තමන්ගේ ස්වාමිපුරුෂයා, තමන්ගේ තාත්තා ගෙදරට එනකම් ඒ අයගේ ජීවිතය පිළිබඳ විශ්වාසයක් නැති වෙලා තිබෙනවා.

හම්බන්තොට වරාය රැක ගන්න එදා තරුණ තරුණියන් උද්ඝෝෂණය කරන වේලාවේ අපේ අමාත්‍යාවරුන්ට, ජනාධිපතිතුමාට, අගමැතිතුමාට පුළුවන්කම තිබුණා, නාවික හමුදාපතිතුමා එතැනට යවලා මාධ්‍යවේදීන්ට ගහලා, ඒ තරුණයන්ට ගහලා ඒ වරාය මුදා ගන්න. හැබැයි, අපේ බෝට්ටුවක් නැවකින් යට කරගෙන ගියාම, අපේ ධීවරයන්ගේ ජීවිතවලට තර්ජන එල්ල වන විට ඒ නාවික හමුදාව යොදවලා මේ නැව අල්ලා ගන්න අපේ නායකයන්ට බැරි වෙලා තිබෙනවා. මොකක්ද ගරු කථානායකතුමනි, මේ නීතිය? මම ඊයේ මේ ගැන ඇමැතිතුමාට ප්‍රකාශ කරද්දී, ඇමැතුමා කියනවා, නාවික හමුදාව මේකට වග කියන්න ඕනෑ කියලා. ගරු අමාත්‍යතුමනි, ඒක ඇත්ත.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
Sir, I rise to a point of Order.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ වේලාවේදී උත්තර දෙන්නකෝ. මට තව විනාඩි දෙක තුනයි තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව විනාඩි තුනක් තිබෙනවා. ගරු ඇමැතිතුමනි, ඔබතුමාගේ පිළිතුරු කතාවේදී පිළිතුරු දෙන්න පුළුවන් නේද?

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු කථානායකතුමනි, එතුමා කිව්වා නාවික හමුදාව මේකට වග කියන්න ඕනෑ කියලා. හැබැයි, මම ඇමැතිතුමාට අවධාරණය කරන්න කැමැතියි, ධීවරයන්ගේ ජීවිත පිළිබඳව එතුමාටත් වගකීමක් තිබෙනවා කියලා. ඒ වාගේම හැම දාම නිලධාරීන්ට මේ ප්‍රශ්න දමන්න එපා. එහෙම නම් නාවික හමුදාවට වග කියන්න ඕනෑ, ජනාධිපතිතුමා. ඔබතුමා කියන්නේ ජනාධිපතිතුමාට වගකීමක් තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, මම ඒ පිළිබඳව වැඩිපුර කථා කරන්න යන්නේ නැහැ.

[ගරු ඩී. වී. චානක මහතා]

අද මේ රටේ පවතින නීතිත් එක්ක මත්ස්‍ය අපනයනය අඩු වෙමින් යනවා. මත්ස්‍ය අපනයනය එන්න එන්නම අඩු වේගෙන යනවා. 2015 වසරේ මහින්ද රාජපක්ෂ මැතිතුමා රට භාර දෙනකොට මත්ස්‍ය අපනයනය මෙට්‍රික් ටොන් 26,320ක් වෙනවා. හැබැයි, 2016 වසර වෙනකොට මත්ස්‍ය අපනයනය මෙට්‍රික් ටොන් 17,593 දක්වා අඩු වෙනවා. ඒ අඩුවීම තුළ රුපියල් මිලියන 7,994ක් -රුපියල් කෝටි 799ක් - අපේ විදේශ විනිමය අපට අහිමි වෙලා තිබෙනවා. මෙයට හේතු වෙලා තිබෙන්නේ අලුතින් පනවපු නීති-රීතියි.

ගරු කථානායකතුමනි, ධීවරයාට නීති දාලා ධීවරයාට ඒ මත්ස්‍ය සම්පත ගෙනෙන්න තිබුණු ඒ පහසුකම් අඩු කිරීම තමයි මේකට බලපාලා තිබෙන්නේ. හැබැයි ගරු කථානායකතුමනි, එක පැත්තකින් අපනයනය අඩු වෙන කොට අනෙක් පැත්තෙන් ආනයනය විශාල ප්‍රමාණයකින් වැඩි වෙනවා. ගරු කථානායකතුමනි, එදා මහින්ද රාජපක්ෂ මහත්තයා ආණ්ඩුව භාරදෙන කොට මත්ස්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 78,712යි. හැබැයි, ගරු කථානායකතුමනි, ඒකත් වැඩි වෙනවා, මෙට්‍රික් ටොන් 115,000කට. ගරු කථානායකතුමනි, මේක මත්ස්‍ය ආනයනය මෙට්‍රික් ටොන් 37,693කින් වැඩි වීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන් වෙන්නයි යන්නේ.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
තත්පර 30ක් දෙන්න, ගරු කථානායකතුමනි. මේක තුළින් වෙන පාඩුව කොච්චරද? අද වෙද්දී පිට රටවලට අපේ රටේ මුදල් යනවා, මිලියන 16,389ක්. මේක නිසා අපේ රටේ සල්ලි කෝටි 1,638ක් පිට රටට යනවා. ධීවර ඇමතිතුමනි, නීති දාන්න පිට රටින් එන බෝට්ටුවලට; පිට රටින් එන නැව්වලට. හැබැයි, අපේ ධීවරයා ආරක්ෂා කරන්න. අපේ ධීවරයාගේ ගැටලු විසඳලා ඒ ගොල්ලන්ට කරන්න පුළුවන් උපරිම සේවාව ඉටු කරන්න. ස්තුතියි.

[අ.භා. 6.09]

ගරු මහින්ද අමරවීර මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Fisheries and Aquatic Resources Development and State Minister of Mahaweli Development)
ගරු කථානායකතුමනි, මම කාරණා කිහිපයක් පිළිබඳව කථා කරන්න කලින් ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ කථාවටම යම් පිළිතුරක් ලබා දෙන්න අවශ්‍ය වෙනවා. ඊයේ දිනයේ එතුමා මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, "ධීවර යාත්‍රා කිහිපයක් අනතුරට පත් වුණා. අපි බලපත්‍ර දුන්නු -අපි මාළු අල්ලන්න දීපු- විදේශ යාත්‍රායි මේ බෝට්ටුවල ගැටුණේ" කියලා. මේක ඉතාමත් අසත්‍ය ප්‍රකාශයක් කියලා මම ඊයේත් කිව්වා. අපි එහෙම බලපත්‍ර දීලාත් නැහැ. අපේ බල ප්‍රදේශයට ආවොත් ඕනෑම කෙනෙක් අත් අඩංගුවට ගන්න, ඕනෑම යාත්‍රාවක් අත් අඩංගුවට ගන්න කියලා අපි උපදෙස් දීලා තිබෙනවා. මම මේ පිළිබඳව-

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ කථාව අවසන් කරන්න ඉඩ දෙන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, එතුමා කිව්වාට පස්සේ මම ඒ පිළිබඳව වාර්තාවක් ලබාගත්තා. ඒ වාර්තාවේ ඉතාමත් පැහැදිලිව ඒ විස්තර තිබෙනවා. යාත්‍රාවේ නම, "ෆයික් පුතා 2". මෙහි අංකය ආදී ඒ විස්තර ටික තිබෙනවා. සිද්ධිය වූ ස්ථානය තිබෙනවා. අයිතිකාරයාගේ නම් තිබෙනවා. මම කෙටියෙන් කිව්වොත්, තවත් යාත්‍රාවකින් ගිහිල්ලා යාත්‍රාවේ ධීවරයන් හතර දෙනෙක් බේරාගෙන තිබෙනවා. ගත් ක්‍රියාමාර්ග විධියට, මෙය වාර්තා වෙන කොට එම අවස්ථාවේම නාවික හමුදාව දැනුවත් කරන එක තමයි අපි කළ යුතු වන්නේ. ඒක කරලා තිබෙනවා. ඒ වාගේම අවට තිබුණු සියලුම යාත්‍රාවලට ඒ දැනුම් දීම කරලා තිබෙනවා. මෙහි නිරීක්ෂණයන් ලෙස අපට දන්වලා තිබෙන්නේ, "මෙම ධීවර යාත්‍රාවේ කිසිදු ධීවර කාර්මිකයෙකු යාත්‍රාවේ තට්ටුවේ deck එක මත නොසිට ඇති අතර යාත්‍රාව නැව් ගමන් මාර්ගයේ තිබී ඇත." කියලා. ඒ කියන්නේ භාණ්ඩ ප්‍රවාහනය කරන ජාත්‍යන්තර නැව් ගමන් මාර්ගයේ තමයි මේ යාත්‍රාව තිබිලා තිබෙන්නේ. මෙම යාත්‍රාව නැවේ ගැටී ඇති ස්ථානය තංගල්ල වරායේ සිට සැතපුම් 30-40 දුර ප්‍රමාණයකින් ප්‍රධාන නැව් ගමන් මාර්ගයේ බැව් ශ්‍රී ලංකා නාවික හමුදාව සනාථ කරලා තිබෙනවා. ඒ වාගේම වෙබ් අඩවියෙත් මේ පිළිබඳව කරුණු සඳහන් වෙනවා.

මගේ කාලය ඉතුරු කර ගන්න ඕනෑ නිසා ඒ සියල්ල ගැන කියන්න යන්නේ නැහැ. ඊළඟ යාත්‍රාව ගැනත් මම කියන්න කැමැතියි. ඊළඟ යාත්‍රාවේ නම "හෂාන් 3". "මෙම යාත්‍රාවේත් කිසිදු කාර්මික නිලධාරියෙකු යාත්‍රාවේ තට්ටුවේ deck එක මත නොසිට ඇති අතර යාත්‍රාව නැව් ගමන් මාර්ගයේ තිබී ඇත. මෙම යාත්‍රාව නැවේ ගැටී ඇති ස්ථානය තංගල්ල වරායේ සිට සැතපුම් 30-40 දුර ප්‍රමාණයකින් ප්‍රධාන නැව් ගමන් මාර්ගයේ බැව් ශ්‍රී ලංකා නාවික හමුදාව මහින් සනාථ කර ඇත." කියලා තිබෙනවා. මේ පිළිබඳව website එකේත් දැනුම් දීලා තිබෙනවා.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු ඇමතිතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමාට වැඩි වෙලාවක් දෙන්න බැහැ.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු කථානායකතුමනි, මම පළමුවෙන්ම ඇමතිතුමාට මේ කාරණය පැහැදිලි කරන්න කැමැතියි. මම චෝදනාවක් එල්ල කළේ නැහැ, ගරු ඇමතිතුමනි. ගරු කථානායකතුමනි, මෙම සිද්ධිය වුණේ මුහුදු සැතපුම් 13ක් විතර දුරින්. ඒ අපේ මුහුදු සීමාවේ. ඔබතුමා නැවතත් කියනවා, ඒ අපේ මුහුදු සීමාව

නොවෙයි කියලා. ගරු ඇමතිතුමනි, අපේ ධීවරයාට තමයි ඔබතුමා වෝදනාව එල්ල කරන්නේ. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය ධීවරයා පිට දාන්න එපා. ඔවුන් ඉඳලා තිබෙන්නේ මුහුදු සැතපුම් 13ක් දුරින්.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, එතුමා කරන මේ ප්‍රකාශයත් එක්ක අපේ ධීවරයන්ට තමයි අවාසියක් වෙන්නේ. ඒක මම පැහැදිලිව කියන්න ඕනෑ. අපි මේ ධීවරයන්ට වන්දියක් ලබා ගන්න දැනටමත් උත්සාහයක් දරනවා. නමුත් මෙතුමා මේ කරන ප්‍රකාශය එක්ක අපට සත්‍යය ප්‍රකාශ කරන්න සිද්ධ වෙනවා. මොකද නැත්නම් පාර්ලිමේන්තුව තුළ වැරැදි මතයක් ඇති වන නිසා. ලබා ගත්තු වාර්තාවට අනුව පැහැදිලිව සඳහන් වනවා, එතුමා කිව්ව කාරණය අසත්‍යයක්ය කියන එක.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. එතුමා කිව්වා, VMS යන්ත්‍රය කැඩුණාම යාත්‍රාව පැය 3ක් ඇතුළත ගොඩ බිමට එන්න ඕනෑය කියලා නියෝගයක් දීලා තිබෙනවා කියලා. ඒකත් සම්පූර්ණ අසත්‍යයක්. එහෙම එන්න අවශ්‍ය නැහැ. අපි කියලා තිබෙන්නේ එහෙම සිද්ධියක් වුණාම දැනුම් දෙන්න කියලායි. ඒක දැනුම් දෙන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදයට අනුව දැනුම් දෙන්න කියලායි අපි කියලා තිබෙන්නේ. ඒ නිසා එතුමාගේ ඒ ප්‍රකාශයත් අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

ඊළඟට එතුමා කිව්වා, මත්ස්‍ය අපනයනයේ අඩු වීමක් තිබෙනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ කාරණය වටහා ගන්න. 2014 වර්ෂයේ තමයි අපට යුරෝපා මත්ස්‍ය තහනම ආවේ. ඒ නිසා 2015 වර්ෂයේ මත්ස්‍ය අපනයනය අඩු වුණා. 2016 වර්ෂයේත් අඩු වුණා. නමුත්, මේ අවුරුද්ද අවසානය වන කොට බලන්න, ඉතිහාසයේ වැඩිම මත්ස්‍ය අපනයනය කළ වර්ෂය බවට මේ වර්ෂය පත් කරනවායි කියන එක මා ඔබතුමාට වගකීමෙන් කියනවා. ඒ විතරක් නොවෙයි. 2020 වන කොට මේ රටේ මත්ස්‍ය කර්මාන්තය ඉහළම තලයට ගෙනැවිත් එය ජාතික නිෂ්පාදනයේ වැදගත්ම හවුල්කාරයා බවට පත් කරනවා.

ඊළඟට, තහනම් පන්න ක්‍රම ගැනත් මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. ගරු කථානායකතුමනි, අවශ්‍ය නම් මේ මත්ස්‍ය අපනයනය තව දෙතුන් ගුණයකින් වැඩි කරන්න අපට පුළුවන්. ඩයිනමයිට් ගහන්න අවසර දීලා, පෝඩු දැල්වලට අවසර දීලා, ලයිලා සහ සුරුක්කු දැල්වලට අවසර දීලා මුහුදු ඔක්කෝම හිඳගෙන ඇවිල්ලා එක පාරටම අස්වැන්න වැඩි කර පෙන්වන්න පුළුවන්. නමුත්, මට වුවමනා වන්නේ එහෙම කරන්න නොවෙයි. මේ කාරණයේදී මා දේශපාලනඥයකු විධියට තීන්දු ගන්නේ නැහැ. මෙතෙක් කල් එහෙම දේවල් තියෙන්න ඇති. නමුත්, නාරා ආයතනය සහ විශේෂඥයින් දෙන නිගමන මතයි මා නියෝග පනවන්නේ; තීන්දු ගන්නේ කියන එක ඉතාමත් පැහැදිලිව කියනවා. අද ඩයිනමයිට් ගහන එක සැලකිය යුතු ප්‍රමාණයකින් නවත්වා තිබෙනවා. මේකෙනුත් යම් ප්‍රමාණයක අවාසියක් සිදු වේවි. ගරු චානක මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාට ඊළඟ වතාවේත් ඔය දැන් කියන කථාව කියන්න පුළුවන් වේවි. නමුත්, මත්ස්‍ය සම්පත හිඳගෙන කන්නේ නැතිව අනාගතයටත් මේ සම්පත ඉතිරි කිරීමයි අප අමාත්‍යාංශයේ දැක්ම වන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. අපි ධීවර කර්මාන්තයට ජාතික ප්‍රතිපත්තියක් හදනවා. මෙතෙක් කලක් තිබුණේ ඇමතිවරයා වෙනස් වෙන කොට වෙනස් වෙන ජාතික ප්‍රතිපත්ති. ආණ්ඩු නොවෙයි, ඇමතිවරයා වෙනස් වෙන කොටත් වෙනස් වෙන ජාතික ප්‍රතිපත්ති තිබුණු මේ කර්මාන්තය සඳහා ඉදිරි කාලයේදී එනම්, මේ අවුරුද්ද ඉවර වෙන්න ඉස්සෙල්ලා අපි ජාතික ප්‍රතිපත්තියක් සකස් කරනවා. එතකොට මා විපක්ෂයේ සියලු දෙනාටත් ආරාධනා කරනවා, ඇවිල්ලා අදහස් ලබා දෙන්න කියලා. ඒ ජාතික ප්‍රතිපත්තිය හදන්නේ මම නොවෙයි. මේ වෙලාවේ විශේෂඥ කණ්ඩායම් ඒ වෙනුවෙන් කටයුතු කරනවා. නෝර්වේ රජයෙන් අපට ඒකට තාක්ෂණික සහයෝගය ලැබෙනවා. අපට ඒ සියල්ල ලැබෙන්නේ නොමිලේ. ඒ වාගේම දේශීය විශේෂඥයිනුත් මේ වෙලාවේ ඒ සඳහා අවශ්‍ය කටයුතු කරෙගන යනවා. අපි ධීවර සංවිධානවල ජනතාවගෙන් කරුණු විමසීම් කරනවා. අවසානයේ මා බලාපොරොත්තු වන්නේ එය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා ඔබතුමන්ලාගේ අදහස් ලබා ගන්නයි. විශේෂයෙන්ම ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා වාගේම දෙමළ ජාතික සන්ධානයේ ගරු මන්ත්‍රීවරුන්, මුස්ලිම් ගරු මන්ත්‍රීවරුන් මේ පිළිබඳව විශාල වශයෙන් උනන්දු වෙනවා. මේ සියලුම දෙනා එකතු වුණාම අපට පුළුවන්කම ලැබෙනවා, සාර්ථක ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ගන්න.

ඊළඟට, මාළු ආනයනය පිළිබඳවත් කරුණු කිහිපයක් සඳහන් කළ යුතුයි. රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා, ජනතාවට ප්‍රෝටීන් වැඩි කිරීම සඳහා මත්ස්‍ය ආහාර ප්‍රචලිත කරන්න කියලා. ඒක මගේ හෝ අපේ අමාත්‍යාංශයේ කාර්ය භාරයක් නොවෙයි. අපි රුපියල් දෙසිය ගණනට තිබුණු ටින් මාළු රුපියල් 125ට, 130ට අඩු කළා. පාරිභෝගිකයාට ටින් මාළු එකක මිල රුපියල් 100කින් විතර අඩු කර දුන්නා. ඒ තුළ ටින් මාළු ආහාරයට ගැනීමේ ප්‍රමාණය අද වන විට දෙගුණයකටත් වඩා වැඩි වෙලා තිබෙනවා. මොකද, මිල අඩු වුණාම වැඩියෙන් කනවා. පිට රටින් තමයි ඒවා ගෙනෙන්නේ. ඉදිරි කාලයේදී ඒකත් අඩු කරලා මේ රටේ ටින් මාළු කර්මාන්තය වැඩි දියුණු කරන්නත්, මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කරන්නත්, අපේ රටේ අභ්‍යන්තර ජලාශවලින් නිසි ප්‍රයෝජනය ලබා ගැනීමටත් -මෙතෙක් කල් අපි ඒවායෙන් නිසි ප්‍රයෝජනය ගත්තේ නැහැ- අපි දැන් වැඩ පිළිවෙළක් හදනවා. ඒ වාගේම අපි මේ රට තුළ aquaculture industrial parks තුනක් ඇති කරනවා. ඒ තුළින් රැකියා ලක්ෂයක් ඇති කිරීමේ ඉලක්කයට අපි මේ කර්මාන්තය යොමු කරනවා වාගේම මේ රටේ ප්‍රධාන විදේශ විනිමය උපයන කර්මාන්ත අතරේ මෙය තුන්වැනි තැනට ගෙනෙන්නයි අපේ ඉලක්කය. ඒක අනිවාර්යයෙන්ම ඉෂ්ට කරනවායි කියන ප්‍රතිඥාව ලබා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් වැදගත් කාරණයක් අහන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න සූදානම් ද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
සූදානම්, ගරු කථානායකතුමනි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ඇමතිතුමනි, අපේ මුහුදු තීරයේ මත්ස්‍ය සම්පත මංකොල්ල කන විදේශ යාත්‍රා සම්බන්ධයෙන් දැනටමත් ඔබතුමා නිසි පියවරක් අරගෙන තිබෙනවාද?

ගරු මහින්ද අමරවීර මහතා
(*மாண்புமிகு மஹிந்த அமரவீர*)
(The Hon. Mahinda Amaraweera)

අද දින ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත සම්මත කිරීමත් එහි එක කොටසකට ඉවහල් වෙනවා. විශේෂයෙන්ම ඉන්දියානු ධීවරයන්ගේ ප්‍රශ්නයට. ඒ විතරක් නොවෙයි, අපි ළඟදීම විදේශ ධීවර යාත්‍රා සම්බන්ධයෙනුත් පනතක් ගෙනෙනවා. ඒකෙදී මීට වඩා සැලකිය යුතු මට්ටමකට දඩ මුදල් වැඩි කරලා ඒ කටයුත්ත නතර කරන්න කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. අපි ආවාට පසුව අන් අඩංගුවට ගත් එකම බෝට්ටුවක්වත් නිදහස් කරලා නැහැ.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)
ගරු මහින්ද සමරසිංහ අමාත්‍යතුමා.

[අ.භා. 6.18]

ගරු මහින්ද සමරසිංහ මහතා (වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා)
(*மாண்புமிகு மஹிந்த சமரசிங்ஹ - துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சர்*)
(The Hon. Mahinda Samarasinghe - Minister of Ports and Shipping)

ගරු කථානායකතුමනි, අද දවස තුළ නොයෙකුත් අදහස් ප්‍රකාශ වුණා. මා සභා ගර්භයේ හිටියේ නැති අවස්ථාවේදී මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ කථාවේදී වරාය අධිකාරියේ සභාපති ආචාර්ය පරාක්‍රම දිසානායක මැතිතුමා පිළිබඳව සඳහන් කරලා තිබෙනවා. මම එතුමා කියපු කරුණ නිවැරැදි කරන්න ඕනෑ. සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවේදී උත්තර දෙන්න බැරි නිලධාරීන් මේ විධියට අපි අපහසුතාවට පත් කරන්නේ නැහැ කියලා සම්ප්‍රදායයක් තිබෙනවා. ඒක තමයි පාර්ලිමේන්තු සම්ප්‍රදාය. ඒ නිසා එතුමා වෙනුවෙන් උත්තර දෙන්න මට සිද්ධ වෙනවා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා සඳහන් කරලා තිබෙනවා, ආචාර්ය පරාක්‍රම දිසානායක මැතිතුමා 2001-2004 කාලයේ වරාය අධිකාරියේ සභාපතිකම දරන කාලයේ වරාය විකුණන්න හැදුවා කියලා. ඒක සම්පූර්ණ අසත්‍යයක්. ඒ වාගේම මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, අපේ වර්තමාන රජයේ ප්‍රතිපත්තිය තමයි, මේ ණය උගුලෙන් බේරිලා, ආර්ථිකය හොඳ පැත්තට හසුරුවන්න අවශ්‍ය විදේශ ආයෝජන ගෙනැල්ලා, ආර්ථික සංවර්ධනය විධිමත්ව ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තිය කියන එක. අපි රජයේ සම්පත් විකුණන්න සූදානම් නැහැ. හම්බන්තොට වරාය ඇතුළු වරාය 8ක් අපේ රටේ තිබෙනවා. ඒ කිසිම වරායක් විකුණන්න අපි කිසිසේත්ම කටයුතු කරන්නේ නැහැ. ඒ ගැන මම බොහොම පැහැදිලිව කියලා තිබෙනවා. ඇත්තටම මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ හිටියා නම්, හම්බන්තොට වරායේ තත්ත්වය ගැන එතුමාට දැනගන්න තිබුණා.

ගරු කථානායකතුමනි, හම්බන්තොට වරාය 2010 ඉඳලා ක්‍රියාත්මක වුණු වරායක්. මේ වන විට, 2010 සිට 2017 මැද භාගය වන විට, හම්බන්තොට වරායේ පාඩුව රුපියල් බිලියන 44යි. ඒ කියන්නේ, රුපියල් මිලියන 44,000ක්. ගරු කථානායකතුමනි, 2015 වසරේ හම්බන්තොට වරායේ පාඩුව රුපියල් බිලියන 18යි. 2016 වසරේ පාඩුව රුපියල් බිලියන 10යි. ඉතින්, එවැනි තත්ත්වයක් තිබියදී මේ වාගේ දෙයක් අපට සඳහටම නඩත්තු කරන්න පුළුවන් ද? ඒ වාගේම, වාණිජ ණය අරගෙන තමයි මේ වරාය ඉදිකරලා තිබෙන්නේ. වරායක් ඉදි කරන පළියට නැව් එන්නේ නැහැ. ඒ වරායට අංගසම්පූර්ණ සංවර්ධනයක් ගෙනත් දුන්නාට පස්සේ තමයි අපට ඒ වරාය දියුණු කරන්න පුළුවන් වෙන්නේ. මේවා ගැන කිසිසේත්ම හිතන්නේ නැතිව විශාල ණයක් අරගෙන හම්බන්තොට වරාය ඉදිකරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, හම්බන්තොට වරායෙන් පාඩු වෙච්ච රුපියල් බිලියන 44 අපි භාණ්ඩාගාරයෙන් ගත්තේ නැහැ. ඒක වරාය අධිකාරියෙන් ගෙවලා තිබෙන්නේ. වරාය අධිකාරිය ගන්න ආදායමෙන් තමයි අපට මේ මුදල ගෙවන්න සිද්ධ වුණේ. ඇත්ත වශයෙන්ම මේ මුදල වරාය අධිකාරිය සතුව තිබුණා නම්, අපට මීට වඩා ලොකු සංවර්ධනයකට යන්න තිබුණා. දැන් වරායේ නැහෙනහිර පර්යන්තය අපි කඩිනමින් සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා. බටහිර පර්යන්තයත් විශාල වශයෙන් සංවර්ධනය කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ වාගේ දේවල්වලට මේ මුදල භාවිත කරන්න අපට පුළුවන්කම තිබුණා. ඇත්ත වශයෙන්ම මේ වාගේ වැරැදි තීරණ ගැනීම නිසා තමයි අපට මේ ණය මුදල ගෙවන්න බැරි තත්ත්වයක් ඇති වුණේ. ඒක තමයි ඇත්ත. අගමැතිතුමා ගිහිල්ලා චීනයත් එක්ක මේ ගැන සාකච්ඡා කළාම චීන රජය කිව්වා, "අපි ආයෝජකයෙක් දෙන්නම්" කියලා. හැබැයි, එතැනදී වරාය විකිණීමක් නොවෙයි කරන්නේ. අපි යම්කිසි කාල සීමාවකට වරාය දෙනවා ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම, අපි බලාපොරොත්තු වෙනවා ඒ වැඩ පිළිවෙළ විනිවිදභාවයකින් කරන්න.

මම බොහොම පැහැදිලිව කියලා තිබෙනවා, කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ඒ ගිවිසුම අත්සන් කළාට පස්සේ, පාර්ලිමේන්තුවට ඒ ගිවිසුම ඉදිරිපත් කරනවා කියලා. එතකොට ඕනෑම කෙනෙකුට ඒක අධ්‍යයනය කරලා අපෙන් ප්‍රශ්න අහන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් අපෙන් පැහැදිලි කිරීම් ලබා ගන්න පුළුවන්. ඒ නිසා මම හිතුවා මේ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්න ඕනෑ කියලා. පාර්ලිමේන්තුව දැනුවත් කිරීමෙන් අනතුරුව මේ රටේ ජනතාව දැනුවත් කරන්න ඕනෑ. මේ රුපියල් බිලියන 44ක පාඩුවක් ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. සියලුදෙනාම හිතන්නේ, අපි රජයේ සම්පතක් විකුණන්න හදනවා කියලායි. ඒ නිසා නැවත වරක් මම බොහොම පැහැදිලිව කියන්න කැමැතියි, කිසිසේත්ම වරාය විකිණීමක් කෙරෙන්නේ නැහැ කියලා. අපි විශාල ආයෝජනයක් ගෙනත් මේ ණය ගෙවා ඉවර කරලා, ඉතිරි වන මුදලින් වරාය තවදුරටත් සංවර්ධනය කරන්න කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(*மாண்புமிகு சபாநாயகர் அவர்கள்*)
(The Hon. Speaker)

යෝජනා අංක 1 - වෙළෙඳ නැව් පනත යටතේ නියෝග අනුමත කිරීම. සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(*மாண்புமிகு உறுப்பினர்கள்*)
(Hon. Members)
එකඟයි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත
கடற்றொழில் நீர்வாழ் உயிரின வளங்கள் (திருத்தம்) சட்டமூலம்
FISHERIES AND AQUATIC RESOURCES (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු මහින්ද අමරවීර මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" [மாண்புமிகு மஹிந்த அமரவீர]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament."- [The Hon. Mahinda Amaraweera]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. SPEAKER in the Chair.]

1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.-(ප්‍රධාන ප්‍රඥප්තියට 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.)
வாசகம் 2.- (முதன்மைச் சட்டவாக்கத்தில் 28(அ) எனும் புதிய பிரிவை உட்புகுத்துதல்.)
CLAUSE 2. - *(Insertion of new section 28A in the principal enactment.)*

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 28අ වගන්තියේ පැති සටහන ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'පතුලේ ඇදගෙන යනු ලබන දැල් භාවිත කරමින් ධීවර මෙහෙයුම් සිදු කිරීම තහනම් කිරීම.' "

(2) "1 වන පිටුවේ, 11 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'බෝට්ටු මගින් පතුලේ ඇදගෙන යනු ලබන තටු දෙකක් සහිතව හෝ රහිතව' ";

(3) "1 වන පිටුවේ, 13 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'භාවිත කරන දැල් ද, ඇතුළුව පතුලේ ඇදගෙන යනු ලබන' ";

(4) "1 වන පිටුවේ, 20 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් පතුලේ ඇදගෙන යනු ලබන' ";

(5) " 2 වන පිටුවේ, 2 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් පතුලේ ඇදගෙන යනු ලබන' ";

(6) "2 වන පිටුවේ, 8 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් පතුලේ ඇදගෙන යනු ලබන' ";

(7) "2 වන පිටුවේ,12 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'එසේ වුව ද, පතුලේ ඇදගෙන යනු ලබන දැල් භාවිතයට' ";

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 2, as amended, ordered to stand part of the Bill.

3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3 ordered to stand part of the Bill.

4 වන වගන්තිය.-(ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66 වන වගන්තිය සංශෝධනය කිරීම.)
வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 66ஆம் பிரிவினைத் திருத்துதல்.)
CLAUSE 4. - *(Amendment of section 66 of the principal enactment.)*

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

3 වන පිටුවේ, 4 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

[ගරු මහින්ද අමරවීර මහතා]

" 'පතුලේ ඇදගෙන යනු ලබන දැල' යනුවෙන් හඳුන්වනු ලබන්නේ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තිරුත්තම් විඩුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
Amendment put, and agreed to.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I move,

"In Clause 4, line 32 in the English text, after the words "mechanized fishing boats" add the words "except boats not exceeding in length 28 feet, not exceeding 32 horse-power engines and operating only in areas to be prescribed by the Hon. Minister as being areas scientifically approved to be safe from the environmental damage"

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා ඒ සංශෝධනයට එකඟද?

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු සභාපතිතුමනි, ඒ සංශෝධනයට එකඟ නැහැ.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 සහ 6 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
5ஆம், 6ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 5 and 6 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
විනා විඩුක්කප්පට්ටු, ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

උතුරු-නැගෙනහිර ප්‍රදේශවලට නුසුදුසු පෙරසවි නිවාස
வடக்கு, கிழக்குப் பிரதேசங்களுக்கு ஒவ்வாத பொருத்துவீடுகள்
PREFABRICATED HOUSES UNSUITABLE FOR NORTH AND EAST

[பி.ப. 6.27]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
කෞරව කුලුක්කලින් බිරතිත් තවිසාලර් අවර්කලේ, இன்றைய தினம் சபை ஒத்திவைப்பு வேளையில் பின்வரும் பிரேரணையை நான் முன்மொழிகின்றேன்:

"வடக்கு, கிழக்கில் யுத்தத்திற்குப் பின்னரான வீட்டுத் தேவையைப் பூர்த்தி செய்வதற்காக 65,000 வீடுகளைக் கட்டும் வேலைத்திட்டமொன்றை முன்னெடுத்த மீள்குடியேற்ற அமைச்சு, உலோகப் பொருத்து வீடுகளைக் கட்டும் யோசனையை முன்வைத்தது. இதற்காக இரண்டு மாதிரி வீடுகளை யாழ்ப்பாணத்தில் மட்டும் அமைத்து மக்களிடம் விண்ணப்பங்கள் கோரப்பட்டன.

இப்படியான வீடுகள் எமது காலநிலைக்கும் வாழ்க்கை முறைக்கும் ஒவ்வாதவையென்றும் இரட்டிப்புச் செலவுடையதென்றும் சுட்டிக்காட்டி, கல் வீடுகள் கட்டிக் கொடுக்குமாறு கேட்டிருந்தோம். மேலும், தமிழ்த் தேசியக் கூட்டமைப்பின் 16 பாராளுமன்ற உறுப்பினர்களும் கையெழுத்திட்டு இந்தப் பொருத்து வீட்டுத் திட்டத்திற்கு எதிர்ப்பையும் வெளிப்படுத்தியிருந்தோம். அத்துடன் யாழ்ப்பாணம், கிளிநொச்சி, வன்னி மாவட்டங்களில் நடைபெற்ற மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலும் இப்பொருத்து வீட்டுத் திட்டத்திற்கு எதிர்ப்புத் தெரிவிக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட முடியாதென முடிவெடுக்கப்பட்டுள்ளது.

அத்தோடு, கல் வீடுகளை அரைவாசிச் செலவில் கட்டும் முறையொன்றையும் நாமே முற்படுத்தியிருந்தோம். ஆனாலும் 65,000 பொருத்து வீடுகளைக் கட்டாமல் 6,000 பொருத்து வீடுகளைக் கட்டுவதற்குச் சில முன்னெடுப்புகள் நடைபெறுகின்றன.

எனவே, இந்த நடவடிக்கையை அரசாங்கம் கைவிடுவதோடு, கல் வீடுகள் கட்டும் திட்டத்தையும் கால தாமதமில்லாமல் நடைமுறைப்படுத்த வேண்டுமெனக் கோருகின்றேன்."

இலங்கையிலே முதன்முதல் 2003ஆம் ஆண்டில் இவ்வாறான பொருத்து வீட்டுத் திட்டமொன்று கொண்டுவரப் பட்டது. தமிழீழ விடுதலைப் புலிகள் இந்த மண்ணிலே வன்னிப் பகுதிகளைத் தங்களுடைய கட்டுப்பாட்டுக்குள் ஆட்சி நடத்திய காலத்தில், சமாதானம் பேசப்பட்டுக்கொண்டிருந்த வேளையிலே, 4 இலட்சம் ரூபாய் பெறுமதியான இந்த வீட்டுத் திட்டம் கொண்டுவரப்பட்டபோது விடுதலைப் புலிகளால்கூட அது ஆய்வு செய்யப்பட்டு அந்த வீட்டுத் திட்டம், "இந்தச் சூழலுக்கும் மக்களுக்கும் பொருத்தமற்றது" என்ற நிலையில், அக்காலத்திலேயே அது கைவிடப்பட்டது. இப்பொழுது பிரான்சு நாட்டிலே நலிந்துபோயுள்ள சில நிறுவனங்களுக்குப் புத்துயிர் கொடுப்பதற்காகவும் அந்த நாட்டிலே உற்பத்தி செய்யப்படுகின்ற ஆணிகள், 'நட்டு'கள் மற்றும் பொருட்களை இங்கு இறக்குமதி செய்வதற்காகவும் நலிந்து போனவர்களை மீண்டும் கட்டியெழுப்புவதற்காகவும் இந்தப் பொருத்து வீட்டுத் திட்டம் வழங்கப்பட்டிருக்கின்றதா? என்ற ஒரு சந்தேகம் எழுகின்றது.

"கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் கட்டப்பட விருக்கின்ற பொருத்து வீடுகள் இரண்டை மாதிரிக்காகக் கட்டுங்கள்!" என ஏற்கெனவே நான் கௌரவ அமைச்சர் அவர்களை ஒருமுறை கேட்டபொழுது, "இதோ! 3 நாட்களில் நாங்கள் கட்டுகிறோம்" என்று சொல்லியும் இதுவரை கிளிநொச்சியிலோ முல்லைத்தீவிலோ அந்தப் பொருத்து வீடுகளை அந்த மக்கள் கண்களால் பார்க்கமுடியாத நிலைமையிருக்கின்றது; மக்கள் ஏமாற்றப்படுகிறார்கள். இவ்வாறான பொருத்து வீடுகள் பொருத்தமற்றதெனப் பல்வேறு வழிகளில் பல தடவைகள் இந்தச் சபையினூடாகவும் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களுக்கூடாகவும் கடிதங்கள் மூலமாகவும் நாங்கள் கருத்துக்களை முன்வைத்திருந்தும்கூட, அவற்றையெல்லாம் புறந்தள்ளி வைத்துவிட்டு மிகவும் தன்னிச்சையாக இந்த வீட்டுத் திட்டத்தை நடைமுறைப்படுத்துவதில் ஏன் மீள்குடியேற்ற அமைச்சு அதிகூடிய கவனம் செலுத்துகின்றது? என்ற ஓர் ஐயப்பாடு எங்களிடம் இருக்கின்றது. மீண்டும் இந்த வீட்டுத் திட்டங்களை அமுல்படுத்த முனைவது ஏன்? இந்த வீடுகளிலே வாழ்வதற்கு மக்கள் முனைந்தால் அவர்கள் கஷ்டப்படுவார்கள். வெளியிலே 32° ஆக வெப்பநிலை இருக்குமானால் இந்த வீடுகளுக்குள்ளே அது 35 - 37°C வரை காணப்படும். இதைவிட, இந்த வீடுகளிலே வாழ்கின்ற மக்கள் நீண்டகால அடிப்படையில் நோய்களுக்கு உள்ளாக்கப்படுகின்ற சூழல் அதிகமாகவே காணப்படுகிறது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தமிழர்களிடம் கலாசார, பண்பாட்டு அடையாளங்கள் உண்டு. தங்களுடைய சாஸ்திர முறைகளுக்கமைவாக, நீண்டகால பயன்பாட்டின் அடிப்படையில்தான் அவர்கள் தங்களுடைய வீடுகளை அமைத்துக்கொள்கிறார்கள். அவ்வாறான வீட்டினை அமைப்பதற்கு இந்த 21 இலட்சம் ரூபாய் தேவையற்ற பணம் என்பதை நாங்கள் பல தடவைகள் சுட்டிக்காட்டியிருக்கிறோம். 2009ஆம் ஆண்டு யுத்தம் முடிந்த பிற்பாடு ஏற்கெனவே 2010ஆம் ஆண்டிலே 3,50,000/- ரூபாய்க்கு வீட்டுத் திட்டங்கள் அறிமுகம் செய்யப்பட்டன. பின்னர் 5,00,000/- ரூபாய்க்கு இந்திய வீட்டுத் திட்டங்கள் அறிமுகம் செய்யப்பட்டன. அதன் பின்னர் 8,00,000/- ரூபாய்வரை வீட்டுத் திட்டங்கள் அறிமுகம் செய்யப்பட்டன. இப்பொழுது 10,00,000/- ரூபாய்வரை கல் வீடுகள் கட்டுவதற்கு மீள்குடியேற்ற அமைச்சினால் வீட்டுத் திட்டங்கள் அறிமுகம் செய்யப்படுகின்றது.

அங்கே இருக்கின்ற மேசன் தொழிலாளர்கள், தச்சுத் தொழிலாளர்கள் மற்றும் ஏனைய கூலித் தொழிலாளர் களுடைய வேலைகளை நிராகரித்துவிட்டு, எங்கோ ஒரு நாட்டில் இருக்கின்ற நலிந்து போனவர்களை முதன்மைப் படுத்துவதற்காக அல்லது அவர்களிடமிருந்து ஏதாவது கையூட்டல்களைப் பெற்றுக்கொள்வதற்காக இந்த முயற்சிகள் மேற்கொள்ளப்படுகிறதா என்ற சந்தேகம் இருக்கின்றது. அதாவது, இந்த வகையிலான நிலைமைகள் இருக்கக் கூடியதாக அந்த மக்களுடைய தொழில் வாய்ப்புகள் ஏன் நிராகரிக்கப்படுகின்றன? அவர்களுடைய வாழ்க்கை முறை நிராகரிக்கப்படுகின்றது; அவர்களுடைய சமய ஆசார முறைகள் நிராகரிக்கப்படுகின்றன. இந்த நிலையில்தான் இந்த வீட்டுத் திட்டம் பொருத்தமற்றதென்று நாங்கள் சொல்கிறோம். எங்களுடைய கட்சி ரீதியாக நாங்கள் ஆய்வு செய்து, இதற்குப் பதிலாகப் பொருத்தமான ஒரு வீட்டை அமைப்பதற்கான செலவை வங்கிகளுக்கூடாகச் செலுத்தலாமென்ற ஆலோசனையைக்கூட நாங்கள் தெரிவித்திருந்தோம். ஆனால், எல்லா விடயங்களும் புறக்கணிக்கப்பட்ட நிலையில், கட்டாயமாக 6,000 வீடுகளை உடனடியாகக் கட்ட வேண்டுமென்ற ஒரு நிலைப்பாட்டை ஏன், கௌரவ அமைச்சர் முன்னெடுக்கிறாரென்பது எங்களுக்குத் தெரியவில்லை.

இந்த இடத்திலே நாங்கள் ஒன்றை திடமாகச் சொல்கிறோம். இந்த வீட்டுத் திட்டம் தமிழர்களுக்குப் பொருத்தமற்றது! தயவுசெய்து இதனைக் கைவிடுங்கள்! நீங்கள் அந்தத் தொகையை 21 இலட்சம் ரூபாயிலிருந்து 12 இலட்சம் ரூபாயாக அல்லது 16 இலட்சம் ரூபாயாகக் குறைப்பதை விட்டுவிட்டு, வீடில்லாத ஒவ்வொரு குடும்பத்திற்கும் 10 இலட்சம் ரூபாயினை வழங்குங்கள்! அதிலே அவர்கள் தங்களுக்கு விருப்பமான, சொந்தமான ஒரு வீட்டைக் கட்டிக்கொள்வார்கள். அவர்களுடைய சமய ஆசாரப்படி, தட்பவெப்ப சூழ்நிலைகளுக்கு அமைய வீட்டை அமைத்துக்கொள்வதற்கு அவர்களுக்கு வழியேற்படுத்தப்பட வேண்டும். ஏனென்றால், அதில் வாழவேண்டியவர்கள் அந்த மக்கள்! இவ்வாறான ஒரு பொருத்துவீட்டை வன்னியிலே உள்ள ஒரு வனாந்தரத்திலே அமைத்து, அந்த வீட்டிலே அமைச்சர் சுவாமிநாதன் அவர்கள் ஒரு பத்து நாட்கள் இருந்தால் நிலைமை எப்படியிருக்கும் என்பதைத் தயவுசெய்து எண்ணிப் பார்க்குமாறு நான் கேட்கின்றேன். கொழும்பிலிருக்கின்ற AC வீட்டை விட்டுவிட்டு அந்த வனாந்தர வெளியிலே இப்படியான ஒரு பொருத்து வீட்டுக்குள் ஓரிரு நாட்கள் இருந்து பாருங்கள்! அப்போது அந்த மக்களுடைய உண்மையான நிலைமை, அங்குள்ள சூழல் உங்களுக்கு விளங்கும்!

உரும்பிராயிலே நீங்கள் ஒரு வீட்டைக் கட்டியிருந்தீர்கள்! மல்லாகத்திலே ஒரு வீட்டைக் கட்டியிருந்தீர்கள்! நான் நேரடியாகச் சென்று அவற்றைப் பார்வையிட்டேன். அந்த மக்களில் பலர் அவற்றைப் பார்வையிட்டார்கள். பலர் அந்த வீட்டுத் திட்டம் தங்களுக்கு வேண்டாமென்று குறிப்பிடுகின்றார்கள். ஆகவே, எல்லா மக்களுடைய விருப்பங்களையும் கவனத்திலே எடுத்துக்கொள்ளுங்கள்! அந்த மக்களுடைய எண்ணங்களைப் புரிந்துகொள்ளுங்கள்! 16 இலட்சம் ரூபாய் கொடுத்து வீடு கட்டவேண்டிய இடத்தில், அதிலும் பொருத்து வீடுகளைப் பொருத்தவேண்டிய

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

අවசியமில்லை. அந்த மக்களுக்கு 10 இலட்சம் ரூபாயினைக் கையளியுங்கள்! அவர்கள் தங்களுக்குப் பொருத்தமான வீடுகளைத் தாங்களாகவே அமைத்துக் கொள்வார்கள். அதற்கேற்ற வகையில், தங்களிடம் இருக்கின்ற வளங்களை அவர்கள் பயன்படுத்திக் கொள்வார்கள்.

அங்கே மணல் தட்டுப்பாடு இருப்பதாகவும் கல் தட்டுப்பாடு இருப்பதாகவும் சில சாட்டுக்கள் சொல்லப்படுகின்றன. மேலும், தேவையான வளங்களை - பொருட்களைப் பெற்றுக்கொள்ள முடியாதென்றும் செய்திகள் சொல்லப்படுகின்றன. ஆனால், அந்த மக்கள் தங்களுடைய இடங்களிலே வீடுகளை அமைப்பதற்குரிய பொருட்களை இவ்வளவு காலமும் தேடிக்கொண்டார்கள்; இப்பொழுதும் அவர்களால் தேட முடியும். அங்கே இருக்கின்ற பல்வேறு தொழிலாளர்களுக்கும் வேலை வாய்ப்புக்கள் கிடைக்கும். வேலையில்லாமல் எத்தனையாயிரம் பேர் அங்கே காணப்படுகின்றார்கள்! அப்படியானவர்களுக்கு ஒரு சந்தர்ப்பம் கிடைக்கும். இந்த நிலைமைகளை உணர்ந்து, இதனை நல்ல முறையிலே கருத்திற்கொண்டு, அரசாங்கம் செயற்பட வேண்டும். இங்கே இருக்கின்ற சில ஒப்பந்தக்காரர்களை - contractors - மேம்படுத்துவதற்காக அல்லது வெளிநாடுகளில் இருக்கின்ற நலிவுற்ற நிறுவனங்களை வளர்ப்பதற்காக நீங்கள் அந்தத் திட்டத்தை முன்னெடுக்காமல், இந்த வீட்டுத் திட்டம் அவர்களுக்கு சரியானதாக அமைய நீங்கள் வழிசமைக்க வேண்டும். இது மக்கள் நலன்சார்ந்த ஒரு திட்டம்! அவர்கள் வாழுகின்ற வீட்டுக்கான ஒரு திட்டம்! அந்த வகையில், வலுக்கட்டாயமாக அல்லது ஏதோ கோபாவேசத்தோடு அவர்கள் மீது திணிக்க வேண்டுமென்ற எண்ணத்தோடு இதனை மேற்கொள்ள வேண்டாமென்பதை நான் இந்த இடத்திலே வலியுறுத்துகின்றேன்.

இந்த வீட்டுத் திட்டம் தமிழர்களுக்குப் பொருத்தமற்றது. தமிழ் மக்கள் இதனை விரும்பவில்லை. அதிலும் யுத்தத்தால் பாதிக்கப்பட்ட, வெப்பமான சூழலையுடைய கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களைச் சேர்ந்த மக்கள் விரும்பவில்லை. தங்களுடைய அந்தப் பிரதேசத்திலே காணப்படுகின்ற கல், மண், மரங்கள் போன்றவற்றை அவர்களால் பெற முடியும். எனவே, அவர்களுக்கு நீங்கள் பத்து இலட்சம் ரூபாய் ஒதுக்குங்கள்! அவர்கள் தங்களுக்குரிய வீட்டைத் தாங்களே அமைத்துக்கொள்வார்கள் என்று கூறி, இப்பிரேரணையை முன்மொழிகின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

இந்தப் பிரேரணையை வழிமொழிய கௌரவ சார்ள்ஸ் நிர்மலநாதன் அவர்களை அழைக்கின்றேன்.

[பி.ப. 6.35]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! நன்றி. கௌரவ உறுப்பினர் சிறீதரன் அவர்கள் கொண்டுவந்த பொருத்து வீடு சம்பந்தமான ஒத்திவைப்புவேளைப் பிரேரணையை நான் வழிமொழிந்து, இந்தப் பொருத்து வீடுகள் சம்பந்தமான ஒருசில கருத்துக்களையும் சொல்ல விரும்புகின்றேன்.

கௌரவ மீள்குடியேற்ற அமைச்சர் அவர்களே! எங்களுடைய மக்களுக்கு வீடுகள் தேவை என்பதை நான் பலமுறை உங்களிடம் கூறியிருக்கின்றேன். அந்த வீடுகள் எங்களுடைய தமிழ் மக்களுடைய கலாசாரத்தின் அடிப்படையிலும் அவர்கள் நிரந்தரமாக வாழக்கூடியதாகவும் அமைய வேண்டும் என்பதும் எங்களுடைய கருத்தாகும். பொதுமக்களுடைய கருத்தும் அதுவாகத்தான் இருக்கின்றது. உண்மையில் கௌரவ மீள்குடியேற்ற அமைச்சர் அவர்கள் இந்த ஆறாயிரம் வீட்டுத் திட்டத்தை வடக்கில் வழங்குவதற்கான முயற்சிகளை இன்று முன்னெடுப்பதாக நாங்கள் அறிந்திருக்கின்றோம்.

அன்றொரு நாள் காலையில் அங்குள்ள பிரதேசச் செயலகங்கள் ஊடாகக் குறித்த விண்ணப்பப் படிவங்கள் கொடுக்கப்பட்டன. உண்மையில் அவை பொருத்து வீடுகளுக்கானவை என்று மக்களுக்குத் தெரியாது. ஆனால், "வீடு தேவையானவர்கள் அன்று பின்னேரத்திற்கு இடையில் விண்ணப்பங்களைக் கையளிக்க வேண்டும்" என்று இந்தப் பிரதேசச் செயலகங்களால் பணிக்கப்பட்டது. அதன் அடிப்படையில் ஓர் ஆர்வத்தின் நிமித்தம் அன்று பின்னேரத்துக்குள் மக்கள் விண்ணப்பங்களைக் கையளித்தார்கள். அதை நான் ஏன் இங்கு குறிப்பிடுகின்றேன் என்றால், கௌரவ அமைச்சர் அவர்கள் தன்னுடைய உரையில், நிச்சயமாக ஒரு கருத்தைக் குறிப்பிடுவார். அதாவது, "அந்த மாவட்ட மக்களிடமிருந்து பொருத்து வீடுகள் தொடர்பாக இத்தனையாயிரம் விண்ணப்பங்கள் கிடைக்கப்பெற்றிருக்கின்றன. மக்கள் இதற்கு விண்ணப்பிக்கின்றபோது ஏன் நீங்கள் இதனை நிராகரிக்கின்றீர்கள்?" என்ற வகையிலான ஒரு கருத்தை நிச்சயமாக கௌரவ அமைச்சர் அவர்கள் தன்னுடைய உரையில் வெளியிடலாம். அதேநேரத்தில் ஈ.பீ.டீ.பீ. பாராளுமன்ற உறுப்பினர் டக்ளஸ் தேவானந்தா அவர்கள்கூட இந்தப் பொருத்து வீட்டை ஆதரித்துப் பேசுவதற்காக இங்கு அமர்ந்திருக்கின்றார் என்று நான் நினைக்கின்றேன். *[இடையீடு]* கண்டுவிட்டேன், கண்டு விட்டேன்.

உண்மையில் நான் உங்களுடன் நெருங்கிய உறவைப் பேணுபவன். நிரந்தர அரசியல் நோக்கம் கொண்டு பேசுபவன் அல்ல. ஆனால், எங்களுடைய மக்களுக்குத் தவறு இழைக்கப்படும்போது, அதனை பார்த்துக் கொண்டிருக்க முடியாது என்பதனால் இதனைச் சொல்கின்றேன். இப்படியான முயற்சிகள் சம்பந்தப்பட்டவர்கள் ஒருசில சலுகைகளைப் பெற்றுக்கொள்வதற்காக நடக்கின்றன என்பதும் எனக்குத் தெரியும்.

கௌரவ அமைச்சர் அவர்களே, இந்த ஒப்பந்தத்தை பிரான்ஸ் நாட்டினுடைய நிறுவனம் ஒன்று எடுத்திருந்தாலும், உள்ளூரில் - இலங்கையில் இதனைச் செய்யவிருப்பது "குமாரிக்கா எஞ்சினியரிங் பிரைவேட் லிமிரெட்" என்ற நிறுவனம் ஆகும். அதனுடைய பணிப்பாளர் பற்றிய ஒருசில விடயங்களை இங்கு குறிப்பிட விரும்புகின்றேன். ஏனென்றால், இந்தப் பொருத்து வீடுகளை அமைக்கும் திட்டத்தை முன்னெடுக்க இருக்கின்றவர் இவ்வளவு காலம் எப்படி வாழ்ந்துவந்தவர் என்ற விடயத்தை நீங்களும் நாடும் அறிந்துகொள்ள வேண்டும் என்பதனாலாகும். இவர் பற்றி உங்களுக்கு ஏற்கெனவே தெரியும். இருந்தாலும் இந்த நாட்டு மக்களுக்காக இந்தக் கருத்தைச் சொல்ல விரும்புகின்றேன்.

அதாவது, வெத்தசிங்க என்பவர் 2001 முதல் 2004 வரை மட்டும் CTB Chairman ஆக இருந்தவர்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய உரையை முடித்துக்கொள்ள வேண்டும்.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எனக்கு இன்னும் இரண்டு நிமிடங்கள் தாருங்கள்!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
இல்லை, ஓர் உறுப்பினருக்கு ஐந்து நிமிடங்கள்தான் ஒதுக்கப்பட்டிருக்கின்றன.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
எங்களுடைய கட்சியின் மற்றைய உறுப்பினர்களுடைய நேரத்திலிருந்து இரண்டு நிமிடங்கள் தாருங்கள்!

அவருக்கு எதிராக 143 பஸ்கள் தொடர்பாக High Court இல் வழக்கு நடந்தது; அந்த வழக்கு இலக்கம் HC/3604/2007. EPF, ETF பணம் கட்டவில்லை என்பதற்காக பண்டாரவளை நீதிமன்றத்தில் அவருக்கு எதிராக வழக்கு நடைபெற்றது; வழக்கு இலக்கம் 5647/2005. மல்லவாரச்சி என்பவருக்குப் பத்து மில்லியன் ரூபாய் கொடுக்க வேண்டும் என்பதற்காக கொழும்பு High Court இல் அவருக்கு எதிராக வழக்கு நடந்தது; வழக்கு இலக்கம் HC/5480/2011. இலங்கையைப் பொறுத்தளவில் செப்பு, 'பிளாஸ்ரிக்' ஏற்றுமதி செய்யக்கூடாது. இருந்தும் அவர் அதை ஏற்றுமதி செய்தமைக்காகச் சுங்கத் திணைக்களத்தினால் 1,700 மில்லியன் ரூபாய் சம்பந்தமாக அவருக்கு எதிராக வழக்குத் தொடுக்கப்பட்டிருக்கின்றது. இப்படியான ஓர் ஒப்பந்தக்காரரை நீங்கள் இதில் முன்னிலைப்படுத்தி இந்த ஒப்பந்தத்தைச் செய்வதன் நோக்கம் என்ன?

அமைச்சர் சார்ந்த கட்சியை வளர்ப்பதற்குப் பல நடவடிக்கைகள் எடுக்கப்பட்டுக் கொண்டிருக்கின்றன என்று நான் நினைக்கின்றேன். இதில் வருகின்ற பணம் அவர்களுடைய கட்சியை வளர்ப்பதற்காகவா? என்றுகூட எனக்கு ஒரு சந்தேகம் எழுகின்றது. ஏனென்றால், நான் பிரதிநிதித்துவப்படுத்தும் மன்னார் மாவட்டப் பிரதேசங்களில் எவராவது ஐக்கிய தேசியக் கட்சியில் இணைந்தால், அவரது வீட்டுக்குப் போடுவதற்கு இப்பொழுது 5 'சீற்' கொடுக்கிறார்கள். இதற்குரிய காசை இந்த வீட்டுத் திட்டத்திற்கு ஒதுக்கப்பட்ட நிதியிலிருந்துதான் எடுத்துக் கொடுக்கிறார்களோ எனக்குத் தெரியாது. கௌரவ அமைச்சர் அவர்களுக்கு எங்களுடைய மக்களின் கலாசாரம் நன்கு தெரியும். அதன் அடிப்படையில் அவர்களுக்குப் பொருத்தமான, அவர்களின் கலாசாரத்திற்கேற்ற முறையில் நிரந்தரமான கல் வீடுகளை மிகவும் விரைவில் பெற்றுக்கொடுக்க முயற்சியெடுக்க வேண்டும். அதற்கு இந்த அரசாங்கமும் முன்வரவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

இச்சந்தர்ப்பத்திலே அரசியல் கைதிகள் தொடர்பான ஒரு வேண்டுகோளையும் குறிப்பிட விரும்புகின்றேன். இவ்விடயமாக நான் கடந்த 10 நாட்களுக்கு முன்பு அமைச்சர் அவர்களை நேரில் சந்தித்திருந்தேன். மாலைதீவில் கைது செய்யப்பட்ட 3 இளைஞர்கள் தங்களுடைய சிறைத் தண்டனைக் காலம் முடிந்தும் மகசின் சிறைச்சாலையில் இருக்கிறார்கள். அவர்களின் தண்டனைக் காலம் முடிந்த பிறகும் அவர்களைச் சிறையில் வைத்திருப்பது தவறாகும். அவர்களுக்கு மிக விரைவில் விடுதலை பெற்றுக் கொடுப்பதற்கு நீங்கள் நடவடிக்கையெடுப்பதாகக் கூறியிருந்தீர்கள். எனவே, அது தொடர்பான விபரத்தை உங்களுடைய பதிலுரையில் எதிர்பார்த்து நிற்கின்றேன். அத்தோடு, அரசியல் கைதிகள் உங்களை நேரடியாகச் சந்திப்பதற்கு விரும்புகிறார்கள். அதுதொடர்பாக என்னிடம் கேட்டிருந்தார்கள். அந்த விடயத்தையும் நான் உங்களிடம் தெரிவித்திருக்கின்றேன். அதுசம்பந்தமான பதிலையும் உங்களுடைய பதிலுரையின்போது வழங்கவேண்டுமென்று கேட்டுக்கொள்கிறேன். அத்தோடு, இந்தப் பொருத்துவீட்டுத் திட்டத்தை நிறுத்தி, எங்களுடைய மக்களுக்கு மிகவிரைவில் கல்வீட்டுத் திட்டத்தை வழங்க நடவடிக்கையெடுக்க வேண்டுமென்று மீண்டும் கேட்டு, விடைபெறுகின்றேன்.

[අ.භා. 6.41]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින විශේෂයෙන් උතුරු පළාතේ ජනතාවගේ නොවිසඳී තිබෙන මූලික ප්‍රශ්නයක් පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් අදහස් කිහිපයක් පළ කරන්නයි මා බලාපොරොත්තු වන්නේ. අද, දහස් ගණන් ජනතාව ජීවත්වීම සඳහා නිවාසයක් සොයන තත්ත්වයකට පත්වෙලා සිටිනවා. පසු ගිය සතියේ මා ත්‍රිකුණාමලයට ගිය අවස්ථාවේදී මුලතිව් ප්‍රදේශය කරා ගමන් කරන්න අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේදී මා ඇසින් දුටු දේ පාර්ලිමේන්තුවේ සඳහන් කරන්න කැමැතියි. ද්‍රවිඩ ජනතාව වේවා, සිංහල ජනතාව වේවා, මුස්ලිම් ජනතාව වේවා, තහඩු -ෂීට්- ආවරණ යට ජීවත් වනවා; පොල් අතු පැලවල ජීවත් වනවා. ඒ වාගේම තාවකාලිකව ලබාදෙන ලද "ටෙන්ට්" තුළත් ඒ අය ජීවත් වනවා. දහස් ගණන් ජනතාවක් මෙසේ ජීවත් වනවා. ප්‍රධාන සටන හමාරවෙලා දැනට අවුරුදු 7ක් ගතවෙලා තිබෙනවා. නමුත් වාද විවාද ඇතිවීම නිසා මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන් විසඳා ගන්න නොහැකි තත්ත්වයකට පත්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය පෙරළෙන්න කලින් නිවාස දහස් ගණනක් නිම කළා. අලුත් ආණ්ඩුවට මේ නිවාස නිම කිරීම සඳහා විශාල මුදලක් නැති බව තමයි පෙන්නුම් කරන්නේ. ඒ සඳහා මුදල් ණයට ගන්න ඕනෑ. මේක තමයි ඇත්ත තත්ත්වය. එහෙම නැත්නම් තව අවුරුදු 10ක් පමණ අපට යෝජනා ඉදිරිපත් කරමින් ඉන්න පුළුවන්. ඒ කාලය තුළ මේ ජනතාවට ජීවත් වෙන්න සිද්ධ වෙන්නේ මූලික අවශ්‍යතාවන්වත් ඉෂ්ට කර ගත නොහැකි ආකාරයටයි. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මා විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි, මුලතිව් දිස්ත්‍රික්කය පුරා තිබෙන මේ කනගාටුදායක තත්ත්වය විසඳීම සඳහා නිවාස යෝජනා ක්‍රමය යටතේ තිබෙන නිවාස භාර ගැනීමට කැමැති ජනතාවට ඒ නිවාස ලබා දෙන්න කියලා. ඒ නිවාස භාර ගැනීමට අකැමැති අය භාර නොගෙන ඉඳීවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ජාත්‍යන්තර වශයෙන් අපව මනිනවා. මිනිසාගේ මූලික අවශ්‍යතා වන්නේ ආහාර, වස්ත්‍ර හා නිවාසයි. ඒ අනුව අපට ලබා දෙන්න පුළුවන් දේත් ලබා නොදී ඉන්නවා නම්, අපි කරන්නේ ඉතාම බරපතළ දෙයක් බව තමයි අපි දකින්නේ.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම ටික වෙලාවයි ඔබතුමා මට ලබා දී තිබෙන්නේ. ඒ නිසා මගේ කථාව අවසන් කරන්නම්. උතුර පළාතේ ජනතාවගෙන් නිවාස ලබාගන්න කැමැති අයටත් ඇමතිතුමා යෝජනා කරන නිවාස ලබාදීමේ වැඩ පිළිවෙළ පුළුවන් තරම් ප්‍රදේශවල දියත් කරලා, අවුරුදු ගණන් කටුක තත්ත්වයෙන් ජීවිත ගත කරන අයට ඒ සහනය ලබා දෙන්න කියා විශේෂයෙන් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

[පි.ප. 6.45]

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(මාණ්පුමිකු ඩක්ලස් තේවානන්දා)
(The Hon. Douglas Devananda)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய சபை ஒத்திவைப்பு வேளைப் பிரேரணையிலே, எமது மக்களுக்கான வீட்டுத் திட்டம் தொடர்பான விடயம் முன்மொழியப்பட்டிருக்கின்றது. நான் அதனை வரவேற்கின்றேன். அப்பிரேரணையில் மீள்குடியேற்ற அமைச்சினால் செயற்படுத்த இருக்கும் பொருத்து வீட்டுத் திட்டம் பொருத்தமற்றது என்றும் எமது மக்களுக்கு கல் வீடுதான் தேவை என்றும் கருத்து முன்வைக்கப்பட்டிருக் கின்றது. அப்பிரேரணையை வழிமொழிந்து உரையாற்றிய கௌரவ உறுப்பினர் சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள், "இங்கு கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்கள் இப்பிரேணையை ஆதரித்துப் பேச வந்திருக்கிறார்" என்று சொன்னார். கௌரவ சார்ள்ஸ் நிர்மலநாதன் அவர்கள் இதனை ஒரு பட்டிமன்றமாக எடுத்துவிட்டார் போலும். அப்படியான ஒரு பட்டிமன்றத்துக்காக நான் இங்கு வரவில்லை. மாறாக, யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு வீட்டுத் திட்டமொன்றைப் பெற்றுக்கொடுப்பதற்காகத்தான் நான் இந்த விவாதத்தில் கலந்துகொள்ள முன்வந்திருக்கின்றேன். அந்த வகையிலேயே கௌரவ அமைச்சர் சுவாமிநாதன் அவர்கள் செயற்படுத்த இருக்கின்ற வீட்டுத் திட்டத்தை நான் ஆதரிக்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இதோ! உங்களுக்கு என்னிடமுள்ள இந்தப் புகைப்படங்களைக் காட்டுகின்றேன். இப்புகைப்படத்திலுள்ள வீடுகளில் - ஓலைக் குடிசைகளிலும் தகரக் கொட்டில்களிலும் - வாழுகின்ற மக்களுக்குத்தான் இந்த வீட்டுத் திட்டத்தைக் கேட்க நான் இங்கே வந்திருக்கின்றேன். இந்த வீட்டுத் திட்டத்தை விருப்பமுள்ளவர்களுக்கு வழங்கலாம்; யாருக்கும் இதனைத் திணிக்கவேண்டாம். அந்த வகையில், இதற்கு வடக்கு, கிழக்கிலுள்ள 70,000க்கும் மேற்பட்ட மக்கள் தங்களுடைய விருப்பத்தைத் தெரிவித்திருப்பதாக அமைச்சின் செய்திக் குறிப்பொன்று கூறுகின்றது. சமீபத்தில் -

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Member?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கௌரவ உறுப்பினர் டக்ளஸ் தேவானந்தா அவர்கள் காட்டிய புகைப்படங்களிலுள்ள வீடுகளில் வாழுகின்ற மக்களுக்குத்தான் நாங்களும் வீடுகளைக் கேட்கிறோம். ஆனால், நாங்கள் கல் வீடுகளைக் கேட்கிறோம்; அவர் பொருத்துவீடு கேட்கிறார்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

கௌரவ உறுப்பினர் அவர்களே, அது point of Order அல்ல. கௌரவ டக்ளஸ் தேவானந்தா அவர்களே, நீங்கள் தொடரலாம்.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, අපේ රටේ සාක්ෂරතාව සියයට 95කට වඩා වැඩි බව. අපේ රටේ පාසල් අධ්‍යාපනය සඳහා පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවන්ගෙන් සියයට දෙකකට ආසන්න පිරිසකට තමයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා යොමු වෙන්න අවස්ථාව ලැබෙන්නේ. සාමාන්‍යයෙන් එම ප්‍රමාණය අවුරුද්දකට 25,000ට ආසන්න වෙනවා. මේ රටේ අධ්‍යාපනය තුළ තිබෙන මේ විෂමතාව අඩු කරන්න, නැති කරන්න කටයුතු කිරීම අප කාගෙත් වගකීමක් බව මම මුලින්ම සඳහන් කරනවා. අනෙක් ශිෂ්‍ය ප්‍රජාවෙන් යම් පිරිසක් ඉතා වෙහෙස මහන්සියෙන් කටයුතු කරලා බාහිර උපාධියක් ලබා ගන්නවා. මම කියන්න අදහස් කරන්නේ මේකයි. මේ රටේ උපාධියක් ලබාගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට එන දරුවන් ගැනත්, උපාධියක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් අධ්‍යාපනය ලබන පාසල් ශිෂ්‍යයන් ගැනත් රජයක් විධියට ජාතික ප්‍රතිපත්තියක් හදන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, අධ්‍යාපනයේ මේ වෙනස්කම්වලට සාපේක්ෂව මේ උපාධිධාරීන්ට රැකියා ලබා දීමේදීත් ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව තිබෙනවා. විශ්වවිද්‍යාලයට එන දරුවන්ගෙන් විද්‍යා විෂය ධාරාව හදාරන දරුවන්ට උපාධිය අවසන් වෙලා යම් කාල සීමාවක් තුළ රැකියාවක් ලබා ගැනීමේ ගැටලුවක් නැහැ. අපේ රට තුළ ඔවුන්ට යම් අවස්ථාවක් හිමි වෙනවා. වාණිජ උපාධියක් ලබා ගන්නවා නම් සාමාන්‍ය මට්ටමේ රැකියාවක් ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා. මේ රටේ උපාධි ලබා ගන්නා පිරිසෙන් සියයට 60ට විතර ආසන්න පිරිසක් කලා උපාධි තමයි ලබා ගන්නේ, ගරු කථානායකතුමනි. බාහිර උපාධි කරන අපේ සහෝදර ශිෂ්‍යයන් බොහෝ වෙලාවට කලා විෂය ධාරාව ඔස්සේ උපාධිය ලබා ගන්නවා. ඒ හදාරන විෂයයන් අනුව මේ රටේ කොහේවත් රැකියාවක් ලබා ගන්න පුළුවන් මහක් නැහැ. අධ්‍යාපනයේ අවසානයේ උපාධියක් අවශ්‍යයැයි කියන නිසා, උපාධියක් ලබා ගැනීමේ අරමුණින් ඒ දරුවන් තෝරා ගන්නා විෂයයන්වලට අනුව උපාධියක් ලැබුණත්, ඊට ගැළපෙන රැකියාවක් නැහැ. මේ ගැටලුව ගැන අපි හිතන්න ඕනෑ. මේ රටේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් බොහෝ පිරිසක් දැඩි දුෂ්කරතා මධ්‍යයේයි ඒ තැන්වලට එන්නේ. විශේෂයෙන්ම මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටියේ මෙන්ම මොනරාගල, අනුරාධපුර වාගේ දුෂ්කර ප්‍රදේශවල ශිෂ්‍යයෝ පාසල් කාලයේ ඉඳලාම මේ උපාධිය දක්වා එන්නේ මහා ලොකු අපහසුතා රාශියකට මුහුණ දීලා.

අප සොයා බැලුවොත්, සමහර විට මේ දරුවන්ගේ අම්මා, තාත්තා කුඹුරු ගොවිතැන කරන්නේ; නැත්නම් කොහේ හෝ එළවලු ගොවිතැනක් කරන්නේ; එහෙමත් නැත්නම් කාගේ හෝ කුලී වැඩක් තමයි කරන්නේ. ඒ දේවල් කරලා තමන් අතට එන පුංචි මුදලින් තමයි ඒ දෙමව්පියෝ මේ දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබාදෙන්නේ. ඒ අම්මා තාත්තාගේ අරමුණ තමන් විඳින මේ දුක, වේදනාව තමන්ගේ දරුවාට නොදීමයි. තමන්ගේ දරුවා මේ රටේ වැදගත් පුරවැසියෙක් කරන්න, අධ්‍යාපනයේ ඉහළ තැනට යවන්න එදා වේල කන්නේ නැතිව, ඉතාම සංවේදීව ජීවිත එක්ක සටන් කරලා තමයි ඔවුන් මේ දරුවා විශ්වවිද්‍යාලයට එවන්නේ. ගරු කථානායකතුමනි, ඒ දරුවා විශ්වවිද්‍යාලයට එන තැනදී ඒ අහිංසක අම්මා තාත්තාගේ බලාපොරොත්තුව ඉටු කරන්න; ඒකට වටිනාකමක් දෙන්න වැඩසටහනක් රජයන් විධියට ඉතිහාසය පුරාම අපේ ළඟ තිබිලා නැහැ. වර්තමානයේත් නැහැ.

සමහර වෙලාවට දේශපාලන අවශ්‍යතා නිසා මේ උපාධිධාරීන් තමන්ගේ දේශපාලන අතකොළු බවට පත් කරගන්නා යෝජනා ගෙනා ඉතිහාසයන් අප දැක තිබෙනවා. හැබැයි, ඒක නොවෙයි විය යුත්තේ. මේ රටේ උපාධියක් හදාරන කොට, අන්න ඒ උපාධියට රැකියා වෙළෙඳ පොළ තුළ රැකියාවක් ලබාගත හැකි වටිනාකමක් දෙන්න පුළුවන් ආකාරයට අධ්‍යාපනය සකස් වෙන්න ඕනෑ. මොකද, අප දන්නවා විශ්වවිද්‍යාලයට යන අපේ බොහෝ දරුවෝ මහපොළ ආධාර මුදලින් ජීවත් වෙමින් එහි අධ්‍යාපනය ලබන බව. ඔවුන්ට ඒ මුදලත් මදි වන වෙලාවට තමන්ගේ අම්මා කනේ තිබෙන කරාබු දෙක උගස් තියලා සල්ලි එවනවා, තමන්ගේ අධ්‍යාපන කටයුතු අවසන් කර ගන්න කියලා. හැබැයි, අම්මා තාත්තාගේ වේදනාවන් කර පින්නා ගෙන මහා බලාපොරොත්තු රාශියක් එක්ක විශ්වවිද්‍යාලය තුළට යන දරුවාට තමන්ගේ උපාධිය ලබා ගැනීමේ වැඩ කටයුතු අවසන් කර ගන්න දෙන්නෙත් නැතිව සමහර දේශපාලන කණ්ඩායම්වල රැල්ලට මේ අහිංසක දරුවන් මැදි කර ගන්නා අවස්ථාවන් අද මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා මා හිතනවා, ඒකත් රජය යම් තාක් දුරට නිවැරදි තැනකට අරගන්න කටයුතු කරන්න අවශ්‍යයි කියා. මොකද, මේ රටේ බුද්ධිමත්ම කණ්ඩායම, මේ රටේ අනාගතය භාර ගන්න ඉන්න කණ්ඩායම තමයි විශ්වවිද්‍යාලය ඇතුළට යන්නේ. ඒ ශිෂ්‍යයා මේ රටට ආදරය කරන පුරවැසියකු විධියට මේ රටේ ප්‍රශ්නයක් වෙනුවෙන් පෙනී සිටිනවා නම් ඒකේ කිසිම වැරැද්දක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
හොඳයි, ගරු කථානායකතුමනි. ඒ නිසා දුක් විඳලා අධ්‍යාපනය ලබා උපාධියක් අරගෙන එළියට එන දරුවාට රැකියාවක් ලබා ගැනීම සඳහා දේශපාලනඥයන් පසුපස යන්නට සිදු වන සංස්කෘතිය නිම කරන්නට ඕනෑ. මේ රටේ අද වනතුරු තිබෙන දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව මත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ ක්‍රමවේදය නවතින්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. උපාධියට සරිලන රැකියා නිර්මාණය වන විධියට මේ රටේ රැකියා වෙළෙඳ පොළ සකස් කිරීමට රජය අවශ්‍ය පියවර ගන්න ඕනෑ.

ඉතිහාසයේ උපාධිධාරීන්ට රැකියා ලබා දුන්නා. ඒක හොඳයි. හැබැයි, ඒ අයට රැකියා ලබා දීමේ දී මූලික වැටුප වුණේ රුපියල් 15,600යි. උපාධිධාරියකුගේ වටිනාකම, උපාධිධාරියකුගේ අනාගතය රුපියල් පහළොස් දහසකින්, දහසය දහසකින් තීරණය කිරීම වැරැදියි කියලා මා හිතනවා. ගරු කථානායකතුමනි, ඒ නිසා උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ නිසි ක්‍රමවේදයක් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම සඳහා අපේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

උපාධිය ලබා ගෙන එන උපාධිධාරියා හැල්ලුවට ලක් කරමින්, මෙසයක්, පුටුවක් පවා නැති කොහේ හරි තැනක රැකියාවක් දීලා දේශපාලනික වශයෙන් වාසි ගන්න යම් ආණ්ඩුවක් ඉතිහාසයේ කටයුතු කරලා තිබෙනවා නම්; වර්තමානයේ කටයුතු කරනවා නම්, ඒක මේ රටේ අභිංසක ශිෂ්‍ය ප්‍රජාවට කරන අසාධාරණයක් කියලායි මම හිතන්නේ. අන්න ඒ වැරැදි දේශපාලන ක්‍රමවේදය මේ රටින් තුරන් කිරීමට පවතින රජය විධියට මේ යහ පාලන රජය ක්‍රියා කළ යුතුයි. මෙක පූර්වාදර්ශයක් විධියට අරගෙන අනාගතයේ දී මේ රටේ බිහි වන සෑම උපාධිධාරියෙකුටම රට තුළ සුදුසු රැකියාවක් ලබා ගැනීමට හැකිවන පරිදි කටයුතු කළ යුතුයි. ඒ වාගේම මේ රටේ සිටින දහස් සංඛ්‍යාත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බලාපොරොත්තු සහිතව මේ රට තුළ අධ්‍යාපනය හදාරා උපාධියක් ලබා ගැනීමේ වටිනාකම පිළිබඳ හැඟීම ස්ථිරවම හදවත් තුළට දැනෙන විධියට රටේ අධ්‍යාපනය සකස් කළ යුතුයි කියන එක මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්ථිර කරන්න.

[පූ.භා. 10.54]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, "උපාධිධාරීන් සඳහා රැකියා ලබා දීමේ දී නිසි ක්‍රමවේදයක් සකස් කිරීම" කියන යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතර, එම යෝජනාව මා ස්ථිර කරන්න කැමැතියි. ඇත්තටම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වෙතින් මේ වාගේ යෝජනාවක් ඉදිරිපත් වීම අගය කළ යුතුයි. අපේ රටේ හැමදාම තිබුණු ප්‍රශ්නයක් තමයි, රජයේ රැකියා ලබා දීමේ දී දේශපාලන ඇඟිලි ගැසීම් සිදුවීම. උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ දීත් මෙවැනි ආකාරයේ දේශපාලන ඇඟිලි ගැසීම්, අකටයුතුකම් සිද්ධ වෙනවා නම් එය රටක් හැටියට තරුණ පරම්පරාව මුහුණ දෙන බරපතළ අපරාධයක්. සාමාන්‍යයෙන් රටේ වසරකට උපදින්නේ දරුවන් 360,000යි. එයින් දරුවන් 315,000ක් පමණ තමයි පාසල් අධ්‍යාපනයට ඇතුළත් වන්නේ. එයින් 2,80,000ක් පමණ අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත් වෙනවා, 1,60,000ක් පමණ අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් සමත් වෙනවා. හැබැයි අපේ විශ්වවිද්‍යාල පද්ධතියට ඇතුළත් කර ගන්නේ 25,000කට ආසන්න ප්‍රමාණයක්. ඒ කියන්නේ, උපදින දරුවන්ගෙන් සියයට 7ක් පමණ තමයි විශ්වවිද්‍යාලයට ඇතුළත්වෙලා උපාධිධාරියකු බවට පත්වන්නේ. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත්වෙලා උපාධිධාරියකු දක්වා යන ගමනේදී ඒ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳ බැලුවොත්, ඔවුන් පළමුවන ශ්‍රේණියේ සිට, ශිෂ්‍යත්ව විභාගයේදී, සාමාන්‍ය පෙළ විභාගයේදී, උසස් පෙළ විභාගයේදී ඉහළම දක්ෂකම් දක්වා තිබෙනවා. මේ තමයි අපේ රටේ අනාගතය සකස් කිරීමේ තීරණාත්මක බලවේගය. එවැනි අය විශේෂ දැනුමක්, හැකියාවක් ප්‍රගුණ කරගෙන, උපාධියක් ලබාගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට එනකොට ආණ්ඩුවක් සමත් වෙන්න ඕනෑ, ඒ අයගෙන් උපරිම ප්‍රයෝජනය ලබාගන්න. නමුත් දැන් සිදු වී තිබෙන කාලකණ්ණි සහගත ස්වභාවය තමයි, උපාධියක් ලබාගන්නා අතිවිශේෂ කොටසටත් යම් කිසි ආකාරයක ලියවිල්ලක් ලබාගන්න දේශපාලනඥයන් පස්සේ යන්න සිද්ධවීම.

සමහර විට දේශපාලනඥයා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයවත් සමත් නැහැ. සමහර විට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට වාඩිවෙලා වීතරයි. හැබැයි විශේෂවේදී උපාධිධාරියා ආසන සංවිධායක පිටි පස්සේ යනවා, ඔහුගෙන් ලිපියක් ලබාගන්න. පසු ගිය කාලයේ මේවාට ඕනෑ තරම් උදාහරණ තිබුණා. රැකියාවක් ලබාගන්න වීතරක් නොවෙයි, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහාත් ඉතිහාසයේ පළමුවන වතාවට පසු ගිය ආණ්ඩුවේ ප්‍රබලයින් විසින් ලිපි නිකුත් කරන ලද කාලයක් තමයි පසු කර ගෙන ආවේ. එම නිසා කවර ආණ්ඩුවක් බලයට පත් වුණත්, මෙවැනි අකටයුතුකම් ඉවත් කිරීම සඳහා යම් කිසි ක්‍රමවේදයක් සකස් කරන එක හොඳයි.

ගරු කථානායකතුමනි, උපාධිධාරීන් හැමදෙනාම ඉගෙන ගෙන තිබෙන්නේ අපේ රටේ ජනතාවගේ බදු මුදල්වලිනුයි. ඔවුන් බදු මුදල්වලින් ඉගෙන ගෙන විශ්වවිද්‍යාලයෙන් එළියට එනකොට ඇත්තෙන්ම රට සූදානම්වෙලා ඉන්න ඕනෑ, ඔවුන්ගෙන් වැඩක් ගන්න. නමුත් අද උපාධිධාරීන්ට සිද්ධ වෙලා තිබෙන්නේ උපාධිය කරපින්නාගෙන, උපාධි ලෝගුව දාගෙන, උපාධි සහතිකය රෝල් කරගෙන එක්කෝ ලිප්ටන් වටරවුමේ එහෙම නැත්නම් රටේ ප්‍රධාන නගරවල ඉඳගෙන "තමන්ට රැකියාවක් දියව්", "තමන්ගෙන් වැඩක් ගනිව්" කියලා උද්ඝෝෂණ කරන්නයි. ආණ්ඩුවක කාර්යභාරය බවට පත්වෙන්නේ ඔවුන්ගෙන් වැඩ ගැනීමයි. හැබැයි, ඔවුන් ඉල්ලනවා තමන්ගේ දක්ෂතාවට සරිලන විධියේ රැකියාවක් ලබාගෙන තමන්ගේ රටට සේවයක් කරන්න දෙන්න කියලා. මෙහෙම දිගින් දිගටම යනකොට රටක් කොතැනටද යන්නේ කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. අපි කොහොමවත් කියන්නේ නැහැ, මේ සියලු උපාධිධාරීන් රාජ්‍ය යන්ත්‍රණයට පමණක් බඳවා ගන්න ඕනෑ කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි.

මේ වෙලාවේදී අපේ ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා සභාවේ සිටින නිසා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා අද දින "දිවයින" සහ "ද අයිලන්ඩ්" පුවත් පත්වල මුල් පිටුවල තිබෙන වාර්තා වෙතට. පේරාදෙණිය සහ කොළඹ විශ්වවිද්‍යාල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ගලවා ඒවා ස්වාධීන ලාභ උපදවන ආයතන බවට පත් කිරීමේ උත්සාහයක් ආණ්ඩු පක්ෂය පැත්තෙන් යෝජනා වන බවට විශේෂයෙන් "ද අයිලන්ඩ්" පුවත් පත ඔවුන්ගේ ප්‍රධාන ප්‍රවෘත්තිය බවට පත් කරගෙන තිබෙනවා. විශේෂයෙන් අපේ රටේ උපාධිධාරීන් බිහිකරන ප්‍රධාන ආයතන දෙකක් වන කොළඹ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාල මේ විධියට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් ගලවලා, ස්වාධීන කරලා, ඒවා ලාභ ලබන ආයතන බවට පත් කරලා අපේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතියෙන් ගැලවීමේ සැලසුමක් ආණ්ඩුවට තිබෙනවාද? එහෙම නම් එය බරපතළ තත්ත්වයක්. අගමැතිතුමාත් ඉගෙන ගත් කොළඹ විශ්වවිද්‍යාලය එතුමාගේ පාලන කාලය තුළ විශ්වවිද්‍යාල පද්ධතියෙන් ගලවා පෞද්ගලික පැත්තට විවර කර ගන්නවා නම්, ඒක බරපතළ තත්ත්වයක්. ඒ සම්බන්ධයෙන්ගරු ඇමතිතුමාගෙන් වගකිවයුතු පිළිතුරක් මා අපේක්ෂා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එවුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, කථා කරන්න තව මන්ත්‍රීවරයෙක් සිටිනවා නම් එතුමාට අවස්ථාව දීලා ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, I have to reply the Hon. Member.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Yes, that is right.

[පූ.භා. 10.58]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
අපේ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ විධියේ අදහසක් අපේ නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නමුත් තමුන්නාන්සේලා,-

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු මන්ත්‍රීතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හැටියට අපි මේ ගැන සාකච්ඡා කරලාත් නැහැ. හැබැයි, Oversight Committeesවල යම් යම් සංවාද ඇති වනවා. There are discussions. මේ ගැන Oversight Committee එකේ සංවාදයක් ඇති වෙන්න ඇති. නමුත්, එය රජයේ ප්‍රතිපත්තිය නොවෙයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඇත්තටම එම අදහස ඉදිරිපත් වුණේ Oversight Committee එකේදී නොවෙයි. තමුන්නාන්සේලාගේ ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා Subcommittee එකක් දා ගෙන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් කැඳවලා, කොළඹ විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා ඇතුළු නිලධාරීන් කැඳවලා තමයි මේ අදහස් ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් කරන්නේ. [බාධා කිරීම්] එතුමන්ලා තේරුම් ගන්නේ, ඒක ආණ්ඩුවේ අදහසක් විධියටයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන ගන්න ඕනෑ Oversight Committeesවල රාජ්‍ය ප්‍රතිපත්තිය ගැන කථා කරන්නේ නැති බව.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු ඇමතිතුමනි, ඒක ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය නොවෙයි නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
Oversight Committees තිබෙන්නේ, යම් යම් සංවාද ඇති කරලා අධ්‍යාපනය උසස් කරන්නේ කොහොමද කියලා අදහස් දැන ගන්න. රජයේ ප්‍රතිපත්තිය Oversight Committeesවල සාකච්ඡා කරන්නේ නැහැ. ඔබතුමා ඒක දන්නවා ඇති නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
එහෙම නම් එතුමාගේ ඇහේ තිබුණු මොකක් හෝ ප්‍රශ්නයකට කරපු වැඩක්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
Oversight Committeesවලින් අපේ සභාපතිත්වය යටතේ තබා ගත්තේ කීපයයි. අනෙක් Oversight Committeesවල සභාපතිත්වය අපි අනෙකුත් පක්ෂවලට දුන්නා. අපට අවශ්‍ය සියලු දෙනාගේම මතය ලබා ගන්නයි. හැම පක්ෂයකම මතය Oversight Committeesවලට එන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr) Nalinda Jayathissa)
නමුත්, තමුන්නාන්සේලාගේ රජය - [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ කාලේ සිදු වුණේ මෙහෙම නොවෙයි නේ. ඒ කාලයේ උපදේශක කාරක සභා කියලා. ඇමතිවරයා තමයි එතුමාගේ අමාත්‍යාංශයට අදාළ උපදේශක කාරක සභාවේ සභාපති. නමුත් අද එහෙම නොවෙයි. උසස් අධ්‍යාපනයට අදාළ Oversight Committee එකේ මම නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒක මම දන්නවා. නමුත්, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව වෙනුවෙන් SAITM එක වෙනුවෙන් වැඩිපුරම කෑ ගහන කෙනා තමයි ඒ Oversight Committee එකේ බලය පාවිච්චි කරලා මේ ස්වායත්ත වන යෝජනා ගෙනෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
කොළඹ විශ්වවිද්‍යාලයයි, පේරාදෙනිය විශ්වවිද්‍යාලයයි පෞද්ගලික අංශයට පැවරීම ගැන අපි කථා කරලාවත් නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
හොඳයි, එහෙම නම් බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, do you want to reply further on this?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No. I replied a particular query.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ යෝජනාව move කරපු මන්ත්‍රීතුමාට කථා කරන්න තව අවස්ථාවක් අවශ්‍යද? හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට තව අදහස් ප්‍රකාශ කරන්න අවශ්‍යද?

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
සුළු අවස්ථාවක් දෙන්න ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කථා කරන්න.

[පූ.භා. 11.00]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, තව කථිකයෝ සිටියත් කාලය ප්‍රමාණවත් නොවන නිසා මේ යෝජනාව වෙනුවෙන් කථා කරන්න විධියක් නැහැ. මගේ යෝජනාව ස්ථිර කළ ජනතා විමුක්ති පෙරමුණේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට මගේ ගෞරවය පුද කරනවා. ඒ වාගේම එතුමා යොමු කළ ප්‍රශ්නයට ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා උත්තර දුන්නා. අපි දන්නවා ගරු මන්ත්‍රීතුමනි, Sectoral Oversight Committeesවලදී ඕනෑ තරම් යෝජනා ඉදිරිපත් වෙනවා. අදාළ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා තමයි තීන්දුව ගන්නේ. ඒ නිසා ඒක මහා ප්‍රශ්නයක් කරගන්න එපා. අපි සියලු දෙනා එකතු වෙලා අපේ පොදු අරමුණ,- අද ඉදිරිපත් කළ මගේ යෝජනාවේ අරමුණ වෙන්නේ, මේ රටේ අද වනතෙක් නිර්මාණය වෙලා තිබෙන ගැටලුවක් වන උපාධිධාරියාට වටිනාකමක්; උපාධියට වටිනාකමක් ලබාදීමයි. අපි දැක්කා, පසු ගිය කාලයේ එක් දේශපාලනඥයෙකුගේ අවශ්‍යතාව වෙනුවෙන් ඇට බෙදන්න සිද්ධ වුණා; පුටුවක් නැතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්න සිද්ධ වුණාය කියලා. එහෙම නොවෙයි. ඊට එහා ගිය ගෞරවයක්, අභිමානයක් දෙන්න පුළුවන් විධියට මේ රටට අවශ්‍ය නීති සම්පාදනය කරන්න හැකියාව ලැබෙන්න ඕනෑ කියා මා විශ්වාස කරනවා. එම නිසා අද මෙම යෝජනාව මේ උත්තරීතර සභාවට යොමු කරන්න ලැබීම පිළිබඳව ගරු කථානායකතුමාට මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ යෝජනාව, පා.155/'15 - ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා - පැමිණ නැත.

ඊළඟ යෝජනාව, පා. 178/'16 - ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

යුද්ධය නිසා දිවි අහිමි වූ ජනතාව සිහි කිරීම සඳහා අනුස්මරණ ස්මාරකයක් තැනීම සහ සිහිපත් කිරීම සඳහා පොදු දිනයක් වෙන් කිරීම

யுத்தத்தின்போது உயிரிழந்த மக்களை நினைவுகூர்வதற்காக நினைவுத்தூபியொன்றை அமைத்தல் மற்றும் நினைவுகூர்வதற்கான பொதுத் திகதியொன்றைக் குறித்தொதுக்குதல்

BUILDING A MEMORIAL FOR THE PEOPLE WHO LOST THEIR LIVES DUE TO THE WAR AND DECLARING A COMMON DAY TO COMMEMORATE THEM

[மு.ப. 11.03]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் பின்வரும் பிரேரணையை முன்மொழிகின்றேன்.

"வட மாகாணத்தில் கடந்த பல தசாப்தங்களாகக் காணப்பட்ட யுத்த நிலவும் நீங்கி அமைதியானதொரு வாழ்க்கை முறைக்கு மக்கள் பிரவேசித்துள்ளதோடு, கடந்த காலப்பகுதியில் நிலவிய அசாதாரண சூழ்நிலைமையின் காரணமாகவும், யுத்த நிலவரம் காரணமாகவும், படுகொலைக்கு உள்ளான அனைத்து இன, மத மற்றும் சமூகங்களைச் சேர்ந்த, சகல மொழிகளையும் பேசுகின்ற மக்களை இலங்கையர்களாக நினைவுகூர்ந்து, அம்மக்கள் தாய்நாட்டுக்காக மேற்கொண்ட தியாகங்களுக்கு மதிப்பளிப்பதற்காக, வட மாகாணத்தின் ஓமந்தைப்

பிரதேசத்தில் பொருத்தமானதோர் இடத்தில் 'நினைவுத்தூபியொன்றை' அமைப்பதற்கும், மேற்படி யுத்த நிலவரம் காரணமாக உயிரிழந்த சகல இன, மத, மற்றும் மாற்று மொழிகளைப் பேசுகின்ற மக்களை நினைவுகூர்வதற்காகப் பொருத்தமான திகதியொன்றைப் பெயரிட்டு ஒவ்வோர் ஆண்டும் அத்தினத்தைக் கொண்டாடுவதற்கும் அரசாங்கம் நடவடிக்கையெடுக்க வேண்டுமென இப்பாராளுமன்றம் பிரேரிக்கின்றது."

கௌரவ சபாநாயகர் அவர்களே, இதனை நான் நீண்டகால ஒரு முயற்சியாக முன்னெடுத்திருந்தேன். எமது நாட்டில் சுமார் 30 வருட காலமாக இடம்பெற்று முடிந்துள்ள கொடிய யுத்தம் காரணமாக எமது நாட்டிலே வாழ்ந்த அனைத்து இன சமூகங்களைச் சேர்ந்த மக்களும் பல்வேறு நிலைகளில் கொல்லப்பட்டுள்ளனர், அங்கவீனமாக்கப் பட்டுள்ளனர், உடைமைகள் மற்றும் சொத்து அழிவு களுக்குட்படுத்தப்பட்டுள்ளனர், பல்வேறு உள ரீதியிலான பாதிப்புகளுக்குட்பட்டுள்ளனர். இன்று எமது மக்கள் அதிலிருந்து மீண்டுவருவதற்கான முயற்சிகளை மேற் கொள்கின்ற காலகட்டத்தில், பல்வேறு இயற்கை மற்றும் செயற்கை அனர்த்தங்களுக்கு முகங்கொடுப்பதோடு, வடக்கு, கிழக்கு மாகாணங்களில் பல்வேறு கலாசார சீரழிவுகளுக்கும் உள்ளாக்கப்பட்டுள்ளனர்.

இந்த அனைத்து இடர்களையும் பிரச்சினைகளையும் சமாளித்து இந்த நாடு முன்னேற வேண்டுமாயின், அதற்கான பொருளாதார நிலையை எட்ட வேண்டும். எனவே, தற்போதுள்ள பொருளாதார நெருக்கடிகளைச் சமாளித்துக் கொண்டே நிலையான பொருளாதாரத்தை எட்ட வேண்டி யுள்ளது. இந்தப் பொருளாதார நிலையை எட்டுவதற்கான பாதையில் மிக முக்கியமான காரணியாக தேசிய மற்றும் சர்வதேச மட்டத்தில் கருதப்படுவது தேசிய நல்லிணக்கம் மற்றும் இனங்களுக்கிடையிலான சகவாழ்வாகும். இனங்களுக் கிடையில் தொடர்ந்தும் முரண்பாட்டு நிலை தொடருமானால் இந்த நாட்டில் நிலையானதொரு பொருளாதார விருத்தியை நோக்கி நகர முடியாத நிலையே ஏற்படும் என்பது யாவரும் அறிந்துகொண்டுள்ள யதார்த்தமாகும்.

அண்மையில் எமது நாட்டில் தேசிய நல்லிணக்கம் மற்றும் சகவாழ்வு தொடர்பிலான தேசியக் கொள்கை வெளியிட்டு வைக்கப்பட்டுள்ளது. அந்த வகையில், மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களும் பாரிய முயற்சிகளை மேற்கொண்டு இந்த நாட்டில் இனங்களுக்கிடையில் ஐக்கியத்தை ஏற்படுத்துவதற்கும் அதனூடாகத் தேசிய நல்லிணக்கத்தைக் கட்டியெழுப்புவதற்கும் நடவடிக்கைகளையெடுத்து வருவது வரவேற்கத்தக்கது. இவர்களது முயற்சிகளுக்கு ஏனைய அமைச்சர்கள் உள்ளிட்ட நாடாளுமன்ற உறுப்பினர்களும் பலம் சேர்ப்பது குறிப்பிடத்தக்கது.

அந்த வகையில் எமது நாட்டில் தேசிய நல்லிணக்கம் கட்டியெழுப்பப்பட வேண்டுமாயின் முதலில் எமது மக்களது உணர்வு ரீதியான பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும். அவை தீர்க்கப்பட்டால் மாத்திரமே தேசிய நல்லிணக்கமானது உணர்வுபூர்வமானதாகவும் வலுவுள்ளதாகவும் அமைவது சாத்தியமாகும். அன்றி, தேசிய நல்லிணக்கம் என்பது பலவந்தமாகக் கட்டியெழுப்பக்கூடியதல்ல. எமது மக்களின் உணர்வுபூர்வமான பிரச்சினைகள் பல இருக்கின்றன. அவை தொடர்பில் ஏற்கெனவே நான் இந்தச் சபையிலே தொடர்ந்தும் கூறி வந்திருக்கின்றேன். அவற்றில் மிகவும் முக்கியமான ஒரு விடயம் பற்றியதாகவே எனது இன்றைய தனிநபர் பிரேரணை அமைந்துள்ளது என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்த நாட்டில் வாழ்கின்ற தமிழ் மக்கள் தமிழர்களாக வாழ வேண்டும் என்பதற்காக 'இலங்கையர்கள்' என்ற அடையாளத்தை விட்டுக் கொடுக்கவோ, இலங்கையர்களாக வாழவேண்டும் என்பதற் காகத் 'தமிழர்கள்' என்ற அடையாளத்தை விட்டுக் கொடுக்கவோ ஒருபோதும் விரும்புவதில்லை. எமது மக்கள் தமிழர்களாகவும் அதேநேரம் இலங்கையர்களாகவுமே வாழ விரும்புகிறார்கள். இதில் எவ்விதமான சந்தேகமும் இல்லை. எனவே, எமது மக்களது உணர்வுகள் மதிக்கப்பட வேண்டு மென்பதை இங்கு மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன். அந்த வகையில் யுத்தம் காரணமாக உயிரிழந்த தமது உறவுகளை நினைவுகூரும் வகையில் ஒரு பொதுவான நினைவுத்தூபி ஒன்றினை அமைப்பதற்கும் அதற்கென ஒரு தினத்தைப் பிரகடனப்படுத்துவதற்குமாகவே மேற்படி தனிநபர் பிரேரணை என்னால் இங்கு முன்வைக்கப்படுகின்றது.

கடந்த காலத்தில் நான் இதற்கான நடவடிக்கையினை முன்னெடுத்திருந்த நிலையில் அது அக்காலகட்டத்தில் ஏற்றுக்கொள்ளப்பட்டும் நிறைவேற்றப்படாததற்குப் பல்வேறு காரணங்கள் கூறப்பட்டிருந்தாலும் யுத்தத்தை வெற்றிகொண்ட ஓர் அரசு என்ற ரீதியில் அது கேள்விக்குறியாகவே இருந்து விட்டது என்றே நான் கருதுகின்றேன். இத்தகைய எமது மக்களின் உணர்வுபூர்வமான விடயங்கள் உட்படப் பல்வேறு தேவைகள் நிறைவேற்றப்படாமை மற்றும் சிறுபான்மையின மக்களை அவதானத்தில் கொள்ளாது செயற்பட்டமை என்பவற்றின் விளைவாகவே அம்மக்களது தேவைகள் உணர்த்தப்பட்ட நிலையில் அம்மக்களில் அதி பெரும்பான்மை யினரால் இந்த ஆட்சிக்கு வித்திடப்பட்டமை பற்றி இந்த ஆட்சியிலிருக்கின்ற பலரும் ஏற்றுக்கொள்கின்றனர். அந்த நிலையிலேயே அதுவும் "யுத்தத்தை வெற்றிகொண்ட நாம் தமிழ் மக்களது மனங்களை வெல்லவில்லை" என தனது ஆரம்ப சுதந்திர தின உரையில் கருத்து வெளியிட்டிருந்த மேதகு ஜனாதிபதி அவர்களினதும் தமிழ் பேசும் மக்களின் மனங்களை வெல்ல வேண்டுமென்ற முனைப்போடு செயற்படுகின்ற மாண்புமிகு பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களினதும் தலைமையில் இந்த நாட்டின் தேசிய நல்லிணக்கச் செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்ற ஆட்சிக் காலத்தில் இந்தப் பிரேரணை நிறைவேற்றப் படுமென்ற நம்பிக்கையில் இதனை நான் இங்கு முன்வைத்துள்ளேன்.

எமது மக்கள் தங்களது உறவுகளைக் கடந்தகால யுத்தத்தில் பறிகொடுத்துவிட்டு, அந்த உயிர்களின் ஆத்ம சாந்திவேண்டி, மதச்சடங்குகளை மேற்கொண்டு, அவர்களை நினைவு கூர்வதற்காக கடந்த காலங்களில் பல்வேறு சிரமங்களை எதிர்கொண்டிருந்தனர் என்பதை யாவரும் அறிவீர்கள். ஆனால், தற்போதைய நிலையில் அந்தச் சிரமங்கள் ஓரளவுக்கு அகற்றப்பட்டுள்ளமை வரவேற்கத்தக்கது. இருப்பினும், பறிபோன உறவுகளை நினைவுகூர்வதை சில தமிழ் அரசியல் வாதிகள் தங்களது சுயலாப அரசியலுக்குப் பயன்படுத்தி வருகின்றார்கள். இது ஒரு காட்சிப்படுத்துகை என்ற ரீதியில் அமைந்துவருகின்றது. ஒரு விளக்கை ஏற்றிவிட்டு, தங்களது அரசியலை அந்தத் துன்பகரமான இடத்தில் அரங்கேற்றுகின்ற அசிங்கங்கள் அங்கே மேற்கொள்ளப்பட்டு வருகின்றன. இதற்கு காவல்துறையினர் பாதுகாப்பும் வழங்குகிறார்கள். இந்த அரசியல் நாடகங்களை ஏற்காத, விரும்பாத எமது மக்கள் சுயமாக தங்களது உணர்வுகளுக்கும் உயிரிழந்த தமது உறவுகளுக்கும் மரியாதை கொடுத்து அந்த உறவுகளை நினைத்து, நெகிழ்ந்து தங்களது மத வழிபாடுகளை மேற்கொள்ள முற்படுகின்றபோது, காவல்துறை உட்பட பாதுகாப்புத் துறையினரால் பல்வேறு இடையூறுகள்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

ඒ්පටුත්තප්පට්ටු වරුවතෙයුම් ඉඞ්කුක්කාට්ට වේණ්ටියුළ්ළතු.

ඉව්වාරාන සෙයර්පාටුකළ් මූලමාක එමතු මක්කළින් උණර්වුකළ් පුණ්පටුත්තප්පට්ටු වරුකින්ර නිලෙයිල්, ඉන්ත නාට්ටිල් තේසිය නල්ලිණක්කම් සාත්තියප්පටුමා? එන්ර කේල්වියේ එම්මුන් එළුකින්රතු. එමතු මක්කළතු උණර්වු රීතියිලාන ඉව්වාරාන පාතිප්පුකළෛත් තොටර්න්තුම් වළර්ත්තෙටුත්තු, අතනෙ ඔරු වෙරුප්පාක එංකළ් මක්කළ් මනතිල් කුටියිරුත්තාමල්, අන්ත මක්කළින් මනතෛ වෙන්රෙටුක්ක වේණ්ටිය පොරුප්පු ඉන්ත අරසුක්කු උණ්ටු එන නාන් නම්පුකින්රේන්. එනවේ, උයිරිළන්ත උරවුකළෛ නිනෛවුකූර්වතර්කු උරිය වකෛයිල් ඔරු පොතුත්තූපි ඔන්රෛ අමෛප්පතර්කුම්, අතර්කෙන ඔරු තිකතියෛ කුරිත්තොතුක්කුවතර්කුම් ඉන්ත අරසු නටවටික්කෛ එටුප්පතු අවසියමාකුම්. ඉතනෙ ඉන්ත අරසු මේර්කොළ්ළුමිටත්තු, ඉන්ත අරසු මීතු එමතු මක්කළින් නම්පික්කෛකළ් වලුප්පෙරුම් එන්පතිල් සන්තේකමිල්ලෛ.

කෞරව සභානායකර් අවර්කළේ, යුත්තත්තාල් කොල්ලප්පට්ට උරවුකළෛ එමතු මක්කළ් නිනෛවුකූර්කින්ර විටය මානතු, සිල ඉනවාතිකළාල් පුලිකළෛ නිනෛවුකූර්වතාකච් චිත්තරික්කප්පට්ටු, සිංකළ මක්කළ් මත්තියිල් ඉනවාතක් කරුත්තුක්කළ් පරප්පප්පට්ටු වරුවතෙයුම් ඉංකු නාන් සුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. කොල්ලප්පට්ට පුලිකළ් ඉයක්ක උරුප්පිනර්කළෛ නිනෛවුකූර්වතර්කාක පුලිකළ් ඉයක්කත්තිනර් නවම්පර් මාතත්තිල් 27ආම් තිකතියෛ ඔතුක්කියිරුන්තනර්; අතු වේරු. ඉංකු නාන්, කටන්තකාල යුත්තත්තින්පෝතු උයිරිළන්ත උරවුකළෛ එමතු මක්කළ් නිනෛවුකූරුම් වකෛයිල් මේ මාතත්තිල් ඔරු තිනත්තෛක් කුරිත්තොතුක්කුම්පටියේ කෝරුකින්රේන්. අතුවුම්, යුත්තම් කාරණමාක උයිරිළන්ත එමතු නාට්ටින් අනෛත්තු මක්කළෛයුම් නිනෛවුකූරත්තක්ක වකෛයිලේයේ ඉතු අමෛයවේණ්ටුම් එන්පතෛයුම් ඉංකු සුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. එනතු ඉන්තක් කෝරික්කෛයෛ එමතු නාට්ටිලේ පෙරුම්පාන්මෛයාක වාළ්න්තුවරුකින්ර සිංකළ මක්කළිල් ඉනවාතමර්ර පෙරුම්පාලානවර්කළ් ඒර්රුක්කොළ්වාර්කළ් එන්ර නම්පික්කෛ එනක්කිරුක්කිරතු. ඉන්රු කේප්පාප්පුලවු මක්කළ් තංකළතු සොන්තක් කාණි, නිලංකළෛ වේණ්ටි නටත්තුකින්ර පෝරාට්ටත්තිල් සිංකළච් චකෝතරර්කළුම් පංකේර්කිරාර්කළ්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, you have two more minutes to speak.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ළස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
නන්රි!

කාණාමර්පෝන තමතු උරවුකළෛක් කණ්ටරිවතර්කාක එමතු මක්කළ් කිළිනොච්චියිලේ මේර්කොණ්ටු වරුකින්ර අරවළිප් පෝරාට්ටත්තිල් තංකළතු උරවුකළ් කාණමර්පෝන සිංකළච් චකෝතරිකළුම් පංකෙටුත්තු වරුකිරාර්කළ්. මුල්ලිවාය්ක්කාල් පකුතියිල් ඉරුතියාක නටෛපෙර්ර යුත්තත්තිල් උයිරිළන්ත උරවුකළුක්කාන නිනෛවේන්තුම් නිකළ්විල් ඔරු පෙළත්ත තේරර් මනිත නෙයත්තුටන් කලන්තුකොළ්කිරාර්. ඉත්තකෛයතොරු නිලෛමාර්රුක් කාලම් එමතු නාට්ටිලේ ඉන්රු ඒර්පට්ටු වරුකින්රතු. ඉතු මිකවුම් වරවේර්කත්තක්කතොරු මාර්රමාකවේ තෙරිකින්රතු.

කෞරව සභානායකර් අවර්කළේ, තන්නෛක් කොලෛ සෙය්ය වන්ත තමිල් ඉළෛඤරෛයේ මන්නිප්පුක් කොටුත්තු, විටුවිත්ත මනිතාපිමානම් කොණ්ටවර් ජනාතිපතියාක ඉරුක්කින්ර නාට්ටිල්, එමතු නාට්ටිල් යුත්තම් මිකක් කොටුරමාක නටෛපෙර්රුක්කොණ්ටිරුන්ත නිලෛයිල්, තනතු උයිරෛයුම් පොරුට්පටුත්තාතු ඕමන්තෛක්කුප් පෝය් පුලිකළ් ඉයක්කත් තුටන් සමාතාන ඔප්පන්තම් සෙය්තුකොණ්ට මනිතාපිමාන මික්කවර් පිරතමරාක ඉරුක්කින්ර නාට්ටිල්, එමතු මක්කළින් උණර්වුකළ් මතික්කප්පටුම් එන්රේ නාන් නම්පුකින්රේන්. අන්ත වකෛයිලේයේ නාන් ඉන්තත් තනිනපර් පිරේරණෛයෛ මුන්වෛත්තුළ්ළේන් එන්පතෛ ඉංකු තෙරිවිත්තු, විටෛපෙරු කින්රේන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එම යෝජනාව කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු විසින් ස්ථිර කළ යුතුයි. Since there is no one to second this Motion, we have to move on to the next Motion.

යෝජනා අංක 5, පා.177/16, ගරු එම්. එච්. එම්. සල්මාන් මන්ත්‍රීතුමා - පැමිණ නැත.

යෝජනා අංක 6, පා.179/16, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම

போதைப் பொருட்களுக்கு அடிமையானவர்களுக்குப் புனர்வாழ்வளிப்பதற்கான அதிகாரசபையொன்றைத் தாபித்தல்

ESTABLISHMENT OF AN AUTHORITY TO REHABILITATE THE DRUG ADDICTS

[පූ.භා. 11.13]

ගරු සිසිර ජයකොඩි මහතා
(මාණ්පුමිකු சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

" මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අති විශාල තරුණ පිරිසක් ඒවායින් අත්මිදීමට අපේක්ෂාවෙන් පසුවුවද, ඒ සඳහා නිශ්චිත වැඩපිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නොමැතිවීම ඔවුන් මුහුණ දෙන බරපතළ ගැටලුවක්ව ඇති බැවින්, ආගමික නායකයන්ගේ මූලිකත්වයෙන් බෞද්ධ අධ්‍යාත්මික භාවනා ක්‍රම, දේශීය ඖෂධ ක්‍රමයන් හා අනෙකුත් ප්‍රතිකර්ම ක්‍රම ද උපයෝගී කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි"

ගරු කථානායකතුමනි, අපේ රටේ මත්කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ගේ ප්‍රමාණය පසු ගිය දශක කිහිපය තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වෙලා තිබෙන බව අපි දන්නවා. මත්කුඩු භාවිතය නිසා මේ මුළු රටේම අපේ තරුණ පරම්පරාව, පාසල් දරුවන් සහ අපේ සමාජය බරපතළ ව්‍යාකූලතාවකට, අනතුරකට අද ලක්වෙමින් පවතිනවා. පොලිස් කුඩු, උසාවි, බන්ධනාගාර මත්කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ගෙන් පිරී ඉතිරී ගොස් තිබෙනවා.

ගරු කථානායකතුමනි, නීතිඥවරයෙකු හැටියට මා පෑලියගොඩ, කඩවත, මහර ප්‍රදේශවල සේවය කරද්දී දිනපතා හද කම්පාවන සිද්ධියක් දකිනවා. ඒ, තරුණයෝ විශාල පිරිසක් දම්වැල් දා ගෙන, මාංචු දාගෙන හැම දාම උදේට මහේස්ත්‍රාත් උසාවිවලට රැගෙන යාමයි. අපේ උසාවි අද මත්කුඩුවලට ඇබ්බැහි වෙච්ච අහිංසක තරුණයින්ගෙන් පිරී ඉතිරිලා තිබෙනවා. ඒ අහිංසක තරුණයින් චෝදනා ලබන, බන්ධනාගාර ගතවෙන පරිසරයකට අපේ රට පත් වෙලා තිබෙනවා. එම නිසා ඇතිවෙන බරපතළ සමාජ ප්‍රශ්න රාශියක් අපිට පෙනෙන්නට තිබෙනවා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් අපේ රටේ මේ වන විට හෙරොයින් නැමැති මත්ද්‍රව්‍ය භාවිතය ඉතාම බරපතළ ලෙස වැඩි වී තිබෙනවා. 2015 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය ඇබ්බැහිවූවන්ගෙන් 82,482ක ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීම් සිදු කර තිබෙනවා. එම නිසා අපේ රටේ මත්කුඩු සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්ගේ තිබෙන බරපතළ සමාජ ප්‍රශ්නය, ඒ අත් අඩංගුවට ගත් ප්‍රමාණයෙන්ම පෙනෙනවා. හෙරොයින් භාවිතයට ඇබ්බැහිවූවන් එම ප්‍රමාණයෙන් සියයට 32ක් විතර වෙනවා. ලංකාවේ ඇස්තමේන්තුගත, හෙරොයින් නැමැති මත්කුඩු භාවිතය සිදු කරන තැනැත්තන් දළ වශයෙන් හතළිස්පන්දහසකට ආසන්න ප්‍රමාණයක් වෙනවා. එම නිසා ඉතාම භයානක තත්ත්වයකට, නරක තත්ත්වයකට අද මේ රට පත්ව තිබෙනවා. මේ දරුවන් අවසානයේ සමාජ විරෝධී ක්‍රියාකාරකම්වල නියැලෙන සමාජය තුළ සිදු වන මිනීමැරීම්, මංකොල්ලකෑම්, හොරකම්, ස්ත්‍රී දූෂණ හා ඉතාම බරපතළ අපරාධ කරන තැනැත්තන් බවට, චිත්තිකරුවන් බවට පත්වනවා.

ගරු කථානායකතුමනි, මත්කුඩු භාවිතයට ඇබ්බැහි වූ තැනැත්තන් නිවැරදිව පුනරුත්ථාපනය කර සමාජ ගත කිරීමේ වැඩ පිළිවෙළක් අපේ රටට අවශ්‍ය වෙනවා. පළමුවෙන්ම එක පැත්තකින් අපේ රටට නිදහසේ මත්කුඩු, මත්ද්‍රව්‍ය පැමිණීම වැළැක්වීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. නිදහස් ආර්ථිකයත් එක්ක නිදහසේ හැම දෙයක්ම එනවා. එය බොහොම ස්වාභාවික දෙයක්. ගරු කථානායකතුමනි. ඉන්දියාව හා පාකිස්ථානය වැනි රටවල් හරහා මේ සඳහා මුහුදු මාර්ගය විවෘත වෙලා තිබෙනවා. එමඟින් මත්ද්‍රව්‍ය මේ රටට නිදහසේ ගෙන ඒමේ ඉඩකඩ වැඩි වෙලා තිබෙනවා. රුපියල් ශත ආර්ථිකය විසින් අපේ සමාජයේ සියලු ආධ්‍යාත්මික ගුණධර්ම තලා පොඩි පට්ටම් කර විනාශ කර, සුණු විසුණු කරලායි තිබෙන්නේ. එම නිසා ලාභය පදනම් කර ගත් මිනිස් ක්‍රියාකාරකම්වල අවාසනයේ ගොදුරක් වෙන්නේ තමන්ගේ දරුවන් වෙන්නට පුළුවන්; තමන්ගේ නෑදෑයින්ම වෙන්න පුළුවන්. අවසානයේ විනාශ වෙන්නේ ඔවුන්මයි. ලාභ පරමාර්ථ කරගත් සමාජය ඉදිරියට යාමත් සමඟ මේ භයානක විපත තව තව වැඩි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ මත් කුඩු නිදහසේ සංසරණය වීම හා මත් කුඩු මේ රටට පැමිණීම වැළැක්වීම සඳහා එක පැත්තකින් අපි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වෙනවා. ඒ වාගේම මගේ යෝජනාව මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම වුණත්, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන ප්‍රමාණය අවම කර ගැනීමේ වැඩ පිළිවෙළක් පුනරුත්ථාපනයට පෙර පවත්වා ගත යුතු වෙනවා. පළමුවෙනි කාරණය, රටට මත් ද්‍රව්‍ය නිදහසේ ගලා ඒම නැවැත්වීමයි.

දෙවැනි කාරණය, මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන, මත් කුඩුවලට ඇබ්බැහි වන තරුණයින් ප්‍රමාණය අවම කර ගැනීමයි. ඒ සඳහා වූ උත්සාහයක අපි නියැලෙන්න ඕනෑ. ඒ සඳහා අපේ ආධ්‍යාත්මික ඉගැන්වීම්, අපේ ආගමික ඉගැන්වීම්, අපේ මනස සහ හිත සංවර කර ගැනීමේ ක්‍රියාමාර්ග හා පෙරදිග අපේ රටවලට උරුම වුණු ආගමික චින්තන උපයෝගී කර ගැනීමේ හැකියාවක් තිබෙනවා.

මත් කුඩු භාවිතය නිසා ඇති වී තිබෙන සමාජ ව්‍යසන පිළිබඳව පාසල් දරුවන් ඉලක්ක කරගෙන සිදු කරන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යාම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. පූර්ව පියවරක් වශයෙන් එවැනි සංවේදී වූ ක්‍රියාදාමයක් අනුගමනය කර එම දරුවන්ට මත් කුඩු භාවිතයට ඇබ්බැහිවූවන්ගේ අනාගතය පිළිබඳව ඇති බියකරු ස්වභාවය හෙළිදරවු කිරීමෙන් පමණයි අපිට මේ තත්ත්වය වළක්වා ගත හැකි වෙන්නේ. ඒ නිසා පළමුව රටට නිදහසේ මත්ද්‍රව්‍ය පැමිණීම වැළැක්වීමට, එම ජාවාරම නැවැත්වීමට, ඔවුන්ව අත් අඩංගුවට ගැනීමට, ඒ සම්බන්ධ නීති ප්‍රතිපාදන කටයුතු කිරීමට සහ ඒවා භාවිතයට හුරු වෙන පුද්ගලයින් එයින් වැළැක්වීම සඳහා වූ මූලික පියවර ගත යුතු වෙනවා. ඒ පියවරෙන් පසුව තමයි අපිට දැනට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙන්නේ.

ගරු කථානායකතුමනි, අපි දන්නවා අපේ රටේ මෙසේ පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළ දැනටමත් ක්‍රියාත්මක කෙරෙන බව. ඒ සඳහා ආයතන රාශියක් තිබෙනවා. හැබැයි, මේ ආයතනවලින් බොහොමයක් ඒවා මත් ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් අත් අඩංගුවට ගත්ත, ඒ වාගේම බන්ධනාගාරගත වුණු, දඬුවමට සහ දඩවලට ලක් වුණු තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා මෙහෙය වන ආයතනයි. මත් කුඩු භාවිතය සිදුකරන තැනැත්තන්ට ඒ පාප කර්මයෙන් ගැලවීමේ සමාජ අවශ්‍යතාවක් තිබෙනවා.

එසේ ගැලවීමට අවශ්‍ය තැනැත්තෙකු එයින් මිදීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබාගන්න කවර ආයතනයකටද යන්නේ? ඔහු ඒ සඳහා කවර තැනක්ද තෝරා ගන්නේ? ඔවුන් සඳහා කවර පුනරුත්ථාපන වැඩ පිළිවෙළක්ද, අපේ රටේ තිබෙන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, අපි දන්නවා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීමේ හා ඔවුනට ප්‍රතිකාර කිරීමේ මධ්‍යස්ථාන අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය මඟින් පවත්වාගෙන යන බව. ඒ වාගේම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයත්, බන්ධනාගාර දෙපාර්තමේන්තුවත් ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යටතේ පිහිටුවන ලද ආයතන තිබෙනවා. මීට අමතරව මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය සඳහා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්තුමා යටතේ ඉතාම උසස් කාර්යයක් මෑත කාලයේ ක්‍රියාත්මක කරනවා. කලින් එල්ටීටීඊ රැඳවියන් පුනරුත්ථාපනය කරපු ආයතනයේ අද මත් කුඩු භාවිතයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා ඉතා ප්‍රශංසනීය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. එහෙත් මත් ද්‍රව්‍ය භාවිතයට ගොදුරු වූ නමුත් බන්ධනාගාරගත නොවුණු තැනැත්තෙකුට, දඬුවමකට ලක් නොවුණ තැනැත්තෙකුට එයින් ගැලවීම සඳහා වූ සුදුසු අධිකාරියක් හෝ සුදුසු වැඩ පිළිවෙළක් හෝ අපේ රටේ නැහැ.

ගරු කථානායකතුමනි, මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ අතිවිශාල තරුණ පිරිසක් ඒවායෙන් මිදීමට අපේක්ෂාවෙන් පසු වුවද ඒ සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් හෝ ක්‍රමවේදයක් නොමැති වීම ඔවුන් මුහුණ දෙන බරපතළ ගැටලුවක්ව ඇති බැවින්, ආගමික නායකයන්ගේ මූලිකත්වයෙන් බෞද්ධ ආධ්‍යාත්මික භාවනා ක්‍රම,

[ගරු සිසිර ජයකොඩි මහතා]

දේශීය ඖෂධ ක්‍රම හා අනෙකුත් ප්‍රතිකර්ම ක්‍රම ද උපයෝගි කර ගනිමින් මත් කුඩු හා මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූ තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් ගොඩ නඟන්න ඕනෑ කියා මෙම ගරු සභාවට මම යෝජනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

මීළඟට යෝජනාව ස්ථිර කිරීම, ගරු ශ්‍රියානි විජේවික්‍රම මන්ත්‍රීතුමිය.

[පූ.භා. 11.23]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් හෝ ආයතනයක් විශේෂයෙන් පිහිටුවිය යුතුය යන මේ යෝජනාව මා මේ අවස්ථාවේදී ස්ථිර කරමින් ඒ සම්බන්ධයෙන් වචන කීපයක් ඉදිරිපත් කරන්න අවසර ඉල්ලා සිටිනවා. මේ යෝජනාව ඉදිරිපත් කළ අපේ ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කියපු කාරණාවලට අමතරව කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් පසු ගිය කාල සීමාවේ මත් ද්‍රව්‍ය ජාවාරමේ පැවැති උච්චතම අවස්ථා අපි දැක්කා. ඉතා ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරවරයකුව සිටි සරත් අමුණුපිටිය මැතිතුමාගේ ජීවිතය අහිමි කරන්න කුඩු ජාවාරම්කරුවන් ක්‍රියා කළා. ඒ වාගේමයි පසු ගිය දිනවල පිළියන්දලදී වූ සිද්ධිය.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ -Police Narcotic Bureau- නිලධාරීන් වාගේම අහිංසක කුඩා දරුවනුත් ඒ බිල්ලට හසු වුණා. එක් පැත්තකින් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවන් මේ විධියට ජීවිත නැති කරමින් කටයුතු කරනවා වාගේම, අනික් පැත්තෙන් මත් ද්‍රව්‍ය භාවිත කරන්නට මුළු සමාජයම ඇබ්බැහි කරලා සමාජයීය වශයෙන් විශාල විනාශයක් මේ වන විට මේ රට තුළ සිදු කරනවා. ඒ නිසා අද වනකොට මෙය ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන කාරණයක්, ගරු කථානායකතුමනි.

සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා කිව්වා වාගේ මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අද වැඩිපුරම උසාවියට අරගෙන එන්නේ තරුණ අය. ළමයින් සම්බන්ධ කාරණයකදී නම්, එය මහෙස්ත්‍රාත් අධිකරණයකට ඉදිරිපත් කරනවා. අධිකරණයට බලයක් තිබෙනවා, ළමයින් සම්බන්ධයෙන් විශේෂයෙන් ක්‍රියා කරන්නට. ඒ ළමයින් සම්බන්ධයෙන් තීරණයක් දෙන්නට උපරිම භාරකරු විධියට දිසා අධිකරණයක විනිශ්චයකාරවරයෙකුට බලයක් තිබෙනවා. නමුත්, මේ තරුණයන් සම්බන්ධයෙන් ඊට එහා ගිය කටයුත්තක් කළ යුතුව ඇති බවට නීතිඥවරියක විධියටත්, දේශපාලනඥවරියක විධියටත් මට හැඟෙනවා, ගරු කථානායකතුමනි. වයස අවුරුදු 18 ඉක්ම ගියාට ගියාට පස්සේ ඒ ළමයා තව දුරටත් 'ළමයෙකු' කියන තැනට වැටෙන්නේ නැහැ. නමුත්, ඒ තරුණයා සම්බන්ධයෙනුත් ළමයෙකු ගැන බලනවා වාගේම දිසා අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට බලන්න පුළුවන්. ළමයින් ඉදිරිපත් කරන්නේ ඒ අධිකරණවලට. ඒ අධිකරණවල විනිශ්චයකාරවරුන්ටත් මේ අය පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් වූ නියෝග දීමේ ඉඩ ප්‍රස්ථාව ලබා දීමට මේ රට තුළ තිබෙන නීතියත් වෙනස් කරන්න ඕනෑ. ඒක මම දකින කාරණයක්. මොකද, මේ ළමයින් බලෙන් හෝ පුනරුත්ථාපනය සඳහා යවන්නට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. මේ වනකොට හෙරොයින් සහ ගංජා කියන මත් ද්‍රව්‍ය දෙක විෂ මත්පැන්වලට අමතරව බහුල වශයෙන් මේ රට තුළ භාවිත වනවා. විශේෂයෙන්ම හෙරොයින් නිසා කොපමණ විපත් වනවාද කියන එක මේ සමාජයේ සිටින සියලු දෙනාම දන්නා කාරණයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ගංජාවලින් ඊටත් එහා ගිය විනාශයක් වෙමින් පවතිනවා. මේ වනකොට ලංකාවේ වියළි කලාපයේ ඕනෑම දුෂ්කර තැනක වැවෙන ශාකයක් ලෙස ගංජා ශාකය හඳුන්වන්න පුළුවන්.

අද මේ වනකොට ඉන්දියාවේ කේරළ ගංජා ලංකාවේ හැම පළාතකම තිබෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ හැම තැනටම දැන් ඉන්දියාවේ කේරළ ගංජා ඇවිල්ලා තිබෙනවා. මේ විෂ මත් ද්‍රව්‍ය ඉන්දියාව හා පාකිස්තානය වැනි රටවල සිට බෝට්ටු යොදාගෙන මුහුදු මාර්ග ඔස්සේ හොර රහසේ අපේ රටට ගෙනෙනවා. මෙලෙස හොර රහසේ අපේ රටට ගෙන එන විෂ මත් ද්‍රව්‍ය වටලන්නටත් විශේෂයෙන් අපි කටයුතු කළ යුතුයි. පසු ගිය දිනවල ශ්‍රී ලංකා රේගුවෙන් විශාල වශයෙන් මත් ද්‍රව්‍ය වැටලීම් කරනවා අපි දැක්කා. මුහුදු මාර්ග ඔස්සේ බෝට්ටුවලින් මේ විෂ මත් ද්‍රව්‍ය අපේ රටට ගෙන ඒම වළක්වා ගන්න අපි කටයුතු කළ යුතුයි. වැටලීම් කරලා විෂ මත් ද්‍රව්‍ය අපේ රටට ගෙන එන අය අත් අඩංගුවට ගැනීමටත් අපි කටයුතු කළ යුතු වනවා. අපේ රටේ ජාතික ප්‍රශ්නයක් බවට අද මේ මත් ද්‍රව්‍ය උවදුර පත් වෙමින් තිබෙනවා. මත් ද්‍රව්‍ය භාවිතය නිසා තරුණ පරම්පරාව විනාශ වනවා කියන්නේ මේ රටේ අනාගතය විනාශ වනවාය කියන එකයි. මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න ඒ තරුණ පරම්පරාව බේරා ගන්නට ශ්‍රී ලාංකික ජාතියක් වශයෙන් අපි එකතු වෙලා කටයුතු කළ යුතුයි කියන යෝජනාව කරමින් මා නිහඬ වනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි.

මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා.

Order, please! ඊට පෙර ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුම [ගරු කිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

[පූ.භා. 11.29]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අපේ සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ගෙනා "මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම" කියන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් වවන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම සතුටට කාරණයක්.

රටේ මූල්‍ය කළමනාකරණය කරනවා වාගේම, නීති සම්පාදනය කරන්න පුළුවන් උත්තරීතර ස්ථානය මේ පාර්ලිමේන්තුවයි. ඊට අමතරව අපි මොන තරම් යෝජනා පාර්ලිමේන්තුවට ගෙනාවත්, අද සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ගෙනා මේ යෝජනාව ඒ හැම යෝජනාවකටම වඩා වැදගත් යෝජනාවක් බව මා මේ අවස්ථාවේදී කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වකවානුවේ තිබුණු නිදහස් වෙළෙඳ ආර්ථික ක්‍රමයත් එක්ක මේ මත් ද්‍රව්‍ය උවදුර අප රට තුළට ආපු ව්‍යසනයක් බව අපි දන්නවා. 1977න් පස්සේ ආපු සියලු ව්‍යසන අතරින් මත් ද්‍රව්‍ය ව්‍යසනය ගත්තොත්, අද කොළඹ ප්‍රදේශය විතරක් නොවෙයි, මුළු ලංකාවම මේ මත් ද්‍රව්‍ය ව්‍යසනයෙන් වෙළාගෙන තිබෙනවා.

විශේෂයෙන්ම කුඩා පාසල් දරුවන් මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි කර ගන්නා වටපිටාවක් නිර්මාණ වෙලා තිබෙන බව අපි දැකලා තිබෙනවා. හෙරොයින්, ගංජා, මත් පෙති ආදී මේ රටට ඇතුළු වන නොයෙකුත් තාලයේ මත් ද්‍රව්‍ය නිසා මේ වන විට ලොකු ව්‍යසනයක් ඇති වෙලා තිබෙනවා. කොළඹ දිස්ත්‍රික්කයට පසුව මත් ද්‍රව්‍ය නමැති රාක්ෂයා ඊළඟට ඩැහැ ගත්ත දිස්ත්‍රික්කය තමයි ගම්පහ දිස්ත්‍රික්කය. මේ වන විට, සංචාරක කර්මාන්තයත් එක්ක විශාල වශයෙන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු පුද්ගලයන් ඉන්නවා. ඒ සමහරු මං මාවත්වල ගමන් කරද්දී පෙනෙන්නේ ඇවිදින ඇට සැකිලි වාගේයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍ය පාවිච්චි කරපු පුද්ගලයාට විතරක් නොවෙයි එහි ආදීනව විඳින්න සිදු වන්නේ. පළමු වසර 2, 3, 4, 5 යනකල් ඒ පුද්ගලයා එහි ආදීනව විඳියි. ඊට පසුව ඒ පුද්ගලයාගේ නිවසේ අයටත් එහි ආදීනව විඳීමට සිද්ධ වෙනවා. ඊට පසුව වටපිටාවේ ඉන්න අයටත් එහි ආදීනව විඳීමට සිද්ධ වෙනවා. ඊට පසුව තවත් අය මත් ද්‍රව්‍යවලට ගොදුරු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත් ද්‍රව්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවේදී කථා කරනකොට කියන්න තිබෙන කනගාටුදායකම කාරණය තමයි "මත් ද්‍රව්‍ය" සමඟ දේශපාලනඥයන්ගේ නම් ඇදී තිබීම. අද වන විට දේශපාලනඥයන් ගණනාවක් "කුඩු" ඉස්සරහට දමාගෙන දේශපාලනය කරන බවට චෝදනා ලබා තිබෙනවා. ඒ නිසා මේ ඉදිරිපත් කරන පෞද්ගලික මන්ත්‍රී යෝජනා හරියාකාරව අධ්‍යයනය කරලා බලලා, මේ මත් උවදුර නවත්වන්න දැඩි නීති රීති පනවන්න කියලායි අපි ඉල්ලන්නේ. අපි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කථා කරනවා; ආගමික සංහිඳියාව ගැන කථා කරනවා; අනෙකුත් නීති - රීති ගැන කථා කරනවා; කැළි කසළ ගැන කථා කරනවා. එවැනි නොයෙකුත් කාරණා ගැන විශාල වශයෙන් කථා කරනවා. හැබැයි, මේ ව්‍යසනය නවත්වා ගත්තේ නැත්නම් සමහර විට තව ටික කාලයකින් අපට මේ පාර්ලිමේන්තුවට එන්න වෙන්නේත්, හෙරොයින්, ගංජා, කුඩු කාරයොත් එක්ක තමයි. එහෙම පුද්ගලයන් බිහි වෙයි. මිනිස්සු ඒවාට ඇබ්බැහි වෙයි. ඒ නිසා මේ ව්‍යසනය නවත්වන්න නීති හදනවා වාගේම ඒ නීතිවලට අනුව කටයුතු කරන්න ඕනෑ. විශේෂයෙන් පසු ගිය ආණ්ඩුවට චෝදනා කළා, කුඩුකාරයෝ, එතනෝල්කාරයෝ ඉන්න ආණ්ඩුවක් කියලා. නමුත් මේ ආණ්ඩුව බලයට පත් වෙලා දැනට අවුරුදු දෙකහමාරක් වෙනවා. ඒ අවුරුදු දෙකහමාර තුළත් කුඩුකාරයෝ, මත් ද්‍රව්‍ය ව්‍යාපාරිකයෝ වැඩි වෙලා මිසක් අඩු වෙලා නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ මිනිස්සු විශාල වශයෙන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙලා තිබුණත්, ඒ අය පුනරුත්ථාපනය කිරීම සඳහා ආයතන හතරකට-පහකට වඩා කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා පුනරුත්ථාපන කාර්යය සඳහා මීට වඩා වැඩි ආයතන සංඛ්‍යාවක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම, පුනරුත්ථාපනය කිරීමට කලින් දැඩි නීති - රීති පැනවීමත් අවශ්‍ය වෙනවා.

ඊයේ-පෙරේදා අපි දැක්කා, අහිංසක පාසල් දරුවෙක් මත් ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ වෙඩි ප්‍රහාරයකට ගොදුරු වුණ හැටි. ඒ වාගේම, අපි දැක්කා ඔවුන්ට නිලධාරීන් ගොදුරු වූ හැටි. මේ ව්‍යසනයෙන් රට වෙළිලා ඉන්න වෙලාවක අනාගත පරපුර රැක ගන්න, අනාගත පරපුර ආරක්ෂා කර ගන්න අවශ්‍ය නීති සම්පාදනය කරලා, -මේ පාර්ලිමේන්තුවට ඒ නීති ගෙනැල්ලා- ඒ තුළින් මේ කටයුතු දැඩි ලෙස මර්දනය කරන්න කටයුතු කළ යුතුයි කියා මා යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.34]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු සිසිර ජයකොඩි මැතිතුමා මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම කළ යුතුයි ගෙන එන ලද යෝජනාව කාලීන යෝජනාවක්. සුන්දර කථා කියන, සුන්දර ලෝක මවන, වේදිකාවේ ඉඳගෙන මිනිසුන් සනසන්න කථා කරන්න දක්ෂ පාලකයෝ අපේ රටේ තරම් වෙන කොහේවත් නැහැ. මැතිවරණ කාලවලදී හැම පක්ෂයකින්ම ඉදිරිපත් කරන මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනවල තිබෙන සුරංගනා ලෝකයේ කිමිදිලා, අවුරුදු පහකට පස්සේ එකෙන් එළියට ඇවිත් බැලුවාම, ඒ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශවල කියපු සුරංගනා කථාවලින් සියයට 10ක්වත් ඉෂ්ටවෙලා තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. මත් ද්‍රව්‍ය නැති කරනවාය කියන ජනප්‍රිය මාතෘකාවත් ඒ ආකාරයේම වැඩක් තමයි.

විශේෂයෙන්ම අපේ මැතිවරණ කොට්ඨාසය වන කොළොන්නාව ගත්තාම, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉතාම ප්‍රචලිත ප්‍රදේශයක්. වැල්ලම්පිටිය පොලිස් වසම තුළ පමණක් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් හත්දහසකට ආසන්න පිරිසක් ඉන්නවා. ඒ කියන්නේ, ඒ ජනගහනයෙන් සියයට 4කට ආසන්න පිරිසක් හෝ ඊට වැඩි පිරිසක් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා සිටිනවා.

[ගරු එස්. එම්. මරික්කාර් මහතා]

වර්තමාන රජය පැමිණි අලුත ඒ පළාත නියෝජනය කළ මන්ත්‍රීවරයාට විරුද්ධව මත්ද්‍රව්‍ය සම්බන්ධ චෝදනා තිබුණා. "වෙලේසුදා" වැනි ප්‍රසිද්ධ ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධ වුණාය කියලා උසාවිවලදී කරුණු කියැවුණා. ඒ වාගේම, ඔහු අර ප්‍රසිද්ධ ඝාතනය සම්බන්ධයෙන් චෝදනා ලබලා හැංගිලා ඉන්න කාලයේ කොළොන්නාවේ මත්ද්‍රව්‍ය භාවිතය විශාල වශයෙන් අඩුවෙලා තිබුණා. වර්තමාන රජය පැමිණි පසුව විශේෂ කාර්ය බළකාය යොදවලා මත්ද්‍රව්‍ය ඇල්ලුවා; මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෝ ඇල්ලුවා. ඒ නිසා මත්ද්‍රව්‍ය හිඟ වුණා. රුපියල් 500ට තිබුණු කුඩු පැකට් එක රුපියල් 2,000ට ගියා. නමුත් අපි ඇත්ත කියන්න ඕනෑ. අද වන විට ඒක නැවත රුපියල් 1,000ට පමණ අඩුවෙලා තිබෙනවා. ඒ කියන්නේ ආයෙත් "බඩු" තිබෙනවා කියන එකයි. එතකොට, මේකට වරදකාරයෝ කවුද කියලා කණ්ණාඩියක් ඉදිරියට ගිහින් බැලුවාම පෙනෙනවා. කෙසේ වෙතත්, මේ ප්‍රශ්නය විසඳන්නට විධිමත් වැඩ පිළිවෙළක් අපේ රට තුළ නැහැයි කියන එක තමයි මගේ මතය. විශේෂයෙන්ම නීතිය මඟින් මත් ද්‍රව්‍ය පාලනය කිරීම සහ මේ ජාවාරම්කරුවන් ඇල්ලීම අත්‍යවශ්‍යයි.

මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් අපේ රටේ නැහැ කියන එක තමයි මගේ අදහස. ඊළඟට, අනාගතයේ දී මේ සඳහා අබ්බැහි වෙන්න - ගොදුරක් බවට පත් වෙන්න- ඉන්න දරු පරම්පරාව බේරා ගැනීම සඳහා නිසි වැඩ පිළිවෙළක් නැහැ. ඇත්ත වශයෙන්ම අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කියලා එකක් තිබෙනවා. එම අධිකාරියෙන් යම් කිසි වැඩක් කෙරෙනවා ඇති. නමුත්, මේ පිළිබඳව සක්‍රිය වැඩ පිළිවෙළක් දීප ව්‍යාප්ත මට්ටමින් සිදු කෙරෙනවාද; ඔවුන්ට ඒ සඳහා බලයක් තිබෙනවාද; ඔවුන්ට ඒ සඳහා ප්‍රතිපාදන තිබෙනවාද; පහසුකම් තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. මේ සම්බන්ධයෙන් විවිධ ගැටලු තිබෙනවා අප දැකලා තිබෙනවා.

ඒඩිස් රෝගය සම්බන්ධව; එහෙම නැත්නම් මත් ද්‍රව්‍ය සම්බන්ධව, එහෙම නැත්නම් වෙනත් නීති විරෝධී දේවල් සම්බන්ධව විවිධ රාජ්‍ය නොවන ආයතන වැඩමුළු පවත්වන්නේ සුඛෝපභෝගී හෝටල්වල. බිම් මට්ටමට ගිහින්, බිම් මට්ටමේ සිටින target crowd එක වෙනුවෙන් වැඩ කටයුතු කරනවාද කියන ගැටලුව තිබෙනවා. විශේෂයෙන්ම අද අපේ රටේ පොලීසිය මේ සම්බන්ධව දක්වන උනන්දුව ඉතාම මන්දගාමී බව පැහැදිලිව කියන්නට ඕනෑ. මාධ්‍ය හමුවීම් පවත්වනවා. මාධ්‍ය හමුවලට ඇවිත් පොලීසිය ලොකු කථා කියනවා. නමුත්, ඔවුන්ට මත්ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා අඛණ්ඩ සහ නිශ්චිත වැඩ පිළිවෙළක් නැහැ කියන එක අපි පැහැදිලිව කියන්නට ඕනෑ.

ඇක්ටන් සාමිවරයා කියලා තිබෙනවා, " බලය දූෂණයට මහ පාදයි" කියලා. වැඩිපුර බලය, වැඩිපුර දූෂණයට මහ පාදන බව කියනවා. මේ යථාර්ථය නිලධාරීන් සහ දේශපාලනඥයන් යන දෙගොල්ලන්ටම පොදුයි. යම් කිසි පොලිස් ස්ථානයක් ගත්තොත්, ස්ථානාධිපතිවරයාගේ සිට බිම් මට්ටම දක්වා සියලු නිලධාරීන් මේ සඳහා දායකත්වය ලබා දෙනවාද, එහෙම නැත්නම් මේ සඳහා මැදිහත් වෙන රාජ්‍ය ආයතන ඔවුන්ගේ කාර්ය භාරය සියයට සියයක් ඉෂ්ට කරනවාද කියන ගැටලුව තිබෙනවා. ඒක එසේ වුණත්, නොවුණත් යම් කිසි පිරිසක් නීතියෙන් පාලනය කරද්දී, අනෙක් කොටස පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් හෝ නිශ්චිත රාජ්‍ය මට්ටමේ වැඩ පිළිවෙළක් නැති එක ගැන අපි කනගාටු වෙන්න ඕනෑ. ජනාධිපති කාර්ය සාධන බලකාය පත් කරලා තිබෙනවා. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය තිබෙනවා. නමුත්, ප්‍රශ්නය තවමත් එතැනමයි; ගැටලුව තවමත් එහෙමමයි. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවන්නන්ගේ ප්‍රමාණය වැඩිවීම පිළිබඳව නිසි වැඩ පිළිවෙළක් නැහැ. සමහර ප්‍රදේශවල හෙරොයින් පාලනය වෙනකොට, හෙරොයින් භාවිතය අඩු වෙනකොට අනෙක් පැත්තෙන් කේරළ ගංජා වැඩි වෙනවා; එහෙම නැත්නම් මත් පෙති වැඩි වෙනවා; එහෙම නැත්නම් හෂීස් වැඩි වෙනවා. ඒක අපට පැහැදිලියි. කොළොන්නාව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ මම මේ යථාර්ථය දකිනවා.

ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම තව යෝජනාවක් එකතු කරන්න කැමැතියි. වර්තමාන ආණ්ඩුව යටතේ මේක කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මොකද, එතනෝල්කාරයෝ, කුඩුකාරයෝ, ගංජාකාරයෝ කියලා පසු ගිය ආණ්ඩුවේ සිටි සමහර අයට විවිධ චෝදනා නැඟුණා. ඒ චෝදනාවලට ලක් වූ අයගෙන් සමහර අය දැන් මේ ආණ්ඩුවට ජැක් ගහගෙන ඉන්නවා. ඒ චෝදනා ලබපු, මේ ආණ්ඩුවේ ඇමතිකම් දරන අයත් ඉන්නවා. නමුත් වර්තමාන යහපාලන රජය මැතිවරණයේ දී ලබා දුන් පොරොන්දු අනුව නිශ්චිත දින වකවානු සහිත අඛණ්ඩ වැඩ පිළිවෙළක් නීතිය ක්‍රියාත්මක කිරීම පැත්තෙන් ඇති කළ යුතුයි. ඒ වාගේම අනෙක් පැත්තෙන් මේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා නිසි බලයක් තිබෙන නිසි ආයතනයක් පිහිටුවිය යුතුයි.

ඇමතිවරුන්ට නිවාස අලුත්වැඩියා කරන්නත්, වාහන ගන්නත් පරිපූරක ඇස්තමේන්තුවක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණා. අපි ඒවා කරන්න එපා කියලා කියන්නේ නැහැ. නමුත් ප්‍රමුඛ අවශ්‍යතාව ඒකද? මේ මොහොතේ දී අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒවාට මුදල් වෙන් කරනවා වාගේ මේ මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහාත් මෙවර අය වැයෙන් මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න කියලා. අපි අධ්‍යාපනයට බිලියන 85ක් වෙන් කරනවා. සියයට 5ක් අය වැයෙන් වෙන් කරන්න යෝජනා කරනවා. අධ්‍යාපනය සඳහා භෞතික සම්පත් ලබා දෙන්න යෝජනා කරනවා. ඒක ඉතාම හොඳයි. හැබැයි, අද සමහර පාසල්වල මත් කුඩුවලට ඇබ්බැහි වුණු දරුවන් ඉන්නවා. ඔවුන් පාසලේ විවේක කාලයෙන් පස්සේ උගන්වන තරුණ ගුරුවරියන් දිහා බලාගෙන ඉන්නේ අමුතුම විධියකට. ඒක නිසා සමහර ප්‍රදේශවල පාසල්වලට ගුරුවරියන් පත්වීම අරගෙන යන්න කැමැති නැහැ. ආපු අයත් ඉක්මනින් මාරුවීමක් හදාගෙන ආපසු යනවා. ඒ නිසා අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරනවා වාගේම අනාගතයේ දී අපේ තරුණ පරම්පරාව -ඉස්කෝලේ යන දරු පරම්පරාව- මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වළක්වා ගැනීම සඳහාත් යම් වැඩ පිළිවෙළක් හදන්න ඕනෑය කියන එකයි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මේ පිළිබඳවත් කියන්නට ඕනෑ. මේ සඳහන් කරන කාරණා තුනම එකට එකතු වෙන්න ඕනෑ. එනම්, පරිපූරක ඇස්තමේන්තුවලින් වෙන් කරන මුදල්වලින් කොටසක් මේ යෝජනා කරන අධිකාරිය පිහිටුවීම සඳහා යොදවන්නට ඕනෑ, නීතිය ක්‍රියාත්මක කිරීම සිදු වෙන්නට ඕනෑ, අනෙක් පැත්තෙන් පාසල් දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන එක නවත්වන්න ඕනෑ. මේ කාරණා තුනම ඇතුළත් එක වැඩපිළිවෙළක් හදලා ක්‍රියාත්මක කරන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. අනෙක් දේවල් වාගේ මේකත් මන්දගාමී වැඩසටහනක් කරන්නේ නැතුව; ඔහේ යන වැඩසටහනක් කරන්නේ නැතුව, මේ සඳහා රජය මැදිහත් වෙලා විධිමත් සැලැස්මක් සකස් කරන්න කියලා රජයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.41]

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මම ගොඩක් සතුටු වෙනවා. අද උදේ වරුවේ ඉඳලාම ඉදිරිපත් කර තිබෙන යෝජනා කිහිපයක් යටතේ, විශේෂයෙන්ම රටේ කොටුනාරටිය වන් තරුණ පෙළ පීඩාවට පත් වෙලා තිබෙන විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන් කථා කළා. විශේෂයෙන්ම සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවත්, හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවත් වර්තමානයේ කථා කළ යුතුම කාරණා දෙකක් කියලා මම හිතනවා. අපේ තරුණ පෙළ රටේ ආර්ථිකයට දායක කර ගන්න ඕනෑ. නමුත් නිදහසින් පසුව බිහි වූ කිසිම රජයක්, අපේ රටේ තරුණ පෙළ අපේ රටේ ආර්ථිකයට දායක කර ගන්නා තැනට පෙළ ගස්සවා තිබෙනවාද කියන ගැටලුව අපට තිබෙනවා. අද අපේ ගම්වල ඉන්න උපාධිධාරී තරුණ, තරුණියන්ට තමන්ගේ උපාධි සහතිකයත් අරගෙන රැකියාවක් ලබා ගැනීම සඳහා දේශපාලනඥයන් පසු පස යන්නට සිදු වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, උපාධි සහතිකයත් තියාගෙන රැකියාවක් නොමැතිව ගෙදර ඉන්නට සිදුවීම නිසා ඔවුන් මානසිකව වැටිලා ඉන්නවා. එවැනි තත්ත්වයක සිටින ඔවුන්ට කාලය ගෙවලා ගෙවලා, අන්තිමට රැකියාවක් සඳහා අයදුම් කළාම නැවත වතාවක් විභාගයකට මුහුණ දෙන්න සිද්ධ වෙන අවස්ථා තිබෙනවා. මේ තරුණ දරුවන්ගේ තරුණ කාලය three-wheelers ඇතුළේ, එහෙම නැත්නම් බෝක්කු උඩ ගෙවන කොට තමන්ට ඇති වන මානසික පීඩාව නිසාම ඒ අය මත් ද්‍රව්‍යවලට සහ නොයෙකුත් අයථා දේවල්වලට යොමු වෙනවා. එම නිසා තරුණ දරුවන් සම්බන්ධයෙන් අප මීට වඩා සැලකිලිමත් විය යුතුය කියන කාරණය මා මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් ගුරුවරියක් විධියට මමත් දැකපු දෙයක් තමයි, අපේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමාත් කියපු ආකාරයට පාසල් විවේක කාලයෙන් පසුව බොහෝ පාසල්වල හවස් වරුවේ ළමයින්ට උගන්වා ගන්න අමාරුයි කියන කාරණය. විශේෂයෙන් ගුරු මහත්මීන්ට එය අපහසුයි. ඒක ඇත්ත කථාවක්. ඒ වාගේම ගුරු මහත්වරුන්ටත් ඒ කාර්ය කරගෙන යන්න අමාරුයි. මොකද, දරුවෝ පියවි සිහියෙන් නැහැ. විශේෂයෙන්ම මාවා, තුල් වැනි හඳුනාගත් මත් ද්‍රව්‍යයන් පාසල් තුළ විශාල වශයෙන් හුවමාරු වෙනවා. ඒ සඳහා තැරැව්කරුවන් ඉන්නවා. මේ දේවල් වැළැක්වීම සඳහා විශේෂ වැඩ පිළිවෙළවල් සකස් කරන්න කියා මම රජයෙන් ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය තමයි මත්පැන් භාවිතය. උසස් පෙළ පන්තිවල දරුවන් විතරක් නොවෙයි, යන්තම් වයස අවුරුදු 14 පසු කළ දරුවන් පවා නිකම් අත්හදා බැලීමක් වශයෙන් මේ දේවල් කරලා ලොකු ව්‍යසනයන්ට ගොදුරු වන ආකාරය අප දකිනවා. අද ළමයින්ට ගෙවල් ඇතුළේ ඉගෙන ගන්න තිබෙන පරිසරය නැතිවෙමින් තිබෙනවා. දෙමවුපියන් -විශේෂයෙන්ම පියවරුන්- ගෙවල්වල මත් ද්‍රව්‍ය භාවිත කිරීමෙන් ඒ පවුල තුළ සාමය සමගිය නැති වෙලා, දරුවන්ගේ මානසිකත්වය විනාශ වෙලා යනවා.

ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව ඉතාම වැදගත් එකක්. මත් ද්‍රව්‍ය භාවිත කළ අය පුනරුත්ථාපනය කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. අද අපේ තරුණ පරම්පරාව බිලිගන්න මත් ද්‍රව්‍ය වෙළෙඳාමේ යෙදෙන බොහෝ පිරිසක් ඉන්නවා. මේ වනකොට ඇත පිටිසර ගම් දක්වා මේ මත් ද්‍රව්‍ය භාවිතය සුළු වශයෙන් හෝ පැතිර ගිහින් තිබෙනවා. අද තරුණ අය විලාසිතාවක් විධියට මත් ද්‍රව්‍ය භාවිත කරනවා.

මත්ද්‍රව්‍ය වෙළඳාමට විශේෂ වැට බැඳීමක් කිරීම කාලීන අවශ්‍යතාවක් බව පෙන්වා දෙමින් නැවත වතාවක් උපාධිධාරීන් සම්බන්ධයෙනුත් මා වචන කිහිපයක් කථා කරන්න කැමැතියි. මීට පෙර කිව්ව විධියට මේ රටේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් සියයට 4යි විශ්වවිද්‍යාලයට තේරෙන්නේ. සියයට 94ක් ගෙදර ඉන්නවා. එතකොට මේ උසස් අධ්‍යාපනය සකස් වෙලා තිබෙන්නේ මේ සියයට 4 වෙනුවෙන් පමණයි කියන එක මා මේ වෙලාවේ මතක් කරනවා. එහෙම නම් සමාජ ශෝධනයක් සිද්ධ වෙන්න ඕනෑ. අධ්‍යාපන ක්‍රමයේ ඉඳලා වෙනස් වෙන්න ඕනෑ. තරුණ දරුවන් මානසිකව පීඩාවට පත් වන විධියට සකස් වෙලා තිබෙන අධ්‍යාපන ක්‍රමය වෙනස් වෙලා උපාධිධාරීන්ටත් ඒ අයගේ උපාධියට ගැළපෙන විධියට රැකියා ලබා දෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. දේශපාලනඥයන් පිටුපසින් යමින් හෝ නැවත වතාවක් විභාගවලට පෙනී සිටීමින් ඒ අය රැකියාවලට යොමු කරන ක්‍රමයක් නොව, රජයේ මැදිහත් වීමෙන් ඒ උපාධිය ලබන අනුපිළිවෙළ අනුව ඒ උපාධියට ගැළපෙන විධියට, ඒ අයගේ ගෞරවය රැකෙන විධියට ඒ අය රැකියාවලට යොමු කළ යුතුයි.

මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් පුනරුත්ථාපනය කරන්නා සේම මත්ද්‍රව්‍ය විකුණන්නන් සහ ප්‍රචාරණය කරන්නන් සම්බන්ධයෙන්ද වැට බැඳීමක් කරන ලෙස මේ ගරු සභාවට නැවත වතාවක් මතක් කරමින් මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, දැන් රත්නපුර දිස්ත්‍රික්කයේ ඩෙංගුයි, කුඩුයි දෙකම තිබෙනවා නේද?

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගංවතුරත් ආවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගංවතුරත් ආවා.

[පූ.භා. 11.47]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම පිළිබඳ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මතට නිත" වැඩසටහන අපේ ආණ්ඩුව කාලයේ ගෙනැල්ලා මෙයට ලොකු වැඩ පිළිවෙළක් එක්ක කටයුතු කළා. එදා පොලීසිය මැදිහත් වෙලා මත්ද්‍රව්‍ය ගෙනෙන එක ඇල්ලුවාම, "ආසියාවේ මත්ද්‍රව්‍ය තිප්පොළ ලංකාවයි" කියලා කිව්වා. එදා එහෙම කියලා අපේ ආණ්ඩුවට බැන්නා. ඒ කාලය සහ මේ කාලය බැලුවාම වැඩිම කුඩු ප්‍රමාණයක්

[ගරු ජානක වක්කුඹුර මහතා]

ලංකාවට ගෙනැල්ලා තිබෙන්නේ මේ කාලයේයි. ඒවා අල්ලන එක හොඳයි. අල්ලපු නිසා තමයි වැඩියි කියලා හොයා ගත්තේ. මේවා අල්ලන්නේ නැතිව හිටියොත් අඩුයි කියන්න පුළුවන්. අපේ ආණ්ඩුව කාලයේත් අල්ලපු නිසා තමයි වැඩියි කියලා කිව්වේ. දැනුත් ඒ කටයුත්ත ඊටත් වඩා හොඳට කෙරෙන නිසා තමයි දැන් මෙච්චර ප්‍රමාණයක් හසු වෙන්නේ. අද තරුණයින් විශාල පිරිසක් මේවාට ඇබ්බැහි වෙලා ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම, කිසිම මත් ද්‍රව්‍යයක් -සිගරට් එකක්වත්- භාවිත නොකරන කෙනෙක්; ඒවායින් මිදිලා ඉන්න කෙනෙක්; ඕනෑම දහම් පාසලකට ගිහිල්ලා ඒ දරුවකුට හෝ කියලා දෙන්න පුළුවන් කෙනෙක්.

2008 අවුරුද්දේ මම කලවාන මැතිවරණ කොට්ඨාසයේ කඩ හිමියන්ගෙන් ඉල්ලීමක් කළා, "සිගරට් විකුණන එක නතර කරන්න." කියලා. ඒ කාලයේ කඩ හිමියන් සියයට 90ක් විතර සිගරට් විකුණන එක නතර කළා. පාසල් දරුවෝ ඉස්සෙල්ලාම ඇබ්බැහි වෙන්නේ සිගරට් බීමටයි. මේ කාලයේ සමහර දරුවෝ මානසික ආබාධිත අයට දෙන පෙති වර්ගයක් අරගෙන ඒවා බොනවා මත් වෙන්න. ඒ පෙති වර්ග කොහොම ගන්නවාද කියලා දන්නේ නැහැ. ඒක නිසා මොන ක්‍රමයෙන් හරි දරුවෝ බලනවා මත් වෙන්නේ කොහොමද කියලා. ඒ නිසා අපි මේක නතර කරන්න ඕනෑ. මත් ද්‍රව්‍ය ගන්න අය පුනරුත්ථාපනය කරන්න වෙලා තිබෙන්නේ ඇයි? මීනිස්සු මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙන්නේ ඒවා ලබා ගැනීමට පහසුකම තිබෙන නිසා. මත් ද්‍රව්‍ය ලබා ගැනීමේ තිබෙන පහසුකමයි නැති කරන්න ඕනෑ. සමහර පුනරුත්ථාපනය කරන මධ්‍යස්ථානවලට අරගෙන යන අයට ගොඩාක් වෙලාවට ගහනවා. ගහලා කියනවා, "මත් ද්‍රව්‍ය පාවිච්චි කරන්න එපා." කියලා. පුනරුත්ථාපන මධ්‍යස්ථානයක හිටපු කෙනෙක් මට හම්බ වෙලා කිව්වා, "මැරුවේ නැති එක විතරයි." කියලා. හැබැයි, ඒ මනුස්සයා එළියට ඇවිල්ලා ආයෙත් බොනවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය එහෙම හදන්න බැහැ. ඒ අයගේ මනසයි හදන්න ඕනෑ. මේවා බිව්වාම මොකද වෙන්නේ කියලා ඒ අයට දැනෙන විධියට තේරුම් කර දෙන්න ඕනෑ.

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණාම දරු පවුල් එහෙම පිටින්ම නැති වෙනවා. තාත්තා බීලා ගෙදර එනකොට දරුවා ඇඳ යටට රිංගනවා. අපි ගෙදර යන කොට අපේ දරුවෝ ඉස්සරහට දුවගෙන ඇවිල්ලා අතේ එල්ලෙනවා. සමහර තාත්තලා ගෙදර එනකොට දරුවන් බයේ ඇඳ යට හැංගෙනවා. ඒකට හේතුව තමයි තාත්තා ගෙදර එන්නේ තාත්තා හැටියට නොවෙයි, මත් වතුර හරි මොනවා හරි බීලා විකෘති වෙච්ච මනුස්සයෙක් විධියටයි. ඒ නිසා පුංචි දරුවෝ මේකෙන් ගොඩාක් පීඩාවට පත් වෙනවා. ඒ නිසා මේ උවදුර නැති කිරීම අපි සියලු දෙනාගේම වගකීමක් වී තිබෙනවා. කිසිම භේදයකින් තොරව අපි සියලුදෙනා ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ.

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කරනවාට වඩා ඒවාට යොමු වන ප්‍රමාණයයි අඩු කරන්න ඕනෑ. අද වන විට අපේ රටේ පුනරුත්ථාපන කඳවුරුවල විශාල පිරිසක් ඉන්නවා. සමහර අය පුනරුත්ථාපන කඳවුරුවලට ගිහින් දැම්මාම පැනලා එනවා. ඒකට හේතු තිබෙනවා. යම් යම් ප්‍රශ්න තිබෙනවා. අරක්කු මිල වැඩි කළා කියලා බොන අයගේ ප්‍රමාණය අඩු වෙලා නැහැ. ඒ වාගේම, විකිණෙන ප්‍රමාණය අඩු වෙලාත් නැහැ. මිල වැඩි කරලා කොහොමටවත් මේක කරන්න බැහැ. එහෙම නම් නතර කරලාම දාන්න ඕනෑ. ඒක නිසා මේකට යම්කිසි වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ. අරක්කු මිල වැඩි වෙන කොට අපේ ගම්වල තිබෙන කසිප්පු වැඩි වෙලා තිබෙනවා. දැන් කසිප්පු බීලා මිනිස්සු මැරෙන ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. සුරාබදු නිලධාරින් ගිහිල්ලා ඒවා හරියට අල්ලන්නේ නැහැ. කසිප්පු නිෂ්පාදනය නවත්වන්න පුළුවන්. නමුත්, එහෙම නවත්වන්න වැඩ පිළිවෙළක් නැහැ. ගොඩාක් තැන්වල දැන් කසිප්පු ව්‍යාපාරය කරන්නේ අල්ලන්න බැරි විධියටයි. වෙලක හරි, ගහක් යට හරි තියලා සල්ලි අරගෙන කියනවා, "අන්න අතන තිබෙනවා." කියලා. ඒක දන්නවා, අල්ලන්න යන කට්ටිය. ඒ ගොල්ලන් කියනවා, "අල්ලන්න අතේ බඩු නැහැ නේ" කියලා. දැන් කුඩු විකුණන්නෙත් අලුත් ක්‍රමයකට. කොහේ හරි තැනක තියලා අතට සල්ලි දුන්නාම කියනවා, "අන්න අතන තිබෙනවා ගන්න" කියලා. ඉතින් අතින් දුන්නේ නැහැ කියලා මෙවැනි මත්ද්‍රව්‍ය අල්ලන්නේ නැහැ. ඒ නිසා අපි කියනවා, මත් ද්‍රව්‍ය වැටලීම වැඩි කරන්න ඕනෑ කියලා.

වාහනය බලලා, licence එක බලනවා. එක වාහනයම දවස් දෙක තුන එක්කෙනාම බලනවා. නමුත් ඒක අවුරුද්ද පැනලා ද කියලා හරියට බලන්නේ නැහැ. මේ රටේ ඊට වඩා බලන්න ඕනෑ මත් උවදුර නැති කරන්නේ කොහොමද කියලායි. මේවා අල්ලන්න පුළුවන්. අලුතෙන් OIC මහත්තයෙක් ආවාම මත් ද්‍රව්‍ය අල්ලනවා. ටික දවසක් ගියාම ඒ තත්ත්වය නැති වෙනවා. නමුත් ඊට හේතුව අපි දන්නේ නැහැ. ඔබතුමන්ලා බැලුවොත් ඕනෑම තැනක වැඩියෙන්ම මේ ව්‍යාපාර අල්ලන කාලය තමයි අලුතෙන් නිලධාරින් පත් වුණු අවස්ථාව. ඊට පස්සේ අල්ලන්නේ නැහැ. ඒ නිසා ඒක නැති කරන්න, ඒක හොයලා බලන්න තවත් පිරිසක් යොදවා හෝ වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

අපේ ගරු සිසිර ජයකොඩි මැතිතුමා ගෙන එන ලද මෙම යෝජනාව ඉතා හොඳයි. මත් උවදුරට හසු වූ එහෙම නැත්නම් මත් ද්‍රව්‍ය භාවිතයට යොමු වූ අය පුනරුත්ථාපනය කරලා හෝ ඔවුන්ට තමන්ගේ දරු පවුලත් එක්ක සතුටින් සිටීමේ අවස්ථාව උදා කරන්න ඕනෑ. තමන්ගේ තාත්තා ගෙදර එනකොට දරුවන්ට "තාත්තා" කියලා කථා කරන්න පුළුවන් වන, සතුටින් ජීවත් වෙන්න පුළුවන් වන පිරිසක් නැවතත් ඇති කරන්න ඕනෑ. ඒ වාගේම ඒ අය පුනරුත්ථාපනය වෙලා එළියට ගියාට පසු සොයා බලන්න ඕනෑ, ඔවුන් නැවත වරක් පරණ ක්‍රමයටම යනවාද කියලා. අපි දන්නවා, සමහර අය හිරේ ඇරියාට හිරේ ඉඳලා ආපු ගමන් නැවත ඒ වැඩේම කරලා ආපසු හිරේට යනවා. මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච අය පුනරුත්ථාපනය කළත් එළියට ඇවිල්ලා ටික දවසක් යනකොට ඒ අය නැවත වෙනස් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා, අරියධම්ම ස්වාමීන්වහන්සේ සිටිය කාලයේ උන්වහන්සේ රත්නපුරයට තුන් මාසයක් වැඩම කරලා සිටියා. ඒ කාලයේ අපේ ගමේ හැමදාම බීබී ඇවිදින පිරිසක් හිටියා. ඒ අය උන්වහන්සේගෙන් බණ අහලා ඔවුන්ගේ ජීවිත කාලයම ආපසු ඒ උවදුරට ඇබ්බැහි නොවී සිටියා. ඒ නිසා මනස හැදුවොත් ඒ අයව මත් උවදුරෙන් බේරාගන්න පුළුවන්. ඒ නිසා අපි කියන්නේ ඔවුන්ගේ මනස හදලා තමන්ගේ දරු පවුලත් සමඟ යා හැකි සමාජයේ හොඳ පුරවැසියන් බවට ඔවුන්ව පත් කරන්න ඕනෑ කියලායි. ඒ සඳහා අපි සියලු දෙනාම එකතු වෙලා මේ කටයුත්ත කරමු. මේ යෝජනාව ගෙන එන ලද ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 04ක් වැනි කාලයක් තමයි තිබෙන්නේ.

[පූ.භා. 11.55]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලීන යෝජනාවක් ගෙන ඒම පිළිබඳව ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය පුද කරනවා. ඇත්තෙන්ම මම එතුමාට කියන්න ඕනෑ, මෙම යෝජනාව ගෙනා වකවානුව සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙන බව. ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව ගෙනෙන්න තිබුණේ මීට කලිනුයි. මොකද, මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීමට තිබුණේ මීට කලිනුයි. එයට බොහොම ප්‍රමාද වෙලා තිබෙනවා.

රටක ජනතාව තමන් සහ තමන්ගේ දූ දරුවන් ගැන මෙන්ම, තම රටේ පැවැත්ම, සංවර්ධනය හා ප්‍රගතිය අපේක්ෂා කරගෙන දහසකුත් එකක් බලාපොරොත්තු තබමින් තමයි ප්‍රාදේශීය සභා, පළාත් සභා සහ පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයෝ වාගේම ජනාධිපතිවරයෙකු හෝ ජනාධිපතිවරියක පත් කර ගන්නේ. පසු ගිය වසර 70 පුරාම අපේ රටේ ජනතාවගේ බලාපොරොත්තුව වුණේත් එයයි. නමුත්, විවිධාකාරවූ පොරොන්දු දහසකුත් එකක් දීලා -කප්පරක් පොරොන්දු දීලා- බලයට පත් වන මහජන නියෝජිතයෝ බලය ගත්තායින් පසු ක්‍රියාත්මක වෙන්නේ අනෙක් පැත්තට කියන එක අපි තේරුම් ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මත්ද්‍රව්‍ය" කියන මේ මහා දැවැන්ත විනාශයට මූලික වුණු අය තමයි, මේ රටේ දේශපාලනඥයෝ. දේශපාලනඥයන්ගේ අනුදැනුම මත තමයි එයාලාගේ හෙංචයියලා, හිතවත් ව්‍යාපාරිකයෝ මේ මහා දැවැන්ත විනාශකාරී කර්තව්‍යයට මැදිහත් වෙලා මුළු රටක්, සමාජයක් විනාශ කිරීමට කැස කවන්නේ. එම නිසා අපි පළමුව පුනරුත්ථාපනය කළ යුත්තේ වෙන කවුරුවත් නොවෙයි; මේ විනාශයට සෘජුව මැදිහත් වෙලා, විනාශය ඉදිරියට ගෙන යන දේශපාලනඥයෝ සහ ඊට අනුකූලතාව දක්වන ඒ අයගේ හෙංචයියලා කියන එක මා අවධාරණය කරනවා.

දළ වශයෙන් ගත්තොත් අපේ රටේ පාසල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන දරුවෝ මේ මොහොත වන විට ලක්ෂ 43ක් 44ක් විතර ඉන්නවා. ඊට අමතරව අධ්‍යාපනය අතරමඟ නතර කළ තරුණ වයසේ දරුවන් බලාපොරොත්තු සුන් කරගෙන නන්නත්තාර වී සිටිනවා. ඒ අයගේ ප්‍රාර්ථනාවන් ඉෂ්ට නොවීම නිසා, ඒ වාගේම අසහනයෙන් පෙළෙන ඒ අයගේ අපේක්ෂාවන් ඉෂ්ට කිරීමට රජයන් අපොහොසත් වී තිබෙන නිසා ඒ දරුවන් අද සමාජ බේදවාචකයන් බවට පත්වෙලා තිබෙනවා. ඒ අය ලෙහෙසි පහසු මාර්ග සොයනවා. අද රජයන්, මා කිව්ව වගඋත්තරකරුවන් ඒ පහසු මාර්ග සමාජය පුරාම පතුරුවා තිබෙනවා. ඒ නිසා මේ දරුවන්ගේ තරුණ ජීවිත, ශිෂ්‍ය ජීවිත මුළුමනින්ම විනාශ කිරීමට අද මේ මත් ද්‍රව්‍ය පාදක වෙලා තිබෙනවාය කියන එක මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ තරුණ පරපුර විශ්වවිද්‍යාලවලින් හෝ පාසල්වලින් හෝ කාර්මික විද්‍යාලවලින් හෝ බහු තාක්ෂණික ආයතනවලින් හෝ කුමන ආකාරයකින් හෝ අධ්‍යාපනය අවසන් කරලා සමාජයට යනවා. සමාජයට ගියාට පස්සේ ඒ අයගේ අධ්‍යාපන ක්‍රියාවලියට සාපේක්ෂව තමන්ගේ හැකියාව අනුව රටේ සංවර්ධනයට මැදිහත් වෙන්න අවකාශ නොමැති නිසා ඒ දරුවෝ බරපතළ අසහනයකට, බලාපොරොත්තු සුන් වීමකට පත්වෙනවා. ඒ නිසා ඒ අයට සිද්ධවෙලා තිබෙනවා, වෙනත් ක්‍රියා මාර්ගවලට යොමු වෙන්න. ඔවුන්ගේ බලාපොරොත්තු සුන් වුණාට පස්සේ ඒ අයට පහසුවෙන්ම කරන්න තිබෙන්නේ කුමන හෝ ආකාරයකට මත් ද්‍රව්‍යයකට ඇබ්බැහි වීමයි. ඒ තුළින් තාවකාලික සුවයක් ලබාගන්න පුළුවන්ය කියා ඒ ගොල්ලෝ විශ්වාස කරනවා. මත් ද්‍රව්‍ය භාවිත කිරීමෙන් ඒ ගොල්ලන්ගේ මුළු ජීවිතයම විනාශ වනවාය කියන එක ඒ ගොල්ලන්ට තේරෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි දරුවන් අපේක්ෂා භංගත්වයට පත්වෙලා මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වන්නේ සමහර විට රටේ පාලකයන්ගේ අමනෝඥ ක්‍රියා කලාපය නිසාය කියන එක අපි විශ්වාස කරනවා. ආණ්ඩුව, රජය මැදිහත්වෙලා තරුණ තරුණියන්ගේ හැකියාවන්, දක්ෂතාවන් හඳුනාගෙන ඒ අනුව ඒ අයට රැකියා අවස්ථා සලසා දෙනවා නම් ඒ අය මෙවැනි විනාශකාරී දේවලට ඇබ්බැහි වන්නේ නැහැ. තරුණ අසහනයට උත්තර විධියට, වැරදි උත්තර විධියට රජයන්, ආණ්ඩු හිතාමතාම දරුවන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම ක්‍රමානුකූලව, සූක්ෂමව කරගෙන යනවාද කියන එක පිළිබඳව ගැටලුවක් මතු වනවා.

ඒ විතරක් නොවෙයි. ගෘහ සේවිකා ප්‍රශ්නය අද සමාජයේ විශාල වශයෙන් තිබෙනවා. තම පවුලේ ආර්ථික අමාරුකම් නිසා ඒ අය තමන්ගේ දූ දරුවන්, තමන්ගේ ස්වාමී පුරුෂයන් දමා පිට රටවලට යනවා. පිට රටවලට ගිහින් දහ දුක් විඳලා, තමන්ගේ විවිධාකාර දේවල් පරිත්‍යාග කරලා, කීයක් හෝ සොයාගෙන ඇවිත් තමන්ගේ දරුවන් පෝෂණය කරන්න, තමන්ගේ පවුල ආරක්ෂා කරන්න මැදිහත් වනවා. එහෙම වුණාට පස්සේ තමන්ගේ බිරිඳත් එක්ක, දරුවොත් එක්ක මේ සමාජය තුළ ජීවත් වන ස්වාමිපුරුෂයාට බරපතළ තනිකමක් ඇති වී, ළෙන්ගතුභාවය නැතිවෙලා ඔවුන් මානසික අසහනයකට පත්වෙනවා. එම නිසා ඔවුන් මේ වගේ සමාජ විරෝධී ක්‍රියාවලට ඇබ්බැහි වීමෙන් තමන්ගේ පැවැත්ම ආරක්ෂා කරගන්න කටයුතු කරනවා. එහෙම වුණාම සිද්ධ වෙන්නේ මොකක්ද? මත් ද්‍රව්‍යවලට බරපතළ විධියට ඇබ්බැහි වෙලා ඔවුන්ගේ දරුවන් ඇතුළු පවුල් සංස්ථාව මුළුමනින්ම විනාශ කරගෙන ලොකු අකරතැබ්බයකට පත්වීමයි සිද්ධ වෙන්නේ.

මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ ක්‍රියා කලාපය නිසා මේ වෙනකොට මුළු මහත් සමාජ දේහයම විනාශයට පත්වෙලා තිබෙනවාය කියන එක අපි කියන්න ඕනෑ. ඒ වාගේම රාජපක්ෂ ආණ්ඩුව කාලයේ "මතට තිත" වැඩසටහන ආරම්භ කළාට, ඒ කාලයේත්, මේ කාලයේත් "මතට තිත" කොහොම වුණත්, මත් ද්‍රව්‍ය පාවිච්චිය තිතට -ඉතාමත් ක්‍රමානුකූලව- සිදුවෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒ නිසා සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? මත් ද්‍රව්‍ය උවදුර නිසා මුළු මහත් සමාජ දේහයම විනාශවෙලා, ඔඩු දුවලා, මහා රෝගී තත්ත්වයක් බවට පත්වෙලා, රට මුළුමනින්ම විනාශ වෙලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ තත්ත්වයෙන් ගොඩ එන්න සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද යෝජනාව ඉතාමත්ම ඉක්මනින් ප්‍රායෝගික තලයට ගේන්නය කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

යෝජනා අංක 7, පා.180/'16, ගරු ජේ.සී. අලවතුවල මහතා - පැමිණ නැත.

යෝජනා අංක 8, පා.181/'16, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා - පැමිණ නැත.

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

ගරු සභානායකතුමනි, අපට තව යෝජනා 2ක් පමණයි සාකච්ඡාවට ගන්න තිබෙන්නේ. අපි මෙම විවාදය දිවා ආහාරය සඳහා නවත්වන්නේ නැතුව දිගටම කරගෙන ගියොත්, අද දින පාර්ලිමේන්තු සැසිවාරය නියමිත වෙලාවට කලින් අවසන් කරන්න හැකියාව තිබෙනවා. ඒ පිළිබඳව සභාවේ එකඟතාව තිබෙනවාද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
යෝජනා අංක 9, පා.189/'17, ගරු අශෝක ප්‍රියන්ත මහතා.

පුත්තලම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස නම් කිරීම

புத்தளம் மாவட்டத்தை தேசிய சகவாழ்வினதும் நல்லிணக்கத்தினதும் மாவட்டமாகப் பெயரிடுதல்

NAMING THE PUTTALAM DISTRICT AS THE DISTRICT OF NATIONAL COEXISTENCE AND RECONCILIATION

[අ.භා. 12.03]

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ යෝජනාව අද දවසේ ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ අනුව මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පුත්තලම දිස්ත්‍රික්කයේ බෞද්ධ, කතෝලික, මුස්ලිම් යන විවිධ ජන කණ්ඩායම් වසර ගණනාවක සිට ඉතා සාමයෙන් හා සමඟියෙන් ජීවත් වන බැවින්, වත්මන් යහපාලන රජයේ ප්‍රමුඛ අරමුණක් වන සහජීවනය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම උදෙසා මෙම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය ලෙස සම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයකට, රටකට සහජීවනය සහ සංහිඳියාව අවශ්‍ය මොහොතක මෙම යෝජනාව ගෙදරින් පටන් ගත්තොත් හොඳයි කියලා මට හිතුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 'ගෙදර' යනුවෙන් අදහස් කළේ, පුත්තලම් දිස්ත්‍රික්කයයි. මෙම පාර්ලිමේන්තුව නියෝජනය කරන්න මා මන්ත්‍රීවරයකු ලෙසට තෝරා පත් කළ ජනතාව ජීවත් වන්නේ පුත්තලම් දිස්ත්‍රික්කයේ නිසායි මම එම දිස්ත්‍රික්කය 'ගෙදර' යනුවෙන් ආමන්ත්‍රණය කළේ.

පුත්තලම් දිස්ත්‍රික්කයේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ඇතුළු විශාල ජන කොටසක් ජීවත් වනවා. වෙනත් දිස්ත්‍රික්කවලට වඩා වෙනස් මුහුණුවරක් මෙම පුත්තලම් දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දිස්ත්‍රික්කයේ අප්‍රිකානු සංයුතියකින් සමන්විත ජන කොටසක් ජීවත් වනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ආසනයේ 'සිරම්බි අඩි' කියන ගමේ අප්‍රිකානුවන් විධියටම ජීවත් වන එම ජන කොටස ඔබට, අපට ගියොත් දැක ගන්න පුළුවන්කම ලැබෙනවා. අපි විවිධ උත්සව අවස්ථා, සංස්කෘතික අවස්ථා සහ වෙනත් කුමන හෝ විශේෂිත අවස්ථාවලට ඔවුන් කැඳවනවා; ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් ගන්නවා. එහිදී ඔවුන්ගේ විවිධ තාල රටා, සංස්කෘතික ක්‍රමවේද, සංගීත වැඩසටහන් අපි දකිනවා. ඒ වාගේම බෞද්ධ, කතෝලික, හින්දු සහ ඉස්ලාම් ආගම් අදහන ජාතීන්, මැලේ සහ බර්ගර් ජාතීන්, කෘෂි කර්මාන්තයේ, ධීවර කර්මාන්තයේ, රාජ්‍ය රැකියාවන්හි නියැලී ඒ ආදායම් මාර්ගවලින් ජීවත්වන ජන කොටසක් මේ දිස්ත්‍රික්කය තුළ ජීවත් වනවා.

රටටත් සංහිඳියාව අවශ්‍යයි, ලෝකයටත් සංහිඳියාව අවශ්‍යයි. ලෝකයේ ඇති වන ප්‍රශ්න ගණනාවක් සමඟිය හා සහජීවනය තුළින් නිරාකරණය කර ගන්න පුළුවන්කම ලැබෙනවා. අපේ ලොව්තුරා බුදුන් වහන්සේ දේශනා කළේ සමගියෙන් එකතු වෙලා, සමගියෙන් සාකච්ඡා කරලා, සමගියෙන් විසිර යන්න කියලා. ඒ සහජීවනය, සමගිය නිර්මාණය කරන දිස්ත්‍රික්කය විධියට පුත්තලම් දිස්ත්‍රික්කය නම් කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

ශ්‍රී ලංකාවේ අටවෙනි පාර්ලිමේන්තුවේ මම ඇතුළු මන්ත්‍රීවරු 6 දෙනෙක් මේ යහ පාලන රජයට සහයෝගය දෙමින් පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. ඒ අතර බෞද්ධ, හින්දු, කතෝලික සහ ඉස්ලාම් ආගම් අදහන ජන කොටස් නියෝජනය කරමින් ඒ ජනතාවගේ අදහස් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්නත්, පාර්ලිමේන්තුව තුළ හඬක් නඟන්නත් පුළුවන් අවස්ථාවක් අපට ලැබිලා තිබෙනවා. මෙම යහ පාලන ආණ්ඩුවට සම්බන්ධ මන්ත්‍රීවරුන් 6දෙනායි, ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන් ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 09දෙනෙකුගෙන් සමන්විත මේ දිස්ත්‍රික්කයේ අපට මේ යෝජනාව සම්මත කර දෙනවා නම් රටට, ලෝකයට ආදර්ශයක් සපයනවා වාගේම පුත්තලම් දිස්ත්‍රික්කය ජාතියට අභිමානයක්, ගෞරවයක් අත්පත් කර ගන්න පුළුවන් දිස්ත්‍රික්කයක් බවට පත් කරන්නත් අපට පුළුවන්කම ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ගරු සභාව තුළ මේ සම්බන්ධයෙන් කථා කිරීමට කටයුතු කිහිප දෙනක් සිටින නිසා මම මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කරමින්, අපට ජාතීන් අතර, ආගම් අතර, කුලභේද අතර කිසි ප්‍රශ්නයක් නොමැති බවත්, එම නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්නට හැකි බවත් මතක් කරමින්, ඒ සඳහා රාජ්‍ය නිලධාරීන්ගේ සහ මෙම පාර්ලිමේන්තුවේ, මෙම රජයේ මැදිහත්වීම ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා.

සහ, වෙද, ගුරු, ගොවි, කම්කරු කියන පංච මහා බලවේගයෙන් එක තැනක තබා රටක් ගොඩනඟන්න පුළුවන් ආකාරයේ ගමක් කොහේ හෝ තිබෙනවා නම්, එතැනින් ආරම්භ කරන්න පුළුවන්, රට ලෝකය ජය ගන්නා වැඩ පිළිවෙළ. එතකොට අද අපේ රට තුළ උද්ගත වෙලා තිබෙන සමහර කාලකණ්ණි ප්‍රශ්නවලට, සමහර ආත්මාර්ථකාමී ප්‍රශ්නවලට, සමහර ඒක පුද්ගලයන්ගේ න්‍යාය පත්‍රවලට, කණ්ඩායම් සංවිධාන ගොඩනඟලා හදන ප්‍රශ්නවලට විසඳුම් සපයන්න පුළුවන් කියන පණිවුඩය ලබා දෙමින්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳ ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මාගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ යෝජනාව ස්ථිර කිරීම සඳහා ගරු එස්.එම්. මරික්කාර් මහතා.

[අ.භා. 12.07]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ "සහජීවන දිස්ත්‍රික්කය ලෙස පුත්තලම් දිස්ත්‍රික්කය නම් කරන්න" කියා ඉල්ලන යෝජනාව මම ස්ථිර කරන ගමන්ම, ඉතාම පැහැදිලිව දෙයක් කියන්න ඕනෑ. මෙම යෝජනාව පුත්තලම් දිස්ත්‍රික්කයට පමණක් ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් නොවෙයි; එතැනින් ආරම්භ කරලා රට පුරාම ව්‍යාප්ත කළ යුතු යෝජනාවක්. මෙය අද, කාලීන අවශ්‍යතාවක් වෙලා තිබෙන යෝජනාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1948ට පෙර අපේ රටේ සිංහල, දෙමළ සහ මුස්ලිම් මිනිසුන් ජාතීන් හැටියට, ආගම් හැටියට බෙදිලා වෙන් වෙලා හිටියා. දේශපාලන පක්ෂ පවා ඒ අනුවයි හැදුණේ. ඒ නිසාම තමයි පරදේශක්කාරයන්ට අපේ මේ බෙදීම ප්‍රයෝජනයට අරගෙන අවුරුදු ගණනක් අපේ රට යටත් විජිතයක් හැටියට පාලනය කරලා, අපේ රටේ ධනය, සම්පත් සූරා කන්න ඔවුන්ට අවස්ථාව ලැබුණේ. එලෙස සිදු වුණේ වෙන කිසිවක් නිසා නොවෙයි, අපි බෙදිලා හිටිය නිසායි. ඒ නිසා තමයි සිංහල මහ සභාව, දෙමළ සංගමය, යෝනක සංගමය වාගේ විවිධ පිල්වලට බෙදිලා හිටපු ද්‍රවිඩ, මුස්ලිම් හා සිංහල නායකයන් 1948 වසරේදී නිදහස ලබා ගැනීම සඳහා එකට එකතු වුණේ.

මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා ප්‍රමුඛ කොටගෙන එසේ එකට එකතු වීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි එකදු ලේ බිඳක්වත් හැලීමකින් තොරව අපේ රටට නිදහස ලබා ගන්න පුළුවන් වුණේ. එසේ නිදහස ලබා ගන්න කොට, අභිමානවත් ජාතියක් හැටියට, අභිමානවත් රටක් හැටියට, ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන රටක් හැටියට අපි බලාපොරොත්තු වුණේ, ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලුදෙනාටම දියුණු ලෝකය තුළ වැජඹෙන්න පුළුවන් සංවර්ධිත ශ්‍රී ලංකාවක් බවට අපේ රට පත් කරන්නයි.

අපේ දෙමව්පියන්ගේ කාලයේදී කිව්වේ, "ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින රටක්" කියලායි. අද අපේ කාලයේත් කියනවා, "ශ්‍රී ලංකාව දියුණු වෙමින් පවතින රටක්" කියලා. යුද්ධයෙන් පසුව බලාපොරොත්තු සහගතව ජීවත් වීම ආරම්භ කළ අපේ ජනතාවට, මේ රට තුළ නැවත ඇති වෙලා තිබෙන මේ තත්ත්වය දිගටම පැවතුණොත්, අපේ දරුවන්ගේ කාලයේදීත් කියන්න වෙන්නේ, "ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින රටක්" කියලායි. අන්න ඒ නිසා අඩුම ගණනේ මේ කාලය තුළ සිටවත් 'සංහිඳියාව' මුළු රට පුරාම, වචනයේ පරිසමාප්ත අර්ථයෙන් බිම් මට්ටමේ සිට ව්‍යාප්ත විය යුතුයි කියන එකයි මගේ අදහස වෙන්නේ. අපි ඉතාම පැහැදිලිව එය කියන්න ඕනෑ.

විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය ගත්තොත්, කොළඹ දිස්ත්‍රික්කයේ මැද කොළඹ, උතුරු කොළඹ, බොරැල්ල වැනි ආසනවලත් ඒ වාගේම කොළොන්නාව වාගේ ප්‍රදේශවලත් වතු ආශ්‍රිතව සිංහල, දෙමළ හා මුස්ලිම් ජනතාව ජීවත් වෙනවා. ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම යම් ප්‍රමාණයකට අඩු වුණත්, ඔවුන්ගේ සහජීවනය, සමඟිය හා සංහිඳියාව එකයි. දෙමළ අවුරුද්ද, මුස්ලිම් අවුරුද්ද හා සිංහල අවුරුද්ද ඔවුන් එකට සමරනවා. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් හැටියට සහ කොළොන්නාව සහ මැද කොළඹ ජනතාවගේ විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් මන්ත්‍රීවරයෙක් හැටියට මම දන්නවා, මේ යථාර්ථය කොළඹ දිස්ත්‍රික්කයේ වතු නිවාසවල තිබෙන බව. ඔවුන්ගේ ජන ජීවිත තත්ත්වය නොදියුණු වුණාට, අධ්‍යාපන මට්ටම ඉහළ නොවුණාට, "ශ්‍රී ලාංකිකයන් හැටියට අපි හැමෝම එකයි" කියන මතය ඔවුන් තුළ තිබෙනවා. ඔවුන් හදවතින්ම ඒ මතය තුළ හිඳිමින් ඔවුන්ගේ ජීවන රටාව පවත්වාගෙන යනවා.

ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලබා ගත් ඡන්ද හැටදෙලක්ෂය තුළ වර්ග තුනක ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා. ඒ තුළ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා; මධ්‍යම පාන්තිකයන්ගේ ඡන්ද ප්‍රමාණයක් සහ දූෂණය පිටු දකින්න ඉදිරිපත් වුණු අයගේ ඡන්ද ප්‍රමාණයක් තිබෙනවා. ඒත් එක්කම අපි පැහැදිලිව කියන්න ඕනෑ, මුස්ලිම් සහ දෙමළ ජනතාවගෙන් සියයට 99.9ක්ම මේ රජය බලයට පත් කරන්න ඡන්ද දුන් බව. එයට හේතුව මොකක්ද? රාජ්‍ය ත්‍රස්තවාදය හරහා ඇති වුණු උසි ගැන්වීම්වලින් -ඒ අනුග්‍රහයෙන්- ඇති වුණු අන්තවාදය, ජාතිවාදය පිටු දැකලා හැමෝටම එක හා සමානව සමඟියෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් නිර්මාණය වෙන බැවින් තමයි එසේ කළේ. නමුත් කියන්න කනගාටුයි, මේ යහ පාලන රජය ඇතුළේත් සංහිඳියාව වෙනුවෙන් විශාල වැඩ කොටසක් වෙන බවක් අපට පෙනෙන්නේ නැහැ; සංහිඳියාව වෙනුවෙන් ජාතික මට්ටමේ ප්‍රවර්ධනයක් වෙන බවක් පෙනෙන්නේ නැහැ; ඒ වෙනුවෙන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් කැප වුණු බවක් අපට පෙනෙන්නේ නැහැ. අපි ඒක පැහැදිලිව කියන්න ඕනෑ. සාපේක්ෂව පසු ගිය රජයට වඩා මේ රජය හොඳ වුණාට, කෙරෙන වැඩ කටයුතු මුල් කාලයේ ඒවාගේම දිගුවක් හැටියට ඒ ආකාරයෙන්ම තවමත් ක්‍රියාත්මක වෙනවා.

අද යම් කිසි තැනක සිද්ධියක් වුණාම, පොලීසියෙන් කියන්නේ මොකක්ද? Insurance එක ගන්න එහෙම කළා කියනවා, එහෙම නැත්නම් "මම මටම ගහ ගත්තා වාගේ වැඩක්" කියලා කියනවා, එහෙමත් නැත්නම් පිටින් ඇවිල්ලා ගැහුවාය කියනවා. මේ උත්තරය දෙන තැනට පොලීසිය හෝ රජය පත් වෙන්න ඕනෑ නැහැ.

මම සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගත් කෙනෙක්. අපි පාසල් යන කාලයේ අපේ යහළුවන් අතර අපට කවදාවත් එවැනි ගැටලු තිබුණේ නැහැ. පසු කාලීනව රැකියා කරන කොට, අපට එවැනි ගැටලු තිබුණේ නැහැ. අදටත් පෞද්ගලිකව මට එය ගැටලුවක් නොවෙයි. අද කොළඹ දිස්ත්‍රික්කයේ ජීවත් වෙන බහුතර සිංහල ජනතාවගේ ඡන්දය, මුස්ලිම් ජනතාව වාගේම මට ලබා දෙන්නේ ඒ නිසායි. ඒ නිසා තමයි මට බස්නාහිර පළාත් සභා මැතිවරණයේදී පළමුවැනියා වෙන්න පුළුවන් වුණේ; කොළඹ දිස්ත්‍රික්කයෙන් මැතිවරණයට ඉදිරිපත් වුණු නවකයන් අතරින් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ගන්න පුළුවන් වුණේ. මේ ජනතාව නොවෙයි, අසමඟි. අපි ඒක පැහැදිලිව කියන්න ඕනෑ. මේ ජනතාව තුළ අසමඟියක් නැහැ. ඔවුන් සමඟියි; දූරදර්ශියි. ඔවුන්ට මේ රට දියුණු වෙන්න ඕනෑ. ඔවුන්ට මේ රට සංවර්ධිත රටක් බවට පත් කරන්න ඕනෑ. හැබැයි, අසමඟි වෙලා තිබෙන්නේ පිල් බෙදුණු, අවස්ථාවාදී දේශපාලනඥයෝය කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ ජනතාව මේ තැනට පත් කරන්නේ මේ දේශපාලනඥයෝය කියන එක අපි කියන්න ඕනෑ.

එක කණ්ඩායමක් කල්පනා කරනවා, බහුතර සිංහල-බෞද්ධ ඡන්ද විතරක් අරගෙන දිනන්න පුළුවන් කියලා. තව කණ්ඩායමක් කල්පනා කරනවා, සිංහල-බෞද්ධ ඡන්ද ටිකක් එකතු කරගෙන, සුළු ජාතික ඡන්ද ටිකක් ගත්තාම ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන්

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

කියලා. මෙන්න මේ මත වෙනස් විය යුතුයි. බිම් මට්ටමේ ඉඳලා, - පාසල් කාලයේ ඉඳලාම- සහජීවනය සහ සංහිඳියාව අප තුළ ඇති වෙන්න ඕනෑ. "අපි සියලුදෙනා ශ්‍රී ලාංකිකයෝ" කියන අනන්‍යතාවත් එක්ක ජීවත් වෙන්න අපි පුරුදු වෙන්න ඕනෑ.

අපි මේ කාරණය ගැන කථා කරද්දී, විශේෂයෙන්ම කිව යුතු තවත් දෙයක් තිබෙනවා. ශ්‍රී ලංකා - පාකිස්තාන ක්‍රිකට් කණ්ඩායම් දෙක තරග වදින කොට, පෙළක් කට්ටිය පාකිස්තානයට අත්පුඩි ගහනවා. ඒක සම්පූර්ණ වැරදියි. ඒක එහෙම වෙන්න බැහැ. මොකක්ද එහෙම කියන්න හේතුව? මේ මහ පොළොව, සිංහල වුණත්, දෙමළ වුණත්, මුස්ලිම් වුණත් අප සියලුදෙනා ඉපදුණු මහ පොළොවයි; අප ජීවත් වන මහ පොළොවයි. අප මැරෙන්නේත් මේ මහ පොළොවේයි. ඒ නිසා ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාවත් එක්ක එකතු වන ගමන් ඉතා ඕනෑකමින් මම යෝජනාවක් කරනවා.

මා මේ කරන්න හදන යෝජනාව සම්බන්ධයෙන් මම දැනටමත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ද්‍රවිඩ මාධ්‍ය සියලු පාසල්වල සිංහල මාධ්‍ය ඒකකයක් තිබෙන්න ඕනෑ. කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ තිබෙනවා වාගේ, රාජකීය විද්‍යාලයේ තිබෙනවා වාගේ, සිංහල මාධ්‍ය සියලු පාසල්වල දෙමළ මාධ්‍ය ඒකකයකුත්, සියලු දෙමළ මාධ්‍ය පාසල්වල සිංහල මාධ්‍ය ඒකකයකුත් තිබෙන්න ඕනෑ. එහෙම නැතිව "සංහිඳියාව" කියා විෂයයක් ගෙනාවාට හරි යන්නේ නැහැ. සංහිඳියාව ගැන වේදිකාවේ සුන්දර කතා කිව්වාට හරි යන්නේ නැහැ. සංහිඳියාව ගැන සම්මන්ත්‍රණ පැවැත්වූවාට, සාකච්ඡා පැවැත්වූවාට හරි යන්නේ නැහැ. ගමේ භාෂාවෙන් කියනවා නම්, එය බොක්කටම යන්න ඕනෑ. එය ඇහේම තිබෙන්න ඕනෑ. එය ඇහෙන්ම එන්න ඕනෑ. අපට එකට වාඩි වෙලා කන්න පුළුවන් වන්න ඕනෑ. අපට එකට trip එකක් යන්න පුළුවන් වන්න ඕනෑ. අපට එකට වැඩක් කරන්න පුළුවන් වන්න ඕනෑ. අපට එකට රැකියාවක් කරන්න පුළුවන් වන්න ඕනෑ. කොටින්ම කිව්වොත්, එකට බෙදා හදාගෙන ජීවත් වීමේ හැකියාව අපට තිබෙන්න ඕනෑ. මම ඉතාම වගකීමෙන්, ඉතාම පැහැදිලිව කියනවා, මට නම් ඒ පසු බිම මේ දක්වාම තිබෙනවා කියා. අනාගතයේදීත් ඒ පසු බිම තිබේවි කියා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ සිටින උදවිය හරහා තමයි රට පාලනය වන්නේ. මේ පාර්ලිමේන්තුවේ සිටින දේශපාලනඥයන් හරහා තමයි රටේ මෙවැනි අර්බුද නිර්මාණය වන්නේත්, මෙවැනි අර්බුද පාලනය වන්නේත්. ඒ නිසා අප සියලුදෙනා හිතට එකඟව අවංක වන්න ඕනෑ. ඒ අවංකත්වය තුළින් එන වුවමනාවක් අපට තිබෙන්න ඕනෑ. ඒ වුවමනාව වෙනුවෙන් අප කැප වුණොත් සංහිඳියාව ඇති කරන්න පුළුවන් කියන එකයි මගේ විශ්වාසය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මැතිවරණ ප්‍රතිඵල ගෙන බැලුවාම අපට පැහැදිලිව පෙනෙනවා, අන්තවාදී කල්ලි නියෝජනය කරන අයට ඡන්ද 5,000ක් වත් ගන්න බැහැ කියා. ඒ අය සිංහල අන්තවාදීන් වන්න පුළුවන්, මුස්ලිම් අන්තවාදීන් වන්නත් පුළුවන්. ඒ අය ඡන්ද වැඩිපුර ලබා ගැනීමේ ප්‍රවණතාවක් නැහැ. නමුත් සමහර ප්‍රදේශවල වෙනත් වෙනත් ප්‍රවණතාවන් තිබෙන්න පුළුවන්. මේ ගැන ජාතික මට්ටමින් සිතා කටයුතු කරන්න ඕනෑ. මම විශ්වාස කරනවා, පුත්තලම දිස්ත්‍රික්කය වෙනුවෙන් ගෙනෙන මේ යෝජනාව සම්මත වෙලා, පුත්තලම දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරලා මේ මුළු රටම ඒ ආකාරයට කටයුතු කරලා ආදර්ශවත් දිවයිනක් බවට, මුළු ලෝකයටම පෙන්වන්න පුළුවන් සංහිඳියාවේ රට බවට ශ්‍රී ලංකාව පත් කිරීම අප සියලුදෙනාගේ වගකීමක් වනවා කියා.

අප අනෙක් අනෙක් ප්‍රශ්නවලට විසඳුම් දුන්නාට, අනෙක් අනෙක් පැතිවලින් දියුණු වුණාට වැඩක් නැහැ. කා කොටාගන්නා, ඇන කොටාගන්නා රටක් බවට අපේ රට පත් වුණොත් ලෝකයට යන පණිවුඩය වැරදි එකක් වනවා. එය අපේ රටේ සංචාරක කර්මාන්තයට බලපාන්න පුළුවන්; ආර්ථිකයට බලපාන්න පුළුවන්; අනෙක් අනෙක් ක්ෂේත්‍රවලට බලපාන්නත් පුළුවන්. ඒ නිසා පාසල් කාලයේ සිටම මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අප සියලුදෙනා එකතු වෙලා ක්‍රියා කරන්න ඕනෑ. අප අවස්ථාවාදී දේශපාලනයෙන් එළියට ඇවිත් රටක් හැටියට සිතන්න ඕනෑ කියමින්, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පළ කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 12.16]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව. ඒ වාගේම, මම ස්තුතිවන්ත වෙනවා, මා එක්ක එකට සිටින මගේ සහෝදර මන්ත්‍රීතුමා විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කය ජාතික සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය හැටියට නම් කරන්න කියා ඉල්ලා සිටීම සම්බන්ධයෙන්. එලෙස නම් කරන්න කියා ඉල්ලා සිටින්න එතුමාට වාගේම පුත්තලම දිස්ත්‍රික්කයේ අප සියලුදෙනාට අයිතියක් තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. ශ්‍රී ලංකාව පුරා ජීවත් වන අනෙක් විවිධ ජන කොටස් ගෙන බැලුවාම, ඒ සියලු දෙනාට වඩා ඉදිරියෙන් සිටීමින් සමඟියෙන්, සමාදානයෙන් එකට ජීවත් වීමේ පණිවුඩය පුත්තලම දිස්ත්‍රික්කය සමස්ත රටටම, ලෝකයටම දී තිබෙනවා. එතැනදී අප දකින විශේෂත්වයක් තිබෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ එහා කෙළවරේ ඉඳලා මෙහා කෙළවර දක්වා දිවෙන ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව මුස්ලිම් වන්න පුළුවන්, ද්‍රවිඩ වන්න පුළුවන්, සිංහල වන්න පුළුවන්, බර්ගර් වන්න පුළුවන්, විවිධ ආගම්වල අය වන්නත් පුළුවන්, අර කිව්වා වාගේ විවිධ රටවලින් ආ ගෝත්‍රවලට අයත් අය වන්නත් පුළුවන්. හැබැයි ඒ සියලු දෙනා ජීවත් වන්නේ එකටයි. ඒ අය බෙදිලා ජීවත් වන්නේ නැහැ. හැම දාකම උදේ අවදි වුණාට පසුව රාත්‍රී නින්දට යෑම දක්වා කාලය තුළ ඒ අය එකට ජීවත් වන නිසා ඒ අය අතර ප්‍රශ්න මතු වෙලා නැහැ. ඒ අය අතර ප්‍රශ්න අවමයි, අනෙක් ප්‍රදේශවලට වඩා. සුනාමිය ගත්තත්, එදා මේ රටේ පැවැති විවිධ අපරාධ ආදිය ගත්තත් ඒ කිසිදු ප්‍රශ්නයකට ගොදුරු වන්නේ නැතිව බේරුණු දිස්ත්‍රික්කයක් තමයි පුත්තලම දිස්ත්‍රික්කය. ඒ වාගේම, එය ස්වාභාවික ආපදාවලිනුත් බේරුණු දිස්ත්‍රික්කයක්. අපේ දිස්ත්‍රික්කය වෙනත් දිස්ත්‍රික්කවලට වඩා බොහොම ඉදිරියෙන් තිබෙන දිස්ත්‍රික්කයක් හැටියට අපට නම් කරන්න හැකි වන්නේ ඒ නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂ දෙයක් මම අද මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑ. පුත්තලම දිස්ත්‍රික්කය සහජීවනයේ හා සංහිඳියාවේ දිස්ත්‍රික්කය හැටියට නම් කරන්නය කියා ඉල්ලා සිටිනවා වාගේම, ඒ විධියට නම් කරාවිය කියා අපි විශ්වාස කරනවා. ඒ විධියට නම් කිරීමට පුත්තලම් දිස්ත්‍රික්කයට ඉතාමත්ම සුවිශේෂී වූ හේතුවක් තිබෙනවා. ඒක තමයි අපේ කුවේණි, එහෙම නැත්නම් යක්ෂ, නාග කියන ගෝත්‍ර දෙක ජීවත් වුණු අඩවිය; ඉපදුණු අඩවිය වන තම්බපණ්නිය පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම. පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය

කෙළවරේ තමයි තම්බපණ්නිය පිහිටා තිබෙන්නේ. සමස්ත ශ්‍රී ලංකාවේම නැති රතු පාට පසක් තවමත් ඒ ප්‍රදේශයේ තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයත්, පුත්තලම් දිස්ත්‍රික්කයත් යාවෙන තැන, පුත්තලම් දිස්ත්‍රික්කයට විශේෂ වූ, ආවේනික වූ තම්බපණ්නිය පිහිටා තිබෙනවා. එහෙම නම් ශ්‍රී ලංකාවේ ජනතාව ආරම්භ වුණු තැන එතැනයි. එම නිසා පුත්තලම් දිස්ත්‍රික්කයට සුවිශේෂී වූ අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මොකද, ශ්‍රී ලාංකික ජනතාව ආරම්භ කළ ස්ථානය වන තම්බපණ්නිය පුත්තලම් දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම නිසා. තම්බපණ්නිය පිහිටා තිබෙන නිසා වෙන්න ඇති; ශ්‍රී ලාංකිකයන් එතැනින් ආරම්භ වුණු නිසා වෙන්න ඇති අපේ පුත්තලම් දිස්ත්‍රික්කයේ සියලුම ජනතාව සමගියෙන්, සමාදානයෙන් එකට අත්වැල් බැඳගෙන ජීවත් වන්නේ. ආර්ථික වශයෙන් බැලුවත් අපේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයන් ඉන්නවා. රජයේ රැකියා කරන, පෞද්ගලික අංශයේ රැකියා කරන, ධීවර කර්මාන්තයේ යෙදෙන, කෘෂිකර්මාන්තයේ යෙදෙන අය ඒ ප්‍රදේශයේ ඉන්නවා. ඒ ප්‍රදේශය, රටට බත සපයනවා වාගේම විශේෂයෙන්ම පොල් ආශ්‍රිත කර්මාන්ත විශාල වශයෙන් තිබෙන ප්‍රදේශයක්. ඒ වාගේම අන්නාසි වගාව වැනි වගාවනුත් අපේ ප්‍රදේශයේ තිබෙනවා.

අපි සියලු දෙනාම එකට එකතුවෙලා තමයි මේ සියලු දේම කරන්නේ. අපට වර්ග හැටියට වෙන්වෙලා එක එක තැන්වල කථා කරන්න පුළුවන්. අද ජනවර්ග හැටියට එක් එක්කෙනාව අවුස්සලා, ප්‍රශ්න ඇති කරලා සතුටක් විඳින මිලේච්ඡ කණ්ඩායමක් රටේ සිටියත්, පුත්තලම් දිස්ත්‍රික්කය තුළ කාටවත් එවැනි දේවල් කරන්න බැරිවෙලා තිබෙන බව අපි දන්නවා. විශේෂයෙන්ම මට ද්‍රවිඩ, මුස්ලිම් සියලු දෙනාගේම ඡන්ද ලැබුණා. ඒ වාගේම අපේ සහෝදර මුස්ලිම් මන්ත්‍රීතුමාටත් සිංහල ඡන්ද සහ ද්‍රවිඩ ඡන්ද ලැබිලා තිබෙනවා. එහෙම නම් අපි සියලු දෙනාම මේ විධියට ඡන්ද ලබා ගෙන පාර්ලිමේන්තුවට ආවා හා සමානව අපට විශාල අයිතියක් තිබෙනවා, දිස්ත්‍රික්කය තුළ වැඩ කටයුතු කරද්දී සියලු දෙනාටම එක විධියට සලකා වැඩ කරන්න. ඒකත් අපෙන් සිද්ධ වෙනවා. මුස්ලිම් මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, ද්‍රවිඩ මන්ත්‍රීවරු වෙන්න පුළුවන්, සිංහල මන්ත්‍රීවරු වෙන්න පුළුවන් අපේ මන්ත්‍රීවරු අතර කවදාවත් වාද භේදයක් ඇති වෙලා නැහැ. පක්ෂ වෙන්න පුළුවන්, විපක්ෂ වෙන්න පුළුවන්, පක්ෂ විපක්ෂ වශයෙන් අපි තර්ක කර ගත්තත්, අප සියලු දෙනා අතර වර්ග විධියට, ආගම් විධියට කිසිම විධියක තර්කයක් හෝ විතර්කයක් ඇතිවෙලා, අපි අතර ප්‍රශ්නයක් ඇතිවෙලා නැහැ. ජන කොටස් හැටියට අපි සියලු දෙනා එකට වාඩිවෙලා එක පවුලක් හැටියට පුත්තලම් දිස්ත්‍රික්කයේ වැඩ කටයුතු කරද්දී පුත්තලම් දිස්ත්‍රික්කය සමස්ත ශ්‍රී ලංකාවටම ආදර්ශයක් ලබා දෙනවා කියලා අපි හිතනවා.

අද ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමා ඉදිරිපත් කර තිබෙන යෝජනාව කාලෝචිත යෝජනාවක් වනවා පමණක් නොවෙයි, පුත්තලම් දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාවටම ගෞරවයක් වනවා. ඒ සම්බන්ධයෙන් පුත්තලම් දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු හැටියට මම ගරු අශෝක ප්‍රියන්ත මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේවා තමයි අපි මන්ත්‍රීවරු හැටියට කළ යුත්තේ. අද බොහෝ දේශපාලනඥයන් කරන්නේ මොනවාද? තමන්ට බලය ලබා ගන්න ඕනෑ නිසා ජනතාව කුලප්පු කරමින්, රටේ තිබෙන භෞතික සම්පත් ටික විනාශ කරමින්, එහෙම නැත්නම් සමාජයීය වශයෙන් අපේ තිබෙන එකමුතුකම විනාශ කරමින්, රටේ ජනතාවට හිමිවෙන්න තිබෙන අයිතීන් විනාශ කරමින් තමන්ට බලය ලබා ගැනීම සඳහා ආත්මාර්ථකාමී චේතනාව මත මේ රට විනාශ කරමින් ඉන්න එකයි. ඒ නිසා ඒ විනාශ කරමින් ඉන්න යුගය අවසාන කරන්න නම්, සංහිඳියාව, සහජීවනය කියන එක ඉතාමත්ම වැදගත් වෙනවා. පක්ෂ අතර මොන වාද භේද තිබුණත් ජන කොටස් හැටියට, ජන වර්ගයන් අතර, ආගම් අතර බෙදීම් තිබුණත් ඒ සියල්ලම අතහැර දමා සියලු දෙනාම එකට එකතු කර ගෙන, එකට ජීවත් වන ජන සමාජයක් සමස්ත රට තුළම නිර්මාණය කරන්න ඕනෑ. ඒ නිර්මාණය කිරීම පුත්තලම් දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරමුය කියා යෝජනාවක් හැටියට මා මෙම යෝජනාවට එකතු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ මම විශේෂ ඉල්ලීමක් කරනවා. තම්බපණ්නිය, කුවේනි ඉපදුණු තැන, කුවේනි මේ රටේ පරපුර ආරම්භ කළ තැන. හැබැයි, එදා විජය රජතුමා විසින් නාග සහ යක්ෂ ගෝත්‍ර දෙක අවසාන කරලා, නැවතත් ඉන්දියාවෙන් ඒ අය ගෙනැල්ලා රාජ්‍ය පටන් ගත්තාය කියලා තමයි ඉතිහාසයේ තිබෙන්නේ. ඒ පටන් ගත්ත පටන් ගැනිල්ල තමයි සමස්ත ශ්‍රී ලංකාව තුළම ව්‍යාප්ත වෙලා, ජාතියක් හැටියට, ශ්‍රී ලාංකිකයෝ හැටියට අද අපි මේ රට තුළ කටයුතු කරන්නේ. ඒ නිසා තම්බපණ්නියත් මේ සහජීවනයට එකතු කරන්නය කියා මම විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. ඒ අනුවත් පුත්තලම් දිස්ත්‍රික්කය විශේෂත්වයේ ලා කටයුතු කරන්නය කියා පුත්තලම් දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාව වෙනුවෙන් අපි ඉල්ලා සිටිනවා. ඒ නිසා නැවත නැවතත් ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් ඉදිරියේදී මේ කටයුත්ත සමස්ත ශ්‍රී ලංකාව තුළම ව්‍යාප්තවෙලා ලස්සන රටක්, යහපත් රටක් නිර්මාණය වේවිය කියා බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා. මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු මොහමඩ් නවවි මැතිතුමා.

[අ.භා. 12.24]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Thank you very much, Mr. Deputy Speaker, for giving me this opportunity.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ දිස්ත්‍රික්කය ගැන මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් ගරු අශෝක ප්‍රියන්ත තරුණ මන්ත්‍රීතුමාට මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ. හැබැයි, කියන්න කනගාටුයි, පුත්තලම් දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මන්ත්‍රීවරු නව දෙනෙක් මේ පාර්ලිමේන්තුවේ සිටියත්, මේ අවස්ථාවට සහභාගි වන්නේ මන්ත්‍රීවරු තුන් දෙනෙක් විතරයි.

So, I am indeed very happy that the Hon. Asoka Priyantha brought in this Private Members' Motion.

Mr. Deputy Speaker, as a Member representing the Puttalam District, I would like to say that we have set an example for the whole nation because communities belonging to various religions live together peacefully in the Puttalam District without any problem. There were a lot of problems to minority communities right around the country. But I am happy to say that none of such problems have arisen in our district, because the religious leaders and political leaders of all communities there get together and guide the people. This, I am sure, is an example to the rest of the country.

[ගරු මොහොමඩ් නවවි මහතා]

I would like to mention that famous places of worship are situated in Puttalam. The famous Thalawila Catholic Church and Pallekandal Catholic Church are situated in Puttalam. I think, these two churches are the biggest churches after the Madu Church. The famous Udappuwa Temple and the Munneswaram Temple of the Hindus' are also situated in our district. Most of the Buddhists do not know about the famous rock temple in Anamaduwa which has been completely carved out of rocks. However, a large number of devotees visit there. We also have a famous mosque in Puttalam.

Why I am saying these things is to tell you how we all are united religious wise. I would like to mention this fact since the Hon. Sagala Ratnayaka is also present here. He too knows that. Whatever problem occurred in other parts of Sri Lanka in the last two months, none of such incidents occurred in Puttalam. That is because we work together and live in unity. We have a religious leaders' committee consisting of clergies from all religions in our area. Therefore, if any problem crops up, they are there to help us and guide us. I think this type of practice can be carried out in other districts too.

As the Hon. Hector Appuhamy told, Prince Vijaya landed in our area. That is the place known as "Thammannawa" which is located in the Vilpattu area. Therefore, the communities in Sri Lanka descended from our area. Kuveni also lived in our area. In addition to that, I would like to say that Ibn Battuta, the famous traveler who came to Sri Lanka, also landed in Puttalam. So, the Muslim community also descended from our area.

In addition, I must say that except tea and rubber, all other crops are found in Puttalam. Business wise, agricultural wise or fisheries wise, we all work together. As you know even electricity is generated from the Norochcholai Coal Power Plant. So, it is in this kind of an area that we live and it is this kind of support that we give to the rest of the country.

As you know, there is a famous Muslim girls' school called "Fathima Girls School" in Puttalam. When I was in the Provincial Council, we started Sinhala medium education in Tamil medium schools. In other parts of the country, they do not have Sinhala medium education in Tamil medium schools and Tamil medium education in Sinhala medium schools. Therefore, setting an example, we started Sinhala medium education in Tamil medium Muslim schools. I am really happy, today, that school has Sinhala medium up to GCE A/L and last year, three Tamil -speaking Muslim girls who studied in Sinhala medium have entered the university. Sir, all these problems begin because of lack of communication. The Tamil and the Muslim children who are studying in Tamil medium do not converse in Sinhala and the Sinhala medium students do not converse in Tamil. So, this is the main problem.

I am happy to say that it has changed a lot. Most of the Tamil and the Muslim students in Puttalam are studying in Sinhala and the Sinhala students are also studying in Tamil. So, if we can extend what we are doing in the Puttalam District to other districts, I am sure, these unwanted, unnecessary problems created by a few people - he maybe a Sinhalese, a Tamil or a Muslim - can be brought to an end and a better understanding can be created among all communities. So, we will get together, improve and increase the unity of this country in the future.

Therefore, once again, I thank the Hon. Member - he is a young Member - who brought in this Motion. As a Member of Parliament from Puttalam District, I am sure that what we are doing will be carried on and no problem will never ever crop up in Puttalam. I also hope this will be extended to the other districts too.

Thank you very much.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

යෝජනා අංක 10, පා.190/'17, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කිරීම

முன்பள்ளி கல்வியை மேம்படுத்துவதற்கான முறைசார்ந்த வேலைத்திட்டமொன்றைத் தயாரித்தல்

FORMULATING A METHODICAL COURSE OF ACTION TO UPLIFT PRE-SCHOOL EDUCATION

[අ.භා. 12.32]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"රටට වැඩදායී යහපත් පිරිසුන් පුද්ගලයන් බිහි කිරීමේ මූලික තෝතැන්න වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් රට පුරා පැවතියද, ඉන් බහුතරයක් නිසි ප්‍රමිතියකින් හා ක්‍රමවේදයකින් තොරව පවත්වා ගෙන යෑම හේතුවෙන්, දරුවන්ගේ පෞරුෂ වර්ධනයේත්, සාරධර්ම හා මූලික අධ්‍යාපන පෙළගැස්මේත් ඍණාත්මක බවක් දක්නට ලැබෙන හෙයින්, පෙර පාසල් අධ්‍යාපන මධ්‍යස්ථානවල භෞතික පහසුකම් පවත්වා ගැනීම, සුදුසුකම් සහිත පාලිකාවන් පත් කිරීම, ඉගැන්වීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සුරැකීම සඳහා ඔවුන් පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම මෙන්ම, මධ්‍යස්ථාන පාලිකාවන් සඳහා නිශ්චිත වැටුප්/දීමනා ලබාදීම මඟින් ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය ඇති කිරීම තුළින් පෙර පාසල් අධ්‍යාපනය නඟා සිටුවීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරුවෙකු මවකගේ කුස පිළිසිඳ ගෙන ගත කරන කාලයත්, උත්පත්තිය ලැබීමෙන් පස්සේ වසර පහක් දක්වා ගත වන කාලයත් මනුෂ්‍ය ජීවිතයේ බුද්ධි වර්ධනයේ වැදගත්ම අවධිය විධියට සැලකෙනවා. ඒ අවධියට අපි කියනවා, "පූර්ව ළමාවිය" කියලා. මෙතැනදී මේ පූර්ව ළමාවියට, එහෙම නැත්නම් බුද්ධිය වර්ධනය වන කාලයට බලපාන සාධක දෙකක් අපි දකිනවා. එකක් තමයි, ආරය. අනික් එක තමයි, පරිසරය. 'ආරය' කියන්නේ දෙමව්පියන්ගෙන් ගෙනෙන ජානවලින් ලැබෙන දේ. 'පරිසරය' කියන්නේ තමන් වටා තිබෙන ස්වාභාවික පරිසරය හා ඇසුරු කරන්නන්. ඒ කියන්නේ දෙමව්පියන්, ගුරුවරුන්, ඒ වාගේම පවුලේ අනෙක් අයත්. ඒකට හොඳම උදාහරණයක් තමයි, බෞද්ධ සාහිත්‍යයේ තිබෙන ගිරා දෙමව්පිය දෙදෙනෙකුට දාව උපදින ගිරා පෝතකයන් දෙදෙනෙකුගේ කථාව. එම ගිරා පෝතකයන් දෙදෙනාගෙන් කෙනෙක් සොරමුළක් ළඟටත්, අනෙකා තපසුන් ළඟටත් වැටිලා හැදෙන හැටි ඒ කථාවේ කියැවෙනවා. එකම ජාන තිබුණත්, පරිසරය විසින් ඒ අයගේ පැවැත්ම වෙනස් කරනවාය කියන එකට හොඳම උදාහරණයක් කමයි ඒ කථාව. එම නිසා මේ පූර්ව ළමාවිය සංවර්ධනය අවස්ථාව, ඉතා විශාල වග කීමකින් යුතුව විශාල කාර්ය භාරයක් හරහා දරුවෙකුගේ ජීවිතයේ පදනම සකස් කරන අවස්ථාව විධියට මා දකිනවා. එහිදී මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට විශේෂ කාර්යභාරයක් තිබෙනවා. එහිදී කෙරෙන්නේ දැනුම, කුසලතා, ආකල්ප ලබා දෙමින් මේ දරුවන් සමාජයානුයෝජනය කිරීමයි. දරුවෙකු සමාජයට ගැළපෙන පුද්ගලයෙකු විධියට සකස් කරන්නේ කොහොමද කියන එක තමයි මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකින් සිද්ධ වන්න ඕනෑ.

භෞතික සම්පත්වල වාගේම, මානව සම්පත්වලත් පවතින යම් යම් දුර්වලතා නිසා මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළින් අපි බලාපොරොත්තු වන කාර්යභාරය මේ පුංචි දරුවන් වෙනුවෙන් සිද්ධ වනවාද කියන කාරණය අපට ගැටලුවක් ලෙස පවතිනවා. වෙලාවකදී මවක විධියට, තවත් වෙලාවකදී හෙදියක විධියට, තවත් වෙලාවකදී ගුරුවරියක විධියට විශාල කාර්යභාරයක් කරන පෙර පාසල්, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් විශාල වැඩ කොටසක් මේ රට වෙනුවෙන් සිද්ධ කරනවාය කියන එකත් මා මේ වෙලාවේ බොහොම ගෞරවයෙන් මතක් කරනවා. නමුත්, මෙන්න මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන අද රට පුරා හතු පිපෙන්නා වාගේ ඇති වී තිබෙන බව අපි දකිනවා.

මා මුලින් සඳහන් කරපු විධියට ඒවායෙන් සමාජයානුයෝජනයම සිද්ධ වනවාද, එහෙම නැත්නම් වාණිජ අරමුණින් මෙවා කටයුතු කරනවාද කියන කාරණය ගැන අපි මේ වෙලාවේ විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. මොකද, අපි දකිනවා ඒ සමහර පාලිකාවන්ට මූලික සුදුසුකම්වත් නැහැ කියලා. සමහර වෙලාවට මේක ස්වයං රැකියාවක් බවට පත් වෙලා තිබෙනවා. එක වසමක පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන දෙක තුනක් තිබෙනවා. රැකියාවක් නැතිව සිටින තරුණිය, ආදායම් මාර්ගයක් නැතිව සිටින කාන්තාව, ළමයින් කීප දෙනෙකු එකතු කර ගෙන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පටන් ගන්නවා. හුදෙක් ඒ තමන්ගේ වාණිජ අරමුණ ඉෂ්ට සිද්ධ කර ගන්නයි. එම නිසා මම මෙතැනදී විශේෂ කරුණක් විධියට මේ පාලිකාවන්ගේ මූලික සුදුසුකම් පිළිබඳව මතක් කරනවා. ඒ අය අනිවාර්යයෙන්ම අධ්‍යාපන මනෝ විද්‍යාව ඇතුළත් වුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුයි කියලා මා සඳහන් කරනවා. ඒත් එක්කම, මේ මධ්‍යස්ථාන පවත්වා ගෙන යන ගොඩනැගිලි ගත්තොත්, ඒ බොහෝ ඒවා අනාරක්ෂිත පරිසරවල තිබෙන, දරුවන්ට නුසුදුසු තැන්වල තිබෙන, දරුවන්ට ප්‍රියමනාප නොවන තැන්වල තිබෙන ගොඩනැගිලි. ඒ වාගේම, ඒ සමහර ගොඩනැගිලිවල ඒ දරුවන්ට අවශ්‍ය ප්‍රමාණයට ඉඩ කඩ නැහැ. සමහර පන්ති කාමර ඇතුළේ හිර වුණු ස්වභාවයක් තිබෙන බවත් අපි දකිනවා.

අවුරුදු පහෙන් ඉහළ, එහෙම නැත්නම් 1 වසරේ ඉඳලා 13 වසර දක්වා පන්තියක උපරිම වශයෙන් ඉන්න පුළුවන් දරුවන් සංඛ්‍යාව 40ක් බව රජය විධියට අප පිළිගන්නවා. නමුත් පෙර පාසල්වල එම සීමාව ඉක්මවා දරුවන් සිටින බව අපි දකිනවා. පන්තියක ළමුන් 40ක් නොවෙයි, එම ප්‍රමාණය ළමයින් 20කට සීමා කර ගන්න පුළුවන් නම්, දරුවන් හොඳින් හඳුනාගෙන, දරුවන්ට අවශ්‍ය සමාජානුයෝජනය ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් කියන කාරණය ගුරුවරියක් විධියට මා දකිනවා. ඒ එක්කම, බොහෝ පෙර පාසල්වල ශාරීරික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය විධිමත් සහ ක්‍රමවත් ආරක්ෂිත සෙල්ලම් මිදුල්, ඒ වාගේම පරිසරයට අනුගත වීමට අවශ්‍ය කරන වටපිටාවක් නැහැ කියන කාරණය මම මතක් කරනවා. මානව සම්පත ගත්තොත්, මම කලින් කිව්වා වාගේ බොහොමයක් පාලිකාවන්ට - උපදේශිකාවන්ට- විධිමත් මූලික සුදුසුකම් හා පුහුණුවීම් නැහැ.

තව කාරණයක් පිළිබඳව කියන්නට ඕනෑ. බොහොමයක් පාලිකාවන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත නැති බව අපි දන්නවා. රජයෙන් වැටුප් ලබන පාසල්වල උගන්වන ගුරුවරියන්ට විශ්‍රාම වැටුපක් ලැබුණත්, දරුවාගේ මූලික අඩිතාලම සකස් කරන පෙර පාසල් පාලිකාවගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත නැහැ. 2014 නොවැම්බර් මස ඉදිරිපත් කළ අය වැයෙන් වාගේම, 2015 ජනවාරි මස ඉදිරිපත් කළ අය වැයෙනුත් එම පාලිකාවන්ට රුපියල් 2,500ක දීමනාවක් ලබා දෙන්න මේ ගරු සභාව තුළ සම්මත වුණා. මා දන්නා තරමින් එම මුදලවත් මේ වන තුරු ලබා දීලා නැහැ. ඒ අය සඳහා පිළිගත්, ඒ අයට සෑහීමකට පත් වෙන්න පුළුවන් විධියේ දීමනාවක් ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා. මේ අය ජීවන අරගළයකයි යෙදිලා ඉන්නේ. එතකොට පෙර පාසල්වල ඉගෙන ගන්නා දරුවන්ගෙන් අය කර ගන්න මුදලේ සීමාව ඉක්මවා යනවා. අපේ රටේ දෙමවුපියන් තමන්ගේ දරුවන් වෙනුවෙන් හොඳම දේ ලබා දෙන්න තමයි කටයුතු කරන්නේ කියා අපි දන්නවා. ඒ නිසා ඔවුන් ඉල්ලන දේවල් ලබා දීමේ දී අපේ දෙමවුපියන් ලොකු අසීරුතාවන්ට පත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මධ්‍යම පළාත් සභාව තුළ පමණක් මේ වනකොට පූර්ව ළමා විය සංවර්ධන ප්‍රඥප්තියක් ගෙනැල්ලා තිබෙනවා. එවැනි ආකාරයට පූර්ව ළමා විය සංවර්ධන ප්‍රඥප්තියක් ගෙන ඒම සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු ඒ වෙනුවෙන් සහයෝගය දැක්වූ සියලු දෙනාට මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. නමුත්, ඒ තුළිනුත් පෙර පාසල් පාලිකාවන්ගේ දැවෙන ගැටලු සම්බන්ධයෙන් මේ වනතුරු පිළියම් යොදලා නැහැ. ඒ අය සතුටට පත් වුණේ නැත්නම්, ඒ අය යටතේ ඉන්න පුංචි දරුවන්ගෙන් සමාජානුයෝජනයක් සිදු වනවාද කියන ප්‍රශ්නය මා මේ වෙලාවේ දී මතු කරනවා. පවත්නා ප්‍රතිපත්ති, රෙගුලාසි නිසි පරිදි ක්‍රියාත්මක කරන්න කියන එකයි මා මේ අවස්ථාවේදී යෝජනා කරන්නේ. එම මධ්‍යස්ථාන නිරන්තර අධීක්ෂණයකට ලක් කිරීම, ඒ වෙනුවෙන් කාර්ය මණ්ඩලයක් යෙදවීම මඟින් පාලිකාවන් දිරිගැන්වීම, උපදේශිකාවන් සඳහා මූලික සුදුසුකම් තීරණය කිරීම, පිළිගත් විශේෂඥ උපදෙස් මත සැකසුණු පොදු පාඨමාලාවක් -විෂය නිර්දේශයක්- ලබා දීම, උපදේශිකාවන් සඳහා නිශ්චිත වැටුපක් නිර්දේශ කිරීම හා එය රජයේ මැදිහත් වීමෙන් ලබාදීම සුදුසුයි කියා මා හිතනවා. ඒ වාගේම, එම ස්ථාන නඩත්තු කිරීම සඳහා නිශ්චිත පොදු වැඩ පිළිවෙළක අවශ්‍යතාවකුත් තිබෙනවා.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුලින් සඳහන් කළා වාගේ ගමක පෙර පාසල් කීපයක් තිබෙනවා. මේ පෙර පාසල් සියල්ලම එකතු කරලා, පුංචි ළමා මනසට ගැළපෙන විධියේ ප්‍රියජනක ස්ථානයන් බවට ඒවා පත් කරමින්, පවතින පාසලට අනුයුක්තව, සුදුසුකම් සපුරාලන පාලිකාවන්ගෙන් සමන්විත වන පරිදි, සියලු පහසුකම් සහිතව වසමකට එකක් හෝ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටු විය යුතු බවත්, අධ්‍යාපන අමාත්‍යාංශය හා ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ පූර්ණ මැදිහත් වීම මත ඒවායේ පරිපාලනය ගෙන යා යුතු බවටත් මම මේ සභාවට යෝජනා කරනවා. මට කථා කිරීමට අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ස්තුති වන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පාර්ලිමේන්තු නියෝජ්‍ය කථානායකතුමා)
(The Hon. Deputy Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු තිලකරාජා මන්ත්‍රීතුමා,

[ප.ව. 12.41]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්ඩලික මයිල්වාගනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முன்பள்ளிக் கல்வியை மேம்படுத்துவதற்கான முறைசார்ந்த வேலைத் திட்ட மொன்றைத் தயாரிக்கும் நோக்கோடு, கௌரவ உறுப்பினர் ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் முன்வைத்திருக்கும் தனிநபர் பிரேரணையை நான் ஆமோதிக்கின்றேன். அவர் ஓர் ஆசிரியர் என்கின்ற வகையில் தன்னுடைய அனுபவங் களையும் கொண்டு, ஒரு தாய் என்கின்ற வகையில் பிள்ளை களின் உணர்வுகளை மதித்து, ஒரு பாராளுமன்ற உறுப்பினர் என்கின்ற வகையில் இந்த நாட்டின் எதிர்காலச் சந்ததியின ருக்குப் பொருத்தமான ஒரு கல்வி முறையை வழங்க வேண்டும் என்ற நோக்கோடு முன்மொழிந்திருக்கும் இந்தப் பிரேரணை, இன, மத, மொழி பேதம் கடந்து நாட்டிலுள்ள அனைத்துப் பிரஜைகளும் ஏற்றுக்கொள்ள வேண்டிய - பின்பற்ற வேண்டிய நடைமுறைகளை உள்ளடக்கியிருக்கின்றது என்கின்ற வகை யில் இது மிகவும் வரவேற்கத்தக்கது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எமது நாடு பல்வேறு விடயங்களுக்கு உலகிலே பிரசித்தி பெற்றிருக் கின்றது. குறிப்பாக இலவச வைத்திய சேவை, இலவசக் கல்வி என்பன அரசாங்கத்தினால் வழங்கப்படுவது, பிற நாடுகள் மத்தியில் வரவேற்கக்கூடிய விடயமாகப் பார்க்கப்படுகின்றது. இந்த நாட்டிலே தரம் 1இலிருந்து பல்கலைக்கழகம் வரை இலவசக் கல்வி நடைமுறையில் இருக்கின்றபோதும்கூட, பல்கலைக்கழகக் கல்வி வரை இலவசமாகக் கல்வி பெறக்கூடிய மாணவர்களுக்கான ஆரம்பக் கல்வி என்பது இலவசக் கல்வியாக இல்லை என்பது தொடர்பாக நாங்கள் இந்த உயரிய சபையின் கவனத்தை ஈர்க்க வேண்டியிருக் கின்றது. மிக ஆரம்ப காலத்திலே, ஒரு பல்கலைக்கழக மாணவர் கூட பகுதிநேர வேலை செய்துகொண்டு தனது கல்வியைத் தொடர முடியும். ஆனால், ஆரம்பப் பாடசாலை களுக்குச் செல்லவேண்டிய ஐந்து வயது வரையான அந்தக் குழந்தைகளுக்கு ஆரம்பத்தில் - அவர்களின் மூளை வளர்ச்சிக் குள்ளாகக்கூடிய அந்தக் காலப்பகுதியில் - முறையான கல்வி வாய்ப்பைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பதுதான் அனைவரினதும் பொறுப்பாக இருக்கின்றது.

நமது நாட்டின் கல்வி முறைமைக்குள் துரதிஷ்டவசமாக இந்த ஆரம்பக் கல்விமுறை இலவசக் கல்வியாக இல்லாமல், முழுக்க முழுக்கத் தனியார் வசம் ஒப்படைக்கப்பட்டிருக்கின்ற, தனியார் சுயாதீனமாக மேற்கொள்கின்ற ஒரு கல்வி முறையாகக் காணப்படுகின்றது. நமது முறைமையிலே அவ்வாறு இல்லாததன் காரணமாக, ஒரு தொழில் வாய்ப்புக் காகவோ வணிக நோக்கத்துக்காகவோ இதனைப் பொறுப்பேற்று நடத்தும் தனியார் துறையினர் இருக்கின்ற பட்சத்தில், அதற்கு அப்பால் இந்தக் குழந்தைகளை நல்ல பிரஜைகளாக உருவாக்க வேண்டும் என்ற தன்னார்வத்தோடு செயற்படுகின்ற பல பாடசாலைகளையும் நாங்கள் பார்க் கின்றோம். அத்தகைய பாடசாலைகளை ஊக்குவிக்க வேண்டும் என்பதுதான் இந்தப் பிரேரணையின் மிக முக்கிய மான நோக்கமாக இருக்கின்றது. எனவே, இந்த ஆரம்பக் கல்வியை ஒரு முறைமைக்குள் கொண்டுவர வேண்டும். அவ்வாறு முறைமைக்குள் கொண்டுவருவதனூடாக நாட்டிலே பாலர் பாடசாலைகளை - ஆரம்பப் பாடசாலைகளை ஒரு முறையான திட்டத்திற்குள் நடைமுறைப்படுத்துவதற்கான ஒழுங்குவிதிகளை உருவாக்க வேண்டும் என்ற விடயத்தைக் கௌரவ உறுப்பினர் அவர்கள் தனது பிரேரணையிலே முன்வைத்திருக்கின்றார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தக் கட்டத்திலே நான் மிக முக்கியமான ஒரு விடயத்தை இந்தச் சபையின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். அதாவது, இந்த நாடு முழுவதிலும் பாலர் பாடசாலைகள் தனியாரால் நடத்தப்பட்டு வருகின்றபோதிலும், பெருந் தோட்டப் பகுதிகளிலே அவற்றை ஆரம்பிக்கின்றபொழுது அதற்கான அனுமதி பெறுவது அல்லது அதனை நடத்துவது தொடர்பாகப் பல்வேறு சிக்கல்கள் காணப்படுகின்றன. நான் ஏற்கெனவே இந்தப் பாராளுமன்றத்தில் மிக முக்கியமான பிரேரணை ஒன்றை முன்வைத்திருக்கின்றேன். அதாவது, பெருந்தோட்டப் பகுதிகளிலே வசிக்கக்கூடிய மக்களுக்குப் பிரதேச சபைகளின் சேவை முழுமையாகக் கிடைப்பதில் சட்டச் சிக்கல்கள் இருப்பதன் காரணமாக, அந்த 1987ஆம் ஆண்டின் 15ஆம் இலக்கச் சட்டம் திருத்தப்பட வேண்டும் என்பதான ஒரு பிரேரணையை முன்வைத்திருந்தேன். அது போலத்தான் பெருந்தோட்டப் பகுதிகளிலே நிருவகிக்கக்கூடிய பாலர் பாடசாலைகளை யார் நடத்துவது என்பது தொடர்பில் இன்னும் பல்வேறு பிரச்சினைகள் காணப்படுகின்றன. பெருந்தோட்ட மனித வள அபிவிருத்தி நிறுவனம் இன்னும் தோட்ட முகாமைத்துவத்தின்கீழாக இருக்கக்கூடிய சிறுவர் பராமரிப்பு நிலையங்களின் ஊடாக அவற்றை முன்கொண்டு செல்ல முற்படுகின்றது. அதேபோல தன்னார்வத் தொண்டர் நிறுவனங்களும் தன்னார்வலர்களும் அவற்றை நிர்வகிக்க முற்படுகின்றார்கள். பிரதேச சபை இதற்குரிய அனுமதியைப் பெற்றுக்கொடுக்க வேண்டியிருக்கின்றது. எனவே, இவ் வாறான சிக்கல்கள் இருக்கின்ற கட்டத்தில் தேசிய ரீதியாகக் கொள்கையொன்றை வகுத்து, பாலர் பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்கு இந்தப் பிரேரணையின்மூலம் கவனம் செலுத்தவேண்டுமெனக் கேட்டுக்கொண்டு, வாய்ப்பளித் தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පාර්ලිමේන්තු නියෝජ්‍ය කථානායකතුමා)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මැතිතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් වෙන් වී තිබෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

[අ.භා. 12.45]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය විසින් ගෙනෙන ලද මේ යෝජනාව ඉතාම සුවිශේෂ, කාලීන යෝජනාවක් බව මා මේ මොහොතේ අවධාරණය කරනවා. අනාගත පරපුරේ, එනම් සිසු පරපුරේ තිඹිරි ගෙය තමයි පෙර පාසල, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කුඩා කාලයේදී පෙර පාසල් ගැන අසා තිබුණේත් නැහැ; අපි ඒවාට ගියේත් නැහැ. ඔබතුමාට මතක ඇති, අපේ අධ්‍යාපනයේ තිඹිරි ගෙය වුණේ, අපේම ඉස්කෝලේ හෝඩියේ පන්තිය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පන්සල.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

පන්සලේ තමයි අකුරු කියෙව්වේ. පන්සලේ ලොකු හාමුදුරුවෝ තමයි අකුරු කියෙව්වේ. ඊට පස්සේ තමයි ඉස්කෝලෙට ගියේ. හෝඩියේ පන්තිය, එහෙම නැත්නම් පහළ බාලාංශය කියලා තමයි ඒකට කිව්වේ. හැබැයි ඒක තිබුණේ පන්සලේ නොවෙයි, ඉස්කෝලේ; ඉස්කෝලෙට පිටින් නොවෙයි තිබුණේ. ඒ නිසා අපි ඉගෙන ගත්තේ ඒ පාසලේමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෝඩියේ පන්තියේදී අපට ඉගැන්වූවේ පුහුණුව ලැබූ ගුරුතුමියක්. අපි එතුමියට කිව්වේ, ලොකු ඉස්කෝලෙ හාමිනේ කියලායි, එහෙම නැත්නම් "ලොකු ටීචර්" කියලායි. හැබැයි අපි එතුමියට හරි බයයි. නමුත් එතුමිය අපට හරිම ආදරෙයි. ඒ වාගේම අපිත් එතුමියට හරිම ආදරෙයි.

මීට දශක හතරකට පමණ පෙර තමයි මේ පෙර පාසල්, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ආරම්භ වුණේ. අද අපේ රටේ සිසු පරපුරේ -අනාගත පරපුරේ- ඉරණම විසඳන තීරණාත්මක, සුවිශේෂී මධ්‍යස්ථානය තමයි මේ පෙර පාසල, එහෙම නැත්නම් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය. එතැනින් තමයි දරුවෙක් අගතිය කරා හෝ ප්‍රගතිය කරා යොමු වන්නේ කියන එක මා අවධාරණය කරනවා. එතැනින් වැරදුණොත්, එතැනින් ඇද වැටුණොත්, ඒ දරුවාගේ අනාගතය පිළිබඳව කථා කරන්න වෙනත් තැනක් ඉතුරු වන්නේ නැහැ. ඒ නිසා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය -පෙර පාසල- කියන්නේ ඉතාම සුවිශේෂී, ඉතාම තීරණාත්මක තැනක් බව මා අවධාරණය කරනවා. ඒ නිසාම මේ සඳහා රජයේ, අධ්‍යාපන අමාත්‍යවරුන්ගේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න සියලුම බලධාරීන්ගේ සුවිශේෂී අවධානයක් යොමු විය යුතුමයි. නමුත් බෙදවාචකය තමයි, ඉහත කී සියලුම අය, අධ්‍යාපන අමාත්‍යවරු, අගමැතිවරු, ජනාධිපතිවරු, ඒ වාගේම බලධාරීන් -පෞද්ගලිකව හෝ සාමූහිකව- මේ පිළිබඳව තුට්ටුවකටවත් ගණන් නොගැනීම; නොසලකා හැර තිබීම; අයාලෙ යන්න ඉඩ හැර තිබීම. ඒක තමයි අපේ රටේ තිබෙන බරපතළම බෙදවාචකය. ඒ නිසා මේ පිළිබඳව වැඩි වශයෙන් අවධානය යොමු කරලා, ප්‍රශස්ත මූල්‍ය දායකත්වයක් සපයලා, දරුවන්ගේ මානසික හා ශාරීරික ක්‍රියාකාරිත්වය සමබරව පවත්වා ගත හැකි සරල, විද්‍යාත්මක ක්‍රමවේදයක් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට වහාම හඳුන්වා දිය යුතුයි කියලායි අපි විශ්වාස කරන්නේ.

පෙර පාසලේ පසු බිම ඉතාම වැදගත් වෙනවා. එය ක්‍රමවත් වෙන්න ඕනෑ. ඒ වාගේම ඒ ස්ථානය දරුවන්ගේ මානසික සහ ශාරීරික ක්‍රියාකාරකම් නිදහස්ව, ඉතාම සරලව කරගෙන යන්න පුළුවන්, ඉඩකඩ තිබෙන ස්ථානයක් බවට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම දරුවාගේ මානසික හා ශාරීරික ක්‍රියාකාරකම් වර්ධනයට සෙල්ලම් මිදුල ඉතාම අත්‍යවශ්‍යයි. ඒක පෙර පාසලකට ඉතාම අත්‍යවශ්‍යයි. අපේ රටේ තිබෙන පෙර පාසල්වලින් සියයට 25කවත් සෙල්ලම් මිදුලක් තිබෙනවාය කියලා මම නම් හිතන්නේ නැහැ. එහෙම නැති වුණාම දරුවන් ඉගෙන ගන්නේ නැහැ. දරුවන්ගේ ක්‍රියාකාරකම් හරියාකාරව සිදු වන්නේ නැහැ. ඔවුන් ගර්භීත දරුවන් බවට පත් වෙනවා. ඒ වාගේම ඒ ස්ථානය ඉඩකඩ තිබෙන ස්ථානයක් වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැකලා තිබෙනවා, අපට අත් දැකීම් තිබෙනවා, සමහර ස්ථානවල සැමන් ටින් අට්ටි ගැහුවා වාගෙයි. එවැනි ස්ථානවල දරුවන් එකිනෙකාට තද වෙලා - කිට් කිටියේ තද වෙලා- තමයි ඉගෙන ගන්නේ. ඒවා කෙරෙහි අවධානය යොමු වෙලාම නැහැ. ඒ වාගේ ස්ථානයකදී දරුවන්ට ඉගෙනීමේ කටයුතු කර ගන්න පහසු තත්ත්වයක් ඇති වෙන්නේ නැහැ.

ඒ ස්ථානවල අනිවාර්යයෙන්ම දරුවාට ගැළපෙන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ස්ථාපිත කළ යුතුයි. ඒ වාගේම සිත් ඇද ගන්නා පරිසරයක් එම ස්ථානවල තිබිය යුතුමයි. එහෙම වුණොත් පමණයි මේ මධ්‍යස්ථානවලින් ලැබෙන මහපෙන්වීම තුළින් දරුවා සාර්ථක ලෙස අනාගතයට පා පොඩි ඔසවන්නේ. එම නිසා පෙර පාසල් ගුරුවරියට අනිවාර්යයෙන්ම සුවිශේෂී පුහුණුවක් ලබා දිය යුතුමයි. එහෙම නැති වුණොත් ඒ දරුවන්ගේ අනාගතය අඳුරු වෙන්නට ඉඩ තිබෙනවා. එම නිසා රජය, ආණ්ඩුව සහ අධ්‍යාපන බලධාරීන් මැදිහත්වෙලා පෙර පාසල් අධ්‍යාපනය සුවිශේෂී වගකීමක් වශයෙන් තේරුම් අරගෙන ඒ සඳහා අවශ්‍ය සියලුම භෞතික හා මානව සම්පත් ලබා දීලා -ඒ කියන්නේ මූල්‍ය සම්පත් ලබා දීලා- පෙර පාසල් අධ්‍යාපනය ශක්තිමත් කරන්න කියන ඉල්ලීම අපි කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව අපි කරගෙන යන කාලයේ සුවිශේෂී පෙර පාසල් තුනක් ආරම්භ කළා. ඒ තමයි, උද්දකන්දර පෙර පාසල, දඩවිල පෙර පාසල සහ කිරින්ද පෙර පාසල. මේ තුළින් දරුවා පාසලේ පළමු වසරට ඇතුළත් වන විට ඉතාමත්ම සාර්ථක විධියට ඒ අයගේ ශාරීරික, මානසික තත්ත්වයන් වර්ධනය කරලා සූදානම් කරන්නට හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම වෛද්‍යවරු ගෙන්වලා දරුවාගේ සෞඛ්‍ය තත්ත්වයන් සම්බන්ධයෙන් වෙනම file එකක් හදලා ඒ දරුවන් ඇතුළත් වන පාසල්වලට යැව්වා. ඒ විධියට ඉතාමත්ම සාර්ථක පෙර පාසල් ක්‍රියාත්මක වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා "හොඳම දේ දරුවන්ට" කියන වාක්‍ය ඛණ්ඩය තොල් මතුර මතුරා ඉන්නේ නැතිව, මේ දරුවන්ගේ අනාගත පැවැත්ම සඳහා ඉතාමත්ම ප්‍රශස්ත හා ප්‍රායෝගික අර්ථයක් ලබාදීමට වර්තමාන යහ පාලන ආණ්ඩුව ක්‍රියාත්මක විය යුතුයි කියන කාරණය අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.52]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඉදිරිපත් කළ යෝජනාව ඉතාමත්ම කාලෝචිත සහ වටිනා යෝජනාවක්. මේ යෝජනාවටම තවත්

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

වැදගත් කාරණයක් එකතු කරමින් මගේ කථාව පටන් ගන්නට කැමැතියි.

අපි දන්නවා, අද රටේ පාසල් අධ්‍යාපනය රැඳී පවතින්නේ විද්‍යාපීඨ ගුරුවරුන් නිසා බව. මේ විද්‍යාපීඨ සංකල්පය අපේ ගරු අග්‍රාමාත්‍යතුමා අධ්‍යාපන අමාත්‍යවරයාව සිටි කාලයේ ආරම්භ කළ එකක්. එම සංකල්පය තුළ මේ රටේ පාසල් අධ්‍යාපනය ඉතාමත් හොඳින් රැඳී පවතිනවා. රටට අවශ්‍ය විධියේ පාඨමාලාවක් හැටියටයි එදා මේ විද්‍යාපීඨ ඇති කළේ. ඒ වාගේම මම රජයෙන් ඉල්ලීමක් කරන්නට කැමැතියි. අපේ රටේ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කරන්නට රාජ්‍ය ආයතන නැහැ. එම නිසා පළාතකට එක බැගින්වත් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා වන විද්‍යාපීඨ ආරම්භ කළ යුතුයි. එවැනි විද්‍යාපීඨ ආරම්භ කළොත් අපේ ගරු මන්ත්‍රීතුමිය යෝජනා කළා වාගේ මනෝ විද්‍යාව සහ පෙර පාසල් සඳහා අවශ්‍ය විවිධ විෂයයන් ඒකාබද්ධ වුණු ඉතාමත් හොඳ පාඨමාලාවක් ආරම්භ කිරීමට හැකි වෙනවා.

පෙර පාසල් ගැන කථා කරනවා වාගේම අපි විශ්වවිද්‍යාල ගැනත් කථා කළ යුතුයි. අද උදේ විශ්වවිද්‍යාල ගැන කථා කළ නිසා ඒ සම්බන්ධයෙනුත් පොඩ්ඩක් කථා කිරීමට මම අවසරය ඉල්ලා සිටිනවා. මොකද, මේ පෙර පාසල් යන දරුවාට අවසානයේ යන්නට තිබෙන්නේ රාජ්‍ය විශ්වවිද්‍යාල. රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය පෞද්ගලිකරණය කරන්නට රජය හැටියට අපි කිසිමදාක හිතලාවත් නැහැ; කරන්නෙත් නැහැ. අපි රජය ලෙස ප්‍රතිපත්තිමය තීරණයක සිටිනවා රාජ්‍ය විශ්වවිද්‍යාලවලට දැනට වසරකට ඇතුළත් කර ගන්නා 27,000ක සිසුන් ප්‍රමාණය 2020 වන විට 50,000 දක්වා වැඩි කරනවා කියලා. ඒක තමයි අපේ අනාගත සැලසුම. ඒ වාගේම අද පත්තරයේ පළ වෙලා තිබුණා, පේරාදෙණිය විශ්වවිද්‍යාලය සහ කොළඹ විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අයින් කරලා මුදල් උපයන ආයතන බවට පත් කරනවා කියන කථාවක්. මේ කථාව කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා COPE එකේ උසස් අධ්‍යාපනය පිළිබඳ අනු කමිටුවේදී කිව්වා කියන කාරණය තමයි සඳහන් වෙලා තිබුණේ. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මගේ නමත් සඳහන් කරමින් මේ ගැන ප්‍රකාශ කළා.

මේ සම්බන්ධයෙන් අපි පැහැදිලිවම කිවයුතුයි. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්ය - මහාචාර්යවරුන් ගෙනැල්ලා අපි කථා කළා.

විශ්වවිද්‍යාල UGC එකෙන් ගලවලා මුදල් උපයන ආයතන බවට පත් කරන්න නොවෙයි කථා කළේ. ආංශික අධීක්ෂණ කාරක සභා ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ආංශික අධීක්ෂණ කාරක සභා තිබෙන්නේ මන්ත්‍රීවරුන්ට රජයේ පාලනයට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී දායක වෙන්නයි. එතකොට අපට විවිධ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්; අපට සාකච්ඡා කරන්නත් පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා විවාදයේද ඉන්නේ?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මට අවස්ථාව දෙන්න. මේක පෙර පාසල් දරුවන්ට සම්බන්ධ කරුණක්. මොකද, පෙර පාසල් දරුවෝ තමයි ඉගෙන ගෙන අවසානයේ විශ්වවිද්‍යාලවලට යන්නේ. අපි මෙතැනදී පැහැදිලිව සාකච්ඡා කළේ දැනට විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රශ්න ගැන. විශ්වවිද්‍යාලවල තිබෙන ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, ආචාර්යවරුන්ගේ හිඟය. පුරප්පාඩු තිබෙනවා. නමුත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ පත් කිරීම් සම්බන්ධව යම් යම් බාධා තිබෙන නිසා එම පුරප්පාඩු සම්පූර්ණ කර ගන්න විධියක් නැහැ. ඊට අමතරව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට පර්යේෂණ කරන්න, විශ්වවිද්‍යාලවල අලුතින් පාඨමාලා පටන් ගන්න විවිධ බාධා තිබෙනවා. මේ බාධා ඉවත් කිරීමට සුදුසු ක්‍රමයක් හැටියට කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා කියා සිටියා, -සියලු උපකුලපතිවරු එකතු වෙලා කථා කළා- විශ්වවිද්‍යාලවල Autonomy and Governance ගැන පර්යේෂණයක් කළා කියලා. මේ පර්යේෂණය ගැන අපි සාකච්ඡා කළා. මේ අවස්ථාවේදී අපි සාකච්ඡා කළේ Autonomy and Governance කොහොමද විශ්වවිද්‍යාලවලට ලබා දෙන්නේ කියලා. ඒ හැර අපි කිසිම තැනක සාකච්ඡා කළේ නැහැ, විශ්වවිද්‍යාල සම්පූර්ණයෙන් ස්වාධීන කරලා විශ්වවිද්‍යාලවල අලුතින් පාඨමාලා පටන් ගන්න-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විෂයට අදාළව කථා කළා නම් හොඳයි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මම විෂයට එන්නම්. මට විෂයට එන්න පොඩ්ඩක් ඉඩ දෙන්න. එවැනි පාඨමාලා පටන් ගන්න අපි අවස්ථාව හදලා නැහැ. උදාහරණයකට මම කලින් කියපු පෙර පාසල් ගුරුවරුන් - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මට අවස්ථාව දෙන්න.-පුහුණු කිරීම වාගේ පාඨමාලා විශ්වවිද්‍යාල ඇතුළේ පටන් ගන්න පුළුවන්. අපට විද්‍යා පීඨ වාගේම, විශ්වවිද්‍යාල ඇතුළේත් මෙවැනි පාඨමාලා පටන් ගන්න පුළුවන්. ඒ අවස්ථාව දෙන්න නම් එම සාකච්ඡාව විශ්වවිද්‍යාල තුළ ඇති විය යුතු වෙනවා. එහෙම වුණොත් විතරයි මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සියලුම තැන්වලට බද්ධ වෙච්ච අධ්‍යාපන ක්‍රමයක් යන්නේ. විශ්වවිද්‍යාල සහ පෙර පාසල් ආදී සියලු කාරණා බද්ධ වෙච්ච අධ්‍යාපන ක්‍රමයක් තමයි මේ රටේ තිබුණේ. නොමිලේ අධ්‍යාපනය ලබා ගන්න ක්‍රමවේදය මේ රටේ ස්ථාපිත විය යුතුයි. ඒකට කිසි විටෙක අපි ඇඟිලි ගහන්නේ නැහැ. ඒ වාගේ දෙයක් කරන්න රජයක් හැටියට කිසිම ප්‍රතිපත්තියක් නැහැ. පට්ටපල් බොරු තමයි මේ පත්තරවලින් කියන්නේ. ඊයේ මහින්ද රාජපක්ෂ මහත්මයා, මාත් එක්ක වාදයකට පැටලුණා. ඒවායේ ප්‍රතිඵලද දන්නේ නැහැ, මේ විධියට පත්තරවලින් එන්නේ. සමහර වේලාවට මේ දේවල් දේශපාලන කුමන්ත්‍රණ වෙන්නත් පුළුවන්. අපට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න, විවාද කරන්න අයිතිය තිබෙනවා. ඒ අයිතිය යටතේ තමයි අපි අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන්නේ; අධ්‍යාපනය සම්බන්ධයෙන් පර්යේෂණ කරන්නේ. එම නිසා පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය, විශ්වවිද්‍යාල දරුවන්ගේ අධ්‍යාපනය ආදී මේ සියලු දේවල් ඒකාබද්ධ වෙච්ච දේවල් හැටියටයි මේ රටේ තිබෙන්නේ. කොළඹ විශ්වවිද්‍යාලයත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයත් UGC එකෙන් ගලවලා මුදල් උපයන ආයතන බවට පත් කරන්න අපි කිසිම වේලාවක උත්සාහ කරන්නේ නැහැ.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට විශ්වවිද්‍යාල ඇතුළේ වැඩ කරන්න තිබෙන බාධා ඉවත් කරලා, නිදහස ලබා දීම ගැනයි සාකච්ඡා කළේ. මේක වැරැදි වැටහීමක්. අපි මේ වැරැදි වැටහීම

නිවැරදි කළ යුතු වෙනවා. අවසාන වශයෙන් මම යෝජනා කරන පාඨමාලා, ඒ කියන්නේ පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ පාඨමාලා අපට ඇත්තටම විශ්වවිද්‍යාල ඇතුළේ පටන් ගන්න පුළුවන්. මේ රටේ පළාත් නවය ඇතුළත තිබෙන පෞද්ගලිකව පාලනය වන පෙර පාසල් ගත්තොත්, එම පෙර පාසල්වල ගුරුවරුන් කොහොමද පුහුණු වුණේ කියන එක, කොහොමද දැනුම ලබා ගත්තේ කියන එක අපි කවුරුත් දන්නේ නැහැ. සමහර විට විවිධ ආයතන, පෙර පාසල් මඟින් නිකුත් කරන ලද සහතික මත පූර්ව ළමා වියේ දරුවන්ට අධ්‍යාපනය ලබා දෙනවා. මෙන්න මේ අය සඳහා පැහැදිලි ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගත යුතු වෙනවා.

මෙම අවස්ථාවේ මේ ගරු සභාවේ උසස් අධ්‍යාපන ඇමැතිතුමාත් ඉන්නවා. අපි ඇමැතිතුමාට යෝජනා කරනවා විශ්වවිද්‍යාල ඇතුළේ හෝ පාඨමාලා පටන් ගන්න කියලා. එතකොට අපේ රටේ තරුණ තරුණියන්ට ඉදිරියේදී තමන්ගේ වෘත්තීය මට්ටම වැඩිදියුණු කර ගන්න පුළුවන්. ඒ වාගේ අවස්ථාවල කොළඹ විශ්වවිද්‍යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය වාගේ විශ්වවිද්‍යාල ඔක්කොම නිදහසේ හිතලා අලුතින් පාඨමාලා පටන් ගන්නයි තිබෙන්නේ. එම පරිසරය සැදිය යුතුයි කියලා මම යෝජනා කරනවා.

[අ.භා. 1.00]

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පෙර පාසල් අධ්‍යාපනය විධිමත් කිරීම සම්බන්ධයෙන් රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරන ලද යෝජනාව මමත් ස්ථිර කරනවා. විශේෂයෙන්ම පෙර පාසල් අධ්‍යාපනය ගැන කථා කරද්දී ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු තුන, හතර, පහ කියන වයස්වල දරුවෝ තමයි පෙර පාසලට යන්නේ. අද අපේ රටේ තිබෙන පෙර පාසල් ගැන බලනකොට, වැඩි ප්‍රතිශතයක් අපේ රටේ තිබෙන සමාජයීය ප්‍රශ්නවලට ගැළපෙන පරිදි ඒ අවශ්‍ය ප්‍රමිතිය සකස් වෙලා නැහැ. පෙර පාසල් අධ්‍යාපනය ලබා දෙන ගුරුවරියට අවම සුදුසුකමක් කොහේවත් නියම කරලා නැහැ. ඒ වාගේම ඒ අය හදාරලා තිබෙන්න ඕනෑ පාඨමාලා මොනවාද කියන කාරණා සම්බන්ධයෙන් ඇත්තටම රජයක් විධියට මැදිහත් වෙලා වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි.

උග්‍ර ජාතිවාදී කණ්ඩායම්, උග්‍ර ආගම්වාදී කණ්ඩායම්, උග්‍ර පන්ති භේදය තිබෙන කණ්ඩායම් අද අපි දකිනවා. මේ ප්‍රශ්නවලට අපි පිළිතුරු සෙවිය යුත්තේ මේ දරුවා සමාජයෙන් යම් යම් දේවල් ලබා ගන්නා අවස්ථාවේමයි; සමාජයෙන් ඉගෙන ගන්න පටන් ගන්න වෙලාවේමයි. මූලික අධ්‍යාපනයේ ඉඳන් ඇති වෙලා තිබෙන මේ තත්ත්වයන් එක්ක අපේ රට තුළ මේ වනකොට සහනයක් නැති, සමානාත්මතාවක් දකින්න බැරි, කාටත් එක විධියට සලකන්න බැරි සමාජයකුයි බිහි වෙලා තිබෙන්නේ. එම නිසා අපේ රටේ පෙර පාසල් අධ්‍යාපනය ගැන අපේ මේ ගරු සභාවට අපේ මන්ත්‍රීවරු කරුණු එකතු කළා. ඊට අමතරව මම මේ කාරණය කියන්න කැමැතියි. මේ රටට ගැළපෙන විධියට, රටේ අනාගතය වෙනුවෙන් අපි විසඳිය යුතු ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන් ජාතීන් අතර ප්‍රශ්න ඇති නොවන්නට, ආගම් අතර ප්‍රශ්න ඇති නොවන්නට, පන්තීන් අතර ප්‍රශ්න ඇති නොවන්නට සියලුදෙනාට සමානාත්මතාවෙන් සලකන සමාජයක් බිහි කරන්නට අවශ්‍ය කරන විධියේ පාඨමාලාවක් දරුවන්ට දෙන්නට පුළුවන් වෙන විධියට ගුරුවරු දැනුවත් කරලා, ගුරුවරුන්ට ඒ දැනුම දීලා සකස් කරන්න ඕනෑ.

මම විශ්වාස කරනවා, යම් කිසි පරාසයක් තුළ මේ විෂය කරුණු දරුවාට උගන්වන එක නොවෙයි, -අකුරු ලියන්න උගන්වන එකද, ඉංග්‍රීසි වචන කියන්න උගන්වන එකද නොවෙයි,- පුංචි කාලයේ ඉඳන්ම හොඳ ආකල්ප හදන්න ඕනෑ කියලා. ඉගෙන ගන්න එක දරුවන්ට තිබෙන බුද්ධි මට්ටමේ හැටියට ඒ ළමයින් ඉදිරියේදී කර ගනීවි. ඒක නිසා හොඳ ආකල්පවලින් සම්පූර්ණ, දැනුම තිබෙන, හොඳ පෞරුෂයක් තිබෙන රටට අවශ්‍ය කරන දරුවෙකු බිහි කරන්නට පෙර පාසල් සම්බන්ධයෙන් අවශ්‍ය කරන විෂය නිර්දේශයක් සකස් විය යුතුයි. ඒ වාගේම පෙර පාසල් හැම තැනම තිබෙනවා. රෝහිණී කුමාරි මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මේක ස්වයං රැකියාවක් විධියට හැමෝම ගෙවල් කිට්ටුව ගෙවල් ටිකක් වට කරගෙන පෙර පාසලක් පටන් ගන්නවා. එහෙම නොවෙයි, ප්‍රමිතියෙන් යුතු පෙර පාසල් ක්‍රමයක් මේ රටේ ඇති කරන්න ඕනෑ.

පෙර පාසල් ගුරුවරුන් මේ ළමයින්ට උගන්වලා සල්ලි හොයාගෙන ජීවත් වෙන ක්‍රමයක් නොවෙයි ඇති කළ යුතු වන්නේ. අපේ හිටපු ජනාධිපතිතුමා -මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා- 2014 අය වැයේදී පෙර පාසල් ගුරුවරුන්ට රුපියල් 2,500ක දීමනාවක් දෙන්න තීරණය කළා. ඒකත් යහපාලන ආණ්ඩුව ආවාට පස්සේ ක්‍රියාත්මක වුණේ නැහැ. මම කියන්නේ රුපියල් 2,500 නොවෙයි, ඊට වඩා සාධාරණත්වයක් කරන්න කියලායි. ඒ ගුරුවරුන්ට ළමයි ගණන එකතු කරගෙන ඒ මත යැපෙන්න ඉඩ දෙන්න හොඳ නැහැ. පෙර පාසල් ගුරුවරුන් විශාල සමාජ මෙහෙවරකුයි කරන්නේ. ඒ අයට අවශ්‍ය දැනුම සහ ඒ අයට අවශ්‍ය පාඨමාලා හදාරන්න අවස්ථාව දෙනවා වාගේම ඒ අයට ජීවත් වෙන්නත් අවශ්‍ය කරන පසු බිම සකස් කළ යුතුයි. අභිංසක කාන්තාවන් තමයි පෙර පාසල් ගුරුවරියන් විධියට ඉන්නේ. ඒක නිසා යම් කිසි දීමනාවක් ලබා දෙන එකත් බොහොම සාධාරණ විධියට කළ යුතුයි කියන යෝජනාව කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

[අ.භා. 1.05]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

එතුමියත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉඳලා නේ පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ඒක තමයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමිය දේශපාලනයට පිවිසුණත්, ගුරු වෘත්තිය පිළිබඳව තිබෙන ඇල්ම

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

බැල්ම තවම අඩු කර නැහැ. ඒ නිසාම එතුමිය මෙවැනි හරවත් යෝජනා ගෙන එනවා. මෙවැනි යෝජනා ගෙන එන කොට මීට වග කිව යුතු අමාත්‍යාංශවල අමාත්‍යවරුන් මේ ගරු සභාවේ හිටියා නම්, තමන්ගේ අමාත්‍යාංශයේ වැඩි වර්ධනය සඳහා මේ මන්ත්‍රීවරුන්ගෙන් බොහොම සාධනීය කරුණු එකතු කර ගතහැකිව තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක පළාත් සභාවට අයිති විෂයයක් නේද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ඒ සම්බන්ධව පළාත් සභා ප්‍රඥප්තියක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමහර තැන්වල පළාත් පාලන ආයතන මඟින් පෙර පාසල් පවත්වාගෙන යනවා. නමුත්, මේ පෙර පාසල් අධ්‍යාපනය කියන්නේ අපේ රටේ ජාතික අධ්‍යාපනයට ඇතුළත් විය යුතු සුවිශේෂී කොටසක් කියා අප හිතනවා. එහෙම නැතිව, තැන් තැන්වලින් පෞද්ගලිකව හෝ පළාත් පාලන ආයතන තමන්ගේ හිතු මනාපයට මේ කාර්යය කරන්න ගියොත් රටේ අධ්‍යාපනය ආරම්භ වන තැන තමයි අඩාළ වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, මේ පෙර පාසල් අධ්‍යාපනයට ලෝකයේ වසර සියයකට වැඩි ඉතිහාසයක් තිබෙන බව. වෛද්‍යවරියක හා අධ්‍යාපන විශේෂඥවරියක වුණු මාරියා මොන්ටිසෝරි මැතිනිය තමයි ඉතාලියේ, රෝමයේදී 1907 පමණ කාලයේදී මේ "මොන්ටිසෝරි" අධ්‍යාපනය කියන සංකල්පය ආරම්භ කළේ. අප පෙර පාසල් ගුරුවරුන්ගේ හැකියා සහ ඔවුන්ගේ අධ්‍යාපන විශේෂඥභාවය වැඩිදියුණු කරන්න යෝජනා ගණනාවක් ඉදිරිපත් කළා.

රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියගේ යෝජනාවේ වැදගත් කරුණු කීපයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉන් එකක් තමයි, පෙර පාසල්වල භෞතික පහසුකම් පවත්වා ගැනීම වැඩිදියුණු කිරීමටත්, පෙර පාසල් පාලිකාවන් සඳහා නිශ්චිත වැටුප් සහ දීමනා ලබාදීමටත් කටයුතු කළ යුතුය කියන කාරණයත්. ඇත්තටම මේ යෝජනා ගැන සංකල්ප ගොඩක් ඉදිරිපත් කරන්න අපට පුළුවන්. නමුත්, ආණ්ඩුවක් හැටියට සූදානම් වෙන්න ඕනෑ, ඒ සඳහා අවශ්‍ය කරන මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන්න. නැත්නම් මෙහි ගුණාත්මක තත්ත්වය ඉහළ නංවන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ.

'පෙර පාසල්' කියන විෂයය අයත් වන ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයට පසු ගිය අය වැයෙන් වෙන් කළේ රුපියල් මිලියන 100යි. ඒ මුදල වෙන් කළේ පෙර පාසල්වලට විතරක් නොවෙයි. කනගාටුවට කාරණය ඒකයි. රුපියල් මිලියන 100කින් පෙර පාසල්වලටත් මොනවා හෝ කරලා ළමයින් හා කාන්තාවන් වෙනුවෙන් කරන්න පුළුවන් මොනවාද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. හැබැයි, එහෙම තියෙද්දි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ මගේ අතේ තිබෙන පරිපූරක ඇස්තමේන්තුවෙන් ඇමතිවරුන්ගේ ගෙවල් තුනක් අලුත්වැඩියාවටත්, ඇමතිවරු දෙදෙනෙකුට වාහන ගන්නත් රුපියල් මිලියන 125කට වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. මම අහන්නේ, මේ ඇමතිවරුන්ට වාහන අරගෙන දැන් ඇති වෙලා නැද්ද කියායි. පසු ගිය ආණ්ඩුව කාලයේත් ඇමතිවරු වාහන පාවිච්චි කළා. රාජපක්ෂ පාලනය තුළ ඇමතිවරු 110ක් හිටියා. ඒ ඇමතිවරු ගියේ පයින් නොවෙයි; බර කරත්තෙන් හෝ ගොන් කරත්තෙන් නොවෙයි. ඔවුන් පාවිච්චි කළ වාහන අමාත්‍යාංශයට තියෙන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවට පරිපූරක ඉදිරිපත් කර කර, හැම දාම ඇමතිවරුන්ට වාහන ගන්න රුපියල් කෝටි ගණන් වෙන් කර ගන්නවා. එහෙම තියෙද්දි, පෙර පාසල් නඩත්තුවටත්, එම ගුරුවරුන්ගේ යැපීම් දීමනා වෙනුවෙනුත් මුදලක් වියදම් කරන්නේ නැහැ. රුපියල් 2,500කින් පෙර පාසල් භාර ආචාර්යවරියකට මොකක්ද කරන්න පුළුවන්? මම දන්නේ නැහැ, ඒ උපදෙස් දුන්නේ අර රුපියල් 2,500කින් පවුලක් නඩත්තු කරන්න පුළුවන් කියපු නිසාද කියලා. හැබැයි, මේ රුපියල් 2,500ත් අවසානයේ රුපියල් 250ට අඩු වෙලා තිබෙන්නේ. ඔවුන්ට ප්‍රමාණවත් දීමනාවක් දෙන්නේ නැතිව, ඔවුන් මානසිකව තෘප්තියට පත් කරන්නේ නැතිව, ඔවුන් කොහොමද මේ අවුරුදු තුනේ, හතරේ, පහේ දරුවන් වෙනුවෙන් යම් සේවයක් කරන්නේ? ඒ නිසා ඇත්තටම මේ යෝජනාව සාර්ථකභාවයට පත් වෙන්න නම්, ආණ්ඩුව විසින් තීන්දුවක් ගත යුතුව තිබෙනවා. ඒක තමයි, පෙර පාසල් අධ්‍යාපනය ජාතික අධ්‍යාපනයේ කොටසක්ය කියලා හිතලා වැඩ කටයුතු කිරීම. මේ වෙනුවෙන් යම්කිසි ප්‍රශස්ත මුදල් ප්‍රමාණයක් වෙන් නොකර, මෙතැනින් එහා අපට මේ ගැන සාකච්ඡා කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව ඉල්ලීමක් කරන්න කැමැතියි. පසු ගිය දිනවල ඇති වුණු ගංවතුර නිසා අපේ දිස්ත්‍රික්කයේ විතරක් බුලත්සිංහල, මීල්ලනිය, අගලවත්ත කියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලත්, පාලින්ද නුවරත් තිබෙන පෙර පාසල් ගණනාවක් විනාශයට පත් වෙලා තිබෙනවා. ඒ බොහොමයක් පෞද්ගලික පෙර පාසල්; දරුවන් 40ක්, 50ක් ඉන්න තැන්. එම දරුවන්ගේ දෙමව්පියන්ගේ අනුග්‍රහයෙන් පමණක් ඒ පෙර පාසල් ප්‍රතිසංස්කරණය කරන්න බැහැ. එම නිසා ඔවුන් යම්කිසි මුදලක්, ආධාරයක් බලාපොරොත්තු වෙනවා. නමුත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් මේ වනතෙක් ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර තිබෙන බවක් මා දන්නේ නැහැ. දැන් අපට වුවමනාව තිබෙන්නේ මොකක්ද? රටේ අවධානය බොහෝ වෙලාවට යොමු වෙන්නේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපනය පිළිබඳව සහ පාසල් අධ්‍යාපනය පිළිබඳවයි. එම නිසා මේ පෙර පාසල් පිළිබඳව තිබෙන අවධානය ඉතාම සීමිත වෙලා තිබෙන්නේ. අපේ ගම්වල සිටින, සමහර විට උසස් පෙළ විභාගය සමත් වුණු, එහෙම නැත්නම් වෙනත් රැකියාවක් නොකරන තරුණියන් මැදිහත් වෙලා, වසර ගණනාවක් තිස්සේ මේ පෙර පාසල් අධ්‍යාපනය ලබා දීම් කරගෙන යනවා. ඔවුන් කරන සේවයට යම් ගෞරවයක් තිබෙන්නත් ඕනෑ. නමුත්, ඊට වඩා එහාට ගිය වැඩ පිළිවෙළකුත් තිබෙන්න ඕනෑ.

අපේ රටේ රැකියා නැති උපාධිධාරීන් ඉන්නවා. අපි මීට කලින් යෝජනාවේ කථා කළා, උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ නිසි ක්‍රමවේදයක් හදන්න ඕනෑයි කියලා. ඒ නිසා විශේෂවේදී උපාධිය ගත්ත -උපාධිධාරීන් සංඛ්‍යාවක් බඳවා ගෙන මේ දරුවන්ගේ මුල් ළමාවිය සංවර්ධනය විධිමත් කිරීම සඳහා යම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. අවශ්‍ය නම් අපට පුළුවන්, මේ වෙනුවෙන් විශ්වවිද්‍යාලවල අලුත් පාඨමාලා බිහි කරන්නත්. ඒ සඳහා අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට අපේ පූර්ණ සහාය ලබා දෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

[අ.භා. 1.11]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ගෙනා යෝජනාව බොහොම කාලෝචිත යෝජනාවක්. ඒ යෝජනාව ගෙනෙන කොට එක්තරා සිද්ධියක් මගේ මතකයට ආවා. එනම්, පසු ගිය මැයි මාසයේ 25 වැනිදා දවසපුරා වැහැලා, 26 වැනිදා වන කොට මේ රටේ බොහෝ ප්‍රදේශවල ගංවතුර ගලලා කඳු නාය යාම් සිදු වූ අවස්ථාවේ, කලවාන මැතිවරණ කොට්ඨාසයේ වේවැල්කඳුර ප්‍රදේශයේත් නාය යාම හේතුවෙන් 13දෙනකු මිය ගියා. එහිදී කලවාන පෙර පාසල් සංගමයේ සභාපතිතුමිය වන චන්ද්‍රා පනාවල ගුරු මාතාවත්, දරුවන් දෙදෙනාත්, ස්වාමී පුරුෂයාත් -මුළු පවුලම- එයට හසු වී මිය ගියා. එතුමිය අවුරුදු 17ක් පෙර පාසල් ගුරුවරියක හැටියට කටයුතු කළා. එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දරුවන් මුලින්ම ගෙදරදී 'අ' යන්න කිව්වාට පස්සේ පෙර පාසලට ගිහිල්ලා යමක් ඉගෙන ගන්නවා. අපි දන්නවා, ඉස්කෝලයට යන්න නිශ්චිත වයසක් තිබෙන බව. හැබැයි, පෙර පාසල්වල ඉතා කුඩා වයසේ දරුවනුත් ඉන්නවා. ගෙවල්වල තියා ගන්න විධියක් නැතිවද කියා මා දන්නේ නැහැ, සමහර අය දරුවා සාමාන්‍යයෙන් ඇවිදින්න පටන් ගන්න කොටම පෙර පාසලට යවනවා. පෙර පාසලට ඇතුළත් කර ගැනීමේ ක්‍රියා පටිපාටියට යම් කිසි ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. ඉස්කෝලෙට යන්න නියමිත වයස අවුරුදු 5 නම් පෙර පාසලට ඇතුළත් කර ගැනීමටත් එවැනි වයස් සීමාවක් තිබෙන්න ඕනෑ. ඇතැම් දරුවන් අවුරුදු දෙකක් පෙර පාසලට යනවා. ඊටත් වඩා කාලයක් පෙර පාසල් යන දරුවනුත් ඉන්නවා. ඒ නිසා මේ සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් තියෙන්න ඕනෑ. අපි පෙර පාසල්වලට කොච්චර වැඩ පිළිවෙළවල් හැදුවත් ඒවායේ අඩු පාඩු සොයා බලන්නේ නැහැ. පෙර පාසලක් register කරන්න ගියාම කියනවා, දරුවකුට මෙපමණ වර්ග අඩි ප්‍රමාණයක් ඕනෑ; මේ මේ පහසුකම් තිබෙන්න ඕනෑ; මේ මේ විධියට පෙර පාසල් කාමරය හදලා තිබෙන්න ඕනෑයි කියලා. මේවා කවුරුවත් ඉෂ්ට කරලා දුන්නේ නැත්නම් අර අහිංසක දරුවකුගෙන් රුපියල් 150ක්, 200ක් අරගෙන පෙර පාසලක් පවත්වා ගෙන යන්න බැහැ. ඒ නිසා අපි පෙර පාසලකට යම් කිසි මුදලක් දීලා ඒ වැඩ කටයුතු අංග සම්පූර්ණ කර දෙන්න ඕනෑ. අපේ රටේ දරුවන්ගෙන් සියයට 95ක් දැන් පෙර පාසල් අධ්‍යාපනය ලබනවා. පාසල් එන්න ඉස්සෙල්ලා මූලික අධ්‍යාපනය ලබන්නේ පෙර පාසලෙනුයි. ඒකට දැන් වෙනත් විධියේ තරගයකුත් තිබෙනවා.

නගරයේ පෙර පාසල්වලට ගියාම දරුවන් ගණුන් හදනවා කියනවා; ඉංග්‍රීසි කථා කරනවා කියනවා. ඒවා පෙර පාසලේ උගන්වන්න කියලා කොහේවත් කියලා නැහැ; ප්‍රඥප්තිවලත් නැහැ. ක්‍රියාකාරකම්, හඳුනා ගැනීම් වාගේ ඒවායි පෙර පාසල් දරුවන්ට කරන්න තිබෙන්නේ. ඒ නිසා මේවා ගැන මීට වඩා හොයා බලා මේ කටයුතු විධිමත් කරන්න ඕනෑ. නගරයේ පෙර පාසල, ගමේ පෙර පාසලට වඩා ලස්සන වෙන්න පුළුවන්; අඩු පාඩු සම්පූර්ණ වෙන්න පුළුවන්. හැබැයි, එකම දේ ඉගැන්වීම වෙන්න ඕනෑ. කොළඹ පෙර පාසල සහ ගමේ පෙර පාසල කියලා syllabus එකේ වෙනසක් වෙන්නේ නැහැ; එකයි තිබෙන්නේ. එහෙම නම් මේ කටයුත්ත විධිමත්ව හරියට කෙරෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර පාසල් විෂයය පළාත් සභාවේ විෂයක් කියලා කියනවා. ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2015 වර්ෂය සඳහා 2014 අය වැය ගෙනාපු අවස්ථාවේ අනෙකුත් කාරණා වාගේම පෙර පාසල් පාලිකාව ගැනත් හිතලා ඒ අයට රුපියල් 2,500ක මුදලක් මාස්පතා ගෙවන්න යෝජනාවක් ගෙනාවා; තව බොහෝ දේවල් දෙන්නත් ගෙනා යෝජනා තිබුණා. හැබැයි, 2015 ජනවාරි මාසයේ 29 වැනිදා මේ ආණ්ඩුව ගෙනා අතුරු අය වැයෙන්, රුපියල් 2,500න් එක බින්දුවක් කපලා එය රුපියල් 250 කළා. අද ඒ රුපියල් 250 ගන්න කවුරුවත් යන්නේ නැහැ. මොකද, AGA's office එකට ගිහිල්ලා කොළ පුරවන්න ගියාම රුපියල් 250ට වඩා වැඩි වියදමක් යනවා. ගරු සභානායකතුමා විතරයි මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නේ. ඒ නිසා එතුමාගෙන් හෝ ඉල්ලා සිටිනවා, දැනට අවුරුදු 2කට ඉස්සෙල්ලා ඉදිරිපත් වුණු රුපියල් 2,500ක් ලබා දීමේ යෝජනාවත් අවම වශයෙන් ක්‍රියාත්මක කරන්නය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දවස් පහක් පෙර පාසල් යන කොට අඩුම ගානේ සාරි තුනක්වත් ඒ පාලිකාවකට තිබෙන්න ඕනෑ. පෙර පාසල් පාලිකාවකට ඒ සාරි ටික ගන්නවත් බැහැ, මේ මුදලින්. සමහර දරුවන් සල්ලි දෙන්නේ නැහැ. ඒ අම්මලා, තාත්තලා සල්ලි දුන්නොත් ගන්නවා මිසක, private class එකට වාගේ සල්ලි ගෙවුවාම දෙන කාඩ් එක පෙන්වා ඇතුළට යන ක්‍රමවේදයක් පෙර පාසල තුළ නැහැ.

දරුවා අවුරුද්දම නිකම් යැව්වත් පෙර පාසල් පාලිකාතුමිය තමන්ගේ කටයුත්ත කරනවා. තමන්ගේ ජීවිතයේ හොඳම කාලයෙන් අවුරුදු 15ක්, 20ක් පුංචි දරුවන් වෙනුවෙන් වැය කරලා කීයක්වත් අතට ලැබෙන්නේ නැතිව අන්තිම කාලයේදී ඔවුන් ගෙදර ගිහිල්ලා අනුන්ගෙන් යැපෙන අය බවට පත් වෙනවා. මේ අය වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. විශ්වවිද්‍යාලවල සිටින උගත් අය, මේ පාර්ලිමේන්තුවේ අපි ඔක්කෝම ඇතුළු මේ රටේ විශාල පිරිසක් පෙර පාසල් ගිය අයයි. නමුත්, අපි මුල අමතක කරලායි හැම තිස්සේම කටයුතු කරන්නේ.

දැන් මේ සභාවේ ඉන්නේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා විතරයි. ඇමතිවරු කවුරුවත් දැන් මේ සභාවේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225ක් ඉන්නවා. නමුත්, දැන් මේ සභාවේ මන්ත්‍රීවරු 10ක් වත් නැහැ. අද උදේ දෙරණ නාලිකාවේ ගියා, "පාර්ලිමේන්තුවේ දවසකට ලක්ෂ ගාණක් වැය කරනවා; මාසයකට දවස් 8යි පාර්ලිමේන්තුව රැස්වන්නේ; මන්ත්‍රීවරු ඒ දවස් අටෙවත් පාර්ලිමේන්තුවට එන්නේ නැහැ." කියලා. ඒක බැලුවාම මට මතක් වුණේ, මිය ගිය චන්ද්‍රා අක්කා එක දවසක් අපේ රැස්වීමකදී කියපු කථාවක්. ඇය කිව්වා, "සර්, පාර්ලිමේන්තුවේදී හැමදාම බණින්නේ මොන්ටිසෝරියටයි." කියලා. මම ඇහුවා, "ඇයි?" කියලා. පාර්ලිමේන්තුවේදී කෑ ගහගන්න කොට කියන්නේ, "මොන්ටිසෝරිය වාගේයි." කියලා ලු. ඇය කියනවා, "හැබැයි සර්, මොන්ටිසෝරියේ දරුවෝ ටික හැමදාම මොන්ටිසෝරියට එනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු ටික පාර්ලිමේන්තුවට එන්නේ නැහැ." කියලා. ඒ කථාව අද ඇත්ත වෙලා තිබෙනවා. මේ සභාව දිහා බැලුවාම අද කවුරුවත් නැහැ නේ. අපි මේ ගැන කොච්චර කිව්වත් ඒක ක්‍රියාවට නැංවෙන්නේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, අඩුම ගණනේ පෙර පාසලක් මෙන්න මේ විධියට තිබෙන්න ඕනෑ කියලාවත් ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. පෞද්ගලික තැනෙක පෙර පාසලක් තිබෙනවා නම් ඒක කරන්න බැරි වෙයි. හැබැයි, ගොඩාක් පෙර පාසල් තිබෙන්නේ රජයේ තැන්වලයි. එහෙම තැන්වල තිබෙන පෙර පාසල් ඒ ක්‍රමවේදයට හදලා පෙර පාසල් පාලිකාවන්ට අවම වශයෙන් මාසිකව රුපියල් 2,500ක් වත් ගෙවන්න කියලා ඉල්ලා සිටිනවා. අපේ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කළා. එතුමිය දීර්ඝ කාලයක් ගුරුවරියක් විධියට කටයුතු කරලා ඒ අත් දැකීම් එක්ක තමයි මේ යෝජනාව ගෙනාවේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා. ස්තුතියි.

[අ.භා. 1.17]

ගරු විජිත බෙරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. පෙර පාසල් නහාසිටුවීම සහ ඒවායේ ප්‍රමිතිය සකස් කිරීමත්, ඒ ගුරුවරියන්ගේ වැටුප් පිළිබඳව සහ වෙනත් කාරණා සම්බන්ධයෙනුත් තමයි මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ. උපන් බිමේ අනාගතය වෙනුවෙන් වර්තමානයේ ඉන්න පුංචි දරුවන් සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු මේ යෝජනාව දිහා බැලුවාම, අද අපේ රටේ ළමයින් සම්බන්ධව තිබෙන බෙදවාචකයන් අපට මතක් වෙනවා. ළමා අපයෝජන පිළිබඳව, ළමා අපචාර පිළිබඳව, වීදි දරුවන් පිළිබඳව, සිඟමන් යදින දරුවන් පිළිබඳව සහ සමාජ විරෝධී ක්‍රියාවලට කුඩා දරුවන් යොදා ගන්නා ආකාරය පිළිබඳව දිනපතා පුවත් පත් බැලුවාම අපි දකිනවා. ඒ නිසා මේ රටේ උපන් බිමේ අනාගතය සකස් කිරීමට ඉන්න දරුවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන ඒ බෙදවාචකයන් මුළු මහත් සමාජයම වෙලා ගෙන පවතිනවා. එවැනි අවස්ථාවක "මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන විධිමත් කිරීම" සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන යෝජනාව බොහොම වැදගත්.

මෙවැනි වැදගත් විෂයයක් සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමිය ගරු සභාවේ නැහැ. අනෙක් පැත්තෙන් මේ රටේ අධ්‍යාපනය බාරව කටයුතු කරන අධ්‍යාපන ඇමතිතුමාත් සභාවේ නැහැ. හොඳ වෙලාවට පාර්ලිමේන්තුවේ සභානායකතුමා විධියට උසස් අධ්‍යාපන අමාත්‍යතුමා ගරු සභාවේ ඉන්නවා. එතුමා මේ දේවල් අහගෙන ඉඳලා අඩුම තරමේ මේ යෝජනා වෙනුවෙන් යම් සාධාරණයක් ඉෂ්ට කරයි කියලා අපි විශ්වාස කරනවා. එංගලන්තයේ හිටපු වින්සන්ට් චර්චිල් අග්‍රාමාත්‍යවරයා දෙවැනි ලෝක යුද්ධය අවසන් කරන්න කටයුතු කරපු කෙනෙක් බව අපි දන්නවා. එතුමා යුද්ධයෙන් පස්සේ ඒ රට දියුණු කිරීම පිළිබඳව අංශ 3ක් ගැන අවධානය යොමු කළා. එකක් තමයි "church". අනෙක් එක "children". අනෙක් එක තමයි "chicken". ඒකෙන් අදහස් කරන්නේ සෞඛ්‍ය, ආහාර සහ අධ්‍යාපනයයි. අධ්‍යාපනය කියන එක බොහොම වැදගත්. අධ්‍යාපනයේ මුල් අවස්ථාව තමයි මුල් ළමාවිය සංවර්ධන අවධිය -පූර්ව ළමාවිය සංවර්ධන අවධිය-. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මේ පිළිබඳව යම් අවධානයක් යොමු කළ ආකාරය අපි දැක්කා. විශේෂයෙන්ම ළමා සංවර්ධන අමාත්‍යාංශයත් මුලින්ම ආරම්භ කළේ එතුමායි. ඒ හරහා අද වෙනකොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන් පත් කරලා තිබෙනවා. ඊට අමතරව ළමා හිමිකම් නිලධාරීන් පත් කරලා තිබෙනවා. මේ විධියට විවිධ තනතුරු ප්‍රමාණයක් ඇති කරලා තිබෙනවා.

අද හැම ගමකම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තිබෙනවා. බොහෝ දෙමව්පියන් තමන්ගේ දරුවන් ඒ මධ්‍යස්ථානවලට යවනවා. හැබැයි, මේවා එකම ප්‍රමිතියකින් යුක්තව ගුණාත්මක තත්ත්වයෙන් තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්. නමුත් දෙමව්පියන් දරුවන්ව ඒවාට යවනවා. සමහර මධ්‍යස්ථානවල ගුරුවරියන් වශයෙන් හැකියාව තිබෙන, දැනුම තිබෙන උපාධිධාරීන් පවා සිටිනවා. මම දන්නවා, මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන බොහෝ මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරියන්ට අධ්‍යාපන පර්යේෂණ පුහුණු කිරීමේ ආයතනය විධියට ලංකාවේ තිබෙන ජාතික අධ්‍යාපන ආයතනයෙන් පවා ඩිප්ලෝමා ලබා දීලා තිබෙන බව. ඒ වාගේම විවිධ රාජ්‍ය නොවන සංවිධානවලින් ඩිප්ලෝමාධාරීන් විධියට දැනුම සහ ඒ අවබෝධය ලබා ගෙන දරුවන්ට නිවැරදිව මග පෙන්වන අය ඉන්නවා. නමුත් සමහර තැන්වල එහෙම නැහැ. ඒ නිසා මේ කාරණයට රජය මැදිහත් වෙන්න ඕනෑ. මේ රටේ අනාගතය සකස් කරන්නේ දරුවන් නම්, මේ රටේ අනාගතය කියන්නේ දරුවන් නම්, දරුවන් වෙනුවෙන් ගන්න ඕනෑ උපරිම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අවශ්‍යයි. පසුගිය කාලවල අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න ඕනෑ කියලා කෑ ගැහුවා. ඒ වාගේම පාසල්වලට ගුරුවරු අඩුයි, මානව අවශ්‍යතා සහ භෞතික පහසුකම් නැහැ කියලා බොහෝ ප්‍රශ්න තිබුණා. ඒ නිසා අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරනවා කියලා කිව්වා. හැබැයි, ඒ සියයට 6 වෙන් කරලා නැහැ. සියයට 6ක් අධ්‍යාපනයට වෙන් කරන්න බලාපොරොත්තුවක් තිබෙනවා නම්, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගැනත් අවධානය යොමු කළ යුතුයි. අවධානය යොමු කරලා, මේ රටේ අනාගතය වෙනුවෙන් මේ දරුවන් හැඩගස්වන්න කියන කාරණය මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

මේ යෝජනාව ඉදිරිපත් කරපු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය ගුරුවරියක්. එතුමිය අත් දැකීමෙන්ම දන්නවා, අධ්‍යාපනයේ තිබෙන වටිනාකම. ඒ නිසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳව රජයක් විධියට විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. එතුමිය කාරණා කිහිපයක් කිව්වා. ඒ තමයි දරුවන්ගේ පරිසරය සහ ආරය. ඒක ඇත්ත. ආරය කියන්නේ දෙමව්පියන්ගේ ජාන ශක්තිය අනුව දරුවන් තුළ උපතින්ම පිහිටා තිබෙන යම් යම් හැකියාවන් සහ විභවතාවයන්. මේ සියලු විභවතාවයන් මතුකරලා, විකසිත කරලා ගන්න පුළුවන් වන්නේ පරිසරයෙන්. ඒ නිසා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල පරිසරය සකස් වෙන්නට ඕනෑ. අධ්‍යාපනික පරිසරයක් -ඉගෙනුම් පරිසරයක්- නිර්මාණය වෙලා තිබෙන්න ඕනෑ. හැබැයි, පෙර පාසල්වලට ගියාම ඒ තත්ත්වය තිබෙනවා ද කියන එක ප්‍රශ්නයක්. සමහර මධ්‍යස්ථානවල "නිදහස් ළදරු උයන" කියලා තිබෙනවා. හැබැයි, නිදහසක් නැහැ; පුංචි කාමරයක් තුළ කොටුවෙලා තමයි දරුවන්ට අවශ්‍ය දැනුම ලබා දෙන්නේ. ඒ වාගේම අවශ්‍ය උපකරණ නැහැ. සෙල්ලම් මිදුල, ක්‍රීඩාව සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් මඟින් තමයි දරුවන්ට අවශ්‍ය නිවැරදි මග පෙන්වීම කරලා දරුවන් ප්‍රාථමික අධ්‍යාපනයට ගැළපෙන විධියට සකස් කරන්නේ. නමුත් ඒ පහසුකම් නැහැ.

අනික් පැත්තෙන්, ඒ ගුරුවරු අද මහත් අසහනයට පත් වෙලා තිබෙනවා. මොකද, රජයෙන් වෙන් කරනවා කියපු රුපියල් 2,500 දුන්නේ නැහැ. රුපියල් 250ක් දෙනවා කිව්වා. ඒකත් හරියට ලැබෙන්නේ නැහැ. සමහර පළාත් සභාවල ප්‍රඥප්ති පිහිටුවලා යම් යම් දීමනා දෙනවා. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා පුංචි දරුවන් වෙනුවෙන් විශාල වෙහෙස මහන්සියක් දරන ඒ ගුරුවරියන්ට අවශ්‍ය නිවැරදි පුහුණුව, මග පෙන්වීම, ප්‍රමිතිය සහ ඒ අයගේ වැටුප පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම වැදගත් වනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දීර්ඝව කථා කරන්න උත්සාහ කරන්නේ නැහැ. ඉතා වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් මේ වෙනකොට මේ සභාවට ඇවිල්ලා තිබෙනවා. එතුමා ළඟත් ගොඩක් සංකල්ප තිබෙනවා. ඒ අතරට පරිගණක ලබා දීම, රක්ෂණ ක්‍රම ආරම්භ කිරීම වැනි සංකල්ප තිබෙනවා. ඒවා හොඳ යෝජනා. ඒවා අපි අගය කරනවා. ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවලට යොමු කරලා ඒවා නගාසිටුවන්න කටයුතු කරන්න. උපන් බිමේ අනාගතය භාරගැනීමට සිටින දරුවන්ගේ අනාගතය හැඩගස්වන්නට ඒ දරුවන්ගේ හැකියාවන් හෙළිදරව් කරලා, ඒ ගොල්ලන්ගේ ශක්තිය සහ දැනුම මේ රටට ප්‍රයෝජනයට ගන්න පුළුවන් වන විධියේ වැඩ පිළිවෙළක් සකස් කිරීමට ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 1.25]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යාතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු මන්ත්‍රීතුමනි, මේ මුළු විවාදයම වාගේ පාර්ලිමේන්තු පරිශ්‍රයේ සිට මම අහගෙන හිටියා. ඔබතුමා චෝදනාවක් කළා, අධ්‍යාපන ඇමතිතුමාත් සභාවේ නැහැ කියලා. නමුත් පාර්ලිමේන්තු පරිශ්‍රයේ සිට මම අහගෙන හිටියා. ඒ නිසා තමයි ඔබතුමාගේ කථාව අතර ආපසු පැමිණියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මෙවැනි කාලෝචිත යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් මා එතුමියට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය මගේ අමාත්‍යාංශයට අදාළ කාරණයක් නොවෙයි, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ විෂයයට අයිති කාරණාවක්. පෙර පාසලෙන් දරුවෙකුට මුල් ළමා වියේ පදනම දැම්මාට පස්සේ, ඒ දරුවා කෙළින්ම එන්නේ පාසලට. ඒ දරුවා පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කළාට පස්සේ, අධ්‍යාපන අමාත්‍යාංශය වශයෙන් ඒ දරුවාගේ ඉතුරු කාර්ය භාරය භාර ගන්නේ අපි. එම නිසා පළමුවැනි ශ්‍රේණියට ඇතුළු වන දරුවන්ට එතැන් සිට විධිමත් අධ්‍යාපනයක් ලබා දීම සඳහා අපි විශාල වෙනස්කම් ටිකක් කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලයේ ප්‍රාථමික ගුරුවරුන් ලෙස පත් කරනු ලැබුවේ ප්‍රාථමික ගුරුවරුන් ලෙස පුහුණු කළ අය නොවෙයි. බොහෝ වෙලාවට කළේ වෙනත් විෂයයක් උගන්වපු අතිරික්ත ගුරුවරයෙක් හෝ මාරු වීමේ පදනම මත පැමිණි ගුරුවරයෙකුට ප්‍රාථමික අංශයට උගන්වන්න දීපු එක. අපි මේ කාරණය සම්බන්ධයෙන් පුළුල්ව සාකච්ඡා කරලා, ප්‍රාථමික ගුරුවරු විධියට පුහුණු කරලාම ප්‍රාථමික අංශවල අධ්‍යාපනය සඳහා ගුරුවරුන් යොදා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කරලා, දැන් එය ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පළාත් සභාවට පැවරී තිබෙන්නේ උපාධිධාරී සහ ඩිප්ලෝමාධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ බලතල පමණයි. නමුත්, පසු ගිය කාලය පුරා වැරැද්දක් වුණා. ඒ තමයි, විෂයයක් ඉගැන්වීම සඳහා එම විෂයයට පරිබාහිර වෙනත් උපාධිධාරීන් බඳවා ගැනීම.

ඇත්ත වශයෙන්ම විය යුත්තේ, විෂයයට අදාළ දැනුම තිබෙන උපාධිධාරීන් බඳවා ගැනීමයි. නමුත් සිද්ධ වුණේ, උපාධිධාරීන් බඳවා ගැනීමේ හැකියාව තිබෙන නිසා, ඕනෑම විෂයයක් උගන්වන්න උපාධිධාරීන් බඳවා ගත්ත එක. ඒ අයට පුහුණුවක් දෙනවාය කියනවා. නමුත්, විධිමත් පුහුණුවක් දෙන්නේ නැහැ. මේ තත්ත්වය තේරුම් අරගෙන දැන් මම කැබිනට් පත්‍රිකාවක් සකස් කරලා තිබෙනවා, ඉදිරියේදී ගුරුවරුන් ලෙස උපාධිධාරීන් බඳවා ගන්නේ නම්, අදාළ විෂයයට ගැළපෙන උපාධියක් හෝ එම විෂයය පිළිබඳව ජාතික අධ්‍යාපන ආයතනයෙන් හෝ විද්‍යා පීඨයකින් හෝ විධිමත් පාඨමාලාවක් හදාරලා වසර 3 - 4ක පළපුරුද්දක් තිබිය යුතුයි කියලා. ඒ අනුව, අදාළ විෂයය පිළිබඳ විධිමත් පාඨමාලාවක් හදාරා ඇති අය බඳවා ගැනීමට කටයුතු කරන්නයි අපි හදන්නේ. එහෙම නොවුණොත්, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආරක්ෂා කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ප්‍රාථමික ගුරුවරුන්ට විතරක් නොවෙයි, සියලු ගුරුවරුන්ට හැම විෂයයක් සම්බන්ධයෙන්ම පුහුණුව ලබා දෙන්න අපි තීරණය කර තිබෙනවා. ගුරුවරුන් පුහුණු කිරීම සඳහා රජයෙන් රුපියල් බිලියන දෙකක් පමණ අපට වෙන් කර තිබෙනවා. ඒ කටයුත්ත අපි ඉක්මනින් ආරම්භ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, තව නොබෝ දිනකින් මේ රටේ රජයේ පාසල්වලද, පෞද්ගලික පාසල්වලද, ජාත්‍යන්තර පාසල්වලද සියලු දරුවන්ට රුපියල් ලක්ෂ දෙකක රක්ෂණාවරණයක් අපි දෙනවා. එම රක්ෂණාවරණය මඟින් ඕනෑම වසංගත රෝගයක් සඳහා -මේ දිනවල බහුලව තිබෙන ඩෙංගු වසංගතය වෙන්න පුළුවන්- පෞද්ගලික රෝහලක නතර වුණත් රුපියල් ලක්ෂයක් දක්වා බිල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගෙවනවා. රජයේ රෝහලක නතර වුණොත්, දවසකට රුපියල් දහසක් දෙනවා. මොකද, අනෙකුත් පහසුකම් රජයේ රෝහල්වලින් දෙන නිසා. ඒ වාගේම, ඩිස්පෙන්සරියකින් බෙහෙත් ගත්තත් රුපියල් දසදහසක් දෙනවා. ඒ සඳහා ටෙන්ඩර් කැඳවා, මේ වන කොට ඒ කටයුතු අවසන් කරලායි තිබෙන්නේ. එම ටෙන්ඩරය රජයේ ආයතනයක් වන Sri Lanka Insurance Corporation Limited එකට දෙන්න තමයි අපි තීරණය කරලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් Insurance එකක් කරද්දී නියෝජිතයාට - agent - ලැබෙන සියයට 10ක් තිබෙනවා. අපි කිව්වා, ඒ සියයට 10 අපට දෙන්න කියලා. අපි ඒකෙන් ජනාධිපති අරමුදල වාගේ අරමුදලක් හදනවා. එය අපේ පාසල් පද්ධතියේ ඉන්න දරුවන්ගේ හදිසි ශල්‍යාකර්මවලදී ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ඇටමිදුළු බද්ධ කිරීම වාගේ ඒවා වෙන්න පුළුවන්, තවත් එවැනි ශල්‍යාකර්මවලදී පාවිච්චි කරන්න දෙන්න කියලා අපි ඒ සියයට 10 ඉල්ලුවා. එහෙම වුණොත්, අපට මේ අවුරුද්දේ රුපියල් මිලියන 270ක් ලැබෙනවා. අවුරුදු 4ක් වන කොට, රුපියල් මිලියන 270 ඒවා 4ක් ලැබෙනවා. එතකොට, ඒ මුදලට තව තව පොලී එකතු වෙලා අපට පාසල් දරුවන්ගේ ශල්‍යාකර්මවලට ඒ මුදල යොදා ගන්න හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වසර අවසන් වෙන්න පෙර නියාමක වැඩසටහනක් වශයෙන් tab පරිගණක ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනයේ නියාමක වැඩසටහන අපි සැප්තැම්බර් මාසයේ පටන් ගන්නවා. ගිය වසරේ O/L විභාගය අසමත් වුණු අයටත් අලුතින් විෂයයන් 26ක් හඳුන්වා දීලා, වසර 13ක අඛණ්ඩ අධ්‍යාපනය හඳුන්වා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර පාසල් නහා සිටුවීම සඳහා මා දන්නා විධියට අපේ කාන්තා හා ළමා කටයුතු ඇමතිතුමියත් අවශ්‍ය නීති කටයුතු කරමින් යනවා. ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ, අද හතු පිපෙන්නා වාගේ පෙර පාසල් පටන් ගන්නවා. මේ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමිය කිව්වා, අද පෙර පාසල් අධ්‍යාපනය ස්වයං රැකියාවක් වෙලා තිබෙනවාය කියලා. එම නිසා අපි නීති - රීති ගෙනැල්ලා, පෙර පාසල් අධ්‍යාපනය විධිමත් කළ යුතුයි. ඒ සඳහා licence එකක් දීලා, හොඳ පුහුණු ගුරුවරුන් පෙර පාසල් අධ්‍යාපනය සඳහා යොදා ගන්න ඕනෑ. මොකද, මුල් ළමා වියේදී තමයි දරුවන්ගේ අධ්‍යාපනයේ පදනම වැටෙන්නේ. ගහක් හැදෙද්දී මුලින්ම ලැබෙන පොහොර ටික සහ සාත්තුව තමයි එම ගහ රුස්ස ගහක් බවට පත් වෙන්න ඉවහල් වෙන්නේ. එම නිසා අපිත් බලාපොරොත්තු වනවා, පෙර පාසල් අවධියේ සිටම, එහෙම නැත්නම් මුල් ළමා අවධියේ සිටම ඒ දරුවන්ට අවශ්‍ය අධ්‍යාපනය ලබාදෙන්න. නමුත් කනගාටුවට කාරණාවක් තමයි, පසු ගිය දශක දෙකක් තිස්සේ ඒවා නොකර දැන් ඒවා ගැන කථා කරන එක. ඒ කාලයේ බොහෝ දේවල් කළ යුතුව තිබුණා.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

අපි විපක්ෂයේ ඉන්න කාලයේ දශකයට වැඩි කාලයක් මේ කරුණු ඕනෑ තරම් පෙන්වා දුන්නා. නමුත් ඒවා සිද්ධ වුණේ නැහැ. අපේ නව ආණ්ඩුව බලයට පත්වෙලා දෙවන අවුරුද්ද අවසන් වෙන්නේත් අගෝස්තු මාසයේදීයි. මේ වසර ඇතුළතදී මේ නීති - රීති සියල්ලම ගෙනැවිත් අවසන් කරන්න අපි බලාපොරොත්තු වනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, යෝජනාව ඉදිරිපත් කළ ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.31]

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම මෙම යෝජනාව වෙනුවෙන් අදහස් ප්‍රකාශ කළ අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන්ට මේ වෙලාවේ මගේ ස්තුතිය පුද කරනවා. මෙහිදී කථා කළ සියලු මන්ත්‍රීවරුන්ගේ අදහස්වලින් අපට පැහැදිලි වනවා, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය තුළින් තමයි ළමයාගේ පදනම ගොඩ නැහෙන්නේ; මනුෂ්‍ය ජීවිතයේ පදනම ගොඩ නැහෙන්නේ කියලා. මෙතැනදී සිදු වන සමාජානුයෝජනය සිදු නොවීම නිසා, දීර්ඝ කාලීනව යම් යම් තැන්වලදී ඇති වුණු වැරැදීම් නිසා උද්ගත වුණු ප්‍රශ්න අද සමාජගත වෙලා තිබෙනවා. ඒ නිසා ජාතින් අතර ගැටුම්, ආගම් අතර ගැටුම්, මානසික අවපීඩනයට ඔරොත්තු නොදෙන දරු පිරිසක් බිහිවීම සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, පවතින අධ්‍යාපන ක්‍රමය තුළ පිරිමි දරුවන් අතර මං වීම සිදුවෙනවා. මා හිතනවා, මේ සභාවේ ඉන්න මැති ඇමතිවරුන්ගෙන් වැඩි දෙනෙක් වර්ෂය අවසානයේදී පාසල්වල පැවැත්වෙන විවිධ ප්‍රසංගවලට සහභාගි වනවාය කියලා. ඒ විවිධ ප්‍රසංගවල පිරිමි ළමයින්ට තැනක් නැහැයි කියලා අපි දකිනවා. පිරිමි ළමයින්ට ඉදිරිපත් කරන්න අංග ඒවායේ නැහැ. එක්කෝ හින්දි සින්දුවකට, එහෙම නැත්නම් ආදර සින්දුවකට ගැහැනු ළමයින් රහ දක්වන අවස්ථා තමයි තිබෙන්නේ. මේ රටේ පිරිමි ළමයින් 9, 10 පන්තිවලට එනකොට අධ්‍යාපනය අත් හැර යනවා. පිරිමි ළමයි බොහෝ විට අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය fail වෙනවා. උසස් පෙළ පන්තිවලට එන පිරිමි දරුවන් ප්‍රමාණය අඩු වනවා. මුල ඉඳලාම පිරිමි ළමයා අත් හැරීම එයට හේතුවක් විධියට මා දකිනවා. ඒක පෙර පාසලේ සිටම සිද්ධ වනවා. ඒ නිසායි මා යෝජනා කළේ, අධ්‍යාපනයට අවශ්‍ය භෞතික හා මානව සම්පත් විධිමත්, පිළිගත් ප්‍රමිතිවලට අනුව සංවර්ධනය වෙන්න ඕනෑය කියලා. අධ්‍යාපන ඇමතිතුමා කිව්වා වාගේ අද ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා නම් මා බොහොම සතුටු වනවා. සුදුසු පාඨමාලා සකස් වෙලා, අධ්‍යාපන සුදුසුකම් සහිත පාලිකාවන් මේ අධ්‍යයන කටයුතු සඳහා යොමු කරන්න ඕනෑය කියා මා යෝජනා කරනවා.

ඒ විතරක් නොවෙයි. අපි දන්නවා, ඒ පාලිකාවන් ළමයින්ගෙන් ලැබෙන දෙයින් ජීවත්වන තත්ත්වයට වැටී සිටිනවාය කියලා. පෙර පාසලේ ඉගැන්වූවේ කවුද කියලා අපටත් දැන් මතක නැහැ. මොකද, අවුරුදු හතරේ, අවුරුදු පහේ වයසේදී තමයි පෙර පාසලට යන්නේ. දැන් දරුවන් නම් අවුරුදු දෙකේ ඉඳලාම පෙර පාසල් යනවා. දෙමවුපියන් ළඟ ඉන්න ඕනෑ කාලයත් පෙර පාසලේ තමයි දරුවා ගත කරන්නේ. පෙර පාසල් ගුරුවරිය විශ්‍රාම ගන්නා වයසේදී ඒ හැමදෙනාටම අමතකවෙලා යන චරිතයක් බවට පත් වනවා. එම නිසා පෙර පාසල් පාලිකාවගේ අනාගතය සුරක්ෂිත කිරීමේ වග කීමකුත් රජයක් හැටියට අපට තිබෙනවා. මොකද, මේ රටේ පදනම සකස් කරන්නේ, මේ රටේ ළමා පරපුරේ පදනම සකස් කරන්නේ, එහෙම නැත්නම් වැඩිහිටි වියට පත්වන පුද්ගලයාගේ පදනම සකස් කරන්නේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානය භාරව කටයුතු කරන පාලිකාවයි. ඒ නිසා ඇය සතුටින් තැබීමත් රජයක් හැටියට අපේ වග කීමක් බව නැවත වතාවක් මතක් කරමින්, මේ අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
பாராளுமன்ற சம்பிரதாயம் இன்று மீறப்பட்டுள்ளது. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුස්ලිම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලුදෙනාටම සිකුරාදා දිනවලට පල්ලියට යන්න ඕනෑ නිසා උදේ 10.30 සිට 12.30 දක්වා පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වාගෙන යන්නත්, ඊට පස්සේ 1.30ට පාර්ලිමේන්තුවේ කටයුතු නැවත පටන් ගන්නත් පාර්ලිමේන්තුවේ පක්ෂ නායකතුමන්ලා තීරණයක් ගෙන තිබෙනවා.

මීට මාස 9කට පෙර මා ඉදිරිපත් කළ පළමුවන පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සාකච්ඡා කරන්න නියමිතව තිබූ දිනයේ, මා කථානායකතුමාට කියලා පල්ලියට ගියා. එතකොට ගරු කථානායකතුමා මට කිව්වා, පස්වරු 3.00ට එන්න කියලා. මම මෙතැනට එනකොට "බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා එකහමාරට ආවේ නැහැ, ඒ නිසා postpone කළා" කියලා කිව්වා. මම **6 වැනිදා** බංගලිදේශයේ ඉඳලා ආවා. Vote of Condolence කියලා **7 වැනිදාත්** මේ යෝජනාව postpone කළා. පසුගිය මාසයේ මෙම යෝජනාව ගන්නට යෙදී තිබුණු දිනයේ, former Prime Minister, Hon. Ratnasiri Wickramanayakaගේ Vote of Condolence එක වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමා කථා කළේ නැති නිසා එතුමාට කථා කරන්න එදින එම ශෝක යෝජනාව ගන්න තිබෙනවා කියලා නැවත වරක් postpone කළා. අද මම පල්ලිය ඇතුළේ ඉන්නකොට දවල් 12.00ට කියලා තිබෙනවා, "අද දින යෝජනා ඉදිරිපත් කිරීමට නියමිත මන්ත්‍රීවරු පස්දෙනෙක් ආවේ නැහැ, ඒ නිසා postpone කරනවා" කියලා. මගේ යෝජනාව very important. ඔබතුමාට මා කියන්න ඕනෑ;

වඩ මාකාණත්තිල් නූற்றாண்டுகளாக வாழ்ந்த முஸ்லிம் சமூகம் 1990ஆம் ஆண்டு விடுதலைப் புலிகளால் - பிரபாகரனால் - பலவந்தமாக வெளியேற்றப்பட்டது. இப்படி யாக வட மாகாணத்திலிருந்து பலந்தமாக வெளியேற் றப்பட்ட முஸ்லிம் மக்களை, தற்போதைய வட மாகாண முதலமைச்சர் விக்னேஸ்வரன் அவர்கள் power இல் இருந்துகொண்டும் மீள்குடியேற்றுவதற்கான நடவடிக் கைகளை எடுக்கவில்லை. 95 சதவீதமான முஸ்லிம்கள் இன்று தங்களுடைய வேலை வாய்ப்பை பெறுவதற்குக்கூட முடியாமல் இருக்கின்றார்கள். ஆறு சுகாதார மையங்களில் புத்தளம் மாவட்டத்திலே வேலை செய்தவர்களையெல்லாம் வடக்குக்கு அழைத்திருக்கிறார். இந்த நேரத்திலே இந்த முக்கியமான யோசனையை -

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාට යෝජනා කරනවා, මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ යෝජනා සියල්ලම පළමුවෙන් ගන්න ඕනෑ කියලා. මගේ යෝජනාව ඉක්මනින් ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙනවා නම් හොඳයි. North and North Central Provinces දෙකේම මුස්ලිම් ජනතාවට ලොකු ගැටලු ඇතිවෙලා තිබෙනවා. එම නිසා මගේ යෝජනාව ඉක්මනින් ඉදිරිපත් කරන්න මට අවස්ථාව දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පල්ලියට යන්න ඉස්සෙල්ලා මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා ඒ ඉල්ලීම කරනවා?

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
ඔව්, මම ඒ ඉල්ලීම කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දන්නවා ඇති, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 34. (2) යටතේ, මන්ත්‍රීවරයාගේ නම ප්‍රකාශ කළායින් පසු අදාළ මන්ත්‍රීවරයා තමාගේ නමින් ඇති යෝජනාව ඉදිරිපත් කිරීමට සභා ගර්භයේ සිටියේ නැත්නම් එදා දවසේ නැවත එම යෝජනාව ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නැහැ කියලා. ඔබතුමා මේ ඉල්ලීම කළ නිසා, ඊළඟ දිනයේ "පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා" අවස්ථාවේදී පළමුවෙන්ම ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදෙන්න අපි වග බලාගන්නවා.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
වඩ පුල මුස්ලිම්කලුඩෙය පිරච්සිනෙ මිකවුම් පාරතූර මාක ඉරුක්කින්ර කාරණත්තිනාල් එංකළුඩෙය පිරතිච් සපානායකර් අවර්කළ් ඉතනෛක් කවනත්තිර්කොළ්ළ වේණ්ඩු මෙන්රු විනයමාකක් කේට්ටුක්කොළ්කින්රේන්.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ. භා. 1.39ට, අද දින සභා සම්මතිය අනුව, 2017 ජූලි මස 25 වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.

අතන්පඩි පි.ප. 1.39 මණික්කු පාරාළුමන්රම්, අදනුඩෙය ඉන්රෛය තීර්මානත්තිර්කිණങ්ක, 2017 යූලෛ 25, සෙව්වාය්ක්කිළමෛ පි.ප. 1.00 මණිවරෛ ඔත්තිවෛක්කප්පට්ටදු.

Parliament adjourned accordingly at 1.39 p.m. until 1.00 p.m. on Tuesday, 25th July, 2017, pursuant to the Resolution of Parliament of this Day.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

253 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 253 - இல. 05
Volume 253 - No. 05

2017 ජූලි 25 වන අඟහරුවාදා
2017 யூலை 25 செவ்வாய்க்கிழமை
Tuesday, 25th July, 2017

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන
කථානායකතුමාගේ සහතිකය
මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු පැහැර ගැනීමට තැත් කිරීම
නියහයෙන් පීඩාවට පත් ජනතාවට කඩිනම් සහන
රත්මලාන සතොස ගබඩා සංකීර්ණයේදී අත් අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය සම්බන්ධ පරීක්ෂණ

වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු අත් අඩංගුවට ගැනීමට ක්‍රියා කිරීමේදී ඇති වූ සිද්ධිය:
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත :
පළමු වන වර කියවන ලදී.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
සිඩ්නි ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) – [ගරු හෙක්ටර් අප්පුහාමි මහතා] - පළමුවන වර කියවන ලදී

විදේශ විනිමය පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල්තැබීමේ යෝජනාව:
අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් රජයේ වගකීම් ඉටු කිරීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள் :
சபாநாயகரது சான்றுரை

மனித உரிமைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

துறைசார் மேற்பார்வைக்குழு அறிக்கைகள்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:
மருத்துவபீட மாணவ செயற்குழு ஒருங்கிணைப்பாளரைக் கடத்த முயற்சித்தமை
வரட்சியினால் பாதிப்புற்ற மக்களுக்கு உடனடி நிவாரணம்
இரத்மலானை சதொச களஞ்சியத்தொகுதியில் கைப்பற்றப்பட்ட போதைப்பொருள் பற்றிய விசாரணை

மருத்துவபீட மாணவ செயற்குழு ஏற்பாட்டாளரைக் கைதுசெய்ய முயன்றபோது இடம்பெற்ற சம்பவம்:
சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரின் கூற்று

குற்றச் செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
சிட்னி ஜயரத்ன மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி] - முதன்முறை மதிப்பிடப்பட்டது

வெளிநாட்டுச் செலாவணிச் சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை :
காணாமற்போன ஆட்கள் தொடர்பில் அரசின் கடப்பாட்டினை நிறைவேற்றுதல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Speaker's Certificate

PERFORMANCE REPORT OF HUMAN RIGHTS COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Attempted Abduction of Convener of Medical Faculty Students' Action Committee
Immediate Relief for People Affected by Drought
Investigation into Narcotic Drugs Nabbed at Sathosa Warehouse Complex Ratmalana

INCIDENT OCCURRED WHILE TAKING INTO CUSTODY CONVENER OF MEDICAL FACULTY STUDENTS' ACTION COMMITTEE:
Statement by Minister of Law and Order and Southern Development

ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Sidney Jayarathne Foundation (Incorporation) – [The Hon. Hector Appuhamy] –Read the First time

FOREIGN EXCHANGE BILL:
Read a Second and the Third Time, and passed as amended

ADJOURNMENT MOTION:
Fulfilment of Governments' Commitments Regarding Missing Persons

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 ජූලි 25වන අඟහරුවාදා
2017 யூலை 25 செவ்வாய்க்கிழமை
Tuesday, 25th July, 2017

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2017 ජූලි 21 වන දින ම'විසින් "ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

II

පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2017 ජූලි මස 25වන අඟහරුවාදා, එනම් අද දින පස් වරු 3.30ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
மனித உரிமைகள் ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF HUMAN RIGHTS COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2016.10.01 දින සිට 2016.12.31 දින දක්වා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර උදර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 07 දිනැති අංක 2022/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය ඉදිරිපත් කරමි.

එම නියමය ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 31 දිනැති අංක 2021/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

එම නියෝග අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2007/2008, 2008/2009, 2009/2010, 2010/2011 සහ 2011/2012 වර්ෂ සඳහා සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2013 සහ 2014 වර්ෂ සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015/2016 වර්ෂය සඳහා ශ්‍රීලංකන් එයාර්ලයින්ස්හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, 2016 වර්ෂය සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන සහ පරිසර හා ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග;
(ii) 2013 වර්ෂය සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්ෂික වාර්තාව;
(iii) 2013 සහ 2014 වර්ෂ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ වාර්ෂික වාර්තා;
(iv) 2013 සහ 2014 වර්ෂ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා;
(v) 2013 සහ 2014 වර්ෂ සඳහා රාජ්‍ය දැව සංස්ථාවේ වාර්ෂික වාර්තා;
(vi) 2013 සහ 2014 වර්ෂ සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තා;
(vii) 2012 සහ 2013 වර්ෂ සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තා;
(viii) 2015 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ
(ix) 2015 වර්ෂය සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද "පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත" සහ "2012 සහ 2014 වර්ෂ සඳහා

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වාර්ෂික වාර්තා" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) Nation Building Tax (Amendment) Bill;

(ii) Orders under Special Commodity Levy Act;

(iii) Resolution under the Customs Ordinance;

(iv) Notes on Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities Provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates; and

(v) Financial Performance of the First Quarter of 2017 (Summary of the Total)

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - பொது நிர்வாக மற்றும் முகாமைத்துவ பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Public Administration and Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) රත්නපුර, නව නගරය, සිරිසුමනගම, අංක 423/133 දරන ස්ථානයෙහි පදිංචි අයි.ඩී. මංගලිකා මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(2) මුලතිව්, කෝකිලායි, ශාන්ත ආනා ග්‍රාමීය ධීවර සංවිධානයේ සභාපති එම්. රුක්මාල් තුෂාර ලිවේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මොරටුව, අහුලාන, දුම්රිය පොළ පාර, නවෝදා ගාඩන්ස්, අංක 128/23 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.ජී. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, බුලත්කොහුපිටිය, වැගල්ල, උඩහවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.පී. දයානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු කථානායකතුමනි, නාවලපිටිය, වරකාව, කොස්වත්ත, අංක 382/1 දරන ස්ථානයෙහි පදිංචි කරුණා නවරත්න මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු කථානායකතුමනි, කොළඹ 02, සෝනඩර්ස් කෝට්, අංක 55/9 දරන ස්ථානයෙහි පදිංචි එම්.එච්.එම්. අසන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟට, පාර්ලිමේන්තුවේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න.

ප්‍රශ්න ඇසීමෙදීත්, පිළිතුරු දීමෙදීත් වෙලාව සම්බන්ධයෙන් කරුණාකරලා අවධානය යොමු කරන්නය කියන කාරණයට මේ අවස්ථාවේදී මම නැවත වරක් ගරු සභාවේ අවධානය යොමු කරවනවා. මේ ගැන ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් ඒකමතික තීරණයකට ආවා. ඒ වාගේම ප්‍රශ්න අඩු කරනවා වෙනුවට, තාවකාලිකව අත් හදා බැලීමක් වශයෙන් අතුරු ප්‍රශ්න දෙකක් ඇසීමටත් -තුනක් ඇසීම වෙනුවට- එදා තීරණයක් ගත්තා.

ඒ අනුව පළමුවැනි ප්‍රශ්නය ගරු බුද්ධික පතිරණ මැතිතුමා, අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගොඩපිටිය ජාතික පාසලේ 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම: අක්‍රමිකතාව
கொடப்பிட்டிய தேசிய பாடசாலையில் 6ஆம் தரத்துக்கு மாணவர்களை அனுமதித்தல்: முறைகேடு
ADMISSION OF STUDENTS TO GRADE 6 OF GODAPITIYA NATIONAL SCHOOL: IRREGULARITY

856/'16

1. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, ගොඩපිටිය ජාතික පාසලට 2016 වර්ෂය සඳහා 6 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී අක්‍රමිකතාවක් සිදු වී ඇති බවත්;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ii) ඒ හේතුවෙන් සිසුන් පිරිසකට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගොඩපිටිය ජාතික පාසලට 2016 වර්ෂය සඳහා වෙනත් පාසල්වලින් 6 ශ්‍රේණියට ඇතුළත් කර ගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍යයන් ඇතුළත් කර ගත් ක්‍රමවේදය, එක් එක් ශිෂ්‍යයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) තෝරාගත් සිසුන් පිළිබඳ ලේඛනයක් විදුහල්පතිවරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබේද;

(iv) එසේ නම්, එම ලේඛනයට අමාත්‍යාංශයේ නිර්දේශය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මේ පිළිබඳව පරීක්ෂණයක් සිදු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) අසාධාරණයට ලක් වූ සිසුන් සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) මාත්තරෙ මාවට්ටත්තිල්, අක්කුරස්ස, කොටප්පිට්ටිය තේසිය පාටසාලෙක්කු 2016ආම් ආණ්ඩුක්කාක 6ආම් තරත්තුක්කු මාණවර්කළෙ අනුමතික්කින්රපෝතු මුරෙකේටු ඉටම්පෙට්රුල්ළතු එන්පතෙයුම්;

(ii) ඉතන් කාරණමාක සිල මාණවර්කළුක්කු අනීති නේර්න්තුල්ළතු එන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) 2016ආම් ආණ්ඩුක්කාක, කොටපිට්ටිය තේසිය පාටසාලෙයින් 6ආම් තරත්තුක්කු ඒනෙය පාටසාලෙකළිලිරුන්තු අනුමතික්කප්පට්ට මාණවර්කළින් එණ්ණික්කෙ යාතු එන්පතෙයුම්;

(ii) මේර්පටි මාණවර්කළ් අනුමතික්කප්පට්ට මුරෙමෙ, ඔව්වොරු මාණවරුක්කුම් ඒර්ප වෙව්වේරාක යාතු එන්පතෙයුම්;

(iii) තේර්න්තෙටුක්කප්පට්ට මාණවර්කළ් පර්රිය ඔරු පට්ටියල් අතිපරිනාල් කල්වි අමෙච්චුක්කු සමර්ප්පික්කප්පට්ටුල්ළතා එන්පතෙයුම්;

(iv) ආමෙනිල්, කුරිත්ත පට්ටියලුක්කු අමෙච්චින් විතප්පුරෙ කිටෙක්කප්පෙර්රුල්ළතා එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු අරිවිප්පාරා?

(ඉ) (i) ඉතු තොටර්පිල් විසාරණෙයොන්රෙ මේර්කොල්වතර්කු නටවටික්කෙ මේර්කොල් වාරා එන්පතෙයුම්;

(ii) ආමෙනිල්, කුරිත්ත තිකති යාතු එන්පතෙයුම්;

(iii) අනීති ඉළෙක්කප්පට්ට මාණවර්කළ් තොටර්පිල් මේර්කොල්ළප්පටුම් නටවටික්ක�ෙකළ් යාතු එන්පතෙයුම්;

අවර් ඉච්චපෙක්කු මේලුම් අරිවිප්පාරා?

(ඊ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) an irregularity has taken place in admitting students to grade 6 of the Godapitiya National School in Akuressa in Matara District in the year 2016; and

(ii) a group of students have been faced with an injustice owing to that?

(b) Will he inform this House -

(i) the number of students who were admitted to grade 6 of Godapitiya National School from other schools in the year 2016;

(ii) the methodology adopted in admitting students in relation to each student, separately;

(iii) whether a list of selected students has been submitted to the Ministry of Education by the Principal; and

(iv) if so, whether the Ministry has given its recommendation to that list?

(c) Will he also inform this House -

(i) whether steps will be taken to conduct an inquiry in that regard;

(ii) if so, the date it will be done; and

(iii) the steps to be taken in regard to the students who faced injustice?

(d) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අක්‍රමිකතාවක් සිදු වී ඇති බව මේ වන තෙක් වාර්තා වී නොමැත.

(ii) නොමැත.

(ආ) (i) 174කි. ඇමුණුම **සභාගත*** කරමි.

**** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** தூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(ii)

අනු අංක	අනුමත ක්‍රමවේදය	අනුමැතිය ලබා දී ඇති සංඛ්‍යාව	ඇතුළත් වී ඇති සංඛ්‍යාව
1	කඩඉම් ලකුණු නිකුත් වීමේදී මුල් වටයෙන්	36	23
2	2008/37 චක්‍රලේඛයට අනුව විදුහලට ඉදිරිපත් වන අභියාචනා සියල්ල ලකුණු මත පෙළගස්වා විදුහල්පතිගේ නිර්දේශය මත අමාත්‍යාංශයේ අනුමැතියෙන්	160	120
3	2008/37(1) 2008.10.30 චක්‍රලේඛයට අනුව ආදී ශිෂ්‍ය ගණය තුළ අමාත්‍යාංශයේ අනුමැතියෙන්	14	14
4	2008/37 (1) 2008.10.30 චක්‍රලේඛයට අනුව සහෝදර සහ අධ්‍යයන කාර්ය මණ්ඩල ගණය තුළ විදුහල්පති විසින්	(අමාත්‍යාංශයට අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොමැත.)	17
	එකතුව	210	174

(iii) සහෝදර හා අධ්‍යයන කාර්ය මණ්ඩල ගණ යටතේ වන ලේඛන හැර අනෙකුත් ලේඛන මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.

(iv) අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ ලේඛන සඳහා අනුමැතිය ලබා දී ඇත.

(ඇ) (i) සිසුන් ඇතුළත් කිරීමේදී අසාධාරණයක් සිදුවී ඇති බවට කිසිවෙකු විසින් දැනුම් දීමක් කර නොමැත. 2008/37 හා 2008/37(1) චක්‍රලේඛ විධිවිධාන අනුව සිසුන් තෝරා ගැනීමේදී අසාධාරණයක් සිදු වී ඇතැයි සැලකෙන ඉල්ලුම්කරුවකු ඒ සඳහා ඉල්ලීමක් කරන්නේ නම්, විධිමත් පරීක්ෂණයක් මසක් ඇතුළත පැවැත්වීමට කටයුතු කළ හැක. එහිදී යම් ගණයක් තුළ ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇතත් තෝරා ගෙන නොමැති සිසුවෙකු වෙත්නම් ඔහුට/ඇයට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කළ හැක.

(ii) විධිමත් ඉල්ලීමක් ලද පසු මසක් තුළ මෙම පරීක්ෂණය සිදු කිරීමට පියවර ගනු ලැබේ.

(iii) යම් ගණයක් තුළ ඇතුළත් වීමට සුදුසුකම් ලබා ඇතත්, තෝරා ගෙන නොමැති සිසුවෙකු වෙත්නම් ඔහුට/ඇයට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කරනු ඇත.

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා සවිස්තරාත්මක පිළිතුරක් ලබා දීම පිළිබඳව එතුමාට මා ස්තුතිවන්ත වනවා.

සමහර ජාතික පාසල්වල තරගයක් තිබෙන බව ඇත්ත. නමුත්, සමහර ජාතික පාසල්වල අනුමත සීමාව වන සිසුන් 45ත් නැහැ. ගොඩපිටිය ජාතික පාසලේ වෙන්නේ ඒ වාගේ දෙයක්. ගරු කථානායකතුමනි, පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාව අනුමත සීමාව තුළ නැති වුණාම විදුහල්පතිවරයා කරන්නේ මොකක්ද? සමහර ළමයි ශිෂ්‍යත්ව ප්‍රතිඵලවල අනුපිළිවෙළ අනුව එම පාසලේ 6වන ශ්‍රේණියට ඇතුළත් කරන්න බැහැ. 7වන ශ්‍රේණියේදී මේ විදුහල්පතිවරයා අමාත්‍යාංශයට නම් ටිකක් යවනවා. ශිෂ්‍යත්වයෙන් ඉහළ ලකුණු ලබා ගත් ළමයි අත් හැරලා පහළ ලකුණු ලබා ගත් ළමයින්ගේ නම් තමයි ඒ ලැයිස්තුවෙන් යවන්නේ. මේ ඊයේ-පෙරේදාත් එහෙම ළමයෙකුගේ නමක් අමාත්‍යාංශයට යැව්වා. ආරංචි විධියට ඒ ගනුදෙනුව රුපියල් ලක්ෂ 3ක ගනුදෙනුවක්. මේ ගනු-දෙනුව වන්නේ අමාත්‍යාංශය පැත්තෙන් නොවෙයි, පාසල පැත්තෙන්. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙහි පසු බිම දන්නේ නැහැ. ලේකම්වරයා කරන්නේ මේකයි. නමුන්ට ලැයිස්තුවක් ආවා, ඉස්කෝලයේ අදාළ පන්තියේ පුරප්පාඩු තිබෙනවා, එම නිසා ඔහු මේ ලැයිස්තුව අනුමත කරනවා. හැබැයි, ඒ අදාළ වසර දෙකකට ප්‍රථම ශිෂ්‍යත්වයෙන් වැඩි ලකුණු ගත් දරුවෝ එම පාසලට ඇතුළත් වීමට නොහැකිව ඉන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
මම අහන්නේ මේකයි. වැඩි ලකුණු ගත් ළමයි ඉන්දෙද්දි අඩු ලකුණු ගත් ළමයෙකු ඊයේ-පෙරේදා මේ පාසලට ඇතුළත් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පිළිබඳව හොයා බලනවාද? පරීක්ෂණයක් කරනවාද? මෙම සිද්ධියේදී විදුහල්පතිවරයා වැරදි නම්, එතුමා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, දැන් පැමිණිල්ලක් ලැබී තිබෙනවා. මේ අනුව ස්ථිරවම විමර්ශනයක් කරනවා. විමර්ශනයක් කරලා වැරදි නම්, විනයානුකූලව ක්‍රියා මාර්ග ගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසාන අතුරු ප්‍රශ්නය.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, එක අතුරු ප්‍රශ්නයයි නේ ඇහුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙකයි.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
හරි, මාගේ තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

[ගරු බුද්ධික පතිරණ මහතා]

සමහර පාසල්වල -විශේෂයෙන් ප්‍රධාන පාසල්වල- විදුහල්පතිවරුන් හෝ විදුහල්පතිවරියන් විශ්‍රාම යෑමේදී පවත්වන උත්සවවලට මුදල් එකතු කිරීම කරනවා. ගුරු මණ්ඩලයෙන් පමණක් මුදල් එකතු කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් දැන් ශිෂ්‍ය නායක නායිකාවන්ගෙනුත් මුදල් එකතු කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මාතර සුජාතා බාලිකා විද්‍යාලයේ ප්‍රාථමික අංශයේ විදුහල්පතිවරිය තව සති කිහිපයකින් විශ්‍රාම යනවා. මේ උත්සවය සඳහා ගුරු භවතකුගෙන් රුපියල් 2,500කුත්, ශිෂ්‍ය නායිකාවකගෙන් රුපියල් 1,500කුත් එකතු කරනවා. මේ පළමු වසරේ සිට පහ වසර දක්වා පන්තිවල ඉන්න ළමයි; පුංචි දරුවෝ. අද උදෑසන, මේ මොහොතේ ඒ ආකාරයට මුදල් එකතු කිරීමේ ක්‍රියාදාමයට අවශ්‍ය මූලික පිඹුරුපත් සකස් කරලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, පාසල්වල මුදල් එකතු කිරීම නවත්වන්නට, ඒ සඳහා වැට බඳින්නට ඔබතුමා ශක්තිමත් ක්‍රමවේදයක් සකස් කළා. ඒ ක්‍රමවේදය තුළත් මෙම පාසලේ පුංචි පන්තිවල ශිෂ්‍ය නායිකාවකගෙන් රුපියල් 1,500කුත්, ගුරු භවතකුගෙන් රුපියල් 2,500කුත් එකතු කිරීමට තීරණය කර තිබෙනවා. සමහර විට හෙට දවසේ ලියුමක් අත්සන් කරයි මේ මුදල් ලබා දෙන්නේ කැමැත්තෙන් කියලා. ගරු ඇමතිතුමනි, කැමැත්තෙන් ලබා දෙන බවට ලියුමක් දුන්නා වුණත්, මෙවැනි දෙයක් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මෙවැනි දේවල් වළක්වන්නට තමයි චක්‍රලේඛයක් නිකුත් කරලා කුමන අවස්ථාවකදීවත් ගුරුවරුන්ට තෑගි භෝග හෝ කුමන දෙයක් හෝ ලබා ගැනීම තහනම් කළේ. එහෙම තිබියදීත්, මෙතුමා සඳහන් කළා වාගේ වක්‍රාකාරයෙන් සමහර තැන්වල මේ කටයුතු ක්‍රියාත්මක වෙනවා. විමර්ශන නිලධාරීන් සංඛ්‍යාව වැඩි කර ගත්තොත් අපට මීට වඩා මේවා ගැන සොයා බලන්නට පුළුවන්. ගරු මන්ත්‍රීතුමා මේ බව ලිඛිතව දැන්වූවහොත් අපි විමර්ශනයක් කරන්නම්. නමුත් ප්‍රශ්නය මේකයි. අපි මේ සියලු කටයුතු කරන්නේ මිනිසුන් සමඟ නිසා ප්‍රායෝගිකව හරි අමාරු තත්ත්වයක් තිබෙනවා. ඒ කෙසේ වෙතත්, ගරු මන්ත්‍රීතුමා අපට පැමිණිල්ලක් කරන්න. ඒ ගැන විධිමත් පරීක්ෂණයක් පවත්වලා ක්‍රියා මාර්ගයක් ගන්නවා.

විදේශ දූත මණ්ඩල සඳහා පත් කළ පුද්ගලයන්: විස්තර

வெளிநாட்டுத் தூதுப் பணிக்காக நியமிக்கப்பட்டோர்: விபரம்

PERSONS APPOINTED TO FOREIGN DIPLOMATIC MISSIONS: DETAILS

928/'16

2. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5):

(අ) (i) 2015.01.08 සිට 2016.08.01 දක්වා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා පත්කළ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් නොවන පුද්ගලයන්ගේ නම්, උපන් දිනයන්, ශ්‍රී ලංකාවේ ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද, පත්කළ රටවල් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් අතරින් ද්විත්ව පුරවැසි/විදේශ පුරවැසි තත්ත්වය හිමි පුද්ගලයන් කවුරුන්ද;

(iii) දේශපාලනිකව පත්කළ මෙම පුද්ගලයන්ට පැවරූ රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.01.08 தொடக்கம் 2016.08.01 வரை இலங்கை வெளிநாட்டுத் தூதுப் பணிக்காக நியமிக்கப்பட்ட இலங்கை வெளிநாட்டுச் சேவை உத்தியோகத்தர்கள் அல்லாத ஆட்களின் பெயர்கள், பிறந்த திகதிகள், இலங்கை முகவரிகள், கல்வித் தகைமைகள், சேவை அனுபவங்கள், நியமிக்கப்பட்ட நாடுகள் மற்றும் பதவிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) இவர்களில் இரட்டை பிரஜாவுரிமை நிலைகள்/ வெளிநாட்டு பிரஜாவுரிமையைக் கொண்டுள்ள ஆட்கள் யாவர் என்பதையும்;

(iii) அரசியல் ரீதியாக நியமிக்கப்பட்ட மேற்படி ஆட்களுக்கு ஒப்படைக்கப்பட்ட கடமைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs:

(a) Will he inform this House-

(i) separately the names, dates of birth, addresses in Sri Lanka, educational qualifications, service experience, appointed countries, posts of the persons who were appointed to Foreign Diplomatic Missions of Sri Lanka from 08.01.2015 to 01.08.2016 and who are not officers of the Sri Lanka Foreign Service;

(ii) of them, the persons holding status of dual citizenship/foreign citizenship; and

(iii) the duties entrusted to these persons who were political appointees?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රාජ්‍ය තාන්ත්‍රික නොවන නිලධාරීන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබුවන්, වෙනත් අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නිලධාරීන්, රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන්, සන්ධාන නිලධාරීන්, පෞද්ගලික සහකාරවරුන්, රියැදුරන් හා කාර්යාල කාර්ය සහායකයන් විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල සේවය කරන, එහෙත් ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නොවන නිලධාරීන් අතර වේ.

රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ නිලධාරීන්ගේ ලැයිස්තුව පමණක් ඇමුණුම (I) ලෙස ඉදිරිපත් කරමි. දීර්ඝ ලැයිස්තුවක් වන බැවින් මම එය **සභාගත*** කරනවා.

(ii) මෙම ප්‍රශ්නයේ පිළිතුරත් ලැයිස්තුවක් හැටියටයි තිබෙන්නේ. එය ඇමුණුම (II) ලෙස **සභාගත*** කරනවා.

(iii) විදේශ රටවල පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවලට සිදු කරනු ලබන පත්කිරීම් දේශපාලන පදනමක් යටතේ සිදු කරනු නොලැබේ. පත්කිරීම් සිදු කරනු ලබන පදනම පහත දක්වා තිබේ.

* වෘත්තිකයන් නොවන රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්- අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලැබූ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය පදනම් කර ගනිමින්

* අමාත්‍ය මණ්ඩල විසින් පත් කරනු ලැබූවන් - අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත

* ආරක්ෂක නිලධාරීන්- ආරක්ෂක අමාත්‍යාංශය විසින් නම් කරනු ලද

* වාණිජ නිලධාරීන් - වාණිජ දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද

* රැකියා හා සුබසාධන නිලධාරීන් - විදේශ රැකියා අමාත්‍යාංශය විසින් නම් කරන ලද

තේ ප්‍රවර්ධන නිලධාරීන් - වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් නම් කරන ලද

කම්කරු නිලධාරීන් - කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් නම් කරන ලද

ශ්‍රී ලංකා පරිපාලන සේවය - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ නම් කිරීම මත/හෝ අමාත්‍යාංශය විසින් රාජ්‍ය සේවයෙන් මාරුකර යැවීම.

ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය -අමාත්‍යාංශය විසින් රාජ්‍ය සේවයෙන් මාරුකර යැවීම.

මෙම නිලධාරීන්ට පැවරී ඇති රාජකාරී පහත පරිදි වේ.

තානාපතිවරුන් හා මහකොමසාරිස්වරුන්

සත්කාරක රටෙදී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම, සත්කාරක රටෙදී ශ්‍රී ලංකාවේ ජාතික අභිලාෂ ආරක්ෂා කිරීම හා අක්තගැන්වූ රට/රටවල් අතර ද්විපාර්ශ්වික සබඳතා ප්‍රවර්ධනය කිරීම.

කොන්සාල් ජනරාල්, නියෝජිතයා හා නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානි

තමාට බලය පැවරී ඇති ප්‍රදේශවලදී ශ්‍රී ලංකාවේ අභිලාෂ ප්‍රවර්ධනය කිරීම.

ආරක්ෂක නිලධාරීන්

අක්තගන්වන ලද රට/රටවල් අතර පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමට හා ආරක්ෂක විෂය ආශ්‍රිත හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා හා/හෝ දූත මණ්ඩල ප්‍රධානි විසින් පවරන ලද ඕනෑම නිල රාජකාරී කටයුත්තක් සිදුකිරීම සඳහා දූත මණ්ඩල කාර්යාල ප්‍රධානිට සහාය ලබාදීම.

වාණිජ නිලධාරීන්

අක්තගන්වන රට/රටවල් අතර පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමට හා ශ්‍රී ලංකාවේ ද්විපාර්ශ්වීය වෙළඳ හා ආර්ථික සබඳතා ආශ්‍රිත රාජකාරී කටයුතුවලට සහායවීම හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා/හෝ දූත මණ්ඩල ප්‍රධානි විසින් පවරන ලද ඕනෑම නිල රාජකාරී කටයුත්තක් සිදුකිරීම.

රැකියා සහ සුබසාධන නිලධාරීන්

අක්ත ගන්වන ලද රට/රටවල් සමඟ පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ සුභසාධනයට අදාළ කටයුතු සඳහා දූත මණ්ඩල/දූත කාර්යාල ප්‍රධානියා හට සහාය ලබාදීම සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හා/හෝ දූත මණ්ඩල ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී කටයුත්තක් සඳහා සහාය ලබාදීම.

තේ ප්‍රවර්ධන නිලධාරීන්

අක්තගන්වන ලද රට/රටවල් සමඟ පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමට සහ තේ ප්‍රවර්ධන ඒකකය මඟින් සංවිධාන කරන ගෝලීය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා දූත මණ්ඩල/දූත කාර්යාල ප්‍රධානියා හට සහාය ලබාදීම මෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හා/හෝ දූත මණ්ඩල ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී කටයුත්තක් සඳහා සහාය ලබාදීම.

කම්කරු නිලධාරීන්

අක්තගන්වන ලද රට/රටවල් සමඟ පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමට සහ ශ්‍රී ලංකාවේ කම්කරු ගැටලුවලට අදාළව දූත මණ්ඩල/දූත කාර්යාල ප්‍රධානියාහට සහාය ලබාදීම මෙන්ම විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හා/හෝ දූත මණ්ඩල ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරී කටයුත්තක් සඳහා සහාය ලබාදීම.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ නිලධාරීන්

අක්තගන්වන ලද රට/රටවල් සමඟ පවත්නා ද්විපාර්ශ්වීය සබඳතා ප්‍රවර්ධනය කිරීමට සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හා/හෝ දූත මණ්ඩල ප්‍රධානියා විසින් පවරන ලද වෙනත් ඕනෑම රාජකාරී කටයුත්තක් සඳහා සහාය ලබාදීම.

(ආ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයේ (අ) (ii) කොටසට පිළිතුර කියවන්න පුළුවන්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයේ (අ) (ii) කොටසට පිළිතුර ඇමුණුම II හි තමයි සඳහන් වෙන්නේ. මා එය කියවන්නම්.

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ද්විත්ව පුරවැසිභාවය/විදේශ පුරවැසිභාවය සහිත පුද්ගලයන් :

1. ස්වර්ණා පී. ගුණරත්න මෙනෙවිය; තනතුර, කොන්සල් ජනරාල්; තානාපති කාර්යාලය, ලොස් ඇන්ජලීස්; රට, ඇමෙරිකා එක්සත් ජනපදය; පත්වීම් දිනය, 2016.03.11; කැනඩා - ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය.
2. මනෝජ් වර්ණපාල මහතා; තනතුර, උපදේශක; තානාපති කාර්යාලය, ලන්ඩන්; රට, එක්සත් රාජධානිය; පත්වීම් දිනය, 2015.10.15; බ්‍රිතාන්‍ය - ශ්‍රී ලංකා ද්විත්ව පුරවැසිභාවය.

අමාත්‍යාංශය සතුව ඇති තොරතුරු අනුව මේ දත්ත තමයි ඉදිරිපත් කර තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
මාණ්පුමිකු පිමල් රත්නායක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට අතුරු ප්‍රශ්න අහන්න වෙලා තිබෙන්නේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමා අතුරු ප්‍රශ්න ඉදිරිපත් කළොත්, ඒවා ගරු ඇමතිතුමාට යොමු කරලා ඔබතුමන්ලාට පිළිතුරු ලබා දෙන්න සලස්වන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒ පිළිබඳ යන්ත්‍රණය මොකක්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
යන්ත්‍රණය ඇත්තටම හදා තිබුණේ නැහැ. ගිය සුමානයේ ඉඳලා තමයි ඒ යන්ත්‍රණය හදා තිබෙන්නේ. යන්ත්‍රණයක් හදන්න කියා ඔබතුමන්ලාම තමයි කිව්වේ. [බාධා කිරීමක්]

විදේශ කටයුතු ඇමතිතුමා සාමාන්‍යයෙන් ප්‍රශ්නවලට පිළිතුරු දෙනවා. අද පොඩ්ඩක් ඒක බැරි වුණා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ගරු අමාත්‍යතුමාගෙන් විමසා පිළිතුරු ලබාදෙනවාය කියා හැම දාම ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම අපේ ගරු සභානායකතුමා - ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා- නිතරම ඒක කියනවා. නමුත්, ඒක වෙන්නේ නැහැ නේ. ඒකට තිබෙන ක්‍රමය මොකක්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගිය සතියේ සිට ඒකට වෙනම වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා. ඒ ගැන ඔබතුමන්ලාවත් දැනුවත් කරනවා. එතකොට සම්බන්ධීකරණයක් ඇති වෙනවා නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, එහෙම කෙරෙනවා නම් හරි නේ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඒක කෙරෙන්නේ කවදා ඉඳලාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඉදිරියේදී එය කෙරෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
වහාම බල පැවැත්වෙන පරිදි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමන්ලා ඉදිරියේ දී බලන්න. ඒකෙන්ම පටන් ගනිමු.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ක්‍රමය මොකක්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
අපි අදාළ ගරු ඇමතිතුමාව දැනුවත් කරනවා, ඔබතුමන්ලා මේ අතුරු ප්‍රශ්න නැඟූ බවට. ඒවාට පිළිතුරු සපයන්න කියලා කියනවා. එතකොට ඔබතුමන්ලාට ගරු ඇමතිතුමා හරහා පිළිතුරු ලබා දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ද්විත්ව පුරවැසිභාවය හෝ විදේශ පුරවැසිභාවය සහිත පුද්ගලයන් ශ්‍රී ලංකා රාජ්‍ය නියෝජනය කරන කොට රටවල් දෙකටම සේවය කරන්න සිදු වන තත්ත්වය පිළිබඳව රජයේ ස්ථාවරය මොකක්ද? ඒ අය වෙනත් යම් යම් අවස්ථාවලට යොදා ගන්න එපාය කියන අදහසක් අප තුළ නැහැ. රාජ්‍ය ප්‍රතිපත්ති, ආරක්ෂක කටයුතු, ආර්ථික කටයුතු සම්බන්ධ කටයුතුවල යෙදීමේදී, එහෙම නැත්නම් ද්විත්ව පුරවැසි භාවය සහිත පුද්ගලයන් තානාපතිවරුන් වශයෙන් කටයුතු කරද්දී, රටවල් දෙකටම සේවය කරන්න සිදු වන තත්ත්වය පිළිබඳව රජයේ ප්‍රතිපත්තිමය ස්ථාවරය මොකක්ද කියලා අපි දැන ගන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
අපි මෙය අදාළ ගරු ඇමතිතුමාට යොමු කරලා ඔබතුමාට ඉක්මන් පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නයත් එම කාරණය සම්බන්ධයෙන්මයි. දැන් එතුමා ලබා දුන් උත්තරයේම තිබෙනවා, බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් උපදේශක කටයුතු කරන පුද්ගලයා බ්‍රිතාන්‍ය පුරවැසියකුය කියලා. පැහැදිලිවම අපි දන්නවා, ඔවුන් බොහෝ අය ශ්‍රී ලංකා පුරවැසිභාවයට වඩා ඒ රටේ පුරවැසිභාවය රැක ගන්න ගොඩක් මහන්සි වෙන බව. කිසිම තත්ත්වයක් යටතේ ඒක අත් හරින්නේ නැහැ. ඒ නිසා double agentsලා වශයෙන් කටයුතු කරන අයට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් පඩි ගෙවන තත්ත්වයක් මේ තුළින් ඇති කර තිබෙනවා. ඒ නිසා මේ ගැන ආණ්ඩුව සැලකිලිමත් වෙන්නය කියන ඉල්ලීමයි නැවතත් ඉදිරිපත් කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. ගරු ඇමතිතුමා ඒ ප්‍රශ්නයත් අදාළ ගරු ඇමතිතුමාට යොමු කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ලැබී තිබෙන තොරතුරු අනුව ද්විත්ව පුරවැසිභාවය තිබෙන අය තානාපති කාර්යාල දෙකක විතරයි පත් කර තිබෙන්නේ. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නයට පිළිතුරු සපයන්න කියලා අපි ගරු ඇමතිතුමාට දැනුම් දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 - 931/'16 - (5), ගරු චන්දිම ගමගේ මහතා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාඩි මත්තොරු දිනත්තිර් සමර්ප්පික්කක් කට්ටළైයిටప్పట్టது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන්: විස්තර
இலங்கை வெளிநாட்டுச் சேவை உத்தியோகத்தர்கள் : விபரம்
OFFICERS OF SRI LANKA FOREIGN SERVICE: DETAILS

945/'16

4. ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (5):

(අ) (i) 2015.12.09 දින සිට 2016.09.30 දින දක්වා වූ කාලය තුළදී පත් කරන ලද තානාපතිවරයන්, මහ කොමසාරිස්වරයන්, නියෝජ්‍ය තානාපතිවරයන්, නියෝජ්‍ය මහ කොමසාරිස්වරයන් සහ එම මට්ටමේ වෙනත් තනතුරු දරන ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් සහ විදේශ සේවයට අයත් නොවන නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2016.09.30 දින වනවිට ඉහත (i)හි සඳහන් වන තනතුරු දරන ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නොවන නිලධාරීන්ගේ නම්, වෘත්තීය සුදුසුකම්, ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහ වර්තමානයේ දරන තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015.12.09ஆந் திகதி தொடக்கம் 2016.09.30ஆந் திகதி வரையான காலப்பகுதிக்குள் நியமிக்கப்பட்ட தூதுவர்கள், உயர் ஸ்தானிகர்கள், பிரதித் தூதுவர்கள், பிரதி உயர் ஸ்தானிகர்கள் மற்றும் அந்த மட்டத்தைச் சேர்ந்த வேறு பதவிகளை வகிக்கின்ற வெளிநாட்டுச் சேவை உத்தியோகத்தர்கள் மற்றும் வெளிநாட்டுச் சேவையைச் சாராத உத்தியோகத்தர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(ii) 2016.09.30ஆந் திகதியளவில் மேற்படி (i) இல் குறிப்பிடப்பட்ட பதவிகளை வகிக்கின்ற வெளிநாட்டுச் சேவையைச் சாராத உத்தியோகத்தர்களின் பெயர்கள், தொழில்சார் தகைமைகள், அதிகபட்ச கல்வித் தகைமைகள் மற்றும் தற்போது வகிக்கின்ற பதவிகள் வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs :

(a) Will he inform this House separately-
(i) the number of Ambassadors, High Commissioners, Chargé d' Affaires, Deputy High Commissioners, and other officers of same rank who belong to the Sri Lanka Foreign Service and the officers who do not belong to the Sri Lanka Foreign Service appointed during the period from 09.12.2015 to 30.09.2016; and
(ii) the names, professional qualifications, highest educational qualifications and the present positions of the officers who do not belong to the Sri Lanka Foreign Service and in the positions mentioned in above (i) as at 30.09.2016;

(b) If not, why?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මට යම් කාරණයක් පිළිබඳව සඳහන් කරන්නට තිබෙනවා. මෙම කාරණය මේ ප්‍රශ්නයට අදාළ ද දන්නේ නැහැ. විදේශ කටයුතු අමාත්‍යතුමාව අද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට කැඳවා තිබුණා. එතුමාගේ නීතිඥ මහත්වරුන් ප්‍රකාශ කරලා තිබුණා, එතුමා අද දින පාර්ලිමේන්තුවේ කටයුතුවලට සහභාගිවීමට නියමිතව තිබෙන බැවින් එම කොමිෂන් සභාවට පැමිණෙන්නේ නැහැ කියලා. එසේ මාධ්‍ය වාර්තා කර තිබෙනවා මා දැක්කා. හැබැයි, අද එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපි නම් පත්තරවල තිබෙනවා දැක්කේ එතුමා කැබිනට් මණ්ඩල රැස්වීමට සහභාගී වනවා කියලායි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කැබිනට් මණ්ඩල රැස්වීම උදේ තිබුණා. ඔබතුමාට දෙක මාරුවෙලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුරු දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් සංඛ්‍යාව

තානාපතිවරයන් සංඛ්‍යාව - 2

මහ කොමසාරිස්වරයන් සංඛ්‍යාව - 0

අතරතුර තානාපතිවරයන් සංඛ්‍යාව - 0

නියෝජ්‍ය මහ කොමසාරිස්වරයන් සංඛ්‍යාව - 0

කොන්සල් ජනරාල්වරයන් සංඛ්‍යාව - 1

ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නොවන නිලධාරීන් සංඛ්‍යාව

තානාපතිවරයන් සංඛ්‍යාව - 4

මහ කොමසාරිස්වරයන් සංඛ්‍යාව - 5

අතරතුර තානාපතිවරයන් සංඛ්‍යාව - 0

අතරතුර තානාපතිවරයන් සංඛ්‍යාව - 0

අතරතුර තානාපතිවරයන් සංඛ්‍යාව—2

(ii) ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු කථානායකතුමනි, මම එක අතුරු ප්‍රශ්නයයි අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම හොඳයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

"මෛත්‍රී පාලනයක්... ස්ථාවර රටක්" කියන ජනාධිපති ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 43වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

"විදේශ සේවාවට අනුයුක්ත කර ඇති සියලු දේශපාලන පත්වීම් හා ඥාතීන්ගේ පත්වීම් අවලංගු කර සමස්ත විදේශ සේවාව වෘත්තීය නිලධාරීන් හා වෘත්තීය කුසලතා සුදුසුකම් සපුරා ඇති පිරිස් යොදාගෙන පූර්ණ ප්‍රතිසංවිධානයකට යොමු කරමි."

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියවපු ඔය ලැයිස්තුව අනුව ජනාධිපතිතුමන් මේ රටේ ජනතාවගෙන් ජනවරමක් ලබා ගැනීමට ජනතාවට දුන් ප්‍රතිඥාව කඩ කර තිබෙනවා නේද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, එයට පිළිතුර නම්, "නැත". මෙම ලැයිස්තුව කියෙව්වොත් ඔබතුමාට තේරුම් ගන්න පුළුවන්, මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. [බාධා කිරීමක්] ඔබතුමා අහන්නේ 2015 ජනවාරි 08වැනි දාට ඉස්සෙල්ලා නම්, එයට පිළිතුර, "ඇත". ඉන් පසුව නම් පිළිතුර, "නැත".

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ප්‍රශ්නය පැහැදිලියි. එය ලිඛිතව දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මට දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොරොන්දු කඩ කළා; කමක් නැහැ. අහන්න.

**** ප්‍රශ්නකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු ඇමතිතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න වනවා. මොකද, පළමුවැනි අතුරු ප්‍රශ්නයට ඔබතුමාගේ පිළිතුර වුණේ, "නැත" යන්නයි. ගරු ඇමතිතුමනි, පිළිතුර "නැත" වන්නේ කෙසේදැයි මට පහදා දෙනු මැනවි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

අද ගරු ඇමතිතුමා පැමිණ නැත. අතුරු ප්‍රශ්නවලට පසුව පිළිතුරු දෙනු ඇත.

නලිනගාන්ධි විමලේන්ද්‍රන් මහත්මිය: ගුරු පුහුණු සහතිකයේ විෂමතාව

திருமதி நளினகாந்தி விமலேந்திரன்: ஆசிரியர் பயிற்சிச் சான்றிதழின் வேற்றுமை
MRS. NALINAGANDI VIMALENDRAN: DISPARITY IN TEACHER TRAINING CERTIFICATE

1102/'16

5. ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) මඩකලපුව, නාවට්කර්නි කන්නකි විද්‍යාලයේ ගුරුවරියක වන නලිනගාන්ධි විමලේන්ද්‍රන් මහත්මිය, 2008දී මඩකළපුව ගුරු විදුහලෙන් සිය පුහුණුව අවසන් කළ බවත්, මුලතිව් දිස්ත්‍රික්කයේ කයිවෙලි ගනේෂා විද්‍යාලයට පත් කළ බවත්;

(ii) 2009 අප්‍රේල් මස පැවති මඩකළපුව ගුරු විදුහලේ අවසන් පරීක්ෂණයට පෙනී සිටින ලෙසට ඇයට දැනුම් දීමක් කෙරුණු බවත්;

(iii) එම කාල සීමාවේ දී යුද්ධය උච්චතම අවස්ථාවට එළඹ තිබූ බැවින් කිසිදු පුද්ගලයෙකුට මුලතිව්වලින් පිට වීමට අවසර නොතිබූ බවත්;

(iv) සිය කනිෂ්ඨ කණ්ඩායම සමඟ පරීක්ෂණයට පෙනී සිටි ඇයගේ සහතිකයේ බලාත්මක දිනය 2011.01.01 වූ අතර ඇයගේ කනිෂ්ඨයන්ට එම දිනය 2009.08.01 වූ බවත්;

(v) මෙම අසාධාරණය පිළිබඳව ජනාධිපතිතුමාට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, මෙම විෂමතාව නිවැරදි කිරීම සඳහා ජනාධිපතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම්වරයාගේ 2016.08.05 දිනැති අංක SL/EDU/APP/0043 දරන ලිපිය එවකට, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඇගේ සහතිකයේ බලාත්මක දිනය 2009.08.01 ලෙස වෙනස් කිරීමට උපදෙස් ලබා දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்/நாவற்கேணி கண்ணகி வித்தியாலய ஆசிரியை திருமதி நளினகாந்தி விமலேந்திரன் அவரது பயிற்சியை மட்டக்களப்பு ஆசிரியர் கலாசாலையில் 2008 இல் பூர்த்தி செய்ததும் முல்லைத்தீவு மாவட்டத்தில் உள்ள கைவேலி கணேசா வித்தியாலத்திற்கு நியமனம் செய்யப்பட்டார் என்பதையும்;

(ii) மட்டக்களப்பு ஆசிரியர் கலாசாலையில் 2009 ஏப்பிரல் மாதம் நடைபெற்ற இறுதிப் பரீட்சைக்குத் தோற்றுமாறு அவர் கோரப்பட்டார் என்பதையும்;

(iii) அக்காலகட்டத்தில் யுத்தம் உச்சக்கட்டத்தினை அடைந்திருந்த காரணத்தினால் முல்லைத்தீவினை விட்டுச்செல்ல யாரும் அனுமதிக்கப்படவில்லை என்பதையும்;

(iv) தனது கனிஷ்ட தொகுதியினருடன் பரீட்சைக்குத் தோற்றிய அவரின் சான்றிதழின் செயற்படும் திகதி 2011.01.01 என வழங்கப்பட்டுள்ள அதேவேளை, கனிஷ்ட தொகுதியினருக்கு இது 2009.08.01 என வழங்கப்பட்டுள்ளது என்பதையும்;

(v) இந்த அநீதியினைப் பற்றி ஜனாதிபதிக்கு இவர் விண்ணப்பித்ததைத் தொடர்ந்து ஜனாதிபதியின் இணைப்புச் செயலாளர் SL/EDU/APP/0043 இலக்கமுடைய 2016.08.01ஆம் திகதியிடப்பட்ட கடிதத்தினை இந்த ஒழுங்கீனத்தை நிவர்த்தி செய்யுமாறு கோரி அப்போதைய கல்வி அமைச்சின் செயலாளருக்கு அனுப்பி வைத்திருந்தார் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) அவரது சான்றிதழின் செயற்படும் திகதியை 01.08.2009 என மாற்றுவதற்கு அறிவுறுத்தல் வழங்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறியத்தருவாரா?

(இ) இன்றேல் ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -
(i) Mrs. Nalinagandi Vimalendran, teacher at Bt/Navatkerny Kannaki Vidyalaya completed her training from Batticaloa Teachers College in 2008 and posted to Kaiveli Ganesha Vidyalaya in Mullaitivu District;
(ii) she was asked to sit for the final examination in April 2009 which was held at Batticaloa Teachers College;
(iii) as war was at its climax during that period and nobody was allowed to leave out of Mullaitivu;
(iv) she sat for the examination with her junior batch and the effective date of her certificate is given as 01.01.2011; whereas juniors were given as 01.08.2009; and
(v) she has appealed to the President about this injustice and the Coordinating Secretary to the President has sent a letter No. SL/EDU/APP/0043 dated 05.08.2016 to then, Secretary, Ministry of Education to rectify this irregularity?

(b) Will he inform this House whether instructions be given to change the effective date of her certificate as 01.08.2009?

(c) If not why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට පිළිතුරු මෙසේය.

(අ) (i) ඉරු පුහුණුව අවසන් කළ බව දනී.

(ii) දනී.

(iii) නොදනී.

(iv) දනී.

(v) නොදනී.

(ආ) වලංගු විභාග කාර්යය පටිපාටිය හා ප්‍රතිඵල තීරණය කිරීමේ පටිපාටිය අනුව කළ නොහැක.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
Yes, Sir. It is well known that due to the situation prevailed in Kilinochchi and Mullaitivu Districts in April, 2009, these teachers were not in a position to go out of those Districts. That is why she was affected. So, some kind of compensation has to be given.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එය එසේ වුණත් විභාග කාර්ය පටිපාටිය අනුව එහෙම සිදු කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Have you got any other Supplementary Questions?

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
There are 43 teachers who faced the similar situation. Earlier, when this question was asked, Hon. V.S. Radhakrishnan, State Minister of Education accepted that some kind of arrangement should be made for those 43 teachers. This teacher is one of them.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් රාධාක්‍රිෂ්ණන් රාජ්‍ය ඇමතිතුමාගේ ඉල්ලීම මත Cabinet Paper එකක් සකස් කරමින් යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you.

ප්‍රශ්න අංක 6 -1113/'16- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

මීගහතැන්න, කුම්බදුව ප්‍රදේශයේ ගල් කොරි : පරිසර හානි
மீகஹதென்ன, கும்பதுவ பிரதேசக் கற்குழிகள்: சுற்றாடல் பாதிப்பு
QUARRIES AT KUMBADUWA AREA IN MEEGAHATHENNA: ENVIRONMENTAL DAMAGE

1152/'16

8. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මීගහතැන්න, කුම්බදුව ප්‍රදේශයේ ගල් කොරි 02ක් ක්‍රියාත්මක වන බවත්;

(ii) එමඟින් දැඩි පරිසර හානියක් සිදුවී ඇති බවත්;

(iii) එම ගල් කොරි නිසා අවට නිවාස විශාල ප්‍රමාණයකට හානි වී ඇති බවත් ;

එතුමා දන්නේද?

(ආ) (i) එම ගල් කොරි අයිතිකරුවන් විසින් යාබද කුඹුරු ගොඩකර ඇති බව වාර්තා වී තිබේද;

(ii) ප්‍රදේශවාසීන් දිගින් දිගටම පැමිණිලි කර තිබියදීත්, මධ්‍යම පරිසර අධිකාරිය විසින් එම ගල් කොරි දෙකේ බලපත්‍ර අහෝසි නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும், தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) வளல்லாவிட்ட பிரதேச செயலாளர் பிரிவுக்குச் சொந்தமான மீகஹதென்ன, கும்பதூவ பிரதேசத்தில் 02 கற்குழிகள் நடத்தப்பட்டு வருகின்றன என்பதையும்;

(ii) அதன்மூலம் சுற்றாடலுக்கு கடுமையான பாதிப்பு ஏற்பட்டுள்ளது என்பதையும்;

(iii) மேற்படி கற்குழிகள் காரணமாக அருகிலுள்ள பெருந்தொகையான வீடுகள் பாதிக்கப் பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கற்குழி உரிமையாளர்களால் அருகிலுள்ள வயல்கள் நிரப்பப்பட்டுள்ளதாக அறிக்கையிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) பிரதேச வாசிகள் தொடர்ச்சியாக முறைப்பாடு செய்திருந்தபோதிலும், மத்திய சுற்றாடல் அதிகாரசபை மேற்படி இரண்டு கற்குழிகளின் உரிமங்களை இரத்துச் செய்யாதிருப்பதற்கான காரணம் யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Is he aware that -

(i) two quarries are being operated at Kumbaduwa area in Meegahathenna belonging to the Walallawita Divisional Secretary's Division;

(ii) they have caused a massive damage to the environment; and

(iii) a large number of houses in the surrounding area have been damaged due to these quarries?

(b) Will he inform this House -

(i) whether it has been reported that nearby paddy fields have been filled up by the owners of those quarries; and

(ii) the reason for not cancelling the quarry permits by the Central Environmental Authority at a time when the residents have continuously lodged complaints regarding the matter?

(c) If not, why?

ගරු අනුරාධ ජයරත්න මහතා (මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அநுராத ஜயரத்ன - மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் பிரதி அமைச்சர்)

(The Hon. Anuradha Jayaratne - Deputy Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුම්බදූව ප්‍රදේශයේ කළුගල් වළවල් දෙකක් පිහිටා ඇත. එයින්,

කේ.ඒ.ඩී. වීරසිංහ මහතාට අයත් කළුගල් වළ දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැත.

පී.කේ. විමල් නානායක්කාර මහතාට අයත් කළුගල් වළ ක්‍රියාත්මක තත්ත්වයේ ඇත.

(ii) කළු ගල් කර්මාන්තය හේතුවෙන් සිදු විය හැකි පරිසර බලපෑම් අවම කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් නිකුත් කළ කැණීම් බලපත්‍රයෙන් හා මධ්‍යම පරිසර අධිකාරියෙන් නිකුත් කළ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි මඟින් කටයුතු යොදා ඇත.

(iii) නිවාස කිහිපයකට හානි සිදු වී ඇති බවට පැමිණිලි මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලැබී ඇත.

(ආ) (i) කුඹුරු ගොඩකර ඇති බව වාර්තා වී නොමැත.

එහෙත්, කේ.ඩී.ඒ. වීරසිංහ මහතාට අයත් ගල් වළ හේතුවෙන් වර්ෂා ජලය මඟින් මඩ, පස් කුඹුරට සේදී යන බව වාර්තා වී ඇති බැවින්, ඒ සඳහා මඩ රඳවුම් (silt trap) සකස් කරන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය විසින් කර්මාන්තකරුට දන්වා ඇත.

(ii) කේ.ඩී.ඒ. වීරසිංහ මහතාට අයත් කළු ගල් වළ දැනට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති අතර, පරිසර ආරක්ෂණ බලපත්‍රය අලුත් කිරීමට මධ්‍යම පරිසර අධිකාරිය වෙත අයදුම්කර නොමැත.

පී.කේ. විමල් නානායක්කාර මහතාට අයත් කළු ගල් වළ ක්‍රියාත්මක තත්ත්වයේ ඇති නමුත්, කොන්දේසි සහිත බලපත්‍රයක් පවතී. මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමට නියමිතය.

(ඇ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මීගහතැන්න සහ කුම්බදූව කියන මේ ගල් කොරි දෙක නිරීක්ෂණය කරන්නට කළුතර දිස්ත්‍රික් ලේකම්වරයාත්, මධ්‍යම පරිසර අධිකාරියේ සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරිනුත් ගියා. මේ නිවාසවලට හානි වෙලා තිබෙනවා; කුඹුරු ගොඩ වෙලාත් තිබෙනවා. එක ගල් කොරියක බලපත්‍රය පසු ගිය පෙබරවාරි මාසයේ අහෝසි වුණාට, අනෙක් බලපත්‍රය දිගින් දිගටම ක්‍රියාත්මක වෙනවා; ඒකෙනුත් මේ හානියම සිද්ධ වෙනවා. මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගන්නම් කියලා ඒ වෙලාවේදී අදාළ නිලධාරීන් පොරොන්දු වෙලා ගියත්, ඒ ප්‍රදේශයට දැඩි හානියක් වෙලා තිබෙනවා. ඒ මිනිස්සුන්ට සෞඛ්‍ය ප්‍රශ්න තිබෙනවා; දරුවන්ගේ ඉගෙනීම් කටයුතුවලට බාධා ඇති වෙලා තිබෙනවා; තවමත් ගෙවල් ඉරි තළනවා. ඒ නිසා, මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් නොගැනීම බරපතළ ප්‍රශ්නයක්.

ගරු අනුරාධ ජයරත්න මහතා

(மாண்புமிகு அநுராத ஜயரத்ன)

(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, කේ.ඩී.ඒ. වීරසිංහ මහත්තයාට අයත් කළු ගල් වළ මේ වනවිටත් ක්‍රියාත්මක වන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමා කියන්නේ, පී.කේ. විමල් නානායක්කාර කියන මහත්තයා කරගෙන යන ගල් වළ සම්බන්ධයෙනුයි. මධ්‍යම පරිසර අධිකාරිය හැටියට අපි දැනට ඒ ගැනත් පසුවිපරම් කරනවා. අනෙක, ඒකාබද්ධ පරීක්ෂණයේ ගත්ත තීරණයක් අනුව තමයි බලපත්‍රය නිකුත් කරලා තිබෙන්නේ. හැබැයි, එකැන යම් අකටයුත්තක් එහෙම නැත්නම් පරිසරය සම්බන්ධයෙන් හානියක් වෙනවා නම්, ඒ ගැන කවුරු හෝ පැමිණිලි කරනවා නම් අපට ඒ ස්ථාන පරීක්ෂා කරලා ඒ පිළිබඳ තීරණ ගැනීමේ හැකියාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ පරීක්ෂණයේ වාර්තාවන්වලට අනුකූලව ඒ ගල් වළ සම්බන්ධයෙන් වෙනත් ප්‍රශ්නයක් දැනට පැන නැඟිලා නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)

(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සම්බන්ධයෙන් ඇති තරම් පැමිණිලි ලැබිලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවටත් ප්‍රදේශවාසීන් පැමිණිලි ඉදිරිපත් කළා. ඒ වාගේම ඒ අදාළ ආයතනයට දැන් වසර ගණනාවක් තිස්සේ පැමිණිලි ඉදිරිපත් කරනවා. නමුත්, මේ පුද්ගලයා දේශපාලන බලය සහ තමන්ගේ මුදල් බලය පාවිච්චි කරලා ඒවා යටපත් කර ගන්නා බවක් තමයි පෙන්නුම් කරන්නේ. එම නිසා අපි කියන්නේ, මේ පිළිබඳව කඩිනමින් ඉතාමත් සාධාරණ මැදිහත්වීමක් කරලා මේ වෙමින් පවතින විනාශය නතර කරන්න කියන එකයි.

ගරු අනුරාධ ජයරත්න මහතා
(මාණ්පුමිකු අනුරාත ජයරත්න)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, පළමුවෙනි කාරණාව තමයි, මුදල් හෝ බලයට හෝ යටවෙලා බලපතුවල කාලය තියා ගැනීම කිසිම විධියකින් කරන්නේවත්, එවැනි දෙයක් සිදු වන්නේවත් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, දහදෙනෙක්, පහළොස් දෙනෙක්, එහෙම නැත්නම් පනස් දෙනෙක් එකතු වෙලා පොඩි උද්ඝෝෂණයක් කරලා මේ රටේ සමහර කර්මාන්ත වහන්න, එහෙම නැත්නම් සමහර පෞද්ගලික ප්‍රශ්න, දේශපාලන ප්‍රශ්න වැනි කාරණා ඉස්මතු කරගෙන මෙවැනි ස්ථානවලට ඇවිල්ලා උද්ඝෝෂණ කරලා, යම් ප්‍රශ්න ඇති කරලා මේ රටේ පවතින ව්‍යාපාර සම්පූර්ණයෙන්ම විනාශ කිරීමේ ව්‍යාපාරයකුත් කර ගෙන යනවා අපි බොහෝ ස්ථානවලදී දැක තිබෙනවා. එම නිසා පැමිණිල්ලක් දැමූ පලියට මෙවැනි ගල් වළවල් -රටේ ක්‍රියාත්මක වන ව්‍යාපාර- නතර කරන්න අපි සූදානමක් නැහැ. එහෙම නතර කරන්න අපි බලාපොරොත්තු වෙන්නෙත් නැහැ. හැබැයි, ඒ සම්බන්ධයෙන් පැමිණිලි ආවොත් ඒ ගැන ස්ථාන පරීක්ෂාවක් සහ ඊට අදාළ සියලු කටයුතු කරලා, ඒක පරිසරයට හානියක් ලෙසට තීරණය වුණොත් පැහැදිලිවම ඒවා නතර කරන්නත් අපි කටයුතු කරනවා.

නියහයෙන් පීඩාවට පත් පොල් වගා කරුවන්: පුත්තලම දිස්ත්‍රික්කය

වරට්සියිනාල් පාතික්කප්පට්ට තෙංකුච් චෙය්කෙයාළර්කළ්: පුත්තලම් මාවට්ටම්

COCONUT CULTIVATORS AFFECTED BY DROUGHT: PUTTALAM DISTRICT

1156/'16

9. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පසුගිය මාස 3- 4 කාලය පුරා පුත්තලම දිස්ත්‍රික්කය දැඩි නියහයකට මුහුණ දුන් බව දන්නේද;

(ii) එම නියහය හේතුවෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් වගාවට දැඩි හානි සිදු වී ඇති බව පිළිගන්නේද;

(iii) නියහයෙන් පීඩාවට පත් පුත්තලම දිස්ත්‍රික්කයේ පොල් වගා කරන්නන්ට යම් සහනාධාරයක් ලබා දීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ටක් කෛත්තොළිල් අමෙච්චරෛක් කේට්ට විනා:

(අ) (i) කඩන්ත 3-4 මාත කාලමාක පුත්තළම් මාවට්ටම් කඩුම් වරට්සියෙ එතිර්නෝක්කියතෙන්පතෙ අරිවාරා එන්පතෙයුම්;

(ii) මේර්පඩි වරට්සියින් කාරණමාක පුත්තළම් මාවට්ට තෙන්නෙච් චෙය්කෙ පෙරුමළවිල් පාතික්කප්පට්ටතෙන්පතෙ අවර් ඒර්රුක්කොළ්කින්රාරා එන්පතෙයුම්;

(iii) වරට්සියිනාල් පාතික්කප්පට්ට පුත්තළම් මාවට්ට තෙංකුච් චෙය්කෙයාළර්කළුක්කු ඒතේනුම් නිවාරණම් අල්ලතු උතවිකළෙ වළංකුවතර්කු මේර්කොළ්ළප්පටුම් නටවටික්කෛකළ් යාවෙ එන්පතෙයුම්;

අවර් ඉච් චපෛක්කු අරිවිප්පාරා?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House-
(i) whether he is aware that Puttalam District has been facing a drought during the last 3-4 months;
(ii) whether it is admitted that coconut cultivation was immensely affected due to this drought; and
(iii) the measures that will be taken to provide any kind of relief and aid for the coconut cultivators of Puttalam District who were affected by the drought?

(b) If not, why?

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නවින් තිසානායක්ක - පෙරුන්තෝට්ටක් කෛත්තොළිල් අමෙච්චර්)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්. (හානි තක්සේරුව පහතින් දක්වා ඇත)

නියං තත්ත්වය හේතුවෙන් පොල් වගාවට සිදුව ඇති හානියේ තක්සේරුව

ප්‍රාදේශීය කාර්යාලය	හානි වූ පොල් ගස් ගණන
මාරවිල (පුත්තලම දිස්ත්‍රික්කය)	25,000 (විසිපන්දහස)
කුරුණෑගල (කුරුණෑගල දිස්ත්‍රික්කය)	100,000 (ලක්ෂය)
කුලියාපිටිය "	50,000 (පනස්දහස)
එකතුව	**175,000 (එක්ලක්ෂ හැත්තෑපන්දහස)**

(iii) පුත්තලම් දිස්ත්‍රික්කයේ නියහයෙන් හානි වූ පොල් වගාව පිළිබඳව දැනට ලැබී ඇති දත්ත අනුව පොල් ගස් 25,000කට ආසන්න ප්‍රමාණයක් මුළුමනින්ම විනාශ වී ඇත.

ඒ අනුව, එම පොල් වගාව නැවත ස්ථාපිත කිරීමත් පවතින පොල් වගාව නියහයෙන් ආරක්ෂා කිරීම

සඳහාත් 2017 වසරේදී පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් පහත සහනාධාර වැඩසටහන් රුපියල් මිලියන 37.75ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ක්‍රියාකාරකම	වෙන්කරන ලද මුදල රුපියල් මිලියන	භෞතික ඉලක්කය
01. නියඟය නිසා හානි වූ පොල් ගස් වෙනුවට පොල් පැළ නොමිලේ ලබා දීම	10	පොල් පැළ 100,000 (ලක්ෂය)
02. පොල් ඉඩම්වල තෙතමන සංරක්ෂණය සඳහා සහනාධාර ලබා දීම.	12.75	අක්කර 850 (අටසිය පනහ)
03. පොල් ඉඩම්වල ජල සම්පාදන පද්ධතිය ඉදිකිරීම සඳහා සහනාධාර ලබා දීම.	6	අක්කර 600 (හයසියය)
04. පොල් ගසේ මූල පද්ධතිය ආශ්‍රිතව තෙතමන සංරක්ෂණය සඳහා වසුන් යෙදීමට සහනාධාර ලබා දීම.	5	ගස් 200,000 (දෙලක්ෂය)
05. පසේ තෙතමන සංරක්ෂණය සඳහා පසට කාබනික පොහොර යෙදීමෙන් ව්‍යුහය දියුණු කිරීමෙන් තෙතමන සංරක්ෂණය සඳහා සහනාධාර ලබා දීම	4	ගස් 40,000 (හතළිස්දහස)
	37.75	

(ආ) අදාළ නොවේ.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ ඒ දිස්ත්‍රික්කවලට ආවේණික වූ භෝග තිබෙනවා. රටක් විධියට අපට එය වැදගත් වෙනවා. පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක පොල් ත්‍රිකෝණයේ ප්‍රධාන දිස්ත්‍රික්ක දෙකක් වෙනවා. මේ වනවිට පොල් ගස් විශාල ප්‍රමාණයක් හානියට පත් වෙලා තිබෙනවා. නමුත් මේ මොහොත වනවිට අපේ රජය විධියට ගරු නවින් දිසානායක ඇමතිතුමාගෙන් අමාත්‍යාංශයෙන් පොල් කර්මාන්තයේ සංවර්ධනයට විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. එසේ නමුත් අපිට පෙනෙන්න සහ දකින්න තිබෙන්නේ පොල් කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත දවසින් දවස වැටෙන බවයි. මම මේ ප්‍රශ්නය අහන්න කාරණාව කර ගත්තේත් ඒකයි.

ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ ක්ෂේත්‍රයට අවශ්‍ය කරන පිරිස් ප්‍රමාණය එහෙම නැත්නම් මේ ක්ෂේත්‍රයට අවශ්‍ය කරන ශ්‍රමය ඔබතුමාගේ අමාත්‍යාංශය සතුව අවශ්‍ය ප්‍රමාණයට තිබෙනවාද කියා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. විශේෂයෙන්ම අපේ පොල් සංවර්ධන මණ්ඩලයේ හා පොල් වගා කිරීමේ මණ්ඩලයේ තාක්ෂණික ඇබෑර්තු යම් කිසි ප්‍රමාණයක් තිබෙනවා. අපි නොයෙක් අවස්ථාවල ඒවාට අයදුම් පත් කැඳෙව්වත්, ඒවාට සමහර පිරිස් අපට බඳවා ගන්න බැරි වී තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, මේ රජයෙන් දෙන අඩු වැටුප. ඒ වාගේ උසස් තාක්ෂණික දැනුමක් තිබෙන පුද්ගලයන් බඳවා ගැනීමට අපගේ වැටුප් කොමිසමෙන් අපට මීට වඩා ප්‍රතිපාදන ලබා දෙන්න අවශ්‍යයි. ඒ ගැන අපි තවම සාකච්ඡා කරමින් පවතිනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, කාලය ඉතිරි කර ගැනීම සඳහා මම දෙවන අතුරු ප්‍රශ්නයත් තුන්වැනි අතුරු ප්‍රශ්නයත්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, දැන් අතුරු ප්‍රශ්න දෙකයි අහන්න දෙන්නේ.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට මම පොඩි යෝජනාවක් කරන්නම්. පොල් කර්මාන්තයට අදාළව හුදකලා බීජ පොල් උයන තිබෙන්නේ අඹකැලේ. එය ආසියාවේ තිබෙන ප්‍රධාන පෙළේ පොල් බීජ නිපදවන ස්ථානයක්. ඒ ප්‍රදේශයේ ඉන්න අයට ඒ පිළිබඳව දැනුමක් තිබෙනවා; හැකියාවත් තිබෙනවා; අඩු පඩියට වැඩ කරන්නත් පුළුවන්කම තිබෙනවා. ගරු ඇමතිතුමනි ඔබතුමා මැදිහත් වෙලා ඒ ප්‍රදේශයේ අයට රැකියා ලබා දෙද්දී ඔබතුමාගේ අමාත්‍යාංශයේ, එහෙම නැත්නම් කොමිෂන් සභාවල තිබෙන rulesවලින් පොඩ්ඩක් පහළට එන්න පුළුවන් නම් හොඳයි. මම යෝජනාවක් විධියට එය ඉදිරිපත් කරනවා. ඒ වාගේම මේ වන විට -මේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ- පොල් වගාව තිබෙන විශාල ඉඩම්වල නියඟයෙන් විනාශ වන පොල් ගස් පොල් පර්යේෂණායතනයේ අනුමැතිව ගෙන ඉවත් කරලා ඒ ඉඩම්වල වැලි කැපීම නිසා ඒ වගාවට යම්කිසි බලපෑමක් වන තත්ත්වයට භාජන වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා මේ පොල් වගාව පුනරුත්ථාපනය කරන්න; නැවත දියුණු කරන්න උත්සාහ කරන ගමන් මේ වගාව ආරක්ෂා කර ගන්න ඔබතුමාගේ මැදිහත්වීම කරන්න කියා ඉල්ලා සිටිමින්, පිළිතුරු සැපයීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

මම ඔබතුමාත් සමඟ එම යෝජනාව පිළිබඳව සාකච්ඡා කරලා අවශ්‍ය පිළිසකර කිරීම් කිරීමට කටයුතු කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 - 1191/'16-(1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මැතිතුමා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

"අරමුදල්වල අරමුදල": විස්තර
"நிதியங்களின் நிதியம்" : விபரம்
"FUND OF FUNDS": DETAILS

1372/'16

12. ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2)

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 124ට අනුව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යාපාර ප්‍රාග්ධනය සැපයීමේ අරමුණින්, "අරමුදල්වල අරමුදල" පිහිටවනු ලැබුවේද;

(ii) එකී "අරමුදල්වල අරමුදල" සඳහා දායක වන ලෙස ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) වෙතින් ඉල්ලීමක් කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එයට ලැබුණු ප්‍රතිචාර කවරේද;

(iv) ව්‍යාපාර ප්‍රාග්ධන සමාගම් සඳහා වූ සාංගමික ආදායම් බදු 50% කින් අඩු කිරීමට අදාළව දේශීය ආදායම් පනත සංශෝධනය කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டு வரவு செலவு திட்ட முன்மொழிவு இலக்கம் 124 இற்கு அமைய, சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில் முயற்சியாளர்களுக்கு தொழில்முயற்சி மூலதனத்தை அளிக்கும் நோக்கத்தில், "நிதியங்களின் நிதியம்" ஒன்று தாபிக்கப்பட்டதா என்பதையும்;

(ii) மேற்படி "நிதியங்களின் நிதியத்திற்கு" பங்களிப்பு செய்யுமாறு சர்வதேச நிதிக் கூட்டுத்தாபனத்திடமும் (IFC) ஆசிய அபிவிருத்தி வங்கியிடமும் (ADB) வேண்டுகோள் விடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அதற்கு கிடைத்த பிரதிபலிப்புகள் யாவை என்பதையும்;

(iv) தொழில்முயற்சி மூலதன கம்பனிகளுக்கான கம்பனி வருமான வரியை 50% ஆல் குறைப்பதற்கு ஏற்புடையதாக உண்ணாட்டரசிறைச் சட்டம் திருத்தப்பட்டதா என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House -

(i) whether a 'Fund of Funds' has been established with the view to providing business capital to small and medium scale entrepreneurs as per Proposal No.124 of the Budget for the year 2016;

(ii) whether requests were made to the International Finance Corporation (IFC) and Asian Development Bank (ADB) seeking their contributions to the aforesaid 'Fund of Funds';

(iii) if so, of the nature of the responses received from those institutes; and

(iv) whether the Inland Revenue Act was amended in relation to reduction of corporate income tax for venture capital companies by 50 per cent;

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) "අරමුදල්වල අරමුදල" නැමැති ඒකාබද්ධ අරමුදලක් ස්ථාපිත කිරීම මඟින් ව්‍යාපාර ප්‍රාග්ධන ප්‍රවේශය ඇති කිරීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා කොටස් මූල්‍ය පහසුකම් ලබා දීමට 2016 අය වැය මඟින් යෝජනා කරන ලදී. බැංකු, රක්ෂණ සමාගම් ඊපීඑෆ්, ඊටීඑෆ් වැනි රාජ්‍ය සතු අරමුදල්, ජාත්‍යන්තර මූල්‍ය ආයතනය (IFC) සහ ආසියානු සංවර්ධන බැංකුව (ADB) යන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් මෙම අරමුදල ආරම්භ කිරීමට යෝජනා විය. ඒ අනුව ආණ්ඩුව මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා ආරම්භ කළ අතර, ආසියානු සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා ව්‍යාපාර ප්‍රාග්ධන සංකල්පය සඳහා පවතින වෙළෙඳපොළ ඉල්ලුම විශ්ලේෂණය කිරීම සඳහා මූලික වෙළෙඳපොළ සමීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමට එකඟ විය.

ඒ අනුව "York Street Partners" ආයතනය විසින් අදාළ වෙළෙඳ පොළ සමීක්ෂණය සිදු කරනු ලැබූ අතර, නියමු ව්‍යාපෘතියක් ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 10ක අරමුදලකින් ආරම්භ කර, එහි ප්‍රගතිය මත ප්‍රධාන අරමුදල ගොඩනැඟීම යෝග්‍ය බව එම අධ්‍යයනයෙන් නිර්දේශ කර ඇත. අදාළ නියමු අරමුදල පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික ප්‍රාග්ධනය (Seed Capital) සපයා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත.

යෝජිත ව්‍යාපාර ප්‍රාග්ධන අරමුදල ක්‍රියාවට නංවන තෙක් එම අරමුදල ස්ථාපිත කිරීම මඟින් විසඳීමට බලාපොරොත්තු වන මූල්‍ය ප්‍රවේශය පුළුල් කිරීම සහ ණය සුරැකුම් පිළිබඳ ගැටලුව සඳහා විසඳුමක් ලබා දීමේ අරමුණින් ආසියානු

සංවර්ධන බැංකුවේ සහාය ඇතිව "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම (SMELoC)" සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ණය සඳහා ඇප ලබාදෙන ණය සුරැකුම් ආයතනය හඳුන්වා දීමට රජය ක්‍රියා කරන ලදී. ඊට අමතරව කෘෂි කර්මය, කුකුළන් ආශ්‍රිත නිෂ්පාදන අංශය, මල් වගාව, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා රටේ වෙනත් පීඩාවන්ට ලක්ව ඇති කණ්ඩායම් ආවරණය වන පරිදි එම ජනතාවට දැරිය හැකි පොලී අනුපාතයකට මූල්‍ය පහසුකම් සපයන සහන ණය යෝජනා ක්‍රම 8ක් හඳුන්වා දීමට රාජ්‍ය විසින් පියවර ගෙන තිබේ. එම යෝජනා ක්‍රම 2017 අය වැය යෝජනා අනුව හඳුන්වාදෙන ලද අතර, 2017 මාර්තු මස 31වැනි දින සිට සියලුම රාජ්‍ය බැංකු හා ප්‍රධාන පෙළේ පෞද්ගලික බැංකු හරහා ක්‍රියාත්මක වේ. එම ණය යෝජනා ක්‍රම පහත දැක්වේ.

1. රන් අස්වැන්න
2. ගොවි නවෝදා
3. ජය ඉසුර
4. රිවි බල සවි
5. රිය ශක්ති
6. සොඳුරු පියස
7. දිරි සවිය
8. මාධ්‍ය අරුණ

(ii) ඔව්.

(iii) මෙම අරමුදල ගොඩනැඟීම පිළිබඳ මූලික වෙළෙඳ පොළ සමීක්ෂණය සිදුකිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය (Technical Assistance) ප්‍රදානයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ලදී.

(iv) නැත.

(ආ) පැන නොනඟී.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය.

ප්‍රදානයක් ලෙස ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු මුදල් ප්‍රමාණය කොතෙක්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
පිළිතුරේ ඒ සම්බන්ධයෙන් සඳහනක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මට ඒ සම්බන්ධයෙන් අහලා කියන්න වෙයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල ගුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
දෙවෙනි අතුරු ප්‍රශ්නය.

ඒ සඳහා වන දේශීය ආදායම් පනතට සංශෝධන ඉදිරිපත් කරන බව සඳහන් කරලා තිබුණා. දේශීය ආදායම් පනතේ නව සංශෝධන පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් වුණා. ඒ අනුව ඒ සඳහා පෙත්සම් 10ක් දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතිනවා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නව පනත් කෙටුම්පතේ මේ සඳහා අවශ්‍ය සංශෝධන ඇතුළත් කරලා තිබෙන්නේ කුමන වගන්තියේද කියලා ඔබතුමා සඳහන් කරනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ නඩු ගොනු වෙලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන නිගමනය අනුව, ඒ වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන උපදෙස් අනුව අපි අදාළ සංශෝධන කරන්න බලාපොරොත්තු වනවා. ඊට අමතරව එක් එක් පාර්ශ්වයන් අප සමඟ සාකච්ඡා කරලා තිබෙනවා. ඒවාටත් සංවේදීව අවශ්‍ය සාධාරණ සංශෝධන කරන්න අපි බලාපොරොත්තු වනවා.

නවාන ප්‍රාථමික විදුහල: නාය යාමේ අවදානම
நவான ஆரம்பப் பாடசாலை : மண்சரிவு ஆபத்து
NAWANA PRIMARY SCHOOL: LANDSLIDE RISK

1481/'1

13.ගරු විදුර වික්‍රමනායක මහතා
(මාණ්පුමිකු විතුර වික්කිරමනායක්ක)
(The Hon. Vidura Wickramanayaka)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 50කට අධික සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන කළුතර දිස්ත්‍රික්කයේ, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බප/මතු/නවාන ප්‍රාථමික විදුහල නාය යාමේ අවදානම සහිත ස්ථානයක් බවට හඳුනාගෙන ඇති බවත්;

(ii) නවාන ප්‍රදේශයට දින තුනක් නොකඩවා වර්ෂාව පැවතියහොත්, පාසල වසා එම දිනයන් සඳහා නිවාඩු දිනයන්හිදී පන්ති පවත්වන ලෙස මතුගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් දන්වා ඇති බවත්;

(iii) ගමනාගමන දුෂ්කරතා සහ ආර්ථික අපහසුකම් නිසා දෙමව්පියන්ට තම දරුවන් වෙනත් පාසල්වලට රැගෙන යාමට හැකියාවක් නොමැති බැවින් අනතුරුදායක තත්ත්වය යටතේ පවා එම විදුහලේම අධ්‍යාපනය ලබා දීමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) දින තුනක වර්ෂාපතනය එක් දිනකදී පතිත වුවහොත්, එම පාසලේ පන්ති පැවැත්වීම සම්බන්ධයෙන් අනතුරුදායක තත්ත්වයක් ඇති නොවන්නේද;

(ii) මෙම අනතුරුදායක තත්ත්වයෙන් පාසල් දරුවන් මුදාගැනීම සඳහා එම ප්‍රදේශයේ වෙනත් සුදුසු ස්ථානයක නවාන ප්‍රාථමික විදුහල ස්ථාපනය කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்தின் பாலிந்தநுவர பிரதேச செயலாளர் பிரிவில் 50 க்கும் மேற்பட்ட மாணவர்கள் கல்வி கற்கின்ற மேமா/மத்து/ நவான ஆரம்பப் பாடசாலை மண்சரிவு ஆபத்தை எதிர்கொண்டுள்ள இடமாக இனங்காணப்பட்டுள்ளதென்பதையும்;

[ගරු විදුර වික්‍රමනායක මහතා]

(ii) நவான பிரதேசத்துக்குத் தொடர்ச்சியாக மூன்று நாட்களுக்கு மழை நீடிக்குமானால் பாடசாலையை மூடிவிட்டு அத்தினங்களுக்குப் பதிலாக விடுமுறை நாட்களில் வகுப்புகளை நடத்துமாறு மத்துகம வலயக் கல்விப் பணிப்பாளரினால்
அறிவிக்கப்பட்டுள்ளதென்பதையும்;

(iii) போக்குவரத்து சிரமங்கள் மற்றும் பொருளாதார வசதியீனம் காரணமாக பெற்றோர்களால் தமது பிள்ளைகளை வேறு பாடசாலைகளுக்கு அழைத்துச்செல்ல முடியாதுள்ளதால் ஆபத்தான நிலையிலும் அப்பாடசாலையிலே கற்பிக்க வேண்டி நேரிட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மூன்று நாட்களுக்கான மழை ஒரேநாளில் பெய்யுமானால் அப்பாடசாலையில் வகுப்புகளை நடத்துவதில் ஆபத்தான நிலைமையொன்று தோற்றுவிக்கப்படாதா என்பதையும்;

(ii) இந்த ஆபத்தான நிலைமையிலிருந்து பிள்ளைகளை மீட்டெடுப்பதற்கு அப்பிரதேசத்தில் வேறொரு பொருத்தமான இடத்தில் நவான ஆரம்ப பாடசாலையை நிறுவுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware-

(i) that the බප/මතු/නවාන Primary School in the Palindanuwara Divisional Secretary's Division of Kalutara District where more than 50 students study, has been identified as a location prone to the risk of landslides;

(ii) that it has been informed by the Zonal Director of Education of Mathugama that the aforesaid school should be closed in the event of three consecutive days of rainfall to the Nawana area and that classes should be held on weekends to cover the missed school days?

(iii) that the parents have to resort to educating their children in the same school despite this dangerous situation since they are not in a situation to take their children to other schools owing to transport problems and economic difficulties ?

(b) Will he inform this House-

(i) whether a perilous situation does not arise pertaining to conducting classes in the school in the event that three days' rainfall is received within a single day;

(ii) whether steps will be taken to re-locate the Nawana Primary school in some other appropriate location in the said area in order to safeguard the school children from this dangerous situation?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

මෙම පාසලේ දැනට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 37දෙනෙකු අධ්‍යාපනය ලබයි. නාය යෑමේ අවදානම පවතින බැවුමට පහළින් පිහිටි බප/මතු/නවාන ප්‍රාථමික විදුහල ආසන්න තැනිතලා භූමියක ස්ථාවරව පිහිටා තිබුණද, ඉහළ බැවුමේ නාය යෑමක් සිදු වුවහොත් එහි සුන්බුන් ගලා යෑම සිදුවිය හැකි මාර්ගය ඔස්සේ පිහිටා ඇති හෙයින් නවාන ප්‍රාථමික විදුහල අවදානම් තත්ත්වයක පවතින බව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ නාය යෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය විසින් හඳුනා ගෙන ඇත.

(ii) අධික වැසි සහිත කාලගුණික තත්ත්වයන්හිදී සිසුන් ඉවත් කර ගන්නා ලෙස හා මේ සඳහා සුදුසු පරිදි වෙනත් දිනවල පාසල පවත්වන ලෙසත්, මතුගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් විදුහල්පතිට ලිඛිතව දන්වා යවා ඇත.

(iii) ඔව්.

2015 වර්ෂයේදී බටහේන බෙම්මානන්දාරාම විහාරස්ථානය වෙත මෙම පාසලේ පන්ති ගෙන ගොස් පැවැත්වුවද, එම තත්ත්වයට දෙමව්පියන්ගේ විරෝධතාව ඇති වූ නිසාත්, දෙමව්පියන්ගේ ඉල්ලීම මත එම සිසුන් නැවත පාසල් භූමියේ පිහිටි ගොඩනැඟිලිවලට ගෙන ගොස් ඉගැන්වීමේ කටයුතු දැනට සිදු කරනු ලබයි.

(ආ) (i) එම ප්‍රදේශයට අධික වර්ෂාපතනයක් ලැබුණහොත් අනතුරුදායක තත්ත්වයක් ඇති විය හැකි බැවින් අධික වැසි සහිත කාලගුණික තත්ත්වයන්හිදී සිසුන් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙසට මතුගම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විදුහල්පති දැනුවත් කර ඇත.

(ii) ඔව්.

ආපදා කළමනාකරණ වාර්තාව පදනම් කරගෙන පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් විසින් මෙම පාසල වෙනත් ස්ථානයකට ගෙනයාමට භූමියක් හඳුනාගෙන ඇති අතර, එම භූමිය පවරා ගැනීමේ මූලික කටයුතු සිදු කරමින් පවතී. එම භූමිය පවරා ගැනීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ඇ) අදාළ නොවේ.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු කථානායකතුමනි, මේ ගම්මානය, අපේ දිස්ත්‍රික්කයේ, - කළුතර දිස්ත්‍රික්කයේ- ඉතාමත්ම දුෂ්කර ප්‍රදේශයක තිබෙන ගම්මානයක්. ඒ දුෂ්කර ගම්මානයේ දුප්පත් ජනතාවගේ අභිංසක දූ

දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන ස්ථානය තමයි මේ පාසල. ගරු ඇමතිතුමා කිව්වාට පන්සලේ විතරක් නොවෙයි, දැන් ප්‍රජාශාලාවේත් පන්ති පැවැත්වෙනවා. දෙකට කඩලා තමයි පන්ති පැවැත්වෙන්නේ. ඔබතුමා කියනවා, පාසල ස්ථාපිත කරන්නට දැනට ස්ථානයක් හඳුනාගෙන තිබෙනවා කියලා. නමුත් දැනට හඳුනාගෙන ඇති ස්ථානයත් නාය යාමට මුහුණ දීලා තිබෙනවා. එම නිසා අපි ඔබතුමාට යෝජනා කරනවා කරුණාකරලා, -ඔබතුමා වගකීමකින් කටයුතු කරන අමාත්‍යාවරයෙන් වශයෙන් මම සලකනවා- වගකීමක් සහිත අමාත්‍යාවරයෙක් හැටියට මේ පාසල ඉතාමත් ඉක්මනින් වෙනත් ස්ථානයක ස්ථානගත කරන්න කියලා. මේ පිළිබඳව අවශ්‍ය තොරතුරු අරගෙන නාය යාම් සිදු නොවන ස්ථානයක මේ පාසල ස්ථානගත කරන්න කියන ඉල්ලීම මම පළමුවෙන්ම කරනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන්නේ දැනට තෝරාගෙන තිබෙන ඉඩම සුදුසු නැහැ කියලාද?

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ඔව්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ඒක අපට දීලා තිබෙන්නේ ආපදා කළමනාකරණ වාර්තාව අනුවයි. ඒ ඉඩම සුදුසු නැත්නම් අපි අවශ්‍ය කටයුතු කරන්නම්.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ළඟදී නාය යාම් ගණනාවක් සිදු වුණානේ? ඒ අවස්ථාවේදීත් මේ ස්ථානය නාය යාමේ තර්ජනයට ලක් වෙලා තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එහෙම නම් අපට නැවත වාර්තාවක් කැඳවන්නට පුළුවන්.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අමාත්‍යතුමනි, මේ පාසල නැවත ස්ථානගත කරන්නට ඔබතුමා හිතන විධියට කොපමණ කාලයක් යයිද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, ඒක පහසුවෙන් උත්තරයක් දෙන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. මම ඒ ප්‍රදේශයට ගිහිල්ලාත් නැහැ; ඒ භූමිය දන්නේත් නැහැ. ඒ වාගේම මේ සම්බන්ධයෙන් ඉංජිනේරු වාර්තාව ගන්නත් ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, 2015 පළමුවෙනි මාසයේ තමයි මේ පාසල නාය යාමේ අවදානමක් තිබෙන බව කියලා තිබෙන්නේ. එතකොට අපේ ආණ්ඩුව බලයට ඇවිල්ලාත් නැහැ. ගරු කථානායකතුමනි, සමහර ප්‍රදේශ අවුරුදු 20ක් තිස්සේ නාය ගිහින් තිබෙනවා. ඒ වාගේම කාලයක් තිස්සේ කුණු කන්ද කඩා වැටී තිබෙනවා. ඒවාටත් අපි උත්තර දෙන්න ඕනෑ. මම මේ ඔබතුමාට කියනවා නොවෙයි ගරු මන්ත්‍රීතුමා. මේ නාය යාමත් කාලයක් තිස්සේ ආපු එකක්.

කොහොම හරි මම අදාළ ලිපි ලේඛන පරීක්ෂා කරලා බැලුවාම, 2014 වසරට පෙර ඉඳලාම මේ තත්ත්වය තිබෙන බව පෙනීගියා. මේ ඔක්කොම පසු ගිය කාලයේ -ඔබතුමන්ලාගේ ආණ්ඩුව පැවැති කාලයේ- කළ යුතුව තිබූ දේවල්. නමුත්, ඔබතුමාගේ ඉල්ලීම අනුව අපි නැවත මේ ගැන බලන්නම්. හැබැයි, මේ ඔක්කොම අපේ ඇහටයි කඩා වැටෙන්නේ. යුද්ධය අවසන් වෙලා ඉතිරි බෝම්බ ටික හරියට ඇසුරුම් කරන්නේ නැතිව, ඒක පිපිරුවාම අපි ඒකටත් උත්තර දෙන්න ඕනෑ. කුණු කන්දත් එහෙමයි; SAITM එකත් එහෙමයි. මේ හැම එකක්ම පසු ගිය කාලයේ විධිමත් ක්‍රමවේද අනුගමනය නොකිරීම නිසා සිදුවූ දේවල් බවයි අපට පෙනෙන්නේ. එය එසේ වුවත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැනුවත් කිරීම මත නැවත මේ ඉඩම පරීක්ෂා කරන්න කියලා මම වහාම අදාළ නිලධාරීන්ට දන්වා යවන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ දෙවන අදියර ආරම්භ නොකිරීම : හේතු
கிளிநொச்சி ஆஸ்பத்திரியின் இரண்டாம்கட்டம் ஆரம்பிக்கப்படாமை : காரணம்
NON-COMMENCEMENT OF SECOND PHASE OF KILINOCHCHI DISTRICT HOSPITAL: REASONS

1576/'17

14.ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව්, මාන්කුලම, මල්ලාවි, මුලංකාවිල්, පූනහාරි සහ පලෙයි යනාදි ප්‍රදේශවල සිට දිනපතා ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝගීන් කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල වෙත පැමිණෙන බවත්;

(ii) 2009 වර්ෂයෙන් පසු මෙම රෝහලෙහි කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු කර නොමැති බවත්;

(iii) වකුගඩු රෝගීන් සඳහා රුධිර කාන්දුපෙරණ යන්ත්‍රයක් සවිකර තිබුණද, එය ක්‍රියාත්මක නොවන බවත්;

(iv) හදිසි අනතුරු ඒකකයක්ද නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, රුධිර කාන්දුපෙරණ මධ්‍යස්ථානය සහ හදිසි අනතුරු ඒකකය ක්‍රියාත්මක තත්ත්වයට පත්කරන දිනය කවරේද;

(ii) ඒ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මෙම රෝහලේ පළමු අදියර සඳහා ආසියානු සංවර්ධන බැංකුව ආධාර ලබා දුන් බව දන්නේද;

(ii) දෙවන අදියර මේ දක්වා ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iii) එය අත්හැර දමා තිබේද;

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

(iv) නොඑසේ නම්, එය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(v) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

සුකාදාර, පෝසණෙ මර්රුම් සුදේස මරුත්තුව අමෛච්සරෛක් කේට්ට විනා:

(අ) (i) මුල්ලෛත්තීවු, මාංකුලම්, මල්ලාවි, මුළංකාවිල්, පූනකරි, පළෛ ආකිය පිරදේසංකළිලිරුන්දු දිනන්දෝරුම් සිකිච්සෛ පෙරුවදර්කාක නෝයාළිකළ් කිළිනොච්චි මාවට්ට පෙරියාස්පත්තිරික්කු වරුකින්රනරෙන් පදෛයුම්;

(ii) 2009ආම් ආණ්ඩුක්කුප් පින්නර් ඉන්ද වෛත්තියසාලෛයිල් එව්විදමාන නිර්මාණප් පණිකළුම් මේර්කොළ්ළප්පඩවිල්ලෛ එන්පදෛයුම්;

(iii) සිරුනීරක නෝයාළිකළුක්කාන කුරුදි ඌටුපිරිත්දල් කරුවි පොරුත්තප්පට්ටිරුප්පිනුම් අවෛ ඉයංකුවදිල්ලෛ එන්පදෛයුම්;

(iv) දිඪීර් විපත්තුක් කූරු ඔන්රුම් ඉල්ලෛයෙන් පදෛයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) ආමෙනිල්, කුරුදි ඌටුපිරිත්දල් නිලෛයම් මර්රුම් දිඪීර් විපත්තුක් කූරිනෛ ඉයංකුම් නිලෛක්කු කොණ්ටුවරුම් දිකදි යාදු;

(ii) අදර්කාක නිදියේර්පාටු සෙය්යප්පට්ටුළ්ළදා;

එන්පදෛ අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ඉ) (i) ඉන්ද වෛත්තියසාලෛයින් මුදර්කට්ටත්දිර්කාක ආසිය අපිවිරුත්දි වංකි උදවි වළංකියදෙන්පදෛ අවර් අරිවාරා;

(ii) ඉරණ්ටාම් කට්ටම් ඉදුවරෛ ආරම්පික්කප් පටාමෛක්කාන කාරණංකළ් යාවෛ;

(iii) අදු කෛවිටප්පට්ටුළ්ළදා;

(iv) ඉන්රේල් අදු ආරම්පික්කප්පටුම් දිකදි යාදු;

(v) අදර්කාක මේර්කොළ්ළප්පට්ටුළ්ළ නටවටික් කෛකළ් යාවෛ;

එන්පදෛයුම් අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ඈ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Is he aware that -

(i) patients from areas like Mullaitivu, Mankulam,Mallavi, Mulankavil, Punahari and Palai come to Kilinochchi District Hospital to obtain daily treatment;

(ii) no construction has been done in this hospital subsequent to the year 2009;

(iii) a blood dialysis machine which has been fixed in this hospital for kidney patients is not functioning; and

(iv) an accident unit too is not available here?

(b) Will he inform this House-

(i) if so, the date on which the Blood Dialysis Centre and the Accident Unit will be made to function; and

(ii) whether financial allocations have been made for that purpose?

(c) Will he also inform this House-

(i) whether he is aware that financial aid was provided by the Asian Development Bank for the first phase of this hospital;

(ii) the reasons for not yet commencing the second phase;

(iii) whether it has been abandoned;

(iv) if not, the date on which it will be commenced; and

(v) the steps that have been taken for that purpose?

(d) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)

(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) කිළිනොච්චි රෝහලේ ඉදි කිරීම් කටයුතු කර ඇත.

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) (i) රුධිර කාන්දුපෙරණ ඒකකය සඳහා මෙම වර්ෂයේදී වෛද්‍යවරුන් හා හෙද නිලධාරීන් අනුයුක්ත කළ වහාම ක්‍රියාත්මක තත්ත්වයට පත් කිරීමට බලාපොරොත්තු වේ. හදිසි අනතුරු ඒකකය සඳහා නෙදර්ලන්ත රජයෙන් ආධාර ලැබී ඇත.

(ii) ඔව්.

(ඇ) (i) ඔව්.

(ii) මේ සඳහා රුපියල් මිලියන 2,500ක් වැය වන අතර, ඒ සඳහා අරමුදල් ඉදිරියේදී ලැබෙනු ඇත. විශේෂයෙන්ම NPB approval එක තිබෙනවා.

(iii) නැත.

(iv) ප්‍රතිපාදන සපයා ගත් විගස එය ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

(v) නෙදර්ලන්ත ආධාර ඇතිව උතුරු පළාතේ පිහිටි රෝහල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (DRIVE Project) යටතේ ඉහත ව්‍යාපෘතියද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

(ඈ) පැන නොනඟී.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிகக் கேள்வி:

வைத்தியசாலையின் முன்புறமாக ஒரு சிறிய காணித்துண்டு இருக்கின்றது. ஏற்கெனவே அது வைத்தியசாலைக்கு ஒதுக்கப்பட்ட காணி. அந்தக் காணிக்கு வைத்தியசாலை நிர்வாகத்தினர் மதில் கட்டியிருக்கிறார்கள். அதிலுள்ள கட்டிடத்தையும் திருத்தியிருக்கின்றார்கள். ஆனால், இப்பொழுது அதனைத் தனியாருக்கு வழங்குவதற்கு RDHS அனுமதியளித்திருக்கின்றது. அதனை உடனடியாக நிறுத்துவதற்கு உத்தரவிடுமாறு தங்களை இந்த மன்றினூடாகக் கேட்கின்றேன்.

இரண்டாவதாக, குருதி ஊடுபிரித்தல் தொகுதியை உடனடியாக ஆரம்பிப்பதற்கான முயற்சியை மேற்கொண்டால், வன்னிப் பகுதியிலிருந்து வேறு வைத்தியசாலைகளுக்குச் செல்கின்ற, குறிப்பாக யாழ்ப்பாணம் அல்லது வவுனியாவிற்குச் செல்கின்ற நோயாளிகளுக்கு அது ஒரு பெரிய வரப்பிரசாதமாக அமையும். அந்த வகையில் அதனை அங்கு ஏற்படுத்தித் தருமாறு வேண்டுகின்றேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

අපි අගෝස්තු මාසයේ හෙදියන්ගේ ලැයිස්තුවත් එක්ක පත්වීම් ලබා දෙනවා. එතකොට රුධිර කාන්දුපෙරණ ඒකකය ආරම්භ කරන්න පුළුවන්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමාට මම කියන්න කැමැතියි, 2010 ඉඳන් දිගටම මේ රෝහල සඳහා මුදල් වියදම් කර තිබෙන බව. මේ රෝහල සඳහා 2010 වසරට රුපියල් මිලියන 74කට වැඩි ප්‍රමාණයක් වියදම් කරලා තිබෙනවා. 2011 වර්ෂය සඳහා රුපියල් මිලියන 57ක් වියදම් කරලා තිබෙනවා. 2012 වර්ෂය වෙනුවෙන් මිලියන 75ක් වියදම් කරලා තිබෙනවා. 2013 වර්ෂය වෙනුවෙන් මිලියන 42ක් වියදම් කරලා තිබෙනවා. 2014 වර්ෂයේ මිලියන 81ක් වියදම් කරලා තිබෙනවා. 2015 වර්ෂයේ මිලියන 7ක් වියදම් කරලා තිබෙනවා. 2016 වර්ෂයේ මිලියන 112ක් වියදම් කරලා තිබෙනවා. මේ රෝහලට 2010 වර්ෂයේ ඉඳලා රුපියල් මිලියන 450කට වැඩි මුදලක් වියදම් කරලා තිබෙනවා. එහි විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා. මන්ත්‍රීතුමාට දැන ගැනීම සඳහා මම මේ කාරණයත් කියන්නම්. මම DRIVE Project එක උතුරට ලබා දුන්නා. නෙදර්ලන්ත රජයත් එක්ක කථා කරලා තමුන්නාන්සේලාගේ උතුරු පළාත් සභාවේ සෞඛ්‍ය ඇමති වෛද්‍ය සත්‍යලිංගම් මැතිතුමාට ඒක භාර දීලා තිබෙනවා. කිලිනොච්චිය රෝහලට විතරක් රුපියල් මිලියන 4,400ක් - රුපියල් බිලියන 4.4ක්- වියදම් කරනවා. මේ DRIVE Project එකෙන් වවුනියාව, මුලතිව්, කිලිනොච්චි, යාපනය, මන්නාරම කියන දිස්ත්‍රික්ක පහට රුපියල් මිලියන 14,065ක් වියදම් කරනවා. ඒකත් එක්ක උතුරේ තිබෙන මූලික අවශ්‍යතා සියල්ලම -විශේෂඥ සේවා සියල්ලම- අංග සම්පූර්ණ වෙනවා.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ அமைச்சர் அவர்களே, நன்றி. நான் குறிப்பிட்ட விடயம், அந்த வைத்தியசாலைக்கு முன்புறமிருக்கின்ற காணி தொடர்பானதாகும். எனவே, அந்த விடயத்தைத் தாங்கள் கவனத்திலெடுக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒක සම්පූර්ණයෙන් ලැබෙනවා.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු පොලිය: චක්‍රලේඛය ක්‍රියාත්මක නොකිරීම

சிரேஷ்ட பிரசைகளின் நிலையான வைப்பு வட்டி: சுற்றறிக்கையை அமுல்படுத்தாமை

SENIOR CITIZENS' FIXED DEPOSIT INTEREST: NON-IMPLEMENTATION OF CIRCULAR

1608/'17

15.ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රුපියල් මිලියන 1.5 දක්වා වන ස්ථාවර තැන්පතු සඳහා 15% ක පොලියක් ලබා දෙන ලෙස දැනුම් දෙමින්, සියලුම බැංකු වෙත චක්‍රලේඛයක් යවා ඇති බවට 2016.11.21 හෝ එයට ආසන්න දිනයකදී පැවති රූපවාහිනී සම්මුඛ සාකච්ඡාවකදී එවකට සිටි මුදල් අමාත්‍යතුමා සඳහන් කළ බවත්;

(ii) එයට වෙනස් ප්‍රකාශයක් කරමින්, අවශ්‍ය උපදෙස් ද සමඟ එතුමා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එම චක්‍රලේඛ යැවූ බව සහ එකී නියෝගය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපොහොසත් වී ඇතැයි එතුමා සඳහන් කළ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය බැංකු ඇතුළුව සියලුම බැංකු 2017.01.31 දිනය වනවිට ද එම චක්‍රලේඛය ක්‍රියාත්මක කර නොමැති බවත්;

(ii) ඒ හේතුවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සිදුවී ඇති පාඩුව රුපියල් ලක්ෂ ගණනක් බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) අමාත්‍යවරයා විසින් යවන ලද චක්‍රලේඛ බැංකු විසින් නොසලකා හැරීමට පාදක වූ පදනම සහ හේතු කවරේද;

(ii) අමාත්‍යතුමා විසින් 2015 නොවැම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලද අය වැය යෝජනාවට අනුව, මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක විය යුතුව තිබූ දිනය කවරේද;

(iii) අමාත්‍යතුමා විසින් එකී නියෝගය නිකුත් කරන ලද දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වන්දිපූරණය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

නිති மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிரேஷ்ட பிரசைகளின் 1.5 மில்லியன் ரூபாய் வரையிலான நிலையான வைப்புகளுக்கு 15% வட்டியை வழங்கக் கோரும் சுற்றறிக் கையொன்று அனைத்து வங்கிகளுக்கும் அனுப்பப்பட்டுள்ளதென்று 2016.11.21ஆந் திகதி அல்லது அதை அண்மித்த திகதியொன்றில்

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

தொலைக்காட்சி நேர்காணலொன்றின்போது அப்போதைக்கு இருந்த நிதி அமைச்சர் குறிப்பிட்டார் என்பதையும்;

(ii) அதற்கு மாறாக, தேவையான அறிவுறுத்தல்களுடன் சுற்றறிக்கைகளை இலங்கை மத்திய வங்கிக்கு அனுப்பியதாகவும் இலங்கை மத்திய வங்கி குறிப்பிடப்பட்ட அந்தப் பணிப்புரையை நிறைவேற்றத் தவறியுள்ளது என்று குறிப்பிட்டதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) 2017.01.31ஆந் திகதி வரைக்கும் அரச வங்கிகள் உள்ளடங்கலாக அனைத்து வங்கிகளும் அந்தச் சுற்றறிக்கையை அமுல்படுத்தியிருக்கவில்லை என்பதையும்;

(ii) அதனால் சிரேஷ்ட பிரசைகளுக்கு ஏற்பட்ட நட்டம் இலட்சக்கணக்கான ரூபாயாகும் என்பதையும்;

அவர் அறிவாரா?

(இ) (i) வங்கிகளால் அமைச்சரின் சுற்றறிக்கைகள் புறக்கணிக்கப்பட்டதற்கான காரணத்தை அல்லது அடிப்படையையும்;

(ii) அமைச்சர் 2015 நவம்பர் மாதத்தில் சமர்ப்பித்த வரவு செலவுத் திட்ட முன்மொழிவுகளுக்கிணங்க எந்தத் திகதியிலிருந்து இந்த நிகழ்ச்சித்திட்டம் நடைமுறைப்படுத்தப்பட்டிருக்க வேண்டும் என்பதையும்;

(iii) அமைச்சரின் குறிப்பிடப்பட்ட அந்தப் பணிப்புரை விடுக்கப்பட்ட திகதியிலிருந்து சிரேஷ்ட பிரசைகளுக்கு இழப்பீடுகளை கௌரவ அமைச்சர் செலுத்துவாரா என்பதையும்;

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media :

(a) Will he admit that -

(i) on or around 21.11.2016 at a TV interview, the then Minister of Finance said that a circular has been sent to all banks to give 15 per cent interest to senior citizens for their fixed deposits up to Rs.1.5 million; and

(ii) in the alternative, he said that he sent the circulars to the Central Bank of Sri Lanka with the necessary instructions and that the Central Bank of Sri Lanka has failed to carry out the said directive?

(b) Is he aware that-

(i) all banks including State banks have not effected such circular up to 31.01.2017; and

(ii) the loss caused thereby to senior citizens is in hundreds of thousands of rupees?

(c) Will he inform this House-

(i) the reason and on what basis the Minister's circulars are disregarded by the banks;

(ii) from what date should this arrangement has been given effect according to the Hon. Minister's Budget Proposal made in November, 2015; and

(iii) will the Hon. Minister indemnify the senior citizens from the date the said directive of the Hon. Minister was issued?

(d) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2016 අය වැය යෝජනාවට අනුව එතෙක් අවුරුදු 60කට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රුපියල් මිලියන එකක් දක්වා ලබාදුන් සියයට 15ක විශේෂ පොලී අනුපාතය වයස අවුරුදු 55ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් ලියා පදිංචි මූල්‍ය ආයතනවල තැන්පත් කරනු ලබන රුපියල් මිලියන 1.5ක් දක්වා වන ස්ථාවර තැන්පතු සඳහා ද ලබා දීමට යෝජනා කරන ලදී.

ඒ අනුව, මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස මුදල් අමාත්‍යාංශය විසින් 2016.02.29 දිනැති ලිපිය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016.04.07 දිනැති ලිපිය මඟින්, යෝජිත ක්‍රමවේදයේ සහ තැන්පත්කරුවන්ගේ තැන්පතුවල ආරක්ෂාව පිළිබඳ ඇති විය හැකි ගැටලු සහගත තත්ත්වය නිසා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට නොහැකි බවත්, එම ගැටලු නිරාකරණය කරන තෙක් පවතින ජ්‍යෙෂ්ඨ පුරවැසි ස්ථාවර තැන්පතු ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරන බවත් දැනුම් දෙන ලදී. එම ලිපිය ඇමුණුම ලෙස ඉදිරිපත් කර ඇත. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සඳහා එතෙක් පැවති සහනය 2016 වසර පුරා අඛණ්ඩව ලබාදෙන ලදී.

2015 සහ 2016 වසරවලදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබාදුන් සහන තවදුරටත් පුළුල් කරමින් 2017 අය වැය මඟින් සියලුම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු හරහා වයස අවුරුදු 60ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රුපියල් මිලියන 1.5ක් දක්වා වූ ස්ථාවර තැන්පතු සඳහා සියයට 15ක විශේෂිත පොලී අනුපාතයක් ලබාදීමට යෝජනා කරන ලදී. ඒ අනුව, 2017.03.01වන දින සිට එම යෝජනාව ක්‍රියාත්මක වන පරිදි අදාළ වක්‍රලේඛය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කර ඇත.

(ii) ඉහත (අ) (i) පිළිතුර අදාළ වේ.

(ආ) (i) ඉහත (අ) (i) පිළිතුරෙහි අවසාන ඡේදය අනුව අදාළ නොවේ.

(ii) අදාළ නොවේ.

(ඇ) (i) අදාළ නොවේ.

(ii) 2016 වසර තුළ ක්‍රියාත්මක කළ යුතුය.

(iii) වන්දි පූරණය කිරීමේ අවශ්‍යතාවක් පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම **සභාගත*** කරමි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, රුපියල් මිලියන 1.5ක් දක්වා වූ ස්ථාවර තැන්පතු සඳහා සියයට පහළොවේ පොලිය වැඩි වයස්ගත අයට දීමට යෝජනා කළ දිනයත්, ඒ යෝජනාව අවසානයේ ක්‍රියාවට නැඟුණු දිනයත් අතර කාලය අවුරුද්දකට වැඩියි කියා ඔබතුමා පිළිගන්නවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අය වැයේ යෝජනා තිබෙනවා. ඒ යෝජනා සියල්ලම එක වතාවේ ක්‍රියාත්මක කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම අහන ප්‍රශ්නය ඒක නොවෙයි නේ. ඔබතුමා මේ වෙන කාරණයක් කියන්නේ. අවුරුද්දක් ඇතුළත ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න බැරි වුණාද කියායි මම අහන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අය වැය හරහා එන යෝජනාවක් එක දවසින් ක්‍රියාත්මක කරන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම අහන්නේ අවුරුද්දක් ඇතුළත, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

සමහර වෙලාවට දවස් දෙකෙනුත් ක්‍රියාත්මක කරන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

තමුන්නාන්සේලා අවුරුද්දක් පුරා ඒ යෝජනාව ක්‍රියාත්මක නොකිරීම නිසා ඒ අයට සිදු වුණු අලාභය ගෙවනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

සමහර වෙලාවට දවස් තුනෙනුත් ක්‍රියාත්මක කරන්න බැහැ. [බාධා කිරීමක්]

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, අපි සාමකාමීව මේ කටයුතු කරගෙන යමු.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය අමාත්‍යතුමා, අවුරුද්දක් පුරා හෝ ඊට වැඩි කාලයක් හෝ මේ යෝජනාව ක්‍රියාත්මක නොවීමෙන් වූ අලාභය මා වැනි වූ ඒ වැඩිහිටි වයස්ගත මිනිසුන්ට -ඒ අය මැරිලා නැත්නම්- ගෙවනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අලාභයක් නැහැ. එය ඇත්තටම සහනයක්. අය වැය හරහා එන යෝජනාව සහනයක් හැටියට තමයි ක්‍රියාත්මක කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දැන් දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මේ රටේ සහන කියන ඒවා ඔක්කෝම නීතියි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඒක දන්නවා. නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුව මැදිහත් වීමේ ප්‍රමාදය නිසා, ලැබෙන්න ඕනෑ අයිතිය ලැබී නැති බවයි අප කියන්නේ. ඔබතුමා එය පිළිගෙන එයට වන්දි ගෙවීමක් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද point of Order එක?

ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු කථානායකතුමනි, මම පසු ගිය මැයි මාසයේ 26වන දා ප්‍රශ්නයක් ඇහුවා, අපේ අලුත් ඉඩම් ඇමතිතුමාගෙන්. එයට පිළිතුර දීම සඳහා එතුමා සති දෙකක් කල් ඉල්ලුවා. දැන් මාස දෙකක් විතර ගත වුණා. මට උත්තරය ලැබුණේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමා, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ ගැන සොයා බලන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඒ ගැන සොයා බලනවා ලු.

ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සති දෙකයි කල් ඉල්ලුවේ. සති දෙකක් කල් දුන්නා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා දැන් සභාවට පැමිණ සිටිනවා. මගේ දෙවන ප්‍රශ්නයට අදාළ අතුරු ප්‍රශ්නවලට එතුමාගෙන් උත්තර ලබා ගන්න පුළුවන් නම් හොඳයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. මා එතුමාගෙන් අහලා බලන්නම්.

ගරු රවි කරුණානායක මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரவி கருணாநாயக்க - வெளிநாட்டலுவல்கள் அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Foreign Affairs)
ගරු කථානායකතුමනි, ප්‍රමාද වීම සම්බන්ධයෙන් මා කනගාටු වනවා. මා ජනාධිපතිතුමාත්, තානාපතිතුමන්ලා දෙදෙනෙකුත් සමඟ සාකච්ඡාවක සිටියේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඇහුවොත්, මා එයට උත්තර ලබා දෙන්නම්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, දෙවැනි ප්‍රශ්නයේ (අ) (ii) යටතේ මා අහලා තිබෙනවා, අවුරුද්දක කාලය ඇතුළතදී විදේශ දූත මණ්ඩල සඳහා පත් කළ නිලධාරීන් අතරින් ද්විත්ව පුරවැසි තත්ත්වයක් තිබෙන අය කවුද කියලා. විදේශ පුරවැසිභාවයක් තිබෙන අය යොදා ගන්න ඕනෑ සමහර අංශ තිබෙන්න පුළුවන්.

මගේ ප්‍රශ්නය වුණේ, මේ රටේ ජනාධිපතිවරයා, මේ රාජ්‍ය නියෝජනය කරන තානාපති ධුරය වැනි තනතුරකට තවත් රටක පුරවැසිභාවය දරන පුද්ගලයන් පත් කළාම, ඔවුන් ශ්‍රී ලාංකා රාජ්‍යයේ අවශ්‍යතා වෙනුවෙන් පමණක් කටයුතු කරන්නේ කොහොමද, ඒ සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථාවරය කුමක්ද කියන එකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නයට උත්තරය දෙන්නම්. එවැනි තනතුරු දරන දෙදෙනෙකු සිටිනවා. එක්කෙනකු ස්වර්ණා ගුණරත්න මෙනෙවිය, කොන්සල් - ජනරාල්, තානාපති කාර්යාලය, ලොස් ඇන්ජලීස්. ඊළඟට, මනෝජ් වර්ණපාල මහතා, උපදේශක, තානාපති කාර්යාලය, ලන්ඩන්. මේ සම්බන්ධයෙන් අපි පුළුල් ලෙස සාකච්ඡා කළා. මේ අය මන්ත්‍රීවරුන්ගෙන් පත් නොවන නිසා, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථාවරය වන්නේ එවැනි dual citizenship තිබෙන අය බඳවා ගැනීම ප්‍රශ්නයක් නොවන බවයි. සමහර වෙලාවට අපේ රටේ ඉතා දක්ෂ අය පිට රටවලට ගිහිල්ලා ඉන්නවා. ඒ අයගේ සේවය මේ රටට ලබා ගන්න පුළුවන් මාර්ගයක් මෙය. අප මේ අවස්ථාවේදී එය උපයෝගි කර ගන්නවා. ඒ අයගේ දැනුමින් පුළුවන් තරම් රටට ප්‍රයෝජන ගන්න කටයුතු කරනවා. මේකට බාධා ඇති වුණොත් මේ වාගේ අය නැවත රටට එන එක ඇණ හිටිනවාය කියන මතයේ තමයි අපි සිටින්නේ. මහජනයා විසින් මේ තනතුරුවලට නියෝජිතයන් පත් කරන්නේ නැති නිසා මෙය රටට අහිතකර නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

මොහිදීන්වත්ත නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්: සින්නක්කර ඔප්පු

மொஹிதீன்வத்த வீடமைப்புத் திட்டக் குடியிருப்பாளர்கள்:அறுதியுறுதி

RESIDENTS OF MOHIDEENWATTA HOUSING SCHEME: FREEHOLD DEEDS

1149/'16

7. ගරු ඉෂාක් රහුමාන් මහතා (ගරු එම්.එච්.එම්. සල්මාන් මහතා වෙනුවට)
(மாண்புமிகு இஷாக் ரஹுமான் - மாண்புமிகு எம்.எச்.எம். சல்மான் சார்பாக)
(The Hon. Ishak Rahuman on behlaf of the Hon. M.H.M. Salman)
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ගාල්ල, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, මොහිදීන්වත්ත නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන් සඳහා සින්නක්කර ඔප්පු ප්‍රදානය කිරීම මේ දක්වා ප්‍රමාදවීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) එහි පදිංචිකරුවන් සඳහා ඔප්පු ප්‍රදානය කිරීමට අපේක්ෂා කරන නිශ්චිත දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

වීඩමෙප්පු, නිර්මාණත්තුරෙ අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) காலி, கடவத்சத்தற பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள மொஹிதீன்வத்த வீடமைப்புத் திட்டத்தின் குடியிருப்பாளர்களுக்கு அறுதியுறுதி வழங்கல் இதுவரை தாமதமாவதற்கான காரணங்கள் யாவை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) அங்குள்ள குடியிருப்பாளர்களுக்கு உறுதிகளை வழங்க எதிர்பார்க்கும் திட்டவட்டமான திகதி யாதென்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Housing and Construction:

(a) Will he state the reasons for delaying the granting of freehold deeds to the residents of the Mohideenwatta Housing Scheme in the Kadawath Sathara Divisional Secretary's Division in Galle?

(b) Will he inform this House of the exact date on which deeds are expected to be granted to those residents?

(c) If not, why?

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Housing and Construction)

ගරු කථානායකතුමනි, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්.

ගාල්ල මොහිදීන්වත්ත ඉඩම 44 වගන්තිය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති ඉඩමක් වන අතර, එම ඉඩම් කෙටිස සඳහා මෙතෙක් නිදහස් දීමනා පත්‍රයක් නිකුත් කර නොමැත. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කඩවත්සතර, ගාල්ල හා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ඉල්ලීම් කර ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ අත්සනින් රජයේ ඉඩම් ආඥා පනතෙහි විධානයන්ට අනුකූලව නිදහස් දීමනා පත්‍රයක් ලද පසුව එම ඉඩම්ලාභීන්ට ඉඩම් අයිතිය ලබා දීම සඳහා ඔප්පු ලබා දීමට හැකි වේ.

(ආ) දැනට නිශ්චිත දිනයක් ප්‍රකාශ කළ නොහැක.

(ඇ) ඔප්පු ලබා දීම සඳහා පහත සඳහන් පියවර සම්පූර්ණ කළ යුතු වේ.

i. දැනට රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති කටවැටි සැලැස්මෙහි සංශෝධන කිරීම.

ii. එසේ සැලසුම් සකස් කළ පසු බිම් කොටස් තක්සේරු කර, නිවාසලාභීන් වෙත දන්වා, නිවාසලාභීන්ගෙන් අදාළ ඉඩම් කොටස්වල තක්සේරු වටිනාකම අය කර ගත යුතු වීම.

iii. (අ) හි සඳහන් පරිදි නිදහස් දීමනා පත්‍රයක් ලද පසුව ඔප්පු ලබා දීමට කටයුතු කළ හැකිය.

රාජ්‍ය සේවකයන්ට යතුරුපැදි ලබා දීම: මාතර දිස්ත්‍රික්කය

அரச உத்தியோகத்தர்களுக்கு மோட்டார் சைக்கிள் வழங்கல்:மாத்தறை மாவட்டம்

PROVISION OF MOTOR CYCLES TO PUBLIC OFFICERS: MATARA DISTRICT

1300/'16

11.ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඉකුත් රජය විසින් රජයේ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සහනදායී පදනම මත යතුරුපැදි ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) ඒ යටතේ මාතර දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන ලද යතුරුපැදි සංඛ්‍යාව, ඔවුන්ගේ වෘත්තිය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් යතුරුපැදියක් සඳහා අදාළ නිලධාරියාගේ මූල්‍ය දායකත්වය හා රජයේ දායකත්වය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) දායකත්ව මුදල නැවත ගෙවනු ලබන බවත්, සියලු රාජ්‍ය සේවකයන්ට නොමිලේ යතුරුපැදි ලබා දෙන බවටත් වත්මන් රජය පොරොන්දු වූ බව දන්නේද;

(ii) නැවත ගෙවනු ලැබූ මුදල් හිමිකර ගත් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) 2015 සහ 2016 වර්ෂවල රජයේ පූර්ණ අනුග්‍රහය මත යතුරුපැදි හිමිකර ගත් රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) දිස්ත්‍රික්කයේ යතුරුපැදි ලබා ගැනීමට හිමිකම් ඇති ඉතිරි රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට නොමිලේ යතුරුපැදි ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිති මත්‍රුම් වෙකුසන ඌටක අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) கடந்த அரசாங்கத்தினால் அரச வெளிக்கள உத்தியோகத்தர்களுக்கு சலுகை அடிப்படையில் மோட்டார் சைக்கிள்கள் வழங்கும் வேலைத்திட்டமொன்று நடைமுறைப்படுத்தப்பட்டதென்பதை அறிவாரா;

(ii) இதன் கீழ் மாத்தறை மாவட்டத்தில் அரசாங்க உத்தியோகத்தர்களுக்கு வழங்கப்பட்ட மோட்டார் சைக்கிள்களின் எண்ணிக்கை இவர்களின் தொழில் மற்றும் பிரதேச செயலாளர் பிரிவுக்கமைய வெவ்வேறாக யாதென்பதையும்;

(iii) ஒரு மோட்டார் சைக்கிளுக்கான ஏற்புடைய உத்தியோகத்தரின் நிதிப் பங்களிப்பும் அரச பங்களிப்பும் வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) பங்களிப்புத் தொகை மீளச் செலுத்தப்படு மெனவும் சகல அரச ஊழியர்களுக்கும் இலவசமாக மோட்டார் சைக்கிள் வழங்கப்படு மெனவும் தற்போதைய அரசாங்கம் வாக்குறுதி அளித்ததென்பதை அறிவாரா என்பதையும்;

(ii) மீளச் செலுத்தப்பட்ட பணத்தைப் பெற்றுக் கொண்ட அரச ஊழியர்களின் எண்ணிக்கை பிரதேச செயலாளர் பிரிவுக்கமைய வெவ்வேறாக யாதென்பதையும்;

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

(iii) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் அரசாங்கத்தின் பூரண அனுசரணையுடன் மோட்டார் சைக்கிள்களைப் பெற்றுக்கொண்ட அரச ஊழியர்களின் எண்ணிக்கை பிரதேச செயலாளர் பிரிவுகளுக்கமைய வெவ்வேறாக யாதென்பதையும்;

(iv) மாவட்டத்தில் மோட்டார் சைக்கிள் பெறுவதற்கு உரித்துடைய எஞ்சிய அரச ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) இவர்களுக்கு இலவசமாக மோட்டார் சைக்கிள் வழங்கப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House-

(i) whether he is aware that the previous Government implemented a programme to provide motor cycles on concessionary basis to the field officers;

(ii) the number of motor cycles given to the public officers in Matara District under the said programme in respect of their profession and each Divisional Secretary's Division separately; and

(iii) the contribution of the Government and the public officer for one motor cycle separately?

(b) Will he also inform this House-

(i) whether he is aware that the present Government promised to refund the subscription and all the Government employees will be given motor cycles free of charge;

(ii) the number of public officers who were refunded in respect of each Divisional Secretary's Division level;

(iii) the number of public officers who owned motor cycles under the full sponsorship of the Government in 2015 and 2016 in respect of each Divisional Secretary's Division;

(iv) the number of remaining public officers who are entitled to motor cycles; and

(vi) the date on which they will be given motor cycles free of charge?

(c) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) අදාළ තොරතුරු ඇමුණුම 1* මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) මූල්‍ය දායකත්වය පහත පරිදි වේ.

යතුරු පැදි වර්ගය	නිලධාරියා විසින් දරන ලද මූල්‍ය දායකත්වය (රු)	රජයේ දායකත්වය (බදු ප්‍රතිශතයේ සිදු වූ වෙනස්වීම් අනුව) රු.
කාන්තා යතුරුපැදි		
a. Hero Pleasure 100 cc	45,000/-	83,963/-
b. Hero Pleasure 100 cc	45,000/-	93,945/-
c. Hero Pleasure 100 cc	45,000/-	119,662/-
a. Bajaj Discover 125M	50,000/-	128,545/-
b. Bajaj Discover 125M	50,000/-	95,264/-

(ආ) (i) සියලු රජයේ සේවකයින්ට නොමිලේ යතුරුපැදි ලබා දීවමට රජය විසින් මෙතෙක් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැත.

(ii) නැවත ගෙවා නොමැත. (මෙම රාජ්‍ය සේවකයින්ට නැවත මුදල් ගෙවීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොමැති බැවින් ගෙවන ලද මදල් නැවත ගෙවීමක් අදාළ නොවේ.)

(iii) ඉහත (අ) (iii) හි සඳහන් පරිදි රජයේ පූර්ණ අනුග්‍රහය මත යතුරුපැදි ලබා දී නොමැත. කෙසේ වුවද, ඉහත සඳහන් සහනදායී පදනම මත 2015 හා 2016 වර්ෂයන්හි ලබා දුන් යතුරුපැදි සම්බන්ධ විස්තර ඇමුණුම 02හි* ඇතුළත් වේ. මේවා ලබා දෙන ලද්දේ 2015.11.20 දිනට අදාළ නිලධාරීන් විසින් මුදල් ගෙවා අවසන් කර නිබීමේ පදනම මතය.

(iv) 2016 අය වැය යෝජනාවල සඳහන් කළ පරිදි 2015.11.20 දින සිට මෙම වැඩසටහන අවසන් කර ඇත.

(v) දැනට මෙම වැඩසටහන අවසන් කර ඇති බැවින් තවදුරටත් ඉදිරියට යතුරුපැදි ලබා දීම සිදුකරනු නොලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 23.(2) යටතේ ප්‍රශ්නය. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඊට පෙරාතුව කාරණයක් සඳහන් කළ යුතුයි. මා පසු ගිය 7 වැනි දින අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් දෙනවාය කියලා සභානායකතුමා එකඟ වුණා. නමුත්, ඒ පිළිතුර දෙන ගරු ඇමතිතුමා නම් සභා ගර්භයේ නැහැ.

අම්පාර නාගරික බස් නැවතුම්පොළ ඉදි කිරීම සම්බන්ධ ප්‍රශ්නයක් මම ඇහුවේ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is referred to Hon. Minister of Transport. Is it? ගරු සභානායකතුමා ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අම්පාර නාගරික බස් නැවතුම්පොළ සම්බන්ධව ඇසූ ප්‍රශ්නය නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විෂය භාර ගරු ඇමතිතුමාට පුළුවන් නම් හෙට මේ සභාවේදී ඒකට උත්තරයක් දෙන්න කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමාට මම කියන්නම් ඒ ප්‍රශ්නයට හෙට පිළිතුරක් දෙන්න කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Thank you.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු පැහැර ගැනීමට තැත් කිරීම
மருத்துவபீட மாணவ செயற்குழு ஒருங்கிணைப்பாளரைக் கடத்த முயற்சித்தமை
ATTEMPTED ABDUCTION OF CONVENER OF MEDICAL FACULTY STUDENTS' ACTION COMMITTEE

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 23(2) යටතේ නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් පිළිතුරු අපේක්ෂාවෙන් අසන ප්‍රශ්නය මෙයයි.

2017 ජූලි 20වැනි දින විද්වත් වෘත්තිකයන්ගේ සංගම් සංවිධානයේ -OPA- කොළඹ කාර්යාලයේදී වෘත්තීය සමිති හා සංවිධාන සයිටම් විරෝධය ගැන සාකච්ඡාවක් පවත්වද්දී, සුදු වැන් රථයකින් පැමිණි නිල නොවන ඇඳුම් ඇඳ ගත් කණ්ඩායමක් වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු රයන් ජයලත් මහතා පැහැර ගැනීමට උත්සාහ දරා ඇත. එහි සිටි වෘත්තීය සමිති නායකයන් පැහැර ගැනීම සිදු කරද්දී අරගළ කොට වළක්වාගෙන ඇත.

ජූලි 24වැනි දින "දි අයිලන්ඩ්" පුවත් පතේ ඒ බව මෙසේ සඳහන් වෙනවා: "GMOA takes tough stand over attempted abduction of medical student activist". I do not want to read the whole thing.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒවා කියවන්න බැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මෙම වාර්තාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන ලෙස ඉල්ලා සිටිමින් **සභාගත*** කරනවා.

ඒ වාගේම, එම සිද්ධිය ඇසින් දුටු සාක්ෂිකරුවන් හැටියට GMOA නිලධාරීන් ප්‍රකාශ කර තිබෙනවා, "අත් අඩංගුවට ගැනීමට උත්සාහ කරද්දී අරගළ කොට වළක්වා ගත්තා." කියලා. පුවත් පතේ 24වැනි පිටුවේ සඳහන් පරිදි ඇසින් දුටු සාක්ෂි ඇතිව,-[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ලිඛිතව ඉදිරිපත් කළ කරුණු පමණක් කියනවා නම් හොඳයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ සිද්ධිය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්. එනම්, වෘත්තීය අයිතින්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට බාධා කිරීමක්.

1. මෙය, වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරුගේ ජීවිතයට තර්ජනයක් බව ගරු ඇමතිතුමා පිළිගන්නේ ද?
2. සුදු වැන් රථයකින් පැමිණ, රැස්වීමකට ඇතුළු වී රයන් ජයලත් ශිෂ්‍යයා පැහැර ගැනීමට පැමිණි, හඳුනා ගත් ඒ නිලධාරීන් කර ඇති බලවත් නීති උල්ලංඝනය කිරීමට හා තර්ජන කිරීමට විරුද්ධව ගෙන ඇති විනය පියවර කුමක්ද? ඔවුන් අත් අඩංගුවට ගෙන තිබේ ද?
3. එම නීති උල්ලංඝනය කිරීම පිළිබඳව ආණ්ඩුව නිසි පියවර ගන්නවා ද?
4. පොලීසිය විසින් සුදු වැන් රථ යොදවමින් මේ ආකාරයෙන් කරන පැහැරගෙන යෑම් නැවැත්වීමට රජය කටයුතු කරනවා ද?

ගරු ඇමතිතුමා පසු ගිය දවස්වල මේ පිළිබඳව බොහෝ ප්‍රකාශ පුවත් පත්වලට හා මාධ්‍යයට කළා. ගරු ඇමතිතුමනි, නමුත් මේ වන තුරු ඒ සම්බන්ධයෙන් කිසිම පියවරක් අරගෙන නැහැ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ අමාත්‍යාංශ නිවේදනය සමඟ මෙයට පිළිතුරු දෙනවාද, නැත්නම් වෙනම පිළිතුරු දෙනවා ද?

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)
ගරු කථානායකතුමනි, ඒ සිදුවීම වූ අවස්ථාවේදීම මම මාධ්‍ය ප්‍රකාශයක් නිකුත් කරලා කිව්වා, "මම මේ ගැන Ministerial Statement කරනවා" කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අසන ප්‍රශ්නයට ගරු ඇමතිතුමා දැන් පිළිතුරක් දෙනවාද?

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
මේ ප්‍රශ්නයට පිළිතුරත් මගේ Ministerial Statement එකෙන් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, එහෙම හොඳයි නේද? එහෙම කළොත් අපට වේලාව ඉතිරි කරගන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොඳයි. අද ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
He is going do that now. [බාධා කිරීමක්]- ඔව්. එතුමා Ministerial Statement එකක් කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, ගරු සාගල රත්නායක අමාත්‍යතුමා අමාත්‍යාංශ නිවේදනයෙන් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරයි. හැබැයි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්නය වැරැදියි. එතුමා කියලා තිබෙනවා, ඇවිත් තිබෙන්නේ සුදු වෑන් එකක් කියලා. ඒක සුදු වෑන් එකක් නොවෙයි. ඇවිත් තිබෙන්නේ පොලීසියට අයිති වාහනයක්. -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක වාදයක් බවට පත් කරගන්න එපා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේක පොලීසියට අයිති වාහනයක්. පොලීසියෙන් අත් අඩංගුවට ගන්න ගිය මේ පුද්ගලයාට වරෙන්තු පහක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමා පැහැදිලි කරයි. Let the Hon. Minister explain it.

මීළඟට, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, let me explain.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Minister will explain. He told me.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, no -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister will explain now. Otherwise, you are unnecessarily going into that.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
No, the Question is wrong. මේක පොලීසියට අයිති වාහනයක්. මේ සැකකාර පුද්ගලයාට වරෙන්තු පහක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා. [බාධා කිරීම්] වාඩි වෙන්න. Order, please! Let us proceed with that. -[*Interruption.*] ගරු ඇමතිතුමා පැහැදිලි කළාට පසුව ඒ අවස්ථාව දෙන්නම්.[බාධා කිරීම්] ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා, you can go ahead.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
නන්‍රි, கௌரவ சபாநாயகர் அவர்களே! [இடையீடு]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order? -[*Interruption.*] Order, please! ගරු අමාත්‍යතුමාගේ ප්‍රකාශයෙන් පසුව තමුන්නාන්සේට ප්‍රශ්න අසන්න අවස්ථාව දෙන්නම්.[බාධා කිරීම්] Let me proceed with the work. - [*Interruption.*] You can go ahead, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

II

නියහයෙන් පීඩාවට පත් ජනතාවට කඩිනම් සහන
வரட்சியினால் பாதிப்புற்ற மக்களுக்கு உடனடி நிவாரணம்
IMMEDIATE RELIEF FOR PEOPLE AFFECTED BY DROUGHT

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, அனர்த்த முகாமைத்துவ அமைச்சர் மாண்புமிகு அனுர பிரியதர்ஷன யாப்பா அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி.

அண்மைக் காலமாக நாட்டில் ஏற்பட்டுள்ள கடும் வரட்சி காரணமாக வடக்கு, கிழக்கு, வடமேல் மற்றும் வட மத்திய மாகாணங்களைச் சேர்ந்த சுமார் 8 இலட்சத்திற்கும் அதிகமான மக்கள் பெரிதும் பாதிக்கப்பட்டுள்ளனர் எனத் தெரிய வருகின்றது. நாட்டின் தென் பகுதியில் அண்மையில் ஏற்பட்ட கடும் மழை மற்றும் மண் சரிவுகள் காரணமாகப் பாதிக்கப்பட்ட மக்கள் அப்பாதிப்புக்களிலிருந்து இன்னமும் முழுமையாக மீள இயலாத நிலையில் இருந்து வருகின்றனர். இம்மக்களது இயல்பு வாழ்க்கை குறித்து அரசு பல்வேறு நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்ற நிலையிலேயே, மேற்படி வரட்சி காரணமாகவும் அதிகளவு மக்கள் பாதிக்கப்பட்டுள்ளனர்.

அந்த வகையில், வடக்கு மாகாணத்தைச் சேர்ந்த 4,53,195 பேரும், கிழக்கு மாகாணத்தைச் சேர்ந்த 2,00,451 பேரும், வடமேல் மாகாணத்தைச் சேர்ந்த 1,78,047 பேரும், வடமத்திய மாகாணத்தைச் சேர்ந்த 16,800 பேருமாக, 8,48,493 பேர் வரட்சி காரணமாகப் பாதிக்கப்பட்டுள்ளதாகத் தெரிய வருகின்றது. இன்றைய நிலையில் இத்தொகை மேலும் அதிகரிக்கக்கூடிய வாய்ப்புக்களும் இல்லாமல் இல்லை. இதன் பிரகாரம் வடக்கு மாகாணத்திலேயே அதிகளவிலான பாதிப்புக்கள் ஏற்பட்டுள்ளதாகத் தெரியவருகின்றது. வடக்கில், குறிப்பாக தீவகப் பகுதிகளைச் சேர்ந்த மக்கள் வரட்சியின் கொடுமை தாங்காது, குடிநீருக்கான வசதிகளற்ற நிலையில் தற்போது இடப்பெயர்வுகளை எதிர்நோக்கி வருகின்ற ஒரு நிலையும் ஏற்பட்டுள்ளது.

மழை மற்றும் வரட்சி போன்ற இயற்கை அனர்த்தங்கள் காரணமாக வடக்கு மாகாணம் தொடர்ந்தும் பாரிய பாதிப்புக் களுக்கு உட்பட்டு வருகின்ற நிலையில், இப்பாதிப்புக்களி லிருந்து மக்களைப் பாதுகாப்பது தொடர்பில் முன்கூட்டியே நிரந்தர நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டிய தேவையுள்ளது. அதேநேரம், எமது மக்களின் தற்போதைய பாதிப்புக்கள் தொடர்பில் உடனடி நிவாரணங்களை வழங்க வேண்டிய நிலையும் ஏற்பட்டுள்ளது.

வடக்கு மாகாணத்தின் நிலத்தடி நீரானது, பல்வேறு படிமங்கள் மற்றும் கழிவுகள் காரணமாகவும் உவர் நீர் உட்புகுதல் காரணமாகவும் மாசடைந்துள்ள நிலைமை காணப்படுகின்றது. அதேவேளை, அங்குள்ள உள்ளூராட்சி நிறுவனங்கள் செயற்றிறன்களை இழந்துள்ள நிலையும் காணப்படுகின்றது. எனவே, இவற்றைக் கவனத்தில் கொண்டே, மேற்படி வரட்சி காரணமாகப் பாதிக்கப்பட்டுள்ள எமது மக்களுக்கு உடனடி ஏற்பாடுகள் குறித்து நாம் நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டியுள்ளது என்பதைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அந்த வகையில் நிலைமைகளை நேரில் ஆராய்வதற்கென அண்மையில் வடக்கு மாகாணத்திற்குச் சென்றிருந்த கௌரவ அமைச்சர் அனுர பிரியதர்ஷன யாப்பா அவர்களுக்கு எமது மக்கள் சார்பாக நன்றியைத் தெரிவித்துக்கொள்வதுடன், அங்குள்ள நிலைமைகளை அவர் நன்கு புரிந்து கொண்டிருப்பார் எனவும் நம்புகின்றேன்.

வரட்சி காரணமாகப் பாதிக்கப்பட்டுள்ள வடக்கு மாகாண மக்களுக்கு உடனடி நிவாரணமாக மேற்கொள்ளப்பட்டுள்ள ஏற்பாடுகள் யாவை?

வடக்கு மாகாணத்தில் தற்போது நீருக்கு ஏற்பட்டுள்ள பாரிய சவால்களின் முன்பாக, தென்பகுதியிலிருந்து குடிநீரை ஒரு விசேட ஏற்பாட்டின் அடிப்படையில் இரயில் மூலமாகக் கொண்டுசெல்வதற்கான நடவடிக்கைகளை முன்னெடுக்க முடியுமா?

கிழக்கு, வடமேல், வடமத்திய மாகாணங்களில் பாதிக்கப் பட்டுள்ள மக்களுக்கான உடனடி நிவாரணங்கள் என்ன?

வடக்கு மாகாணத்தில் மேற்படி இயற்கை அனர்த்தங் களிலிருந்து மக்களைப் பாதுகாக்கும் வகையில் நிரந்தர ஏற்பாடுகளுக்கான நடவடிக்கை ஏதேனும் திட்டமிடப் பட்டுள்ளதா? ஆமெனில், அதுகுறித்து விளக்க முடியுமா?

இல்லையேல், அதற்கான காரணங்களை கௌரவ அமைச்சர் அவர்கள் தெளிவுபடுத்துவாரென எதிர்பார்க் கின்றேன். நன்றி.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு அனுர பிரியதர்ஷன யாப்பா - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Disaster Management)

ගරු කථානායකතුමනි, නියහය හේතුවෙන් පීඩාවට පත් වී සිටින උතුරු පළාත් ජනතාවට වහාම සහන සැලසීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන වෙන් කරවාගෙන ඇති අතර, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම පරිදි පානීය ජලය බෙදා හරින බවුසර් රථවල ඉන්ධන, ඒවායේ සේවය කරන රියැදුරු හා රිය සහායක අතිකාල දීමනා, ජලය සඳහා ගෙවීම්, ජල මූලාශ්‍ර පිරිසිදු කිරීම් හා පරිපාලන වියදම් ආදිය සඳහා මේ වන විට පහත පරිදි ප්‍රතිපාදන ලබා දී ඇත.

දිස්ත්‍රික්කය	ලබා දී ඇති ප්‍රමාණය (රුපියල්)
මුලතිව්	2,171,000
කිලිනොච්චි	3,000,000
වවුනියාව	350,394
යාපනය	4,889,492
එකතුව	55,21,394

ඒ අනුව දිසාපතිවරුන්ගේ ඉල්ලීම මත මේ මොහොත වන විට රුපියල් 5,521,394ක් ලබා දී තිබෙනවා. තවද, ජනාධිපති ලේකම් කාර්යාලය, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් පානීය ජලය බෙදා හැරීම සඳහා ට්‍රැක්ටර් බවුසර් හා ලොරි බවුසර් රථ පහත පරිදි ලබා දී ඇත.

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

දිස්ත්‍රික්කය	ට්‍රැක්ටර් බවුසර් ප්‍රමාණය	ලොරි බවුසර් ප්‍රමාණය
යාපනය	13	01
මුලතිව්	8	
කිලිනොච්චි	11	
මන්නාරම	5	
වවුනියාව	8	

ඒ අනුව ට්‍රැක්ටර් බවුසර් 45කුත්, ලොරි බවුසර් 01කුත් දීලා තිබෙනවා. ඒ අතරතුර අපි දිසාපතිවරුන්ට කියා තිබෙනවා, අවශ්‍ය පරිදි බවුසර් රථ කුලියට ගනිමින් අවශ්‍ය වතුර ප්‍රමාණය බෙදා හරින්න කියලා. ඊට අතිරේකව, සෑම ට්‍රැක්ටර් බවුසර් රථයකට හෝ බවුසරයකට ලබා ගන්නා රියැදුරුට අමතරව අතිරේක රියැදුරෙකුත් අරගෙන වැඩි කාලයක් ජලය බෙදා හරින්න කියලාත් මම යාපනයට ගිය වෙලාවේ ඒ ගොල්ලන්ට කිව්වා. අපි දිස්ත්‍රික්ක පහට අවශ්‍ය ජල ටැංකි 650ක ප්‍රමාණයක් දීලා තිබෙනවා. අපි යාපනයට ගිය වෙලාවේදී කියා සිටියා, ජල ටැංකි තවත් මදි බව. ඒ අනුව අපි අවශ්‍ය ජල ටැංකි ප්‍රමාණය යවන්න නියෝග ලබා දී තිබෙනවා.

දුම්රිය මඟින් ජලය ප්‍රවාහනය කිරීමට අවශ්‍ය මූලික පහසුකම් සපයා ගැනීම පිළිබඳව අදාළ ආයතන හා සාකච්ඡා කළ යුතු අතර, එහිදී ජලය ප්‍රවාහනය කළ හැකි දුම්රිය ටැංකි සකසා ගැනීම හා ප්‍රමාණවත් ජලය ලබා ගත හැකි ප්‍රදේශ ආදී කරුණු සැලකිල්ලට ගෙන මෙය ක්‍රියාවට නැංවීමේ ඇති හැකියාව පිළිබඳව ඉදිරියේදී තීරණය කරනවා.

නැඟෙනහිර, වයඹ හා උතුරු මැද ප්‍රදේශවල පීඩාවට පත් ජනතාවට ලබා දිය හැකි සහන ලෙස පානීය ජලය බෙදා හරින බවුසර් රථවල ඉන්ධන, ඒවායේ සේවය කරන රියැදුරු හා රිය සහායක අතිකාල දීමනා, ජලය සඳහා ගෙවීම්, ජල මූලාශ්‍ර පිරිසිදු කිරීම්, පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන සහ ජල ටැංකි අපි ලබා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා විසින් පසු ගිය සතියේ යාපනය සහ අදාළ දූපත්වල සංචාරය කළා.

මට දැන ගන්නට ලැබුණු හැටියට දූපත්වල ඉතාමත් නරක තත්ත්වයක් තිබෙන්නේ. දූපත්වලට ජලය ලබා දීමට ශ්‍රී ලංකා නාවික හමුදාව අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන් සෑම දිනකම වාගේ ශ්‍රී ලංකා නාවික හමුදාව මඟින් නයිනතිව් දූපතට ජලය අරගෙන යනවා. ඒ වාගේම අපි මේ පිළිබඳව තාක්ෂණික සොයා බැලීමකුත් කළා. තාක්ෂණික සොයා බැලීම්වලින් පස්සේ අවශ්‍ය දිගු කාලීන සහ කෙටි කාලීන ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ඉදිරි සතියේදී අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට මවිසින් ක්‍රියා කරනු ලබනවා. ඒ අනුව විශේෂයෙන් නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය වැනි අමාත්‍යාංශ සමඟ එක්ව වැඩ කරන්න අපි සූදානම් වනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, are you satisfied with the answer?

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ළස් දේවානන්දා)
(The Hon. Douglas Devananda)
Okay.

වඩක්කු මාකාණත්තිලේ යාழ්. மாவட்டத்தில் நீங்கள் ஏற்பாடு செய்த வசதிகளுக்கு மிகவும் நன்றி! இருந்தாலும் அங்கே அந்த வசதிகளுக்கேற்பத் தண்ணீரைப் பெறமுடியாத நிலைமை இருக்கின்றது. அதனால் தென்னிலங்கையிலிருந்து ரயில்மூலம் தண்ணீரை அங்கு கொண்டுவருவதற்கான ஏற்பாடுகளைச் செய்யுமாறு கேட்டுக்கொள்கின்றேன்.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
Sir, we will try.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් අහනවා. ඔබතුමාට පිළිතුරු දෙන්න පුළුවන්ද?
Hon. Minister, are you ready to reply?

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
Yes, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු ඇමතිතුමනි, උතුරු මැද පළාතේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේත් මෙවැනිම තත්ත්වයක් තමයි තිබෙන්නේ. මා හිතන හැටියට ඔබතුමා කියපු ආකාරයේ පහසුකම් ජනතාවට ලබා දෙන්න රජය කිසිදු කටයුත්තක් කරලා නැහැ. අනුරාධපුරය දිස්ත්‍රික්කයට දැනට පානීය ජලය තිබෙන්නේත් දින 25ක කාලයකට පමණයි. එම නිසා මා හිතනවා, ඔබතුමන්ලාගේ මේ වැඩ පිළිවෙළ ඉතාම කඩිනමින් අපේ දිස්ත්‍රික්කය තුළත් ක්‍රියාත්මක කරන්න කටයුතු කළොත් හොඳයි කියා, ඇමතිතුමනි.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ගරු මන්ත්‍රීතුමනි, දැනට සති 2කට කලින් මා අනුරාධපුරය දිස්ත්‍රික්කයට ගිහින් සියලු දෙනා සමඟම සාකච්ඡා කළා. ඒ අය මට කියපු හැටියට අනුරාධපුරය දිස්ත්‍රික්කයට තව මාස 2කට ප්‍රමාණවත් වතුර ප්‍රමාණයක් තිබෙනවා. නමුත් යම් යම් ස්ථානවල තිබෙන අඩු පාඩුකම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි දිසාපතිවරුන්ට උපදෙස් දුන්නා. මේ විධියටමයි ලංකාව පුරාම ක්‍රියාත්මක වන්නේ. අවශ්‍ය බවුසර් ප්‍රමාණයක් අපි ලබා දීලා තිබෙනවා. තව ප්‍රමාණයක් අනිකුත් ප්‍රදේශවලින් ගෙන යන්න අපි කල්පනා කරනවා. ඒ අනුව විශේෂයෙන් අනුරාධපුරය, පොළොන්නරුව, වවුනියාව, කිලිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල මේ කටයුත්ත සඳහා අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඒ වාගේම අපි බලාපොරොත්තු වනවා, කුලියට

ගන්න පුළුවන් සෑම බවුසරයක්ම අරගෙන ඒ ප්‍රදේශවලට යවන්න. [බාධා කිරීමක්] අවශ්‍ය සියලු උපදෙස් දුන්නා. සමහර මන්ත්‍රීතුමන්ලාත් ඒ සාකච්ඡාවට සහභාගි වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ස්ථාවර නියෝග 23 (2) යටතේ ප්‍රශ්න, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

III

රත්මලාන සතොස ගබඩා සංකීර්ණයේදී අත් අඩංගුවට ගත් මත්ද්‍රව්‍ය සම්බන්ධ පරීක්ෂණ
இரத்மலானை சதொச களஞ்சியத்தொகுதியில் கைப்பற்றப்பட்ட போதைப்பொருள் பற்றிய விசாரணை
INVESTIGATION INTO NARCOTIC DRUGS NABBED AT SATHOSA WAREHOUSE COMPLEX RATMALANA

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 23(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකාවට මහා පරිමාණයෙන්, නීති විරෝධී මත් ද්‍රව්‍ය ආනයනය කිරීමේ සිදුවීම් වාර්තා වීම බහුලවීම හේතුවෙන් පැනනැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

මේ වන විට ශ්‍රී ලංකාව මත් ද්‍රව්‍ය බෙදාහැරීමේ මධ්‍යස්ථානයක් බවට පත්වී ඇති බවත්, තවමත් නොකඩවා මහා පරිමාණයෙන් මත් ද්‍රව්‍ය ආනයනය කෙරෙමින් ඇති බවත්, පසු ගිය 19වැනිදා රත්මලාන සතොස ගබඩා සංකීර්ණයේදී කොකේන් කිලෝග්‍රෑම් 160ක ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීමෙන් අනාවරණය වෙනවා.

ගරු කථානායකතුමනි, කිලෝග්‍රෑම් 160ක් කියන්නේ ආසන්න වශයෙන් ගත්තොත් පිටි මිටි තුනකට සමානයි. සාමාන්‍යයෙන් අපේ ගම්වල තිබෙන බේකරියක පාන් පුච්චන්න ගන්නෙත් පිටි මිටි එකයි. පිටි මිටි තුනක ප්‍රමාණයට සමානව කුඩු ආනයනය කරලා තිබෙනවා.

මෙතෙක් ලංකාවෙන් සොයාගත් විශාලතම හෙරොයින් තොගය වූ කිලෝග්‍රෑම් 220ක ප්‍රමාණය අත් අඩංගුවට ගෙන තිබුණේ පසු ගිය වසරේ නොවැම්බර් මාසයේදීයි. එයද ආනයනය කර තිබුණේ සීනි කන්ටේනරයක් තුළයි. මෙම නවතම සිදුවීම සීනි කන්ටේනර් සමඟ සිදුවීම මඟින් නීති විරෝධී ආනයනකරුවන් තවමත් එම මාර්ගය වෙත විශ්වාසය තබා ඇති බව පෙනෙන්නට තිබෙනවා. විශේෂයෙන් මෙවර සිදුවීමට අදාළ තොගයේ ප්‍රමාණය පෙර සිදුවීමට වඩා අඩු වුවත්, වඩා බරපතළ වන්නේ එය රජයට අයත් සතොස වෙනුවෙන් ආනයනය කළ සීනි තොගයක් හා බැඳී තිබීමයි. එමෙන්ම එය අත් අඩංගුවට ගෙන ඇත්තේ සතොස ගබඩා සංකීර්ණයකදී වීමයි. මොකද, සතොස ගබඩාවේ ඇති රජය විසින් ආනයනය කරන ලද සීනි තොගයකින් එම කුඩු තොගය හමුවීම නිසා, ඒ සඳහා රජයේ යම් පාර්ශ්වයක සම්බන්ධයක් ඇති බවට මහ ජනතාව තුළ පැනනඟින සැකය අතිශය සාධාරණයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අද වැලිකඩ බන්ධනාගාරයට ගොස් බැලුවොත් කුඩු පාවිච්චි කරන පුද්ගලයන් විශාල ප්‍රමාණයක් අත් අඩංගුවේ සිටින බව පැහැදිලියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඉදිරිපත් කොට ඇති ප්‍රශ්නය තුළ තිබෙන කොටස විතරක් කියවන්න. කාලය ඉතුරු කරන්න අවශ්‍යයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එසේ වුවද, කිසිසේත්ම මේ මහා පරිමාණ කුඩු ජාවාරම්කාරයෝ කිසිවෙක් අත් අඩංගුවට ගන්නේ නැහැ. ඒ නිසා ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබෙන්නේ මේ සඳහා දේශපාලනඥයින්ගේ හා නිලධාරීන්ගේ ප්‍රබල මැදිහත්වීමක් ඇති බවයි. එසේ නොමැතිව මෙතරම් කුඩු තොගයක් ලංකාවට ආනයනය කිරීමට හැකියාව ලැබෙයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. එම නිසා මෙම ගැටලුවට අදාළ අමාත්‍යවරයා පිළිතුරු ලබාදෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

1. මෙම කොකේන් තොගය අත් අඩංගුවට ගැනීම සම්බන්ධ පරීක්ෂණ කටයුතුවල ප්‍රගතිය කවරේද?
2. රජයේ පාර්ශ්ව මෙම සිදුවීමට සම්බන්ධ බවට චෝදනා නැඟෙමින් තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණ කර තිබෙනවාද? මොකද, මේවා සතොස ගබඩාවකින් හසුවෙනවා නම්, සතොස වෙනුවෙන් ගෙන්වන ලද සීනි තොගයක් තුළින් මෙම කුඩු තොගය හසුවෙනවා නම්, පැහැදිලි ලෙස රාජ්‍ය පාර්ශ්වයන්ගේ මැදිහත්වීම් මේ සඳහා තිබිය යුතුයි.
3. එම චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණ යොමුවී තිබේද?

දිගින් දිගට මෙසේ මහා පරිමාණ නීති විරෝධී මත් ද්‍රව්‍ය ආනයන වැළැක්වීම සඳහා ගෙන ඇති පියවරයන් කවරේද කියා ගරු ඇමතිතුමා මේ පාර්ලිමේන්තුව දැනුවත් කරනු ඇතැයි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කරන්නේ Ministerial Statements යටතේ එන ප්‍රකාශයක්ද, නැත්නම් වෙනත් එකක්ද?

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, මෙය වෙනම ප්‍රකාශයක්.

ගරු කථානායකතුමනි, ගරු අනුර කුමාර දිසානායක මහතා ස්ථාවර නියෝග 23/2 යටතේ අහපු පළමුවන ප්‍රශ්නයට පිළිතුර මෙයයි.

1 ප්‍රශ්නයෙන් විශේෂයෙන් එතුමා අහන්නේ, මෙම හෙරොයින් තොගය අත්අඩංගුවට ගැනීම සම්බන්ධ පරීක්ෂණ කටයුතුවල ප්‍රගතිය පිළිබඳවයි. ගල්කිස්ස මූලස්ථාන පොලිස් ස්ථානය මඟින් අත් අඩංගුවට ගන්නා ලද කොකේන්

[ගරු සාගල රත්නායක මහතා]

කිලෝග්‍රෑම් 218යි ග්‍රෑම් 600කට අදාළව අංක WPLK 4546 දරන ලොරි රථයේ රියැදුරු සහ කම්කරුවන් 06 දෙනෙකු ගල්කිස්ස ම/ඵ බී 1803/2017 යටතේ කරුණු වාර්තා කර 2017.07.19 දින සිට දින 07ක් රඳවා ගැනීමේ නියෝග ලබා ගැනීමෙන් පසුව වැඩිදුර විමර්ශන කටයුතු සඳහා පොලිස් මත් ද්‍රව්‍ය කාර්යාංශය වෙත භාරදීමෙන් පසු ඊට අදාළ විමර්ශන කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව වාර්තා කර ඇත.

මෙහිදී සැකකරුවන්ගෙන් මෙම ජවාරම් සිද්ධියට අදාළව දීර්ඝ ලෙස ප්‍රශ්න කර වැඩිදුර ප්‍රකාශයන් සටහන් කර ඇති බවත්, මෙම සිද්ධියට අදාළව ප්‍රශ්නගත බහාලුම මිලදී ගන්නා ලද ලංකා සතොස රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයෙන් හා මෙම සිද්ධිය වන විට මෙහි රැඳී සිටි රංජිතා ට්‍රේඩර්ස් හි නියෝජිතයන්ගේ හා එහි රැඳි සිටි වෙනත් සතොස අයවලුන්ගේ විස්තර වාර්තා කර ඇත. එම අයවලුන්ගේ නාමලේඛනයක් තිබෙනවා, මම එය සඳහන් කරන්නම්.

සුදත් කෝලිත වීරසිංහ- ලංකා සතොස ආයතනය, සාමාන්‍යාධිකාරි (මිලදී ගැනීම්); මාලින්ඛඩ ලියන පතිරත්නැහැලාගේ නාලක- ලංකා සතොස රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයේ ගබඩා ලිපිකරු; කළුආරච්චිගේ ප්‍රභාත් අනුරුද්ධ- ලංකා සතොස රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳ සහායක; හල්නෙත්ති අසේල ඉන්දික - ලංකා සතොස රත්මලාන ආයතනයේ වෙළඳ සහායක; දොන් ලක්ෂාන් චතුරංග පෙරේරා- හේමාස් ආයතනයේ ලංකා සතොස රත්මලාන ආර්ථික මධ්‍යස්ථානයේ ගබඩා පාලක; සුප්පයියා සෙල්වකුමාර් - රංජිතා පල්සස් ස්පිලිටින්ග් ඇන්ඩ් ප්‍රොසෙසින්ග් ඉන්ඩස්ට්‍රි ආයතනයේ වෙළඳ සහායක; මාරිංග අජිත් අනුරප්‍රේම - හේමාස් ආයතනයේ බරඅත සේවක සැපයීම් ප්‍රධානී; චන්ද්‍රසේකර ශාන්ත කුමාර් -අංක WPLK 4546 දරන ලොරි රථයේ හිමිකරු.

මෙම විමර්ශනයට අදාළව භාණ්ඩ නිශ්කාෂණය කිරීම සඳහා ඉදිරිපත් වී ඇති අංක 89/45/ඒ, ජම්පටා වීදිය,කොළඹ 13 ලිපිනයේ පිහිටි ඔක්ස්ෆර්ඩ් ක්ලියරින් ඇන්ඩ් ෆෝවර්ඩින් ආයතනය හා භාණ්ඩ ආනයන සමාගම වන අංක 233, කොළඹ වීදිය, නුවර පිහිටි ඩබ්ලිව්.ඩී.ආර්. සමරකෝන් සහ පුත්‍රයෝ හා එහි තැරැව්කරුවන් ලෙස කටයුතු කළ අංක 33, බෞද්ධාලෝක මාවත, සී වාර්ට් ඉන්ටර්නැෂනල් ආයතනයේද මෙම ප්‍රශ්නගත බහාලුම පරීක්ෂා කර මුදාහරින ලද ශ්‍රී ලංකා රේගුවේ ප්‍රකාශ සටහන් කිරීමට කටයුතු කරමින් පවතින බව වාර්තා කර ඇත. මෙම විමර්ශන තවම ඉතාම මූලික අවස්ථාවල පවතින්නේ. වැඩිදුර සඳහන් කරන්න තරම් තොරතුරු නැහැ.

2 රජයේ පාර්ශ්ව මෙම සිදුවීමට සම්බන්ධ බවට නැඟෙන චෝදනා සම්බන්ධයෙන් මෙතෙක් සිදු කරනු ලැබූ විමර්ශනවලදී සෘජු හෝ වක්‍රව දැනීමක් රජයේ පාර්ශ්වයන් සම්බන්ධයෙන් කිසිසේත් අනාවරණය වී නොමැති බව වාර්තා කර ඇත.

3. ඒ පිළිබඳව නාවික හමුදාව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වැනි ආයතන රාශියක් එක්ක ශ්‍රී ලංකා පොලිසියේ මත් ද්‍රව්‍ය නාශක කාර්යාංශය -Police Narcotic Bureau එක- කටයුතු කරනවා. මේ සම්බන්ධ වැටලීම් විශාල ප්‍රමාණයක් මැත ඉතිහාසයේ කරලා තිබෙනවා. විශේෂයෙන්, එක්සත් ජාතීන්ගේ මත් ද්‍රව්‍ය පිළිබඳ කාර්යාංශයඒ කියන්නේ UNODC එක මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අරගෙන තිබෙන පියවර ගැන, "දකුණු ආසියා ප්‍රදේශයේ ඉතාම සාර්ථකම වැඩ පිළිවෙළ" කියලා විශේෂ සටහනක් දමා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ සීනි බහාලුම් එක්ක මත් ද්‍රව්‍ය ගෙනෙන එක රජයටත් ප්‍රශ්නයක්. ඒ නිසා අපි මේ පිළිබඳව වැඩිපුර අවධානය යොමු කරන්න පටන් ගත්තා; වැඩිපුර විමර්ශන කරන්න පටන් ගත්තා; මේ බහාලුම් ආවාම ඒවා පරීක්ෂා කරන්න පටන් ගත්තා. ඒත් එයින් ඊට වඩා ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, මේවා විශාල ප්‍රමාණයක් එනවා. ඒ නිසා මේවා පරීක්ෂා කරන්න දීර්ඝ කාලයක් ගත වෙනවා. රේගුවෙන් ඒවා පරීක්ෂා කිරීමට ප්‍රමාද වෙනකොට සීනි මිල පිළිබඳව, වෙළෙඳ පොළේ තිබෙන සීනි ප්‍රමාණය පිළිබඳව ප්‍රශ්න මතු වෙනවා. ඒ නිසා අපි අලුත් උපකරණ ලබා ගැනීමට පවා අවශ්‍ය පියවර, උපදෙස් අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඊට අමතරව "සංවිධානාත්මක අපරාධ කොට්ඨාසය" කියලා කොට්ඨාසයක් පොලිසියේ තිබෙනවා. ඒ වාගේම -PNB - Police Narcotic Bureau කියන කොට්ඨාසය තිබෙනවා. මේ කොට්ඨාස දෙකම අපි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ භාරයට පත් කර ප්‍රතිව්‍යුහගත කිරීමක් කරනවා. එතකොට ඒක කොට්ඨාසයක් නොවෙයි, වෙනම range එකක් වෙනවා; ඉහළ මට්ටමකට යනවා. මේ කොට්ඨාස ප්‍රතිව්‍යුහගත කිරීමේ අපේ ඉල්ලීම් මේ සතියේ බ්‍රහස්පතින්දා ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා අනුමැතිය ලැබීමෙන් අනතුරුව එහි කටයුතු ආරම්භ කරනවා. ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු මීට වඩා ඉහළ මට්ටමකින් කරලා, මීට වඩා හොඳ ප්‍රතිඵල ලබලා දෙන්න අදහස් කරනවා. ඒ නිසා එවැනි වැරදි කරන අයට කිසිම සමාවක් දෙන්නේ නැහැ. ඒවාට සම්බන්ධ අයවලුන්ට නැවත කිසිම ආරක්ෂාවක් ලබා ගන්න බැරි වෙනවා. නීතියට අනුව ක්‍රියාත්මක කරනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ගරු කථානායකතුමනි, මම ගරු අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නට කැමැතියි. රත්මලානේ මත් කුඩු සම්බන්ධයෙන් දැනට අත් අඩංගුවේ රඳවා තබා ගෙන ඉන්නවා නාට්ටාම්වරු හයදෙනෙක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක වෙනම අහන්න; වෙනම raise කරන්න. [බාධා කිරීමක්]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

නාට්‌ටාම්වරු භයදෙනෙක් තමයි අරගෙන තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මේ මත් ද්‍රව්‍ය ගැන තොරතුරු හෙළි කරලා තිබෙන්නේත් ඔවුන්ම තමයි. ඔවුන්ව තමයි දැන් අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ. හැබැයි, කුඩු ජාවාරමට සම්බන්ධ කිසිවෙක් අත් අඩංගුවට අරගෙන නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඒ ගැන පරීක්ෂා කරලා දවස් තුනකින් කරුණු ඉදිරිපත් කරයි. මේ අවස්ථාවේ ඒ ගැන වාද-විවාද කරන්න අවශ්‍ය වන්නේ නැහැ. [බාධා කිරීමක්]

Next, Ministerial Statement by the Hon. Sagala Ratnayaka.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)

ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 23(2) යටතේ ඇසූ ප්‍රශ්නයටත් පිළිතුරු දෙන්න මම බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්, කෙටියෙන් කිව්වොත් ඒක "සුදු වෑන්" එකක් නොවෙයි ගරු කථානායකතුමනි, ඒක පොලීසියට අයිති වාහනයක්. ඒ ගොල්ලෝ නිල කටයුත්තකටයි ගියේ; අවශ්‍ය සටහන් වාර්තා කරලා තමයි ගියේ. කෙසේ වෙතත්, මගේ ප්‍රකාශය කරන්නම්.

වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු අත් අඩංගුවට ගැනීමට ක්‍රියා කිරීමේදී ඇති වූ සිද්ධිය: නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය

மருத்துவபீட மாணவ செயற்குழு ஒருங்கிணைப்பாளரைக் கைதுசெய்ய முயன்றபோது இடம்பெற்ற சம்பவம்: சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரின் கூற்று

INCIDENT OCCURRED WHILE TAKING INTO CUSTODY CONVENER OF MEDICAL FACULTY STUDENTS' ACTION COMMITTEE: STATEMENT BY MINISTER OF LAW AND ORDER AND SOUTHERN DEVELOPMENT

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු කථානායකතුමනි, 2017.07.20වන දින කුරුඳුවත්ත පොලිස් වසමේ පිහිටි වෘත්තිකයන්ගේ සංගමයේ ගොඩනැඟිලි පරිශ්‍රයේදී වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු වන රයන් ජයලත් ශිෂ්‍යයා අත් අඩංගුවට ගැනීමට යාමේදී සිදුවූ සිද්ධිය සම්බන්ධව මා විසින් පොලිස්පතිගෙන් මූලික වාර්තාවක් කැඳවන ලදී. එම වාර්තාව අද දින ගරු පාර්ලිමේන්තුවේ **සභාගත*** කිරීමට කටයුතු කරමි.

2017.06.21වන දින සෞඛ්‍ය අමාත්‍යාංශ ගොඩනැඟිල්ලට බලහත්කාරයෙන් ඇතුළු වී රජයේ දේපොළවලට අනර්ථයක් සිදු කිරීමට අදාළව පොදු දේපොළ පනත යටතේ මාළිගාකන්ද මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී. 16250/17 දරන නඩුවට අත් අඩංගුවට ගැනීමට අවශ්‍ය සැකකරුවෙකු ලෙස නම් කර ඇති, එමෙන්ම කොටුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු අංක බී. 3049/16 දරන නඩුවට අදාළව අධිකරණ නියෝග උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ගොනු කර ඇති නඩුවට පෙනී නොසිටීම හේතුවෙන් වරෙන්තු නිකුත් වී ඇති සැකකරුවෙකු වශයෙන් වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු වන රයන් ජයලත් ශිෂ්‍යයා උක්ත සඳහන් දින අත් අඩංගුවට ගැනීමට යාමේදී මෙම සිදුවීම සිදු වී ඇත.

කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මෙම වරෙන්තුකරු හෙවත් අත් අඩංගුවට ගැනීමට අවශ්‍ය සැකකරු 2017.07.20 වන දින කුරුඳුවත්ත පොලිස් වසමේ වෘත්තිකයන්ගේ සංගම් ගොඩනැඟිල්ල තුළ සිටින බවට ලද තොරතුරක් අනුව ඔහු අත් අඩංගුවට ගැනීමට එම කොට්ඨාසයේ නිලධාරීන් මෙහෙයුමක් සිදු කර ඇත. එම සැකකරු අත් අඩංගුවට ගැනීම සඳහා පොලිස් නිලධාරීන් පමණක් සහභාගි වී ඇත. කොළඹ අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපති ඇතුළු නිලධාරීන් සිව් දෙනෙකු නිල ඇඳුමින් ගමන් කර ඇති අතර, තවත් නිලධාරීන් නව දෙනෙකු සිවිල් ඇඳුමින් සැරසී නිල හැඳුනුම් පත් රැගෙන ගොස් ඇත. නිලධාරීන් ප්‍රවාහනය හා මෙහෙයුම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට අයිති වාහන පමණක් භාවිත කර ඇත. එම වාහනවල රියැදුරන් පොලිස් නිල ඇඳුමින් ගමන් කර ඇත. ඒ කෙසේ වෙතත් කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් 2017.07.20 වන දින මෙම සැකකරු අත් අඩංගුවට ගැනීම සඳහා සිදු කරන ලද මෙහෙයුමේ ක්‍රමවේදය සම්බන්ධව අඩු පාඩු ඇති බව මට නිරීක්ෂණය වෙයි. පොලිස් දෙපාර්තමේන්තුව මෙලෙස මෙම සැකකරු අත් අඩංගුවට ගැනීමට ක්‍රියා කිරීමේදී ඊට සහභාගි වූ නිලධාරීන්ගෙන් යම් යම් අඩු පාඩු සිදු වී ඇද්දැයි පරීක්ෂා කර වාර්තාවක් සපයන ලෙස මේ වන විට පොලිස්පතිට නියෝග කර ඇත. මහ ජනතාවගේ සහ ජාත්‍යන්තරයේ දැඩි අවධානය සඳහා භාජනය විය හැකි මෙවැනි ක්‍රියා දාමයන් සිදු කිරීමේදී කොළඹ අපරාධ කොට්ඨාස අධ්‍යක්ෂ ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ශ්‍රී ලංකාවේ නීති රාමුව තුළ රැඳී සිටිමින් කනිෂ්ඨ නිලධාරීන් වෙත නිසි උපදෙස් ලබා දී කළ යුතු රාජකාරිය පිළිබඳව නිවැරැදිව දැනුවත් කිරීමක් සිදු කර නිලධාරීන් මෙහෙයවීමට අපොහොසත් වීමක් හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් යම් ආකාරයකින් රාජකාරී අත පසු කිරීමක් හෝ සිදු කර ඇද්දැයි පරීක්ෂා කිරීමට පොලිස්පතිට උපදෙස් දුනිමි. මින් අනතුරුව ගත යුතු ක්‍රියා මාර්ග හෝ විනය ක්‍රියා මාර්ග හෝ ඇතොත් ඒ සම්බන්ධව පොලිස්පති කටයුතු කරනු ඇත. මේ වාර්තාව සති දෙකක් තුළ -අද දින සිට සති දෙකක් තුළ- ලබා දෙන ලෙස මා පොලිස්පතිතුමාට දන්වා ඇත. මා මේ කාරණය පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සමඟත්, වෛද්‍ය ශිෂ්‍යයන්ගේ දෙමාපියන්ගේ සංගමය සමඟත්, තවත් පාර්ශ්වකරුවන් සමඟත් අද කතා කළා. එමෙන්ම, නිසි සැලසුමක් හා නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් සැකකරුවන් අත් අඩංගුවට ගැනීමට යෑම සම්බන්ධව සෑම පොලිස් නිලධාරියකුම ක්‍රියා කළ යුතු ආකාරය සඳහන් උපදෙස් චක්‍ර ලේඛනයක් පොලිස්පති මහින් නිකුත් කිරීමට මා විසින් දැනුවත් කරන ලදී.

අවසන් වශයෙන්, මෙම වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ කැඳවුම්කරු වන රයන් ජයලත් නමැති ශිෂ්‍යයා අත් අඩංගුවට ගැනීමට යාම හේතු කොටගෙන අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු රජය මෙන්ම පුරවැසියන්ට පොලිස් දෙපාර්තමේන්තුව මහින් යම් අපහසුතාවක් සිදුවීම සම්බන්ධයෙන් මා කනගාටුව ප්‍රකාශ කරමි.

---

* *ප්‍රස්තකාලයේ තබා ඇත.*
நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
Placed in the Library.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැනට අපි පැය භාගයක් ප්‍රමාද වී ඇති නිසා,-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු අමාත්‍යතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපට දීර්ඝ විවාදයක් ගෙන යාම අපහසුයි. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, දැනට අප පැය භාගයක් ප්‍රමාද වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, "පොලිස් දෙපාර්තමේන්තුවෙන් වැරැද්දක් සිදු වෙලා තිබෙනවා, ඒ ගැන අපි කටයුතු කරනවා." කියලායි ගරු ඇමතිතුමාගේ කථාව අවසන් කළේ. Does the Hon. Minister admit that the Organization of Professional Associations is the highest body of professionals of this country? In Colombo 07, your people entered in civilian clothes and tried to forcibly abduct Ryan. Former MP Mr. Lal Kantha and the GMOA officers saved this boy. Are you still trying to deny that those who were in civilian clothes were not police officers?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමාගේ කථාවේ පැහැදිලි කරන්නේ පොලිස් නිලධාරියෙක් පිළිබඳවයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
It is a very dangerous situation, Hon. Minister.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
He said that they were all police officers.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Hon. Minister, they have no right to enter and abduct a civil person.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
He said that they were all police officers. [*Interruption]*

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
No, not moral. What morals do you have when you abduct a person? - [*Interruption.*] Do not talk about morals. There are no morals - [*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. Minister explained that. Now I have to move on to the main items of the day.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I just want to clear this, so that there is an understanding. The Hon. Minister is inquiring, but we want to get an answer from the Hon. Minister.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, මගේ ප්‍රකාශයේ මම ඉතාම පැහැදිලිව එය සඳහන් කළා. ආයෙත් කියවලා ඒක තේරුම් ගන්න ඕනෑ නම්, එතුමාට මම මෙහි පිටපතක් යවන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබතුමා කිව්වා නේ. [බාධා කිරීම්] සම්පූර්ණයෙන් කියවන්න අවශ්‍ය වන්නේ නැහැ. අපටත් වෙලාවේ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු ඇමතිතුමා.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
එතුමාට කියවලා හොඳට තේරුම් ගන්න මම මෙය යවන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
குற்றச்செயல்களுக்குப் பலியாக்கப்பட்டோருக்கும் சாட்சிகளுக்குமான உதவி மற்றும் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்
ASSISTANCE TO AND PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES (AMENDMENT) BILL

"2015 අංක 4 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2017 අගෝස්තු මස 08 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

නීති අමෙච්චරුම් පුත්තසාසන අමෙච්චරුමානවරින් චාර්පාක මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක අවර්කළාල් සමර්ප්පික්කප්පට්ටදු.

2017 ඔකස්ට් 08, සෙව්වාය්ක්කිළමෙ මුදර්ච්චියාක වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙච්චාර් මේර්පාර්වෛක් කුළුවුක්කු ආට්රුප්පටුත්තප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෛයිටප්පට්ටදු.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Justice and Minister of Buddhasasana; to be read a Second time upon Tuesday, 8th August, 2017 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු හෙක්ටර් අප්පුහාමී මහතා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

සිඩ්නි ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
சிட்னி ஜயரத்ன மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SIDNEY JAYARATHNE FOUNDATION (INCORPORATION) BILL

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා.

"සිඩ්නි ජයරත්න පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙත පවරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒර්ට්රුක්කොළ්ළප්පට්ටදු.

ඉතන්පටි, චට්ටමූලම් මුතන්මුරෛ මතිප්පිටප්පට්ටු, අච්චිටප්පටක් කට්ටළෛයිටප්පට්ටදු.

චට්ටමූලම් නිලෛක්කට්ටළෛ ඉල. 47(5) ඉන්පටි සමූක වළුවූට්ටල් මර්ට්රුම් නලන්පුරි මර්ට්රුම් කණ්ඩි මරපුරිමෛකළ් අමෛච්චරුක්කු අරික්කෛ චෙය්යප්පටුතර්කාකච් චාට්ටප්පට්ටදු.

Question put, and agreed to.
Bill accordingly read the First time, and ordered to be printed.
The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Social Empowerment and Welfare and Kandyan Heritage for report.

විදේශ විනිමය පනත් කෙටුම්පත
வெளிநாட்டுச் செலாவணி சட்டமூலம்
FOREIGN EXCHANGE BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[2.36 p.m.]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

Hon. Speaker, I move,

"That the Bill be now read a Second time."

Hon. Speaker, our current law applicable to foreign exchange is the Exchange Control Act, No. 24 of 1953. Just after the World War II, many European countries brought in exchange control. The United Kingdom had exchange control from the start of the World War II. The whole European economy and many Asian economies were completely devastated and they would not have revived without the Marshall Aid Programme by the Americans. But at that time, Sri Lanka did not see it necessary to have an Exchange Control Act because we had sufficient reserves. In fact, we had enough reserves and during the war, we had built up our reserves thanks to our sale of rubber and tea, which were needed by the Allies, and at the end of World War II, as we became independent, our reserves were such that we gave a loan to the United Kingdom and the whole of the Gal Oya Scheme was totally financed by Sri Lankan resources. We did not have to go to the World Bank or to the Exim Bank or to anyone else.

But in 1953, we had a foreign exchange crisis when our earnings came down from rubber and tea. When commodity prices got affected and went up a bit high during the Korean War, our reserves came down and at that time the then Government brought in the Exchange Control Act. Actually the situation revived after 1953 and we were again on a good wicket, but nevertheless this was kept on. The Central Bank and the Finance Ministers after 1956 felt that this was a necessity.

There were also many doctrines of the socialist market where controls were felt necessary. Therefore, it became a habit. Then, Kaldor's Proposals and all that got built into our system and then we started liberalizing from 1977. Actually many other countries that started liberalizing after us have changed their law. They have amended the law or they have repealed the law. Only 47 countries have not moved away from the restrictive laws of foreign exchange control.

Now, we have a very peculiar system. On one hand, our law is to control foreign exchange. We talk of foreign exchange control, but if you look at the present

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

liberalization that has come through different regimes, whether it be from President J.R. Jayewardene, until today, every government has virtually liberalized it. So, our law and our regulations are at variance. What the law says is one thing and the regulations do something else. For instance, residents in Sri Lanka are permitted to accept foreign currency from non-residents against goods and services. A person who maintains a Foreign Exchange Earners Account is eligible to borrow in foreign currency. A person can take out and bring in to Sri Lanka any amount of foreign currency subject to declaration of Customs, if it exceeds US Dollars 10,000 and US Dollars 15,000 respectively. Now, a person can retain and possess foreign exchange up to US Dollars 10,000. A person can operate and maintain accounts outside Sri Lanka.

A person resident outside Sri Lanka can take out unutilized foreign currency throughout Sri Lanka. A person resident in Sri Lanka can make and receive payments to and from non-residents in relation to issuance and transfers of shares; purchase, transfer and make payments in respect to transactions related to Sri Lanka Rupee Denominated Treasury Bonds; make payments to or for credit of citizens of foreign states, corporate bodies incorporate outside Sri Lanka and foreign institutions in respect to Rupee Denominated Treasury Bills; purchase, transfer and make payments in respect of Sri Lanka Development Bonds; issue, transfer and make payments in respect to Unit Trusts operated with licences issued under the Securities and Exchange Commission; issue and transfer Sri Lankan Rupees Denominated Redeemable Preference Shares in a company to persons resident outside Sri Lanka; make payments in rupees to non-residents in respect to immovable property. Holders of NRFC, RFC, RNNFC and FECA can make payments outside Sri Lanka for any purpose. Residents to make payments in foreign exchange to persons resident outside Sri Lanka using credit/debit cards.

Then, we have also adopted the Articles of Agreement of the International Monetary Fund where we have to remove all foreign exchange restrictions related to current transactions. We have not done that in our law. We have made regulations. So, there is a contradiction here. If you are not controlling your exchange, why do you want to keep a law of which the objective is to control exchange and then have regulations? So, people do not have full confidence in Sri Lanka. So, that is one reason.

The other reason is regulation of gold. We really do not control gold. In 1981, the convertibility of USD to gold was ended. Then, finally in 2002, we said that in terms of Sections 5, 21 and 22 of the Exchange Control Act, for any person to buy, sell, import or export gold without any restriction must subject to the requirement that it has to be approved by the Director General of Customs. Then, in 2012, we specified that an import licence would be required for importation of gold and now it is not controlled by the Central Bank. Though the law has provision, it is controlled by Sri Lanka Customs. So, we have many contradictory provisions in the Exchange Control Act and that is why we have brought in a new law. The objective of the new law is to promote and regulate foreign exchange and we have repealed the Exchange Control Act; we call it the Foreign Exchange Act. What we have done by regulations, we have now enshrined by legislative provisions.

The key features of the new law are; the Central Bank of Sri Lanka is the agent of the Government and is responsible for implementing of the new law. So, now, as the agent of the Government, they manage foreign exchange. They need not control foreign exchange. Authorized dealers and restricted dealers, currently authorized to deal in foreign exchange, will continue to be subject to the provisions of the new law and the Central Bank. Every commercial bank, newly licensed or in operation, will continue as authorized dealers. A person resident in Sri Lanka having foreign exchange or foreign assets may use it for current or capital transactions. So, we have now liberalized the total of current account transactions.

Capital transactions will be defined by regulations and certain classes of transactions with the limits specified will be free of any control. Sri Lankan resident in Sri Lanka can play a role in the development of the country. If they have foreign exchange belonging to them outside the country, even if they have not declared it, they can bring it in. Because, today foreign exchange is not the luxury of a few rich people. A large number of people have money abroad. They may have earned 25,000 Dollars, 100,000 Dollars or 500,000 Dollars. They have kept the money which they have earned abroad. They have done transactions. Then, monies have, for over a period of time, being kept by people when they exported or imported. Now we want them to bring all these monies back into Sri Lanka.

At the moment, our interest rates are higher than that of most of the countries in which they are keeping that money. But, many of them do not like either to go through the exchange control procedure or to be labelled as a criminal. So, they are keeping the money in those countries. Therefore, what we have done is, we have given a concession to Sri Lankans to make use of this opportunity. They can remit up to US Dollars 1 million without having to pay a tax and above that, they have to pay only a remittance fee of one per cent. This is because we want the money in Sri Lanka for development. But we have excluded from this the monies coming under the Prevention of Money Laundering Act, Convention on the Suppression of Terrorist Financing Act or the Bribery Act. In addition, under the Bribery Act, if any person is convicted, all his monies and properties are forfeited. So, we have left those areas out. If an ordinary person has kept money and has not made a declaration, he could bring the money in. There are people who do transactions with Japan, buying vehicles and spare parts. There are a large number of people from Wennapuwa, Nattandiya and Harispattuwa who have got money outside the country. There are many people who have small accounts abroad. So, we will bring all that in. That is the whole purpose of this exercise.

But, we have given paramount importance to preservation of financial stability. So, if the Monetary Board says that there is a crisis coming up or there is a fear that there can be a shortage of foreign exchange, the Minister, with the approval of the Cabinet, can regulate or restrict the remittances of foreign exchange into Sri Lanka for a period not exceeding six months. What happens after that six months? Then, you get permission of Parliament and extend it to another six months. All we are saying is, this cannot be an administrative act; this must be done with the permission of Parliament because public finance has to be controlled by Parliament.

What have we done? Now, the control and restriction on foreign exchange, which was the objective of the Exchange Control Act, has been moved out and been replaced with management and monitoring of foreign exchange, but with provision for the Minister to act on the advice of the Monetary Board, if he feels certain controls have to be brought in.

Current accounts are fully liberalized and capital transactions are under Regulations approved by Parliament. We will have a more liberalized foreign exchange regime. We have to. The whole region is developing. As you know, in economic development, the real engine of growth is now coming into Asia and it will come to the Indian Ocean Region. Look at the growth that will take place in India, Pakistan, Bangladesh, Indonesia, Thailand, Malaysia, Singapore and the Middle East. So, with so much of money transactions taking place, we should be able to utilize it and benefit from it. We should not put any restrictions. Sri Lankans are going abroad. They are dealing with foreign exchange. So, we are having a more liberalized system while the Central Bank can monitor the actual foreign exchange that is being utilized by people and we have made it a civil penalty. In most parts of the world, once exchange control went out, it no longer became a criminal liability, but a civil penalty.

The worry that some Hon. Members have is, will there be a draw-off on our foreign exchange? No, it would not be there. I can certainly tell you that we do not anticipate it and at the moment, with our agreements with the IMF, we do have sufficient reserves. We have also had agreements with some of the other countries. In addition to it, in the next few months, I think within the next year, we will also be acquiring another US Dollars 1.1 billion to our own account when we do the transaction, while retaining and controlling the Hambantota Harbour, in case of terminal operations and common user facilities, we will be paid and we can set that off later on against our loans, but after using it first as a buffer. Later on, I hope, the Hon. Minister of Transport and Civil Aviation will also be bringing us some more money in regard to the Mattala Airport. So, we have the reserves at the moment to face a crisis.

Sir, I would commend to Parliament that we do pass this Bill and enable these transactions to take place, monies to be invested in Sri Lanka and the people of Sri Lanka to benefit in general. Thank you.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
ඛිනා එලුත්තියම්පප්පෙට්‍රත්තු.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. E. Saravanapavan. Before that, the Hon. Deputy Speaker will take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Though the Hon. E. Saravanapavan has been called upon to speak, he is not here. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා පළමුව කථා කරන්න. මම දෙවනුව කථා කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඔබතුමා කථා කරන්න වෙලාව ඉල්ලනවා, ඉල්ලනවා. දැන්නාම ඔබතුමා බැහැයි කියනවා.[බාධා කිරීමක්] හොඳයි, ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

[අ.භා. 2.50]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි. ඉස්සෙල්ලා කථා කරන්නේ කවුද කියන කාරණය එතරම්ම වැදගත් නැහැ. නමුත් මම හිතන විධියට මේ වෙලාවේ මගේ මිත්‍ර ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාට සූදානම් වීමට කාලයක් අවශ්‍ය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතින් අරමුණු කරන්නේ විදේශ විනිමය පාලනය ලිහිල් කිරීමකුයි. විදේශ විනිමය පාලනය ලිහිල් කරන්නේ ලංකාවට වැඩියෙන් විදේශ විනිමය ලබා ගන්නයි. විදේශ විනිමය පාලනය ඇති කරන්න සිද්ධ වුණේ විදේශ විනිමය ලංකාවෙන් පිටවී යාම සීමා කරන්නයි; ඒ පිළිබඳව යම් පාලනයක් පවත්වා ගැනීමටයි. මේ පියවර ගන්නේ "විනිමය පාලන පනත" සම්පූර්ණයෙන්ම ඉවත් කරලා, විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීමේ සහ විධිමත් කිරීමේ පනත් කෙටුම්පතක් හැටියට මේ පනත් කෙටුම්පත ගෙන ඒමටයි. ඒ සඳහා මේ ආණ්ඩුව තීන්දු කර තිබෙන්නේ අපේ ජංගම ගිණුම කැමැති පරිදි යම් විධියකට භාවිත කරන්නට ඉඩදීමේ නීතිය කාලයක් පැවතුණාට පසුවයි. ඒ නිසා Current Account මුදල් - ප්‍රාග්ධනය සම්බන්ධ මුදල්- නොවෙයි, ලංකාවේ සෙසු මුදල් කැමැති පරිදි භාවිත කරන්න; විදේශ මුදල් බවට හරවා ගන්න පුළුවන්කම තිබුණා. මේ නිසා ලංකාවේ විදේශ සම්පත් විශාල වශයෙන් වියදම් කර තිබෙනවා. අපි දන්නවා, අපි කවුරුත් කාටත් වුවමනා දේවල් වෙනුවෙන් මුදල් වියදම් කරන බව. මේ රටේ හැම

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

දෙනාටම වුවමනා කරන දේවල් ගෙන්වන්න විදේශ සම්පත් වැය කරන්න සිදු වී තිබෙනවා. ඒ විදේශ සම්පත් ප්‍රමාණය හැරුණුවිට ඉන් පසුව විදේශ සම්පත් වැය කිරීමේ අයිතිය පිළිබඳව තමයි මේ අහන්නේ. තමන් විසින් යම් යම් සේවා සපයලා, භාණ්ඩ සපයලා උපයා ගත් මුදල් තිබෙනවා නම්, විදේශ මුදල් වුවත් ඒවා තමන් කැමැති පරිදි, තමන්ගේ වුමනාවන් වෙනුවෙන් තමන්ට පාවිච්චි කරන්න පුළුවන්. මෙතැනදී තමන්ගේ වුවමනාවන් කිව්වාම, වුවමනාවන් මොනවාද කියලා කවුරුවත් නියම කරලා නැහැ. එවැනි තත්ත්වයක් යටතේ පසු ගිය කාලයේ ලංකාවෙන් කොපමණ මුදලක් පිටවී ගොස් තිබෙනවාද? කවුරු හරි අපට මේක කියනවාද? කොපමණ මුදලක් ලංකාවෙන් පිටවී ගොස් තිබෙනවාද? අපි හැම දෙනාටම වුවමනා කරන දේවල් වෙනුවෙන් ලංකාවේ කරන විදේශ සම්පත් වැය කිරීම හැරුණාම, යම් යම් පුද්ගලයන්ට තම තමන් අත තිබෙන මුදල් ප්‍රමාණය අනුව, ඒවා තමන්ට විදේශ විනිමය බවට හරවා ගෙන ගිහින් වියදම් කරන්න ලබා දුන් ඉඩ කඩ - [බාධා කිරීමක්] ඔව්, ගරු සුජීව සේනසිංහ මැතිතුමා, කියන්න.

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ නීත්‍යානුකූලව ගිය මුදල් සම්බන්ධයෙන් නේද?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඔව්, ඔව්. මම කියන්නේ නීත්‍යානුකූලව ගිය මුදල් ගැනයි.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට දත්තයක් දෙන්නම්. පසු ගිය අවුරුදු දහය තුළ නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ඩොලර් බිලියන -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒක මම දන්නවා. මගේ ළඟ Global Financial Integrity Report එක තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

A sum of US Dollars 10 billion has gone out of the country.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

I have the Report. I will be using it.

මම දැන් කියන්න හදන්නේ මේකයි. මේවායේ ගණනක්-මිම්මක් නැහැ. අතේ මුදල් තිබෙන හැටියට වියදම් කරනවා. Credit cards තිබෙනවා, මිලියන ගණනක. Credit card එක පිටරටට අරගෙන ගිහිල්ලා විදේශ මුදල් හැටියට ඒකෙන් වියදම් කරනවා. ඒ මුදල් මේ රටෙන් අරගෙන ගිය ඒවා නොවෙයි. එතකොට ඒ රට-රටවලට ගිහින් කරන ඒ වියදම්වලට ලංකාවෙන් මුදල් ගෙවන්න ඕනෑ. නමුත්, මේ විධියට වියදම් කරන උදවිය විදේශ මුදල් කොපමණ උපයනවාද?

අපේ කාන්තාවන් නැත්නම් අපේ පුරුෂයන් නොයෙක් විදේශ රැකියාවල යෙදිලා විදේශ මුදල් උපයනවා. ඒ අය මේ ලංකාවට විදේශ මුදල් අරගෙන එනවා. නමුත්, ලංකාවේ ඉන්නා මේ ධනවතුන් ටික ඒ විදේශ මුදල් වියදම් කරනවා. මේක තමයි ඇත්තටම සිද්ධ වෙලා තිබෙන්නේ.

මගේ ළඟ Global Financial Integrity Report එක තිබෙනවා. "Global Financial Integrity" කියන එක වොෂිංටන් නගරයේ තිබෙන සංවිධානයක්. අවුරුද්දකට නීති විරෝධීව ලංකාවෙන් පිටවෙලා යනවා, ඩොලර් බිලියන 1.99ක්. අවුරුද්දකට!

මේ ආණ්ඩුව බලයට පැමිණි හැටියේම මම යෝජනාවක් කළා. එවකට හිටපු මුදල් ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇසුවා. මේ වේලාවේ හිටපු මුදල් ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්න එක ගැන මම සතුටුයි. "විවිධ රටවල විවිධ බැංකු ගිණුම්වලවල, විවිධ ආයතනවල ලාංකිකයෝ කොපමණ මුදල් තැන්පත් කරලා තිබෙනවාද, මේ මුදල් ලංකාවෙන් ගෙන යන ලද්දේද, මේ මුදල්වලට නිසියාකාරව ලංකාවේ බදු ගෙවීම් කර තිබේද" කියලා මම ප්‍රශ්නයක් ඇහුවා. දැන් තිබෙන හැටියට එම මුදල් පිට කරගෙන යෑමට විරුද්ධව නීතියක් නැහැ. ඒ නිසා දොර ඇරලා තිබෙන්නේ; මුදල් පිට කරගෙන යන්න පුළුවන්. මම ඒ ප්‍රශ්නය අහන වේලාවේ ඒ දොර ඇරලා තිබුණේ නැහැ. මම අපේ හිටපු මුදල් ඇමතිතුමාගෙන් ඇහුවා, "ඒ රටවල බැංකුවල ලාංකිකයන්ගේ මුදල් කොපමණ තිබෙනවාද කියලා රාජ්‍ය තාන්ත්‍රිකව අපි ඒ හැම රටකින්ම විමසමුද?" කියලා. එතුමා මට කිව්වා, "ඔව්, ඔව්. ඒක හොඳ අදහසක්. අපි ඒ ගැන පියවරක් ගන්නම්" කියලා. ඒ අනුව, මම නැවත හය මාසයක් විතර ගියාට පසුව ඇහුවා, "ඒ සම්බන්ධව ගත්ත පියවර කුමක්ද?" කියලා. එතුමා මට කිව්වා, "අපේ මහ බැංකුවේ විදේශ මුදල් නීති පිළිබඳ බුද්ධි අංශයක් තිබෙනවා. ඒ බුද්ධි අංශයට සම්බන්ධව අපි යම් නීති - රීති හදා ගන්න වුවමනායි" කියලා. මම කිව්වා, "නීති රීති හදන්න යන්න ඕනෑ නැහැ, අපේ රාජ්‍ය නායකයන් කැබිනට් මණ්ඩලයේදී තීරණයක් අරගෙන, 'අපේ රටේ අයගේ මුදල් ඔබේ රටේ කොපමණ තිබෙනවාද කියලා සොයා ගැනීමට අපට උදව්වෙන්නය' කියලා ඒ හැම රටකටම රාජ්‍ය තාන්ත්‍රිකව දැන්වුවොත්, මේක හොයා ගන්න පුළුවන් වෙයි" කියලා. නමුත් අවසාන වශයෙන් ඒකට ප්‍රතිඵලයක් ලැබුණු බව නම් මම දැන ගත්තේ නැහැ. එවැනි රාජ්‍ය තාන්ත්‍රික ඉල්ලීමක් කරපු බව දැන ගන්න ලැබුණේත් නැහැ. නමුත් මම දන්නවා, මුදල් තිබෙනවාද කියලා දැන ගැනීමට ඩුබායිවලට නම් නීතිවේදීන් සහිත කණ්ඩායමක් ගිය බව.

ගරු රවි කරුණානායක මැතිතුමනි, ඔබතුමා ඒ ගැන යමක් කියන්න කැමැතිද? ඔබතුමා යමක් කිව්වොත් හොඳයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විගසම අගමැතිතුමා අපට කිව්වා, ඔබතුමාගේ ඉල්ලීම සම්බන්ධයෙන් සොයා බලා තොරතුරු ලබා ගන්න කියලා. අපි ඒ ගැන පැනමා රටට ලිව්වා; ස්විට්සර්ලන්තයට ලිව්වා; ඩුබායි රටට ලිව්වා. නමුත් ඒ ගොල්ලන් කිව්වේ, රටේ නීතියක් ඇති කරලා තමයි මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න පුළුවන් වෙන්නේ කියලා. ඒකයි තිබුණු ලොකුම ප්‍රශ්නය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ කියන්නේ, ඒ ගොල්ලන්ගේ රටවල පවතින නීති මඟින් ඒවායේ රහස්‍යභාවය ආරක්ෂා කරලා තිබෙනවා, ඒක නිසා ඒවා ගැන අපට කියන්න බැහැ කියන එකයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එක විධියකින් ඒක තමයි ලැබුණු උත්තරය.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
නමුත් මම කියන්නේ රාජ්‍ය තාන්ත්‍රිකව ඒ ඉල්ලීම කළේ නැහැ කියන එකයි. මම එහෙම කියන්නේ, අපේ විදේශ ඇමතිතුමා හරහා එබඳු ඉල්ලීමක් ලෝකයේ කිසිම රටකට කරලා නැති නිසා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක කළේ මම මුදල් ඇමති වශයෙන් සිටි අවස්ථාවේදී. ඔබතුමා මේ ප්‍රශ්නය අහලා මාස 18ක් වෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඔව්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අහපු එකට උත්තර දුන් රටවල් තුන ගැන තමයි මම කිව්වේ. ඒ අවස්ථාවේදී ඒ ගොල්ලන් කිසිසේත්ම උදව්වක් - [බාධා කිරීමක්] වුණේ නැහැ. මොකද, ඒ ගොල්ලන්ගේ රටවල මුදල් එකතු කිරීමක් තමයි තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක තමයි මම මේ කියන්නේ. අපි විතරයි අපේ මුදල් එකතු කරනවා වෙනුවට පිට වෙලා යන්නට අවශ්‍ය කරන දොරවල් ඇරියේ. ඒකයි මාත් කියාගෙන ආවේ. ඒ නිසා තමයි අපේ රටින් නීතියට පිටින් අවුරුද්දකට ඩොලර් බිලියන 1.99ක් පිටවෙලා යන බව කියන්නේ.

දැන් මේ පනත් කෙටුම්පතින් ඉඩ දෙනවා, ලංකාවට මුදල් අරගෙන එන්න. හැබැයි, නීති විරෝධීව, ඒ කියන්නේ විශුද්ධිකරණය, එසේ නැත්නම්-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඔබතුමා පිළිගන්නවාද පසු ගිය ආණ්ඩු කාලයේ තමයි වැඩිම ප්‍රමාණයක් මුදල්,- [බාධා කිරීමක්]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු මන්ත්‍රීතුමනි, ඒක රීති ප්‍රශ්නයක් නම් මම උත්තර දෙන්නම්. රීති ප්‍රශ්නයක් නොවෙයි නම්-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
-ගරු මන්ත්‍රීතුමා රීති ප්‍රශ්නය කියන්නේ මොකක්ද කියලා ස්ථාවර නියෝග අනුව බලන්න.

ස්ථාවර නියෝග අනුව නේ මෙතැන අපි විවාද කරන්නේ. එහෙම නැතිව ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමාගේ නීතිය අනුව නොවෙයි නේ. [බාධා කිරීමක්] ඒ ගැන පැටලෙනවාට වඩා මම කියන්න හදන්නේ මේකයි.

එදා මේ රටින් පිට වෙලා ගිය මුදලුත් එක්ක තමයි මම මේ කථා කරන්න හදන්නේ. මේ මුදල් කාගේද කියලා බැලුවොත්, මේ මුදල්වලින් වැඩි පංගුවක් තමුන්නාන්සේලාගේ අයගේ. මේ මුදල් විශුද්ධිකරණයෙන් ගත්ත මුදල් නොවිය යුතුයි. මේ මුදල් ලංකාවේ මුදලක් විදේශ මුදල්වලට හරවපු මුදල් නොවිය යුතුයි. මේ මුදල් අල්ලස් නඩුවකට සම්බන්ධ වූ, එවැනි හේතු නිමිත්තකට අනුව සොයා ගත් මුදල් නොවිය යුතුයි. මේ මුදල් ත්‍රස්තවාදයෙන් උපයා ගත් මුදල් නොවිය යුතුයි. නමුත්, කවුද මේවා ගැන සොයන්නේ? මේවා කොහොම ලැබුණු මුදල්ද කියලා කවුද අන්තිමට වාර්තා කරන්නේ? අපි දන්නවා, යම් යම් ගිණුම්වලට, යම් යම් අයගේ නම්වලට මුදල් ප්‍රේෂණය කර තිබෙන බව. ඒ මුදල් -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසාන වෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ මුදල් ප්‍රේෂණය කරනකොට ඒ මුදල්වල උත්පත්තිය මොකක්ද කියලා කවුද බලන්නේ? ඒ නිසා මේ ඔක්කොම තුළින් නිකම් බොරු මැවීමක් තමයි මේ කරන්නේ.

අද බනිජ තෙල් සංස්ථාවේ සේවකයෝ විරෝධතාවයක් කරනවා. [බාධා කිරීම්] මොකක්ද මේ විරෝධතාවයේ තේරුම? ඒ අය විරෝධතාව කරන්නේ ලංකාවේ තෙල් ටැංකි ටික බෙරාගන්නයි. ඒ මොකටද? මේ රටේ විදේශ සම්පත් රැක ගන්නයි. අපි Bunkering වලින් කොච්චර මුදල් හොයනවා ද? Bunkering කියන්නේ මොනවාද කියලා දන්නවාද? Bunkering කියන්නේ නැව්වලට තෙල් සැපයීම. නැව්වලට තෙල් සැපයීම මඟින් අපේ බනිජ තෙල් නීතිගත සංස්ථාව එදා සොයාගත් මුදල් ප්‍රමාණය චන්ද්‍රිකා මැතිනිය ජෝන් කිල්ස්ලාට පාවා දුන්නා. මම නඩුවක් දාලා ඒ ගනුදෙනුව අවලංගු කෙරෙව්වා. අද බනිජ තෙල් සංස්ථාවේ කම්කරුවෝ මේ සටන කරන්නේ මේ රටේ විදේශ සම්පත් බේරා ගන්නයි. එම නිසා විශේෂයෙන් අද මෙවැනි පනත් කෙටුම්පතක් සම්මත කරන වෙලාවේ ඒ සටනට පාර්ලිමේන්තුවේ අපි සහයෝගය දෙන්න ඕනෑය කියමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු දයා ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.03]

ගරු දයා ගමගේ මහතා (ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Primary Industries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් අපි රටට කරලා තිබෙන්නේ විශාල යහපතක්. ඇත්තටම අද වෙන රටවල මේ ආකාරයට විදේශ විනිමය පාලනයක් කෙරෙන්නේ නැහැ. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාම කිව්වා, අපේ රටේ ඩොලර් බිලියන 1.99ක් "හවාලා" ක්‍රමයට නීති විරෝධී ලෙස අපේ රටින් පිට කරනවා; ඒ වාගේම අපේ රටට එනවා කියලා. අද ඕනෑම කෙනෙකුට ඕනෑම මුදල් ප්‍රමාණයක් පිට රටට ගෙනියන්න ඕනෑ නම්, ඒ මුදල ඕනෑම රටකදී ලබා දෙන නියෝජිතයන් ඉන්නවා. ඒ වාගේම වෙන රටවලින් මුදල් මේ රටට ගෙනෙන්නත් නියෝජිතයන් ඉන්නවා.

අද අපේ රටේ ශිෂ්‍යයන් විශාල පිරිසක් පිටරට විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නවා. සමහරවිට ඒ දෙමව්පියෝත් නීති විරෝධී ලෙස තමයි ඒ දරුවන්ට ඒ රටවලට මුදල් යවන්නේ. මේ ක්‍රියාව නීත්‍යානුකූල කරන්න තමයි අද මෙම පනත් කෙටුම්පත අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

අපට අද ඇත්තටම අවශ්‍ය කර තිබෙනවා, පිට රටවල ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ගේ මුදල් අපේ රට ගෙන්වා ගන්න. ඒ ගොල්ලන් වෙනත් රටවල ඩොලර්වලින් මුදල් තැන්පත් කළාට ඒවාට හම්බ වන්නේ ඉතාමත්ම අඩු පොලියක්. ඒ නිසා අපි ඒ අයට ලංකාවේ එම පහසුකම් සලසා දුන්නොත්, ශ්‍රී ලාංකිකයන්ගෙන්ම විශාල මුදලක් අපේ රටට ගෙන්වා ගන්න අපට පුළුවන්. සමහර වෙලාවට බොහෝ අයට ලොකු භයක් තිබෙනවා, ලංකාවේ මුදල් ආයෝජනය කළාම income tax එක ඒ ගොල්ලන්ගේ පස්සෙන් එළවයිද කියලා. එහෙම නැත්නම්, ඒ ගොල්ලන්ගේ ගෙවල්වල ඉන්න උදවියගේ පස්සෙන් එළවයිද කියලා. මොකද, මේ සම්බන්ධයෙන් වූ නීති බැලුවාම හිරබත් කන්න තරම් වූ නීති තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හා සම්බන්ධ සිද්ධියක් මට මේ අවස්ථාවේදී මතක් වනවා. මම එදා ගුවන් යානයක් මිලදී ගෙන ඒ සඳහා අපේ pilotsලා train කළා. මම හිතන්නේ ඇමෙරිකාවේදී pilotsලා train කරන්න මිලියන 30ක් පමණ අපි ඒ අවස්ථාවේ වියදම් කළා. ඒ වාගේම ගුවන් යානයට අපි මිලියන 200ක් පමණ වියදම් කළා. මේ ඔක්කෝම මුදල් අපි පිට රටට යැව්වාට පස්සේ එදා තිබුණු ආණ්ඩුවෙන් මේ ගුවන් යානය ලංකාවට ගේන්න අපට ඉඩ දුන්නේ නැහැ. නමුත්, ඒ ගුවන් යානය ලංකාවට ගෙනාවේ නැත්නම් මාව හිරහාරයට ගන්න පුළුවන්කමක් තිබුණා, එදා පැවැති නීතිය අනුව. ඒ ආකාරයට දේශපාලන පළිගැනීම් පවා සිදු කරන්න එදා පැවැති රජයේ හිටපු උදවිය ක්‍රියා කළා. ඒ අවස්ථාවේ මම උසාවියට ගිහිල්ලා නියෝගයක් ගත්තා, එම ගුවන් යානය වෙනත් රටක පියාසර කරවන්න අපට පුළුවන් වන ආකාරයට.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
රට කුමක්ද?

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ඇමෙරිකාව.

ඇත්තටම පුදුම විධියට ව්‍යාපාරිකයන්ට විශාල හානි සිදු කරන තත්ත්වයක් තමයි එදා තිබුණේ. දැන් මේ සම්බන්ධ නීති පුළුවන් තරම් ලිහිල් කරලා රටට විශාල ආයෝජනයක් ගෙන ඒමයි අපි බලාපොරොත්තු වන්නේ. මොකද, ඇත්ත වශයෙන්ම කියනවා නම්, මේ අවස්ථාව රටට මුදල් අවශ්‍ය කරන අවස්ථාවක්. මේ අවස්ථාවේ දී අපේ රටට අවශ්‍ය කරන්නේ ආයෝජනයන්. මොකද, මේ අවස්ථාව වනකොට විශාල ණය ප්‍රමාණයක් අපි ලබාගෙන තිබෙනවා. ඉදිරියේ දීත් අපට විශාල ණය ප්‍රමාණයක් අවුරුද්දෙන් අවුරුද්ද-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මගේ මේ ප්‍රශ්නයටත් උත්තර දෙන්න කියලා මා ඉල්ලනවා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ඔව්, ගරු මන්ත්‍රීතුමා අහන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ලංකාවට මුදල් ගෙන ඒමට කිසිම බාධාවක් තිබුණේ නැහැ නේ? ලංකාවෙන් මුදල් පිටට ගෙන යන එකට නේ නීතිය තිබුණේ?

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

දැන් ඔබතුමාම කිව්වා නේ, ඩොලර් බිලියන 2ක් අවුරුද්දකට නීති විරෝධීව මේ රටින් පිට වනවා කියලා. එතකොට මේ නීති විරෝධී ලෙස පිට වන මුදල නීත්‍යානුකූල ආකාරයට පිට කරන්න නොහැකි වීමට තිබෙන හේතුව මොකක්ද? ඒ වාගේම ඕනෑම කෙනෙකු අපි-

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කළු සල්ලි කොහොමද නීත්‍යානුකූලව පිට කරන්නේ?

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

කළු සල්ලි නීත්‍යානුකූලව පිට කරනවා නම්, බදු ගෙවා තමයි පිට කරන්න ඕනෑ. දැන් ඇත්ත වශයෙන්ම කියනවා නම්, ඕනෑම කෙනෙකු හම්බ කරපු මුදල් ඒ අයට පෙන්වන්න පුළුවන්. එතකොට ඒ අය බදු ගෙවා තිබෙන්නේ. අද සිදුවෙලා තිබෙන්නේ මොකක්ද? රජයට බදු ගෙවන්නේ නැතිව සමහර උදවිය කරන දේවල් අද නීත්‍යානුකූලව බදු ගෙවා කරන්න පුළුවන්. කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ මුදල් බැංකුවේ deposit කළාම ඒ මුදල් බැංකුවේ තිබෙනවා. ඉන්දියාවේ ඒක කළේ වෙන ක්‍රමයකට. ඉන්දියාවේ කළේ, මුදල්-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමාට තව විනාඩියයි තිබෙන්නේ. ඔබතුමාගේ කථාවට බාධා කරන්න අවසරයක් දෙනවාද? ගරු අනුර දිසානායක මැතිතුමා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ඒ විනාඩිය මට දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම බැහැ.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
එහෙම නම්, එතුමාගේ වෙලාවෙන් ගන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කැබිනට් මණ්ඩලය නියෝජනය කරන ගරු අමාත්‍යවරයෙකු කියනවා, කළු සල්ලි වුවත් -ඒ කියන්නේ නීත්‍යානුකූල නොවන මාර්ගයෙන් උපයා ගන්නා ලද මුදල් වුණත්- යම් බදු ගෙවීමකට ලක් කරනවා නම්, එය නීත්‍යානුකූලව ගෙන යා හැකියි කියලා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
නැහැ, නැහැ, ඔබතුමා කියන එක වැරැදියි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කළු සල්ලි කියන්නේ ඒක.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ඔබතුමා ඒක වැරැදි විධියට කියන්න එපා. මම එහෙම කිව්වේ නැහැ. මම එහෙම කිව්වාද කියලා බලන්න. ඔබතුමා ගිහිල්ලා බලන්න. නීත්‍යානුකූල නොවන විධියට- [බාධා කිරීමක්] මම කිව්වේ බදු ගෙවා රටේ මුදල් යවන්න පුළුවන් කියලායි. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයටයි මම උත්තරය දුන්නේ. අපේ රටෙන් ඕනෑ තරම් මුදලක් පිට රටට ගෙන යන්න පුළුවන්ද කියලා මගෙන් ඇහුවා. මම කිව්වා, "ඔව්, බදු ගෙවා ගෙන යන්න පුළුවන්" කියලා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
එතකොට ඇහුවා, කළු සල්ලි ගෙනියන්න පුළුවන්ද කියලා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
කළු සල්ලි නොවෙයි. මම එහෙම කිව්වේ නැහැ. ඔබතුමා හැන්සාඩ් වාර්තාව බලන්න.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Declare නොකරපු සල්ලි. කළු සල්ලි නොවෙයි.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
එතුමා අහපු ප්‍රශ්නයට මම උත්තරය දුන්නේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලාට මේ ආකාරයට කථා කරන්නට දෙයක් නැහැ. ඇත්ත වශයෙන්ම මේ මහ ලොකු දෙයක් කරලා නැහැ. හොඳ දේට හොඳයි කියලා කියන්න. [බාධා කිරීමක්] අපි බදු ගෙවලා තිබෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අනෙක් මන්ත්‍රීවරුන් 224 දෙනාටම වඩා මම බදු ගෙවලා තිබෙන බව කියන්නට කැමැතියි. ඒක නිසා තමුන්නාන්සේලා ඒක ගැන කථා කරන්නට එපා. අපි බදු ගෙවලා තමයි ව්‍යාපාර කරගෙන යන්නේ. බොහොම ස්තුතියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය වෙනුවෙන් පැහැදිලි කිරීමක් තිබෙනවා. මේ පනත් කෙටුම්පත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට යටත්, ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතට යටත්. [බාධා කිරීමක්] නැහැ, මම කියන්නේ මේ පනත් කෙටුම්පත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතට යටත් කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ විවාදය මැද විවාද ඇති කර ගන්නට බැහැ. අපි ඊළඟ කථික මන්ත්‍රීවරයාට අවස්ථාව දෙන්නට ඕනෑ. The next speaker is the Hon. S. Shritharan.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය පැන නඟින්නේ ගරු ඇමතිතුමා කිව්වා කළු සල්ලි වුණත්-

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
නැහැ, නැහැ. එහෙම කිව්වේ නැහැ. ඒක වැරැදියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. S. Shritharan.

[பி.ப. 3.10]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வெளிநாட்டுச் செலாவணிச் சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்திலே கலந்துகொண்டு பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்தமைக்காக முதலில் நன்றியைத் தெரிவித்துக்கொண்டு, இன்றைய விவாதப் பொருளுக்குள் நுழைய விரும்புகின்றேன். இந்த நாட்டுக்குப் பல்வேறு வழிகளில் அந்நியச்செலாவணி கிடைக்கின்றது.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Daya Gamage, would you like to clarify something? දැන් ඔබතුමාගේ කථාව ඉවරයි.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
Please give me a few minutes.

අපේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කියනවා නම් මගෙන් එහෙම දෙයක් කියැවුණා කියලා, ඒක නිවැරදි කරන්න. මොකද, එහෙම දෙයක් නොවෙයි එයින් මම අදහස් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කොහොම වුණත් ගරු අගමැතිතුමා මේ ගැන පැහැදිලිව යමක් කිව්වා නේ. Hon. S. Shritharan, you may continue.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
இந்த நாட்டுக்குப் பல்வேறு வழிகளிலே கிடைக்கின்ற அந்நியச்செலாவணி தொடர்பாகப் பல்வேறுபட்ட கருத்துக்கள் முன்வைக்கப்பட்டு வருகின்ற இந்த நேரத்தில், கடந்த 22ஆம் திகதி சனிக்கிழமை மாலை நேரம், யாழ்ப்பாணம் நல்லூர் கந்தசுவாமி ஆலயத்துக்குப் பின்னாலுள்ள கோவில் வீதியில் வைத்து யாழ். மேல் நீதிமன்ற நீதிபதி மாணிக்கவாசகர் இளஞ்செழியன் அவர்களைச் சுட்டுக்கொல்வதற்கான முயற்சியொன்று மேற்கொள்ளப்பட்டது பற்றி நான் குறிப்பிட வேண்டும். இன்று யாழ். மாவட்டத்தில் பெருமளவு இராணுவம் குவிக்கப்பட்டிருக்கின்ற நிலையில், பொலிஸாரினதும் கடற்படையினரினதும் பாதுகாப்பு இருக்கின்ற நிலையில், துப்பாக்கிதாரி ஒருவர் நீதிபதியொருவரைக் கொலைசெய்வதற்கு முயற்சி மேற்கொண்டது எவ்வாறு? என்பதை நாங்கள் பலத்த சந்தேகத்தோடு பார்க்கவேண்டியிருக்கிறது. நாங்கள் இந்தச் சம்பவத்தை மிகவும் வன்மையாகக் கண்டிருக்கிறோம்.

நீதிபதி மாணிக்கவாசகர் இளஞ்செழியன் அவர்கள் யாழ். மாவட்டத்தில் நடந்த பல குற்றச் செயல்களுக்கு அளித்த நேர்மையான, நேர்த்தியான தீர்ப்புகளினூடாக அங்கு அவற்றை முடக்குவதில் பாரிய பங்கினை ஆற்றிவந்தார். அதுமாத்திரமன்றி, யாழ்ப்பாணத்திலே பொலிசாராலும் பல்வேறுபட்ட இராணுவக் குழுக்களாலும் உருவாக்கப்பட்ட வாள்வெட்டுக் குழுக்களைக் கட்டுப்படுத்துவதில்கூட அவர் தன்னுடைய பங்களிப்பைச் செலுத்தியிருந்தார். இதனைவிட, இப்பொழுது அங்கு நடைபெற்று வருகின்ற மாணவி வித்தியாவினுடைய கொலை வழக்கானது யாழ்ப்பாண மண்ணில் மட்டுமல்ல, உலகம் பூராவும் பேசப்படுகின்ற ஒரு வழக்காக இருக்கின்றபொழுது, அந்த வழக்கிலே முக்கிய பாத்திரத்தை வகிக்கின்ற இளஞ்செழியன் அவர்கள் ஏன் குறிவைக்கப்பட்டிருக்கிறார்? என்ற கேள்வி எழுகின்றது.

இதேவகையில், முன்னர் யாழ்ப்பாண மண்ணிலே இரண்டு பல்கலைக்கழக மாணவர்கள் பொலிசாரால் சுட்டுக் கொல்லப்பட்டார்கள். இந்நிகழ்வு இடம்பெற்று இன்று ஒரு வருடமும் மூன்று மாதங்களும் ஆகின்றன. அதேபோல, அண்மையில் வடமராட்சியிலே ஒரு 'கென்டர்' வாகனத்தில் மணல் ஏற்றிச்சென்ற வடமராட்சியைச் சேர்ந்த ஓர் இளைஞன் பொலிசாரால் சுட்டுக் கொல்லப்பட்டிருக்கிறார். அந்த மண்ணிலே ஏன், இவ்வாறான செயல்கள் நடக்கின்றன? 2009ஆம் ஆண்டுக்குப் பிற்பாடு அங்கே ஆயுதங்கள் இல்லை, எந்த வன்முறையும் இல்லை. இத்தகைய ஒரு சூழலில், துப்பாக்சிச் சத்தங்கள் கேட்காத ஒரு நிலையில், நீதியை நிலைநாட்டுகின்ற ஒரு நீதிபதியின் மீதான இந்தத் தாக்குதல் மிகவும் வன்மையாகக் கண்டிக்கப்பட வேண்டியதாகும். இவ்வாறு நீதித்துறையினர் மீதே தாக்குதல்கள் நடக்குமென்றால், இந்த நாட்டிலே நீதி எவ்வாறு செயற்படப்போகின்றது? அந்த மக்களுக்கான நீதி எவ்வாறு கிடைக்கப்போகின்றது?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டிலே பாதுகாப்பு யாருக்குத் தேவை? இந்த நாட்டிலே இருக்கின்ற மக்கள் தங்களுடைய எதிர்காலம் பற்றிச் சிந்தித்துக்கொண்டிருக்கின்ற இந்த நேரத்தில் அவர்களுக்குச் சரியான பாதுகாப்பைக் கொடுக்கக்கூடிய நீதிமன்றங்களே இன்று கேள்விக்குட்படுத்தப்பட்டிருக்கின்றன. இலங்கையின் சட்ட நியாயாதிக்கங்கள் தனிப்பட்டவர்களுடைய கைகளுக்குச் செல்கின்ற ஒரு சூழல் உருவாகியிருக்கிறது. அந்த சட்ட நியாயாதிக்கமும் நீதித்துறையும் கேள்விக்குட்படுத்தப்பட்டிருக் கின்றது. இந்தச் சூழலில் யாழ்ப்பாணத்தில் இடம்பெற்ற இளஞ்செழியன் மீதான தாக்குதலானது, அசௌகரியத்தை ஏற்படுத்திய விடயமாகப் பார்க்கப்படுகின்றது. அந்த மக்கள் கொதித்துப்போயிருக்கிறார்கள். இன்றைய தினத்திலும்கூட வடக்கு மாகாணத்தின் பல்வேறு பகுதிகளில் இளஞ்செழியன் மீதான தாக்குதலைக் கண்டித்து மக்கள் தங்களுடைய உணர்வுகளைப் போராட்டங்களூடாக, அடையாளப்படுத்தல் களூடாக வெளிப்படுத்தியிருக்கிறார்கள். இன்று அந்தச் சந்தேக நபர் சரணடைந்ததாகச் சில தகவல்கள் தெரிவிக்கின்றன. அவர் கைது செய்யப்பட்டாரா அல்லது சரணடைந்தாரா என்பது தெரியவில்லை. ஆனால், அவ்வாறான சில செய்திகள் வெளிவருகின்றன. இந்த நாட்டில் சரியான முறையில் நீதி நிலைநாட்டப்பட வேண்டும்; நடந்த பல்வேறுபட்ட சம்பவங்களுக்கு நீதி கிடைக்க வேண்டும். இதனைத்தான் நாங்கள் பல ஆண்டுகளாகக் கேட்டு வருகின்றோம்.

குறிப்பாக, காணாமலாக்கப்பட்ட ஆட்கள் பற்றிய விசாரணைகளை மேற்கொள்வதற்கான அலுவலகம் அமைத்தல் தொடர்பான சட்டமூலத்தில் ஜனாதிபதி அவர்கள் அண்மையிலே ஒப்பமிட்டிருக்கிறார். அதற்கான அலுவலகத்தை அமைப்பதற்கான செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு வருகின்றன. கிளிநொச்சி, மருதங்கேணி, முல்லைத்தீவு, வவுனியா, திருகோணமலை ஆகிய பிரதேசங்களிலுள்ள மக்கள் வலிந்து காணாமலாக்கப்பட்ட தங்களுடைய உறவுகளுக்காகத் தொடர்ந்தும் போராடிக் கொண்டிருக்கின்றார்கள். ஆனால், அரசாங்கம் பராமுகமாக இருக்கின்றது. இந்த நாட்டிலே பாதிக்கப்பட்ட ஒரு தேசிய இனம், நீதி கேட்டு 150 நாட்களுக்கும் மேலாகப் போராடிக்கொண்டிருக்கின்றபொழுது அதனைக் கண்டும் காணாததுபோல், ஒன்றும் தெரியாததுபோல் நடித்துக் கொண்டிருக்கின்ற அரசினுடைய செயற்பாடானது மிகமிக வெட்கித் தலைகுனியக்கூடியதாக இருக்கின்றது. மிக முக்கியமாக இது மக்களுடைய பிரச்சினை! அந்த மக்கள் இந்த

நாட்டிலே தொடர்ந்து போராடுகின்ற ஒரு சூழலில், அவர்களுடைய கண்ணீர்க் கதைகளுக்கு இதுவரை அரசாங்கத்தால் ஒரு நியாயத்தைச் சொல்ல முடியவில்லை.

அண்மையிலே கேப்பாப்புலவுக்குச் சென்ற அமைச்சர் சுவாமிநாதன் அவர்கள் அங்கேயிருந்த மக்களுடைய சொந்தக் காணிகளைப் பற்றிப் பேசாமல், இராணுவம் காட்டுகின்ற காடுகளில் எங்கேயோ ஓரிடத்திலே கொண்டுபோய் அவர்களைக் குடியேற்றுவதற்கு முனைந்திருக்கிறார். அவர்கள் 104 நாட்களுக்கும் மேலாகப் போராடிக்கொண்டிருக்கின்ற பொழுது, அந்தக் காட்டை அவர்களுடைய காணியாகக் காட்ட அவர் முயற்சித்திருக்கிறார். இப்படியாக இந்த நாட்டிலே மக்களை ஏமாற்றுகின்றார்கள். போராடுகின்ற அந்த மக்களுடைய சிந்தனைகளை வேறு திசைகளுக்குக் கொண்டுசெல்கின்ற நடவடிக்கைகளாகவே இவை அமைந்திருக்கின்றன.

அதனைவிட, இரணைதீவுக்கு வருகைதந்த பாதுகாப்பு இராஜாங்க அமைச்சர் அவர்கள் இரண்டு வாரங்களில் அந்த மக்களின் பிரச்சினைக்கு ஒரு முடிவு சொல்லவதாகக் குறிப்பிட்டிருந்தார். ஆனால் இன்றுவரை அந்த மக்கள் தங்களுடைய சொந்த நிலங்களுக்குச் செல்வதற்காக ஏங்கிக் கொண்டிருக்கின்றார்கள். இதுவரை எந்த முடிவும் அந்த மக்களுக்கு வழங்கப்படவில்லை. இந்த நாட்டிலே புரையோடிப் போயிருக்கின்ற பல்வேறுபட்ட பிரச்சினைகள் இவ்வாறு கிடப்பிலே போடப்பட்டிருக்கின்றன.

இங்குள்ளவர்களால் அந்நியச்செலாவணி பற்றிப் பேசப்படுகின்றது. அந்நியச்செலாவணி இந்த நாட்டுக்குள்ளே எப்படி வருகின்றது? இந்த நாட்டிலிருந்து வேறு நாடுகளுக்கு எவ்வாறு செல்கின்றது? என்றெல்லாம் பேசப்படுகின்றது. ஆனால், இந்த நாட்டிலே இருக்கின்ற மக்களுடைய இந்தப் பிரச்சினைகள் பற்றிப் பேசப்படுவதில்லை. இரணைதீவு மக்கள் தங்களுடைய சொந்த நிலத்திற்குச் சென்று தங்களுடைய வாழ்வாதாரச் செலாவணியைச் சேர்ப்பதற்கு, தங்களுடைய வாழ்க்கையைக் கொண்டுநடத்துவதற்கு இந்த அரசாங்கத்தால் ஏன், ஒரு வழியைத் தேட முடியாதிருக்கின்றது? கௌரவ பாதுகாப்பு இராஜாங்க அமைச்சர் ருவன் விஜயவர்தன அவர்கள் இங்கிருக்கின்றார். இரணைதீவு மக்கள் தங்களுடைய வாழ்க்கையை, தங்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காகச் சொந்த இடத்திற்குச் செல்வதற்குக் கேட்கின்றார்கள். கௌரவ அமைச்சர் அவர்கள் அங்கு வருகைதந்து, அதற்கு இரண்டு வாரங்களில் முடிவு சொல்வதாகக் கூறியிருந்தார். ஆனால், இரண்டு மாதங்களைக் கடந்தும் இதுவரை அந்த மக்கள் தொடர்பில் எந்த முடிவுகளும் எட்டப்படவில்லை. இவ்வாறான ஒரு சூழல் நீடித்துக்கொண்டே இருக்கின்றபொழுது, இந்த நாட்டிலே வாழ்கின்ற ஒரு மக்கள் தொகுதியினர் -

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)

(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

Hon. Member, I actually spoke to His Excellency the President about this issue. He has directed his Coordinating Secretary, now to liaise with me to sort out the issue in Iranaithivu. Today I spoke to the Hon. Mavai S. Senathirajah as well. We will soon speak to you. We will have a meeting and try to solve this matter out as fast as possible.

ගරු එස්. ශ්‍රීතරන් මහතා

(மாண்புமிகு சி. சிறீதரன்)

(The Hon. S. Shritharan)

கௌரவ பாதுகாப்பு இராஜாங்க அமைச்சர் அவர்களே, உங்களுடைய இந்த முயற்சியை நான் பாராட்டுகின்றேன்; தங்களுக்கு நன்றியைத் தெரிவிக்கின்றேன். இந்த நாட்டிலே வாழ்கின்ற மக்களுடைய வயிற்றுப் பசியைப் போக்குவதற்கும் அவர்களுடைய எதிர்கால வாழ்வுக்காகவும் அவர்கள் சொந்த இடங்களுக்குச் சென்று தொழில் செய்ய நீங்கள் எடுக்கின்ற முயற்சியைப் பாராட்டுகின்ற அதேவேளை, நீங்கள் அதனை மிக விரைவில் கச்சிதமாகச் செய்யவேண்டும் என்றும் நாங்கள் எதிர்பார்க்கின்றோம்.

இதேபோல் தான் கேப்பாப்புலவு மக்களும் தங்களுடைய சொந்த நிலத்திலே இருக்கின்ற தென்னைகளிலே தேங்காய்களைப் பறித்துக்கொள்ளவும் அந்த இடத்திலே தங்களுடைய தோட்டங்களைச் செய்யவும் அங்கு போவதற்காகப் போராடுகின்றார்கள். ஆனால், சென்றவாரம் அமைச்சர் சுவாமிநாதன் அவர்கள் சென்று அவர்களுக்குக் காடுகளைக் காட்டியிருக்கின்றார். இந்த உலகில் எவ்வளவோ ஊடகப் பரப்பிருக்கின்றது. அவ்வாறு இருக்கத்தக்கதாக அமைச்சர் சுவாமிநாதன் அவர்கள் வெறுமனே ஏமாற்றுகின்ற ஒரு வேலையை ஏன், செய்தார்? யார் அவரை அவ்வாறு தவறாக வழிநடத்தினார்கள்? ஏன், அவ்வாறான ஒரு பாதைக்கூடாக அவர் சென்றார்? போன்ற கேள்விகள் எங்கள் எல்லோருக்கும் பலத்த சந்தேகத்தைத் தருகின்றது. ஆகவே, அந்த மக்களுடைய எண்ணங்களைப் புரிந்துகொள்ளுங்கள்! உண்மையான பிரச்சினைகளைத் தீர்த்துவைப்பதன்மூலம் உள்நாட்டுச் செலாவணியை - உள்நாட்டிலேயிருக்கின்ற வருமானங்களை, இந்த நாட்டிலே வாழ்கின்ற மக்களுடைய வாழ்வாதாரங்களை மேம்படுத்துகின்ற விடயங்களில் நாங்கள் கவனத்தைச் செலுத்தவேண்டும். அப்பொழுதுதான் எமது வெளிநாட்டுச் செலாவணி வருமானம் இந்த நாட்டுக்கு உகந்ததா? வருகின்ற வெளிநாட்டுச் செலாவணியினூடாக இந்த நாட்டை மேம்படுத்த முடியுமா? என்ற விடயங்களை நாங்கள் கருத்திற்கொள்ள முடியும்.

நான் மிக முக்கியமான ஒன்றைச் சொல்கின்றேன். ஏற்கெனவே, 2015ஆம் ஆண்டு ஜெனீவாவிலே மனித உரிமைகள் பேரவையின் தீர்மானத்தினூடாகக் கொண்டுவரப் பட்ட பல்வேறு விடயங்களை அப்போது வெளிநாட்டமைச்சராக இருந்த மங்கள சமரவீர அவர்கள் ஏற்றுக்கொண்டிருந்தார். அவ்வாறு ஏற்றுக்கொண்டதன் அடிப்படையில்தான் வெளிநாட்டுச் செலாவணிகள் - வெளிநாட்டு வருமானங்கள் இந்த நாட்டுக்கு வரத்தொடங்கின. வெளிநாட்டு நிறுவனங்கள்கூட இந்த நாட்டிலே பல முன்னேற்றங்கள் ஏற்பட்டதனால் முதலீடுகளைச் செய்ய முன்வந்தன. ஆனால், இன்றைய காலகட்டத்தில் இந்த நாட்டிலே அந்த முன்னேற்றங்கள் தடைப்பட்ட நிலையிலே காணப்படுகின்றன. அண்மையிலே ஜெனீவாவிலிருந்து வருகைதந்த ஐக்கிய நாடுகள் சபையினுடைய சிறப்பு அறிக்கையாளர் பென் எமர்சன்கூட இந்த நாட்டிலே இருக்கின்ற மனித உரிமைகள் தொடர்பாகத் தன்னுடைய கருத்துக்களை முன்வைத்திருக்கின்றார். இலங்கையில் இறுதிக்கட்டப் போரில் மேற்கொள்ளப்பட்ட போர்க்குற்றங்கள் தொடர்பில் ஐக்கிய நாடுகள் சபையின் செயலாளர் நாயகத்திற்கு ஆலோசனைகள் வழங்கும் குழுவில் அங்கம் வகிக்கும் ஜஸ்மின் சூக்கா அவர்கள் இந்த நாட்டிலே ஏற்பட்டிருக்கின்ற இன்றைய சூழ்நிலைகள் பற்றியும் ஆட்கள் காணாமற்போதல்கள் பற்றியும் தன்னுடைய கருத்துக்களை முன்வைத்திருக்கின்றார். இதனைவிடச் சர்வதேச மன்னிப்புச் சபை இந்த நாட்டினுடைய போக்குப் பற்றி அதனுடைய

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

கவலையை வெளியிட்டிருக்கின்றது. ஆகவே, இந்த நாடு இன்னமும் சரியான ஒரு நிலைக்கு வரவில்லை.

அரசியல் தீர்வு பற்றி நாங்கள் பேசிக்கொண்டிருக் கின்றோம். அரசியலமைப்பினுடைய வழிநடத்தல் குழுக்கள் பற்றிப் பேசுகின்றோம். ஆனால், வெறுமனே பேசிக் கொண்டேயிருக்கின்றோம்; நம்பிக்கையிழந்த நிலையில் பேசிக்கொண்டிருக்கின்றோம். நான் நினைக்கின்றேன் எல்லாத் தரப்புகளிடமும் இந்த நம்பிக்கை தற்பொழுது படிப்படியாகக் குறைந்துகொண்டு செல்கின்றது என்று. இன்று பத்திரிகைகளை விரித்தால், அவை கட்சிகளுடைய ஒற்றுமையைப் பற்றியும் அரசாங்கம் தொடர்ந்து நிலைக்குமா, இல்லையா? என்ற விடயம் தொடர்பிலும் பேசுவதைக் காண முடிகின்றதே தவிர, இந்த நாட்டிலே புரையோடிப் போயிருக்கின்ற இனப்பிரச்சினைக்கான தீர்வு, தமிழ் மக்களுடைய வாழ்க்கைப் பிரச்சினை, அவர்களுடைய சொந்த நிலங்களுக்குச் செல்வதில் உள்ள பிரச்சினை போன்றவை தொடர்பில் கருத்திலெடுப்பதாகத் தெரியவில்லை. இவ்வாறு இவை கருத்திலெடுக்கப்படாமையும் இந்த நாட்டுக்கான அந்நியச்செலாவணியின் வருகையிலே பல பாதிப்புக்களைத் தந்திருக்கின்றது என்பதை நீங்கள் கருத்திற்கொள்ள வேண்டும். ஆகவே, இருக்கின்ற பிரச்சினைகளுக்கு முதலில் தீர்வு வேண்டும். அந்தவகையில்ஈ புரையோடிப்போயிருக்கின்ற இனப்பிரச்சினை தீர்க்கப்படுகின்றபோது வேண்டியளவு அந்நியச்செலாவணியை இந்த நாடு பெற்றுக்கொள்ள முடியும்.

இன்று புலம்பெயர் நாடுகளிலே 12 இலட்சத்துக்கும் மேற்பட்ட இலங்கைத் தமிழர்கள் வாழ்கின்றார்கள். குறிப்பாக, கனடா மற்றும் பிரித்தானியா போன்ற ஐரோப்பிய நாடுகளிலே வாழ்கின்ற இலங்கைத் தமிழர்களுடைய தொகை மிக அதிகமானது. இவர்கள் எமது நாட்டுக்கு வந்து முதலீடுகளைச் செய்வதற்குத் தயாராக இருக்கின்றார்கள். அவர்கள் அந்நியச்செலாவணியை நாட்டுக்குக் கொண்டுவரத் தயாராக இருக்கின்றார்கள். ஆனால், இந்த நாட்டிலே அவர்களுக்குப் பாதுகாப்பில்லை. அதனால் அவர்கள் தொழில்முயற்சிகளைச் செய்யமுடியாமல் இருக்கின்றார்கள். அவர்களால் இங்கு ஒரு தொழிலை ஆரம்பிக்க முடியாமலிருக்கின்றது.

நாங்கள் அந்நியச்செலாவணி பற்றிப் பேசுகின்ற இந்தநேரத்தில், இங்கே இருக்கின்ற பல அமைச்சர்கள் மற்றும் பிரதிச் சபாநாயகர் அவர்களுடைய கவனத்திற்கு நான் ஒரு விடயத்தைக் கொண்டுவருகின்றேன். அதாவது, வடக்கு மாகாணத்திலே போரால் பாதிக்கப்பட்ட பல இளைஞர்கள் இருக்கின்றார்கள், போரினால் தங்களுடைய அவயவங்களை இழந்தவர்கள் இருக்கின்றார்கள், போரினால் தங்களுடைய குடும்பத் தலைவர்களை இழந்த நிலையில் வாழ்கின்ற குடும்பத் தலைவிகள் இருக்கின்றார்கள், போரினால் தாய் தந்தையரை இழந்த சிறுவர்கள் இருக்கின்றார்கள். இந்த நிலையில், வடக்கு மாகாண முதலமைச்சருக்கான 'முதலமைச்சர் நிதியம்' ஒன்றை உருவாக்கினால், அதனூடாக அவர்களுக்கு புலம்பெயர் தமிழர்கள் வழங்கும் சிறிய உதவிகளைப் பெறமுடியும். ஆனால், அதற்கான முயற்சிகளை மேற்கொள்கின்றபொழுது - அதனை ஆரம்பிப்பதற்கு அரசாங்கம் தடை விதிக்கின்றது. அதாவது, முதலமைச்சர் நிதியத்தை ஆரம்பிப்பதற்கு இதுவரை அனுமதி வழங்கவில்லை. வடக்கு மாகாண சபை ஆரம்பித்து ஏறத்தாழ நாலு ஆண்டுகள் முடிவுறவிருக்கின்றன. அந்த நிலையிலும் வடக்கு மாகாண சபையின் முதலமைச்சருக்கு ஒரு நிதியத்தைக்கூட உருவாக்க முடியாத சூழல் காணப்படுகின்றது என்பதை இந்த இடத்திலே மிகமிக முக்கியமான ஒரு விடயமாகக் குறிப்பிடுகின்றேன். ஏன் அந்த நிலைமை?

வடக்கு மாகாண ஆளுநருக்கு ஒரு நிதியம் இருக்கின்றது. அவர் நினைத்தால் அந்தக் காசை - அரச காசைப் பயன்படுத்த முடியும். ஆனால், நாங்கள் அந்த அரச காசைச் சொல்லவில்லை. அதாவது, முதலமைச்சர் நிதியத்தினூடாக, புலம்பெயர் நாடுகளிலே இருக்கின்ற தமிழர்களுடைய காசை, அதனைவிட வெளிநாடுகளிலிருந்து அன்பளிப்புச் செய்பவர்களுடைய நிதிகளைப் பெற்று வடக்கு, கிழக்கிலே பாதிக்கப்பட்ட தமிழர்களுடைய வாழ்வாதாரத்துக்கும் அங்கே போரினால் பாதிக்கப்பட்டவர்களுக்கும் உதவுவதற்கு ஏன், பயன்படுத்தக்கூடாது? என்றுதான் கேட்கின்றோம். இந்த மண்ணிலே வடக்கு மாகாணத்தில் மட்டும் 19,724 அங்கவீனர்களும் 60,757 விதவைப் பெண்களும் 8,830 கைவிடப்பட்ட பெண்களும் 1,514 தாய் தந்தையரை இழந்த அநாதைச் சிறுவர்களும் காணப்படுகின்றார்கள். இவ்வாறானவர்களுக்கு - கிட்டத்தட்ட 70,000 பேருக்கு - புலம்பெயர்ந்து வேறு நாடுகளில் வாழ்கின்றவர்களிடமும் வெளிநாடுகளிடமுமிருந்து பணத்தைச் சேகரித்து வடக்கு மாகாண முதலமைச்சர் நிதியத்திற்கூடாக உதவமுடியாத கையறுநிலையில்தான் வடக்கு மாகாண சபை இருக்கின்றது என்பதை நான் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

ஒரு நாட்டுக்கு அந்நியச்செலாவணி வருவதற்குப் பல வழிகள் இருக்கின்றன. அந்த அந்நியச்செலாவணி என்பது அந்த நாட்டு மக்களுடைய பொருளாதாரத்திலே மேம்பாடுகளைக் கொண்டுவர வேண்டும். குறிப்பாக, வடக்கிலும் கிழக்கிலும் 2009ஆம் ஆண்டுக்குப் பிறகு எந்தத் தொழில்முயற்சி ஆரம்பிக்கப்பட்டிருக்கின்றது? எந்தத் தொழிற்சாலை இயங்குநிலைக்கு வந்திருக்கின்றது? என்று நான் கேட்கின்றேன். இதனை நான் பல தடவைகள் இந்தச் சபையிலே குறிப்பிட்டிருக்கின்றேன். இதுவரை எல்லாத் தொழிற்சாலைகளும் மூடப்பட்ட நிலையிலேயே இருக்கின்றன. யாழ்ப்பாணத்திலே, நீர்வேலியிலிருந்த கண்ணாடித் தொழிற்சாலை காணாமலே போயிருக்கின்றது. ஏற்கெனவே புத்தூர் பகுதியிலிருந்த மஸ்கன்ஸ் 'சீற்' தொழிற்சாலை இயங்க முடியாத நிலையிலிருக்கின்றது. அதனைவிட, நாவற்குழியிலிருந்த அன்றீஸ் இறால் தொழிற்சாலை இயங்க முடியாத நிலையில் இருக்கிறது. பரந்தன் இரசாயனத் தொழிற்சாலை மூடியநிலையில் காணப்படுகின்றது. காங்கேசன்துறை சீமெந்துத் தொழிற்சாலையை இயக்குவதற்கு இதுவரை எந்த முயற்சியும் இல்லை. ஆனையிறவு உப்பளம் இப்பொழுதுதான் ஓரளவுக்கு ஆரம்பிக்கப்பட்டிருக்கின்றது. வட்டக்கச்சி அரசினர் விவசாயப் பண்ணை இராணுவமயப்படுத்தப்பட்டிருக்கின்றது; அது இப்பொழுதும் இராணுவ முகாமாகவே இருக்கின்றது. இவ்வாறான நிலைமையில் அங்கிருக்கின்றவர்களுக்கு எவ்வாறு வேலை வழங்கமுடியும்? ஒரு தொழில்மயப்படுத்தப் பட்ட வேலைகளுக்கு யார் செல்ல முடியும்?

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இவ்வாறான நிலைமைகளின் மத்தியில்தான் அந்நியச்செலாவணி பற்றி இங்கு பேசுகின்றோம். ஆகவே, உள்நாட்டில் இருக்கின்ற இந்த மக்களுடைய வாழ்க்கையிலும் வாழ்வாதாரங்களிலும் மேம்பாடு ஏற்பட வேண்டும்; அதற்கான வழிமுறைகள் பற்றி முதலிலே சிந்தியுங்கள்! என்று கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Kabir Hashim. Before he starts, will an Hon. Member propose the Hon. J.M. Ananda Kumarasiri to the Chair?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம- விசேட பணிப்பொறுப்புகளுக்கான அமைச்சர்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)

I propose that the Hon. J.M. Ananda Kumarasiri do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. J.M. ANANDA KUMARASIRI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථා කරන්න, ගරු අමාත්‍යතුමා.

[අ.භා. 3.27]

ගරු කබීර් හාෂිම් මහතා (රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - அரச தொழில்முயற்சிகள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Public Enterprise Development)

මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමාගෙන් අවසරයි. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනකොට මුදල් විශුද්ධි කිරීම පිළිබඳව සැකයක් මතු කළා. ප්‍රථමයෙන්ම මම මේ කාරණය මතක් කරන්න කැමැතියි. පසු ගිය රජය අනෙක් පැත්තට තමයි මුදල් විශුද්ධි කිරීම සිදු කළේ. අපේ රටේ මුදල් මේ රටින් පිට රටවලට ගෝනි ගණන්, බෑග් ගණන් අරගෙන ගිය කාලයක් තිබුණා කියලා අපි කවුරුත් දන්නවා. ඒ තත්ත්වය වෙනස් කරලා, මේ රටට නීත්‍යානුකූලව මුදල් ආයෝජන ලබා ගැනීම සඳහා ගෙනෙන කාලෝචිත පනත් කෙටුම්පතක් හැටියට මම මේ පනත් කෙටුම්පත දකිනවා.

Hon. Presiding Member, I would like to say that countries in the world and in our region have reformed their Exchange Control Acts at different times as needed. The Thatcher Government in the UK in 1979 went for a major reform by abolishing exchange controls overnight. Reforms in India were more piecemeal and in 1999 they repealed their Foreign Exchange Regulation Act and brought in the Foreign Exchange Management Act.

In 2002, the then Ranil Wickremesinghe Government in Sri Lanka had extensive consultations with the Central Bank, other banks, exporters, business community, professionals and brought in the Foreign Exchange Management Bill. But, unfortunately, there was litigation in courts and as such we could not get the Bill through during our tenure in government. But, that was an excellent piece of legislation that should have come through at that time.

Historically, Sri Lanka during the ancient days of kings to colonial times did not have any exchange control regulations in our country. We, more or less, during the time of our ancient kings promoted free trade and exchange. One such good example is, Parakramabahu the Great who ruled Sri Lanka during 1153 to 1186. During that period, in order to consolidate his rule in the entire region, one of the things he decided to do was economic development. In the plan for economic development, he proposed a free trade zone area. In this free trade area, there were a huge number of local industries that worked especially in spices, elephant tusks and different timber which was available for traders to come and trade in Sri Lanka. In exchange, there were other goods like silk that we traded. Arabs and Chinese were the famous people who came and traded in these areas. So, historically when we look at our country, we were not a country that has been regulated or closed. We were an open country where we traded openly with the world. We did not fear to work with the global environment. During this time, we can see that our country was a part of the famous Maritime Silk Road which is now famously talked about in our region.

It was only during World War II that the colonial rulers introduced exchange control to Sri Lanka as a war strategy in order to control monies falling into the enemies' hands. This was first brought under the Finance Regulation in 1939. Exchange controls have been too rigid most often creating inefficient unproductive economic activities and have created more problems for countries. This has been confirmed by the famous Columbia University Professor Jagdish Bhagwati. These are some of the economic theories well spoken against rigid exchange control measures.

In 1953, the then Governor of the Central Bank, N.U. Jayawardena, though he was a student of the London School of Economics and Political Science under the famous Professor Hiet, believed in free exchange, but he was forced to present the Exchange Control Bill because that was then decided as policy for the government. It was passed through and it was actually called a draconian Act at that time. Basically, the Exchange Control Act had enormous powers. The Central Bank virtually had control, the Minister had control over the Central Bank and basically, any offences created under it was considered a financial crime. This went on for a long time without any changes. We did not have the foresight to look at making the changes. In 2002, Hon. Ranil Wickremesinghe realized that we need to link with the rest of the world and be competitive. We tried to make the change but our government was short-lived at that time.

If you take Singapore, Singapore has followed a totally different strategy from the time they started developing their country. Singapore's first Finance Minister, Dr. Goh Keng Swee considered options of introducing exchange controls to tackle their balance of payment problems. But, they realized that it is not the symptoms that you need to solve, but it is the remedy.

So, instead of looking at the balance of payment problems, they addressed the root cause of the problem by having a disciplined budget and controlling money creation. Instead of putting Exchange Control Acts and trying to prevent money moving up and down freely as

[ගරු කබීර් හාෂිම් මහතා]

per demand and supply, they began to cut down their unnecessary expenditure and that created strict fiscal discipline. As a result, they developed their country in the right direction.

In 1966, Sri Lanka lost another opportunity when a Professor of Economics from the Gujarat University came to Sri Lanka and developed a Paper advocating flexible exchange rates. We did not think of pursuing that either. The Foreign Exchange Bill that we are talking about today is too late a few decades, but it addresses some of the key problems. I think it has to be still stronger, but I do not think we have taken all the issues into consideration. It addresses some of the key problems though not all. It is an improvement on the Exchange Control Act definitely. Rather than controlling authorized dealers, it is more management-oriented. It controls the management of foreign exchange. The Central Bank implements laws subject to directions from the Minister. So, basically the Minister still has the power to control certain activities.

[මෙම අවස්ථාවේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மேதகு ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]

[At this stage, His Excellency President Maithripala Sirisena entered the Chamber.]

The other important aspect that we have seen in this Bill is that we decriminalize exchange control violations. This has been a very important change that we have made. Since all violations are supposed to be criminalized, it always creates a fear factor for businessmen to use the exchange mechanism as a tool for developing their businesses.

In the current Exchange Control Act, holding of foreign currencies by citizens is actually presented in a negative context. In terms of Section 5, no person other than an authorized dealer should hold or deal in foreign exchange. However, in the proposed Foreign Exchange Bill it has been put in a positive context so that according to Clause 8(1) (b) of the Bill, "A person in, or resident in, Sri Lanka shall hold foreign exchange in his possession or in a bank account in Sri Lanka;". They could use it subject to the purpose, limits and terms of conditions set by the Minister.

Finally, I would like to say further, Section 5 of the Foreign Exchange Bill stipulates that those who hold foreign exchange in a bank account in Sri Lanka or outside Sri Lanka or those who own a foreign asset could use such foreign exchange for paying of any current or capital transaction of his or her choice. The requirement to be satisfied is that such foreign exchange should not have been acquired by converting local currency into foreign currency meaning that those who genuinely earn foreign currency can use it in the way they want. These laws are subject to the act of money laundering, or corruption, or bribery. Therefore, it has enough safeguards against illegal money. The proposed Amendment most importantly gives dignity and protection to Sri Lankans. Up to now, Sri Lankans holding money abroad sometimes could not bring in their monies because it was under certain restrictions. Accordingly, the Amendment has protected citizens' personal property rights which are not available under the present law. This is a great achievement that we have given to our own citizens of the country. We have always looked at foreign exchange being brought by foreigners. This is an opportunity to recognize our people's earnings abroad. Therefore, citizens can engage in current and capital transactions subject to rules by the Central Bank and the Minister. Therefore, I think this is step forward in the right direction to make Sri Lanka a strong country in the region and in the world.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

මීළඟට, ගරු (ආචාර්ය) සරත් අමුණුගම අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.36]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (විශේෂ කාර්යභාර අමාත්‍යතුමා)

(மாண்புமிகு (கலாநிதி) சரத் அமுனுகம- விசேட பணிப்பொறுப்புகளுக்கான அமைச்சர்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of Special Assignment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිගරු ජනාධිපතිතුමා සභා ගර්භයේ සිටින මේ අවස්ථාවේ මෙම වැදගත් පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතාම සන්තෝෂ වෙනවා.

අප මේ පාර්ලිමේන්තුවේ අලුත් පනත් ගෙන ඒම විතරක් නොවෙයි, විශේෂයෙන්ම අපේ ආර්ථිකයේ අත්දැකීම් අනුව තිබෙන පනත් සංශෝධනය කිරීමත්, ඒ වෙනුවට නවීන ආර්ථික තත්ත්වයට මුහුණ දෙන පනත් ඉදිරිපත් කිරීමත් අපේ යුතුකමක්. අපේ විනිමය අංශය දිහා බැලුවාම අපට පෙනෙන දෙයක් තමයි, 1953දී ගෙනා විනිමය පාලන පනතට අවශ්‍යතා අනුව රෙගුලාසි ගෙනාවා මීසක්, කවුරුවත් ඒ සමස්ත විෂය දෙස බලා අලුත් එළඹුමකට ගිහින් නැහැයි කියන කාරණය. එම නිසා මේ විනිමය ප්‍රශ්නය දිහා බලන කොට අද අපට පෙනෙන්නේ පනස්තුනේ පනතත්, විටින් විට ගෙනෙන වෙන වෙන රෙගුලාසිත් විතරයි. ඒ නිසා එක පැත්තකින් අපට අවශ්‍ය වෙලා තිබෙනවා, අද රටේ අවශ්‍යතා අනුව ඒ කරුණුවලට, ප්‍රශ්නවලට මුහුණ දෙන පනතක් මේ ගරු සභාව ඉදිරියේ තබන්න. එය මේ සඳහා පදනම් වූ එක කාරණාවක්.

ඊළඟ කාරණය මෙකයි. 1953 වාගේ කාලයේ තිබුණු ආර්ථික පරිසරය, ආර්ථික ප්‍රශ්න, ආර්ථික විසඳුම් අද ගොඩක් දුරට වෙනස් වෙලා තිබෙනවා; ඒ ආර්ථික ස්වරූපය වෙනස් වෙලා තිබෙනවා. අද අපේ රට දිහා බලන්න. ඒ කාලයේ නොතිබුණු විධියට අද අපේ ජනතාව ලක්ෂ 15ක් පිට රටවල විවිධ රැකියා කරනවා. ඒ අතරේ උසස්ම රැකියා කරන අයත් ඉන්නවා; වෘත්තිකයෝ ඉන්නවා. ඒ වාගේම මැද පෙරදිග වෙන වෙන සේවා සපයන අය ඉන්නවා. ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා එක කාලයක ඒ ක්ෂේත්‍රය භාර ඇමතිවරයා වෙලා සිටියා. අද අපේ මිනිසුන් ලක්ෂ 15ක් විදේශ රටවල වැඩ කරලා, විවිධ ක්‍රමවලට සල්ලි

එවනවා. ඉන් එක ක්‍රමයක් තමයි මේ හවාලා ක්‍රමය. ඒ කියන්නේ, අපේ රටේ තිබෙන විනිමය පාලනය, විනිමය කරුණුවලට, ඒ ව්‍යුහයට පිටස්තරව වෙනම ආර්ථිකයක් මේ රටේ පවතිනවා. ඇයි එහෙම පවතින්නේ? අපේ තිබෙන ඒ වර්තමාන ව්‍යුහය - සමහර විට බැංකු ක්‍රමය වෙන්න පුළුවන්; අතිගරු ජනාධිපතිතුමනි, වෙන වෙන ආයතන වෙන්න පුළුවන්, - තුළින් ඒ මනුෂ්‍යයාට ක්ෂණික විසඳුමක් ලබාගන්න බැරි නිසා වෙන වෙන විසඳුම්වලට යනවා. ඒක එකක්.

දෙවන කරුණ තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන මොන සමාජ දර්ශනය තිබුණත්, අද ලෝකයේ හැම රටකටම විදේශ විනිමය අවශ්‍යයි තමන්ගේ රට දියුණු කරන්න. චීනය තමයි එයට හොඳම නිදසුන. අප දන්නවා, මා ඕ සේතුංගේ කාලයේ, ඒ රටට නිදහස ලැබිලා දශක දෙකක් විතර දැඩි අභ්‍යන්තර ආර්ථිකයක් - රට ඇතුළට බලන ආර්ථිකයක් - ගැන කටයුතු කළ බව. ඒ කාලයේ තිබුණා, 'ඉදිරි පිම්ම' - "The Great Leap Forward" - කියලා සංකල්පයක්, ඒ වාගේම 'ගැමි කර්මාන්තකරණය' කියලා සංකල්පයක්. මේ වාගේ දේවල් පිළිබඳව සාකච්ඡා කළා. නමුත්, ඩෙන් ෂියාඕපිංගේ කාලය එන කොට එය ඉතාම අසාර්ථක ක්‍රමයක්. ආර්ථිකය විවෘත කරලා, විදේශ විනිමය -විදේශ මුදල්- ගෙනැත් තමයි අද චීනය මේ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ.

වියට්නාමය ගැන බලන්න. වියට්නාමය -ඒ පුංචි රට,- ඇමෙරිකාවත් එක්ක මාරාන්තික සටනක යෙදුණා. ලෝකයේ සිටි ලොකුම බලවත්තු ගිහින් බෝම්බ දාලා ඒ රට විනාශ කළා. නමුත් අද ඇමෙරිකානු මුදල්, බටහිර රටවල මුදල්, බැංකු මුදල් ආදිය ඒ රටවලට -චීනය, වියට්නාමය ආදි රටවලට- ඇවිල්ලා ඒ රටවල ආර්ථික සංවර්ධනයට, ආර්ථික පුනරුත්පාදනයට ලොකු සේවයක් කරනවා.

ඉන්දියාවේ නේරු, ගාන්ධි දර්ශන අනුව කටයුතු කළ ආකාරය අපි දන්නවා. විශේෂයෙන් ගාන්ධිගේ දර්ශනය අනුව- සියල්ල රට ඇතුළේ කරන්න ඕනෑ කියා තමයි ඒ කාලයේ සිතුවේ. "අපට විදේශ ආධාර ඕනෑ නැහැ; please leave India to Indians and to God." කියා තමයි ගාන්ධිතුමා කිව්වේ. "ඔයගොල්ලෝ අයින් වෙන්න. අපි වැඩේ බලාගන්නම්" කියලායි කිව්වේ. ඉන්දියාව ටිකක් කල් ඒ ක්‍රමය අනුගමනය කළා. නමුත් එය ඉදිරියට ගෙන යන්න බැරි වුණා. විශේෂයෙන් ඉන්දිරා ගාන්ධි මැතිනියගේ කාලයේ තමයි දැඩි ලෙස ඒ විධියට කල්පනා කළේ. නමුත් ඊට පසුව ආ රජිව් ගාන්ධි අගමැතිතුමාගේ කාලයේ ඉඳන් සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණයකට ගියා. ඒ ප්‍රතිසංස්කරණයේ එක ලක්ෂණයක් තමයි, විදේශ රටවලින් සල්ලි ගලා එන්න අවස්ථාව සලසන එක. මොකද, ඉන්දියාවටත්, අද අපේ ලංකාවට වාගේ, Non-Resident Indians - NRIs - විශාල පිරිසක් සිටියා කියා ඔබතුමන්ලා දන්නවා. පිට රටවල සල්ලි හම්බ කරලා ඒ සල්ලි තමන්ගේ රටට එවනවාද, නැද්ද කියා සිතාගන්න බැරිව විශාල පිරිසක් සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අතීත කාරණයක් කියන්නම්. මට මතකයි, අපි තාජ් හෝටලය හදපු කාලය. එය හදන්න සියල්ලම කතා කරගෙන ඉන්දියාවෙන් සල්ලි ගෙනෙන්න හදන කොට දවසක් දැනුම් දුන්නා, මේ හෝටලය හදන්න Reserve Bank of India එකෙන් අපට සල්ලි දෙන්න බැහැ කියනවා - ලංකාවට සල්ලි එවන්න බැහැ කියනවා- කියා. අපි කල්පනා කළා, 'දැන් මොකද කරන්නේ?' කියා. කොම්පැනියක් හදලා, ඉඩම් අරගෙනත් තිබුණ නිසා කර කියාගන්න දෙයක් නැති තත්ත්වයක් ඇති වුණා. ඒ වෙලාවේ ඒ කොම්පැනිය මොකක්ද කිව්වේ? "භය වෙන්න එපා. Reserve Bank of India එකෙන් අපට සල්ලි දුන්නේ නැතත්, දහස් ගණනක් ඉන්දියන්කාරයෝ ඇමෙරිකාවේ, එංගලන්තයේ, අප්‍රිකාවේ වැඩ කරමින් ඉන්නවා. ඉන්දියානු බැංකුව හරහා ගෙන්වා ගන්නේ නැතිව විදේශ රටවල සිටින ඉන්දියානුවන්ගෙන් සල්ලි ගෙනැල්ලා අපි තාජ් හෝටලය හදමු" කියා ඒ අය කිව්වා. අද තාජ් හෝටලයේ අයිතිවාසිකම් ඇති අය ගෙන බැලුවොත්, ඒ අයගේ කොටස් මුදල් ගෙන බැලුවොත් පෙනෙනවා, ඒ මුදල් යොදවපු ඉන්දියන්කාරයන් ඉන්දියානු බැංකුව හරහා ආවේ නැහැ කියා. වෙනත් වෙනත් රටවල වැඩ කරන ගමන් තමයි ඒ අය කෙළින්ම මුදල් එව්වේ. ඒ බොහෝ ඉස්සර සිද්ධියක්. මට මතක හැටියට ඒ 1978 වර්ෂය ද කොහේදෝ. නමුත් දැන් තත්ත්වය සම්පූර්ණයෙන් වෙනස්. අපේ රටේ විශාල- [බාධා කිරීමක්] ඔව්, ඒ කාලයේ වෙනම එකක් හැදුවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඒක හොඳින් මතකයි.

ගරු මන්ත්‍රීතුමනි, මා දැන් ඔබතුමාට තවත් එක් කාරණයක් කියන්නම්. මැණික් කර්මාන්තය ගෙන බලන්න. අද එය අර්බුදයකට ගිහින්. එහි නිරත මිනිස්සු කියනවා, "අපට සල්ලි ගෙන යන්න, ගෙන එන්න දෙන්නේ නැහැ." කියා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එය පිළිගන්නවා නේද? ඒ සල්ලි යැවීම, ගෙවීම ඒ කර්මාන්තයට ඔබින විධියට දැන් සිදු වන්නේ නැහැ. අද තේ කර්මාන්තය ගෙන බලන්න. අද මොකක්ද කියන්නේ? සියල්ලෝම කියනවා, "තේ පිට රටවලට විකුණා ඒ සල්ලි ඒ කොම්පැනිකාරයන් ඒ රටවල තියාගන්නවා. ආපසු ගෙනෙන්නේ නැහැ" කියා. ඒ අයත් කියන්නේ, "අප මෙය තවත් මාසයක් දෙකක් තබා ගත්තොත්, විනිමය අනුපාතය වැඩි වන කොට අපට රුපියල් වැඩියෙන් ගන්න පුළුවන්" කියායි. මේ විධියට ඇති කරන ලද ආකෘතිය තුළින් රටේ ආර්ථිකයට ඇත්ත වශයෙන්ම අවාසි තත්ත්වයක් ඇති වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය ඉතාම අවාසියි. මේ රටට ගන්න පුළුවන් සල්ලි එන්නේ නැහැ. එහෙම කරන්නේ විදේශ මිනිසුන් නොවෙයි; අපේම රටේ අයයි. අපේ වෙළෙන්දෝ ඒ සල්ලි මේ රටට ගෙනෙන්න කැමැති නැහැ. මොකද, ඒ අය සිතනවා, 'ඒ සල්ලි ඒ රටවල තබා ගත්තොත් පසුව මීට වඩා වැඩි මුදලක් ගන්න පුළුවන්' කියා. ඒ විතරක් නොවෙයි. මෙය තමයි දූෂණයට මූල. "හවාලා" ක්‍රමය ගෙන බලන්න. වැඩ කරන, අපේ දහස් සංඛ්‍යාත අය සාමාන්‍ය බැංකු ක්‍රමයෙන් පිටස්තරව ගනුදෙනු කරනවා. නව තාක්ෂණය අනුව එසේ කරන්න පුළුවන්. අද කටාර්වලට ගියත්, ඩුබායිවලට ගියත්, ඒ ආදි ඕනෑ තැනකට ගියත් ඒ සල්ලි දීපු ගමන් ඒ වෙලාවේම ගන්න පුළුවන්. eCash කියා ක්‍රමයක් තිබෙනවා. එතැනට ගිය ගමන් ඒ සල්ලි දෙනවා. මේ නව තාක්ෂණය තුළ විනිමය පාලනය කියන එක ගැන අප හොඳින් බලන්න ඕනෑ. ඒක වෙනස් කර ගන්න බැරි වුණොත් දූෂණ සිදු වෙනවා. ඒ විතරක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. පුංචි මිනිසුන්ට තමන්ගේ වැඩක් කරගන්න හරිම අමාරුයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හොඳින්ම දන්නවා නේ ජපානයේ අපේ වෙළෙන්දන් කොච්චර ඉන්නවාද, අපේ හොඳ ව්‍යවසායකයන් කොච්චර ඉන්නවාද, ඒ අයට සල්ලි ගෙනෙන්න කොච්චර අමාරුද කියා.

හැම කෙනාම මොකක් හරි සුකුරුත්තමක් කරන්න ඕනෑ, ඒ සල්ලි අරගෙන මේ රටේ ආයෝජනය කරන්න. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ඒ ගැන හොඳටම දන්නවා නේ. මේ රටේ ආයෝජනය කරන්න ජපානයේ හුඟක් දෙනෙක් ලැහැස්ති වෙලා ඉන්නවා නේද? මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා, ඔබතුමා ඒක පිළිගන්නේ නැද්ද? අපි ඒවා පහසු කරන්න ඕනෑ. එතුමා අපහසුතාවට පත් කරන්න නොවෙයි, මම මෙහෙම කියන්නේ. අපි දෙන්නාම ඒ ගැන දන්නා නිසායි කියන්නේ. මේ වාගේ තත්ත්වයක liberalized, ඒ කියන්නේ විදේශ විනිමය හොරකම් කරන දෙයක් නොවෙයි. විදේශ විනිමය රටකට අවශ්‍ය දෙයක් හැටියට සලකන තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. දැන් බලන්න, ඉස්සර විනිමය පාලන පනතේ කියන්නේ, ".....to make provisions conferring powers, and imposing duties and

[ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා]

restrictions..." කියලා. නොයෙක් විධියේ controls දමන්න තමයි පරණ පනතෙන් කියලා තිබුණේ.

මේ පනත් කෙටුම්පතෙන් මොකක්ද කියන්නේ? මෙයින් කියනවා විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම - "....to provide for the promotion and regulation.." - කියලා. ඒ නිසා දුප්පත් රටකට විදේශ විනිමය ගෙනෙන්න ඕනෑ. එයාට අවස්ථාවක් සලසන්න ඕනෑ, නම්බුකාර විධියට ඒ මුදල් ලබා ගන්න. දැන් යම් කෙනෙකුට කියන්න පුළුවන් මේ විධියට නිදහස් කළාම, නොයෙක් විධියේ වැරදි වැඩ සිද්ධ වෙන්න පුළුවන් කියලා; නීති විරෝධී විධියට මුදල් සංසරණය වෙන්න පුළුවන් කියලා. මම ඔබතුමන්ලාට මතක් කරනවා, කරුණාකරලා මේ පනතේ 10වැනි වගන්තිය බලන්න කියලා. එහි පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතට, මුදල් විශුද්ධි කිරීමේ පනත යටතට සහ රටේ පවතින වෙනත් නීති යටතට යම් කෙනෙක් ගන්න පුළුවන් නම්, ඒ තැනැත්තාට මේ පහසුකම් ලැබෙන්නේ නැහැ කියලා.

වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඇහුවා, "හොඳයි. මේ නීතිය තිබෙනවා, නමුත් මේ නීතිය ක්‍රියාත්මක වෙනවාද නැද්ද කියලා අපි දැන ගන්නේ කොහොමද" කියලා. ඒකට තමයි මේ රටේ නීතිය ක්‍රියාත්මක කිරීමේ යන්ත්‍රණ තිබෙන්නේ. ඒ සඳහා යම් යම් ආයතන තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිතුමා කොමිෂන් සභාවකුත් පත් කරලා තිබෙනවා. ඒවාට ආයතන තිබෙනවා. ඒ ආයතනවල ක්‍රියාකාරිත්වය නවත්වලාත් නැහැ; වෙනස් කරලාත් නැහැ. නමුත්, අපි මේ පනත් කෙටුම්පතේ කියලා තිබෙනවා, මුදල් විශුද්ධි කිරීමේ පනත යටතට, එහෙම නැත්නම් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතට සහ නම් කරපු වෙනත් පනත් යටතට අහු වෙනවා නම්, ඒ අයට මේ සහනය ලැබෙන්නේ නැහැ කියලා. එම නිසා මේ ප්‍රශ්නය වෙනුවෙන් අපි කාලය ගත කරන්නේ නැහැ. ඒ නිසා මෙම පනත් කෙටුම්පතේ 10වැනි වගන්තිය කෙරෙහි මම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවනවා.

අපි මතක් කර ගත යුතු තව කාරණයක් තිබෙනවා. මෙතැන මහ බැංකුවේ අධීක්ෂණයට තමයි මුල් තැන ලබා දීලා තිබෙන්නේ. පරණ පනත් අනුව මහ බැංකුව අබිබවා ගිහින් එම අංශය භාර ඇමැතිතුමාට නියෝග දෙන්න අයිතියක් තිබුණා. ඒක මෙම පනත් කෙටුම්පතෙන් ඉවත් කරලා තිබෙනවා. ප්‍රධාන කීන්දු, තීරක බලවේගය වෙන්නේ මහ බැංකුවයි. ඒක යහපත් ප්‍රවේශයක් කියලා මම හිතනවා. ඒකත් මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙලා තිබෙනවා. ඒක ක්‍රියාත්මක වෙන්නේකොහොමද? මහ බැංකුව විදේශ විනිමය ගනු දෙනු කරන්න වාණිජ බැංකු තෝරා ගන්න පුළුවන්; රාජ්‍ය බැංකු වාගේම මේ රටේ තිබෙන අනෙකුත් බැංකුත් තෝරා ගන්න පුළුවන්. ඒ පළමුවැනි කොටස. දෙවැනි කොටස අනුව ඒ ගොල්ලන්ට ඕනෑ නම්වෙන වෙන බැංකුවලටත් - designated banksවලටත් - ඒ බලතල පවරන්න පුළුවන්. තුන්වැනි කොටස අනුව විනිමය ගනු - දෙනු කරන්න නීත්‍ය බලධාරිනුත් - authorized agentsලාත් - පත් කරන්න පුළුවන්. මේ ගොල්ලන්ව හොඳට පරිපාලනය කරන්න පනත් කෙටුම්පතේ මේ කොටස් හරහා මහ බැංකුවට හුඟක් බලතල ලබා දීලා තිබෙනවා. ඒ වැඩ කටයුතු හොඳට සිද්ධ වෙනවාද කියලා පරීක්ෂා කරලා, අධීක්ෂණය කිරීමේ බලතල මහ බැංකුවට ලබා දීලා තිබෙනවා. එම නිසා ඇමැතිතුමාට මොනවා හරි කියන්න ඕනෑ නම්, මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය හරහා එම අදහස් ප්‍රකාශ කරනවා මිස, මහ බැංකුවට සෘජුව බලපෑම් කරන්න බැහැ.

ඒ වාගේම මතක් කරන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මේ විධියට ලංකාවට මුදල් එන කොට රජය නිකුත් කරන බැඳුම්කර තිබෙනවා. ඒවා Development Bonds වෙන්න පුළුවන්; වෙන වෙන බැඳුම්කර වෙන්න පුළුවන්. දැන් අලුත් අදහසක් තිබෙනවා, ඒ ඒ ක්ෂේත්‍රයන් වෙනුවෙන් බැඳුම්කර නිකුත් කරන්න.

විශේෂයෙන් නගර සංවර්ධනය සඳහා වෙන්න පුළුවන්, වාරි මාර්ග සඳහා වෙන්න පුළුවන්, ජලය බෙදා හරින ජලසම්පාදන අමාත්‍යාංශය වෙන්න පුළුවන් මේ විධියට බැඳුම්කර නිකුත් කිරීමට පුළුවන්. ඒක ඉස්සරත් තිබුණා. දැනුත් ඒ ගොල්ලන් වෙනම බැඳුම්කර නිකුත් කරන්න කටයුතු කරනවා. ඊටත් වඩා රජයේම බැඳුම්කර තිබෙනවා. ඒ බැඳුම්කරවලට මේ සල්ලි එනවා නම්, ඒවා රජයේම විශ්වාසයක් තිබෙන බැඳුම්කර නිසා, අය කරන බද්දෙන් - පිට රට ඉන්න වෙන අය සල්ලි එවනවා නම් යම් කිසි බද්දක් රජයට ගෙවන්න ඕනෑ- යම් සීමාවක්, වාසියක් ලැබෙනවා. ඒ, ඒ ගොල්ලන් කෙළින්ම රජයේ බැඳුම්කරවලට මුදල් යොමු කරන නිසා. මේකේ අවසාන ප්‍රතිඵලය මොකක්ද? අපි මේ රට ඉක්මනට සංවර්ධනය කරන්න ඕනෑ නම් සල්ලි නැතුව ඒක කරන්න බැහැ. දේශීය වශයෙන් අපට ආයෝජනය කරන්න අවශ්‍ය ප්‍රමාණයට මුදල් සොයා ගන්න බැහැ. මේක අපට විතරක් නොවෙයි, අද මුළු ලෝකයටම සිද්ධ වෙලා තිබෙන දෙයක්. ඔබතුමන්ලා පුදුම වෙයි. සවුදි අරාබිය වාගේ පොහොසත් රටවල් පවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වෙන්න පුළුවන්, ජාත්‍යන්තර බැංකුවලට වෙන්න පුළුවන් සල්ලි ගන්න යනවා. මොකද, ඒ සංවර්ධන වේගය වැඩි කරන්න ඕනෑ නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කර ගන්න ඉස්සර වාගේ අවුරුදු 30, 40 බලාගෙන ඉන්නේ නැහැ. හැම දෙනාම බලාපොරොත්තු වෙනවා, අවුරුදු දෙකෙන්-තුනෙන් තමන්ට අවශ්‍ය ඒ සංවර්ධනය ලැබෙයි කියලා. අද ආර්ථික ලෝකයේ යථා තත්ත්වයක් බවට පත් වෙලා තිබෙන්නේ, මුදල් සංසරණය. මුදල් සංසරණය අපි කළමනාකරණය කරන්න ඕනෑ. ඒක දිහා බලන්න ඕනෑ. අපේ රටට ඒක වාසි විධියට හරවා ගන්න ඕනෑ. එහෙම නැතුව 50 ගණන්වල වාගේ "අපට මුදල් ඕනෑ නැහැ, විදේශ සල්ලි ඕනෑ නැහැ, විනිමය පාලනය කළ යුතුයි" කියන අදහස් අද නැහැ. මේකට හොඳම නිදසුන තමයි මැලේසියාව. එක කාලයක අපේ කලාපයේ ලොකු මූල්‍ය අර්බුදයක් ඇති වුණා. ඒ වෙලාවේ මහතීර් මොහොමඩ්ගේ විසඳුම වුණේ තම රටින් පිට රටට යන විදේශ විනිමය සම්පූර්ණයෙන් නවත්වන එක. ඒ, අවුරුදු 25කට විතර ඉස්සර. ඒ කාලයේ ඒක වැඩ කළා. නමුත් අද ඒක වැඩ කරන්නේ නැහැ. අද මහතීර් මොහොමඩ්ගේ මැලේසියාව තමයි වැඩියෙන්ම විවෘත ආර්ථික ක්‍රමයට යන්නේ. ඒ නිසා අද ලෝකයේ තිබෙන ඒ ප්‍රවණතාවන් දිහා අපි හොඳට කල්පනා කරලා බලන්න ඕනෑ. චීනය, වියට්නාමය, සමාජවාදී ලෝකය සංවර්ධනය සඳහා මුදල් ලබා ගත්තේ කොහොමද, අද ජාත්‍යන්තර මුදල් සංසරණය වෙන්නේ කොහොමද, රටක් සංවර්ධනය කර ගන්න ඒ ආයතන අපි හදා ගන්නේ කොහොමද කියලා අපි හොඳට කල්පනා කරලා බලන්න ඕනෑ.

මම අවසාන වශයෙන් තව එක කාරණයක් කියන්න කැමැතියි. මේ නීති ලිහිල් කරන්නේ ඇයි? අද කවුරුත් දන්නා දෙයක් තමයි නීති පිට නීති දැම්මාම ඒක තමයි දූෂණයට මුල කියලා. අපි පාර්ලිමේන්තුවේ නීති හැදුවාට මන්ත්‍රීවරු, ඇමතිවරු ඉහළ මට්ටමේ විධායකයේ සිටියාට නීතිය ක්‍රියාත්මක කරන්නේ රාජ්‍ය නිලධාරිනුයි. ඉහළම මට්ටමේ ඉඳන් පහළ මට්ටම දක්වා නිලධාරීන් තමයි නීති ක්‍රියාත්මක කරන්නේ. මේ රටේ නීති වැඩි වෙන්න, වැඩි වෙන්න නීති කළමනාකරණය කිරීම සහ නීති ක්‍රියාත්මක කිරීම තුළ නොයෙක් පරිපාලන ප්‍රශ්න ඇති වෙනවා.

ඒක අද ලෝකයේම ඇති වෙලා තිබෙන තත්ත්වයක්. එක කාලයක එංගලන්තයේ තමයි මේක වැඩිපුරම තිබුණේ. මොකද, එංගලන්තයේ කම්කරු පක්ෂයෙන් තමයි එන්න එන්නම, එන්න එන්නම නීති දැම්මේ. එතකොට මොකද වුණේ? එතකොට කිව්වේ, එංගලන්තය තමයි යුරෝපයේම ඉන්න ලෙඩා, ලෙඩ මිනිහා, "Sick man of Europe" කියලා. මොකද, ඒ? නීති - රීති වැඩියි, සාමාන්‍ය මිනිහාට හැරෙන්නට විධියක් නැහැ. ඒ අනුව තමයි නීති - රීති අඩු කරලා, සරල කරලා දූෂණය නැති කරන්නේ. එක පැත්තකින් දූෂණය නැති කරනවා කියලා අනෙක් පැත්තෙන් නීති වැඩි කළොත් දූෂණය නැති කරන්නට බැහැ. මම හිතනවා අද පොඩි මිනිහාට බලපාන නීති වැඩියි කියලා. එම නිසා අපි පරණ නීති දිහා බලලා අවශ්‍ය නීති සංශෝධනය කරලා නූතන ලෝකයට හරියන විධියට හදා ගන්නට ඕනෑ. ඒක පාර්ලිමේන්තුවේ වගකීමක්. හැමදාම පල්වෙන නීතියම ක්‍රියාත්මක කළාද නැද්ද - [බාධා කිරීමක්] අර විධියට කළත් අද අපිට විරුද්ධ පක්ෂයෙන් ඒ කරුණු අහන්නට ලැබුණා. ඒක එක පැත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට අමතරව අපි කල්පනා කරලා බලන්නට ඕනෑ නව ලෝකයට හරියන විධියට දූෂණ විරෝධී කාර්යක්ෂම පාලනයක් සඳහා අවශ්‍ය නීති පද්ධතියක් හදන්නට. එහෙම නීති පද්ධතියක් හදා ගන්න පුළුවන් වෙන්නේ ඒ ආර්ථික ව්‍යුහය තුළ බලය බෙදා හැරීමෙන්. රජය විතරක් නොවෙයි, බැංකු ක්‍රමය, වෙන වෙන පළාත්බද මූල්‍ය ආයතන, සමුපකාරය, ගම්බද මූල්‍ය ආයතන යනාදී සියල්ලම නිදහස් කරලා ඒ අයට ආර්ථික තීන්දු ගන්න බලය ලබා දෙන පරිසරයක් තුළ තමයි අපි හිතන ඒ ආර්ථික වර්ධනයට යන්නට පුළුවන් වෙන්නේ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මංගල සමරවීර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
විනාඩි හතයිද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්.

[3.56 p.m.]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Hon. Presiding Member, as we celebrate 40 years of the open economy in Sri Lanka this week, the Sri Lankan economy, today, is currently at the crossroads in the macroeconomic policy formulation. Sri Lanka needs now, as the Hon. Amunugama just mentioned, to introduce a set of policy reforms on an urgent basis to address some of the persistent structural vulnerabilities of the economy. The current Government has been able to reverse the decades-long trend of falling Government revenue relative to national income. Today we have managed to bring it to a level where it can go forward with confidence.

Actually, in 2015, when His Excellency the President, who is here with us in the Chamber today, took over the reins of Government along with the Prime Minister, Ranil Wickremesinghe, we had an economy in shambles. The fiscal sector was in shambles: falling government revenue, high Government debt, unproductive investments, inefficient transfer payments were some of these problems. The external sector was in shambles: falling exports, widening imports, unsustainable short-term capital flows and borrowed international reserves were some of our problems at that time and the monetary sector was also in shambles. This was all due to the crony -capitalist system which was adhered to by President Mahinda Rajapaksa during his dark rule of nine years.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට දීර්ඝ වේලාවක් නැති නිසා මේ පිළිබඳව වැඩිපුර කථා කරන්න බැහැ. 2015දී අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රටේ පාලනය බාර ගන්න කොට, එතුමාට, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට, අපේ ආණ්ඩුවට කුණු කඳු කිහිපයකටම කර ගහන්න සිද්ධ වුණා. එක පැත්තකින් මහා ණය කන්දක් තිබුණා. තව පැත්තකින් මානව අයිතීන් පිළිබඳ චෝදනා කන්දක් තිබුණා. තවත් පැත්තකින් මහා දූෂණ කන්දක් තිබුණා. කියන්න සන්තෝසයි, මානව අයිතීන් පිළිබඳ චෝදනා කන්දට අද නිසි පිළිතුරු ලබා දෙමින් ශ්‍රී ලංකාව ලෝකයේ කීර්තියට භාජන වෙලා තිබෙන බව. දූෂණ කන්ද සම්බන්ධ පරීක්ෂණවලින් ඒ දූෂිතයන්ගේ වැඩ දැන් ක්‍රමානුකූලව හෙළිදරවු වෙමින් තිබෙනවා. දැන් සමහර අය කියනවා, "කෝ, මොකුත් වෙන්නේ නැහැ නේ." කියලා. රාජපක්ෂ පවුලේ තුන්දෙනෙක් රුපියල් බිලියන 3.1ක් වැනි විශාල මුදලක් වියදම් කරලා අරගෙන තිබෙන ඉඩම්, නිවාස වාගේම, සුදු කරන ලද කළු සල්ලි පිළිබඳව අපි හොයලා, දැන් උසාවිවල ඒ නඩු අසමින් තිබෙනවා. "මොකුත් වෙන්නේ නැහැ" කියලා කියන අය ඒ බව දැන ගන්න ඕනෑ. පිට රටවල්වල තිබෙන ඒ මහා මුදල් කන්දට අත ගහන්න බැරි වුණාට මේ දේවල් කෙරෙනවා.

අපේ ණය ඉදිරියට වැඩි වෙමින් යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් අපි ආණ්ඩුවක් හැටියට මේ ණය කන්දටත් මුහුණ දෙන්න කටයුතු කළා. උදාහරණයක් හැටියට ගත්තොත්, අපට මේ අවුරුද්දේ විතරක් මහින්ද රාජපක්ෂලාගේ ණය ගෙවීමට ඩොලර් මිලියන 2,805ක් ගෙවන්න වුණා. ඒ මුදලින් සියයට 72ක්ම 2015ට කලින් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ගත්ත ණය. රේස් පදින්නයි, වෙනත් කෝටි ගණන් වියදම් සඳහා ගත්ත ණයවලටයි, නැව් එන්නේ නැති වරාය හදන්නයි, ගුවන් යානා එන්නේ නැති ගුවන් තොටුපොළ හදන්නයි ගත්ත ණය මුදල් තමයි දැන් අපි ගෙවන්නේ. ඒ විතරක් නොවෙයි, ඒ ණය ගෙවීමේ බරපතළම කාලය තමයි මේ එන්නේ. අපි ඒවායින් පැනලා යන්න නොවෙයි මේ කාරණා කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2019 අවුරුද්ද වන විට අපට විදේශ ණයවලට විතරක් ඩොලර් මිලියන 4,245ක් ගෙවන්න තිබෙනවා. ඒ මුදල රුපියල්වලින් ගත්තොත්, රුපියල් ට්‍රිලියන - මිලියන නොවෙයි, බිලියන නොවෙයි- ට්‍රිලියන 3.2ක්. මේ රුපියල් ට්‍රිලියන 3.2ක මුදලින් සියයට 82ක්ම මහින්ද රාජපක්ෂ ආණ්ඩුව ගත්ත ණය. ඉතිරි ටික තමයි අපි 2015 සිට ගත්ත ණය. අපේ මුළු රටේම වාර්ෂික ආදායම රුපියල් ට්‍රිලියන එකයි දශම ගණනයි. නමුත්, 2019 අවුරුද්දට විතරක් ජාතික ආදායම වාගේ තුන් ගුණයක් රාජපක්ෂ දූෂිත පාලනයේ ණය ගෙවන්න අපට සිද්ධ

[ගරු මංගල සමරවීර මහතා]

වෙනවා. 2020 අවුරුද්ද වන විට ඩොලර් මිලියන 3,752ක් ණය ගෙවන්න ඕනෑ. එයිනුත් සියයට 85ක් සමන්විත වන්නේ රාජපක්ෂ සමයේ ගත්ත ණයවලින්. 2022 වන විට අපට ඔළුව උස්සන්න බැරි වෙන විධියටයි මේ රට ගමන් කරමින් තිබුණේ. ඒක තමයි පසු ගිය ජනාධිපතිවරණය අවුරුදු දෙකකට කලින් තිබ්බේ. ඒ ජනාධිපතිවරණය කලින් තිබ්බේ 'සුමනදාස' කියපු නිසා නොවෙයි.

එයා ඒ ජනාධිපතිවරණය කලින් තිබ්බේ මේ ණය ගෙවා ගන්න බැරි නිසායි. එයා හිතුවේ, කොහොම හරි මැතිවරණය දිනලා, මැතිවරණයෙන් පස්සේ ඒකාධිපති රාජ්‍යයක් බිහි කරන්නයි. මේ ණය ගෙවා ගන්න බැරිව ජාත්‍යන්තරයෙන් සම්බාධක එනකොට මිනිසුන්ට ගහලා, පොඩි කරලා හරි ඒකාධිපතිත්වයක් මේ රටේ ඇති කිරීමේ අරමුණින් තමයි අවුරුදු දෙකකට කලින් මහින්ද රාජපක්ෂ මැතිවරණයකට ගියේ.

අපි 2022දී ඩොලර් මිලියන 4,273ක්, ට්‍රිලියන තුනහමාරකට වැඩි ප්‍රමාණයක ණය ගෙවන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ තරම් බැරෑරුම් ආර්ථිකයක් භාර ගත්තත් මේ වෙනකොට එය ගොඩ නහමින් තිබෙනවා; ඒ සඳහා මාර්ග විවෘත කරමින් සිටිනවා; වේගවත් සංවර්ධනයකට මුල පුරමින් සිටිනවා.

ඇත්ත වශයෙන්ම කිව්වොත්, සාමාන්‍යයෙන් කිසිම රටකට හොඳ වාර්තාවක් නොදෙන IMF එක ගිය සතියේ, එනම් පසු ගිය 17 වෙනි දා නිකුත් කරන ලද වාර්තාවේ මොකක්ද කියන්නේ? “Fiscal performance has been very strong. Targets for the fiscal balance and tax revenue have been met." මෙන්න මේ විධියට, මේ සියලු ප්‍රශ්න තිබියදී අපේ ආර්ථිකය කඩා වට්ටවන්න විපක්ෂයේ සිටින සමහරු කුමන්ත්‍රණය කරද්දී, අපි මේ ආර්ථිකය ඉදිරියට ගෙන යනවා. මේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑමේ තවත් වැදගත් පියවරක් තමයි අද මේ පනත් කෙටුම්පතෙන් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාට නියමිත කාලය ලබා දෙන්න එතුමා කැමැත්ත පළ කර තිබෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු ඇමතිතුමාට අවශ්‍ය කාලය ගන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම වැඩිය කාලය ගන්නේ නැහැ.

I would also like to say, Mr. Presiding Member, that the prudent management of the exchange control liberalization is also the need of the hour and I am sure there are many Hon. Members who may have expressed some of these fears earlier in this Debate. In fact, the Government is fully cognizant of the risk associated with imprudent management of exchange control relaxations.

මේ ලිහිල්කිරීම් සිද්ධ වෙනකොට ඇති වෙන්න පුළුවන් අඩු පාඩු ගැන හොඳ අවධානයක් ඇතිවයි මේ හැම දෙයක්ම අපි කරන්නේ.

The recent global financial crisis and many currency crises before have aggravated the fear of capital account liberalization as they could lead to potential financial crisis due to sudden outflow of foreign capital in the event of loss of international investor confidence. However, history has shown many a time that capital control relaxations *per se* have not been solely responsible for such crisis, but the imprudent macroeconomic management of the respective governments. Such imprudent macroeconomic policies may include over-valued exchange rates, weak supervision and regulation of banks and other financial institutions, bad corporate governance and practices et cetera.

Therefore, the current Government’s approach to the introduction of more liberalization to the foreign exchange management through the proposed Bill rests on a well-coordinated effort among all institutions and stakeholders involved. Such efforts towards more liberalization underscore the corresponding improvements to prudential controls designed to mitigate any volatility of foreign capital inflows at least in the short run. Further, the Government is very well mindful of the fact that it is a fine line between relaxation of exchange regulations in order to encourage foreign investments and leaving potential room for activities such as money laundering, tax havens et cetera. Therefore, we are taking all measures to address all potential avenues that could be potentially detrimental to the free flow of capital and financial account movements.

අවසාන වශයෙන් කියන්න කැමැතියි, මේ රට ඉදිරියට ගෙන යෑමේ තවත් වැදගත් තීන්දුවක් අද අපේ වරාය හා නාවික කටයුතු අමාත්‍ය ගරු මහින්ද සමරසිංහ මැතිතුමා ගත් බව. 1977න් පසුව මේ රට තුළ ක්‍රියාත්මක වෙන විශාලතම සංවර්ධන වැඩපිළිවෙළ එයයි. මම හිතන්නේ නොබෝ දිනකදී මේ රටට දකින්න ලැබෙන විශාලතම සංවර්ධන පිම්ම ඉදිරියට තියන්න අද තීන්දු කළා. විශේෂයෙන්ම රටට මහා බරක් වෙලා තිබුණු, මහා විනාශයක් කරා රට ගෙන යන්නට තිබුණු හම්බන්තොට වරාය ලාභ ලබන ප්‍රදේශයක් බවට පත් කරලා, දකුණේ සිටින තරුණ තරුණියන් දස දහස් ගණනාවකට රැකී රක්ෂා සපයා මුළු ශ්‍රී ලංකාවම සංවර්ධනය කරා ගෙන යන මහා අත්තිවාරම දැමීමේ ඒ තීන්දුව ගත්තා. එපමණක් නොවෙයි, අපේ ජනාධිපතිතුමාගේ ඉල්ලීම අනුව, එම ගිවිසුම ගරු ඇමතිතුමා හෙට දින මේ පාර්ලිමේන්තුවේ සභාගත කරනවා. එතකොට තමුන්නාන්සේලාට ඕනෑ තරම් ඒ ගැන වාද විවාද කරන්න අවස්ථාව ලැබෙනවා.

ඒ සංවර්ධන පිම්ම තුළින් රටට සිදුවන යහපත, එහි වාසිය ලැබෙන්නේ ආණ්ඩු පක්ෂයේ අපට විතරක් නොවෙයි. ඒ කටයුත්ත විනාඩියෙන් විනාඩියට කඩාකප්පල් කරන්න හදන තමුන්නාසේලාටත් එයින් වාසි ලැබෙන බව ප්‍රකාශ කරමින් මේ අවස්ථාවේදී මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබී තිබෙනවා.

[අ.භා. 4.10]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යාංශයට අදාළ විදේශ විනිමය පනත් කෙටුම්පත පිළිබඳ විවාද කරන අද දිනයේ මටත් ඒ පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. විශේෂයෙන් අපේ අලුත් මුදල් ඇමතිතුමා අමාත්‍යාංශය භාර ගත්තාට පසුව අද තමයි එතුමාගේ අමාත්‍යාංශය ගැන කථා කරන්න අවස්ථාවක් ලැබුණේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මේ තුන්වන අවස්ථාව.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට ලැබුණු අවස්ථාව ගැනයි මා කිව්වේ. ඉස්සර නම් මුදල් අමාත්‍යාංශයට අදාළ පනතක් එනකොට අපි බලන්නේ බයෙන්. මොකද, ඒ පනත ඇතුළෙන් deal එකක් තිබෙනවා. ඉතින් ඒ නිසා ඒ කාලයේ අපට පොඩි බයක් තිබුණා. දැන් ඒ බය ඇරිලා තිබෙනවා. අපි බලාගෙන ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ලැබී තිබෙන්නේ විනාඩි 10ක කාලයක්. මම ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා, මේ අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ සිටීම ගැන. ඒ පිළිබඳ මගේ සන්තෝෂය පළ කරනවා. මම ගිය වතාවේ මේ මාතෘකාව කථා කරනකොටත් එතුමා පාර්ලිමේන්තුවේ සිටියා. අදත් ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ ඉන්න එක ගැන මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මුදල් ඇමතිතුමා කථා කරනකොට මම අහගෙන හිටියා. එතුමා කිව්වා, එතුමන්ලා මේ රට භාරගන්න කොට බරක් වෙලා තිබුණු කඳු තුනක් පිළිබඳව. ආර්ථිකය පිළිබඳවත්, ඒ වාගේම දූෂණ පිළිබඳවත් ගරු මංගල සමරවීර ඇමතිතුමා කථා කළා. ඒ විධියට එතුමා මාතෘකා තුනක් පිළිබඳව කථා කළා. නමුත් ඒ රටට බරක් වුණු කඳු ඉවත් කර අලුත් ගමනක් යන්න තමයි ඔබතුමන්ලා බලයට පත් වුණේ. එහෙම බලයට පත් වුණු ඔබතුමන්ලාට නැවත ඒ කඳු ගොඩනහන්න බැහැ. ඒ කඳු ගොඩනහන්න ඔබතුමන්ලාට සාදාචාරාත්මක අයිතියක් නැහැ. 2015 ජනවාරි 08වැනි දා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ජනවරම දුන්නේ, ඒ සඳහායි.

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කිව්වා, මේ වන කොට රුපියල් බිලියන 3.2ක මුදලක් වියදම් කිරීම පිළිබඳව හොයාගෙන, ඒ සම්බන්ධව කටයුතු කරමින් පවතිනවා කියලා. ඒ රුපියල් බිලියන 3.2 වැඩි කිරීම 3 කියන්නේ, බැඳුම්කර වංචාවේ පාඩුව රුපියල් බිලියන 10යි. ඔබතුමා දන්නවා, බැඳුම්කර වංචාව නිසා සිදු වූ පාඩුව රුපියල් බිලියන 10ක් බව. දැන් ඔබතුමා කියපු විධියට සිදු වී තිබෙන බැඳුම්කර වංචාව රුපියල් බිලියන 3.2යි. ගරු මුදල් ඇමතිතුමනි, මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට පාර්ලිමේන්තුවට, විධායකයට වග කියන නායකයාගේ අනුග්‍රහයෙන්, තවත් ඇමතිවරුන්ගේ අනුග්‍රහයෙන්, රාජ්‍ය අනුග්‍රහයෙන් වෙච්ච විශාලම වංචාව තමයි මහ බැංකු බැඳුම්කර වංචාව. ලංකා ඉතිහාසයේ සිදු වූ ලොකුම වංචාව. ඔබතුමා දන්නවා, එම වංචාව පිළිබඳව අපි පැමිණිලි කළ බව.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ එවැනි වංචාවක් සිදු වුණා නම්, අඩුම ගානේ ඒ ගැන කථා කරන්නවත් අයිතියක් තිබුණේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම ස්තුතියි. මම ඔබතුමාට බාධා කළේ නැහැ නේ. [බාධා කිරීමක්] ගරු මංගල සමරවීර ඇමතිතුමනි, මම ඔබතුමාත් එක්ක ගැටුමකට යන්න කැමැති නැහැ. මම ඔබතුමාට බාධා කළේ නැහැ. අපට කථා කිරීමේ අයිතියවත් දෙන්න. ගරු මංගල සමරවීර ඇමතිතුමනි, අපි මේ කියන දේ ගැන ඔබතුමාගේ හෘදය සාක්ෂියට එකඟව සිතන්න. අපි මේ අවනඩුවක් කියන්නේ. රටේ ජනාධිපතිතුමා ඉදිරියේදීයි මම මේක කියන්නේ. මහ බැංකු බැඳුම්කර මංකොල්ලය පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අපි පැමිණිලි කළා; CID එකට අපි පැමිණිලි කළා. පැමිණිලි කරන කොට මොනවාද කිව්වේ? මේ කරපු පැමිණිලි එකක්වත් විභාග කළේ නැහැ. කොමිසම හමුවට කැඳෙව්වේ නැහැ. ගරු ජනාධිපතිතුමනි, ඔබතුමා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීමේ සහ විමර්ශනය කිරීමේ ජනාධිපති විමර්ශන කොමිසම පත් කළා. අපි ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා. අපි මාධ්‍ය හමුවලදී වුණත් කිව්වා, මේ පිළිබඳව සොයා බලන්න කොමිසමක් පත් කරන්න කියලා. මේ කොමිසම පත් කරන්න කලින් අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කළා.

හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමාට විරුද්ධව එදා විශ්වාස භංග යෝජනාවක් ගෙනාවා. එම අවස්ථාවේ අතිගරු ජනාධිපතිතුමාත් මේ පාර්ලිමේන්තුවේ සිටියා. නිවසක් බදු ගත්ත ගිවිසුමක් මම එදා සභාගත කළා. රවි කරුණානායක ඇමතිතුමා ඉන්න සුපිරි නිවසට මසකට ඩොලර් 10,000යි. එම නිවස මාස හයකට කුලියට අරගෙන, නැවත මාස අටකට දීර්ඝ කළා. එම නිවසට කුලිය ගෙව්වේ අර්ජුන ඇලෝසියස් මහත්මයාගේ සමාගමෙන් කියලා, අදාළ ලේඛන මම එදින සභාගත කළා. 2016.06.09 **දින** හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. එදා රවි කරුණානායක ඇමතිතුමා ඒ අවස්ථාවේ නැඟිටලා කිව්වා, "බොරු කියන්න එපා, නඩු දානවා. පුළුවන් නම් මේ ගිවිසුම ඔප්පු කරන්න" කියලා. මට නඩු දානවා කිව්වා. එතුමා වාඩි වුණාට පසුව අගමැතිතුමා නැඟිටලා ගරු කථානායකතුමාට කිව්වා, "මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට බොරු කියන එක ගැන වරප්‍රසාද කමිටුවට යොමු කරන්න" කියලා. මම පාර්ලිමේන්තුවට බොරු කිව්වා කියලා, මාව වරප්‍රසාද කමිටුවට යොමු කරන්න කියලා කිව්වා. මම ඊට මාස දෙකකට පසුව එම ඔප්පුව පාර්ලිමේන්තුවේ සභාගත කළා. මම කිව්වා, "මුදල් ඇමතිතුමාට අයත් සමාගමකට රුපියල් මිලියන 1,650කට මේ නිවස මිලදී ගත්තා" කියලා. එදත් රවි කරුණානායක ඇමතිතුමා මට කිව්වා, "මඩ ගහන්න එපා. එළියට ගිහිල්ලා පුළුවන් නම් කියන්න" කියලා. මම මාධ්‍ය හමුවකදී ඒ බව කිව්වා. නමුත්, මට නඩු දැමීමේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි එදා මේ ගැන පාර්ලිමේන්තුවේ කියන කොට හිටපු මුදල් ඇමතිතුමා කිව්වා, අපට නඩු දානවා කියලා. අගමැතිතුමා තර්ජනය කළා, අපව වරප්‍රසද කමිටුවට ගෙන යනවා කියලා. තමුන්නාන්සේලාත් දකින්න ඇති, මේ කාරණය ගැන රටම බලාගෙන සිටිද්දී ඊයේ ජනාධිපති කොමිසමට අනිකා විජේසූරිය මහත්මිය ඇවිල්ලා සාක්ෂි දුන්නා. "ඇමතිවරයාගේ බිරිඳ යනවා, සුපිරි නිවස බලන්න. බලන්න ගියාට පස්සේ එතැනින් call එක ගන්නවා අර්ජුන ඇලෝසියස්ට. අර්ජුන ඇලෝසියස් එතැනට එනවා; කුලිය ගෙවනවා." ඇමතිවරයා ඇතුළු පවුලේ අය ඉන්නේ ඒ නිවසේ. හිටපු මුදල් ඇමතිවරයා, බැඳුම්කර සිද්ධියට සම්බන්ධ ඇමතිවරයායි. අපි මෙවා කිව්වා. හැබැයි, අපි කිව්වාම පිළිගත්තේ නැහැ. අද ජනාධිපති කොමිසම ඉදිරියේ ඒවා සියල්ල හෙළිදරවු වනවා.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

අතිගරු ජනාධිපතිතුමනි, හිටපු මුදල් ඇමතිවරයාව ඊයේ කොමිසම ඉදිරියට කැඳෙව්වා. එතුමා කිව්වා, "අද කැබිනට් මණ්ඩලය රැස් වන නිසා එන්න වෙන්නේ නැහැ" කියලා. කොමිසම එතුමාගෙන් ඇහුවා, "එන්න පුළුවන් කවදාද?" කියලා. එතුමා ලියුමක් යවනවා, "අගෝස්තු 25වැනි දා මම කොමිසම හමුවට එන්නම්" කියලා. ජනාධිපතිතුමනි, අපව කොමිසමක් හමුවට කැඳෙව්වාම, අපි ගියේ නැත්නම් අපව අල්ලා හිරේ දානවා. කොමිසම අද රැස්වෙලා තීරණය කර තිබෙනවා, හිටපු මුදල් ඇමති රවි කරුණානායක මහතා හෙට කොමිසම හමුවේ ඉන්න ඕනෑ කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ වත්මන් විදේශ කටයුතු ඇමතිවරයා මේ ගනු-දෙනුවට සම්බන්ධ වෙලායි තිබෙන්නේ. මේ ගනු-දෙනුව නිසා රටට වෙච්ච පාඩුව, විනාශය කොපමණද? ණය පොලී අනුපාත පවා ඉහළ ගියා. මොන තරම් අපරාධයක්ද සිදු වෙලා තිබෙන්නේ? මේ අපි කථා කළේ එක වංචාවක් ගැනයි.

අතිගරු ජනාධිපතිතුමනි, තවත් වංචා තිබෙනවා. අපි ඔබතුමාට ඉදිරිපත් කරන්නම්, ඇමතිවරු දහදෙනෙකුට විරුද්ධව රුපියල් බිලියන 131ක් සම්බන්ධයෙන් චෝදනා තිබෙනවා. ගරු මංගල සමරවීර ඇමතිතුමනි, රුපියල් බිලියන 131ක් සම්බන්ධයෙන් චෝදනා තිබෙනවා.

ප්‍රාඩෝ වංචාව, SriLankan Airlines වංචාව, වී වංචාව සම්බන්ධයෙන් චෝදනා තිබෙනවා. ඔබතුමන්ලාට කියන්නම්, මේ වංචාවලට සම්බන්ධ දහදෙනා කවුද කියලා. අපි පැමිණිලි කළා. බිලියන 131ක වංචාවක්. [බාධා කිරීම්] තමුන්නාන්සේට ඉතින් කොන්ත්‍රාත් හම්බ වෙන කොට - [බාධා කිරීම්] කොන්ත්‍රාත්කාරයින් කෑ ගහනවා. බාධා නොකර මට මේ කාරණය කියන්න දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කියලා තිබෙන කරුණුවලින් එක දෙයක් හෝ වැරදි නම් මට කියන්න. [බාධා කිරීම්] ගරු නවින් දිසානායක ඇමතිතුමනි, කියන්න. ඔබතුමාට අවස්ථාව දෙන්නම්. මගේ වෙලාව අරගෙන කියන්න. මිලියන එක්ලක්ෂ තිස්එක්දහසක් -බිලියන 131ක්- සම්බන්ධයෙන් චෝදනා තිබෙනවා. අපි ඒවා පැත්තකට දමමු. මට අද කථා කරන්න ඕනෑ වුණේ මොකක්ද? මන්ත්‍රීවරයකු හැටියට මා මේ තොරතුරු ටික සභාගත කළාම මාව වරප්‍රසාද පිළිබඳ කමිටුවට යොමු කරන්න අගමැතිතුමා ගරු කථානායකතුමාට නියෝග කළා. අපට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න තිබෙන අයිතිය නැති කරන්න හදනවා. මේවා කිව්වාම අපට තර්ජනය කරනවා; නිර්නාමික දුරකථන ඇමතුම් එනවා; නීතිපති දෙපාර්තමේන්තුවට කථා කරලා නඩු දමන්න නියෝග එවනවා. මේ සියල්ල වෙන්නේ අරලියගහ මන්දිරයෙනුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක වගකීමකින් යුතුව කියනවා.

ගරු මංගල සමරවීර ඇමතිතුමනි, වැරදි තිබෙනවා නම් නඩු දමන්න; චෝදනා කරන්න. ඒවා ගැන හොයන්න, බලන්න. ඒ පිළිබඳ අපි තර්ක කරන්නේ නැහැ. අපට ඒ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. වැරදි නම් කවුරු වුණත් වැරදියි. ඒ පිළිබඳ ගැටලු නැහැ. ඒ විතරක්ද? ජනාධිපතිතුමනි, එතුමාගේ කාලය තුළ කටයුතු කළ ආකාරය පිළිබඳව වෙනම file එකක් ඔබතුමාට ගෙනැවිත් දෙන්නම්. එතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු අණපනත් මොනවාද? එතුමා මුදල් ඇමතිවරයා හැටියට ඉන්දැද්දී එතුමාගේ දියණිය එතුමාට ලියනවා, ගුදමක් දෙන්න කියලා. රජයට අයිතිව තිබෙන ලොකුම ගුදම. ඒ ගුදම දුවට දෙන්න තාත්තා අනුමත කරනවා, මුදල් ඇමතිවරයා හැටියට. ඒ, bonded warehouse එකක්. Logistics business එකක් කරන කෙනෙකු Finance Minister කෙනකු වුණේ ලංකා ඉතිහාසයේ කවදාද? රේගුව එන්නේ මුදල් ඇමතිවරයා යටතටයි. මුදල් ඇමතිවරයාට රේගුව තිබියදී රේගුව සම්බන්ධ ව්‍යාපාරිකයකු රටේ මුදල් ඇමති කළේ කවදාද? මොනවා වුණත් ජනාධිපතිතුමා ඒ විෂය එතුමාගෙන් ඉවත් කළා අවුරුදු දෙකක් හෝ ගිහිල්ලා. ජනාධිපතිතුමනි, අපි ඒ පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මේක ඉතා බරපතළ තත්ත්වයක්. හිටපු මුදල් ඇමතිවරයා - වර්තමාන විදේශ කටයුතු ඇමතිවරයා- හරි නම් මේ වෙන කොට ඉල්ලා අස්වෙන්න ඕනෑ. ඒක තමයි යථාර්ථය. ඒ විතරක් නොවෙයි. හෙට අනිද්දා වෙන කොට මේ බැඳුම්කර කොමිසමේ සාක්ෂි අනුව, තව තව ආණ්ඩුවේ ඉහළ ලොක්කන්ට මේ කොමිසම හමුවට එන්න සිද්ධ වෙනවා. මේ බැඳුම්කර සල්ලි අරගත්ත කට්ටිය, මේවා ගහපු කට්ටිය, මේවා බෙදාපු කට්ටිය ගැන සියල්ල දැන් හෙළි වෙමින් පවතිනවා. දැන් මේවා වහ ගන්න පත්තරයක් හදාගෙන තිබෙනවා. පත්තරයේ නම "ජනයුගය". "ජනයුගය" නමින් පත්තරයක් හදලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පත්තරය හදලා මොකක්ද කියන්නේ? [බාධා කිරීම්]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මොකක්ද point of Order එක?

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කථාව අහන්න ලැබීම ගැන බොහොම සන්තෝෂයි. ජනවාරි - [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ Point of Order එක මොකක්ද?

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
එතුමන්ලා දැන් මේ කථා කරන්නේ රෙදි ඇඳ ගෙනද? එතුමන්ලාත් ඒ කාලයේ ඇමතිවරු වෙලා හිටියා. එදා කථා කරලා කිව්වා, අපි ජනවාරි 08 වැනිදා - [බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ඔබතුමා කරුණාකර, වාඩි වෙන්න. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

බොහොම ස්තුතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බැහැ, බිලා පාර්ලිමේන්තුවට එන්න. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට බැහැ, ඌරන්ට වෙඩි තියන්න.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තත්ත්වයට මන්ත්‍රීවරුන් පත් වුණාට මට කරන්න දෙයක් නැහැ. මා කියාගෙන ආවේ - [බාධා කිරීම්] මන්ත්‍රීවරයකුට මේ සභාවේ යම් දෙයක් කියන්න අයිතියක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වුණු වංචාව නිසා හරි නම් මේ වෙන කොට විදේශ කටයුතු ඇමතිවරයා ඉල්ලා අස් විය යුතුයි. හරි නම් එතුමා ඉල්ලා අස් විය යුතුයි. ඒ නිසා මේක තේරෙන්නේ නැති- [බාධා කිරීම්] විදේශ ඇමතිවරයාගෙන් පඩි ගත්ත

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මාසයකට ලක්ෂ පහක පඩි ගත්ත

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මුදල් අමාත්‍යාංශයේ සල්ලිවලින් පඩි ගත්ත මිනිස්සු අද මෙතැන කථා කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මුදල් අමාත්‍යාංශයෙන් පඩි දෙන්න පුළුවන්ද? ගරු මංගල සමරවීර ඇමතිතුමනි, කවදාවත් ගෞරවනීය ඇමතිවරයෙක් ඒ වාගේ දේවල් කරන්නේ නැහැ. ඇමතිවරුන් පඩි ගෙවලා තියා ගත්තා තමන්ගේ කුණු හෝදා ගන්න. දැන් දැක්කා නේ, කෑ ගහපු හැටි. දැන් මේ සභාවේ ඉන්නවා, එක්සත් ජාතික පක්ෂයේ ගෞරවනීය ඇමතිවරු. ඒ අය කවුරුවත් කථා කරන්නේ නැහැ.

එතුමන්ලා ඒක පිළිගන්නවා. ගෞරවනීය ඇමතිවරු ඒක පිළිගන්නවා. එතුමන්ලා ඒ ගැන කථා කරන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි. ලොතරැයි මණ්ඩලය ගැනත් කියන්න ඕනෑ. මේ සියල්ල ගැන කථා කරන්න වෙලාව නැහැ. අනික් ඒවා සියල්ල පැත්තකට දමමු. ජනාධිපතිතුමාත් මේ ගරු සභාවේ සිටිනවා. ගරු ජනාධිපතිතුමනි, මේ කොමිසම පත් කරලා දැන් මාස 6යි. ඔබතුමා තව මාස 3ක් දීර්ඝ කළා. මේ කොමිසමට අවශ්‍ය සියලු තොරතුරු ලැබී තිබෙනවා. COPE වාර්තා දෙකක් තිබෙනවා. විගණකාධිපතිතුමා ඇවිල්ලා එතුමාගේ සාක්ෂිය අමුවෙන්ම දීලා ගියා. ඒ වාගේම පැන් ඒෂියා බැංකුවේ නිලධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් මේ පිළිබඳව අවශ්‍ය සියලු සාක්ෂි දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට වඩා කථා කරන්න දෙයක් නැහැ.

ඒ විතරක් නොවෙයි. සාක්ෂිකරුවන්ට බලපෑම් කරනවා. ඔවුන් ජනාධිපති කොමිසමට ඇවිල්ලා ඒ ගැන කියනවා. ඒ වාගේම දුරකථන ඇමතුම් එනවාය කියනවා. ඒ අත්සන් කරපු ගිවිසුම් පුළුස්සා දමන්නය කියලා අර්ජුන් ඇලෝසියස් මහත්මයා අනිකා විජේසූරිය මහත්මියට කියපු දේ අපි ඊයේ දැක්කා. මෙවැනි බලපෑම් කරනවා. නමුත් සියලු සාක්ෂි ලැබිලා ඉවරයි. ඔබතුමන්ලා අපට ඕනෑ චෝදනාවක් කියලා කෑ ගහන්න. ඒකට කමක් නැහැ. අපට ප්‍රශ්නයක් නැහැ. අපට ඕනෑම චෝදනාවක් කරන්න. අවුරුදු දෙකහමාරක් තිස්සේ අපට චෝදනා එල්ල කළා. මහින්දානන්ද අලුත්ගමගේ හොරෙක් කියලා නඩු පැවරුවා. ඒ ගැන පත්‍ර පිටු ගණන් ලිව්වා. අන්තිමට අධිකරණයේ නඩු පැවරුවා. නඩු පවරා නීතිපතිට යොමු කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කරුණාකර දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මට විරුද්ධව තිබෙන චෝදනාව මොකක්ද? වෘත්තීය සමිතියෙන් රුපියල් ලක්ෂ 10ක් මුදල් ගත්තාය, දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩමක මගේ කාර්යාලයක් තිබෙනවාය කියන චෝදනා තමයි මට විරුද්ධව තිබෙන්නේ. කොහේවත් නැති carrom board එකකට මා සම්බන්ධයි කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ කියන්නේ කවුද කියලා දන්නවා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

අලුත්ගමගේ කියන්නේ කවුද කියලා දන්නවා. එම නිසා ඒ ගැන මා කථා කරන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මංගල සමරවීර ඇමතිතුමනි, අපි ඔබතුමාට ගරු කරනවා. මෙවැනි අවාසනාවන්ත සිද්ධීන් සිදු වුණා. ඒක හොඳ නැහැ. දැන් කොමිසම පත්වෙලා තිබෙනවා; පරීක්ෂණ පැවැත්වෙනවා. එම නිසා මේවාට විරුද්ධව ආණ්ඩුව කඩිනමින් කටයුතු කරන්නය කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. I. Charles Nirmalanathan, please. You have 12 minutes.

[பி.ப. 4.23]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தப் பாராளுமன்றத்தில் மாண்புமிகு பிரதம மந்திரி அவர்களால் சமர்ப்பிக்கப்பட்ட, இலங்கையின் அந்நியச்செலாவணியை மேம்படுத்துவதற்கும் ஒழுங்குபடுத்துவதற்குமான அந்நியச் செலாவணிச் சட்டமூலம் இன்று விவாதத்துக்கு எடுக்கப்பட்டிருக்கின்ற இந்த நேரத்தில் என்னைப் பேசுவதற்கு அனுமதித்தமைக்காகத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்தச் சட்டமூலத்தைப் பற்றி விவாதிக்கின்ற இந்தநேரத்தில் இலங்கையில் பல மோசடிச் சம்பவங்கள் நடைபெற்றுக்கொண்டிருக்கின்றன. அதாவது, மிகப் பெரிய போதைப்பொருள் கடத்தல்கள் இங்கு நடைபெறுகின்றன. குறிப்பாக, வடக்கில் ஆயிரக்கணக்கான கிலோகிராம் நிறையுடைய கஞ்சாப் பொதிகள் கடந்த காலங்களில் பிடிபட்டிருக்கின்றன. அதேபோன்று இரத்மலானை 'சதொச'வுக்குக் கொண்டுவரப்பட்ட சீனி மூடைகளுடன் 320 கோடி ரூபாய் பெறுமதியான போதைப்பொருள் பிடிபட்டிருக்கின்றது. இந்தக் கடத்தல்களுக்குப் பின்னால் அல்லது இந்தக் கடத்தல்களின்மூலம் இந்த அரசாங்கம் அந்நியச்செலாவணியைப் பெற்றுக்கொள்ள முயல்கின்றதா? என்ற சந்தேகம் எழுகின்றது. ஏனெனில், இவ்வளவு காலமும் கைப்பற்றப்பட்ட கஞ்சாவின் உரிமையாளர்களை இந்த அரசாங்கம் கைது செய்யவில்லை; கைது செய்வதற்குரிய நடவடிக்கைகளையும் எடுக்கவில்லை. அண்மையில் இரத்மலானையில் உள்ள 'சதொச' களஞ்சியசாலையில் கைப்பற்றப்பட்ட போதைப்பொருள் எவ்வாறு கொண்டுவரப்பட்டது? என்பதையும் கைப்பற்றப்பட்டதைவிட மேலதிகமாக எவ்வளவு போதைப்பொருள் இலங்கைக்குள் கொண்டுவரப்பட்டிருக்கின்றது? என்பதையும் இந்த அரசாங்கம் தெளிவுபடுத்த வேண்டும். உண்மையில் உரிமையாளர்கள் கண்டுபிடிக்கப்படாவிட்டால், போதைப் பொருட்களின் மூலம் அந்நியச்செலாவணியைப் பெற்றுக் கொள்வதற்கு இந்த அரசாங்கம் முயற்சி செய்கின்றது என்றுதான் மக்கள் கருதுவார்கள். ஏனென்றால், உண்மையில் மிகப் பெரிய கடத்தல்கள் நடைபெறுகின்றபோது அந்தப் பொருட்கள் மட்டும் பிடிபடுகின்றன; அதன் பின்னணியில் ஒருசில நபர்களும் பிடிபடுகின்றார்கள்; ஆனால், அதனுடைய உரிமையாளர் யார் என்பதை இந்த அரசாங்கம் கண்டுபிடிக்க முயல்வதில்லை. இதற்குக் காரணம் என்ன? இந்த நாட்டின் புலனாய்வுத்துறை தகுதிவாய்ந்த தரத்தில் இல்லையா? அல்லது அவர்களுக்கு விசாரணை செய்வதற்குரிய அனுமதியை இந்த அரசாங்கத்திலிருக்கின்ற பொறுப்பு வாய்ந்தவர்கள் வழங்கவில்லையா? என்பது கேள்விக்குறியாக இருக்கின்றது.

அந்நியச்செலாவணியை அதிகரிப்பதற்காக நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் சட்டமூலங்களைக் கொண்டுவருகின்றோம். அதேநேரத்தில், வடக்குப் பிரதேசத்தில் இருக்கின்ற எமது மக்களுடைய வாழ்வாதாரத்தை, குறிப்பாக யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுடைய, பெண் தலைமைத்துவத்தைக் கொண்ட குடும்பங்களுடைய, புனர்வாழ்வு பெற்ற போராளிகளுடைய, யுத்தத்தால் அங்கவீனமானவர்களுடைய வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காக இந்த அரசாங்கம் எந்தவகையில் முயற்சிகளை எடுத்துக்கொண்டிருக்கின்றது? என்ற கேள்வியை நான் இந்தச் சபையினூடாகக் கேட்க விரும்புகின்றேன். உண்மையில் வடக்கில் மட்டுமல்ல, இலங்கையில் இருக்கின்ற எல்லாக் கிராமங்களிலும் அந்தக் கிராம மக்கள் பயன்பெறுகின்ற வகையில் அவர்களுடைய வாழ்வாதாரத்தை நாங்கள் கட்டியெழுப்பினால் அது மிகப் பெரியளவில் அந்நியச்செலாவணியை எங்களுடைய நாட்டுக்குப் பெற்றுத்தரும் என்பதை இந்தச் சபையில் நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

எங்களுடைய நாட்டில் இயற்கை வளங்கள் அழிக்கப்பட்டு வருகின்றன. கடந்த காலங்களில் இயற்கை வளங்கள் அழிக்கப்பட்டதன் காரணத்தால் தற்பொழுது எமது நாட்டில் மிகப்பெரியதொரு வரட்சியை மக்கள் எதிர்நோக்கியிருக்கிறார்கள். இந்த வரட்சி நிலைமையை எப்படிக் கையாள்வது? இந்த வரட்சியால் பாதிக்கப்பட்ட மக்களின் வாழ்வாதாரத்தைப் பாதுகாப்பதற்கும் அவர்களுடைய இயல்பான வாழ்க்கையைக் கொண்டுசெல்வதற்கும் எவ்வாறு நடவடிக்கையெடுப்பது? என்ற ஒரு திட்டமிடலைச் செய்வதற்கான குழுவை இந்த அரசாங்கம் ஏன், ஏற்படுத்தவில்லை? குறிப்பாக, தற்பொழுது இந்தச் சபையிலிருந்து சென்ற மேதகு ஜனாதிபதி அவர்களின் கவனமும் வரட்சியால் பாதிக்கப்பட்ட மக்கள் தொடர்பில் குறைவாகவே இருக்கின்றது என்பதையும் இந்த நேரத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

"முல்லைத்தீவு மாவட்டத்தில் குமுழமுனையிலுள்ள தங்கபுரம் கிராமத்தைச் சேர்ந்த மக்கள் குடிப்பதற்கு நீரில்லாமல் மிகவும் அவஸ்தைப்படுகிறார்கள்" என்ற செய்தியை நான் நேற்றைய தினம் ஒரு பத்திரிகையில் படித்தேன். முல்லைத்தீவு மாவட்டத்தில் 2 வருடங்களுக்கு முன்பு காடுகளை அழித்தார்கள். அவ்வேளையில் நான் மேதகு ஜனாதிபதி அவர்களின் கவனத்திற்கு அதனைக் கொண்டு வந்தேன். அதன்பின் அதனை அவர் தடுத்துநிறுத்தியிருந்தார். தற்போது அந்தப் பிரதேசங்களில் குடிப்பதற்குத் தண்ணீரில்லாமல் மக்கள் அவஸ்தைப்படுகிறார்கள். ஆனால், அந்த நேரம் அனுமதியில்லாமல் மேற்கொள்ளப்பட்ட அந்தக் காடழிப்பை தற்பொழுது அனுமதி பெற்று மேற்கொள்வதற்கு நடவடிக்கையெடுக்கிறார்கள். உண்மையில் எங்களுடைய பிரதேசங்களில், குறிப்பாக வடக்கு பிரதேசத்தில் மரங்களை அழித்ததன்மூலம் மிகப்பெரிய வரட்சியை நாங்கள் தற்பொழுது அனுபவித்துக்கொண்டிருக்கின்றோம்.

மன்னார் மாவட்டத்தில் வில்பத்து என்ற பிரதேசத்தில் காடுகள் ஏற்கெனவே அழிக்கப்பட்டிருக்கின்றன. வெளிப் புறத்தில் பார்த்தால் அங்கே காடுகள் அழிக்கப்பட்டதுபோல் தெரியாது. ஆனால், உள்ளே சென்று பார்த்தால்தான் அந்தப் பிரதேசத்துக்குரிய காடுகள் எவ்வளவு அழிக்கப்பட்டிருக் கின்றன என்பதை நன்கு அறியமுடியும். முள்ளிக்குளம், வில்பத்துப் பிரதேசங்களில் எவ்வளவு காடுகள் அழிக்கப்பட்டிருக்கின்றன என்ற விபரங்கள் மன்னார் மாவட்டத்திலுள்ள கடற்படை அதிகாரிகளிடம் இருக்கின்றன என்று நான் நினைக்கின்றேன். அதேபோன்று இரண்டு வருடங்களுக்கு முன்பு முல்லைத்தீவு பிரதேசத்தில் காடுகளைச் சட்டவிரோதமாக அழித்தவர்கள் இன்று அனுமதி எடுத்து அவற்றை அழிப்பதற்கு நடவடிக்கை எடுக்கிறார்கள். எனவே, இவ்வாறு காடுகள் அழிக்கப்படுவதை மேதகு ஜனாதிபதி அவர்கள் தடுத்து நிறுத்தவேண்டும். ஏனென்றால், அவரே சுற்றாடல் அமைச்சராகவும் இருக்கிறார். எங்களுடைய பிரதேசங்களில் இருக்கின்ற வளங்கள் அழிக்கப்படுவதை அங்குள்ள மக்கள் உட்பட நாங்களும் முற்றுமுழுதாக எதிர்க்கின்றோம். அந்த வளங்களைக் கடந்த காலங்களில்-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
You have only two more minutes, Hon. Member.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

කදන්ත කාලයක්ලයේ අප්පිරතේසංකලේ යුත්තම් නටෙපත්තු. මිකප්පරිය අළිවෙක් කොටුත්ත ඉරුතු යුත්තම් මුල්ලෙත්තීවු මාවට්ටත්තිලේයේ නටෙපත්තු. තත්පොළුතු නීංකල් මුල්ලෙත්තීවු මාවට්ටත්තුක්කුච් චෙන්රු පාර්ත්තාල් තෙරියුම්, අංකු එව්වළවු තේක්කු මරංකල් නාට්ටප්පට්ටු කාටුකල් උරුවාක්කප්පට්ටිරුක්කිතු එන්රු. විටුතලෛප් පුලිකළින් කාලත්තිල් අංකුල්ළ ඉයර්කෛ වළංකල් පාතුකාක්කප්පට්ටන. අතුමට්ටුමන්රි, අවර්කල් පුතිය පුතිය මරංකලෛ නාට්ටි, මුල්ලෙත්තීවු මාවට්ටත්තෛ මිකප්පරිය චෝලෛයාක උරුවාක්කි වෛත්තිරුන්තාර්කල්. ආනාල්, ඉන්රු අන්තක් කාටුකල් අරචියල් පලම් මික්කවර්කළාල් අලික්කප්පටුකින්රන. ඉතෛ නාංකල් වන්මෛයාකක් කණ්ටික්කිරෝම්. යුත්තත්තුක්කු මුන්පු අංකිරුන්තු ඉටම්පෙයර්න්ත මක්කලෛ මීල්කුටියේර්රුවතාක ඉරුන්තාල්, කාටුකලෛ අලික්ක වේණ්ටිය තේවෛයිල්ලාත පිරතේසංකළිල් අවර්කලෛ මීල්කුටියේර්රම් චෙය්යලාම්. අතර්කු යාරුම් එතිර්ප්පිල්ලෛ එන්පතෛ නාන් ඉංකු චොල්ලික්කොල්ළ විරුම්පුකින්රේන්.

අතේනේරත්තිල්, අරචියල් චාර්න්ත, අරචියල් පලමුල්ළ, අරචියල් රීතියාකච් චෙල්වාක්කුටෛයවර්කළ් ඉලංකෛයිල් එන්තප් පිරතේසත්තිලුම් චෙන්රු අරස කාණිකලෛප් පෙර්රුක්කොල්කිරාර්කල්; අංකු වීටුකලෛ අරචාංකත් තින්මූලම් අමෛත්තුක්කොල්කිරාර්කල්; මීණ්ටුම් පිර මාවට්ටංකළුක්කුච් චෙන්රු අංකුල්ළ අරස කාණිකලෛප් පෙර්රුක්කොල්කිරාර්කල්; වීටුකලෛප් පෙර්රුක් කොල්කිරාර්කල්. ඉව්වාරු අරචාංකත්තෛච් චාර්න්තවර්කළුක්කු ඔරු මාතිරියාකවුම් අරචාංකත්තෛච් චාරාතවර්කළුක්කු වේරොරු මාතිරියාකවුම්තාන් අරචාංකත්තින් චෙයර්පාටුකල් ඉරුක්කින්රන. ආකවේ, ඉලංකෛයිලුල්ළ මක්කල් අනෛවරෛයුම් එල්ලා විතත්තිලුම් ඔරේමාතිරියාකප් පාර්ක්කවේණ්ටුමෙන්රු නාන් ඉන්ත නාට්ටින් ජනාතිපති, පිරතමර් උට්පට අරචාංකත්තිල් අංකම් වකික්කින්ර අත්තනෛ පේරිටමුම් එංකළුටෛය මක්කල් චාර්පාකක් කෝරික්කෛ විටුත්තු, විටෛපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු සුජීව සේනසිංහ රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.34]

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඒකට මේ දවස්වල අපේ අමාත්‍යාංශවල ගොඩක් වැඩ. [බාධා කිරීමක්] නම අමතක වුණාට අපේ වැඩ අමතක වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම අපේ අලුත් මුදල් අමාත්‍යතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා ප්‍රායෝගික හා දක්ෂ මුදල් අමාත්‍යවරයෙක්. අපේ ඉදිරි ගමන සම්බන්ධයෙන් එතුමා විශාල කාර්ය භාරයක් ඉටු කරාවි. අපි බලාපොරොත්තු වන විධියට මේ රටේ සංවර්ධනය සඳහා, මේ අවුරුදු දෙක තුළ අපි හොඳ අත්තිවාරමක් දාලා තිබෙනවා. අවුරුදු තුන හතරක් යනකොට එම අත්තිවාරම මත විශාල සංවර්ධනයක් කරන්න, ඇමෙරිකානු ඩොලර් බිලියන 10ක වගේ ප්‍රමාණයක් ගෙනැල්ලා, කර්මාන්ත පුර පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු මුදල් ඇමතිතුමාගේ කාලය තුළ මේ රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් උපරිම වශයෙන් කටයුතු කරන්න අවස්ථාව ලැබේවා කියා මම එතුමාට සුබ පතනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාත් එතුමාගේ ගුණ වර්ණනා කළා. ඒක හොඳයි. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් පවා අපේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ හොඳ, ඒ වාගේම දක්ෂතා සම්බන්ධයෙන් යම් කිසි අවබෝධයකින් ඉන්න එක හොඳයි.

Perpetual Treasuries ආයතනයේ ගනු-දෙනු පිළිබඳව සොයන ජනාධිපති විමර්ශන කොමිසමට ඉදිරිපත් වන කරුණු සම්බන්ධයෙන් එතුමා දිගින් දිගටම කථා කළා. විශේෂයෙන්ම මේ රටේ කථා බහට ලක්වුණු දෙයක් සම්බන්ධයෙන් ඉතා කෙටි කාලයක් තුළ පරීක්ෂණ ආරම්භ කර කටයුතු කරගෙන යන එක දැන් රටටම අමතක වෙලා තිබෙනවා. වර්තමානයේ සිදුවුණු සිදුවීමක් සම්බන්ධයෙන් ඉතාමත් කෙටි කාලයක් තුළ පරීක්ෂණ පවත්වමින් තිබෙනවා. මේ වන විට Perpetual Treasuries ආයතනය සම්බන්ධයෙන් යම් කිසි ආකාරයක විශ්ලේෂණයක් සිදුවෙනවා. හැබැයි, අපි විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට මතක් කරනවා, Perpetual Treasuries ආයතනය ගැන කථා කරනවා වාගේම කියන්න ඕනෑ බව, ගරු මන්ත්‍රීවරයෙකුගේ මල්ලි කෙනෙකුට අයත්, -මන්ත්‍රීවරයෙකුගේ පවුලේ කෙනෙකුට අයත්- Entrust Securities ආයතනයත් රුපියල් බිලියන නමයහමාරක් ගිල්ල බව. අපි ජනාධිපතිතුමාගෙනුයි, අගමැතිතුමාගෙනුයි අහන්නේ, මේවාට ජනාධිපති විමර්ශන කොමිෂන් පත් කරන්නේ නැත්තේ ඇයි කියන එකයි. මම දැන් ගරු මුදල් ඇමතිතුමාගෙනුත් මේ ඉල්ලීම කරනවා. මුදල් ඇමතිතුමනි, Entrust Securities සමාගම රුපියල් බිලියන නවයහමාරක් ගිලලා තිබෙනවා. මහ බැංකුවෙන් රුපියල් බිලියන 5ක්, අපේ රටේ ආයෝජකයන්ගෙන් රුපියල් බිලියන හතරහමාරක් ගිල්ලාට පස්සේ ඒ සඳහා මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙන්නේ නැහැ. කුමන හෝ දූෂණයක් සිදුවෙනවා නම්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වලා, දඬුවම් දෙන්න මේ ආණ්ඩුවට කොන්දක් තිබීම පිළිබඳව අපි ආඩම්බර වෙනවා. විශේෂයෙන්ම මේ ආණ්ඩුව විනිවිදභාවයකින් යුතුව, ඒ වාගේම දූෂණයට විරුද්ධව කටයුතු කළ ආණ්ඩුවක් වශයෙන් ප්‍රශ්නය කාගේද කියා බලන්නේ නැතුව නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. හැබැයි, රටේ ජනතාවට ඒක අමතක වෙන්න පුළුවන්.

රාජපක්ෂ පවුලට තිබෙන වත්කම් මොනවාද කියන විස්තර මට ලැබුණා. අවශ්‍ය නම් මට ඒවා පෙන්වන්න පුළුවන්. රුපියල් මිලියන 2,873ක දේපළ තිබෙනවා. අවශ්‍ය නම් මම එකින් එකට කියන්නම්. බලන්න, අංක 28, බුවුන්සිල් පෙදෙස කියන තැන අක්කර 1යි, රූඩ් 1ක විශාලත්වයෙන් යුත් ඉඩම රුපියල් ලක්ෂ 560යි; මල්වාන ඉඩම රුපියල් ලක්ෂ 1,900යි; ගම්පහ, ඔරුතොට අක්කර 1ක ඉඩමේ වටිනාකම රුපියල් ලක්ෂ 1,500යි; අංක 173/2, මිහිදු මාවත, දෙහිවල දකුණ ලිපිනයේ ඇති දේපළේ වටිනාකම රුපියල් ලක්ෂ 490යි; හම්බන්තොට, "සිරිබෝපුර කැලේ" නමැති ඉඩම රුපියල් ලක්ෂ 16යි; සිරිබෝපුර කැලේ තව ඉඩම් කැල්ලක් රුපියල් ලක්ෂ 16යි; ඒ වාගේම රුපියල් ලක්ෂ 16ක් වටිනා තවත් ඉඩම් කැබැල්ලක් තිබෙනවා. CSN නාලිකාවට අයත්ව තිබූ OB රථය -ජංගම විකාශන රථය- රුපියල් ලක්ෂ 800යි. මුදල් ඇමතිතුමනි, දැන් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කරන්නේ නැත්තේ ඇයි? මුදල් අමාත්‍යතුමනි, විශේෂයෙන්ම ඔබතුමා ඉදිරිපත් කරන "විදේශ විනිමය" පනත් කෙටුම්පතට අපි

[ගරු සුජීව සේනසිංහ මහතා]

සහයෝගය ලබාදෙන්නේ මෙන්න මේ කාරණා නිසායි. ඉදිරියේදී මේ රට දියුණු වෙනවා. කර්මාන්තපුර, ආයෝජන කලාප විශාල ප්‍රමාණයක් ඉදි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ වෙනකොට මම කළුතර දිස්ත්‍රික්කය තුළ ඒ සම්බන්ධයෙන් වැඩ කරගෙන යනවා. අදාළ සමාගමත් එක්ක සාකච්ඡා කරලා අපි කළුතර දිස්ත්‍රික්කයේ අක්කර 700ක් දියුණු කරන්න බලාපොරොත්තු වෙනවා.

මාස 4ක්, මාස 5ක් යනකොට අපි මේ කටයුතු පටන් ගන්නවා. අපි කර්මාන්ත 200ක් ආරම්භ කරන්න බලාපොරොත්තු වනවා. රුපියල් බිලියන 9ක විශාල ආයෝජන ප්‍රමාණයක්, විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපි බලාපොරොත්තු වනවා. විශේෂයෙන් තෙල් පිරිපහදුවක්, ගෑස් lines දෙකක්, සිමෙන්ති කර්මාන්තශාලා දෙකක්, ඒ වාගේම හම්බන්තොට වරාය දියුණු කිරීම, මත්තල ගුවන් තොටුපොළ දියුණු කිරීම, ත්‍රිකුණාමලය වරාය දියුණු කිරීම ආදිය තුළින් රුපියල් බිලියන 9ක් අපි බලාපොරොත්තු වනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පනත් කෙටුම්පත ගෙනා එක හොඳයි. මුදල් ඇමතිතුමනි, පසු ගිය අවුරුදු 10 තුළ -චාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා දැක්වූ ආකාරයට, මා කියන්නේ මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින නිසායි.- 2005 සිට 2015 දක්වා අපේ රටින් ඩොලර් බිලියන 10ක් එළියට ගිහින් තිබෙනවා. නීත්‍යානුකූල නොවන ආකාරයේ හොර සල්ලි ඩොලර් බිලියන 10ක් මේ රටින් එළියට ගිහින් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපේ ඇඟිල්ල කෙළින්ම දික් වෙන්නේ, පසු ගිය ආණ්ඩුවේ හිටපු පාලකයන්ටයි. ඒ පිරිස ඩොලර් බිලියන 10ක් මේ රටින් එළියට ගෙන යනකොට මේ රටේ නීතිවලට හසු වුණේ නැහැයි කියලා අපේ විජිත හේරත් මන්ත්‍රීතුමන්ලාත්, අපිත් දන්නවා. මෙවැනි මුදලක් අපේ රටින් පිට රටට යනකොට අපේ රට ආර්ථික වශයෙන් විශාල ලෙස ඇදගෙන වැටෙනවා. එම නිසා තමයි අන්තිම අවුරුදු 10 තුළ අපේ අපනයන සියයට 20කින් පහළට ගිහින් තිබෙන්නේ. ලෝක වෙළෙඳ පොළේ බැලුවොත්, 2005 දී සියයට 0.09ක් වශයෙන් තිබුණු අපේ අපනයන සියයට 0.04 දක්වා සියයට 0.05කින් ඇද වැටුණා; ආර්ථිකයේ කිසිම සංවර්ධනයක් සිදු වුණේ නැහැ.

ජනාධිපතිතුමා කිව්වා, මාස තුනකින් හොරුන් අල්ලන්න එතුමාට පුළුවන්ය කියලා. අපි එතුමාගෙන් ඉල්ලා සිටිනවා, Entrust Securities එක සම්බන්ධයෙන්, First Capital එක සම්බන්ධයෙන් ජනාධිපති කොමිෂන් සභා පත් කරන්න කියලා. පසු ගිය ආණ්ඩුව කාලයේ මේ ආයතන තුනටම licence දුන්නේ ටෙන්ඩර් නැතුවයි. මේ අය පසු ගිය ආණ්ඩුවේ හිටපු ජනාධිපතිතුමාගේ දරුවන්ගේ හොඳ යහළුවෝ. මේ අයට තමයි දුන්නේ. අපට අනිවාර්යයෙන්ම නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. ජනාධිපතිතුමාට පුළුවන් නම් මේ ආයතන තුනටත් ජනාධිපති කොමිෂන් සභා ඇති කරන්න. ඩොලර් බිලියන 5ක මුදල් ප්‍රමාණයක් වංචා කරලා, ඩුබායි රටේ ඩොලර් මිලියන 600ක්, 700ක් තිබෙනවා ලු; ඒ වාගේම සී ෂෙල්ස් රාජ්‍යයේ ඩොලර් මිලියන 700ක්, 800ක් තිබෙනවා ලු. මේවාට ජනාධිපති කොමිෂන් සභා පත් කරන්නේ නැත්තේ ඇයි? ඒ වාගේම ගෝඨාභය රාජපක්ෂ මහත්මයා සම්බන්ධයෙන් ඩොලර් මිලියන ගණනක MiG deal එකක් තිබෙනවා. කෝ, මේවාට ජනාධිපති කොමිෂන් සභා පත් කරනවා? මේ ආණ්ඩුව පත් කරන්න අපි මහන්සි වුණා. දූෂණය ගැන අපි කථා කළා. ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් අපි ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධයෙනුත් ජනාධිපති කොමිෂන් සභා පත් කරන්නය කියලා. ජනාධිපති කොමිෂන් සභා ඇති කරන්න තිබෙන බාධාව මොකක්ද; ප්‍රායෝගික අපහසුතාව මොකක්ද? මේ අවස්ථාවේදී ජනාධිපති කොමිසම මඟින් අපි කෙන්දක් තමයි මතු කරලා තිබෙන්නේ. පසු ගිය අවුරුදු 10, 15 තුළ මේ රටේ ගොඩනැඟිලි ඉදි කිරීම සම්බන්ධයෙන් සිදු කරපු වංචා, දූෂණ කඳු ගණනාවක් තිබෙනවා තව සොයන්න. ඒවාට නීතිය ක්‍රියාත්මක කරන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ නිසා අපි ඉල්ලා සිටිනවා, ඉතා ඉක්මනින් මේවා සම්බන්ධව කටයුතු කරන්න කියලා. මේ කටයුතු අපට කරන්න බැහැ. අපි පොඩි අමාත්‍යාවරු. මේවාට උත්තර දෙන්න පුළුවන් ජනාධිපතිතුමාටත්, ඒ වාගේම අගමැතිතුමාටත්. ඒ වෙනුවෙන් කොමිෂන් සභා පත් කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. හැකි නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා, මුල ඉඳලා විශේෂ අධිකරණ පත් කරන්න අපි එතුමාට යෝජනා කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි අනාගතයේදී අපි විශාල සංවර්ධනයක් කරනවා. අපි කාර්මික වෙළෙඳ කලාප කිහිපයක්ම ඇති කර මේ රටේ අක්කර 20,000ක ප්‍රමාණයක් සංවර්ධනය කරනවා. හම්බන්තොට අක්කර 3,000ක්, ඔබතුමාගේ මොණරාගල අක්කර 7,000ක්, මාතර අක්කර 2,000ක්, කළුතර අක්කර 2,000ක්, ගාල්ලේ අක්කර 2,000ක්, මහනුවර-කුරුණෑගල ප්‍රදේශයේ තවත් අක්කර 1,000ක්, 1,500ක් ආදී වශයෙන් ගන්න මේ වෙන කොට අපි ඒ වැඩ පටන් අරගෙන තිබෙනවා. තායිලන්තයේ රොජානා සමාගම මේ වෙන කොට අප සමඟ ඒ ගැන කථා කරලා දවස ගණනේ අපි හම්බ වෙනවා. RDA එක, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ආදී ආයතනවලින් ඒ පහසුකම් සියල්ල අපි සම්පාදනය කරනවා, කළුතර ආසනයේ මිල්ලනිය සහ මිල්ලැව කියන ප්‍රදේශයේ අක්කර තුන්සිය ගණනක් සහ අක්කර දෙසිය ගණනකට. මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් මුල්ගල් තියලා ඒ වැඩ පටන් ගන්න අපි බලාපොරොත්තු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම කටයුතු පටන් ගත්තොත් අවුරුදු දෙකක් ගත වෙන කොට කාර්මික ආයතන දෙසියයක් වැනි සංඛ්‍යාවක් ස්ථාපිත කරන්න පුළුවන් වෙනවා.

"හොණ්ඩා" වැනි ලෝකයේ බලවත් ආයතන තුළින් මේ රටේ තරුණයන්ට රැකියා උත්පාදනය කරන්නත්, එමඟින් ආදායම් ලබා ගන්නත් හැකි වෙනවා. ඒ තුළින් මේ රට විශාල සංවර්ධනයකට ගමන් කරවීමටත් අපි බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අගමැතිතුමාගේ දේශපාලන දිවියේ 40වැනි සංවත්සරය සමරන අවස්ථාවේදී එතුමාගේ දැනුම, එතුමාගේ හැකියාව ඉදිරි අනාගතය සඳහා යොදා ගැනීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, ඉතා කෙටි කාලයක් තුළදී දක්ෂ මුදල් ඇමතිවරයෙක් එක්ක අනාගතයේදී මේ රට මැලේසියාවක් බවට පත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ඒ කාර්යභාරය අපි කරනවා. විශේෂයෙන් ජනාධිපතිතුමා හොරකම්, දූෂණ සම්බන්ධයෙන් සොයා බලා, ඒවා වෙනුවෙන් කොමිෂන් සභා ඇති කරලා, ඒ ආයතනවලට නියෝග කරලා, ඒවාට වැරැදිකරුවන් වන පුද්ගලයන් අධිකරණයට ගෙනැල්ලා ඒ

සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ ගෙන ආ විදේශ විනිමය පනත් කෙටුම්පත අනුව ඇත්තටම එක පැත්තකින් ප්‍රාග්ධන ගිණුමත්, අනෙක් පැත්තෙන් ජංගම ගිණුමත් සීමා ඉක්මවමින් විවෘත කිරීමක් සිද්ධ වෙනවා. විවෘත ආර්ථිකයට අවුරුදු 40ක් පිරෙන අවස්ථාවේ ඔබතුමන්ලා මෙතෙක් තිබුණු සීමා මායිම් ඉවත් කරලා, -මුදල් ඇමතිතුමාගේ වචනයෙන්ම කියනවා නම්, සම්පූර්ණ liberalization එකකට- ලිබරල්කරණයකට- ආර්ථිකය ගෙන යන තත්ත්වයකටයි දැන් ඇවිල්ලා තිබෙන්නේ.

මෙහි තිබෙන අනතුර අපි මතක් කරන්න කැමැතියි. විශේෂයෙන්ම ලෝක ආර්ථික අර්බුදය ඇති වුණු වෙලාවේ, 2008 නැඟෙනහිර ආසියාවේ ආර්ථිකය කඩා ගෙන වැටුණු වෙලාවේ, අපේ රට බේරුණේ අපි මේ ගිණුම් ඕනෑවට වඩා විවෘත කරලා නොතිබුණු නිසායි. ඒ නිසා එදා සෝරෝස්ලාට ඕනෑ විධියට අපේ රටට සල්ලි ගෙනැල්ලා, සෝරෝස්ලාට ඕනෑ විධියට අපේ රටෙන් සල්ලි එකවර අදින්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මොකද, අපේ විදේශ විනිමය පනත එදා ශක්තිමත්ව තිබුණා; ඕනෑවට වඩා ලිබරල්කරණයක් තිබුණේ නැහැ. ඒ නිසා ලෝක ආර්ථික අවපාතය ඇති වුණු මොහොතේදී නැඟෙනහිර ආසියාවේ බොහෝ රටවල් -දකුණු කොරියාව, මැලේසියාව පවා- මේ අර්බුදයට මුහුණ දීපු වෙලාවේ, අපේ විදේශ විනිමය පනතේ තිබුණු ශක්තිමත්කම නිසා රටක් විධියට අපි ආරක්ෂා වුණා. නමුත්, ඔබතුමන්ලා අද මේ කරන ලිබරල් කිරීමෙන් එවැනි අනතුරක් අනාගතයේ ඇති වුණු මොහොතකදී, එවැනි ආර්ථික අවපාතයක් ඇති වුණු මොහොතකදී, සෝරෝස් පන්නයේ, මුදල් ක්ෂණිකව රටකින් තවත් රටකට අදින මොහොතකදී, අපිට ඒකෙන් ආරක්ෂා වෙන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ අනතුර ඉතා පැහැදිලිව මෙතැන තිබෙනවා කියන එක මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවක් විධියට ගත්තොත්, "රටේ ආර්ථිකය බංකොලොත් කරන්න ණය ගන්නවා"ය කියමින් ඔබතුමන්ලා පසු ගිය ආණ්ඩුවට යම් යම් විවේචන ඉදිරිපත් කළා. නමුත්, ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත්තාට පස්සේ ඔබතුමන්ලාත් නැවත වතාවක් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් වාගේම වෙනත් මූල්‍ය ආයතනවලින් ණය ගන්න පටන් ගත්තා. අනෙක් පැත්තට බදු ගැහුවා; දඩ ගැහුවා; සහනාධාර කප්පාදු කළා; පාසල් නිල ඇඳුම කප්පාදු කළා; පොහොර සහනාධාරය කප්පාදු කළා; ඒ මුදල් අඩු කලා. ඔබතුමන්ලා කළේත් පරණ ආණ්ඩුව කරපු දේම තමයි. එක පැත්තකින් ණය ගත්තා. අනෙක් පැත්තෙන් බදු ගැහුවා, දඩ වැඩි කළා. අනෙක් පැත්තෙන් සහන කප්පාදු කළා. දැන් ඔබතුමන්ලා රාජ්‍ය සම්පත් විකුණනවා. අද වරාය විකිණීම, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික විකිණීම, ඒ වාගේම හම්බන්තොට වරායේ bunkering සම්පූර්ණයෙන්ම චීනයට පවරා දීම සිද්ධ වෙන්නේ ඒක නිසායි. ඒ නිසා, ඔබතුමන්ලා දැන් මේ කරලා තිබෙන්නේ රටේ නිෂ්පාදනය වැඩි කරන ආර්ථිකය ශක්තිමත් කිරීමක් නොවෙයි. රටක ආර්ථික සංවර්ධනය වේගයෙන් ගෙන යන්න පුළුවන් වෙන්නේ රටේ කෘෂි කාර්මික සහ කාර්මික නිෂ්පාදනය වැඩි කිරීමෙන් පමණයි. නමුත් ඔබතුමන්ලා කළේ, පරණ සෙල්ලමම ඒ විධියට අරගෙන යන එකයි; බදු ගහලා, දඩ ගහලා, ණය වෙලා, රාජ්‍ය සම්පත් විකුණලා, සහනාධාර කප්පාදු කරලා අරගෙන යන්න හදන එකයි. එහෙම කරලාත් දැන් ඔබතුමන්ලාට ආර්ථිකය ගෙන යන්න බැහැ. මොකද, ඒ විධියට ණය අරගෙනත්, දඩ ගහලාත්, බදු ගහලාත් ආර්ථිකය ඉස්සරහට ගෙන යන්න බැහැ.

මොකද, ඔබතුමන්ලා කියපු දේවල් -ආයෝජකයන් ඇවිල්ලා, කර්මාන්ත පුර ඇති කරලා ලක්ෂ ගණන් රැකියා දෙනවා කියලා කියපු ඒවා- මොකක්වත් සිද්ධ වෙලා නැහැ. එම නිසා ඔබතුමන්ලා හිර වෙලා, හිර වෙලා බිත්තියට හේත්තු වුණාට පසුව අත තිබ්බේ මොකකටද? මේ විදේශ විනිමය පනතටයි. විදේශ විනිමය පනත හරහා ඔබතුමන්ලා දැන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? පසු ගිය කාලයේ රටින් බැහැර කරපු -විවිධ අක්‍රමිකතා, විවිධ වංචා, දූෂණ හරහා රටින් ගෙනිච්ච- කළු සල්ලි නැවත රටට ගෙනෙන්නයි මේ උත්සාහ කරන්නේ. එම නිසා ඔබතුමන්ලාගේ ආර්ථික උපාය මාර්ගය කොයි තරම් දුප්පත්ද, කොයි තරම් අපොහොසත්ද කියන එක මෙයින් ඔප්පු වෙලා තිබෙනවා. ඔබතුමන්ලා රටේ නිෂ්පාදනය වැඩි කරන්න පියවර ගත්තේ නැහැ. සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා කිව්වා, "පසු ගිය කාලයේ අපේ අපනයන ආදායම අඩු වුණා" කියලා. 2000 වසරේදී GDP එකෙන් සියයට 33ක් තිබුණු අපේ අපනයන ආදායම රාජපක්ෂ පාලන කාලයේදී අවුරුද්දෙන්-අවුරුද්ද අඩු වුණා. 2014 වන විට GDP එකෙන් සියයට 14ක් දක්වා අපේ අපනයන ආදායම අඩු වුණා.

පසුගිය අවුරුදු දෙකහමාරේ මොකක්ද වුණේ? ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අපනයන ආදායම වැඩි කළාද? ඔබතුමන්ලා කිව්වේ, "රාජපක්ෂ පාලන කාලයේ අපේ අපනයන ආදායම අඩු කළා" කියලායි. හැබැයි, 2014දී GDP එකෙන් සියයට 14ක් වෙච්ච අපේ අපනයන ආදායම ඔබතුමන්ලා අද වන විට සියයට 12ක් දක්වා අඩු කරලා තිබෙනවා. මේ අවුරුදු දෙකහමාර තුළ ඔබතුමන්ලා විශ්වකර්මයක් කරලා, නිෂ්පාදනය වැඩි කරලා අපනයන ආදායම වැඩි කළේ නැහැ. සාමාන්‍යයෙන් අද රුපියලේ අගය බාල්දුවීමත් එක්ක -ඩොලර් එක රුපියල් 155ක් විතර වන විට- අපනයන ආදායම වැඩි වීමයි විය යුත්තේ. නමුත් වෙලා තිබෙන්නේ, අපනයන ආදායම සම්පූර්ණයෙන්ම කඩා වැටිච්ච එකයි. රටේ නිෂ්පාදනය වැඩි කරලා නිෂ්පාදන ආර්ථිකය තුළ රටේ රැකියා අවස්ථා, රටේ ආයෝජන අවස්ථා වැඩි කිරීම නොවෙයි ඔබතුමන්ලා කර තිබෙන්නේ. ඔබතුමන්ලා කරලා තිබෙන්නේ, පරණ සෙල්ලම; ණය ගන්න එක; බදු ගහන එක; දඩ ගහන එක; බදු ගහන්නත් තව අලුත් පනත් කෙටුම්පත් හඳුන්වා දෙන එක; එතැනින් එහාට ගිහිල්ලා පසු ගිය කාලයේ සොරකම් කරපු ඒ කළු සල්ලි ටික නැවත රටට ගෙනෙන්න අලුතෙන් මේ පනත වෙනස් කරපු එක. ඒ හැර ඔබතුමන්ලාගේ පැත්තෙන් නිෂ්පාදනය මත රටේ ආර්ථිකය ගෙනියන ක්‍රමයක් ඇති කරලා නැහැ. මෙතැනදී, මුදල් විශුද්ධිකරණ පනතට යටත් කියලා ඔබතුමන්ලා කියනවා. හැබැයි, මෙහි ඉතා බරපතළ අනතුරක් තිබෙනවා. මේ සියලු අණපනත් තිබියදී අද අපේ ආර්ථිකය තුළ කොයි තරම් වංචා, දූෂණ සිද්ධ වෙනවාද? කොයි විධියටද මේවා එහාට මෙහාට වෙන්නේ කියන එක ඉතා පැහැදිලිව පේන්න තිබෙනවා. මේ පනත් කෙටුම්පත හරහා ඇත්තටම සිද්ධ වෙන්නේ තවදුරටත් ජංගම ගිණුමත්, ප්‍රාග්ධන ගිණුමත් විවෘත වෙන එකයි. ඒ විවෘත වුණාට පසුව, 1977 විවෘත ආර්ථිකය ඇවිල්ලා එක පාරටම දෝරේ ගලා ගෙන සියල්ල කඩා ගෙන ගියා වාගේ, මේ හරහා අපේ මූල්‍ය ක්ෂේත්‍රය, මූල්‍ය ආයතන ටික කඩා ගෙන යන්න

[ගරු විජිත හේරත් මහතා]

පුළුවන් අනතුරක් මෙය ඉදිරියේ තිබෙනවා. ඒක පාලනය කරන්නේ කොහොමද? මුදල් විශුද්ධිකරණ පනතෙන් ඒක පාලනය කරන්න පුළුවන්ද? එහෙම නැත්නම් අල්ලස් කොමිෂන් සභා පනතෙන් ඒක පාලනය කරන්න පුළුවන්ද? ඒවායින් පාලනය කරන්න බැහැ. වංචා, දූෂණවලින් හම්බ කරපු සල්ලි පිළිබඳව යම් කිසි මැදිහත්වීමක් කරන්න ඒවායින් පුළුවන්. නමුත්, මූල්‍ය ක්ෂේත්‍රය එකවර කඩා වැටෙන එක ඒකෙන් පාලනය කරන්න බැහැ. මොකද, දොරවල් විවෘත කළාට පසුව ඕනෑ කෙනෙකුට එන්නත් පුළුවන්; යන්නත් පුළුවන්. ඒ නිසා මුදල් එන්නත් පුළුවන්, ඒ වාගේම මුදල් යන්නත් පුළුවන්. ඒ යන විධිය එක එක විධියට ප්‍රකාශ කරන්න පුළුවන්. ඔබතුමන්ලා කියනවා, රජයට බදු ගෙවලා තමයි මේ සල්ලි ගන්න තිබෙන්නේ; රජයට ප්‍රකාශ කරලා තමයි මේවා ගේන්න තිබෙන්නේ කියලා. නමුත් වෙන්නේ කොහොමද කියලා අපි බලමු. අපි දකිනවා, මෙතැන අනතුරක් තිබෙන බව.

ඒ අනතුර ප්‍රායෝගිකව සිද්ධ වෙන තත්ත්වයෙන් තමයි එයින් කොයි තරම් අවාසිදායක තත්ත්වයක් එනවාද, කොයි තරම් වාසිදායක තත්ත්වයක් එනවාද කියලා රටේ ජනතාවට තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. රටක ආර්ථිකය විවෘත කිරීම කියන එක ඕනෑවට වඩා, අනවශ්‍ය විධියට සීමාව ඉක්මවලා විවෘත කළොත් එහි අනතුරක් තිබෙන බව ඉතා පැහැදිලිව අපි මතක් කරන්න කැමැතියි. මොකද, ලෝකයේ කොයි රටවත්, විවෘත ආර්ථිකයේ හිණිපෙත්තටම ගිය උග්‍ර බටහිර රටවල් පවා තමන්ගේ ආර්ථිකය ඕනෑවට වඩා නිදහස් කරන්නේ නැහැ; තමන්ගේ මූල්‍ය වෙළෙඳ පොළ ඕනෑවට වඩා අනෙක් රටවලට විවෘත කරන්නේ නැහැ. එවැනි අනතුරක් වෙයි කියන ඒ අවදානම ගැන ඔවුන් හැම වෙලාවේම කල්පනා කරනවා. ඒ නිසා තමන්ගේ ආර්ථිකය ආරක්ෂා කර ගැනීමේ පැත්තෙන් තමයි නීති-රීති හදන්නේ; විදේශ විනිමය පනත් කෙටුම්පත් තමන්ගේ රටට ගැළපෙන විධියට සම්මත කර ගන්නේ. නමුත්, අපි අද ඒකේ අනෙක් පැත්තට ගමන් කරනවා. අපි ඒකේ ආරක්ෂණ වාදයෙන් එහා පැත්තට යනවා. එතකොට විශේෂයෙන් පුංචි රටක් විධියට ඒ ඇතිවෙන ආර්ථික තත්ත්වයට මුහුණ දෙන්න අපට අමාරු වනවා. එම නිසා ඒ අනතුර නැවතත් මම මේ ගරු සභාවේ අවධානයට ලක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් විශුද්ධිකරණය ගැනත්, ඒ වාගේම පසු ගිය කාලයේ සිද්ධ වුණු වංචා, දූෂණ පිළිබඳවත් මීට පෙර කථා කළ කථිකයන් කථා කළා. මට කලින් කථා කළ සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමා ලැයිස්තුවක් කිව්වා. ඒ ලැයිස්තුව කියලා කිව්වා, පරණ ආණ්ඩුව කාලයේ සිද්ධ වෙච්ච ඒවා පිළිබඳව. ඒවායේ වටිනාකම් රුපියල් මිලියන මෙච්චරයි මෙච්චරයි කියලා කිව්වා. නමුත්, ඒවා පිළිබඳ තවම නිසි ක්‍රියා මාර්ග අරගෙන නැහැ කියලා කිව්වා. කවුද එම ක්‍රියා මාර්ගයන් ගන්න ඕනෑ? ඒ ක්‍රියා මාර්ග ගැනීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවටයි. ඒ සියල්ලම ජනාධිපති කොමිසම හරහාම ක්‍රියාත්මක කරනවාය කියන එකක් එදා කිව්වේ නැහැ. 2015දී බලයට එද්දි මැතිවරණ වේදිකාවේ ඉතා පැහැදිලිව කිව්වේ, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතා පැහැදිලිව කිව්වේ ඒ සඳහා වෙනම විශේෂ අධිකරණයක් හදනවා කියලායි. මහා පරිමාණයෙන් -බිලියන, ට්‍රිලියනවලින්- සිද්ධ වුණු වංචා, දූෂණ පිළිබඳ සොයා බලන්න විශේෂ අධිකරණයක් පිහිටුවනවා කියලා කිව්වා. නමුත්, දැනට අවුරුදු දෙකහමාරක් ගතවෙලා තිබෙනවා. ඔබතුමන්ලා තවම එවැනි අධිකරණයක් පිහිටෙව්වේ නැහැ. ඒවා පිළිබඳ සොයා බලන්න, පරීක්ෂණ කරන්න, ඒවා කඩිනම් කරන්න යන්ත්‍රණය තවම ශක්තිමත් කරලා නැහැ.

දැන් ජනාධිපති කොමිෂමටත් සිද්ධ වෙලා තිබෙනවා, මාස තුනෙන් තුනට කාලය දික් කර, දික් කර යන්න. මේ කොමිෂමෙන් සොයාගත් කරුණු කිහිපයක් තිබෙනවා. දැන් ඔබතුමන්ලා කියනවා, "පසු ගිය ආණ්ඩුවේ ඇමතිවරුන්ට චෝදනා තිබෙනවා; ඒ අය මෙහෙන් සල්ලි රුපියල් බිලියන පහ - දහය ගෙන ගියා; ඩුබායි බැංකුවල දැම්මා" කියලා. මාධ්‍ය ප්‍රකාශක රාජිත සේනාරත්න ඇමතිතුමාම මාධ්‍ය සාකච්ඡාවලට ඇවිත් කිව්වා, "ඇස් දෙකෙන් දැක්කා" කියා. අද වෙන තුරු ඒවා පිළිබඳව මොනවාද කළේ? එක හොරෙක්ව ඔබතුමන්ලාට අල්ලා ගන්න පුළුවන් වුණාද?

පසු ගිය ආණ්ඩුවේ ඒ හොරකම් කළාය කිව්ව එක හොරෙක්වත් අල්ලා ඔබතුමන්ලා මේ තාක් කල් නීතිය ඉස්සරහට ගෙනැවිත් නැහැ. හැබැයි ඔබතුමන්ලා කළ පළමුවන හොරකම අතේ මාට්ටුවෙලා ඉවරයි; ඒක අහුවෙලා ඉවරයි. මේ මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් ඊයේ දුන් ඒ සාක්ෂියක් එක්ක කවුද හොරා කියන එක දැන් මුළු රටටම දැන ගන්නට පුළුවන් වුණා. හොරු කවුද කියන එක ඔප්පුවෙලා ඉවරයි. දැන් ඒකේ නැවත හංගන්න දෙයක් නැහැ. රටේ මුදල් ඇමතිවරයාට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂවරයා තමන්ගේ මුදලින් ගෙයක් කුලියට අරගෙන දෙනවා නම් -නිකම් පුංචි ගණනක ගෙයක් නොවෙයි. රුපියල් ලක්ෂ 116ක කුලියක් ගෙවන ගෙයක් අරගෙන දෙනවා නම්- එතැන තිබෙන්නේ මොන ගනු දෙනුවක්ද කියන එක මුළු රටටම හිතාගන්නට පුළුවන්. ඒ ගෙය පස්සේ තමන්ගේ කොම්පැනියේ සල්ලිවලින් සින්නක්කර ගන්නට පුළුවන්. නමුත් අර්ජුන ඇලෝසියස් මේ නිවස හිමිකාරියගෙන් ඉතා පැහැදිලිව මේ නිවස මුදල් ඇමතිවරයාට අරගෙන දී තිබෙනවා. ඇය ඒ බව සාක්ෂියේදී කියනවා. ඒ පිළිබඳ බදු ඔප්පු තිබෙනවා. ඒ පිළිබඳ ලිඛිත සාක්ෂි තිබෙනවා. ඒ ලිඛිත සාක්ෂි දැන් ඉදිරිපත් වී තිබෙනවා. එහෙමනම් මේ මහ බැංකු බැඳුම්කර වංචාව සිද්ධ වුණේ කොහොමද කියන එක, අර්ජුන ඇලෝසියස්ලාට මේ ගනු දෙනු කොහොමද භාර දුන්නේ කියන එක දැන් රටට රහසක් නොවෙයි. එවැනි ඇමතිවරුන් ඔබතුමන්ලා තවදුරටත් ආරක්ෂා කරනවා. මුදල් අමාත්‍ය ධුරයෙන් ඉවත් කර, මුදල් අමාත්‍යාංශයට අයිති විෂයයන් දීලා, ඊටත් වඩා වෙනස් විදේශ අමාත්‍යාංශය භාර දීලා, තවමත් ආණ්ඩුව ඇතුළේ ඒ අය රකිනවා. හැබැයි, ඔබතුමන්ලා ඒ අය කොච්චර රැක්කත්, මේ රටේ ජනතාවගෙන් ඒක රකින්න බැහැ.

රාජපක්ෂ පාලනයෙන් වෙච්ච කප්පරක් සොරකම්, කප්පරක් දූෂණ වංචා පිළිබඳව කොච්චර ඔබතුමන්ලා කථා කළත්, ඔබතුමන්ලා පටන් ගන්නකොටම කරපු මහා පරිමාණ බැඳුම්කර වංචාවෙන් ඔබතුමන්ලා අහුවෙලා ඉවරයි. ඒ සොරකමට කවුද සම්බන්ධ වුණේ කියන එක දැන් මුළු රටටම හෙළිදරවු වෙලා ඉවරයි. එම නිසා මේ සිද්ධ වෙච්ච දේ හරියට තේරුම් අරගෙන දැන්වත් ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට බැඳුම්කර වංචාවේ ඇත්ත සිද්ධිය රටට හෙළිදරවු කරන්න. මේ කොමිෂන් පත් කරමින් සාක්ෂි විභාග කරමින් තව කල් ගත කරන්න ඕනෑ නැහැ. කවුද මේක සිද්ධ කළේ, මූලිකව මේකට සම්බන්ධ වෙච්ච තුන් හතර දෙනා කවුද කියා මේ ආණ්ඩුවේ හුඟක් අය දන්නවා; හුඟක් ඇමතිවරු, මන්ත්‍රීවරු දන්නවා; තමන්ගේ හෘදය සාක්ෂිය දන්නවා. එම නිසා එය ඉක්මනින් හෙළිදරවු කර ඒක ශුද්ධ කරන්න. තවත් හත් පොළේ ගා ගාන්නේ නැතිව ඒක රටට, ජනතාවට කියන්න. හෙට අනිද්දා වෙනකොට තව මොනවා එළියට ඒවිද දන්නේ නැහැ. එතුමා හෙට සාක්ෂි දෙන්න ගිහින් කරන ප්‍රකාශය තුළ තව මොන මොනවා එළියට ඒවිද දන්නේ නැහැ. එතුමා දැන් පොඩ්ඩක් තරහෙන් ඉන්නේ, එතුමාගේ ඇමතිකම වෙනස් කරන්න තව ඇමති කෙනෙක් - ජාතික ලැයිස්තුවෙන් පත්වෙච්ච ඇමති කෙනෙක්- මැදිහත් වුණාය කියා. මේ තිබෙන තරහ-මරහ අස්සේ කොමිසමට ගිහින් එතුමා සම්බන්ධයෙන් මොනවා කියයිද දන්නේ නැහැ. ඒ වාගේ දේවල් එළියට එනකොට ඔක්කොම හොරු ටික අතේ මාට්ටු වෙනවා. එම නිසා තවත් මේක ඉස්සරහට ගෙන ගිහින් හත් පොළේ ගා ගන්නේ නැතිව දැන්වත් ජනතාවට මේ ගැන කියන්න. මේ වෙච්ච සිදුවීම, මේ සොරකම, මේ මහා

පරිමාණ බැඳුම්කර වංචාව නිසා රුපියල් කෝටි 5500ක් ඒ මොහොතේම රටට අහිමි වුණා. ඒ සල්ලි, මේ රටේ පෞද්ගලික අංශයේ වැඩ කරන ජනතාවගේ අර්ථ සාධක අරමුදලේ -EPF එකේ- සල්ලි. ඒවා කොහෙන්වත් කොමිපැනිවලින් හම්බ කරපුවා නොවෙයි. මිනිස්සු දහඩිය මහන්සියෙන් පෞද්ගලික ආයතනවල වැඩ කරලා හම්බ කරපු සල්ලියි ඒ ජනතාවට අහිමි කළේ. එසේ අහිමි කර, ලක්ෂ 116 ගණනේ කුලියට ගෙවල් ගන්න ලජ්ජා නැද්ද? එහෙම දේවල් කරන්න හිරිකිත නැද්ද මේ ඇමතිවරුන්ට? මොකක්ද මේ ගනු - දෙනුව?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
අවුරුදු දෙකහමාරක් යනකොට මේ ආණ්ඩුව ඒ තත්ත්වයට පත් වුණා නම් තව අවුරුදු පහක් හයක් යනකොට මොනවා වෙයිද? ඇත්තටම අවුරුදු දෙකහමාරක් යන්න කලින් මේක සිද්ධ කර තිබෙන්නේ. මාසයෙන් මේ වැඩය කර තිබෙන්නේ. ජනවාරි මාසයේයි මේ ආණ්ඩුව පත් වුණේ. පෙබරවාරි මාසය වෙනකොට මේ බැඳුම්කර වංචාව සිද්ධ වුණා. ඒ කාලයේම තමයි මේ ගෙය කුලියට අරගෙන තිබෙන්නේ. ඒකට තමයි අර්ජුන ඇලෝසියස් සම්බන්ධ වෙලා තිබෙන්නේ. තව අවුරුදු පහක් හයක් යනකොට මොනවා වෙයිද? එතකොට රාජපක්ෂ පාලනයට හපන් වෙනවා නේ. රාජපක්ෂ පාලනය අන්තිම නරක දූෂිතම තත්ත්වයට එන්න ගත්තේ දෙවැනි වතාවේ. පළමුවැනි වතාවේ ටික ටික පටන් ගත්තා. ඊට පස්සේ භය අරුණා. 2010දී පත් වුණාට පස්සේ සොරකම, දූෂණය, වංචාව කප්පරක් එහා ගියා. ඒක පවුල් පාලනයක් දක්වා ගියා. ඒ තත්ත්වය, ආණ්ඩුව පටන් ගෙන මාසයෙන් ඔබතුමන්ලා කර තිබෙනවා. ඒ කට්ටිය අවුරුදු දහයක් තිස්සේ කරපු දේවල් ඔබතුමන්ලා මාසයක් යනකොට කර තිබෙනවා.

ඒ නිසා, එක පුද්ගලයෙක්, දෙන්නෙක්, තුන්දෙනෙක් සම්බන්ධ වෙලා කරපු මේ මහා පරිමාණ අපරාධයට ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා හැමෝටම අද වග කියන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ ගැන දැන් කොමිෂන් පත් කර-කර ඉන්න දෙයක් නැහැ; කොමිෂන්වලට සාක්ෂි දෙන්න දෙයක් නැහැ; ඒ සාක්ෂිවලින් තව මොනවා එළියට එයිද දන්නේත් නැහැ. එතෙක් ඉන්නේ නැතුව මේ අපරාධයට සම්බන්ධ අයට නිසි දඬුවම් දෙන්න, ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා ඒකට අවශ්‍ය කරන නිසි කඩිනම් ක්‍රියාමාර්ග ගන්න කියලා ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා කියපු ඒ වෙනම අධිකරණය පිහිටුවා මේ සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියා මාර්ග ගැනීමේ කටයුතු කඩිනම් කරන්න. ඒක මැතිවරණ පොරොන්දුවක්. ඒ මැතිවරණ පොරොන්දුවේ ඉතා පැහැදිලිව තිබුණා, වංචා-දූෂණ සෙවීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා වෙනම අධිකරණයක් පිහිටුවනවා කියලා. නමුත් ඔබතුමන්ලා තවමත් ඒක පිහිටෙව්වේ නැහැ. දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලය පිහිටෙව්වා; FCID එක පිහිටෙව්වා. ඒවායින් යම් යම් ක්‍රියා මාර්ග ගත්තා. නමුත් ඒවා පිළිබඳවත් ආණ්ඩුවේ ඇමතිවරු කිව්වේ මොනවාද? "දූෂණ විරෝධී කමිටු ලේකම් කාර්යාලයට මිලියන 65ක් වියදම් වුණා; ඒ මිලියන 65න් ශත පහක වැඩක් වුණේ නැහැ" කිව්වා.

දැන් සුජීව සේනසිංහ රාජ්‍ය ඇමතිතුමාම කිව්වා, මල්වානේ ඉඩම වෙනුවෙන් කොපමණ මුදලක් ගත්තාද කියලා. ඒ ඉඩමේ වටිනාකම කීයද? මිලියන 300යි. CSN නාළිකාවෙන් මිලියන 159යි. බැසිල් රාජපක්ෂලා ගෙවන්නේ නැතුව ගිය ගුවන් යානා ගාස්තු ගෙව්වා. එතැන මිලියන 16යි. ඊළඟට, තාත්තාගේ සොහොන හම්බන්තොට හදන්න රජයේ සල්ලි පාවිච්චි කරලා තිබුණා. ඒ පරීක්ෂණ කරගෙන යන කොට, හදිසියේ එම මුදල් ගෙවා තිබුණා. එතැන මිලියන 25ක්. ඒ ටික එකතු කළාමත් -ඒ පරීක්ෂණවලින් විතරක්- රුපියල් මිලියන 500ක් ආණ්ඩුවට ලැබී තිබෙනවා; රජයට -ජනතාවට- ලැබී තිබෙනවා. ඒවා තමයි ඒ කාර්යාල හරහා, FCID එක හරහා පරීක්ෂණ පවත්වා නැවත ලබා ගත් මහජන ධනය. දැන් ඒ ආයතන විසුරුවා හැරලා ඔබතුමන්ලා කරන්නේ පරණ ආණ්ඩුවේ කට්ටියගේ වැරදි ගැන කථා කර කර ඉන්න එකයි. පරණ ආණ්ඩුවේ අයගේ වැරදි සොයන්න තමයි ඔබතුමන්ලාට බලය දුන්නේ. ඒ වැරදි සොයලා, ඒවාට නීතිය ක්‍රියාත්මක කරන්නයි ඔබතුමන්ලාට බලය දුන්නේ. නමුත් ඔබතුමන්ලා එහෙම කළේ නැහැ. ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් නැවත ඒ වැරදි කරන්න පටන් ගත්තා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ සමහර ඇමතිවරු එවැනි කටයුතුවලට සම්බන්ධ වෙන කොට, ඒවා ගැන දැන් පරීක්ෂණ පටන් ගන්න ඕනෑ. ඒවා පිළිබඳ පැමිණිලි තමයි දැන් FCID එකේ තිබෙන්නේ. දැන් ඒවා ගැන පරීක්ෂණ පටන් ගන්න කොට, ඒ කාර්යාල වසනවා; ඒ ආයතන විසුරුවා හරිනවා. පසු ගිය ආණ්ඩුවෙන් වුණු වැරදි නිවැරදි කරනවාය කියලා බලයට පැමිණි ඔබතුමන්ලා ඊට වඩා බරපතළ වැරදි, මූල්‍ය අපරාධ කරලා දැන් ජනතාව ඉදිරිපිට නිරුවත් වෙලා තිබෙනවා. දැන්වත් මේ තත්ත්වය වෙනස් කරන්න කියන බල කිරීම කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට යමක් මතක් කර දෙන්න කැමැතියි. අපි විනිවිදභාවය තුළින් වැඩ කරන නිසා තමයි මෙතෙක් කල් ඇමතිවරුන් දැරූ කෝප් එකේ සභාපතිකම පවා විපක්ෂයට භාර දීලා, ආණ්ඩුවෙන් යම් වරදක් සිදු වේ නම් ඒ සම්බන්ධව කරුණු සෙවීමට, ඒ පිළිබඳව විනිවිදව දැකීමට හැකි අවස්ථාව ඉතාම සද්භාවයෙන් උදා කරලා දුන්නේ. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි, එදා ඔබතුමා මහ බැංකු බැඳුම්කරය ගැන විශේෂයෙන් ප්‍රකාශ කළා. අදත් ඔබතුමා ඒකම ප්‍රකාශ කරනවා. නමුත් අපි එදා හිටපු තැන ඉඳලා අද වෙන කොට, ඒ සම්බන්ධව පරීක්ෂණ පවත්වමින් කොතෙක් දුර ඇවිත් තිබෙනවාද කියන එක සලකා බැලීමත් වැදගත් කියලා මම හිතනවා. ඒ වාගේම යම් වරදක් කරලා තිබෙනවා නම්, ඒ සඳහා එදා ඔබ "විට්" එකෙන් දඬුවම් දීපු ක්‍රමයට දඬුවම් දීමේ හැකියාව අපට නැහැ. ඒ නිසා, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ අපි ඒ සඳහා කටයුතු කරමින් සිටිනවාය කියන එක මම විශේෂයෙන් සඳහන් කරනවා. එමෙන්ම, රාජ්‍ය කටයුතු, රාජ්‍ය මුදල් පාලනය විනිවිද පෙනෙන ආකාරයෙන් සිදු කිරීමට වර්තමාන ආණ්ඩුව හැම තිස්සේම උත්සාහ කරනවා. ඒ නිසා තමයි අපි අපේ අධීක්ෂණ කමිටුවල සභාපතිකම් පවා විපක්ෂයට භාර දීලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි, මේ රටේ ජනතාව බලවත් කිරීම සඳහා තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත වැනි පනත් ගෙනැල්ලා තිබෙනවා. රාජ්‍ය සේවකයාට තම බුද්ධිය පාවිච්චි කර, හෘදය සාක්ෂියට එකඟව වැඩ කරන්න පුළුවන් විධියට ස්වාධීන කොමිෂන් සභා පත් කරලා තිබෙනවා.

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කථා කරන්නේ, විදේශ විනිමය පනත් කෙටුම්පත පිළිබඳවයි. 1953 වර්ෂයේ අංක 42 දරන පනත තමයි මෙතෙක් කල් විවිධ පැලැස්තර දම්-දමා අරගෙන ආවේ. ඒ පනත අවුරුදු 64ක් පරණයි. අපි අද හදන්නේ පැලැස්තර අලව-අලවා ගෙනා පනත, එක පනතක් වශයෙන් හරිගස්සන්නයි.

අද රටේ අවශ්‍යතාව අනුව අපට විදේශ විනිමය අවශ්‍යයි. ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කියපු කථාවක් තමයි, හොරු අල්ලන්නේ නැහැ කියන එක. අපි ඒකත් කරනවා. අපට ඒකත් කරන්න ඕනෑ. ඒ වාගේම මේ රටේ ජනතාව ණය උගුලෙන් බේරා ගන්නා එකත් අප කරන්න ඕනෑ. රටේ මිනිසුන් ජීවත් කරවන ගමන්, පසු ගිය දූෂණ, වංචා සිද්ධි සොයන ගමන් වර්තමානයේදී දූෂණ සිද්ධි නොවන්නට වග බලා ගැනීම සඳහා මේ සියලු ක්‍රියා දාම හරහා රජය වැඩ කටයුතු කරනවාය කියන එක විශේෂයෙන් සඳහන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1953 අංක 24 දරන විනිමය පාලන පනතට එක එක වෙලාවල විවිධ පැලැස්තර ඇලෙව්වා. එය එක පනතක් වශයෙන් නොතිබීම නිසා රටේ ජනතාවට ඒ පනත කෙරේ විශ්වාසයක් තිබුණේ නැහැ. පාර්ලිමේන්තුවට වග නොකියන මුදල් පාලනයක් තමයි මේ රටේ තිබුණේ. 1953 පනත වුණත් වෙනස් කරන්න ඕනෑ නම්, එය වෙනස් කිරීමේ බලය මුදල් අමාත්‍යවරයාට තිබුණා. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් බලාපොරොත්තු වන අප විදේශ විනිමය පනත පාර්ලිමේන්තුවට ගෙන ඒම මඟින් පාර්ලිමේන්තුවට තිබෙන බලය ශක්තිමත් කරලා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට විදේශ විනිමය අවශ්‍යයි. අපි පළමුවෙන්ම, අපේ රට අද පත් වී තිබෙන ඉරණම නිවැරැදිව දැකීමේ අවස්ථාව ජනතාවට විවෘත කළා. එදා "සංවර්ධනය - සංවර්ධනය - සංවර්ධනය" කියා කළේ බොරු මැවීමක්. ඒ මිස රටට වෙච්ච සංවර්ධනයක් නැහැ. අපේ පැරණි කියමනක තිබෙනවා වාගේ, රත් වන දිය සැලියේ නටන කකුළුවන් වාගේ මේ රටේ ජනතාව සතුටු කරවූවා මිස සත්‍යය - යථාර්ථය- ඒ ජනතාවට පෙන්වා දෙන්න එදා කටයුතු කළේ නැහැ. කුමන බාධක ආවත්, කුමන කම් කටුලු ආවත්, කුමන උද්ඝෝෂණ කළත්, කුමන ප්‍රශ්න ආවත් රජයක් වශයෙන් අපි අද රටේ ඇත්ත තත්ත්වය විනිවිද පෙනෙන්න, ඇමතිවරුන් ඇතුළු වර්තමාන දේශපාලනඥයන් හෝ වේවා රාජ්‍ය නිලධාරීන් හෝ වේවා වීදුරු ගෙදරක ඉඳන් වැඩ කරන තත්ත්වයට පත් කරන්න, ජනතාවට ඉතාම විවෘතව පෙනෙන විධියට වැඩ කරන්න අවශ්‍ය පරිසරය හරි ගස්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය විවිධ විවිධ ආකාරයෙන් ගෙනෙන්න අද අපට අවශ්‍ය වෙලා තිබෙනවා. 1950දී පමණ අපේ රටේ තිබුණේ ඇමෙරිකානු ඩොලර් මිලියන 50.2ක විදේශ වෙළඳ වාසියක්. අද රුපියල්වලින් බැලුවොත්, රුපියල් කෝටි 753ක් ලෙස එදා විදේශ වෙළඳ වාසිය තිබුණා. 1950දී විදේශීය වෙළඳාම තුළ එතරම් වාසියක් පැවතුණා. නමුත් 2015දී අප මේ ආණ්ඩුව භාර ගන්නා විට රුපියල් කෝටි 124,486ක පාඩුවක් තිබුණා. එහෙම නම්, නිදහස ලබාගෙන අප ආ අවුරුදු 69ක ගමන් මඟේ ජනතාව රැවටීම මිස, සංවර්ධනය කියා දෙයක් කර තිබෙනවාද කියා අප ආපසු හැරී බැලිය යුතුව තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විවිධ අණපනත් ගෙනෙනවා. 1980 අවුරුද්දේ මේ රටේ ණය වශයෙන් ගෙවා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 74යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 1,110යි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ණය අරගෙන රට සංවර්ධනය කළා වුණත්, ඒ සඳහා අරගෙන තිබුණේ රුපියල් කෝටි 1,110යි. නමුත් පසු ගිය පාලන කාලයේ ගත් ණය නිසා 2019 අවුරුද්ද වන කොට අපට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 3,992ක්. ඒ කියන්නේ රුපියල් කෝටි 60,000ක්. එතරම් මුදලක් අපට ගෙවන්න වෙලා තිබෙනවා, ඒ අවුරුද්දට විතරක්. එහෙම නම් අප කොහොමද මේ ප්‍රශ්නය විසඳන්නේ? පසු ගිය ආණ්ඩුව කළා වාගේ තවත් රටකින් ණය අරගෙනද මේ ප්‍රශ්නය විසඳන්නේ? නැහැ. අපි ඒ සඳහා විදේශ විනිමය උපයන ක්‍රමවේද නිර්මාණය කරන්න ඕනෑ.

අපි දන්නවා, පසු ගිය කාලයේ සුදු වැන් අරගෙන ඇවිත් සල්ලිකාරයන් පැහැරගත් බව. ඒ මිනිසුන්ගේ සල්ලි ගෙන ගිහින් වෙනත් රටවල තැන්පත් කළා. අපනයනකරුවන් තමන්ගේ ලාභය වෙනත් රටවල බැංකුවල තැන්පත් කළා. මේ රටේ බුද්ධිමත් පුද්ගලයන් විවිධ විවිධ හේතු නිසා මේ රට හැර දා ගියා වාගේ මේ රටේ මුදල් ද රට හැර දා ගිහින් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කතාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඉතාම ඥානාන්විතව, ඉතාම දුර දිග බලා මේ පනත ගෙනැල්ලා, නීති විරෝධී මුදල් නොවේ නම් ඒවා කිසිම ප්‍රශ්නයක් නැතිව මේ රටේ ආයෝජනය සඳහා ගෙන එන්න පුළුවන් ආකාරයට අපි නීති - රීති ලිහිල් කර තිබෙනවා. එයින් විදේශ විනිමය ලැබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කතාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
තවත් විනාඩි දෙකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය මදි, ගරු මන්ත්‍රීතුමා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
එහෙම නම්, තවත් විනාඩි එකක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි තවත් පැත්තකින්, සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කරනවා; විදේශීය ආයෝජකයන් ගෙන්වනවා. ඒ වාගේම අපේ බුද්ධිමත් පුද්ගලයන් හරහා උපයන

ලාභය -විදේශ විනිමය- වැඩි කර තිබෙනවා. එම නිසා මා කියනවා, ශ්‍රී ලංකාව මේ ලෝකයේ බලගතු රටක් බවට පත් කරන්න අප දරන උත්සාහයේදී මෙය විශේෂ සන්ධිස්ථානයක්ය කියා. එසේ සඳහන් කරමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. E. Saravanapavan. You have ten minutes.

[5.07 p.m.]

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
Hon. Presiding Member, it is no secret that our country has a severe foreign exchange shortfall. The two aims of the Government are to attract Foreign Direct Investment and to encourage the private sector to invest more.

The war-affected provinces of the North and the East have the highest untapped potential for export trade. However, there is not much effort to convert the export potential of these provinces. No action has been taken to understand the ground situation. A professional assessment to know what actions must be taken to increase exports of products and processes and the conducive environment required has not been done.

As Members representing the war-affected provinces, we know that human skills and capacity is one of the most important requirements. There are nearly two million overseas Sri Lankans who have the required skills and capacity to assist, only if we have a clearly spelled out Government policy that is backed by the conduct of the leadership of the Government. We keep getting consistent and disappointing feedback from people attempting to visit Sri Lanka to provide that capacity. They rely on fluffy statements made by some of the Ministers and only end up being disappointed by the actions of the Members of the same Government.

There is lack of investor confidence in these overseas Sri Lankans. It is the country that must fight to win their hearts and minds if we want to prosper. No one just invest if the country is on a high horse and dictate how the others must behave. The Government lacks a sense of direction on economic policy and the potential contribution of the overseas Sri Lankans. Even if there is one, I do not think many in the Government know what it is. The human capacity is the most important prerequisite for the development of the war-affected provinces.

A person with dual citizenship who has diligently worked for nearly two years to plan a way for post-war development and created models for rural development had a very bad experience recently and returned in disgust. That is because, one of the Ministers has questioned the legitimacy of the foreigners working for development. We want clear policies, not concessions; we want laws, not favours; we want rules, not friendships; we want stability, not luck.

I wish to quote the following extract of the 2017 Budget Speech made by the Hon. Ravi Karunanayake:

> "Honorable Speaker, we have continued to address issues pertaining to the Northern and Eastern Provinces on separate basis in the past. I wish to lay emphasis on the fact that the Government is committed to eliminate existing socio-economic gap between North and East with the rest of the country by 2020."

Sir, is there a plan for the noble cause? We would like to see the action plan for this, we want to be involved in and understand what this plan entails. We also want to share some of the work our Party has been doing to assist with development, so, our efforts are not jeopardized by some high-handed attitude of Hon. Ministers or public officials.

If this could be done, we all could go in the same direction. The potential investors have plenty of negatives in the current political landscape, economic instability and security related issues. We do not need any more that will retard economic development, livelihood, exports and foreign exchange. –[*Interruption.*]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! There is a point of Order being raised.

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා (බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - சிறைச்சாலைகள் மறுசீரமைப்பு, புனர்வாழ்வளிப்பு, மீள்குடியேற்றம் மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Prison Reforms, Rehabilitation, Resettlement and Hindu Religious Affairs)
Hon. Member, the UDA and the BOI have got a plan for the entire Northern region and two permanent officers are there. We are also trying to establish an economic zone in the Mankulam area. So you cannot say that there is a high-handed manner of any Minister or any official. We are doing our best.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
I can prove that today a gentleman is flying off to Australia because of the problems he faced with regard to this project. If you can give the approval I will get him down from Australia.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
You check with your own officers who are placed in Jaffna.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)
I am only coming out with facts.

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)

I am also coming out only with facts. Please discuss this matter with your UDA officers.

ගරු ඊ. සරවනපවන් මහතා
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

You have not understood what I am trying to tell you. I think everyone is canvassing for the diaspora to come here, but you are not making the situation conducive for them. That is what I am trying to say. So, let me speak, please.

Foreign exchange is not something you order and receive. We must work hard and build investor confidence and this cannot be achieved through the indifferent attitudes of some politicians. In Sri Lanka, foreign exchange earnings have persistently remained at a lower level than the demand for the same. That is, our inflow of foreign exchange through earnings in exports, overseas workers' remittances, tourist earnings and direct investment have been lower than our expenditure on import payments and loan repayments. Hence, the current account deficit has become a salient feature of the Sri Lankan economy. Whilst there are many factors to consider, I believe the best solution to our current account deficit is pursuing the fundamental goals of finding ways to increase our export earnings and foreign direct investment.

Now, we already know that such a goal can be achieved through mechanisms of training our work force in relevant sectors, running of campaigns to attract investment and so on. Sri Lanka has been trying to implement those. But, to me, there is a factor which has overlooked with regard to the current account deficit, which if realized could propel the success of our exports and FDI goals simultaneously. That is to take necessary action to uphold the human rights of all its citizens in Sri Lanka, regardless of caste, race or minority status, and if there is political stability it could bring in.

Let me elaborate how such human concerns plays an important role in economic and financial discussion. When speaking at the presentation at the BMICH earlier this year, Professor Ricardo Hausmann from the Harvard Kennedy School of Government noted that the dearth to export earnings in Sri Lanka is because of our lack of diversification. That is why we lag in export earnings in comparison to nations like Thailand, Malaysia and Vietnam. For instance, between the years 2000 and 2015 whilst Thailand added 70 products worth US Dollars 326 per capita, Sri Lanka only started producing five products worth US Dollars 7 per capita. Also our production has been largely limited to its traditional exports like tea, rubber precious stones and garments whereas countries such as China have diversified into much higher productivity sectors such as electronics and machinery. The key to this shift, is noted to be, the development of know how. As it takes a long time to develop this because there is training and trial involved, Professor of Ricardo Hausmann recommended that Sri Lanka should take advantage of its considerable diaspora population to build a labour force with a variety of high skills, and make strong partnerships for FDI flows. This necessity is what brings me to the requirement of upholding human rights. Modern political and economic studies have found that developing countries that respect human rights are more successful in attracting foreign direct investment than those publicized to have a history of abusing any part of its populace, and being in political turmoil.

This is because, other than the obvious dangers associated with political instability, investors increasingly face what is called, "audience costs." That is, if they are involved with a country which has failed to uphold its promises to its people and has violated their rights, they may face repercussions in terms of their image, reputation and even stock value.

Thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.17]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ විනිමය පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීමේ විවාදයට සහභාගි වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම දෙවන ලෝක යුද්ධය අවසාන වීමත් එක්කම තමයි, හුඟාක් රටවල් තමන්ගේ විදේශ විනිමය ආරක්ෂා කර ගන්න නීති - රීති ගෙනාවේ. එදා තිබුණු ලෝක පරිසරයත් එක්ක, ලෝක වෙළෙඳාමත් එක්ක කාලයට ගැලපෙන විධියට හුඟාක් රටවල් තම තමන්ගේ රටවල විදේශ විනිමය ආරක්ෂා කර ගන්න නීති - රීති ගෙනාවා. ඒ වාගේම අපිත් 1953දී පමණ, එදා ලංකාවේ තිබුණු ආර්ථික තත්ත්වයත් එක්ක අපේ රටේ විදේශ විනිමය ආරක්ෂා කර ගන්න නීති රීති ගෙනැල්ලා යම් කිසි පාලනයකට නතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ රටේ ආර්ථික ගමන වෙනස් වුණේ 1977දී බව අපි දන්නවා. 1977 ආර්ථික පෙරළියත් එක්ක අද වන විට අවුරුදු 40ක් ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. චීනය, ඉන්දියාව වැනි සංවෘතික ආර්ථිකයක් තිබුණු රටවල් පවා මේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය -වෙළෙඳ පොළ මත ක්‍රියාත්මක වන ආර්ථික ප්‍රතිපත්තිය- පටන් ගත්තේ අපි ක්‍රියාත්මක කළාට පසුවයි. මම හිතන විධියට ඉන්දියාව 1991දී මේ විවෘත ආර්ථික ක්‍රමය පටන් ගත්තා. මන්මෝහන් සිං අගමැතිතුමා ඉන්න කාලයේ තමයි මේ විවෘත ආර්ථික ක්‍රමය ඉන්දියාවට හඳුන්වා දුන්නේ. චීනය වාගේම අද ලෝකයේ හැම රටක්ම තමන්ගේ රටවල ආර්ථිකය විවෘත කරලා යන ගමනක් අපට දක්නට ලැබෙනවා. 1977 අපේ රටේ ආර්ථිකය විවෘත කළාට, ඒ නිදහස් ආර්ථිකයට ගැලපෙන පරිදි අපි මේ විනිමය පාලනය වෙනස් කළේ නැහැ. 1977 ආර්ථිකය වෙනස් කළාට, විනිමය පාලනය වෙනස් නොකර අද වන විට අවුරුදු 40ක්

ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒක බැලුවාම හරියට, ටයර් තුනක් සහ අනෙක් ටයර් එක වෙනුවට කරත්ත රෝදයක් දමා ගෙන වාහනයක් දුවනවා වාගේ දෙයක්. එහෙම ආර්ථිකයක් ඉදිරියට ගෙන යන්න බැහැ. අපි නිදහස් වෙළෙඳ ආර්ථිකයකට ගමන් කරනවා නම්, ඒ ආර්ථිකය ගමන් කරන මොඩලයටම අපේ විදේශ විනිමය ප්‍රතිපත්තිත් වෙනස් විය යුතුයි. පසු ගිය අවුරුදු 40 පුරාම අපට ඒක වෙනස් කර ගන්න බැරි වුණා. නමුත් මේ යහපාලන ආණ්ඩුව මේ තත්ත්වය තේරුම් ගෙන තිබෙනවා. මේ තුළ ඉදිරියට ගමන් කරනවා නම්, මේ ක්‍රමය ඉදිරියට ගෙන යනවා නම් අනිවාර්යයෙන්ම අපි මේ විදේශ විනිමය නීති - රීති වෙනස් කරන්න ඕනෑ. මම කලින් කිව්වා වාගේ වාහනයක ගමන් කරනවා නම් වාහනයේ එක රෝදයක්වත් කරත්ත රෝදයක් තියෙන්න බැහැ. රෝද හතරටම ටයර් තිබුණොත් තමයි වාහනයට ගමන් කරන්න පුළුවන් වන්නේ. දැන් තිබෙන ආකාරයට වාහනයේ රෝද තුනක් ටයර්; එකක් කරත්ත රෝදයක්. ඒක ගැලපෙන්නේ නැහැ. මේ නිදහස් ආර්ථිකයට, මේ නිදහස් ගමනට, නිදහස් වෙළෙඳ ප්‍රතිපත්තියට මේක ගැලපෙන්නේ නැහැ. ඒ නිසා අනිවාර්යයෙන්ම අපි මේක වෙනස් කළ යුතුයි. ආණ්ඩුව අද ඒක වෙනස් කරන්න ඉදිරියට ඇවිල්ලා තිබෙනවාය කියලා මම හිතනවා. ලෝක ආර්ථිකයත් එක්ක ඒ ගමන ඉස්සරහට යන්න නම්, මේ තිබෙන තරගකාරිත්වයට මුහුණ දෙන්න නම් අනිවාර්යයෙන්ම වෙළෙඳපොළ මත යැපෙන, වෙළෙඳපොළ මඟින් පාලනය වන විනිමය ප්‍රතිපත්තියක් අපට අවශ්‍ය වෙනවා. නිලධාරීන් විසින් පාලනය කරන විනිමය ප්‍රතිපත්තිය වෙනස් කරන්න අවශ්‍ය වෙනවා. නිලධාරීන් විසින් හසුරුවන විනිමය ප්‍රතිපත්තිය මාරු කරන්න අවශ්‍ය වෙනවා. රජයක් හැටියට අපි ඒ තීන්දුව අරගෙන වෙළෙඳ පොළේ ඉල්ලුම, සැපයුම මත විනිමය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන කාරණයට ආණ්ඩුව එකඟ වෙලා, අද ඒක පිළිගෙන ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙතැන කථා කළ බොහෝ මන්ත්‍රීවරු මේ ආර්ථිකය සම්බන්ධයෙන් චෝදනා කළා. මේ යහ පාලන ආණ්ඩුව තුළ ඊයේ-පෙරේදා වනකොට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඩොලර් බිලියන 166ක් තුන්වන වාරිකය විධියට අපට දෙන්න එකඟ වෙලා තිබෙනවා. ඒ වාරිකය දෙන්න එකඟ වුණේම වෙන දෙයක් නින්දා නොවෙයි. මේ යහ පාලන ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය ගැන, ආර්ථික දියුණුව ගැන, ආර්ථිකය ගැන ආණ්ඩුව ගන්නා වූ තීන්දු තීරණ ගැන විශ්වාසයක් තිබෙන නිසා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - IMF එක - වාගේ ආයතන යම් ඇගැයීමක් කරලා මේ මුදල් අපට දෙන්න එකඟ වෙලා තිබෙන්නේ. රජයක් හැටියට ඉදිරි ගමනක් යන්න පුළුවන් වාතාවරණයක් මේ තුළින් අපි හදා ගෙන තිබෙනවාය කියලා මා හිතනවා.

අපි මේ ගමන ආවේ ඉතාම අමාරුවෙන් බව මතක තබා ගන්න ඕනෑ. අපි 2015දී යහ පාලන ආණ්ඩුවේ මේ ගමන පටන් ගන්න කොට රුපියල් බිලියන 8,500ක පමණ ණය කන්දරාවක් එක්කයි මේ ගමන පටන් ගත්තේ. අපි උපයන ආදායමෙන් විශාල ප්‍රමාණයක් ණය ගෙවන්න අපි වියදම් කරනවා. ඒ විතරක් නොවෙයි. 2018 සිට 2021 වනකොට ඩොලර් බිලියන 2ත්, 4ත් අතර ප්‍රමාණයක් ණය වාරිකයයි, පොලියයි වශයෙන් ගෙවන්න අපි වෙන් කරන්න ඕනෑ. ඒ කියන්නේ ණය ගෙවන්න මුදල් හොයනවා හැර වෙනත් කිසිම දෙයක් කරන්න අපට වෙලාවක් නැහැ. අන්න එහෙම ආර්ථිකයක් තමයි අපට භාර දුන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නින්දා ඒ ආර්ථිකය වෙනස් කර අද ක්‍රම ක්‍රමයෙන් - ක්‍රම ක්‍රමයෙන් ලෝක ජනතාවගේ ආර්ථිකය දිහා බලාගෙන, ලෝක ආර්ථිකයත් එක්ක එකට යන්න පුළුවන් ජාත්‍යන්තරය දිනන ඒ ගමන අපි යන්න උත්සාහ කරන කොට අපට යම් යම් බාධක එනවා කියලා අපි දන්නවා. මේ රටට ආයෝජකයින් ගෙන්වා ගැනීමට නොහැකි වන පරිදි දවස පුරා මහාමාර්ගවල වර්ජන ක්‍රියාත්මක වන බව, පෙළපාළි ක්‍රියාත්මක වන බව අපි දන්නවා. ඒ අනුව මේ රට සම්පූර්ණයෙන්ම අගාධයකට ගෙන යන්න නැවත යම් යම් බලවේග විසින් මේ රටේ කුමන්ත්‍රණ කරනවාය කියන එකත් අපි මතක තබා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ක්‍රම ක්‍රමයෙන් ලෝක ආර්ථිකයත් එක්ක ගැට ගහන්න අප දරන මේ උත්සාහය මේ මොහොතේත් ආරක්ෂා කර ගෙන ඉස්සරහට යන්න ඕනෑය කියන එක අවසාන වශයෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙකු ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. J.M. ANANDA KUMARASIRI *left the Chair and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 5.23]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ මෙතෙක් කල් ක්‍රියාත්මක වුණේ, ක්‍රියාත්මක වන්නේ 1953 අංක 24 දරන විනිමය පාලන පනතයි. මේ පනත සම්පූර්ණයෙන් වෙනස් කරලා නව පනතක් ගෙනෙන මේ අවස්ථාවේදී ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මම ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළා. එය ඉදිරිපත් කිරීම සඳහා හේතු වුණු කරුණු කීපයක් තිබෙනවා. එක කරුණක් තමයි, මෙතෙක් කල් අපේ රටේ විනිමය පාලනය පිළිබඳ පැවතුණු තත්ත්වය අනුව 1977ට පෙර ආනයන බලපත්‍ර, විනිමය බලපත්‍ර, ආනයන සලාක, විනිමය සලාක, විවිහිස වැනි ක්‍රම තුළින් විශාල ලෙස විදේශ විනිමය ගනුදෙනු සීමා කරලා, පාලනය කරලා තිබීම. ඒක නිසා 1977ට පෙර විදේශ අධ්‍යාපනය ලබන්න යන්න, එහෙම නැත්නම් විදේශවලින් බෙත් හේත් ගන්න යන්න මේ රටේ ජනතාවට අවසරයක් තිබුණේ නැහැ. 1977 කාලයේ පැවැති ජේ.ආර්. ජයවර්ධන යුගයේදී ආර්ථිකය විවෘත කළා. ඉස්සර කාලයේ නම් වෙළෙඳ ගිණුම, සේවා ගිණුම, සංක්‍රාම ගිණුම යන තුනේ එකතුවට කියනවා, "අන්තර් ජාතික ගෙවුම් තුලාවේ ජංගම ගිණුම" කියලා. දැන් වෙළෙඳ ගිණුමත්, ප්‍රාථමික හා ද්විතීයික ආදායම් ගිණුමත් ගත්තාම ඒ ගෙවුම් තුලාවේ ජංගම ගිණුමේ ගනුදෙනු සඳහා විනිමය පාලකවරයාගේ අවසරය නැතිව නිදහසේ සල්ලි යවන්න, සල්ලි ගෙන්වා ගන්න පුළුවන්කම තිබෙනවා. භාණ්ඩ නිර්යාත කරන්න, භාණ්ඩ ආයාත කරන්න, සේවා සඳහා ලැබීම්වලට, ගෙවීම්වලට, විදේශ සංචාර කරන්න, විදේශ අධ්‍යාපනය ලබන්න යෑම වැනි ඒ කිසිවක් සඳහා කිසිම පූර්ව අනුමැතියක් ලබන්න ඕනෑ නැහැ. එම නිසා ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම සම්පූර්ණයෙන් නිදහස් කරලා තිබුණේ. ජංගම ගිණුම මත වන ගනුදෙනු සඳහා රුපියල පරිවර්ත මුදලක් බවට පත් වෙලා තිබුණා. නමුත්, ප්‍රාග්ධන ගිණුම ගෙවුම් තුලාවෙන් නිදහස් කරලා තිබුණේ නැහැ. යුද්ධය තිබෙන කාලය තුළදී ජාතික ආරක්ෂාව උදෙසා විදේශ විනිමය සම්බන්ධයෙන් ඉතා දැඩි තීන්දු තීරණ ගන්න රජයට සිද්ධ වුණා. එම නිසා යුද්ධය නිම වන තෙක් ජංගම ගිණුම පමණයි විවෘත කරලා තිබුණේ.

මහින්ද රාජපක්ෂ යුගයේ මේ රට කඩන්නේ නැතිව, බෙදන්නේ නැතිව ත්‍රස්තවාදය මුළුමනින්ම නිම කළාට පසු ආර්ථිකයේ වේගවත් පිම්මක් පැනීම සඳහා 2010දී ප්‍රාග්ධන ගිණුමේ යම් යම් කොටස් ලිහිල් කරනු ලැබුවා. ඒ ගැන කිසිවෙක් කථා නොකළ නිසා, ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2010, II කොටස - 69 සිට 73 දක්වා සහ ශ්‍රී ලංකා මහ බැංකුව වාර්ෂික වාර්තාව 2016, II කොටස - 86 සිට 91 දක්වා වූ ප්‍රාග්ධන ගිණුම ලිහිල්කරණය පිළිබඳව සහ විනිමය පාලනය පිළිබඳව සඳහන් පිටු, -මට තිබෙන්නේ සීමිත වේලාවක් නිසා- මම **සභාගත*** කරනවා.

ඒ අනුව 2010 ඉඳන් ප්‍රාග්ධන ගිණුමේ ඇතැම් කොටස් නිදහස් කළා. ඉන් පසුව විශාල ලෙස, මුළුමනින්ම පාහේ ප්‍රාග්ධන ගිණුම විවෘත කරන්නට සූදානම් වුණා. ඉතාම නිදහසේ විදේශවල තිබෙන සල්ලි ඕනෑම ජාවාරම්කරුවෙකුට, හොරෙකුට, මංකොල්ලකාරයෙකුට වුණත් ලංකාවට ගේන්න පුළුවන් වන ලෙස ප්‍රාග්ධන ගිණුම විවෘත කරන්නයි හැදුවේ. ඒක ඉතා අවදානම් සහිතයි. එම නිසා අපි ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කරුණු කිව්වා. එසේ කරුණු කීමේ ප්‍රතිඵලයක් ලෙස ඇතැම් තොරතුරු දැනගැනීමට "හැකිය" කියන ඒවාට තොරතුරු දිය "යුතුය" කියලා, "may" නොවෙයි "shall" කියන වචනය පාවිච්චි කරන්න කියලා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දුව ලබා දුන්නා. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් ඊට අදාළ නඩු තීන්දුව මම **සභාගත*** කරනවා.

මේ කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වෙනස් කරන්නට නියම කළ සියලුම සංශෝධන මේ අවස්ථාව වන විට අපට බෙදා දීලා තිබීම ගැන මම රජයට ස්තුතිවන්ත වෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණය කිව්ව විධියට ඒ සංශෝධන කිරීම සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට ස්තුතිවන්ත වෙනවා.

අපේ තිලක් මාරපන අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පැවති ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා, නීතිපතිතුමා සමඟ අපි යම් යම් සංශෝධනවලට එකඟ වුණා. උදාහරණයක් වශයෙන් එතෙක් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ පැවති විනිමය පාලන දෙපාර්තමේන්තුව - Exchange Control Department එක- සම්පූර්ණයෙන් අහෝසි කරන්නට උත්සාහ දරලා තිබුණා. අපි ඒ අවස්ථාවේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේත්, ඒ කමිටුවේ සිටි සියලුම දෙනාගේ ඉල්ලීම මත ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව ඒ ආකාරයෙන්ම තියා ගන්නත්, විනිමය පාලනයට සෑහෙන ප්‍රමාණයකට මැදිහත් වෙන්නත් ඉඩ දුන්නා. එහිදී අපේ උගත් මිත්‍ර ආචාර්ය ගරු සරත් අමුණුගම මැතිතුමා කිව්වා, "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට තමයි සම්පූර්ණ විනිමය පාලනය තිබෙන්නේ. ඇමතිවරයාට ඕනෑ ඕනෑ විධියට ඒක කරන්න බැහැ." කියලා. ඒක සාවද්‍යයයි, වැරදියි. අපි මේ පනත් කෙටුම්පතේ ඒ කොටසටයි විරුද්ධ වෙන්නේ. තවමත් අපට බැරි වුණා මේක නිර්දේශපාලනීකරණය කරන්නට. මොකද, මහ බැංකුවට උඩින් අමාත්‍යාවරයා තියලා තිබෙනවා.

මම විදේශ විනිමය පනත් කෙටුම්පතේ 2. (2) උප වගන්තිය කියවන්නට කැමැතියි. එහි මෙසේ සඳහන් වෙනවා:

"මහ බැංකුව විෂයය පැවරී ඇති අමාත්‍යාවරයා විසින් වරින් වර, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර මෙම විධාන ක්‍රියාත්මක කරවීම, මුදල් මණ්ඩලයේ කාර්යය විය යුතු ය."

ඒ අනුව Monetary Board එක කරන්නේ ඇමතිවරයා කියන එක. ඒ වාගේම මෙම පනත් කෙටුම්පතේ 9. (1) උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"අමාත්‍යාවරයා වෙත දැනුම් දීමට යටත්ව, මහ බැංකුව විසින් කලින් කල, ජංගම ගනුදෙනුවල නිරතව සිටින බලයලත් වෙළෙන්දන් සහ පරිසීමිත වෙළෙන්දන් වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය."

පනත් කෙටුම්පතේ 9. (3) වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

" අමාත්‍යාවරයාගේ අනුමතයට යටත්ව මහ බැංකුව විසින් කලින් කල,..."

තවදුරටත් පනත් කෙටුම්පතේ 9. (4) උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

"අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව, මහ බැංකු විසින්, කලින් කලට 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය වෙළෙඳාම් කිරීමට අවසර ලබා දී ඇති බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු, තැනැත්තන් පන්තියක් හෝ පන්ති වෙත මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කරනු ලැබිය හැකි ය."

මේ හැම අවස්ථාවේදීම මහ බැංකුවට උඩින් විෂය භාර අමාත්‍යවරයා තියලා තිබෙනවා. එම නිසායි මේ පනත් කෙටුම්පතට අපි විරුද්ධ වෙන්නේ. මේ පනත් කෙටුම්පතේ ශ්‍රී ලංකා මහ බැංකුව රටේ සමස්ත මුදල් ක්‍රමය, බැංකු ක්‍රමය, ණය ක්‍රමය, විනිමය පාලනය කිරීම දේශපාලනීකරණය කිරීම සාධාරණ සහ යුක්ති සහගත වෙන්නේ නැහැ. අපිට ඒ ටික වෙනස් කර ගන්නට බැරි වුණා. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂය වශයෙන් අපි මෙහි තිබෙන දරුණු ස්වභාවය දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත තුළ සමහර යටි අරමුණු තිබුණු බව මම තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ. ඇතැම් වැරදිවලින් සමහර අය නිදහස් වෙන්නට උත්සාහ දරලා තිබුණා. මම උදාහරණයක් සඳහන් කරන්නට කැමැතියි. අපේ රටේ හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මහතාට විරුද්ධව විදේශ විනිමය වංචා නඩුවක් තිබුණා. විදේශ විනිමය වංචාවක් පිළිබඳ නඩුවක් තිබෙන කෙනෙක් මුදල් අමාත්‍ය ධුරයේ දිවුරුම් දුන්නා නම් මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ඒ ලංකාවේ පමණයි. නමුත් එතුමා අමාත්‍ය ධුරයට පත්වීමෙන් පසු ඒ නඩුවෙන් නිදහස් වුණා.

එතුමා නඩුවෙන් නිදහස් වන විට, "ලංකාදීප" පුවත් පතේ මෙහෙම සඳහන් වෙනවා:

"යූනියන් බැංකුවේ කොටස් මිලදී ගැනීම සඳහා අනේවාසික පදිංචිකරුවන් දෙදෙනෙකුගෙන් රුපියල් කෝටි 42කට අධික මුදලක් ගෙන්වා ගෙන සිය බැංකු ගිණුමේ තැන්පත් කරවා ගත්තේ යැයි විනිමය පනත යටතේ චෝදනා ලබා සිටි මුදල් ඇමැති රවි කරුණානායක මහතා ඇතුළු තිදෙනෙක් කොළඹ මහාධිකරණ විනිසුරු අයිරාංගනි පෙරේරා මහත්මිය විසින් ඊයේ නිදහස් කරනු ලැබූහ.

විනිසුරුවරිය මෙසේ විත්තිකරුවන් නිදහස් කළේ ඔවුන්ට එරෙහිව ඉදිරිපත් කොට ඇති චෝදනා පත්‍රය දෝෂ සහිත බැවින් මෙම නඩුව තවදුරටත් පවත්වා ගෙන යා නොහැකි බවට රවි කරුණානායක මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ කෝලිත ධර්මවර්ධන මහතා ඉදිරිපත් කළ මූලික විරෝධතාව පිළිගනිමිනි.

සිය 31 වසරක විනිසුරු දිවියෙන් විශ්‍රාම යන අද (18) දින තමා මෙම තීන්දුව ප්‍රකාශයට පත් කරනු ලබන්නේ තමන්ගේ භෘද සාක්ෂියට සම්පූර්ණයෙන් එකඟ බව පැවසූ මහාධිකරණ විනිසුරු අයිරාංගනි පෙරේරා මහත්මිය පැමිණිල්ලට අවශ්‍ය නම් තම නියෝගයට එරෙහිව ඉහළ අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි බවද පැවසුවාය."

විනිසුරුතුමිය විශ්‍රාම යන දවසේ රවි කරුණානායක මහත්මයා විදේශ විනිමය වංචා නඩුවෙන් නිදහස් කරනු ලබන්නේ අධි චෝදනා පත්‍රය වැරැදි සහගතයි කියලා. වරදක් සිදු වෙලා තිබෙනවා. නමුත්, අධි චෝදනා පත්‍රයේ වරද කරපු දිනය වැරැදියට සඳහන් වෙලා තිබෙනවා. මේ මුදල " අතේ තිබුණා " -cash in hand - කියලා සඳහන් කරලා තිබෙනවා. මුදල් තිබිලා තිබෙන්නේ අතේ නොවෙයි; බැංකුවේ. ඇමෙරිකානු ඩොලර් මිලියන 3ක්, රුපියල් කෝටි 42ක් අතේ තියාගෙන ඉන්නේ මොන මිනිහාද? ඒ මුදල තිබිලා තිබෙන්නේ අතේ නොවෙයි, බැංකුවේ කියන නිසාත්; මේ වරද සිදු වෙලා තිබෙන දිනය -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

එසේම එම පුවත් පතේ තවදුරටත් මෙහෙම සඳහන් වෙනවා:

"... රාජ් රාජරත්නම් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රසික වීරතුංග මහතා විසින් මෙම ඉල්ලීම ඊයේ (04) කොළඹ මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම රාජ් රාජරත්නම් නැමැත්තා එල්ටිටීඊ සංවිධානයට මුදල් රැස් කළ අයෙකු බවට තොරතුරු ලැබී ඇති බවත් ඔහු මූල්‍යමය වංචාවන් සම්බන්ධයෙන් ඇමෙරිකානු රජය විසින් අත් අඩංගුවට ගෙන ඇති පුද්ගලයකු බවත් පවසමින් රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥ දිලීප පීරිස් මහතා අධිකරණයට කළ කරුණු දැක්වීම සැලකිල්ලට ගනිමින් නීතිඥවරිය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී."

එතකොට රාජ් රාජරත්නම්ලා හා සම්බන්ධ මුදල වන ඇමෙරිකානු ඩොලර් මිලියන තුන -රුපියල් කෝටි 42- දැනට කොහේද තිබෙන්නේ? රාජ් රාජරත්නම් ළඟද? රවි කරුණානායක නිටපු මුදල් ඇමැතිතුමා ළඟද? එහෙම නැත්නම් අධිකරණයේ යම් කිසි ගිණුමකද? කොහේද මේ මුදල් ටික තිබෙන්නේ කියන එක පිළිබඳව මේ රටට කියන්න අවශ්‍ය වෙනවා. මේ අධි චෝදනා පත්‍රය වැරැදි නම්, නැවත චෝදනාව ඉදිරිපත් කරන්න නීතිපතිවරයාට පුළුවන්. සාධාරණ හා යුක්ති සහගත ආණ්ඩුවක් නම් එම චෝදනාව නැවත ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම ඉදිරිපත් කරලා තිබෙනවාද? නැහැ. එහෙම නම් තමුන්නාන්සේලා මේ වාගේ ඇමැතිවරු කියාගෙන හොරකම්, වංචා, දූෂණ, අක්‍රමිකතා ගැන කැබිනට් මණ්ඩලයක් හැටියට කථා කරන්නේ කොහොමද? මම වැදගත් කරුණක් කියන්න ඕනෑ. මේ පනත් කෙටුම්පතේ වගන්තියක් දමලා තිබෙනවා, එවැනි විදේශ විනිමය වංචා අපරාධ ලෙස නොසැලකෙන බව. මම අදාළ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව සභාගත කළා. එම නඩු තීන්දුවේ නමවැනි පිටුවේ ඉතා පැහැදිලිව දක්වලා තිබෙනවා, "මේ වාගේ වැරැදි සම්බන්ධයෙන් කටයුතු කරන්නේ අද මේ පාර්ලිමේන්තුව සම්මත කරන පනත් කෙටුම්පත යටතේ නොවෙයි. මේවා සම්බන්ධයෙන් පරණ විදේශ විනිමය පාලන පනත අයත් වෙනවාය." කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නඩු තීන්දුව සම්පූර්ණයෙන් හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම රවි කරුණානායක නිටපු මුදල් අමාත්‍යවරයා නිදහස් වූ නඩුව සම්බන්ධයෙන් නැවත අධි චෝදනා පත්‍රයක් සකස් කරලා නඩු පවරන්නේ නැත්තේ ඇයි කියන එක රටට හෙළිදරවු කරන්න කියන ඉල්ලීමත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

[5.36p.m.]

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Thank you, Mr. Presiding Member, for giving me this opportunity to speak on this very important Bill.

As we all are aware, there are over 10 lakhs of people who have been working abroad, doing big or small jobs,

[ගරු මොහොමඩ් නවවි මහතා]

for the last so many years. I think they are the second or the third highest foreign exchange earners, but, very unfortunately, they have not been given their due respect. I can remember, during the last Session when we had the Debate on the Registration of Electors (Special Provisions) Bill, I stated that those 10 lakhs of people working abroad do not have the opportunity to cast their votes at elections. But, I know of some countries which make arrangements in the embassies of the respective countries for the migrant workers to cast their votes during elections. That opportunity has not been given to our migrant workers. I mentioned it at that Debate.

Today, I am very happy that this Bill has been brought in so that we could broaden the opportunities and help these people to bring in their money - foreign exchange - in a way that will be useful to them. I would like to mention that earlier there were so many restrictions. Whatever earnings they had, they saved elsewhere. Even today, that is happening - they reserve their earnings in countries they are working. Because of the restrictions, they have been sending only the money required for the well-being of their families or for other matters and kept back the rest until they came back. So, we have to change that situation. I am sure that with this Bill, the money they have been reserving in foreign banks can be brought into our country and banked here.

Actually, it is our duty to look after them. There are only a few people doing professional jobs, but about 70 per cent of the migrant workers do small jobs. The Hon. Minister of Foreign Employment, the Hon. (Mrs.) Thalatha Atukorale is not here. Those workers have problems. The problems they face are made known to us as Members of Parliament. Then, we go to the Ministry and do the needful and look after their problems. I must thank the Hon. Minister because she gives the due respect to the workers. When we solve the workers' problems for them, they are happy. This is a cycle. Some people work abroad for years and years, they come back and then, another lot goes - it goes round and round. The problem that these workers face today - I must come out with that - is, once they come back here, there is no organization to give them proper advice. So, most of the time what happens is, once they come back, money is spent unnecessarily and once again, they go abroad. So, I request the Hon. Minister of Finance and Mass Media to have such a setup. There must be a setup where they can seek advice on spending money properly once they come back here so that they can improve their lives and go on with that money. So, that part must be included in this. Only now the Hon. Minister of Foreign Employment walked in. She is doing her part. In the Electorate I represent, over 30,000 people are working abroad. All of them are poor people. But, what is happening is, once they come back, they spend their money and when it is finished, they go back.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Sir, give me one more minute.

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)
Hon. Member, I want you to know that we have already started a reintegration programme, through which we are trying to help them with financial benefits, to start self-employment schemes and all that. In future, under the migrant workers' welfare scheme called "Shramika Surekuma", which we introduced last year, they will be monitored by the officers attached to the Ministry of Foreign Employment.

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Hon. Minister, I thanked you before you came in for the work you do.

ගරු තලතා අතුකෝරල මහත්මිය
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
I know, thank you very much for that.

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
But, that is not enough. Even the Hon. Minister of Finance and Mass Media must look into this.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Okay, thank you.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Gnanamuthu Srineshan, you have five minutes.

[பி.ப. 5.41]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற வெளிநாட்டுச் செலாவணி சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்புக் கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். அந்நியச்செலாவணி என்பது எமது

பொருளாதாரத்தில் முக்கியத்துவம் வாய்ந்த ஒரு எண்ணக்கருவாக இருக்கின்றது. அந்நியச்செலாவணியை அதிகரிப்பதன்மூலம்தான் நாங்கள் எமது நாட்டின் வருவாயை அதிகரிக்க முடியும், அல்லது எமது நாட்டுக்கு ஏற்படுகின்ற செலவினங்களைக் கட்டுப்படுத்திக் கொள்ளமுடியும். எந்தவொரு நாட்டிலும் எல்லா வளங்களும் இருப்பதில்லை. சில நாடுகளில் சில வளங்களும் இன்னும் சில நாடுகளில் வேறு சில வளங்களும் இருக்கின்றன. எனவே, எந்தவொரு நாடும் இன்னுமொரு நாட்டில் தங்கியிருப்பது என்பது தவிர்க்க முடியாத ஒரு விடயமாக இருக்கின்றது என்று அரசியல் பொருளியலாளர் டேவிட் ரிகாடோ குறிப்பிட்டுள்ளார். எனவே, மற்றைய நாடுகளில் தங்கியிருக்கின்ற நாடுகள் தமக்கு வேண்டியவற்றை அந்நாடுகளிலிருந்து இறக்குமதி செய்யவேண்டிய நிலை இருக்கின்றது. இறக்குமதிக்கு அந்நியச்செலாவணி என்பது மிக முக்கியத்துவம் வாய்ந்த ஒரு விடயமாகக் காணப்படுகின்றது.

அந்நியச்செலாவணியை எடுத்துக்கொண்டால், எமது நாட்டுக்கு அதனை ஈட்டித் தருவதில் பெண்கள் அதிக முக்கியத்துவத்தைப் பெறுகின்றார்கள். குறிப்பாக, ஆடைத் தொழிற்சாலைகளில் பணியாற்றுகின்ற பெண்கள் உருவாக்குகின்ற ஆடைகளை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்கின்றபோது, அதிலிருந்து எங்களுக்கு அந்நியச் செலாவணி கிடைக்கின்றது. அதுபோல் பெருமளவு அந்நியச் செலாவணியைத் தேடித் தரும் பெருந்தோட்டத் தொழிலை எடுத்துக்கொண்டால், அதில் தொழில் புரிகின்றவர்களில் பெரும்பாலானவர்கள் பெண்களாக இருக்கின்றார்கள். இதனையும்விட, அதிகளவான பெண்கள் மத்திய கிழக்கு நாடுகளிலே வீடுகளில் பணிப்பெண்களாக உழைத்து அந்நியச்செலாவணியை ஈட்டித்தருகின்றார்கள். இவ்வாறு மூன்று பிரதான வழிகளில் இந்நாட்டுப் பெண்கள் தங்களுடைய உழைப்பின்மூலம் அந்நியச்செலாவணியை ஈட்டித்தருவதில் பங்களிப்புச் செய்கின்றார்கள். அதாவது, ஆடைத் தொழிலாக இருக்கட்டும், பெருந்தோட்டத் தொழிலாக இருக்கட்டும், மத்திய கிழக்கில் பணிபுரியும் பணிப்பெண்களாக இருக்கட்டும், இவர்கள் எங்களுக்கு அதிக அளவில் அந்நியச்செலாவணியை ஈட்டித்தருகின்றார்கள். ஆனால், இவ்வாறான பெண்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்து வதற்கு அரசாங்கம் என்ன செய்திருக்கின்றது? என்ற கேள்வி எழுகின்றது.

உண்மையில் நாட்டுக்கு அந்நியச்செலாவணியை ஈட்டித்தருகின்றவர்கள் மகிழ்ச்சியாக இருந்தால்தான், அவர்கள் மென்மேலும் அதனை ஈட்டித்தரக் கூடியவர்களாக இருப்பார்கள். ஆனால், கடந்த காலங்களில் இந்தப் பெண்களின் வாழ்க்கைத் தரம் என்பது உயர்ந்ததாகத் தெரியவில்லை. இன்றைய நிலையில் பெருந்தோட்டத் துறையில் வேலைசெய்கின்ற மக்களுக்கு வீடுகளை அமைக்கின்ற திட்டமொன்று நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றது. அது வரவேற்கத்தக்க ஒரு விடயம். அதேவேளை, புலம்பெயர்ந்த எமது நாட்டு மக்கள் அங்கிருந்து உழைத்து எங்களுக்கு அந்நியச்செலாவணியைப் பெற்றுத் தருகின்றார்கள். இவ்வாறு அந்நியச்செலாவணியைப் பெற்றுத் தருகின்றபோதும், அவர்களைப் பற்றி எமது அரசாங்கம் சரியான அபிப்பிராயங்களைக் கொண்டிருப்பதாகத் தெரியவில்லை. அதேவேளை, புலம்பெயர்ந்தவர்கள் இந்த நாட்டுக்கு வந்து தங்களுடைய பங்களிப்பைச் செய்வதற்கும் தயாராக இருக்கிறார்கள். எனவே, இதற்கு ஏற்றவிதத்தில் இந்த நாட்டில் சுமுகமான அரசியல் சூழ்நிலையும் மக்கள் சந்தோசமாக வேலை செய்வதற்குரிய சூழ்நிலையும் உருவாக்கப்பட வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have one more minute.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Okay.

கடந்த காலத்தோடு ஒப்பிட்டுப் பார்க்கின்றபொழுது தற்போது ஓரளவுக்கு சுமுகமான சூழ்நிலை ஏற்பட்டிருந்தாலும் இனப்பிரச்சினைக்கு ஓர் அரசியல் தீர்வினை ஏற்படுத்துவதன்மூலம் அதனை இன்னும் மேம்படுத்தலாம். அத்துடன், புலம்பெயர்ந்த எமது சகோதரர்கள் இங்கு வந்து பணியாற்றி இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு நல்ல வாய்ப்பினையும் பெற்றுக்கொடுக்க முடியும். அந்த வகையில், புலம்பெயர்ந்த சமூகம் இங்கு வருவதற்கு இந்த நல்லாட்சி அரசாங்கத்தில் நல்ல விடயங்கள் நடைபெற வேண்டும். எங்களுக்கு அந்நியச்செலாவணியைப் பெற்றுத்தருகின்ற பெண்களுக்கு உரிய மரியாதை கொடுப்பதன் மூலமாகவும் அதனை அதிகரித்துக்கொள்வதற்கு வாய்ப்பு இருக்கின்றது. அத்தோடு, வெளிநாடுகளிலிருந்து வருகின்ற அந்த நிதிமூலத்தை - நாணயத்தை மாற்றிக்கொள்வதற்கும் இப்போது Western Union மற்றும் MMBL Centre போன்ற நிறுவனங்கள் செயற்படுகின்றன. இவை மாத்திரம் போதுமானவையல்ல. மேலும் புதிய நிறுவனங்களினூடாக இலகுவாக அந்த நிதியினைப் பரிவர்த்தனை செய்வதற்குரிய செயற்பாடுகளையும் இந்த அரசாங்கம் மேற்கொள்ள வேண்டுமென்று கூறி, எனது உரையினை நிறைவுசெய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.45]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
විනාඩි පහයිද?

මූලාසනය භාරවන ගරු මන්ත්‍රීතුමනි, විනාඩි පහක් ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද විදේශ විනිමය සම්බන්ධ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධව වැඩියෙන්ම කථා කරන්න ඕනෑ පුත්තලම් දිස්ත්‍රික්කයේ ජීවත් වෙන අපයි කියා මා විශ්වාස කරනවා. මොකද, මේ රටට විදේශ විනිමය සපයන වැඩි සංඛ්‍යාවක් පුත්තලම් දිස්ත්‍රික්කයේ සිටින නිසා. යුරෝපය, ඇමෙරිකාව, ඕස්ට්‍රේලියාව වැනි රටවලට අමතරව අනෙක් විදේශ රටවල් සියල්ලකම වාගේ සම්බන්ධතාව වැඩියෙන් තිබෙන ප්‍රදේශය හැටියට මම දකින්නේ පුත්තලම් දිස්ත්‍රික්කයයි. ඒ නිසා මේ පනත් කෙටුම්පතක් එක්ක පුත්තලම් දිස්ත්‍රික්කයට කළ හැකි වැඩ කොටස් රාශියක් එකට එකතු වෙනවා.

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

මේ පනත් කෙටුම්පත නිසා මේ රටේ ඇති වෙන අලුත් ප්‍රවර්ධනය පසුගිය ආණ්ඩුවට කරන්න බැරුව ගියා. පසුගිය ආණ්ඩුව කරපු දේවල් අරගෙන බැලුවාම දැන් තමයි මොළය ඇති වැඩසටහන් ටික ඉස්සරහට එන්නේ. හැබැයි, මේක පටන් ගත්තු ගමන්ම නිසා ප්‍රශ්න තිබෙන්න පුළුවන්; සමහර අඩු පාඩු තිබෙන්න පුළුවන්. හැබැයි, මේවා කඩාකප්පල් කරලා, මේවා නාස්ති කරලා, විනාශ කරලා, රටත් විනාශ කරලා වැඩ කටයුතු කරනවාට වඩා මෙවැනි වැඩ කටයුතුවලින් රට ප්‍රවර්ධනය කරන්න පුළුවන් නම්, රටේ ආර්ථික තත්ත්වය නඟා සිටුවන්න පුළුවන් නම්, ඊටත් අමතරව රටේ සමාජයීය සහ අනෙකුත් ප්‍රශ්න ටික අවසාන කරන්න පුළුවන් නම් ඒක තමයි අපි සියලු දෙනාම එකතු වෙලා කළ යුතු දේ. ඒක නිසා මේ පනත් කෙටුම්පතත් එක්ක රටට යම් කිසි අවාසියක් සිදු වෙනවා නම් ඒක කොහොමද අවම කර ගන්නේ, රටට සිදුවන වාසි ටික කොහොමද අපි වැඩි කර ගන්නේ කියන වැඩ පිළිවෙළ අපි සකස් කළ යුතු වෙනවා.

මේ පනත් කෙටුම්පත සම්මත කර ගත්තාට පස්සේ, රටේ ප්‍රවර්ධනය සඳහා, රටේ ආයෝජන වැඩි කිරීම සඳහා, රටේ ඉදිරි අනාගත සැලසුම් සඳහා මේ පනත් කෙටුම්පතෙන් ලැබෙන වාසියත් එක්ක අපි වැඩ කටයුතු කරන්නේ කොහොමද කියන එක ගැන අපි සාකච්ඡා කරලා තීන්දු තීරණ අරගන්න ඕනෑ. අද අපි මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්නවා හා සමානව මම යෝජනා කරනවා, විදේශ රටවල සේවය කරන අයත් අපේ රටේ මුදල් ආයෝජනය කරන්න දිරිමත් කළ යුතුය කියලා. අපේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ජීවත්වන ජනතාවගෙන් සමහර අයට විදේශ රටවල විශාල වත්කම් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඒ රටවල විශාල ව්‍යාපාර තිබෙනවා. ඒ රටවල විශාල තැන්පතු තිබෙනවා. ඒක නිසා ඒ සියල්ල ශ්‍රී ලංකාවට ගෙන එන්න සම්බන්ධීකරණයක් කරන්න ඕනෑ. ඒවාගේම මේවාත් එක්ක බැඳුණු අනෙක් ක්‍රියාකාරකම් කෙරෙහිත් අපේ අවධානය යොමු කළ යුතුයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා.

ඛනිජ තෙල් බෙදා හැරීම අත්‍යවශ්‍ය සේවාවක් ලෙස නම් කිරීමේ ගැසට් නිවේදනය ඊයේ රාත්‍රියේ නිකුත් කළා. මේ සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය, ප්‍රතිපත්තිය හා දැක්ම මේ සභාවට පැහැදිලි කළ යුතු යැයි අප කල්පනා කළා. අප එසේ කරන්නේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ආරක්ෂා කිරීමට අපේ රජය සැමවිටම කැප වී සිටින නිසායි.

පසු ගිය කාලයේ එවැනි පිළිවෙතක් ක්‍රියාත්මක වුණේ නැහැ. රජයේ ප්‍රතිපත්තිමය තොරතුරු පමණක් නොව මූල්‍ය තොරතුරුද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. රාජපක්ෂ රෙජීමය සමයේ පාර්ලිමේන්තුව නිකම්ම නිකම් සීල් එකක් බවට පත් කර තිබුණා.

2015 ජනවාරි 08වෙනි දා විප්ලවයෙන් ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා ජනාධිපති ලෙස මේ රටේ බහුතර ජනතාව පත් කර ගත් පසු, අප නැවතත් ප්‍රජාතන්ත්‍රවාදී අගයන් රට තුළ ස්ථාපිත කරලීමට කටයුතු කළා. පාර්ලිමේන්තුව බල ගැන්වූවා.

එහි ප්‍රතිඵල ලෙස ජනතාවට නිදහසේ ජීවත්වීමේ, නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ලැබුණා. මේ අයිතියෙන් ප්‍රයෝජන ගත් යම් යම් කොටස් ඒ නිදහස් අයිතිය පාවිච්චි කරමින් පටු දේශපාලන අරමුණු මුදුන්පත් කර ගැනීමට උත්සාහ කළ අවස්ථා ගණනාවක්ද අප නිරීක්ෂණය කළා.

ඕනෑම වෘත්තීය කණ්ඩායමක් සිය වෘත්තියේ උන්නතිය සහ සුබසාධනය වෙනුවෙන් කරනු ලබන ඉල්ලීම්, අරගළ, විරෝධතා ව්‍යාපාර පිළිබඳ අපට කිසිදු ගැටලුවක් නැහැ. නමුත් කිසියම් පිරිසක් පදනම් විරහිතව, කිසිදු පිළිගත හැකි හේතු නොමැතිව රටේ සාමාන්‍ය ජන ජීවිතය කඩාකප්පල් කොට, රට අස්ථාවර භාවයට පත් කිරීමට අප ලබා දුන් නිදහස පාවිච්චි කරනවා නම් රජයක් හැටියට වගකීමෙන් යුතුව ක්‍රියා කිරීමට අප බැඳී සිටිනවා.

ඛනිජ තෙල් වෘත්තීය සමිති ඊයේ හදිසි වැඩ වර්ජනයක් ආරම්භ කළා. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ නිල අදහස් දැක්වීම

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මෙසේයි. මෙහෙම කියන්නේ බනිජ තෙල් වෘත්තීය සමිති එකමුතුවේ කැඳවුම්කරු බන්දුල සමන් කුමාර මහතායි.

"ලිබියව ජනාධිපතිවරයා එකඟ වෙනවා නම්, අපි අනිවාර්යයෙන් වැඩ වර්ජනය නවත්තනවා. එහෙම නැතිව ජනාධිපතිතුමා එක්ක නොවෙයි, ශක්‍ර දේවේන්ද්‍රයා එක්කවත් අපි සාකච්ඡා පවත්වන්න එන්නෙ නෑ. ඒක අපේ තීරණය."

ගරු කථානායකතුමනි, අපේ රජය කිසිම විටෙක කිසිදු වෘත්තීය සමිතියක් සමඟ සාකච්ඡා ප්‍රතික්ෂේප කර නැහැ. බණිජ තෙල් වෘත්තීය සමිති සමඟ අපේ මැතිඇමතිවරුන් අවස්ථා ගණනාවකදී සාකච්ඡා පවත්වා තිබෙනවා. මම අප්‍රේල් 24 සහ ජූලි 13 යන දිනවල ඔවුන් සමඟ සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවලදී ඔවුන් ප්‍රධාන කරුණු තුනක් පිළිබඳව අවධාරණය කළා.

ඉන් පළමුවැන්න හම්බන්තොට තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳවයි. දෙවැන්න, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳවයි. තුන්වැන්න, සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකරණය කිරීම සම්බන්ධයි. ත්‍රිකුණාමලය තෙල් ටැංකි පිළිබඳව සිදු කෙරෙන මූලික සාකච්ඡාවලට වෘත්තීය සමිති නියෝජිතයන්ගේ අදහස් ලබා ගන්නා බව අප ඔවුන්ට දැනුම් දුන්නා. දැන් ඒ පිළිබඳ බරපතළ ගැටලුවක් නැහැ. අදාළ අවස්ථාවේදී සාකච්ඡා පිළිබඳ දැනුවත් කරලා, ඒ අදහසුත් අපි ඇතුළත් කරනවා.

මේ තෙල් ටැංකි පිළිබඳව හා බදු දීමේ ගිවිසුම පිළිබඳව දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතිනවා. එම නඩු තීන්දුවෙන් අනතුරුව මෙහි ඇති නීත්‍යානුකූල තත්ත්වය තවත් පැහැදිලි වෙනවා. සපුගස්කන්ද තෙල් පිරිපහදුව පිළිබඳ සංවර්ධන යෝජනා බනිජ තෙල් සම්පත් සංවර්ධන ඇමැතිතුමාට භාර දෙන ලෙස අප දැනුම් දී තිබෙනවා. ඒවා ලැබුණ පසුව අපි සලකා බලනවා.

හම්බන්තොට තෙල් ටැංකිවල අයිතිය ඇත්තේ ශ්‍රී ලංකා වරාය අධිකාරියටයි. ශ්‍රී ලංකා වරාය අධිකාරියට මේ අයිතිය ලබා දුන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතායි. නමුත්, ඒ අවස්ථාවේ කිසිවෙක් විරෝධය පළ කළේ නැහැ. මේ තෙල් ටැංකිත් හම්බන්තොට වරායේ ණය ගෙවීමට ඇතුළත් වෙලා තිබෙනවා. දැන් බනිජ තෙල් වෘත්තීය සමිතිවල ඉල්ලීම වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයට යොමු කර තිබෙනවා.

හම්බන්තොට වරාය සඳහා අපි ගත්ත ණය ගෙවීමට මේ තෙල් ටැංකි ඇතුළත් කරන වැඩසටහනක් තමයි තිබුණේ. එම ණය ගෙවන්න වැඩ කටයුතු කරගෙන යනවා. ඒකේ සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 1.4යි. ඒකෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.1ක් ලංකාවට ලැබෙනවා. ඒ සියල්ල මේ වරාය උපයන්න ඕනෑ. එම නිසා වරාය හා නාවික කටයුතු ඇමැතිතුමා මේ සියල්ල ගැන හිතලා බලලා තමයි තීරණයක් ගන්නේ. ඒ කටයුතු සියල්ල අපි වරාය හා නාවික කටයුතු ඇමැතිතුමාට භාර දීලා තිබෙනවා. මොකද, අද එහි අයිතිය තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට මිස වෙන කාටවත් නොවන නිසා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක චීන කොම්පැනියක්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අයිතිය තිබෙන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට. ඒක චීන කොම්පැනියක් නොවෙයි. මම දන්නේ නැහැ ඒක චීන කොම්පැනියක් කියලා මෙතුමා හිතන්නේ කොහොමද කියලා. එදා චීන කොම්පැනිය එක්ක ගිවිසුම අත්සන් කරපු කැබිනට් එකේ හිටපු ඇමැතිවරයෙක් නේ මෙහෙම කියන්නේ. දැන් මොනවාටද මෙතැනට වෙලා කෑ ගහන්නේ? [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි සභාවේ වැඩ කටයුතු කරමු. මේ ගැන වාද විවාද අවශ්‍ය වන්නේ නැහැ. ගරු අගමැතිතුමා කථා කරන්න.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
රජයේ කිසිදු ක්‍රියා පිළිවෙතකින් තෙල් සංස්ථාවට අගතියක් හෝ හානියක් සිදු නොවන බවට මා වෘත්තීය සමිති හමුවේ සහතික වුණු බවද මෙහිදී සඳහන් කරන්න කැමැතියි. එවැනි පසු බිමක බනිජ තෙල් වෘත්තීය සමිති හදිසි වර්ජනයක් කැඳවීම අවාසනාවන්ත තත්ත්වයක්.

ගරු කථානායකතුමනි, වර්තමානයේ රට පුරා ඩෙංගු වසංගත තත්ත්වයක් පවතිනවා. මේ තත්ත්වයෙන් ජනතාව මුදා ගැනීම සඳහා සියලු පාර්ශ්ව එකට එක්ව ඩෙංගු මර්දන ව්‍යාපාරයකට සම්බන්ධ වී තිබෙනවා. රටේ සියලු විද්‍යුත් මාධ්‍ය ආයතන සිය තරගකාරිත්වය පසෙකලා ඩෙංගු මර්දන වැඩසටහන් සඳහා දායකත්වය ලබා දී තිබෙන්නේ රට වෙනුවෙන් යුතුකම් ඉටු කළ යුතු නිසායි. ඩෙංගු පාලනයට, වැළැක්වීමට සහ රෝගීන් සුවපත් කිරීමට පක්ෂ, පාට, ජාති, ආගම් ආදී සියලු භේද ඉවතලා රටේ බහුතර ජනතාව වෙහෙසවන අවස්ථාවකයි, "ශක්‍රයා එක්කවත් සාකච්ඡා කරන්නේ නැහැ" කියමින් බනිජ තෙල් වර්ජනය ක්‍රියාත්මක කරන්නේ.

බනිජ තෙල් බෙදා හැරීම අකර්මන්‍ය වුණොත් රටේම එදිනෙදා කටයුතු අඩපණ වෙනවා. රෝහල් සේවක-සේවිකාවන්ගේ ගමනාගමනය, ගිලන් රථ ධාවනය, ඩීසල් විදුලි ජනනය, පොදු ප්‍රවාහන සේවා ආදී සෞඛ්‍ය සේවාවලට සෘජුවම බලපාන ක්ෂේත්‍ර ගණනාවකට මේ වර්ජනය බලපානවා.

එසේම, කසළ කළමනාකරණය දැන් අපි ආරම්භ කරලා තිබෙනවා; කසළ ඉවත් කිරීම කර ගෙන යනවා. මේ ප්‍රශ්නය මාස දෙකක් තිබුණා. ඉන්ධන නොලැබීමෙන් කසළ ඉවත් කිරීම හා කසළ කළමනාකරණයට පහරක් වැදුණා නම්, ඒකෙනුත් වන්නේ ඩෙංගු උවදුර තවත් උග්‍ර වීමයි.

අනෙක් අතින් ගුවන් යානා ගමන් ඇනහිටීම, වරාය අංගනයවලට තෙල් නොමැතිවීම නිසා බහාලුම් කටයුතු නතර වීම ආර්ථිකයට බලපානවා. තවත් අතකින් සාමාන්‍ය ජන ජීවිතයට බාධා ඇති වෙනවා. හෙට අනිද්දා ආරම්භ වීමට නියමිත පාසල් විභාග කටයුතු අඩාල වෙනවා. ඊයේ රාත්‍රිය වන විට බනිජ තෙල් නීතිගත සංස්ථා පරිශ්‍ර තුළ යම් යම් ක්‍රියා සිදුවන බවට වාර්තා ලැබුණා. තෙල් බෙදා හැරීමට බාධාවන අයුරින් බවුසර් හරස් කිරීම, ඒවායේ හුළං ඇරීම, valves ගලවා වීසි කිරීම වැනි දේත් ඒ අතර සිදුවී තිබෙනවා. මීටත් වඩා බරපතළ ක්‍රියා සිදුවිය හැකි බවටත් තොරතුරු වාර්තා වුණා.

බනිජ තෙල් බෙදා හැරීම අත්‍යවශ්‍ය සේවාවක් ලෙස නම් කළේ මේ සියලු කරුණු ඉතා සැලකිල්ලෙන් අධ්‍යයනය කිරීමෙන්

පසුවයි. අත්‍යවශ්‍ය සේවා ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් පසු, පරිශ්‍ර හා ඒවායේ ප්‍රවේශ මාර්ග ආරක්ෂා කරලීමේ කටයුතුවලට ආරක්ෂක හමුදා මැදිහත් වුණා. ඒ වාගේම, ඉන්ධන බෙදා හැරීමේ කාර්යයන්ට පූර්ණ ආරක්ෂාවක් සැපයීමේ වග කීමත් ඔවුන්ට පැවරුණා. අද දවල් වන විට සියලු කටයුතු යථා තත්ත්වයට පත් කෙරුණා. මේ වන විට ඉන්ධන බවුසර් පිටත් කරමින් පවතිනවා. ගුවන් යානා ඉන්ධන රැගත් දුම්රියද කටුනායක බලා යන්න සූදානම්. ඒ සියලු කටයුතු යථා තත්ත්වයට පත් වෙමින් පවතිනවා.

ගරු කථානායකතුමනි, අපි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ඉහළට ඔසවා තබනවා. අධිකරණයට හා නීතියට ගරු කරනවා. නමුත්, ඒවා විනාශ කරමින් රට අස්ථාවර කරන බලවේගවලට යටත් වෙන්නේ නැහැ. ඒ බලවේගවලට හිස නමන්නත් බැහැ.

ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුතු අපේ රජය හැම විටම රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් ක්‍රියා කරනවා. අප යහපත් දෙය අගය කරනවා; යහපත් දෙය ආරක්ෂා කරනවා; යහපත් දෙය වෙනුවෙන් පෙනී සිටිනවා. නමුත්, අයහපතට අපි ඉඩ දෙන්නේ නැහැ. අපි ජනතා යහපත වෙනුවෙන් යහපත් පිළිවෙතින් අයහපත් දේ යටපත් කරනවා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමා කැමැතිද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
Okay.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, එතුමා කළ ප්‍රකාශයේ අසත්‍ය කරුණු කීපයක් තිබුණා. බනිජ තෙල් වෘත්තීය සමිති එකමුතුවේ කැඳවුම්කරු රාජකරුණා මහත්මයායි. ඔබතුමා කියපු මහත්මයා නොවෙයි, ගරු අගමැතිතුමනි. බනිජ තෙල් වෘත්තීය සමිති එකමුතුව කිසිසේත්ම සාකච්ඡා ප්‍රතික්ෂේප කර නැහැ. ඒක වැරැදි කථාවක්. දැනුත් ජනාධිපතිවරයා සමඟ කළ සාකච්ඡාවකින් පසුව එන විටදී කොළොන්නාවේදී වෘත්තීය සමිති නියෝජිතයන් කීපදෙනෙක් ඇතුළු 15දෙනෙක් පොලීසිය විසින් අත් අඩංගුවට ගෙන තිබෙනවා. [බාධා කිරීමක්] මේ දැන්, ගරු අගමැතිතුමනි. ඔබතුමා සොයා බලන්න. සාකච්ඡාවට ගිහින් එන විට පොලීසියෙන් පැහැරගෙන යනවා. ඒකයි තමුන්නාන්සේලාගේ මැදිහත්වීමේ ක්‍රියා මාර්ගය. ඔබතුමා කිව්වාට, හමුදාව යොදවලා කිසිදු තෙල් බවුසරයක් තෙල් සංස්ථාවෙන් පිටත් වෙලා නැහැ. වෘත්තීය සමිතිම එකඟතාවකට ආවා, අත්‍යවශ්‍ය සේවා සඳහා ඔවුන් තෙල් නිකුත් කරන්න සූදානම් බවට. උදාහරණයක් ගත්තොත්, ගුවන් සේවාව වෙනුවෙන්. ඒ වාගේම, ජාතික රෝහලේ කටයුතු ඇන හිටීමේ අනතුරකට මුහුණ දී තිබුණා. ඒ සඳහා තෙල් නිකුත් කරන්නත් ඔවුන් එකඟතාවකට එමින් තිබුණා. එවැනි එකඟතාවකට එමින් තිබියදී තමයි හමුදාව යොදවලා එහි හිටපු සේවකයන්ට පන්න පන්නා පහර දීලා තිබෙන්නේ. ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ බව දන්නවා. සමහර අයට පහර දුන්නා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කිරීමක් පමණක් කරන්න, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. මේ අවස්ථාවේ විවාදයකට යන්න අමාරුයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම මේ කියන්නේ එතුමා කියපු කරුණුවල තිබෙන සාවද්‍ය කරුණු පිළිබඳවයි ගරු කථානායකතුමනි. මේ හමුදාව යෙදවීමක් නොවෙයි, සාමකාමී තත්ත්වයක්, දේපොළ ආරක්ෂා කිරීමේ තත්ත්වයක් ඇති කිරීම නොවෙයි එතැන කර තිබෙන්නේ. එතැන සිටි සේවකයන්ට පහර දී නෙරපා හැර තිබෙනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා කියූ පරිදිම ඔවුන්ගේ යෝජනා මොනවාද? එකක්, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳවයි. ඔබතුමා ජූලි මාසයේ 13වැනි දා සාකච්ඡාවක් කළා. ඒ සාකච්ඡාවේදී ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය ගැන ගත යුතු යෝජනා පිළිබඳ විධිමත් යෝජනාවලියක් ඔබතුමාට භාර දුන්නා, ගරු අගමැතිතුමනි. ඔබතුමා සමහර ඒවා ගැන ප්‍රශ්න කර සිටියා. ඒ ප්‍රශ්නවලටත් ඒ එකමුතුවේ නියෝජිත මහත්වරු කරුණු ඉදිරිපත් කර තිබුණා. ඒ නිසා ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය පිළිබඳ යම් එකඟතාවකට ඒමේ ඉඩකඩ නිර්මාණය වෙලා තිබුණා. අපි ඔබතුමාට ඒ පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, පිරිපහදුව නවීකරණය පිළිබඳ කාරණය අද ඊයේ තිබුණු සාකච්ඡාවක් නොවෙයි. පිරිපහදුව නවීකරණය කරන්න 2007දී මුල්ගල තැබුවා. එම පිරිපහදුව නවීකරණය කිරීමකින් තොරව අපේ රටේ ජනතාවට අඩු මිලට, සහන මිලට තෙල් ලබාදීමේ හැකියාවක් නැහැ. අද අපට අවශ්‍ය තෙල්වලින් විශාල ප්‍රමාණයක් සඳහා පිරිපහදු කරන ලද තෙල් ආනයනය කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා ඔවුන් එය කියන්නේ කුමක් වෙනුවෙන්ද? ජනතාවට සහන මිලට තෙල් ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා, පිරිපහදුව නවීකරණය කළොත්. 1968 ඉඳන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ පිරිපහදුව නවීකරණය කිරීම පිළිබඳව කථා කරනවා. එයට විසඳුම් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ඔබතුමා මේ ගැන- [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊළඟට, තුන්වන ප්‍රධාන කරුණ වන්නේ වරාය පිළිබඳ ප්‍රශ්නයයි. ඔබතුමන්ලා ඊයේ ඒ සම්බන්ධයෙන් වන ගිවිසුම අත්සන් කළා. පැවැති රජය තෙල් ටැංකි ගොඩ නැඟීමට දුන්නේ වරාය අධිකාරියටයි. හැබැයි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙන කොහේවත් රටකට අයිති එකක් නොවෙයි. ඒක අයිති ශ්‍රී ලංකා ආණ්ඩුවටයි. වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයත් ඉන්නේ කැබිනට් මණ්ඩලයේ. බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයත් ඉන්නේ කැබිනට් මණ්ඩලයේ. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉල්ලා සිටියේ අන් කවරක්වත් නොවෙයි. අපේ රටට වැඩිම ලාභ ලබා ගත හැකි ව්‍යාපෘතිය බවට පත් වෙන්න නැව් තෙල් අංශය වර්ධනය කරන්න කියලායි ඉල්ලන්නේ. හම්බන්තොට වරාය ගැන අපි සිකුරාදා සාකච්ඡා කරමු. හැබැයි, නැව් තෙල් අංශය තමයි අපේ රටේ වැදගත්ම දේ.

[ගරු අනුර දිසානායක මහතා]

ගරු කථානායකතුමනි, ඔබතුමා විදුලිබල සහ බලශක්ති අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරපු කාලයේ තමයි ඔබතුමා යටතේ තිබුණු මැරයින් සර්විස් ලිමිටඩ් ආයතනය ජෝන් කීල්ස් ආයතනයට විකුණුවේ. ඒ වෙලාවේත් වෘත්තීය සමිති කෑ ගැහුවා, මැරයින් සර්විස් ආයතනය විකුණන්න එපාය කියලා. හැබැයි, අද නැවත හම්බන්තොට වරායේ නැව්වලට තෙල් ගැසීමේ බලය තෙල් සංස්ථාවට ලබා දෙන්න කියලා කියන්නේ, තෙල් සංස්ථාවට වැඩිම ලාභ උපයා ගත හැකි පංගුව එය නිසයි. ඒ හරහා මේ රටේ ජනතාවට අඩු මිලට තෙල් ලබා දිය හැකිව තිබෙනවා. හැබැයි, නැව් තෙල් අංශයත් චීන රජයට පැවරීම තමුන්නාන්සේලාගේ කැබිනට් මණ්ඩලය අනුමත කරන්න සූදානම් වෙනවා නම් ඒකට විරුද්ධව ඉක්මන් ක්‍රියාමාර්ගයක් හැටියටයි ඔය සටන් ක්‍රියා මාර්ගයට අවතීර්ණ වුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒ නිසා මේ හැම ක්‍රියාවක්ම තෙල් සංස්ථාවත්, ආර්ථිකයත්, රටේ ජනතාවගේ උපයෝගීතාවත් වෙනුවෙන් කරන ගැටුම්. මේවා කිසිවක් වෘත්තීය සමිතිවලින් කරන්න ඕනෑ ඒවා නොවෙයි. පාලකයන් විසින් හොයා බලා විසඳුම් දෙන්න ඕනෑ කාරණයි. හැබැයි පාලකයන් විසඳුම් ලබා නොදෙන නිසා තමයි වෘත්තීය සමිතිවලට මැදිහත් වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා තමයි මේ රටේ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු අගමැතිතුමනි, ඔබතුමා එතුමාගේ ප්‍රශ්නයටත් ඉඩ දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය කෙටියෙන් අහන්න. කථාවක් නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හදිසියේම මහජන ආරක්ෂක නිවේදනය ප්‍රකාශයට පත් කරමින් ඊයේ දිනයේ රජය කටයුතු කළ ආකාරය හා එයට හේතුව දක්වමින් ගරු අගමැතිතුමා කළ ප්‍රකාශය ගැන කාරණා කිහිපයක් පමණක් සැකෙවින් ඉදිරිපත් කරනවා, පිළිතුරු ලබාදෙයි කියලා බලාපොරොත්තුවෙන්. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් දැන් සඳහන් කළ පරිදි මේ පිළිබඳ තෙල් සංස්ථාවේ සේවකයන් හා වෘත්තීය සමිති රජයට කරුණු ඉදිරිපත් කළේ ඊයේ නොවෙයි; පෙරේදාත් නොවෙයි. පසුගිය මාසයට පෙරත් මේ කරුණු ඉදිරිපත් කළා. මේ පිළිබඳව අමාත්‍යවරයා හා සංස්ථාව ඉතා හොඳින් දන්නවා. මේ ප්‍රධාන කරුණු පිළිබඳව විසඳුමක් ඉල්ලා සිටින බව රජය දන්නවා. එයට විසඳුමක් ලබා නොදී සිටීමෙන් හා ඒ පිළිබඳ දැනට ගෙන තිබෙන ක්‍රියාමාර්ගය නිසයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි වේවා, හම්බන්තොට තෙල් ටැංකි වේවා, කොළඹ වරායේ තෙල් නළ මාර්ග සම්බන්ධයෙන් වේවා, ඒ පිළිබඳව ගත හැකි ඊළඟ ක්‍රියා මාර්ගය කුමක්ද?

ඊළඟ ක්‍රියා මාර්ගය තමයි, තමන්ගේ අයිතිවාසිකම් හා ආයතනය ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ වර්ජනයකට පිවිසීම. ආයතනය ආරක්ෂා කර ගැනීම සඳහා සේවකයන් ගෙන ඇති ක්‍රියා මාර්ගය ලෙස වැඩ වර්ජනයකට පිවිස තිබියදී ආණ්ඩුව විසින් මහජන ආරක්ෂක පනත ප්‍රකාශයට පත් කොට හමුදාව යවා ඔවුන් ලවා මේ කටයුතු කිරීමේ උත්සාහයක යෙදෙමින් සිටිනවා. ඊයේ රාත්‍රියේ ගත් එම උත්සාහය අසාර්ථකයි. ගරු අගමැතිතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. අගමැතිතුමා දීර්ඝ කාලයක් මේ පාර්ලිමේන්තුවේ ඇමැතිකම් සහ අගමැතිකම දරපු කෙනෙක්. ඒ නිසා ගරු අගමැතිතුමා මේ සම්බන්ධයෙන් දැනගන්න ඕනෑ. ගරු කථානායකතුමනි, හමුදාව නොදන්නා යම් බොත්තමක් එබුවොත් එතැන ඇති වෙන්නේ භයානක සිදුවීමක්.

අනෙක් කාරණය තමයි, එහෙම වුණොත් මිශ්‍ර ද්‍රව්‍ය නිකුත් වෙනවා. මම වග කීමෙන් කියනවා, එවැනි සිදුවීමක් අද උදේ වෙන්න ගිහිල්ලා නවත්වා තිබෙන බව. ඒ නිසා සේවකයන්ගේ සහයෝගය ලබාගෙන අත්‍යවශ්‍ය ආයතනවලට ලබාදීමට වෘත්තීය සමිති ගත්ත ක්‍රියා මාර්ගයට අනුව කටයුතු කරන්න. ඒ දුන්නු පොරොන්දුවෙන් බාහිරව කටයුතු කරන්න එපා.

දෙවැනි කාරණය, දැන් කොළඹ වරායත් මහජන ආරක්ෂක නීතිය යටතට ගෙනැල්ලා තිබෙනවා. හම්බන්තොට වරායත් මහජන ආරක්ෂක නීතිය යටතට ගෙනැල්ලා තිබෙනවා, තෙල් ටැංකි තිබෙන නිසා. මේක බරපතළ ක්‍රියා මාර්ගයක්. ඒ අතරතුර ඇමතිතුමා -

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇයි strike කළේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනේ! මේ තොත්ත බබා දන්නේ නැහැ නේ. මේ තොත්ත බබා දන්නේ නැහැ strike කළේ මොකද කියලා. ඉතින් මොනවා කියන්නද? ඔබතුමා තොත්ත බබා නේ. ඊට වඩා භයානකයි තෙල් ගිනි ගන්නවා. ඔය තොත්ත බබා දැනගන්න ඕනෑ, තෙල් කියන දේ ගිනි ගන්නා භයානක දෙයක් බව. - [බාධා කිරීම්] මට තව කාරණාවක් ගැන අගමැතිතුමාගෙන් අහන්න තිබෙනවා. හම්බන්තොට වරාය විකිණීම සඳහා කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තාය කියලා අගමැතිතුමා,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු අගමැතිතුමා පිළිතුරු දෙයි. [බාධා කිරීම්] අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, ඕනෑම වෘත්තීය සමිතියකට වෘත්තීය ක්‍රියා මාර්ග ගන්න අයිතියක් තිබෙනවා. හැබැයි, වැඩ කරන්න යන තවත් කණ්ඩායමක් බලහත්කාරයෙන් රඳවා ගන්නත්, ඒ යන අයට බිත්තර ප්‍රහාර එල්ල කරලා රටේ ජන ජීවිතය අකර්මණ්‍ය කරන්නත් කිසිදු වෘත්තීය සමිතියකට අයිතියක් නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ කරපු ප්‍රකාශය වැරැදියි. යුද හමුදාව ගියේ තෙල් බෙදා හරින්න නොවෙයි. යුද හමුදාව ගියේ තෙල් සංකීර්ණයේ ආරක්ෂාවටයි. නමුත් එක වෘත්තීය සමිතියක් ස්වේච්ඡාවෙන් වැඩ කරන්න යද්දී, - [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම අවස්ථාව දුන්නා නේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව දෙන්න. එක වෘත්තීය සමිතියක් ස්වේච්ඡාවෙන් වැඩ කරන්න යද්දී, තවත් කණ්ඩායමක් බලහත්කාරයෙන් ඔවුන්ට කුණු බිත්තර ප්‍රහාර එල්ල කරනවා. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ස්වේච්ඡාවෙන් වැඩ කරන සේවකයන් සිටිනවා. [බාධා කිරීම්] ඔවුන්ව නවත්වන්න තමයි මේ අය කටයුතු කරන්නේ. [බාධා කිරීම්]

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Namal Rajapaksa, what is your point of Order?

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු කථානායකතුමනි, කාරණා දෙකක් සම්බන්ධව පැහැදිලි කර ගන්න අවශ්‍යයි. ඊයේ, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමනි, ඔබතුමාගෙන් ප්‍රශ්න තුනක් ඇහුවා. ඔබතුමා පිළිතුරු දෙනවාද? [බාධා කිරීම්] Let the Hon. Prime Minister explain.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට කියන්න අවස්ථාව දෙන්න කෝ.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමා මට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

ගරු කථානායකතුමනි, සාකච්ඡාවට එන්නේ නැහැ කිව්වා නේ. නමුත් දැන් ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරන්න කියලා ගිහිල්ලා එනකොට 20දෙනෙකුව අත් අඩංගුවට ගෙන තිබෙනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොහොම හොඳයි.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
නමුත් එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා කියනවා, යුද හමුදාව යැව්වේ ආරක්ෂාවට කියලා. අපේ ගරු අගමැතිතුමා කිව්වා, හමුදාව යැව්වේ තෙල් බෙදන්න කියලා. මේ දෙදෙනාගෙන් ඇත්ත කියන්නේ කවුද? ගරු අගමැතිතුමනි, අපට ඒ පිළිබඳ උත්තරයක් ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට දැන් මේ පිළිබඳව විවාදයකට යන්න අපහසුයි. ගරු අග්‍රාමාත්‍යතුමා, - [බාධා කිරීම්]මේ ගැන විවාදයක් කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. Let the Hon. Prime Minister give the reply.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙනවා නම් මම පිළිතුරු දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු අගමැතිතුමාගෙන් තව එක කාරණයක් අහන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can have a separate Debate on this later, but now let the Hon. Prime Minister make the Statement.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Not a debate, I want to ask a question.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
So, ask the question quickly.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා අන්තිමට කිව්වා මෙය නීතිමය ප්‍රශ්නයක්, ඒ නීතිමය ප්‍රශ්නය ඉවරයි කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
එහෙම කිව්වේ නැහැ. Let me explain what I said.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Yes, okay. [බාධා කිරීම්] ස්ථාවර නියෝග අනුව Ministerial Statement එකක් සම්බන්ධයෙන් විවාදයක් කරන්න බැහැ. මම මන්ත්‍රීවරුන් තුන්දෙනෙකුට කථා කරන්න අවස්ථාව දුන්නා. දැන් ගරු අගමැතිතුමා පැහැදිලි කරයි. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
මට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හැමෝටම අවස්ථාව දුන්නා. දවස පුරා මේ ගැන වාද කරන්න බැහැ. ගරු අගමැතිතුමා පැහැදිලි කරන්න. [බාධා කිරීම්] එතුමාටත් අවස්ථාව දුන්නා. මත ප්‍රකාශ කරන්න අවශ්‍ය හැමෝටම අවස්ථාව දුන්නා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමන්ලාටත් අවස්ථාව දුන්නා. අනෙකුත් පක්ෂවල මන්ත්‍රීවරුන්ටත් අවස්ථාව දුන්නා. මම තුන් හතර දෙනෙකුට අවස්ථාව දුන්නා.

ගරු අගමැතිතුමා. [බාධා කිරීම්]

Let the Hon. Prime Minister reply. [බාධා කිරීම්] ඔබතුමන්ලා ප්‍රශ්න හතරක්, පහක් ඇහුවා. ඔබතුමන්ලාගේ ප්‍රශ්නවලට ගරු අගමැතිතුමා පිළිතුරු දෙයි. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
මට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමාට පිළිතුරු දෙන්න ඔබතුමන්ලා ඉඩ දෙන්නේ නැහැ නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
අපට ප්‍රශ්න අහන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මිනිත්තු දහයක් තිස්සේ ප්‍රශ්න ඇහුවා නේ. [බාධා කිරීම්] මිනිත්තු පහක් තිස්සේ ප්‍රශ්න ඇහුවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඇහුවේ නැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න ඇහුවා. [බාධා කිරීම්] ප්‍රශ්න ගණනාවක් ඇහුවා. [බාධා කිරීම්] ගරු සභාවේ සෝෂා කරන්න එපා. ඔබතුමන්ලාට ප්‍රශ්න අහන්න ඉඩ දුන්නා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාට දුන්නා; ඔබතුමාට දුන්නා; නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට දුන්නා. මේක විවාදයක් කර ගන්න දෙන්න බැහැ. [බාධා කිරීම්] පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්. ස්ථාවර නියෝග අනුව විවාද කරන්න දෙන්න බැහැ. ඒ බව තමුන්නාන්සේලා හැමෝම දන්නවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා පැහැදිලි කරන්න. ගරු මන්ත්‍රීවරුනි, මෙතුමා කැමැති නම් තව ප්‍රශ්න ගැන පැහැදිලි කිරීම් කරයි. ගරු සභාවේ වාඩි වෙලා, සාමකාමීව ප්‍රශ්න අහන්න. රණ්ඩු වෙන්නේ නැතුව ප්‍රශ්න අහන්න. ගරු අගමැතිතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න. ඔබතුමන්ලා මෙතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්නේ නැහැ නේ. [බාධා කිරීම්] ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ප්‍රශ්න අහන එකයි, පිළිතුරු දෙන එකයි දෙකම. දැන් තමුන්නාන්සේලාට ප්‍රශ්න අහන්න අවස්ථාව දුන්නා. මෙතුමා පිළිතුරු දෙන්න ලෑස්තියි. පිළිතුරු දෙන්න ඉඩ දෙන්නේ නැත්නම් මොකද කරන්නේ?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ඔබතුමා තීරණය ගන්නේ - [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමා වැරදි දෙයක්- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඔබතුමාට ප්‍රශ්න අහන්න අවස්ථාව දුන්නා. ඔබතුමා දීර්ඝ කථාවක් කළා නේ. ඔබතුමන්ලා ඔක්කෝම කළේ, දීර්ඝ කථා. [බාධා කිරීම්] ඉතින්, එතුමාටත් අයිතියක් තිබෙනවා. එතුමාට දුන්නේ මිනිත්තු දෙකයි. ඔබතුමාට මිනිත්තු හතක්, අටක් විතර දුන්නා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාටත් මිනිත්තු අටක් දුන්නා. තමුන්නාන්සේලා මට කොච්චර ඇහිල්ල දික් කළත්, කොච්චර තර්ජනය කළත්, මම හුහක් සාධාරණව කටයුතු කර තිබෙනවා. මම සාධාරණ විධියට වෙලාව දුන්නා. [බාධා කිරීම්] ඔව්, සාධාරණ විධියට වෙලාව දුන්නා. [බාධා කිරීම්] ගරු අගමැතිතුමනි, you may reply.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මින් අනතුරුව ගරු මුදල් ඇමතිතුමා නියමයන් කීපයක් ගරු සභාවට ඉදිරිපත් කරනවා. ඒ යටතේ ඕනෑ තරම් මේ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. පැය දෙක, තුනක් තිබෙනවා.

පළමුවෙන්ම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමයි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමයි මතු කළ කාරණා ගැන පිළිතුරු දෙන්න මට ඉඩ දෙන්න. මම ඉස්සෙල්ලාම කියන්න කැමැතියි, ඇයි මේක සිදු වුණේ කියලා. පළමුවැනි වතාවට ගරු සභාවට ඇවිල්ලා මම කරුණු කිව්වා. පසු ගිය පාලන කාලයේ නම්, මේ එකක්වත් ගැන කියන්නේ නැහැ. [බාධා කිරීම්] මේ එකක්වත් කියන්නේ නැහැ. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම රටේ අද තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය නිසා තමයි මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ප්‍රකාශය කළේ.

මම ප්‍රකාශයක් කළේ නැත්නම් මෙහෙම නැඟිටලා කෑ ගහන්න බැහැ නේ. රාජකරුණා මැතිතුමා ගැන මම මෙතැන මොකක්වත් කියන්න ගියේ නැහැ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, බන්දුල සමන්කුමාර තමයි කියා තිබෙන්නේ, බනිජ තෙල් සංස්ථාවේ වෘත්තීය සමිතියේ කැඳවුම්කරු කියා. ඇත්ත වශයෙන්ම මටත් ඒක ප්‍රශ්නයක් වුණා. රාජකරුණා මැතිතුමා එක්ක අපි එකඟ නොවුණත් හොඳ කථාවක්, සාකච්ඡාවක් කරන්න පුළුවන් මහත්මයෙක්. ඒ ගැන මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] දැන් රාජකරුණා ගැන කථා කරනකොටත් කෑ ගහනවා. හරි වැඩක් වෙලා තියෙන්නේ. රාජකරුණා මැතිතුමාත් එක්ක මම එකඟ වෙන කාරණා නැහැ. එහෙත් අඩු ගණනේ මට එතුමා එක්ක කථා කරන්න පුළුවන්. මම කිව්වේ බන්දුල සමන්කුමාර ගැන. [බාධා කිරීමක්] මම දැන් මෙතුමාත් එක්ක කථා කරනවා නේ. මම කී දෙනෙක් එක්ක කථා කරන්නද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

දැන් ඇත්තටම ජනාධිපතිවරයාත් එක්ක සාකච්ඡාවක් තිබුණා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
(The Hon. Anura Dissanayake)

අපි වෙඩි තියන්න කියලා නැහැ කාටවත්. වෙඩි තියන්න කියලා නැහැ කාටවත්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

සාකච්ඡාවක් තියලා එකඟතාවකට ආවා. ඒ එකඟතාව තිබියදී තමයි අත් අඩංගුවට ගන්නේ. [සෝෂා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මේ වැලිවේරිය නොවෙයි, කොළොන්නාව. අපි වෙඩි තියන්නේ නැහැ, කාටවත්. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර වාඩි වෙන්න. නැත්නම් මට සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවන්නට සිදු වෙනවා. [සෝෂා කිරීම්] කරුණාකර වාඩි වෙන්න. [සෝෂා කිරීම්] මේ අවස්ථාවේදී සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 3.09ට නැවත පවත්වන ලදී.

අතන්පඩි, அமர்வு பி.ப. 3.09 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.

Sitting accordingly suspended till 3.09 p.m. and then resumed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, අද දින ගරු අග්‍රාමාත්‍යතුමා විසින් අමාත්‍යාංශ නිවේදන ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එම නිවේදනවලින් පැන නැඟුණු කරුණු පිළිබඳව පැහැදිලි කර ගැනීම සඳහා ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාටත්, අනුර දිසානායක මන්ත්‍රීතුමාටත්, අදාළ ප්‍රදේශය නියෝජනය කරන මරික්කාර් මන්ත්‍රීතුමාටත්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාටත් පවතින ස්ථාවර නියෝගවලට අනුකූලව අග්‍රාමාත්‍යතුමාගේත් අනුමැතියට යටත්ව මවිසින් ප්‍රමාණවත් පරිදි කාලය ලබා දෙන ලදී. සමහර අවස්ථාවල මිනිත්තු 6ක් දුන්නා; සමහර අවස්ථාවල මිනිත්තු 7ක් දුන්නා. ඉන් අනතුරුව ගරු අග්‍රාමාත්‍යතුමා විසින් මතු කරන ලද කරුණු පිළිබඳව පැහැදිලි කිරීමට කටයුතු කළ අවස්ථාවේදී, එසේ කිරීමට ඉඩ නොදීම හේතුවෙන් පාර්ලිමේන්තුව තුළ නොසන්සුන්තාවක් පැන නැඟුණෙන් පාර්ලිමේන්තුව තාවකාලිකව අත් හිටුවීමට සිදු වුණා. කලින් නියම කර ගත් පරිදි පස් වරු 2.30ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් පවත්වන ලදී. එහිදී තීරණය කර ගත් පරිදි හෙට දිනයේදී පැවැත්වීමට නියමිත රජයේ කටයුතු වෙනුවට ජනාධිපතිවරයා විසින් අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ නිකුත් කරන ලද නියමය පිළිබඳව දවස පුරා විවාදයක් පැවැත්වීමට නියමිතය. ඒ අනුව සියලුම මන්ත්‍රීවරුන්ට අදාළ කාරණය සම්බන්ධයෙන් තම අදහස් හෙට දින විවාදයේදී ප්‍රකාශ කිරීමට අවස්ථාව තිබෙන බැවින්, අද දවසට නියමිත කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

නැඟී සිටියේය.

எழுந்தார்.

rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මගෙන් අහපු කාරණයක් ගැන මා පැහැදිලි කරන්නම්. [බාධා කිරීම්] මට අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Let the Hon. Prime Minister explain. [බාධා කිරීම්] දැන් එතුමාට කථා කරන්න ඉඩ දෙන්න. ඊට පස්සේ ඔබතුමා කථා

[ගරු කථානායකතුමා]

කරන්න. [බාධා කිරීම්] මෙය ගරු සභාවක් නිසා කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] හෙට දවස පුරා විවාද කරන්න පුළුවන්. දැන් අග්‍රාමාත්‍යතුමා පැහැදිලි කරන්න ලෑස්තියි. [බාධා කිරීම්] එතුමාට පැහැදිලි කරන්න ඉඩ දීලා, එතුමා කැමැති නම් ප්‍රශ්නයක් අහන්න. මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] ඔබතුමන්ලා මොකක්ද කරන්න කියන්නේ? [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, point of Order එකක් තිබෙනවා, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මොකක්ද, point of Order එක? Now, let the Hon. Prime Minister explain. [බාධා කිරීම්] අගමැතිතුමා පැහැදිලි කළාට පස්සේ අවශ්‍ය නම් එතුමාගේ කැමැත්ත අනුව තමුන්නාන්සේලාට පැහැදිලි කර ගන්න පුළුවන්. [බාධා කිරීම්] ඉතින් ඒක කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
We will not agree for a Debate tomorrow.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශයේ විවිධ කරුණු රාශියක් තිබෙනවා. ප්‍රශ්න 2, 3ක් අහන්න ඕනෑ නිසා එතුමා කිව්වා, ප්‍රශ්න අහන්න කියලා. මා ප්‍රශ්නය ඉදිරිපත් කරමින් ඉන්නකොට මගේ ප්‍රශ්න ඇසීම නවත්වා වෙන කෙනෙකුට ප්‍රශ්න ඇසීමට අවස්ථාව දෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට විනාඩි 7ක් පමණ දුන්නා. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
විනාඩි 7ක් නොවෙයි. [බාධා කිරීම්] නැහැ. අගමැතිතුමා උත්තර දෙයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්. කැමැති නම් උත්තර දෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඉතින් මට ප්‍රශ්න අහන්න ඉඩ දෙන්න. ඔබතුමා නේ වළක්වන්නේ. ඔබතුමා වළක්වන්නේ ඇයි?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මා වළක්වන්නේ නැහැ. ඔබතුමා දැන් ප්‍රශ්නය අහන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ඇයි ඔබතුමා වළක්වන්නේ? ඔබතුමා වළක්වන්න එපා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට දැන් ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙනවා. දැන් ප්‍රශ්නය අහන්න. ගරු අගමැතිතුමා උත්තර ලබාදෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
විවාදයක් කිරීමේ කිසිදු වුවමනාවක් අපට නැහැ. අපට ඕනෑ විවාදයක් කරන්න නොවෙයි, ප්‍රශ්නයක් අහලා පැහැදිලි කර ගන්නයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
මම කැමැතියි, පැහැදිලි කිරීමක් කරන්න. I would like to clarify one of the issues that-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. [බාධා කිරීම්] අනෙක් අය වාඩි වෙන්න. [බාධා කිරීම්] දෙපැත්තේම අනෙක් මන්ත්‍රීවරු වාඩි වෙන්න. [බාධා කිරීමක්] හරි, ඒක මම කරන්නම්, ඔබතුමා වාඩි වෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අගමැතිතුමා එතුමාගේ කථාවේදී කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා, දැන් වැඩ ආරම්භ කරලා තිබෙනවා කියලා. දැන් තෙල් බෙදාහැරීම පටන් ගෙන තිබෙනවා කිව්වා. මේක අගමැතිතුමාව නොමඟ යවපු තොරතුරක් කියන එකයි අපි පළමුවෙන්ම කියන්නේ. වෘත්තීය සමිති සාකච්ඡා කරලා ආපසු පැමිණෙන විට ඒ සියලු දෙනාවම අත් අඩංගුවට ගෙන තිබෙනවා, ගරු අගමැතිතුමනි. දැන් ඒ අයව වැලිකඩ පොලිස් කුටියට අරගෙන ගිහින් තිබෙනවා. එතකොට ඔබතුමා කොහොමද කියන්නේ, වෘත්තීය සමිතිවලට නිදහස දෙනවා කියලා. දැන් කොළොන්නාවේ තෙල් ටැංකි ඉස්සරහ ඔවුන්ගේ ලේ හලනවා. මේක ඔබතුමා කථා කරමින් සිටිනකොට මතුවුණු ප්‍රශ්නයක්. මුළු ලෝකයටම මේ ප්‍රවෘත්තිය ගිහිල්ලා තිබෙනවා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. එතුමාට ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න. ඊට පස්සේ ගරු අගමැතිතුමා පිළිතුරු දෙයි. මේ සභාව තුළ ප්‍රශ්න අහන්නත්, පිළිතුරු දෙන්නත් සෑම කෙනෙකුටම අයිතිය

තිබෙනවා. ඒ නිසා ඔබතුමා ප්‍රශ්නය අහන්න, අගමැතිතුමා පිළිතුරු දෙයි. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ජනාධිපතිතුමාත් වෘත්තීය සමිති එක්ක සාකච්ඡාවක් කැඳවලා තිබෙනවා. වෘත්තීය සමිති නායකයන් පොලිස් අත් අඩංගුවට ගත්තාම ඒක සාධාරණ හා ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවක් වෙන්නේ කොහොමද?

දෙවැනි කාරණය මෙයයි. අගමැතිතුමා කියන විධියට හමුදාව විතරයි ආරක්ෂාවට යවලා තිබෙන්නේ. නමුත් දැන් මැරයෝ දාලා ඒ මං සන්ධියේ දිගින් දිගටම පහර දෙමින් ලේ හලනවා. [බාධා කිරීම්] මේ වැඩ කරන ජනතාව,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉඩ දෙන්න, අගමැතිතුමා පිළිතුරු දෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ වැඩ කරන ජනතාව. දේශපාලන පක්ෂවලට අයත් අය නොවෙයි. තෙල් සංස්ථාවේ වැඩ කරන සේවකයන්ගේ ලේ තමයි මේ හලන්නේ. [බාධා කිරීමක්] ඔව්. අගමැතිතුමනි, ඔබතුමන්ලා මේකට මැදිහත් විය යුතු බවයි අපි නැතිවලා කියන්නේ. මේ වැඩේ නවත්වන්න. ලේ හලන එකයි, වෘත්තීය සමිති නායකයන් අත් අඩංගුවට ගැනීමයි නවත්වලා ප්‍රජාතන්ත්‍රවාදී සාකච්ඡාවක් සඳහා එම සේවකයන්ට ඇති අයිතිය ලබා දෙන්න. ඔබතුමා ඒ පිළිබඳව පිළිතුරක් ලබා දෙන්න. ඒ වාගේම ඔබතුමා කිව්වා, අධිකරණ කටයුතු ඔක්කෝම ඉවරයි කියලා. [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි,-

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොඩ්ඩක් ඉන්න කෝ. ඔබතුමා කියපු දේවල් දැන් ඔබතුමාට මතක නැහැ. මම මතක් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කිව්වා, "අධිකරණයේ කටයුතු ඉවරයි, ඒ නිසා දැන් මේ ගිවිසුම ක්‍රියාත්මක කරන්න පුළුවන්" කියලා.

අගමැතිතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ තවම විභාගයට ගන්නේ නැතිව නඩුවක් තිබෙනවා. ඒ තමයි, ආචාර්ය ලලිතසිරි ගුණරුවන් විසින් පවරන ලද නඩුව. එහෙමනම්, මේ ගිවිසුම් අත්සන් කිරීම නවත්වන්න. හම්බන්තොට වරාය විකිණීමට ඉඩ දෙන්න බැහැ. මේ නඩුව අහලා ඉවර වෙන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණයට විරුද්ධව කැබිනට් මණ්ඩලය මෙවැනි හිතුවක්කාර තීරණයක් දෙන්නේ කොහොමද? ශ්‍රේෂ්ඨාධිකරණයට ගරු කරන්න ඕනෑ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයක් තිබෙන්න ඕනෑ. නඩු දෙකෙන් එක නඩුවක් අයින් කළා. අනෙක් නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයේ තවම තිබෙනවා. අගමැතිතුමාව නොමහ යවලා; කැබිනට් මණ්ඩලය නොමහ යවලා. හම්බන්තොට වරාය විකිණීම පිළිබඳ නීතිවිරෝධී ගිවිසුමකට අගමැතිතුමාගේ ප්‍රකාශය,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් අපි ගරු අගමැතිතුමාට අවස්ථාව දෙනවා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මම මගේ ප්‍රකාශයෙන් සඳහන් කළේ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පිළිබඳවයි. ඒවා බදු දීම පිළිබඳව දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගයක් වෙමින් පවතිනවා. අපි සාකච්ඡාවේදී කිව්වේ, එම නඩු තීන්දුවෙන් අනතුරුව මෙහි ඇති නීත්‍යානුකූල තත්ත්වය තවත් පැහැදිලි වනවා කියලායි. මම හිතන්නේ, එම නඩු විභාගය වෙන්න තිබෙන්නේ සැප්තැම්බර් මාසයේයි. එම නඩුව ඉක්මනට අහලා අවසන් කරන්න අපිත් එකඟ වුණා. මම මෙතැන හම්බන්තොට වරාය සම්බන්ධ නඩුවක් ගැන කථා කළේ නැහැ. අපි කවුරුවත් අත් අඩංගුවේ තියන්න යන්නේ නැහැ. මේ සම්බන්ධව කටඋත්තර අරගෙන යවනවා. [බාධා කිරීම්] මට කථා කරන්න අවස්ථාව දෙන්න.

මීට ටික වේලාවකට ඉස්සෙල්ලා කොලොන්නාවේ තෙල් ගබඩාවේ ගේට්ටුව ළඟදී සිද්ධියක් ඇති වෙලා තිබෙනවා. සමහර අයට ඇතුළු වෙන්න ඉඩ දීලා නැති නිසා, water cannons එහෙම පාවිච්චි කරලා තිබෙනවා. මම සිද්ධිය ගැන සම්පූර්ණයෙන් විස්තර කියන්න යන්නේ නැහැ. මොකද, ඒ ගැන කටඋත්තර ගන්නා නිසා. කෙසේ හෝ එම සිද්ධිය ඇති වූ ස්ථානයෙන් පිරිසක් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. පොලීසිය කිව්වා, හඳුනා ගත්ත අය ගෙනිහිල්ලා තිබෙනවා කියලා. ඒ අයගේ ප්‍රකාශ අරගෙන ඒ අයව ඉවත් කරනවා. කාගේවත් ලේ හැළිලා නැහැ. කාටවත් ලේ - [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, පොඩ්ඩක් ඉන්න.[බාධා කිරීම්] අගමැතිතුමාට පැහැදිලි කරන්න ඉඩ දෙන්න.[බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා වාඩි වෙන්න. එතුමාට පැහැදිලි කරන්න දෙන්න. ඉන් පසුව ඔබතුමන්ලාට අවස්ථාව ලබා දෙන්නම්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මම මේ ගැන කිව්වාට පසුව හෙට මේ ගැන විවාද කරන්න පුළුවන්. ඒත් මෙහෙම කෑ ගහන්න ගියොත් අද තිබෙන වැඩ කටයුතු ටිකත් හෙට ගන්න වෙයි. ඔය දෙකම කරන්න බැහැ.

අනෙක අපි මෙතැන ලේ හළලා නැහැ. ඩෙංගු හැදුණු අයට මැරෙන්න අයිතිය දෙනවාද? ඒ අය මරන්න අයිතිය දෙනවාද? ලෙඩ වෙන අය මරන්න අයිතිය දෙනවාද? අන්න, ඒක කියන්න. මේ රටේ අද ඩෙංගු ප්‍රශ්නය තිබෙනවා. අපි ඒක විසඳන්න හදනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

දැන් ඩෙංගු ප්‍රශ්නයත් තිබෙද්දී, විශේෂයෙන්ම රෝහල්වල තිබෙන ජෙනරේටර් යන්ත්‍ර ක්‍රියාත්මක කර ගන්න බැරි නම්, වාහන ධාවනය කරන්න බැරි නම් මොකද වෙන්නේ? මෙතුමන්ලා කියන්නේ, ඩෙංගු රෝගීන් මරන්න ඕනෑ කියලාද? ඒ අයිතියද ඉල්ලන්නේ?

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි, ලජ්ජයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමන්ලා මට කියන්න, ඩෙංගු හැදුණු අය ගැන කටයුතු කරන්න අපට යුතුකමක් නැද්ද කියලා. මෙතැන කාරණා දෙකක් තිබෙනවා. තෙල් සංස්ථාවට අදාළ කාරණා දෙකම අපි කථා කරලායි තිබෙන්නේ. මේ තුන්වන එක තිබෙන්නේ, හම්බන්තොට වරායේ තෙල් ටැංකි ගැන. හම්බන්තොට වරායට තෙල් ටැංකි දමලා, ඒක වරාය සතුව තියෙන්න ඕනෑ කියලා තීරණය කරපු අය දැන් කෑ ගහලා වැඩක් නැහැ. එහෙම නම් එදා ඒක තෙල් සංස්ථාවට වෙන් කරලා දෙන්න තිබුණා. ඇමතිතුමා හෙට කියාවි, එතුමාට ගන්න තිබෙන තීරණ කුමක්ද, විශේෂයෙන්ම කොහොමද ඒ වැඩ කටයුතු කෙරෙන්නේ කියලා. ඒකට අපි අවස්ථාව දෙනවා. විශේෂයෙන්ම හෙට සහ අනිද්දා මේ සභාවේ විවාද තිබෙනවා. හෙට තිබෙනවා, මේ ගැන විවාදය. අනිද්දා විවාදය තිබෙනවා, හම්බන්තොට වරාය ගැන. මේ කිසි දෙයක් ඇති වෙන්නේ නැහැ, සම්පූර්ණයෙන්ම හම්බන්තොට වරාය තෙල් සංස්ථාවට දුන්නා නම්. අපි 2003 වසරේදී යෝජනා කරපු හැටියට හම්බන්තොට වෙන් කළේ තෙල් පිරිපහදු කිහිපයක් ඇති කරන්න විතරයි. ඒ ජැටිය පාවිච්චි කරන්නේ තෙල් පිරිපහදුවලටයි, විශේෂයෙන්ම තාප විදුලි බලාගාරවලටයි. ඒක වෙනස් කරලා ඔබතුමන්ලා වරායක් ඇති කරලා, වරායේ තෙල් ටැංකි ටික ශ්‍රී ලංකා වරාය අධිකාරියට දුන්නා නම්, එහෙම නම් ඒ අධිකාරිය සතුව තමයි අන්තිම තීරණය තිබෙන්නේ. දැන් මෙතැන කෑ ගහලා වැඩක් නැහැ. ඒ තිබෙන එක අපට ගලවන්න බැහැ. ඇමතිතුමා කියාවි, ඒකට එතුමා මොකක්ද කරන්නේ කියලා. එච්චරයි. ඉස්සර වෙලා මට කියන්න, තමුන්නාන්සේලා තෙල් ටැංකි වෙන් කළේ නැත්තේ ඇයි කියලා. ඇයි, ඒවා එදා දුන්නේ නැත්තේ? ඇයි, ඔය ටික එදා තෙල් සංස්ථාවට දුන්නේ නැත්තේ? ඇයි, කැබිනට් මණ්ඩලයෙන් ඉවත් වුණේ නැත්තේ? දැන් කෑ ගහන්න පුළුවන්. මේ එදා කැබිනට් මණ්ඩලයේ හිටපු සාමාජිකයෝ. තමුන්නාන්සේලා එකතු වෙලා කිව්වා, මේ ඔක්කෝම වරායට දමන්න කියලා, මේ ඔක්කෝම තිබෙන්නේ වරායේ කියලා. ඔබතුමන්ලා තමයි තීරණය ගත්තේ, අපි නොවෙයි. දැන් මේක කියතක් අරගෙන බෙදන්න බැහැ. එච්චරයි මම කියන්නේ. කියතක් අරගෙන වෙන් කරන්න බැහැ. කරපු අය මෙතැන කෑ ගහලා වැඩක් නැහැ.

මම මේකට අදාළ කාරණා ගැන කිව්වේ නැහැ. මම එක දෙයයි ඇහුවේ. ඔබතුමන්ලා කෑ ගහනවා. ඇයි, ඔබතුමන්ලා එහෙම නම් වෙන් කළේ නැත්තේ? ඇයි, තෙල් පිරිපහදුවට මේ කොටස කියලා වෙනම ණයක් අරගෙන, මේක අයිති වරායට කියලා වෙනම ණයක් අර ගත්තේ නැත්තේ? ඉතින් ඔය දෙකම කරන්නේ නැතුව - [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කැබිනට් මණ්ඩලයේ හිටියා. මට කියන්න, ඇයි එකඟ වුණේ නැත්තේ කියලා. මෙච්චර ණය ගන්නකොට කිව්වේ නැද්ද, තෙල් ටැංකි ටික වෙන් කරන්න කියලා? ඇයි කිව්වේ නැත්තේ, තෙල් ටැංකි ටික වෙන් කරන්න කියලා?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අගමැතිතුමනි, ලේ හළන්නේ මොකද? මැරයෝ දමලා ගහන එක වහාම නවත්වන්න. මැරයෝ දමලා ගහන එක වහාම නවත්වන්න අගමැතිතුමාට පුළුවන්. ඒක කරන්න, පළමුවෙන්ම.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ජනතාව අහන්නේ, මේක වෙන් කළේ නැත්තේ ඇයි කියලායි. තෙල් පිරිපහදුවට මේ කොටසයි, මේ කොටස වරායටයි කියලා වෙන් කළේ නැත්තේ ඇයි? දැන් කෑ ගහලා වැඩක් නැහැ නේ. මම අහන්නේ එච්චරයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වෙන කතන්දරවලින් වැඩක් නැහැ. මේවා වෙන කතන්දර. ඇයි, මෙහෙම හැසිරෙන්නේ? මිනිස්සු ලේ හළාගෙන මහ පාරේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමල් වීරවංශ මැතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද? හෙට දවස පුරාම විවාදයක් තිබෙනවා. ඒ නිසා අපි අද ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ. එහෙම නැත්නම් ඒක රටට කරන අසාධාරණයක්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හරි, ගරු කථානායකතුමනි. මම ඔබතුමා කියන කාරණය ඉත සිතින් පිළිගන්නවා. මෙන්න මේ කාරණය විතරයි මට ඔබතුමාගේ අවධානයට ලක් කරන්න තිබෙන්නේ. මේ රටේ ව්‍යක්තීය සමිති ව්‍යාපාරයට තමන්ගේ සම්පත් රැක ගන්න වැඩ වර්ජනයක් කරන්න අයිතියක් නැද්ද? ඒ වැඩ වර්ජනය කරන අයට මරික්කාර් කියලා මැරයෙකුගේ ගෝලයෝ ටික යවලා පහර දෙන්න අයිතිය තිබෙන්නේ කාටද? මරික්කාර් කියලා මැරයෙකුගේ ගෝලයෝ ටිකක් තමයි යවලා තිබෙන්නේ. ගහලා තිබෙන්නේ මරික්කාර් කියලා මැරයෙකුගේ ගෝලයෝ. තමුන්නාන්සේලා නැහැ කිව්වාට, තවම ගහනවා.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමා හම්බන්තොට තෙල් ටැංකි ගැන කථා කළා.

ගරු අගමැතිතුමනි, ඒක කියතකින් වෙන් කරන්න දෙයක් නැහැ, තෙල් ටැංකි ටික තිබෙන්නේ පර්යන්තයේ එහා පැත්තේ. වතුරෙන් වෙන් වෙලායි තිබෙන්නේ. ඔබතුමාට ගිවිසුම්ගත කරලා ඒක විකුණා ගන්න ඕනෑ නම්, ඒක වෙනම කථාවක්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඇයි ඒක තෙල් සංස්ථාවට භාර දුන්නේ නැත්තේ? ඇයි, ඒවා එකට දමලා දැන් කෑ ගහන්නේ?

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමනි, සේවකයින් ඉල්ලුවේ සාකච්ඡාවක්. ගරු කථානායකතුමනි, සාකච්ඡාවෙන් විසඳා ගන්නේ නැතුව මැරයෝ දමලා ගහනවා. ගරු අගමැතිතුමනි, මැරයෝ දමලා ගහන එක නම් ඔබතුමාගේ ප්‍රතිපත්තිය, එහෙම නම් ගිය ආණ්ඩුවට බැණලා වැඩක් වෙන්නේ නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
China Exim Bank එකෙන් ණය අරගෙන ගියේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වෙන කවුරුවත් නොවෙයි.

ගරු නාමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa)
ගරු අගමැතිතුමනි, ඔබතුමන්ලා මේ වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කළා නම් ඔය ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි රජයක් විධියට මේ සුළු වෘත්තීය සමිතියක් වෙනුවෙන් නොවෙයි, රටේ බහුතර ජනතාව වෙනුවෙනුයි කටයුතු කරන්නේ.

ඒ නිසා රටේ ජනතාව වෙනුවෙන් මේ රජය ඉස්සරහට ඇවිල්ලා ගන්න ඕනෑ තීන්දු තීරණ ගන්නවා. [බාධා කිරීම්] ඒ නිසා කාටවත් මේ ආණ්ඩුව නටවන්න බැහැ. [සෝෂා කිරීම්] එක-එක්කෙනාට ඕනෑ විධියට ආණ්ඩුව හොල්ලන්නත් බැහැ; වටවන්නත් බැහැ. [බාධා කිරීම්] කවුරුහරි හිතාගෙන ඉන්නවා නම් මේකෙන් වටවන්න, ඒ ගැන හිතන්න එපා. ඔය වීරවංශලා මේ රට ගිනි තිබ්බා. [බාධා කිරීම්] අදත් කරන්නේ ඒකයි, හෙටත් කරන්නේ ඒකයි. [සෝෂා කිරීම්]

[මේ අවස්ථාවේදී මන්ත්‍රීවරු පිරිසක් සිය අසුන්වලින් නැඟී සිටියහ.]
[இச்சந்தர்ப்பத்தில் உறுப்பினர்களில் பலர் எழுந்து நின்றனர்]
[At this stage, some Members rose from their seats.]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අශෝක් අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
චීනයට සින්නක්කර දුන්නේ, එක ඉඩමක් විතරයි ලු. එය මේ බන්දුල ගුණවර්ධන කියනවා. රාජපක්ෂ ආණ්ඩුව චීනයට සින්නක්කර දුන්නේ එක ඉඩමක් විතරලු. ඒ ගොල්ලන් සින්නක්කර දීලා, දැන් අපි බදු දෙන්න යනකොට කෑ ගහනවා. එක ඉඩමක් විතරක් දුන්නාය කියලා පොදුවේ පිළිගෙන තිබෙනවා. බන්දුල ගුණවර්ධන මැතිතුමා කියනවා, චීනයට සින්නක්කර දුන්නේ එක ඉඩමක් විතර ලු. චීනයට ඉඩම් සින්නක්කර දුන්නාය කියලා මෙන්න පිළිගෙන. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අපි දවසේ ප්‍රධාන කටයුතුවලට යොමු වෙමු. හෙට දවස පුරාම වාද කරන්න පුළුවන්.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විජිත හේරත් මැතිතුමා. [සෝෂා කිරීම්]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු අගමැතිතුමනි, මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් විසිදෙනෙකු අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ අය ගිහින් තිබෙන්නේ ගේට්ටුව අවහිර කරන්න නොවෙයි. ගරු දුමින්ද දිසානායක ඇමතිතුමා එක්ක සාකච්ඡාවට ගිහින් එනකොට තමයි අත් අඩංගුවට අරගෙන තිබෙන්නේ. [බාධා කිරීම්] ඒ නිසා ඔබතුමා මේ විසිදෙනා නිදහස් කිරීමට වහාම කටයුතු කරන්න. [බාධා කිරීම්] රතුපස්වල ඇති වුණු තත්ත්වයත්, කටුනායක ඇති වුණු තත්ත්වයත් එතැන නැවත ඇති කරන්න එපා. [බාධා කිරීම්] මේ විසිදෙනා නිදහස් කිරීමට වහාම කටයුතු කරන්න. ඒක තමයි හදිසි ප්‍රශ්නය. [සෝෂා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
කවුරුවත් තියා ගන්නේ නැහැ. [බාධා කිරීම්] කට උත්තර සටහන් කරගෙන පිට කරනවා. සිද්ධිය ගැන හෙට කථා කරන්න.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

මේ, හැම පැත්තෙන්ම මට ලැබුණු කරුණු විතරයි. [බාධා කිරීම්] මන්ත්‍රීතුමනි, මොකක්ද වුණේ කියලා හෙට කථා කරන්න පුළුවන්. මම එකක් කියන්න කැමැතියි. හැම එක්කෙනාගෙන්ම කට උත්තර අරගෙන පිට කරනවා. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ? මෙතැනින් මෙම කටයුතු අවසන් කරමු. මේක අපි අද දවසේ වැඩ කටයුතුවලට කරන අසාධාරණයක්. [බාධා කිරීම්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ වේලාවේ බොහොම පැහැදිලිව තගාලා ඇවිල්ලා ගහනවා; පහර දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අගමැතිතුමා ඒ ගැන බලන්නම් කිව්වා නේ.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
අගමැතිතුමාට පුළුවන්, රට වෙනුවෙන් මේක නතර කරන්න. ලිච්චවි ක්‍රමය ගහන එක නොවෙයි නේ. [බාධා කිරීම්] මිනිස්සු දම්මලා ගහන්න එපා. ගෝනවල සුනිල්ලා වාගේ මිනිස්සු ගෙනැල්ලා දැන් ගස්සන්නේ. [බාධා කිරීම්] මරික්කාර් ගස්සන්නේ; තගාලා ගස්සන්නේ. එපා, රටට මෙහෙම කරන්න. [බාධා කිරීම්] මේක තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය; පොලිස් රාජ්‍යය.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි පළමුවැනි වතාවට මේ ගැන ප්‍රකාශයක් කළා. මෙතෙක් කල් රාජපක්ෂ ආණ්ඩුවෙන් කළේ නැහැ. හෙට වාද කරන්න. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, හෙට වාද කරමු. [ඝෝෂා කිරීම්] අපි දැන් ප්‍රධාන වැඩ කටයුතුවලට යමු. දවස පුරාම - [ඝෝෂා කිරීම්] නැත්නම් අසාධාරණයි. ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා - [ඝෝෂා කිරීම්] අද බාධා කළා. හෙට දවසේදී - [ඝෝෂා කිරීම්] මම මේ බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ, - [ඝෝෂා කිරීම්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගජදීර මැතිතුමා, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ? [ඝෝෂා කිරීම්] ඔබතුමාට මොකක්ද අහන්න තිබෙන්නේ? අපි ප්‍රධාන වැඩ කටයුතුවලට යොමු වෙන්න ඕනෑ. ඔබතුමාට අවස්ථාව දුන්නානේ. අගමැතිතුමා ඒකට අවශ්‍ය පියවර ගනියි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මට කථා කරන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි දවසේ වැඩ කටයුතුවලට යොමු වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි. මේක අවසාන අවස්ථාව.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You go ahead and speak. මම අහගෙන තමයි ඉන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු කථානායකතුමනි, දවසේ වැඩ කටයුතුවලට යන්න අපි ලැහැස්තියි; අපි සූදානම්. අපි ඒකට බාධා කරන්නේ නැහැ. නමුත් අත්‍යවශ්‍ය සේවා යොදවා වැඩ කරන පන්තිය මර්දනය කිරීමේ පළමු පියවර විධියට - [ඝෝෂා කිරීම්] මේ කරන මිලේච්ඡ ප්‍රහාරය වහාම නවත්වනවාද, නැද්ද කියන එක ගැන ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කරන්න ඕනෑ. [ඝෝෂා කිරීම්] ප්‍රකාශ කරලා මදි. [ඝෝෂා කිරීම්] ප්‍රකාශ කරලා මදි. ඒක නවත්වන්න වැඩ කටයුතු පටන් ගන්න. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි දවසේ වැඩ කටයුතුවලට යොමු වෙමු. [ඝෝෂා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අපි එහෙම නම් ප්‍රධාන වැඩ කටයුතු ආරම්භ කරමු. මම රොෂේන් චානක ගැන කථා කරන්නේ නැහැ. අපි ප්‍රධාන වැඩ කටයුතු පටන් ගනිමු. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු යටතේ යෝජනා අංක එකේ සිට හත දක්වා - [ඝෝෂා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එකේ සිට හය දක්වා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊට කලින් පනත් කෙටුම්පත් පිළිගැන්වීම තිබෙනවා. [ඝෝෂා කිරීම්]

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත
மாகாண சபைத் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம்
PROVINCIAL COUNCILS ELECTIONS (AMENDMENT) BILL

"1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවට ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා විසිනි.

2017 අගෝස්තු 08වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයි ද, එය මුද්‍රණය කළ යුතුයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයි ද නියෝග කරන ලදී.

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் சார்பில் மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2017 ஆகஸ்ட் 08, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக்குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண் டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Lakshman Kiriella, on behalf of the Minister of Provincial Councils and Local Government; to be read a Second time upon Tuesday, 08th August, 2017 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමා. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media , I move Item I. We will pass it. -[*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දවස පුරා මේ නියමයන්, යෝජනාව සහ පනත් කෙටුම්පත සාකච්ඡා කිරීමට තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්න කැමැතිද? මම මේ තුන්වැනි වතාවටයි ඉල්ලන්නේ.[බාධා කිරීම්] මේක වැදගත් පනත් කෙටුම්පතක්. අනෙක් ප්‍රශ්නය හෙට දවස පුරාම විවාද කරන්න පුළුවන්. ඒ නිසා මේ වැඩ කටයුතු කරන්න ඉඩ දෙන්න. එහෙම නැත්නම් වෙනත් විධියකට රටේ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න වෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසාන වතාවට මම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාට කථා කරන්න අවස්ථාව දෙන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමා ඊයේ පැහැදිලිව නියෝගයක් දුන්නා, මා ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රකාශයට අද පිළිතුරු දෙන්නය කියා. අද ගරු ඇමතිතුමා ඇවිල්ලා ඉන්නවා. ඒ නිසා ඒකට පිළිතුරු නොදී වෙනත් කටයුත්තකට යන්න බැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට පිළිතුරු ලබා දෙන්න කියන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ සභානායකතුමා කිසිම දෙයක් දන්නේ නැහැ. [බාධා කිරීම්] කිසිම දෙයක් දන්නේ නැහැ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වැඩ කරන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. ඔබතුමා අද ඒකට පිළිතුරු දෙන්නේ නැද්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පිළිතුරු දෙන්න වාතාවරණයක් තියෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හෙට මේ ප්‍රශ්නය වාද විවාද කරමු. හෙට ඒක ඉදිරිපත් කරන්න. මෙය ජාතික වැදගත්කමකින් යුත් පනත් කෙටුම්පතක් නිසා මම තමුන්නාන්සේලාට නැවත වරක් ආයාචනය කරනවා, මෙයට සහාය දෙන්නය කියා. නැත්නම් මේක මේ දේශයට කරන විරෝධතාවක් වෙනවා. මේක වාද විවාද කරන්න කැමැතිද? නැත්නම් මේක ගෙන යන්න බැහැ. මම නැවත වරක් අවස්ථාවක් දෙනවා, මේක වාද කරන්න. කැමැති නම් වාද කරන්න පුළුවන්. එහෙම නැත්නම් තමුන්නාන්සේලා - [බාධා කිරීම්]

විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත: නියමය
விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
SPECIAL COMMODITY LEVY ACT: ORDER

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Section 5 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2012/16 of 28th March 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No.2012/17 of 28th March 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2012/52 of 31st March 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2018/2 of 08th May 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Order made by the Minister of Finance under Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007, relating to Special Commodity Levy and published in the Gazette Extraordinary No. 2019/21 of 19th May 2017, which was presented on 20.06.2017, be approved.

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රේගු ආඥාපනත: යෝජනාව
சுங்கக் கட்டளைச் சட்டம் : தீர்மானம்
CUSTOMS ORDINANCE: RESOLUTION

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Resolution under Section 10 of the Customs Ordinance (Chapter 235) relating to Import Duties, which was presented on 20.06.2017, be approved.
(Gazette Extraordinary No. 2006/42 of 16th February 2017)
(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்
NATION BUILDING TAX (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, " පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." --[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Lakshman Kiriella]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. SPEAKER in the Chair.]

1වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (2009 අංක 9 දරන පනතේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.)
வாசகம் 2.- (2009ஆம் ஆண்டின் 9ஆம் இலக்கச் சட்டத்துக்கான முதலாம் அட்டவணையைத் திருத்துதல்.)
CLAUSE 2.- (*Amendment of the First Schedule to the Act, No. 9 of 2009.*)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) " 2 වන පිටුවේ, 15 සිට 20 දක්වා වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'(ඇ) (xvi෴) අයිතමයේ "එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ්" යන වචන වෙනුවට, පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

'2017 අගෝස්තු මස 1වන දිනට පෙරාතුව වූ යම්, කාල පරිච්ඡේදයක් සඳහා එයාර් ලංකා කේටරින් සර්විසස් ලිමිටඩ් '" ;

(2) " 2 වන පිටුවේ, 32වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'මෙින් 2017 අගෝස්තු මස 1වන දිනට පෙරාතුව' ";

(3) "3වන පිටුවේ, 15 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'විදුලිබල සැපයීම' ":

(4) "3වන පිටුවේ, 22වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'විදුලිබල සැපයුම' ";

(5) " 4වන පිටුවේ, 7 වන සහ 8 වන පේළි ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'එදිනට පසු නමුත් 2017 අගෝස්තු මස 1වන දිනට පෙරාතුව ඉදිකිරීම්' ";

(6) " 4වන පිටුවේ, 12වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඇ) 2017 අගෝස්තු මස 1වන දින හෝ' ";

(7) "4වන පිටුවේ, 22 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (අ) 2017 අගෝස්තු මස 1වන දිනට පෙර' ";

(8) "4වන පිටුවේ, 24වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (ආ) 2017 අගෝස්තු මස 1 වන දින හෝ' ";

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(9) "5 වන පිටුවේ, 17 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'අගෝස්තු මස 1වන දිනට පෙරාතුව' ";

(10) "5 වන පිටුවේ, 21වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(xxxviii) 2017 අගෝස්තු මස 1වන දිනට පෙර' ";

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සහ සම්මත විය.

තිරුත්තංකල් විටුක්කප්පට්ටු එත්රුක්කොළ්ළප්පට්ටතු.
Amendments put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 2, as amended, ordered to stand part of the Bill.

3 සහ 4 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

3ආම්, 4ආම් වාසකංකළ් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clauses 3 and 4 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

චට්ටමාකු වාසකමුම් තලෛප්පුම් චට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.
චට්ටමූලම් තිරුත්තංකළුටන් අරික්කෛ චෙය්යප්පට්ටතු.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් තුන් වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

විනා විටුක්කප්පට්ටු, ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
අතන්පටි, චට්ටමූලම් තිරුත්තප්පට්ටවාරු මූන්රාම්මුරෛයාක මතිප්පිටප්පට්ටු නිරෛවේට්රප්පට්ටතු.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ඔත්තිවෛප්පු
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, " පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒත්රුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 3.35ට, 2017 ජූලි 07වන දින සහා සම්මතිය අනුව, 2017 ජූලි 27 වන බ්‍රහස්පතින්දා පූ.භා.10.30වන තෙක් කල් ගියේය.

අතන්පටි පි.ප. 3.35 මණික්කු පාරාළුමන්රම්, අතනුටෛ 2017 යූලෛ 07ආන් තිකතිය තීර්මානත්තුක්කිණංක, 2017 යූලෛ 27, වියාළක්කිළමෛ මු.ප. 10.30 මණිවරෛ ඔත්තිවෛක්කප්පට්ටතු.

Parliament adjourned accordingly at 3.35 p.m. until 10.30 a.m. on Thursday, 27th July, 2017, pursuant to the Resolution of Parliament of 07th July 2017.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

253 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 253 - இல. 7
Volume 253 - No. 7

2017 ජූලි 27වන බ්‍රහස්පතින්දා
2017 யூலை 27, வியாழக்கிழமை
Thursday, 27th July, 2017

පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය යන සංගම්වල විධායක සභා රැස්වීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

අත්‍යවශ්‍ය මහජන සේවා පනත:

යෝජනාව - විවාදය කල් තබන ලදී

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள் :

பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம், அனைத்துப் பாராளுமன்ற ஒன்றியம், 'சார்க்' பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் ஆகியவற்றின் நிறைவேற்றுக் குழுக் கூட்டம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:

தீர்மானம் - விவாதம் ஒத்திவைக்கப்பட்டது

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Executive Committee Meeting of Commonwealth Parliamentary Association, Inter-Parliamentary Union and SAARC Parliamentarians' Association

ORAL ANSWERS TO QUESTIONS

ESSENTIAL PUBLIC SERVICES ACT:

Resolution –Debate Adjourned

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2017 ජූලි 27වන බ්‍රහස්පතින්දා
2017 யூலை 27, வியாழக்கிழமை
Thursday, 27th July, 2017

පූ.භා. 10.30ට පාර්ලිමේන්තුව රැස් විය.
නියෝජ්‍ය කථානායකතුමා [ගරු තිලංග සුමතිපාල මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.30 மணிக்குக் கூடியது.

பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு திலங்க சுமதிபால] தலைமை வகித்தார்கள்.

The Parliament met at 10.30 a.m.,

MR. DEPUTY SPEAKER [THE HON. THILANGA SUMATHIPALA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය යන සංගම්වල විධායක සභා රැස්වීම

பொதுநலவாய பாராளுமன்றச் சங்கம், அனைத்துப் பாராளுமன்ற ஒன்றியம் மற்றும் 'சார்க்' பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் ஆகியவற்றின் நிறைவேற்றுக் குழுக் கூட்டம்

EXECUTIVE COMMITTEE MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION, INTER-PARLIAMENTARY UNION AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)

අද දින පස් වරු 3.30ට පැවැත්වීමට නියමිතව තිබූ පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල විධායක සභා රැස්වීම අද දින පස් වරු 3.00ට අංක 8 දරන කාරක සභා කාමරයේදී පැවැත්වෙන අතර, එයට සහභාගි වන ලෙස ගරු කාරක සභික මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම 2016 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කටයුතු අමාත්‍ය)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයේ ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික කටයුතු අමාත්‍ය අවර්ගයේ)
(The Hon. Deputy Speaker)
ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා - පැමිණ නැත.

ගරු තලතා අතුකෝරල මහත්මිය (විදේශ රැකියා අමාත්‍යතුමිය)
(මාණ්ඩලික (திருமதி) தலதா அத்துகோரல - வெளிநாட்டுத் தொழில்வாய்ப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Foreign Employment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩවලව, ආර්.ඊ.ටී හන්දිය, අංක ටී. 6 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එච්.ජේ.පී. විමලසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික කටයුතු අමාත්‍ය අවර්ගයේ)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා - පැමිණ නැත.

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெதஆரச்சி - கடற்றொழில் மற்றும் நீரக வளமூல அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තංගල්ල, ගොයම්බොක්ක, "හංසගිරි"යන ලිපිනයෙහි පදිංචි එස්.සී.කේ. වීරවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නාවලපිටිය, හල්ගොල්ල 01, අංක 06 දරන ස්ථානයෙහි පදිංචි බී.එම්.කේ.බී. බස්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(மாண்புமிகு ஏ.ஏ. விஜேதுங்க)
(The Hon. A. A. Wijethunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර, බටුගෙදර පරණ පාර, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි එල්.එච්.එල්. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Hon. Deputy Speaker, I present a petition from Mr. M.H. Athambawa of Al Murshid Maha Vidyalaya, Silmiyapura, Badulla.

ගරු මොහොමඩ් නවවි මහතා
(மாண்புமிகு முஹமட் நவவி)
(The Hon. Mohamed Navavi)
Hon. Deputy Speaker, I present -

(1) a petition from Mr. A.M.A. Latheef of Alhira Muslim College Kottaramulla; and

(2) a petition from Mr. M.I.M. Siddeen of No. 31/A, Madawakkulama, Andigama.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික කටයුතු අමාත්‍ය අවර්ගයේ)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 1 -1046/'16- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ: ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා බලප්‍රදේශය

அரச கட்டிடங்களில் இயங்கும் அமைச்சுக்கள்: ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே மாநகர சபை ஆளுகைப் பிரதேசம்

MINISTRIES FUNCTIONING IN STATE-OWNED BUILDINGS: SRI JAYEWARDENEPURA KOTTE MUNICIPAL LIMITS

1051/'16

2. ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ ගොඩනැඟිලිවල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන රජයේ ගොඩනැඟිලි කවරේද;

(iii) බදු කුලී ගෙවන හා නොගෙවන අමාත්‍යාංශ, එක් එක් ගොඩනැඟිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) බදු ගෙවන අමාත්‍යාංශ, එක් වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු කුලිය හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැඟිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගොඩනැඟිලිවල රථගාල් සඳහා ගෙවීමක් සිදු කරන්නේද;

(vi) එසේ නම්, එම මුදල කොපමණද;

(vii) රථ සංඛ්‍යාව අනුව සිදු කරන එම ගෙවීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැඟිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යන ගොඩනැඟිලි කවරේද;

(iii) එම ගොඩනැඟිලිවල වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු මුදල හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැඟිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ගොඩනැඟිලිවල රථගාල් සඳහා ගෙවීමක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே மாநகரசபை ஆளுகை பிரதேசத்தில் உள்ள அரசாங்கக் கட்டிடங்களில் பேணிவரப்படுகின்ற அமைச்சுக்கள் யாவை என்பதையும்;

(ii) இவ்வமைச்சுக்கள் பேணிவரப்படும் அரசாங்க கட்டிடங்கள் யாவை என்பதையும்;

(iii) குத்தகைக் கூலி செலுத்தும் மற்றும் செலுத்தாத அமைச்சுக்கள், ஒவ்வொரு கட்டிடத்திற்கு அமைவாக தனித்தனியே யாவை என்பதையும்;

(iv) குத்தகை செலுத்தும் அமைச்சுக்கள், ஒரு சதுர அடிக்குச் செலுத்தும் குத்தகைக் கூலி மற்றும் சேவைக் கட்டணம், ஒவ்வொரு கட்டிடத்திற்கு அமைவாக தனித்தனியே எவ்வளவு என்பதையும்;

(v) இந்தக் கட்டடங்களில் வாகனங்களை நிறுத்தி வைப்பதற்காக கொடுப்பனவு செய்யப்படு கின்றதா என்பதையும்;

(vi) ஆமெனின், இத்தொகை யாதென்பதையும்;

(vii) வாகனங்களின் எண்ணிக்கைக்கு அமைவாக மேற்கொள்ளப்படும் கொடுப்பனவு முறையியல் யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே மாநகர சபை ஆளுகைப் பிரதேசத்தில் உள்ள தனியார் கட்டிடங்களில் பேணிவரப்படும் அமைச்சுக்கள் யாவை என்பதையும்;

(ii) இவ்வமைச்சுக்கள் பேணிவரப்படும் கட்டிடங்கள் யாவை என்பதையும்;

(iii) இக்கட்டிடங்களில் ஒரு சதுர அடிக்கு செலுத்தும் குத்தகைத் தொகை மற்றும் சேவைக் கட்டணம், ஒவ்வொரு கட்டிடத்திற்கு அமைவாக தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iv) இக்கட்டிடங்களில் வாகனங்களை நிறுத்தி வைப்பதற்காக உள்ள இடப்பரப்புக்கு கொடுப்பனவு செய்யப்படுகின்றதா என்பதை யும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he state -

(i) the Ministries that run their offices within the limits of Sri Jayewardenepura Kotte Municipal Council area;

(ii) the State-owned buildings, in which aforesaid offices of the Ministries have been located;

(iii) separately, in terms of each building, the Ministries that pay and do not pay lease;

(iv) separately, in terms of each building, amounts of lease and service charges paid per one square foot by aforesaid Ministries;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(v) whether a fee is charged for the parking spaces of these buildings;

(vi) if so, the aforesaid amount; and

(vii) the method of payment calculated in terms of the number of vehicles?

(b) Will he inform this House -

(i) the Ministries that run their offices in private buildings within the limits of Sri Jayewardenepura Kotte Municipal Council area;

(ii) the buildings in which aforesaid offices of the Ministries have been located;

(iii) separately, in terms of each building, of the amounts of lease and service charges paid per one square foot of aforesaid buildings; and

(iv) whether a fee is charged for the parking spaces of these buildings?

(c) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) අමාත්‍යාංශ කිසිවක් නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(vi) පැන නොනඟී.

(vii) පැන නොනඟී.

(ආ) (i) ඇමුණුමෙහි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරනවා.

(ii) ඇමුණුමෙහි සඳහන් වේ.

(iii) ඇමුණුමෙහි සඳහන් වේ.

(iv) රථගාල් සඳහා ගෙවීමක් සිදු කරනු නොලැබේ.

(ඇ) පැන නොනඟී.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

ඇමුණුම

අනු අංකය	අමාත්‍යාංශයේ නම	එම අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන පෞද්ගලික ගොඩනැඟිලි	බදු කුලී ගෙවන්නේ ද යන වග	ගෙවනු ලබන ගාස්තු (වර්ග අඩියක් සඳහා)	
				බදු මුදල (රුපියල්)	සේවා ගාස්තු (රුපියල්)
01	ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය	රාජගිරියේ පිහිටි නො. 1090 සිනෝ ලංකා ගොඩනැඟිල්ල	ගෙවනු ලැබේ	160.00	30.00
02	කෘෂිකර්ම අමාත්‍යාංශය	රාජගිරියේ පිහිටි නො. 288 ඩී.පී.ජේ. ගොඩනැඟිල්ල	ගෙවනු ලැබේ	167.50	60.00
03	ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය	රාජගිරිය, බුත්ගමුව පාර පිහිටි නො.40 ගොඩනැඟිල්ල	ගෙවනු ලැබේ	79.65	-
04	ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය	නාවල නාරාහේන්පිට පාරේ පිහිටි අංක 34 ගොඩනැඟිල්ල	ගෙවනු ලැබේ	56.54	-

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු රාජ්‍ය අමාත්‍යතුමාට ස්තිතුවන්ත වෙනවා, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන්. පිළිතුරට අදාළ ඇමුණුම සභාගත කරපු නිසා එම ඇමුණුමේ සඳහන් තොරතුරු නැතිව හරියාකාරව අතුරු ප්‍රශ්න අහන්න මට අමාරුයි. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, කෙසේ නමුත් මා ඔබතුමාගෙන් පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. සාමාන්‍යයෙන් කොළඹ නගරයේ පෞද්ගලික ගොඩනැඟිල්ලක් බදු ගන්නවාට වඩා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ හෝ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ගොඩනැඟිලි බදු ගැනීම වාසිදායකයි.

ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය තමයි ප්‍රතිපත්තිමය තීන්දු ගන්නා අමාත්‍යාංශය. කොළඹ නගරයේ පෞද්ගලික ගොඩනැඟිලිවල තිබෙන සියලුම අමාත්‍යාංශ බත්තරමුල්ල, කඩුවෙල හෝ කෝට්ටේ ප්‍රදේශයේ තිබෙන රජයේ ගොඩනැඟිලිවලට ගේන්න අමාරුයි කියන එකත් අපි දන්නවා. ඒවා පෞද්ගලික ගොඩනැඟිලිවලට ගෙන ඒමේ වාසිදායක තත්ත්වයක් තිබෙනවා.

පසුගිය කාලයේ බොහෝ දෙනෙක් "ජයසිංහ ටවර්ස්" එකට ගෙනා අමාත්‍යාංශය ගැන කථා කළා. නමුත් මට තිබෙන තොරතුරු අනුව ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ -WTC එකේ- වර්ග අඩියකට වඩා රුපියල් 100ක් අඩුයි, "ජයසිංහ ටවර්ස්" එකේ වර්ග අඩියක්. එම නිසා ජයවර්ධනපුර අවට අමාත්‍යාංශ සහ රජයේ ප්‍රධාන ආයතන ස්ථාපනය කරනවා නම් රජයේ ගොඩනැඟිලි හදාගන්නාකම් හෝ කොළඹ මේ ආයතන පවත්වාගෙන ඉන්නේ ඇයි, මේවා ජයවර්ධනපුර හෝ ඒ අවට ප්‍රදේශයට මේවා ගෙන ඒම වාසිදායක නැද්ද?

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැනටමත් ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තමයි අමාත්‍යාංශ ක්‍රම ක්‍රමයෙන් මේ

ප්‍රදේශවලට අරගෙන එන්නේ. නමුත් සමහර වෙලාවට කෝටිවෙ බල ප්‍රදේශයෙන් අපේ අමාත්‍යාංශවලට අවශ්‍ය භූමි ප්‍රමාණය, ඉඩකඩ සහ පහසුකම් සහිතව පෞද්ගලික ගොඩනැඟිල්ලක්වත් සොයා ගන්නට අමාරු තත්ත්වයන් තිබෙනවා. මොකද, පරීක්ෂා කර බලා වාර්තා අනුව තමයි ගොඩනැඟිලි තෝරන්නේ. ඒ අනුව සමහර වේලාවට ඒ අපහසුතාව තිබෙනවා. නමුත් එදා මම මතක් කළා වාගේ, අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ සංකල්පය අනුව අපි මේ වන විට අමාත්‍යාංශ විශාල ප්‍රමාණයක් මේ අවට ස්ථාපිත කරලා තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ යුගයේ ජනාධිපති මන්දිරය හදන්නට වෙන් කළ ඉඩම තිබෙනවා.

ඒ වාගේම සමහර අමාත්‍යාංශවලට වෙන් කරපු ඉඩම්වල හදලා තිබෙන්නේ තට්ටු දෙකක්, තට්ටු තුනක්, තට්ටු හතරක් තිබෙන ගොඩනැඟිලි බව අපි දන්නවා. උදාහරණ විධියට දැනට කෘෂිකර්ම අමාත්‍යාංශය පවතින ගොඩනැඟිල්ල, දැනට ඉඩම් අමාත්‍යාංශය පවතින ගොඩනැඟිල්ල, දැනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පවතින ගොඩනැඟිල්ල ගන්න පුළුවන්. මේ ගොඩනැඟිලිවල උපරිම තිබෙන්නේ තට්ටු දෙකයි, තුනයි, හතරයි. හැබැයි, මේ භූමිය පාවිච්චි කරලා තට්ටු 10කට වැඩි ගොඩනැඟිලි සෑදීමට කිසිම බාධාවක් නැහැ; කිසිම ගැටලුවක් නැහැ. මෙතැන සිදුවී තිබෙන්නේ එම ඉඩමෙන් නියම ප්‍රයෝජන නොගැනීමයි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගොඩනැඟිලි හදලා තිබෙන්නේ දැනට අවුරුදු 20කට, 30කට ඉස්සෙල්ලා. ඒ කාලයේ අවශ්‍යතාව අනුව සහ ඉදිරි දැක්ම අනුවයි එම ගොඩනැඟිලි හදලා තිබෙන්නේ. නමුත් පසු කාලීනව එම අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලය විශාල වීම හේතුවෙන් සමහර වේලාවට අපහසුතා මතු වෙන්න ඇති. අපි එම ස්ථානයේම තවත් ගොඩනැඟිල්ලක් හදනවා නම් තිබෙන ගොඩනැඟිල්ල විනාශ කරන්න ඕනෑ. හොඳ තක්සේරුවක් කරලා තමයි එම තීන්දුවට යනවා නම් යා යුත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 4 - 1116/'16-(1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා කියනවා මේ ප්‍රශ්නයට එතුමාටම පිළිතුර ලබා දෙන්න අවශ්‍යයි කියලා. ඒ නිසා එතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 5 - 1171/'16-(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

විදුලිය ලබා දී ඇති නිවාස : කිලිනොච්චිය දිස්ත්‍රික්කය
மின்சாரம் வழங்கப்பட்ட வீடுகள் : கிளிநொச்சி மாவட்டம்
HOUSES PROVIDED WITH ELECTRICITY: KILINOCHCHI DISTRICT

1193/'16

6. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர்.எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 1983 වර්ෂය වනවිට කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் கிளிநொச்சி மாவட்டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென் பதையும்;

(iii) 1984 முதல் 2009ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென் பதையும்;

(iv) 2009ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) the number of houses in the Kilinochchi District that had been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) the total number of houses which have been provided with electricity supply by now;

(iii) the amount of money allocated for the supply of electricity from year 1984 to 2009 on per year basis;

(iv) the number of houses that had been provided with electricity supply up to year 2015 after the end of war situation in year 2009 on per year basis; and

(v) the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதி அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Deputy Minister of Power and Renewable Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) කිසිවක් නැත. බෙදාහැරීම සිදු කරනු ලැබුවේ පළාත් පාලන ආයතනයෙනි.

(ii) 2017 මැයි 31 දිනට විදුලි සම්බන්ධතා 32,458ක් සපයා ඇත.

2015 වර්ෂයේදී අපි බලයට පත් වුණාට පස්සේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරිවරු මඟින් සිදුකරන ලද සංගණනය අනුව කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාවන් ලබාගෙන නොමැති නිවාස විශාල ප්‍රමාණයක් තිබෙන බව හඳුනා ගත්තා. ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාවන් අපි හඳුනා ගත්තා. ඒවා තමයි, නිවාස wiring කරලා නැතිකම; සමහර අතුරු මාර්ගවලට විදුලි කණු සවි කරගැනීමට මුදල් නොමැතිකම; සමහරුන්ට සබඳතා වයරයට ගෙවීමට නොහැකිකම. මේ ඔක්කෝම සලකා මෙම දිස්ත්‍රික්කයටත්, මුළු රටටමත් බලපාන ආකාරයට "රටම එළියයි - අඳුර දුරලයි" ජාතික විදුලි සත්කාරය ණය යෝජනා ක්‍රමය අපි හඳුන්වලා දුන්නා. ඒ අනුව රුපියල් 45,000ක උපරිමයකට යටත්ව එක් එක් අයදුම්කරුට සහන ණය මුදලක් ලබා දුන්නා, අවුරුදු හයකින් මාසික වාරික විධියට ගෙවීමට හැකි ආකාරයට.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ ප්‍රශ්නයේ කිලිනොච්චි දිස්ත්‍රික්කය සම්බන්ධව අසා ඇති (අ) (i) කොටසටද ඔබතුමා ඔය උත්තර දෙන්නේ?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මම පිළිතුරු දෙන්නේ ඔබතුමා අසන ලද ප්‍රශ්නයේ (අ) (ii) කොටසට, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

(අ) (ii) කොටසින් අහන්නේ, මේ වන විට විදුලිය ලබාදී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද කියලා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔව්. ඒකට උත්තරය 32,458යි. ඒ 32,458 හැදුණු විධියයි මම මේ කියන්නේ.

අපි මහ ඇරලා යන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අප විස්තරාත්මකව උත්තරය දෙනවා. ඔබතුමන්ලා ඇහුවාම හොඳටම කියන්න එපා යැ. ඔබතුමා ඒක අහගෙන ඉන්න ඕනෑ.

මේ ක්‍රමයට අපි මුළු ලංකාවේම ගෙවල් 262,000ට විදුලිය ලබා දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

(iii) 1984 වර්ෂයේ සිට 2009 දක්වා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල් පහත සඳහන් වේ.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු. මිලියන)
1984	-
1985	-
1986	-
1987	-
1988	-
1989	13.30
1990	36.58
1991	8.06
1992	2.55
1993	-
1994	-
1995	-
1996	-
1997	-
1998	-
1999	-
2000	-
2001	-
2002	-
2003	-
2004	40.90
2005	23.67
2006	5.00
2007	-
2008	-
2009	110.49

(iv) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් ලබාදුන් නිවාස සංඛ්‍යාව පහත පරිදි වේ. 2009 සිට 2015 දක්වා අපි ඉතා විශාල ආයෝජනයක් කර තිබෙනවා.

වර්ෂය	අදාළ වර්ෂය තුළදී ලබා දුන් නව සබඳතා සංඛ්‍යාව	වර්ෂය අවසාන වන විට විදුලිය පරිභෝජනය කරනු ලබන සම්පූර්ණ නිවාස සංඛ්‍යාව
2009.01.01 - 2009.12.31	5	5
2010.01.01 - 2010.12.31	696	701
2011.01.01 - 2011.12.31	1,424	2,125
2012.01.01 - 2012.12.31	2,798	4,923
2013.01.01 - 2013.12.31	8,624	13,547
2014.01.01 - 2014.12.31	4,483	18,030
2015.01.01 - 2015.12.31	7,900	25,930

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසා තිබෙන කාලය තුළ, ඒ කියන්නේ 2009 සිට 2015 දක්වා නිවාස 25,930කට අපි විදුලිය සබඳතා ලබා දී තිබෙනවා. 2016 සහ 2017 වසරවල තවත් නිවාස 6520ක් සඳහා සබඳතා ලබා දී තිබෙනවා.

(v) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල පහත පරිදි වේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර හැටියට සමස්ත මුදල සඳහන් කරන්න පුළුවන්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එක් එක් වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල වෙන වෙනමයි පිළිතුරේ සඳහන් කර තිබෙන්නේ. එය පහත පරිදි වෙනවා.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු. මිලියන)
2009	167
2010	125
2011	127
2012	72
2013	149
2014	560
2015	120

(ආ) අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඒ නිවාස සංඛ්‍යාවක් සමඟ ඒ විස්තර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. 2015, 2016, 2017 වර්ෂ සඳහා කිලිනොච්චි දිස්ත්‍රික්කයට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද කියලා සඳහන් කරන්න ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවාද ?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නයටයි එතුමා උත්තර දුන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මම අහන්නේ ඒ ප්‍රමාණය පෙන්වන්න පුළුවන්ද කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක අලුත් ප්‍රශ්නයක්. ඒ නිසා වෙන දවසක අහන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා ඒ ප්‍රශ්නය අසා නැහැ. නමුත් ඒ ප්‍රශ්නය එතුමාට මතු වන නිසා මම කියන්නම්. නිවාස 6,520ක් තිබෙනවා. ඔබතුමා අසන ලද (අ) (ii) ප්‍රශ්නයට මම ඒ පිළිබඳ පිළිතුරු දීලා තිබෙනවා. 2016 සහ 2017 මැයි 31 වන විට විදුලි සම්බන්ධතා 32,458ක් අපි සපයා තිබෙනවා. 2015 වර්ෂය අවසන් වෙනකොට විදුලි සම්බන්ධතා සංඛ්‍යාව 25,930ක් වනවා. ඒ දෙක අතර පරතරයේ ප්‍රමාණය තමයි අපි මේ වසර එකහමාරක කාලය තුළ ලබාදීලා තිබෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මුදල කොපමණද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මුදල කොපමණද කියලා ඔබතුමා අහලා නැහැ. මට ඒ තොරතුර ලැබිලාත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
7 වන ප්‍රශ්නය, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා. එතුමා නැහැ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තුන්වන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කොපමණ මුදලක් ගියාද කියලා දැන් ඔබතුමා ඇහුවානේ. කොච්චර වියදම් කළාද කියලා ඇහුවා නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
තුන්වෙනි ප්‍රශ්නය ඇහුවේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් ප්‍රශ්න තුනක් අහන්න අවස්ථාව දෙන්නේ නැහැ.

ප්‍රශ්න අංක 8 - 1381/'16 (2) ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රීතුමා, පිළිතුර නම් තිබෙනවා. නමුත් ඔබතුමාට පිළිතුරු දීමට අවශ්‍ය බව අමාත්‍යතුමා කිව්වා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 9 - 1466/'16- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජාතික විදුලි සත්කාරය වැඩසටහන : විස්තර
தேசிய மின்சார உபசரணை நிகழ்ச்சித்திட்டம் : விபரம்
NATIONAL ELECTRIFICATION PROGRAMME: DETAILS

1598/'17

11. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) "රටම එළියයි - අඳුර දුරලයි" ජාතික විදුලි සත්කාරය වැඩසටහන ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම (ලෙකෝ) විසින් විදුලිය ලබා දී ඇති නිවාස ඒකක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම වැඩසටහන සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් වැය කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ වනවිට ශ්‍රී ලංකාවේ නිවාස ඒකක අතරින් කොපමණ ප්‍රතිශතයකට විදුලිය සපයා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මින්වලු මැටුම් හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා විසින් පිළිතුරු දෙනු ලැබීමට ඇසූ ප්‍රශ්න

(අ) (i) "*රට්ටම එලියය් - අන්දුර දුරලය්*" යන ජාතික විදුලි බලාගාර ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය;

(ii) ඒ අනුව වෙන වෙනම, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් විදුලිය සපයා ඇති නිවාස ඒකක සංඛ්‍යාව;

(iii) ඒ අනුව වෙන වෙනම, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් විදුලිය සපයා ඇති නිවාස ඒකක සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය;

(ආ) ශ්‍රී ලංකාවේ නිවාස ඒකක අතරින් කොපමණ ප්‍රතිශතයකට විදුලිය සපයා තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේ නම්, ඒ මන්ද;

(ඇ) නැත්නම්, ඒ මන්ද යන්නත්

asked the Minister of Power and Renewable Energy :

(a) Will he inform this House -

(i) the date on which "Ratama Eliyai Andura Duralai" national electrification programme was commenced;

(ii) separately the number of household units for which electricity connections have been supplied by the Ceylon Electricity Board and Lanka Electricity Company (LECO) (Pvt.) Ltd.;

(iii) separately, the amounts of money spent by the Ceylon Electricity Board and Lanka Electricity Company (LECO) (Pvt.) Ltd. under the aforesaid programme?

(b) Out of the households in Sri Lanka, will he also inform this House of the percentage of households for which electricity connections have been provided by now?

(c) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. - [බාධා කිරීමක්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Bandula Gunawardane?

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරයෙක් කල් ඇතිව ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා, ප්‍රශ්නයට උත්තර දෙන එක පිළිබඳව ගරු සභාවේදී අදහසක්වත් හුවමාරු කර ගන්න දෙන්නේ නැතුව, switch එක off කරන බලධාරියා කවුද? මේක පුදුම වැඩක් නේ. ගරු මන්ත්‍රීවරුන්ට කථා කරන්න දෙන්නේ නැති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

කවුද? මේක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළතු]
[Expunged on the order of the Chair.]

පාර්ලිමේන්තුවක් නේ. [බාධා කිරීම්] බලධාරියෝ දාලා- [බාධා කිරීම්] තමුන්නාන්සේ තමයි ඊයේ ගිහිල්ලා ගැහුවේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order,please! ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමනි, 11 වන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) "රටම එළියයි - අඳුර දුරලයි" ජාතික විදුලි සත්කාරය වැඩසටහන ආරම්භ කරන ලද්දේ 2016.01.12 වන දිනදීය.

ඊට කලින් අපි ප්‍රචාරණ කටයුතු පටන් ගත්තා. සබඳතා ලබා දීම පටන් ගත්තේ 2016.01.12 වන දිනයි.

(ii)

ආයතනය	විදුලිය ලබා දී ඇති නිවාස ඒකක සංඛ්‍යාව
ලංකා විදුලිබල මණ්ඩලය	2,62,729
ලංකා විදුලි පෞද්ගලික සමාගම	3,647

(iii)

ආයතනය	වැය කර ඇති මුදල (රු.මිලියන)
ලංකා විදුලිබල මණ්ඩලය	6,617.7
ලංකා විදුලි පෞද්ගලික සමාගම	71.9

ඒ කියන්නේ, අපි රුපියල් බිලියන 6.6ක පමණ මුදලක් දුප්පත්, අහිංසක මිනිසුන්ට විදුලිය ලබා දීම සඳහා වියදම් කරලා තිබෙනවා. සියයට 100ක විදුලිය ලබා දීම සඳහා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ආ) මේ වන විට ශ්‍රී ලංකාවේ නිවාස ඒකක අතරින් සියයට 99.7 ප්‍රතිශතයකට විදුලිය සපයා ඇත.

ප්‍රායෝගිකව විදුලිය ලබා දෙන්න පුළුවන්; නීත්‍යානුකූලව විදුලිය දෙන්න පුළුවන්, විදුලිය ඉල්ලපු හැම නිවසකටම විදුලිය ලබා දීලා තිබෙනවා. සියයට 100ක් විදුලිය ලබා දීලා තිබෙනවාය කියලා මා ආඩම්බරයෙන් කියනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවාද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාසුදේව නානායකකාර මන්ත්‍රීතුමාගේ වයර් මාරු වෙලාද මා දන්නේ නැහැ. ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා උත්තර දුන්නේ මගේ ප්‍රශ්නයටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
වයර් මාරු වෙලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මටයි අතුරු ප්‍රශ්න අහන්න තිබෙන්නේ. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාගේ වයර් මාරු වෙලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක මා බලා ගන්නම්. ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වයර් ගැලවිලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
වයර් ගැලවිලා නම් ගහගන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න කෝ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, "රටම එළියයි අඳුර දුරලයි" වැඩසටහන යටතේ නිවාස 262,729කට විදුලිය ලබාදී විදුලිය ඉල්ලුමෙන් සියයට 99.7ක් සම්පූර්ණ කළා කියලා ඔබතුමා කිව්වා. ඒ කියන්නේ ඔබතුමා කියන විධියට තව 0.3යි ඉතිරිවෙලා තිබෙන්නේ. රජයක් හැටියට ඒ ඉලක්කයට යෑම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. හැබැයි මට ප්‍රශ්නයක් තිබෙනවා. විදුලි පද්ධතිය වැඩිදියුණු කළා කියලා ඔබතුමා කිව්වත්, මේ වන විට රට පුරාම විදුලිය බිඳ වැටීම් වරින් වර සිද්ධ වෙනවා. රටක් හැටියට, රජයක් හැටියට ඒක සාමාන්‍ය මහ ජනතාවට විශාල ප්‍රශ්නයක් සහ අර්බුදයක්. එම බිඳවැටීම්වලට හේතුව කඩාකප්පල්කාරී ක්‍රියාවක්ද, දේශපාලන හස්තයක්ද, වෘත්තීය සමිති ගැටලුවක්ද, යාන්ත්‍රික දෝෂයක්ද, එහෙමත් නැත්නම් වෙනත් කුමන හෝ අද්භූත සිද්ධියක්ද කියන එක මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ විදුලිය පද්ධතිය මූලික වශයෙන් රඳා පවතින්නේ නොරොච්චෝලේ විදුලි බලාගාරය මතයි. විශේෂයෙන්ම මේ කාලයේ බලාගාර ප්‍රදේශවල දැඩි නියහයක් පවතිනවා. නොරොච්චෝලේ විදුලි බලාගාරයේ තිබෙන එක් යන්ත්‍රයක් මේ වෙලාවේ සම්පූර්ණයෙන්ම අක්‍රියයි. අපි එය ඉක්මනින්ම යථා තත්ත්වයට පත්කරනවා. යාන්ත්‍රික දෝෂ නිසා දෙවැනි සහ තුන්වැනි යන්ත්‍රත් අර්ධ වශයෙන් තමයි ක්‍රියා කරන්නේ. අඩු තාක්ෂණයෙන් යුත් මෙවැනි බාල ගල් අඟුරු බලාගාරයක් මිලදී ගැනීමේ විපාක අපි විඳිමින් ඉන්නවා. කෙසේ නමුත්, අපට තිබෙන වටිනා දෙයක් වශයෙන් සලකා, ඒ ආබාධිත දරුවා වුණත් ආරක්ෂා කරගෙන කෙසේ හෝ ජාතික පද්ධතියට විදුලි බලය ලබා දීමටයි අපි කටයුතු කරන්නේ. ඒක තමයි යථාර්ථය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා තවමත් හිටගෙන.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. ඔබතුමාට ඒක ප්‍රශ්නයක් නැහැ නේ?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය වන්නේ මෙයයි. පසු ගිය දිනවල එක් නිලධාරියෙකුට පහරදීමක් නිසා විදුලිය කඩාකප්පල්වීමක්; බිඳ වැටීමක් සිදු වුණා. එක් පුද්ගලයෙක් වෙනුවෙන් සිදු වෙච්ච ඒ දේ පිළිබඳව අපි රජයක් හැටියට කනගාටුව පළ කරනවා. නමුත්, එක් පුද්ගලයෙක්ට සිදු වුණු ක්‍රියාවක් වෙනුවෙන් සියදහස්-දසදහස් ගණනින් රෝගීන් ඇතුළු විශාල පිරිසකගේ ජන ජීවිතය අඩාල වනවා. ගරු අමාත්‍යතුමනි, ඒ කියන්නේ දතට දතකුත් නොවෙයි, දතට දත් ඇන්දක්ම ගලවන එක සාධාරණ ද අසාධාරණ ද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්නය සාමාන්‍ය මිනිසුන් බොහෝ දෙනෙක් මගෙනුත් ඇහුවා. මම ඒ ගැන කනගාටු වෙනවා. විදුලිබල මණ්ඩලයේ ඉන්න දක්ෂ, අවංක සේවකයෙකුට විරුද්ධව මැර බලය පාවිච්චි කරලා, තුවාල කරපු ඒ ප්‍රහාරය අපි තරයේ හෙළා දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. පැහැදිලියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

නමුත්, ඒ වෙලාවේ වෘත්තීය සමිති ගත්ත ක්‍රියා මාර්ගය නිසා ඒ ප්‍රශ්නයට කිසිම සම්බන්ධයක් නැති දස දහස් ගණනින් විශාල පිරිසක් අපහසුතාවට පත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එය මේ ප්‍රශ්නයට අදාළ ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මම ඔවුන් වෙනුවෙන් කනගාටුව පළ කරනවා. මම හිතනවා, මේ ප්‍රශ්නයේ තිබෙන සංවේදීකම වෘත්තීය සමිති තේරුම් ගනීවි කියලා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12-1603/'17-(1), ඇසීමට කලින් ගරු වාසුදේව නානායක්කාර මැතිතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් මතු කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නය වන්නේ අංක 9යි. මෙම 9වන ප්‍රශ්නය අහලා තිබෙන්නේ, ප්‍රතිපත්ති ප්‍රශ්නයක් හැටියටයි. ඉතින් ප්‍රතිපත්ති ප්‍රශ්නයක් හැටියට අහපු අවස්ථාවක ප්‍රතිපත්තිය මේකද, නැද්ද කියන එකට දෙමාසයක් කල් ඉල්ලීම ඉතාමත්ම අසාධාරණයි. ඔබතුමා නියෝජ්‍ය කථානායකතුමා හැටියට මේ ප්‍රශ්නවලට උත්තරදීමේදී හා කල් ගැනීමේදී, කල් ගැනීමේ තිබෙන සාධාරණභාවය හා ඒ සඳහා ඉල්ලන කාලය පිළිබඳවත් එහි යුක්ති සහගතභාවය ගැන අපට කරුණු දැක්වීමටත් ඉඩක් දෙන එක හොඳයි. එතකොට ඔබතුමාට ඒ සඳහා මැදිහත් වෙන්න පුළුවන්, "නැහැ, මේ ප්‍රශ්නයට මාස දෙකක් නොවෙයි ඊටත් කලින් පිළිතුරක් ලබා දෙන්න" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඇත්තටම වාසුදේව නානායක්කාර මැතිතුමාගේ ප්‍රශ්නය අග්‍රාමාත්‍යතුමා ගරු සභාවේ ඉන්න වෙලාවක ප්‍රකාශයට පත්,-

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පිළිතුරු දීම සඳහා මාස දෙකක් කල් ඉල්ලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්. ඒක ඇත්ත.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

සති දෙකක් නොවෙයි. මාස දෙකක්. මොකද හේතුව, විමධ්‍යගත අරමුදල් මඟින් දුන්න ඒවා ගැනයි අහන්නේ. තවමත් විමධ්‍යගත අරමුදල් සංශෝධනය වෙමින් පවතිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, එතුමා අහන්නේ, සෙවිලි තහඩු -

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේවා මේ file එකේ තිබෙන ඒවා. මම කියන ඒවා නොවෙයි. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! We can sort it out.

ගරු ගයන්ත කරුණාතිලක මැතිතුමනි, මෙතුමා අහන්නේ, සෙවිලි තහඩු පිළිබඳව ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දුවක් ගත්තාද කියලායි. ඒ තීන්දුව අරගෙනද, නැද්ද කියන එක පිළිබඳව ගරු අගමැතිතුමා මේ සභාවේ ඉන්න වෙලාවක මේ සභාවට ප්‍රකාශ කරන්න පුළුවන්. ඊට පසුව ඒ ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරක් ලබා දීම සඳහා මාස දෙකක කාලයක් ලබා ගැනීම පිළිබඳව ගැටලුවක් නැහැ. එතුමා සාධාරණ කාරණයක් තමයි කියන්නේ. ඒ නිසා ගරු අගමැතිතුමා ඉන්න වෙලාවක ඒ සඳහා කෙටි උත්තරයක් දෙයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මාස දෙකකින් උත්තර දෙන්නම් කියලා දන්වලා තිබෙනවා. ලංකාවේම ඒවා ගැන හොයලා කියයි.

ලංකා ගමනාගමන මණ්ඩල සේවකයන් : රත්නපුර දිස්ත්‍රික්කය

இலங்கைப் போக்குவரத்துச் சபை ஊழியர்கள்: இரத்தினபுரி மாவட்டம்
EMPLOYEES OF SRI LANKA TRANSPORT BOARD: RATNAPURA DISTRICT

1609/'17

13. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ නියුතු සේවක සංඛ්‍යාව, එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සේවකයන් අතරින් වන්දි ලබාගෙන සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කර ඇති සේවක සංඛ්‍යාව, එක් එක් ඩිපෝව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය කාලසීමාව තුළ මෙම සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම ක්‍රමානුකූලව සිදුවී තිබේද;

(iv) ඔවුන් වෙත වන්දි ලබා දෙන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் இலங்கைப் போக்குவரத்துச் சபையில் சேவையில் ஈடுபட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு டிப்போ வாரியாக தனித்தனியாக எவ்வளவு;

(ii) இந்த ஊழியர்கள் மத்தியில் நட்டஈட்டினைப் பெற்றுக்கொண்டு சேவையிலிருந்து நீங்க விண்ணப்பித்துள்ள ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு டிப்போவாரியாக தனித்தனியாக எவ்வளவு;

(iii) கடந்த காலப்பகுதியில் இந்த ஊழியர்களுக்காக ஊழியர் சேமலாப நிதி செலுத்துதல் முறைப்படி இடம்பெற்றுள்ளதா;

(iv) இவர்களுக்கு நட்டஈடு செலுத்தப்படுகின்ற விதம் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Civil Aviation:

(a) Will he inform this House -

(i) separately on per depot basis, the total number of employees employed at Sri Lanka Transport Board in the Ratnapura District;

(ii) separately the number of employees at each of the aforesaid depots who have applied for voluntary retirement with compensation;

(iii) whether payments of EPF contributions of those employees have been made regularly during the past period; and

(iv) the manner in which compensation will be paid to those employees?

(b) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි ඩිපෝවල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2017.03.31 දිනට සේවක සංඛ්‍යාව පහත සඳහන් කර ඇත.

ඩිපෝව	සේවක සංඛ්‍යාව
රත්නපුර	400
බලංගොඩ	445
ඇඹිලිපිටිය	276
කලවාන	252
ගොඩකවෙල	193
එකතුව	1566

(ii) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි ඩිපෝවල සිටින සේවකයන් අතරින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලිය යටතේ (VRS) සඳහා ඉල්ලුම්කර ඇති සේවකයින් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ඩිපෝව	සේවක සංඛ්‍යාව
රත්නපුර	56
බලංගොඩ	47
ඇඹිලිපිටිය	18
කලවාන	13
ගොඩකවෙල	27
එකතුව	161

(iii) යහ පාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් අනතුරුව 2015 සැප්තැම්බර් මස සිට අර්ථ සාධක අරමුදල් ගෙවීම් කටයුතු ක්‍රමානුකූලව සිදු කරගෙන යනු ලැබේ.

කෙසේ වුවද, 2010 සිට 2015 දක්වා නොගෙවා පැහැර හැර ඇති අර්ථ සාධක අරමුදලේ හිඟ මුදල වන රුපියල් මිලියන 11,832.00ක -ඒ කියන්නේ කෝටි 1,183ක- මුදල අතරින් රුපියල් මිලියන 6,213කට -කෝටි 621.3කට- ආසන්න මුදලක් දැනට ගෙවා අවසන් කර ඇත. ඉතුරු මුදල් ගෙවීම සඳහා භාණ්ඩාගාරය සමඟ ක්‍රමවේදයක් සලසා ඇත.

(iv) ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලිය (VRS) යටතේ විශ්‍රාම යන සේවකයින්ට වන්දි ලබා දීම සම්බන්ධ මූලික විස්තර පහත පරිදිය.

- රියැදුරු, කොන්දොස්තර හා කාර්මික තනතුරුවල සේවයේ යෙදී සිටින සේවකයින් හැර අනෙකුත් තනතුරුවල සේවකයින්ට මෙම සහනය හිමිවීම.

  1. අවුරුදු 10ක් හෝ අවුරුදු 10කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ස්ථිර සේවකයින් සඳහා (වයස අවුරුදු 55ට අඩු සේවකයින් සඳහා)

     (i) ගෙවී ගිය සේවා කාලය: සම්පූර්ණ කළ සෑම මාස 12ක් සඳහාම මාස 3.5ක මූලික වැටුප්;

     (ii) ඉතුරු සේවා කාලය: සෑම මාස 12ක් සඳහාම මාස 2.0ක මූලික වැටුප්.

  2. අවුරුදු 10ට අඩු සේවා කාලය සම්පූර්ණ කළ ස්ථිර සේවකයින් සඳහා (වයස අවුරුදු 55ට අඩු සේවකයින් සඳහා)

     (i) ගෙවී ගිය සේවා කාලය: සම්පූර්ණ කළ සෑම මාස 12ක් සඳහාම මාස 08ක මූලික වැටුප්;

     (ii) ඉතුරු සේවා කාලය: කිසිම ගෙවීමක් නොමැත.

  3. වයස අවුරුදු 55-59 දක්වා සේවකයින් සඳහා සිය කැමැත්තෙන් විශ්‍රාම යන විට

     (i) අවසාන වශයෙන් ලබා ගත් සියලුම දීමනාව ඇතුළු මාස හයක වැටුප් පමණක්.

- වන්දි මුදල් ගෙවීම පහත සඳහන් ආකාරයට සිදු වේ.

	අවම සීමාව	උපරිම සීමාව
විධායක ශ්‍රේණි (I-V) ශ්‍රේණි	රු.450,000	රු.2,500,000
මධ්‍යම ශ්‍රේණි (I-VIII) ශ්‍රේණි	රු.350,000	රු.1,800,000
සුළු ශ්‍රේණි (IX-X) ශ්‍රේණි	රු.250,000	රු.1,200,000
අනුචිත කර්තව්‍ය දැනට යෙදී සිටින රියැදුරු I/II පෙළ කාර්මික I/II පෙළ	රු.350,000	රු.1,700,000
වයස අවුරුදු 55-59 දක්වා සේවයේ යෙදී සිටින සේවකයින්		අවසාන වශයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලබා ගත් සියලුම දීමනාව ඇතුළු මාස 06ක වැටුප් පමණක්.

ස්ථිර සේවක සංඛ්‍යාව වශයෙන් වර්ග කර නොමැති සේවකයින්ට (කොන්ත්‍රාත් ගිවිසුම් යටතේ සේවය කරන සේවකයින් හැර) ගෙවී ගිය සේවා කාලය සඳහා සම්පූර්ණ කළ සෑම මාස 12ක් සඳහාම මාස 02ක මූලික වැටුප්, අවම වන්දි මුදල මාස 12ක මූලික වැටුපක් වශයෙන් වන්දි ගණනය කිරීම සිදුවේ.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂාන් විකානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේම ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ට ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ ක්‍රමයක් හඳුන්වා දෙනවාය කියලා යහ පාලන ආණ්ඩුව බලයට පත් වූ මුල් කාලයේදී ප්‍රකාශයට පත් කළා. ලංකා ගමනාගමන මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය කරලා සේවක ප්‍රමාණය අඩු කරන්න කටයුතු කළේ සේවක වැටුප් ගෙවීමේ ගැටලු විසඳන්නයි. ඔබතුමන්ලා බලාපොරොත්තු වූ විධියට ප්‍රතිව්‍යුහගතකරණය හරහා සේවකයන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගන්වා එහි පාලනයක් කර ගන්න පුළුවන් වුණාද? රැකියාව පිළිබඳව පළපුරුද්දක් තිබෙන, රැකියාව කරන්න තව වයස තිබෙන කණ්ඩායම්වලට ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන්න ඔබතුමන්ලා අවස්ථාව දීලා එම තනතුරුවලට නැවත අලුත් කණ්ඩායම් බඳවා ගන්නා ආකාරය අද වනකොට අපි දකිනවා. මේ තුළින් ඔබතුමන්ලා බලාපොරොත්තු වූ අරමුණ කරා යන්න පුළුවන් වෙනවාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින් 36,700ක් සිටියා. සාමාන්‍යයෙන් දිනකට ධාවනය වන්නේ බස් රථ 5,500ක්. එක බස් රථයකට සේවකයන් 07ක පමණ ප්‍රමාණයක් සිටියා. කෙසේ වෙතත් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන ක්‍රමයට අපි බස් රියදුරන්, කොන්දොස්තරවරුන් සහ කාර්මික ශිල්පීන් ඇතුළත් කළේ නැහැ. අපි විශේෂයෙන්ම මේ ක්‍රමයට ඇතුළත් කළේ කාර්යාල සේවකයින්. මේ ක්‍රමයෙන් සේවකයින් 8,000ක් පමණ විශ්‍රාම යයි කියලා අපි බලාපොරොත්තු වුණා. නමුත්, මෙම ක්‍රමයෙන් විශ්‍රාම ගියේ සේවකයින් 5,000කට ආසන්න ප්‍රමාණයක්.

දැනටත් අපේ රියදුරු සහ කොන්දොස්තරවරුන්ගේ ප්‍රමාණය බැලුවාම සාමාන්‍යයෙන් රියදුරන් 10,400ක් පමණත්, කොන්දොස්තරවරු 10,450ක් පමණත් සිටිනවා. කාර්මික ශිල්පීන් 6000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. දැනට බස් රථවලට අවශ්‍ය සේවක සංඛ්‍යාව සිටිනවා. බස් රථ 100ක් ධාවනය වනවා නම්, රියදුරන් 140කුත් කොන්දොස්තරවරු 140කුත් ඕනෑ. සාමාන්‍යයෙන් නිවාඩු ගන්න ප්‍රමාණයත් අනුව 100ට 140ක අනුපාතයට තමයි දෙන්නේ. ඒ අනුව දැනට ඒ සේවක ප්‍රමාණය ඉන්නවා. කාර්යාලවල ඉන්න අතිරික්ත සේවකයන් වෙනුවෙන් තමයි අපි ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ ක්‍රමය -VRS එක- ඇති කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේෂාන් විතානගේ)
(The Hon. Heshan Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා හරහා නැවත කඩිමුඩියේ බඳවා ගැනීම් සිද්ධ කළා. ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන්න ඉඩ දෙන්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන අරමුණ අනුව නම්, එහෙම විශ්‍රාම යවලා අලුතින් සේවකයන් බඳවා ගන්නේ ඇයි කියලායි මම අහන්නේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(මාණ්පුමිකු අශෝක් අබේසිංහ)
(The Hon. Ashok Abeysinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කාර්යාලවලට කිසිම සේවකයෙක් බඳවා ගත්තේ නැහැ. සමහර ඩිපෝවල රියැදුරු සහ කොන්දොස්තරවරුන්ගේ අතිරික්තයක් තිබෙනවා. අපට දසදහස් ගණනක් සිටියාට නිවාඩු ප්‍රශ්න මත, යම් යම් දූෂණ ක්‍රියා මත වැඩ තහනම් වුණු ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා මම කිව්ව පරිදි බස් රථ 100කට 140ක් වන අනුපාතයට සේවකයන් නැහැ. ඒ නිසා රියදුරු කොන්දොස්තරවරුන් පමණක් බඳවා ගැනීම් කරනවා. ඒ හැර අපේ රජය යටතේ වෙනත් කිසිම තනතුරකට බඳවා ගෙන නැහැ. අවශ්‍ය ඩිපෝවලට රියදුරු කොන්දොස්තරවරු පමණයි බඳවා ගන්නේ. එහෙම බඳවා ගන්නේත් කොන්ත්‍රාත් පදනම මතයි. රජයෙන් පඩි ගෙවන්නේ නැහැ. හැම මාසයේම පඩි ගෙවන්න රජයෙන් රුපියල් කෝටි 135ක් වෙන් කර තිබෙනවා. අපි දවසට රුපියල් 1000 බැගින් ගෙවන්න කොන්ත්‍රාත් පදනම මත තමයි බඳවා ගෙන තිබෙන්නේ.

SMILE III ණය යෝජනා ක්‍රමය: ක්‍රියාත්මක නොකිරීම

SMILE III கடன் திட்டம் : செயற்படுத்தாமை
SMILE III LOAN SCHEME: NON-IMPLEMENTATION

1707/'17

14. ගරු විදුර වික්‍රමනායක මහතා
(මාණ්පුමිකු විදුර වික්කිරමනායක)
(The Hon. Vidura Wickramanayaka)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය-

(1):

(අ) (i) ව්‍යවසායකයන් සවිබලගැන්වීම පිණිස සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ක්ෂුද්‍ර කර්මාන්ත සඳහා සහන පොලී පදනමක් මත, වසර දෙකක සහන කාලයක්ද සහිතව SMILE III ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලද බවත්;

(ii) ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් 2016 ජූලි මස 10 වැනි දින පුවත්පත් දැන්වීම් පළකර, ණය ලබාදීම පිළිබඳව ප්‍රචාරය කරන ලද බවත්;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමට වාණිජ බැංකු දහයක් ඉදිරිපත් වූ අතර, ණය අයදුම්කරුවන් පන්දහසක් පමණ එම ණය අපේක්ෂාවෙන් ඉදිරිපත් වුවද ණය ලබාදීම නවතා ඇති බවත්;

(iv) බොහෝ ව්‍යවසායකයන් විසින් අවශ්‍ය මූලික වියදම් දරමින් ඇප ඔප්පු අත්සන් කිරීම සහ උකස් ඔප්පු සකස් කිරීම වැනි කටයුතු අවසන්කර ඇතත්, ණය ලබාදී නොමැති බවත්;

(v) මෙම තත්ත්වය හේතුවෙන් නව ව්‍යාපාර සහ ව්‍යාපාර වැඩිදියුණු කිරීම්, අතරමඟ නැවතී ඇති අතර එය ජාතික ආර්ථිකයටද බලවත් පහරක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ණය මුදල් ලබාදීමට හැකියාවක් නොමැති නම්, 2016.07.10 දින පුවත්පත් දැන්වීම් ප්‍රචාරය කර ජනතාව අපහසුතාවයට පත් කරන ලද්දේ මන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොழිල් මற්றුම් වාණිප අලුවල්කළ් අමෛච්චරෛක් කේට්ට වින්නා:

(අ) (i) තොழිල්මුයර්චියාළර්කළෛ වළුවූට්ටුම් පොරුට්ටු චිරිය මර්රුම් නටුත්තර අළවිලාන කෛත්තොழිල්කළ් මර්රුම් නුණ්පාක කෛත් තොழිල්කළුක්කු චලුකෛ වට්ටියින් අටිප් පටෛයිල් ඉරණ්ටු වරුටංකළ් චලුකෛක් කාලත්තුටන් SMILE III කටන් තිට්ටම් නටෛමුරෛප්පටුත්තප්පට්ටතෙන්පතෛයුම්;

(ii) කරුත්තිට්ට පණිප්පාළරිනාල් 2016 යූලෛ මාතම් 10ආම් තිකති පත්තිරිකෛකළිල් අර්විත් තල්කළ් වෙළියිටප්පට්ටු, කටන් වළංකුතල් චම්පන්තමාක පිරචාරම් චෙය්යප්පට්ටතෙන්පතෛයුම්;

(iii) මේර්පටි කරුත්තිට්ටත්තින් මූලම් කටන් වළංකු වතර්කු 10 වර්ත්තක වංකිකළ් මුන්වන්තතුටන්, කටනෛ එතිර්පාර්ත්තු 5000 කටන් විණ්ණප්ප තාරිකළ් මුන්වන්තපෝතිලුම් කටන් වළංකුතල් නිරුත්තප්පට්ටුළ්ළතෙන්පතෛයුම්;

(iv) පල තොழිල්මුයර්චියාළර්කළිනාල් තේවෛ යාන අටිප්පටෛ චෙලවුකළ් මේර්කොළ්ළප් පට්ටු පිණෛ උරුතිකළෛ කෛච්චාත්තිටල්, ඊට්ටුරුතිකළෛත් තයාරිත්තල් පෝන්ර නටවටික්කෛකළ් නිරෛවුචෙය්යප්පට්ටුළ්ළ පෝතිලුම් කටන් වළංකප්පට විල්ලෛ එන්පතෛයුම්;

(v) ඉන්ත නිලෛමෛයින් කාරණමාක පුතිය තොழිල් මුයර්චිකළ් මර්රුම් මේම්පටුත්තප්පටුම් තොழිල් මුයර්චිකළ් ඉටෛනටුවේ තටෛප්පට්ටුළ්ළතුටන්, ඉතු තේචිය පොරුළාතාරත්තිර්කුම් පෙරුම් තාක්කමාක අමෛන්තුළ්ළතු එන්පතෛයුම්;

අවර් අර්විවාරා?

(ආ) කටන් තොකෛයෛ වළංකුවතර්කු ආර්රල් ඉල්ලෛ යෙනිල්, 2016.07.10ආම් තිකතිය පත්තිරිකෛකළිල් අර්විත්තල්කළෛ වෙළියිට්ටු මක්කළෛ අචෙළකරියත් තිර්කු උළ්ළාක්කියතර්කාන කාරණම් යාතෙන්පතෛ අවර් ඉච්චපෛක්කු අර්විවිප්පාරා?

(ඉ) ඉන්රේල්, ඒන්?

asked the Minister Industry and Commerce:

(a) Is he aware that-

(i) the loan scheme named SMILE III was implemented for small and medium-scale industries and micro industries on a concessionary interest rate and with a two-year grace period in order to empower entrepreneurs;

(ii) the Project Director published newspaper advertisements on 10th July 2016 and gave publicity regarding granting of loans;

(iii) even though ten commercial banks came forward to grant loans under this scheme and nearly five thousand applicants applied for those loans, granting of loans has now been stalled;

(iv) even though most entrepreneurs have completed signing of deeds of security and deeds of mortgage by making preliminary expenses, loans have not been granted; and

(v) this situation has resulted in improvement of businesses and emerging businesses being stalled while being a blow to the national economy?

(b) Will he inform this House as to why people were inconvenienced by publishing newspaper advertisements on 10.07.2016, if granting of loans is not possible?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ ගරු ඇමතිතුමා පැමිණෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මේ අවස්ථාවේ ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා ආවා. මේ ප්‍රශ්නයට එතුමාම පිළිතුරු දුන්නොත් හොඳයි කියන එක තමයි ගරු මන්ත්‍රීතුමාගේ අදහස වන්නේ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

(a) (i) Yes. SMILE III is a revolving fund loan scheme which has been implemented since 2012. Fund allocated to this loan scheme was Rs. 11.2 billion with interest. The account is maintained with the Central Bank.

(ii) Yes. The Project Director did publish newspaper advertisements to make the public aware of the existence of such a loan scheme. Otherwise, they would have not known about the loan scheme.

(iii) Since 2012, the Project Management Unit has received 13,385 applications out of which 11,309 applications have been selected as eligible to consider granting of loan by the respective Committees. The Project Management Unit has already granted loans, through the selected banks, to 2,530 applicants amounting to Rs. 11,200 million.

(iv) Does not arise in view of the answer to (a) (iii) above.

(v) This situation has neither affected any business nor is a blow to the national economy. The loan scheme contributes for the uplift of the national economy. Already 2,530 small and medium-scale industries have been benefitted by this loan scheme.

(b) People were not inconvenienced by the publication of the advertisement. They came to know about the loan scheme only through this advertisement. I assure the Hon. Members of this august Assembly that each and every eligible applicant will be granted loans through this scheme. However, time delay is unavoidable due to immediate non-availability of funds.

(c) Does not arise.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමනි, පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සඳහා 2016දී පුවත් පත් දැන්වීමක් දමනවා. මෙතුමා කියන ආකාරයට මේ ණය ක්‍රමය ආරම්භ වුණේ 2012දී. - 2012 අපේ ආණ්ඩුව කාලයේ.- ඔබතුමා විශේෂ අනුග්‍රහයක් අපේ ආසනයටත් දුන්නා මට මතකයි. ඒ පිළිබඳවත් ස්තුතිවන්ත වෙනවා. ඒ කෙසේ වෙතත්, ඔබතුමා කියන පරිදි අපි හැමෝම දන්නවා මේ රටේ ආර්ථික පුනර්ජීවනයක් ඇති වෙන්නට නම් අනිවාර්යයෙන්ම කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වෙන්නට ඕනෑය කියලා.

විශේෂයෙන්, සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත. එය ඉලක්ක කර ගෙනයි මේ ණය ක්‍රමය ආරම්භ කළේ. නමුත්, මේ වෙන කොට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොරොන්දු වූ පරිදි ණය ලබා දෙන්නේ නැහැ. ඒ ණය ක්‍රමය ඇතුළත් කරන්නේත් සාමාන්‍ය ණය ක්‍රමයක් පරිදියි; විශේෂ ණය ක්‍රමයක් නොවෙයි. But, this is a very special loan scheme. It is very unfortunate that once a person asks for a loan under this Scheme, it is granted under the regular scheme. This has happened. And, if I ask for a loan of Rs. 100,000, first they approve it, but they grant only Rs. 50,000. So, Hon. Deputy Speaker, I am asking the Hon. Minister whether he is aware of these things.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු අමාත්‍යතුමා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු මන්ත්‍රීතුමනි, මම උත්තරයේදී පැහැදිලි කළා මේ සඳහා applications 13,000ක් විතර ලැබුණා කියලා. ඒකෙන් දොළොස්දහස් ගණනක් වැනි ගණනක් මම කිව්වා. ඒවා අපි බැංකුවලට recommend කරනවා. ඒ අනුව, මේ loan scheme එක යටතේ බැංකු 10ක් loans ලබා දෙමින් යනවා. ඒ බැංකු 10න් දැනටමත් ණය දීලා තිබෙන්නේ applicantsලා 2,503කට විතරයි. එහෙම ලබා දුන්නාට පස්සේ ඒ මුදල් ඔක්කෝම ඉවරයි. අපි බැංකුවලට එවා තිබෙන applications12,000කට ණය ලබා දෙමින් තිබෙන්නේ, මුලින් ලබා දුන් ණය මුදලින් මාස හයකට සැරයක් recover කර ගන්නා මුදලින් බවයි දැනට ඒ අය අපට කිව්වේ.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඊයේත් මට කිව්වා, රුපියල් ලක්ෂ 50ක් ඉල්ලපු කෙනාට දීලා තිබෙන්නේ රුපියල් ලක්ෂ 25යි කියා. අප recommend කරලා යැව්වාට පසුව ණය දෙන විට බැංකුව තමයි තීරණය කරන්නේ ඒ අයට කොච්චර මුදලක් දෙන්න පුළුවන්ද කියා. ඒ අය එය තීරණය කරනවා. එතැනදී වැඩිපුර ඉල්ලුම් කර තිබෙන නිසා තමයි ඒ තිබුණු රුපියල් බිලියන 11.2ක් වූ මුළු මුදලම දැනටමත් අවසන් වෙලා තිබෙන්නේ. අද මම check කළා. Rs 1.2 billion දැනටමත් recover වෙලා තිබෙනවා. අපි ආපසු පත්‍රිකාවක් දාලා දැනුම් දීමක් කළේ මෙය transparent වෙන්න ඕනෑ නිසායි. කර්මාන්ත දියුණු කරවීම සඳහා සහ රැකියා අවස්ථා වැඩි කර ගැනීම සඳහායි අප recommendations දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි මා මෑතකදී Cabinet Paper එකක් දාලා මේ සම්බන්ධයෙන් වැඩි මුදලක් ඕනෑ කියා ඉල්ලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කාරණය පැහැදිලියි. දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය මෙසේයි. මේ SMILE III scheme එක නේ. SMILE I and SMILE II have already been finished. Then, you should have an assessment of how many loan applications you will receive and how much seed capital you all have. All those have to be taken into consideration. I feel that you have not taken these factors into consideration. Otherwise this will not flop. This Scheme is a flop.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

කාරණය පැහැදිලියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

2012 වර්ෂය වන විටයි අපි SMILE III scheme එක පටන් ගත්තේ. SMILE I and SMILE II schemes මා සිටින කාලයේ නොවෙයි කෙරුණේ. පිළිවෙළක් නැතිව තමයි ඒවා කෙරිලා තිබුණේ. රුපියල් මිලියන 50ක් දුන්නා, සමහර අයට. ඒ අය industry එක පටන් ගත්තේවත් නැහැ. නමුත් 2012න් පසුව මගේ අමාත්‍යාංශයේ නිටපු ලේකම්තුමා වන තිලක් කොල්ලුරේ මහත්මයාගේ නායකත්වයෙන් එතුමා ඒ සියල්ල හරියාකාරව සැලසුම් කළා. 2012න් පසුව එක loan එකක්වත් වැරදි විධියට දීලා නැහැ. ගරු මන්ත්‍රීතුමා, එය ඔබතුමාට සොයා බලන්න පුළුවන්. අපේ අමාත්‍යාංශය ලේකම්තුමා යටතේ Committee එකක් පත් කළා. ඒ කමිටුවේ recommendations අනුව තමයි අප recommend කර තිබෙන්නේ. ඒකයි මා කිව්වේ, "අපි applications 12,000ක් recommend කර තිබෙනවා" කියා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නා පරිදි බැංකුව ලාභ ලබන විධියට කටයුතු කරමින් යනවා. එම නිසා ඒ අය අපේ තිබුණ මුදල් බෙදා දීලා, භාගයක් මේ මුදලින් දීලා, ඉතුරු මුදල සඳහා වෙනම loans දීගෙන යනවා කියා කිව්වා. ඊයේත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මට මේ ගැන පැහැදිලි කළා.

මේ සම්බන්ධව සියලු වාර්තා අරගෙන තිබුණු වැරදි සියල්ලම හදාගෙනයි දැන් මේ වැඩ පිළිවෙළ කරගෙන යන්නේ. ඒකයි Rs. 1.2 billion දැනට ඉතිරි වෙලා තිබෙන්නේ. එහෙම නැත්නම්, ඒ සල්ලි ඉතිරි වන්නේ නැහැ. දැනට අපට applications එවා තිබෙන අයගෙන් සුදුසු අයට ඒ ණය දීමේ වැඩ පිළිවෙළක් දැන් යොදා තිබෙනවා. මාසයක් ඇතුළත ඒ Rs. 1.2 billion සුදුසු අයට දෙනවා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කවුරුන් හෝ කෙනෙකුට - ඒ loans apply කරපු අයගෙන් සුදුසු අයට- ඒ ණය ලැබී නැත්නම් ඒ විස්තරය මට දෙන්න.

ඒ සම්බන්ධව ලේකම්තුමා හරහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරවන්නට මට පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, what is the interest rate of the loan? Everything depends on the interest rate.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

It is less than the rates of other loans.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Can you specifically say what the special interest rate of the loans is? - [*Interruption*]

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

Hon. Deputy Speaker, that was the expectation.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Exactly.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

But it is not happening. This is granted as a regular loan.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

People are expecting a concessionary rate.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(මාණ්පුමිකු රිස්ාට් පදියුදීන්)
(The Hon. Risad Badhiutheen)

We are recommending loans only under the SMILE III Scheme. If you have any applications, please let me know and I will look into it.

සුළං විදුලි බලාගාර : ඒකක ගාස්තුව

කාැට්රු මින් උපැත්ති නිලෙයංකළ: අලකුක් කට්ටණම්

WINDMILL POWER: UNIT RATE

1328/'16

15. ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඇති සුළං විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරයන්ගෙන් විදුලි ඒකකයක් ලංකා විදුලිබල මණ්ඩලය ලබා ගන්නා මිල, එක් එක් බලාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම බලාගාර අතරින් සී/ස එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් බලාගාර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) අලිමංකඩ ඉදි කරන නව සුළං බලාගාරයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ඒකකයක් ලබා දෙන මිල කවරේද;

(ii) සුළං බලාගාරයන්ගෙන් විදුලිය ඒකකයක් අඩුම මිලකට ලබා ගැනීමට රජය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මින්වලු මැත්රුම් පුතුප්පිකක්කත්තක්ක සක්ති අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) இலங்கையில் காணப்படும் காற்று மின் உற்பத்தி நிலையங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி மின் உற்பத்தி நிலையங்களிலிருந்து இலங்கை மின்சார சபை மின் அலகொன்றைப் பெற்றுக்கொள்ளும் விலையானது ஒவ்வொரு மின் உற்பத்தி நிலையத்துக்கும் ஏற்ப வெவ்வேறாக யாது;

(iii) மேற்படி மின் உற்பத்தி நிலையங்களில் வ/ப எல்டீஎல் ஹோல்டிங்ஸ் (தனியார்) கம்பனிக்குச் சொந்தமான மின் உற்பத்தி நிலையங்கள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) ஆனையிறவில் நிர்மாணிக்கப்படும் புதிய காற்று மின் உற்பத்தி நிலையத்திலிருந்து இலங்கை மின்சார சபைக்கு மின் அலகொன்று வழங்கப்படும் விலை யாது;

(ii) காற்று மின் உற்பத்தி நிலையங்களிலிருந்து குறைந்த விலையில் மின் அலகொன்றைப் பெற்றுக்கொள்வதற்கு அரசாங்கம் நடவடிக்கை மேற்கொண்டுள்ளதா;

(iii) ஆமெனில், அது எவ்வாறு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he state-

(i) the number of windmills installed in Sri Lanka;

(ii) the price at which a unit of electricity is obtained from those power plants by the Ceylon Electricity Board separately in relation to each power plant; and

(iii) out of those windmills, the power plants that belong to the L.T.L. Holdings (Pvt) Limited;

(b) Will he inform this House-

(i) the price at which a unit of electricity is supplied to the Ceylon Electricity Board by the new windmills being erected at Elephant Pass;

(ii) whether the Government has taken steps to obtain a unit of electricity from windmills at a lowest rate; and

(iii) if so, in what manner?

(c) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) එකතුව මෙගාවොට් 128 ධාරිතාවකින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත බලශක්තිය සැපයෙන සුළං බලාගාර 15ක් (සම්මත විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම යටතේ පාලනය වන) ක්‍රියාත්මක කර තිබේ.

මේ සියල්ලම විදුලිබල මණ්ඩලය සහ පෞද්ගලික ආයෝජකයන් අතර ඇති කර ගන්නා ලද සම්මත විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් යටතේයි පාලනය වෙන්නේ.

(ii) ඇමුණුමෙහි සඳහන්ව ඇත. ඇමුණුම **සභාගත*** කරමි. (ඇමුණුම පිළිතුර අවසානයේ ඇත.)

මම ඔබතුමාට මිලදී ගැනීමේ මිල සඳහන් කරන්නම්. විදුලි ඒකකයක් සඳහා ගෙවා තිබෙනවා, රුපියල්, 21.62, 26.11, 26.11, 23.07, 21.56, 19.43, 25.67, 21.66, 25.67, 21.43, 19.43, 19.43, 21.26, 21.26 සහ 19.43 බැගින්.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මේ වාගේ ඉතා ඉහළ අගයකට තමයි විදුලි ඒකකයක් අපි මිලදී ගත්තේ. ඒවා කාලයක් තිස්සේ සිදු වුණු දේවල්.

(iii) ඇමුණුමෙහි අංක 09 කොටස යටතේ සඳහන් කර ඇත.

එම බලාගාර අතරින් සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමට අයත් එක් බලාගාරයක් තිබෙනවා. එහි නම, 'පවන් දනවි ප්‍රයිවට් ලිමිටඩ්'. එම පවන් දනවි ප්‍රයිවට් ලිමිටඩ්හි වැඩිපුර පංගුවක අයිතිය සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමටයි තිබෙන්නේ. අනෙක් බලාගාරවලට සී/ස. එල්ටීඑල් හෝල්ඩින්ග්ස් (පෞද්.) සමාගමේ අයිතිවාසිකමක් නැහැ.

(ආ) (i) මේ ප්‍රශ්නය ඉතා වැදගත් ප්‍රශ්නයක්. පෞද්ගලික හිතවත්කම් මත, දේශපාලන කාරණා මත, මැති ඇමැතිවරුන්ගේ විතරක් නොවෙයි, ජනාධිපතිවරුන්ගේත් මැදිහත්වීම් මත ඉතාම දූෂිත විධියට තමයි කලින් මේ බලපත්‍ර ලබා දුන්නේ. එම බලපත්‍ර ලබා දීම හරහා විශාල වශයෙන් දූෂණ සිදු වුණා. අපේ රජය බලයට පත් වූ පසුව 2016 වසරේ මැයි මාසයේ පළමුවැනි වතාවට මෙගාවොට් 10 බැගින් වූ සුළං බලාගාර දෙකකට තරගකාරී මිල ගණන් කැඳෙව්වා. ඒකකයක් රුපියල් 12.29ක් වැනි අවම මිලකට ගන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ කියන්නේ ඒකකයක අඩුම මිල රුපියල් 19 මට්ටමේ තිබුණේ. විදුලි ඒකකයක ගැණුම් මිල රුපියල් 12.29ක් දක්වා අඩු කර ගන්න අපට පුළුවන්කම ලැබුණා. මෙම බලාගාරයේ කටයුතු මේ වන විට ආරම්භ කරලා තිබෙනවා. ඉඩම් පවරා ගැනීම පිළිබඳ ගැටලු තිබුණා. අපි ඒවා නිරාකරණය කරලා තිබෙනවා. ඒ වාගේම කොන්ත්‍රාත්කාර සමාගම් තෝරා ගෙන තිබෙනවා. ඒ කටයුතු සිදු වෙමින් තිබෙනවා.

(ii) මේක තමයි අවශ්‍යම දේ. එසේ කළ හැක්කේ තරගකාරී මිල ගණන් කැඳවීමෙන් පමණයි. සමහරු තවමත් මේ තරගකාරී මිල ගණන් කැඳවීමට විරුද්ධයි. එහෙම විරුද්ධ වෙන්නේ දූෂිතයෝ; එහෙම විරුද්ධ වෙන්නේ දූෂණය හා සම්බන්ධ පුද්ගලයෝ; එහෙම විරුද්ධ වෙන්නේ දූෂිතයන්ගෙන් කොමිස් ලබා ගැනීමට උත්සාහ කරන පුද්ගලයෝ. අපි එම ක්‍රමයට සම්පූර්ණයෙන් විරුද්ධයි. කිසිසේත්ම පුනර්ජනනීය බලශක්ති සම්බන්ධ permit ක්‍රමය නැවත එන්න දෙන්නේ නැහැ කියන ස්ථාවරයේ මමත්, ඇමැතිතුමාත් ඉන්නවා.

(iii) සියල්ලම දෙන්නේ තරගකාරී මිල ගණන්වලට පමණයි. අපි මේ ක්‍රමයම සූර්ය බලාගාරවලටත් භාවිත කළා. ඉදිරියටත් එහෙම කරනවා. මේ මොහොතේත් මෙගවොට් 10ක් වූ බලාගාර දෙකක් සඳහා ටෙන්ඩර් කැඳවලා තිබෙනවා. එම ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වෙන්න කියලා මම මුළු රටටම ආරාධනා කරනවා. මෙතැන දේශපාලනයක් නැහැ; යාළුකම් නැහැ. අවම මිලට ජයග්‍රහණය ලැබෙනවා.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*

**Annex tabled:*

Commissioned Wind Power Projects as at 2017.03.25

Sr No.	CEB Ref No.	Developer's Name	Name of Facility	Capacity (MW)	Present Year Tariff (Rs./kWh)	Area	Project Type
1	2420	Senok Wind Power (Pvt) Ltd	Mampuri I WPP	10.000	21.62	Puttalam	WP
2	3060	Seguwantivu Wind Power (Pvt) Ltd	Seguwantivu WPP	10.000	26.11	Puttalam	WP
3	3050	Vidatamunai Wind Power (Pvt) Ltd	Vidatamunai WPP	10.000	26.11	Puttalam	WP
4	3540	Vallibel Willwind (Pvt) Ltd	Willpita WPP	0.850	23.07	Kahawatta	WP
5	2440	Nirmalapura Wind Power (Pvt) Ltd	Nirmalapura WPP	10.000	21.56	Puttalam	WP
6	4030	Ace Wind Power (Pvt) Ltd	Ambewela WPP	3.000	19.43	Nuwara Eliya	WP
7	3040	Powergen Lanka (Pvt) Ltd	Uppudaluwa WPP	10.000	25.67	Puttalam	WP
8	3300	Daily Life Renewable Energy (Pvt) Ltd	Madurankuliya WPP	10.000	21.66	Puttalam	WP
9	2430	Pavan Danavi (Pvt) Ltd	Kalpitiya WPP	9.800	25.67	Puttalam	WP
10	2450	Nala Dhanavi (Pvt) Ltd	Erumbukkudal WPP	4.800	21.43	Puttalam	WP
11	4500	Senok Wind Energy (Pvt) Ltd	Mampuri II WPP	10.000	19.43	Puttalam	WP
12	4510	Senok Wind Resource (Pvt) Ltd	Mampuri III WPP	10.000	19.43	Puttalam	WP
13	5680	Jaul Power (Pvt) Ltd	Pulappalai WPP	10.000	21.26	Kilinochchi	WP
14	5670	Beta Power (Pvt) Ltd	Vellimunai WPP	10.000	21.26	Kilinochchi	WP
15	4890	Musalpetti Wind Power (Pvt) Ltd	Musalpetti WPP	10.000	19.43	Puttalam	WP
Total Capacity				128.450			

**** මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]***

[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]

[This annex is also placed in the Library.]

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. පසු ගිය වකවානුවේ ජනාධිපතිවරු, විෂය භාර ඇමැතිවරු බොහෝ දෙනෙක් මැදිහත් වෙලා අන්ත දූෂිත විධියට බලපත්‍ර ක්‍රමය ක්‍රියාත්මක වුණා කියලා නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. එම බලපත්‍ර ක්‍රමය මොනම හේතුවක් නිසාවත් යළි ඇති කරන්නේත් නැහැ; මොන විවේචන ආවාත් එහෙම ඇති වෙන්න දෙන්නේත් නැහැ කියලා ඔබතුමා කිව්වා. අපි ඒක ප්‍රකාශයක් විධියට ප්‍රමාණිකව පිළිගන්නවා. යළි ඇති කරන්නේ නැහැ කියන සහතිකය වාගේම, පසු ගිය වකවානුවේ සිදු වුණු දූෂණ හෙළිදරව් කරලා ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්න අමාත්‍යාංශයේ කොටස ඉටු කරන්න තමයි ඔබතුමා පත් වුණේ. අපි පත් වුණේ රජයේ කොටස ඉටු කරන්නයි. ඒ දූෂණ සම්බන්ධයෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු අජිත් පී. පෙරේරා මහතා

(மாண்புமிகு அஜித் பீ. பெரேரா)

(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දූෂිත ගනු-දෙනු පිළිබඳව කඩදාසි මත බැලුවාම ගැටලුවක් නැහැ. මොකද ඒ කාලයේ තිබුණු නීතිය තමයි permit දෙන එක. Permit දෙන තීරණය ගත්තේ විධායකය. ඒ ක්‍රියාවලිය පොතට හරි. හැබැයි, පොත යටින් මුදල් හුවමාරු වුණා; දූෂණය සිද්ධ වුණා. ඒ නිසා ඔබතුමා කියන ආකාරයට ඒ පුද්ගලයන්ව හිරේ යවන්න අපට බැහැ. හැබැයි, ඒවා වැරැදියි. ඒ වාගේම ඒ තොරතුරු අපි දන්නවා. ඒ නිසා ඉදිරියට මේ දේවල් සිද්ධවෙන එක වැළැක්වීම තමයි අපේ උපාය මාර්ගය වෙන්නේ.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නීතිඥයෙක්. ඔබතුමා කියන විධියට පොත උඩින් ලස්සනට වැඩේ වෙලා පොත

යටින් ගනු-දෙනු වුණා නම් ඉදිරියටත් එහෙම නොවෙයි කියලා සහතිකයක් නැහැ. එක පැත්තකින් ඒ තත්ත්වය. අනෙක් පැත්තෙන් මෙතරම් පුනර්ජනනීය බලශක්ති ක්‍රමවේදයන් පාවිච්චි කරන්න පුළුවන්කම තිබෙද්දී සමහර අය තවමත් කඹුරනවා, ගල් අඟුරු සහ වෙනත් ක්‍රමවේද ඔස්සේ මුදල් ගරා ගන්න පුළුවන් අයථා ගනු දෙනු සිදු කළ හැකි ක්‍රමවේදයන් සඳහා. පුනර්ජනනීය බලශක්ති මෙපමණ ආකාරයට පරිහරණය කිරීමේ හැකියාව තිබෙද්දී ගල් අඟුරු, ගෑස් එහෙම නැත්නම් ඉන්ධන ගැන බර තියන ක්‍රමවේදයන්ට අමාත්‍යාංශය තවම සහයෝගය සහ උඩගෙඩි දෙන්නේ ඇයි?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන ලොකු ප්‍රශ්නයක් ඇහුවේ. ඒක නිසා මට පොඩි අවස්ථාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දැන් වෙලාව නම් ගොඩක් ගත වෙලායි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අවසාන ප්‍රශ්නය නිසා මට විනාඩි කිහිපයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළමුවැනි කාරණය තමයි පුනර්ජනනීය බලශක්තිවලට විශේෂයෙන් සුළං සහ සූර්ය බලය පිළිබඳව අපේ රටේ විශාල විභවයක් තිබෙනවා. අපි වර්තමානයේ සකස් කරලා තිබෙන දිගු කාලීන ජනන සැලැස්ම තුළ පුනර්ජනනීය බලශක්තිය හරහා විදුලිය උත්පාදනය කිරීමට ලොකු බරක් තබා තිබෙනවා. ඒ නිසා පුනර්ජනනීය බලශක්ති මිලදී ගැනීම පිළිබඳව අපට ලොකු වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ හැම එකක්ම තරගකාරී ටෙන්ඩර් කාර්ය පටිපාටියට අනුව කරන්න ඕනෑ. ඒ තරගකාරී ටෙන්ඩර් කාර්ය පටිපාටිය විනිවිදභාවයෙන් යුතුව අපි කරනවා. ඒ වාගේම ඒ සම්බන්ධව රටේ තිබෙන හොඳම ක්‍රමය ඒක. ටෙන්ඩර් කාර්ය පටිපාටියට වඩා permit ක්‍රමය හොඳ වෙන්න බැහැ. ඒ නිසා ටෙන්ඩර් කාර්ය පටිපාටියේ තිබෙන අඩුපාඩුකම් සහ ඒවා තුළදී දේශපාලනික නොවන වෙනත් තැනැත්තන් විසින් සිදු කරනු ලබන යම් යම් ක්‍රියාවන් පාලනය කිරීමට අපට අවශ්‍යයි. අපි ඒ පිළිබඳව අවධානයෙන් ඉන්නවා.

ඊළඟ කාරණය තමයි, මෙතුමා සඳහන් කරපු, "තවමත් ගල් අඟුරු ඇයි?" කියන කාරණය. සුදුසු මූලාශ්‍ර මොනවාද කියලා ඉංජිනේරුමය වාදයක් ලොකුවට තිබෙනවා. පුනර්ජනනීය බලශක්තිවලින් විතරක් රටක විදුලි පද්ධතියක් අරගෙන යන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

Base load එක එක්කෝ LNG වෙන්න ඕනෑ; නැත්නම් ගල් අඟුරු වෙන්න ඕනෑ; එහෙමත් නැත්නම් ජල විදුලිය වෙන්න ඕනෑ. නමුත්, අද වැස්ස පිළිබඳව විශ්වාසය තබන්න බැරි තත්ත්වය තුළ LNG හෝ ගල් අඟුරුවලට යන්න ඕනෑ. නැත්නම් ඒ දෙකේ මිශ්‍රණයකට යන්න ඕනෑ. එම නිසා මේ පිළිබඳව ලොකු විවාදයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ උනන්දුව පිළිබඳව අප ස්තුතිවන්ත වෙනවා. අප ඔබතුමාට වගකීමෙන් කියනවා, දූෂණයෙත් තොර, පරිසර හිතකාමී ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දෙවන වටය.

දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් හපුතලේ ඉඩම්: බදු වැඩි කිරීම

புகையிரதத் திணைக்களத்துக்குரிய ஹப்புத்தளையிலுள்ள காணி: குத்தகை அதிகரிப்பு

LANDS BELONGING TO DEPARTMENT OF RAILWAYS IN HAPUTALE: INCREASE OF LEASE

1076/'16

3. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Bimal Rathnayake)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් හපුතලේ ඉඩම්වල වසර 75කට අධික කාලයක සිට මේ දක්වා පදිංචිව සිටින ජනතාවගෙන් වාර්ෂිකව බදු අයකරන බවත්;

(ii) මෙම වාර්ෂික බද්ද 1970දී, රු. 75/- ත් රු. 80/- ත් අතර ගණනක් වූ අතර මේ වනවිට එය රු. 10,000/- ත් රු. 25,000/- අතර ගණනක් දක්වා වැඩිකර ඇති බවත්;

(iii) එකම ඉඩමේ කොටසක පදිංචි පුද්ගලයන් සඳහා ඔප්පු මඟින් හිමිකම පවරා දී තිබියදී, එම ඉඩමේම වෙනත් කොටසක පදිංචි පුද්ගලයන්ට බදු ගෙවන මෙන් දන්වා ඇති බවත්;

(iv) බදු මුදල් නොගෙවන්නේ නම්, ඉඩම්වලින් ඉවත්වන ලෙස දන්වා ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) 1930 වර්ෂයේ සිට මේ දක්වා මෙම ඉඩම්වල පදිංචිව සිටින මෙම පිරිසගෙන් වර්තමානයේ අය කරන අධික බදු මුදල අඩු කිරීමට පියවර ගන්නේද;

(ii) මෙම ඉඩම් ඒවායේ පදිංචිකරුවන්ට පවරා දීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புகையிரதத் திணைக்களத்திற்குச் சொந்தமான ஹப்புத்தளையிலுள்ள காணிகளில் 75 ஆண்டு களுக்கும் மேற்பட்ட காலம்தொட்டு இன்று வரை வசிக்கும் மக்களிடம் ஆண்டு தோறும் குத்தகை அறவிடப்படுகிறது என்பதையும்;

(ii) மேற்படி ஆண்டுக் குத்தகை 1970 இல், ரூபா 75/- க்கும் ரூபா 80/-க்கும் இடைப்பட்டதாகக் காணப்பட்டதுடன், இன்ற ளவில் அத்தொகை ரூபா 10,000/- க்கும் ரூபா 25,000/-க்கும் இடைப்பட்ட தொகையாக அதிகரிக்கப்பட்டுள்ள தென்பதையும்;

(iii) ஒரே காணியின் ஒரு பகுதியில் வசிப்பவர்களுக்கு உறுதிகள்மூலம் உரித்தளிக்கப்பட்டுள்ள நிலையில், அதே காணியின் வேறொரு பகுதியில் வசிப்பவர்களுக்குக் குத்தகை செலுத்துமாறு அறிவிக்கப்பட்டுள்ளது என்பதையும்;

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

(iv) කුත්තකෙත්තොකෙ සෙලුත්තප්පටාවිටින්, කාණි කළිලිරුන්දු වෙළියේරුමාරු අරිවික්කප් පට්ටුල්ළදු එන්බදෙයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) 1930ආම් ආණ්ටිලිරුන්දු ඉර්රෙවරෙ ඉක් කාණිකළිල් වසික්කුම් ඉවර්කළිටමිරුන්දු තර්පෝදු අරවිටප්පටුම් කුත්තකෙත් තොකෙ යෙක් කුරෙක්ක නටවටික්කෙ එටුප්පාරා එන්බදෙයුම්;

(ii) මේර්පටි කාණිකළෙ අවර්රිල් වසිප්පවර් කළුක්කු ඔප්පටෙක්ක නටවටික්කෙ එටුප්පාරා එන්බදෙයුම්;

අවර් ඉච්සබෙයිල් අරිවිප්පාරා?

(ඉ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Transport and Civil Aviation:

(a) Is he aware that -

(i) an annual lease amount is charged from the residents who have been residing in the lands belonging to the Department of Railways in Haputale for over 75 years up to now;

(ii) the annual lease amount which stood at Rs.75 to Rs. 80 in 1970 has been increased up to Rs.10,000 to Rs. 25,000 at present;

(iii) while people who are residing in one part of the land have been awarded through deeds the title to the lands they are residing in, some others who are residing in another part of the same land have been required to pay a lease amount; and

(iv) they have been asked to vacate their lands, if they do not pay the lease?

(b) Will he inform this House -

(i) whether steps will be taken to reduce the lease amount that is currently charged from the aforesaid persons who have been residing in those lands since 1930; and

(ii) whether necessary steps will be taken to grant those lands to the persons who are residing in them?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා,

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හපුතලේ පිහිටි දුම්රිය රක්ෂිත ඉඩම් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් එම ප්‍රදේශයේ ජනතාවට වගාව, නේවාසික පරිහරණය, වාණිජමය අරමුණු මත අතීතයේ සිට බදු ලබාදී ඇති අතර, වාර්ෂිකව බදු මුදල් කැඳවීම කළද, වැඩි පිරිසක් නිසි පරිදි බදු මුදල් නොගෙවා රක්ෂිතය පරිහරණය කරනු ලබයි.

(ii) මෙහිදී වාර්ෂික බදු මුදල තීරණය වනුයේ කාලීනව එම ප්‍රදේශයේ ඉඩම්වලට ඇති වාණිජමය වටිනාකම, පරිහරණය කරන බදු අරමුණ හා භූමි ප්‍රමාණය මත බැවින් රුපියල් 75-80ව බදු මුදල වර්තමානය වන විට රුපියල් 10,000-25,000 දක්වා වැඩිවී ඇත. මෙම වාර්ෂික බදු මුදල රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තීරණය කරන අතර, එය සෑම වසර 05කට වරක් සංශෝධනය වනු ඇත.

(iii) බොහෝ විට අතීතයේදී පියාගේ හෝ මවගේ නමින් බදු ලබාගෙන ඇති රක්ෂිත ඉඩම තුළ වර්තමානයේදී තම දරුවන් විසින් අනවසරයෙන් නිවාස තනා වෙන් වෙන්ව භුක්ති විඳීම නිසා එක් එක් අය පරිහරණය කරන කොටස් වෙනුවෙන් බදුකරුගේ නමින් පරිහරණකරුගේ භාරයේ පරිහරණ මුදල් වශයෙන් අය කිරීමට කටයුතු කර ඇත.

(iv) ඔව්.

(ආ) (i) බදු මුදල් අඩුකිරීමේ බලයක් දුම්රිය දෙපාර්තමේන්තුවට නොමැත. එසේ කළහොත් මූල්‍ය අක්‍රමිකතා යටතේ නිලධාරීන්ට විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවනු ඇත. තවද, විගණකාධිපතිවරයා විසින් ද මේ පිළිබඳව විගණන වාර්තා තුළින් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවට පැමිණිලි කරනු ඇත. එහෙයින් මා විසින් ඉදිරිපත් කොට ඇති අංක 17/1040/709/042 හා 2017.05.19 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් ඔවුන් සඳහා සහන සැලසීමට පියවර ගෙන ඇත. ඒ අනුව හිඟ බදු ගෙවීඹ සඳහා සහන කාලයක් ලබාදීමට පියවර ගෙන ඇත.

(ii) පවරා දීමට හැකියාවක් නැත.

(ඇ) දුම්රිය ආඥා පනත අනුව දුම්රිය දෙපාර්තමේන්තුව මඟින් පදිංචිකරුවන්ට වසර 05ක උපරිම කාල සීමාවකට බදු දීමට අවකාශ ඇත. එයින් බැහැරව කටයුතු කරන්නේ නම් ඒ එක් එක් ඉඩම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුව ඇත.

විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයාගේ මරණය : හේතු
ஓய்வுபெற்ற புலனாய்வுப் பிரிவு அதிகாரியின் மரணம்: காரணம்
DEATH OF RETIRED INTELLIGENCE OFFICER: CAUSE

1308/'16

7. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා (ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවට)
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா - மாண்புமிகு டலஸ் அழஹப்பெரும சார்பாக)
(The Hon. T. Ranjith De Zoysa on behalf of the Hon. Dullas Alahapperuma)

නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය කරනු ලැබුවේ තමා බවට පාපොච්චාරණයක් සටහන් තබමින් කැගල්ල ප්‍රදේශයේ විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයෙකු දිවි නසාගෙන ඇති බවට වාර්තා පළවී ඇති බවත්;

(ii) එය දිවි නසාගැනීමක්ද; නැතහොත්, ඝාතනයක්ද; යන්න පිළිබඳ සැක සහිත බව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යවරයා විශේෂ මාධ්‍ය හෙළිදරව්වක් කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එකී විශ්‍රාමික බුද්ධි අංශ සාමාජිකයාගේ මරණය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, වෛද්‍ය නිගමනය කවරේද;

(iii) සිදුවී ඇත්තේ සිය දිවිනසා ගැනීමක් නොවේ නම්, මරණයට අදාළ වූ හේතූන් කවරේද;

(iv) එයට වග කිව යුත්තන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) වග කිව යුතු පුරවැසියෙක් වශයෙන් නියෝජ්‍ය අමාත්‍යවරයා කර ඇති ප්‍රකාශය පිළිබඳ යම් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය පිළිබඳ පරීක්ෂණයේ වත්මන් තත්ත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

සට්ටමුම් ඔழුංකුම් මට්‍රුම් තෙන් අපිවිරුත්‍ති අමෛච්චරෙක් කේට්ට වින:

(අ) (i) ඌටකවියලාළර් තිරු. ලසන්ත වික්කිරමතුංගවෙ තාමේ පටුකොලෙ සෙය්තතාකක් කුට්ර ඔප්පුතල් කුරිප්පොන්‍රෙ එළුතිවිට්ටු, කේකාලෙ පිරතේසත්තින් ඔය්වුපෙට්ර පුලනාය්වුප් පිරිවින් අංකත්තවර් ඔරුවර් තර්කොලෙ සෙය්තු කොණ්ටුළ්ළතාක අරික්කෙකළ් වෙළියාකි යුළ්ළතෙන්පතෙයුම්;

(ii) ඉතු තර්කොලෙයා අල්ලතු පටුකොලෙ යාවෙනච් සන්තේකම් එළුන්තුළ්ළතාක මින්වළු මට්‍රුම් පුතුප්පික්කත්තක්ක සක්ති පිරති අමෛච්චර් විසේට ඌටක අරික්කෙයොන්‍රෙ වෙළියිට්ටුළ්ළාරෙන්පතෙයුම්;

අවර් අරිවාරා?

(ආ) (i) මේර්පඩි ඔය්වුපෙට්ර පුලනාය්වුප් පිරිවු අංකත්තවරින් මරණම් පට්‍රිප් පිරේතප් පරිසෝතනෙ යොන්‍රු මේර්කොළ්ළප්පට්ටුළ්ළතා එන්පතෙයුම්;

(ii) ආමෙනින්, මරුත්තුව මුටිවු යාතෙන්පතෙයුම්;

(iii) නිකළ්න්තතු තර්කොලෙ ඉල්ලෙයෙනිල්, මරණත් තිර්කුරිය කාරණංකළ් යාවෙ එන්පතෙයුම්;

(iv) ඉතර්කුප් පොරුප්පානවර්කළුක්කු එතිරාක එටුක්කප්පට්ටුළ්ළ සට්ට නටවටික්කෙ යාතෙන් පතෙයුම්;

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(ඉ) (i) පොරුප්පුවාය්න්ත ඔරු පිරසෙ එන්‍ර වකෙයිල් පිරති අමෛච්චර් වෙළියිට්ටුළ්ළ කූට්රු පට්‍රි ඒතේනුම් විසාරණෙ මේර්කොළ්ළප්පටුකින්‍රතා එන්පතෙයුම්;

(ii) ඌටකවියලාළර් තිරු. ලසන්ත වික්කිරමතුංගවින් පටුකොලෙ පට්‍රි මේර්කොළ්ළප්පටුම් විසාරණෙයින් තර්පෝතෙය නිලෙමෙ යාතෙන්පතෙයුම්;

අවර් ඉච්සපෙයිල් අරිවිප්පාරා?

(ඊ) ඉන්‍රෙල්, ඒන්?

asked the Minister of Law and Order and Southern Development:

(a) Is he aware that -

(i) there have been reports which state that a retired intelligence officer in Kegalle had committed suicide claiming in a confession that it was he who killed journalist Lasantha Wickrematunge; and

(ii) the Deputy Minister of Power and Renewable Energy had stated in a special media release that it is suspicious whether the death of the aforesaid retired officer is an act of committing suicide or a murder?

(b) Will he inform this House -

(i) whether a post-mortem has been carried out on the dead body of the aforesaid retired intelligence officer;

(ii) if so, the conclusion reached by the doctors about the aforesaid death;

(iii) the cause of the death of the intelligence officer, if it was not an act of committing suicide; and

(iv) the nature of legal action that has been taken against those who are responsible for the death of the intelligence officer?

(c) Will he also inform this House -

(i) whether an inquiry would be conducted about the statement that has been made by the aforesaid Deputy Minister as a responsible citizen; and

(ii) of the present situation of the investigations carried out into the killing of Journalist Lasantha Wickrematunge?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මෙතෙක් ලැබී නොමැත.

(iii) පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මෙතෙක් ලැබී නොමැත.

(iv) පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව ලද පසු ඉදිරි නීතිමය පියවර ගනු ලැබේ.

(ඇ) (i) නැත.

(ii) • මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංග මහතාගේ මෘත දේහය ගොඩගෙන නැවත සිදුකරන ලද පශ්චාත් මරණ

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

පරීක්ෂණයට අදාළ වාර්තාව ලැබී ඇත. එමඟින් මුල් පශ්චාත් මරණ පරීක්ෂණයේදී සඳහන් කර ඇති ආකාරයට වෙඩි වැදීමකින් මෙම මරණය සිදුවී නොමැති බවත්, අධික ශක්තියක් යෙදූ උපකරණයකින් තුන් වතාවකට වඩා පහරදීමෙන් සිදුවූ හානි නිසා මෙම මරණය සිදුවී ඇති බවත්, පත් කරන ලද ත්‍රිපුද්ගල වෛද්‍ය මණ්ඩලය විසින් 2017.01.27 දිනැති වර්තාව මඟින් දක්වා ඇත.

- මෙම අපරාධයට භාවිත කර ඇති බවට සැක කරනු ලැබූ ජංගම දුරකථන 05 හි අයදුම්පත්වල ඇති අත් අකුරු සමඟ සැසඳීමට අපරාධය සිදුවූ කාලයේ මරදාන ට්‍රිපෝලි බුද්ධි අනු බණ්ඩය, කොහුවල බුද්ධි අනු බණ්ඩය හා මුත්තයියා පාර රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සේවය කරන ලද යුද්ධ හමුදා බුද්ධි සාමාජිකයන්ගේ අත් අකුරු ආදර්ශක ලබාගෙන ආණ්ඩුවේ සැක කටයුතු ලේඛන පරීක්ෂක වෙත 2016.11.24 දින අංක H44/16 යටතේ යොමු කර ඇති අතර, ඊට අදාළ වාර්තාව මෙතෙක් ලැබී නොමැත.
- එමෙන්ම, බුද්ධි සාමාජිකයින්ගේ අතුල් සටහන් ලබාගෙන ලඝන්ත වික්‍රමතුංග මහතාගේ කාර් රථයේ වූ අතුල් සටහන් සමඟ සැසඳීමට යොමු කර ඇති නමුත්, එම අතුල් සටහන් සමඟ සැසඳී නොමැත.
- මෙම අපරාධය සම්බන්ධයෙන් සිදු කරන ලද දුරකථන විශ්ලේෂණයේදී ලඝන්ත වික්‍රමතුංග මහතා ඝාතනය වූ දිනට පෙර දින, එනම් 2009.01.07 දින යුද්ධ හමුදා බුද්ධි සාමාජිකයින් සිව් දෙනෙකුගේ පුද්ගලික ජංගම දුරකථන 04ක් රත්මලාන සන්ඩේ ලීඩර් පුවත් පත් කාර්යාලය අවට ප්‍රදේශයේ ක්‍රියාත්මක වී ඇති බවත්, ලඝන්ත වික්‍රමතුංග මහතාගේ ඝාතනය වූ දින, එනම් 2009.01.08 දින ඔහු බිරිඳගේ නිවසට ගමන් කර ඇති බවත්, ඒ අවස්ථාවේදී එම ගමන් මාර්ගයේ පිහිටි කුලුනු ඇතුළත් ප්‍රදේශවල එක් බුද්ධි හමුදා සාමාජිකයෙකුගේ පුද්ගලික ජංගම දුරකථනයක් ක්‍රියාත්මක වී ඇති බවටත් කරුණු අනාවරණය වී ඇත.
- මෙම සිද්ධියට අදාළව ගල්කිස්ස මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක බී 92/2009 දරන නඩුව 2017.08.10 දිනට වැඩිදුර වාර්තා සඳහා කැඳවීමට නියමිතව ඇත.

(ඇ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු பிரதிச් சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -1478/'16- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩුමිකු புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
ඛිණාවෙ மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12 -1603/'17- (1), ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්ඩුමිකු (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්ඩුමිකු அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර සූදානම් නැහැ. අද ප්‍රශ්න ගොඩක් තිබෙන නිසා ඒ සඳහා වෙන දිනයක පිළිතුර දෙන්න මා කැමැතියි.

එම නිසා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
ඛිණාවෙ மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම. අංක 1 යෝජනාව ඉදිරිපත් කිරීම.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්ඩුමිකු ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්ඩුමිකු ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හැටියට වර්තමානයේ රටේ ගොවි ජනතාවට බලපාන ප්‍රශ්නයක් පිළිබඳ යෝජනාවක් මා විසින් ඉදිරිපත් කරන්න නියමිතව තිබුණා. ඒ, ගම්මිරිස් මිල පහළ යාම පිළිබඳවයි. නමුත්, ගරු සභානායකතුමා විසින් කිසිම විමසීමක් හෝ දැනුම්දීමක් නැතිව සභාව කල් තබනවා කිව්වා. එම නිසා ඒ යෝජනාව ඊයේ සාකච්ඡාවට ගත්තේ නැහැ. ඒ සම්බන්ධව -එම යෝජනාව නැවත ඉදිරිපත් කිරීම පිළිබඳව- දෙන විසඳුම මොකක්ද කියා මා දැනගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩුමිකු பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු කථානායකතුමා ඉන්න රැස්වීමකදී තමයි පාර්ලිමේන්තුවේ වැඩ පිළිබඳ න්‍යාය පත්‍රය හදන්නේ. එම නිසා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී කල්තබන අවස්ථාවේ යෝජනා - Adjournment Motions - ඉදිරිපත් කරන්න ඊළඟ අවස්ථාව ලැබුණාම, ඔබතුමාට ප්‍රථම අවස්ථාව ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන් වෙයි. ගරු සභානායකතුමනි, ඊට අමතර අවස්ථාවක් අපට තිබෙනවා කියා මා නම් හිතන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණයක් අරගෙන තමයි අපට ඊයේ දිනයේ සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබාදුන්නේ. ඒක, එම කාරක සභාවේ තීරණයයි. ඒ අනුව ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා රටේ ජනතාව වෙනුවෙන් ඒ යෝජනාව භාර දුන්නා. ඒක පිළිගත්තා. ඒක පිළිගෙන, ඒ යෝජනාව ඉදිරිපත් කිරීමට ඊයේ අවස්ථාව ලබාදීමට නියමිතව තිබුණා. නමුත්, ඒ ගැන කිසිම සඳහනක් නොකර ගරු කථානායකතුමා පාර්ලිමේන්තුවේ මේ සභාවෙන් නැඟිටලා ගියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We will take this up at the Party Leaders' Meeting.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

We will take it up at the Party Leaders' Meeting. But, Hon. Deputy Speaker, this is a matter of violating the Standing Orders.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You are talking about a decision taken by the Hon. Speaker.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

No, no.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You just mentioned that. So, I cannot give a ruling.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

The Speker or anyone in the Chair cannot violate Standing Orders in this manner. Hon. Deputy Speaker, you know that all of us agreed at the Party Leaders' Meetig to take up this Adjournment Motion.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

It is very clear.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන්න සියලු දෙනාගේම සහයෝගය අවශ්‍යයි. ගරු කථානායකතුමාට තනියම මේක කරගෙන යන්න බැහැ. ඊයේ ඇති වුණු තත්ත්වය කවුරුත් දන්නවා. ප්‍රශ්නය ඇති කළේ කවුද කියන එක කවුරුත් දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

We will take it up first at the Party Leaders' Meeting.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Hon. Deputy Speaker, I move,

"That the proceedings on Item No. 1 of Public Business appearing on the Order Paper of the Parliament be exempted at this day's sitting from the provisions of the Standing Order No. 23 of the Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා ඊයේ මේ ගරු සභාවේ සිටි අවස්ථාවේ අපි එතුමාගේ අවධානයට යොමු කළා, වර්ජනයේ නියුතු සේවකයන්ට මැරයන් දමා පහර දෙනවාය කියන කාරණය. නමුත්, එතුමාත් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් හැමෝමත් කිව්වේ එහෙම සිද්ධියක් වෙලා නැහැ කියලායි. නමුත්, ඊයේ රූපවාහිනී නාලිකාවල අපි හොඳින්ම දැක්කා, වෘත්තිය සමිති සාමාජිකයන්ට කුඩු කාරයන් දාලා පහර දෙන්න පටන් ගත්ත හැටි. [බාධා කිරීම්] ඒක වැරදියි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මරික්කාර්ගේ මැරයන්- [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ රාත්‍රියේ 1.00 වන තුරු මා website බැලුවා. එකම website එකකවත් පහර දීමක් සිදු වූ බවක් පළ වුණේ නැහැ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! අපි ප්‍රධාන කටයුතුවලට යමු. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පහර දීම් කළේ නැහැ. ඇද ගෙන ගියා. [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මෙන්න පත්තරේ. මෙන්න, පත්තරවල පළ වෙලා තියෙනවා පහර දීපුවා.[බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මන්ත්‍රීවරුනි, වාඩි වෙන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි,- [බාධා කිරීම්] Order, please! ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මයික් එක ලබා දෙන්න කලින්,- [බාධා කිරීම්] Order, please! ගරු මන්ත්‍රීවරුන් පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න. අද දවසේ විමල් වීරවංශ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කරුණු ඇතුළු සියලු දේ පිළිබඳව කථා කරන්න අද දවසම තිබෙනවා. ඔබතුමන්ලාගේ කරුණු අද දවසේ ඉදිරිපත් කරන්න අවස්ථාව තිබෙනවා. ඒ වාගේම, අද සවස් වන විට මේ පිළිබඳව රජය පැත්තෙනුත් අවශ්‍ය ප්‍රකාශ කරයි. ඒ නිසා, න්‍යාය පත්‍රයට අනුව ගරු සභානායකතුමා අද දිනට නියමිත කටයුතු පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරන්න.

අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනාව
அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

[පූ. භා. 11.29]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥා පනතේ අර්ථමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බැම, ගබඩා කිරීම, භාරදීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම යන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමූපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන බව සැලකිල්ලට ගනිමින් හා එම සේවාවන් සැපයීමට අවහිරයක් හෝ බාධාවක් ඇතිවීමට හැකියාවක් පැවතීම හේතුවෙන් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමූපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් ඉහත කී වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය සේවාවන් බවට ජනාධිපතිවරයා විසින් 2017 ජූලි 25 දිනැති අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මඟින් 2017 ජූලි 25 දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු යැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(2017 ජූලි 26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பட்டது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Leader of the House, you have eight minutes. You can make your speech now if you wish. Otherwise, the Hon. M.A. Sumanthiran will start.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ උද්ඝෝෂණයේ යෙදී සිටි කිසිම කෙනෙකුට පහර දී නැති බව websitesවලින් බැලුවා කියලා සභානායකතුමා ප්‍රකාශ කළා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sumanthiran, you can commence your speech.

[11.30 a.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Hon. Deputy Speaker, the Government has placed before this House for debate the Proclamation by His Excellency the President declaring as essential public service under the Essential Public Services Act, No. 61 of 1979, the supply or distribution of fuel including petroleum products and gas and all services, work, labour of any description whatsoever, necessary or required to be done in connection with the discharge, carriage, landing, storage, delivery and removal of oil or fuel from vessels within any port as defined for the purpose of the Customs Ordinance. This is being done under the Essential Public Services Act, No. 61 of 1979, a very important Proclamation. There was trouble in this House yesterday with regard to the strike action that had been commenced by the employees of the Ceylon Petroleum Corporation. Sir, I would like to congratulate the President for declaring the supply of fuel as an essential service in this particular context.

It is an important Debate that we are entering today in this House. For long years, we have supported the right of trade unions to resort to legitimate trade union action. I do not think any Hon. Member of this House from either side of the divide will dispute that workers in this country must have right to join and take trade union action, collective action, so that the rights - their rights, rights of the industries that they are engaged in - are protected. But, there comes a time when one asks the question as to whether the pendulum has swung the other way a little too much and today, I think, is an opportune moment to ask that question. Inasmuch as we all recognize and would want to protect the rights of workmen of the labour force of this country, we would also like to see that sacrosanct rights of theirs being exercised in a very responsible and constructive manner. It is a matter of regret that we see strike action at the drop of a hat belittling the most potent weapon in the hands of the workforces.

Trade union action has many facets to it. The Trade Union Ordinance, which is an old piece of legislation declares those rights. Article 14 of the Constitution very clearly protects the rights of workers to join and take trade union action. But, it must be legitimate and responsible trade union action. I believe, I am expressing the general sense of disillusionment of the people of this country today when they see various organizations calling themselves trade unions resorting to what they term "trade union action", but in effect political action, to cripple the functioning of the country.

The leading group of this is the Government Medical Officers' Association, a group of professionals who ought

to know better, who is said to have taken an oath - an ancient responsible oath - but who behave in this country worse than even criminals at times. I say these words advisedly and with responsibility, because if you deny medical attention to those who require it, then that is criminal negligence and you do it to attain your own selfish objectives - I would say, it is worse than criminal. I will not say all the medical professionals, but, today, certainly those who have taken control of this association called the GMOA, are often holding the country to ransom. This feature has been there for quite some time; it is not something arose yesterday, and they have used this important resource that has been bestowed on them by the taxpayers of this country, because they have gone through the tertiary education, they have gone through the medical education in this country for free. The whole country has paid for that. Why? Because we want doctors, we want health professionals attending to the sick. We have what most countries in the world do not have and that is free medical care. To sustain that industry we produce doctors, and all the people of this country - even those who do not pay direct taxes but everyone in this country pay indirect taxes - even the poorest contribute towards that medical education and they behave in this most irresponsible manner.

When I saw the gazette notification with regard to workers in the fuel supply area I wondered about the medical professionals. Of course, you do not have to declare that as an essential service. Everybody knows that medical services are essential. You do not have to have a gazette notification calling it an essential service. They know it better than anyone else for they take that oath, the Hippocratic Oath and dare behave in this fashion actually putting the lives of people physically and literally at stake. I personally know people who have died for lack of medical attention in the last couple of months whenever GMOA has gone on strike for some flimsy reason or another.

I am not saying that strike action is always irrelevant. There may be times when that is necessary, not only for doctors but even for others. There may be times that it is necessary and we must safeguard that right of the workers. But the tragedy today in this country is that the workers themselves are putting that right at risk. They will no longer have that right if they abuse that right; if they behave in a fashion that is most irresponsible. There are many actions that are taken as trade union actions. Lockout is what the employer can do but strike is the ultimate weapon. It is not the first thing that you do. But the tragedy, as I said, today is the trade unions do not know of any other trade union action. They do not know that they must give notice of trade union action. They do now know that they have to start with different kinds of protests and that if nothing works, if everything fails-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
A process.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Yes, there has to be a process. If everything fails, it is only then, you take this extreme step of going on strike. Transport is, in fact, essential to the life of the community. You cripple that - even if it is some legitimate concern that you have, then those must be addressed first. There must be discussions held and constructive engagement must be entered into. In the context of what is happening today, I do not believe that strike action is appropriate even as a last resort for the demands that these trade unions have put forward. That is a matter that concerns the economy of this country, the relationship this country has with other countries, the serious debt this country has been committed to and the Government's action to come out of that debt - a whole host of issues, not just a very narrow issue about Hambantota, Trincomalee or anything like that. It has to be looked at from broader concept.

These persons may be stakeholders; I do not deny that. They may be stakeholders, but there are many more stakeholders. In fact, the whole country, all the people of the country, are stakeholders in this and in order to achieve their narrow political objectives to resort to strike action is criminal and I am glad the Government, at least now, has taken swift action to declare it as an essential service. Declaring it as an essential service is not sufficient, but stern action must be taken to enforce the Proclamation that this is an essential service. Not only this, even the other areas that are essential to the life of the community must be treated as such and it is unfortunate that such action has to be resorted to. But, in the context where persons behave in this irresponsible manner, we believe the Government is left with no other option, but to use the law which provides for such action. Thank you.

[පූ.භා. 11.45]

ගරු අර්ජුන රණතුංග මහතා (බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Arjuna Ranatunga - Minister of Petroleum Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ අද ඉදිරිපත් කර තිබෙන යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න මට අවස්ථාවක් ලබා දීම ගැන මා සන්තෝෂ වනවා. මේ අත්‍යවශ්‍ය සේවා යෝජනාව ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට සම්බන්ධයි. පසු ගිය 24වැනි දා රාත්‍රියේ අගමැතිතුමා සහ ඇමතිවරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලායි මේ තීරණය ගත්තේ. මම මේ ගැන පසු ගිය දවස් කීපය තිස්සේ වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කළා. වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කරන එක අත්‍යවශ්‍ය දෙයක්. නමුත්, අවාසනාවකට වාගේ හම්බන්තොට තෙල් ටැංකි බදු දීමේ ප්‍රශ්නය මත වැඩ වර්ජනයකට යන්න වෘත්තීය සමිති තීරණය කර තිබෙනවා. මම අමාත්‍යවරයෙක් හැටියට පමණක් නොවෙයි, සාමාන්‍ය පුරවැසියෙකු හැටියටත් පෞද්ගලීකරණයට විරුද්ධ කෙනෙක්. නමුත් සමහර ආයතන තිබෙනවා, ඒවා ආයෝජකයෝ ගෙනැල්ලා

[ගරු අර්ජුන රණතුංග මහතා]

සංවර්ධනය කළ යුතුයි. විශේෂයෙන්ම අද මේ කාරණාව දිහා බලන කොට, අපි මීට වඩා දීර්ඝව හිතන්න ඕනෑ ප්‍රශ්න කීපයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අමාත්‍යාවරු හැටියට එක අතකින් අමාත්‍යාංශය ආරක්ෂා කරන ගමන්, අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතන ආරක්ෂා කරන ගමන්, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා ඒ අවශ්‍යතා ඉටු කරන ගමන්, ප්‍රධානම අරමුණ විය යුත්තේ, මේ රටේ මහ ජනතාවට කරදරයක් නොවන වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමයි. තමුන්නාන්සේලා දන්නවා පසු ගිය මාස කීපයක පටන් ඩෙංගු රෝගය අපේ රටේ දැඩි ලෙස ව්‍යාප්ත වීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන බව. ඒ වාගේම කුණුකසළ බැහැර කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. මෙවැනි අවස්ථාවක අපි ක්‍රියාත්මක වන කොට සලකා බැලිය යුතු කාරණා කීපයක් තිබෙනවා. මේ කාරණා නිසා ජීවිත කොච්චර නැති වුණාද කියන එක අපි කාටවත් හිතෙන්නේ නැතුව ඇති. අද රටේ පවතින ඉන්ධන බෙදා හැරීම පිළිබඳ ප්‍රශ්නය මීට වඩා දුර ගියා නම්, සමහර වෙලාවට අපේ දරුවන් පාසල්වලට යන ක්‍රමවේදයේද, සාමාන්‍ය මහ ජනතාවට ගමනාගමන ප්‍රශ්නද මතු වන්න තිබුණා. විශේෂයෙන්ම three wheelers ගනිමු. අද අපේ රටේ three wheelers ලක්ෂ 10කට වැඩිය තිබෙනවා. මේ three wheelersවලින් දවසේ ආදායම හොයා ගන්න මිනිස්සු ඉන්නේ. ඒ ගොල්ලන්ගේ ජීවිත, ඒ පවුල් ගැන හිතුවාද? ඒ විතරක් නොවෙයි, ඉස්පිරිතාලවලට එන ලෙඩ්ඩු. අපි කොහොමද මේ අය වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නේ? මෙවැනි ප්‍රශ්න කීපයක් දිහා අපි බලන්න ඕනෑ. එහෙම නැතුව පටු දේශපාලන අරමුණුවලින් වර්ජන ක්‍රියාත්මක කරන්න හොඳ නැහැ.

අපි දැක්කා, රෝහල්වල වැඩකටයුතු සෑහෙන දුරට අඩපණ වුණු බව. නමුත් හමුදාවටත්, ඒ වාගේම ජාතික සේවක සංගමයටත් මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. ඔවුන් පසුගිය දවස් දෙකේ තෙල් බෙදා හැරීමේ කටයුතු සඳහා සෑහෙන කාර්යභාරයක් කළා. එහි අවශ්‍යතාව අපි දැන ගන්න ඕනෑ. මොකද, මේ රටේ අපි මොන දේශපාලනය කළත්, මොන තීරණ ගත්තත්, ඒ ආයතන ආරක්ෂා කරනවා වාගේම මහජනතාවට පීඩා ගෙන දෙන වැඩ නොකළ යුතුයි. එසේ කරනවා නම්, ඇමතිවරයෙක් හැටියට එතැනදී මම ඕනෑම තීරණයක් ගන්න කැමැති කෙනෙක්. තමුන්නාන්සේලා දන්නවා, මම වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා හැටියට ඉන්නකොට සමහර ගිවිසුම්වලදී වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා, ඒවා වෙනස් කරන්න සෑහෙන වැඩ කොටසක් කළ බව. ඒ මා කරන දේ. අපේ ඉදිරි අනාගතය වෙනුවෙන් අපේ ජාතික සම්පත් ඉතිරි කරලා දෙන්න ඕනෑ කියන ඒ ක්‍රමවේදයේ අපි ඉන්නවා. අද ඉතාමත් නරක තත්ත්වයකට පත්වෙලා තිබෙන සමහර ආයතන තිබෙනවා. ඒවා ඉදිරියට ගෙන යනවා නම්, ආයෝජකයන් එක්ක අපට වැඩි වාසි තිබෙන ක්‍රමවේදයකට යන්න ඕනෑ. ඒ වාගේම මම කියන්න ඕනෑ, සමහර වෘත්තීය සමිති ඉතාමත් හොඳින් අපිත් එක්ක සාකච්ඡා කළ බව.

අපට ඊයේ 12.00 වෙනකොට මේ වැඩ වර්ජනය ඉවර කරන්න පුළුවන්කම තිබුණා. නමුත් අවාසනාවකට වාගේ යම් යම් දේශපාලන අත ගැසීම් නිසා මේ වැඩ වර්ජනය තවත් ඉදිරියට ගියා කියන එක මම කියන්න ඕනෑ. මම හුහක් දුරට හිතන්නේ සාකච්ඡාවලින් අපට හුහක් දේවල් විසඳා ගන්න පුළුවන් බවයි. මම වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා හැටියට ඉන්නකොට අපි වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කළා. සමහර කාරණා ඉතාම වැදගත් කරණා. අපි ඒවා පිළිබඳ සාකච්ඡා කරලා අවශ්‍ය තීරණ ලබලා දුන්නා. ඒවාගේම මම කියන්න ඕනෑ, සමහර වෘත්තීය සමිති නායකයන් දේශපාලන අතකොළු වෙලා සිටින බව. මම වරායේ ඉන්නකොටත් ඒ වාගේ හොර වෘත්තීය සමිති නායකයන් -තමන්ගේ වැඩ කර ගන්න- ජන බල නැති සමහර දේශපාලනඥයන්ගේ පස්සෙන් ගිහිල්ලා ක්‍රියාත්මක වුණා. ඒ වාගේ දූෂිත පුද්ගලයන් මම ඉවත් කළා. අපි වරායේ බිලියන 11ක ලාභයක් ලැබුවා. ඒ ක්‍රියාදාමය කළේ මේ රටේ අවශ්‍යතාව නිසා. මේ වෙලාවේ සමහර ජන බල නැති දේශපාලනඥයන් මට ඇඟිල්ල දික් කරනවා, මම ඇමතිකම් කරන්න ඕනෑ කොහොමද කියලා. මේ ඇමතිකම් සූදුවක් හැටියට කරන්න බැහැ; අශ්ව රේස් හැටියට කරන්න බැහැ. මේවා කරනකොට ආයතන දිහා බලන්න ඕනෑ; ඒ වාගේම ජනතාව දිහා බලන්න ඕනෑ.

එහෙම නැතුව මුදල විතරක් ඉස්සර කරගෙන රේස්කාරයන් වාගේ මට මේවා කරන්න බැහැ. මට මේ රටේ ජන බලයක් දීලා තිබෙනවා. මා ගම්පහ දිස්ත්‍රික්කයෙනුත්, කොළඹ දිස්ත්‍රික්කයෙනුත්, කලුතර දිස්ත්‍රික්කයෙනුත් ඡන්දය ඉල්ලා දිනලා තිබෙන්නේ මේ රටේ මහ ජනතාවගේ ඡන්දයෙනුයි. මා කවදාවත් ඒකට විරුද්ධ වන්නේ නැහැ. සමහර විට ඒ නිසා වෙන්න ඇති මට අද කොන්ද කෙළින් තබාගෙන කථා කරන්න පුළුවන් වන්නේ.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට අයිතිවෙලා තිබෙන දේවල් ඉදිරියේදීත් ආරක්ෂා කරන ගමන්, කවුරුන් මොන දේවල් කළත්, මා අමාත්‍යවරයා හැටියට ඉන්න කල් මේ රටේ මහ ජනතාවට පීඩා ගෙනදෙන කිසිම දෙයක් කරන්න ඉඩ දෙන්නේ නැහැයි කියන එකත් මා ඉතාමත් වග කීමෙන් කියන්න ඕනෑ.

අපි සාකච්ඡාවෙන් බොහෝ දේවල් කළා. මා අමාත්‍යවරයා හැටියට පත් වුණු අවස්ථාවේ සිට ඒකාබද්ධ වෘත්තීය සමිති සමඟ අපි කථා කළා. එහිදී ඉතාමත් හොඳ සාකච්ඡා පැවැත්වුණා. නමුත් අමතක කරන්න එපා, හම්බන්තොට වරායේ තිබෙන තෙල් ටැංකි තිබෙන්නේ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ නොවන බව. ඒවා ඉල්ලා ගන්න ක්‍රමවේදයක් තිබෙනවා. මා මේ සම්බන්ධයෙන් දැනුවත් කළා; කියා දුන්නා. නමුත් අවාසනාවකට වාගේ තමන්ට කරන්න පුළුවන් දේවල් මොනවාද, කරන්න බැරි දේවල් මොනවාද කියා දන්නේ නැති, මා ඉස්සෙල්ලා කියපු ජන බලයක් නැති දේශපාලනඥයන් මේවාට අත ගහලා මේවා විනාශ කරන්න හදනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, -

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
අනේ! මට බාධා කරන්න එපා. මා කාටවත් බාධා කරන්නේ නැහැ නේ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
"මයික්" එක දෙන්නේ නැහැ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක කථිකයාගේ කැමැත්ත නේ.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
එතුමාට ප්‍රශ්නයක් අහන්න අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමනි, අපි ඔබතුමාට ඉතාම ගරු කරනවා. මා අහන්න කැමැතියි, ජන බලයක් නැති පුද්ගලයන් කියා ඔබතුමා හඳුන්වන්නේ කවුද කියලා. ජාතික ලැයිස්තුවෙන් ආණ්ඩුවට පත්වෙලා ඉන්න අයද?

ගරු අර්ජුන රණතුංග මහතා
(මාණ්පුමිකු අර්ජූන රණතුංග)
(The Hon. Arjuna Ranatunga)
නැහැ. මෙහෙමයි. තොප්පිය කවුරුත් දමාගන්න අවශ්‍ය නැහැ. කැමැති අය තොප්පිය දමා ගත්තාවේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ ප්‍රශ්නයට ඔබතුමාට උත්තරයක් දෙනවාට වඩා මේ ප්‍රශ්නය ගැන අපි කථා කරන්න ඕනෑ. මා කෙළින් කථා කරන කෙනෙක්. මා භය නැතුව කථා කරන කෙනෙක්. ඇමති තනතුරුවලට වඩා මට අවශ්‍ය වන්නේ මේ රටේ මහ ජනතාවගේ අවශ්‍යතාවන් ඉෂ්ට කරන්නයි. ඒ වෙනුවෙන් ඕනෑම වෙලාවක තීරණ ගන්නා කෙනෙක් තමයි මම. අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමාත් එක්ක මේ තීරණය ගත්තේ වෙන එකක් නිසා නොවෙයි. පසු ගිය කාලයේ පාරවල් දිගේ මිනිසුන් මොන තරම් රස්තියාදු වුණාද කියලා අපි දැක්කා. අත්‍යවශ්‍ය සේවාවක් අවශ්‍ය වුණේ එම නිසායි. මා අද වුණත් ඉන්නේ සාකච්ඡාවලට අපි යා යුතුයි කියන මතයේයි. නමුත් ඒ සාකච්ඡා තුළින් ඉල්ලන හැම දෙයක්ම අපට දෙන්න බැරි වෙයි. හැම දාම පක්ෂ දේශපාලනය බදාගෙන, රටට අවශ්‍ය නැති, රටට විනාශයක් කරන දේශපාලන ක්‍රමයක් මේ රටේ තිබෙනවා. ඒක මම භය නැතුව කියනවා. ඉදිරියේදී මෙවැනි ප්‍රශ්න ඇති වෙනකොට දේශපාලනය ගාවගන්න එපා. මුලින්ම රටේ මිනිස්සු ගැන හිතන්න, ඊට පස්සේ ආයතන ගැන හිතන්න. එහෙම හිතලා ඊට පස්සේ අමාත්‍යාංශ ගැනත් හිතලා තීරණ ගන්න මම කවදාවත් පස්සට යන්නේ නැහැ කියන එකත් මම කියනවා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, පසු ගිය දවස් කිහිපයේදී විශාල විනාශයක් සිද්ධවෙලා තිබෙනවා. දැනට එම සංඛ්‍යා ලේඛන පිළිබඳව මට ඔබතුමන්ලාට කියන්නට බැහැ. නමුත්, සිදුවී තිබෙන පාඩුව සහ විනාශය ඉදිරි දින කිහිපයේදී මේ පාර්ලිමේන්තුව විතරක් නොවෙයි මහජනතාවත් දැනුවත් කරන බව කියන්න කැමැතියි. විශේෂයෙන්ම මහ ජනතාව පීඩාවට පත් වුණු අවස්ථාවේ ඉදිරිපත් වෙලා අපට ලබාදුන් සහයෝගය පිළිබඳව හමුදාවටත්, මගේ අමාත්‍යාංශයේ නිලධාරින්ටත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරින්ටත්, ඒ වාගේම ජාතික සේවක සංගමයේ සියලුම දෙනා සේවයට වාර්තා කර ලබාදුන් සහයෝගයටත් මගේ ස්තුතිය නැවත වරක් පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු පන්තුල කුණවර්තන)
(The Hon. Bandula Gunawardane)

නැඟී සිටියේය.
එழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. දැන් ඇමතිතුමාගේ කථාව ඉවරයි නේ. ඒ නිසා දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා.

[පූ.භා. 11.55]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කීර්තිමත් ජයග්‍රහණයක් ලබාගනිමින් ලෝක ක්‍රිකට් කුසලානය ලංකාවට ගෙනාපු අර්ජුන රණතුංග මැතිතුමා අදහස් පළ කිරීමෙන් පසු මට කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම පළමු කොටම ඉතාමත් සතුටු වෙනවා. "Captain Cool" තවමත් cool බව,-

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
නෑ, දැන් ටිකක් hot.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
නැහැ, තවමත් cool බව අදත් ප්‍රකාශ වුණා. එතුමාගේ අදහස් එක්ක අපි සම්පූර්ණයෙන් එකඟ නොවෙන්න පුළුවන්. නමුත්, වරාය පැත්තෙන් ගත්තොත්, යම් වැදගත් අවස්ථාවලදී නිර්භයව කටයුතු කරන්න පුළුවන් විධියේ අදහස් රාශියක් එතුමා ඉදිරිපත් කළ බව අපි ඉතා හොඳින් දන්නවා.

අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් පසු ගිය 25වැනි දින ජනාධිපති ලේකම් හරහා පනවන ලද මෙම නියෝගය තුළින්, පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥා පනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, භාරදීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම අත්‍යවශ්‍ය සේවාවන් හැටියට දක්වා තිබෙනවා. එය අත්‍යවශ්‍ය නියෝගයක් හැටියටයි පනවා තිබෙන්නේ. එම නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කියන ප්‍රධාන ආයතනයට පමණක් නොව, රජයට ලංකාව පුරා කේන්ද්‍රීයව සෑම තැනකටම මහජන ආරක්ෂක පනත ප්‍රකාශයට පත්කරන්න සිද්ධ වුණා. මේ රජය දෙවැනි වරට තමයි මහජන ආරක්ෂක පනත ප්‍රකාශයට පත්කරන්නේ.

මීතොටමුල්ලේ කුණු කන්ද කඩා වැටිලා මිනිස්සු මිය ගියාම, මහජනයා මේ ගැන කථා කරනකොට රජයට ප්‍රශ්නය විසඳා ගන්න බැරිව මහජන ආරක්ෂක පනත පැනෙව්වා. එය පනවලා අනුමැතිය ඉල්ලන්න පාර්ලිමේන්තුවට ආවා. දැන් තෙල් සංස්ථාවේ ප්‍රශ්නය විසඳන්න මහජන ආරක්ෂක පනත දෙවැනි වරට පනවනවා. ව්‍යක්තීය සමිති සමඟ සාකච්ඡා මාර්ගයකට පැමිණ ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරන්න පුළුවන්කම තිබෙද්දී, ඒ සාකච්ඡාවේ සෑම දෙයම සාර්ථක නොවුණත් වැඩ වර්ජන යද්දී අත්‍යවශ්‍ය සේවාවන්ට ඉන්ධන සැපයීමට කටයුතු කරන්න ව්‍යක්තීය සමිතිත් එකඟ වුණා. එතකොට, මහජන ආරක්ෂක පනතක් ප්‍රකාශයට පත් කළේ මොකටද? එක පැත්තකින් මහජන ආරක්ෂක පනත යොදා ගන්නේ, හමුදාව යොදවා ගැනීමට. අනෙක් පැත්තෙන් ව්‍යක්තීය සමිති ක්‍රියාමාර්ග කුඩු පට්ටම් කිරීමට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "කිසිම සිද්ධියක් නැහැ." කියලා ඊයේ අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. අද වන විට මුළු රටත්, ලෝකයත්, ජනාධිපතිතුමාත් දන්නවා, ඊයේ ව්‍යක්තීය සමිති නායකයෝ සියලු දෙනා අත් අඩංගුවට ගත්තා කියලා. එතැන හිටපු තෙල් සංස්ථා සේවකයෝ මහජන ආරක්ෂක පනත යටතේ අත් අඩංගුවට ගත්තා. මෙන්න මේකටයි දැන් මේක

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

ඉල්ලන්නේ. පොලීසිය ඇතුළට අරගෙන ගියා. මොන පොලීසිය ඉන්නවාද දන්නේ නැහැ. සාමාන්‍යයෙන් අදාළ පොලීසිය වන්නේ, වැල්ලම්පිටිය පොලීසියයි. වැල්ලම්පිටිය පොලීසිය නොවෙයි, වැලිකඩ පොලීසියෙන් අත් අඩංගුවට ගත්තේ. ඒක ඇතුළේදී සිද්ධීන් රාශියක් සිදු වුණා. අපි ඒ අවස්ථාවේදී අගමැතිතුමාට කිව්වා, "ලේ හලනවා." කියලා. එතුමා කිව්වා, "ලේ හලන්නේ නැහැ." කියලා. අද රට පුරා ලෝකය පුරා ලේ හලන, පොලු අරගෙන ආව අයගේ ඡායාරූපයන් ප්‍රසිද්ධ වෙලා තිබෙනවා. වරාය හා නාවික කටයුතු හිටපු අමාත්‍යතුමා මගෙත් එක්ක එකඟ වෙයි. මේ මැරයෝම තමයි හම්බන්තොට ගිහිල්ලා ගැහුවේ. හම්බන්තොටත් ඒ ඡායාරූප තිබෙනවා. සභානායකතුමා නැතිටලා ලජ්ජා නැතිව මේ සභාවට කියනවා, "එහෙම සිද්ධියක් වෙලා නැහැ." කියලා. අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය මළගමට ගමන් කරමින් තිබෙන වෙලාවකදී ඒකාබද්ධ විපක්ෂය ඉතා ඕනෑකමින් කියනවා, මහජන ආරක්ෂක පනත පැනවීම ඉල්ලා අස් කර ගන්න කියලා. අපි විරුද්ධයි. දැන් මේ ගැන ව්‍යක්තිය සමිති සමඟ සාකච්ඡා කරලා, ප්‍රශ්නය විසඳා සාමකාමී ක්‍රියාමාර්ගයකට ගමන් කරන්නට පුළුවන් බව ගරු සභාපතිතුමාත් දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමාත් දන්නවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මට විනාඩි 10යි තිබෙන්නේ. මේ වෙලාවේ ඉඩ දෙන්න එපා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඔබතුමාගෙන් මම අහන්නේ, රතුපස්වලට,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ. ඒක අදාළ නැහැ ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මැරයෝ අරගෙන ගිය වැන් එකක් ගම්පහින් තමයි ආවේ. [බාධා කිරීම්] අපි දන්නවා. ලජ්ජා නැතිවයි කථා කරන්නේ. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ අපේ මන්ත්‍රී කණ්ඩායමක් වැලිකඩ පොලීසියට ගියා. වැලිකඩ පොලීසියට ගියේ අත් අඩංගුවට අරගෙන ඉන්න ව්‍යක්තිය සමිති නායකයන් බලන්න. ව්‍යක්තිය සමිති නායකයන්ට පහර දීලා, තර්ජනය කරලා තිබුණා; ජීවිත තර්ජන එල්ල කරලා තිබුණා. මෙන්න, යහ පාලන ප්‍රජාතන්ත්‍රවාදය! දැන් රෙද්ද ගැලවිලා. දැන් යහ පාලන ප්‍රජාතන්ත්‍රවාදයේ රෙද්ද ගැලවිලා! දැන් ඉතුරු වෙලා තිබෙන්නේ ආයුධ බලයෙන් ආණ්ඩු කිරීම පමණයි. මහජන බලයක් නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මගේ වෙලාව ගත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ වැලිකඩ පොලිස් ස්ථානය ඇතුළේ හිටියා, ශ්‍රී ලංකා නිදහස් ව්‍යක්තීය සමිති සම්මේලනයේ සභාපති ලෙස්ලි දේවේන්ද්‍ර මහතා. ලෙස්ලි දේවේන්ද්‍ර මහතා ඇවිල්ලා හිටියේ, ව්‍යක්තීය සමිති නායකයන් සහ ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යක්තීය සමිති නායකයා අපත් එක්ක වැලිකඩ පොලීසියේ හිටියා. ඇප දීලා කූඩුවෙන් එළියට අරගෙන ඔහුව ජනාධිපතිතුමා ළඟට එක්කගෙන යන්න ඉඩ දුන්නේ නැහැ. ඒකට මැරයෝ ඉඩ දුන්නේ නැහැ. මැරයන්ගේ මැරයෝ ඉඩ දුන්නේ නැහැ. මැරයන්ගේ මැරයෝ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යක්තීය සමිති නායකයින්ට ජනාධිපතිතුමා හමු වෙලා සාකච්ඡා කරන්න ඉඩ ලැබුණේ නැහැ. මෙන්න බලන්න, අද ආණ්ඩුව ඇතුළේ ඇති වෙලා තිබෙන මැර අරගළය. ආණ්ඩුව ඇතුළේ මැර අරගළයක් තිබෙනවා. අපි කියනවා, ප්‍රජාතන්ත්‍රවාදය ඉතා භයානක තත්ත්වයකට පත් වෙලා තිබෙනවා කියලා. මගේ වෙලාව අවසන් වන නිසා මා සඳහන් කරන්න කැමැතියි,-

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, මේ විවාදයට බාධා කරන අරමුණින් නම් point of Order ගෙනෙන්න එපා. ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අවස්ථාව ලබා දීම ගැන. මෙතුමන්ලා ඊයේ වැලිකඩ පොලීසියට ගිහිල්ලා පොලිස් ස්ථානාධිපතිතුමාටත් තර්ජනය කරලා-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ- [බාධා කිරීම්] අපි අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මළගමට- [බාධා කිරීම්] අපි අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයේ මළගමට ගමන් කරමින් තිබෙන බව මා ප්‍රකාශ කරන්න ඕනෑ. [බාධා කිරීම්] මේ ආණ්ඩුව පළාත් පාලන ආයතන 330ක මැතිවරණය පවත්වන්නේ නැහැ.

ඒකාධිපති පාලනයක් ගෙන යනවා. පළාත් සභා මැතිවරණය පවත්වන්නේ නැහැ කියලා මේ ඒකාධිපති කැබිනට් මණ්ඩලය

තීරණය කරලා තිබෙනවා. ඡන්දය නැති ප්‍රජාතන්ත්‍රවාදය ඒකාධිපතිවාදය මිසක්, වෙන මොකක්ද? ඒකාධිපතිවාදය ගෙන යන්න තමයි වැඩ කරන ජනතාව, වැඩ කරන ජනතාවගේ සංවිධාන වන ව්‍යක්තීය සමිති සමඟ යම් ප්‍රශ්නයක් ඉදිරිපත් කළාම, ඒක මෙල්ල කරන්න මහජන ආරක්ෂක පනත පනවන්නේ. [බාධා කිරීම්] ආණ්ඩුව අද වැටී තිබෙන තත්ත්වය ගැන ලජ්ජයි. ආණ්ඩුවට මහජන සහයෝගයක් නැහැ. [බාධා කිරීම්] අද සයිටම් ප්‍රශ්නය විසඳන්නේ නැහැ. සයිටම් ප්‍රශ්නය විසඳන්නේ නැති අද සෞඛ්‍ය ඇමතිතුමා පුවත්පතකට ප්‍රකාශයක් කරලා තිබෙනවා, රාජපක්ෂවරු ඔක්කෝම අත් අඩංගුවට ගන්නවා කියලා. එයා අධිකරණ ඇමතිද? එයාට පුළුවන්ද, එහෙම ප්‍රකාශයක් කරන්න? ලජ්ජා නැති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ලජ්ජා නැති

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඒකයි කියන්න තිබෙන්නේ. [ඝෝෂා කිරීම්] ලජ්ජා නැති ඇමතිවරයෙක්. එහෙම ප්‍රකාශ කරන්නේ කොහොමද, රටේ නීතිය තමන්ගේ සාක්කුවට දමලා? [ඝෝෂා කිරීම්] රටේ නීතිය තමන්ගේ සාක්කුවට අරගෙන ප්‍රකාශයක් නිකුත් කරනවා මේ රටේ දේශපාලන නායකයෝ, හිටපු රාජ්‍ය නායකයෝ අත් අඩංගුවට ගන්නවාය කියලා. මෙන්න රටේ තත්ත්වය.

මේ නිසා මගේ කථාව අවසන් කරන්නට පෙර යමක් කියන්න අවශ්‍යයි. මහජන ආරක්ෂක පනත මෙහෙම සම්මත කිරීම සමඟ ඊයේ පාර්ලිමේන්තුවේ - [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දිනයට නියමිතව තිබුණු පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4 සහ 5 බලහත්කාරයෙන් සම්මත කළා. අපි ඡන්ද විමසීමක් ඉල්ලුවා. නමුත් බලහත්කාරයෙන් එම නියමයන් සම්මත කළා. කථානායකතුමා ඔය ආසනයේ හිඳිමින් පනත් කෙටුම්පතක් සම්මත කළා. අපි ඡන්දයක් ඉල්ලුවා. නමුත් ඡන්දයක් විමසීමට අවස්ථාවක් දුන්නේ නැහැ. [ඝෝෂා කිරීම්] පාර්ලිමේන්තුව තුළ මේ වාගේ හැසිරෙනවා නම්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ඉතාම භයානක තත්ත්වයකට පත් වෙලා තිබෙන බව නිශ්ශබ්දව සිටින විපක්ෂ නායකතුමාටත් මම මතක් කරන්න කැමැතියි. [බාධා කිරීම්] පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අද මේ විධියේ මළ ගමකට ගමන් කරනකොට, විරුද්ධ පක්ෂ නායකකමක් අල්ලා ගෙන ඉන්න ඊනියා නායක කට වහගෙන ඉන්නවා. [ඝෝෂා කිරීම්] කට වහගෙන ඉන්නවා. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂ මන්ත්‍රී කණ්ඩායමේ 52දෙනා වෙනුවෙන් අපි ඉතාම ඕනෑකමින් - [බාධා කිරීම්] අපි අගමැතිතුමාගෙන් නම් ඉල්ලන්නේ නැහැ. අගමැතිතුමා කැමැතියි, ප්‍රජාතන්ත්‍රවාදය යට කරලා යූඇන්පී ආණ්ඩුවක් බලෙන් ගෙනි යන්න. අපි ජනාධිපතිතුමාට කියනවා, මේ යෝජනාව අයින් කර ගන්නය කියලා. [බාධා කිරීම්] මේ යෝජනාව අයින් කර ගන්න. මැරයෝ ගහන්නේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ට. තෝර-තෝරා ගැහුවේ ශ්‍රී ලංකා ව්‍යක්තීය සමිති නියෝජිතයන්ට.

ඒ කියන්නේ යූඑන්පී එකෙන් තමයි මැරයන් එව්වේ. යූඑන්පී මැරයෝ තමයි ආවේ, වෙන මැරයන් නොවෙයි. එම නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, යූඑන්පීයත් අතර මැර අරගළයක් ආණ්ඩු බලය සඳහා අද තිබෙනවා. අපි වැටිලා ඉන්නේ ඒ භයානක ප්‍රජාතන්ත්‍රවාදී මැරකම නිසායි. මේ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න ඊයේ දින පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ විෂයය අංක 1, 2, 3, 4 සහ 5 යටතේ තිබුණු විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ වූ නියමයන් පහක් නීති විරෝධීව සම්මත කළ බව ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මා සඳහන් කරනවා. අවසානයේ මට කියන්න තිබෙන්නේ, the battle for democracy has now been awakened in the country. The Government has failed on all fronts including governing economic front and day-to-day management. It is better for you to call for the elections today in this country. වරාය ගැන හෙට විවාද කරන නිසා මම හෙට වරාය ගැන කියන්නම්. අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනාව ඉල්ලා අස් කර ගන්නා ලෙසත් ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මා සඳහන් කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා මගේ නම සඳහන් කළා. මා එතුමාට සඳහන් කරන්න කැමැතියි, අපි ගත් ක්‍රියා මාර්ගයට ජනතාවගේ සම්පූර්ණ ආශීර්වාදය තිබෙන බව. [බාධා කිරීම්] මුළු රටම ආණ්ඩුවට ප්‍රශංසා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා.

[අ.භා. 12.07]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මා මේ කරුණ කියන්න ඕනෑ. මේ සභාවේ සිටින මන්ත්‍රීවරු කිහිප දෙනෙකුත්, එක්තරා කුඩු මාධ්‍යයකුත්, තවත් සමාජ මාධ්‍ය ජාල කිහිපයකුත් ඊයේ කොළොන්නාව ඉන්ධන ගබඩා සංකීර්ණය අබියස සිදු වූ සිදුවීම මගේ කර පිටින් යවන්න, මා මැරයෙකු කරන්න ගන්නා උත්සාහය තරයේ හෙළා දකිනවාය කියන එක මා පැහැදිලිව කියන්න ඕනෑ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න පුරුදු වන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගංවතුර ගැලුවත් අල්ලා ගන්නේ මාව, කුණු කන්ද නාය ගියත් අල්ලා ගන්නේ මාව, Petroleum Corporation එකට ගැහුවත් අල්ලා ගන්නේ මාව. හැබැයි, මම එකක් කියන්න ඕනෑ. ගංවතුර ගැලුවාම ඒකටත් මා අල්ලා ගත් කට්ටිය, මම පවුල් 27,000කට ආධාර අරගෙන දුන්නාම ඒ ගැන කථා කරන්නේ නැහැ. අවසානයේදී කුණු කන්ද වෙනුවෙන් කඳුළු හලපු කට්ටිය කවුරුත් යන්න ගියා. ඒ මිනිසුන් වෙනුවෙන් ආධාර අරගෙන දෙන්න ඉතිරි වුණේ මා පමණයි. ඕනෑ නම් ඒ සම්බන්ධයෙන් අද වුණත් මීතොටමුල්ලෙන් ගිහිල්ලා අහලා බලන්න. එම නිසා මා පැහැදිලිව එකක් කියන්න ඕනෑ. අපේ

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

රජය ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරලා යහ පාලනය ක්‍රියාත්මක කර ගෙන යනකොට සුදු වැන්වලින් මිනිසුන් උස්සපු, මාධ්‍යවේදීන් ඝාතනය කරපු, හලාවත ධීවරයන්ට වෙඩි තැබූ, කටුනායක රොෂෙන් චානක මැරූ මේ කට්ටිය අද කිඹුල් කඳුළු හෙළීම ගැන ඉස්සරහා පැත්තෙන් නොවෙයි, පිටුපස පැත්තෙන් හිනාවක් අපට තිබෙන්නේ. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර මගේ කථාවට බාධා කරන්න එපා කියන්න. [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුද ගැහුවේ?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
තමුන්නාන්සේලාට ප්‍රජාතන්ත්‍රවාදය පුරුදු නැහැ. අහගෙන ඉන්න පුරුදු වන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
විපක්ෂ නායකකම නැති ශෝකයෙන්- [බාධා කිරීම්] පොඩ්ඩක් අහගෙන ඉන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේගොල්ලෝ කෑගහනවා නම් මට කථා කරන්න බැහැ. [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තු මන්ත්‍රී මරික්කාර්" කියලා අපි කිව්වේ නැහැ. අපි කිව්වේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ඇලෝසියස්- [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

තමයි මේ කථා කරන්නේ. ඉතින් ඒ වාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ගැන මට කථා කරන්න දෙයක් නැහැ. අපි එකක් පැහැදිලිව කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව ආවාට පසු සංවිධානාත්මකව උද්ඝෝෂණ හා වැඩ වර්ජන හරහා රටේ ආර්ථිකයත්, රටත් අකර්මණ්‍ය කිරීමේ ව්‍යාපාරයක් යනවා. පසු ගිය ජනවාරි 01වැනිදා ඉඳලා ජුනි මාසයේ 30වැනිදා විතර වන තෙක් ගත්තොත් මේ රටේ වැඩ වර්ජන හා උද්ඝෝෂණ 1,100කට ආසන්න ප්‍රමාණයක් සිදුවෙලා තිබෙනවා. ඒ එකකටවත් ප්‍රහාර එල්ලවෙලා නැහැ. මේවා හරහා වුණේ රටේ ආර්ථිකය හා ජන ජීවිතය අකර්මණ්‍ය වීමයි. ඊයේත් පෙරේදාත් ඛනිජ තෙල් සංස්ථාවේ වැඩ වර්ජනය හරහාත් කළේ මොකක්ද? මේ ඛනිජ තෙල් සංස්ථාවේ වැඩ වර්ජනය සාධාරණද? වරායට අයිති දෙයක් සම්බන්ධයෙන් විරෝධය පාමින් ඔවුන් කරන්නේ මොකක්ද? ඛනිජ තෙල් සංස්ථාවේ බවුසර්වල හුළං ඇරලා, ඩීසල්, පෙට්‍රල්, ලාම්පුතෙල් නළවල වෑල් මාරු කරලා, දේපොළවලට හානි කරලා තමයි මේ දේශ ද්‍රෝහීන් රට වෙනුවෙන් උද්ඝෝෂණ කරන්නේ. ඒ අය දේශ ද්‍රෝහී වෙලා කථා කරන කොට හමුදාව විරෝදාරයි. ඊයේ ඛනිජ තෙල් සංස්ථාවට අයිති රජයේ දේපොළ ආරක්ෂා කරලා මේ රටේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරන්න, තෙල් බෙදා හැරීම සඳහා අවශ්‍ය ආරක්ෂාව ලබා දෙන්න හමුදාව ගියාම අන්න ඒ අය ද්‍රෝහීන් වුණා. පොලිස් නිලධාරීන් ආරක්ෂාව වෙනුවෙන් පෙනී සිටියාම අන්න ඒ අය ද්‍රෝහීන් වුණා.

අපි තව එකක් පැහැදිලිව කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් වැඩ වර්ජනයක් කරද්දී කලින් සාකච්ඡා කරලා දැනුම් දීම් කරලා තමයි කරන්නේ. මේක එක දවසින් කළේ. එක දවසින් කරන්න මේ වැඩ වර්ජනය පිටිපස්සේ සිට එය මෙහෙයවපු අය කවුද කියලා අපි දන්නවා. මේක කළේ කොහොමද කියලා දන්නවා. ඊයේ මේ අවාසනාවන්ත සිද්ධිය වුණේ කොහොමද කියලා වීඩියෝ පට අර ගෙන හරියට බලන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඊයේ මොකද වුණේ? මීතොටමුල්ල, දෙමගොඩ ජනතාවගේ දරුවන් ඉස්කෝල ඇරිලා එක්ක ගෙන එන කොට පාර වහලා. ඒක අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ වරදක්. පාර වහලා, බ්ලොක් කර ගෙන ඉන්නකොට ඒ ජනතාවට එතැනින් යන්න බැරි වුණා. ඒ වාගේම ඒ පළාතේ ඉන්න ගොඩාක් අය ත්‍රී වීලර් රථ එළවන, ස්වයං රැකියා කරන ජනතාව. ඔවුන්ගේ ආදායම් මාර්ග ඇණහිටියා, දරු මල්ලන්ට කන්න දෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. මුළු රටේම ඩෙංගු ප්‍රශ්නය තිබෙනවා. පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වාර විභාග තිබෙනවා. මේවා ගැන ශත පහක තරම් තැකීමක් කරන්නේ නැතිව රට අකර්මණ්‍ය කරලා තමන්ගේ දේශපාලන අභිමතාර්ථ මුදුන්පත් කර ගන්න තමයි ඒ අය උත්සාහ කළේ. දැන් මේ කෑ ගහන්නේ වෙන මොකකටවත් නොවෙයි.

මීට කලින් තිබුණු උද්ඝෝෂණවලින් වාගේ රට අකර්මණ්‍ය කරන්න බැරි වුණා. තෙල් බවුසර් එළියට ගියා; උද්ඝෝෂණය නතර වුණා. මහ ජනතාව පිළිගත්තා, මේක නිවැරැදි වැඩක්; හොඳ වැඩක් කියලා. ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, ඊයේ මේ සිදුවීම මේ රටේ සාමාන්‍ය ජනතාවගේ නැගිටීමේ පළමු ආරම්භය කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මොකද, ආණ්ඩුව හුරතල් කරනවා නේ සියල්ලන්වම. ආණ්ඩුව, "ප්‍රජාතන්ත්‍රවාදය, යහ පාලනය" කියලා හුරතල් කරනවා. ඒ නිසා සාමාන්‍ය ජනතාව නැඟිට්ටා. මිනිසුන් මොනවාද කරන්නේ කියලා බලන්න හෙට තව උද්ඝෝෂණ පටන් ගන්න කෝ. [බාධා කිරීම්] ඒ නිසා අපි එකක් පැහැදිලිව කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගංවතුරෙන් ගැහුවත්, කුණු කන්දෙන් ගැහුවත්, පෙට්‍රල්වලින් ගැහුවත්, හෙට තවත් මොනවායින් හෝ ගැහුවත් මරික්කාර් මොනවාද කරන්නේ කියලා කොළොන්නාවේ ජනතාව දන්නවා. මේ ගහන්නේ ඇයි? අවුරුදු විස්සකට පස්සේ කොළොන්නාව දියුණු කර ගෙන, කොළොන්නාව සංවර්ධනය කර ගෙන ඊළඟ මැතිවරණයට යන කොට ඇපත් නැති වෙන කට්ටියයි මෙහෙම ගහන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා, මම මැරයන් දමලා ගස්සවනවා කියලා. විමල් වීරවංශ මන්ත්‍රීතුමා එහෙම කිව්වා නම් මම ඉතා පැහැදිලිව කියනවා, කොළඹ දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක් වෙලා ඉඳලා සත පහක වැඩක් කොළොන්නාවට නොකර, කොළොන්නාවේ සංවර්ධනය බලා ගන්න බැරිව මේ කෑ ගහනවා කියලා. මා ඉතා පැහැදිලිව කියනවා, අපට පාස්පෝට් චෝදනා නැහැ; අපට ඥාති සංග්‍රහ චෝදනා නැහැ කියලා. අපට තිබෙන්නේ රටේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කළාය කියන චෝදනාවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ. මගේ අත් දෙකම පිරිසිදුයි; ඇඟිලි දහයම පිරිසිදුයි. අපි ළඟ මැරයිනුත් නැහැ; හොරුත් නැහැ; කුඩඩොත් නැහැ; හොරකම් කරපු එවුනුත් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය තුළයි අපේ දේශපාලන ගමන තිබෙන්නේ කියමින් මගේ කථාව අවසාන කරනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා. ඊට පෙර ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නම සඳහන් කරලා එතුමා අසත්‍ය ප්‍රකාශයක් කළා. [බාධා කිරීමක්] කට වහගෙන ඉන්න කියන්න කෝ අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඇලෝසියස්ගේ සල්ලිවලට කහිනවා.

[බාධා කිරීම්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේ පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළේ, "මරික්කාර් කියන මැරයාගේ ගෝලයෝ දමලයි ගැහුවේ" කියලායි. ඒ මෙතුමා නම්, මට කරන්න දෙයක් නැහැ. මම කිව්වේ 'මරික්කාර්' කියලා මැරයෙක් ගැනයි. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පැහැදිලියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මන්ත්‍රී කෙනෙක් ගැන නොවෙයි. ඒක ගැළපෙන හින්දා මෙතුමා ඔළුවට දමා ගෙන. ඒකට මම මොනවා කරන්නද? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු විජිත හේරත් මැතිතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මරික්කාර් මැතිතුමනි, ඔබතුමාව නිර්දෝෂී කළා නේ; ඔබතුමා ගැන එහෙම කියලා නැහැ නේ. ඒ නිසා ඔබතුමා කලබල වෙන්න එපා.

[අ.භා. 12.14]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේදී මුදල් අමාත්‍යාංශයේ බදු පැනවීමට අදාළ ගැසට් නිවේදන කිහිපයක් ඉදිරිපත් වුණා. ඒ වාගේම, ජාතිය ගොඩනැඟීමේ බදු ප්‍රමාණය වැඩි කිරීමක් සඳහන් පනත් කෙටුම්පතක් ඉදිරිපත් වුණා. විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි, ඉතා පැහැදිලිව, ඒ පනත් කෙටුම්පත්වලට බෙදීමක් ගරු මූලාසනයෙන් ඉල්ලා සිටියා. නමුත් කියන්න කනගාටුයි, මූලාසනයෙන් - ගරු කථානායකතුමාගේ පැත්තෙන්- ඒකට කිසිදු අවස්ථාවක් දුන්නේ නැහැ. ලේකම් මණ්ඩලයටත් වග කීමක් තිබුණා, ඒ අවස්ථාව ලබා දෙන්න. නමුත්, ඒ අවස්ථාව ලබා දුන්නේ නැහැ. ඒ නිසා ඒ පනතට අදාළ නියමයන් සම්මත කර ගත්තේ ඉතාම නීති විරෝධී විධියටයි. ඒක සම්පූර්ණ වැරැදියි. ඔබතුමන්ලාම පාර්ලිමේන්තු

[ගරු විජිත හේරත් මහතා]

ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. නමුත්, ගරු අගමැතිතුමාත් සිටියදීම ඒ ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩේ සිද්ධ වුණා. එසේ නොකර, ඒ සඳහා ඡන්ද විමසීමකට යන්න පැහැදිලිවම අවස්ථාවක් දිය යුතුව තිබුණා. මොකද, ඒවා මේ රටේ ජනතාව මත පනවපු බදු. ඒ විධියට ජනතාව මත පනවපු බදුවලට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරන්න අපට ඉඩක් දුන්නේ නැහැ. ඒ නිසා එයට අපේ බලවත් විරෝධය මේ අවස්ථාවේ පළමුවෙන්ම ප්‍රකාශයට පත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ ගැසට් නිවේදනය නිකුත් කරමින්, තෙල් බෙදා හැරීම හදිසි අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කළා. මෙතැනදී ඉතා පැහැදිලිව මේ වෘත්තීය සමිති දිගින් දිගටම ආණ්ඩුවට බලපෑම් කළා, ආණ්ඩුවෙන් ඉල්ලා සිටියා, "හම්බන්තොට වරායේ තෙල් බෙදා හැරීම, සහ තෙල් ටැංකි ටික චයිනා මර්චන්ට් සමාගමට පවරා දෙන්න එපා; ඒ පවරා දෙන්න ගිවිසුම් අත්සන් කරන කොට අඩුම ගණනේ ඒ ගිවිසුම්වල තිබෙන කරුණු පිළිබඳව වෘත්තීය සමිති විධියට මේ රටේ ජනතාවට දැන ගන්න අයිතියක් තිබෙනවා; ඒ ගිවිසුම්වල තිබෙන්නේ මොනවාද කියන එක පැහැදිලිව අපිට ඉදිරිපත් කරන්න" කියලා.

අපි මහජන නියෝජිතයෝ විධියට පාර්ලිමේන්තුවේ ඉල්ලා සිටියා, මේ ගිවිසුම පාර්ලිමේන්තුවට ගෙනෙන්න; පාර්ලිමේන්තුවේ විවාද කරන්න; ඒ විධියට විවාදයට ලක් කරලා එහි තිබෙන රටට අහිතකර වගන්ති ඉවත් කරන්න අවස්ථාවක් දෙන්න කියලා. ඉතා පැහැදිලිව මේ රටේ ජනතාව කියන්නේ, "හම්බන්තොට වරායේ තෙල් ටැංකි කිසිදු විදේශ රටකට, විදේශ සමාගමකට පවරා දෙන්න එපා; ඒවා පවත්වා ගෙන යාමේ හැකියාව මේ රටේ ආණ්ඩුවට, මේ රටේ ජනතාවට තිබෙනවා. ඒක ජාතික සම්පතක්. ඒ ජාතික සම්පත කිසිදු ආකාරයකින් කිසිදු සමාගමකට විකුණන්න, පවරන්න, බදු දෙන්න එපා" කියලායි. නමුත් එය නොසලකා ආණ්ඩුව ඉතාම අත්තනෝමතික විධියට මේ කටයුත්තට මූලාරම්භය තැබුවා. පසු ගිය සෙනසුරාදා හැන්දෑව වන කොට කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් වනවා කියන ආරංචිය ආවා. ඒ කැබිනට් පත්‍රිකාව අප අතට ආවා; වෘත්තීය සමිති අතට ආවා. ඒ නිසා තමයි ඉක්මනින් -ඉරිදා වන කොට- වෘත්තීය සමිති ඒකාබද්ධ සාකච්ඡාවක් කැඳෙව්වේ. ඒ ඒකාබද්ධ සාකච්ඡාවේදී ඉතා පැහැදිලිව තීන්දුවක් ගත්තා. ආණ්ඩුව කලින් දුන් පොරොන්දු කඩ කරපු නිසා, වෘත්තීය සමිතිත් එක්ක සාකච්ඡා කරන්නේ නැතිව, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතිව හදිසියේ, තකහණියේ කැබිනට් පත්‍රිකාවක් විධියට ගෙනැල්ලා ගිවිසුම සම්මත කරගන්න යන කොට ඒකට විරෝධය දක්වන්න ඕනෑ කියන ප්‍රජාතන්ත්‍රවාදී වෘත්තීය සමිති අයිතිය වෙනුවෙන් ඒ අය තීන්දුවක් ගත්තා. ඒ අනුව තමයි එදා -25වන දා- ඒ සේවකයන් වැඩ වර්ජනයක් කැඳෙව්වේ. ඒ වැඩ වර්ජනය ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වුණා. ආණ්ඩුව ඒ වැඩ වර්ජනයට පදනම් වූ මූලික හේතුවලට උත්තර සැපයුවේ නැහැ. ආණ්ඩුව එය මර්දනය කරන්න උත්සාහ කළේ, ඉතාම නිර්ලජ්ජිත විධියටයි; නින්දිත විධියටයි. ඇත්තටම මේ ගැසට් නිවේදනය නොවෙයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ.

ගැසට් නිවේදනයකට අනුව අත්‍යවශ්‍ය සේවාවක් ප්‍රකාශයට පත් කළාම එකී අත්‍යවශ්‍ය සේවාව සඳහා හමුදාව මැදිහත් වන ආකාරයකුත් තිබෙනවා. ඉතිහාසයේ මීට දශක ගණනාවකට කලින් බනිජ තෙල් නීතිගත සංස්ථාවේම සේවකයන් මෙවැනි වෘත්තීය සමිති ක්‍රියා මාර්ගයකට ගියාම මොකක්ද කළේ? හමුදාව ඇවිල්ලා පළමුවෙන්ම කරන්නේ සේවකයන්ට ඉවත් වන්න කියා දැන්වීම් කරන එකයි; ඒ සේවකයන් ඉවත් කරන එකයි. සේවකයන් වැඩ කරන්න සූදානම් නැත්නම් හමුදාවේ මැදිහත් වීමෙන් ඒ සේවකයන් එතැනින් ඉවත් කරලා ඊට පසුව අලුතින් සේවකයන් බඳවා ගන්නවා. එසේ බඳවා ගත් සේවකයන් බනිජ තෙල් නීතිගත සංස්ථාවේ තවමත් සිටිනවා. අදත් ඔවුන්ට කියන්නේ "Army batch" කියලායි. එදා මොරටුව විශ්වවිද්‍යාලයේ NDT පාඨමාලාව හදාරපු අය රස්සා නැති නිසා -එවැනි තත්ත්වයක් යටතේ- රැකියාවට බැඳුණා. "Army batch" නමින් අදත් ඒ අය එහි සේවකයන් විධියට සිටිනවා. එය තමයි මෙවැනි ගැසට් නිවේදනවලට අනුව හමුදාව මැදිහත් වීමේ සම්ප්‍රදාය වෙලා තිබුණේ. ඒ මිස හමුදාව බලහත්කාරයෙන් ගිහින් සිවිල් සේවකයන් එළවා දමා එය අත් පත් කරගෙන එවැනි බලහත්කාරී යුදමය ක්‍රියා මාර්ග ගත්තේ නැහැ. මෙය තමයි එවැනි තත්ත්වයකට පත් වූ පළමුවන වතාව. මෙවැනි හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කළාම අත්‍යවශ්‍ය සේවා ක්‍රියාත්මක කරන්න හමුදාව මැදිහත් වන ආකාරයක්, සම්ප්‍රදායයක් තිබුණා. හැබැයි, ඔබතුමන්ලා ඒ සම්ප්‍රදාය බින්දා; ඒ සම්ප්‍රදාය කැඩුවා. ඊළඟට මොකක්ද කළේ? හමුදාව මැදිහත් වෙලා සේවකයන් සියලුදෙනා ඒ ආයතනයෙන් ඉවත් කළා. ඒ අය ගේට්ටුවෙන් එළියට දමලා ගේට්ටුව වැහුවා. සේවයට වාර්තා කළ එම ආයතනය ඇතුළේ සිටි සේවකයන් ඔක්කෝම එවිට ගේට්ටුව ළඟ රැස් වුණා; එකතු වුණා. එවිට එතැන හැදෙන්නේ මහා පිරිසක් තමයි. ඊට පසුව මොකක්ද කළේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සේවකයන්ගේ පැත්තෙන් ඉතා පැහැදිලිව සූදානමක් තිබුණා. වෘත්තීය සමිති වෙනම කමිටුවක් හදා තිබුණා. ඒකාබද්ධ වෘත්තීය සමිති එකමුතුව වෙනම කමිටුවක් හදා තිබුණා රටේ අත්‍යවශ්‍ය සේවාවලට තෙල් සපයන්න. හමුදාවලට, රෝහල්වලට, ගුවන් යානාවලට, මහජන සේවයේ අත්‍යවශ්‍ය සේවා සඳහා තෙල් සපයන්න ඒ කමිටුව පත් කර තිබුණා. ඊයේ උදේ 10.00ට ඒ කමිටුව රැස් වෙලා හමුදාවේ බ්‍රිගේඩියර්වරයාට දැනුම් දුන්නා, MDට දැනුම් දුන්නා, "අපි සූදානම්, ඒ අත්‍යවශ්‍ය සේවාවලට තෙල් සපයන්න. අපට කිසිදු වුවමනාවක් නැහැ මහ ජනතාව පීඩාවට පත් කරන්න" කියා. මොකද, ඒ සේවකයනුත් මේ රටේ පුරවැසියෝ. ඒ අයගේ දරුවනුත් ඉස්පිරිතාලවල තවමත් ඉන්නවා, ඩෙංගු රෝගය හැදිලා. ඒ අයට එහෙම භේදයක් නැහැ. ඒ අය කාරුණිකව කිව්වා, "අපි සූදානම් නැහැ අත්‍යවශ්‍ය සේවා අඩ පණ කරන්න. හැබැයි මේ විකිණීමට විරුද්ධව අප වෘත්තීය සමිති ක්‍රියා මාර්ග ගත යුතුයි. අපි එම ක්‍රියා මාර්ගය ගෙන තිබෙනවා. හැබැයි ඒ අත්‍යවශ්‍ය සේවාවන්ට තෙල් සපයන්න අපි සූදානම්" කියා. එහෙම තත්ත්වයක් තියෙද්දී හමුදාවේ බ්‍රිගේඩියර්වරයා සහ MD මැදිහත් වෙලා ඒ වෘත්තීය සමිති නායකයනුත් එක්ක තෙල් සංස්ථාව ඇතුළේම සාකච්ඡාවක් පැවැත්වුවා. ඒ සාකච්ඡාව පැවැත්වෙන අතරතුරේ තමයි අර එළියට දැමූ සේවකයන් ගේට්ටුව ළඟ පිරුණේ. එතැන ඒ අයට යන්න ඉඩක් තිබුණේ නැහැ. ඒ මිස, ඒ අය එතැන අනවශ්‍ය විධියට හැසිරුණේ නැහැ. එක පාරට 1,000ක් 2,000ක් එතැනට එකතු වුණාම පිරිසක් හැදෙනවා තමයි. එවිට ඔබතුමන්ලා මොකක්ද කළේ? [බාධා කිරීම්] පොලීසිය කඳුළු ගෑස් අරගෙන, බැටන් පොලු අරගෙන, ජල ප්‍රහාරක රථ වාහන අරගෙන ඇවිත් එතැන කලබලයක් ඇති කළා. අන්න එතැනදී තමයි පොලීසියත් එක්ක -[බාධා කිරීම්] ඒ ආයතනය ඇතුළේ සාකච්ඡා පැවැත්වෙද්දී තවත් වෘත්තීය සමිති නායකයන් කණ්ඩායමක් දුමින්ද දිසානායක ඇමතිවරයාත් එක්ක ඒ ආයතනයෙන් පිට ගිහින් සාකච්ඡාවක් පැවැත්වුවා. එතැනදී දුමින්ද දිසානායක ඇමතිවරයා පොරොන්දු වෙලා තිබුණා, හවස 6.00 වන කොට ජනාධිපතිතුමාත් එක්ක සාකච්ඡාවක් අරගෙන දෙනවා කියා. ඒ සාකච්ඡාව අවසන් වෙලා ඒ වෘත්තීය සමිති නායකයන් එතැනට ආවා. ඇතුළේ හිටපු වෘත්තීය සමිති නායකයන් කීප දෙනා අත්‍යවශ්‍ය සේවා සඳහා තෙල් සපයන්නේ කොහොමද කියා හමුදා බ්‍රිගේඩියර්වරයාත් එක්ක, MDත් එක්ක සාකච්ඡා කරමින් සිටියා. ඒ අයට සැලැස්මක් තිබුණා. ඒ අය ඒ සේවකයන් යොදා ගෙන ඉන්ධන සපයන්න සූදානම්නුයි සිටියේ. ඒ මොහොතේ ඔබතුමන්ලා මොකක්ද කළේ? ඉතාම නින්දිත විධියට යහ පාලනයට පයින් ගහලා, බොරු යහ පාලනය පෙන්නා

ඔබතුමන්ලා මොකක්ද කළේ? ගේට්ටුට ඉස්සරහා සිටි සේවක, සේවිකාවන්ට මැරයෝ ගෙනැත් ගැහුවා. ඒ මැර කණ්ඩායම හැසිරුණු විධිය මුළු රටම දැක්කා.

එදා කොළොන්නාවේ මැරයෝ ගෙනැත් ගහපු ඉතිහාසය අපට මතකයි. එදා ගෝඨාභය රාජපක්ෂලා කොලොන්නාවේ මැරයෝ ගෙනැල්ලා, කුඩුකාරයෝ ගෙනැල්ලා පොලු, මුහුරු අරගෙන ගහපු හැටි අපට මතකයි. ඒ රූප රාමු තවමත් තිබෙනවා. ඒ දෙයම තමයි ඔබතුමන්ලාත් කළේ. පොලීසිය ඉස්සරහින් ඉන්නවා. පොලීසිය ළඟම තමයි මැරයෝ පොලු අරගෙන හිටියේ; මැරයෝ කඩු අරගෙන හිටියේ. එතකොට පොලීසිය මොකද කළේ? පොලීසිය භාර ඇමැතිවරයා විධියට සාගල රත්නායක ඇමතිතුමා මොනවාද කළේ? ඒක නැවැත්තුවාද? අද වෙනකම් කියන්න පුළුවන් වුණාද කවුද ඒ මැරයෝ කියලා? කවුද ඒ පොලු තියා ගෙන හිටියේ; කවුද ඒ කඩු තියාගෙන හිටියේ? ඒ, මරික්කාර්ගේ මැරයෝ නොවෙයි නම් කවුද? ඒක මේ රටට කියන්න. ඒකට ඔබතුමන්ලා මොකක්ද කළේ? එක පැත්තකින් දුමින්ද දිසානායක ඇමැතිතුමාව පාවිච්චි කරලා වෘත්තීය සමිති නායකයන් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ව ඩැහැ ගන්න හැදුවා. සමන්ට කිව්වා "රස්සාව නැතුව නේ ඉන්නේ, රස්සාව දෙන්න අපි සලකා බලන්නම්, අපි ඒ ගැන සාකච්ඡා කරමු" කියලා. එහෙම කියලා වෘත්තීය සමිති නායකයන්ට බෝලේ බස්සලා "සමන්ට රස්සාව දෙන්නම්" කියලා පොරොන්දු දීලා, එතැනින් වෘත්තීය සමිති නායකයන්ගේ සටන් ක්‍රියා මාර්ගය අඩපණ කරන්න බැලුවා. මේ පැත්තෙන් පොලු, කඩු අරගෙන මැරයෝ එවලා පොලීසිය ඉස්සරහා ඉතාම අමානුෂික විධියට පහර දුන්නා. කිසිම නීතියක් නැහැ. පොලීසිය බලාගෙන හිටියා.

ඊට පස්සේ මොකද වුණේ? බ්‍රිගේඩියර්වරයා එක්ක සාකච්ඡාවේ සිටි වෘත්තීය සමිති නායකයන්ට අරහෙන් කැගහනවා "මෙන්න අපට ගහනවෝ" කියලා. ඊට පස්සේ තමයි සාකච්ඡාව නතර කරලා, එතැන හිටපු වෘත්තීය සමිති නායකයන් තුන් හතරදෙනා එතැනට දුවගෙන ආවේ. ඒ වෙනකොට තමයි දුමින්ද දිසානායක ඇමැතිවරයා එක්ක තිබුණු සාකච්ඡාව අවසන් කරලා ඉතිරි අය ආයතනයට ආවේ. ඒ අය ඇවිත් මේ පහර දීම පිළිබඳ බලන්න බහිනකොට පොලීසිය මොකක්ද කළේ? පොලීසිය වෘත්තීය සමිති නායකයන්ට ගහලා, කොඳු කඩලා පොලීසියේ වාහනවලට දමා ගත්තා. පහර දුන්නේ පොලීසිය; හමුදාව නොවෙයි. හමුදාවත් එක්ක සාකච්ඡා කළ බ්‍රිගේඩියර්වරයා, ඒ වන විට හමුදාවේ යම් කොටසක් එම ආයතනය ඇතුළේම එක පැත්තකට අරගෙන තිබුණේ. එතුමන්ලා එකහ වෙලා තිබුණා හමුදාව පැත්තකට අරගෙන අත්‍යවශ්‍ය සේවා සඳහා එම ආයතනයේ සේවකයින් හරහා ඉන්ධන සපයන්න. එහෙම තත්ත්වයක් තිබියදී තමයි මේ මැර කණ්ඩායම උසි ගන්වලා පොලීසිය මැදිහත් කරගෙන පහර දුන්නේ. ඊට පස්සේ මොකද වුණේ? වෘත්තීය සමිති නායකයන් පොලීසියට ගෙනැල්ලා ගැහුවා. පොලීසියට එහෙම ගහන්න අයිතියක් නැහැ. ඒ රූප රාමු තිබෙනවා. ඒ වීඩියෝ පට තිබෙනවා. පොලීසියේ OIC මහත්තයාගේ ඉඳලා පොලිස් නිලධාරින් වෘත්තීය සමිති නායකයන්ට අමානුෂික විධියට පහර දුන්නා. ඔවුන් පොලීසියට කෑ ගැහුවා "ඔහේලාට අයිතියක් නැහැ අපට පහර දෙන්න" කියලා. ඒ ගැහුවේ නිකම්ම නිකම් වෘත්තීය සමිති නායකයන්ට නොවෙයි. Ceylon Petroleum Corporation එකේ Laboratory එකේ වැඩ කරන -Laboratory එකේ සේවය කරන- රසායන විද්‍යාව පිළිබඳ MSc උපාධිය තිබෙන උපාධිධාරීන්ටයි, පොලීසියේ රාළහාමිලා ගැහුවේ. එහෙම උපාධි තිබෙන පරිපාලන සේවයේ නිලධාරීන්ට තමයි කොළොන්නාවේ මැරයෝ ගෙනැත් ගැහුවේ. ඒක කොහොමද ප්‍රජාතන්ත්‍රවාදී වෙන්නේ; ඒක කොහොමද යහ පාලනය වෙන්නේ? ඔබතුමන්ලා එක පැත්තකින් දුමින්ද දිසානායක හරහා සාකච්ඡා මඟින් වෘත්තීය සමිති නායකයන් ඩැහැ ගන්න උත්සාහ කළා. අනික් පැත්තෙන් මැරයෝ දමලා ගහලා, බලපෑම් කරලා වෘත්තීය සමිති සටන යටපත් කරන්න හැදුවා. මේක බොනපාට පන්නයේ ක්‍රමවේදයක්. එක පැත්තකින් සාකච්ඡා කරලා, වෘත්තීය සමිති නායකයින්ට වරදාන-වරප්‍රසාද දීලා, රස්සාව දීලා ඩැහැ ගන්න හැදුවා, සටන අඩාළ කරන්න. අනෙක් පැත්තෙන් මැරයෝ ගෙනැත් පහර දීලා, තර්ජනය කරලා, මර්දනය කරලා පාලනය කරන්න උත්සාහ කළා. නමුත්, අවසානයේ මොකක්ද ඔබතුමන්ලා කර ගත්තේ? අවසානයේ ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට රට ඉස්සරහා රෙදි ගලවා ගත්තා; නිරුවත් වුණා. යහ පාලනයේ නිරුවත මුළු රටම දැක්කා. ඇඳගෙන නා ගත්තා; ඉල්ලන් කෑවා. ඒක තමයි කර ගත්තේ.

SAITM සටනට මැදිහත් වෙච්ච ශිෂ්‍යයන්, දෙමව්පියන්, වෛද්‍යවරුන්, වෘත්තීයවේදීන් ඉදිරිපිටදී රයන් ජයලත් වෛද්‍ය ශිෂ්‍යයා පැහැර ගන්න සුදු වෑන් එක එවලා කර ගත්තේත් ඒකම තමයි. ඔබතුමන්ලාම ඔබතුමන්ලාගේ ආණ්ඩුව පිරිහීමට ලක් කර ගන්නවා. ආණ්ඩුවේ නිරුවත පෙන්වා ගත්තා. එක පැත්තකින් ගෝඨාභය රාජපක්ෂලාගේ සුදු වෑන් සංස්කෘතිය ආපහු හඳුන්වලා දීලා, මහ දවාලේ එළිපිට රටටම පෙන්නුවා.

අනික් පැත්තෙන් කොලොන්නාවේ මැරයන් ගෙනැල්ලා මේ වෘත්තීය සමිති නායකයන්ට පොලු, මුගුරු, කඩුවලින් ගහලා නිරුවත පෙන්නුවා. අවසානයේ නා ගත්තේ ආණ්ඩුව; ඇඳගෙන නා ගත්තේ ආණ්ඩුව. මේක යහ පාලනය නොවෙයි. මෙය යහ පාලනයට කිසිදු ආකාරයකින් එකඟ නැහැ. ඔබතුමන්ලා මේ කරන්න හදන්නේ බලහත්කාරයෙන්, මර්දනයෙන් සටන යටපත් කිරීමයි. ඒවායින් වෙන්නේ තව තවත් සටන් උත්සන්න වෙන එකයි. SAITM සටනේදී වෛද්‍ය ශිෂ්‍යයා සුදු වෑන් එකකින් පැහැර ගන්න උත්සාහ කළාට පසුව මොකක්ද වුණේ? සටන නතර වුණාද? නැහැ. 25වැනි දා මුළු රටේම වෛද්‍යවරුන් වැඩ වර්ජනය කළා. සටන් නතර වෙන්නේ නැහැ. එදා කටුනායක, රතුපස්වල කළා වාගේ වෙඩි තියලා මරලා, ලේ හලලා ඒවා මර්දනය කරලා ඉස්සරහාට යන්න පුළුවන් කියලා ඔබතුමන්ලා හිතනවා නම් ඒක වැරැදියි. එහෙම කරන්න බැහැ. ඒ ආණ්ඩුවලටත් ජනතාව උත්තර දුන්නා. අපට මතකයි, රතුපස්වල සිද්ධිය; කටුනායක රොෂේන් චානකලාගේ සිද්ධිය. හලාවත ධීවරයා මරා දාපු සිද්ධිය. ඒවා තමයි ආණ්ඩුව වෙනස් වන්න බල පෑ ප්‍රධාන හේතු. ඒවා තමයි ඒ සඳහා ප්‍රධාන සිද්ධි වුණේ. අද ඔබතුමන්ලා යන්නේත් ඒ අඩිපාරේම තමයි. ඒක වෙනස් කරන්න ඔබතුමන්ලා මැදිහත් වෙලා නැහැ.

ජාතික සම්පතක් තමයි අද තමුන්නාන්සේලා මේ විකුණන්න හදන්නේ. ඒ ජාතික සම්පත ආරක්ෂා කිරීම වෙනුවෙන් තමයි මේ වෘත්තීය සමිති නැඟිට තිබෙන්නේ. එසේ නැතිව ඒ වෘත්තීය සමිතිවලට පඩි වැඩි කර ගන්න නොවෙයි; ඔවුන්ට වරප්‍රසාද ලාභ ප්‍රයෝජන ගන්න නොවෙයි. ඔවුන් ඉතා පැහැදිලිව කියන්නේ හම්බන්තොට වරායේ තෙල් ටැංකි ටික කියන්නේ, මේ රටේ ජාතික සම්පතක් කියන එකයි. ත්‍රිකුණාමල වරායේ තෙල් ටැංකි ටික කියන්නේ මේ රටේ ජාතික සම්පතක් කියන එකයි.

එදා 1987 ජූලි 29 වැනි දා ජේ.ආර්. ජයවර්ධනගේ අත කරකවලා, රජීව් ගාන්ධිලා ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කරලා, අපේ රටට හිමිවෙච්ච ජාතික සම්පත -ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික- අපට අහිමි කරනවා. ඒ දේම තමයි මේ ජූලි 29 වැනි දාත් ඔබතුමන්ලා කරන්න ලෑස්ති වුණේ, හරියටම ඊට අවුරුදු තිහකට පස්සේ. මේ සෙනසුරාදාටයි ජූලි 29 එන්නේ. එදා ඉන්දියාවට ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි දුන්නා වාගේම, අද හම්බන්තොට තෙල් ටැංකි ටික චීනයට දීලා, ත්‍රිකුණාමලයේ ඉතිරි තෙල් ටැංකි ටිකත් ඉන්දියාවට දෙන්නයි ලෑස්ති වෙන්නේ. මේකද ජාතික

[ගරු විජිත හේරත් මහතා]

සම්පත් සුරැකීම කියන්නේ? මේ ජාතික සම්පත් සුරැකීමද? එදා රාජපක්ෂ පාලනය වැරදි කරනකොට, අඩුපාඩු සිද්ධ වෙනකොට ඔබතුමන්ලා කිව්වේ, "අපි ඒවා වෙනස් කරනවා, අපි ඒවා නතර කරනවා, නතර කර යහපාලනයක් ගේනවා" කියායි. හැබැයි ඔබතුමන්ලා අද මොකද කරන්නේ? අද බදු ගහලා, ණය අරගෙන රටේ ජනතාව තව තවත් ආර්ථික වශයෙන් වළපල්ලට යවලා මේ ආර්ථිකය ශක්තිමත් කරන්නට බැරි වෙනකොට ඔබතුමන්ලා අන්තිමට යන්නේ ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණන්නයි.

ආණ්ඩුවේ ඉන්න ඇමතිවරුන්ට අද එක එක ප්‍රකාශ කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. සුදු වෑන් එකෙන් පැහැර ගෙන යනකොට එක පැත්තකින් ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා කියනවා, "ඒ ගැන මම හරි කනගාටුයි, ඒ ගැන මම දුක් වෙනවා. එහෙම කර තිබෙන්නේ ආණ්ඩුව අපහසුතාවට පත් කරන්නයි" කියලා. අනෙක් පැත්තෙන් එස්. බී.දිසානායක ඇමතිවරයා කියනවා, "ගැහුවා මදි, තව පහර දෙන්න ඕනෑය" කියලා. එහෙම කියන්නේ මේ ආණ්ඩුවේම ඇමතිවරු. ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා එහෙම කියද්දී ඒ ආණ්ඩුවේම ඇමතිවරයෙක් කියනවා, "තවත් පහර දෙන්න ඕනෑ" කියලා. අද ඇමතිවරුන්ටත් ඒ ගැන එක එක ප්‍රකාශ කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. ඇමතිවරුන්ටත් එක ඉලක්කයක් නැහැ; අරමුණක් නැහැ; ආණ්ඩුවටත් අරමුණක් නැහැ. ඒකයි අද මේ රට අයාලෙ යන්නේ. මේ කර ගත් දෙයින් ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට රට ඉස්සරහ නිරුවත් වුණා. ඒ විතරක් නොවෙයි. බොරු යහපාලනය මොකක්ද කියන එක මේ රටේ ජනතාව හරියට තේරුම් ගත්තා.

ජනතාව මේ වර්ජනයෙන් පීඩාවට පත් වෙන බව ඇත්ත. අද ජනතාව පීඩාවට පත් වෙන එක ගැන වග කියන්න ඕනෑ, වෘත්තීය සමිති නායකයෝ ද? වෘත්තීය සමිති ද? ඒකට වග කියන්න ඕනෑ වෘත්තීය සමිති නායකයෝ නොවෙයි, ආණ්ඩුව. ජනතාව යම් කිසි පීඩාවකට පත් වුණා නම් ඒ වගකීම ගන්න ඕනෑ ආණ්ඩුව. ආණ්ඩුව තමයි මේ ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණන්න හදන්නේ.

අවසාන වශයෙන් මා කියන්න ඕනෑ, මෙවැනි මර්දනකාරී ක්‍රියාමාර්ගවලින් රටේ ජාතික සම්පත් කුණු කොල්ලයට විකුණන්න හදනවා නම් ඒවා නතර කරන්න, මේ රටේ ජනතාවත් එක්ක, වෘත්තීය සමිතිත් එක්ක අපි සූදානම් බව. ඔබතුමන්ලාගේ මේ උත්සාහය පරාද කරන්න අපි සූදානම් කියන එක අවධාරණය කරමින් මම කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දිවා ආහාරය සඳහා පස් වරු 1.30 දක්වා පාර්ලිමේන්තුවේ කටයුතු අත් හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා.1.30ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

සහකාර මහ ලේකම්තුමිය
(உதவிச் செயலாளர் நாயகம்)
(Assistant Secretary-General)
කරුණාකර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
"ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සහා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.
அதன்படி, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හරින් ප්‍රනාන්දු මහතා.

[අ.භා. 1.30]

ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள் மற்றும் டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication and Digital Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට වැදගත් වන කාලෝචිත යෝජනාවක් ගැනයි අද දින සාකච්ඡා කරන්නේ. මේ රටේ යහපාලන රජය බලයට පත් වෙලා අවුරුදු දෙකක් ගත වෙනකොට රටේ කතිකාවතක් ගොඩනැඟීගෙන ආවා, "ඇත්තටම මේ ආණ්ඩුවට කොන්දක් තිබෙනවාද" කියලා. මේ ආණ්ඩුව බලයට පත් වූ දවසේ සිට රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නට උත්සාහ කරමින් වැඩ කටයුතු කර ගෙන යද්දී ජනතාවට කුතුහලයක් ඇති වෙන්නට පටන් ගත්තා, මෙය ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමක් ද, නැත්නම් මේ නායකයන්ගේ නිවටකමක්ද කියලා. ආණ්ඩුව මේ විධියේ ගමනක් යනකොට මේ රටේ සොරකම් කරපු සමහර කට්ටිය කල්පනා කරන්නට වුණා, තමන්ට කිසි ප්‍රශ්නයක් ඇති නොවෙන්නේ මේ පාලකයන් තමන්ගේ බලය ක්‍රියාත්මක නොකරනවාද, එහෙම නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදය වල් බිහිවෙලාද, එහෙම නැත්නම් මොකක්ද මේකට හේතුව කියලා. යම් පිරිසක් රටේ හැම තැනකම උද්ඝෝෂණ සිදු කිරීම නිසා සාමාන්‍ය මහජනතාවට හිරිහැර සිද්ධ වෙන්නට පටන් ගත්තා. රටක උද්ඝෝෂණය කිරීම ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වෘත්තීය සමිති උද්ඝෝෂණය කිරීම ඔවුන්ගේ අයිතියක්. නමුත් මේවා අත්‍යාවශ්‍ය සේවාවන් ලෙස ගැසට් කළේ මොන හේතුවක්, මොන පදනමක් ඇතිවද? අපි එය තේරුම් ගත යුතුයි. අපි මේවා අත්‍යවශ්‍ය සේවාවන් ලෙස සලකන්නේ ඇයි?

මට පෙර කථා කළ අපේ ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුත් මේ පිළිබඳව පැහැදිලි කළා. පසු ගිය කාලය තුළ ඉස්පිරිතාලවල තිබුණු ප්‍රශ්නය අපි දැක්කා. ඉස්පිරිතාලවල තිබෙන එම ප්‍රශ්නයට විසඳුම් සෙව්වාට, සාකච්ඡා කළාට කවදාවත් විසඳුමක් නැහැ. ඒත් කමක් නැහැ කියමු කෝ. ඒ ප්‍රශ්නය එහෙම යනවාත් එක්කම, ඒ අතරතුර මේ strike එක ආවා. මේ strike එකේ පදනම මොකක්ද? සාකච්ඡාමය විසඳුමක් එනකොට මේකට දේශපාලන මුහුණුවරක් ආවා. ඒ පිළිබඳව හොඳම නිදසුන තමයි, ඊයේ දවසේ මේ උද්ඝෝෂණයත් එක්කම උද්ඝෝෂණය පිටුපස හිටියේ කවුද කියන එක පැහැදිලිව ඔප්පු වීම.

මා එම කාරණයට එන්නට ඉස්සෙල්ලා මේ පිළිබඳවත් සඳහන් කරන්නට ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඊයේ දවසේ රට අකාර්යක්ෂම කරන්න, අකර්මණ්‍ය කරන්න, මේ කරුණු මොනතරම් සාධක කර ගත්තාද? එක පාරක් නොවෙයි, මේ ආණ්ඩුව ආවාට පස්සේ ඇතැම් පිරිස් දෙතුන් වරක් මේක සිදු කරන්නට උත්සාහ කළා. මේකෙ අවසාන බලාපොරොත්තුව මොකක්ද? ආණ්ඩුව අපහසුතාවට පත් කිරීමයි. මේ රටට එන ගුවන් යානා ටික නවත්වන්න, ලෝකය තුළ මේ ආණ්ඩුවට තිබෙන ප්‍රසිද්ධිය නැති කරන්න, අපේ රට කෙරෙහි ආයෝජකයන්ගේ තිබෙන ආකර්ෂණ අඩු කරන්න, ඒ දේවල් කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. එහි නොපෙනෙන පැත්ත ඒකයි. මේ රජය කෙරෙහි තිබෙන විශ්වාසය කෙළෙසන්න කටයුතු කරමින් කාලකණ්ණි වින්දනයක් ලබන්න පුංචි කණ්ඩායමක් කරන උත්සාහයක්. මේකේ ගැබ්වෙලා තිබුණු අරමුණ ඒකයි. ඒකට උපයෝගී කර ගත්තා, දොස්තරලාගේ වැඩ වර්ජනයත්. එවැනි කිහිප දෙනෙකුගේ උත්සාහයක් තමයි, Petroleum strike එකත්.

දැන් පෙන්වන්නට හදනවා, මැරයෝ කල්ලියක් ඇවිත් පහර දුන්නා කියලා. මිනිසුන්ගේ නැඟිටීම තව ටික දවසකින් සිදු වෙයි. අපිත් කට වහගෙන ඉන්නවා. මාත් ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයෙක් හැටියට ආණ්ඩුව කරන හැම දෙයක්ම හරි කියලා කියන්නේ නැහැ. වැරැදි ඇතොත් පෙන්වා දෙන්න.

පෙන්වා දෙන එක කරන්න ඕනෑ මෙහෙම නොවෙයි. වැරැද්දක් වෙලා තිබෙනවා නම්, ඒවා හොයන්න දැන් ප්‍රසිද්ධ ජනාධිපති කොමිසමක් පත් කරලා තිබෙනවා. රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ජීවිතේට ඔහොම කොමිෂන් සභා පත් කරලා තිබුණාද? දැන් කොමිෂන් සභා පත් කරලා තිබෙනවා; කොමිෂන් සභාවට සාක්ෂි දෙන්න කැඳවා තිබෙනවා.

මම අද පැහැදිලිව කියනවා, පත් කර තිබෙන කොමිෂන් සභාවලින් යම් අය වැරැදිකාරයන් වුණොත්, මම නම් ඒ වැරැදිකාරයන් රකින්නේ නැති බව. වැරැදිකාරයන් රකින්න අපි නම් කවදාවත් එකඟ වන්නේ නැහැ. වැරැදිකාරයන් රකින්න අපි ඉන්නේ නැහැ. අපිත් වැරැදි නම්, නම්බුකාර විධියට එළියට යන්න සූදානම්. ඒක අපේ ප්‍රතිපත්තිය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මම එකක් කියන්නට ඕනෑ. එහෙම වැරැදිකාරයන් පෙන්වා දෙන්න පුළුවන් වන්නේ වැරැදි නැති මිනිසුන්ට පමණයි. වැරැදි තියෙන අයට කථා කරන්න බැහැ. පට්ටපල් හොරුන්ට, වංචා, දූෂණ චෝදනා තියෙන අයට මේ රටේ වංචාවන් ගැන කථා කරන්න අයිතියක් නැහැ. එහෙම කථා කරන්න පුළුවන් මිනිසුන් මේ රටේ ඉන්නවා. එහෙම පිරිසිදු මිනිසුන් මේ රටේ ඉන්නවා. පිරිසිදු මිනිසුන් සමඟ පිරිසිදු වෙන්න හදන අය ඉන්නවා නම්, ඒක පිරිසිදුකමක් හැටියට මම නම් කවදාවත් පිළිගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ සිදු වුණේ මොකක්ද? ඒ සිදුවීමෙන් පසුව විපක්ෂයේ කණ්ඩායමක් පොලීසියට යනවා. අපේ විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ Facebook Live එකේ එය තිබෙනවා. Facebook Live එකක තිබෙන නරකම දේ තමයි, ඒක අයින් කරන්න බැහැ. Facebook Live එකක් දුන්නාට පසුව ඒක මකන්න බැහැ. එම Facebook Live එකේ අන්තිමට යද්දි අහනවා, "අනේ ඔයාට ගැහුවාද, අනේ ඔයාට ගැහුවාද?", "කවුද ගැහුවේ?", "පොලීසිය ගැහුවාද?", "තල්ලු කරලා ගැහුවාද?", "බිත්තියට තල්ලු කළාද?" අහනවා. තුම්මුල්ලේ විමලේ පොලිසියේ මහත්මයෙකුට තොප්පිය ගලවලා ගහපු හැටි අමතකද? අපි මැරිලා ඉපදිලාද? එතකොට මේ කථා කරන්නේ කවුද? එදා කැබිනට් ඇමතිවරයෙක් හැටියට තුම්මුල්ල හංදියේදී පොලීසියේ OICගේ තොප්පිය ගලවලා ගහපු කෙනා, අද Facebook Live එකක් අල්ලාගෙන "අනේ ඔයාට ගැහුවාද?" කියලා අහනවා. ඊළඟට කියනවා, "නාමල් ඔයා එන්න, ගහන්න එපා", "නාමල් එන්න, නාමල් එන්න" කියලා. මේ අපි ද කථා කළේ? බලය නැති කොට මෙහෙම නම්, බලය ඇතිකොට කොහොම වෙයි ද?

අද ජනතා විමුක්ති පෙරමුණ ගැනත් වචනයක් කියන්න ඕනෑ. උද්ඝෝෂණ, මර්දන එනකොට ජනතා විමුක්ති පෙරමුණත් හරි ආසයි, උඩ පැනගෙන ඒවාට යන්න. වෙන මොනවා කරන්නද? ඒ ගොල්ලන්ට වෙන මොන දේශපාලනයක්ද? ඒ වාගේ දෙයක් තිබුණාම හරි ආසාවෙන් පැනලා යනවා. SAITM විරෝධය එනකොට ඒකටත් ඔළුව දානවා; උමා ඔය ප්‍රශ්නය එනකොට ඒකටත් ඔළුව දානවා. වෙන කොහේ යන්නද? එහෙම කරලා කීයක් හරි එකතු කර ගත්තොත් තමයි. ඒත් කමක් නැහැ. හැබැයි, ඒ අය උද්ඝෝෂණවල හිටපු කට්ටිය. මේ උද්ඝෝෂණ මොනවාද? මේ උද්ඝෝෂණ පාවිච්චි කරන්නේ දේශපාලන වශයෙන් අපිව මර්දනය කරන්නයි. දේශපාලන වශයෙන් අපිව මර්දනය කරනවාටත් වඩා රට අරාජිකත්වයට පත් කරලා රට විනාශ කරන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ මහත්මයා ඒ කාලයේ කිව්වා මට මතකයි, "ත්‍රස්තවාදයට උත්තර දිය යුත්තේ ඒ අයට තේරෙන භාෂාවෙන්" කියලා. අපි නම් ඔය වැඩ වර්ජනවලදී ත්‍රස්තවාදයට එහෙම උත්තර දෙන්න ගිහිල්ලා නැහැ.

SAITM එකට විරුද්ධව උද්ඝෝෂණය කරද්දී, පොලීසියේ මහත්වරු ඒ දරුවන්ට කථා කරපු ආකාරය මම දැක්කා. ඒ දරුවන්ටත් "දරුවා", "පුතේ" කියලා කථා කළේ. "අනේ! පුතේ මෙහෙම කරන්න එපා" කියලා කිව්වා. මම නම් කියන්නේ පොලීසියේ මහත්වරුත් හරි පව් කියලායි. මොන ආණ්ඩුව ආවත් ඒ මිනිසුන්ගේ රක්ෂාව තිබෙනවා. OIC මහත්තයා OIC, ASP මහත්තයා ASP, DIG මහත්තයා DIG, SI මහත්තයා SI, SSP මහත්තයා SSP. නමුත්, ආණ්ඩුව අවුරුදු පහෙන් පහට මාරු වෙනකොට අපේ තමයි නිලතල නැති වෙන්නේ. නමුත්, පොලීසියේ මහත්වරුන්ට ඒ ගරුත්වය තියෙනවා. ඒ මහත්වරුන්ගේ ගරුත්වය කෙළෙසන්නේ දේශපාලනඥයන්. අපි හෝ ඔබතුමන්ලා. දෙ ගොල්ලන්ගෙන් ඕනෑ කෙනෙක්. ඊයේ ඒකාබද්ධ විපක්ෂය එම ස්ථානයකට ගිහිල්ලා, පොලීසියේ මහත්වරුන්ට සලකපු විධිය හරිම හිරිකිතයි; අප්පිරියයි. මම කියන්නේ නැහැ, ඒක ඒ ගොල්ලන් කළත්, අපි කළත් ඒක හරියි කියලා. කරපු දේ අන්තිම කැතයි. මොකද, ඒක රටේ නීතියට කරපු කැලලක්; කරපු අපහාසයක්; නින්දිත වැඩක්. පොලීසියේ OICලා සහ නිලධාරීන් වටකරලා දේශපාලනඥයන් කරපු පහත් ක්‍රියාවක්. මොකක්ද ඒකෙන් බලාපොරොත්තු වන්නේ? මේ රටේ විනයක් හදන එකද? ඒවා බලාගෙන සිටින මේ රටේ සුවහසක් තරුණ ජනතාව මොකද කරන්නේ? පෙළපාළි කරනවා; උද්ඝෝෂණ කරනවා; පොලීසියට ගහනවා. එතකොට රටක් හැදෙයි ද? රටක විනයක් තිබෙයි ද? රට හදන්න නොවෙයි, රට විනාශ කරන්නයි මේ හදන්නේ. මේ උද්ඝෝෂණයේ අරමුණ මොකක්ද? ව්‍යක්තීය සම්පත් එහි අරමුණවත් හරියට දන්නේ නැහැ. තෙල් ටැංකි විකුණනවා ලු. තෙල් ටැංකි විකුණන්න තියා හිතලාවත් නැහැ. මේ බදු දෙන්න හදන්නේ ගැලුම් මිලියන 1.2ක් පමණ දමලා වහන්න පුළුවන්, අවුරුදු ගණනාවක් තිස්සේ කෑලේ තිබුණු ටැංකි ටිකක්. දෙවියනේ! බදු දෙන්නේ නැතිව ඒවායේ බුදියන්න ද?

ඒවායින් මොකක් කරන්නද? කවුරුන් හෝ ඇවිල්ලා business එකක් කළාද ඒකෙන්? 2003දී එක්සත් ජාතික පෙරමුණු ආණ්ඩුව ඉස්සෙල්ලාම මෙවැනිම යෝජනාවක් ගෙනත් ඒවායින් බද්දක් අය කළා. එදා රාජපක්ෂ මහත්මයාට ඒවායින් බදු ගන්නේ නැතිව ඉන්න තිබුණා. නමුත් එතුමාගේ ආණ්ඩුවෙනුත් ඒවායින් බද්දක්

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ගත්තා. හැබැයි මේ තුළින් ඊට වඩා හොඳ දෙයක් කරනවා, ලංකාවේ මිනිසුන්ට රක්ෂා ටිකක් හදලා ලංකාවේ ආර්ථිකය හදන්න යනවා. ඒක වැරදිද? වැරදි නැහැ, මේ තිබෙන්නේ කුහකකම. කුහකකම, පෙරේතකම සහ බල තන්හාව; පෙරේත බල ලෝභීත්වය.

ඊයේ අපි දැක්කේ ඊට වඩා භයානක දෙයක්. තාත්තාට එදා තිබුණු බලය පුතාට ආයෙත් මැවි මැවී පේන්න පටන් අරන් පොලීසියක් ග්‍රහණය කළා. විමල් වීරවංශ මහත්මයා කියනවා, "නාමල්ව ගන්න, නාමල්ව ගන්න, නාමල්ව ගන්න" කියලා. ඔන්න! අපට අඳුරු අතීතය ආයිත් පේනවා. මේ ආණ්ඩුවේත් හොඳ නරක දෙකම තිබෙනවා. අපි කවුරු ආවාත්; ජේවීපී එක බලයට ආවත් ඒ අය සුදනෝ වෙන්නේ නැහැ. ඒකේත් හොරු ඉන්න පුළුවන්. නැහැ කියන්න බැහැ. ඔක්කොම පෘථග්ජන මිනිස්සු. බල පෙරේතකම, සල්ලි පෙරේතකම හැමෝටම බෝ වෙනවා, කවුරු ආවාත්. හැබැයි ඒකේ අඩුම පෙරේතකම තිබෙන මිනිසුන් සහ හොඳම මිනිසුන් සොයා ගන්න එක තමයි රටේ මිනිසුන්ගේ යුතුකම.

අද මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනාව ලංකාවේ ඉන්න ජෝකර්ලා 225දෙනා බවට අපිමයි පත් කරගෙන තිබෙන්නේ. ඒක තමයි යථාර්ථය. විපක්ෂය ආණ්ඩුවට ගහනවා, ආණ්ඩුව විපක්ෂයට ගහනවා. එක එක්කෙනා මෙහෙම කර ගන්නා විට ලංකාවේ මිනිසුන්ට මේ 225දෙනා ජෝකර්ලා 225ක් වාගේ පේනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා දැන් අවසන් කරන්න.

ගරු හරින් ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරනවා. මම ඉල්ලීමක් කරනවා. ඉන්ධන සැපයුම හා බෙදා හැරීම අත්‍යාවශ්‍ය සේවාවක් වෙන්නේ අපිට විතරක් නොවෙයි. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට, ඒ අයගේ පවුල්වලට, තමන් ආදරය කරන මිනිසුන්ට, මේ සියලු දෙනාට මේ වර්ජනය හිරිහැරයක් වුණා. මේ strike එක තුළින් අපට බලයක් හම්බවෙනවා, මේ strike එක තුළින් ආණ්ඩුව අරාජිකත්වයට පත් වෙනවා, මේ strike එක තුළින් මිනිසුන්ට මේ ආණ්ඩුව එපා වෙලා රාජපක්ෂ මහත්මයාගේ හීනය හැබෑ වෙනවා කියලා කාලකණ්ණි චින්දනයක් ගන්න හදනවා නම් ඒක මේ කපේදී සිද්ධ වෙන්නේ නැහැ. මොකද, ඒ කාලකණ්ණි චින්දනය ඔබතුමන්ලාට ලැබෙන්නේ නැහැ, නමුත් ඒ ශාපය ඔබතුමන්ලාට වැදෙනවා. ඒ ශාපය වැදෙන බව මතක තියා ගන්න. [බාධා කිරීමක්] අනේ මේ! අර වචනය තමයි මතක් වෙන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තමයි මතක් වෙන්නේ. ඒක නිසා කට වහගෙන ඉන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ "වම්බොට්ටන්" නිසා තමයි මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් මම මේ ඉල්ලීමක් කරන්නේ. කරුණාකරලා අදවත් කල්පනා කරලා බලන්න, මේ කරන්නේ රටට ද්‍රෝහීකමක් මේ ආණ්ඩුව පෙරළන්න. මේ ආණ්ඩුවේ වැරදි ඇති; මේ ආණ්ඩුවේ අනන්ත අප්‍රමාණ වැරදි ඇති. ජනතාව ඒවා තේරුම් කරලා දෙයි. ඔබතුමන්ලා ඊළඟ ඡන්දය ඉල්ලන්න. මේ ආණ්ඩුව ඡන්දයෙන් පරාජය කරන්න. හැබැයි මේ රටේ මහ ජනතාවට හිරිහැර කරන්නට එපා. මේ අවස්ථාවේදී හමුදාව ඇවිල්ලායි ඒ කටයුතු කළේ. දැන් මිනිස්සු හමුදාවට කියනවා, "අපි උඹලාට ලේ දුන්නා, අපි උඹලාට බෝධි පූජා කළා" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල මේ වාගේ කථාවලට කියන්නේ "කුල කියනවා" කියලා. ලේ දීලා කියනවා අපි උඹලාට "ලේ දුන්නා" කියලා. ලජ්ජයි! ඕවා කියන්නේ ඇත්තටම එහෙම ලේ දීපු මිනිස්සු නොවෙයි. අපේ ගම්වල අපිට ඡන්දය දුන්නේ නැති මිනිස්සු ඇවිල්ලා ඔය විධියට අපිට එක එක දේවල් කියනවා. ඒ වාගේ තමයි මේකත්. හමුදාවට ලේ දීපු මිනිහෙක් කවදාවත් ඔය වාගේ කථා කියන්නේ නැහැ.

මම අද උදේ කඩේ යන එක රූපවාහිනී නාලිකාවක පත්තරවල විස්තරයක් කියවනවා දැක්කා. ඒ මනුස්සයා තමයි හරියටම කඩේ යන්නේ. උදේ ඒ මනුස්සයා අහනවා, "හමුදාවට තෙල් බෙදන්නට තාක්ෂණයක් තිබෙනවාද" කියලා. මට අහන්න ඕනෑ මේකයි. ඒ දවස්වල රාජපක්ෂ පුතෙක් රොකට් යැව්වානේ. එයා තාක්ෂණය දැනගෙනද ඒ රොකට් යැවියේ? මම ඒක අහන්නම ආසාවෙන් හිටියේ. එක නාලිකාවක් කඩේ යන යෑම! ලජ්ජා සහගතයි. මෙහෙම මාධ්‍යයකුත් ලංකාවේ තිබෙන බව අමතක කරන්නට එපා. [බාධා කිරීමක්] හරි, හරි. ඔබතුමාට මම කිව්වා නේ. මට අර වචනය තමයි මතක් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙතැනින් එහාට කථා කරන්නට අවශ්‍ය නැහැ. මම ඉල්ලීමක් විතරක් කරනවා. මේ රට ගැන හිතන්න. මේ දවස්වල පාසල් ළමයින්ගේ term tests පවත්වනවා. ඉන්ධන සැපයුම හා බෙදා හැරීම අත්‍යවශ්‍ය සේවාවක් නොකරනවා නම් අපට දොස්තරලාගේ සේවය අත්‍යවශ්‍ය සේවාවක් කරන්න බැහැ. දොස්තරලා වෙනුවට වෙනත් මිනිසුන් ගෙනැල්ලා බෙහෙත් දෙන්න බැහැනේ. හැබැයි ඒ කරන්නෙත් තිරිසන් වැඩක් බව අමතක කරන්නට එපා. මේකට කොළොන්නාවේ මරික්කාර්ට ඇහිල්ල දික් කරන එක වැරදියි. කොළොන්නාවයි, මුතුරාජවෙලයි දෙකක්. මුතුරාජවෙල එහෙම මිනිස්සු හිටියේ නැහැ. නමුත් අපි දන්නවා, කොළොන්නාව කියන්නේ ටිකක් සැර මිනිස්සු ඉන්න පැත්තක් කියලා. ඒ මිනිසුන්ටත් ආවේගයක් තිබුණා. පාරවල් වහගෙන, කඩවල් වහගෙන; ඒ නිසා ඒ මිනිසුන්ටත් ආවේගයක් ඇවිත් එහෙම දෙයක් වුණාද කියන එක අපි දන්නේ නැහැ. ඒකත් සොයලා බලන්න පරීක්ෂණයක් කරනවා. ඔබතුමන්ලා පොලීසියේ entry එකක් දාන්න; මිනිසුන්ගේ මුහුණු ටික දාන්න.

අපි ඊළඟ දවසේ ඒක ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කරමු. අපි ඔබතුමන්ලාත් සමඟ ඉන්නම්. හැබැයි එකක් පැහැදිලිව තේරුම් ගන්න. මේ රටේ විනයක් හදා ගන්නනට ඕනෑ නම්, මේ රටේ අත්‍යවශ්‍ය සේවා තිබෙන්නට ඕනෑ. මිනිසුන්ගේ පාරවල් වහලා, දොස්තරලා බෙහෙත් දීම වර්ජනය කරවමින් මේ ආණ්ඩුව වට්ටන්නට හිතා මතා කරන වැඩ නිසා ඔබතුමන්ලාට ශාප වෙනවා. මේවා කළාට ආණ්ඩුවක් ගන්න හම්බ වෙන්නේ නැහැයි කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

[1.43 p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Hon. Presiding Member, we are debating today a Proclamation made by His Excellency the President pertaining to an essential Public Service relating to fuel including petroleum products and gas and various aspects relating to that particular matter.

In this country, we have had trade unions for a long period of time and I think trade unions are a vital and important component of a democratic society. The rights of workers need to be protected at all points of time and I think trade unions play a very important role in ensuring the rights of workers are protected. In that sense, Sir, we have always respected trade unions, we have always given our support to trade unions to ensure that workers' rights are protected**.** Trade unions also sometimes engage in trade union action for national reasons, for reasons which they claim are related to the country's future.

I think, the action currently contemplated by the trade unions relating to petroleum and gas was on account of certain decisions taken by the Government in respect of certain proposed projects in the South of this country and the East of this country and the trade unions seem to think that that should not be allowed, that it should be resisted and they had initiated some trade union action to cripple certain essential services relating to gas, petroleum, oil and so on and the President's Proclamation is to ensure that these services are available to the people of this country without any impediment.

Sir, when the Hon. Dinesh Gunawardena spoke in the morning, in fact, he referred to me and called upon me to be supportive of democracy. He, in fact, requested that elections be held in this country soon - not Local Government Elections or Provincial Elections but elections to the national legislature should be held soon - and he said that this Government must go home. This has been a consistent objective of the Joint Opposition. They have been consistently demanding that the Government must be crippled, that the Government must be toppled and that the Government must be prevented from functioning in keeping with the democratic verdict of the people of this country.

I think, Sir, we cannot forget the fact that there were Elections in 2015, first the Presidential Election in January, 2015. Hon. Mahinda Rajapaksa who had served as the President for two terms sought a third term by even amending the country's Constitution to enable him to seek a third term and the people very politely said to him that he would not be elected President of the country. He was defeated by President Maithripala Sirisena quite convincingly. In fact, President Maithripala Sirisena defeated him more convincingly than when Hon. Mahinda Rajapaksa was elected President in 2005 for the first time.

So, the verdict of the people was that they would not have Mr. Mahinda Rajapaksa as the President and in terms of our Constitution and the democratic verdict of the people, that is a verdict which has to be respected for a certain period of time and no one is entitled to demand that that verdict be abrogated or that that verdict be toppled or disregarded. That would be undemocratic. What followed on that? After the Presidential Election, we had the Parliamentary Election in August, 2015 and Mr. Mahinda Rajapaksa was projected by the Parties in the Joint Opposition now and by the UPFA as the country's Prime Ministerial candidate. The country was aware that the choice, the contest was between Hon. Ranil Wickremesinghe, who then functioned as the Prime Minister of this country, who had been appointed as the Prime Minister of this country by President Maithripala Sirisena on his election as President - he was Prime Minister until the Elections were called - and Mr. Mahinda Rajapaksa who was the candidate of the UPFA for the position of Prime Minister. The people once again delivered their verdict. The people, once again, came to the conclusion that they would not elect Mr. Mahinda Rajapaksa as their Prime Minister and they rejected that claim that he be made Prime Minister. You cannot deny these facts.

The UNP won 106 seats and the Joint Opposition, the UPFA won 95 seats and the difference was 11 seats. There were 6 seats won by the JVP and there were 16 seats won by the TNA which were not supportive of Mr. Mahinda Rajapaksa. They were all against him. And despite his effort to become Prime Minister, after his failure to be elected as President, there was a verdict of the people that he could not be Prime Minister and that they would prefer Mr. Ranil Wickremesinghe to continue as Prime Minister. So, what is the support that you want me to give you? There is a verdict of the people, a clear verdict of the people both at the Presidential Election and at the Prime Ministerial Election that Mr. Mahinda Rajapaksa is neither acceptable to them as President nor as Prime Minister. That is a very clear democratic verdict. You cannot get over that.

You cannot topple governments as you like. If you are able to topple governments as you like despite the verdicts of the people and despite the provisions of the Constitution stating that governments elected are entitled to continue to function for a certain period of time unless they are toppled in keeping with the Constitution on the basis of a No Confidence vote in the House or something like that. You cannot topple governments through strikes; you cannot topple governments through conspiracies, you cannot topple governments by persuading essential

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

services to breakdown and that is what this Proclamation made by the President seeks to prevent. Trying to topple Governments by getting essential services to break down, I think, is utterly, thoroughly undemocratic and cannot be accepted and in the context of the Opposition's demand consistently and continuously that this Government must be toppled, one is entitled to think that the Joint Opposition which is headed by Mr. Mahinda Rajapaksa is responsible for a number of disturbances that are taking place in this country which are impeding and interfering with governance.

People are entitled, Sir, to the benefits of proper governance by a government elected by them. I think I must also caution this Government. You must have the spine to govern. You must make decisions that are necessary. The country's economy is in a very serious state. The country is neck-deep in debt. The country must be redeemed from this position. If this country is to be redeemed from this position the Government must take bold steps, the Government must take bold decisions and the Government must be in a position to implement those decisions. I think it is your failure to make bold decisions and your failure to implement bold decisions that encourages the Opposition to become difficult. You should demonstrate that you are governing efficiently and effectively. That is your duty and if you do that, I think, you will be in a much better position to silence the Joint Opposition and make sure that you are able to carry on.

I am happy, Field Marshall Sarath Fonseka is here. I referred to you when I spoke on a matter in Parliament a couple of days ago when there was an Adjournment Motion in regard to missing persons. There is an effort being made in this country to show that this Government is about to betray the armed forces in this country. We do not agree with that. There is no effort on the part of anybody to betray the armed forces. The soldiers who fought the war, fought it on behalf of the Government, on the decision of the Government, as per the directions of the Government. There may have been soldiers- there were soldiers- who committed certain crimes. They may be responsible for various matters, but that is not applicable to all the soldiers. You cannot say that every single soldier who fought in the war is a war criminal or that he is guilty of some offense. But, if soldiers are responsible of contraventions, violations of the law, violations of international humanitarian law and violations of domestic laws of this country, they certainly must be dealt with. There is no question about it.

But, we all saw the way in which Field Marshal Sarath Fonseka, whom you claimed as being the best Army Commander in the whole world, was treated after the Presidential Election in 2010. You were in prison clothes. We saw you; We felt sorry for you; You were humiliated; you were insulted. You were the Army Commander. You won the war for the Government, but you were treated like "dirt". You were charged on frivolous matters, on matters that should never have constituted the basis for a proper charge against anyone, leave aside the Former Army Commander. You were convicted. You were deprived of your Title. That is the way you were treated. How can we accept that these persons who treated you in that way are concerned genuinely about war heroes or about soldiers? Are they not merely trying to provoke tension in this country; to promote communalism in this country; to promote division in this country and to prevent reconciliation in this country which is fundamental for the future of this country? The National question needs to be resolved. It is a responsibility of the Government. We must unite all the people in this country and bring them together.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Leader of the Opposition, you have one more minute.

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

I am finishing, Sir. How can that be done, if you are going to promote communalism, if you are going to promote division and if you are going to promote rancour? You treat Field Marshal Sarath Fonseka like "dirt", and claim to be very concerned about your soldiers. Who will believe this? How can it be believed? So, I think, Sir, this type of thing must stop. We must all work towards a better future for this country. This Government has been elected to be in power. Please, govern! Please, do not dilly-dally. Take bold decisions, implement them and show that you can govern.

Thank you, Sir.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. Next, the Hon. Eran Wickramaratne.

[අ.භා. 1.58]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ස්තුතියි. මම පළමුවෙන්ම, "රජය සෘජු තීරණ ගත යුතුයි" කියලා විපක්ෂ නායකතුමා කියපු කථාවත් එක්ක එකඟ වෙනවා. තෙල් හා ගෑස් බෙදා හැරීම අත්‍යවශ්‍ය සේවාවක් හැටියට ප්‍රකාශ කරන්න ජනාධිපතිතුමාට සිදු වෙලා තිබෙනවා. මොකද සුළු පිරිසක් මුළු රටම කොන් කර ගන්න වැයමක යෙදී සිටින නිසා. රජය රජයේ වග කීම ඉෂ්ට කරනවා. රජයට ඡන්දය දුන්නු අය වෙනුවෙනුත්, රජයට ඡන්දය නොදුන්නු අය වෙනුවෙනුත් අපේ

වගකීම ඉෂ්ට කරනවා. ජනාධිපතිතුමායි, අගමැතිතුමායි කිසිම මැළිකමක් නොමැතිව නීතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කරන්නට කටයුතු කරගෙන යනවා. ජන ජීවිතය සාමකාමීව දිගින් දිගටම තබා ගෙන යන්න ගන්නා තිබෙන පියවර සියල්ලක්ම අපේ රජය ගන්නවා. අද සිදු වෙලා තිබෙන්නේ, මේ වෘත්තීය සමිති වෘත්තීය ඉල්ලීම් මුල් කරගෙන නොව, දේශපාලන ඉල්ලීම් මුල් කරගෙන මේ වැඩ වර්ජනවල යෙදී සිටින එකයි.

ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි අපේ හවුල් සමාගමක් යොදවලා ඉන්දියාවත් එක්ක කටයුතු කර ඒකේ ලාභය ලබා ගන්න වෑයමක යෙදී ඉන්න කොට ඒ අය විරුද්ධ වෙනවා. නමුත් දශකයක් තිස්සේ කිසිම වෑයමක් තිබුණේ නැහැ, ඒ තෙල් ටැංකි ගන්න. අද විපක්ෂයේ දේශපාලන න්‍යාය පත්‍රය තමයි ඔය එක එක තැන්වල සිදු වෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒකාබද්ධ විපක්ෂයේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්, ඒකාබද්ධ විපක්ෂයේ. හරියටම හරි කිව්ව එක. ඒකාබද්ධ විපක්ෂයේ න්‍යාය පත්‍රය තමයි සිදු කරගෙන යන්නේ. ඒක ඇත්තටම සම්පූර්ණයෙන්ම පැහැදිලියි. මේ පින්තූර දිහා බලන කොට ඒකාබද්ධ විපක්ෂයේ ඔබතුමන්ලා සියලුදෙනාම මෙහි ඉන්නවා. ඔබතුමා කියපු එකත් එක්ක මම සම්පූර්ණයෙන් එකඟයි. ඒකාබද්ධ විපක්ෂයේ න්‍යාය පත්‍රය ගෙන යන්න තමයි මේ වෑයමේ යෙදී සිටින්නේ. නමුත් අපි මේ ජන ජීවිතය කඩාකප්පල් කරන්න ඉඩ තියන්නේ නැහැ. මොකද සුළු පිරිසකගේ න්‍යාය පත්‍රයට රට යට කරන්න දෙන්නට බැරි නිසා.

මම ගිය හැම තැනකම තෙල් පෝලිම් තිබෙනවා දැක්කා. ඒ තෙල් පෝලිම්වල ඔබතුමන්ලාගේ වාහන දැක්කේ නැහැ; ප්‍රාඩෝ දැක්කේ නැහැ; මර්සිඩීස් බෙන්ස් දැක්කේ නැහැ. ඒවා දැක්කේ නැහැ. ඒවා එකක්වත් දැක්කේ නැහැ. මෙන්න, දැක්කේ මේවා තමයි. මෙන්න, මේ පින්තූරවල තිබෙන දේ තමයි දැක්කේ. ත්‍රිරෝද රථ, මෝටර් සයිකල්, පෝලිම් ගහගෙන ඉන්නවා. මේ පින්තූරවල තිබෙන ඒවා තමයි දැක්කේ. මේ අයට තමයි ඒ අවාසිය සිදු වුණේ. මම මේ පින්තූරත් සභාගත කරනවා. මට කරුණාකරලා අවසර දෙන්න, ඒ පින්තූර **සභාගත*** කරන්න.

ත්‍රි රෝද රථ එළවන, බඩි වෑන් එළවන, කුඩා මෝටර් සයිකල් එළවන මේ අය ගිහිල්ලා දවසකට තෙල් ගහන්නේ රුපියල් 200කයි. රුපියල් 20,000ක තෙල් ගහන අය ඒ පෝලිම්වල හිටියේ නැහැ. මේ ක්‍රියා මාර්ගයෙන් මේ රටේ අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වයට තමයි පහර ගැහුවේ; ඒ අයගේ ආදායමට තමයි විශාල පහරක් ගැහුවේ. ඔය ඒකාබද්ධ විපක්ෂයෙන් ඇවිල්ලා ඒ පෝලිම්වල ඉන්න කාටවත් කථා කරනවා අපට දකින්නට ලැබුණේ නැහැ. එහෙම කවුරු හෝ මන්ත්‍රීවරයෙක් ඉන්නවා දැක්කේ නැහැ.

රජයට ඉවසීමක් තිබෙනවා. විපක්ෂ නායකතුමා කිව්වා, අපි සෘජුවම ක්‍රියා කරලා නැහැයි කියලා. ඒකේ ඇත්තකුත් තිබෙනවා. නමුත් අපේ ශක්තියත් ඒකයි. ඉවසීමෙන් ක්‍රියා කරන එක තමයි අපේ ශක්තිය. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ ක්‍රියාකරන්නට ඕනෑ. නමුත් ජන ජීවිතය අවුල් කරන්න නම් ඉඩ දෙන්නේ නැහැයි කියන එක අපි සඳහන් කරන්න ඕනෑ. අපි දන්නවා, වර්ෂාව නිසා ජල ගැලීම් තිබුණා කියලා. ඒ වාගේම නියඟයකුත් තිබුණා. නමුත් ආර්ථිකයේ සියයට 4ක පමණ වර්ධනයක් සිදුවෙමින් තිබෙනවා. අද ව්‍යාපාරවල, කර්මාන්තශාලාවල රැකියාවලට යන්න මිනිසුන් නැහැ.

මහ බැංකුවේ වාර්තාව අනුව අප දන්නවා, 2016 වර්ෂයේ රැකියා ලක්ෂයකට වඩා ඇති වෙලා තිබෙන බව. අප්‍රේල් මාසයේ විදේශ සංචිතය ඩොලර් බිලියන 5යි. නමුත්, ජූලි මාසය වන විට විදේශ සංචිතය ඩොලර් බිලියන 7ක් වෙනවා. රජයේ ආදායම ඉහළට ගිහින් තිබෙනවා. අය වැය පරතරය පහළට ගිහින් තිබෙනවා. නමුත්, රජය මොනවා කළත් සාමාන්‍යයෙන් විරුද්ධ වෙන්න තමයි වෑයමක් තිබෙන්නේ.

අප ගිලන් රථ සේවාවක් ආරම්භ කළේ අඩු ආදායම්ලාභීන්ටයි; මේ රටේ සාමාන්‍ය ජනතාවටයි. ඒකටත් විරුද්ධ වුණා. නමුත්, අප ඒක කළා. මත්ස්‍ය තහනම අප ඉවත් කළා. GSP Plus එක අප ලබා දුන්නා. හම්බන්තොට කාර්මික ජනපදයක් අප ඇති කරනවා. හම්බන්තොට වරාය සම්බන්ධයෙන් ඒ ගිවිසුමත් අප සභාගත කර තිබෙනවා. ඒ ගැන වාද විවාද කරන්න අප ලැහැස්තියි.

එපමණක් නොවෙයි, අප වෙළෙඳ ගිවිසුම් නිර්මාණය කරගෙන යනවා. අද අපට කෝටි දෙකක වෙළෙඳ පොළක් පමණයි තිබෙන්නේ. අපි කෝටි 400කට වෙළෙඳ පොළක් නිර්මාණය කරගෙන යනවා. ඒ වෙළෙඳ ගිවිසුම් පාර්ලිමේන්තුවට ගෙනැත්, ඒවාත් අප අනුමත කරගන්නවා. මේක තමයි අපේ ගමන. මේක අප හංග හංගා කරන එකක් නොවෙයි. අපේ න්‍යාය පත්‍රය පැහැදිලියි; ආර්ථික ප්‍රතිපත්තිය පැහැදිලියි. අප මේ දේවල් කරන්නේ මේ රටේ ජනතාවගේ යහපත සඳහායි කියා විශ්වාස කරන නිසා තමයි අප මේ න්‍යාය පත්‍රය අනුව ක්‍රියා කරන්නේ. ඒ දේවල්වලට විරුද්ධ වෙන කොට, "විදේශිකයන්ට ඉඩම් විකුණනවා" කියා කියනවා. උල්හිටියේ අක්කර 1,000ක් විදේශිකයන්ට වික්කේ කවුද, පැල්වත්තේ අක්කර 1,000ක් විදේශිකයන්ට වික්කේ කවුද කියා මම අහනවා. සෝමාවතියේ අක්කර 5,000ක් විදේශිකයන්ට වික්කේ කවුද කියාත් මම අහනවා. චීනය සමඟ ගිවිසුම් ගහලා කොළඹ වරාය නගරයේ අක්කර 20ක් සින්නක්කරයට දෙන්න එකඟ වුණේ කවුද කියාත් මම අහනවා. ගාලු මුවදොර ඉඩම චීන සමාගමට -ෂැන්ග්‍රි-ලා හෝටලයට- සින්නක්කරයට දුන්නේ කවුද කියාත් මම අහනවා.

කොළඹ වරාය ගත්තොත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ තිබෙන බහලුම් පර්යන්තය හැර තව පර්යන්ත දෙකක් තිබෙනවා. SAGT පෞද්ගලික සමාගම තිබෙනවා. ඒකේ රජයට තිබෙන අයිතිය සියයට 15ක් පමණයි. අනික් පෞද්ගලික සමාගම්වලට එහි සියයට 85ක අයිතියක් තිබෙනවා. කොයි ආණ්ඩුවද ඒකට ගිවිසුම් ගැහුවේ, කවුද එය කළේ කියා මා අහන්න කැමැතියි. අවුරුදු ගණනාවකට උඩදී CICT කියා තවත් බහලුම් පර්යන්තයක් විවෘත කළා. එම පර්යන්තයේ අයිතිය තිබෙන්නේ කොහොමද? චීන සමාගමකට සියයට 85යි; ශ්‍රී ලංකාවට සියයට 15යි. කවුද ඒ ගිවිසුම ගැහුවේ කියා මම අහන්න කැමැතියි. මේ සියලුම ඉඩම් වික්කේ පසු ගිය ආණ්ඩුව බව මම කියන්න ඕනෑ. නමුත්, අප ඒකට විරුද්ධ වුණේ නැහැ. SAGT එක හදන කොට, CICT එක හදන කොට අපි විරුද්ධ වුණේ නැහැ; අපි මිනිසුන් පාරට බැස්සුවේ නැහැ; බෝඩ් අල්ලාගෙන හිටියේ නැහැ. මොකද, යමක් කරන්නේ මේ රටේ පොදු ජනතාවගේ යහපත සඳහා නම් අප එයට එකඟයි. එහෙමයි අප විශ්වාස කරන්නේ. රජයෙන් ගෙනාවත්, අප විපක්ෂයේ ඉඳලා ඒකට විරුද්ධ වුණේ නැහැ. ඒ දේවල් ඒ අය කරගෙන යන කොට අප විරුද්ධ වුණේ නැහැ.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොරු දේශ ප්‍රේමීත්වයක් මවාගෙන මේ රජයේ කටයුතුවලට අකුල් හෙළනවා නම්, 2020 පෙබරවාරි මාසය වනතුරු -දිගටම- අප මේ රජය පවත්වාගෙන යනවාය කියන කාරණය මම සඳහන් කරනවා. කාටවත් මේ රජය සොලවන්න බැහැ. පොදු ජනතාව වෙනුවෙන් අප අපේ පරමාර්ථය ඉෂ්ට කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.08]

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගැනෙන මෙම ගැසට් පත්‍රයේ ප්‍රස්තුතය වෙලා තිබෙන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින්ගේ වැඩ වර්ජනයයි. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයින් කියන්නේ අපේ රාජ්‍ය සේවයේ ඉන්න සුපිරි සේවක පිරිසක්; ඉහළ වැටුප් ලබන, ඉහළ දීමනා ලබන, වැඩියෙන් සැලකුම් ලබන පිරිසක්. මේ අය මේ සටන් කරන්නේ තමන්ගේ වැටුප වැඩි කර ගන්න නොවෙයි. මේ අය මේ සටන ගෙන යන්නේ තමන්ගේ දීමනා, පහසුකම් වැඩි කරන්න කියලා නොවෙයි. මේ අය මේ සටන කරන්නේ රට වෙනුවෙනුයි; නුපන් පරම්පරාව වෙනුවෙනුයි; අපට අපේ මුතුන් මිත්තන්ගෙන් ලැබුණු ජාතික සම්පත් ඊළඟ පරම්පරාවටත් සුරැකිව භාර දිය යුතුයි කියන විශ්වාසය ඔවුන්ගේ හදවත් තුළ තිබෙන නිසායි. ගුටි කන්නේ, බැනුම් අහන්නේ, හිරේ ලඟින්නේ මෙන්න මේ අධිෂ්ඨානය ඒ සේවකයින්ගේ හදවත් තුළ තිබෙන නිසායි. ඔවුන් සැබවින්ම දේශප්‍රේමී වීරයින් විධියටයි අපි නම් දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මුල් කාලයේ ආරංචි වුණා මේ ආණ්ඩුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ලංකා රෝහල, වෝටර්ස් ඒජ් හෝටලය පෞද්ගලීකරණය කරනවා කියලා. ඒවා පෞද්ගලීකරණය කළාට පස්සේ ඊළඟ ආණ්ඩුවකින් නැවත පවරා ගැනීමක් කර ගන්න පුළුවන්. එවැනි දේවල් මේ මෑත අතීතයේ ඕනෑ තරම් සිදු වුණා. නමුත්, වරාය, තෙල් ගබඩා කියන්නේ ජාතික ආරක්ෂාවට අතිශයින්ම වැදගත්, ජාතික ආර්ථිකයට අතිශයින්ම වැදගත් අපේ රාජ්‍යයේ ජාතික මර්මස්ථාන. මේවා පෞද්ගලීකරණය කිරීම, විශේෂයෙන්ම විදේශීය බලවතුන්ට මේවා භාර දීම පරම්පරා ගණනකට බලපාන ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවා දෙන්නේ නේපාලයට නම්, මේවා දෙන්නේ මාලදිවයිනට නම් අර අවුරුදු 99 ඉවර වුණාම හෝ ගන්න පුළුවන් කියලා හිතන්න පුළුවන්. එහෙම නැත්නම් අවුරුදු 99 ඉවර වෙන්න කලින් කථා බහ කරගෙන බෙරා ගන්න පුළුවන් කියලා හිතන්න පුළුවන්. හැබැයි, මේ හම්බන්තොටට, ත්‍රිකුණාමලයට එන්නේ අනාගත ලෝකයේ සුපිරි බලවතුන් දෙදෙනායි. අවුරුදු 99න් පස්සේ ඒ අයට යන්න කිව්වාම නොගියොත් අපි මොකද කරන්නේ? ගේ අස්සට බල්ලෙක් රිංගුවාම නම් කොස්ස අරගෙන එළවා දමන්න අපට පුළුවන්. හැබැයි, ගේ අස්සට රිංගා ගන්නේ සිංහයෙක් නම් සිංහයාට ගෙය දීලා අපට එළියට දුවන්න සිද්ධ වෙනවා. සුපිරි බලවතුන්ට මේ රටේ කොටස් පැවරීම සිංහයකු ගෙට වද්දා ගැනීම හා සමානයි කියන එක අපි සිහිපත් කරන්න ඕනෑ.

දැන් ආණ්ඩු පක්ෂයේ මෙතුමන්ලා කිව්වා, දේශපාලනික කාරණා සඳහා මේ වැඩවර්ජන කරනවායි කියලා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පසු ගිය මැතිවරණවලදී "හම්බන්තොට චීනයට", "ත්‍රිකුණාමලය ඉන්දියාවට" යනාදී වශයෙන් සඳහන් කරලා ජන වරමක් ගත්තා නම් මේවාට සටන් කරන්න, උද්ඝෝෂණ කරන්න, වැඩ වර්ජන කරන්න අපට අයිතියක් නැහැ කියලා අපි පිළිගන්නවා. තමුන්නාන්සේලා ජාතියට කොළේ වහලායි බලය ලබාගත්තේ. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනවල මේ කිසි දෙයක් සඳහන් වෙන්නේ නැහැ. අන්න ඒ නිසායි මේ සේවකයින්ට හා අනෙකුත් දේශප්‍රේමී බලවේගවලට පාරට බැහැලා මව් බිමේ සම්පත් වෙනුවෙන් සටන් කරන්න සිදු වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා පසුගිය වසරේ තායිලන්ත ආණ්ඩුවත්, චීන ආණ්ඩුවේ සමාගමකුත් එක්ව තායිලන්තයේ ක්‍රා ප්‍රදේශය හරහා කිලෝ මීටර් 42ක් දිග ඇළක් ඉදි කිරීමට තීරණය කළ බව. මේ ඇළ ඉදි කිරීම වසර 10කින් සම්පූර්ණ වෙනවා. ක්‍රා ඇළ ඉදි කිරීමෙන් පස්සේ ඈත පෙරදිග ජපානය, කොරියාව, චීනය, වියට්නාමය වාගේ රටවලට නැව් ගමනාගමනයේ දුර කිලෝ මීටර් 1,200කින් අඩු වෙනවා. අපට මතකයි, සූවස් ඇළ කැපුවාට පස්සේ ලෝකයේ කාර්ය බහුලම වරාය බවට පත් වෙලා තිබුණු සුභ පැතීමේ තුඩුව වරාය හොල්මන් වරායක් බවට, පාළු වරායක් බවට පත් වුණා. තවත් වසර 9කින් ක්‍රා ඇළ ක්‍රියාත්මක වීමේදී සිංගප්පූරු වරායටත් අර සුභ පැතීමේ තුඩුව වරායට අත් වූ ඉරණම අත් වීමට නියමිතයි. ඒ තැන ගන්න මේ සේද මුහුදු මාර්ගයේ තිබෙන වඩාත්ම වැදගත් වරාය බවට පත් වෙන්නේ කුමක්ද? ඒ, අන් කවරක්වත් නොව, අපේ හම්බන්තොට වරායයි. එහි ඉතාම වැදගත් ව්‍යාපාරය බවට පත් වෙන්නේ ලෝකයේ කාර්ය බහුලම මුහුදු සේද මාවතේ ගමන් කරන නැව්වලට තෙල් සැපයීමයි. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගැබ්බර වුණු ගමන් එළ දෙන විකුණා දැමීමකට හා සමානයි හම්බන්තොට වරායත්, ඒ තෙල් ගබඩා සංකීර්ණයත් චීනයට ලබා දීමට මේ ආණ්ඩුව අරගෙන තිබෙන තීරණය.

අනෙක් පැත්තෙන් ඉන්දියාවේ වුවමනාව මොකක්ද? ඉන්දියාව වටා නැව් ගමන් කරන්න බැහැ. ඒකට හේතුව තමයි, හනුමා පාලම සහ පෝක් සමුද්‍ර සන්ධිය ගැඹුරු ස්ථානයක් නොවීම. ඉන්දියාව 1997දී සේතු සමුද්‍රම් නමින් ව්‍යාපෘතිය ආරම්භ කළේ හනුමා පාලම කඩලා දාලා මුහුදු භාර ගන්නයි. ඒක කරන්න බැහැ කියලා තේරිලා වසර 2000දී මේ ව්‍යාපෘතිය අත් හැරලා දැම්මා. ඉන්දියාවේ බස්නාහිර සහ නැගෙනහිර ප්‍රදේශවල තිබෙන වරායන් අතර අන්තරාල වෙළඳාමේදී - entrepot trading සඳහා - පාවිච්චි කරන්නේ අපේ කොළඹ වරායයි. ඒකෙන් ඉන්දියාවෙන් ලංකාවට විශාල මුදලක් ගලා එනවා. ඉන්දියාවෙන් ලංකාවට ගලා එන මේ මහා ධන සම්භාරය නැවත ඉන්දියාවට අත් කරගැනීමේ යටි අරමුණෙන් තමයි ත්‍රිකුණාමලය වරාය ඉන්දියාව අත් පත් කරගන්න උත්සාහ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම බලන කොට ඉන්දියාවයි, චීනයයි අපේ රටට එන්නේ ටික කලක් ඉඳලා යන්න නොවෙයි; දීර්ඝ කාලීන යුද, දේශපාලන, ආර්ථික වුවමනාවන් ඉටු කරගන්නයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපට උපාය මාර්ගික වශයෙන් වැදගත් වන මේ දේශීය සම්පත් විදේශිකයන්ට ලබා දිය යුතුද, නැද්ද කියන ඉතාම වැදගත් ප්‍රශ්නය තමයි බනිජ තෙල් සේවකයන් තමන්ගේ වැඩ වර්ජනය හරහා මේ ජාතිය ඉදිරියේ තබලා තිබෙන්නේ. මේ පිළිබඳව අවම වශයෙන් පාර්ලිමේන්තුව තුළවත් සංවාදයක් ඇති වුණාද? දැන් කියනවා, "මේ ගිවිසුම ගැන හෙට විවාදයක් තිබෙනවා" කියලා. හැබැයි, ඒ අතර අපට මාධ්‍ය වාර්තා කරනවා, "අනිද්දා ගිවිසුම අත්සන් කරනවා" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම සිද්ධ වෙනවා නම් පාර්ලිමේන්තුවේ විවාද කිරීමේ ඇති ඵලය මොකක්ද? මේ විවාදයේ මතු වෙන කරුණුවලින් ඒ තීරණය කෙරෙහි බලපෑමක් කරන්න බැරි නම්, හුදු විලාසිතාවක් සඳහා පමණක් තමන් ප්‍රජාතන්ත්‍රවාදී යැයි ලෝකයට පෙන්වීමට පමණක් මේ පාර්ලිමේන්තුව මෙවලමක් කරගැනීමේ දුෂ්ට උත්සාහයක් පමණයි හෙට තිබෙන විවාදයෙන් ඇත්තටම සිද්ධ වෙන්නේ. මේ සේවාවන් අත්‍යවශ්‍ය සේවාවන් බවට පත් කිරීම කමක් නැහැ කියලා කියමු කෝ. මේ වැඩ වර්ජනයට ආණ්ඩුවේ පළමුවැනි ප්‍රතිචාරය, මේ සේවාවන් අත්‍යවශ්‍ය සේවාවන් විධියට ප්‍රකාශයට පත් කර ගැසට් නිවේදනයක් නිකුත් කිරීමෙන් නතර වුණේ නැහැ. අපි ඊයේ දැක්කා, මේ සේවකයන් මර්දනය කරන්න පොලීසිය සහ හමුදාව යෙදවූ ආකාරය.

ඊළඟට, මැරයන් යොදා පහරදීමක් සිද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපි දැක්කා, පොලිස් නිලධාරීන් ඉතාම ආදරයෙන් මේ වෘත්තීය සමිති නායකයන් හඳුනා ගනිමින් ඒ අයව පොලීසියේ ලොරියකට පටවා ගන්නා ආකාරය. ඊට පස්සේ පොලීසිය ඇතුළේදී ඉතාම නින්දිත ආකාරයට පොලිස් නිලධාරීන් මේ අයට පහර දීලා තිබෙනවා. එසේ පහරදීලා වෘත්තීය සමිති නායකයන් අධිකරණ වෛද්‍ය නිලධාරි ළඟට ගෙන යාම සිතා මතා පරක්කු කළා. හැමදාමත් අසත්‍ය කියන පොලීසියේ මාධ්‍ය ප්‍රකාශක නිවේදනයකින් කිව්වා, "පොලිස් ඇප මත මේ අය නිදහස් කළා." කියලා. නමුත්, ඇත්තටම සිද්ධ වුණු දේ ඒක නොවෙයි. මම මේ අය සමඟ අධිකරණ වෛද්‍ය නිලධාරි ළඟට ගියේ රාත්‍රී 8.00ටයි. රාත්‍රී 8.00 වන තුරුත් අධිකරණ වෛද්‍ය නිලධාරියා ළඟට ගෙන යාම සිතා මතා පමා කළා. මොකද, පහරදීම නිසා ඔවුන්ට සිදුවී ඇති තැළුම්, රිදුම්, ඉදිමීම්, සමනය වුණාට පස්සේ තමයි පොලීසියට අවශ්‍ය වුණේ මේ සේවකයන් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයාට ඉදිරිපත් කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මෙන්න මේ කාරණයත් මම කියන්න ඕනෑ. අද මේ රට වෙනුවෙන් කරන සටනට ආණ්ඩුවේ ප්‍රතිචාරය මේක නම්, ඉදිරියේදී මීට වඩා ප්‍රචණ්ඩව ජනතාව ආණ්ඩුවට ප්‍රතිචාර දක්වන්න ඉඩ තිබෙනවා. මීට වසර 30කට කලින් අගමැතිතුමාගේ මාමණ්ඩිය රට කරන සමයේ ආණ්ඩුවේ මර්දනය පිළිබඳව "සුනිල් ආරියරත්න - නන්දා මාලනී" සුසංයෝගය විසින් දැක්වූ ප්‍රතිචාරයක් සඳහන් කරමින් මම මගේ කථාව අවසන් කරනවා. ඒ තමයි, "උපන් බිමට පෙම් කිරීම දඬුවම් දෙන වරද නම් - කුමට එරට අධිකරණය නීතිය සහ විනිසුරන්". තෙරුවන් සරණයි!

[අ.භා. 2.18]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - திறன்கள் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Skills Development and Vocational Training)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී මට කථා කරන්න අවස්ථාවක් ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 2015 මේ රජය බලයට පත් වන තුරු සෑහෙන කාලයක් -දශක කිහිපයක්ම- මේ රට ක්‍රියාත්මක වුණේ, වැඩ කටයුතු සිද්ධ වුණේ හදිසි නීතිය යටතේයි. යුද්ධ කාලයේ හදිසි නීතිය ක්‍රියාත්මකවීම කවුරුත් පිළිගත්ත කාරණාවක්. නමුත්, යුද්ධය අවසන් කිරීමේ කීර්තිය ඕනෑවටත් වඩා අත් පත් කරගත්ත මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේදීත් -යුද්ධයෙන් පස්සේ මේ රටේ ඇති වුණු සාමකාමී කාලයේදීත්- අපේ රට ක්‍රියාත්මක වුණේ හදිසි නීතිය යටතේයි. 2015න් පස්සේ තමයි හදිසි නීතිය නැති කරලා සාමාන්‍ය නීතිය යටතේ මේ රට පාලනය වෙන්න පටන් ගත්තේ. මිනිස්සුන්ට සාමාන්‍ය වෙලා තිබුණේ සාමාන්‍ය නීතිය නොවෙයි, හදිසි නීතියයි. දැන් මේ සාමාන්‍ය නීතිය යටතේ රට ගෙනියන කොට අපට ජේනවා, හැම තැනින්ම උද්ඝෝෂණ, වර්ජන යනාදිය එනවා කියලා. ගරු මරික්කාර් මන්ත්‍රීතුමා උදේ ප්‍රකාශ කළා වර්ජන, උද්ඝෝෂණ 1,000කට වැඩි ප්‍රමාණයක් මේ යහ පාලන කාලය තුළ සිද්ධ වුණා කියලා. [බාධා කිරීමක්] කියන්න ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හදිසි නීතිය අයින් කරපු අවුරුද්ද ඔබතුමාගෙන් කියැවුණේ වැරදියටයි. 2015න් පස්සේ නොවෙයි හදිසි නීතිය අයින් වුණේ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හදිසි නීතිය ඉවත් කළේ, 2005දී. එය නිවැරදි කරගෙන කථා කරන්න. මම ඔබතුමාට උදව්වක් කළේ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
හදිසි නීතියේ යම් යම් කොටස් අයින් කළාට, හදිසි නීතිය යටතේ රට පාලනය වුණා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඒ කාලයේ ඔබතුමා හිටියේ අපිත් එක්ක.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ඒක මම කියන්නම්. මම එතැනින් ආවේ ඇයි කියලා රටටම කියලා තිබෙනවා නේ. දැන් මට කියන්න ඕනෑ වුණ කාරණා- [බාධා කිරීම්] හදිසියේ ආවේ ඒකයි.

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න ඕනෑ කාරණය මේකයි. සාමාන්‍ය නීතිය රටේ ක්‍රියාත්මක වන කොට ආකාර දෙකකින් වර්ජන, උද්ඝෝෂණ සිද්ධ වනවා. සමහර ඒවා සාධාරණයි; සාධාරණ උද්ඝෝෂණ. සාධාරණ වර්ජන වාගේම මහාචාර්ය කාලෝ ෆොන්සේකා මැතිතුමාගේ වචනයෙන් කියනවා නම් අති දුර්ජන වර්ජනත් සිද්ධ වනවා. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේත් ක්‍රියාත්මක වුණ වැඩ වර්ජනය වෘත්තීය සමිතිවල ඉල්ලීමක් මුල් කරගත් වර්ජනයක්වත්, වැඩ බිම පිළිබඳ ඉල්ලීමක් මුල් කරගත් වර්ජනයක්වත්, ජාතික සම්පත් රැකීම පිළිබඳ වර්ජනයක්වත් නොවෙයි. ඒක අති දුර්ජන වැඩ වර්ජනයක්. ඇයි මම එහෙම කියන්නේ? ඒක දැනගන්න මේ වර්ජනය කරන කාරණා දිහා අපි බලමු.

මේ වර්ජනයේ පළමුවැනි ඉල්ලීම වශයෙන් තිබුණේ ත්‍රිකුණාමල වරායේ තෙල් ටැංකි පිළිබඳ කාරණය. ඒ කාරණය සම්බන්ධයෙන් වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා එකඟතාවකට එන්න ආණ්ඩුව ස්ථාවරයකට ඇවිල්ලා තිබුණු වෙලාවකයි මේ වර්ජනයට ඒ ඉල්ලීමත් දාගෙන තිබුණේ. ඊළඟට, කොළොන්නාවේ තෙල් පිරිපහදුව නවීකරණය කිරීම කියන කාරණය. ඒ කාරණයේදීත් ආණ්ඩුවට වෘත්තීය සමිතිත් එක්ක ගැටුමක් නැහැ. නමුත් ඒකත් මෙම වර්ජනයේ ඉල්ලීමක් විධියට දාගෙන තිබුණා. ඊළඟට, හම්බන්තොට වරායේ තෙල් ටැංකි පිළිබඳ කාරණය. ඒක ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට අදාළ කාරණාවක් නොවෙයි. ඒ තෙල් ටැංකි පිළිබඳ අයිතිය තිබෙන්නේ ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට නොවෙයි, වරාය අධිකාරියට. වරාය අධිකාරියේ සේවකයෝ ඒ තෙල් ටැංකි සම්බන්ධ කාරණාවක් මතු කළා නම්, අඩුම තරමින් එහි සාධාරණත්වයක් දකින්න තිබුණා. ඒ මොකුත් නැතිව මේ ආවේ වෙන මොකක්වත් නොවෙයි, දේශපාලන වැඩ වර්ජනයක්. මේ අය කල්පනා කරනවා, සාමාන්‍ය නීතිය යටතේ වැඩ වර්ජනය කරලා, කරලා, කරලා ජන ජීවිතයට බාධා කරන කොට ජනතාවට ආණ්ඩුව එපා වෙයි කියලා. නමුත් ඒක නොවෙයි වෙන්නේ. පෙරේදා වුණේ මොකක්ද? ඊයේ වුණේ මොකක්ද? ජනතාවට ආණ්ඩුව වැඩියෙන් ඕනෑ වුණා. ඒක තමයි මුළු රටෙම ජනතාව ප්‍රකාශ කළේ, "මේකට මොනවා හෝ කරන්න" කියලා. "මේ දුර්ජන වැඩ වර්ජනයට එරෙහිව මොනවා හෝ කරන්න" කියලා, ජනාධිපතිතුමා ඇතුළු සියලුදෙනාගෙන්ම ජනතාව ඉල්ලා සිටියා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මේ අර ඉස්සර හිටපු පරණවිතාන නේද?

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(මාණ්පුමිකු කරුණාරත්න පරණවිතාන)
(The Hon. Karunarathna Paranawithana)
ඔව්, මේ එයාම තමයි කථා කරන්නේ. කිසි වෙනසක් නැහැ. ඒ ජවය, ඒ ගුණ ධර්ම, ඒ ප්‍රතිපත්තියම තිබෙන නිසා තමයි ඒකාධිපති වාදයට, පවුල් වාදයට, වර්ග වාදයට, ආගම් වාදයට, කොල්ල කෑමට එරෙහිව අපි එළියට බැස්සේ. [බාධා කිරීම්] ඇයි, මොකද? [බාධා කිරීම්] වෙන විවාදයකදී මම ඒ ගැන පැහැදිලි කරලා දෙන්නම්. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරුනි, තමුන්නාන්සේලා කථා කරන කොට මම බාධා නොකර හැම දාම අහගෙන ඉන්නවා. තමුන්නාන්සේලා කථා කරන ඒවා කොච්චර අප්‍රසන්න වුණත් මම අහගෙන ඉන්නවා. ඒ නිසා මටත් කථා කරන්න ඉඩ දෙන්න. දැන්, -[බාධා කිරීම්] ඔබතුමන්ලා කියන ඒවා තේරෙන්නේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරාය ගිවිසුම පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී අපි හෙට සාකච්ඡාවක් කරනවා. මේ ආයෝජනය කරන්නට අපේ රටට පුළුවන්කමක් තිබෙනවා නම්, ත්‍රිකුණාමලය සම්බන්ධ ප්‍රශ්නය බෙරා ගන්න අපට පුළුවන්කමක් තිබෙනවා නම්, අපට මේ කිසිවක් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. නමුත්, අද අපට විදේශ ආයෝජන අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ විදේශ ආයෝජන ගෙන ඒමේදී රට විකුණන්නේ නැති ක්‍රමයකටයි අපට යන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ. වරාය නගරය පිළිබඳ පරණ එකඟතාව මොකක්ද? ඒක චීනයට සින්නක්කරව විකිණීම තමයි එකඟතාව. හම්බන්තොට වරාය සම්බන්ධයෙන් එදා කරන්න ගියේ මොකක්ද? ඒ හෙක්ටෙයාර් 1,500ම චීනයට සින්නක්කරව දීම තමයි කරන්න ගියේ. ෂැන්ග්‍රි-ලා එකට ඉඩම් දීලා, එහෙම දෙන්න පුළුවන් කියලා කරලා පෙන්නුවා. අපි ඒවා වෙනස් කරලායි මේ ගිවිසුම ගෙනෙන්නේ. ඒවා වෙනස් කරලා, රටේ ජාතික ආරක්ෂාව පිළිබඳ අයිතිය තහවුරු කරලා, නාවික හමුදාවට හා රේගුවට මේකට මැදිහත් වෙන්න තිබෙන ඉඩකඩ තහවුරු කරලායි මේ ගිවිසුම ගෙනැල්ලා තිබෙන්නේ. දැන් මම ඒ සම්බන්ධයෙන් වැඩිය කථා කරන්න යන්නේ නැහැ. මොකද, අපි හෙට ඒ සම්බන්ධයෙන් විවාදයක් කරන නිසා.

දැන් සමහර ගරු මන්ත්‍රීවරු කියනවා, "මේ පාර්ලිමේන්තුව වැඩක් නැහැ, අපට මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න දෙන්නේ නැහැ" කියලා. ඊයේ අපි නියමය 5ක්, යෝජනාවක් සහ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළා, කථා කරන්න. නමුත් තමුන්නාන්සේලා මොකක්ද කළේ? ඒ ගැන කථා කරන්න ඉඩ දුන්නාද? සාකච්ඡාවට ඉඩ දුන්නාද? පාර්ලිමේන්තුව මස්තබාල්දු කළේ කවුද? එහෙම කරලා අද මේ ගරු සභාවේදී කියනවා, "කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ"යි කියලා. එම නිසා සියලුදෙනාගෙන්ම මා ඉල්ලා සිටින්නේ, මේ රට අරාජිකත්වයට අරගෙන ඇවිත්, මහ ජනතාවගේ ජීවිතයට බාධා කරලා, නැවත වතාවක් ඒ දූෂිත, දුර්තාන්ත පාලනය තහවුරු කරන්න සූදානම් වන්න එපා කියලායි. මේ ආණ්ඩුව පෙරළන්න ඒ ගොල්ලන් සූදානම් නම්, මේ ආණ්ඩුව රැක ගන්න අපිත් එළියට බහින්න සූදානම් කියලා මා මතක් කරන්න කැමැතියි.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ද සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
එය පරණ කථාවක් නේ.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(මාණ්පුමිකු කරුණාරත්න පරණවිතාන)
(The Hon. Karunarathna Paranawithana)
පරණ වුණත් ඒක අලුත් විධියට ඔබතුමාට ඇහෙනවා. [බාධා කිරීමක්] එහෙමද ඇහෙන්නේ? එහෙම නම් අපි ඒක රත්නපුරයේදී බෙරා ගනිමු.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන්ගෙන් මා ඉතා කරුණාවෙන්, ආදරයෙන් ඉල්ලා සිටින්නේ මේකයි. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට ආදරය කරන අය එතැන ඉන්නවා. එදා පවුලේ උදව්ය, ඥාතීන්, අන්තේවාසිකයන් ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවට, ගුවන් සමාගමට, ශ්‍රී ලංකා වරාය අධිකාරියට පත් කරලා, ඒවා විනාශ කරනකොට, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සිටින ඔය දේශ ප්‍රේමීන් එක් කෙනෙක්වත් ඒවාට විරුද්ධව නැඟිටිවේ නැහැ. ඒවා පාඩු කරනකොට, ඒවා කොල්ල කනකොට, ඒවා ඥාතීන්ගේ දේපොළක් බවට පත් කරනකොට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ එක් කෙනෙක්වත් ඊට විරුද්ධව නැඟිවේ නැහැ. ඒ වාගේම, මේ අරගලය ඔස්සේ අද මේ ගොල්ලෝ කියන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය බංකොලොත් කරන්න කියලායි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ වනවිටත් නිෂ්ප්‍රයෝජනයේ තිබෙන හම්බන්තොට වරාය වෙනුවෙන් රුපියල් මිලියන 46,000ක් ගෙවා තිබෙනවා. ඊළඟ අවුරුද්ද වනකොට තවත් රුපියල් මිලියන 15,000ක් ගෙවන්න තිබෙනවා. ණය ගෙවලා, ණය ගෙවලා

ශ්‍රී ලංකා වරාය අධිකාරිය හින්දවලා, කොළඹ වරායත් බංකොලොත් කරන්න කියලාද ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේශපාලන වෘත්තිය සමිති කියන්නේ? ඒකට මේ රටේ ජනතාව සූදානම් නැහැ වාගේම ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවකයනුත් සූදානම් නැහැයි කියන එක මතක් කන්න ඕනෑ.

මේ කැඳවපු වැඩ වර්ජනය අතිදුර්ජන වැඩ වර්ජනයක්; ජනතා විරෝධී වැඩ වර්ජනයක්; මේ දුර්දාන්ත ක්‍රමයට එරෙහිව මේ රටේ ජනතාව නැවත වතාවක් ඒක රාශි කරපු වර්ජනයක්; මේ දුර්දාන්ත කණ්ඩායමට එරෙහිව ජනතාව ඒකරාශි කරපු වර්ජනයක්. අන්න ඒක විතරයි මේ වැඩ වර්ජනයෙන් සිද්ධ වුණු හොඳ දේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා.

ඒ විතරක් නොවෙයි. ගරු විපක්ෂ නායකතුමා එක කාරණාවක් මතක් කළා. මේ රට පාලනය කරන්න කියලා තමයි එතුමා ප්‍රකාශ කළේ. එහෙම නම්, ඒ කාරණයට රජය මැදිහත් වෙලා තිබෙනවාය කියන එකත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 2.28]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වනවා.

මට කලින් කථා කළ කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය අමාත්‍යවරයා කිව්වා, රටේ මහා විනාශයන් සිද්ධ වනකොට ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් නැඟිටිටේ නැහැයි කියලා. හැබැයි එහෙම කියන එතුමාත් ඒ කාලයේ කැනඩාවට වෙලා රජයේ තානාපති වරප්‍රසාද ලබා ගනිමින් සුව සේ ජීවිතයක් ගත කළා. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් ගැන කථා කරනකොට ඒකත් මතක තබා ගන්න ඕනෑ. එහෙම මහත්වරු තමයි දැන් මේ දේශ ප්‍රේමය පිළිබඳව, පොදු දේපොළ පිළිබඳව, වංචා දූෂණ පිළිබඳව, නාස්තිය පිළිබඳව කථා කරන මහා වියත් මහත්වරුන් බවට පත්වෙලා තිබෙන්නේ. ඒ නිසා ඉතිහාසය දෙසට පොඩ්ඩක් හැරිලා බලන්න, ඉතිහාසයේ මොකක්ද කළේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇති වුණු ප්‍රශ්නය පිළිබඳව දැන් විවිධ කරුණු, අදහස් ඉදිරිපත් කරමින් තිබෙනවා. මෙය ප්‍රධාන කරුණු තුනක් මත පදනම් වනවා. පළමුවන ප්‍රධාන කාරණය තමයි, ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි සංකීර්ණය ඉන්දියානු රජයට ලබා දීම සඳහා දරන ප්‍රයත්නය. ජූලි මාසයේ 13වන දා ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවක එකමුතුව අග්‍රාමාත්‍යවරයා සමඟ ඒ පිළිබඳව දීර්ඝ සාකච්ඡාවක් පවත්වා තිබුණා. ඔවුන් ඒ සඳහා වන යෝජනා ඉදිරිපත් කර තිබුණා. මේ පැන නැඟුණු වර්ජනයට ඒ කරුණ මූලික සාධකයක් වුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවන ප්‍රධාන සාධකය බවට පත් වුණේ, සපුගස්කන්ද තෙල් පිරිපහදුව නවීකණය කිරීමයි. මොකද, අවුරුදු 50කට ආසන්න කාලයක් මේ තෙල් පිරිපහදුව නවීකරණ නොකිරීම හේතුකොටගෙන එය කඩා වැටීමකට ලක්වෙලා තිබෙනවා.

2007 මුල් ගලක් තැබුවත්, ඒ සඳහා ඉඩම් පවරා ගැනීම් කර තිබුණත්, කාර්යාලයක් ගොඩනඟා තිබුණත්, පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත්ව සිදු නොවීම හේතුකොට ගෙන තෙල් පිරිවැය වෙනුවෙන් අද අපේ රටේ ජනතාවට විශාල බරක් දරන්න සිද්ධවෙලා තිබෙනවා. බොර තෙල් ආනයනය කරලා, පිරිපහදු කරලා විකුණනවා නම් මේ රටේ ජනතාවට මීට වඩා අඩු මිලට පෙට්‍රල් සහ ඩීසල් ලබාදීමේ හැකියාව තිබුණා. කල් මරනවා වෙනුවට, එය වේගවත්ව නවීකරණය කිරීම තමයි ඔවුන්ගේ ඉල්ලීම බවට පත්වුණේ. එය ඉතාම සාධාරණ ඉල්ලීමක්. හැබැයි, වැඩ වර්ජනය ප්‍රමුඛ වුණේ ඒ ඉල්ලීම මතම නොවෙයි. වැඩ වර්ජනය ප්‍රධාන ලෙස ප්‍රමුඛ වුණේ හම්බන්තොට වරායේ ගිවිසුම සමඟ එම වරායේ තිබෙන තෙල් ටැංකි සංකීර්ණය සහ නැව් තෙල් අංශය -නැව්වලට සේවා සැපයීමේ කාර්ය- චීන සමාගමකට පැවරීමයි. එය අතිශය වැදගත් සාධකයක් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපේ රටේ ආර්ථික සංවර්ධනයේ ඉතාමත් වැදගත් ක්ෂේත්‍රයක් තමයි අපේ රටේ පිහිටීම. ඒ පිහිටීම උපයෝගී කර ගැනීමේදී අපට වැදගත්ම ක්ෂේත්‍රය තමයි අපේ රටේ තිබෙන වරායන්. එහිදීත් හම්බන්තොට වරාය අනෙක් සාධකවලට වඩා වැඩියෙන් වැදගත් වෙන්නේ, නැව් තෙල් අංශයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආසන්න වශයෙන් ගත්තොත් හම්බන්තොට මුහුදු තීරයෙන් දවසකට නැව් 400කට ආසන්න ප්‍රමාණයක් ගමන් කරනවා. ආසන්න වශයෙන් එම නැව් 400න් නැව් 40කටවත් -එම නැව්වලින් සියයට 10කටවත්- තෙල් සැපයීමට අපට අවස්ථාව ලැබුණොත්, ඒ මඟින් තෙල් මෙට්‍රික්ටොන් 40,000ක වෙළෙඳාමක් කරන්න පුළුවන්. මෙට්‍රික්ටොන් එකකින් ඇමෙරිකානු ඩොලර් 15ක ලාභයක් ලැබුවොත්, මාසයක් ඇතුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 18ක ලාභයක් ලබන්න පුළුවන්. ඒ තරම් වටිනා, ආර්ථික වශයෙන් වැදගත්ම ක්ෂේත්‍රය තමයි මේ නැව් තෙල් අංශය. ඒ නිසා තමයි වරාය සේවකයන් නැව් තෙල් අංශය ගැන කථා කළේ. වරාය ගිවිසුම පිළිබඳව ඔවුන් ප්‍රශ්න කරන්නේ නැහැ. ඒක ගැන අපි හෙට කථා කරමු. හැබැයි, ඔවුන් ඉතා වැදගත් ලෙස කියන්නේ මොකක්ද? එතැන ගොඩනඟලා තිබෙනවා, මෙට්‍රික්ටොන් 75,000ක් ගබඩා කරන්න පුළුවන් ගබඩා සංකීර්ණයක්. ඒ වාගේම නැව්වලට තෙල් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් එතැන ගොඩනඟා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ගබඩා සංකීර්ණය උපයෝගී කරගෙන වරාය අධිකාරිය විසින් 2014 දී නැව්වලට තෙල් සැපයුවා. ඒ අනුව 214 වසරේදී ශ්‍රී ලංකා වරාය අධිකාරිය හම්බන්තොට වරාය හරහා නැව් තෙල් වෙළෙඳාම ඇරඹූ අතර, ප්‍රථම මාස 8 තුළ තෙල් මෙට්‍රික්ටොන් 69,000ක් අළෙවි කොට ඉපැයූ ආදායම රුපියල් බිලියන 4ක් වෙනවා. ඒ කියන්නේ වරාය අධිකාරිය මාස 8ක් තුළ රුපියල් මිලියන 4,000ක ආදායමක් ඉපැයුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය අධිකාරියට එතැනට තෙල් ගෙන ඒම සඳහා මුළු ගබඩා සංකීර්ණයම උපයෝගී කරගන්න සිද්ධ වෙන්නේ අන් කවරක් සඳහාවත් නොවෙයි, නැව්වලට අවශ්‍ය තෙල් ගබඩා කිරීම සඳහා පමණයි. හැබැයි, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව එම ගබඩා සංකීර්ණය උපයෝගී කරගන්නවා නම්, නැව්වලට අවශ්‍ය තෙල් පමණක් නොව, රට තුළ තෙල් බෙදීම සඳහාත් වඩා වැඩි කාර්යක්ෂමතාවක් ලබාගන්න පුළුවන්කම තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ගබඩා සංකීර්ණයේ තෙල් ගබඩා කරගෙන, ඒ මඟින් ගාල්ල,

[ගරු අනුර දිසානායක මහතා]

මාතර, හම්බන්තොට, මොනරාගල යන දිස්ත්‍රික්කවලට පමණක් තෙල් බෙදා හැරියොත්, ලංකා ඛනිජ තෙල් සංස්ථාවට ප්‍රවාහන වියදම පමණක් මසකට රුපියල් මිලියන 845ක් ඉතිරි වෙනවා. ලංකා ඛනිජ තෙල් සංස්ථා සේවකයන්ගේ යෝජනාව වුණේ මොකක්ද? වරාය පිළිබඳව ඔබතුමන්ලා තීරණයක් ගන්න, අපි ඒක ගැන හෙට කථා කරමු. තෙල් සංස්ථා සේවකයන්ගේ යෝජනාව වුණේ මොකක්ද? ඉතාම වැදගත්, නැව්වලට තෙල් ගැසීමේ අංශය සඳහා තිබෙන මෙම ගබඩා සංකීර්ණය සහ එම පහසුකම් ටික ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ලබාදෙන්න කියන එකයි ඔවුන්ගේ යෝජනාව වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව 2016 වසරේ දී ටෙන්ඩර් කැඳෙව්වා. මෙම නැව් තෙල් අංශය පැවරීම සඳහා වරාය අධිකාරිය ටෙන්ඩර් කැඳෙව්වා. ඒ සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් ටෙන්ඩරයක් ඉදිරිපත් කළා. තෙල් සංස්ථාව ටෙන්ඩරයක් ඉදිරිපත් කළාට පසුව සමාගම් 4ක් ටෙන්ඩර් ඉදිරිපත් කරලා තිබුණා. එම සමාගම්වලින් වඩාත්ම ලාභදායී ටෙන්ඩරය ඉදිරිපත් කරලා තිබුණේ තෙල් සංස්ථාව -CPC එක- විසිනුයි. ඒක නතර කළේ ඇයි? ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමතිතුමා දැන් අහනවා, මේකට තෙල් සංස්ථාවේ තිබෙන සම්බන්ධය මොකක්ද කියලා. තෙල් සංස්ථාවට තිබෙන සම්බන්ධය මේකයි. 2016 වසරේ මෙම නැව් තෙල් අංශය සඳහා වරාය අධිකාරිය විසින් ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඔවුන් ඉදිරිපත් කළ ටෙන්ඩරය මූලික සුදුසුකම් ලැබුවා. තමුන්නාන්සේලා ඒ ටෙන්ඩරය නතර කළා. මූලාසනාරූඪ ගරු මන්.ත්‍රීතුමනි, මාස 8ක තෙල් ගහලා ශ්‍රී ලංකා වරාය අධිකාරිය රුපියල් මිලියන 4,000ක ලාභයක් ලැබුවා.

මාසයකට හම්බන්තොට, මාතර, ගාල්ල, මොනරාගල තෙල් ප්‍රවාහන වියදම විතරක් රුපියල් මිලියන 845ක් ඉතිරි කර ගන්න පුළුවන්. ඒ නිසා තෙල් සංස්ථාව කියන්නේ වෙන මොකවත් නොවෙයි, "මෙය පැවරීම නතර කරන්න" කියලායි. හම්බන්තොට වරාය පිළිබඳව නොවෙයි, ඒ ගොල්ලන් කථා කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම තෙල් ගබඩා සංකීර්ණයත්, නැව් තෙල් පැටවීමේ පහසුකම සහ නැව් තෙල් පැටවීමේ සේවාව සැපයීමේ අයිතියත් ශ්‍රී ලංකා රජය සතුව තබා ගත්තා. හැබැයි, ඒ වුණාට තමුන්නාන්සේලා මොකක්ද කළේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. අහඟරුවාදා කැබිනට් මණ්ඩලයට වරාය ගිවිසුම ඉදිරිපත් කරන බව ඊට පෙර කැබිනට් පත්‍රිකාවල සඳහන් වෙලා තිබුණාද? නැහැ. ඕනෑම කැබිනට් මණ්ඩල රැස්වීමකදී පත්‍රිකා බන්ඩලයක් එනවා. ඒ බන්ඩලයේ එදිනෙදා සාකච්ඡාවට බදුන් කරන කැබිනට් පත්‍රිකා තිබෙනවා. හැබැයි, හම්බන්තොට ගිවිසුම පිළිබඳ කැබිනට් පත්‍රිකාවක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලා ගිහිල්ලා වාඩි වුණාට පසුව තමයි ගිවිසුම බෙදුවේ. පස්වෙනිදා ගිවිසුම බෙදුවා. අහඟරුවාදා හදිසියේ පාර්ලිමේන්තු පක්ෂ නායක රැස්වීමක් කැඳවලා, සිකුරාදා විවාදයක් පවත්වන්න තීරණය කළා. සිකුරාදා පස් වරු 7.30ට විවාදය අවසන් වෙනවා; සෙනසුරාදා 9.00ට වරාය විකුණනවා. තමුන්නාන්සේලා හිතන්නේ ඒක සාධාරණද? ඒකද ප්‍රජාතන්ත්‍රවාදය? මේවා තමුන්නාන්සේලාගේ දේපළ නොවෙයි. මේක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ කුරුණෑගල තිබෙන පොල් වත්තක් හරි, "ලේක් හවුස්" එකේ තිබෙන කොටස් හරි, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ පොළොන්නරුවේ තිබෙන ඉඩමක් හරි විකිණීම පිළිබඳ තිබෙන ප්‍රශ්නයක් නොවෙයි. මේ රටේ ජාතික සම්පත් සහ අනාගතය පිළිබඳ අප රටේ වැදගත් වෙළෙඳ ආර්ථික ක්ෂේත්‍රයක් අවුරුදු 99කට අලෙවි කිරීම සඳහා තමයි තමුන්නාන්සේලා කටයුතු කරන්නේ. දැන් මෙතැන පම්පෝරි ගහනවා "මේක විකුණන්නේ නැහැ" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 99ක් ගියාට පසුව නැව් දුවන්නේ තෙල්වලින්ද දන්නේත් නැහැ. නැව් තෙල් අංශය අදට තමයි වැදගත් වන්නේ. තවත් අවුරුදු 99කට පසුව තෙල්වලින් නැව් දුවයිද? තෙල්වලින් වාහන දුවයිද? තව අවුරුදු 99කට පසුව නැව් තෙල් අංශයක් රටකට මොකටද? ඒ කාලයට බලා ගන්න පුළුවන්, ඒ කාලයේ තාක්ෂණයේ දියුණුව මොකක්ද කියලා. ඒ නිසා දැන් තමයි මෙය වැදගත්. මේ වරාය පිළිබඳව නොවෙයි, තෙල් සංස්ථාව ප්‍රශ්නය මතු කළේ. නැව් තෙල් අංශය ගැනයි ප්‍රශ්නය මතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර තෙල් සංස්ථාව සතුව තිබුණා Lanka Marine Services (Pvt.) Limited එක. 2003 වර්ෂයේ දී මේ රනිල් වික්‍රමසිංහ මහත්තයාම PERC එක හරහා ඒක විකිණුවා. එවකට මිලින්ද මොරගොඩ තමයි PERC එක භාරව හිටපු ඇමති. මිලින්ද මොරගොඩගේ ඥාති දියණියක් විවාහ වුණා, ජෝන් කීල්ස් සමාගම අයිති මුදලාලිගේ දරුවකු සමඟ. මොකද කළේ? එදා PERC එක හරහා නැව් තෙල් අංශය ජෝන් කීල්ස් මුදලාලිට විකුණුවා. ඊට පසුව, වාසුදේව නානායක්කාර මහත්මයා ඇතුළු වාත්තිය සමිති විසින් නඩුවක් පවරලා එම විකිණීම අවලංගු කළා. එම විකිණීම් අවලංගු කළාට පසුව වරායේ තෙල් ටැංකි අට නැවත වරායට හිමි වුණා. හැබැයි, රාජපක්ෂ පාලනය ඒක තෙල් සංස්ථාවට ලබා දෙනවා වෙනුවට නැවත ඒක විකිණුවා. හේලිස් සමාගම, ජෝන් කීල්ස්, ඇතුළු සමාගම් 4කට එහි පහසුකම් විකිණුවා. අප සතුව කොළඹ වරායේ තිබූ නැව් තෙල් අංශය තමයි තෙල් සංස්ථාවට ලාභ ඉපැයුවේ. ඒ අංශයත් 2003දී විකුණුවා. ඒ නිසා තමයි තෙල් සංස්ථාව කියන්නේ, මෙම නැව් තෙල් අංශය තමන් අතට දෙන්න, ඒක තමන්ට කළමනාකරණය කරන්න පුළුවන්; තමන්ට ඒක පාලනය කරන්න පුළුවන්, ලාභ උපයන්න පුළුවන් කියලා. කොච්චරද ණය? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සඳහා වරාය අධිකාරිය ඩොලර් මිලියන100ක් හෝ ඩොලර් මිලියන 150ක් අතර ණයක් අරගෙන තිබෙනවා. මොකද, වරායේ ඇස්තමේන්තුව තුළ තමයි මෙම ණය ප්‍රමාණය ඇතුළත්ව තිබෙන්නේ.

ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේලා විකුණන්න කලින් එම මුදල ඇස්තමේන්තු කරන්න ඇති නේ? විකුණන්න කලින් කළ ඇස්තමේන්තුව මට කියන්න. ඩොලර් මිලියන 150ට අඩුයි, ඩොලර් මිලියන100ට වැඩියි. මේ ක්ෂේත්‍රයට වැය වෙලා තිබෙන්නේ, මේ ප්‍රමාණයයි. තෙල් සංස්ථාව කියන්නේ මොකක්ද? මේක ලබා දෙන්න, ඩොලර් මිලියන 100ක ණය ප්‍රමාණය තෙල් සංස්ථාවට පවරන්න, තෙල් සංස්ථාව මේක මාසිකව ගෙවන්නම් කියලායි. ඇයි තමුන්නාන්සේලා ඒක කරන්නේ නැත්තේ? ඇයි තමුන්නාන්සේලා ඒ පිළිබඳ සාකච්ඡාවක් කරන්නේ නැත්තේ?

අහඟරුවාදා කැබිනට් මණ්ඩලයට ගිවිසුම ඉදිරිපත් කරනවා. ඇමතිවරු කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා එනකොට ගිවිසුම මේසය උඩ. පාර්ලිමේන්තුවේ සිකුරාදා 7.30 වනතෙක් විවාදය පැවැත්වෙනවා. සෙනසුරාදා විකුණනවා. අපි අහන්නේ, මේක තමුන්නාන්සේලාගේ ඉඩමක් ද? මේ නිසා තමයි ඛනිජ තෙල් සංස්ථාවේ සේවක මහත්වරුන්ට හදිසි වැඩ වර්ජනයකට යන්න සිදු වෙන්නේ. ඇයි? හොරෙන් ගිවිසුම කැබිනට් එකට දානවා නම්, පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ සිකුරාදා නම්, සෙනසුරාදා අත්සන් කරනවා නම්, ඒ පිළිබඳ කරන ලද සාකච්ඡාවන්, ඒ පිළිබඳ කරන ලද යෝජනාවන් පිළිබඳ කිසිවක් ගැන සැලකිල්ලක් කරලා නැත්නම්, ඔවුන්ට තිබෙන ඉතාමත් බලවත් ව්‍යක්තිමය ක්‍රියාමාර්ගය තමයි වැඩ වර්ජනය කිරීම. අපි පිළිගන්නවා, ඛනිජ තෙල් සංස්ථාව කියලා කියන්නේ රටක ආර්ථිකයේ රුධිර සංසරණ පද්ධතිය හා සමාන දෙයක් බව. ඛනිජ තෙල් සංස්ථාවේ අඩපණ වීම හේතුවෙන් ආර්ථිකයටත්, ජන ජීවිතයටත් විශාල

බලපෑමක් සිදු වන බව ඇත්ත. දැන් තමුන්නාන්සේලාට තිබෙන්නේ මේ ජනතාව දුෂ්කරතාවට පත්වීමේ කනගාටුවද? බොරු කියන්න එපා. ගංවතුරට මිනිස්සු සිය ගණනක් මැරෙනකොට කැබිනට් ප්‍රකාශක කිව්වා, "එච්චරයි මැරිලා තිබෙන්නේ" කියලා. දහස් ගණනක් මැරුණේ නැති එක ගැනයි ඒ මහත්තුරු කථා කළේ.

මේ කනගාටුව ජනතාව ගැනද? ඩෙංගු වැලඳිලා 300කට ආසන්න ප්‍රමාණයක් මියැදෙනකොට, රෝහල් පිරෙනකොට, රෝහල්වල ඉඩ නැතිවෙනකොට හදවතක් නැතුව හිටපු මිනිස්සු දැන් ඇවිල්ලා කියනවා, ජනතාවගේ ප්‍රශ්නයක් ගැන. කුණු කඳුවලට යට වෙලා මිනිස්සු මැරෙනකොට, උමා ඔය ව්‍යාපෘතිය නිසා ගෙවල් පුපුරනකොට, මිනිස්සු අවතැන් වෙනකොට, මිනිසුන්ට උන් හිටි තැන් අහිමි වෙනකොට, ළිං හිඳෙනකොට, කුඹුරු පාළු වෙනකොට හදවතක් නැතුව හිටපු මිනිස්සු අද ඇවිල්ලා කියනවා, ජනතාවගේ ප්‍රශ්නයක් නිසා අපි මේකට මැදිහත් වුණා කියලා.

මොකක්ද, මේ කියන්නේ? ජනතාව මුහුණ දුන් අනෙක් ගැටලුවලට තමුන්නාන්සේලා මේ හා සමානව කාර්යක්ෂම ලෙස මැදිහත් වුණාද? එහෙම මැදිහත් වුණු ආණ්ඩුවක්ද? බැඳුම්කර ගනුදෙනුවෙන් ආර්ථිකය විනාශ කරනකොට, කෝටි-ප්‍රකෝටි ගණන් හොරකම් කරනකොට, ඇමතිවරයාට ගෙයක් අරගෙන දුන්නා කියලා කොමිෂන් සභාවට ඇවිල්ලා නිලධාරීන් කියනකොට, ඔහුගේ ගේ තමයි ගත්තේ කියා කියනකොට, ඒ ඇමතිවරයා කැබිනට් මණ්ඩලයේ තබාගෙන, ඒ ඇමතිවරයා ආරක්ෂක මණ්ඩලයේ තබාගෙන, ඒ ඇමතිවරයා පාර්ලිමේන්තුවේ ඉස්සරහින්ම තබාගෙන අද ජනතාවගේ දුක ගැන කථා කරනවා. ජනතාවගේ දුක ගැන කථා කරන්න කලින් අඩුම තරමින් හොරා වාඩි කරවන්න පිටු පස ඉඳිලයේ. තමුන්නාන්සේලා කිසිසේත්ම ජනතාවගේ ප්‍රශ්නයක් පිළිබඳව නොවෙයි මේ සැලකිල්ලට ලක් කළේ. තමුන්නාන්සේලාට ඕනෑකම තිබුණා, හිතුවක්කාර ලෙස, තක්කඩි ලෙස මේ ගිවිසුම අත්සන් කරලා මේ කටයුත්ත කරන්න.

හම්බන්තොට වරායේ අනෙක් කරුණු පිළිබඳව හෙට විවාද කරමු. තෙල් සංස්ථාවේ සේවක සේවිකාවන් මතු කරන ප්‍රධාන ප්‍රශ්නය තමයි නැව් තෙල් අංශය ඔවුන් අතට දෙන්න කියන එක. ඇයි, තමුන්නාන්සේලා ඒක දෙන්නේ නැත්තේ? ඩොලර් මිලියන 100ත් - 150ත් අතර ණය මුදලක් තිබෙන්නේ. මාස අටක ලාභය රුපියල් බිලියන 4යි නම්, මාස අටක් තෙල් ගහලා වරාය අධිකාරිය රුපියල් බිලියන 8ක ලාභයක් ලැබුවා නම්, "අපට මේක දෙන්න, ඩොලර් මිලියන 100ත් - 150ත් අතර ණය මුදලත් එක්ක තෙල් සංස්ථාවට දෙන්න, ඒක අපි පියවන්නම්, අපට මේ සේවාව පවත්වාගෙන යන්න ඉඩ දෙන්න, ඒ සේවාවෙන් තෙල් සංස්ථාව ලබන ලාභය මත ජනතාවට අඩු මිලට තෙල් ලබා දෙන්නම්" කියලා තෙල් සංස්ථාව කියනවා නම්, ජනතාවගේ දවසක දුෂ්කරතාවට වඩා වැදගත් වන්නේ මොකක්ද? මේ රටේ තෙල් සංස්ථාව ජනතාවට අඩු මිලට ඉන්ධන ලබා දීමත්, ජනතාවට පහසුකම් සැලසීමත්, ජාතික ආර්ථිකයත් නොවෙයිද, වැදගත්ම සාධකය? අන්න ඒ වැදගත් සාධකය වෙනුවෙන් තමයි මේ වැඩ වර්ජනයේ නිරත වුණේ. ඒ නිසා මෙය දුර්ජන වැඩ වර්ජනයක් නොවෙයි. මේ දුර්ජනයින් රටේ ජාතික සම්පත් විකුණනකොට, ඒ දුර්ජනයින්ට එරෙහිව මේ රටේ ප්‍රගතිශීලී ජනයා විසින් දියත් කරන ලද වැඩ වර්ජනයක් මේක. ඒක තමයි ඇත්ත කථාව. මේ වැඩ වර්ජනයට එරෙහි වන්නන් තමයි දුර්ජනයින්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය විකුණනකොට, නැව් තෙල් අංශය විකුණනකොට, ගබඩා සංකීර්ණය විකුණනකොට, හම්බන්තොට වරාය හරහා නැව්වලට තෙල් ගැහීමේ සේවාව චීන සමාගමකට විකුණනකොට, ඒවාට අත උස්සන අය තමයි දුර්ජනයින්. මතක තබා ගන්න. ඒවාට එරෙහි වන්නන් නොවෙයි දුර්ජනයින්. තමුන්නාන්සේලා කියන පරිදි දුර්ජනයින් පිළිබඳව අලුත් අර්ථකථනයක් අවශ්‍ය වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙය සාධාරණ වැඩ වර්ජනයක්. ආර්ථිකය පිළිබඳවත්, රටේ අනාගතය පිළිබඳවත්, රටේ අනාගත ආර්ථික උපාය මාර්ග පිළිබඳවත් වැදගත් වැඩ වර්ජනයක තමයි නිරත වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පිළිගන්නවා, ජනතාව විශාල දුෂ්කරතාවකට පත් වුණු බව. පැය දෙක-තුනක් රස්තියාදු වෙලා තිබෙනවා; තෙල් පෝලිම්වල ඉඳලා තිබෙනවා. හැබැයි ඔවුන් -එම වෘත්තීය සමිති- අවසානයේදී -හමුදාව එය අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරන්න පෙර- එකඟතාවකට ආවා, මේ වැඩ වර්ජනය නිසා හදිසි සේවාවන් බිඳ වැටෙන්න ඉඩ ලබා නොදිය යුතුයි කියලා. ඒ නිසා ඔවුන් එකඟතාවකට ආවා, ගුවන් සේවා සඳහා තෙල් සැපයිය යුතුයි, ජාතික මහ රෝහලේ ජෙනරේටර් අක්‍රිය වුණොත් ලේ බැංකුව ආදී ආයතන ගැටලු ගණනාවකට මුහුණ දෙනවා, ඒ නිසා ඒ සඳහා තෙල් ලබා දිය යුතුයි කියලා. එහෙම එකඟතාවකට එමින් තිබියදී තමයි තමුන්නාන්සේලා හමුදාව මැදිහත් කළේ. අපි තමුන්නාන්සේලාට කියනවා, දේපළ පිළිබඳ ආරක්ෂාවට තමයි හමුදාව මැදිහත් කළේ කියලා. නමුත් මුතුරාජවෙල ගබඩා සංකීර්ණයේ කිසිදු තෙල් බවුසරයක් හමුදාවට මැදිහත් වෙලා යවන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. හැබැයි ඊට පස්සේ තමුන්නාන්සේලා මොකද කළේ? ඊට පස්සේ තමයි තමුන්නාන්සේලා මැර කණ්ඩායම් යෙදෙව්වේ.

මම අජිත් පී. පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් කාරණයක් අහනවා. ඔබතුමාට මතක ඇති, ඔබතුමා හම්බන්තොට ගිය වෙලාවේ එරාජ් කියන නගරාධිපතිවරයා පිස්තෝලයක් අරගෙන තමුන්නාන්සේලාගේ පස්සෙන් පැන්නුවා. අද ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බෙලිඅත්ත ආසන සංවිධායක. ඒක වෙනම දෙයක්. ඒ එරාජ් අද රාජිත සේනාරත්නගේ ගජ මිත්‍රයෙක්; එදත් එහෙමයි. එදා තමුන්නාන්සේලාගේ පස්සෙන් පිස්තෝල අමෝරාගෙන පැන්නුවා; ගල් ගැහුවා. අපට මතකයි, ශිරාන් බණ්ඩාරනායක මැතිතුමිය නෙරපා හැරීම සම්බන්ධව උද්ඝෝෂණයක් තිබුණා. එදාත් මේ විධියටම ශ්‍රේෂ්ඨාධිකරණය ළඟට මැරයන් ගෙනැල්ලා ඒකට මැදිහත් වුණු අයට පයින් ගැහුවා. තමුන්නාන්සේලා සරත් ෆොන්සේකා මහත්මයා වෙනුවෙන් උද්ඝෝෂණයක් දියත් කළ අවස්ථාවේදී පුංචි බොරැල්ලේ ඉඳලා වැලිකඩට යනකල් මැරයින් මහ රැකලා ඉඳලා ගැහුවා. ඒක අනුමත කළාද? තමුන්නාන්සේලා ඒක අනුමත කළාද? නැහැ. තමුන්නාන්සේලා විතරක් නොවෙයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව විශ්වාසය තිබෙන කිසිවෙක් මේ මැර ප්‍රහාරය අනුමත කරන්නේ නැහැ. ඒ මැර ප්‍රහාරවලට එරෙහිව තමයි තමුන්නාන්සේලා බලය ගත්තේ. එහෙම බලය ගත්ත තමුන්නාන්සේලා දැන් මොකද කරන්නේ? දැන් තමුන්නාන්සේලා මැර කණ්ඩායම් යොදවනවා. මෙතැන කියනවා, "කුපිත වූ ජනතාව" කියලා. ඕක අපි හම්බන්තොටදීත් ඇහුවා, කුපිත වූ සේවකයින් තමුන්නාන්සේලාට පහර දුන්නා කියලා. ඕක අපි එදා ශ්‍රේෂ්ඨාධිකරණය ළඟදීත් ඇහුවා, නඩුවලට ආපු කුපිත වූවන් පහර දුන්නා කියලා.

අදත් තමුන්නාන්සේලා ඒකම උච්චාරණය කරනවා. මේ කුපිත වූ ජනතාවද? මම කියන්නම් මේ ගෙනාවේ කවුද කියලා. කළුපුල්වත්තේ බන්දු පැට්ටා තමයි මේ දැන් මා අතේ තිබෙන පින්තූරයේ පොල්ලක් අතේ තබාගෙන ඉන්නේ. බන්දු පැට්ටා. කළුපුල්වත්තේ තමුන්නාන්සේලාගේ මැරයා.

ඊළඟට, තමුන්නාන්සේලා ගෙනාවේ කවුද? ඊළඟට, තමුන්නාන්සේලා කළුපුල්වත්තේ මෙල්වින් ගෙනාවා. කල්පනා කරලා බලන්න. ඊළඟට, තමුන්නාන්සේලා සිංහපුරෙන් ගාමිණී ගෙනාවා; සිංහපුරෙන් බණ්ඩාර ගෙනාවා. මැර කණ්ඩායම් දෙකක් ගෙනාවා. මැර කණ්ඩායම් ගෙනැල්ලා තමයි පහර දුන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අතේ මේ තිබෙන පින්තූරවල තිබෙන්නේ පහර දීම් සිදු කළ ආකාරයයි. මේ, කුපිත

[ගරු අනුර දිසානායක මහතා]

වූ ජනතාවද? කුපිත වූ ජනතාව හරියට දෙකයි, දෙකේ පොලු අරගෙන ඒවා අඩි තුනහමාරට කපා ගෙන ගෙදර තියා ගෙන ඉන්නවාද? මේ කඩු සහ මේ පොලු තමුන්නාන්සේලා ලොරිවලින් ගෙනැල්ලා එතැන තිබුණු බේකරියේදී බෙදුවා. එම බේකරිය ඇතුළේදී තමයි මේ මැර කණ්ඩායම්වලට බෙදුවේ. ඒ පළාතේ මන්ත්‍රීවරයෙකුගේ driver ඉන්නවා, එක මැරයෙක් හැටියට. ඒ ගොල්ලන් තමයි මේ ප්‍රහාර දියත් කළේ. මේ පින්තූරයේ ඉන්නේ බණ්ඩාර. බණ්ඩාර මෙතැන ඉන්නේ පොල්ලක් අතේ තියාගෙන. මේ පින්තූරයෙන් පෙන්නුම් කරන්නේ, අයිටිඑන් නාළිකාවෙන් බණ්ඩාරගෙන් voice cut ගන්නා ආකාරය. අයිටිඑන් නාළිකාවෙන් අහනවා, "ගැහුවේ කොහොමද?" කියලා. මේ නාළිකා මොනවාද? මැරයා ගැහුවාට පසුව අයිටිඑන් නාළිකාවෙන් අහනවා, "තෙල් වැඩ වර්ජනය සාධාරණද?" කියලා. ඔහු කියනවා, "අසාධාරණයි" කියලා. කවුද, මේ "අසාධාරණයි" කියලා කියන්නේ? පොලු අරගෙන හිටපු මැරයා තමයි එහෙම කියන්නේ. මේ පින්තූරයේ ඉන්නේ කවුද? මේ ඉන්නේ ගාමිණී. මේ ඉන්නේ සිංහපුර ගාමිණීලා. මේ පින්තූරයේ ඉන්නේ කවුද? මේ ඉන්නේ, සිංහපුර බණ්ඩාරලා. තමුන්නාන්සේලා කියනවා, මෙය සාමකාමියි කියලා. සාමකාමීත්වය බිඳ වැටුණු නිසා එතැන ඇති වුණු ජනතාවගේ ප්‍රතිරූපයක් නොවෙයි, මේක. මැරයන් ඇවිල්ලා පහර දෙනකොට, එදා පැවති ආණ්ඩුවත් මේ මුසාව තමයි දෙඩෙව්වේ. අද තමුන්නාන්සේලා ඒක පුනරුච්චාරණය කරනවා. මෙම මැරයන් මෙසේ පහර දෙන එක තමුන්නාන්සේලා අනුමත කරනවාද, කියලා මම කිරිඇල්ල ඇමතිවරයාගෙන් අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා නිතරම ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව, ලිව්ඡවි රජ දරුවන් පිළිබඳව, සාකච්ඡා පිළිබඳව, සම්මන්ත්‍රණ පිළිබඳව, පාර්ලිමේන්තුව පිළිබඳව, එංගලන්තයේ පාර්ලිමේන්තුව පිළිබඳව මහා ඝෝෂා දමන "ප්‍රජාතන්ත්‍රවාදයේ පියා" හැටියටයි පෙනී සිටින්නේ. එතුමා ප්‍රජාතන්ත්‍රවාදයේ පියා හැටියටයි පෙනී සිටින්නේ. කොළොන්නාවේ තෙල් ගබඩා සංකීර්ණයට පැනලා මැරයෝ පහර දීලා තිබෙනවා. කාන්තාවන්ට පහර දීලා තිබෙනවා. අත-පය කඩා තිබෙනවා. එසේ සිදු කළ මැරයන්ට දැන් මොකද කරන්නේ කියලා අපි අහනවා. තමුන්නාන්සේලා උත්සාහ කරමින් සිටින්නේ, ජනතාවගේ ප්‍රශ්න මේ ආකාරයෙන් විසඳන්න නම්, තමුන්නාන්සේලා සූදානම් වෙන ඕනෑම ආකාරයකට මේ රටේ ජනතාව සූදානම් කරන බවත් අපි කියනවා. සහතිකයි. මෙවැනි තත්ත්ව වර්ධනය වෙන්න ඉඩ දෙන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපිට මතකයි එදා අධිකරණයේදී, ලිප්ටන් වටරවුමේදී මේ හා සමාන ලෙසම මැර කණ්ඩායම් මේ රටේ ජනතාවට පහර දෙන්න උත්සාහ කළ ආකාරය. අද තමුන්නාන්සේලාට එරෙහිව දියත් වුණු ප්‍රධාන, පළමු සහ ප්‍රබල වැඩ වර්ජනයේදී තමුන්නාන්සේලා මැර කණ්ඩායම් මුදා හරින්න කටයුතු දියතු කරලා තිබෙනවා. රාජපක්ෂ පාලනයට ඒක දියත් කරන්න සිද්ධ වුණේ, අවුරුදු නවයක් ගිහිල්ලා. හැබැයි, අවුරුදු දෙකක් යන කොට මැර කණ්ඩායම්වලින් තොරව දේශපාලනය පවත්වා ගෙන යන්න තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මැර කණ්ඩායම් කාත් එක්කද ඉන්නේ? පොලීසියත් එක්ක ඉන්නේ. අපි අහනවා, පූජිත ජයසුන්දරලාගෙන්. පොලීසිය ඉන්නේ මැර කණ්ඩායම් අත් අඩංගුවට ගන්නයි. හැබැයි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මැර කණ්ඩායම් සහ පොලීසිය එකට සාකච්ඡා කරනවා. එකට මෙහෙයුම් දියත් කරන්නේ. පොලීසිය කියනවා, "ඔය ගොල්ලන් මේ පැත්තෙන් එන්න" කියලා. "මේ පැත්තෙන් එන්න. බේකරිය ගාව තාප්පයට හිර කර ගන්න. එතැනට ගිහින් පහර දෙන්න" කියා මැර කණ්ඩායම්වලට කියලා පොලීසිය සහ මැර කණ්ඩායම් ඒකාබද්ධව තමයි එය මෙහෙයවුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරන්නේ නැහැ, එතැනදී හම්බවෙලා මැරයා සහ පොලිස්කාරයා එකට කථා කළාය කියලා. නැහැ. මේකට දේශපාලනය මැදිහත් වුණා. පොලීසිය සහ මැර කණ්ඩායම් එකම සාකච්ඡාවක් කරන තැනට ගෙනාවේ කවුද? දේශපාලකයා මැදිහත් වෙලා තමයි එය කළේ. ඒ නිසා තමුන්නාන්සේලා වග කියන්න ඕනෑ, මේ මැර කණ්ඩායම් මුදා හැරලා මේ සේවකයින්ට පහර දීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැර කණ්ඩායම් විතරක් නොවෙයි. අපිට මතකයි, එතැනදී පිරිසක් අත් අඩංගුවට ගත් බව. එසේ අත් අඩංගුවට ගත්තේ ඔවුන් දුම්න්ද දිසානායක අමාත්‍යවරයා මුණ ගැසී සාකච්ඡා කරමින් ඉන්නා වේලාවේයි. ඒ වේලාවේ පහළොවකට අධික ප්‍රමාණයක් අත් අඩංගුවට ගත්තා. ඒ ගොල්ලන් අත් අඩංගුවට අරගෙන, truck එකක පටවා ගෙන ඇවිල්ලා වැලිකඩ පොලීසියෙන් බැවා. වැලිකඩ පොලීසිය ළඟදී ඒ ගොල්ලන් බිමට බහිනකොටම, වැලිකඩ පොලීසියේ OIC මොකද කළේ? එන එන එක්කෙනාගේ බෙල්ලෙන් අල්ලනවා. වැලිකඩ පොලීසියේ OICට එහෙම බලයක් දීලා තිබෙන්නේ කොහොමද? ලංකා බනිජ තෙල් පොදු සේවක සංගමයේ සභාපති හැටියට කටයුතු කරන්නේ ආචාර්ය රන්වල මහත්මයායි. ඔවුන් තුට්ටු දෙකේ මැරයෝ නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආචාර්ය රන්වල මහත්මයාට මොකක්ද කළේ? OIC ඔහු අරගෙන ගිහිල්ලා බිත්තියට හේත්තු කරනවා. බිත්තියට හේත්තු කරලා පිටුපස හරවන්න කියනවා. අත් දෙක බිත්තියට තියා ගන්න කියනවා. එහෙම කියලා OIC අතින්-පයින් පහර දෙනවා. එහෙම මැර බලයක් තමුන්නාන්සේලා පොලීසියට දීලා තිබෙනවාද කියලා අපි අහනවා. අත් අඩංගුවට ගත් කෙනා කියනවා, "මට ගහන එක වැරදියි. දැන් මම පොලීසිය භාරයේ ඉන්නේ." කියලා. පොලීසිය භාරයේ ඉන්න කෙනාට OIC පහර දෙනවා. දැන් තමුන්නාන්සේලාගේ "යහ පාලනය" මේකද? තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදය මේකද? අපි අහන්නේ එපමණයි, තමුන්නාන්සේලාගෙන්. පොලීසිය භාර අමාත්‍යවරයා හැම වේලාවේම සූජ්පුව කටේ ගහ ගත්තා වාගේයි ඉන්නේ.

පොලීසිය භාර ඇමතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න ඕනෑ, මොකක්ද මේ කරන්නේ කියලා. පොලිස්පතිවරයා මෙහෙයවනවා. තමන්ගේ හොරු බේරා ගන්නවා; තමන්ට ඕනෑ දේ බේරා ගන්නවා. ඒ විධියේම ඇමතිවරයෙකුත් පොලීසිය භාරව ඉන්නවා. පොලීසිය භාර ඒ ඇමතිවරයා මොකක්ද කරන්නේ? එතුමා පොලීසියට නියෝග දීලා තිබෙන්නේ කුමක් වෙනුවෙන්ද? මැරයන්ට ආරක්ෂාවත්, සේවකයන්ට පහර දීම වෙනුවෙනුත් නියෝග දුන් පොලීසිය භාර ඇමතිවරයෙකු තමයි මේ ඉන්නේ. පොලීසිය භාර ඒ ඇමතිවරයාට ඉතාමත් හොඳින් ආරක්ෂාව දෙන අගමැතිවරයෙකු ඉන්නවා. ඒකයි ඇත්ත කථාව. එම නිසා අගමැතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කරන්න ඕනෑ, මේ මැරයන් ආවේ කොහොමද; මේ මැරයන් කවුද; මේ මැරයන් අත් අඩංගුවට ගන්නවාද කියලා. තමුන්නාන්සේලා මේ OICට එරෙහිව ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද? තමුන්නාන්සේලා හිතනවාද, මේ OIC වැලිකඩ තබාගෙන මේ පිළිබඳව පරීක්ෂණයක් කරන්න පුළුවන් කියලා. රන්වල මහත්තයා පැමිණිල්ල දමනකොට OIC කියනවා, පැමිණිල්ල ලියන්න දෙන්න බැහැයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා ඒ ගොල්ලන්ට සිද්ධ වනවා; ඒ ගොල්ලන් කල්පනා කරනවා; පොලිස් මූලස්ථානයට ගිහිල්ලා පැමිණිල්ල දමන්න. ඒ වෙලාවේ ඉන්න පොලීසියට පැමිණිල්ලක් දමන්න බැහැ. දැන් ඒ OIC තබාගෙන ද මේ පරීක්ෂණ කරන්නේ? ඒ මැර OICලා තබාගෙන පරීක්ෂණ කරන්නද, තමුන්නාන්සේලා සූදානම් වන්නේ? තමුන්නාන්සේලා මේ මෑතකදී පොලීසියේ ස්ථානාධිපතිවරු ගණනාවක් මාරු කර ගත්තා. අපි දන්නවා,

හොඳටයි මාරු කළේ කියලා. තමුන්නාන්සේලා මැතිවරණයක් කිට්ටු වනකොට තමන්ගේ ආසනයට තමන්ගේ හිතවත් පොලිස් OIC මහත්තයෙකු ගෙන එන සැලසුමක් හැදුවා. ඒ විධියට 26දෙනෙකු තමුන්නාන්සේලා නියෝජනය කරන ආසනවල තිබෙන පොලිසිවලට ස්ථානගත කර ගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩ වර්ජනයෙන් ජනතාව පීඩාවට පත් වනවා. ආණ්ඩුව ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගත යුතුයි. ඒක ආණ්ඩුවේ කාර්ය භාරය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මෙතැන සිද්ධ වන්නේ ඒක නොවෙයි. මැර කණ්ඩායම් සහ පොලීසිය ඒකාබද්ධව එම සේවක සේවිකාවන්ට එල්ල කරන ලද මැර ප්‍රහාරයක් තමයි ඉතා පැහැදිලිව මෙතැන සිදුවී තිබෙන්නේ. අපි මේ මැර ප්‍රහාර අනුමත කරනවාද? ඒවා අනුමත කරන්නේ මෙතැන සිටින කවුද? කෝ, කොළොන්නාව නියෝජනය කරන පුද්ගලයා මෙතැන ඉන්නවාද? කවුද මේ? අපි දන්නේ නැද්ද, මේ ගොල්ලන් ගැන. අපි දන්නේ නැද්ද, මේ ගොල්ලන් මැරයෝද? අනේ! තේරුම් ගන්න, මේ ගොල්ලන් කවුද කියන්න. 2015 වර්ෂය කිට්ටු වෙනකම්ම එහේද, මෙහේද කියලා බල බලා, පළාත් සභා මැතිවරණය එනකම්ම එහේද, මෙහේද කියලා බල බලා හිටපු මහත්වරු තමයි මේ. මම දන්නේ නැද්ද, මේ මහත්වරු ගැන. ඕනෑ නම්, මේ මහත්වරු ගැන මම කියන්නම්. 2015 වර්ෂය වන තෙක් රාජපක්ෂ පාලනය; භීෂණය තිබෙනකොට ඒවාට එරෙහිව හඬ නහන්නේ නැතිව එහෙටත් මෙහෙටත් නැතිව දෙපැත්ත බල බලා හිටපු මහත්වරු තමයි මේ. සමහර අය කොයි වෙලාවේත් මේවාට විරුද්ධව හිටියා. මේ ගොල්ලන් චණ්ඩි නොවෙයි. ඒක මතක තබා ගන්න. ආණ්ඩු බලය එනකොට මේ ගොල්ලන් නොන්ඩි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ ගොල්ලන් චණ්ඩිද? සේවකයින්ට මැරයන් ලවා පහර එල්ල කරන්න මේ ගොල්ලන් චණ්ඩි ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රමානුකූලව ශිෂ්‍යයින්ට පහර දෙන්න පටන් ගෙන තිබෙනවා නම්, සුදු වෑන් සංස්කෘතියක් ඇති කරනවා නම්, මේ දියත් වෙමින් තිබෙන්නේ කවර පාලනයක්ද? පොලීසිය භාර ඇමතිවරයා මෙතැනට ඇවිල්ලා මේ දේවල් සම්බන්ධයෙන් කනගාටුව ප්‍රකාශ කරනවා. කනගාටුව ප්‍රකාශ කළාම හරිද? එදා ඒ දරුවා උස්සා ගෙන ගියා නම්, මොකක්ද වෙන්නේ? ඊට පස්සේ ඉන්නවා, කතන්දර මාමා. ඒ කවුද? පොලිස් මාධ්‍ය ප්‍රකාශක. එතුමා ඇවිල්ලා කතන්දරයක් ගොතා කියනවා, මේක නේ අද සිද්ධ වෙලා තිබෙන්නේ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කාලය අවසානයි.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරාය සම්බන්ධයෙන් වූ ගිවිසුම අත්සන් කිරීම පිළිබඳව ජනාධිපතිවරයා එකඟතාවකට ආවා ලු. ඒ සම්බන්ධයෙන් මා දන්නේ නැහැ. ඒක කල් දමන්න. අපි ඒ ගිවිසුම ගැන හෙට කථා කරමු. තෙල් සංස්ථාවේ සේවකයින්ගේ ඉල්ලීම මත අඩුම තරමින් තෙල් ටැංකි සංකීර්ණයත්, එහි පහසුකම් සහ නැව් තෙල් අංශයත් මේ ගිවිසුමෙන් ඉවත් කරන්න කියලා මේ විවාදයේදී අපි කියනවා. ඒ වාගේම එම සේවක සේවිකාවන්ට අවශ්‍ය ආරක්ෂාව දෙන්න කියලාත්, මේ මැර කණ්ඩායම් අත් අඩංගුවට ගන්න කියලාත්, ඒ වාගේම වැලිකඩ OIC අත් අඩංගුවට ගෙන පරීක්ෂණ පවත්වන්න කටයුතු කරන්න කියලාත් බල කරමින් මා නතර වනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා. 2.53]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(මාණ්පුමිකු අජිත් මාන්නප්පෙරුම)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද මා මේ විවාදයට සහභාගි වන්නේ ඉතාමත් සතුටෙන්. මොකද හේතුව, මෙතෙක් කල් පැවැති ආණ්ඩු මෙවැනි වැඩ වර්ජන විසඳුවේ කොහොමද කියලා අපි දන්නවා. රාජ්‍ය සේවකයෝ ගැන හරි උනන්දුවෙන්; හරි කැක්කුමෙන් කථා කරපු නායකයෝ, වෘත්තීය සමිති ගැන හරි කැක්කුමෙන් කථා කරපු හිටපු ආණ්ඩුව නියෝජනය කරන විපක්ෂයේ කණ්ඩායම් එදා ඒකල ප්‍රදේශයේදී අපේ වෘත්තීය සමිති නායකයින් තමුන්ගේ අර්ථ සාධක මුදල පවරා ගන්නවා කියලා උද්ඝෝෂණය කරද්දි වෙඩි තබා ඔවුන් මරා තමයි ඒ උද්ඝෝෂණය නැවැත්වූයේ. රාජ්‍ය දේපළ ගැන උනන්දුවෙන්, රාජ්‍ය දේපළ ආරක්ෂා කරන්න ඕනෑය කියලා කියන ඔය දේශපාලන කණ්ඩායම එදා මේ රටේ ඉතිහාසයේ වැඩිම රාජ්‍ය දේපළ ප්‍රමාණයක් විනාශ කළ කණ්ඩායමයි. බස් ටික පුච්චා දැම්මා. ඒවා රාජ්‍ය දේපළ නොවෙයිද? Transformers ගිනි තැබුවා. ඒවා රාජ්‍ය දේපළ නොවෙයිද? අපේ රටේ සිටි උගතුන් මරා දැම්මා. අපේ රටේ සිටි උගතුන් කියන්නේත් රාජ්‍ය සතු දේපළය කියන එක මා විශේෂයෙන් කියනවා. මේ රටේ transformers විනාශ කරලා විදුලිබලය ලබා ගැනීමේ අවස්ථාව නැති කරලා, තෙල් පිරිපහදුව වාගේ දේවල් විනාශ කරපු, විදුලි බලාගාර විනාශ කරපු මේ කණ්ඩායම අද කිඹුල් කඳුළු හලනවා, අනේ අපේ රාජ්‍ය දේපළ රැක ගන්න ඕනෑය කියලා. ඒවා දැන්ද මතක් වුණේ? අපි එදත් රාජ්‍ය දේපොළ රැක්කා, අදත් රාජ්‍ය දේපොළ රකිනවාය කියන එක මම විශේෂයෙන් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි අවිහිංසාවාදී ක්‍රමවේදය තුළ තමයි මේ ප්‍රශ්නය විසඳුවේ. 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත පාවිච්චි කරලා, මෛත්‍රී යුගයකට ගැළපෙන ආකාරයට, යහපාලනයට ගැළපෙන ආකාරයට 2017 ජූලි 25වැනි දින අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අත්‍යවශ්‍ය සේවය ස්ථාපිත කරලා තමයි මේ ප්‍රශ්නය විසඳුවේ. යම් මන්ත්‍රීවරයෙක් මේ පනතට විරුද්ධ වෙනවා නම්, ඒ විරුද්ධ වන මන්ත්‍රීවරු ටික බලා ගෙන ඉන්නේ මේ වර්ජකයන් අවුස්සලා, දේපොළ විකුණනවා කියලා බනිජ තෙල් සංස්ථාවේ අභිංසක සේවකයන්ට පවා පට්ටපල් බොරු කියලා, ඒ අය රවට්ටලා ඒ අයගේ ජාති හිතෛෂිකම අවුස්සලා බිල්ලක් ගන්නයි. මීනිහෙක් මරන තෙක් තමයි බලා ගෙන ඉන්නේ. ඒක බැලුවා. හම්බන්තොටදීත් දැඟලුවා. කවුරු හරි මරයි කියලා හිතුවා. මේ ගොල්ලෝ තෙල් පිරිපහදුවට ගියා; කට්ටිය ඇවිස්සුවා; හැංගිලා බලාගෙන හිටියා; ආණ්ඩුවෙන් ඇවිල්ලා කවුරු හරි මරයි කියලා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

බලාගෙන හිටියා. මැරුවේ නැහැ. හිතට අමාරුයි. අද මේක සාමකාමී විධියට විසඳපු නිසා මෙතැනට ඇවිල්ලා හිතේ අමාරුවෙන් බෙරිහන් දෙනවා. එහෙම නැත්නම් මේ ක්‍රමවේදයට විරුද්ධ වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර දේශපාලන පක්ෂ තිබෙනවා. ඒ පක්ෂවලින් රටට වැඩක් කළේ නැහැ. රටට කළ සංවර්ධනයක් නැහැ. වැඩ වර්ජන පිළිබඳව විතරයි ප්‍රසිද්ධියට පත්වෙලා තිබෙන්නේ. කොහේ හරි වැඩ වර්ජනයක් තිබෙනවා නම්, ඒක ඒ පක්ෂය තමයි මෙහෙයවලා තිබෙන්නේ. රටේ වැඩ වර්ජන කරලා ප්‍රසිද්ධ වුණු පක්ෂ වැඩ වර්ජනය සාමකාමීව විසඳුවාම අද හිතේ අමාරුවෙන් ඉන්නවා. මොකද, ඒ ගොල්ලන්ට ගමනක් නැහැ. පැවැත්මක් නැහැ. ඒක තමයි විශේෂයෙන්ම ඇතිවෙලා තිබෙන ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අය තවදුරටත් කියනවා, මේ තෙල් ටැංකි ටික තියා ගත්තා නම් ඩීසල් මිල, පෙට්‍රල් මිල අඩු කරන්න තිබුණාය කියලා. පසු ගිය ආණ්ඩුවල මුදල් ඇමති විධියට හිටපු සමහර අය කිව්වේ මොකක්ද? "ශක්‍රයාගේ පුතා වයිමා ආවත් ගෑස් මිල අඩු කරන්න බැහැ"යි කිව්වා. ශක්‍රයාගේ පුතා වයිමා ආවේත් නැහැ. ඔය තෙල් ටැංකි ටික බදු දෙන්න ඉස්සෙල්ලා අපි මේ ආණ්ඩුව භාර ගත්ත ගමන් ඉතිහාසගත වන විධියට ඩීසල්, පෙට්‍රල් මිල අඩු කරලා ජනතාවට බෙදා හැරියා. ඩීසල්, පෙට්‍රල් අඩු මිලට දෙන්න අපට මේවා බදු දෙන්න ඕනෑ නැහැ. ශක්‍රයාගේ පුතා වයිමා එන්න ඕනෑ නැහැ, ගෑස් ටික අඩු මිලට දෙන්න. අපි ආණ්ඩුව ගත්තා විතරයි, කරපු දූෂණ, වංචා නවත්වලා ජනතාවට අපි සහන දුන්නා. යහපාලන රජයක් වශයෙන් කිසිදු ලේ සෙලවීමක් නැතිව අපි මේ ප්‍රශ්නය ලස්සනට විසඳුවා. ඒ අනුව අද පොදු ජනතාවගේ ප්‍රශංසාවට ලක් වෙලා තිබෙනවා. සමාජ වෙබ් අඩවිවල කියනවා "ආණ්ඩුව ඇයි මේක ඊයේ කළේ. ඒක කලින් කරන්න තිබුණා නේ." කියලා. අද ජනතාව කථා වෙන්නේ මොකක්ද? ජනතාව කියන්නේ, "මේක සෞඛ්‍ය සේවයටත් කරන්නකෝ. ජනතාව ගැන හිතලා සෞඛ්‍ය සේවාවත් අත්‍යවශ්‍ය සේවාවක් බවට ප්‍රකාශයට පත් කරන්න." කියලායි. ඔන්න, ආණ්ඩුව වැඩ පටන් ගත්තා කියලා මතක තියා ගන්න. හැබැයි, වැඩ පටන් ගත්තේ ජේ.ආර්ගේ ව්‍යවස්ථාවෙන්. වැඩ පටන් ගත්තේ ඒ බලය අරගෙන උද්ඝෝෂකයන්ට වෙඩි තියලා මරලා, මිනී අරගෙන ගිහිල්ලා නොවෙයි. වැඩ පටන් ගත්තේ සාමකාමී විධියටයි. තව අලියා නැටට හෙල්ලුවෙත් නැහැයි කියන එක මතක තියා ගන්න. තවම අලියා නැටට හෙල්ලුවෙත් නැහැ. අලියා කියන්නේ බොහොම සාමකාමී සතෙක්. දැකුම්කලු සතෙක්. හැබැයි, කුලප්පු කර ගන්න එපා. අපි එහෙම කුලප්පු වෙන්නේත් නැහැ. දහලන්න එපා. මෛත්‍රී යුගය තුළ ඔයගොල්ලන්ට උත්තර දෙන්න ඕනෑ විධිය අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ පසු ගිය ආණ්ඩුව කළ විධියට කටයුතු නොකර, රජයේ ගෞරවය ආරක්ෂා වන විධියට, ජාත්‍යන්තරය තුළත් අපේ ගෞරවය ආරක්ෂා වන විධියට, ඉතාමත්ම සාමකාමී විධියට මේ ප්‍රශ්නය විසඳීමට කටයුතු කළ යුද හමුදාවේ සියලු සේවක මහත්වරුන්ටත්, නිලධාරි මහත්වරුන්ටත්, පොලීසියටත් අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. පසු ගිය ආණ්ඩුව පොලීසිය එවලා තමයි වෙඩි තැබුවේ. වැලිවේරියට හමුදාව එවලා තමයි වෙඩි තැබුවේ. රොෂේන් චානකලාට වෙඩි තිබ්බේ කවුද? හලාවත ඇන්ටනීට වෙඩි තිබ්බේ කවුද? ඒ නිසා අපේ හමුදාව ඉතාමත්ම ශිෂ්ට සම්පන්න විධියට මේ ප්‍රශ්නය විසඳීම ගැන මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා.

එදා අපේ රටේ ජනතාවට සුරංගනා කථා කිව්වා. සුරංගනා ලෝක මවලා පෙන්නුවා. වරායවල් පෙන්නුවා, නැව් නොඑන බව පෙන්නුවේ නැහැ. ඒවාට ගත්ත ණය මුදල පෙන්නුවේ නැහැ. එදා ගුවන් තොටුපොළවල් පෙන්නුවා. සුරංගනා කථා කිව්වා. සුරංගනා ලෝක මැව්වා. ඒ ගුවන් තොටුපොළට ගුවන් යානා නොඑන එක ගැන කථා කළේ නැහැ. එදා නොරොච්චෝලේ විදුලි බලාගාරය ගැන කිව්වා. ඒකෙන් මෙගාවොට්ස් මෙච්චර ප්‍රමාණයක් හදනවා කිව්වා.

නමුත් කැඩුණු මැෂින් ගෙනැල්ලා, බාල මැෂින් ගෙනත් ඒවායින් ගහපු දේවල් ගැන කිව්වේ නැහැ. එහෙම කරලා මේ රටේ රාජ්‍ය දේපොළ, මහ ජන දේපොළ කොල්ල කාලා, කොල්ලකන්න බැරි වුණාම උලා කාලා එදා සැප විඳපු මේ කණ්ඩායම අද කලබල වෙලා තිබෙනවා. මොකද, මේ කණ්ඩායම කලබල වෙන කොට මේවායේ කටු කාපු හෙංචයියෝ ටිකත් කලබල වෙලා තිබෙනවා. අද සාමකාමී විධියට උද්ඝෝෂණය මෙහෙයවන කොට හෙංචයියෝ ටික එහෙම කලබල වෙලා ඒවාට විරුද්ධව කථා කරනවා. විශේෂයෙන්ම මම කියනවා, මිරිදියේ මාළුන්ට කරදියේ ඉන්න බැහැ කියලා. ඒ වාගේම මෛත්‍රී යුගයක් තුළ, මෛත්‍රී පාලනයක් තුළ, යහ පාලනයක් තුළ ඔය ඉන්න යකුන්ට, රාක්ෂයන්ට ජීවත් වෙන්න බැහැ. යක්කු, රාක්ෂයෝ නිකම්ම යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි මේ යකුන් යන්නේ නිකම් නොවෙයි, කොරහත් බිඳ ගෙනයි යන්න හදන්නේ. යකුන් පලවා හරින්නත්, කොරහා ආරක්ෂා කරන්නත් ජනතාව වෙනුවෙන් අප තුළ වගකීමක් තිබෙනවාය කියන එක විශේෂයෙන් මම පැහැදිලි කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ජනතාව බලවත් කරලා තිබෙනවා; අද රාජ්‍ය නිලධාරියා බලවත් කරලා තිබෙනවා. තොරතුරු දැනගැනීමේ පනත අද ක්‍රියාත්මක වී තිබෙනවා. පසු ගිය කාලයේ තොරතුරු දැනගන්න පුළුවන් වුණාද? මේ පාර්ලිමේන්තුවට රටේ මූල්‍ය කටයුතු ගැන දැනුම් දුන්නාද? සියල්ලම හොර රහසේයි කළේ. දැන් හම්බන්තොට සම්බන්ධයෙන් ගහන ගිවිසුම පාර්ලිමේන්තුගත වෙලා ඉවරයි. නමුත්, පසු ගිය ආණ්ඩුව කාලයේ හම්බන්තොටට ගිවිසුම් ගැහුවේ නැද්ද? එදා මේ සභාවේදී, හිටපු කථානායකතුමා කිව්වා, "අපේ කාලයේත් ගිවිසුමක් ගැහුවා. මේ බලන්නකෝ; මේකත් බලන්නකෝ" කියලා. එහෙම කියලා එදා -අපි ආණ්ඩුව ගත්තාට පස්සේ,- ඒ ගිවිසුම සභාගත කළා. නමුත් මොන උද්ඝෝෂණ ආවත්, මොන විරුද්ධකම් කළත් අපි ජනතාවට සත්‍ය හෙළි කරනවා. සත්‍ය හෙළි කරලා තමයි අපි රටේ වැඩ කටයුතු කරන්නේ. විනිවිදභාවය තුළයි අපි කටයුතු කරන්නේ. අද අපි රාජ්‍ය සේවකයා ශක්තිමත් කර තිබෙනවා. ඒ කියන්නේ, අපි ස්වාධීන කොමිෂන් සභා පත් කරලා රාජ්‍ය සේවකයා, අධිකරණය, පොලීසිය මේ හැම දේම ස්වාධීන කළා. එදා මේ ගොල්ලෝ දේශපාලන අතකොළු වශයෙන් තමයි පොලීසිය පාවිච්චි කළේ. ගමේ ඉන්න දේශපාලනඥයා ගිහිල්ලා පොලීසියේ OIC පුටුවේ ඉඳගත්තා. අද එවැනි යුගයක් තිබෙනවාද? අග්‍රවිනිශ්චයකාරවරයාව වෙනස් කරන්නේ, තීන්දු ගන්නේ රටේ ජනාධිපතිවරයා. එදා කොහේද රටේ නීතියක් තිබුණේ? නමුත් අද ස්වාධීන කොමිෂන් සභාවලින් මේ රටේ රාජ්‍ය සේවකයා ශක්තිමත් කළා විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් දසදහසක් පඩි වැඩි කරනවා කියලා ඒ වැඩි කිරීම රුපියල් දසදහසෙන් නවතින්නේ නැතිව සියලු සේවකයන්ගේ මූලික වැටුප 2020දී දෙගුණයක් වෙන ආකාරයේ යන්ත්‍රණයක් එකතු කරලා ඒ සඳහා කටයුතු කරමින් පවතිනවා. එයින් පඩිය දෙගුණ වෙනවා විතරක් නොවෙයි, 2020දී pension එකත් දෙගුණයක් වෙනවා. Pension එක දෙගුණ වෙනවා විතරක් නොවෙයි, කෙනෙක් ලබා ගන්නා සේවක අර්ථ සාධක මුදලත් දෙගුණ වෙනවා. එහෙම යන්ත්‍රණයක් අද අපි විශේෂයෙන්ම ඇති කරලා තිබෙනවා.

ඔබතුමන්ලා එදා හොරකම් කළේ රාජ්‍ය නිලධාරියා පාවිච්චි කරලායි. ඇමතිවරයා හොරකම් කළාට, ගිහිල්ලා බැලුවාම අත්සන් කරලා තිබෙන්නේ රාජ්‍ය නිලධාරියා. එහෙම වෙන්නේ ඇයි? රාජ්‍ය නිලධාරියා තමයි අතකොළුව වශයෙන් පාවිච්චි කරලා වැඩ කටයුතු කළේ. නමුත්, ඒ විධියට දේශපාලනයේ අතකොළු නොවී වැඩ කරන්නට හැකි වන ආකාරයට රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම සඳහා අද කොමිෂන් සභා නිර්මාණය කරලා දැන් එහි කටයුතු කරමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ අය කලබල වෙන්නේ ඇයි? අද ඒ ගොල්ලෝ බලාපොරොත්තු වුණු උත්තරය ආවේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මේ ගොල්ලෝ බලාපොරොත්තු වුණේ, තෙල් ටැංකි ටික රැක ගන්න නොවෙයි, සේවකයන්ගේ ප්‍රශ්න නොවෙයි. කවුරු හෝ මේ උද්ඝෝෂණයේදී මරලා දමයි කියලායි බලාපොරොත්තු වුණේ. එතකොට ඒ මිනිය අරගෙන ලෝකේ වටේ දුවන්නයි හිටියේ. ඒකට අවස්ථාව නොලැබීම ගැන අද වියරු වැටිලා. අද ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරලා තිබෙනවා. උද්ඝෝෂණය කරන්න ඕනෑ නැහැ. මේ සභාවේ ඉන්න ඕනෑම මන්ත්‍රීවරයකුට ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න අවස්ථාව ඉතිහාසයේ ප්‍රථම වරට මේ රටේ උදා කරලා දුන්නේ අපියි. අද ඕනෑම ප්‍රශ්නයක් තිබෙනවා නම් අගමැතිතුමාගෙන් කෙළින්ම අහන්න පුළුවන්. ඒ අවස්ථාව උදා කරලා දුන්නේ අපි. ඒ විතරක් නොවෙයි, ඇමතිවරයා අමාත්‍යාංශය මෙහෙයවනවාට අමතරව ආංශික අධීක්ෂණ කාරක සභාවට සභාපතිවරයෙක් පත් කරලා, මන්ත්‍රීවරයෙක් පත් කරලා මේ අමාත්‍යාංශ ගැන හොයලා බලන්න පුළුවන් යුගය උදා කළේත් අපියි. ඒ විතරක් නොවෙයි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ආණ්ඩුව රාජ්‍ය ආයතනවල වංචා, දූෂණ හොයන කමිටුවේ සභාපති කර ගෙන හිටියේ කවුද? හිතෙෂී ඇමතිවරයෙක්, තමන්ගේ ඇමතිවරයෙක් තමයි එහි සභාපති වුණේ. එතකොට ඕනෑම විධියකට නටවන්න පුළුවන්. නමුත් අද අපි ඒ තනතුරු විපක්ෂයට භාර දීලා තිබෙනවා. ඒ ආකාරයට විනිවිද පෙනෙන රජයක්, විනිවිද පෙනෙන යන්ත්‍රණයක්, විනිවිද පෙනෙන රටක් නිර්මාණය කළේ අපියි. ඒ නිසා, ජනතාවගේ සිතුම්-පැතුම් අද ඉෂ්ට වුණාය කියා මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අපට තෙල් නැහැ, ඇයි මේ රජය ක්‍රියාත්මක වෙන්නේ නැත්තේ?" කියලා ජනතාව බලා ගෙනයි හිටියේ.

මම අහනවා, අහිංසක දුප්පත් මිනිස්සු තෙල් පෝලිමේ හිටියා මිසක්, මේ එක මන්ත්‍රීවරයෙක් තෙල් පෝලිමේ හිටියා ද කියා. මේ ගොල්ලන්ට හොර පාරෙන් තෙල් එනවා ගෙදරට. තෙල් කෑන් ගණන් ගෙදර stock කරනවා. [බාධා කිරීමක්] ඔය එක මන්ත්‍රීවරයෙක් තෙල් පෝලිමේ සිටියාද කියා මම අහනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ස්තුතියි.

ඊළඟට, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 09ක් තිබෙනවා.

[අ.භා. 3.04]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බනිජ තෙල් ක්ෂේත්‍රයේ සේවාවන් අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කරන්න අද දින ඉදිරිපත් කරන ලද අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනාව සම්බන්ධයෙන් පැවැත්වෙන මේ විවාදයට කරුණු කිහිපයක් එකතු කරන්නට මම බලාපොරොත්තු වෙනවා.

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලා මේ ගැන කරුණු බොහොමයක් කියූ නිසා ඒ කථාවලින් ආවරණය නොවූ කරුණු කිහිපයක් මේ ගරු සභාව හමුවේ තැබීමටයි මගේ බලාපොරොත්තුව.

මගේ කථාවට එන්න කලින් මම මේ ගැන කියන්න ඕනෑ. ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, "ගරු අගමැතිතුමාගෙන් ප්‍රශ්න අහන්නට දැන් අවස්ථාව මන්ත්‍රීවරුන්ට තිබෙනවා; ඒ තරම් ප්‍රජාතන්ත්‍රවාදී කාලයක් දැන් උදාවෙලා තිබෙන්නේ" කියා. අගමැතිතුමාගෙන් පාර්ලිමේන්තුවේ ප්‍රශ්න හතරක් පහක් අහන්න අවස්ථාව ලැබුණාට ආණ්ඩුවේ ඉන්න එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට අගමැතිතුමාට එක ප්‍රශ්නයක්වත් ඉදිරිපත් කරන්න බැරිව මොනතරම් අසරණ වෙලා ඉන්නවාද කියන එක මම දන්නවා. ඒ නිසා ඒ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථා කරන්නේ බනිජ තෙල් සේවකයන්ගේ හුදු සටනක් ගැන විතරක් නොවෙයි. ඒ අය සටන් කළේ වැටුප් වැඩි කරන්න ඉල්ලා නොවෙයි. ඒ අය සටන් කළේ තමන්ට මොනවා හෝ වෘත්තීය වරප්‍රසාදයක් ඉල්ලා නොවෙයි. ඒ අය සටන් කළේ මෙන්න මේ නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරාය විකිණීමත් එක්ක ඒකේ තෙල් පිරිපහදුවත් සම්පූර්ණයෙන් චීනයට අයිති වෙනවා. ඒ වැරැද්ද නිවැරදි කරන්න කියලායි ඒ අය සටන් කළේ. හෙට වරාය වෘත්තීය සමිති සටන් කරනවා; වර්ජන කරනවා. ඒ වරාය වෘත්තීය සමිති සටන් කරන්නේත් මේ මහා වටිනා සම්පත විකුණන්න එපා කියන ඉල්ලීම කරන්නයි. ජාතියේ අනාගත පරපුරට ඒ සම්පත අයිති කර දෙන්නය කියායි ඉල්ලන්නේ. එම නිසා මේක පටු සටනක් විධියට කවුරු හෝ දකිනවා නම් ඒ වෘත්තීය සටන හැල්ලු කරන්න කවුරු හෝ සිතනවා නම්, ඒක කරන්න පුළුවන් දෙයක් නොවෙයි. මේ මර්දනකාරී තත්ත්වය අද උදා කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදයේ සළුපිළි ගැලවිලා තිබෙනවා, අමු නිර්වස්ත්‍ර වන විධියට. තමුන්නාන්සේලා මැරයන් දාලා ඒ වෘත්තීය සංගම් නායකයන්ට ගහලා තිබෙනවා. රාජගිරිය පොලිසිය ඇතුළේදී පොලිස් නිලධාරීන් මේ වෘත්තීය සංගම් නායකයන්ට පහර දී තිබෙනවා. මේ විධියට තමුන්නාන්සේලා ක්‍රියා කිරීම මගින් නැවත අසූනවයේ යුගයකට මේ රට ගෙන යන ලකුණු තමුන්නාන්සේලා මේ වෙනකොට පෙන්වලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් මේ වෘත්තීය සටන මගින් මේ වැඩ කරන ජනතාව මොකක්ද

[ගරු විමල් වීරවංශ මහතා]

කියන්නේ? තමුන්නාන්සේලාගේ විකුණන් කෑමේ ප්‍රතිපත්තිය නවත්වන්න, රාජ්‍ය දේපළ විකුණා කෑමේ ප්‍රතිපත්තිය නවත්වන්න කියායි. තමුන්නාන්සේලා "ණය බර" කිය කියා තමයි මේ හැම අපරාධයම කරන්නේ.

දැන් බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා වරාය අධිකාරිය පසු ගිය අවුරුද්දේ ගෙවන්න තිබුණු ණය සහ පොලී මුදල් - ගෙවන්න තිබුණු සියලු මුදල්- ගෙවා ලාභ තිබෙන ආයතනයක්. හම්බන්තොට වරාය සම්බන්ධයෙන් ණය පොලී වාරිකත් ගෙවා ලාභ සොයපු ආයතනයක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය. බහලුම් නැතිව තිබෙද්දී පවා හම්බන්තොට වරායේ අවුරුද්දෙන් අවුරුද්ද ආදායම ඉහළ ගිහින් තිබෙනවා. ආදායම 2011 වර්ෂයේ රුපියල් මිලියන 11යි; 2012 වර්ෂයේ රුපියල් මිලියන 135යි; 2013 වර්ෂයේ රුපියල් මිලියන 565 යි; 2014 වර්ෂයේ රුපියල් මිලියන 1,277යි; 2015 වර්ෂයේ රුපියල් මිලියන -[බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 වර්ෂයේ රුපියල් බිලියන 47.8ක් හම්බන්තොට වරාය පාඩුයි. මේ ගරු මන්ත්‍රීතුමා අසත්‍ය ඉලක්කම් වගයක් කියවා ගරු සභාව නොමඟ යවනවා. ඉස්කෝලේ ගිහින් නැද්ද මම දන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

දමනය කරන්න මට මගේ විනාඩි නවය ඕනෑ.

දැන් තමුන්නාන්සේලා මේ වරාය විකුණන්නේ කීයටද? හම්බන්තොට වරාය ඩොලර් බිලියන එකකට විකුණන්නේ. රුපියල් දහදාහ ගණනේ වැටුප් වැඩි කළා; දීමනාව දුන්නා. ඩොලර් බිලියන එකෙන් තමුන්නාන්සේලාට අවුරුද්දක් ඒ වැටුප ගෙවත හැකියි. වෙන මොකවත් කරන්න බැහැ. එසේ වැටුප ගෙවීමටත් යනවා, ඩොලර් බිලියන 1.1ක්. අක්කර 500කට වඩා ඉඩම් ප්‍රමාණයක් සමඟ, අර තෙල් පිරිපහදු සංකීර්ණයත් සමඟයි විකුණන්නේ. තමුන්නාන්සේලා තේරුම් ගන්න. මේ හම්බන්තොට වරාය ඉදිරියේදී ඉතා වැදගත් වන බව. අද චීනය, තායිලන්තයේ ක්‍රා ඇළ කපාගෙන එනවා. මේ අවුරුද්ද වෙනකොට ක්‍රා ඇළ සම්පූර්ණයෙන් කපා අවසන් වෙනවා. අවසන් වුණාම මැලේසියාව, සිංගප්පූරුව පැත්තෙන් නොවෙයි සේද මාවත හැදෙන්නේ. ක්‍රා ඇළ හරහා කෙළින්ම එන්නේ හම්බන්තොටටයි. දවසකට නැව් පන්සියයක් විතර මෙතැනින් ගමන් කරනවා. ඒ විතරක් නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය අද අලුතෙන් හදන්නේ විශාල පරිමාණයේ නැව්. දැන් තිබෙන නැව්වල බහලුම් -containers- විසි එක්දාහකට වඩා ගෙනියන්න පුළුවන්. විසි එක්දාහකට වඩා බහලුම් ගෙනියන්න පුළුවන් විශාල නැව්වලට ඇතුළු වන්නට පුළුවන් වරායන් ලෝකයේ තිබෙන්නේ 15ක් පමණ. ඒ පහළොවෙන් දෙකක් තිබෙන්නේ ලංකාවේ.

එකක්, හම්බන්තොට ජාත්‍යන්තර වරාය. අනෙක, කොළඹ වරාය. ඒ කියපු විශාල නැව් තමයි ලෝකයේ අනාගත භාණ්ඩ ප්‍රවාහන නැව් බවට පත් වන්නේ. ඒ නිසා හම්බන්තොට වරාය කියන්නේ ධනය උපයන්න පුළුවන් ඉතාම හොඳ සම්පතක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් දැනට තිබෙන පාරේ -ඒ කියන්නේ සේද මාවතේ මැලේසියාව පැත්තෙන්- ලංකාවට එන්න නැව්වලට දවස් 11ක් ගත වනවා. ක්‍රා ඇළ කැපුවාම දවස් නවයෙන් නැව් එනවා. සාමාන්‍යයෙන් නැවක තෙල් තිබෙන්නේ, දවස් 10කට සරිලන ප්‍රමාණයකටයි. දවස් නවයෙන් හම්බන්තොට පැත්තට නැව එන කොට අනිවාර්යයෙන් තෙල් ගහන්න ඕනෑ වනවා. වෙනත් මොනවා නොකළත්, එතැන තෙල් සැපයුම පමණක් කළත්, හම්බන්තොට වරාය වෙනුවෙන් ගෙන තිබෙන සම්පූර්ණ ණය මුදල අවුරුද්දක් දෙකක් යන විට පියවා අවසන් කරලා එය ලාභ ලබන තත්ත්වයකට ගෙනෙන්න පුළුවන්. ඒ නිසා- [බාධා කිරීමක්] අනේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කෑ නොගහා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙය තේරුම් ගන්න. මේ කරුණු කියන කොට මේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

තේරෙන්නේ නැත්නම් අපි මොනවා කරන්නද? [බාධා කිරීමක්] අපි මොනවා කරන්නද? නිතරම වලිගය ඔසවාගන්නා එකමයි වැඩේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හැම තිස්සේම පෙන්නන්න එපා; හැම තිස්සේම අනින්න එපා;

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

නිතරම පෙන්නන්න එපා,

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීමක්]

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

ලක්ෂණ හැම තිස්සේම පෙන්නන්න එපා. වරායේ තිබෙන වැදගත්කම ගැන කරුණුයි මේ කියන්නේ. [බාධා කිරීමක්] අහගෙන ඉන්න බැරි නම් එළියට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතරම් වටිනා වරායක් තමයි මේ විකුණාගෙන කන්න හදන්නේ. ඒකත් විකුණනවා. එය විකුණාගෙන කන්නේ මොකටද? ඒ විතරක් නොවෙයි. අද දාලා තිබෙනවා යෝජනාවක්. [බාධා කිරීම්] හෙට අත්සන් කරනවා, ගිවිසුම්. [බාධා කිරීම්] මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනය ඉඩම් සමහ දෙනවා, බංග්ලාදේශයේ සමාගමකට. දෙයි හාමුදුරුවනේ! මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනය කියන්නේ, මේ රටේ කෘෂි කාර්මික අස්වැන්න වැඩි දියුණු කිරීම පිළිබඳ පර්යේෂණ කරන තැනයි. එහි අධ්‍යක්ෂ ජනරාල් පවා විරුද්ධව සිටියදී එය සම්පූර්ණ අක්කර ප්‍රමාණයත් එක්කම බංග්ලාදේශ සමාගමකට විකුණන්න හෙට ගිවිසුම් අත්සන් කරනවා. බංග්ලාදේශ සමාගමක් කියන්නේ කුමන තත්ත්වයක සමාගමක්ද කියා අපට තේරුම් ගන්න පුළුවන්.

මේ රටේ සියලු දේවල් විකුණාගෙන කන කොට, ත්‍රිකුණාමලය වරාය ඉන්දියාවට විකුණන කොට, හම්බන්තොට වරාය චීනාට දෙන කොට, මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ ආයතනය බංගලි සමාගමට දෙන කොට, ඒ ඔක්කෝම තමුන්නාන්සේලාගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළදු]
[Expunged on the order of the Chair.]

විකුණාගෙන කනකොට මේ රටේ වැඩ කරන ජනතාව, මේ රටේ ජීවත් වන ජනතාව ඔහේ බලාගෙන ඉන්න ඕනෑ කියාද තමුන්නාන්සේලා කියන්නේ? ඔහේ බලාගෙන ඉන්න පුළුවන් ජනවාරි 8වන දා තමුන්නාන්සේලා බලයට ගෙන එන්න කර දීපු අයට; ඒ වෙනුවෙන් මුට්ටිය අල්ලපු අයට; ඒ වෙනුවෙන් වට්ටිය අල්ලපු අයට. ඒ අයට නම් එහෙම ඉන්න පුළුවන් ඇති. අපට එහෙම ඉන්න පුළුවන්කමකුත් නැහැ; ඕනෑකමකුත් නැහැ. [බාධා කිරීම්] මේ රටේ වැඩ කරන ජනතාවට සාධාරණ අයිතියක් තිබෙනවා, මේ සම්පත් ආරක්ෂා කිරීම සඳහා තමන්ගේ ව්‍යක්තීය සමිති මඟින් ක්‍රියා මාර්ග ගන්න. ඒ ව්‍යක්තීය සමිති සටන්වලට තමුන්නාන්සේලා උත්තර දෙන්නේ කොහොමද? අද කරන ව්‍යක්තීය සටන්වලට තමුන්නාන්සේලා උත්තර දෙන්නේ කොහොමද? අත්‍යවශ්‍ය සේවාවක් කිරීම වෙනත් කාරණයක්. හමුදාව එහි පාලනය අතට ගැනීමත් වෙනත් කාරණයක්. ඒ සේවකයන් ඔක්කෝම එළියට දමලා පාරේ ඉන්න සලස්වා මැරයන් ගෙනැල්ලා -මරික්කාර්ගේ මැරයන් ගෙනැල්ලා- උන්ට කුඩු පැකට් එකක් දුන්නා; අතට පොල්ලක් දුන්නා. [බාධා කිරීම්] කුඩුයි, පොලුයි, සල්ලියි තමයි දුන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් ඔබතුමාට නියමිත කාලය අවසානයි. කතාව නතර කරන්න. කාලය අවසානයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කතාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මරික්කාර්ගේ මැරයන්ට කුඩුයි, පොලුයි, සල්ලියි දීලා තමයි පහර දුන්නේ. ඒක මහජන නැඟිටීමක් ලු. මට මතක් වෙනවා ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ පිටකොටුව station එක ළඟ මාධ්‍ය වේදින්ට පහර දීලා "මහ ජනතාව කුපිත වෙලා ගැහුවා" කියා කියපු හැටි. ඒ වාගේ විකාර කතා තමයි තමුන්නාන්සේලා අද කියන්නේ. මේ රටේ පොදු ජනතාව ප්‍රජාතන්ත්‍ර විරෝධී මේ මැර භාවිතාව වැඩි කල් යන්න කලින් තුරන් කරනවා. පුළුවන් නම් පළාත් පාලන මැතිවරණය පවත්වන්න; පළාත් සභා මැතිවරණය පවත්වන්න. ඒවා පවත්වන්නේ නැතිව කල් දමන්නේ ඒවා පැවැත්වූවොත් තමුන්නාන්සේලාට ඇපත් නැති වනවාය කියා දැන් හොඳින්ම දන්නා නිසායි. දිනන්න පුළුවන් නම් ආණ්ඩුවක් ඡන්ද කල් දමන්නේ නැහැ. ඡන්ද කල් දමන්නේ දිනන්න බැරි නිසායි. මහ ජනයා ඉන්නේ උත්තර දෙන්න බලාගෙනයි. තමුන්නාන්සේලා සිතනවා නම් මේ ක්‍රමයට දිගටම ඉන්න පුළුවන් කියා, පැරදුණු දවසට තේරුම් යාවි, මේ කරන විපත්කිදායක දේවලට කොච්චර වන්දි ගෙවන්න වේවිද කියා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. එතුමාගේ කතාවට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු එඩ්වඩ් ගුණසේකර මහතාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - Deputy Minister of National Policies and Economic Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතු ය" යි මම යෝජනා කරනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලක්ෂ්මි ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.14]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෂැංග්‍රි-ලා එකට ඉඩම් විකුණද්දී අප්පොච්චිට බයේ හැංගිලා හිටපු, ඩෝල් සමාගමට අක්කර 15,000ක් 20,000ක් දෙන කොට හැංගිලා හිටපු, ව්‍යාජ්‍ය වෙළඳාමේ ලංකාවේ දේශීය ප්‍රචාරණය භාරව කටයුතු කරපු

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කතා කළාට පසුව මේ කතාව මට ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද විකිණීම ගැන කථා කරන්නේ සැබැවින්ම "විකිණීම" කියන වචනයට අදාළව විකුණපු අය තමයි. අද විකිණීමක් නැහැ. ආයෝජනයක් එහෙම නැත්නම් පෞද්ගලික - රාජ්‍ය බද්ධ ව්‍යාපාරයක් ගැන අවබෝධයක් නැති බොරුවට ඉලක්කම් දොඩවන මිනිහෙක් තමයි දැන් කථා කළේ. ගිය අවුරුද්දේ හම්බන්තොට වරායේ ශුද්ධ ලාභය රුපියල් බිලියන 47.8යි. [බාධා කිරීමක්]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
පසුගිය කාලයේ අලාභයි තමයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඉරුවර්)
(An Hon. Member)
කෑ ගහන්න එපා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
හම්බන්තොට වරාය හදන්න -[බාධා කිරීම්]

අන්න යනවා. අන්න යනවා, වීරයා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

කළුතර තිස්ස විද්‍යාලය ඉස්සරහා අභිංසක ළමයි

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

පුළුවන් නම් ඇවිල්ලා අහගෙන ඉඳලා උත්තර දෙන්න. [බාධා කිරීම්] දැන් ඔය එහා පැත්තේ ඉඳන් බොරුවට කෑ ගහන ප්‍රසන්න රණවීරගෙන් මම අහනවා, මේ ආණ්ඩුව යටතේ permit එකක් අරගෙන වැලි ජාවාරම් කරන්නේ නැද්ද කියලා. [බාධා කිරීම්] වැලි ජාවාරම් කරන මිනිස්සු තමයි ඔය කෑ ගහන්නේ. මේ ආණ්ඩුවෙනුත් වරප්‍රසාද ලබන මිනිස්සු. යාන් ඔයේ බැකෝ දහයක් දාගෙන වැලි ජාවාරම් කරනවා. මේක තමයි ඇත්ත. යහ පාලනය අස්සේ රිංගාගෙන ඒකෙනුත් හම්බ කරන වැලි ජාවාරම්කාරයෝ. ඒ නිසා මම කියනවා, පුළුවන් නම් උත්තර දීලා "නැහැ" කියන්න කියලා. පුළුවන් නම් ප්‍රසන්න රණවීර නැඟිටලා කියන්න, යාන් ඔය ගිහින් වැලි ජාවාරම් කරන්නේ නැහැ කියලා. [බාධා කිරීමක්] ජාවාරම් කර කර තමයි මේ ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන්නේ. හම්බන්තොට වරාය ව්‍යාපෘතිය හදන්න රුපියල් බිලියන 193ක් ගියා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු උරුප්පිනර් ඉරුවර්)
(An Hon. Member)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්‍රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
මම නලින් බණ්ඩාර ජයමහට කියනවා මේ ප්‍රසන්න රණවීර යාන් ඔයේ වැලි, ගල් හාරන permit එකක් අරන් තිබෙනවා නම්, පුළුවන් නම් ඔප්පු කරන්න කියලා. ඔප්පු කළොත් මම මන්ත්‍රීකමෙන් අයින් වෙනවා. [බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගැරඩියාට භූමි තෙල් ගැහුවා වාගේ හැසිරෙන විධියෙන්ම පෙනෙනවා වැඩේ ඇත්ත බව. "පුහුල් හොරා කරෙන් දැනේ" කියන එක ඔප්පු වුණා. රුපියල් බිලියන 193ක් වියදම් කළ වරාය-

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
හැබැයි මම අභියෝග කරනවා, අපි කුරුණෑගල මිනිසුන්ට cheques වලට පොලු තියලා නැහැ නලින් බණ්ඩාර ජයමහ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

පැහැදිලිවම වරායට රුපියල් බිලියන 193ක් වියදම් කරලා තිබුණා. ඒකෙන් හතරෙන් එකක් මේ දක්වා පාඩුව. අපි දන්නවා, මේ වරාය ජාත්‍යන්තර සන්ධිස්ථානයක තමයි පිහිටා තිබෙන්නේ කියලා. මේ වරාය ජාත්‍යන්තර සන්ධිස්ථානයක පිහිටා තිබුණාට මේකට නිකම් නැව් එන්නේ නැහැ; මේකට නිකම් කර්මාන්ත එන්නේ නැහැ. ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ. මොනවාටද වරාය හැදුවේ? වරාය හැදුවේ කොමිස් ගහන්නයි, තමන්ගේ රාජපක්ෂ නාමය පුම්බා ගන්නයි. මේ දේවල්වලට තමයි වරාය හැදුවේ. වරාය හදනවාත් සමහම ඒකට සමගාමීව වරාය සංවර්ධනය කරන්නට වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. එදා සුද්දෝ කොළඹ වරාය හැදීමට සමගාමීව මේ රටේ කෘෂි ආර්ථිකයක් හැදුවා. තේ, පොල්, රබර් හැදුවා. එතකොට වරාය හරහා මේ රටෙන් අපනයනය කරන්නට භාණ්ඩ නිෂ්පාදනය වුණා. එතකොට වරාය දියුණු වුණා. 1977දී ලලිත් ඇතුලත්මුදලි මහත්මයා කොළඹ වරායේ ජය බහලුම් පර්යන්තය හැදුවා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
තවම ණය ගෙවනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

දකුණු ආසියාවේ පළමුවෙනි කන්ටේනර් පර්යන්තය ඒක. ඒ වරාය හදනවාත් සමහම අපනයන කලාප හැදුණා; කර්මාන්ත හැදුණා. වරායත් සමහම වරාය දියුණු වීමට අවශ්‍ය වටපිටාව හැදුණා. නමුත් හම්බන්තොට වරාය හැදෙනවාත් සමඟ එහෙම වැඩ පිළිවෙළක් තිබුණාද? එහෙම වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. අද වරාය හදලා අවුරුදු 5ක් ගිහිල්ලා. 2011 ඉඳන් රුපියල් බිලියන 47ක් පාඩුයි. රුපියල් බිලියන 47 පාඩුව සමානයි කොළඹ - කටුනායක Highway එක සඳහා ගිය මුදලට. ඒ කියන්නේ වරාය නිසා ඇති වුණු පාඩුවෙන් කොළඹ - කටුනායක Highway එක වාගේ තවත් highway එකක් හදන්න තිබුණා. Lotus Tower එක වාගේ තුනක් හදන්නට තිබුණා. මෙන්න මේකයි ඇත්ත. නමුත් අද අපි මේ වරාය ජාත්‍යන්තර ආයෝජනයක් විධියට, චයිනා මර්චන්ට්ස් සමාගමත් සමඟ එකතු වෙලා කරන ආයෝජනයක් විධියට කරනවා. අපිට මේක තනියම කරන්නට බැහැ. අපි අපේ හැකියාව හඳුනා ගන්න ඕනෑ. අපි මේ වරාය අද නිවැරදි නෙකළොත් මොකද වෙන්නේ? හොඳම උදාහරණයක් මම කියන්නනම්. එම්ටේට්ස් සමාගමත් සමඟ හවුල් ව්‍යාපාරයක් විධියට තිබුණු ශ්‍රීලන්කන් ගුවන් සමාගම ලාභ ලබමින් තිබුණු ආයතනයක්.

2008 සිට 2016 වෙනකම් වූ ශුද්ධ අලාභය රුපියල් බිලියන 461ක්! හැබැයි, අපේ මිනිස්සු සතුටු වෙනවා, අපට ගුවන් යානා තිබෙනවා; අපට ගුවන් සමාගමක් තිබෙනවා කියලා. අපේ අභිංසක ගොවියා, කම්කරුවා, දුප්පතා, ත්‍රීවීල් රියදුරා, යන මේ හැම කෙනෙක්ම මේ ණය කන්දට යට වෙලායි ඉන්නේ. හැබැයි, අපේ මිනිස්සු කියනවා "අපට අපේ ගුවන් සේවයක් තිබෙනවා" කියලා. එහෙම කියන්නේ රුපියල් බිලියන 461ක් ඉවර කරලායි.

හම්බන්තොට වරායක් හැදුවා කියලා මේ අය උදම් අනනවා. හැබැයි, මේ දක්වා ඒකට රුපියල් බිලියන 47ක් ඉවර කරලා! එහෙම උදම් අනන්න අපේ ජනතාව මත බර පටවන, ණය කඳු පටවන ව්‍යාපෘති අපට ඕනෑද? ඒ නිසා අපි පැහැදිලිවම කියනවා මේ වාගේ ව්‍යාපෘතියක්-

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, මොකක්ද රීති ප්‍රශ්නය?

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා, මම ඔබතුමාගෙන් අහනවා 2014 වසරේ වාහන කොපමණ ප්‍රතිඅපනයනය කළාද, 2016 වසරේ වාහන කොපමණ ප්‍රතිඅපනයනය කළාද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කැලණිය ආසනයේ හරක් පට්ටියක් බලපු මිනිස්සු වාහන ගැන කථා කරනවා. [බාධා කිරීම්] කැලණියේ හරක් පට්ටියක් බලපු මිනිස්සු වාහන ගැන අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතනය ලාභ ලබන තැනට පත් කරන්න අවශ්‍ය මූලික කටයුත්තක් තමයි අපි කරලා තිබෙන්නේ. සේද මාවත තුළින් දැවැන්ත චීනය දියුණු වෙද්දී, මේ වරාය සහ මේ ව්‍යාපෘතිය ලාභ ලබන තත්ත්වයට තල්ලු කරන්න ඕනෑ නිසා තමයි -[බාධා කිරීම්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බාධා කරන්න එපා. දැන් බාධා කළා ඇති.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

-China Merchants සමාගම එක්ක අපි මේ ව්‍යාපෘතියට ගිහින් තිබෙන්නේ. මේ උද්ඝෝෂණ කරපු අයගේ මූලික අවශ්‍යතාව වෙලා තිබුණේ මොකක්ද? අප්‍රේල් මාසයේ වරාය වෘත්තීය සමිති මොකක්ද ඉල්ලුවේ? එයාලා කිව්වේ ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි චීනයට දෙන්න එපා කියලායි. රජය පැහැදිලිවම කිව්වා මේ දක්වා එවැනි කිසිම ගිවිසුමක් අත්සන් කරලාත් නැහැ; ඒ ගැන සාකච්ඡා කරලාත් නැහැ කියලා. ඒක අසාර්ථක වුණු නිසා මේ අය හම්බන්තොටට ආවා. දැන් හම්බන්තොට තෙල් ටැංකි ගැන කථා කරනවා. හම්බන්තොට තෙල් ටැංකි කාගේද? ඒවා තෙල් සංස්ථාවට අයිති නැහැ. ඒවා අයිති වරාය අධිකාරියට. මේක හරියට අනුන්ගේ ගෑනියක් ඉල්ලලා වෙන මනුස්සයෙක් උද්ඝෝෂණය කරනවා වාගේ වැඩක්. ඒ අයට මේකට අයිතියක් නැහැ. අයිතියක් නැති දෙයක් ඉල්ලලා උද්ඝෝෂණය කරනවා. [බාධා කිරීම්] නෝනායි, මහත්තයායි එකතු වෙලා තමන්ගේ පවුල් සංස්ථාව සංවර්ධනය කරන්නේ කොහොමද, දියුණු වෙන්නේ කොහොමද, ණය වෙලා තිබෙනවා නම් ඉඩමෙන් කැල්ලක් උගසට තියලා ණයක් අරගෙන හරි දියුණු වෙන්නේ කොහොමද කියලා තීරණය කරන්න අයිතිය

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

තිබෙන්නේ ඒ දෙදෙනාට. නමුත්, තෙල් සංස්ථාවට අයිතියක් නැති මේ තෙල් ටැංකි ටික දෙන්න එපා කියලා තෙල් සංස්ථාවේ වෘත්තීය සමිති කියනවා. මේ තෙල් සංස්ථාව ගැන අපි හොඳට දන්නවා. අපි විපක්ෂයේ සිටියදී නිරීක්ෂණ චාරිකාවක් සඳහා තෙල් සංස්ථාවට ගිය අවස්ථාවේ ඔය වෘත්තීය සමිති අපට සැලකුවේ කොහොමද කියලා අපට මතකයි. වරායට ගියාම කොහොමද අපට සැලකුවේ? අපේ අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාත් ඒ ගැන දන්නවා. අපට කොහොමද හම්බන්තොට වරායේදී ගැහුවේ. ඒ වරායේදී මගේ කාර් එක කුඩු වෙන්න ගැහුවා. ඔය වෘත්තීය සමිති මහින්ද රාජපක්ෂ මහත්මයා බොහොම හොඳට හුරතල් කළා. ඒ හුරතල් කරන කාලයේ මහින්ද රාජපක්ෂ අප්පොච්චිගෙන් ඉල්ලා ගන්න තිබුණා නේ "අනේ, වරායේ තිබෙන තෙල් ටැංකි ටික අපට දෙන්නකෝ" කියලා. ඉල්ලුවාද? ඒ දවස්වල නැට්ට පස්සේ ගහගෙන හිටියා. ඒ දවස්වල එහෙම කටයුතු කරපු අය අද පාරට බැහැලා.

පැහැදිලිවම ඊයේ මේ ප්‍රහාරය එල්ල කළේ කොලොන්නාවේ ජනතාව. ඒක අපි දැක්කා. කොලොන්නාවේ තෙල් ටැංකි සංකීර්ණයට යාබදව ඉන්න මිනිස්සු ඒ සේවකයන්ට බත් පැකට් විකුණනවා. ඒ සේවකයන් මේ අයගේ ත්‍රීවීල්වලින් භයර් යනවා. තමන්ගේ නිවසේ කාමරයක් ඒ අයට කුලියට දීලා ජීවත් වෙනවා. ඒ සේවකයන් නිසා තෙල් ටැංකි සංකීර්ණය ආශ්‍රිතව තිබෙන තමන්ගේ කඩෙන් ආදායමක් ලබනවා. ඒ ජනතාවට මේවා නැති වෙද්දී, තමන්ගේ ගමේ දේ තමන් ඉදිරිපිට විනාශ කරනවා දකිද්දී කැක්කුමක් ඇති වෙනවා. ඒ වෙලාවට කැත්ත, පොල්ල අතට ගත්තේ නැත්නම් තමයි වරද. ඒකට තමයි ජාක්‍යාලය කියන්නේ. තමන්ගේ දේ රැක ගන්න තමන්ට තිබෙන කැක්කුම තමයි ඒ. හැබැයි, මේ අයට එහෙම වුවමනාවක් නැහැ. මේ අය වැඩට ආපු සේවකයන්ට ගහන හැටි අපි දැක්කා. ඒ අයට කුණු බිත්තරවලින් ගැහුවා; ඒ වාහනවල හුළං ඇරියා; valves කැඩුවා. මේවා තමයි කළේ. මේ අවශ්‍යතාව කාගේද? මේ අයට රජ වෙන්න හිතාගෙන වෘත්තීය සමිති ගැන කථා කරනවා. එදා පොලිස් නිලධාරීන්ගේ තොප්පි ගලවපු වීරවංශලා තමයි අද පොලිස් නිලධාරීන් ගැන කථා කරන්නේ. ඊයේ වැලිකඩ පොලීසියට ගිහින් පාට් දමපු හැටි අපි දැක්කා. පොලිස් නිලධාරීන්ට තිබුණේ අර පරණ ගනුදෙනුව බේරා ගන්න අල්ලා ගන්නයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

එදා නාමල් රාජපක්ෂ මහත්මයා, විමල් වීරවංශ මහත්මයා ඇතුළු කට්ටිය පොලීසියට ගිහින් හැසිරුණු ආකාරය අපට මතකයි. එදා පොලිස් නිලධාරීන්ට තර්ජනය කළා.

ඒ නිසා පැහැදිලිවම කියනවා, මෛත්‍රී-රනිල් ආණ්ඩුව පෙරළන්න හිතාගෙන ඉන්නවා නම් ඒක කරන්න බැරි දෙයක් කියලා. අපේ කාලෝ ෆොන්සේකා මහත්තයා කියපු විධියට මනරංජන වැඩ වර්ජනවලට විරුද්ධව නම් අපි අත ඔසවන්නේ නැහැ. හැබැයි අතිදුර්ජන වැඩ වර්ජන ආවොත් ඊට එරෙහිව ජනතාව ඉස්සරහට එනවා; මන්ත්‍රීවරුන් විධියට අපි ඉස්සරහට එනවා. දැන් අපි සිග්නල් එක දුන්නා. "බහුජන හිතාය" කියලා බහුතර ජනතාව ගැන හිතලා අපි ඒ වැඩ වර්ජන වළක්වන්න, මර්දනය කරන්න, නතර කරන්න කටයුතු කරනවා. රතුපස්වලදී වාගේ මිනී මරන්නේ නැතුව, කටුනායකදී වාගේ මිනී මරන්නේ නැතුව, හලාවතදී වාගේ මිනී මරන්නේ නැතුව බහුතර ජනතාවගේ හිත සුව පිණිස මේ ආණ්ඩුව දැඩි තීන්දු ගන්නවාය කියන එක මතක් කරමින්, මට කාලය ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සභාවට මේ කාරණය දැනුම් දෙන්න කැමැතියි. අපි අද මේ විවාදය අවසානයේ ඡන්දයක් ඉල්ලන්නේ නැහැ. අපි හෙට තමයි ඒ ඡන්දය ඉල්ලන්නේ. එය මන්ත්‍රීවරුන්ට දැනුම් දෙනවා. We are not asking for a Vote today. මොකද, සමහර කථිකයන්ට අද එන්න අමාරුයි. ඒ නිසා අපි හෙට උදේ නැවත මේ විවාදය ආරම්භ කරලා, ඊට පසුව ඡන්දයක් ගන්නවා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ගරු ඇමතිතුමනි, ඒ ඡන්දය එපා. පළාත් පාලන ආයතන ඡන්දය තියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පළාත් පාලන පනත් කෙටුම්පත අපි අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. එදාට ඒ පනත සම්මත කරගෙන අපි ඡන්දයට සූදානම් වෙමු.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
අද මේ විවාදය ගැන ඡන්දයක් ගන්නේ නැද්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, අද අපි ඡන්දයක් ගන්නේ නැහැ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හෙට ඡන්දය ගන්නේ අද එකටයි, හෙට එකටයි දෙකටමද? නැහැ නේද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
නැහැ, නැහැ. හෙට උදේ මේ යෝජනාවට පමණක් ඡන්දය ගන්නවා. අපේ කථිකයන් දෙන්නෙක් කථා කළාට පස්සේ ඡන්දයක් ගන්නවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එම්.ඒ.එල්.එම්. හිස්බුල්ලා රාජ්‍ය ඇමතිතුමා.

[பி.ப. 3.26]

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - புனர்வாழ்வளிப்பு மற்றும் மீள்குடியேற்ற இராஜாங்க அமைச்சர்)
(The Hon. M.L.A.M. Hizbullah - State Minister of Rehabilitation and Resettlement)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டத்தின் கீழ் பெற்றோலிய உற்பத்திகள் மற்றும் திரவ எரிவாயு உட்பட அனைத்து வகையான எரிபொருள் வழங்கல் மற்றும் விநியோகத்தை அத்தியாவசியமான சேவைகளாகப் பிரகடனப்படுத்துவதற்கான விவாதம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது.

குறிப்பாக யார் ஆட்சி செய்தாலும் மக்களுடைய -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු සභානායකතුමා කිව්වා මේ යෝජනාවට ඡන්දයක් ඉල්ලන්නේ නැහැ කියලා. ඡන්දය ඉල්ලන්නේ අපි නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ගැන කථා කරන්න තව අපේ කථිකයන් ඉන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමන්ලාට තිබෙන්නේ මේ යෝජනාව ඉදිරිපත් කරන්නයි. මේක සම්මත කරනවාද නැද්ද කියලා අහනකොට, අපි තමයි ඡන්දයක් ඕනෑද නැද්ද කියලා තීරණය කරන්නේ. ඔබතුමා කොහොමද තීරණය කරන්නේ ඡන්දයක් ඉල්ලනවාද, නැද්ද කියලා?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ විවාදය හෙට දවසේත් පවත්වන බව තමයි එතුමා කිව්වේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
විවාදය හෙට දවස දක්වා කල් තබනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඒක වෙනම කථාවක්. විවාදය හෙට දක්වා යනවා. නමුත් ඡන්දයකට යනවාද, නැද්ද කියලා තීරණය කරන්න ඕනෑ අපි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ගරු එම්.ඒ.එල්.එම්. හිස්බුල්ලා ඇමතිතුමා ඔබතුමාගේ කථාව කරන්න.

ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
யார் ஆட்சி செய்தாலும் அரசாங்கம் மக்களுடைய நலன்களைக் கருத்திலேகொண்டு செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும்.

கடந்த 3 நாட்களாக இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபன ஊழியர்கள் மேற்கொண்ட வேலை நிறுத்தம் காரணமாக இலங்கை பூராவும், குறிப்பாக, கொழும்பு மாவட்டத்தில், மக்கள் பல்வேறுபட்ட அசௌகரியங்களை எதிர்கொண்டார்கள். இதனால் சாதாரண மக்கள்தான் மிகவும் கஷ்டமான ஒரு சூழ்நிலைக்குத் தள்ளப்பட்டார்கள். எந்தப் பிரச்சினைகள் இருந்தாலும் அவற்றை அரசாங்கத்தோடு பேசி அவற்றுக்கான தீர்வுகளைப் பெற்றுக்கொள்ள வேண்டுமே தவிர, ஆர்ப்பாட்டங்கள், வேலைநிறுத்தங்கள் போன்றவற்றை மேற்கொள்வதனூடாகப் பிரச்சினைகளுக்குத் தீர்வுகாண முடியாது. கடந்த காலங்களில் மேற்கொள்ளப்பட்ட இவ்வாறான வேலைநிறுத்தங்களால் இந்த நாட்டில் பாரிய பிரச்சினைகள் ஏற்பட்டதை நாங்கள் எல்லோரும் அறிவோம். ஆகவே, இந்தச் சூழ்நிலைகளை நாங்கள் எல்லோரும் கருத்திற்கொள்ள வேண்டும்.

எரிபொருள் என்பது நாட்டிலேயுள்ள அத்தனை செயற்பாடுகளுடனும் சம்பந்தப்பட்ட முக்கியமான ஒரு விடயம். இது தேசிய ரீதியிலும் சர்வதேச ரீதியிலும் தாக்கத்தை ஏற்படுத்துகின்றது. ஆகவே, இவ்வாறான துறையில் உள்ளவர்கள் வேலைநிறுத்தங்களை மேற்கொள்வதனூடாகப் பிரச்சினைகளுக்குத் தீர்வுகாண முடியாது. மக்களுடைய அத்தியாவசிய தேவைகளை முடக்குகின்றதான செயற்பாடுகள் அரசியல் ரீதியான சிந்தனைகளுக்கு அப்பால் நோக்கப்பட வேண்டும். உண்மையிலே மேதகு ஜனாதிபதி அவர்கள் இந்த வேலைநிறுத்தத்துடன் சம்பந்தப்பட்டவர்களோடு பேசுவதற்கான உடன்பாடு இருந்தது. அந்நிலையிலும் அவர்கள் இவ்வாறு ஆர்ப்பாட்டத்தில் ஈடுபட்டதை நாங்கள் ஒருபோதும் அனுமதிக்க முடியாது. அவர்கள் வேலைநிறுத்தத்தில் ஈடுபடுவதற்கு நியாயமான காரணங்கள் இருக்கலாம். அவை பேசித் தீர்க்கப்பட வேண்டும்.

ஏனென்றால், நாங்கள் அரசாங்கத்தின் மீது அல்லது தொழிற்சங்கங்கள் மீது பழியைச் சுமத்தி, இரண்டு நாட்களின் பின்பு மீண்டும் பழைய நிலைமைக்குக் கொண்டுவந்திருக்கின்றோம். ஆனால், கடந்த மூன்று நாட்களாக மக்கள் பட்ட துன்பங்களையும் துயரங்களையும் கஷ்டங்களையும் நாங்கள் ஒருபோதும் மறக்க முடியாது. எரிபொருளைப் பெற்றுக்கொள்வதற்காக அவர்கள் நீண்ட நேரம் வரிசையில் நின்றார்கள். குறிப்பாக, 'ஆட்டோ' சாரதிகள் கடுமையான கஷ்டங்களை எதிர்நோக்கினார்கள். அவர்களுடைய நாளாந்த வருமானம் அதிலேதான் தங்கியிருக்கிறது. ஆகவே, இவ்வாறான சூழ்நிலைகள் உருவாகின்றபோது, அதிகாரங்களைப் பயன்படுத்தி அச்சேவைகளை மக்களுக்கு வழங்கக்கூடிய வகையிலே அவற்றை அத்தியாவசியச் சேவைகளாகப் பிரகடனப்படுத்தவேண்டிய தேவை அரசாங்கத்துக்கு இருக்கிறது; அது எந்த அரசாங்கமாகவும் இருக்கலாம். அந்த வகையிலே, இவ்வாறான சூழ்நிலைகளுக்கு முகம்கொடுப்பதற்கு அதிகாரங்கள் இருக்க வேண்டும். இவ்வாறு அத்தியாவசிய சேவைகளை முடக்க நினைக்கின்றவர்களுக்கு எதிராக நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும்; அதனூடாக நாங்கள் எதிர்காலத்திலே மக்களுடைய அன்றாட நடவடிக்கைகள் பாதிக்கப்படுவதைத் தடுக்க வேண்டும். இவ்வாறான வேலைநிறுத்தங்களினூடாக

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

මක්කලුණක්කුත් තුන්ප දුයරන්කල් ඒර්පටුවතෙ නාන්කල් අනුමතික්කක් කූටාතු. සාතාරණමාන වේරු වේලෙනිරුත්තම් එන්රාලුම් පරවායිල්ලෙ. ඉදු නාළාන්ත නටවටික්කෙකළෝටු තොටර්පුපට්ට විටයම්. සර්වතේස පෝක්කුවරත්තුටන් - විමාන සේවෙකළ්, කප්පර් සේවෙකළ් පෝන්රවෙ - සම්පන්තප්පට්ටිරුක්කුම් ඉව්විටයමානදු නාට්ටුක්කු අවමානත්තෙයුම් අපකීර්ත්තියෙයුම් ඒර්පටුත්තුම්. ආකවේ, ඉව්වාරාන සූල්නිලෙකළ් ඒර්පටුකින්රපෝදු නාන්කළ් කට්සි පේතමිල්ලාමල් ඔන්රුපට්ටුච් සෙයර්පට වේණ්ටුම්. ඒනෙන්රාල්, ඉන්ත නාට්ටෛක් කට්ටියෙළුප්ප වේණ්ටිය තේවෙයුම් නාට්ටිලුළ්ළ ඉන්නෝරන්න පිරච්සිනෙකළුක්කුත් තීර්වුකාණ වේණ්ටිය තේවෙයුම් එල්ලෝරුක්කුම් ඉරුක්කිරදු. ආකවේ, තේසිය රීතියාක මේර්කොළ්ළප්පටුකින්ර ඉව්වාරාන සෙයර්පාටුකළුක්කු ඒතාවදු කාරණංකළ් ඉරුක්කුම්. අවෙ පේච්සුවාර්ත්තෙකළිනූටාකත් තීර්ක්කප්පට වේණ්ටුම්. ඉව්වාරු සෙය්වතනූටාකත්තාන් නාන්කළ් පිරච්සිනෙකළුක්කු නිරන්තරත් තීර්වුකළෛප් පෙර්රුක්කොළ්ළ මුටියුම්. එතිර්කාලත්තිලුම් ඉව්වාරාන සෙයර්පාටුකළ් මුන්නෙටුක්කප්පටලාම්. ආකවේ, නාන්කළ් ඉවර්රෙ අරසියල් මයප්පටුත්තක්කූටාතු. ඉන්රු එංකළුක්කු ඉරුක්කින්ර මුක්කියමාන තේවෙ නාට්ටිලේ ඉරුක්කින්ර පල්වේරු පිරච්සිනෙකළුක්කුත් තීර්වු කාණ්පතාකුම්. අවර්රුක්කු මුකම්කොටුක්ක වේණ්ටිය සූල්නිලෙක්කු නාන්කළ් ආයත්තමාක වේණ්ටුම්.

මේලුම්, කට්සිකළුක්කිටෙයිල් වේරුපාටුකළෛ වළර්ත්තුක්කොණ්ටු සාතාරණ මක්කළෛක් කෂ්ටප්පටුත්තුවතෙ, අවර්කළෛත් තුන්පත්තිල් ආළ්ත්තුවතෙ, වරුමෙයිල් ඉරුක්කින්ර එළිය මක්කළෛ ඉව්වාරාන පිරච්සිනෙකළුක්කු උට්පටුත්තුවතෙ එන්ත වකෙයිලුම් නාම් අනුමතික්ක මුටියාදු. ආකවේ, ඉව්වාරාන නිලෙමෙකළ් ඒර්පටුම්පෝදු අවසරකාල නිලෙමෙයෛප් පයන්පටුත්ති, මක්කළුක්කු අත්තියාවසිය සේවෙකළෛප් පෙර්රුක් කොටුප්පතර්කාන නටවටික්කෙකළ් එටුක්කප්පටවේණ්ටුම් එන්රු කූරි, විටෛපෙරුකින්රේන්.

[අ.භා. 3.32]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(මාණ්පුමිකු සන්තිරසිරි කජදීර)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනාව පිළිබඳවයි අපි අද දින විවාද කරන්නේ. අදාළ ගැසට් නිවේදනයේ උපලේඛනයේ, "පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥාපනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩබෑම, ගබඩා කිරීම, භාර දීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම යන සේවාවන් සැපයීමෙහි...." යනුවෙන් සඳහන් කර තිබෙනවා. මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේයි ඉදිරිපත් කර තිබෙන්නේ.

එවකට ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ සිටි අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් 1979 දී එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ වෙන කිසිම කරුණක් නිසා නොවෙයි. ඒ සඳහා හේතු වුණේ මොකක්ද? 1977 දී බලයට පත් වුණු ආණ්ඩුව පාර්ලිමේන්තු බලතල සියල්ල අතට අරගෙන, නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය ව්‍යවස්ථාව - ඒකාධිපති ස්වරූපයේ ව්‍යවස්ථාව- සම්මත කරලා, එම ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙන යන ක්‍රියාවලියත් එක්ක වැඩ කරන පන්තියේ මතුවීම, එම පන්තියේ අරගළ මර්දනය කිරීමේ පදනම ඇතිව තමයි අත්‍යවශ්‍ය මහජන සේවා පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

සාකච්ඡා හා සංවාද මාර්ගයෙන් මේ ප්‍රශ්න විසඳා ගන්නවාය කියා අද අපේ සමහර අය කිව්වා. ඇත්ත. මොකද, රට ඇතුළේ තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් ගෙන යන අරගළවලදීත්, ජාතික කාරණාවලදීත් කම්කරු පන්තියට ඒක වෙන් නොකර අරගළ කරන්න බැරිකමක් නැහැ. මොකද, මේ එකකට එකක් බද්ධ වෙලායි තිබෙන්නේ. ආර්. ප්‍රේමදාස අගමැතිතුමා මේ පනත ඉදිරිපත් කරන අවස්ථාවේත් කිව්වා, "මහ ජනතාවගේ සුබසිද්ධිය, යහපත වෙනුවෙන් තමයි අප මේ අත්‍යවශ්‍ය සේවාව පනවන්නේ" කියා. නමුත්, ඒ අත්‍යවශ්‍ය සේවා පනවන කොට රටේ ආන්දෝලනාත්මක තත්ත්වයක් ඇති වුණා. වැඩ කරන පන්තිය මත බර පැටෙව්වා. ඒකට එරෙහිව වැඩ වර්ජනවලට පෙරාතුව විරෝධතා ව්‍යාපාර පටන් ගත්තා. අමතක කරන්න එපා, ඒ විරෝධතා ව්‍යාපාර ගෙන යන අවස්ථාවේ පොලු මුගුරුවලින්, බයිසිකල් චේන්වලින් පහර දීලා වැඩ කරන පන්තියේ නායකයන් මරා දමපු බව. එහිදී සෝමපාල සහෝදරයා වැනි අය මරා දැමුවා. ඒ එක්කම තමයි අසූවේ ජූලි වැඩ වර්ජනය ඇති වුණේ. වැඩ කරන පන්තිය මර්දනය කිරීමේ අරමුණින්, යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් කිරීම පාදක කරගනිමින් ක්‍රියා කරන්න ආණ්ඩුවක් උත්සාහ කරනවා නම්, ඒ තුළින් කම්කරු පන්තිය මර්දනය කරන්න ලැහැස්ති වෙනවා නම්, මේවා පැනවෙන්නේ වැඩ වර්ජන එපා කියන කොන්දේසි යටතේ නම්, අපට මේවාට කිසිදු සහායක් දෙන්න පුළුවන්කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බනිජ තෙල් සංස්ථාවේ වැඩ කරන පන්තියේ කම්කරුවන්ට ඊයේ දිනයේ කරන ලද මිලේඡ පහරදීම අප දැඩි ලෙස හෙළා දකිනවා. මේ වාගේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යෑමේදී, පොලිසිය හමුදාවට වඩා වෙනත් බාහිර කොටියාස පාවිච්චි කරලා ත්‍රස්තවාදී ස්වරූපයෙන් මේවා යටපත් කරන්න ගත් උත්සාහයන් ඉතිහාසයේ අප දැක තිබෙනවා. එම නිසා රටට අනතුරක් සිදුවෙනවා නම්, රටේ ආර්ථිකයට බලපෑමක් සිදුවෙනවා නම්, තමන්ගේ වෘත්තියට බලපෑමක් සිදු වෙනවා නම්, තමන්ගේ ආර්ථිකය ශක්තිමත් කර ගන්න ක්‍රියා මාර්ග ගන්න කොට ආණ්ඩුව ඊට කන් දෙන්නේ නැත්නම්, විවිධ ආකාරයේ විරෝධතා ගෙන යන්න රටක වැඩ කරන පන්තියට පුළුවන්කමක් තිබෙනවා.

ඒක නිසා අපට වෙන් කරලා කථා කරන්න පුළුවන්කමක් නැහැ. මම කියන්න කැමැතියි, මේකට පාදක වෙච්ච කරුණු කුමක් වුවත් ඒවා අපට වෙනම සාකච්ඡා කරන්න පුළුවන් බව. රටේ ආර්ථිකය සම්බන්ධව, රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළකදී, මේ ආණ්ඩුව කල්පනා කරනවා නම් "අපේ පැත්ත තමයි හරි, ඒකට කාටවත් විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ" කියලා, ඒක සාධාරණ පිළිවෙතක් නොවෙයි.

අපි වඩා ප්‍රජාතන්ත්‍රවාදී විධියට, ඒ වැඩ කරන පන්තියත් එක්ක සංවාදශීලීව මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න ඕනෑ. වැඩ වර්ජන මතු වෙන විට ඒවා බලෙන් යටපත් කරන්න උත්සාහ කළොත් කඩාකප්පල්කාරී ක්‍රියාවන්වලට පරිවර්තනය වෙන්න පුළුවන්. ඒක ලෝක ඉතිහාසයේ අපි දැකලා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවේශයන් නරක විධියට යටපත් කරන්න ක්‍රියා කළොත්, විශේෂයෙන්ම ආර්ථික මර්මස්ථාන සම්බන්ධයෙන්

ක්‍රියා කරනකොට, ඒවා කඩාකප්පල්කරන තත්ත්වයට වැඩ කරන පන්තිය පත් වුණොත්, ඒවා ඊට වඩා නරක විධියට රටට බලපානවා පමණක් නොවෙයි, මේ රටේ පවතින තත්ත්වය මීට වඩා අරාජික වෙන්න පුළුවන්. ඒක නිසා ආර්ථික සංවර්ධනය සඳහා ගමනක් යන අවස්ථාවක අපට කම්කරු පන්තිය මර්දනය කරලා ඒක ගෙන යන්න බැහැ.

කම්කරු පන්තියේ සහයෝගය දිනා ගන්න ඕනෑ. ඒ ක්‍රියා මාර්ග පිළිබඳව දැනුවත් කරන්න ඕනෑ. ඒ ක්‍රියා මාර්ග පිළිබඳව කම්කරු පන්තියේ විඥානය දියුණු කරලා වඩා අර්ථවත් විධියට ඒ අයගේ සහයෝගය ලබා ගන්න ක්‍රියා කිරීම හැර, පොලිස් මර්දනය යොදවලා, එහෙම නැත්නම් වෙනත් බාහිර ත්‍රස්තවාදී කොටස් පාවිච්චි කරලා මේ වාගේ ප්‍රහාරාත්මක විධියට හැසිරෙන කොට, මේ ඉදිරිපත් කරපු ගැසට් නිවේදනය තුළඅපට හිතෙනවා, "ලබ්බට තියපු අත පුහුලටත් තියයි" කියලා.

මේක නරක තත්ත්වයක්. මේක වෙනත් සේවාවන් සඳහාත් පාවිච්චි කරන්න පුළුවන්. 1979 සැප්තැම්බර් මාසයේ ගෙනාපු ඒ පනත යටතේ ඕනෑම සේවයක් අත්‍යාවශ්‍ය සේවාවක් බවට පරිවර්තනය කරලා වැඩ කරන පන්තිය මර්දනය කරන්න පාවිච්චි කරන්න පුළුවන්. ඒ සඳහා නෛතික විධිවිධාන මෙහි තිබෙනවා. ඒ අය හිරේ දමන්න පුළුවන්, දඩ ගහන්න පුළුවන්, දඩුවම් කරන්න පුළුවන්. ඒ නිසා මේක කම්කරු පන්තිය වහලුන් හැටියට තියා ගන්න හදන උත්සාහයක්ද කියන එක ගැන අපට කල්පනා කරන්න සිද්ධ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හෙළා දකිනවා ඒ මෘග ප්‍රහාරය. එවැනි මැර ප්‍රහාර මඟින් වැඩ කරන පන්තිය ප්‍රකෝප කිරීම හරහා ඔවුන් වඩ වඩාත් ප්‍රචණ්ඩත්වයට පත් කිරීම සහ වෙනත් ක්ෂේත්‍ර මේ අරගළයට තල්ලු කර දැමීම ජන ජීවිතවලට මීට වඩා තදින් බලපාන්න පුළුවන්. ඒ නිසා රටේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් මේ ආණ්ඩුව යම් ගමන් මහක යන්න උත්සාහ කරනවා නම් රටේ සාමය ආරක්ෂා වෙන්න ඕනෑ. නමුත්, ඒ පිළිබඳ සංවාදයක් තවම පාර්ලිමේන්තුව තුළ හෝ ගෙන යන්න මේ ආණ්ඩුව අපොහොසත් වී තිබියදී, විවිධ අදහස්, මනෝ භාවයන් වැඩ කරන පන්තිය තුළට එන එක වළක්වන්න බැහැ. වෙනත් අයට විවිධ බලපෑම් මඟින් ඒ අයගේ මනස විකෘති කරන්න තිබෙන ඉඩ කඩ නවත්වන්න බැහැ. ඒ නිසා ඒ තිබෙන අඩු පාඩු වැඩ කරන පන්තිය පිට දාලා පහර දීලා, මර්දනය කරලා, මිලේච්ඡ විධියට හැසිරීම නවත්වා, ඒ වැඩ වර්ජනය මර්දනය කරන්න ක්‍රියා කරපු, අනවශ්‍ය විධියේ බලපෑම් කරමින් පහර දීපු කොටස්වලටත් නීත්‍යානුකූල පියවර ගන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 3.42]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා කථා කළා, වැඩ වර්ජනයේදී සිදු කළ පහර දීම් ගැන. කෙසේ වෙතත් අපි මතක් කරන්න ඕනෑ, අද වන කොට විශාල හානියක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේපොළවලට සිද්ධ වෙලා තිබෙන බව. විශේෂයෙන්ම Ceylon Petroleum Storage Terminals Limited හි මුතුරාජවෙල පර්යන්තයේ විශාල හානියක් කර තිබෙනවා. ඒ ගැන මා ඉදිරියේදී කථා කරන්න බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත අනුව, 2017 ජූලි 25 වැනිදා අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මඟින්, 2017 ජූලි මස 25 දින සිට පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥා පනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම ආදී සියලු කටයුතු අත්‍යවශ්‍ය සේවා විධියට ප්‍රකාශයට පත් කළා. රටක මහජනතාවගේ ජන ජීවිතය අඩාල වීම වැළැක්වීමට පවතින රජය විසින් විවිධ තීන්දු ගන්නවා. විශේෂයෙන්ම මහ බැංකුව, විදුලිබල මණ්ඩලය, විදුලි සංදේශ, තැපැල්, සෞඛ්‍ය, මහාමාර්ග, ප්‍රවාහන, දුම්රිය, වරාය, ආනයන අපනයන ආදී ආයතනත් ඉදිරියේදී මේ නියෝගයට යටත් කළ යුතුයි කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08 වැනිදායින් පස්සේ මේ රටේ යහපාලනය ස්ථාපිත වීමත් එක්ක ජනතාවට සැබෑ නිදහස උදා වුණා. ඒ නිදහස අනිසි ලෙස යොදා ගනිමින් රාජ්‍ය විරෝධීන් ආණ්ඩු පෙරලීමේ අසාර්ථක උත්සාහයක නිරත වෙනවා. රාජපක්ෂ යුගයේ හදිසි නීතිය යොදා ගෙන තමන්ට රිසි පරිදි රට පාලනය කළා. ඒ අය අද ඒවා අමතක කරලායි මේ යහපාලන ආණ්ඩුවට විරුද්ධව කථා කරන්න උත්සාහ කරන්නේ. විශේෂයෙන්ම ඛනිජ තෙල් වර්ජනය ගැන කථා කිරීමේදී සඳහන් කරන්න ඕනෑ ප්‍රධාන කරුණුවලින් එකක් තමයි ත්‍රිකුණාමල ටෙල් ටැංකි පර්යන්තය පිළිබඳ කාරණය. එතැන තෙල් ටැංකි 101ක් තිබුණා. ඒවා ඉදි කර තිබෙන්නේ 1931 ඉංග්‍රීසි ආණ්ඩුව කාලයේ.

එදා ඉඳන් අපි මේ තෙල් ටැංකි සම්බන්ධයෙන් විවිධ වාර්තා දැක්කා. 1948දී අපි නිදහස ලැබූ දින සිට 2003 දක්වා මේ තෙල් ටැංකි 100 කිසිම කටයුත්තක් සඳහා පරිහරණය කළේ නැහැ. මේ තෙල් ටැංකි 100ම වල් වැදිලායි තිබුණේ. 2003දී එයින් තෙල් ටැංකි 14ක් ඉන්දියන් IOC සමාගමට බදු දුන්නා. තවත් තෙල් ටැංකි 86ක් ඉතිරි වෙලා තිබෙනවා. 2003 සිට මේ වන විටත් ඒ තෙල් ටැංකි 86 කැලෑ වදිමින් තමයි තිබෙන්නේ. බදු දීපු තෙල් ටැංකි 14න් විතරක් අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් ලක්ෂයක ආදායමක් ආණ්ඩුවට ලැබෙනවා. "මේවා බදු දෙන්න එපා, මේවා වල් වදින්න මේ විධියට තියන්න." කියලා කියන්නේ රාජ්‍ය දේපොළ ආරක්ෂා කරන කට්ටිය ද? නැත්නම්, රාජ්‍ය දේපොළ විනාශ මුඛයට යන්න දීලා බලන් ඉන්න කට්ටියද කියලා මම අහන්න කැමැතියි. ඔය කියන කට්ටිය 2015 වනතුරු ආණ්ඩු බලයේ හිටියා. ඔවුන් මේ තෙල් ටැංකි සම්බන්ධයෙන් මොකක්ද ගත්ත පියවර කියලා මම අහන්නත් කැමැතියි. ඒ වාගේම, පසු ගිය රෙජීමය යුගයේදී ඒකාධිපති බලය යොදවා ගෙන රාජ්‍ය සම්පත් තමන්ගේ පවුලේ සම්පත් විධියට පරිහරණය කළා. කිසිදු වග විභාගයක් ඒ සම්බන්ධයෙන් සිදු කළේ නැහැ. යම් යම්

[ගරු චන්දිම ගමගේ මහතා]

අවස්ථාවලදී තමන්ගේ විරුද්ධවාදීන් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කළේ සුදු වැන්වලින්. ත්‍රිපෝලිවල කැම්ප් එකක් තියාගෙන පරීක්ෂණ පැවැත්වූයේ එතැනයි. පරීක්ෂණවලින් පස්සේ පාවිච්චි කරපු වචනය තමයි, "මස් මාංස ඉවත් කිරීම" කියන වචනය. මස් මාංස ඉවත් කිරීම තමයි ඒ කාලයේ දීපු දඬුවම. මේ වන විට බනිජ තෙල් නීතිගත සංස්ථාවේ වර්ජනය අසාර්ථක ව්‍යායාමයක් බවට පත් වෙලා තිබෙනවා.

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ සුළු කල්ලියක් මේ වර්ජනය සඳහා මධ්‍යස්ථ සේවකයන් නොමඟ යවලා තමන්ගේ පටු පරමාර්ථ ඉෂ්ට කරගන්න උත්සාහ කළා. ඒ ගොල්ලන්ට ඕනෑ වුණේ මේ වර්ජනය හරහා රටට විවිධ ආර්ථික වශයෙන් බලපෑමක් කරලා තමන්ට අවශ්‍ය පරිදි රටේ පරිපාලනය වෙනස් කරන්නයි. නමුත්, රාජ්‍ය හමුදාවේ සැලසුම් ඉදිරියේ ඒ නිවට වර්ජකයන් දණ ගැස්සුවා. ඔවුන් බලාපොරොත්තු වුණේ ගමනාගමනය, විදුලිය සැපයීම, සෞඛ්‍ය සේවය ඇතුළු සේවාවන් අඩාල කරන්නයි. ඒ කටයුතු එකක්වත් ඒ ආකාරයට කරගන්න බැරි වුණා.

ඊළඟට, දිගින් දිගටම චෝදනා එල්ල වෙන්නේ ඒ අවස්ථාවේදී සේවකයන්ට පහරදීමක් වුණා කියලයි. විශේෂයෙන්ම කියන්න ඕනෑ, සාධාරණව ආණ්ඩුවක් පාලනය කරන කොට ඒ ආණ්ඩුවට විරුද්ධව කටයුතු කරන්න ගිහිල්ලා සාමාන්‍ය ජන ජීවිතය අඩාල වෙන කොට සාමාන්‍ය ජනතාවගෙන් යම් යම් විරෝධතා උද්ඝෝෂණයේ යෙදී සිටින අය වෙත එල්ල වෙන්න පුළුවන් බව. විශේෂයෙන්ම මෙවැනි උද්ඝෝෂණ නිසා කුලී රථ රියැදුරන්, ත්‍රීවිල් රියැදුරන්, සුළු වෙළෙඳ සැල්, හෝටල් ආදිය පවත්වා ගෙන යන උදවියගේ ව්‍යාපාර කටයුතු අඩාල වෙලා ඒවා පවත්වා ගෙන යන්න බැරි වෙනවා. එතකොට ඒ උදවිය කුපිත වෙලා එතැන ඇති වෙච්ච තත්ත්වයත් එක්ක පහරදීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ පහරදීම සිද්ධ වෙච්ච වෙලාවේදී ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු ඔවුන් හඳුන්වන්නේ "රජයේ මැරයන්" කියලයි. "ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු මැරයන්" කියලා බෝඩ් ගහන්න විතරක් ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු බොහෝම දක්ෂයි. රාජ්‍ය විරෝධී වර්ජකයන් ප්‍රමාණාත්මකව කුඩා වුණත්, මේ වන විට විශාල දේපොළ හානියක් මුතුරාජවෙල පර්යන්තයේ සිද්ධ වෙලා තිබෙනවා. මුතුරාජවෙල, "Automated Loading Arms" ක්‍රමයට ක්‍රියාත්මක වන පර්යන්තයත්, ඒකේ පරිගණක කොටස්වලටත්, panel boardsවලටත්, control panelsවලටත්, ලීටර් 33,000 බවුසර්වලටත්, ලීටර් 24,600 බවුසර්වලටත් හානි සිදු කර තිබෙනවා. 1979 අංක 61 දරන පනතේ 4වන වගන්තියට අනුව ඒ උදවියට ඉදිරි කාලයේදී දඬුවම් ලැබෙන බව හොඳට මතක තියාගන්න ඕනෑ.

ඒ දඬුවම් තුළ දඩ මුදල්, සිරගත කිරීම්, රැකියා අහිමිවීම්, වංචල සහ නිශ්චල දේපොළ රාජසන්තක කිරීම්වලට මුහුණ දෙන්න සිද්ධ වෙන බව මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. මෙවැනි අණ පනත් තිබියදී තමයි එක එක්කෙනාගේ උසිගැන්වීම්වලට ගිහිල්ලා මේ වර්ජනය සිදු කළේ. ඒවාට ඉදිරියේදී මුහුණ දෙන්න, ඒවා විඳ දරාගන්න ලෑස්ති වෙන්න කියලා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි. ඒ වාගේම ඊයේ දිනයේදී බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගින්නක් ඇති විය හැකි බව දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්වා. වර්ජන, දේපොළ හානි කිරීම් සහ ඉදිරියේදී තෙල් ටැංකිවලට ගිනි තැබීම පසු පස තිබෙන බළල් අත් කවුද කියලා ඊයේ පැහැදිලි වුණා. වැදගත් කියලා අපි විශ්වාස කරන දේශපාලන පවුලකින් එන පවුකාර දේශපාලනඥයෙක් මේ සභාව තුළ සිටීම සම්බන්ධයෙන් ඇත්තටම අපි කනගාටු වෙනවා. පසු ගිය කාලයේ මේ වාගේ දේවල් කළේ ප්‍රභාකරන්. එදා ප්‍රභාකරන් කරපු දේවල් අද ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු කරන්න උත්සාහ කරනවා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, මේ වාගේ උදවියට පාර්ලිමේන්තුවට එන්න ඡන්දය දීපු මිනිස්සුන්ටත් මේ පවුවලින් කොටසකට කර ගහන්න වෙනවා කියලා. ඒ නිසා ඉදිරියටත් මේ වාගේ පවුකාර දේශපාලනඥයෝ පාර්ලිමේන්තුවට එවන එක නවත්වන්න ඕනෑ කියන එක මේ රටේ ජනතාව දැන්වත් තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වර්ජන පවත්වමින් කොච්චර කඩාකප්පල්කාරී වැඩ කරන්න උත්සාහ කළත් ඊයේ හවස් වනකොට මුතුරාජවෙලින් දැව් තෙල් මෙට්‍රික් ටොන් 20,000ක් පොම්ප කරන්න හැකි වෙලා තිබෙනවා. ඒ වාගේම අද උදේ වනකොට මුතුරාජවෙලින් කිලෝ ලීටර් ලක්ෂ හතහමාරක් හා කොළොන්නාව තෙල් නිමාවෙන් කිලෝ ලීටර් ලක්ෂ දහහතක් සහිත ඉන්ධන නැවක් ත්‍රිකුණාමල වරායට යවා තිබෙනවා. බොහෝ විට එම ඉන්ධන හෙට සිට බෙදා හැරීමට කටයුතු කරන්න හැකියාව ලැබෙයි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකාබද්ධ විපක්ෂයට කඩේ ගිය එම වර්ජකයන්ට ඉදිරියේදී සිද්ධ වෙන්නේ මොකක්ද කියන එක පැහැදිලියි. අදාළ පරීක්ෂණ කටයුතු ඉවර වුණාට පස්සේ වර්ජනය කරපු උදවියට සිදු වන්නේ, ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල්වල හැළි වළන් හෝදන්නට සිදු වීමයි කියන එක ප්‍රකාශ කරමින් මම නවතිනවා.

[අ.භා. 3.52]

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු සභා ගර්භය තුළ කථා කිරීමේදී ඉතා පරිස්සමින් මෙන්ම, මන්ත්‍රී ධුරයේ අභිමානවත් බව රැකගෙන කථා කරන්න කියලා මම ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමාට අවවාදාත්මකව කියන්න කැමැතියි. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි,- [බාධා කිරීමක්]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මගේ නම සඳහන් කරමින් ප්‍රකාශයක් කළා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා ඊයේ-පෙරේදා හැසිරුණු ආකාරය අපි දැක්කා නේ. මට පරිස්සම් වෙන්න කියන්න ඉස්සෙල්ලා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එය point of Order එකක් නොවෙයි.

ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරන්න.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාට මම අවවාදයක් දුන්නේ. ඒකට point of Order එකක් මතු කරන්න අවශ්‍ය නැහැ. එතුමා තරුණ මන්ත්‍රීවරයෙක්. එතුමාට ඉදිරියට යන්න පුළුවන්. එම නිසා මම අවවාදයක් හැටියටයි එම ප්‍රකාශය කළේ. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය "වළ වළ" ගෑවට ඔබතුමාට ඉගෙන ගන්න තව හුඟක් දේවල් තිබෙනවා. කථා කරන්න ඉගෙන ගන්න කියන එකයි මට කියන්න තිබෙන්නේ. ඒක නිසා- [බාධා කිරීමක්] ඒ ගැන මම මීට වඩා කථා කරන්නේ නැහැ. මම හිතුවා, මහත්තයෙකුට අවවාදයක් දුන්නා කියලා. දැන් බලාගෙන යනකොට අවවාදය දීලා තිබෙන්නේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියලා මට තේරුණා. එම නිසා මා ඒ ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට ඊට වැඩි දෙයක් කියන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ කාලයේ පාට හා පක්ෂ කියන දෙක ගැන නොවෙයි, අපේ ප්‍රතිපත්ති අනුවයි කථා කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

නොගැළපෙන වචන ප්‍රකාශ වුණා නම්, ඒවා හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන ලෙස මම නියෝග කරනවා. ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා බාධා කරන්න එපා. ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උපදේශයක් දෙන්න ගිහින් සිදු වූ දේ ගැන මා කනගාටු වනවා. මීට වැඩිය මම ඒ ගැන කථා කරන්නේ නැහැ.

අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ අද ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් වූ විවාදයට සහභාගි වෙමින් ගරු මන්ත්‍රීවරු ඉතිහාසය ගැන කථා කළා, ඉතිහාසයේ සිදු වුණු දේවල් ගැන කථා කළා. ඒ වාගේම ඉතිහාසයට ඇඟිල්ල දික් කළා. නමුත්, වර්තමානයේ කොයි ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියන එක පිළිබඳවත් අපි අවබෝධ කරගෙන කථා කළ යුතු වනවා. රටේ ජනතාව මහජන නියෝජිතයෝ හැටියට අපව පාර්ලිමේන්තුවට පත් කර එවන්නේ ඔවුන්ගේ ශුභසිද්ධිය සහ ඔවුන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් අපි කටයුතු කරයි කියන බලාපොරොත්තුවෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වරාය ගැන කථා කරනකොට මා මුලින්ම මේ කාරණය කිව යුතුයි. මගේ ප්‍රති පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිවලට මම එකඟ නොවන නමුත්, එවකට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ හිටපු ලලිත් ඇතුලත්මුදලි ශ්‍රීමතාණන් ආයතන මට්ටමින් ගත්තාම 300 වන තැනට තිබුණු වරාය 28 වන තැනට ගෙනාවේ ඉතා ඕනෑකමින් සහ දේශ මාමකව, දේශ හිතෛෂීව මාතෘ භූමියට යම් දෙයක් කරන්න ඕනෑ කියලා හිතේ තබා ගෙනයි. නමුත්, මාතෘ භූමියට ඒ උදාරතර සේවය ඉටු කරන්න කටයුතු කළේ වෙන මොකක්වත් නිසා නොවෙයි, අපේ උරුමය සහ අපේ අයිතිය රැක ගන්න තිබෙන ඕනෑකම නිසාමයි. මෙන්න මේ ඕනෑකම නිසාම තමයි පසු ගිය කාල වකවානුවේදී අපට අවශ්‍ය වුණේ ලෝකයේ ප්‍රධාන පෙළේ ස්වාභාවික වරායක් වන අපේ ත්‍රිකුණාමල වරාය වාගේම, අපට තිබෙන දේපළ රැක ගන්න. අපේ සහානායක ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මගෙත් එක්ක එකඟ වනවා ඇති මේ කාරණයට. එදා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පැය 24න් ෂෙල් සමාගම අත්පත් කරගත් ආකාරය වාගේම, මාතෘ භූමියේ ධජය ඉහළට ඔසවා ගෙන අභිමානවත්ව ඒ ගමන ගියේ කොයි ආකාරයටද කියා අපට මතකයි.

අභිමානවත්කම රැකගෙන අපේ දේශයේ අවශ්‍යතාව ඉෂ්ට කිරීම සඳහා කටයුතු කිරීමේදී ඒ ව්‍යක්තිය අයිතිවාසිකම් වෙනුවෙන් ඒ කම්කරුවන් කථා කළේ, ඔවුන්ගේ පඩි වැඩි කරන්න කියලා නොවෙයි; ඔවුන්ගේ අතිකාල දීමනා වැඩි කරලා දෙන්න කියලා නොවෙයි. ඔවුන් ඉල්ලුවේ වෙන මොකක්වත් නොවෙයි, අනාගත පරපුර වෙනුවෙන් අපට, අපේ දරුවන්ට අහිමි වී යන දේ රැක දෙන්න කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය බර ගැන අපි කථා කළා. ණය ගෙවන්න ඕනෑය කියන එක ගැන කථා කළා. මේ ආකාරයෙන් මර්දනකාරී පිළිවෙතක් ක්‍රියාත්මක කරලා, ඒ අවශ්‍යතාව ඉෂ්ට කිරීමට කටයුතු කිරීම පිළිබඳව අපි කනගාටු වනවා.

ලංකා ඉතිහාසයේ කවදාවත් අපි ප්‍රතිඅපනයන ක්‍රියාවලියට දායක වෙලා තිබුණේ නැහැ. කොළඹ වරායේ එතරම් ඉඩක් තිබුණේ නැහැ. එම නිසා හම්බන්තොට වරාය ප්‍රතිඅපනයන ක්‍රියාවලිය සඳහා දායකත්වය ලබා දුන්නා. 2014 වර්ෂයේදී 1,60,382ක් වාහන ප්‍රතිඅපනයනය කරන්න අපට පුළුවන්කම ලැබුණා. 2015 වනකොට ඒ ප්‍රමාණය 1,17,000කට බැස්සා. 2016 වනකොට 72,000කට බැස්සා. මේ ආදායම් මාර්ගය උත්පාදනය කරගෙනයි ආවේ. වරායක් හදපු ගමන් ආදායම ඉහළට යන්න පුළුවන්කමක් නැහැ. ඒ පිළිබඳව අවබෝධ කරගෙන, ඒ කටයුතු ක්‍රියාත්මක කරගෙන, ගත්ත ණයත් ගෙවාගෙන යන්න සූදානම් වනකොට තමයි මේ ආයතනය පාඩු ලබන තැනක් බවට පරිවර්තනය කළේ. ඒ විතරක් නොවෙයි.

බංකර මඟින් තොග රැස්කර ගැනීමේදී ලැබූ ලාභය කොතෙක්ද කියා හොඳට ගණනය කරලා බලන්න. ඒ වාගේම වරායට පැමිණි නැව් සංඛ්‍යාව බලන විට, 2012 වනකොට නැව් 31කුත්, 2013 වනකොට නැව් 134කුත්, 2014 වනකොට නැව් 195කුත්, 2015 වනකොට නැව් 175කුත්, 2016 වනකොට නැව් 140කුත් පැමිණ තිබෙනවා. වරායට පැමිණි නැව් සංඛ්‍යාව වැඩිවෙමින් ගොස් ඉන් පසු අඩු වීමට ප්‍රධාන වග කිව යුත්තා කවුද කියලා ඒකෙන් අවබෝධ කර ගන්න කියන එක මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

පළමුවන අදියර, දෙවන අදියර හැටියට ගොඩ නහා මාතෘ භූමිය වෙනුවෙන්, අනාගතය වෙනුවෙන් තමයි ඒ අවස්ථාව සලසා දුන්නේ. ඒ සඳහා සේද මාවත -Silk Road එක- හරහා ක්‍රා ඇළ මාර්ගය කැපීමෙන් අපේ දේශයට මොන තරම් ආදායමක් උත්පාදනය කරන්න පුළුවන් ක්‍රමවේදයක් ඇතිවනවාද? ඒ ක්‍රමවේදය තුළින් අපේ දේශයේ අභිමානවත්කම වැඩිවනවා වාගේම අපේ ආර්ථිකයත් දියුණු තත්ත්වයට පත් වනවා. විදේශ රටවල් ගත්තොත්, සිංගප්පූරුව වැනි රටවල් මේ ක්‍රා ඇළ කැපීම සම්බන්ධයෙන් ඉතා විරුද්ධයි. සමහර විට ඇමෙරිකාවත්, ඉන්දියාවත්, චීනයත් අතර තිබෙන ඝට්ටනයන් තුළ ඒක තෝතැන්නක් හැටියට ගන්න සූදානම් කරලා තිබෙනවා. තෝතැන්නක් හැටියට සූදානම් කරලා තිබෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ඔවුන්ගේ base එකක් බවට පරිවර්තනය කරගන්නයි. මේ කාරණා දෙස අපි ඉතා සාවධානව බලා තීන්දුවක් ගන්න අවශ්‍ය කටයුත්ත කරන්න ඕනෑ. පෙට්‍රෝලියම් ආයතනයේ සේවකයන් ඉල්ලුවේ නැව්වලට තෙල් ගහන තැන අපට දෙන්න, ඒ වාගේම ත්‍රිකුණාමලය වරායේ ඒ

[ගරු සී.බී. රත්නායක මහතා]

අවශ්‍යතාව අපට ලබා දෙන්න කියලායි. ඒ භූමිය වල් වැදිලා තිබුණත්, ඒ භූමිය අරක්ෂා කරගෙන ඉදිරියට යන්න අපට පුළුවන්කම තිබෙනවා. කාටත් මේවා දෙන්න පුළුවන්. නමුත් ආපසු ගන්නේ කොහොමද කියන ප්‍රශ්නය අප තුළ තිබෙනවා. මේ විධියට අවුරුදු 99කට බද්දට දුන්නාම, අවුරුදු 99කින් පස්සේ ඒ ගැන සොයා බලන්න සිද්ධ වනවා. එතකොට මේ ගිවිසුම අත්සන් කරපු අයත් නැහැ, මේ කථා කරන අපිත් නැහැ, ඒ භූමිය ගත්ත උදවියත් නැහැ. ඒ තුළින් අනාගත පරපුරට මේ දේශය තුළ තිබෙන අයිතිය නැති වනවා. අවම වශයෙන් මෙපමණ ලාභයක් ලබාගෙන අපි ගෙනගිය ක්‍රියාවලිය ආපස්සට හරවන්නේ කොහොමද කියන එක ගැන අපට කථා කරන්න සිද්ධවෙලා තිබෙනවා. සමහර විට මේ මොහොතේ ගන්නා වූ තීන්දු කොයි ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් වනවාද කියන්න බැහැ. හැබැයි ඒ වරාය තුළින් අදායම් මාර්ගයක් ඇති කරන්න සූදානම් වනකොට, මේ භූමිය විකිණීම තුළින් ඒ අවස්ථාව අත හරිනවාද, මහ හරිනවාද කියන එක විශේෂයෙන් අහන්න ඕනෑ.

හෙට මේ ගිවිසුම් ගැන කථා කරන්න සූදානම් වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව මම අද කථා කරන්නේ නැහැ. අවශ්‍ය අවස්ථාවල මර්දනකාරී පිළිවෙත් අනුගමනය කරන්න ඕනෑ, සභානායකතුමනි. නමුත්, වහාම පරීක්ෂණයක් කරන්න. අපි යම් දෙයක් කළා නම් ඒක කියන්න පුළුවන් වෙන්න ඕනෑ. රටක නීතියක් තිබෙනවා, ඒ නීතිය ක්‍රියාත්මක කරන්න ආණ්ඩුව තිබෙනවා. ආණ්ඩුව ගත්තාම ඒ යටතේ පොලීසිය තිබෙනවා. පොලීසියත් එක්ක ඒ නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්. පොලීසිය විසින් ක්‍රියාත්මක කළ යුතු නීතිය වෙන මිනිසුන් අතට ගන්න දෙන්න එපා. අපි ජංගම දුරකථනයෙන් යවන එස්එම්එස් පණිවුඩයත් උසාවියකදී සාක්ෂියක් බවට පරිවර්තනය වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඒ විතරක් නොවෙයි, අපි ගන්නා වූ රූප රාමුත් සාක්ෂි බවට පරිවර්තනය කරලා තිබෙනවා. විශ්වවිද්‍යාලවලට යවලා නව තාක්ෂණයෙන් කටහඬ පරීක්ෂා කරලා සනාථ කරගන්න පුළුවන් ක්‍රියාවලියක් තිබෙන යුගයක, මැරයන් ඇවිල්ලා කම්කරුවන්ට ගහන හැටි අපි රූප රාමුවලින් දකිනවා. ඒ අපේ දේශයේ කම්කරුවන් නේද? ඔවුන්ට ගහනවාට අපි තදින් විරුද්ධයි. ඒකයි අපි පැහැදිලිව ප්‍රකාශ කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඒක කවුරු කළත්, මම කළත්, ඔබ කළත් ඒක කම්කරුවන්ට කරන මහා විත්තැහියක්. ඒ අපේ දේශයේ කම්කරුවන් නේද? ඒ නිසා මේ ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑ. ඒ පරීක්ෂණය කිරීමයි අපේ වගකීම කියන එක විශේෂයෙන්ම ප්‍රකාශ කරමින්, මට කථා කරන්න අවස්ථාව සලසා දීම පිළිබඳව මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

[අ.භා. 4.01]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත් වැදගත් යෝජනාවක් පිළිබඳව කථා කරන මේ වෙලාවේ එම විවාදයට එක්වෙන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා.

ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමනි, දැන්ම ගරු සභාවෙන් පිටව යන්න එපා. පොඩ්ඩක් අහගෙන ඉන්න. 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතගැන කථා කරන කොට ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා මෙතැන ඉඳගෙන දහලනවා; නළියනවා; එක එක දේවල් කරනවා මම පහළ ඉන්න කොට රූපවාහිනීයෙන් බලාගෙන සිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු සී.බී. රත්නායක හිටපු අමාත්‍යතුමාගේ කථාවට මම ඉතාමත් හොඳින් සවන් දුන්නා. එතුමා හොඳ දේශපාලනඥයෙක්. එතුමා උපදෙස් ලබාදුන්නා. ඒ වාගේම එතුමාගේ කථාවෙන් අපට දැනගන්න ලැබුණු කාරණා රාශියක් තිබෙනවා. අපි එතුමාගේ කථාවට ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මේක මතක තියාගන්න. මේ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ගෙනෙන යෝජනාව බලගැන්වීම සඳහා අද සාකච්ඡා කරන්න හේතුවක් වුණේ මොකක්ද? පසු ගිය අවුරුදු දෙකක්, දෙකහමාරක් තිස්සේ යහ පාලන ආණ්ඩුව නිවැරදි මහක ගිහිල්ලා, මිනිසුන් තළා පෙළන්නේ නැතුව මේ රටේ නියම සංවර්ධනයක් කරා යන්නට කටයුතු කරමිනුයි සිටියේ. නමුත් අපි මේ කටයුතු සියල්ල ඉවසාගෙන සිටියා. ගරු සභානායකතුමා සාක්ෂි දරනවා ඇති, මම පසු ගිය ආණ්ඩු පක්ෂ රැස්වීමේදී පැහැදිලිවම ඇහුවා, "ගරු අගමැතිතුමනි, මේ විධියට මේ රටේ නාඩගම් නටන්න, ඩෙහා නටන්න තව දුරටත් ඉඩ දෙනවාද, නැත්නම් මේවාට වහාම පිළියම් යොදන්න ඕනෑද?" කියලා. මේ යෝජනාව අරගෙන ඒ පිළිබඳ සංවාදයක යෙදෙන්න කටයුතු කිරීම ගැන ගරු අගමැතිතුමාටත්, අතිගරු ජනාධිපතිතුමාටත්, සභානායකතුමාටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අද කථා කරනවා, එතුමන්ලා ඉතාමත්ම අවංකව, ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කළා කියලා. ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා රටේ සම්පත් විකිණීම පිළිබඳව කථා කළා. මේ රටේ හදවත වගේ තිබුණු ආරක්ෂක මූලස්ථානය ෂැන්ග්‍රි-ලා හෝටලයට සින්නක්කරව විකුණන කොට ඒ ඇමතිවරුන් කොහේද හිටියේ කියන එක මම අහනවා.

ඒ විතරක් නොවෙයි, Port City එකට ඉඩම සින්නක්කරව දෙනකොට එදා හිටපු ඇමතිවරුන්ට කථා කරන්න බැරිවෙන්න කටේ පිටිටු තිබුණාද කියලා මම අහනවා. තමන්ගේ ජනාධිපතිවරයා කියා අද මහ ලොකුවට කථා කරන ඉතාමත්ම කෘතහස්ත ඒ දේශපාලනඥයාත් එක්ක දේශපාලන කටයුතු කරද්දී එතුමන්ලා කොහේද හිටියේ කියන එක මම අහනවා. අපේ සිංහල ජනප්‍රවාදවල කථාවක් තිබෙනවා, "කන්න ඕනෑ වුණාම කබරගොයාත් තලගොයා වෙනවලු" කියලා. කබරගොයා කන්න බැරි නිසා තලගොයා කියලා හිතාගෙන කන තත්ත්වයක් තිබුණා. ඒ වගේ දෙබිඩි ප්‍රතිපත්තියක් තමයි ඇති කරලා තිබුණේ.

මේ පනත් කෙටුම්පත ගෙනාවේ මොකටද? ආණ්ඩුවක් හැටියට මේ රටේ ජනතාවගේ එදිනෙදා කටයුතු ඉතාමත් හොඳින් පවත්වාගෙන යන්න අපට අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක විපක්ෂයට අවශ්‍ය නැති වුණාට, ඒ අයට තේරුම් ගන්න බැරි වුණාට අපට අවශ්‍යයි. විපක්ෂයේ කාර්ය භාරය මොකක්ද කියලා ඒ අය තවම දන්නේ නැහැ. ඒ අය තවමත් හිතාගෙන ඉන්නේ තමන් ඉන්නේ ආණ්ඩුව ඇතුළේ කියායි. ඔවුන් හිතාගෙන ඉන්නේ තවමත් මේ රටේ ජනාධිපති මහින්ද රාජපක්ෂ

කියායි. මෙන්න මෙතැන තමයි වැරදුණු තැන. මෙන්න මේක තමයි ඒ අයගේ තිබෙන අඩු පාඩුව. අවුරුදු දෙකක, දෙකහමාරක කාලයක් විපක්ෂය තුළ ඉවසාගෙන, විඳ දරාගෙන ඉන්න බැරි මේ මහජන නියෝජිත කණ්ඩායමට, මේ කල්ලියට අද අපට නියම පාඩම් උගන්වන්න සිද්ධ වෙනවා. තවම පටන් ගත්තා විතරයි. "හොඳ හොඳ සෙල්ලම් එළිවෙන ජාමෙට" කියලා කියන්න ඕනෑ. මේ පසු ගිය අවුරුදු දෙක තුළ ඔවුන් මේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා කප්පල් කරන්න කටයුතු කළා.

ඊයේ ඇති වූ තත්ත්වය දිහා බැලුවාම අපි ඒ බව දන්නවා. අපි දැක්කා, පෙරේදා හැන්දෑවේ ඉඳලා ඉන්ධන පිරවුම්හල්වල, තෙල් පිරවුම්හල්වල අභිංසක මිනිසුන් පෝලිම් ගැහිලා හිටිය අන්දම. මේ පෝලිම්වල හිටියා, ඩිමෝ බට්ටා රථයෙන් තමන්ගේ ව්‍යාපාර කටයුතු කරන මිනිසුන්; රජයේ රෝහලට හෝ පෞද්ගලික රෝහලට සැත්කමට යන්න බලාගෙන ඉන්න වෛද්‍යවරයා; තමන්ගේ කාර්යයට යන ඉංජිනේරුවා. එදිනෙදා මාළු විකුණන අභිංසක මිනිහත් මෝටර් සයිකලය තියා ගෙන මේ පෝලිමේ හිටියා. ඉතාමත්ම කුමන්ත්‍රණකාරීව, දැඩි ලෙස මේ වැඩ වර්ජනය කිරීම නිසා එදා වෙල හම්බ කරගෙන කන අභිංසක මිනිසුන් ලක්ෂ ගණනකගේ ජීවිතය විනාශ කරලා කටයුතු කරපු මේ අය කිසි ගුණයක් දන්නේ නැහැ කියලා මම හිතනවා. මන්ත්‍රීවරයෙක් හැටියට බලන්න ඕනෑ, තමන්ටත් පාර්ලිමේන්තුවට එන්න මේ ඉන්ධන ටික ඕනෑ වෙනවා නේද කියලා. කිසිම හේතුවක් නැතිව, කිසිම සාකච්ඡාවක් නැතිව තමන්ට ඕනෑ විධියට තමන්ගේ බූදලයක් විධියට මේවා තියා ගෙන, ඩීසල්, පෙට්‍රල් පුරවපු ලොරිවල ටයර්වල හුළං ඇරලා, අලාභ හානි කරලා ඇතුළු වෙන්න නොදී ගේට්ටු හිර කරගෙන ඉඳලා තිබෙනවා. අපි දන්නේ නැහැ, එතැන අවි-ආයුධ තිබුණාද කියලා. එවැනි ඉතාම කාලකණ්ණි ආශ්වාදයක් ලැබුවා. එමඟින් ඒකාබද්ධ විපක්ෂයත් මේ ආශ්වාදය ලබලා ලජ්ජා නැතිව ඇවිල්ලා අද ඒ අයව බේරා ගන්න යනවා. නියම විපක්ෂයක් නම් "මිනිසුන්ගේ මහජන අවශ්‍යතා කඩාකප්පල් කරන මෙවැනි අවස්ථාවක බොරදියේ මසුන් අල්ලන්න අපි ලැහැස්ති නැහැ" යි කියන එක කියමින් ඒ සඳහා පෙනී ඉන්න ඕනෑ. නමුත්, ඒක කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මෙතුමන්ලා ගරු සභාවෙන් එළියට යනවා. ගරු මන්ත්‍රීතුමනි, අද මේවා අහගන්න. තමුන්නාන්සේලා විතරක් කථා කරලා යෑම නොවෙයි විය යුත්තේ. ඇවිල්ලා අහගන්න. මේ වැඩ වර්ජන සාධාරණ ද කියලා හෘදය සාක්ෂියට අනුව හිතන්න.

ආණ්ඩුවක් හැටියට අපි අවශ්‍ය තීන්දු ගන්න ඕනෑ. 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ආහාරපාන ද්‍රව්‍ය සැපයීම, ආරක්ෂා කිරීම සහ බෙදා හැරීම, බනිජ තෙල් නිෂ්පාදන හා ගෑස් ඇතුළුව ඉන්ධන සැපයීම හෝ බෙදා හැරීම, විදුලිබලය සැපයීම, මගීන් හෝ බඩු ප්‍රවාහනය සඳහා වූ පොදු ගමනාගමන සේවා, ජලය සැපයීම, තැපැල්, දුරකථන, විදුලි පණිවිඩ සහ ගුවන් විදුලි සේවා වැනි දේවල් අත්‍යවශ්‍ය සේවාවන් හැටියට එම පනතේ උපලේඛනය යටතේ ඉදිරිපත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල තැපැල් සේවකයන් වැඩ වර්ජනය කළේ කුමක් සඳහාද කියලා අපි දන්නවා. තමන්ගේ වෘත්තීය අයිතිවාසිකම් සඳහාද? ඉන්ධන පිළිබඳ වැඩ වර්ජනය සිදු වුණේ කවුරු වෙනුවෙන්ද? එදා වැඩ වර්ජනය කළේ, ගාල්ල ප්‍රදේශයේ කඩා වැටෙන්න තිබුණු තැපැල් කාර්යාල ගොඩනැඟිල්ල කාටවත් දෙන්න එපා කියලායි. බනිජ තෙල් නීතිගත සංස්ථාවේ රැකියාවන් ගත්තාම, ඒ අය ලබන වැටුප් ප්‍රමාණයන් ගැන අපි දන්නවා. ඒ වාගේම රියැදුරෙකුගේ, ආරක්ෂක අංශයේ සේවකයෙකුගේ වැටුප රුපියල් ලක්ෂය ඉක්මවා යනවා. රුපියල් 20,000ට 30,000ට වඩා අඩු වැටුප් ගන්නා අභිංසක මිනිසුන්ගේ ජීවන වෘත්තිය කඩා විනාශ කරලා, තමන්ට ඕනෑ අවශ්‍යතාව මේ ආණ්ඩුව තුළින් ලබා ගැනීමට ඔවුන් කරන යම් කිසි කුමන්ත්‍රණකාරී වැඩවලට අපි මුහුණ දෙන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ දන්නවා, ඉතාමත් පැහැදිලි ලෙස අපි මේවා කථා කරනවා කියලා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ න්‍යාය දැන් රටක් හැටියට අපට පාවිච්චි කරන්න වෙනවා.

මට බොහෝ දෙනෙක් දුරකථනවලින් කථා කරලා කිව්වා, දැන් තමයි ආණ්ඩුවක් තිබෙන බව දැන ගත්තේ කියලා. "මෙන්න මෙහෙම එන්න. ඔන්න ඔහොම යමු" කියලා කිව්වා. මොකද, මේ රටේ ආණ්ඩුවක් තිබෙන බව අපි පෙන්වන්න ඕනෑ. ඉතාම වැදගත් දෙයක් අපි කියන්න ඕනෑ. එතුමන්ලා හම්බන්තොට වරාය හැදුවා; මත්තල ගුවන් තොටුපොළ හැදුවා කියමින් ඒවායේ වැඩ කටයුතු පිළිබඳව කිව්වා. මට මතකයි, මත්තල ගුවන් තොටුපොළට අපේ පාර්ලිමේන්තු විපක්ෂයේ මන්ත්‍රීවරු කණ්ඩායමක් ගිය වෙලාවේ, එහි සිටි නගරාධිපතිවරයා පිස්තෝල අරගෙන ඇවිල්ලා ගල් පහරවල් ගහලා, පොලු අරගෙන ගිය ඒවා පුවත් පත්වල තිබුණා. මේවා බලපු මේ මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් අද කථා කරන්නේ රෙදි ඇඳ ගෙන ද කියලා මම අහන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි, අපි එදා ගරු අග්‍රාමාත්‍යතුමාගේ නායකත්වයෙන් හම්බන්තොට වරායේ ප්‍රදේශ සංවර්ධන පිළිබඳ ව්‍යාපෘතියට මුල් ගල තියන්න ගියා. මමත් ගියා, අපේ මිනිසුන් අරගෙන. හැබැයි මොකක්ද කළේ? නාමල් රාජපක්ෂගේ, මහින්ද රාජපක්ෂගේ ඔය කියන සියලු කණ්ඩායම් ඇවිල්ලා ගල් ගහලා, පොලු මුගුරුවලින් ගහලා විනාශයක් කරලා, යුද්ධයක තත්ත්වයකට පත් කළා. පාරවල්වල තිබුණු ගල්, පොලු මුගුරු ඒ සියල්ල අපි දැක්කා. ඒ, රටේ අගමැතිවරයා එන උත්සවයක්; රටේ නිල වශයෙන් තිබුණු උත්සවයක්. ඒකට බාධා පමුණුවන්නට, ඒකට ආපු අභිංසක මිනිසුන්ට පහර දෙන්න, ලේ වගුරුවන්න, මිනී මරන තත්ත්වයකට පත් කරන්න එදා කටයුතු කරද්දී, අද ලජ්ජා නැතිව මේ ගරු සභාවේ කථා කරන්නේ කොහොමද කියලා මම ඒ මැති-ඇමතිවරුන්ගෙන් අහන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදයට කණ කොකා හඬපු යුගයන් පිළිබඳ කථා කරනකොට අපට ඕනෑ තරම් සාක්ෂි තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම තවදුරටත් කියා සිටින්නේ, පසු ගිය අවුරුදු දෙකහමාර තුළ අපි මේ රට පාලනය කළේ ඉතාමත් සාධාරණව, යුක්ති සහගතව සහ අභිංසක විධියට බවයි.

එක මිනිහෙක් අතුරුදහන් කළේ නැහැ. රයන් සහෝදරයාගේ සිද්ධිය ගැන කිව්වා. ඒක මහ දවල් වුණේ. මහ දවල් පැහැරගෙන යන්නේ කොහොමද? දෙනෝදාහක් බලාගෙන ඉන්දෙද්දී පැහැරගන්න ගියා කිව්වාම, හිනා යනවා. දෙනෝදාහක් බලාගෙන ඉන්දෙද්දී පැහැරගන්න ගියා නොවෙයි. ඉතාම පැහැදිලිව අපි දන්නවා, වරෙන්තුවකින් අත් අඩංගුවට ගන්න එන්නේ කියලා. එහෙම පැහැරගෙන යන්න නම් රෑ දොළහට-එකට යන්න ඕනෑ. නමුත් එහෙම නොවෙයි, අපි කටයුතු කළේ. අපි මේ රටේ එක මිනිහෙක් අතුරුදහන් කරලා නැහැ; දේශපාලනික වශයෙන් එක මිනිහෙක් මරලා නැහැ; එක ශිෂ්‍යයෙක් ඝාතනය කරලා නැහැ. සියල්ල කරලා තිබෙන්නේ සාධාරණ සහ යුක්ති සහගත ලෙස,

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ප්‍රජාතන්ත්‍රවාදීවයි. චතුර ප්‍රහාරයක් එල්ල කරලා, එක්කෝ කඳුළු ගෑස් ප්‍රහාරයක් එල්ල කරලා අලාභ සිදු වීම නවත්වන්න කටයුතු කිරීම පමණයි අපි කළේ.

අවසාන වශයෙන් මා ඉතාම පැහැදිලිව කියනවා, මෙවැනි අණපනත් තුළින් අපි ප්‍රයෝජන ගන්න ඕනෑ කියලා. ඉදිරියේදී මේ රටේ ජේ.ආර්. නියරිය ක්‍රියාත්මක කරන්න ඕනෑ, කඩාකප්පල්කාරීන් එළවන්න. ඒ සඳහා කටයුතු කරන්න කියලා අපි අත් දෙකම ඔසවලා රජයට කියනවා. නිවැරදිව තීන්දු ගන්න, අපි ඔබතුමන්ලා සමඟ ඉන්නවා කියන එක ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත් අප ප්‍රකාශ කරනවා. මේ යෝජනාව සම්මත වීමෙන් පසුව ඒ තුළින් ගන්න පුළුවන් ඉහළම ක්‍රියා මාර්ග අරගෙන මේ රටේ ජනතාවගේ එදිනෙදා කටයුතු පවත්වා ගෙන යන්න හැකියාවක් ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මාගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 4.11]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 08වන දා අපේ නව රජය බලයට පත් වෙද්දී ජනතාව වෙනුවෙන් අපි කරපු ප්‍රකාශවල විශාල වශයෙන් තිබුණා, ලංකාවේ ජනතාවට නැවතත් ප්‍රජාතන්ත්‍රවාදය බුක්ති විඳින්න අවස්ථාව සලසනවාය කියන කාරණය. ප්‍රජාතන්ත්‍රවාදය නැවතත් බුක්ති විඳින්න අවස්ථාව සලසනවාය කියන කාරණයට අපේ ආණ්ඩුව ප්‍රමුඛත්වය ලබා දීලා තිබෙනවා. එය ප්‍රමුඛතා ලේඛනයේ ඉහළින්ම තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය බුක්ති විඳින්න අවස්ථාව ලබා දෙන්න අපි පසු ගිය අවුරුදු දෙකක කාලය තුළ කටයුතු කර තිබෙනවා. විශේෂයෙන්ම 2015 අගෝස්තු 17වන දා මේ යහපාලන රජය බලයට පත්වීමත් එක්ක, මේ ලබාගත් නිදහසත් එක්ක, අවුරුදු 10ක්-15ක් තිස්සේ තිබුණු ප්‍රශ්න ගැන අදහස් ප්‍රකාශ කරන්න ජනතාව පාරට බැස්ස බව අප දැක්කා. ප්‍රශ්න තිබුණේ අවුරුදු 10ක්-15ක් තිස්සේ; අවුරුදු 10කට-15කට කලින්. නමුත් පසුගිය ආණ්ඩුවෙන් ජනතාවට ඒ නිදහස දුන්නේ නැහැ; ජනතාවට ඒ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ලැබුණේ නැහැ. ඒවා හිර කරගෙන, මිරිකාගෙන ඉඳලා තමයි ජනතාව 2015 ජනවාරි 08වන දාත්, අගෝස්තු 17වන දාත් අපට මේ ජයග්‍රහණ ලබා දුන්නේ.

මේ නිදහස වල් බූරු නිදහසක් බවට පත් වෙන්නත් ගියා. මේ නිදහස වල් බූරු නිදහසක් බවට පත් වෙන්න ගියා පමණක් නොවෙයි, පිටු පස්සෙන් ඉඳගෙන කණ්ඩායමක් මෙහෙයවලා, රජය අපහසුතාවට පත් කරලා, රටේ ආර්ථිකය විනාශ කරලා, රට බංකොලොත් කිරීම දේශපාලන අරමුණ කරගත් පිරිසකුත් හිටියා. ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න අයගේ -ඒ කණ්ඩායමේ- වැරදි ටික වහ ගන්න, ඒ නඩු ටික අවසන් කර ගන්න තිබෙන එකම ක්‍රමවේදය තමයි ආණ්ඩුව පෙරළන එක. මේ ආණ්ඩුව පෙරළන්න ජනතාව උසි ගන්වන්න, ජනතාව පාරට බස්සවන්න, රටේ අස්ථාවරභාවයක් ඇති කරන්න මේ කණ්ඩායම ඉදිරියෙන්ම ඉන්නවා. මේ අතර සාධාරණ ඉල්ලීම් තිබෙනවා; අසාධාරණ ඉල්ලීම් තිබෙනවා. ඒ අතරින් දැන් අපි දකින්නේ, සාධාරණ ඉල්ලීම්වලට වඩා අසාධාරණ ඉල්ලීම් ගණනාවක් තිබෙන බවයි. දේශපාලන අරමුණු උදෙසා සටන් කරන කණ්ඩායමක් දැන් පාරට බස්සවලා තිබෙනවා. ඒ වාගේ අවස්ථාවක් තමයි පසුගිය දින දෙක තුළත් අපට දකින්න ලැබුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මේ කණ්ඩායම මේ පාර්ලිමේන්තුවේදී කරන මේ සෙල්ලම ගැන. මේ කටයුත්ත පාර්ලිමේන්තුවෙන් තමයි පටන් ගත්තේ. පාර්ලිමේන්තුවෙන් තමයි මේ අස්ථාවරභාවය ඇති කරන්න පටන් ගත්තේ; ඒ සඳහා කටයුතු කළේ.

මම කියන්න සතුටුයි, කථානායකතුමා ඒ අවශ්‍ය තීන්දු-තීරණ අරගත්ත බව. අවශ්‍ය තීන්දු-තීරණ අරගෙන පාර්ලිමේන්තුව ස්ථාවර කළා. සමහර අය අපෙන් අහනවා, මේ ආණ්ඩුව තදින් තීන්දු-තීරණ අරගෙන ආණ්ඩුවක් විධියට කටයුතු කරන්නේ නැත්තේ ඇයි කියලා.

මේ බනිජ තෙල් සම්පත නැතුව අපට රටක් ඉදිරියට ගෙන යන්න බැහැ. බනිජ තෙල් සම්පත ගැන කථා කරන කොට, මේ අය ඊයේ පාරට බැස්සේ මොනවාටද කියාත් විමසා බලමු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැහෙනහිර තිබෙන තෙල් ටැංකිවල පින්තූර ටික තමයි මේ මගේ ළඟ තිබෙන්නේ. නැහෙනහිර තිබෙන තෙල් ටැංකි ටික, තව ටික කාලයක් යන කොට, අපට සංචාරකයන් එක්ක ගෙන ගිහින් නටබුන් හැටියට ඔවුන්ට පෙන්වන්න පුළුවන්. අපට නටබුන් හැටියට ඒවා බලන්න පුළුවන්. අවුරුදු සියයකට ආසන්න කාලයක් නටබුන් බවට පත් වුණු එම තෙල් ටැංකි දැන් සංවර්ධනය කරන්න යන කොට, කරන්නේ මොකක්ද? ජනතාව උසි ගන්වනවා. දේශපාලන තීන්දු-තීරණ ගන්න පුළුවන් වෙන්නේ මේ පාර්ලිමේන්තුවට; එහෙම නැත්නම් කැබිනට් මණ්ඩලයට. Trade unionsවලට මේ දේශපාලන තීන්දු-තීරණ ගන්න බැහැ. මේ trade unions පිටුපස ඉඳගෙන ඒකාබද්ධ විපක්ෂය තමයි දේශපාලන කටයුත්තක්, අරමුණක් කරා ඒ අයව මෙහෙයවන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මට මතක් වෙනවා, අපත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ සාධාරණ ඉල්ලීම් කළ ආකාරය. ඔබතුමා ඒ ගැන දන්නවා. ඔබතුමා ඉන්නේත් ගම්පහ දිස්ත්‍රික්කයේ. සාධාරණ, අභිංසක ඉල්ලීමක් වෙනුවෙන් ජනතාව එදා එළියට බැස්සා. ඒ, මොකටද? රතුපස්වල ජනතාව වතුර ටිකක් ඉල්ලා තමයි එසේ එළියට බැස්සේ. රතුපස්වල ජනතාව වතුර ටිකක් ඉල්ලා එළියට බහින කොට, මේ අය එදා මොන විධියටද ඒ ජනතාවට සැලකුවේ? ඒ සිද්ධියේදී ජීවිත කීයක් විනාශ වුණාද? කී දෙනෙකුට තුවාල වුණාද? ඒ ආකාරයට තමයි පසු ගිය කාලයේ ජනතාව මර්දනය කළේ. අපිට මතකයි, කටුනායක වුණු සිද්ධිය.

අපට මතකයි, මීගමුවේ වුණු සිද්ධිය. අපට මතකයි රතුපස්වල වුණු සිද්ධිය. දැන් මේ ඒකාබද්ධ විපක්ෂයේ ඉන්නා අය තමයි එදා ආණ්ඩු කළේ. එසේ ආණ්ඩු කරපු අය අද විපක්ෂයේ ඉඳගෙන මේ අසාධාරණ ඉල්ලීම්වලට ජනතාව මෙහෙයවනවා. රජය මැදිහත් වෙලා බහුතර ජනතාවට සහනයක් ලබා දෙන කොට, මේ අය මේ ජනතාව වෙනුවෙන් කථා කරන්නේ රෙදි ඇඳගෙනද කියන එක මට හිතෙනවා.

ඊයේ සිදුවුණු හොඳම ජවනිකාව තමයි, ඒ සිද්ධියට නායකත්වය දුන් අය වෙනුවෙන් මේ අය වැලිකඩ පොලීසියට ගිය ආකාරය. කවුරු හරි බන්ධනාගාරගත වුණාම, සමහර වේලාවට ඥාති හිතවතුන් කැම පාර්සලයක් එහෙම අරගෙන බන්ධනාගාරයට යනවා තම ඥාතියා බලන්න. ඒ විධියට තමයි මේ අය වැලිකඩ පොලීසියට ගියේත්. ඒ මොකද? හිතවත්කම හින්දා. අන්න, ඒ අය තමයි ඊයේ වුණු සිද්ධියට නායකත්වය දුන්නේ. එසේ නායකත්වය දුන් කට්ටිය බලන්න මේ අය පොලීසියට ගියා කියන එක ඉතා පැහැදිලියි. ඒ අවස්ථාවේදී පොලීසියේදී සිදු වුණු සිදුවීම් අපි දැක්කා. මේ අය විපක්ෂයේ ඉඳගෙන වැලිකඩ පොලීසියේ ස්ථානාධිපතිතුමාට ඒ විධියට බලපෑම් කළා නම්, මේ අය ආණ්ඩුවේ හිටියා නම් කොහොම වෙයිද? එහෙම වුණා නම් පොලීසියේ OICගේ ඇඳුම් පවා නැහැ; එහෙම නැත්නම්

පොලීසියේ OICගේ කණට එකක් ගහලා එළියට දමලා. එහෙම නැත්නම් අද වෙනකොට එතුමා යාපනයේ පොලීසියක මොකක් හරි මේසයක් ළඟ ඉන්න තිබුණා. මේ අය විපක්ෂයේ ඉඳගෙන පොලීසියට තර්ජනය කරන ආකාරය අපි දැක්කා. ඔන්න ඔය දේම තමයි පසු ගිය කාලයේත් පොලීසියට වුණේ. පොලීසිය දේශපාලනීකරණය වුණා. පොලීසියේ පොලිස් ස්ථානාධිපතිතුමාට එදා ආණ්ඩු පක්ෂයේ සංවිධායකවරයා කියන විධියටයි, කටයුතු කරන්න වුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
අද දින මේ සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ ජනතාව වෙනුවෙන් ගත්ත තීන්දුවක්. අද දින අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ ඉදිරිපත් කර තිබෙන මෙම යෝජනාව බහුතර ජනතාව වෙනුවෙන් ගත්ත තීන්දුවක්. අපි අත් දෙකම ඔසවා එය අනුමත කරනවා. ඒ වාගේම ජනතාවත් රජය එක්ක එකට මෙම යෝජනාව අනුමත කරනවා කියන එක ඉතා පැහැදිලිව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 4.20]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் அத்தியாவசிய சேவைகள் பற்றிய கருப்பொருள் கருத்தாடலுக்கு உட்படுத்தப்பட்டிருக்கின்றது. அந்தவகையில், போக்குவரத்துச் சேவையாக இருக்கலாம், எரிபொருள் வழங்குகின்ற, அதாவது பெற்றோலியப் பொருட்களுடன் சம்பந்தப்பட்ட சேவையாக இருக்கலாம், மின் வழங்கல் சேவையாக இருக்கலாம் அல்லது மருத்துவ சேவையாக இருக்கலாம் இப்படிப்பட்ட சேவைகளை நாங்கள் அத்தியாவசிய சேவைகள் என்ற வகுதிக்குள் அடக்கிவைத்திருக் கின்றோம். இந்த அத்தியாவசிய சேவைகளை வழங்குகின்ற விடயத்தில் மக்கள் பாதிக்கப்படாமல் பார்த்துக்கொள்ள வேண்டியது முக்கியமான விடயமாகும். அரசோடு மோதுகின்ற விடயங்களில், உரிமைக்காக மோதுகின்ற விடயமென்று ஒன்றிருக்கின்றது; சில இலாபங்களுக்காக மோதுகின்ற விடயமென்றும் ஒன்றிருக்கின்றது. உண்மையில் தொழிலா ளர்கள் தமது உரிமைகளுக்காக அல்லது எதிர்கால நேர்கணிய நோக்கோடு அரசோடு மோதுகின்ற விடயம் என்பது ஒருபுறமிருக்க, சிலர் ஆட்சி அதிகாரத்தைக் கைப்பற்ற வேண்டும் என்கின்ற பின்னணியில் தொழிலாளர்களை ஒன்றிணைத்து மோதல்களை உருவாக்குதென்பது ஏற்றுக் கொள்ள முடியாததாகும்.

நாட்டில் பொருளாதார முக்கியத்துவம் வாய்ந்த துறைமுகங்களை அமைப்பதாக இருந்தாலென்ன, விமான நிலையங்களை அமைப்பதாக இருந்தாலென்ன அல்லது சந்தைகளை அமைப்பதாக இருந்தாலென்ன, காய்தல் உவத்தல் இல்லாமல் எதிர்கால அபிவிருத்தியை நோக்காகக் கொண்டு பொருத்தமான இடங்களில் அவற்றை அமைக்க வேண்டும். அவை அவ்வாறு அமைக்கப்படுமாக இருந்தால், ஆட்சிகள் மாறினாலும் காட்சிகள் மாறினாலும் அவற்றை எல்லோரும் ஏற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும். மாறாக, மாவட்டத்தை மையமாகக்கொண்டு, தொகுதியை மையமாகக்கொண்டு, ஊரை மையமாகக்கொண்டு, சுயநல அரசியலுக்காக பொருளாதார கேந்திர முக்கியத்துவம் வாய்ந்த நிலையங்களை அமைத்தால், ஆட்சி மாறுகின்றபோது அது கேள்விக்குரிய, விமர்சனத்திற்குரிய ஒரு விடயமாக அமைந்துவிடுகின்றது.

මට ඔක්කොම කියන්න වෙනවා, ගරු කථානායකතුමනි. ඒ නිසා මට ටිකක් වෙලාව දෙන්න. අදවත් මේ ප්‍රශ්නය අවසන් කර දමන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වෙලාව නැහැ. අද ප්‍රශ්නයට පිළිතුරු දෙන්න, ගරු ඇමතිතුමනි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

පළමුවැනි කොටසට පිළිතුර ඉදිරිපත් කරලා මම පොඩි විග්‍රහයක් කරන්නම්, ගරු කථානායකතුමනි. මේ ගැන පස් වතාවක් දැනට අහලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එහෙම නම් කෙටි විග්‍රහයක් කරන්න.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කහල්ල පල්ලේකැලේ සහ හක්වටුන ජලාශය පදනම් කරගනිමින් සංචාරක කලාපයක් නිර්මාණය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කිසිදු සැලැස්මක් මෙතෙක් ඉදිරිපත් කර නැත. නමුත්, ඉදිරියේදී කහල්ල පල්ලේකැලේ අභයභූමිය ජාතික උද්‍යානයක් ලෙසට සකස් කර අවට ජනතාවට ප්‍රතිලාභ ලැබෙන ලෙස සංචාරක කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ. එම වැඩ පිළිවෙළ සකස් කර මා විසින්ම එතැනට ගිහින් ඒ කටයුතු කරනු ලැබුවා, ගරු කථානායකතුමනි. ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

(ii) මෙතෙක් සැලැස්මක් සකසා නොමැත.

(iii) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී සැලසුමක් ඉදිරිපත් කර නොමැත. කෙසේ වුවද, වයඹ ව්‍යාපෘතිය යටතේ රක්ෂිතය තුළ දැනට පවතින මාර්ග පුනරුත්ථාපනය කිරීමට නියමිත අතර, එම ව්‍යාපෘතිය යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය කාර්යාල ඉදි කිරීමට නියමිතය.

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

මේ සඳහා මහවැලි හා පාරිසරික අමාත්‍යාංශය සම්බන්ධ වනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධ වනවා. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වනවා. මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වනවා. මේක ඒ සියලු ආයතන ඒකාබද්ධව කරන කටයුත්තක්. මේකට එන්නේ මහවැලි වතුර.

(iv) වයඹ ඇළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම සඳහා පවතින මාර්ග ප්‍රතිසංස්කරණය කරන අතර, රක්ෂිතයේ ආරක්ෂාවට යොදවා ඇති නිලධාරීන් සඳහා දැනට වනජීවී කාර්යාල පවතින ස්ථානවල කාර්යාල ඉදිකර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

(ආ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් එවැනි ක්‍රියාකාරකම් කිසිවක් ආරම්භ කර නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, පැහැදිලි කිරීමට පෙර අතුරු ප්‍රශ්න අහන්න ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව දෙමුද? ඔබතුමාට තව කාරණා කියන්න තිබෙනවාද?

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි, වැදගත් කාරණයක් ගරු සභාවට කියන්න අවස්ථාව දෙන්න. ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ ජාතික සංවිධායක නාමල් කරුණාරත්න මහතා නිකවැරටියේ එස්.පී. මහත්මයාට ලිපියක් යවා තිබෙනවා. ඊට පස්සේ, එස්.පී. මහත්මයා ඊට පිළිතුරු ලිපියක් යොමු කරලා තිබෙනවා. ඒ ලිපිය අනුව මෙම ව්‍යාපෘතිය අයිති වන්නේ ජනාධිපතිතුමාට අයිති අමාත්‍යාංශයක් වන මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයටත්, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයටත්, මගේ අමාත්‍යාංශයටත් බවයි සඳහන් කර තිබෙන්නේ. ගරු කථානායකතුමනි, එම විස්තර ඇතුළත් ලේඛන සියල්ල මම ***table**** කරනවා. ගරු කථානායකතුමනි, මේ ව්‍යාපෘතිය හරහා ප්‍රතිලාභ ලබන මුළු පවුල් සංඛ්‍යාව 13,500ක්. මා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කය ඉතාම ශුෂ්ක ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ පවුල් 13,500ට අයත් 40,000කට, 50,000කට ආසන්න ජනතාවකට මෙම ව්‍යාපෘතිය හරහා ප්‍රතිඵල ලැබෙනවා. ගරු කථානායකතුමනි, ඒ ලේඛනයත් මම **සභාගත*** කරනවා. ඒ මුළු ව්‍යාපෘතියේම තොරතුරු මම **සභාගත*** කරනවා. මේ ව්‍යාපෘතිය නිසා පවුල් 13ට පමණයි ප්‍රශ්නයක් ඇති වන්නේ. ඒ පවුල් 13ට අයත් ඉඩම්, ගෙවල්, ගහ කොළ, -දෙල් ගසේ සිට සෑම ගසකටම- වන්දි ගෙවන්න ක්‍රියා කරන බව මම සහතික කොට ප්‍රකාශ කරනවා. මම මේ ගැන 5වැනි වතාවටයි ගරු සභාවේදී කියන්නේ. මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයත්, වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයත්, මගේ අමාත්‍යාංශයත් ඒ වන්දි ගෙවීම් පිළිබඳව සොයා බලනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් අතුරු ප්‍රශ්න අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා හැමතිස්සේම වයඹ ඇළක් පටලවාගෙන කථා කරනවා. මට වයඹ ඇළත් එක්ක ප්‍රශ්නයක් නැහැ. "කොහේද යන්නේ, මල්ලේ පොල්" වැනි උත්තර තමයි එතුමා දෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සහ ගරු ඇමතිතුමා මුහුණට මුහුණ හමු වෙලා මේ ප්‍රශ්නය සාකච්ඡා කළොත් ලේසි නැද්ද? එහෙම වුණොත් හුහක් දුරට මේ ප්‍රශ්නය අවසන් වෙයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමාට තේරෙනවා ඇති ඔබතුමා ඉදිරියේදී,- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, නිසි ගෞරවය ඇතිවයි - with all due respect to you - මම ඔබතුමාට කථා කරන්නේ.

ගරු කථානායකතුමනි, ඔබතුමා ඉදිරියේදී සහ සජීවී විකාශය තුළදී ගරු ඇමතිතුමා මුහුණට මුහුණ කටයුතු කරන විධිය අනුව ඔබතුමාට තේරුම් ගන්න පුළුවන්, මේ සභාවෙන් පිටත මුහුණට මුහුණ හමුවෙලා සාකච්ඡා කළොත් මොන වගේ තත්ත්වයක් ඇති වෙයිද කියලා.

ගරු ඇමතිතුමනි, ඒ සැලැසුම හදලා නැහැ කියලා ඔබතුමා ප්‍රකාශ කළා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න කෙටියෙන් අහන්න. ගරු ඇමතිතුමනි, කෙටි උත්තරයක් දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, සැලැසුම හදලා නැති නිසා මට අතුරු ප්‍රශ්න නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන සැලසුම හදනවා නම් ජනතාවත් එක්ක කථා කරලා ඒ සැලසුම හදන්න කියන ඉල්ලීම තමයි මට කරන්න තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු කථානායකතුමනි,-

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි,ගරු ඇමතිතුමනි. ගරු මන්ත්‍රීතුමා ඉල්ලීම කළා නේ.

විදුලිය ලබා දී ඇති නිවාස : වවුනියාව දිස්ත්‍රික්කය
மின்சாரம் வழங்கப்பட்ட வீடுகள்: வவுனியா மாவட்டம்
HOUSES PROVIDED WITH ELECTRICITY: VAVUNIYA DISTRICT

1194/'16

5. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 1983 වර්ෂය වන විට වවුනියාව දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂ දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் வவுனியா மாவட்டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை யாதென் பதையும்;

(iii) 1984 முதல் 2009ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வள வென்பதையும்;

(iv) 2009ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப் பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) the number of houses in the Vavuniya District that had been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) the total number of houses which have been provided with electricity supply by now;

(iii) the amounts allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) the number of houses that have been provided with electricity supply up to year 2015 after the end of war situation in year 2009 on per year basis; and

(v) the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා. ගරු මන්ත්‍රීතුමනි, දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. පිළිතුර සභාගත කළාට කමක් නැද්ද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීමේ- [බාධා කිරීමක්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, පිළිතුර සභාගත කරන්නම්. ගරු ඇමතිතුමා ඉන්න වෙලාවක අතුරු ප්‍රශ්න අහමුද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අතුරු ප්‍රශ්නවලට ඔබතුමාට උත්තර දෙන්නත් බැහැ නේද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔව්. පිළිතුරත් දීර්ඝයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර සභාගත කරලා, ගරු ඇමතිතුමා ඉන්න වෙලාවක අතුරු ප්‍රශ්න අහන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම කරමු. එය වඩාත් හොඳ වෙයි. දීර්ඝ පිළිතුරක් තිබෙන්නේත්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා පිළිතුර සභාගත කරන්න. මට තිබෙන අතුරු ප්‍රශ්නය මෙකයි. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට අදාළව පුවත් පතක පළ වී තිබෙනවා, "ගෑස් බලාගාර ටෙන්ඩරය යට අණ්ඩරයක්" කියලා. ඇත්තටම මට ඒකයි අද අහන්න තිබුණු අතුරු ප්‍රශ්නය.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, මම පිළිතුර **සභාගත*** කරන්නම්. මෙතැන හුහක්ම තිබෙන්නේ සංඛ්‍යාලේඛන.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(ඇ) (i) කිසිවක් නැත. බෙදාහැරීම් සිදු කරනු ලැබුවේ පළාත් පාලන ආයතනයෙනි.

(ii) 2017 මැයි 31 දිනට විදුලි සම්බන්ධතා 53160 ක් සපයා ඇත.

2015 වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරිවරුන් මඟින් සිදුකරන ලද සංගණනය අනුව විදුලිය දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබාගෙන නොමැති නිවාස ඒකක ගණන 4,217 ක් බව වාර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනාගැනීම් කිරීමට අවශ්‍ය මූල්‍ය පිරිවැය දැරීමට නිවැසියන් නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළිසයි අඳුර දුරලයි - ජාතික විදුලි සත්කාරය" නමැති යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් යළහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනාගැනීම් කිරීමට රු. 45,000 ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක විය.

2016 වර්ෂය අවසන් වන විට විදුලිය සේවාව ලබා දී ඇත.

(iii) 1984 වර්ෂයේ සිට 2009 දක්වා විදුලිය සේවාව දිස්ත්‍රික්කයේ විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල් පහත සඳහන් වේ.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු. මිලියන)
1984	-
1985	-
1986	-
1987	-
1988	-
1989	0.54
1990	0.13
1991	2.32
1992	35.21
1993	-
1994	14.69
1995	-
1996	-
1997	-
1998	30.53
1999	-
2000	-
2001	-
2002	51.91
2003	31.56
2004	13.76
2005	28.71
2006	46.81
2007	34.34
2008	20.24
2009	479.29

(iv) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් ලබාදුන් නිවාස සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	අදාළ වර්ෂය තුළ දී ලබාදුන් නව සබඳතා සංඛ්‍යාව	වර්ෂය අවසානය වනවිට විදුලිය පරිභෝජනය කරනු ලබන සමස්ත නිවාස සංඛ්‍යාව
2009.01.01 - 2009.12.31	301	13,704
2010.01.01 - 2010.12.31	946	14,650
2011.01.01 - 2011.12.31	5,250	19,900
2012.01.01 - 2012.12.31	5,574	25,474
2013.01.01 - 2013.12.31	12,623	38,097
2014.01.01 - 2014.12.31	4,852	42,949
2015.01.01 - 2015.12.31	3,845	46,794

(v) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල් පහත පරිදි වේ.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු. මිලියන)
2009	317
2010	125
2011	103
2012	23
2013	77
2014	193
2015	89

(ඈ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා අතුරු ප්‍රශ්නය විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති ඇමතිතුමාට යොමු කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ ප්‍රශ්නය අපි ඇමතිතුමාට යොමු කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට පිටපතක් එවන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 - 1383/'16-(2), ගරු බන්දුල ගුණවර්ධන මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ඇමති සඳ පැමිණ නැත.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඇමති සඳ සති දෙකක් කල් ඉල්ලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති ක්‍රීඩා පාසල්: විස්තර
புத்தளம் மாவட்ட விளையாட்டுத்துறைப் பாடசாலைகள்: விபரம்
SPORTS SCHOOLS IN PUTTALAM DISTRICT: DETAILS

1480/'16

8. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩා පාසල් පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් සංවර්ධනය කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

(iv) දැනට පුත්තලම දිස්ත්‍රික්කය තුළ සේවයේ නියුතු ක්‍රීඩා ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ගේ නම් සහ සේවයේ නියුතු පාසල් කවරේද;

(vi) දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩා ගුරු පුරප්පාඩු පවතී නම්, ඉදිරියේදී එම පුරප්පාඩු සඳහා අවශ්‍ය බඳවා ගැනීම් සිදු කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) வடமேல் மாகாணத்தின் புத்தளம் மாவட்டத்தில் விளையாட்டுத்துறைப் பாடசாலைகள் அமைக்கப்பட்டுள்ளனவா;

(ii) ஆமெனில், மேற்படி பாடசாலைகளின் பெயர்கள் யாவை;

(iii) மேற்படி பாடசாலைகளை அபிவிருத்தி செய்வ தற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

(iv) தற்போது புத்தளம் மாவட்டத்தினுள் பணி யாற்றும் விளையாட்டுத்துறை ஆசிரியர்களின் எண்ணிக்கை யாது;

(v) இவர்களது பெயர்கள் மற்றும் பணியாற்றும் பாடசாலைகள் யாவை;

(vi) மாவட்டத்தினுள் விளையாட்டுத்துறை ஆசிரியர் களுக்கான வெற்றிடங்கள் காணப்படுமாயின், எதிர்வரும் காலத்தில் குறித்த வெற்றிடங் களுக்குத் தேவையான ஆட்சேர்ப்புகளை மேற் கொள்வதற்கு நடவடிக்கை மேற்கொள்வாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether Sports Schools have been established in the Puttlam District in the North Western Province;

(ii) if so, the names of those schools;

(iii) the steps that will be taken to develop those schools;

(iv) the number of sports teachers serving in the Puttlam District;

(v) their names and the names of the schools in which they are serving at present; and

(vi) whether action will be taken to make necessary recruitments in the future, if there are vacancies for sports teachers in the district?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 1. හලාවත/ සේනානායක ජාතික පාසල - මධ්‍යම රජය මඟින් පාලනය වන පාසලකි.

2. පුත්තලම/ ආණමඩුව මධ්‍ය මහා විද්‍යාලය - පළාත් සභාව මඟින් පාලනය වන පාසලකි.

(iii) (i) 2017 වර්ෂයේදී ක්‍රීඩා පාසල් සඳහා වොලිබෝල්, නෙට්බෝල් සහ බාස්කට් බෝල් ක්‍රීඩා පිටි ඉදිකිරීම හා නඩත්තුව සඳහා රුපියල් මිලියන 1.5ක් ලබා දීම.

(ii) 2017 වර්ෂයේදී රුපියල් මිලියන 01ක කාය වර්ධන උපකරණ ලබා දීම සහ කාය වර්ධන ක්‍රීඩාගාරයක් ලෙස කාමර නවීකරණය හා අවශ්‍ය පහසුකම් සැපයීම හා සුළු අලුත්වැඩියා සඳහා රුපියල් මිලියන 2ක් ලබා දීම.

(iii) 2017 වර්ෂයේදී සිසුන් සඳහා ක්‍රීඩා ඇඳුම්, සපත්තු සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා රුපියල් ලක්ෂ 5ක මුදලක් ලබා දීම

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

සහ අත්‍යවශ්‍ය ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 1.67ක් ලබා දීම.

(iv) 2017 වර්ෂයේ පළමු කාර්තුවේ ආහාර හා දීමනා සඳහා පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන රුපියල් 49,500ක් ලබා දී ඇති අතර, දෙවන කාර්තුව සඳහා ප්‍රතිපාදන 2017 ජූලි 15 දිනට ලබා දීමට නියමිතව ඇත.

(v) 2018 වර්ෂයේදී ක්‍රීඩාගාරයක් ඉදිකිරීම සඳහා පළමු අදියරට රුපියල් මිලියන 10ක මුදලක් වෙන් කර ඇත.

(vi) ක්‍රීඩා පාසල් නවීකරණය කිරීම ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේදී ක්‍රීඩා පාසල් ශිෂ්‍යත්වධාරීන් 40ක් බඳවා ගැනීමට අපේක්ෂිතය.

(vii) 2018 වර්ෂයේදී ක්‍රීඩා ශිෂ්‍යත්වධාරීන්ගේ පෝෂණ දීමනාව රුපියල් 2,500 - 5,000 දක්වා **වැඩි කිරීමට** නියමිතයි.

(viii) 2018 වර්ෂයේදී පුහුණුකරුවන්ගේ සහ කාර්ය මණ්ඩල දීමනා වැඩි කර ඇත.

(iv) ක්‍රීඩා ගුරුවරු සංඛ්‍යාව 170කි.

(v) ඇමුණුම 01 බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(vi) ඔව්.

පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රීඩා ගුරු පුරප්පාඩු 191ක් පවතී. ඉදිරියේදී එම පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රීඩා උපදේශකවරුන් බඳවා ගැනීමට 2017.05.22 දිනැති දිනමිණ පුවත් පත් දැන්වීමට අනුව අයදුම් පත් කැඳවා ඇත. මේ සඳහා අයදුම් පත් 20,000ක් පමණ මේ වනකොට ලැබී ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

පිළිතුරු ලබාදීම පිළිබඳව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමාගේ පිළිතුරුවලින් අපට එක කාරණයක් අවධාරණය වෙනවා. ගරු කථානායකතුමනි, 2007න් පස්සේ නැවත 2017 දී තමයි මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ක්‍රීඩා පාසල් දෙස ඇහැ ඇරලා බලලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මන්ත්‍රීවරුන්ට තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ගැටලු සහගත තත්ත්වයන් තිබියදී තමයි මම මේ ප්‍රශ්නය යොමු කළේ. නමුත් මෙම දිස්ත්‍රික්කය ගරු ඇමතිතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කයට අල්ලපු දිස්ත්‍රික්කය නිසා, එතුමාගේ මැදිහත් වීමෙන් මෙම දිස්ත්‍රික්කයේ සමහර ප්‍රශ්න ඒ කාලයේම විසඳලා තිබෙනවා. එතුමා 2017 දී විසඳුම් දෙන්න කලිනුයි මම මේ ප්‍රශ්නය යොමු කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, නමුත් 2007න් පසු 2017 වෙනකල් ක්‍රීඩා පාසල් පිළිබඳව අවධානය යොමු නොකර අත් හැරලා තිබුණා කියන්නේ, පසු ගිය කාල වකවානුව තුළ ක්‍රීඩාවට යොමු වූ දරුවන්ගේ අනාගතය අඳුරු කිරීමයි. පාසල් අධ්‍යාපනය ලබන දරුවන් ක්‍රීඩාවට හුරු පුරුදු කිරීම, විද්‍යාලය තුළ දරුවන් සුමගට ගැනීමට සහ සමාජයේ සිදුවන ව්‍යසනයන්ගෙන් බේරීමට තරුණ තරුණියන්ට ලබාදෙන අත් වැලක්. ගරු ඇමතිතුමනි, ඉදිරියේ දී ඒ වගේ දෙයක් සිදු නොවීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් යම් වැඩ පිළිවෙළක් දියත් කර තිබෙනවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, දැනට ක්‍රීඩා පාසල් 22ක් තිබෙනවා. එම ක්‍රීඩා පාසල් 22හි සියලුම ක්‍රීඩා අධ්‍යක්ෂවරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පසු ගිය දවස්වල මා හමුවුණා. විශේෂයෙන්ම අපි එම පාසල් සඳහා අවශ්‍ය පහසුකම් වැඩි කරමින් තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩා පාසල් 22 සඳහා කාය වර්ධන මධ්‍යස්ථාන ඇති කිරීම වෙනුවෙන් එක් පාසලකට රුපියල් ලක්ෂ 22 බැගින් ලබාදීමට මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා.

ක්‍රීඩා පාසල් දියුණු කිරීම විතරක් නොවෙයි, ලක්ෂ 45කට ආසන්න පිරිසක් වන පාසල් සිසුන්ට කුමන හෝ ක්‍රීඩාවක් පුහුණු කළ යුතුයි කියලා, එය අනිවාර්ය කරලා වක්‍රලේඛයක් යවා තිබෙනවා. මොකද, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පමණක් ප්‍රමාණවත් නොවන නිසා. අපි පාසල් සිසුන් විෂය සමගාමී කටයුතුවලටත් යොමු කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි අනාගතයේ දී සමබර මනසකින් යුතු පෞරුෂයක් සහිත පාසල් දරුවන් පිරිසක් බිහි වන්නේ. අපි ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු අමාත්‍යතුමනි, එම විසඳුමට ස්තුතිවන්ත වනවා. ගරු කථානායකතුමනි, මාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමා කිව්වා, ක්‍රීඩා ගුරුවරුන්ගේ පුරප්පාඩු 190ක් විතර දිස්ත්‍රික්කය තුළ තිබෙනවා කියලා. එම ප්‍රශ්නයටත් විසඳුමක් ලබා දීම සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් ක්‍රීඩා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා මේ වනකොට වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙන බව අපි දන්නවා. ඒ නිසා එම ප්‍රශ්නයටත් දැන් විසඳුමක් ලැබිලා තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් යෝජනාවක් කරනවා මිසක් වෙනත් දෙයක් නැහැ.

ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ, ඔබතුමා අමාත්‍ය ධුරය දරන කාලය තුළම මෙම ක්‍රීඩා ගුරුවරුන්ට නියමිත පුහුණු කරවීමේ කටයුතු භාර දීලා, පාසල් දරුවන්ව නැවත ක්‍රීඩාවෙන් ඈත් නොවෙන විධියට එම ගුරුවරුන් පාසල් ක්ෂේත්‍රයට සම්බන්ධ කරන්නය කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපි ක්‍රීඩා පුහුණුකරුවන් 3,850ක් ගන්න ගැසට් කරලා, අයදුම්පත් කැඳවලා තිබෙනවා. දැනට 20,000කට ආසන්න ප්‍රමාණයක් අයදුම්පත් ලැබිලා තිබෙනවා. ලබන මාසේ දෙවැනිදා සහ තුන්වෙනිදා යන දිනවලදී මෙම අයදුම්කරුවන්ව සම්මුඛ පරීක්ෂණයකට භාජන කරලා, ජාතික මට්ටමින්, පළාත් මට්ටමින් ඉහළම සුදුසුකම් තිබෙන අය බඳවා ගැනීමට කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී තව කාරණයක් ගැන මා කියන්න ඕනෑ. අපි අද, හෙට සහ අනිද්දා යන දිනයන්වල පාසල් 10,000ක "ඩෙංගු මර්දන ව්‍යාපාරය"

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

වෙනුවෙන් ශ්‍රමදාන ව්‍යාපාරයක් ආරම්භ කළා. අද උදේ මම නාලන්දා විද්‍යාලයටත්, සංඝමිත්තා විද්‍යාලයටත් ගියා. ඉතාම සාර්ථකව මෙය ක්‍රියාත්මක වෙනවා. මේ සඳහාත් මගේ ස්තුතිය පුද කරන්න ඕනෑ.

විශේෂයෙන්ම මම පොලිස්පතිතුමාටත්, ත්‍රිවිධ හමුදාපතිවරුන්ටත් පෞද්ගලිකව කථා කරලා ඒ ගොල්ලන්ගේ සහයෝගයත් ඉල්ලුවා. ඒ නිලධාරිනුත් ඇවිල්ලා, ඒ හැම තැනකම අද මේ වන විට ඉතාම විධිමත් ලෙස ඩෙංගු මර්දන ව්‍යාපාරයක් ක්‍රියාත්මක වෙමින් පවතින බව අපට දැන ගන්න ලැබුණා. විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට, සිසුන්ට සහ දෙමව්පියන්ට මා ආරාධනා කරනවා, හෙට සහ අනිද්දාත් ඇවිල්ලා තමන්ගේ පාසල සම්පූර්ණයෙන්ම පිරිසිදු කරලා, ඩෙංගු මර්දන ව්‍යාපාරය වෙනුවෙන් කැප වෙන්න කියලා.

යාන් ඔය ව්‍යාපෘතිය නිසා ඉඩම් අහිමිවූවන් : ඉඩම් ලබා දීම

යාන් ඔයා කරුත්තිට්ටත්තිනාල් කාණි இழந்தோர்: காணிகள் வழங்கல்

PEOPLE MADE LANDLESS DUE TO YAN OYA PROJECT: PROVISION OF LANDS

1495/'16

9. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) යාන්ඔය ව්‍යාපෘතිය සඳහා අවට පදිංචි ප්‍රදේශවාසීන්ගේ ඉඩම් අත්කර ගැනීම හේතුවෙන් පාරම්පරික වැව් 07 ක්, ගේදොර සහ කුඹුරු මෙම ජලාශයට යටවීම නිසා එම පිරිස ඉදුම් හිටුම් නොමැතිව අසරණ තත්ත්වයට පත්වී ඇති බවත්;

(ii) ප්‍රදේශවාසීන්ගේ විරෝධය නොතකා ජන ජීවිතයට නුසුදුසු කඳුවත්ත ප්‍රදේශයේ විශාල සන වනාන්තරයක් ඔවුන් හට බෙදා දීමට නිලධාරීන් විසින් කටයුතු කරන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ප්‍රදේශවාසීන් විසින් මල්පෝරුව ගම්මානය අසල, දකුණු ඇළට යාබදව, ජලාශයට යට නොවූ ඉඩම් අක්කර 600ක ප්‍රමාණයෙන් අක්කර 200ක් ලබා දෙන ලෙස ඉල්ලා සිටි බවත්;

(ii) ඒ අනුව, විෂය භාර අමාත්‍යවරයා අදාළ නිලධාරීන් සමඟ පැමිණ ඉහත කී ඉඩමෙන් අක්කර 200ක ගොඩ ඉඩම් හැකි ඉක්මනින් එම ජනතාවට ලබාදෙන ලෙස ඔවුන්ට උපදෙස් දුන් බවත්;

එතුමා පිළිගන්නේද?

(ඇ) එසේ වුවද, මේ දක්වා ඔවුන්ට පදිංචිය සඳහා ඉඩම් නොලැබී ඇති බැවින්, ඉහත ආ (ii) හි කීරණය අනුව වහාම ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யான்ஓயா கருத்திட்டத்திற்காக சுற்றயலில் வசித்த பிரதேசவாசிகளின் காணிகள் சுவீகரிக்கப் பட்டதன் காரணமாக பாரம்பரிய 07 குளங்கள், குடிமனைகள் மற்றும் வயல்கள் இந்த நீர்த்தேக்கத்தில் மூழ்கியுள்ளதால் இவர்கள் போக்கிடமின்றி நிர்க்கதியாகியுள்ளனர் என்பதையும்;

(ii) பிரதேசவாசிகளின் எதிர்ப்பினைப் பொருட் படுத்தாது கஜுவத்த பிரதேசத்தில் மனித வாழ்வுக்குப் பொருத்தமற்ற அடர்ந்த வனப் பிரதேசமொன்றை இவர்களுக்கு பகிர்ந்தளிக்க உத்தியோகத்தர்கள் நடவடிக்கை எடுத்து வருகின்றனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) பிரதேசவாசிகள் மல்போருவ கிராமத்திற்கு அருகில், தெற்கு கால்வாயை அண்டியதாக நீர்த் தேக்கத்திற்கு மூழ்காத 600 ஏக்கர் காணியில் 200 ஏக்கர் காணியைப் பெற்றுத்தருமாறு கோரியிருந்தனர் என்பதையும்;

(ii) அதன்படி, விடயத்திற்குப் பொறுப்பான அமைச்சர் சம்பந்தப்பட்ட உத்தியோகத்தர் களுடன் வருகைதந்து மேற்கூறிய காணியி லிருந்து 200 ஏக்கர் மேட்டுக் காணியை துரித கதியில் இந்த மக்களுக்கு வழங்குமாறு அவர் களுக்கு அறிவுரை வழங்கியுள்ளார் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(இ) எனினும், இதுவரை இவர்களுக்கு குடியிருப்பதற் கான காணிகள் கிடைக்காததால், மேற்படி ஆ(ii) இன் முடிவின்படி உடனடியாக காணிகளை வழங்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச் சபையில் அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Is he aware that -

(i) due to the acquisition of lands for the construction of Yan Oya Project, seven ancestral tanks, houses and paddy fields were submerged in the reservoir and the residents of the area have lost their homes and have been left destitute; and

(ii) despite objections by the residents of the area, arrangements are being made by authorities to distribute among those residents the lands in a thick forest in Kajuwatta area which is not suitable for living?

(b) Will he admit that -

(i) the aforesaid residents had requested that, out of the area of 600 acres that has not been submerged in the reservoir close to Malporuwa Village and bordered by the south canal, an extent of 200 acres be provided to them; and

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

(ii) accordingly, the subject Minister who visited the area along with the relevant officials instructed them to provide those residents with an extent of 200 acres of high land out of the aforesaid land as early as possible?

(c) Will he inform this House whether immediate steps would be taken as per the decision stated in (b)(ii) above to provide lands to the aforesaid people as they have not been provided with any land to reside in to date?

(d) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - நீர்ப்பாசன மற்றும் நீரக வளமூல முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Irrigation and Water Resources Management)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) මම දන්නෙමි.

එහෙත්, කිසිදු පදිංචිකරුවෙකු ඉඳුම් හිටුම් නොමැතිව අසරණ තත්ත්වයට පත් වී නැත.

ඔවුන්ගේ ඉඩම් හා දේපළ නිසි පරිදි තක්සේරු කර වන්දි ගෙවීමටත්, ඊට අමතරව නිවාස හා වගා බිම් අහිමි වන අයට අලුතෙන් සංවර්ධනය කරන වාරි ඉඩම් අක්කර 1 1/2 බැගින් හා ගොඩ ඉඩම් අක්කර 1 බැගින් ලබා දීමටත්, නිවාස සඳහා රුපියල් ලක්ෂ 8ක අවමයකට යටත්ව -පැල්පතටත් රුපියල් ලක්ෂ 8ක් ගෙවනවා. උපරිමය තමන්ගේ නිවසේ තක්සේරු වටිනාකම- ප්‍රතිස්ථාපන පිරිවැයක් ගෙවීමටත් කටයුතු කෙරෙමින් පවතී.

(ii) නොදනිමි.

නමුත්, කඳුවත්ත හා මයිලෑව අතර පිහිටි ප්‍රදේශය පරිසර ඇගයීම් වාර්තාවේ අනුමත වුණ ප්‍රදේශයක් බවත්, දැනටමත් පවුල් 55ක් එහි පදිංචියට යාමට එකඟතාව පළ කර ඇති බවත් මම දනිමි.

(ආ) (i) මුලින් නිවසක් තනා ගැනීමට ගොඩඉඩම් කැබැල්ලක් ඉල්ලූ බවත්, පසුව වරින් වර තවත් ඉල්ලීම් වැඩි වූ බවත් දනිමි.

(ii) නැත.

වාරිමාර්ග අමාත්‍යවරයා වශයෙන් මා මල්පෝරුව ගම්මානයට ගොස් අක්කර 50ක් ලබා දෙන ලෙස වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර, ඒ සඳහා ඔවුන් වාචිකව එකඟ වී ඇත.

(ඇ) මල්පෝරුව ප්‍රදේශයෙන් අක්කර 50ක් පමණක් නිදහස් කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව එකඟ වූ බැවින්, ප්‍රධාන පවුලකට අක්කර 1/2 බැගින් හා අනු පවුල් සඳහා අක්කර 1/4 බැගින් ලබා දීමට එම ගම්වාසීන් සමඟ ද එකඟතාවකට පැමිණ ඇති අතර, දැනට ඒ අනුව ඉදිරි කටයුතු කෙරෙමින් පවතී. එම ඉඩම් ඉතා ඉක්මනින් අදාළ ජනතාව වෙත ලබා දීමට කටයුතු කරමි.

(ඈ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මේ ජනයාට දුන් කඳුවත්ත ප්‍රදේශය පිළිබඳව එම ජනයාගේ විරෝධයක් තිබුණා. ඒක මහ -තද- ඝන වනාන්තරයක්. මල්පෝරුව ගම්මානයට යාබදව තිබෙන ජලාශයට යට නොවුණු ඉඩම් අක්කර 600ක් තිබෙනවාය, ඒ ඉඩම් අක්කර 600න් අක්කර 200ක් අපේ වුවමනාවට දෙන්නය කියලා එම ජනතාවගෙන් ඉල්ලීමක් තිබුණා. ඒ අනුව ඔබතුමා ගිහිල්ලා ඒ වෙනුවෙන් අක්කර 50ක් දෙන්නය කියලා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් එකඟත්වය ලබා ගත්තා. එසේ ලබා ගත් එකඟත්වය අනුව මේ සියලු ජනයාට දිය යුතු ඉඩම් ප්‍රමාණය දෙන්න පුළුවන්ද, නැත්නම් මේ ජනයාගෙන් යම් කොටසකට කඳුවත්ත ඝන වනාන්තරයට යට වෙන්න වෙනවාද කියා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
නැහැ. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව පවසන විධියට, කඳුවත්ත තමයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව දෙන්න කැමැති. මල්පෝරුව ගම්මානය ඝන වනාන්තරයක්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මල්පෝරුව ගම්මානයට යාබදව ඝන වනාන්තරයක් තිබෙනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ඔව්. මල්පෝරුව ගම්මානයට යාබදව ඝන වනාන්තරයක් තිබෙනවා. නමුත් අපි ගොවි බිමත්, නිවාසත් අතර තිබෙන ප්‍රවාහන පහසුකම් ගැන කල්පනා කරලා අක්කර භාගයක් මූලික පවුලකටත්, අක්කර කාලක් අනු පවුලකටත් දීම සඳහා අක්කර -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, මෙම වැසියන්ගේ වුවමනාව ඒ කියන බිම් ප්‍රමාණ තුළින් ඉටු කර ගන්න පුළුවන්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
පුළුවනි. මොනවා හරි තිබෙනවා නම් ඔබතුමා සාකච්ඡා කරන්න.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මේ ජනයා කරන මේ ඉල්ලීම ඉටු කර දෙන්න පුළුවන්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
මම නැවත කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරනවා. ගතේ හයිය තිබෙන ගොවියෙකුට අක්කර කාලක් මදියි කියන එක මා පිළිගන්නවා. එම නිසා ඔවුන්ට අඩුම ගණනේ අක්කරයක් හෝ

අක්කර භාගයක්වත් තිබිය යුතුයි. අපේ ගෙවත්ත කොස්, පොල්, දෙල් වගා කර ගන්න පුළුවන් ප්‍රමාණයට තිබිය යුතුයි කියලා මා විශ්වාස කරනවා. මම ඒ සම්බන්ධයෙන් නැවත කැබිනට් පත්‍රිකාවක් යොමු කරනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
යම් කෙනෙකු අකමැති වුණොත්?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
අකමැති කිසි කෙනෙකු දමන්නේ නැහැ.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, යාන් ඔය ජලාශයේ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කැමතිද? [බාධා කිරීමක්] ඇමතිතුමනි, අද දිනට නියමිත වැඩ කටයුතුවලට කාලය මදි නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් එතුමාට වෙනම පැහැදිලි කරලා දෙන්න.

2017 අය වැය සඳහා මාධ්‍ය දැන්වීම් : වියදම් කළ මුදල

2017 வரவு செலவுத்திட்டத்திற்கான ஊடக விளம்பரங்கள்: செலவிட்ட பணம்

MEDIA ADVERTISEMENTS FOR BUDGET 2017: MONEY SPENT

1498/'16

10. **ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) 2017 අයවැය සඳහා ජනතාවගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම වෙනුවෙන් රූපවාහිනී, ගුවන්විදුලි සහ පුවත්පත් දැන්වීම් සඳහා වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2017ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத் திற்குப் பொதுமக்களிடமிருந்து கருத்துக்கள் மற்றும் பிரேரணைகளைப் பெற்றுக்கொள்வதற்காக தொலைக்காட்சி, வானொலி மற்றும் பத்திரிகை விளம்பரங்களுக்காகச் செலவிடப்பட்ட பணத்தொகை தனித்தனியே எவ்வளவு என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House separately, of the amount of money spent on television, radio and newspaper advertisements in obtaining public opinions and proposals on Budget 2017?

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රූපවාහිනී දැන්වීම් සඳහා - රුපියල් 5,602,169.76 (බදු සහිත)

ගුවන්විදුලි දැන්වීම් සඳහා - නොමැත.

පුවත් පත් දැන්වීම් සඳහා - රුපියල් 3,748,811.20 (බදු සහිත)

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

මා අහලා තිබෙන්නේ 2017 අය වැය සඳහා ජනතාවගෙන් අදහස් හා යෝජනා ලබා ගන්න රූපවාහිනී, ගුවන්විදුලි සහ පුවත් පත් දැන්වීම් සඳහා වියදම් කරපු මුදල කොපමණද කියලායි.

රාජ්‍ය අමාත්‍යතුමා කිව්ව විධියට මෙතැන රුපියල් ලක්ෂ 100 විතර රූපවාහිනී සහ පුවත්පත් දැන්වීම් සඳහා වියදම් කර තිබෙනවා. ඔබතුමා සෑහීමට පත් වෙනවාද, මේ රුපියල් ලක්ෂ 100ක් වියදම් කරලා ජනතාව ලබා ගත් අදහස් අයවැය යෝජනාවලට ඇතුළත් කළාය කියලා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඔව්. මම හිතන විධියට රුපියල් මිලියන 10ක් කියන්නේ විශාල මුදලක් නොවෙයි. ඒක ජනතාවගේ අදහස් ලබා ගන්න වියදම් කළ ප්‍රමාණය. එතැන කොටස් දෙකක් තිබෙනවා. එකක් තමයි අදහස් ලබා ගන්න ඕනෑ කියන එක. ඒ වාගේම අයවැය සම්මත වුණාට පස්සේ ඒ සම්මත වුණු දේවලුත් ජනතාවට පැහැදිලි කරන්න අවශ්‍යයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙහෙම යෝජනා අරගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අය වැය යෝජනා පවා ක්‍රියාත්මක කිරීමේ තිබෙන ප්‍රමාදයන් ගැන පාර්ලිමේන්තුවේ විටින් විට ප්‍රශ්න මතු වෙනවා. ඒ කියන්නේ, ජනතාවගේ අදහස් ගන්නවාය කියලා යම් කිසි ආකාරයකට සන්දර්ශනයක් කළාට, මුදල් වියදම් කළාට ඇත්තටම අය වැය ලේඛනයේ තිබෙන ඒ අදහස්, යෝජනා ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා අඩු තරමින් ඒ පිළිබඳව පසු විපරම් කරලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීමේ ක්‍රියාවලියක්වත්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තමුන්නාන්සේලා දියත් කරනවා නම් වියදම් කරන මුදලටවත් සාධාරණයක් වෙනවා. එහෙම නැත්නම් හැම අවුරුද්දකම අයවැය ළං වෙන කොට මෙවැනි සන්දර්ශන සඳහා මීට වඩා මුදල් වියදම් කිරීමක් තමයි සිද්ධ වන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)

සන්දර්ශන කියලා කියන්න බැහැ. මොකද, සාමාන්‍යයෙන් ව්‍යාපාරික කොටස් ඒ අයගේ යෝජනා ඉදිරිපත් කරනවා. නමුත් සාමාන්‍ය ජනතාව ඒක කරන්නේ නැහැ. ඒ නිසා මෙහෙම දැනුවත් කරන එක හොඳයි. අපට පසු විපරම් කරන්න පුළුවන්.

හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයට දරුවන් ඇතුළත් කිරීම : විදුහලේ සංවර්ධන කටයුතු සඳහා ආධාර

ஹொரண தக்சிலா மத்திய வித்தியாலயத்தில் மாணவர் அனுமதி: பாடசாலை அபிவிருத்தி நன்கொடை

ADMISSION OF CHILDREN TO HORANA THAKSHILA CENTRAL COLLEGE : DONATIONS FOR SCHOOL DEVELOPMENT

1597/'17

11. ගරු විදුර වික්‍රමනායක මහතා
(මාණ්පුමිකු විදුර වික්කිරමනායක්ක)
(The Hon. Vidura Wickramanayaka)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) දිවයිනේ ජනප්‍රිය පාසල්වලට, විශේෂයෙන්, ජාතික පාසල්වලට දරුවන් ඇතුළත් කිරීම සඳහා දැඩි තරගකාරීත්වයක් පවතින බවත්;

(ii) මේ හේතුවෙන් අපහසුතාවයට පත්වන දෙමාපියන් තම දරුවා එම පාසල්වලට ඇතුළත් කරගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ද ඉල්ලීම් ඉදිරිපත් කරන බවත්;

(iii) දෙමව්පියන් පිරිසකගේ එවැනි ඉල්ලීමක් සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ විවිධ ශ්‍රේණි සඳහා ඇතුළත් කර ගැනීම පිණිස සිසුන්ගේ නාම ලේඛනයක් විදුහල්පතිතුමියට එවා ඇති බවත්;

(iv) එම නාම ලේඛනයේ ඇතුළත් නම් අතරින්, ප්‍රමුඛතාවය ලබාදීම සඳහා විදුහලේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් ලක්ෂ පහක මුදලක් අපේක්ෂා කරන බව සමහර දෙමාපියන් වෙත ආදි ශිෂ්‍ය නියෝජිතයන් වශයෙන් සිටින ඇතැම් පුද්ගලයන් විසින් දන්වා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) විශේෂයෙන්ම දුප්පත් දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා නිදහස් අධ්‍යාපනයේ පියා විසින් ආරම්භ කරන ලද මධ්‍ය විද්‍යාල මෙලෙස මුදල් පසුපස හඹායාම බරපතළ වරදක් මෙන්ම, බරපතළ අසාධාරණයක් වන බවත් එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන්ට එරෙහිව කටයුතු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டின் பிரபல்யமான பாடசாலைகளுக்கு குறிப்பாக, தேசியப் பாடசாலைகளுக்கு பிள்ளைகளைச் சேர்ப்பதற்காகக் கடும் போட்டி நிலவுகின்றதென்பதையும்;

(ii) இதன் காரணமாக சிரமங்களுக்கு உள்ளாகின்ற பெற்றோர்கள் தமது பிள்ளைகளை அந்த பாடசாலைக்குச் சேர்ப்பதற்காக கல்வி அமைச்சிடமும் விடயங்களை முன்வைக் கின்றனரென்பதையும்;

(iii) பெற்றோர்கள் குழுவொன்றின் அத்தகைய வேண்டுகோளினைப் பரிசீலனை செய்த கல்வி யமைச்சினால் ஹொரண தக்ஷிலா மத்திய வித்தியாலயத்தின் பல்வேறு தரங்களுக்காகச் சேர்த்துக்கொள்ளும்பொருட்டு மாணவர்களின் பெயர்ப்பட்டியலொன்று பாடசாலை அதிபருக்கு அனுப்பிவைக்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) மேற்படி பெயர்ப்பட்டியலில் உள்ளடக்கப்பட்ட பெயர்களில், முன்னுரிமை வழங்குவதற்காக வித்தியாலயத்தின் அபிவிருத்தி நடவடிக்கைகளுக்காக ஐந்து இலட்சம் ரூபாய் பணம் எதிர்பார்க்கப்படுவதாக ஒருசில பெற்றோர் களுக்குப் பழைய மாணவர்களின் பிரதிநிதிகளாக உள்ள ஒருசில ஆட்களால் அறிவிக்கப் பட்டுள்ளதென்தையும்;

அவர் அறிவாரா?

(ஆ) குறிப்பாக வறிய பிள்ளைகளின் எதிர்கால மேம் பாட்டுக்காக இலவசக் கல்வியின் தந்தையால் நிர்மாணித்து ஆரம்பிக்கப்பட்ட மத்திய வித்தியாலயங் களிலிருந்து இவ்விதமாகப் பணத்தைப் பின்தொடர்ந்து செல்கின்ற நிலைமை உருவாகின்றமை பாரதூரமான தவறாகவும் அதேபோன்று பாரதூரமான அநீதி யாகவும் அமைகின்றதென்பதை அவர் ஏற்றுக் கொள்கிறாரா?

(இ) இது சம்பந்தமாகப் பொறுப்புக்கூறவேண்டிய ஆட்க ளுக்கு எதிராகச் செயலாற்ற நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that -

(i) there is fierce competition to get children admitted to popular schools, especially the National Schools in the Island;

(ii) parents inconvenienced as a result, make requests to the Ministry of Education as well to get their children admitted to those schools;

(iii) a list of names of students to be admitted to different grades at Horana Thakshila Central College has been sent to the principal of that school by the Ministry of Education, after considering such a request made by a group of parents;

(iv) some parents have been informed by certain individuals who are representatives of past

pupils that a sum of Rs.5 lakhs was expected for school development work to give priority to names in the said list?

(b) Will he admit that emergence of a situation of running after money by Central Colleges founded by the Father of Free Education for future advancement of especially the poor children is a serious offence as well as a serious injustice?

(c) Will he inform this House whether steps would be taken for action against the individuals responsible for this situation?

(d) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) 2017 වර්ෂයේ හොරණ තක්ෂිලා මධ්‍ය විද්‍යාලයේ අතරමැදි ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබුණු ඉල්ලීම් 2008/37 චක්‍රලේඛ ප්‍රකාරව සුදුසුකම් පරීක්ෂා කර තෝරා එවීම පිණිස එම ඉල්ලීම් ලැබුණු පිළිවෙළ අනුව අවස්ථා කිහිපයකදී විදුහල්පති වෙත යොමු කර ඇත. එසේම විදුහල්පති විසින් එම චක්‍රලේඛ ප්‍රකාරව තෝරා එවන ලද නාම ලේඛනයක් සඳහා අනුමත සීමාවට යටත්ව සිසුන් ඇතුළත් කිරීමට අධ්‍යාපන ලේකම් විසින් අනුමැතිය ලබා දී ඇත.

(iv) නැත.

2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණි දක්වා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2008/37 චක්‍රලේඛයේ 6.0 වගන්තිය මඟින් ළමයින් ඇතුළත් කිරීම සඳහා මුදල් සහ වෙනත් ආධාර ලබා ගැනීම තහනම් බවට පැහැදිලිව දක්වා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න නැතිව නොවෙයි. තොරතුරු සොයා බැලුවාම ලැබෙන පිළිතුර අනුවයි මම "නැත" කියන්නේ.

(ආ) මුදල් පසුපස හඹායාම බරපතළ වරදක් බව පිළිගනිමි.

එබැවින්, එය වැළැක්වීමට අවශ්‍ය පියවර අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ගෙන ඇත.

(ඇ) මෙවැනි පැමිණිල්ලක් අධ්‍යාපන අමාත්‍යාංශයේ විමර්ශන අංශයට මෙතෙක් ලැබී නොමැත. පැමිණිල්ලක් ලද හොත්, මූලික විමර්ශනයක් සිදු කර 2008/37 චක්‍රලේඛයේ 6.0 වගන්තිය උල්ලංඝනය කර ඇති බව සනාථ වුවහොත්, එවැනි ක්‍රියාවලට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව අනාවරණය වන විමර්ශන නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

ගරු විදුර වික්‍රමනායක මහතා
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු ඇමතිතුමනි, පිළිතුරෙන් පැහැදිලියි, ඔබතුමා මෙවැනි කිසිම දෙයකට අනුමැතියක් නොදෙන බව. ඒ අනුසාරයෙන් අපි ඔබතුමාට යෝජනාවක් කරනවා. මේ ප්‍රශ්නය පැමිණිල්ලක් හැටියට භාර ගෙන - ඔබතුමා කියනවා, සමහර නිලධාරීන් ඔබතුමාට දෙන උත්තර අනුව තමයි මේ ගරු සභාවේදී කියන්නේ කියලා. ඒක මම දන්නවා. මම ඔබතුමාට මීට කලිනුත් අධ්‍යාපනයේ තිබෙන්නා වූ මාෆියා ගැන කිව්වා. දැන් ඔබතුමා කියයි, "මේක තිබුණේ පසු ගිය ආණ්ඩුව කාලයේ." කියලා. එහෙම නැහැ, තවමත් තිබෙනවා. ඒ නිසා නේ මෙහෙම වැරැදි උත්තර ඔබතුමාටත් දෙන්නේ.

ගරු ඇමතිතුමනි, ඉසුරුපායෙන් පරිබාහිරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මෙය භාර දී මේ ගැන පරීක්ෂණයක් කරන්න කියා අපි යෝජනා කරනවා. මොකද, මෙය බරපතළ ප්‍රශ්නයක්. නිදහස් අධ්‍යාපනයේ පියා මධ්‍ය මහා විද්‍යාල හැදුවේ දරුවන්ට නිදහසේ අධ්‍යාපනය දෙන්න; නිදහස් අධ්‍යාපනයක් ලබන්න. නමුත් ඒක සිද්ධ වෙන්නේ නැත්නම්, එතැන බරපතළ ඛේදවාචකයක් තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඒ නිසා මා ඔබතුමාගෙන් ඉතාම ඕනෑකමින් සහ බැගෑපත්ව ඉල්ලන්නේ, පරීක්ෂණයක් කිරීම සඳහා මේ කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන්න කියායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, අමාත්‍යවරයා වශයෙන් මම මෙය මැඩලීම සඳහා ගන්න පුළුවන් හැම පියවරක්ම ගෙන තිබෙනවා සහ ගනිමින් යනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ පළමුවන ශ්‍රේණියට ළමුන් ගන්නේ චක්‍රලේඛනය ප්‍රකාරවයි; 6වන ශ්‍රේණියට ළමුන් ගන්නේ ශිෂ්‍යත්ව ලකුණු මතයි. පසුගිය දවස්වල මට අනාවරණය වුණා, අතර මැදි පන්තිවලට පුරප්පාඩු විශාල වශයෙන් තිබෙනවා කියා අනුමත කරවාගන්න අමාත්‍යාංශයට එවා තිබෙන බව. ගරු කථානායකතුමනි, අතර මැදි පන්තිවල පුරප්පාඩු ඇති වුණාම, අපේ අමාත්‍යාංශයට අනුමැතිය සඳහා එව්වාම අප කරන දේ මා කියන්නම්. 2 ශ්‍රේණියේ පුරප්පාඩු තිබෙන්න බැහැ නේ. නමුත් දෙකේ පන්තියේ පුරප්පාඩු තිබෙනවා නම් අපි අදාළ විදුහල්පතිවරයාට දන්වා යවනවා, චක්‍ර ලේඛනය ප්‍රකාරව waiting list එකට අනුව ඊළඟ කෙනා ගන්න කියා. 6 ශ්‍රේණිය සම්බන්ධයෙන් කරන්නේත් එයමයි. හැබැයි අවාසනාවකට පසු ගිය දවස්වල මට හසු වුණා, සමහර අතරමැදි පන්තිවලට සිතන්න බැරි පුරප්පාඩු ප්‍රමාණයක් තිබෙන බව. ඒකට හේතුව මෙකයි. සියලු දෙනා නොවුණත් සමහර විදුහල්පතිවරුන් කරන්නේ, එකේ පන්තියට අවශ්‍ය සංඛ්‍යාව 35 නම් ඒ 35 ගන්නේ නැතිව අඩුවෙන් ගන්නා එකයි; 6 පන්තියට 45ක් ගත යුතුව තිබියදී 39 දෙනෙකු අරගෙන ඉතිරිය පුරප්පාඩුව තබන එකයි. ඊට පසුව 7 ශ්‍රේණියේදී පුරප්පාඩු ඇති වෙනවා. ඔතැනදී තමයි මේ සෙල්ලම වෙන්නේ. ඒ නිසා අපි දැන් තද තීරණයක් ගෙන තිබෙනවා. ඉදිරියේදී අතර මැදි පන්තිවල පුරප්පාඩු පුරවන්න විදුහල්පතිවරුන්ට අවස්ථාව දෙනවා නම් ඒ සඳහා සම්මුඛ පරීක්ෂණයට භාජන කරලා ළමුන් ගත යුතු ශක්තිමත්, විධිමත්, විනිවිද පෙනෙන ක්‍රමවේදයක් හදන්න ඕනෑ කියා මම නිලධාරීන්ට උපදෙස් දී තිබෙනවා. එහෙම කරන තෙක් අතර මැදි පන්තිවලට ළමයින් ඇතුළත් කරන එක සම්පූර්ණයෙන් නවත්වන්න කියා කිව්වා. එසේ නැත්නම් ඒ සඳහා වෙනත් ක්‍රමයක් හදන්න පුළුවන් නේ. එහෙම නම් එක්කෝ මහ ජන නියෝජිතයන්ට දෙන්න පුළුවන් නේ.

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ගරු මන්ත්‍රීතුමනි, අප මේ හැම දෙයක්ම කරන්නේ විධිමත්භාවය ඇති කරන්නයි. ඔබතුමා කිව්වා වාගේ පැමිණිලි විශාල ප්‍රමාණයක් එනවා; ඒවා විමර්ශනය කරනවා. සිටින නිලධාරිනුත් සමහර වෙලාට මදි. අප මේ තත්ත්වය පුළුවන් තරම් පාලනය කරන්නම්. ගරු මන්ත්‍රීමනි, ඔබතුමාගේ අවධාරණය කරවීම මත මේ කාරණය පිළිබඳවත් විමර්ශනයක් කරන්නම්. මේ සම්බන්ධයෙන් අනවශ්‍ය මැදිහත් වීමක් කර තිබෙන නිසා -මගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට පවා අනවශ්‍ය මැදිහත් වීමක් කර තිබෙන නිසා.- මා බඳවා ගත් නිලධාරියෙකු පවා මම ඉවත් කළා. මා මෙය අවංකවම කියන්න ඕනෑ. අපි එවැනි දේට කිසි විටෙකත් ඉඩ දෙන්නේ නැහැ. කවුරුන් හෝ නිලධාරියෙකු ඒ ආකාරයට කටයුතු කරනවා නම් ඔවුන්ට කිසිම සමාවක් දෙන්නේ නැහැ. අපි ඔවුන් සම්බන්ධයෙන් ඒකට විරුද්ධව විනය පියවර ගන්නවා.

ගරු විදුර වික්‍රමනායක මහතා
(මාණ්පුමිකු විදුර වික්කිරමනායක)
(The Hon. Vidura Wickramanayaka)
මම කරපු යෝජනාව ගැන ඔබතුමා පොඩ්ඩක් හිතලා බලන්න. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මෙය භාර දෙන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(මාණ්පුමිකු අක්කිල විරාජ් කාරියවසම්)
(The Hon. Akila Viraj Kariyawasam)
අවශ්‍ය නම් මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන්නම්. ගරු කථානායකතුමනි, එහෙම භාර දෙනවා නම් සෑහෙන්න කිබෙනවා. එක එක ප්‍රශ්න නිසා බොහෝ අයට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වෙනවා. ඇත්තටම දැන් පාසැල්වලට පත් කරන්න විදුහල්පතිවරු නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඉල්ලීම මත මම මෙය යොමු කරන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කල්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ප්‍රශ්න අංක 13- 1604/'17-(1), ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආසු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයකදී පිළිතුරු දීමට නියමිත විය.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කල්)
(The Hon. Speaker)
දෙවන වටය.

1983 ජාතිවාදී කෝලහල හේතුවෙන් මියගිය, තුවාල සිදු වූ සහ අවතැන් වූ දමිළ ජනතාව: විස්තර

1983 இனக்கலவரத்தில் இறந்த, காயமடைந்த மற்றும் காணாமற்போன தமிழர்கள்: விபரம்

TAMIL PEOPLE KILLED, INJURED AND DISPLACED BY 1983 INSURGENCY: DETAILS

1071/'16

2. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Udaya Prabhath Gammanpila)
නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 1983 ජූලි සහ අගෝස්තු මාසයන්හි සිදු වූ ජාතිවාදී කෝලහල හේතුවෙන්,

(i) මියගිය, තුවාල සිදු වූ සහ අවතැන් වූ දමිළ පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මියගිය, තුවාල සිදු වූ සහ අවතැන් වූ මුළු දමිළ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1983 யூலை மற்றும் ஆகஸ்ட் மாதங்களில் இடம் பெற்ற இனக்கலவரம் காரணமாக,

(i) இறந்த, காயமடைந்த மற்றும் காணாமற்போன தமிழர்களின் எண்ணிக்கை, அவர்கள் வசித்த மாவட்டங்களின்படி தனித்தனியாக யாது என்பதையும்;

(ii) இறந்த, காயமடைந்த மற்றும் காணாமற்போன மொத்தத் தமிழர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Law and Order and Southern Development:

(a) Will he inform this House -

(i) separately, in terms of the residential district, of the number of Tamil individuals, dead, injured and displaced;

(ii) of the total number of dead, injured and displaced Tamil individuals;

owing to the racist insurgencies that took place in July and August of 1983;

(b) If not, why?

ගරු සාගල රත්නායක මහතා (නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சாகல ரத்நாயக்க - சட்டமும் ஒழுங்கும் மற்றும் தெற்கு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sagala Ratnayaka - Minister of Law and Order and Southern Development)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා පොලීසිය විසින් දිස්ත්‍රික්ක අනුව දත්ත රැස් නොකරන අතර, ශ්‍රී ලංකා පොලීසියට අයත් පොලිස් කොට්ඨාස 42ට අදාළ පොලිස් කොට්ඨාස මට්ටමින් දත්ත රැස් කිරීම සිදු කරයි. එම කොට්ඨාස මට්ටමින් පොලිස්පති විසින් කැඳවා ඇති වාර්තාවලට අනුව පහත තොරතුරු ඉදිරිපත් කරයි.

අනු අංකය	කොට්ඨාසය	1983 ජූලි			1983 අගෝස්තු		
		මියගිය	තුවාල	අවතැන්	මියගිය	තුවාල	අවතැන්
1	බදුල්ල	2	-	67	-	-	1
2	මාතර	1	-	-	-	-	-
3	මහනුවර	2	-	3	-	-	236
4	කෑගල්ල	2	-	48	-	-	-
එකතුව		7	-	118	-	-	237

* අවතැන් වූවන් වශයෙන් නිවාස/ලැයිම් කාමර/වෙළඳ සැල්වට ගිනි තබා අනර්ථය කිරීම්/පහර දීම්/කොල්ල කෑම් මේ යටතට ඇතුළත් කර ඇත.

(ii)

1983 ජූලි			1983 අගෝස්තු		
මිය ගිය	තුවාල	අවතැන්	මිය ගිය	තුවාල	අවතැන්
7	-	118	-	-	237

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රශ්න අංක 3-1117/'16 -(1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රශ්න අංක 6-1298/'16 -(1), ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ගරු ඩලස් අලහප්පෙරුම මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රශ්න අංක 12-1601/'17 -(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පල්ලෙබැද්ද - බලංගොඩ ප්‍රධාන මාර්ගය: සංවර්ධනය
பல்லேபெத்த - பலாங்கொட பிரதான வீதி : புனரமைப்பு
PALLEBEDDA - BALANGODA MAIN ROAD: DEVELOPMENT

1610/'17

14. **ගරු අශෝක ප්‍රියන්ත මහතා (ගරු හේෂාන් විතානගේ මහතා වෙනුවට)**
(மாண்புமிகு அசோக்க பிரியந்த - மாண்புமிகு ஹேசான் விதானகே சார்பாக)
(The Hon. Ashoka Priyantha on behalf of the Hon. Heshan Withanage)

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රක්වාන මැතිවරණ කොට්ඨාසයේ, පල්ලෙබැද්ද - බලංගොඩ ප්‍රධාන මාර්ගය විශාල පිරිසක් දෛනිකව භාවිත කරන බවත්;

(ii) වසර ගණනාවකින් මෙම මාර්ගයෙහි කිසිදු ප්‍රතිසංස්කරණයක් සිදු කර නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) මෙම මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා ගතවන කාලය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

உயர் கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) றக்வான தேர்தல் தொகுதியில் பல்லேபெத்த - பலாங்கொட பிரதான வீதியை நாள்தோறும் பெருந்தொகையானோர் பயன்படுத்துகின்றனர் என்பதையும்;

(ii) பல வருடங்களாக இந்த வீதியில் எவ்விதமான புனரமைப்பும் மேற்கொள்ளப்படவில்லை என்பதையும்; அவர் அறிவாரா?

(ஆ) இந்த வீதியை அபிவிருத்தி செய்ய அவசியமான முன் நடவடிக்கைகளை மேற்கொள்வதற்கு எடுக்கின்ற காலம் எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education and Highways:

(a) Is he aware that -

(i) the main road from Pallebedda to Balangoda in the Rakwana Electorate is daily used by a large number of people; and

(ii) no renovation has been carried out on the aforesaid road for many years?

(b) Will he inform this House of the period of time that will be taken to make arrangements to develop the aforesaid road?

(c) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, I **table*** the Answer for Question No. 14.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a) (i) May be.

(ii) Now this road is in the condition of mettle and tarred and proper maintenance works are being done by the Road Development Authority.

(b) Presently, this road is in a good condition. According to the increase in the number of vehicles use this road and development requirements of the area, it will be considered to include this road into the projects to be implemented in future.

(c) Not relevant.

රන්, රිදී හා යකඩ කර්මාන්තකරුවන්: විස්තර
தங்கம், வெள்ளி, இரும்புசார் கைத்தொழிலாளர்கள் : விபரம்
GOLD, SILVER AND IRON CRAFTSMEN: DETAILS

891/'16

15. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රන්, රිදී හා යකඩ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවන් පාරම්පරිකව, ජීවත් වන ප්‍රදේශ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරී වසම්වල, ජීවත්වන උක්ත කර්මාන්තයේ පාරම්පරිකව යෙදෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් කර තිබේද;

(v) එසේ නම්, එම ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උක්ත කර්මාන්තකරුවන්ට අවශ්‍ය නව තාක්ෂණය හා පුහුණුවීම් ලබාදීමට කටයුතුකර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) නිෂ්පාදන අළෙවි කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ සපයාදීමට රජය මැදිහත් වී තිබේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) මෙම කර්මාන්තකරුවන් සඳහා විදේශ රැකියා අවස්ථා ලබාදීමට වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) උක්ත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

(v) 2015 හා 2016 වර්ෂයන්හිදී මෙම භාණ්ඩ අපනයනයෙන් ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

කෛත්තොෂිල් මර්රුම් වාණිප අලුවල්කළ් අමෛච්චරෛක් කේට්ට වින්නා:

(අ) (i) තංකම්, වෙළ්ළි මර්රුම් ඉරුම්පු චාර්න්ත පොරුට්කළෛ උර්පත්ති චෙය්යුම් කෛත්තොෂිලාළර්කළ් පාරම්පරියමාක, වසික්කුම් පිරදේසංකළ් පර්රිය ආය්වොන්රු මේර්කොළ්ළප්පට්ටුළ්ළදා එන්පදෛයුම්;

(ii) ආමෙනින්, මේර්පඩි කිරාම අලුවලර් පිරිවුකළින් එණ්ණික්කෛ එව්වළවෙන්පදෛයුම්;

(iii) මේර්පඩි කිරාම අලුවලර් පිරිවුකළිල්, වසික්කුම් මේර්පඩි කෛත්තොෂිලිල් පාරම්පරියමාක ඊටුපටුම් කුටුම්පංකළින් එණ්ණික්කෛ එව්වළ වෙන්පදෛයුම්;

(iv) මේර්පඩි කෛත්තොෂිලාළර්කළ් එතිර්නෝක්කු කින්ර පිරදානමාන පිරච්චිනෛකළ් පර්රි ආය්වොන්රු මේර්කොළ්ළප්පට්ටුළ්ළදා එන්ප දෛයුම්;

(v) ආමෙනින්, අප්පිරච්චිනෛකළ් යාවෛ එන්පදෛයුම්;

අවර් ඉච්චපෛයිල් අරිවිප්පාරා?

(ආ) (i) මේර්පඩි කෛත්තොෂිලාළර්කළුක්කුත් තේවෛයාන පුතිය තොෂිල්නුට්පම් මර්රුම් පයිර්චිකළෛප් පෙර්රුක්කොටුප්පතර්කු නටවටික්කෛ මේර්කොළ්ළප්පට්ටුළ්ළදා එන්පදෛයුම්;

(ii) ආමෙනින්, එව්වාරු එන්පදෛයුම්;

(iii) උර්පත්තිකළෛච් චන්දෛප්පටුත්තුවතර්කුත් තේවෛයාන චන්දෛ වාය්ප්පෛ ඒර්පටුත්තික් කොටුප්පතර්කු අරචාංකම් තලෛයිට්ටුළ්ළදා එන්ප දෛයුම්;

(iv) ආමෙනින්, එව්වාරු එන්පදෛයුම්;

අවර් ඉච්චපෛයිල් අරිවිප්පාරා?

(இ) (i) මේර්පඩි කෛත්තොෂිලාළර්කළුක්කු වෙළිනාට්ටු තොෂිල්වාය්ප්පෛප් පෙර්රුක් කොටුප්පතර්කාන වේලෛත්තිට්ටමොන්රු කාණප්පටුකින්රතා එන්පදෛයුම්;

(ii) ඉන්රෙල් වේලෛත්තිට්ටමොන්රු තයාරික්කප් පටුමා එන්පදෛයුම්;

(iii) මේර්පඩි උර්පත්තිකළ් ඒර්රුමති චෙය්යප් පටුකින්රවා එන්පදෛයුම්;

(iv) ආමෙනින්, අන්නාටුකළ් යාවෛ එන්පදෛයුම්;

(v) 2015 මර්රුම් 2016ආම් ආණ්ටුකළිල් ඉප් පොරුට්කළ් ඒර්රුමතියින්මූලම් කිටෛක්කප් පෙර්ර වරුමානම් එව්වළවෙන් පදෛයුම්;

අවර් කුරිප්පිටුවාරා?

(ஈ) இன்றෙල්, ඒන්?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House -

(i) whether a survey has been carried out regarding the areas which are traditionally occupied by craftsmen who engage in gold, silver and iron craft;

(ii) if so, the number of such Grama Niladhari Divisions;

(iii) the number of families which traditionally engage in aforementioned industry in the aforesaid Grama Niladhari Divisions;

(iv) whether a study has been carried out regarding the main issues faced by those craftsmen; and

(v) if so, the issues faced by those craftsmen?

(b) Will he also inform this House -

(i) whether action has been taken to provide those craftsmen with new technologies and training they require;

(ii) if so, the manner in which it has been done;

(iii) whether the Government has intervened to find them the market to sell their products; and

(iv) if so, the manner in which it has been done?

(c) Will he state -

(i) whether there is a programme to provide foreign employment opportunities to these craftsmen;

(ii) if not, whether such a programme will be formulated;

(iii) whether aforesaid products are exported;

(iv) if so, the names of the countries to which the products are exported; and

(v) the income earned in the years 2015 and 2016 through exporting these products?

(d) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජාතික ශිල්ප සභාව විසින් ඉදිරියේදී සාම්ප්‍රදායිකව රන්, රිදී හා යකඩ නිෂ්පාදන කර්මාන්තයේ නියුතු වූවන් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරයි. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් යකඩ හා ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තයේ නියුතු ගම්මාන හඳුනා ගැනීමක් සිදු කර ඇත.

(ii) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් යකඩ සහ ස්වර්ණාභරණ නිෂ්පාදන කර්මාන්තයේ නියුතු ගම්මාන

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

77ක් හඳුනා ගෙන ඇත. (එය ඇමුණුමේ දක්වා ඇත. ඇමුණුම** බලන්න.)

(iii) ජාතික ශිල්ප සභාවේ පමණක් ලියා පදිංචි කර්මාන්තකරුවන් (ශිල්පීන් - විශේෂයෙන්ම රිදී කර්මාන්තය) සංඛ්‍යාව 1,339කි. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ කම්මල් සහ ස්වර්ණාභරණ නිෂ්පාදනයේ නියුතු කර්මාන්තකරුවන් සංඛ්‍යාව 1,833ක් පමණ වේ.

(iv) ඔව්.

(v) මෙම කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටලු විධිමත් සමීක්ෂණයකින් හඳුනා නොගත්තද, ආයතන විසින් හඳුනා ගෙන ඇති ප්‍රධාන ගැටලු පහත දැක්වේ.

* අමුද්‍රව්‍යවල මිල අධික වීම.

* රන්, රිදී හා ලෝහ ආශ්‍රිත නිෂ්පාදිත භාණ්ඩ විදේශීය රටවලින් අඩු මිලට ආනයනය කිරීම.

* ව්‍යාජ නිෂ්පාදකයින් විසින් ප්‍රමිතියෙන් අඩු අමුද්‍රව්‍ය යොදා භාණ්ඩ නිෂ්පාදනය කිරීම හේතුවෙන් තත්ත්වයෙන් උසස් අමුද්‍රව්‍ය යොදා නිෂ්පාදනය කරන භාණ්ඩ සඳහා සාධාරණ මිලක් ලබා ගත නොහැකි වීම.

* භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියේදී පැරණි තාක්ෂණික ක්‍රම යොදා ගැනීම.

* පුහුණු ශ්‍රමිකයන් හිඟවීම.

(ආ) (i) ඔව්.

(ii) මාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, කාර්මික සංවර්ධන මණ්ඩලය හා ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය ඉහත කර්මාන්තකරුවන්ට නව තාක්ෂණය සහ පුහුණුවීම් ලබා දීමට කටයුතු කර ඇත.

එසේම, සෑම වසරකම ජාතික ශිල්ප සභාව මඟින් අදාළ ක්ෂේත්‍රයේ නියැළෙන ශිල්පීන්ගේ ඉල්ලීම් පදනම් කර ගෙන මූලික තාක්ෂණ පුහුණු, අන්තර් මාධ්‍ය පුහුණු හා උසස් තාක්ෂණික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ ද සහාය ඇතිව නව නිර්මාණ හඳුන්වා දීමට කටයුතු කර ඇත.

(iii) ඔව්.

(iv) ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ (ලක්සල), ජාතික ශිල්ප සභාව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ අළෙවි සැල් හා ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය හරහා මෙම කර්මාන්තකරුවන්ට නිර්මාණ අළෙවි කිරීමට පහසුකම් සලසා ඇති අතර, දේශීය හා විදේශීය වශයෙන් පවත්වනු ලබන අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ලක්සල සහ ජාතික ශිල්ප සභාව විසින් කර්මාන්තකරුවන් යොමු කිරීමට කටයුතු කර ඇත.

(ඇ) (i) නැත.

ශ්‍රී ලංකාවේ මෙම අංශයේ කර්මාන්ත සඳහා ශ්‍රම හිඟයක් පවතී.

(ii) අප අමාත්‍යාංශය යටතේ නොමැත.

(iii) ඔව්.

(iv) ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්තාවලට අනුව එක්සත් ජනපදය, සිංගප්පූරුව, එම්රේට්ස්, ජර්මනිය, ජපානය, ඕස්ට්‍රේලියාව, හොංකොං, එක්සත් රාජධානිය ආදී රටවලට ප්‍රධාන වශයෙන් අපනයනය කරයි.

(v) 2015 වර්ෂය - ඇමෙරිකානු ඩොලර් මිලියන 19.2

2016 වර්ෂය - ඇමෙරිකානු ඩොලර් මිලියන 18.4
(ශ්‍රී ලංකා අපනයන මණ්ඩල වාර්තාවලට අනුව)

(ඈ) පැන නොනඟී.

**** * පුස්තකාලයේ තබා ඇත.***
** * நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** * Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

බීජ නිෂ්පාදන අයිතිය පවරා දීම
விதைநெல் உற்பத்தி உரிமையை மாற்றுதல்
TRANSFER OF SEED PRODUCTION RIGHTS

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

දේශීය කෘෂි කාර්මික බීජ නිෂ්පාදනය විදේශීය සමාගමකට පවරා දී ඇති බවට අනාවරණය වීම හේතුවෙන් ගොවි ජනතාවට බලපාන්නා වූ ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

ශ්‍රී ලංකාවේ බිත්තර වී නිෂ්පාදනයෙන් සියයට 80ක් ගොවීන් විසින් නිෂ්පාදනය කර ගන්නා අතර, ඉතිරි සියයට 20 නිෂ්පාදනය කරනු ලබන්නේ දේශීය සමාගම් විසිනුයි. අවශ්‍ය එළවලු බීජවලින් සියයට 40ක් ගොවීන් නිෂ්පාදනය කරන අතර, ඉතිරි සියයට 60ක බීජ දේශීය එළවලු බීජ නිෂ්පාදකයන් දසදහසක් විසින් නිෂ්පාදනය කරනු ලබනවා. මේ තත්ත්වය යටතේ ශ්‍රී ලංකාව තුළ බිත්තර වී නිෂ්පාදනය සහ එළවලු බීජ නිෂ්පාදනය ප්‍රමාණවත් අයුරින් සිදුවන බව පැහැදිලි කරුණක්.

තත්ත්වය මෙසේ තිබියදී වත්මන් ආණ්ඩුව බොහෝ ක්ෂේත්‍ර විදේශීය සමාගම්වලට විකුණා දැමීමට පිඹුරුපත් සකස් කරන්නා සේම රටේ ජාතික සම්පතක් වූ බීජ නිෂ්පාදනයද විදේශීය සමාගමකට විකුණා දැමීමේ සැලැස්මක නිරතවෙමින් සිටින බවට ගොවි ජනතාව චෝදනා කරනවා.

ඒ අනුව බංග්ලාදේශයේ බංකොලොත් බීජ නිෂ්පාදන සමාගමක් වූ 'ලාල් ටියර්' නමැති සමාගමට ශ්‍රී ලංකාවේ බීජ නිෂ්පාදන අයිතිය ලබාදීමට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දී ඇති බව අනාවරණය වෙනවා. එසේම මෙම බංග්ලාදේශ සමාගමට දේශීය බීජ නිෂ්පාදන අයිතිය පමණක් නොව බීජ ආනයනය කිරීමේ අයිතිය ලබා දීමටත් ආණ්ඩුව සැලසුම් සකස් කර ඇති බව අනාවරණය වෙනවා.

මෙසේ බීජ නිෂ්පාදනයට අමතරව බීජ ආනයනය සඳහා මෙම විදේශීය සමාගමට අවසර දීම තුළින් දේශීය බීජ නිෂ්පාදනය මුළුමනින්ම බිඳ වැටීමට අවදානමක් මෙයින් ඇති වනවා. ඒ නිසා මෙම කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි විද්‍යාඥයන් සහ විශේෂඥයන් සමඟ කිසිදු සංවාදයක් නොකොට, දේශීය බීජ නිෂ්පාදකයන් හෝ බීජ නිෂ්පාදකයන්ගේ සංගම් සමඟ කිසිදු සාකච්ඡාවක් නොමැතිව බංග්ලාදේශයේ 'ලාල් ටියර්' නමැති පෞද්ගලික සමාගමට ශ්‍රී ලංකාවේ දේශීය බීජ නිෂ්පාදනයේ අයිතිය ලබා දීමට ආණ්ඩුව විසින් සිදුකරන මැදිහත් වීම බරපතළ ලෙස සැක මතු කරන කාරණාවක් වනවා.

මෙහිදී සැලකිල්ලට ගත යුතු බරපතළ කාරණය වන්නේ බීජ ජාන සම්පත් විදේශීය සමාගම්වලට කොල්ලකෑමට ඉඩ සැලැස්වීම මේ තුළින් සිදුවීමයි. ඒ කියන්නේ අපේ රටටම ආවේණික වූ ජාන සම්පත් තිබෙනවා. මෙම ජාන සම්පත් කොල්ලකෑම, රැහෙන යාම පවා මෙම සමාගම් හරහා සිදු විය හැකියි, ගරු කථානායකතුමනි.

දැනට මේ සම්බන්ධයෙන් කෙටුම්පත් කර ඇතැයි කියනු ලබන ගිවිසුම අනුව, -ගරු කථානායකතුමනි, ඒ ගිවිසුම මා සතුව තිබෙනවා. මෙක තමයි දැන් කෙටුම්පත් කළා කියන ගිවිසුම.- මෙම සමාගමට දේශීය බීජවල පේටන්ට් බලය පවා ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙනවා. ඒ කියන්නේ අපේ රටේ බීජයක් නිෂ්පාදනය කරනවා නම් එහි පේටන්ට් අයිතිය පවා මේ සමාගමට ලැබෙනවා. මේක ලංකාවේ සමාගමක් නොවෙයි, බංග්ලාදේශ සමාගමක්. අපේ රටේ බීජ නිෂ්පාදනයේ පේටන්ට් අයිතිය විදේශීය සමාගමකට ලබාදීම සඳහා දරන මේ ප්‍රයත්නය සම්පූර්ණයෙන් වැරදියි.

මෙවැනි තත්ත්වයක් තුළ ආණ්ඩුව බීජවල ජානමය අයිතිය ආරක්ෂා කර ගැනීමේ වගකීමෙන් බැහැරව ඇති බව පෙනී යනවා. ආණ්ඩුවට වගකීමක් තිබෙනවා, අපේ රටේ තිබෙන ශාකවල ජානමය වගකීම ආරක්ෂා කර දීමට. ඒක තමුන්නාන්සේලාගේ වගකීම. හැබැයි තමුන්නාන්සේලා ඒ වගකීම අත්හරිනවා. අපේ ජාන විදේශීය කොම්පැනිවලට ගෙන යාමට අවශ්‍ය වන ඉඩකඩ මෙම ගිවිසුමෙන් නිර්මාණය කරනවා.

යාන්ත්‍රික අංශයක්, පර්යේෂණ අංශයක්, ගොවිපොළ අංශයක් සහිත කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සතු අක්කර 1,000කට ආසන්න ජාතික සම්පතක් වූ මහඉලුප්පල්ලම බීජ ගොවිපොළ සතු සම්පත් පෞද්ගලික විදේශීය සමාගමකට පවරාදීමේ ක්‍රියාමාර්ගය අතිශය භයානක පියවරක් වනවා.

ගරු කථානායකතුමනි, මහඉලුප්පල්ලම ගොවිපොළ තමයි එම්අයි-1, එම්අයි-2 වැනි ඉතා වටිනා බීජ ප්‍රභේද අපේ රටට හඳුන්වා දුන්නේ. එතැන පර්යේෂණ ආයතන තිබෙනවා, ගොවිපොළ තිබෙනවා. නමුත් තමුන්නාන්සේලා කරන්න හදන්නේ මොකක්ද? මෙම ගොවිපොළෙන් විශාල ඉඩම් ප්‍රමාණයක් මෙම සමාගමට ලබා දෙන්නට සැලසුම් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙම ගිවිසුම අනුව අවුරුදු 150ක කාලයකට, -මා මේකේ 50 කියලා සඳහන් කළාට ඇත්තම ගිවිසුමේ තිබෙන්නේ අවුරුදු 150ක කාලයකට කියලා.- මේ ගොවිපොළ ලබා දීමට තමුන්නාන්සේලා කටයුතු කරනවා.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

1. බංග්ලාදේශ බීජ නිෂ්පාදන සමාගමක් වන 'ලාල් ටියර්' නමැති ආයතනයට දේශීය බිත්තර වී නිෂ්පාදනය සඳහා අවස්ථාව ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා දී තිබෙද්ද? ඒ කවර කොන්දේසි යටතේද?

2. කෙටුම්පත් කරනු ලැබ ඇති ගිවිසුම සභාගත කරනු ලබන්නේද? දැනට එකඟතාවකට ඇවිත් තිබෙන ගිවිසුම සභාගත කරන්නේද?

3. දැනට දේශීය බීජ නිෂ්පාදනයේ අතිරික්තයක් තිබියදී මෙවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට හේතු වූ කරුණු කවරේද?

4. අදාළ බංග්ලාදේශ සමාගමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් මහඉලුප්පල්ලම බීජ ගොවිපොළෙන් අක්කර 300ක් වසර 50ක කාලයක් සඳහා, -වසර 50ක් කියා සඳහන් කළාට ගිවිසුම බැලුවාම පෙනෙනවා, වසර 50ක් නොවෙයි වසර 150ක කාලයක් සඳහා බව.- ලබා දීමට සැලසුම් කර තිබෙද?

5. එවැනි දීර්ඝ කාලයක් සඳහා රජය සතු වටිනා කෘෂි කාර්මික පර්යේෂණ භූමියක් විදේශීය සමාගමකට පවරාදීමේ පදනම කුමක්ද?

මම මේ ප්‍රශ්නවලට පිළිතුරු ගරු කෘෂිකර්ම ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමැතියි ගරු කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We will answer in the next Sitting day.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, දැන් කෘෂිකර්ම ඇමතිවරයෙක් පත් කරලා තිබෙනවා. ඒ ඇමතිවරයා සඳහා මසකට රුපියල් මිලියන 24ක් වැය වන කාර්යාලයක් මීලඟට අරගෙන තිබෙනවා. නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා. හැබැයි, මෙය මේ රටට බලපාන - තමුන්නාන්සේලාගේ දේපළක ඔප්පුවක් ලියනවා නම් අපට ප්‍රශ්නයක් නැහැ-මහඉලුප්පල්ලම ගොවිපළේ අක්කර 300කට ආසන්න ප්‍රමාණයක් බංග්ලාදේශ සමාගමකට ලබා දීම පිළිබඳව ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කරන්න යනවා.

ගරු කථානායකතුමනි, ඇමතිතුමා ඇවිල්ලා උත්තර දෙන්නේ ගිවිසුම අත්සන් කළාට පසුවද කියා මම දැනගන්න කැමතියි. එහෙම නැත්නම් මේ පිළිතුර ලබා දීමට පෙර ගිවිසුම අත්සන් කරන්නේ නැහැ කියලා කියන්න ඕනෑ. එහෙම නැතිව පිළිතුර ලබා දීම පසුවට අරගෙන ඒ ගිවිසුම අත්සන් කළොත් මොකද කරන්නේ?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම එතුමාට ඔබතුමාගේ අදහස දන්වන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මගේ අදහස නොවෙයි. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ අදහස මොකක්ද? [බාධා කිරීමක්] ඒ ගැන අදහසක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම් සභානායකතුමා ඇමතිතුමා සමඟ සාකච්ඡා කරලා, ඒ කාරණය සම්බන්ධයෙන් දැනුවත් කරන්න. එහෙම හොඳයි නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඒ කාරණය සම්බන්ධයෙන් ඇමතිතුමාට දන්වන්නම්. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අද මේ ප්‍රශ්නයට උත්තර ලබා දෙන්න ඕනෑ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
අද මේ ප්‍රශ්නයට උත්තර ලබා දෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මහඉලුප්පල්ලම ගොවිපළේ බීජ පර්යේෂණ ආයතනය බිඳ වට්ටලා, බංග්ලාදේශ සමාගමකට දෙන්න තමුන්නාන්සේලා සැලසුම් කරලා තිබෙනවා. හැබැයි, තමුන්නාන්සේලාගෙන් මම ප්‍රශ්නය අහලා තිබියදී උත්තර ලබා නොදී ඒ ගිවිසුම අත්සන් කළොත්, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඒ සම්බන්ධයෙන් විවාදයක් ලබා දෙන්නම්. [බාධා කිරීම්] අපි විවාදයක් ලබා දෙන්නම්. [බාධා කිරීම්] මේ සම්බන්ධයෙන් විවාදයක් ලබා දෙන්නම්. එච්චරයි මට කියන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි ඒ සම්බන්ධයෙන් විවාදයක් ලබා දෙන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගිවිසුම අත්සන් කළාට පසුවද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, you can convey that to the Hon. Minister of Agriculture.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් විවාදයක් ලබා දෙන්න අපි ඕනෑම වේලාවක සූදානම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගිවිසුම අත්සන් කිරීමට පෙරද, පසුවද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ සම්බන්ධයෙන් මම සාකච්ඡා කරලා කියන්නම්. ඔබතුමා ඒ ගැන දන්නවානේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් පිළිතුරු ලබා දෙන්න බැහැ. එතුමා දැන් ඇමතිතුමා එක්ක ඒ සම්බන්ධයෙන් කථා කරයි. [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද අපි වරාය ගැනත් සාකච්ඡා කරන්න විවාදයක් ලබා දෙනවා. අපි බය නැහැ, විවාදවලට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කාරණය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාව දැනුවත් කරන්න. [බාධා කිරීම්] ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, "විවාදයක් ලබා දෙනවා" කියා සභානායකතුමා කියනවා. හැබැයි, මෙතුමා එකඟතාවකට එන්න ඕනෑ, "අපි ඒ විවාදය ලබා දෙන්නේ ගිවිසුම අත්සන් කිරීමට පෙර" කියලා. නමුත් "ඒ සම්බන්ධයෙන් පසුව කියන්නම්" කියලා එතුමා කියනවා. එහෙම පසුව කරන විවාදවලින් වැඩක් නැහැ. මෙම ගිවිසුම අත්සන් කිරීමට පෙර ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේදී විවාදයට ලක් කළ යුතුයි. මේ රටේ බීජ සම්පතත්, අපේ රටේ බීජවල ජානමය අයිතියත් පැවරීම සඳහා තමයි තමුන්නාන්සේලා කටයුතු කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමාට පුළුවන් නම් ඇමතිතුමාට කථා කරලා මේ කාරණය සම්බන්ධයෙන් දැනුවත් කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපට හංගන්න දෙයක් නැහැ. හැම දාම මේ වාගේ දේවල් මතු කරනවා. අපට හංගන්න දෙයක් නැහැ. අපි ඒ සම්බන්ධයෙන් විවාදයක් ලබා දෙනවා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ කාලයේ Port City එක හැදුවා. Port City එක සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වචනයක්වත් කිව්වේ නැහැ. අද අපි හම්බන්තොට වරාය ගැන විවාද කරන්න අවස්ථාව ලබා දෙනවා. විවාදයක් ඉල්ලන්නේ නැතිවයි අපි ඒ අවස්ථාව ලබා දෙන්නේ.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු කථානායකතුමනි, මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනයේ තමයි පේරාදෙණිය කෘෂි විද්‍යා පීඨයේ සිසුන් වසරක් අධ්‍යාපනය ලබන්නේ. මේ ආයතනය බංග්ලාදේශ සමාගමකට දීම ඇත්තටම ජාතික අපරාධයක්. මේ ගැන විවාද කරලා වැඩක් නැහැ. ඒක නිසා අපි ආණ්ඩුවෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර මේ වාගේ තීන්දු තීරණ ගන්න එපා කියලා. මේක ජාතික ව්‍යසනයක්. විවාද කරලා බංග්ලාදේශ සමාගමට දීලා වැඩක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඇමතිතුමාව දැනුවත් කරන්න. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, මමත් කථා කරලා කියන්න උත්සාහ කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කථා කරලා කියන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. පාර්ලිමේන්තුවේ සභානායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament and the motion agreed to by Parliament on 08.03.2016, the hours of sittings of Parliament on this day shall be 10.30 a.m. to 6.30 p.m. At 11.30 a.m. Standing Order No. 7(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 7 of the Parliament, and the motion agreed to by Parliament on 08.03.2016, the Parliament shall sit on August 04th Friday, 2017 and the hours of sitting this day shall be 10.30 a.m. to 12.30 p.m. At 12.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That this Parliament at its rising this day do adjourn until 10.30 a.m. on Friday 04th August, 2017."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද රීති ප්‍රශ්නය, ගරු මන්ත්‍රීතුමියනි?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අම්පාර දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් පසු ගිය 7වැනි දා පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 23(2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා. නමුත් ඒ අහපු ප්‍රශ්නයට උත්තර මේ දක්වා ලැබුණේ නැහැ, ගරු කථානායකතුමනි. [බාධා කිරීම්] ඇයි මේ? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමාට අවස්ථාව දුන්නා. ඊට පස්සේ මම අනෙක් මන්ත්‍රීවරුන්ට අවස්ථාව දෙන්නම්.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, පෙරේදා එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න සූදානම්නුයි සිටියේ. පෙරේදා විපක්ෂයේ මන්ත්‍රීවරුන් ප්‍රශ්න ඇති කරලා පාර්ලිමේන්තුව කල් තියන්න සිද්ධ වුණා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, කාන්තාවක් කථා කරන කොට හැසිරෙන්නේ කොහොමද කියලා පළමුව මන්ත්‍රීවරුන් දැන ගන්න ඕනෑ. [බාධා කිරීම්] පළමුවැනි කාරණය එයයි. [බාධා කිරීම්] මම ඒක වග කීමෙන් කියනවා. [බාධා කිරීම්] මම ඒක වග කීමෙනුයි කියන්නේ. අපට දේශපාලන වශයෙන් විවිධ මත භේද තිබෙන්න පුළුවන්. ගරු කථානායකතුමනි, අපි හැසිරෙන්නේ මෙහෙම නම්, ඔබතුමා ගෙනෙන්න යන ආචාර ධර්මවලින් වැඩක් නැහැ. මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළාම -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට මතකයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කිහිප වතාවක් සභානායකතුමා කිව්වා, පිළිතුරු දෙනවා කියලා. හැම දාම කියනවා, "හෙට, හෙට, හෙට, හෙට" කියලා. කවදාටද, "හෙට" කියලා කියන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයට එදා පිළිතුරු දෙන්න බැරි වුණේ, එදා කලබලය නිසාය කියලා සභානායකතුමා කියනවා. [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කවදාද උත්තරය දෙන්න පුළුවන්?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කවදාද උත්තර දෙන්න පුළුවන් වන්නේ? [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sit down! Let me answer. - [*Interruption.*] Sir, we were ready to answer that Question the day before yesterday. The Hon. Faiszer Musthapha was here to answer that. They are the people who created problems in Parliament on that day. -[*Interruption.*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර කවදාද දෙන්න පුළුවන්?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Today, the Hon. Faiszer Musthapha is out of the country.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can answer that on the first day of the next Sitting Week.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනික් කාරණය මෙකයි. මේ අම්පාරේ තිබෙන bus stand එකක් ගැන අහන්නේ, ගරු කථානායකතුමනි. ලජ්ජයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අප ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේ පළමුවැනි දවසේ එම ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කටයුතු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවදාද කියන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේ පළමුවැනි දවසේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ප්‍රශ්නය ඉදිරිපත් වෙන්න ඕනෑ සම්බන්ධීකරණ කමිටුවටයි.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන පිළිතුරක් දෙන්න පුළුවන් නේ, ගරු සභානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මේ ප්‍රශ්නයට පිළිතුරක් දෙන්න හිටියේ පෙරේදා. පෙරේදා මෙතුමන්ලා ප්‍රශ්න ඇති කළ නිසා නේ, පාර්ලිමේන්තුව කල් තැබුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිතුර ලබන වාරේ දෙන්න පුළුවන් නේ. එය ලබා දෙන්න, ගරු සභානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හොඳයි, මම ගරු ඇමතිතුමාට දන්වන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර ලබාදෙයි, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි. මමත් එයට වග කියනවා. ලබන පාර්ලිමේන්තු වාරයේ පිළිතුර ලබාදීමට අප කටයුතු කරන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කීවැනි දිනයේද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මට කියන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. සභානායකතුමා තමයි දන්වන්න ඕනෑ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඊළඟ පාර්ලිමේන්තු සතිය ඇතුළත; during the next Sitting Week.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ විධියට කටයුතු කරමු, ගරු සභානායකතුමනි.

යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු.

අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනාව. විවාදය කල් තබන ලද ප්‍රශ්නය.

අත්‍යවශ්‍ය මහජන සේවා පනත : යෝජනාව
அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
ESSENTIAL PUBLIC SERVICES ACT : RESOLUTION

කල් තබන ලද විවාදය නවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී
ඊට අදාළ ප්‍රශ්නය [2017 ජූලි 27]

ඔත්තිවෙක්කප්පට්ට විවාදම් මීළත් තොටංකුතර්කාන කට්ටළෙ වාසික්කප්පට්ටදු.
සම්පන්දප්පට්ට විනා - [2017 යූලෙ, 27]

Order read for resuming Adjourned Debate on Question - [27th July, 2017]

"1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය යටතේ පෙට්‍රෝලියම් නිෂ්පාදන හා ද්‍රව වායු ඇතුළු සියලුම ඉන්ධන සැපයුම හා බෙදා හැරීම සහ රේගු ආඥා පනතේ අරමුණු සඳහා වරායක් ලෙස නිර්වචනය කර ඇති ඕනෑම වරායක් තුළ නැවකින් තෙල් හෝ ඉන්ධන බැහැර කිරීම, ප්‍රවාහනය කිරීම, ගොඩ බෑම, ගබඩා කිරීම, හාරදීම හෝ ඉවත් කිරීමට අදාළව සිදු කළ යුතු හෝ අත්‍යවශ්‍ය වන සියලුම සේවාවන්, වැඩ හෝ ඕනෑම ආකාරයක ශ්‍රමය යෙදවීම යන සේවාවන් සැපයීමෙහි නිරත වන ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් සාමාන්‍ය ජන ජීවිතය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන බව සැලකිල්ලට ගනිමින් හා එම සේවාවන් සැපයීමට අවහිරයක් හෝ බාධාවක් ඇතිවීමට හැකියාවක් පැවතීම හේතුවෙන් ඕනෑම රාජ්‍ය සංස්ථාවකින් හෝ රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පළාත් පාලන ආයතනයකින් හෝ සමුපකාර සමිතියකින් හෝ ඒවායෙහි ශාඛාවකින් සපයනු ලබන සේවාවන් ඉහත කී වගන්තියෙහි කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය සේවාවන් බවට ජනාධිපතිවරයා විසින් 2017 ජූලි 25 දිනැති අංක 2029/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මඟින් 2017 ජූලි 25 දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු යැයි, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි. "(2017 ජූලි 26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

"1979ஆம் ஆண்டின் 61ஆம் இலக்க அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டத்தின் பிரிவு 2 இன் கீழ் பெற்றோலிய உற்பத்திகள் மற்றும் திரவ எரிவாயு உட்பட அனைத்து வகையான எரிபொருள் வழங்கல் மற்றும் விநியோகம் மற்றும் சுங்கக் கட்டளைச்சட்டத்தின் நோக்கங்களுக்காகத் துறைமுகம் என வரைவிலக்கணப்படுத்தப்பட்டுள்ள எந்தவொரு துறைமுகத்திலும் கப்பலில் இருந்து எண்ணெய் அல்லது எரிபொருளை அகற்றுதல், கொண்டுசெல்லல், இறக்குதல், களஞ்சியப்படுத்தல், ஒப்படைத்தல் அல்லது அகற்றுவதுடன் தொடர்பாக மேற் கொள்ள வேண்டிய அல்லது அத்தியாவசியமான அனைத்து சேவைகள், வேலைகள் அல்லது எந்த வகையிலுமான ஊழியத் தைப் பயன்படுத்தல் போன்ற சேவைகளை வழங்கும் நடவடிக்கைகளில் ஈடுபட்டுள்ள எந்தவொரு அரச கூட்டுத் தாபனத்தினூடாக அல்லது அரச திணைக்களத்தினூடாக அல்லது உள்ளூராட்சி நிறுவனத்தினூடாக அல்லது கூட்டுறவுச் சங்கத்தினூடாக அல்லது அவற்றின் கிளையினூடாக வழங்கப்படும் சேவைகள் பொது மக்களின் இயல்பு வாழ்க்கைக்கு அத்தியாவசியமெனக் கருத்திற்கொண்டு மற்றும் அந்தச் சேவைகளை வழங்குவதற்கு இடைஞ்சல் அல்லது தடைகள் ஏற்படுவதற்கான வாய்ப்பு நிலவுவதன் காரணமாக எந்தவொரு அரச கூட்டுத்தாபனத்தினூடாக அல்லது அரச திணைக்களத்தினூடாக அல்லது உள்ளூராட்சி நிறுவனத்தி னூடாக அல்லது கூட்டுறவுச் சங்கத்தினூடாக அல்லது அவற்றின் கிளையினூடாக வழங்கப்படும் சேவைகள் மேலுள்ள உறுப்புரையின் அலுவல்கள் தொடர்பில் அத்தியாவசிய சேவைகளாக சனாதிபதியினால் 2017 யூலை 25ஆம் திகதிய 2029/23ஆம் இலக்க

அதிவிசேட வர்த்தமானப் பத்திரிகையில் பிரசுரிக்கப்பட்ட கட்டளையின் ஊடாக, 2017 யூலை மாதம் 25ஆம் திகதி முதல் இலங்கை முழுவதும் அமுல்படுத்தி மேற் கொள்ளப்பட்ட பிரகடனம் அங்கீகரிக்கப்பட வேண்டுமென இப்பாராளுமன்றம் பிரேரணை நிறைவேற்றுமாக. "(2017 யூலை 26 ஆம் திகதி பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டது)"

[මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල]

"That this Parliament resolves that the proclamation made by the President in the form of an order under Section 2 of the Essential Public Services Act, No. 61 of 1979 which was published in the Gazette Extraordinary No. 2029/23 of 25th July 2017 throughout Sri Lanka with effect from 25th July 2017 declaring the services of any Public Corporation or Government Department or Local Authority or Co-operative Society or any branch thereof being a Department or Corporation or Local Authority or Co-operative Society, which is engaged in supply or distribution of fuel including petroleum products and gas and all services, work, labour of any description whatsoever, necessary or required to be done in connection with the discharge, carriage, landing, storage, delivery and removal of oil or fuel from vessels within any port as defined for the purposes of the Customs Ordinance, considering that those services are essential to life of the community and are likely to be impeded or interrupted, be approved. "(Presented to the Parliament on 26th July 2017.)"

[The Hon. Lakshman Kiriella]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.
විනා මීණ්ඩුම් එඩුත්තියම්පප්පට්ටදු.
Question again proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟයිද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Divide!

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊයේ මෙම විවාදය කල් දැමීමට ඔබතුමා විසින් ඉදිරිපත් කළ සාධකය තමයි, ඡන්ද විමසීමටයි කල් දමන්නේ, තවත් කථිකයන් කථා කරන්න ඉන්නවා කියන එක.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කථිකයෝ නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඊයේ හවස මේ යෝජනාව පිළිබඳව ඡන්දය ගන්නේ නැතිව, අද තිබෙන මේ විවාදයත් පැත්තකට දමලා කාලයක් ගත්තේ තමුන්නාන්සේලා කථා කරන්න අරගෙන -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, ගරු සභානායකතුමනි. මම තවම කියලා ඉවර නැහැ. මම ඊයේ නිශ්චිත ප්‍රශ්න කීපයක් ඇහුවා. මම බලාගෙන හිටියා අද ඒවාට උත්තර දෙයි කියලා. මැර කණ්ඩායම් ආපු විධිය, මැර කණ්ඩායම්වල නම්, ඔවුන් ගෙනාපු අය, පහර දෙන්න සම්බන්ධ වුණු අය, ඔවුන් මාධ්‍යයට දුන් ප්‍රකාශ, ඔවුන් පොලීසියට රැකවරණ දුන් ඒවා කියන මේ සියල්ල ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, අප ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. අගමැතිවරයාත්, පොලීසිය භාර ඇමතිවරයාත් හිටියේ නැහැ. අප අවධානය යොමු කෙරෙව්වේ වෙන මොකක්වත් ගැන නොවෙයි, මේ පහර දුන් මැර කණ්ඩායම්වලට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියන එක ගැනයි. අප බලාපොරොත්තුවෙන් හිටියේ අද ඇවිත් කථා කරලා ඒ ගැන කියයි කියලායි. නමුත්, ඒ ගැන කියන්නේ නැතිව, මෙය සම්මත කර ගන්න දරන උත්සාහය වැරැදියි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අගමැතිතුමා ඊයේ උත්තර දුන්නා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අගමැතිතුමාගේ කථාවෙන් පසුව මම කථා කළේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I moved Item No. 1.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් මොකක්ද අප කරන්න බලාපොරොත්තු වන්නේ, ගරු සභානායකතුමනි? We have to take a Division.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි,-[බාධා කිරීමක්] මා ඊයේ පැහැදිලිවම ඡායාරූප සහිතව ඉදිරිපත් කළා. මේ මගේ අතේ තිබෙන ඡායාරූපයේ ඉන්නේ මැර කණ්ඩායම්. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We can have another debate on that.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇමතිවරයෙක් පාර්ලිමේන්තුවේ කිව්වාට පසුව මේ පිළිබඳව අගමැතිවරයා හෝ පොලීසිය භාර ඇමතිවරයා හෝ උත්තරයක්

දෙන්න ඕනෑ. ඒවා පාර්ලිමේන්තුවේ කියලා නිකම් සම්මත කර ගැනීමේ තේරුමක් තිබෙනවාද? මේ පාර්ලිමේන්තුවට කියන්න ඒ මැර කණ්ඩායම සම්බන්ධයෙන් ගත්ත පියවර මොකක්ද කියලා. තමුන්නාන්සේලා- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ. ඒ නිසා හැමෝම තීරණය කරන්න- [බාධා කිරීම්]

ගරු සාගල රත්නායක ඇමතිතුමනි, ඔබතුමා මේ ගැන පැහැදිලි කිරීමක් කරන්න බලාපොරොත්තු වෙනවාද?

ගරු සාගල රත්නායක මහතා
(මාණ්පුමිකු සාකල රත්නායක්ක)
(The Hon. Sagala Ratnayaka)
ගරු කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් විමර්ශන අවසන් වූ පසු මා පාර්ලිමේන්තුවට පිළිතුරු දෙන්නම්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නම් අපි ප්‍රධාන කටයුතුවලට යමු. [බාධා කිරීම්] There was a request for a Divison. Division එකක් ඉල්ලුවා. Division එක දුන්නා. Division එක මම approve කළා. අද ආපසු ඒ ගැන- [බාධා කිරීම්] ගරු සාගල රත්නායක ඇමතිතුමා කියනවා, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ ඉවර වුණාට පස්සේ සභාවට පිළිතුරක් දෙන්නම් කියලා. [බාධා කිරීම්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, - [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
අපි පැහැදිලි ලෙස කිව්වා, වැලිකඩ පොලිස් ස්ථානයේ OIC පළාත් සභා මන්ත්‍රීවරයකුට බිත්තියට හේත්තු කරලා පහර දුන්නා කියලා. [බාධා කිරීම්] අත් අඩංගුවට ගත්ත අයට පහර දුන්නා. ඒ OIC තියාගෙන පරීක්ෂණ කරන්නේ කොහොමද? ඒ OIC තියාගෙන පරීක්ෂණ කරන්න බැහැ නේ. මැරයෝ තියාගෙන පරීක්ෂණ කරන්නේ කොහොමද? ඒ නිසා මෙය පැහැදිලි ලෙස- [බාධා කිරීම්] මොකක්ද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ස්වාධීන පරීක්ෂණයක් කරලා වාර්තාව දෙන්නම්. අද සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
සභාවේ වැඩකටයුතු කරගෙන යන්න ඕනෑ තමයි. හැබැයි, ගරු කථානායකතුමනි, මැර කණ්ඩායම් දාලා ප්‍රහාර එල්ල කරලා තිබෙනවා නම්, තමුන්නාන්සේලා ආණ්ඩුව හැදුවේ ඒකටද? [බාධා කිරීම්]

ගරු සාගල රත්නායක මහතා
(මාණ්පුමිකු සාකල රත්නායක්ක)
(The Hon. Sagala Ratnayaka)
පින්තූරයක් පෙන් වූ පළියට මට මිනිසුන්ගේ නම් කියන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
We will go ahead and take the Division.

බෙදුම් සීනු නාද වෙද්දී -
பிரிவுமணி ஒலிக்கும்போது -
while the Division Bells were ringing -

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
කවුද, Bell එක ගහන්න කිව්වේ? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Division එක ඉල්ලුවා නේ. I gave that to the Opposition. [බාධා කිරීම්] නැහැ, එහෙන් ඉල්ලුවා. [බාධා කිරීම්] නීතිය හා සාමය පිළිබඳ ගරු අමාත්‍යතුමා කිව්වා, මේ ගැන පරීක්ෂා කරලා සභාවට වාර්තාවක් ඉදිරිපත් කරනවා කියලා. එතුමාට ඊට වඩා පිළිතුරක් දෙන්න බැහැ. අපි මේ සභාවේ වැඩ කටයුතු කරගෙන යන්නත් ඕනෑ. මේ විධියට- [බාධා කිරීම්] මා එතුමාගෙන් ඉල්ලීමක් කළා. එතුමා ඒ සහතිකය දුන්නා. මෙතැනින් එහාට සභාවේ වැඩ කටයුතු කරගෙන යන්න- [බාධා කිරීම්]

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, අපි සභාවෙන් නිශ්චිත ප්‍රශ්න ටිකක් අහලා තිබුණා. ඒක තමයි මේ විවාදයේ වැදගත්ම දේ.[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එතුමාට දෙන්න පුළුවන් පිළිතුර දුන්නා. පරීක්ෂා කර බලා එතුමා වාර්තාවක් ඉදිරිපත් කරයි. ගරු ඇමතිතුමාට දැන් ඊට වඩා පිළිතුරක් දෙන්න බැහැ. තමුන්නාන්සේලාත් සාධාරණ වෙන්න.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
සාධාරණ වෙලා තමයි- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක තමයි මම මෙච්චර වෙලා කියන්නේ. [ඝෝෂා කිරීම්] ඊයේ පාර්ලිමේන්තුව කලින් අවසන් වෙන්න හේතුවක් තිබුණා. ඊයේ ගරු අගමැතිතුමාට සම්බන්ධ උත්සවයක් තිබුණා. ආණ්ඩු පක්ෂයේ සියලු දෙනාටම අගමැතිතුමා වෙනුවෙන් පැවැත්වුණු ඒ උත්සවයට යන්න සිද්ධ වුණා. ඒකයි ප්‍රධාන හේතුව. ඊයේ එකඟ වුණා අද උදේ ඡන්දයක් ගන්නවා කියලා. [ඝෝෂා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඊයේ පැහැදිලිව කිව්වා, ඡන්ද විමසීමක් නොකර මේ විවාදය අදට කල් දමන්න කියලා. ඒ කිව්වේ, පිළිතුරු දෙන්න කථිකයන් දෙදෙනෙක් ඉන්නවා කියලා.

පෙරේදා මහජන ආරක්ෂක ආඥාපනත යටතේ පිරිසක් අත් අඩංගුවට ගත්තා. වර්ජනය කළ අයට ගහන්න ආපු මිනිස්සු කවුරුවත් අත්අඩංගුවට ගත්තේ නැහැ. [ඝෝෂා කිරීම්] ඔවුන්ගෙන් ප්‍රශ්න කළේ නැහැ. [ඝෝෂා කිරීම්] පොලීසිය හාර ඇමතිතුමා අද,- [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
We have moved Item No 1. We cannot raise points of Order now. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථානායකවරයා වශයෙන් මට ඇමතිතුමාට උපදෙස් දෙන්න පුළුවන් වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. That I have instructed. දැන් සභාවේ වැඩ කටයුතු පවත්වාගෙන යන්න ඕනෑ. දැන් ඡන්දය ගැනීම ආරම්භ වෙනවා. [ඝෝෂා කිරීම්] දැන් ඡන්දය පටන් ගන්න වෙනවා. ගරු අමාත්‍යතුමා කිව්වා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරනවා කියලා. So, we have to take the Vote now. අද ඡන්දය ගන්න වෙනවා. දැන් Division එකක් ඉල්ලුවා. [බාධා කිරීම්] නැහැ, දැන් Division එකක් ඉල්ලුවා._ [බාධා කිරීම්] හරි, දැන් ඡන්දය පටන් ගන්න. මේ විධියට කටයුතු කරන්න බැහැ නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
Mikes තිබුණෙත් නැහැ. Division එකක් ඉල්ලුවේත් නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, Division එකක් ඉල්ලුවා. [බාධා කිරීම්] - ඊට පස්සේ තමයි මම ඔබතුමාට කථා කරන්න අවස්ථාව දුන්නේ. [බාධා කිරීම්] Yes, Hon. Prime Minister.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, දැන් ඡන්දය ගන්න වෙලාව. [බාධා කිරීම්] පාර්ලිමේන්තු ස්ථාවර නියෝග කඩන්න බැහැ. මේකෙන් අලුත් සම්ප්‍රදායක් ඇති වෙයි. අපි ඒකට විරුද්ධයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා වාඩි වෙලා ඡන්දය ප්‍රකාශ කරන්න. ඊට පස්සේ මේ ගැන කථා කරන්න පුළුවන්. [බාධා කිරීම්] මේ කටයුතු අවසන් කරලා පක්ෂ නායක රැස්වීමක් කැඳවන්නම්. පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී මේ ගැන කථා කරලා විසඳා ගනිමු. පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරගෙන යන්න ඉඩ දෙන්න. ගිය සතියේත් මේ දේමයි වුණේ. [බාධා කිරීම්] Division එකක් ඉල්ලුවා. Division එකක් ඉල්ලුවාම මම අනුමැතිය දුන්නා. [බාධා කිරීම්] එතකොට අදාළ අමාත්‍යවරයා කිව්වා, "යථා කාලයේදී පිළිතුරු දෙනවා" කියලා.

Now, we will go for the Vote. දැන් ඡන්ද විමසීම පටන් ගන්න. කරුණාකරලා වාඩි වෙලා ඡන්ද විමසීම පටන් ගන්න. [ඝෝෂා කිරීම්] නැත්නම් අපට ආපහු- [ඝෝෂා කිරීම්] ඔව්, ඡන්දය දෙන අය දෙයි; අනෙක් අය නිකම් ඉඳියි.- [ඝෝෂා කිරීම්] පෙරේදාත් වුණා මේ වැඩේ. [ඝෝෂා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. "Divide" කියලා ඉල්ලුවා. [ඝෝෂා කිරීම්] විපක්ෂයෙන් "Divide" කියලා ඉල්ලුවා. ඊට පස්සේ තමයි ඔබතුමාට ඉඩ දුන්නේ පැහැදිලි කිරීමකට. [ඝෝෂා කිරීම්] මම ඒ අවස්ථාව දුන්නා. කරුණාකරලා වාඩි වෙලා ඡන්දය දෙන්න. ඊට පස්සේ අපි පක්ෂ නායක රැස්වීමක් පවත්වලා මේ ගැන කථා කර ගනිමු. [ඝෝෂා කිරීම්] මෙසේ බාධා කරන එකෙන් කිසි ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. තමුන්නාන්සේලාට ප්‍රයෝජනයක් වෙන්නෙත් නැහැ; ජනතාවට ප්‍රයෝජනයක් වෙන්නෙත් නැහැ. නිකම් මහජන මුදල් නාස්ති කිරීමක් විතරයි වෙන්නේ. [ඝෝෂා කිරීම්] අදාළ අමාත්‍යවරයාගෙන් මම ඉල්ලීමක් කළා, වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා. එතැනින් එහාට- [ඝෝෂා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එක මොකක්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඡන්දය ගැනීමට තවම කැඳවලා නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කැඳෙව්වා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අර පුවරුවේ "Voting in Progress" කියලා සටහන් වෙලා තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Standing Ordersවල ඉතා පැහැදිලිව තිබෙනවා. ඡන්දය ගැනීම තවම පටන් අරගෙන නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් පටන් අරගෙන තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සීනුව නාද කළා කියලා ඡන්දයකට යා යුතු නැහැ. ඡන්දය පටන් ගත්තාට පස්සේ තමයි ඔබතුමාට යමක් කරන්න බැරි. It is clearly stated in the Standing Orders.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ. මම Order එකක් දීලා තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, නැහැ. It is clearly stated in the Standing Orders. ඡන්ද විමසීම පටන් අරගෙන නැහැ. ඒ ගැන Standing Orders හරිම clear. එම නිසා ගරු කථානායකතුමනි, ආණ්ඩුවට උත්තර දෙන්න කියන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා යථා කාලයේදී පිළිතුරු දෙනවා කිව්වා. අද එතුමාට පිළිතුරු දෙන්න බැහැ. [සෝෂා කිරීම්]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,- [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Division එකක් ඉල්ලුවා නේ. [සෝෂා කිරීම්] ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, මට ඇහෙන්නේ නැහැ. [සෝෂා කිරීම්]

ගරු බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)
ප්‍රකාශක කියනවා, කිසිම පැමිණිල්ලක් නැහැ; අත් අඩංගුවට ගන්න බැහැ කියලා. ඔබතුමා ඒ කරුණ මතු කරන්නවත් ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතකොට- [සෝෂා කිරීම්]

[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ සෝෂා කරන්නට වූහ.]
[இச்சந்தர்ப்பத்தில் எதிர்த்தரப்பு உறுப்பினர்கள் சிலர் சபாமண்டபத்தின் மத்திக்கு வந்து கோஷமிட்டனர்.]
[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඔබතුමා පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි පක්ෂ නායක රැස්වීමක් කැඳවමු. [සෝෂා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ආණ්ඩුවට වගකීම ගන්න කියන්න, ගරු කථානායකතුමනි. [සෝෂා කිරීම්] ඒ වගකීම ගන්න කියන්න. එතකොට ඉවරයි මේක.[සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා. [සෝෂා කිරීම්] නැහැ, නැහැ. කල් දමන්න බැහැ. [සෝෂා කිරීම්] ගරු අග්‍රාමාත්‍යතුමා - [සෝෂා කිරීම්] Voting system එක වැඩ කරන්නේ නැද්ද? [සෝෂා කිරීම්] We will take the Vote by name. මා Vote එක අරගෙන-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ස්ථාවර නියෝග 43 යටතේ - [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා order කළා. [සෝෂා කිරීම්] උත්තරයක් දුන්නා. [සෝෂා කිරීම්] සාමය පිළිබඳ ඇමතිතුමා කිව්වා, පිළිතුරක් දෙනවාය කියලා. ඊට පස්සේ මා ඒ ගැන සාකච්ඡා කරන්නම්. [සෝෂා කිරීම්] එහෙම කරන්න බැහැ. [සෝෂා කිරීම්] අපි කථා කරමු. Hon. Prime Minister, දැන් ඡන්දයක් ගන්න වෙනවා. [සෝෂා කිරීම්] By name තමයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
We agree. - [*Uproar*]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දයක් ගන්න instructions දුන්නා. [සෝෂා කිරීම්] කොහොමත් ඡන්දයක් ගන්න වෙනවා. අපට Vote එක by name ගන්න වෙනවා. [සෝෂා කිරීම්] මා කැඳවන්නම්, පක්ෂ නායක

[ගරු කථානායකතුමා]

රැස්වීමක්. [සෝෂා කිරීම්] මට අමාත්‍යවරයාට උපදෙස් දෙන්න පුළුවන්, පැහැදිලි කරන්න කියලා. [සෝෂා කිරීම්] නමින් ඡන්දය ගන්න වෙනවා. හොඳයි. [සෝෂා කිරීම්] Vote එක ගන්න. [සෝෂා කිරීම්] අපට vote එකක් ගන්න වෙනවා. Vote එකක් අරන් ඊට පස්සේ ඒ ගැන බලමු. [සෝෂා කිරීම්] අපි Vote එකක් අරන්, ඊට පස්සේ කථා කරමු. අපි ඡන්දය අරගෙන ඊට පස්සේ සාකච්ඡාවක් දෙන්නම්. [සෝෂා කිරීම්] We will take the Vote by name. [සෝෂා කිරීම්] මම මුලදී මේ ගැන කිව්වා, Division ඉල්ලුවා, පැහැදිලි කිරීමකට ඉඩ දුන්නා. එතැනින් එහාට මට මෙතැන ඉඳලා කරන්න දෙයක් නැහැ. [සෝෂා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
We will put it to the House and " 'Ayes' had it." කියලා ඉවර කරන්න කෝ. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුව මම කටයුතු කළා. ඒ නිසා මේක අවසානයක් කරන්න ඕනෑ. හැමදාම මේ විධියට යන්න බැහැ නේ. පෙරේදාත් මේ සිද්ධියම වුණා. We will take the Vote by name. [සෝෂා කිරීම්] ඡන්දය ගන්න. [සෝෂා කිරීම්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
එහෙම ඡන්දය ගන්න බැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට පුළුවන්. මම Vote එක ඉල්ලුවා. [සෝෂා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, බල-බලා ඉන්නේ, නමින් ඡන්දය ගන්න කෝ. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ඉස්සෙල්ලාම වාඩිවෙන්න. වාඩිවෙලා කථා කරන්න. නැත්නම් පසුව මට දෝෂාරෝපණය කරන්න එපා. [සෝෂා කිරීම්] කරුණාකරලා වාඩිවෙන්න. [සෝෂා කිරීම්] මම 5වැනි වතාවට කියන්නේ, වාඩි වෙන්න. පෙරේදාත් මේ සිද්ධියම වුණා. [සෝෂා කිරීම්] සෝෂා කරන එක නවත්වන්න. වාඩිවෙන්න. [සෝෂා කිරීම්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඡන්දය ගන්න ඉස්සෙල්ලා අපට මේ කාරණය පිළිබඳව සාකච්ඡාවක් ඕනෑ. [සෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will take the Vote by name.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(Deputy Secretary-General)
Hon. Ranil Wickremasinghe.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(Deputy Secretary-General)
Hon. (Mrs.) Thalatha Atukorale - absent.
The Hon. Wajira Abeywardana

ගරු වජිර අබේවර්ධන මහතා
(மாண்புமிகு வஜிர அபேவர்தன)
(The Hon. Wajira Abeywardana)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(Deputy Secretary-General)
Hon. John Amaratunga.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(Deputy Secretary-General)
Hon. Mahinda Amaraweera - absent.

Hon. (Dr.) Sarath Amunugama - absent.

Hon. Hon. Gayantha Karunatileka.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Ravi Karunanayake.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Akila Viraj Kariyawasam.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
පක්ෂයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම කරන්න බැහැ. විද්‍යුත් ඡන්ද පුවරුව ක්‍රියාත්මක වෙද්දි එක එක්කෙනාගේ නම කථා කරන්න බැහැ. වැරැදියි. එහෙම කරන්න බැහැ. [ඝෝෂා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
එහෙම කරන්න එපා. එහෙම කරන්න බැහැ. [ඝෝෂා කිරීම්]

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Lakshman Kiriella.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Mano Ganesan. - Absent.

Hon. Daya Gamage.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Dayasiri Jayasekara.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Nimal Siripala De Silva.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Palany Thigambaram. - Absent.

Hon. Duminda Dissanayake. - Absent.

Hon. Navin Dissanayake.

ගරු නවින් දිසානායක මහතා
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. S.B. Dissanayake. - Absent.

Hon. S.B. Nawinne. - Absent.

Hon. Gamini Jayawickrama Perera.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Harin Fernando. - Absent.
Hon. A.D. Susil Premajayantha - Absent.

Hon. Sajith Premadasa. - Absent.

Hon. Risad Badhiutheen.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. R.M. Ranjith Madduma Bandara. - Absent.

Hon. (Mrs.) Chandrani Bandara. - Absent.

Hon. Tilak Marapana.

ගරු තිලක් මාරපන මහතා
(மாண்புமிகு திலக் மாரபன)
(The Hon. Tilak Marapana)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Faiszer Musthapha. - Absent.

Hon. Anura Priyadharshana Yapa.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Sagala Ratnayaka.

ගරු සාගල රත්නායක මහතා
(மாண்புமிகு சாகல ரத்நாயக்க)
(The Hon. Sagala Ratnayaka)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Arjuna Ranatunga.

ගරු අර්ජුන රණතුංග මහතා
(மாண்புமிகு அர்ஜுன ரணதுங்க)
(The Hon. Arjuna Ranatunga)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Patali Champika Ranawaka. - Absent.

Hon. (Dr.) Wijeyadasa Rajapakshe.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Chandima Weerakkody.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
පක්ෂයි.

නියෝජ්‍ය මහ ලේකම්
(பிரதிச் செயலாளர் நாயகம்)
(The Deputy Secretary-General)
Hon. Malik Samarawickrama.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
It is well settled law that interpreting statutes is power vested in Courts and considered as part of the judicial power. When interpreting statutes Courts will follow the well established rules of interpretations. If the language is clear and unambiguous there is no need for interpretation and it is a matter of applying the Law. When Courts interpreting statutes it will consider the purpose and object of the Act as disclosed in the preamble, long title or in the body of the Act. Therefore any Act requiring Court to follow a particular method of interpretation or consider material not forming part of the Act amounts to encroaching upon powers of the Judiciary and repugnant to the doctrine of separation of powers recognized in the Articles 3 and 4 of the Constitution.

The learned President's Counsel for the Petitioner in SC/SD/ 09/2017 referred to several cases where it was held that interpreting law is a matter for the Courts. He had cited the case of Queen v. Liyanage 64 NLR 313 , Tuckers Ltd. Vs. Ceylon Mercantile Union 73 NLR 31. CWC vs. Superintended, Beragala Estate 76 NLR 1.

According to clause 200 (a), (b) and (c) matters not forming part of the Act such as documents, explanatory memorandum, speech made by the Minister by when introducing the Bill and official records could be considered in interpreting the Act. According to the law as set out in J.B. Textiles Industries Ltd. Vs. Minister of Finance (1981) 1 SLR 156 . De Silva vs. Jeyaraj Fernandopulle (1996) 1 SLR 22 the Hansard could be used under limited circumstances . This clause permits the extraneous matters and other material not forming part of the Act to be considered in interpreting the provisions of the Act. We are of the view this clause violates Article 3 and 4 of the Constitution.

Second and Fourth Schedule of the Bill

A depreciation allowance is granted in respect of depreciable assets, and calculating the same is contained in the Second and Forth schedules of the proposed Bill.

The second schedule contains the investment incentives that would be offered under the proposed law. The petitioners submit that said Second schedule contain provisions that clearly favour and promote the establishment of business with up to 250 or 350 new employees respectively in the Northern Province.

Second schedule 1(1) states that a person who incurs expenses in respect of depreciable assets other than tangible assets during a year of assessment shall be granted an enhanced depreciation allowance computed in accordance with this paragraph, and not, depreciation allowances computed under the Fourth schedule.

Section (2) A depreciation allowance of **100%** of the expenses incurred by a person on depreciable assets, other than intangible assets during a year of assessment shall be granted to that person for that year where the total expenses incurred by that person during that year on depreciable assets(other than intangible assets) that are **used in a part of Sri Lanka other than the Northern Province** exceeds USD 3 million but does not exceed USD 5 million, and where the person has employed at least 250 new employees during the year of assessment with those

new employees being reported in the statement that the person, as a withholding agent, is required to file under section 79.

Section (3) states that a depreciation allowance of **200%** of the expenses incurred by a person on depreciable assets other than intangible assets during a year of assessment shall be granted to that person for that year where the total expenses incurred by that person during that year on depreciable assets (other than intangible assets) that are used in the **Northern Province** exceeds USD 3 million but does not exceed USD 5 million and where the person has employed at least 250 new employees during the year of assessment with those new employees being reported in the statement that the person as a withholding agent, is required to file under section 79.

Section (4) provides that a depreciation allowance of **100%** of the expenses incurred by a person on depreciable assets other than intangible assets during a year of assessment shall be granted to that person for that year where the total expenses incurred by that person during the year on depreciable assets (other than intangible assets) that are used in a part of Sri Lanka **other than Northern Province** exceeds USD 5 million but does not exceed USD 50 million and where the person has employed at least 350 new employees during the year of assessment with those new employees being reported in the statement that the person, as a withholding agent, is required to file under section 79.

Section (5) provides that a depreciation allowance of **200%** of the expenses incurred by a person on depreciable assets other than intangible assets during a year of assessment shall be granted to that person for that year where total expenses incurred by that person during that year on depreciable assets (other than intangible assets) that are used in the **Northern Province** exceeds USD 5 million but not exceeding USD 50 million and where the person employed at least 350 new employees during the year of assessment with those new employees being reported in the statement that the person, as a withholding agent, is required to file under section 79. A depreciation allowance of 100% is granted by Section 2 & 4 for other parts of the country.

Therefore Item 2 and 3 of the Second schedule is in respect of business with inter alia up to 250 new employees and investments of between USD 3 million to 5 million. Out of the said category of business, a depreciation allowance of **200%** is granted in respect of depreciable assets (other than intangible assets) for business in the **Northern Province**, A depreciation allowance of **100%** is granted for **other parts of the country**.

Item 4 and 5 of the schedule is in respect of business with inter alia up to350 new employees and an investment of between USD 5 to 50 million. Out of the said category of business, a depreciation allowance of 200% is granted in respect of depreciable assets (other than intangible assets) for business in the Northern Province .A depreciation allowance of 100% is granted for other parts of the country. It was contended on behalf of the petitioners that there is no reasonable justification and/or intelligible differentia to grant the said higher depreciation allowance to the Northern Province.

The Petitioners in SD 16/2017, 17/2017, and 18/2017 therefore are complaining that granting of a higher depreciation allowance to those investing in the Northern Province is discriminatory and violates Articles 12(1).They further allege that since 90% of the occupation in the Northern Province is by a particular ethnicity, the said concession amounts to a violation of Article 12(2). The Petitioners further contend that the said provisions are unjustified in that the statistics in relation to poverty and un employment do not show that the Northern Province is in need of such concession.

It is the position of the Respondents that the argument of the petitioners is misconceived, both in fact and in law. The Respondents submits that in fact, the present Act No.10 of 2006 contains **similar** provisions that permit the development of areas known as lagging regions as well as special concessions being afforded to those who invest outside Colombo and Gampaha. Section 20 refers to exemptions of the profit and income of any new industrial undertaking.

Section 20 of the Act No.10 of 2006 reads as follows:-

For this purpose a 'new undertaking' in relation to any company and to any year of assessment means an undertaking –

(a) Carried on by such company;

(b) located in any area outside the administrative districts of Colombo and Gampaha and specified in part A or B of the second schedule to this section.

(c) in which the sum invested before April 1, 2008-

(1) in any plant, machinery, furniture, building or land used in such undertaking , where such undertaking is an agricultural undertaking; or

(2) in any plant, machinery, furniture, or building used in such undertaking is an undertaking other than an agricultural undertaking

Is not less than thirty million rupees.

It was held in Charanjit Lal Chowdhury V. The Union of India and Others (1951) A.I.R S.C 41.that:-

"A law applying to one person or one class of persons is constitutional if there is sufficient basis or reason for it. Any classification which is arbitrary and which is made without any basis is no classification and a proper classification must always rest upon some difference and must bear a reasonable and just relation to the things in respect of which it is proposed."

In the case of Budhan Chaudhry V. State of Bihar (1955) A.I.R.S.C. 191) on a discussion of Article 14 of the Indian constitution which is the provision regarding Equality, which is similar to Article 12 of the Sri Lankan Constitution, it was held that:-

'It is now well established that while Article 14 forbids class legislation, it does not forbid reasonable classification for the purpose of legislation. In order however, to pass the test of permissible classification two conditions must be fulfilled, namely,

(1)That the classification must be founded on an intelligible differentia, which distinguishes persons or things that are grouped together from others left out of the group; and

(2)That the differentia must have a rational relation to the object sought to be achieved by the statute in question.

Classification may be founded on different basis,

Namely, geographical; or according to objects or occupations or the like. What is necessary is that there must be a nexus between the bases of classification and the object of the Act under consideration. It is also well established by the decisions of this Court that Article 14 condemns discrimination not only by a substantive law, but also by a law of procedure."

It is not in dispute that Sri Lanka was ravaged by a war for over 30 years. The worst affected region was the Northern Province, followed by certain parts of the Eastern province. The Respondents has annexed and sighted certain paragraphs of the Budget Speech of 2011 delivered in November 2010 and Budget speech of 2013 and the Budget speech of 2017, to show the development goals of the Government with regard to the Northern Province.

The Respondents submit that after 2009, much development work had been carried out in the rest of the country. Southern province and Eastern province have benefitted from this development initiative. Large amounts of money have been spent by the Government on developing Southern and Eastern provinces.

The Respondents further submits that the government also had introduced the Strategic Developments Projects Act in order to grant concessions to investments, over and above what was being given by the Board of Investment (BOI) in the Western province. Money has been allocated to transform Western province into a Megapolis show casing Colombo as a model city. The Government also has taken steps to allocate money for the development of North Western province too.

Thus, it is very clear that much effort was being made by the government to develop the rest of the country and attractive fiscal incentives being offered to those keen to invest in those areas. It is clear the government was seeking to attract donor funding. Higher incentives must be offered to those wanting to invest in the Northern Province. Thus it is evident that special considerations are necessary to attract investment to the Northern Province.

Article 12(2) states that no citizen shall be discriminated against on the grounds of race, religion, language, caste, sex, political opinion, place of birth or any one of such grounds. It cannot be said that the decision to grant a higher depreciation allowance to those investing in the Northern Province was based on any of the grounds set out in Article 12(2).

In the case of East India Tobacco Co. V. State of Andhar Pradesh (1963) 1 SCR 404, 409,it was observed that:-

".....in deciding whether the taxation law is discriminatory or not it is necessary to bear in mind that the State has a wide discretion in selecting persons or objects it will tax, and that a statute is not open to attack on the ground that it taxes some persons or objects and not others; it is only when within the range of its selection, the law operates unequally, and that cannot be justified on the basis of any valid classification, that it would be violative of Article 14 . It is well settled that a State does not have to tax everything in order to tax something. It is allowed to pick and choose districts, objects, persons, methods and even rates for taxation if it does so reasonably.

Thus it is very clear that the Legislature enjoys a wide discretion in formulating policy on economic matters of the country. This Court has very rarely interfered in matters of policy and has always been reluctant to do so, and done so only when such policy is found to be manifestly unreasonable.

Therefore this Court holds that the said Clause 16 (2) be justified on the basis of any valid classification, that it would be read with Second Schedule is not inconsistent with the Article 12(1) and 12(2) of the Constitution.

[ගරු කථානායකතුමා



Summary of determination

That clauses 97 to 98 are inconsistent with article 12 of the Constitution and may only be passed by a special majority required under the provision of paragraph 2 of article 84. However, if that clauses are amended as agreed by the Additional Solicitor General this inconsistency could be removed.

Clause 100(1) (e) is inconsistent with article 12 of the Constitution and may only be passed by a special majority required under the provision of paragraph 2 of article 84. However if it is amended as suggested by Court this inconsistency could be removed.

Clause 167 is inconsistent with article 12, 13 and 14 (1) h & 1 of the Constitution and may only be passed by a special majority reqnirecl under thc provision of paragraph 2 of article 84. However if it is amended as agreed by the Additional Solicitor General this inconsistency could be removed.

The Clause 200 is inconsistent with articles 3 and 4 of the Constitution and requires to be passed by a special majority required under the provisions of paragraph (2) of article 84 and approved by the people at a referendum by virtue of Article 83.

We shall place on record our appreciation of the valuable assistance given by all the learned counsel for petitioners and Additional Solicitor General and other State Counsel in our deliberation.

Priyasath Dep
Chief Justice

Anil Gooneratne
Judge of the Supreme Court

Nalin Perera
Judge of the Supreme Court

[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This document is also placed in the Library.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරමින් අඛණ්ඩව වසර 40ක කාලයක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා වෙත ශුභාශිංසන පළ කිරීමේ යෝජනාව.

ගරු සභානායකතුමා, යෝජනාව ඉදිරිපත් කිරීමට.

අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පාර්ලිමේන්තු දිවියට ශුභාශිංසන

பிரதம அமைச்சர் மாண்புமிகு ரணில் விக்கிரமசிங்க அவர்களின் பாராளுமன்றச் சேவையைப் பாராட்டுதல்

VOTE OF FELICITATION ON PRIME MINISTER HON. RANIL WICKREMESINGHE'S PARLIAMENTARY CAREER

[ප.භා. 10.34]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ் சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෙම සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කරමින් අඛණ්ඩව වසර 40ක කාලයක් සම්පූර්ණ කිරීම වෙනුවෙන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත මෙම සභාව විසින් මෙහිලා ශුභාශිංසනය පළ කරන අතර, පොදුවේ රටට සහ විශේෂයෙන් පාර්ලිමේන්තුව වෙත ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් පරාර්ථකාමීව හා කැපවීමෙන් ඉටු කරන ලද සේවය ඇගයීමට ලක් කරමින් එතුමාගේ සියලු අනාගත පරිශ්‍රමයන් සාර්ථක වීම සඳහා සිය සුභ පැතුම් පිරිනමයි."

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වර්තමාන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පාර්ලිමේන්තු දිවියේ හතළිස් වසරක් සපිරෙන අද වැනි දිනෙක, මෙතුමාට උණුසුම් සුභ පැතුම් එක් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වෙමි.

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරය මෙන්ම විපක්ෂ නායක ධුරය ද සිව්වරක් බැගින් හෙබවීමේ දුර්ලභ භාග්‍යය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට හිමි වීම විශේෂයෙන් අගය කළ යුතු වේ. එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයෙකු ලෙස බියගම ආසනයට තරග කර එය ජය ගනිමින් 1977 ජූලි 21වන දින පාර්ලිමේන්තුවට මෙතුමා තේරී පත් වූ අතර, 1977 අගෝස්තු මස 4වන දින එනම්, අද වැනි දිනක නවක මන්ත්‍රීවරයෙකු වශයෙන් ගාලුමුවදොර පාර්ලිමේන්තුවේදී දිවුරුම් දුන්නේය. 1977 වර්ෂයේදී පිහිටුවන ලද රජයේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ධුරය හෙබවූ මෙතුමාට 1978 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද නව ඇමති මණ්ඩලයේ තරුණ කටයුතු හා රැකී රක්ෂා පිළිබඳ කැබිනට් ඇමති තනතුර පැවරිණි. එවකට වයස අවුරුදු 29ක් වූ එතුමා කැබිනට් මණ්ඩලයේ ළා බාලම ඇමතිවරයා විය. ජාතික තරුණ සේවා සභාවට නව පණක් දෙමින් යෞවන යෞවනියන්ගේ හැකියාවන් ඔප් නංවන තෝතැන්නක් ලෙස එය පත් කිරීමට එම කාලයේදී මෙතුමාට හැකි විය.

1980දී අධ්‍යාපන අමාත්‍ය ධුරයට පත් මෙතුමා, පාසල්වලට දක්ෂ ගුරුවරු බඳවා ගැනීමට හැකියාව ලැබෙන සේ අධ්‍යාපන විද්‍යා පීඨ ඇරඹීමත්, පාසල් සිසුන්ට නොමිලේ පොත්පත්, නිල ඇඳුම් හා දිවා ආහාරය ලබා දීමත් ආරම්භ කළේය. එසේම 1989 වර්ෂයේ කර්මාන්ත අමාත්‍ය ධුරයත්, පසුව 1990දී කර්මාන්ත විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය ධුරයත් දරමින් රටේ සෑම ප්‍රදේශයකම පාහේ කර්මාන්ත පුර බිහි කරමින් තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දීමට කටයුතු කළ මෙතුමා, පාර්ලිමේන්තුවේ සභානායක ධුරය ද හෙබවීය.

1993 මැයි මස 01වන දින ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමන් කොටි ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරන ලද අවස්ථාවේ රට අරාජික වීමට ඉඩ නොතබා අගමැති ඩී.බී. විජේතුංග මැතිතුමා හට ජනාධිපති ධුරයේ දිවුරුම් දීමට කටයුතු සැලැස්වීමට රනිල් වික්‍රමසිංහ මහතා කඩිනමින් පියවර ගත්තේය. ඒ අනුව 1993 මැයි 07වන දින ඩී.බී. විජේතුංග මැතිතුමා ශ්‍රී ලංකාවේ තෙවැනි විධායක ජනාධිපති ලෙස පත් වූ අතර, රනිල් වික්‍රමසිංහ මැතිතුමා ශ්‍රී ලංකාවේ දහවැනි අගමැති ලෙස පත් විය.

2001 දෙසැම්බර් මස 05වන දින පැවැති මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට නායකත්වය දෙමින් ජයග්‍රහණය අත්කර ගැනීමට රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමත් විය. ඒ අනුව 2001 දෙසැම්බර් 09වන දින මෙතුමා දෙවැනි වරටත් ශ්‍රී ලංකාවේ අග්‍රමාත්‍යවරයා බවට පත් විය.

2015 ජනවාරි මස 08වන දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඓතිහාසික ජයග්‍රහණයක් අත්කර ගත් පසු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ශ්‍රී ලංකාවේ අගමැතිවරයා ලෙස තෙවැනිවරටත් දිවුරුම් දුන්නේය. අගමැති තනතුරට අමතරව ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ධුරය ද එතුමා විසින් දරන ලදී.

2015 අගෝස්තු මස 17වන දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයෙන් පාර්ලිමේන්තුවේ වැඩි ආසන ප්‍රමාණයක් ජය ගත් එක්සත් ජාතික පක්ෂය, අනෙක් විශාලතම පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමඟ එක්ව ජාතික රජයක් පිහිටුවන ලදී. එයට සෙසු පක්ෂ රැසක සහයෝගය ලැබීම ද විශේෂයෙන් සඳහන් කළ යුතු අතර, එම ජාතික රජයේ අග්‍රාමාත්‍යවරයා ලෙස 2015 අගෝස්තු මස 21වන දින රනිල් වික්‍රමසිංහ මැතිතුමා සිව්වන වරටත් අගමැති තනතුර සඳහා දිවුරුම් දුන්නේ ය. එසේම, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ධුරය ද උසුලමින් මෙතුමා රටේ තිරසර සංවර්ධනයක් ඇති කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කරමින් සිටී.

නව රජය විසින් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයෙන් සම්මත කර ගැනීමට සමත් වීම ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් සාධනීය පියවරක් වූ අතර, ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය පාර්ලිමේන්තුවට හඳුන්වා දෙමින් ඒ තුළින් ව්‍යවස්ථාදායකය ශක්තිමත් කිරීමට ද මෙතුමා පියවර ගත්තේය. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි දැඩි විශ්වාසයක් ඇති මූලික මානව අයිතිවාසිකම් සුරැකෙන සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම අරමුණ කර ගත් මෙතුමා, පොත් පත් නිබඳව පරිශීලනය කිරීම තුළින් දැනුම් සම්භාරයක් රැස් කර ගත්, ආවේගශීලී නොවී, බුද්ධිමත් තීරණ ගන්නා විශිෂ්ට නායකයෙක් බව අවස්ථා ගණනාවකදී පෙන්නුම් කර ඇත. ඉවසිලිවන්ත බව, නොසැලෙන සුළු බව වැනි ගුණාංග අගමැතිතුමාගේ චරිතය තුළ වඩාත්ම ඉස්මතු වී ඇත.

තවද, වර්තමානයේ ශ්‍රී ලංකාවේ පමණක් නොව ආසියානු මහාද්වීපයේම සිටින කෘතහස්තම දේශපාලනඥයන් අතලොස්සට අපේ අගමැතිතුමා අයත් වන බව සඳහන් කිරීමට ද කැමැත්තෙමි. පසු ගිය දශක හතර තුළ අප රටේ දේශපාලන ක්ෂේත්‍රය තුළ විශේෂ භූමිකාවක් නිරූපණය කළ මෙතුමා, අත් දැකීම් බහුල, ප්‍රවීණ ජන නායකයෙකු ලෙස ද ලෝක ප්‍රකට වී ඇත.

සරල, චාම් ගතිගුණ ඇති, උදාර නායකයෙක් වන රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ පාර්ලිමේන්තු දිවියට වසර හතළිහක් සපිරෙන මේ අවස්ථාවේ, මෙතුමාට සිය ඉදිරි මෙහෙවර සාර්ථකව කර ගෙන යාමට හැකියාව, ශක්තිය, ධෛර්යය, වාසනාව හා ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය නොමඳව ලැබේවා! යි මම ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Rajavarothiam Sampanthan, Leader of the Opposition.

[10.40a.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Thank you, Mr. Speaker. I am indeed happy to second this Vote of Congratulations and Felicitations on the occasion of the completion of 40 years of Parliamentary career by Mr. Ranil Wickremesinghe, one of Sri Lanka's most senior and seasoned politicians and presently, Prime Minister of Sri Lanka.

Mr. Ranil Wickremesinghe entered Parliament for the first time in 1977. I, too, entered Parliament, for the first time, in 1977. We met each other for the first time as fellow Members of Parliament. Mr. Ranil Wickremesinghe has continued to serve as a Member of Parliament for 40 years. I, however, vacated my Seat in Parliament voluntarily in 1983 consequent to certain things that happened at that point of time. In fact, my Party had 18 Members of Parliament in 1977 and two of them had left us and my other 16 Colleagues also voluntarily vacated their Seats in 1983. I might mention that I was the first Member of Parliament to lose my Seat in 1983.

Mr. Ranil Wickremesinghe had, during this period of 40 years, served as a Deputy Minister, a Minister and a Prime Minister. Inclusive of his present term, he has served as Prime Minister for the fourth time. This, Mr. Speaker, is in itself an outstanding and significant achievement. Mr. Ranil Wickremesinghe has also served as the Leader of the Opposition.

Mr. Ranil Wickremesinghe is by nature, a very calm, a very stable and also a very subtle person. He is not one who could be easily ruffled. He is, in that sense, a formidable person. I might say a formidable opponent. It is well known that he has a very wide knowledge of men and matters and that his vast experience in the public sphere, to a great extent, influenced all the work that he was engaged in. He is respected both domestically and internationally as a leader with a vision. This aspect of his personality perhaps needs to bear fruit in a more visible manner in the future. Mr. Ranil Wickremesinghe was prepared to take decisions which he considered to be in the best interests of the country irrespective of any other consideration. A crucial decision taken by Mr. Ranil Wickremesinghe was that taken to field Mr. Maithripala Sirisena as the Common Opposition Candidate at the Presidential Election held in 2015. There was pressure for Mr. Ranil Wickremesinghe to be the Opposition Candidate. He, however, boldly and wisely decided that Mr. Maithripala Sirisena would be the Common Opposition Candidate.

The result at the election justified his decision and the country has embarked on a journey widely different from that pursued by the former Government. This was a significant contribution made by Mr. Ranil Wickremesinghe towards the betterment of the country's future. The benefits that have accrued from that victory must be utilized fully for the benefit of the country.

When we talk of the larger interests of the country, Sir, it is perhaps with Mr. Ranil Wickremesinghe's future that we are more concerned. The economy needs to be

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

redeemed. The national question needs to be resolved. They are linked to each other. They are inextricably linked to each other. The thirty-year armed conflict is one of the primary causes for the parlous state of affairs in the economy. Mr. Ranil Wickremesinghe has always taken a progressive and pragmatic view on the national question. Resolution of the national question would make a big contribution towards the redemption of the national economy. All the steps contemplated by Mr. Ranil Wickremasinghe vastly enhanced domestic and foreign investment in various fields of the economy, particularly export-oriented manufacture and growth, promotion of tourism and developing Sri Lanka as an economic hub in the region can succeed to the extent of its full potential only if the national question is resolved in a just, reasonable and acceptable manner.

His Excellency President Maithripala Sirisena and the Hon. Ranil Wickremesinghe need to work together to enable the country to succeed in these two objectives. Today, Sri Lanka enjoys the goodwill and support of the world. This needs to be preserved and developed. This can only be achieved by President Maithripala Sirisena and the Hon. Ranil Wickremesinghe working together to achieve these two objectives. The two of them owe this to an undivided, indivisible, just and prosperous Sri Lanka and to all its people.

On my behalf, Sir, and on behalf of all the Members of Parliament representing the Tamil National Alliance and the Tamil people, particularly in the North and the East, and on behalf of all the people of this country, we convey our very best wishes and felicitations to the Hon. Ranil Wickremesinghe and wish him the very best.

Thank you, Sir.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා.

[ප.භා. 10.50]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, හතර වතාවක් ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ධුරයට පත් වෙමින් වත්මන් අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා හතළිස් වසරක් තුළ ශ්‍රී ලංකාවට හා දේශපාලන ක්ෂේත්‍රයට කරන ලද සේවය, දෙන ලද නායකත්වය පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා.

එතුමාත්, මාත් නියෝජනය කරන්නේ ප්‍රතිවිරුද්ධ දේශපාලන පක්ෂ දෙකක්. මා 1988දී නවක මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේදී, අපි එක්සත් ජාතික පක්ෂය එක්ක දැඩි ලෙස සටන් වැදුණා. අපි එතුමා විවේචනය කළා. එතුමා තුළ තිබුණු සුවිශේෂී ගුණයක් තමයි, තමන්ගේ දේශපාලන ප්‍රතිවාදීන් කරනු ලබන විවේචන සිනහ මුසු මුහුණින් භාර ගැනීම. එසේ විවේචන කළාය කියලා ඒ පිළිබඳ වෛරයක්, ක්‍රෝධයක් නිතේ තබාගෙන කටයුතු කරපු දේශපාලනඥයකු නොවෙයි එතුමා. විපක්ෂයේ සිටියදී වුණත් එතුමා ගරු සභාවෙන් එළියට ගිහිල්ලා lobby එකේදී ඉතාම මිත්‍රශීලිව අප සමඟ කථා කළා; අපට සැලකුවා.

දේශපාලනඥයකු වශයෙන් විවේචනයට භාජන වුණු, මාධ්‍ය මඟින් පහර ගැසීම්වලට ලක් වුණු, එතුමා තරම් දේශපාලනඥයකු ශ්‍රී ලංකා ඉතිහාසයේ නැති තරම්! නමුත්, එතුමා ඒ සියල්ල විඳ දරාගෙන නවකයන් වූ අපට හොඳ ආදර්ශයක් ලබා දුන්නා, දේශපාලනික වශයෙන් කුමන විවේචන එල්ල වුණත් නිවැරදිව ඉදිරියට යෑමට ශක්තිය තිබෙනවා නම් සාර්ථක දේශපාලනඥයකු වශයෙන් සිය දේශපාලන ජීවිතය අවසාන කරන්න පුළුවන්ය කියලා. එතුමාගේ ඒ ගුණාංගය අප ඉතා ඉහළින් අගය කරනවා.

ගරු කථානායකතුමනි, ඉතිහාසය පිළිබඳව එතුමාට ඇති දැනුම, ආර්ථිකය පිළිබඳව එතුමාට ඇති දැනුම, විදේශ කටයුතු පිළිබඳව එතුමාට ඇති දැනුම, මූල්‍ය පරිපාලනය පිළිබඳව එතුමාට ඇති දැනුම සහ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හා ලෝකයේ දේශපාලන ක්‍රම පිළිබඳව එතුමාට ඇති දැනුම අතිවිශිෂ්ටයි. එතුමා මේ ගරු සභාව තුළදී කරන ලද වාද විවාදවලදී මෙන්ම, විශේෂයෙන්ම ආර්ථික කමිටුවේ සභාපතිත්වය දරමින් ඒ කටයුතු මෙහෙය වන ආකාරය තුළින් ද එතුමා තුළ ඇති නිපුණත්වය, විශිෂ්ටත්වය අපි දැක්කා. එතුමා තුළින් එය ඉතාම හොඳින් ප්‍රදර්ශනය වුණා. එතුමා ලබාගෙන ඇති අත් දැකීම් සම්භාරය අතිවිශාලයි. ඒවා සාමාන්‍ය දේශපාලනඥයකු තුළ තිබෙන අත් දැකීම්වලට වඩා විශාලයි. එම අත් දැකීම් තුළින් රටට විශාල සේවයක් කරන්නට පුළුවන්.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදියෙක්. එතුමා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගෙන ඒම සඳහා විශාල උනන්දුවක් දැක්වූවා. ඒ වාගේම දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉවත් කරලා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා පාර්ලිමේන්තුවට වැඩි බලතල ලබා දීමේ කටයුත්තේදී එතුමා ප්‍රමුඛත්වයක් ගත්තා. එතුමා දේශපාලන වශයෙන් විවිධ අවස්ථාවලදී ඉතාම ප්‍රායෝගික තීරණ ගත්තා. ඒ නිසා තමයි පසු ගිය ජනාධිපතිවරණයේදී එතුමා නිර්ලෝභීව මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ජනාධිපති පදවිය සඳහා තරග කරන්නට ඉඩ දුන්නේ. ඒ වෙලාවේ එතුමා ලෝභ වුණේ නැහැ. යම් දෙයක් සැලසුම් කිරීමේ දී ජයග්‍රහණයක් ලබා ගත යුතු ආකාරය පිළිබඳව එතුමා තුළ තිබෙන ඉදිරි දැක්ම එතැනදී සාර්ථක වුණා. එතුමා ඒ වෙලාවේදී ලෝභ වෙලා කටයුතු කළා නම් ප්‍රතිඵලය වෙනස් වෙන්න තිබුණා. ඒ නිසා දේශපාලන කාරණා පිළිබඳව එතුමා තුළ තිබෙන දුර දක්නා නුවණ අපි අගය කරන්න ඕනෑ.

එක්සත් ජාතික පක්ෂයේ සියලු ආර්ථික වැඩ පිළිවෙළවල් පිළිබඳව අපේ සතුටක් නැහැ; අපි එකඟ වන්නේ නැහැ. අපේ පක්ෂ දෙක අතර නොයෙකුත් වෙනස්කම් තිබෙනවා. එතුමා අපේ දේශපාලන ප්‍රතිවාදියකු වෙන්න පුළුවන්. නමුත්, අවුරුදු 40ක් දේශපාලනයේ යෙදිලා මේ රටට නායකත්වය දුන්නු, මේ රටට අවශ්‍ය දේශපාලන නායකයකු ගැන කථා කිරීම කිසිසේත්ම අපේ පක්ෂ ප්‍රතිපත්ති පාවා දීමක් නොවෙයි. යහපත් ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා පක්ෂ ක්‍රමය තිබෙන්න ඕනෑ. ඒ පක්ෂවල නායකයන් එකිනෙකා ඇණ කොටා ගන්නා, මරා ගන්නා වෛරී දේශපාලනයක් අපි කළ යුතු නැහැ. අපි කරන්නේ වෛරී දේශපාලනයක් නොවෙයි. අපි ඒ සම්බන්ධයෙන් ඉතා හොඳ ආදර්ශයක් දෙන්න ඕනෑ. අපි මැතිවරණවලදී වෙනම සටන් කරනවා; එකඟ නොවන තැන්වලදී වාද විවාද කර ගන්නවා;

එකඟ නොවී ඉන්නවා. එයින් අදහස් කරන්නේ නැහැ, යම් පක්ෂයක නායකයකු හෝ පුද්ගලයකු සමඟ අපි වෛරී දේශපාලනයක් කරනවාය කියලා.

අපට -මේ රටට- අත් දැකීම් බහුල දේශපාලනඥයන් බොහෝ පිරිසක් අවශ්‍යයි. අපේ ගරු ආර්. සම්පන්දන් මැතිතුමා ගත්තොත්, දීර්ඝ කාලයක් දේශපාලනය කිරීමෙන් ලත් දැවැන්ත අත් දැකීම් සම්භාරයක් එතුමාට තිබෙනවා. ඒ වාගේම ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා ගත්තොත්, එතුමාත් දැන් මේ පාර්ලිමේන්තුව තුළ වැඩ කටයුතු රාශියක් කරනවා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ගත්තොත්, එතුමාත් දැවැන්ත කාර්ය භාරයක් ඉෂ්ට කරනවා. ඒ විධියට බැලුවොත්, යම් අවස්ථාවකදී ඔවුන්ට සුබ පැතීම අපේ යුතුකමක් හා වග කීමක්. එතුමන්ලාගේ දේශපාලන ජීවිතවලත් මෙවැනි අවස්ථාවක් ආවාම, අපි මේ වාගේම එතුමන්ලාටත් සුබ පතනවා. අපට විරුද්ධ මත ප්‍රකාශ කළාය කියලා, අපට විරුද්ධ සහ ප්‍රතිවාදී දේශපාලන පක්ෂයක සිටියාය කියලා සුබ පැතීම හොඳ නැහැ කියන ස්ථාවරයේ අපි නැහැ.

1988දී මා පාර්ලිමේන්තුවට පැමිණි අවස්ථාවේ සිට මේ දක්වා රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමඟ එතුමාගේ නායකත්වයෙන් විදේශ චාරිකා ගණනාවකට සහභාගි වෙන්න මට අවස්ථාව ලැබුණා. එවැනි අවස්ථාවලදී එතුමා විදේශ දූත පිරිස් සමඟ, විදේශ රාජ්‍ය නායකයන් සමඟ ඉතාම හොඳින් කටයුතු කළා. අපි චීනයට ගියා. ඒ අවස්ථාවේ එතුමා දක්වන ලද දේශපාලන පරිණතභාවය අතිවිශිෂ්ටයි. ඒක අපි කියන්න ඕනෑ. ඒක අපි දැක්ක දෙයක්. ඒ නිසා එවැනි පරිණත දේශපාලනඥයෙකුට අපි හදවතින්ම සුබ පතනවා. එතුමා තුළ තිබුණු විවිධ ජාත්‍යන්තර දේශපාලන සම්බන්ධතා විශේෂයෙන්ම GSP Plus සහනය ලබාගැනීමේ කාර්යයේදී විශාල වශයෙන් උදවු වුණා. අපි ඒක අගය කරන්නට ඕනෑ. එතුමා, මේරටට වාසි විශාල ප්‍රමාණයක් ලබාදෙන්න එතුමාට තිබුණු ජාත්‍යන්තර දේශපාලන සම්බන්ධතා පාවිච්චි කළා.

අපේ රටට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීම සඳහා, ඒ සංශෝධන සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරන මෙහෙයුම් කාරක සභාව එතුමා ඉතාම විචක්ෂණශීලි ලෙස මෙහෙයවනවා. එතුමා ඒ කටයුතු ඉතාම ඉවසීමෙන් හා වුවමනාවෙන් කරනවා. බොහෝ විට ඇති වෙන දැඩි වාද-විවාද සියල්ල සමනය කරලා, එතුමා ඒ කාර්ය ඉටු කරන ආකාරය ගැනත් අපි ඉතාම සතුටට පත් වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තුවට පත් වී වසර 40ක අඛණ්ඩ දේශපාලන ජීවිතයක් ගත කරන ලද පුද්ගලයන් අපේ ඉතිහාසයේ ඉන්නේ ඉතා අතලොස්සයි. ගරු අග්‍රාමාත්‍යතුමනි, එයින් එක්කෙනෙක් තමයි ඔබතුමා. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ සභානායක වශයෙන් පත් වුණා; විපක්ෂ නායක වශයෙන් පත් වුණා. ඒ වාගේම, හතර වතාවක් මේ රටේ අග්‍රාමාත්‍ය ධුරයට පත් වුණා. එවැනි විවිධ දේශපාලන භූමිකා තුළින් ඔබතුමා මේ රටට විශාල සේවයක් ඉටු කළා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා, ඔබතුමා විශ්වාස කරන දේශපාලන දර්ශනයෙන් බැහැරව ගියේ නැහැ. විචෘත ආර්ථිකය පිළිබඳව, පෞද්ගලික අංශයේ සහභාගිත්වය පිළිබඳව අප යම් ආකාරයකින් ඊට වඩා වෙනස් මතිමතාන්තර දැරුවත්, ඔබතුමා විශ්වාස කරන ලද ඒ මතිමතාන්තරවලම ඔබතුමා සැමවිටම එල්බගෙන සිටියා; ඒ අනුව වැඩ කටයුතු කළා; ඒ අනුව තීන්දු ගත්තා. ඒ නිසා තීරණ ගැනීමේදී නොපැකිළව තීරණ ගත්ත දේශපාලනඥයකු හැටියට ඔබතුමාගේ නම ඉතිහාසයට එකතු වෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, අතිගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුභාශිංසන අපි මේ අවස්ථාවේදී ඔබතුමාට පිරිනමනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Rauff Hakeem.

[11.00a.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
மாண்புமிகு றவுப் ஹகீம் - நகரத்திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon.Rauff Hakeem - Minister of City Planning and Water Supply)
BismillahirRahmanir Raheem.

Hon. Speaker, we have gathered today to celebrate 40 years of Parliamentary and public service of our Prime Minister. 1977, the year that he entered Parliament, was a transformational year in the post-independence history of this country. Unshackling a fully-insulated, centrally directed socialist economy and introducing a market-driven open economy while having to retain the essential features of a welfare state is a very difficult balancing act for any Head of State or Prime Minister.

In our Prime Minister, we have someone who is endowed with those essential qualities of patience and perseverance that is necessary to surmount all these difficulties and steer the ship of Government.

Coming into politics with President J.R. Jayewardene who believed in market reform and free enterprise being the key driving forces to achieve economic growth and social advancement, our Prime Minister today, is following the social market economic principles which are the guiding principles of our Government.

His political trajectory is intrinsically embedded in the 1977 economic revolution. I would dare say, arguably he is the sharpest intellect in our contemporary political scene. Though some may say or some may see his human chemistry as somewhat wanting at times which is unavoidable for any leader at the helm of power with all the stress of day-to-day political pressures, even his worst enemies would notice one special trait in him. That is whenever he speaks in Parliament, even in his most aggressive presentations, he is rarely seen as intimidating. That is an essential quality of a mature political leader, which is quite unique to the Hon. Ranil Wickremesinghe. He is undoubtedly one of our most gifted leaders. High office sought him out not due to destiny but for his quintessential quality of steadfast loyalty to his Party and his policy consistency. When I talk of Party loyalty, I would like to remind the Hon. Members of this House particularly, the loyalty he showed President Premadasa when he faced the impeachment in the House. Such qualities are the reasons why he was able to surmount all the vicissitudes of the political winds in this country and rise to the position of Prime-ministership four times.

[ගරු රවුෆ් හකීම් මහතා]

I must say on a personal note, I was perhaps one of those people who associated with him in his last two ascensions to the Office of Prime-ministership. Firstly, in 2001, when I was somewhat unceremoniously removed from Cabinet, being the astute political leader he is, he seized that political opportunity and engineered the necessary defections from the Government to install his own Government within five months of that incident happening in this House.

We also saw certain other qualities in him. I must particularly say that sometimes he is unfairly criticized. That is inevitable when you hold public office. I am perhaps the only one left in this House now who were part of his negotiating team with the LTTE. I will witness one thing. Several people sometimes find fault with him for having signed the Ceasefire Agreement with the LTTE. Those who are pragmatic enough to understand the political situation then, with our international airport being attacked by the LTTE, the new Government had a few options, but to also look at the sentiments of the international community and putting together the Co-chair concept bringing together Washington, Brussels, Tokyo and New Delhi as well as Norway, New Delhi in an indirect manner, to negotiate with the LTTE. He is, sometimes, unfairly criticized for many things. But, I would here say which many people may not know that if the Hon. Ranil Wickremesinghe unconditionally agreed to the Interim Self-Governing Authority proposed by the LTTE, he would have been the President in 2005; he would have won the Parliamentary Elections in 2004. So, I am one of those witnesses to the fact that he steadfastly refused to agree to pressure by even our facilitators to look at ISGA unconditionally and agree to some of those issues contained in the Interim Self-Governing Authority document.

Hon. Speaker, I must also hasten here to say that when the previous administration, of which I was also unfortunately a Member, was blinded by the euphoria of a military victory and unfortunately allowed xenophobic forces to raise their ugly head and create racial disharmony in the country, the Hon. Prime Minister from the Opposition Benches then and also, during the term of this Government for a brief period, when these same forces once again were trying to disturb the hard-fought harmony among ethnicities that we have restored in this country, he was steadfast in condemning them and taking the necessary action to bring such forces to account.

So, I must here take this opportunity to wish the Hon. Prime Minister for the yeoman service he has rendered the country.

I must also hasten to add one more thing, Mr. Speaker. I am somewhat saddened today to see that the decency that we Members of this House should observe on solemn occasions like this has sunk to the lowest levels by some of our Members in the Opposition boycotting this Felicitation Motion. This is a very sorry state of affairs. In my 23 years of Parliamentary life, this is perhaps the first time I see the essential Parliamentary decency has sunk to a lowest level. And therefore, I must say, some of the Members in the Opposition have compromised their principles for the sake of cheap political expediency.

Having said that, may I take this opportunity to say that Hon. Ranil Wickremesinghe was and is indeed an iconic leader, a stature. I am bold to say as a leader of a minority Party that only a very few lived to endure in amity and harmony with everyone in this country.

We wish our Hon. Prime Minister well and invoke God's blessings on his fortieth year in politics.

On my personal behalf as well as other Members of my Party, we wish him many more years of success and strength.

Thank you Mr. Speaker.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා.

[ප.භා. 11.13]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - வலுவாதார அபிவிருத்தி மற்றும் வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Sustainable Development and Wildlife)

ගරු කථානායකතුමනි, මගේ ජීවිතයේ ඉතාමත් සතුටුදායක අවස්ථාවක් විධියට මේ අවස්ථාව මා දකිනවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මට කතා කරලා, "ජයවික්‍රම, ජයවික්‍රම 1973 වසරේදී සංවිධායක විධියට පත් කළේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නොවෙයි, ඩඩ්ලි සේනානායක මැතිතුමායි" කියලා මතක් කරලා දුන්නා. ඒක මගේ හිතේ තිබුණේ නැහැ. ඒ වාගේම එතුමා කිව්වා, එතුමාව පත් කළේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කියලා.

ගරු කථානායකතුමනි, එක් අවස්ථාවක එතුමා මට කිව්වේ, "ජයවික්‍රම, ඔබතුමා තමයි එක්සත් ජාතික පක්ෂයේ පැරණිම සංවිධායක" කියලා. තරුණයෙක් විධියට එතුමාත් සමඟ එදා දේශපාලන පිටියේ ඉතා දුෂ්කර අවස්ථාවන් අපි පසු කළා. අපි කලාවැව අතුරු මැකිවරණයට සහභාගි වුණා. එතුමාත් අප සමඟ ගියා. එදා පස් අවුරුදු සාපයක් තිබුණු වෙලාවක්. එදා කන්න නැහැ, වතුර නැහැ. මට මතකයි, මට ඡන්ද කටයුතු කරන්න දීලා තිබුණේ "අභිමාන" කියන කැලේ ගම්මානයක්. අන්තිමට අපි ගෙනිච්ච කෑම ටික පවා ඒ මිනිසුන්ට දෙන්න සිද්ධ වුණා. ඒ අයට ඇඳුමක්වත් තිබුණේ නැහැ. එදා ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දයේදී ඒ.එම්.එස්. අධිකාරි මැතිතුමාත් තරගකරුවෙක් බව මේ අවස්ථාවේදී මා මතක් කරන්න ඕනෑ. අපි ඔක්කෝම පැල් බැඳ ගෙන ඡන්දය කළේ, එදා බලයේ සිටි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ අපේක්ෂකයා පරාජය කරන්නයි. ඒ අවස්ථාවේ

ඡන්දයට ඉස්සෙල්ලා දවසේ අලි ඉන්නා ඒ අභිමාන ගම්මානයේ ගෙවල් ගාණේ මම ගිහිල්ලා කිව්වා, "මේ පාර අලියාට ඡන්දය දෙන්න." කියලා. ඒ ආසනය වාමාංශික ආසනයක්. එක ගෙදරකට ගියාම ඒ අම්මා කිව්වා, "මහත්තයෝ මම කවදාවත් අලියාට ගහලා නැහැ. අපටත් කන්න නැහැ. කෙසෙල් බඩ කන්නේ." කියලා. එහෙම කියලා ඒ අම්මා කිව්වා, "අපි මේ ගමන අලියාට දෙනවා." කියලා. පැත්තක වාඩි වෙලා දුව හිටියා. දුවගෙන් මම ඇහුවා, "නංගියේ හෙට ඡන්දය දාන්න ඔයත් එනවා නේද?" කියලා. මේ දුව කිව්වා, "බැහැ. බැහැ." කියලා. මම විනාඩි 15ක්, පැය භාගයක් විතර කථා කළා. මම මේ කියන්නේ සත්‍ය කථාවක්. අම්මා දුවට කිව්වා, "නැහැ, උඹ එන්න ඕනෑ මාත් එක්ක ඡන්දය දාන්න යන්න." කියලා. මමත් කිව්වා, "එන්න." කියලා. ඒ ළමයා බිම බලා ගෙන හිටියා. මම ඇහුවා, "නංගියේ එන්න බැරි කාරණය මොකක්ද?" කියලා. ගරු කථානායකතුමනි, විශ්වාස කරන්න ඒ ළමයා කිව්වා, "මට ඇඳගෙන යන්න ඇඳුමක් නැහැ." කියලා. ඒ ළමයා අඬමිනුයි ඒ කථාව කිව්වේ. ඒ කථාව මගේ හදවතේ තවම රැඳී තිබෙනවා. අන්තිමට මට කහ උණ හැදුණු නිසා ඩර්ඩන්ස් රෝහලට එන්න සිද්ධ වුණා. ඒ තරම්ම දුෂ්කර යුගයක්, ඒ යුගය.

ජේ.ආර්. ජයවර්ධන යුගය ගැන මම තව ටිකකින් කතා කරන්නම්.

ගරු කථානායකතුමනි, අපේ ඉතිහාසයේ යුග තුනක් මා දකිනවා. ඒ යුග තුනෙන් එකක් තමයි, රාජ යුගය. එම යුගයේ වැව් පද්ධති ඇති ගම්මාන සහිත මහා ආර්ථික හා ආගමික පසු බිමක් තිබුණු සමාජයක් තිබුණා. දෙවැනි යුගය විධියට මා දකින්නේ, අපේ රට යටත් විජිතයක් වෙලා තිබුණු අවධිය. ඒ අවධියේදී අපේ රාජධානි වල්බිහි වෙන තත්ත්වයට පත් වී රජවරු අතරමං වුණා. අපේ රට මහා බ්‍රිතාන්‍යයේ යටත් විජිතයක් විධියට තිබුණු කාලයේ, 1932 ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය පැවැති කාලය තුළ අපේ නායකයන් අපේ නිදහස ලබා ගැනීම වෙනුවෙන්, ලේ වගුරුවන්නේ නැතුව සාමකාමීව, අවිහිංසාවාදීව, බුද්ධිමත්ව කටයුතු කළා. මේ අවස්ථාවේදී අපි මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමාගේ නම සඳහන් නොකළොත් වරදක්. අපේ රටට නිදහස ලැබුණාට පස්සේ, අවුරුදු 800ක් තිස්සේ වල් බිහි වී තිබුණු මින්නේරිය වැනි වැව් එතුමා ප්‍රතිසංස්කරණය කළා. මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා අමුඩය ගහගෙන, සී.පී. ද සිල්වා, අයිවෝ ජෙනිංග්ස් වැනි අය එක්ක මින්නේරිය වැව හැදුවාට පස්සේ එතුමා ඒ හොරොව්වේ සිට මහා ප්‍රතාප සිංහයෙක් වාගේ ගත් ඡායාරූපයක් මා ළඟ තිබෙනවා. එතුමාගේ යුගය මා සඳහන් කරනවා, ඉතිහාසයේ දෙවැනි යුගය විධියට. එය ස්වර්ණමය යුගයක්.

ගරු කථානායකතුමනි, 1977 වර්ෂයේ ආරම්භ කළ නව ආර්ථික දර්ශනයත් එක්ක අපේ රට ලෝකයට ගෙන ගිය අවධිය තුන්වැනි යුගය විධියට මා සඳහන් කරනවා. අර මා කලින් කියපු කන්ඩ නැති, ඇඳුමක් නැති, "පොලු යුගය" අවසන් කරලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නව යුගයක් ආරම්භ කළා. එවකට භාණ්ඩාගාරයේ ශතයක් තිබුණේ නැහැ. මට මතකයි, ඒ කාලයේ පත්තරවල සඳහන්ව තිබුණා, භාණ්ඩාගාරයෙන් හැම දාම Tobacco Company එකට යනවා කියලා. මොකටද, යන්නේ? හවසට බදු මුදල් ටික එක්කාසු කරලා භාණ්ඩාගාරයට ගෙනෙන්න, එදිනෙදා කෑමට සහ පඩිවලට ගෙවන්න. එවැනි තත්ත්වයක තිබුණු යුගයක් තමයි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා වෙනස් කළේ. එතුමා මහා පුදුම නායකයෙක්. ඒ වාගේ නායකයෙක් මගේ ජීවිත කාලයේ මේ මැතකදී මම දැක්කේ නැහැ. මම ඇයි, එහෙම කියන්නේ? එතුමා තෝරා ගත්තේ කවුද? බුද්ධියක් තිබෙන, ශක්තියක් තිබෙන, දර්ශනයක් තිබෙන කණ්ඩායමක් එතුමා හැදුවා. එවැනි කණ්ඩායමක් මම තවම මේ පාර්ලිමේන්තුවේ පාලන තන්ත්‍රය තුළ දැක්කේ නැහැ.

එතුමාගේ පාලන තන්ත්‍රය තුළ ලලිත් ඇතුලත්මුදලි, ගාමිණී දිසානායක, හිටපු ජනාධිපති ප්‍රේමදාස රණසිංහ වැනි අය මා දැක්කා. ඊළඟට, මම දැකපු හතරවැනියා තමයි මේ ඉන්නා -අපි අද උපහාර කරන, ගරු කරන- රනිල් වික්‍රමසිංහ මැතිතුමා. ඒ, ඇයි? මම මෙතුමා දුටුවේ කොහොමද? මම දුටු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තීක්ෂණ බුද්ධියක් තිබෙන, මහා ඉවසීමක් තිබෙන කෙනෙක්. මම හිතනවා, එතුමා බොහෝ දේ ඉගෙන ගත්තා කියලා. මොකද, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාටත් ඒ කාලයේ - 'ඩඩ්ලි-ජේආර් සටිටනය' තිබුණු වේලාවේ- නොයෙක් ප්‍රශ්න තිබුණා. එතුමා එංගලන්තයේ ඉඳලා එනකොට, කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් එතුමාව පක්ෂයෙන් නෙරපන්න හැදුවා. නමුත් එතුමාගේ සහෝදරයා නඩුව අත් හිටවූ නිසා තමයි එතුමා එදා ආවේ. එතුමා අවුරුදු 40ක් ඉවසිලිවන්තව සිටියා. එතුමාගේ දේශපාලන ජීවිතය ඒ විධියට ඉදිරියට ගිහිල්ලා, අවුරුදු 70දී අගමැතිවෙලා, ජනාධිපති වෙලා, විනාශ වෙමින් තිබුණු මේ රටේ වාමාංශික ආර්ථික ක්‍රමය නැති කරලා ආර්ථික සංවර්ධනයක් ඇති කරමින්, මිනිසාගේ අයිතිය තුළින් මිනිසා සංවර්ධනය කරවන රටක් බවට මේ රට පත් කළා. එතුමා එදා තිබුණු "පොලු යුගය" නැති කරලා, ඒ නීති සියල්ල ඉවත් කරලා බෞද්ධ රාජ්‍යයක් බිහි කළා.

1965-70 කාලයේ ඩඩ්ලි සේනානායක මැතිතුමා ආරම්භ කළ මහවැලි යෝජනා ක්‍රමය එදා තිබුණේ අවුරුදු 30කින් අවසන් කරන්නට. ඒ වන විට ඒ ව්‍යාපෘතිය පොල්ගොල්ලෙන් නැවතිලා තිබුණා. මම කියන්නේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නායකයෙක්; නායකයන්ගෙත් නායකයෙක් කියලායි. එවැනි ආත්ම ශක්තියක්, විශ්වාසයක්, නොසැලෙන අධිෂ්ඨානයක් වාගේම දර්ශනයක් මත යන්න පුළුවන්, ඉලක්කයන් ක්‍රියාත්මක කරන්න පුළුවන් නායකයෙක් ඉන්නවා නම්, මා දුටු එවැනි ජේ.ආර්. ජයවර්ධන කෙනෙක් තමයි අද මේ ගරු සභාව තුළ ඉන්නේ. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා තරුණයකු වූ ගාමිණී දිසානායක මැතිතුමා එක්ක ගිහිල්ලා ජාවත්තේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදී කිව්වේ, "මට අවුරුදු 30 ක් ඉන්න බැහැ, මේ ව්‍යාපෘතිය අවුරුදු 8කින් 10කින් ඉවර වෙන්න ඕනෑ. මට ඕනෑ මගේ කාලයේ මේක ඉවර කරන්න" කියලායි. අන්න බලන්න! සියලුම අය ඒ කථාවට හිනා වුණා. මොකද, එතකොට භාණ්ඩාගාරයේ ශතයක්වත් නැහැ. නමුත් එතුමා නොසැලී ඔය වික්ටෝරියා වැනි ජලාශ හදපු නිසායි, අද මේ සියලුම දේවල් තිබෙන්නේ. ඒ යුගයේ හිටපු කණ්ඩායමේ එක එක්කෙනාගේ දක්ෂතා අනුව ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කටයුතු කළ ආකාරය, වැඩ පවරා ආකාරය, ක්‍රියා කළ ආකාරය මම දුටුවා.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා එස්මන්ඩ් වික්‍රමසිංහ මැතිතුමාගේත්, ඉතාම ශ්‍රේෂ්ඨ කාන්තාවක් වන නාලිනී වික්‍රමසිංහ මැතිනියගේත් පුත්‍රයායි. ඒ කාලයේ එස්මන්ඩ් වික්‍රමසිංහ මහත්මයාට අපි බොහොම ගරු කළා. එදා එතුමා බොහොම දක්ෂ ලෙස, බුද්ධිමත් ආකාරයට මේ අය මෙහෙයවන ආකාරය තරුණයෙක් විධියට මා දැක්කා. මම දැක්කේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා තමන්ගේ පුතකු විධියට රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙහෙයවන ආකාරයයි. ඒ, ඥාතිකමට සැලකුවා නොවෙයි. හැම කෙනෙකු තුළම තිබෙන නායකත්වයේ ගුණාංග එතුමා දැන ගෙන හිටියා. එතුමා දැක්කා, මේ රනිල් වික්‍රමසිංහ කියන කෙනා ඉවසිලිවන්තව, හොඳ අනාගතයකට යන කෙනෙක් බව. ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත්මුදලි, ප්‍රේමදාස මැතිතුමන්ලා ඉදිරියට යද්දී, ඔවුන් ගෙන ගිය යුගය අවසන් වෙද්දී, ඒ නායකත්වය ඉදිරියට ගෙන යන්න රනිල් වික්‍රමසිංහ මැතිතුමාව හදපු ආකාරය මම දැක්කා. එතුමාත් ඇමතිවරයකු විධියට, නියෝජ්‍ය ඇමතිවරයකු විධියට එතුමාගේ කාර්ය භාරයන් හරියටම කළා; අවංකව ඉටු කළා; දර්ශනයක් අනුව කටයුතු කළා. ඒ දර්ශනයේ ප්‍රතිඵල අද ලංකාවේ තිබෙනවා. කාලයක් එක්ක විටින් විට වෙනස් වූ පරිපාලන තන්ත්‍රවලින් මේ රට විනාශ මුඛයට ගියා. ඒ දර්ශනය

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

අනුව කටයුතු කර ගෙන ගියා නම් අද මේ රට ආසියාවේ තිබෙන ස්වර්ණමය රට බවට පත් වෙනවා; ලෝකයේ උතුම් රටක්, දියුණු ආර්ථිකයක් සහිත රටක් බවට පත් වෙනවා.

ගරු කථානායකතුමනි, තවත් එක අවස්ථාවක් ගැන මා සඳහන් කරනවා. අපේ විදේශ ඇමතිතුමා හිටිය ඒ ගොඩනැඟිල්ලේ තමයි එක් දවසක් අපේ කණ්ඩායම් රැස්වීම් පැවැත්තුවේ. ඒ යුගයේ එක අවස්ථාවක් මට මතක් වෙනවා, මෙතුමාටත් මම ඒ අවස්ථාව මතක් කරනවා. බොහෝ අය මේවා දන්නේ නැහැ. එක්තරා දවසකදී අපි රැස්වීම පවත්වන අතරේ එක්වරම පැරණි ගොඩනැඟිල්ලේ වහලයේ බාල්කයක්, "ඩෝං" ගාලා උඩින් ආවා. ඒ බාල්කය දිරලායි කඩා වැටුණේ. ඒක හරියට උලක් වාගේ. ඒක ජනාධිපතිතුමාගේ මේසය උඩට වැටිලා බිමට වැටුණා. මම දැක්කා, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හෙල්ලුණේවත් නැති බව. එතුමා නොසැලී හිටිය ආකාරය මම දැක්කා. ඒ වෙලාවේ සියල්ලන්ම ගල් ගැහිලායි හිටියේ. Security එක භාරව සිටි අය ඇවිල්ලා ජනාධිපතිතුමාව ඇදලා ගත්තා. අර බෝම්බ ගහපු වෙලාවෙත් එහෙමයි හිටියේ.

ගරු කථානායකතුමනි, ඒ යුගයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු හිඟයක් ඇති වුණා. ඒ වෙලාවේ නිශ්ශංක විජේරත්න මැතිතුමා ගුරුවරුන් දෙතුන්-දාහක් අපේ ආසනවලට පත් කළා. එහෙම පත් කිරීමේදී අඩු පාඩු සිදු වුණා; සුදුසුකම් නැති අයත් පත් වුණා. ඒ වෙලාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් විපක්ෂයෙන් චෝදනාවක් ආවා. අවසානයේ ජනාධිපතිතුමා -ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා- රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් පත් කළා. ඒ වෙලාවේ මෙතුමා තරුණ ඇමතිවරයෙක්. මෙතුමා තීරණයක් ගත්තා, "සුදුසුකම් නැති කිසි කෙනෙක් බඳවා ගන්නේ නැහැ" කියලා. ඒ වෙලාවේ ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වල හැම දාම යුද්ධයක්; "මේ ප්‍රතිපත්ති ලිහිල් කරන්න" කියලා අපි සියලු දෙනාම මෙතුමාට කෑ ගහනවා. නමුත්, එතුමා හෙල්ලුණේ නැහැ: තීරණය වෙනස් කළේ නැහැ.

ගරු කථානායකතුමනි, දවසක් ජනාධිපතිතුමා -ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා- කිව්වා, "රනිල්, ඔය ප්‍රතිපත්තිය පොඩ්ඩක් ලිහිල් කරන්න කෝ" කියලා. තරුණ ඇමතිවරයෙක් හැටියට මෙතුමා දුන්නු උත්තරය මොකක්ද? "සර්, එහෙනම් මම ඇමතිකමෙන් අයින් වෙන්නම්" කිව්වා. අන්න බලන්න! මම හිතනවා, ඒක මේ සභාවේ ඉන්න තරුණ මන්ත්‍රීවරුන්ට හොඳ පාඩමක් කියලා. ඒ වෙලාවේ ජනාධිපතිතුමා නිශ්ශබ්ද වුණා. අපි යටත් වුණා; අපි එතැන නැවතුණා. ඒ වාගේම, එතුමා බොහොම ඉවසිලිවන්තයි මේ ගමන යන්නේ. ගරු කථානායකතුමනි, මේ තමයි මෙතුමා සම්බන්ධයෙන් තිබෙන දීර්ඝ ඉතිහාසය. මම දුටුව ඒ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් කථා කරනවා නම් බොහෝ වෙලා කථා කරන්න තරම් සිද්ධි මම දන්නවා.

ගරු කථානායකතුමනි, 1994 පැවති මැතිවරණය අපට මතකයි. ඒ ප්‍රතිඵල අනුව එක ආසනයයි වෙනස් වෙලා තිබුණේ. ඒ එක ආසනය අනෙක් පැත්තෙන් ගන්න අපට පුළුවන්කම තිබුණා. නමුත් මෙතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන පුද්ගලයෙක් විධියට, මහ ජන මතයට ගරු කරලා බැග් එකත් අරගෙන අරලියගහ මැදුරෙන් ගියා. ඒවා අපට අමතක කරන්න බැහැ. ඒ වාගේම, 1995 අවුරුද්ද මට මතකයි. ඒ කාලයේ මමත් පක්ෂයේ තනතුරක හිටිය කෙනෙක්. ඒ, විපක්ෂයේ අපි බොහොම තාඩන-පීඩනවලට මුහුණ දුන් වෙලාවක්. පහුවෙනි දා උදේ newsවලට කිව්වා, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමියත්, රනිල් වික්‍රමසිංහ විපක්ෂ නායකතුමාත්, ලියම් ෆොක්ස් විදේශ ඇමතිතුමා එක්ක ගිවිසුමක් අත්සන් කළා කියලා. අපි ඇහුවා, "ඇයි එහෙම කළේ?" කියලා. අපට හරි තරහක් ඇති වුණා, අපට හිරිහැර කරන අයත් එක්ක මෙහෙම ගිවිසුමක් අත්සන් කළේ ඇයි කියලා. ඒ වෙලාවේ අපේ විපක්ෂ නායකතුමා අපව කාමරයට කැඳෙව්වා. කැඳවා කිව්වා,"ජයවික්‍රම, මතක තියාගන්න. අපි බලයට ආවත් ප්‍රභාකරන්ගේ එල්ටීටීඊ ප්‍රශ්නයට අපට මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. අපි මේ ප්‍රශ්නය කොහොම හරි ඉවර කරන්න ඕනෑ. අපි දැන් විපක්ෂයේ හිටියත් කවදා හෝ ආණ්ඩු පක්ෂයට එනවා. දැන් අප මුහුණ දී තිබෙන මේ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක් විධියට සලකා විසඳන්නට ඕනෑ. මම ලියම් ෆොක්ස් හා චන්ද්‍රිකා කුමාරණතුංග මැතිනියත් සමඟ ගිවිසුම අත්සන් කළේ අනාගතය දිහා බලලා" කියා. අන්න ඒ නායකත්වයයි මේ ගරු සභාවට ඕනෑ. එවැනි නායකත්වයක් ඇති අය මේ ගරු සභාවේ නැතිකමයි ප්‍රශ්නය වෙලා තිබෙන්නේ. හැම කෙනාම පටු ආකල්ප ඉස්සරහට ගෙනැවිත් තමන් බලයට එන්න උත්සාහ කරනවා; බලය සදාකල් පවතින්නේ නැති බව මතක තියාගන්නේ නැහැ. අද බලයේ හිටියත් හෙට ඒ බලය නැති වන්නට පුළුවන්. අපි කාටවත් සතුරුකම් කරන්නේ නැහැ. අද මේ අවස්ථාවට සහභාගි නොවුණු මේ පාර්ලිමේන්තුවේ මේ උත්තරීතර සභාවේ සගෝදර මන්ත්‍රීවරුන් මේ ගරු සභාවට ඇවිත් වාඩි වෙලා හිටියා නම් ඒ ඇති; කථා නොකළත් කමක් නැහැ. එක තමයි උතුම් ගුණාංගය.

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන කථා කරන්න අද කථිකයන් රාශියක් ඉන්නවා. ඔබතුමාටත් එය ප්‍රශ්නයක් බව මම දන්නවා. දීර්ඝ වශයෙන් කථා කරනවා නම් මට හුඟක් දේවල් කියන්නට තිබෙනවා. ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමනි, ඔබතුමාගේ දේශපාලන ජීවිතය මේ අවුරුදු හතළිහක කාලයකින් නවතින්නට බැහැ. මොකද, ඔබතුමා මහා දාර්ශනිකයෙක්. ඔබතුමාට ආර්ථික දර්ශනයක් තිබෙනවා. ලෝකයේ රටවල්වලට ගිය අවස්ථාවලදී ලෝක නායකයන් මට කියා තිබෙනවා,"රනිල් කියන්නේ ලංකාව පමණක් නොවෙයි ලෝකයේ ඕනෑම රටක් පාලනය කරන්නට පුළුවන් ආර්ථික දර්ශනයක් තිබෙන නායකයෙක්" කියා. ලංකාව ආඩම්බර විය හැකි ඉතිහාසයක් තිබෙන ශ්‍රේෂ්ඨ රටක්. ඔබතුමා ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත් සමඟ නොසෙල්වීයන මේ ගමනේදී, එක පවුලක් වන මේ සහෝදර මන්ත්‍රීවරුනුත් අපි ඔක්කොම මේ ගමන නොසෙල්වී යනවා. ඒ ගමන කාටවත් නවත්වන්නට බැරි බව මම කියනවා. අපි ඔක්කොම එකමුතුව ඉවසිලිමත්ව මේ ගමන ඉදිරියට යන්න ඕනෑ.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් සමඟ මේ රට ඒ ආකාරයෙන් ඉවසිලිමත්ව ඉදිරියට ගෙන ගිහින් 2020 වර්ෂය වෙද්දී මේ රටේ ණය බර නැති කර, මේ රට ආර්ථික ලෝකයේ උතුම් රටක් බවට පත් කරනු ඇතැයි කියන විශ්වාසය මා තුළ තිබෙනවා. ඒ සඳහා ඔබතුමාට ත්‍රිවිධ රත්නයේ පිහිට හා දෙවියන්ගේ ආශීර්වාදය ලැබී දීර්ඝායුෂ, ශක්තිය හා ධෛර්යයත් ලැබෙවායි මගේ හදවතින්ම ප්‍රාර්ථනා කරනවා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමාට හොඳ මැතිනියක් සිටිනවා. එතුමිය බොහොම ඉවසිලිවන්ත මහාචාර්යවරියක්. සාර්ථක, යුග දිවියක් ගෙවන මෛත්‍රී වික්‍රමසිංහ මැතිනියටත්, ඔබතුමන්ටත් මේ අවස්ථාවේදී මා නැවතත් දීර්ඝායුෂ පතනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමන් රට වෙනුවෙන් කරගෙන යන සේවය තවත් ශ්‍රේෂ්ඨ ආකාරයට කර ගෙන යාමට හැකිවේවා!යි මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි ගරු අමාත්‍යතුමනි.

ඊළඟට, ගරු පලනි දිගම්බරම් අමාත්‍යතුමා.

[மு.ப. 11.27]

ගරු පලනි දිගම්බරම් මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා)

(மாண்புமிகு பழனி திகம்பரம் - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சர்)

(The Hon. Palany Thigambaram - Minister of Hill Country New Villages, Infrastructure and Community Development)

கௌரவ சபாநாயகர் அவர்களே, தனது வாழ்க்கையில் 40 வருடங்களைப் பாராளுமன்ற அரசியலில் அர்ப்பணிப்புடன் ஈடுபடுத்திக்கொண்டிருக்கும் மாண்புமிகு பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்குத் தொழிலாளர் தேசிய முன்னணியின் தலைவர் என்ற வகையிலும் மலையகத் தமிழ் மக்களைப் பிரதிநிதித்துவப்படுத்தும் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையிலும் அமைச்சர் என்ற வகையிலும் எனது வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, அரசியல் வாழ்க்கை என்பது இலகுவானதல்ல. மக்கள் பணிக்காக முன்வந்து அரசியல் கட்சியொன்றில் இணைந்து பணியாற்றுகின்றபோது, வருடத்தின் 365 நாட்களிலும் அந்தப் பணிக்காகவே அர்ப்பணிப்போடு இருத்தல் வேண்டும். சுமார் 5 வருடங்களாக மாகாண சபை உறுப்பினராகவும் 7 வருடங்களாகப் பாராளுமன்ற உறுப்பினராகவும் அரசியல் பணியில் இருக்கும் என்னால், முழுமையான அரசியல் பணியில் இருப்பதன் சிரமத்தினையும் அழுத்தங்களையும் உணர்ந்துகொள்ள முடிகின்றது. இலங்கை அரசியலின் 40 வருட கால வரலாற்றில் நாடாளுமன்ற உறுப்பினராக, அமைச்சராக, எதிர்க்கட்சித் தலைவராக, பிரதமராக ஒருவர் செயற்பட்டு வந்திருக்கின்றார் என்பதும் அவர் ஓர் அரசியல் கட்சியின் தலைவராக இருந்து வந்திருக்கின்றார் என்பதும் சாதனைதான்.

மாண்புமிகு பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்கள் பல்கலைக்கழகக் காலத்தில் இருந்தே தனது அரசியல் பயணத்தை ஆரம்பித்தவர். மறைந்த முன்னாள் ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தன அவர்களின் அரசியல் வழிகாட்டலில் வளர்ந்தவர். ஆர். பிரேமதாச, டி.பி. விஜேதுங்க, லலித் அத்துலத் முதலி, காமினி திசாநாயக்க போன்ற மூத்த தலைவர்களுடன் ஐக்கிய தேசியக் கட்சியில் இணைந்திருந்து அனுபவங்களைப் பெற்றுக்கொண்டவர். இளம் வயதிலேயே தலைமைத்துவப் பொறுப்புக்களை ஏற்று, ஐக்கிய தேசியக் கட்சியின் தலைவராகப் பதவி ஏற்றுப் பல்வேறு சிக்கலான காலகட்டங்களில் கட்சியை வழிநடத்தியவர். தனது அரசியல் பயணத்தில் பல்வேறு இடையூறுகள் வந்தபோதும் அதனைப் பொறுமையோடு எதிர்கொண்டு, தனது சாணக்கியமான செயற்பாடுகளால் ஐக்கிய தேசியக் கட்சியை மீண்டும் ஆட்சி பீடம் ஏற்றியவர்.

கௌரவ சபாநாயகர் அவர்களே, ஐக்கிய தேசியக் கட்சியை ஒரு கூட்டணிக் கட்சியாக - ஐக்கிய தேசிய முன்னணியாக விரிவாக்கி ஒரு கூட்டணியை உருவாக்கி, பிற அரசியல் கட்சிகளினதும் சிவில் சமூக அமைப்புக்களினதும் ஒத்துழைப்புடன் மாத்திரம் அன்றி, சுதந்திரக் கட்சியுடன்கூட ஒன்றிணைந்து தேசிய அரசாங்கத்தினை நடத்திவருவதிலும் பங்களிப்பை வழங்கி வருபவர் பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்கள்.

ஐக்கிய தேசிய முன்னணியை உருவாக்கியபோது, தொழிலாளர் தேசிய முன்னணியின் ஆதரவினைத் தமிழ் முற்போக்குக் கூட்டணியூடாகப் பெற்றுக்கொடுத்துக் கடந்த பொதுத் தேர்தலில் நுவரெலியா மாவட்டத்தில் அதிகளவு வாக்கு வித்தியாசத்தில் ஐக்கிய தேசியக் கட்சியை வெற்றி பெறச் செய்யும் வாய்ப்பு எமக்குக் கிடைத்தது. எமது கட்சியின் பலத்தை உணர்ந்து, எமக்கு அமைச்சரவையில் உரிய அமைச்சுப் பொறுப்பு ஒன்றைப் பெற்றுக்கொடுத்த பெருமை பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களையே சாரும்.

நான் பிரதிநிதித்துவம் செய்கின்ற மலையகப் பெருந்தோட்ட மக்கள் காலாகாலமாக அரச பொது நிர்வாக முறைமையில் இருந்து விடுபட்டவர்களாக இருந்து வருகின்ற நிலையில், அவ்வப்போது எமது அரசியல் பேரம் பேசுதல் ஊடாக நாம் சில முன்னெடுப்புக்களை மேற்கொண்டு வெற்றிகளைக் கண்டுள்ளோம். முன்னாள் ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்க குமாரணதுங்க 1996ஆம் ஆண்டு மலையகப் பெருந்தோட்ட மக்களுக்காக முதன்முதலில் தோட்ட உட்கட்டமைப்பு அமைச்சினை உருவாக்கிக் கொடுத்திருந்தார். 2009ஆம் ஆண்டில் அடுத்ததாக வந்த அரசாங்கம் குறித்த அமைச்சினை இல்லாமல் செய்திருந்தது. எனினும் 2015ஆம் ஆண்டு நல்லாட்சி அரசு அமையப்பெற்றதும் பெருந்தோட்ட உட்கட்டமைப்பு அமைச்சினை உருவாக்கி, 100 நாள் வேலைத்திட்டத்திலே 7 'பேர்ச்' காணியுடன்கூடிய தனிவீட்டுத் திட்டத்தினை நடைமுறைப்படுத்தும் பொறுப்பினை அவர் என்னிடம் ஒப்படைத்தார்.

நூறு நாட்களில் வெற்றிகரமாக முன்னெடுக்கப்பட்ட திட்டம் காரணமாக எனது அமைச்சுப் பணியில் நம்பிக்கை கொண்டு, பொதுத் தேர்தலுக்குப் பின்னர் அமைந்த தேசிய அரசாங்கத்தில் "மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு" என்ற ஓர் அமைச்சை உருவாக்கி, 'தோட்டம்' எனும் சொல்லுக்குப் பதிலாக, மலைநாட்டில் புதிய கிராமங்களை உருவாக்கித் தோட்டங்களைக் கிராமங்களாக மாற்றும் எண்ணக்கருவினை நடைமுறைக்குக் கொண்டுவந்து, அதனை உத்தியோகபூர்வமாக ஆரம்பித்து வைத்தவர் மாண்புமிகு பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்கள் என்பதை மலையக மக்களின் சார்பில் நன்றியுடன் இந்த உயரிய சபையிலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

எதிர்க்கட்சித் தலைவராகச் செயற்பட்ட காலத்தில் ஒருசில ஊடகங்கள் பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்கவைத் திட்டமிட்ட அடிப்படையில் விசமப் பிரசாரம் மூலம் கீழிறக்க முயற்சித்தன. எனினும் அவர், தனது மனம் தளராத ஆற்றலால் இன்று இலங்கை நாட்டின் பிரதமராக மீண்டும் உயர்ந்து நிற்கின்றார். இன்று பாராளுமன்ற அரசியல் வாழ்வில் 40 ஆண்டுகாலப் பூர்த்தியைக் கொண்டாடும் பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்கள் தனது அரசியல் செயற்பாட்டில் இன்னும் பல ஆண்டுகள் திடமாகச் செயற்படுவதற்கு மலையக மக்கள் சார்பில் எனது மனமார்ந்த வாழ்த்துக்களைத் தெரிவித்துக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

Thank you, Hon. Minister. The next speaker is the Hon. Mano Ganesan.

[மு.ப. 11.32]

ගරු මනෝ ගනේසන් මහතා (ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා)

(மாண்புமிகு மனோ கணேசன் - தேசிய சகவாழ்வு, கலந்துரையாடல் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்)

(The Hon. Mano Ganesan - Minister of National Co-existence, Dialogue and Official Languages)

நன்றி, கௌரவ சபாநாயகர் அவர்களே!

எங்களது பிரதம அமைச்சர் ரணில் விக்கிரமசிங்க அவர்களது 40 ஆண்டு காலப் பாராளுமன்ற மற்றும் பொதுப் பணி தொடர்பாக, அவரைப் பாராட்டி மகிழ்வதற்காக நாங்கள் இங்கு கூடியிருக்கின்றோம். நான் பாராளுமன்றத்திலே உரையாற்றும்பொழுது வழமையாகச் சிங்கள மொழியில் உரையாற்றினாலும்கூட, இன்று எனது தாய்மொழியில் உரையாற்றி, அதன்மூலமாக எங்களது மகிழ்ச்சியைத் தெளிவான முறையிலே, சரியான வகையில் பகிர்ந்துகொள்ள விரும்புகின்றேன்.

கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களது அரசியல் வாழ்வை உற்றுநோக்கும்போது எனக்கு இரண்டு விடயங்கள் புலனாகின்றன. ஒன்று கல்வி, அடுத்தது இளைஞர் முன்னேற்றம். இந்த இரண்டு விடயங்களையும்தான் அவர் தனது அரசியல் வாழ்விலே அடிப்படைத் தேவைகளாக உணர்ந்து முன்னெடுத்துக்கொண்டிருந்தார் என்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இன்று கல்விக்காக இயங்கிவரும் தேசியக் கல்வி நிறுவகமானது அவரின் சிந்தனையில் உதித்த ஒரு முத்தென நான் நினைக்கின்றேன். வெறுமனே கல்வி என்ற ஒரு முறைமையிலே இருந்த ஒரு செயற்பாட்டை அவர் மாற்றியமைத்தார். எதிர்காலத்தை நோக்கிய கல்வி இருக்கவேண்டும், அதுவே நாட்டின் அடிப்படை அவசியமாக இருக்கின்றது என்பதை உணர்ந்து கல்விக் கொள்கையைத் தொடர்ந்து புதுப்பித்துக்கொண்டு - update செய்துகொண்டு வருகின்ற ஒரு முறைமையை அவர் அன்று ஏற்படுத்தி அதனை நிறுவனமயப்படுத்தியிருக்கின்றார். அதை நாங்கள் புரிந்துகொள்ள வேண்டும்.

அதுமட்டுமல்ல, கல்வியுடன் சேர்த்துத் தொழில்நுட்பம், கணினி, ஆங்கிலம் ஆகிய துறைகளையும் அவர் அபிவிருத்தி செய்திருக்கின்றார். கடந்த காலங்களில் இந்த நாட்டிலே பல தலைவர்கள் இருந்தார்கள். அவர்கள் இந்த நாட்டின் பாமர மக்களின், ஏழை மக்களின் பிள்ளைகளை எல்லாம் ஆங்கிலம் படிக்கவேண்டாம் என்று சொல்லிவிட்டுத் தமது பிள்ளைகளை எல்லாம் வெளிநாட்டுக்கு அனுப்பி ஆங்கிலம் படிப்பித்தார்கள் என்பது எமக்கு நன்றாகத் தெரியும். ஆனால், கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் அப்படிச் செய்யவில்லை. அவர் இந்த நாட்டின் ஏழைப் பிள்ளைகள், பாமரப் பிள்ளைகள் எல்லோருமே ஆங்கிலம் படிக்கவேண்டும் என்ற ஆர்வத்தை அடிப்படையாகக்கொண்டு, ஆங்கிலக் கல்வியை வளர்த்தெடுத்தார். ஆங்கிலம், கணினிக் கல்வி, தொழில்நுட்பக் கல்வி ஆகியவற்றைக் கல்விச் செயற்பாட்டிலே முன்னிலை வகிக்கச் செய்திருந்தார்.

அதுமட்டுமல்ல, விளையாட்டுத்துறையிலும்கூட அவர் பாரிய பங்களிப்பை வழங்கியிருந்தார் என்று சொல்ல வேண்டும். நாடு முழுக்க இன்று பாடசாலைகளை ஒட்டிய விளையாட்டு மைதானங்கள் அமைக்கப் பட்டிருக்கின்றன என்றால், அதற்கு ஆரம்ப கர்த்தாவாகக் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் இருந்தாரென்று சொல்லலாம். அதுமட்டுமல்ல, விளையாட்டுத்துறையில் சிறந்து விளங்கியவர்களைக் கண்டுபிடித்து, அவர்களை வளர்த்தெடுத்து, விளையாட்டுத்துறை சார்ந்த ஆசிரியர் நியமனங்களை அவர்களுக்கு வழங்கித் திட்டமிட்ட முறையிலே விளையாட்டுத்துறையையும் வளர்த்தெடுத்தார்.

அடுத்து, இளைஞர் துறையென்று பார்க்கும்போது, இளைஞர் சேவை மன்றத்தின் பிதாமகனாக அவர் இருந்திருக்கின்றார். இளைஞர்களை அடையாளங்கண்டு, அவர்கள் வளர்ந்து வரவேண்டும், எழுச்சி பெறவேண்டும் என்று தெளிவான ஒரு உணர்வைக் கொண்டிருந்தார். எந்தவொரு நாட்டிலே, எந்தவொரு சமூகத்திலே இளைஞர்கள் தூங்கிவழிகின்றார்களோ, அந்த நாடும் அந்தச் சமூகமும் தூங்கிவிடும். அதேபோல், எந்தவொரு நாட்டிலே, எந்தவொரு சமூகத்திலே இளைஞர்கள் விழித்திருக்கின்றார்களோ அந்த நாடும் அந்தச் சமூகமும் எழுச்சிபெறும், மலர்ச்சி பெறும், முன்னேறும் என்ற அடிப்படையை அவர் தெளிவான முறையில் உணர்த்தி அதனை நடைமுறைப்படுத்திக் காட்டியிருந்தார். அந்தக் காரணத்தினாலேதான் இளைஞர் சேவைகள் மன்றத்தோடு மட்டும் நின்றுவிடாமல், ஒவ்வோர் ஆண்டும் தொடர்ச்சியாக இளைஞர் முகாம்களை நாடெங்கிலும் திட்டமிட்ட முறையிலே நடத்திக்கொண்டிருந்தார். அதன்மூலமாக எமது நாட்டின் இளைஞர் சமுதாயத்திற்கு ஓர் உந்துசக்தியாக இருந்தார். ஏனென்றால், இளைஞர் சமுதாயம்தான் நாட்டின் எழுச்சிக்கான ஓர் உந்துசக்தி - engine என்பதை அவர் தெளிவாக அறிந்திருந்தார். அது உண்மை. ஆகவே, இதை நாங்களும் கவனத்திலெடுக்க வேண்டும்.

எனக்குத் தற்போது ஒரு சம்பவம் ஞாபகத்திற்கு வருகின்றது. 2010ஆம் ஆண்டு ஜனாதிபதித் தேர்தலின்போது எமது பொது வேட்பாளர் சரத் பொன்சேகா அவர்களுக்கு ஆதரவு தெரிவித்து நாங்கள் எல்லோருமே பிரசாரம் செய்துகொண்டிருந்த வேளையிலே, மலைநாட்டில் வலப்பனையிலிருந்து நோர்வூட் வரையும் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடன் நான் பயணித்துக் கொண்டிருந்தேன். வலப்பனையில் கூட்டத்தை முடித்துவிட்டு நோர்வூட் கூட்டத்திற்குச் செல்வதற்காக அவரது வாகனத்தில் நான் பயணித்தேன். மறைந்த எமது நண்பர் டாக்டர் ஜயலத் ஜயவர்தன அவர்களும் அன்று என்னுடன் இருந்தாரென்று நினைக்கின்றேன். அந்த மலைநாட்டு வீதிகளிலே நாம் வந்துகொண்டிருந்தபோது கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் ஒரு விடயத்தைச் சொன்னார். அது இன்றும் என் காதுகளில் ஒலித்துக்கொண்டிருக்கின்றது. "எங்கள் தோட்டத் தொழிலாளர்களது வாழ்க்கையைப் பாருங்கள் மனோ. அவர்களது வாழ்க்கை ஏன் தேசிய நீரோட்டத்திலிருந்து தள்ளிவைக்கப்பட்ட ஒரு வாழ்க்கையாக இருக்கின்ற தென்றால், அவர்களது 'லயன்' குடியிருப்புக்கள் எல்லாம் தோட்டங்களுக்குள்ளே மலைகளுக்கு அப்பால் மேலே இருக்கின்றன. எனவே, அவற்றினை மாற்றியமைத்துச் சாலையோரங்களிலே தனி வீடுகளை அமைத்துக் கொடுக்க வேண்டும்" என்ற தனது கனவை என்னிடம் பகிர்ந்துகொண்டு வந்தார். அதன்மூலமாகத் தோட்டத் தொழிலாளர்களை நடைமுறை ரீதியாகத் தேசிய நீரோட்டத்தில் கலந்திட முடியுமென்ற கனவை என்னிடம் பகிர்ந்துகொண்டார். அதுமட்டுமல்ல, "எதிர்காலத்தில் எங்களது ஆட்சிவரும்போது தோட்டத் தொழிலாளர்கள் எல்லோருக்கும் தனி வீடுகளைச் சாலையோரங்களில் அமைத்துக் கொடுப்பதன்மூலமாக அவர்கள் தேசிய நீரோட்டத்தில் கலந்த பின்னர், அவர்கள் உங்களுக்கு வாக்களிக்காது சிங்கள மொழியைப் பேசுகின்ற சிங்கள இனத்தைச் சார்ந்த எமது வேட்பாளர்களுக்கு

வாக்களிக்கக்கூடிய வாய்ப்பு ஏற்படும்" என்று சிரித்துக்கொண்டு வேடிக்கையாகச் சொன்னார். நானும் சிரித்துக்கொண்டே, "அது நல்ல விடயம். உண்மையிலே அப்படி அவர்கள் செய்வார்களேயானால் எதிர்காலத்திலே தமிழ் மக்கள் தமிழர்களுக்கு மட்டுமே வாக்களிக்கவேண்டும் என்ற கொள்கையை மாற்றி, நாங்களும் சிங்கள மக்களின் வாக்குகளைப் பெறக்கூடிய வாய்ப்புகள் ஏற்படும்." என்று சொன்னேன். அவருக்கு அது ஞாபகமிருக்குமென்று நினைக்கின்றேன். உண்மையில் அதுதான் சரி. இந்த நாட்டிலே இருக்கக்கூடிய இன அடையாள அரசியலைத் தவிர்த்து, படிப்படியாக தேசிய ரீதியாக அரசியலில் நுழைய வேண்டும் என்ற அடிப்படையை எனக்குக் காட்டித்தந்தவர் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள்தான் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

தேசிய இனப்பிரச்சினைக்குப் பேச்சுவார்த்தை மூலமாகத்தான் தீர்வு காணப்படவேண்டும் என்பதிலே அவர் தெளிவான, உறுதியான நிலைப்பாட்டைக் கொண்டிருக்கிறார். ஏனென்றால், பேச்சுவார்த்தை மூலம்தான் இனங்களுக்கு மத்தியில் உண்மையான புரிந்துணர்வைக் ஏற்படுத்தமுடியும். அதனடிப்படையில், இனங்களுக்கு மத்தியிலே ஓர் இணைந்த செயல்பாட்டைக் கொண்டுவர வேண்டும் என்பதிலே அவர் அக்கறையாக இருந்தார் என்பது எங்களுக்கு நன்றாகத் தெரியும். பேச்சுவார்த்தை மூலமாகத் தீர்வு காண்பதற்காக அவர் கடந்த காலங்களிலே பல்வேறு சந்தர்ப்பங்களில் தொடர் முயற்சிகளை மேற்கொண்டு வந்தார். இனப்பிரச்சினைக்கு இன்றுவரை தீர்வொன்று காணப்படாவிட்டாலும் அவருடைய முயற்சிகள் தோல்வியடைந்துவிட்டன என்று சொல்ல முடியாது. அதன்பிறகு தனிநாட்டுக் கோரிக்கையை முன்வைத்து மேற்கொள்ளப்பட்ட ஆயுதப் போராட்டம் முடிவுக்கு வந்தது; அரச பயங்கரவாதம் முடிவுக்கு வந்தது. என்றாலும்கூட, யுத்தம் முடிவடைவதற்கு கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடைய பேச்சுவார்த்தை முயற்சி ஓர் அடிப்படையாக அமைந்தது என்பதை வரலாறு ஒரு நாளைக்கு நிச்சயமாகப் பதிவுசெய்யும் என்று நான் நம்புகின்றேன்.

அதுமட்டுமல்ல, தமிழீழ விடுதலைப் புலிகளின் தோல்வியானது ஒருபோதும் தமிழ் மக்களின் தோல்வியாக அமைந்துவிடக்கூடாது என்பதிலும் தமிழீழ விடுதலைப் புலிகளுக்கு எதிரான வெற்றி என்பது தமிழ் மக்களுக்கு எதிரான வெற்றியாக அமைந்து விடக்கூடாது என்பதிலும் அவர் தெளிவாக இருந்தார் என்று நான் நினைக்கின்றேன். காரணம், கடந்த பத்து வருடங்களுக்கு மேலாக நான் அவருடன் எதிர்க்கட்சியில் இருந்துகொண்டு தெருப் போராட்டங்கள் முதல் பாராளுமன்றப் போராட்டங்கள் வரை தொடர்ந்து செயல்பட்ட ஒருவன் என்ற வகையில், அதுபற்றி எனக்கு நன்றாகத் தெரியும்.

அதுமட்டுமல்ல, அன்று நாங்கள் மக்கள் கண்காணிப்புக் குழுவை அமைத்திருந்தோம்; "நிதஹஸ் வேதிகாவ" என்று சொல்லக்கூடிய சுதந்திரத்துக்கான மேடையையும் அமைத்திருந்தோம். அதற்குப் பின்னர், "விபக்ஷ விரோதய" என்று சொல்லக்கூடிய எதிர்க் கட்சிகளின் எதிர்ப்பு இயக்கத்தையும் அமைத்திருந்தோம். கடைசி காலகட்டத்தில், "சமகி பெரமுன" என்று சொல்லக்கூடிய ஒரு முன்னணியையும் அமைத்திருந்தோம். இவை அனைத்தும் முன்னெடுக்கப்பட்ட பொழுது, நான் அவருடன் கூடவே இருந்திருக்கின்றேன்; அவர் கரம்பிடித்து செயற்பட்டிருக்கின்றேன் என்பது அவருக்கு நன்றாகத் தெரியும் என்று நினைக்கின்றேன். அக்காலகட்டத்தில் ஜனநாயகம், சுதந்திரம், மனித உரிமைகள், சட்டத்தின் ஆட்சி, ஊடகச் சுதந்திரம் என்பன இல்லாமல் இருந்தது மட்டுமல்ல, நமது மக்களைத் திட்டமிட்ட முறையிலே அடையாளம்கண்டு, அவர்களைக் கைதுசெய்வதாகச் சொல்லி, வெள்ளை வேன் மூலம் கடத்திச் சென்று கொலை செய்த அந்தக் காட்டாட்சியை வீட்டுக்கு அனுப்பவேண்டிய தேவையிருந்தது. அதனை அடிப்படையாக் கொண்டு நாங்கள் அன்று செயற்பட்டோம் என்பது உங்களுக்கு நன்றாகத் தெரியும் என்று நினைக்கின்றேன்.

இவையெல்லாம் நடைபெற்றபொழுது, நான் அவரிடம் படித்துக்கொண்ட பாடங்கள் நிறையவே இருக்கின்றன. முதலாவது பாடம் நிதானம்! அடுத்து பொறுமை! இந்த இரண்டு விடயங்களையும் நான் அவரிடமிருந்துதான் கற்றுக்கொண்டேன். அதுமட்டுமல்ல, கொடுத்த வாக்குறுதியை - உறுதிமொழியை தன்னுடைய தலையைக் கொடுத்தாவது நிறைவேற்றவேண்டும் என்ற பண்பையும் நான் அவரிடமிருந்து கற்றுக்கொண்டேன். அவரிலும் வயது குறைந்த ஓர் அரசியல்வாதியாக, ஒரு கட்சியின் தலைவராக இருக்கின்ற நான், அவரிடமிருந்து படித்துக்கொண்ட முக்கிய பாடங்கள் என்னவென்றால், நான் முன்னர் சொன்னதுபோல், ஒன்று பொறுமை! அடுத்தது நிதானம்! அதற்கு அடுத்தது கொடுத்த வாக்கை தன்னுடைய தலையைக் கொடுத்தாவது நிறைவேற்றவேண்டும் என்ற பண்பு!

இப்பொழுது பாருங்கள்! இந்த நாட்டிலே யுத்தம் முடிந்துவிட்டாலும்கூட, தேசிய இனப் பிரச்சினை இன்னும் தீர்க்கப்படவில்லை. "தேசிய இனப் பிரச்சினையை யுத்தத்தின்மூலம் முடிவுக்குக் கொண்டுவந்துவிட்டோம்" என்று எவராவது சொல்வார்களேயானால், அவர்கள் முட்டாள்கள். இப்பொழுது நாங்கள் மக்கள் ஆணையைப் பெற்றுக்கொண்டு, புதியதோர் அரசியலமைப்பை உருவாக்குகின்ற செயற்பாட்டை அரசியலமைப்புப் பேரவையின்மூலம் உருவாக்கப்பட்டிருக்கின்ற வழிப்படுத்தும் குழுவினூடாக நிதானமான முறையிலே மேற்கொண்டு வருகின்றோம். அந்தக் குழு வெறுமனே அரசாங்கத்தின் குழுவல்ல. மாறாக, நாட்டின் குழு என்றுதான் சொல்லவேண்டும். அதில் அரசாங்கத்தில் அங்கம் வகிக்கின்ற அமைச்சர்கள் - கட்சித் தலைவர்கள் மாத்திரமல்ல, எதிர்க்கட்சித் தலைவர் உட்பட எதிர்க் கட்சிப் பிரதிநிதிகளும் அங்கம் வகிக்கின்றார்கள். எனவே, இச்செயற்பாடானது தேசிய ரீதியான ஒரு செயற்பாடாக முன்னெடுக்கப்படவேண்டும் என்பது கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுடைய எண்ணக்கரு என்பது எனக்கு நன்றாகத் தெரியும்.

இந்த வழிப்படுத்தும் குழுவின் தலைவர் என்ற முறையிலே அவர் நிதானமாகவும் பொறுமையாகவும் பண்புடனும் முதிர்ச்சியுடனும் செயற்பட்டுக்கொண்டிருப்பதை நாங்கள் தினசரி பார்க்கக்கூடியதாக இருக்கின்றது. எனவே, புதியதோர் அரசியலமைப்பை உருவாக்கி, நாட்டில் காணப்படுகின்ற அடிப்படைப் பிரச்சினைகள் அனைத்துக்கும் அடிப்படைக் காரணியாக இருக்கக்கூடிய தேசிய இனப்பிரச்சினைக்கு நியாயமான தீர்வை கண்டேதீருவோம் என்று நினைக்கின்றேன். அதுதான், இந்த நாட்டிலே அரசியல் வாழ்க்கையிலே 40 ஆண்டுகளாக நட்சத்திரமாக திகழ்ந்துகொண்டு இன்று எமக்குத் தலைமைதாங்கிக் கொண்டிருக்கக்கூடிய கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு நாங்கள் செய்யக்கூடிய மிகப் பெரிய நன்றிக் கடனாக இருக்கும் என்று நினைக்கின்றேன். நிச்சயமாக நாங்கள் அதைச் செய்வோம் என்ற நம்பிக்கை எனக்கிருக்கின்றது. அந்த அடிப்படையிலேதான் நான் என்னுடைய உணர்வுகளை இங்கு பகிர்ந்து கொண்டிருக்கின்றேன்.

[ගරු මනෝ ගනේසන් මහතා]

கொழும்பு மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்கள் என்ற வகையில், நானும் அவரும் ஒரே மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்றோம். இதுகூட, எங்களுக் கிடையில் உள்ள பாரியதொரு ஒற்றுமையாக - ஐக்கியமாக - இருக்கின்றது என்று நான் நினைக்கின்றேன். அது உண்மை! அதுமட்டுமல்ல, கொழும்பு மாவட்டத்தில் வாழக்கூடிய, கொழும்பு மாநகரில் வாழக்கூடிய ஏழை மக்கள், பாமர மக்கள், மத்தியதர மக்கள் உட்படச் சேரிப்புறங்களில் வாழுகின்ற மக்களுக்குக்குச் சரியான முறையிலே வீடமைப்புத் திட்டங்களை உருவாக்கவேண்டும் என்பது அவருடைய கனவாக இருக்கின்றது; அது எனக்கு நன்றாகத் தெரியும். அந்த வீடமைப்புத் திட்டமானது சேரிப் பகுதியிலே - பின்தங்கிய பகுதியிலே வாழ்ந்துகொண்டிருக்கும் மக்களுக்கு நம்பிக்கை தரக்கூடிய ஒரு செயற்பாடாக அமைந்திருக்கிறது. அது என்னுடைய கனவாகவும் இருக்கின்றது. இன்று அந்தக் கனவை நனவாக்கக்கூடிய வாய்ப்பு ஏற்பட்டிருக்கிறது. தோட்டத் தொழிலாளர்களுக்குச் சாலையோரங்களிலேயே வீடுகளை அமைத்துக் கொடுத்து, அவர்களைத் தேசிய நீரோட்டத்தில் கலக்கவேண்டுமென்று நான் சொன்னேன். அதேபோல, கொழும்பு மாநகரிலே வாழ்கின்ற வாழக்கூடிய எமது மக்களுக்கும் நியாயமான முறையிலே தொடர்மாடி வீடுகளை அமைத்து அவர்களது வீட்டுப் பிரச்சினையையும் தீர்க்கவேண்டுமென்பது அவரது கனவாக இருக்கிறது. அதை நனவாக்குவதற்கும், ஏனைய பிரச்சினைகளைத் தீர்ப்பதற்குமான அடிப்படையை நிச்சயமாக அவர் ஏற்றுக்கொண்டிருப்பாரென நினைக்கின்றேன். அது அவரது தொகுதியாக, எனது தொகுதியாக, நமது நண்பர்களின் தொகுதியாக இருக்கின்றது. அந்த அடிப்படையில், அவருக்கு எனது கட்சியின் சார்பாகவும், தொகுதி மக்களின் சார்பாகவும், ஜனநாயக மக்களின் சார்பாகவும், தமிழ் முற்போக்குக் கூட்டணி சார்பாகவும் அவருக்கு எனது வாழ்த்துக்களைத் தெரிவித்துக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. Risad Badhiutheen.

[11.43 a.m.]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

Hon. Speaker, thank you for giving me this opportunity. Hon. Prime Minister, Ranil Wickremesinghe, was a very young Parliamentarian who entered Sri Lanka's political system at a historic juncture from the Biyagama Electorate when late President J.R. Jayewardene had led the country into a new economic journey with the introduction of open-trade policies in 1977. His journey in Sri Lankan politics and immensurable service extended to the country are inspiring directions to any politician who wishes to serve the nation. After entering Parliament in 1977, he steadily progressed in his political journey having entrusted with many ministerial portfolios and even holding the office of Prime Minister thrice, previously.

As the Minister of Education, he introduced radical educational reforms in 1980s, which have directed the country to a knowledge-based economy. He has pioneered in addressing the needs of the youth and in directing them for self-employment. The establishment of the National Youth Services Council has been a tremendous success with multiple benefits to the youth even today. Later, as the Minister of Industries, Science and Technology, he has contributed to the second phase of economic liberalization since 1989. The Biyagama Free Trade Zone was his creation that helped many young men and women to find employment opportunities, thereby contributing to the economic prosperity of our motherland. His unvarying aim of providing employment to youth as a means of economic development in the country continues even at present, as the Prime Minister for the fourth time. His vision of creating one million new employment opportunities for the youth without a burden to the taxpayer will bring economic prosperity to this nation.

More importantly, taking up the challenges to introduce large-scale reforms to the economy in many aspects at present in his fourth term as the Prime Minister is commendable. Increasing export capacities, developing new technology-based industries, development of Western Province through the Megapolis project, and continuing efforts to convert our country to a knowledge-based economy are some of his targets for which we are happy to contribute in all possible ways. Towards leading this process he has initiated new market access through FTAs with China, Singapore and strengthening the existing FTA with India.

I, as the former Minister of Export Development and presently as the Minister of Industry and Commerce, congratulate him for all his new initiatives to expand our trade to the global market.

Hon. Speaker, our Prime Minister, Ranil Wickremesinghe had a firm commitment and leadership to regain GSP Plus for the country and to remove the fisheries ban imposed by the EU. He has succeeded both these hard-gained achievements even before he completed two years in office as the Prime Minister. As the Minister of Industry and Commerce, I believe GSP Plus is a great achievement for Sri Lanka in recent history. I am confident that his vision for Sri Lanka with all these industry reforms and directing the country to a knowledge-based economy will bring in great rewards for the Sri Lankan economy in future.

I wish to mention that before I joined the UNF Alliance, Hon. Ranil Wickremesinghe undertook the responsibility to resettle the Muslim refugees who were chased out within two hours by the terrorists from their native places in the North. In spite of various challenges

he has kept his word by appointing a Task Force under my Chairmanship in this regard. I too was a refugee. We respect you, Sir, for keeping your word and helping to solve this burning issue of the Muslim community.

Finally, as a Party Leader, a representative of Vanni District voters and a representative of the Sri Lankan exporters, traders and industrialists, I wish to congratulate our Prime Minister, Ranil Wickremesinghe on his 40-years of continuing service to the people of Sri Lanka; his courage to stand up for the right thing; his position on secularism; equality and his great respect for all citizens of this country, irrespective of race, religion, caste or creed.

I wish him long life and Almighty Allah's hidayath. Thank you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you, Hon. Minister. The next speaker is the Hon. Douglas Devananda.

[மு.ப. 11.50]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள் அரசியலில் நாற்பது ஆண்டுகளை நிறைவு செய்துள்ளதன் நிமித்தம் நடைபெறும் நாடாளுமன்ற விவாதத்தில் கலந்துகொள்ளக் கிடைத்துள்ள வாய்ப்பையிட்டு மிகவும் மகிழ்ச்சியடைகின்றேன். இதற்காக உங்களுக்கு நன்றி கூறுகின்றேன்.

1977ஆம் ஆண்டில் ஆட்சிக்கு வந்த ஜனாதிபதி ஜே. ஆர். ஜயவர்தன அவர்களின் அரசு நாட்டின் சமூக, பொருளாதார விடயங்களில் பாரிய மாற்றங்களுக்கு இடமளித்திருந்தது. அது பொருளாதார வளர்ச்சிக்குப் பெருமளவு பங்களிப்பைச் செய்துள்ளதுடன், அதனால் உச்சளவில் முன்னேற்றங்களும் ஏற்பட்டன. 1983இல் துர்ப்பாக்கிய கறுப்பு ஜூலை நிகழ்வுகள் இடம்பெறாதிருந்திருக்குமாயின் நாட்டினை பெரும் அபிவிருத்தியை நோக்கி நகர்த்திச் சென்றிருக்க முடியும். துரித மகாவலி அபிவிருத்தித் திட்டம், தேசிய இளைஞர் சேவைகள் மன்றம், மஹபொல மாணவர் நிதியம், உதாகம கிராம எழுச்சித் திட்டம், ஜனசவிய நிதியம் ஆகிய தேசிய திட்டங்கள் அன்றைய அரசினால் ஏற்படுத்தப்பட்டன.

இனப்பிரச்சினைக்கு அரசியல் தீர்வை நோக்கியதாக மாவட்ட அபிவிருத்திச் சபை முறைமையும், இலங்கை - இந்திய ஒப்பந்தத்தினூடாக மாகாண சபைகள் முறைமையும் ஏற்படுத்தப்பட்டன. இத்தனை செயற்றிட்டங்களுக்கும் ஜனாதிபதி ஜே.ஆர். ஜயவர்தன மற்றும் ஜனாதிபதி பிரேமதாச ஆகியோருக்கு நிழல்போல் இருந்து கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் செயற்பட்டு வந்தார். அவ்வப்போது எதிர்கொள்ளப்பட்ட அரசியல் நெருக்கடிகள் பலவற்றுக்கும் முகங்கொடுத்து, அவற்றையெல்லாம் துணிச்சலுடன் எதிர்கொண்டுதான் இன்றைய இந்த நிலைவரை அவர் உயர்துள்ளார் என்றே ரணில் விக்கிரமசிங்க அவர்களை நோக்க முடிகின்றது.

1977ஆம் ஆண்டில் இளம் நாடாளுமன்ற உறுப்பினராக அரசியலில் களம் புகுந்த கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்கள் பிரதி வெளிவிவகார அமைச்சராகப் பதவியேற்றுத் திறம்படச் செயற்பட்டதனால் ஜயவர்தன அரசு பின்னர் அவருக்கு இளைஞர் சேவைகள், கல்வி விவகார அமைச்சுப் பொறுப்பைக் கொடுத்தது. அந்தக் காலகட்டத்தில் பலரது பாராட்டுதல்களையும் அவர் பெற்றிருந்தார். ஆசிரியர் சேவைக்கு ஆட்களைத் திரட்டுவதற்காக ஏற்கெனவே இருந்த முறையை மாற்றினார். போட்டிப் பரீட்சையின் மூலம் சிறந்த ஆசிரியர் சமுதாயத்தை உருவாக்கிய பெருமை அவரைச் சார்ந்ததாகும்.

இத்தகைய ஒருவருடான எனது உறவுகள் 1990 களின் ஆரம்பத்தில் ஏற்பட்டது. அக்காலகட்டத்தில் இந்தியாவில் காலத்தைக் கழித்த நான், இந்திய இராணுவம் நாட்டிலிருந்து வெளியேறிக்கொண்டிருந்த நேரத்தில் இலங்கை வந்து ஜனாதிபதி பிரேமதாச அவர்களுடன் பேச்சுவார்த்தைகளில் ஈடுபட்டு, அன்றிலிருந்து தேசிய அரசியல் நீரோட்டத்தில் கலந்துகொண்டேன். அக்காலத்திலிருந்து இன்றுவரையிலான சுமார் 3 தசாப்தங்களாக ரணில் விக்கிரமசிங்க அவர்களுடன் நீண்டகால உறவுகளைப் பேணிக் கொண்டிருக்கின்றேன். அவர் ஆளுந்தரப்பினராக, எதிர்த்தரப்பினராக விளங்கிய காலங்களிலெல்லாம் நாம் மிகுந்த அந்நியோன்யமாக அரசியல் விடயங்களை முன்னெடுத்திருந்தோம்.

நாட்டின் இனப்பிரச்சினை தொடர்பில் அவரிடம் இருக்கும் தெளிவு மிக உயர்ந்ததாகும். அந்தக் காலகட்டத்தில் நோர்வே ஒப்பந்தத்தினூடாக பிரச்சினைகளைத் தீர்க்க முற்பட்டார். அதேபோல, ஜனாதிபதியாக வந்தால் துணிச்சலான முடிவுகளின்மூலம் பிரச்சினைகளைத் தீர்க்கலாம் என்ற நம்பிக்கையைக் கொண்டிருந்தார். துரதிருஷ்டவசமாக தூரநோக்கற்ற தமிழ் தலைமைகளின் போக்கால் அது கானல்நீராக மாறியது மாத்திரமல்லாமல், பாரிய அழிவையும் தமிழ் சமுதாயத்திற்கு கொடுத்திருந்தது.

இந்நிலையில் அவர் கொண்டிருக்கக்கூடிய தீர்வுக்கான யோசனைகள் மிகப் பயனுள்ளவை என நாம் அறிவோம். அவை 13வது திருத்தச் சட்டத்தை முழுமையாக நடைமுறைப்படுத்துவதில் முன்னோக்கிச் செல்லும் திட்டத்தைவிடச் சிறப்பானதாக அமையுமாக இருந்தால், அவரது அந்த யோசனைகளுக்கூடாக இலங்கையின் இனப்பிரச்சினைக்கான தீர்வு விரைவாக உருவாகவுள்ள அரசியல் யாப்பு வழியாக நிச்சயம் எட்டப்படுமாயின், அவரது யோசனைகளை நாம் நிச்சயம் வரவேற்போம் எனக்கூறிக்கொண்டு, 40 ஆண்டுகால அரசியல் வரலாற்றுப் பூர்த்தியினைக் கொண்டாடும் கௌரவ ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு எனதும் எனது EPDP கட்சியினதும் நான் பிரதிநிதித்துவப்படுத்தும் மக்களினதும் நல்வாழ்த்துக்களைத் தெரிவித்துக்கொள்கின்றேன். நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you, Hon. Member. The next speaker is the Hon. Gayantha Karunatileka'

[ප.භා. 11.55]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)

(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක - කාණි මර්රුම් පාරාළුමන්ර මරුසීරමෙප්පු අමෙච්චරුම් අරසාංගක් කට්චියින් මුදර්කෝලාචානුම්)

(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අදින් දශක හතරකට පෙර තුන්කල් දැකපු නායකයෙක් අපේ මේ මාතෘ භූමිය වෙනුවෙන් අති විශිෂ්ට ලෙස නායකත්වය සපයපු බව මේ සභාවේ සිටින බොහෝ දෙනෙකු මෙන්ම මූලාසනයේ සිටින ඔබතුමාත් හොඳින් දන්නවා. ගරු කථානායකතුමනි, අපි අද අත් විඳින අලුත් යුගයේ නිර්මාතෘවරයා වුණේ එතුමායි. ඒ අන් කවරෙක්වත් නොවෙයි මේ ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ධුරය හෙබවූ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමායි. ගරු කථානායකතුමනි, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමන් වසර හතළිහකට පෙර ලෝකයත් සමඟ ඉදිරියට යන්නට සුවිශේෂී හඳුන්වාදීම් දෙකක් සිදු කළ ආකාරය මට මේ වැදගත් අවස්ථාවේදී සිහිපත් වෙනවා. ඉන් එකක් තමයි ගරු කථානායකතුමනි විවෘත ආර්ථිකය. ඒ විවෘත ආර්ථිකය, ගෙවී ගිය වසර හතළිහ පුරාවටම විවිධ දේශපාලන කුණාටු, රැළි පෙරළිවලට මුහුණ දෙමින් තවමත් අපේ රට තුළ මහමෙරක් සේ නොසැලී පවතිනවා. එදා-මෙදා තුර විවිධ දේශපාලන වේදිකාවල විවෘත ආර්ථිකය පිළිබඳව නොයෙකුත් දේවල් කිව්වා. ගරු කථානායකතුමනි, නමුත් මේ කාල සීමාව පුරාවට විවිධ ආණ්ඩු මේ රට පාලනය කළත් ඒ හැම ආණ්ඩුවක්ම විවෘත ආර්ථිකය වැලඳ ගන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ, ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝක යථාර්ථයම එය වූ නිසායි ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඊළඟට ඒ අලුත් යුගයට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දුන් අනෙක් හඳුන්වාදීම තමයි, අද මේ උත්තරීතර සභාවේ හතළිස් වසරක පාර්ලිමේන්තු දිවිය සම්පූර්ණ කළ, අපේ ගෞරවාදරයට පාත්‍ර වී සිටින අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා. මෙතුමාත් මේ වසර හතළිහ පුරාවට විවෘත ආර්ථිකය වාගේම විවිධ අභියෝගවලට මුහුණ දෙමින්, අවලාද, අපහාස, රැළි පෙරළිවලට මුහුණ දෙමින් මහමෙරක් සේ නොසැලී සිටියා කියන එක අපි මේ වෙලාවේ මතක් කළ යුතුව තිබෙනවා. මේ සභාවේ අවුරුදු හතළිහක් විවිධ තනතුරු, ඝනාන්තර එතුමා හොබවපු හැටි අපි දැකලා තිබෙනවා. වර්තමානයේත් අග්‍රාමාත්‍ය තනතුර දරමින් මේ උත්තරීතර සභාවේ සිටින අද් දැකීම් බහුලම, පරිණතම රාජ්‍යතාන්ත්‍රිකයා ලෙස අදත් අපට එතුමා දකින්නට සිටීම මුළු රටටම ආශීර්වාදයක් හැටියටයි මම මේ වේලාවේ දකින්නේ ගරු කථානායකතුමනි.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කියන්නේ, තමන් උපන් නිවසත්, පදිංචිව සිටි නිවසත් ජාතියට දායාද කළ නායකයෙක්; තමන්ගේ වටිනා ඉඩ කඩම්, දේපොළ සහ සතු කළ නායකයෙක්; කිසිම අවස්ථාවක තමන්ගේ දරු මුණුපුරෙක් දේශපාලනයට ගේන්නට කල්පනා නොකළ නායකයෙක්. ගරු කථානායකතුමනි, ඒත් එතුමා දේශපාලන දරුවන් කිහිප පොළක් රටට නිර්මාණය කළා කියන එක ඔබතුමා හොඳින් දන්නවා. ඒ අතරින් විශිෂ්ඨතම දේශපාලන දරුවා, එදා ජේ.ආර්. ජයවර්ධනයන් නායකත්වය සපයපු මේ රටේම දැවැන්තම දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාටත් වැඩි කාලයක් අයෝමය නායකත්වයක් ලබා දෙමින්, එදා එතුමා හෙළි පෙහෙළි කළ අලුත් මාවත ඔස්සේ රට ඉදිරියට ගෙන යාමේ වගකීම තම උර මත රඳවාගෙන දැවැන්තම කාර්ය භාරයක් කරන, අද හතළිස්වෙනි පාර්ලිමේන්තු දිවිය සමරන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමායි කියලා අපි ඉතාමත්ම ආඩම්බරයෙන් කියන්නට කැමැතියි.

ගරු කථානායකතුමනි, ලෝකයේ විවිධ වූ නායකයින් බිහි වුණු හැටි දේශපාලන විද්‍යාවේදී අපට පෙන්වලා දීලා තිබෙනවා. විටෙක සාම්ප්‍රදායික නායකයන් බිහි වනවා. තවත් විටෙක වීරත්වය පදනම කර ගත් අනුභාසාත්මක නායකයන් බිහි වන හැටි අපි දැකලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එහෙත් දියුණු දේශපාලන සංස්කෘතික පිළිබිඹුව තමයි තාර්කික නායකයන් බිහි වීම. ශ්‍රී ලංකාවේ මෑත කාලයේ බිහි වෙච්ච තාර්කිකම නායකයා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාය කියලා මම කියන්න කැමතියි.

ගරු කථානායකතුමනි, එතුමා දේශපාලන වශයෙන් වැටිච්ච හැම වෙලාවකම රටේ දේශපාලන සංස්කෘතියේ ඇද වැටීමක් ඇති වුණු බව අපි දැක්කා. එතුමා දේශපාලන වශයෙන් නැඟිට්ට හැම වෙලාවකම රටේ දේශපාලන සංස්කෘතියේ විශාල පිබිදීමක් ඇති වුණ හැටිත් අපි හොඳින් දැකලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එතුමාගේ දේශපාලන දිගු ගමන තුළදී එතුමා කිසි විටෙකත් අටලෝ දහමින් කම්පා වුණේ නැහැ. එසේ අටලෝ දහමින් කම්පා නොවූ ආදර්ශවත්ම දේශපාලනඥයාත් රනිල් වික්‍රමසිංහ මැතිතුමාය කියලා මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. එතුමාගේ පාර්ලිමේන්තු දිවියට හතළිස් වසරක් පිරීම නිමිත්තෙන්, එතුමාට අසීමිතව ආදරය කරන, ගරු කරන අපේ මේ ගරු සභාවේ සිටින සමස්ත ආණ්ඩු පක්ෂයේම මන්ත්‍රීවරුන්ගේ හදවතේ ගැඹුරුම තැනින් මතුවෙලා එන උණුසුම් ශුභාශිංසනය අපේ අගමැතිතුමන්ට මේ අවස්ථාවේදී පුද කරනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමන්ට චිරං ජයතු! යයි ප්‍රාර්ථනා කරමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා

(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)

(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ඊළඟට, ගරු අග්‍රාමාත්‍යතුමා.

[අ.භා. 12.02]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)

(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ - පිරතම අමෙච්චරුම් තේසිය කොළ්කෙකළ් මර්රුම් පොරුළාතාර අළුවල්කළ් අමෙච්චරුම්)

(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, මගේ පාර්ලිමේන්තු දිවියට හතළිස් වසරක් පිරීම වෙනුවෙන් අද දින පාර්ලිමේන්තුව රැස් වී මෙම ශුභාශිංසන යෝජනාව ගෙනෙන්නට පක්ෂ නායක රැස්වීමේදී ගත් තීරණය සම්බන්ධයෙන් පළමුවෙන්ම ඔබතුමාටත්, පක්ෂ නායකයන් සියලු දෙනාටමත් මම ස්තුතිවන්ත වනවා. මේ අවස්ථාවට සහභාගි වුණු මෙම ගරු සභාවේ සිටින සියලු දෙනාටමත් මම මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා.

මම පළමුවෙන් පැමිණියේ ගාලු මුවදොර පරණ ව්‍යවස්ථාදායක ගොඩනැගිල්ලේ පැවති ජාතික රාජ්‍ය සභාවටයි. අපට සර්වජන ඡන්දය ලැබුණාට පස්සේ ඇති වුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවත්, නිදහසින් පසු ඇති වුණු පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රණ සභාවත්, පසුව ජාතික රාජ්‍ය සභාවත්, පසුව පාර්ලිමේන්තුවත් ලෙස ඒ ස්ථානයේදී රැස් වුණා. කුඩා සභා ගර්භයක තමයි එදා අපි වැඩ කටයුතු කළේ.

කැබිනට් ඇමතිවරයෙක් හැටියට වාගේම ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ප්‍රකාශක හැටියට මේ ස්ථානයට එන්න එදා මට අවස්ථාව ලැබුණා. එදා මේ ස්ථානයේ තිබුණු වගුරු බිමයි, කුඩා වැවයි, දූපතයි මැද මේ ගොඩනැඟිල්ල ඉදි කරන්න තීරණය කළා. මම හිතන්නේ ආසියාවේ තිබෙන අලංකාරම පාර්ලිමේන්තුවේ සිටිමින් තමයි 1982 ඉඳලා අපි කටයුතු කරන්නේ. මම ආණ්ඩු පක්ෂයේ හිටියත්, විරුද්ධ පක්ෂයේ හිටියත් එක් දෙයක් කළා. ඒ තමයි, අමාරු අවස්ථාවකදී වුණත් පාර්ලිමේන්තුව රැස් විය යුතුයි කියලා, පාර්ලිමේන්තුව රැස්වීම. ඒ අනුව අඩු ගණනේ පැය භාගයක් හෝ එලෙස පාර්ලිමේන්තුව රැස්වෙලා තමයි ආපසු අපි විසිරිලා ගියේ.

දේශපාලන වශයෙන් තරග කරන්න කියලා මාව යොමු කළේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමායි. ඒ වෙනුවෙන් මම එතුමාට ණය ගැතියි. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාර්ලිමේන්තු පළපුරුද්ද, එදා ගාමිණී දිසානායක, ලලිත් ඇතුලත්මුදලි ඇතුළු අපි වැනි අනිකුත් තරුණ මන්ත්‍රීවරුන්ට සහ ඇමතිවරුන්ට ලබා දුන්නා. විශේෂයෙන්ම ලංකාවේ පාර්ලිමේන්තුව සහ ලංකා පාර්ලිමේන්තු සම්ප්‍රදාය පිළිබඳව, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් පළ වී තිබෙන රසවත් කථා සියල්ලක්ම පිළිබඳව එතුමා විටින් විට අපට දැන්වූවා. ඊට පස්සේ ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා සමඟත් වැඩ කටයුතු කරන්න මට අවස්ථාව ලැබුණා. පාර්ලිමේන්තු පළපුරුද්ද මට ලැබුණේ මම පාර්ලිමේන්තුවට එන්නත් කලිනුයි.

ගරු කථානායකතුමනි, මම දැක්කා, අවුරුදු 7ක් ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විපක්ෂ නායක හැටියට කටයුතු කළ ආකාරය; මාස හතක් අගමැති හැටියට ජාතික රාජ්‍ය සභාවේ කටයුතු කළ ආකාරය; ඊට පස්සේ 1988 අවසන් වන තුරු ප්‍රේමදාස මැතිතුමා අගමැති හැටියට කටයුතු කළ ආකාරය. අන්න ඒවායින් තමයි මම දේශපාලනය පිළිබඳව අත් දැකීම් ලැබුවේ. අවුරුදු 20ක් විතර මම පාර්ලිමේන්තුව ගැන ඉගෙන ගත්තා. මගේ දැනුම වැඩි වුණා. මම ඒ නායකයන් දෙදෙනාටම විශේෂයෙන්ම ස්තුති කරනවා. ඒ එක්කම තව එක කාරණයකට අපි පුරුදු වුණා. ඒ තමයි, ආපසු විපක්ෂයට යාම. විපක්ෂයට යනවා කියන්නේ ඇත්ත වශයෙන්ම, "වළගම්බා රජතුමා කැලයට ගියා." වාගේ අත් දැකීමක්. අපි විතරයි දන්නේ, ඒකේ හැටි කුමක්ද කියලා. මගේ අත් දැකීම් අනුව, වැඩිහිටි උගතුන්ගේ අවවාදය රත්තරං හැටියට සලකන්න ඕනෑ වාගේම තම අත් දැකීම්වලිනුත් ඉගෙන ගන්න ඕනෑ. ඔය දෙකෙන් තමයි අපට ඉදිරියට යන්න අවස්ථාව ලැබුණේ.

ලෝක ඉතිහාසයේ සදාකාලික දේශපාලන සමාජයක් නැහැ. මේ අවුරුදු 40 තුළ ලංකාවේත්, ලෝකයේත් විශාල විපර්යාස ඇති වුණා. තවමත් ඒවා සිදු වෙනවා. බලගතු රාජ්‍ය දෙකක් තිබෙන ලෝකයක් නොවෙයි අද තිබෙන්නේ. මාක්ස්වාදය තිබුණු රටවලින් සම්පූර්ණයෙන්ම ඒක අවසන් වෙලා. අපි ඉපදුණු කාලයේ යුරෝපය කේන්ද්‍ර වුණු දේශපාලනයකුයි තිබුණේ. 1977දී යුරෝපය කේන්ද්‍රස්ථානයක් වුණු දේශපාලනයකුයි තිබුණේ. අද ආසියාව ශීඝ්‍රයෙන් නැඟී ගෙන එනවා. ඒ වාගේම තමයි මම පාර්ලිමේන්තුවට ආපු කාලයේ ඉඳන් ලංකාවේ විශාල විපර්යාස සිදු වෙලා තිබෙනවා. අපට වෙළෙඳ ආර්ථිකයන් ලැබුණා. මහවැලි ව්‍යාපාරය වැනි විශාල සංවර්ධන වැඩ ආරම්භ කළා. ඒ වාගේම 1983 ජාතිවාදී කෝලාහල තිබුණා. බෙදුම්වාදය තිබුණා. ත්‍රස්තවාදය තිබුණා. යුද්ධය තිබුණා. ඉන්දු-ලංකා ගිවිසුම ඇති වුණා. ඉන්දියානු සාම සාධක හමුදාව ලංකාවට ආවා. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ඇති වුණා. දකුණේත් හීෂණයක් තිබුණා. ජනාධිපතිට විරුද්ධව දෝෂාභියෝගයකට අපි මුහුණ දුන්නා. ජනාධිපති ඝාතනයක් සිදු වුණා. විපක්ෂ නායක ඝාතනයක් සිදු වුණා. ඊට පස්සේ පළමුවෙන් චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපතිවරිය සාමය සඳහා ව්‍යායාමයක් ගත්තා. ඊට පස්සේ මම අගමැති හැටියට සාම ගිවිසුමකට ඉදිරිපත් වුණා. අපි දැක්කා, යුද්ධයේ අවසානය. අපි දැක්කා, ජනාධිපති අපේක්ෂකයෙක් හිරේ දාන එක.

ප්‍රථම වතාවට විවිධ දේශපාලන පක්ෂ හා සිවිල් සංවිධාන ඇති කරලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොදු අපේක්ෂකයා කරලා අපි ජයග්‍රහණය කළා. පොදුජන එක්සත් පෙරමුණේ ජනාධිපතිවරයෙකුයි, යූඑන්පී ඇමතිවරුනුයි ඉන්න ඇමති මණ්ඩලයක් අපි ඇති කළා. එක්සත් ජාතික පෙරමුණයි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි එකතු වෙලා ජාතික ආණ්ඩුවක් ඇති කළා.

1977 ජූලි මාසයේ දී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස පත් වූ මට, 1978 ජූලි මස සිට 1978 සැප්තැම්බර් මස දක්වා විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ලෙසත්, ඉන්පසුව 1978 සැප්තැම්බර් මස සිට 1989 දක්වා යෞවන කටයුතු හා රැකී රක්ෂා අමාත්‍යවරයා ලෙසත්, 1980 පෙබරවාරි මස සිට 1989 දක්වා අධ්‍යාපන අමාත්‍යවරයා ලෙසත්, 1984 දෙසැම්බර් මස සිට 1989 දක්වා යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යවරයා ලෙසත්, 1989 ජනවාරි මස සිට පෙබරවාරි මස දක්වා කෙටි කාලයක් තුළ අධිකරණ අමාත්‍යවරයා ලෙසත්, 1989 මාර්තු මස සිට 1993 මැයි මස දක්වා පාර්ලිමේන්තුවේ සභානායක ලෙසත්, 1990 මාර්තු මස සිට 1994 අගෝස්තු මස දක්වා කර්මාන්ත, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා ලෙසත්, 1993 මැයි මස සිට 1994 අගෝස්තු මස දක්වා අග්‍රාමාත්‍ය ලෙසත්, 1994 ඔක්තෝබර් මස සිට 2001 ඔක්තෝබර් මස දක්වා විපක්ෂ නායක ලෙසත්, 2001 දෙසැම්බර් මස සිට 2004 පෙබරවාරි මස දක්වා අග්‍රාමාත්‍ය, ප්‍රතිපත්ති සම්පාදක සහ ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය ලෙසත්, 2004 අප්‍රේල් මස 22 සිට 2015 ජනවාරි මස 09 දක්වා විපක්ෂ නායක ලෙසත්, ඉන්පසුව, 2015 ජනවාරි මස 09 සිට ජූනි මස දක්වා අග්‍රාමාත්‍ය සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ලෙසත්, 2015 අගෝස්තු මස සිට අද දක්වා අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ලෙසත් කටයුතු කරමින් දේශපාලන ජීවිතයේ උඩටම බඩ ගාන්නට හැකි වුණා. මේ, මගේ දේශපාලන ගමනේ පසු බිමයි.

මම වාගේ අවුරුදු 40කට ඉස්සර දේශපාලනයට ඇතුළත් වුණු තවත් මන්ත්‍රීවරුන් දෙදෙනෙක් දැන් මේ ගරු සභාව තුළ ඉන්නවා. ඒ දෙදෙනා තමයි, වර්තමානයේ විපක්ෂ නායක ලෙස කටයුතු කරන අපේ ගරු ආර්. සම්පන්දන් මැතිතුමා සහ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිතුමා. මෙතුමන්ලා මම වාගේ සම්පූර්ණ දේශපාලන කාලයම පාර්ලිමේන්තුවේ සිටියේ නැති වුණත් ඒ අයත් ඇත්ත වශයෙන්ම අපේ අවුරුදු හතළිහේ සංකේතයක්. අපේ සම්පන්දන් විපක්ෂ නායකතුමා ප්‍රතිපත්තියක් හැටියට තමන්ගේ පක්ෂයත් එක්ක පාර්ලිමේන්තුවෙන් පිට වුණා; මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නය විසඳන්න අප එක්ක කථා කළා. ඒක විසඳලා, ඉන්දු-ලංකා ගිවිසුමත් ක්‍රියාත්මක කරනකොට තමයි එතුමාට ආපසු පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණේ. ගරු සම්පන්දන් මන්ත්‍රීතුමනි, අප දන්නවා ඒ කාලයේ ඔබතුමන්ලා ජීවත් වුණු උතුරු- නැඟෙනහිර පළාත්වල තිබුණු ප්‍රශ්න සහ ත්‍රස්තවාදය නිසා එක සැරේ තරග කරන්න අවස්ථාව ලැබුණේ නැති බව. අපිට ඒ වාසිය ලැබුණා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා එදා මේ පාර්ලිමේන්තුවෙන් පිට වෙලා ගියේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇතිවුණු පළාත් සභාවක් නියෝජනය

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

කරන්නයි; පළාත් සභාවක් භාර ගන්නයි; මහ ඇමති වෙන්නයි. එතුමා ඉතාම සාර්ථක මහ ඇමතිවරයෙක් විධියට අපට පෙන්නුවා, පළාත් සභා ක්‍රියාත්මක කරන්න පුළුවන් බව. එහෙම නම්, මම එක්ක මේ ගරු සභාවේ ඉන්න මෙම දෙදෙනාත් එක අතකින් අපේ දේශපාලනයේ සංකේත හැටියට හඳුන්වන්න පුළුවන්. එක මන්ත්‍රීතුමෙක් - කණ්ඩායමක් - ප්‍රතිපත්තියක් හැටියට පාර්ලිමේන්තුවෙන් පිටවෙලා ගියා. අනික් මන්ත්‍රීතුමා පළාත් සභා ක්‍රියාත්මක කරන්න ගියා. මේ සිද්ධීන් දෙකම අපේ දේශපාලන ඉතිහාසයටත්, අපේ දේශපාලන ක්‍රමවේදයටත් සම්බන්ධ කරුණු.

අද මේ ගරු සභාවේ හිටියත් නැතත්, සියලුදෙනාටම මම මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. අපට දැන් තිබෙන්නේ මේ ගමන ඉදිරියට ගෙන යන්නයි. යුද්ධය ඉවරයි. ඒත් විපක්ෂ නායකතුමා කිව්ව හැටියට සාමයයි, ජාතික ප්‍රශ්න විසඳීමයි, ආර්ථික සංවර්ධනයයි එකට එකතු වෙලා තිබෙන්නේ. සංවර්ධනයත් එකැනට එකතු වෙලා තිබෙනවා. එහෙම නම්, පළමුවෙන්ම අප එකම ශ්‍රී ලාංකික ජනතාවක් හැටියට සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි සියලුදෙනාම එකතු කරගෙන ඒ ගමන යන්න ඕනෑ. මම හිතන විධියට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව, පක්ෂ සියල්ලම එකතු වෙලා, අපට ඒ වැඩ කරන්න පුළුවන්. අප ඒ කැපකිරීම ඇතිකරලා තමයි මේ පාර්ලිමේන්තුවටත් පැමිණියේ.

අප සියලු දෙනාටම ජීවත් වෙන්න පුළුවන් ආකාරයට, කාටවත් මදිපුංචිකම් නොකරන මේ රටේ ඒ දේශපාලන විසඳුම මේ පාර්ලිමේන්තුව තුළින් අප ලබාගත යුතුය කියා මම කියන්න කැමැතියි. ප්‍රධාන පක්ෂ දෙකත් ආණ්ඩුවේ ඉන්න නිසා පස්ස බලන්නේ නැතිව, කිසිම බයක් නැතිව, ආර්ථික සංවර්ධන වේගය වැඩි කරලා, අපේ රටේ දියුණු ආර්ථිකයක් ඇති කරන්න අපි මේ අවුරුදුවල අඩිතාලම දමලා ඒ දෙසට ශීඝ්‍රයෙන් ගමන් කරමු. මේ සියල්ලම කරන්න අප පාර්ලිමේන්තුව කේන්ද්‍රස්ථානය කරගන්න වුවමනායි. අප දැනටම පාර්ලිමේන්තුව ශක්තිමත් කරගෙන යනවා. සර්වජන ඡන්දයෙන් තේරුණු ආසියාවේ පැරණිම පාර්ලිමේන්තුව හැටියට අපේ පාර්ලිමේන්තුව 70වැනි සංවත්සරය පවත්වනවා. පාර්ලිමේන්තුවේ තිබෙන මූල්‍ය බලතල අප වැඩි කරනවා. අලුත් කාරක සභා ක්‍රම අප ගෙනැත් තිබෙනවා. යුරෝපයේ සමහර රටවල තිබෙන පාර්ලිමේන්තුවල -ජපානයේ, ඇමෙරිකාවේ පාර්ලිමේන්තුවල- තිබෙනවා වාගේ බලතල අපේ මන්ත්‍රීවරුන්ටත් ලබාදීලා, ඒ අයට තමන්ගේ වැඩ කටයුතු කරන්න ඒ ව්‍යවස්ථාදායක වැඩකටයුතුවලට වුවමනා පහසුකම් හා ඒ වුවමනා ආයතන අප ඇති කළ යුතු බව මම විශේෂයෙන්ම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මට උදව් උපකාර කළ සියලු දෙනාටම මේ අවස්ථාවේදී මගේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම මගේ දෙමව්පියන්, භාර්යාව, පවුලේ සියලු දෙනා, මා සමඟ වැඩ කළ මගේ කාර්ය මණ්ඩලය, අපේ පක්ෂයේ අය යන මේ සියලු දෙනාගේම උදව් උපකාර එක්ක තමයි මට මේ ගමන එන්න පුළුවන් වුණේ.

අවසාන වශයෙන්, මගේ පළපුරුද්දෙන් හා අත් දැකීමෙන් දිය හැකි උපදෙස් කීපයක් මම ඔබතුමන්ලා ඉදිරියේ තබන්නම්. ඉන් පළමුවැනි කාරණය තමයි, විනයානුකූලව ක්‍රියා කරන්නය කියන එක. දෙවැනි කාරණය තමයි, ඉවසීම ඇතිව කටයුතු කරන්නය කියන එක. තුන්වැනි කාරණය තමයි, අනික් අය කෙරෙහි ඊර්ෂ්‍යාව නැතිව තමන්ගේ වැඩ කටයුතු කරන්නය කියන එක. හතරවෙනි කාරණය තමයි, ජය පරාජය දෙකම එක සේ පිළිගන්නය කියන එක.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය ඇතුළත් ත්‍රිපිටකයේ බුද්ධක නිකාය 1 හි, 6. පණ්ඩිත වග්ගය- දම්පියා පෙළ 43 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා.

"දියාලුවෝ තමන් කැමති තැනකට දිය ගෙන යති
හී වඩුවෝ හී දඬු නමති
ලී වඩුවෝ දැව නමති
නුවණැත්තෝ සිත දමනය කරත්."

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු අග්‍රාමාත්‍යතුමනි, ගරු මැති ඇමතිවරුනි. පාර්ලිමේන්තු ඉතිහාසයේ දශක හතරක දිගු කාල පරිච්ඡේදයක් පුරා තම නාමය සනිටුහන් කරනු ලබන ගරු අග්‍රාමාත්‍යතුමන් පිළිබඳ ස්වකීය අදහස් පළ කළ සියලු දෙනාටම මාගේ කෘතඥතාව මේ අවස්ථාවේදී පිළිගන්වමි. මේ දීර්ඝ චාරිකාව තුළ එතුමන් සමඟ බොහෝ කලක් ඉතා සමීපව කටයුතු කරන්නට හැකි වූ පුද්ගලයකු ලෙස ඔබ සැම විසින් ප්‍රකාශ කළ කරුණු මාගේ ද පිළිගැනීම බව සඳහන් කිරීමට කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය භාර ගෙන මාස කිහිපයකින් පසුව එතුමාගේ ආරාධනයෙන් පක්ෂ සභාපතිත්වය ඇතුළු පදවි රාශියක් භොබවමින් එතුමා සමඟ කිට්ටු දේශපාලන සම්බන්ධතාවක් ඇති කර ගැනීමට හැකි වීම ගැන මම ඉතාම සතුටු වෙමි. එතුමා සතු ඉවසීම, ජය පරාජය සම සිතින් දරා ගැනීම වැනි ගුණාංග දේශපාලනයේ යෙදෙන අලුත් පරපුරට බෙහෙවින්ම ආදර්ශ සපයා ඇති බව මා මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමැතියි. ඒ ගැන එතුමාත් සඳහන් කළා.

එතුමා විශේෂයෙන්ම මේ රටේ අනාගතය වෙනුවෙන් තීරණාත්මක, වැදගත් ප්‍රතිසංස්කරණ කිහිපයකට දායක වන්නට අප සියලු දෙනාම ධෛර්යවත් කිරීම හා මෙහෙය වීමට ක්‍රියා කළ අවස්ථා ගණනාවක් මට මේ මොහොතේ සිහි වෙනවා. 1995 වසරේ දී කතරගම පැවැත්වුණු පක්ෂ සම්මේලනයේදී සිය පක්ෂය බිහි කළ විධායක ජනාධිපති පදවිය අහෝසි කිරීම සඳහා වූ යෝජනාව අනුමත කිරීම හා පසුව ඒ වෙනුවෙන් පෙනී සිටීම අපි අගය කළ යුතුයි. ඒ වාගේම, 1999 වසරේදී පැවැත්වූ වයඹ පළාත් සභා මැතිවරණයෙන් පසු මෙරට දේශපාලන සංස්කෘතියේ දැවැන්ත ඉදිරි පිම්මක් ලෙස සනිටුහන් කළ හැකි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය බිහි කිරීමට මුල් වූ පුරවැසි කමිටුව ඇති කර, එම පනත් කෙටුම්පත සැකසීමේදී දුන් ධෛර්යය හා උපදෙස් මේ අවස්ථාවේදී අපි බොහොම ගෞරවයෙන් සිහි කරනවා.

2002දී නව මැතිවරණ ක්‍රමයක් හා මනාප ක්‍රමය වෙනස් කිරීම සඳහා වූ ජන මතයට ගරු කරමින් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් ඇති කිරීමට එතුමා දුන් සහයත් මේ අවස්ථාවේදී අපි ගෞරවයෙන් සිහි කරනවා. 2002 වර්ෂයේදී තොරතුරු දැන ගැනීම පිළිබඳ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා රටේ හා පක්ෂය තුළ වූ අදහස්වලට ගරු කරමින් ඒ සඳහා දුන් අනුබලය හා නායකත්වය විශේෂයෙන්ම සිහි කළ යුතුයි.

එමෙන්ම, "ආංශික අධීක්ෂණ කාරක සභා" සහ "අග්‍රාමාත්‍යවරයාට යොමු කළ ප්‍රශ්න" වැනි නව සම්ප්‍රදායයන් ඇති කරමින් අටවන පාර්ලිමේන්තුවට නව උපාංග හඳුන්වා දී

ආදර්ශවත් ව්‍යවස්ථාදායකයක් බිහි කිරීමට ගත් පියවරත් මේ අවස්ථාවේදී අපි අගය කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ ස්වාධීන කොමිෂන් සභා ක්‍රියාවලිය යථාර්ථයක් බවට පත් කිරීමේදී එතුමා සෑම විටම සියලු දෙනාටම ධෛර්යය සපයමින්, සැබෑ පරිණත ප්‍රජාතන්ත්‍රවාදී කාර්ය භාරය ඉටු කළ බව මා ඉතා ගෞරවයෙන් සඳහන් කළ යුතුයි.

මා ඉහත සඳහන් කරුණු ගෙනහැර පෑවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා එතුමා දුන් දායකත්වය ගෞරවයෙන් සිහි කිරීමටයි. එලෙසම අපි පොදු මතයක හිදිමින් ක්‍රියා කළ අවස්ථා වාගේම ඇතැම් කාරණා සම්බන්ධව අප එකඟ නොවූ අවස්ථා ද තිබෙනවා. නමුත්, ඒ එකඟ නොවූ අවස්ථාවල පවා අපි එකිනෙකාගේ මතවලට ගරු කරමින් කටයුතු කළ බව මට මේ අවස්ථාවේදී සිහිපත් වෙනවා. එය දේශපාලනයේ විශාල පරිණතබවක්. දේශපාලනයේ යෙදෙන කාටත් එවැනි ආත්ම සංයමයක් අවශ්‍ය බවයි මගේ හැඟීම.

ක්‍රියාකාරී දේශපාලනයෙහිලා මගේ ගමනේ ආරම්භය සඳහාත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විශාල මැදිහත්වීමක් සිදු කළ බව මෙහිදී සිහිපත් කළ යුතුයි. කොළඹ නගර සභාවෙන් මා ආරම්භ කළ එම ගමන එතුමාගේ බලවත් ඉල්ලීමක්, එහෙම නැත්නම් බලකිරීමක් කියලා කිව්වොත් වැරදි නැහැ. මාගේ දේශපාලන පැමිණීම එසේ සිදුවීමක්. මා දීර්ඝ වශයෙන් අදහස් දැක්වීමට අපේක්ෂා කරන්නේ නැහැ.

කෙසේ වෙතත්, අද දවසේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා පිළිබඳව වැදගත් අදහස්වලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් සමඟ එකඟ වෙමින්, ඔබ සියලු දෙනාටම පාර්ලිමේන්තුවේ කථානායකවරයා විධියට මාගේ කෘතවේදීත්වය යළිත් පිරිනමමින්, ගරු අග්‍රාමාත්‍යතුමන්ට ඉදිරි අනාගතයේදී මේ රට වෙනුවෙන් විශාල සේවයක් ඉටු කිරීමට ශක්තිය, ධෛර්ය වාසනාව ලැබේවා! කියා ප්‍රාර්ථනා කරනවා. එමෙන්ම, මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මැතිනියට ද පාර්ලිමේන්තුවේ සුභාශිංසනය මේ අවස්ථාවේදී පුද කරනවා. ස්තූතියි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 12.21 ට, 2017 අගෝස්තු 08වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.
அதன்படி பி.ப. 12.21 மணிக்கு பாராளுமன்றம், 2017 ஆகஸ்ட் 08, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப் பட்டது.

Parliament adjourned accordingly at 12.21 p.m. until 1.00 p.m. on Tuesday, 08th August, 2017.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.